භදන්තාචරිය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

## පරමත්ථජෝතිකා නම් වූ

# සුත්තනිපාතට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

# සුත්තනිපාතට්ඨ කථා සිංහල පරිවර්තනය

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි, සුත්තනිපාතට්ඨ කථාව සිංහලට පරිවර්තනය කරන ලද්දේ දොඩන්දූව පින් කන්දේ රුක්සෙවනේ පදිංචි ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා විසිනි.

නිමල් ලාල් රංජිත් අධ්‍යාපනය ලැබුවේ අම්බලම්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙනි. තත් විද්‍යාලයයේ දීප්තිමත් ශිෂ්‍යයෙකු වූ ඔහු විද්‍යාලඞබාර විශ්ව විද්‍යාලයයෙන් පාලි විශේෂ ගෞරව දෙවැනි පෙල උපාධිය හිමි කරගත්තේය. උපාධිධාරියකු වසයෙන් රජයේ සේවයට බැඳුනු නිමල් ලාල් රංජිත් ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ 11/1 ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස කටයුතු කරමින්ම ප්‍රාචීන විභාග සමත්වැ පණ්ඩිවරයකු විය. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයයෙන් පාලි භාෂා සාහිත්‍ය අධ්‍යයනය යටතේ ශාස්ත්‍රපති උපාධිය ලබාගත් නිමල් ලාල් රංජිත් මහතා අද ද ශාස්ත්‍රීය කටයුතුවල යෙදෙන්නෙකි. පළාතේ ආගමික හා සමාජසේවා කටයුතුවල යෙදෙමින් සමාජ ශුභ සිද්ධිය සඳහා කටයුතු කරන ඒ මහතා දෙදරු පියෙකි.

Vol VII

භදන්තාචරිය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

# පරමත්ථජෝතිකා නම් වූ

# සුත්තනිපාතට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 28

භදන්තාචරිය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

## පරමත්ථජෝතිකා නම් වූ

# සුත්තනිපාතට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)

*සිංහල පරිවර්තනය*

**ජේ.පී. නිමල් ලාල් රංජිත්**

**ශාස්ත්‍රවේදී පාලි විශේෂ II පෙළ - කැළණිය විශ්ව විද්‍යාලය**
**ශාස්ත්‍රපති පාලි භාෂා සාහිත්‍ය - ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය**
**ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය, නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම්**

*අධීක්ෂණය*

**ශාස්ත්‍රපති පී.එල්.කේ. පෙරේරා**

**ප්‍රාචීන පණ්ඩිත**
**තුලනාත්මක වාග් විද්‍යාව පශ්චාත් උපාධිය බර්ලින් විශ්ව විද්‍යාලය**

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256 ෆැක්ස්: 21736737

භදන්තාචරිය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

## පරමත්ථජෝතිකා නම් වූ

# සුත්තනිපාතට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-37-8

*පරිගණක අකුරුකරණය*

උපමාලි කුලසේකර - කටුගස්තොට.

*පිටකවරය*

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

දුරකථනය: 0112517269

*ප්‍රකාශනය*

**බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය**

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737

විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk

www.buddhistcc.com

# ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නිට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාද්වීපයේ තහවුරු විය.

## හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්වීය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

**මහා අට්ඨකථා**
**කුරුන්දි අට්ඨකථා**
**පච්චරිය අට්ඨකථා** නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

## බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුත් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්‍ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්‍ෂ එක්සැටදහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

## අටුවා විස්තරය

### විනය පිටකය

| | පෙළ | | අටුවාව | කර්තෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභංග | 1 පාරාජිකා පාළි | 1 ආණා දෙසනා | සමන්තපාසාදිකා | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 2 පාචිත්තිය පාළි | 2 යථාපරාධ සාසන | විනය අට්ඨකථා | | |
| ඛන්ධක | 3 චුල්ල වග්ග පාළි | 3 සංවරාසංවර කථා | | | |
| | 4 මහාවග්ග පාළි | | | | |
| පරිවාර | 5 පරිවාර පාළි | | | | |
| | | භික්ඛුපාතිමොක්ඛ | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | | භික්ඛුණී පාතිමොක්ඛ | (මාතිකට්ඨ කථා) | | |

### අභිධර්ම පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1 ධම්මසංගණිප්පකරණ | 1 පරමත්ථ දේසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2 විභංගප්පකරණ | 2 යථාධම්ම සාසන | සම්මොහ විනොදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 3 නාමරූප පරිච්ඡේද කථා | | | |
| 3 කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 4 පුද්ගලපඤ්ඤප්තිප්පකරණ | | | | |
| 5 ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6 යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7 පට්ඨානප්පකරණ | | | | |

## සූත්‍ර පිටකය

| | | | |
|---|---|---|---|
| 1 දීඝනිකාය | 1 වොහාරා දේශනා | සුමංගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 මජ්ඣිමනිකාය | 2 යථානුලෝමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 සංයුක්තනිකාය | 3 දිට්ඨි විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 4 අංගුත්තරනිකාය | | මනෝරථපූරණී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 5 ඛුද්දක නිකාය | | | |
| 1 ඛුද්දකපාඨ | | පරමත්ථ ජොතිකා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 ධම්මපද | | ධම්මපදට්ඨ කථා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 උදාන | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 4 ඉතිවුත්තක | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 5 සුත්තනිපාත | | පරමත්ථ ජොතිකා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 6 විමානවත්ථු | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 7 පේත වත්ථු | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 8 ථේර ගාථා | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 9 ථෙරී ගාථා | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 10 ජාතක | | ජාතකට්ඨකථා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 11 නිද්දේස (චුල්ල-මහා) | | සද්ධම්ම ජොතිකා | උපසේන ආචාර්ය 6වන ශ.ව. |
| 12 අපදාන (ථේර-ථෙරී) | | විසුද්ධ ජන විලාසනී | මහානාම ආචාර්ය 7වන ශ.ව. |
| 13 පටිසම්භිදා මග්ග | | සද්ධම්මප්පකාසිනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 14 බුද්ධවංස | | මදුරත්ථප්පකාසිනී | බුද්ධදත්ත හිමි 5වන ශ.ව. |
| 15 චරියාපිටක | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| | | විසුද්ධි මග්ග | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| නෙත්තිප්පකරණ | | නෙත්තී අට්ඨකථා | ධර්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| චතුභාණවාරපාළි | | චතුභාණවාර අට්ඨකථා | ආනන්ද වනරතන 8වන ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාළියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

## බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

## උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

## මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

## ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - ප්‍රේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින ත්‍රිපිටක මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදී. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරසේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

**කිරම විමලජෝති ස්ථවිර,**
**අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,**
නැදිමාල, දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවතාතේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

| | |
|---|---|
| රාජකීය පණ්ඩිත | කීර්ති නාරම්පනාව මහතා |
| ශාස්ත්‍රවේදී | ඇන්.එච්. පෙරේරා මහතා |
| පණ්ඩිත | ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා |
| පණ්ඩිත | ටී.ජී. ජයතිලක මහතා |
| පණ්ඩිත | ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| පණ්ඩිත | බී.ඇම්.පී. බාලසූරිය මහතා |
| පණ්ඩිත | සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා |
| පණ්ඩිත | දයා ගුණසේකර මහතා |
| පණ්ඩිත | ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා |
| පණ්ඩිත | ජිනදාස ගොඩකන්ද මහතා |
| පණ්ඩිත | ලසිත් නලන්ත මහතා |
| පණ්ඩිත | පී.ඇල්.කේ. පෙරේරා මහතා |

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්‍ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ (පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ (කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

# සංඥාපනය

ථෙරවාදී සුත්ත පිටකයේ ඛුද්දක නිකායට අයත්, සුත්ත නිපාතයට ඇතුලත් සූත්‍ර හැත්තෑවට ලියැවුණු අටුවාව 'පරමත්ථජෝතිකා' යැයි හැඳින්වේ. ඒ අනුව අටුවාචාරීන් බලාපොරොත්තු වන්නේ සදහම්හි දිගු පැවැත්ම වෙනුවෙන් සුත්ත නිපාතයට අරුත් විවරණය කිරීමෙන් තමන් විසින් රැස් කරගන්නා ලද කුසල බලයෙන් පොදු ජනතාව ඒ උතුම් දහම් දැනුමෙන්, අවබෝධයෙන් දියුණුවට පැමිණේවා යන්නයි. අටුවාවක් ලියන ලෙස ආරාධනාවක් නොවූවත්, මෙම උදාර අදහස පෙරටුව, අටුවාකරණයෙහිදී අනුගමනය කරන රචනා මග මුලදීම පහදා දෙයි.

මේ ගැන සාකච්ඡා කිරීමේදී සුත්ත නිපාතය හා එහි අට්ඨක පාරායණ වග්ග පිළිබඳවද වෙසෙසින්ම අවධානය යොමු කළ යුතුය. අරුත් විවරණය සඳහා වූ (මහා) නිද්දෙසය අට්ඨක වග්ග වෙනුවෙන් ද (චූලල) නිද්දෙසය පාරායණ වග්ග වෙනුවෙන් ද (දැනට කොටස් දෙකක්) සේ තිබුණත්) ඛුද්දක නිකායේ පොත් අතර නිද්දෙස නමින් එකක් තිබේ. එසේම පාරායණ වග්ගයෙහි පසුබිම එහි වත්‍ථු ගාථාවලින් ද පැහැදිලි වෙයි. පරමත්ථජෝතිකාව එම ගාථා ද තවදුරටත් පැහැදිළි කරමින්, එහි අනෙකුත් සූත්‍ර දේසනයට හේතු වූ කරුණු ද සඳහන් කරයි. මේ අනුව අනෙක් පෙළ පොත් අටුවාවන්ට වඩා සුවිසෙස් වෙනස් බවක් මෙයට හිමිවෙයි. මෙහිදී අටුවා ඇදුරු වඩාත් උනන්දු වන්නේ නිදාන කතා දැක්වීම හා ඒ සූත්‍රවලට හරවත් අරුත් ඉදිරිපත් කිරීමයි. එමෙන්ම (චූලල) නිද්දෙසයේ ඛග්ගවිසාණ සූත්‍ර කරුණු හා අටුවාවේ විස්තරද මෙහිදී සැළකීම මැනවි. අට්ඨක - පාරායණ වග්ගවල අරුත් විවරණයට අටුවා ඇදුරන්ට නිද්දෙසය බෙහෙවින්ම උපකාර වූ බව පෙනේ.

මෙම අටුවාවද, පාරම්පරික අදහස අනුව බුද්ධඝෝස හිමිගේ බව සඳහන් වෙතත්, පොල්වත්තේ බුද්ධදත්ත හිමි පවසන පරිදි, එහි පැහැදිලි වෙනසක් දැකිය හැකිය. සුත්ත නිපාතයේ සෙල සූත්‍රය හා වාසෙට්ඨ සූත්‍රය පිළිවෙලින් මජ්ඣිම නිකායෙහිද, සභිය සූත්‍රය දීඝ නිකායෙහි ද ඇතුලත්ව ඇත. මේ පිළිබඳව සුත්ත නිපාත අටුවාව හා මජ්ඣිම-දීඝ නිකාය අටුවාවල කරුණු විමසීමේදී සමානතා මෙන්ම වෙනස්කම්ද

පැහැදිලිය. (මින් ඉදිරියට අටුවා එහි මුල් නමින්ම දැක්වේ.) පරමත්ථ ජොතිකා අටුවා ඇදුරු නිසැකවම අනෙක් අටුවා ඇසුරු කරන ලදැයි සිතිය හැකි අතර, පිළිගත් අටුවා නය ඔස්සේම, බොහෝදුරට නිදහස් මගක්ද අනුගමනය කළ බව පෙනේ. අනෙක් අටුවාවල මෙන් 'මහා විහාර මග' ගැන මෙහි සඳහන් නොවීමද වැදගත් කරුණකි.

සේල සූත්‍රයේදී පරමත්ථජෝතිකාව කලින් විස්තර නොවූ පදවල අරුත් දක්වන බවද පහදයි. 'පපඤ්ච සූදනී' 'එවමෙව සුතනති සෙල සුතතං, තත්ථ අංගුතතරාපෙසුති ආදී පොතලිය සුතෙත විත්ථාරිතමෙව' යැයි කියා, පොතලිය සූත්‍ර විස්තරයේ දී 'තතරමහියා උතතරෙන යො ආපොති, මහාමහියා - තත්‍රායං ආවිභාව කථා, අයං කිර ජම්බුදීපො..... යනුවෙන් සඳහන් කරයි. පරමත්ථජොතිකාවෙහි අංගුතතරාපෙසු යන වචනය විස්තර වන්නේ මහාමහී ගඟට උතුරින් වූ අදාල පෙදෙස ගැන කීමේදී, ඒ ගඟෙහි පටන්ගැන්ම මුලසිටම දැක්වීමට 'අයං කිර ජම්බුදීපො'... ආදී ලෙසිනි. මෙතැන් සිට මහාමහී ගංගාවෙහි ඇරඹීම අටුවා දෙකෙහිම සමානය. චාරිකං චරමානො යන පදය පරමත්ථජොතිකාව තුරිත චාරිකා - අතුරිත චාරිකා යැයිද, 'මහතා භිකඛු සංඝෙන යන්නට ගුණයෙන් හා පමණින් ද වැඩිවූ සඟ පිරිස ලෙසද දක්වයි. අටුවා දෙකෙහිම කේණිය ජටිල ගැන විස්තර වන්නේ මඳ වෙනස්කම් සහිතවය. 'ඨයෙහි කම්සුව විඳී' යැයි පපංච සූදනිය සඳහන් කරනවිට, පරමත්ථජොතිකාව 'ඨයෙහි කැමති පරිදි පස්කම්හි නියැලෙමින් සපුරා එය විඳින අයුරු දක්වයි. 'ඉතිපිසො භගවා..........ආදී තථාගත කිතුරාවය විස්තර කිරීමේදී සක්‍යපුතෙතා යන්නට පරමත්ථ ජොතිකාව මනාප වෙයි.

පපංචසූදනියෙහි දී 'කේණිය ජටිල යන පදයට පසුව, 'ධම්මියා කථාය' විස්තරයේදී හිස් අතින් තථාගතයන් දැකීමට යාම නුසුදුසු බව සිතන කෙණිය, ඩෙබර (මසං) පානයක් සකසා ගෙනගිය බවත්, ඒ පුවත භෙසජ්ජකඛන්ධකයෙහි දැක්වෙන බවත් වෙසෙසින් සඳහන් කරයි. පරමත්ථ ජෝතිකාවද 'එය භෙසජ්ජකඛන්ධකයෙහි කියා ඇති පරිදි දතයුතු යැයි දක්වා, තථාගතයන් වහන්සේ ඒ ඒ වේලාවන්හිදී සුදුසු පරිදි කරුණු පහදා දුන් අයුරු නිදසුන් කොට සේඛ, ගෝසිංග, රථවිනීත සූත්‍ර ද සඳහන් කරයි. සඟ පිරිස වැඩි බැවින් කේණියගේ දාන ආරාධනාව මුලදී පිළිනොගැනීම ගැන පපංචසූදනී පේළි දහහතරක් දක්වන විට, පරමත්ථජොතිකාවේ පේළි පහකිනි. තථාගතයන් පියවරෙන් පියවර තබා

වඩින අයුරින්, ඉක්මන් ගමනින් වැළකෙන අයුරු එක සමාන අදහසම, එහෙත් වෙනත් ආකාරයෙන් අටුවා දෙකෙහිම දැක්වේ. දත්වල සුදු, පැහැපත් බව පපංච සූදනී කියන විට, පරමත්ථජෝතිකාව අමතරව, භාග්‍යවතුන් වහන්සේගේ දත්වලින් සඳකිරණ මෙන් ඉතා සුදු රැස් විහිදෙන නිසා 'සුසුක්ක දාඨො' යනුවෙන් අරුත් කියයි.

වාසෙට්ඨ සූත්‍රය පිළිබඳවද අදාල අටුවා දෙකෙහි වෙනස්කම් සැළකුව මනාය. මුලදීම මෙහි අසමානතාව පැහැදිලි වේ. ඉච්ඡානංගල නම් ගමෙහි චංකී, තාරුක්ඛ ආදී මහසල් බමුණන් මෙන්ම, පොක්ඛරසාතී, ජානුසෙසාණි නිමිති කියන්නන් බවත්, ඔවුන්ගේ උපත ගැනත් පරමත්ථජෝතිකා විස්තර කරයි. වේදය දත් බමුණන් වේද සජ්ඣායනයටත්, අරුත් පිරික්සීමටත් ඒ ගමෙහි රැස්වන බවත් තවදුරටත් දක්වයි. පපංචසූදනී කියන්නේ ඉච්ඡානංගල යනු ගමට නුදුරු වනලැහැබක් බවත්, කෝසල රජුගේ පුරෝහිතයන් වූ චංකී ආදී බමුණන් පස්දෙනා හයමසකට වරක් එහි රැස්වන අතර, තම ජාතිය පිළිබඳ වූ කරුණු උදෙසා උක්කට්ඨාවෙහිදී පොක්ඛරසාති හමුවීමට රැස්වන බවත්, වේද මතුරු පිරිසිඳ දැනීමට ඉච්ඡානංගලයෙහි රැස්වන බවත්ය. උදකෙ යන තන්හී දියෙහි හටගත් යනුවෙන් පපංචසූදනී කියනවිට, පරමත්ථජෝතිකා දියෙහි උපන් ප්‍රේමසුන් ආදී කොට ඇති නොයෙක් ආකාර මසුන් යැයි වැඩිදුර දක්වයි. යොනිජං මත්තිසම්භවං යන පදයටද ඊට පෙර සූත්‍රාගත වචනද සඳහන් කොට, පරමත්ථජෝතිකාව පැහැදිලි කරතත්, පපංචසූදනී ඒ කරුණු කෙටියෙන් කියයි. අටුවා දෙකෙහි මෙම සූත්‍රයට අදාලව දැකිය හැකි ඇතැම් වෙනස්කම් සසඳ බැලීම වැදගත් වේ.

| පරමත්ථජෝතිකා | පංපච සූදනී |
| --- | --- |
| න පරිතස්සති - තණ්හාය න භායති | න පරිතස්සති, තණ්හා පරිසසනාය න පරිතස්සති. |
| සංගාතිගං - චතුන්නම්පි යොගානං අභාවෙන | සංගාතිගං, රාගසංගාදයො අතික්කන්තං |
| සහනුක්කමන්ති, අනුසයානුක්කම සහිතං දවාසට්ඨී දිට්ඨී සන්ධානං, ඉදං සබ්බම්පි ඡන්දිත්වා ඨිතං අවිජ්ජා පලිඝස්ස උක්ඛිත්තත්තා උක්ඛිත්ත පලිඝං | සහනුක්කමන්ති, අනුක්කමො වුච්චති පාසෙ, පවෙසන ගණ්ඨිදිට්ඨානුසයසෙසතං නාමං උක්ඛිත්ත පටිසොති අවිජ්ජා |

චතුනනං සචචානං බුදධතතා බුදධං අහං බ්‍රාහමණ වදාමීති අතෙථා (මෙහි දී අදාල ඒ ගාථාවල තවත් වචනවලට ද තේරුම් දී ඇත.)

උභයනති, ගිහීච අනගාරෙහිචාති උභයෙහිපි අසංසටඨං

අනොකසාරිනති, අනාලයචාරිං

අමතොගධං, අමතං නිබබාණං ඔගහෙතවා අනුපපතතං

කිඤචනනති යෙසසතෙසු ඨානෙසු තණහා ගාහසංඛාතං කිඤචනං නතථි

තපෙනාති, ඉනද්‍රිය සංවරෙන බ්‍රහමචරියෙනාති සිකඛානිසසිතෙන වුතතාවසෙස සෙටඨචරියෙන

බුදධනති චතුසචච බුදධං

අනාගාරෙහි චූභයනති, අනගාරෙහිච විසංසටඨං උභයඤච දවීහිපි චෙතෙහි විසංසටඨමෙවාති අතෙථා

අනොතසාරිනති, ඔකං වුචචති පඤචකාම-ගුණාළයො, තං අනලලීයචානනති අතෙථා.

අමතොගධං, අමතබභනතරං

කිඤචනනති කිඤචනකාරකො කිලෙසො

තපෙනාති ධුතංග තපෙන

බ්‍රහමචරියෙන මෙථුන විරතියා

සුත්ත නිපාතයේ දී එවං මෙසුතං යැයි සඳහන් සූත්‍රයක් ලෙස මුලින්ම හමුවන්නේ කසීභාරද්වාජ සූත්‍රයයි. සුමංගල විලාසිනී අටුවාවේ බ්‍රහ්මජාල සූත්‍රයට අදාල වන එම විස්තරය මෙහිලා වැදගත් වේ. එසේ අනෙක් අටුවා හා සළකන විට පරමත්ථජෝතිකාවේ කිසියම් වෙනසක් මෙන්ම, ඉදිරියට දැක්වෙන පරිදි රචනා සැකැස්මෙහිද නිදහස් බවක් පැහැදිලි වෙයි. මෙහිදී මහාකස්සප හිමි පළමු සංගීතියේදී අනඳ තෙරුන් විමසන ලද පරිදි එය කසීභාරද්වාජ සූත්‍රයට ගලපන අටුවා ඇදුරු තවදුරටත් එවං යන පදය යෙදෙන අයුරු දක්වන්නේ සුමංගල විලාසිනී හා සමාන ලෙස, 'නානත්තනය නිපුණ...........න අඤඤථාති දට්ඨබ්බන්ති' යන වැකි එපරිදිම යොදා ගනිමිනි. ඊට පසු මෙසුතං යන පද පේළි තුනකට සීමාවී ඇත. මුලදී තථාගතයන් වහන්සේ සුවඳ කුටියට පිවිසීම තෙක් පෙර බත්කිස ගැන කියන පරමත්ථජෝතිකාව, සුමංගල විලාසිනිය හා සමානව සඳහන් කරතත්, එහි නොකී කරුණක් ඇතොත් බ්‍රහ්මායු

සූත්‍ර විස්තරයෙන් දතයුතු බව කීම අවධානය කළයුතු කරුණකි. තථාගතයන් වහන්සේගේ සිවු ඉරියවු පැවැත්ම එයින් විස්තර වන බැවින්, එවැනි පෙළ සූත්‍රයක් නම් කිරීම වැදගත්ය. සුමංගල විලාසිනියේ 'අථ භගවා කත පුරෙභතතකිචෙචා........ ආදී ලෙසින් ඇරඹෙන ඡේදය පරමත්ථ ජොතිකාවේදී වචන කිහිපයක වෙනසක් ඇත. මෙම අටුවාචාරීන්ට උවමනා වූයේ අදාල සූත්‍ර දේසනයට තථාගතයන් වහන්සේ යොමුවන අයුරු ඇඳහිය හැකි ලෙස ඉදිරිපත් කිරීමයි.

කසීභාරද්වාජ සූත්‍රය සංයුත්ත නිකායෙහිද ඇතුලත්ය. එහි අටුවාව වූ සාරත්ථපපකාසිනියට වෙනස් ලෙස තථාගත දිනචරියාව මුලදීම පරමත්ථජෝතිකාව දක්වයි. උන්වහන්සේ දේවතාවුන්ගේ පැන විසඳමින් මැදියම් රැය ගතකරන අතර, පැසුළු සමය කොටස් සතරක් කොට, එහි විස්තර කරනවිට, සාරත්ථපපකාසිනි එය කොටස් තුනක් සේ දකී. එම යාමයේ සිවුවන භාගයේදී මහා කරුණා සමවතින් ලොව බලන බව වෙසෙසින් සඳහන් කරමින්, කසී බමුණු හමුව ඉදිරිපත් කිරීමට සාර්ථක පිවිසුමකට පරමත්ථජොතිකාව යොමු වේ. 'අහංඛො සමණ කසාමි' කොටසට අදාල විස්තරයක් සාරත්ථපපකාසිනියෙහි නැත. එහෙත් 'පුබබණහ කිචචං' ආදී විස්තර පරමත්ථජොතිකාවෙහිද සමානය. 'ඡබබණණ රසමියො නිකඛමිත්වා සුවණණා රස පිඤජරානි විය, චිත්‍රපට පරිකඛිතානි විය' මෙම පද කීපය පමණක් පරමත්ථජොතිකාවේ නොතිබුණද, නැවත සුවඳ කුටියට පිවිසීම දක්වා අටුවා දෙකෙහිම එක්බඳු විස්තරයකි. සුවඳ කුටියෙහිදී අවවාද දෙන විට, එහි 'ඛණ සමපතති දුලලභා' යන්න වෙනුවට 'දුලලභා සදධා සමපතති' යනුවෙන් පමණක් සාරත්ථපපකාසිනියෙහි වෙනස් වේ.' 'ගාථායාති අකඛරපද නියමිතෙන වචනෙන' වැනි වැදගත් තැනක් සාරත්ථපපකාසිනියෙහි නොපෙනෙන අතර, වැඩි විස්තර ඇත්තේ පරමත්ථ ජොතිකාවේය.

ආලවක කතා පුවත අටුවා දෙකෙහිම සමානව ඇතත්, පැන විමසීමෙන් තථාගතයන් වෙහෙසට පත්කිරීමට සැරසෙන අයුරු වඩාත් ගැඹුරු හා බියකරු ලෙසින් පරමත්ථජොතිකාවෙහි විස්තර කරද්දී, සාරත්ථපපකාසිනී දක්වන එම පැනවල අතීත තොරතුරු ලෙස වූ ඒ සමාන වැකි පරමත්ථජොතිකා ඉදිරිපත් කරන්නේ පසුවය. එමෙන්ම සදෙවක, සමාරක, සබ්‍රහමක - සදෙව මනුසස වචන ගැනත්, පැන විමසීමට වෙනත් පුද්ගලයන්ට ද තථාගතයන් වහන්සේ ඉඩ ලබාදුන්

අයුරුත් නිදසුන්කොට සූත්‍ර පසුබිම හරවත් කරයි. එහෙත් සාරත්‍ථප්පකාසිනී එකවිටම 'කිංසූධ චිත්තං' විස්තර කරයි.

කතා පුවත් සඳහන් කිරීමේ දී සම්මා පරිබ්බාජනීය සූත්‍ර අටුවා විස්තරයෙහි කෝලිය පරපුරේ ඉතිහාසය, සුමංගල විලාසිනියේ අම්බට්ඨ සූත්‍ර විස්තරයට සමාන වැකි මෙන්ම, ඇතැම් තැනක වෙනස් වන බවද පෙනේ. පරමත්‍ථජෝතිකාවට අනුව තුන්වන ඔක්කාක රජු වෙනත් බිරියකගෙන් ලද පුතුට රජකම දීමට සූදානම් වූ විට, මතුවන ගැටළු සහගත බවින් මිදීමට, මුල් බිසවගේ දූපුතුනට තම ඇවෑමෙන් පැමිණ රජකම කරන්නැයි කියා, ඇමතිවරුන් අටදෙනෙකු සමග ඔවුන් පිටතට යවයි. කුමාරවරුන් සොහොයුරියන්ද කැටුව සිවුරඟ සෙනග හා නික්මුණු බවද සඳහන් කරන අතර, සුමංගල විලාසිනිය කියන්නේ ඔවුන් නොයෙක් අයුරින් හඬාවැළපී තම වැරදිවලට කමාකරන ලෙස රජුට කී බවයි. පරමත්‍ථජෝතිකාවට අනුව මේ කුමාරවරුන්ට හිමාලයෙහිදී හමුවන්නේ කපිල නම් වූ දැඩි තවුස්දම් පුරන්නෙකි. සුමංගල විලාසිනී අනුව, බමුණු මහසල් කුලයක උපන් කපිල බමුණු ඉසිවරයකු වූ බෝසතුන්ය. අටුවා දෙකෙහි මීට අදාල වැකිවල වෙනස්කම් ඇත. අම්බට්ඨ සූත්‍රයේදී තථාගතයන් වහන්සේ සාක්‍යයන් ගැන පැවසූ පාඨයක් ද පරමත්‍ථජෝතිකාව දක්වයි.

රාම රජු සහ සිරුර පුරා වණ සැදුණු (සැකිකුල) දෙටු සොයුරිය අතර ඇතිවන සංවාදයත්, පසුව රාමරජු සිටින පෙදෙසට එන නගරය ගැන දන්නා වනචාරී පුද්ගලයාත් අතර සංවාදයත් අටුවා දෙකෙහි වෙනස්ය. වැඩි තොරතුරු දැක්වෙන්නේ පරමත්‍ථජෝතිකාවේ බව පෙනේ. රාම රජු හා සුවය ලද ඇය හා සහවාසයෙන් ඇතිවන සාතිය-කෝලිය පරපුර බුද්ධකාලය තෙක්ම පැවති බව සුමංගල විලාසිනිය කෙටියෙන් දක්වද්දී, පරමත්‍ථජෝතිකාව සීහහනු රජුගේ සුද්ධෝදන ආදී පුතුන් පස්දෙනා ගැන කියයි. රෝහිණී නදියෙහි ජල කලහය සංසිඳවීම ආදී තතු සුමංගල විලාසිනිය කෙටිකොට දක්වන්නේ සම්මා පරිබ්බාජනීය සූත්‍රයට පෙරවදනක් මෙනි. පරමත්‍ථජෝතිකාවට අනුව එම සූත්‍රයද මහාසමය සූත්‍රය යැයි හඳුන්වා තිබීමෙන් හැඟෙන්නේ (අපට දැනට ඇසෙන මහාසමය සූත්‍රයට වඩා) එහි පැරණි බවකි. 'පුච්ඡාමි මුනිං......'ආදී මුල් ගාථාව ඉඳුබෙලෙන් පෙන්වන ලද බුදුවරයකු විසින් විමසන ලද්දකි. බොහෝ දේවතාවුන් රැස්වූ මේ හමුවෙහිදී පුරාභෙද ආදී සූත්‍ර හයක් වදාළ බවත්, මෙම සූත්‍රය

රාගී චරිතවත් දේවතාවුන්ට සුදුසු වන පරිදි පසුබිම සකසා ගැනීමට පැනයක් සේ එම ගාථාව කී බවත් දැක්වෙයි. එසේ පෙන්වූ බුදුරුව, තථාගතයන් බෝමුල්හිදී කෙලෙසුන් නැසීම ගැන තුතිකොට එම ගාථාව කී බව සුමංගල විලාසිනිය සඳහන් කරයි. ඒ ඒ දේවතාවුන් චරිත අනුකූලව බෙදී ඇති අයුරුත්, පුරාභෙද ආදී සූත්‍ර දේසනා ගැනත් අටුවා දෙකෙහි සඳහන් වන්නේ එකම අයුරින් නොවේ. මෙහිදී දේවතාවුන් වෙන වෙනම කී ගාථා සගාථක වගගයෙහි දැක්වෙන පරිදි දතයුතු බව පරමත්ථජොතිකාව කියන අතර, සුමංගල විලාසිනිය එම ගාථා පෙළෙහි ඒ ඒ තන්හි වෙන් වෙන්ව දැක්වෙන බව කියයි. එහි අරමුණ මහාසමය සූත්‍රයට විස්තර දැක්වීම වුවත්, මූලික පසුබිම ගොඩනැගෙන්නේ සමමා පරිබබාජනීය සූත්‍රය ඇසුරිනි.

මීළඟට සභිය සූත්‍ර විස්තරයට අවධානය යොමු කරන්නේ එහි ඇතැම් කරුණුද පරමත්ථජෝතිකාවෙහි වෙනස්ව සඳහන් හෙයිනි. මෙහි පූරණකසසප ආදීන් ගැන දැක්වූ කරුණු සාමඤ‍ඤඵල සූත්‍ර අටුවාව හා වෙනස්කම් දක්වද්දී පරමත්ථජොතිකාව 'තෙසං දිට්ඨානුගතිං ආපජජනෙතහි ඔතරිතබබානං ඔගාහිතබබානං දිට්ඨිතිත්ථානං කනතාරො' යැයි වැඩි විස්තර පහදයි. තවදුරටත් ඒ ආගමික නායකවරුන් හයදෙනා ගැන කියන අතර, 'ඔවුන් සියල්ල දන්නා බව පවසති'යි අවධාරණයෙන් යළි යළිත් සඳහන් කරන්නේ, ඔවුන්ගේ මතවාදවල නිසරු බව පෙන්වා, තථාගත දහම් විනයෙහි උසස් බව පහදා දීමටයි.

සුතතනිපාත වසල සූත්‍රයෙහි මාතංග ගැන ද දැක්වෙන නිසා අටුවාවේ අගගික භාරද්වාජ සූත්‍ර නමින් දැක්වෙන විස්තරයෙහි එම කතාව විස්තර වන අතර, ජාතක අටුවාවේ මාතංග ජාතකය අතර වූ වෙනස්කම් කිහිපයක් ගැන මීළඟට අවධානය යොමු කරන්නේ ඉහත දැක්වූ පරිදි බොහෝ අටුවා බුද්ධඝෝස හිමියන්ටම පැවරීම නොපිළිගත හැකි බවද පැහැදිලි වන හෙයිනි. පරමත්ථජොතිකා රචකයා ජාතක අටුවා රචකයාට වඩා, තමා දැනසිටි හෝ අසා ඇති කරුණු අනුව හෝ එම පුවත වඩාත් සජීවී හා විසිතුරුව ඉදිරිපත් කරයි. 'බෝසත්වරුන්ගේ අදිටන නම් ඉටුවේමය' යන අදහස බොහෝ ගැටළු සහගත තැනකදී සඳහන් කොට කතාව ඉදිරියට ගෙනයාමේ ආවේණික ජාතක කතා කලාව අනුව දිට්ඨ මංගලිකාවගේ නිවෙස් දොරටුවෙහි වැතිර සිටින මාතංග බෝසතුන් එතැනින් ඉවත්කොට ඔහුට ඇය භාරකළ බව කියයි.

පරමත්ථජෝතිකාවේ දිට්ඨමංගලිකාවගේ මව ඇය වෙනුවෙන් සමාව ඉල්ලීමක් (කහවණු) සියදහසක් දීමටත් සූදානම් වෙද්දී, ඇයව විවාහ කරගැනීමට නොහැකි වූ රජකුමාරවරුන් අවුත් එතැනින් ඉවත් නොවන ලෙසට මාතංග පොළඹවන අයුරුත් රසවත්ව දක්වයි. සතියක් ගතවනවිට අසල්වැසියන් පවා විරුද්ධතා පෙන්වන්නේ මෙබඳු කුලහීනයකු මෙසේ මළහොත්, 'අවට නිවැසියන්ද සැඬොලන් බවට පත්වෙති'යි යන දැඩි මතවාදය නිසා බවද සඳහන් වේ. මෙහිදී අසරණ වන දිට්ඨමංගලිකාව මාතංග පාමුලට කැඳවා ගෙනයාමට මවට සිදුවෙයි. මාතංගගේ කීම පරිදි ඇය නගරයෙන් පිටව යන්නේ ඔහුගේ අතින්ද අල්ලාගෙනයි. කතාවේ උච්චතම හා වැදගත් මෙවන් තැනකදී පරමත්ථජෝතිකාව ජාතක භාණක මතය වන්නේ කර තබාගෙන ගිය බව යැයි සඳහන් කිරීමද අවධානයට යොමුවිය යුතුය. මේ කරුණුවලින් පැහැදිලි වන්නේ විවරණය වන සූත්‍රයට අනුගත වන පරිදි අදාල ජාතක කතා පුවත නිදහස්ව හා තාත්විකව ඉදිරිපත් කිරීමට පරමත්ථජෝතිකා රචකයා ගත් උත්සාහයයි.

සුත්ත නිපාතයේ ජරා සූත්‍රයට පසුබිම් වූ සාකේත නුවර එක් බමුණු යුවලක තථාගතයන් කෙරෙහි ඇතිවූ දරු සෙනෙහස ගැන පසුව ආනන්ද හිමියන් විමසන ලදී. එවිට පෙර සසරේදී දිගුකලක සිට පැවති එබඳු සබඳතාව බුදුහිමි පහදා දුන්හ. ඒකක නිපාත සාකෙත ජාතක අටුවාව කියන්නේ බමුණු දෙමහල්ලන් තථාගතයන් නිවසට කැඳවා මහදන් පිළිගැන්වීමෙන් පසුව ජරා සූත්‍රය අසා දෙදෙනාම අනාගාමී වූ බවයි. වඩාත් පිළිගත හැකි පරිදි පරමත්ථජෝතිකාව දක්වන්නේ නිවසේදී ඔවුන්ට සුදුසු දහම් දෙසීමෙන් පසු සෝවාන් පල ලද බවත් පසුව හිමිවරුන් වෙත පැමිණ දහම් අසා ඉතිරි මගපල පත්ව කෙලෙස් නසා පිරිනිවනට පත් වූ එම අරියසාවක ආදාහන උළෙලට සැපත්වන තථාගතයන් වහන්සේ පැමිණ සිටි පිරිසට මෙම සූත්‍රය දෙසූ බවයි. (ජාතක කතා කලාව ඇතැම්විට වෙනස් විය හැකි වුවත්) අටුවා නය අනුව මෙබඳු තැන් වඩාත් වැදගත් වේ.

විජය සූත්‍රය දෙතැනකදී දෙසූ බැවින් නිදාන කතා දෙකක් දක්වා ඇති පරමත්ථජෝතිකාව ජරා සූත්‍රය ගැන එසේ නොකියයි. හිරි සූත්‍රය දේසනා කරන ලද්දේ බමුණකුගේ පැන විසඳුමක් ලෙසට මෙම අටුවාව විස්තර කරන අතර, මෙම ගාථා 'හිරි ජාතක කතාවෙන් පෙර බෝසත් සිරිතටද ඇතුලත් කර ඇත. එසේ ජාතක ගාථාවලදී මුළු ගාථාවලින්ම

වෙනස් වන්නේ එක් පේළියක් පමණි. අටුවා දෙකෙන් ගාථා අරුත්වලදී වඩාත් උසස් වන්නේ පරමත්ථජෝතිකා විස්තර බව පැහැදිළිය. ගන්ධාර ජාතකයේදී සුත්තනිපාත මංගල සූත්‍රයේ 'බාහුසච්චං............. ගාථාවද සඳහන්ය.

රචනා මග සැළකීමේ දී ඉතා දිග වැකි ද හමුවන අතර, බොහෝවිටම පෙළ සූත්‍ර පාඨ හා ගාථා ද සඳහන් කිරීමෙන් කරුණු තහවුරු කිරීමට පරමත්ථජෝතිකා රචකයා මනාප වෙයි. පොදු අටුවා ව්‍යාකරණය අනුගමනය කරමින් කිහිප තැනකදීම නාම, විබත්, සන්ධි ආදියද දක්වයි. වෑගම පියරතන හිමි පෙන්වා දෙන පරිදිම පොදුවේ අටුවා ඇදුරන් සකු ව්‍යාකරණය අනුව නොයා නිදහස් මගක යාම මෙහිදී ද අගය කළ යුතු කරුණකි. නිද්දෙසය විසුද්ධිමග්ග අත්ථසාලිනි, මහඅට්ඨකථාව, පොරාණ පාඨ, භාණක මත, කරුණු පහදා දීමට යොදා ගන්නා රචකයා, වඩා සුදුසු අදහස මෙන්ම, තවත් විටක කැමති පරිදි පිළිගැනීමට ඉඩ ලබාදී ඇති අයුරුද මෙහිදී අපට හමුවේ. වෙසෙසින්ම මිලින්දපඤ්හයෙන්ද සංවාද පෙන්වා දී තිබීම ද වැදගත් කරුණකි.

සමාජමය අගයෙන් යුතු කරුණු අතර, ලුණු වතුරෙන් ඇඳුම් පිරිසිදු කිරීම, සියඹලා ඇඹුල් යොදා තඹ බඳුන් ඔප දැමීම, පින්වතියනට අළුයම් කල දරු උපත් සිදුවීම, මිණුම් විධි මෙන්ම, හෙළ දිවයිනෙහි කෙතක් රකිමින් සිටි දාසියක විසින් ජරාව-මරණය ගැන ගයනු ලබන ගීයක් අසා මග යමින් සිටි සඟ සැට නමක් රහත් බවට පත්වීමේ පුවතද වැදගත්ය.

එක් අතකින් පරමත්ථජෝතිකාව කෙටිකතා එකතුවක්ද වැනිය. ඛග්ගවිසාණ සූත්‍රයේ ගාථාවනට අදාල කතා එයින් මුල්තැන ගනී. එමෙන්ම බුත්සරණ වැනි හෙළ පොතකට (අනෙක් අටුවා මෙන්ම) ආලවක දමනය විසිතුරුව දැක්වීමට මෙම අටුවාවද මුල් වූ අයුරු ලබුගම ලංකානන්ද මාහිමි තම සංස්කරණයේදී පෙන්වා දෙති.

සද්ධම්ම පජ්ජෝතිකා හෙවත් නිද්දෙස අටුවාවටද මෙම පරමත්ථ ජෝතිකාව මහෝපකාරී වූ බව පැහැදිලිය. බොහෝවිට සුත්ත පිටකයේ මුල් නිකායානුගත අටුවාවලට වැඩි අවධානයක් යොමුවීම නිසාදෝ පරමත්ථජෝතිකාවේ වැදගත්කම සීමාවී යැයි ද සිතේ. 'විස්තර කිරීමට

අපහසු ගාථා සුත්ත නිපාතයේ ඇතත්, අටුවාචාරීන් ඒ අපහසුතාව ගැන කිසිත් නොකියාම අරුත් විවරණය ඇරඹීම එතුමන්ගේ අලාමක බව යැයි බුද්ධදත්ත හිමි තවදුරටත් සඳහන් කරති. 'අනුධම්මනති, අත්ථානුරූපං පාලිං ආරොපෙනෙතා' යනුවෙන් මෙහි සභිය සූත්‍රයෙහි සඳහන් කළ ද එය පොදුවේ මුළු අටුවාවටම අදාල කළ හැකි වන්නේය.

මෙම පරිවර්තනයේදී පහත සඳහන් පොත් ඇසුරු කරන ලදී.

i. PALI - ENGLISH DICTIONARY (P.T.S)
ii. A. PALI ENGLISH GLOSSARY OF BUDDHIST TECHNICAL TERMS
BHIKKU NANAMOLI (B.P.S)

(අම්බලන්ගොඩ දෙල්දූව විවේකාරාම සෙනසුන් අධිපති ශාස්ත්‍රපති කිරින්දේ චන්දසුමන හිමිපාණන් හා කරන ලද කතාබහද මෙහිදී සිහිපත් කරමි.)

# පටුන

පිටු අංකය

| | | |
|---|---|---|
| | උරග වර්ගය | 3-281 |
| 1-1 | උරග සූත්‍ර වර්ණනාව | 3 |
| 1-2 | ධනිය සූත්‍ර වර්ණනාව | 26 |
| 1-3 | ඛග්ග විසාණ සූත්‍ර වර්ණනාව | 45 |

ඛග්ගවිසාණ සූත්‍රාගත පළමුවැනි වර්ගය

1. පළමුවැනි ගාථා වර්ණනාව 51
2. සංසග්ග ගාථා වර්ණනාව 64
3. මිත්ත සුහජ්ජ ගාථා වර්ණනාව 68
4. වංසකලීර ගාථා වර්ණනාව 70
5. මිග ගාථා වර්ණනාව 71
6. ආමන්තන ගාථා වර්ණනාව 78
7. ඛිඩ්ඩාරති ගාථා වර්ණනාව 79
8. චාතුද්දිස ගාථා වර්ණනාව 80
9. දුස්සංග ගාථා වර්ණනාව 82
10. කොවිළාර ගාථා වර්ණනාව 83

ඛග්ගවිසාණ සූත්‍රාගත දෙවැනි වර්ගය

11. සහාය ගාථා වර්ණනාව 85
12. අනවජ්ජ භෝජී ගාථා වර්ණනාව 87
13. සුවණ්ණ වලය ගාථා වර්ණනාව 89
14. ආයති භය ගාථා වර්ණනාව 90
15. කාම ගාථා වර්ණනාව 92
16. ඊති ගාථා වර්ණනාව 94
17. සීතාලුක ගාථා වර්ණනාව 95
18. නාග ගාථා වර්ණනාව 96
19. අට්ඨාන ගාථා වර්ණනාව 97

ඛග්ගවිසාණ සූත්‍රාගත තෙවැනි වර්ගය
20. දිට්ඨිවිසූක ගාථා වර්ණනාව 99
21. නිල්ලොලුප ගාථා වර්ණනාව 101
22. පාප සහාය ගාථා වර්ණනාව 102
23. බහුස්සුත ගාථා වර්ණනාව 104
24. විභූසනට්ඨාන ගාථා වර්ණනාව 105
25. පුත්තදාර ගාථා වර්ණනාව 106
26. සංග ගාථා වර්ණනාව 107
27. සන්දාල ගාථා වර්ණනාව 109
28. ඔක්ඛිත්ත චක්ඛු ගාථා වර්ණනාව 110
29. පාරිච්ඡත්තක ගාථා වර්ණනාව 111

ඛග්ගවිසාණ සූත්‍රාගත සිව්වැනි වර්ගය
30. රසගෙධ ගාථා වර්ණනාව 112
31. ආවරණ ගාථා වර්ණනාව 113
32. විපිට්ඨි ගාථා වර්ණනාව 114
33. ආරද්ධ විරිය ගාථා වර්ණනාව 115
34. පටිසල්ලාන ගාථා වර්ණනාව 117
35. තණ්හක්ඛය ගාථා වර්ණනාව 118
36. අසත්ත සත්ත ගාථා වර්ණනාව 119
37. දාඨාබලී ගාථා වර්ණනාව 121
38. අප්පමඤ්ඤ ගාථා වර්ණනාව 122
39. ජීවිත සංඛය ගාථා වර්ණනාව 123
40. කාරණා ගාථා වර්ණනාව 124

1-4 කසීභාරද්වාජ සූත්‍ර වර්ණනාව 126
1-5 චුන්ද සූත්‍ර වර්ණනාව 151
1-6 පරාභව සූත්‍ර වර්ණනාව 159
1-7 අග්ගික භාරද්වාජ (වසල) සූත්‍ර වර්ණනාව 167
1-8 මෙත්ත සූත්‍ර වර්ණනාව 185
1-9 හේමවත සූත්‍ර වර්ණනාව 203
1-10 ආලවක සූත්‍ර වර්ණනාව 225
1-11 විජය (කාය විච්ඡන්දික) සූත්‍ර වර්ණනාව 247
1-12 මුනි සූත්‍ර වර්ණනාව 259

| | | |
|---|---|---|
| | චූල වර්ගය | 282-454 |
| 2-1 | රතන සූත්‍ර වර්ණනාව | 282 |
| 2-2 | ආමගන්ධ සූත්‍ර වර්ණනාව | 318 |
| 2-3 | හිරි සූත්‍ර වර්ණනාව | 332 |
| 2-4 | මංගල සූත්‍ර වර්ණනාව | 337 |
| 2-5 | සූචිලොම සූත්‍ර වර්ණනාව | 380 |
| 2-6 | කපිල සූත්‍ර වර්ණනාව | 384 |
| 2-7 | බ්‍රාහ්මණ ධම්මික සූත්‍ර වර්ණනාව | 390 |
| 2-8 | ධම්ම සූත්‍ර වර්ණනාව | 402 |
| 2-9 | කිංසීල සූත්‍ර වර්ණනාව | 407 |
| 2-10 | උට්ඨාන සූත්‍ර වර්ණනාව | 412 |
| 2-11 | රාහුල සූත්‍ර වර්ණනාව | 416 |
| 2-12 | නිග්‍රෝධ කප්ප සූත්‍ර වර්ණනාව | 421 |
| 2-13 | සම්මා පරිබ්බාජනීය සූත්‍ර වර්ණනාව | 428 |
| 2-14 | ධම්මික සූත්‍ර වර්ණනාව | 443 |
| | මහා වර්ගය | 454-575 |
| 3-1 | පබ්බජ්ජා සූත්‍ර වර්ණනාව | 454 |
| 3-2 | පධාන සූත්‍ර වර්ණනාව | 459 |
| 3-3 | සුභාසිත සූත්‍ර වර්ණනාව | 467 |
| 3-4 | පුරලාස සූත්‍ර වර්ණනාව | 472 |
| 3-5 | මාඝ සූත්‍ර වර්ණනාව | 485 |
| 3-6 | සභිය සූත්‍ර වර්ණනාව | 490 |
| 3-7 | සේල සූත්‍ර වර්ණනාව | 507 |
| 3-8 | සල්ල සූත්‍ර වර්ණනාව | 527 |
| 3-9 | වාසෙට්ඨ සූත්‍ර වර්ණනාව | 532 |
| 3-10 | කෝකාලික සූත්‍ර වර්ණනාව | 542 |
| 3-11 | නාලක සූත්‍ර වර්ණනාව | 550 |
| 3-12 | ද්වයතානු පස්සී සූත්‍ර වර්ණනාව | 567 |
| | 4 අට්ඨක වර්ගය | 576-639 |
| 4-1 | කාම සූත්‍ර වර්ණනාව | 576 |
| 4-2 | ගුහට්ඨක සූත්‍ර වර්ණනාව | 578 |

| | | |
|---|---|---|
| 4-3 | සුද්ධට්ඨක සූත්‍ර වර්ණනාව | 583 |
| 4-4 | සුද්ධට්ඨක සූත්‍ර වර්ණනාව | 588 |
| 4-5 | පරමට්ඨක සූත්‍ර වර්ණනාව | 593 |
| 4-6 | ජරා සූත්‍ර වර්ණනාව | 595 |
| 4-7 | තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර වර්ණනාව | 598 |
| 4-8 | පසුර සූත්‍ර වර්ණනාව | 601 |
| 4-9 | මාගන්දිය සූත්‍ර වර්ණනාව | 606 |
| 4-10 | පුරාභේද සූත්‍ර වර්ණනාව | 612 |
| 4-11 | කලහ විවාද සූත්‍ර වර්ණනාව | 615 |
| 4-12 | චූළ වියූහ සූත්‍ර වර්ණනාව | 619 |
| 4-13 | මහා වියූහ සූත්‍ර වර්ණනාව | 622 |
| 4-14 | තුවටක සූත්‍ර වර්ණනාව | 627 |
| 4-15 | අත්ත දණ්ඩ සූත්‍ර වර්ණනාව | 631 |
| 4-16 | සාරිපුත්ත සූත්‍ර වර්ණනාව | 635 |
| | 5 පාරායණ වර්ගය | 640-672 |
| 5-1 | වත්ථු ගාථා අජිත සූත්‍ර වර්ණනාව | 640 |
| 5-2 | තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර වර්ණනාව | 651 |
| 5-3 | පුණ්ණක සූත්‍ර වර්ණනාව | 652 |
| 5-4 | මෙත්තගු සූත්‍ර වර්ණනාව | 654 |
| 5-5 | ධෝතක සූත්‍ර වර්ණනාව | 655 |
| 5-6 | උපසීව සූත්‍ර වර්ණනාව | 656 |
| 5-7 | නන්ද සූත්‍ර වර්ණනාව | 658 |
| 5-8 | හේමක සූත්‍ර වර්ණනාව | 659 |
| 5-9 | තෝදෙය්‍ය සූත්‍ර වර්ණනාව | 660 |
| 5-10 | කප්ප සූත්‍ර වර්ණනාව | 661 |
| 5-11 | ජතුකණ්ණි සූත්‍ර වර්ණනාව | 661 |
| 5-12 | භද්‍රාවුධ සූත්‍ර වර්ණනාව | 662 |
| 5-13 | උදය සූත්‍ර වර්ණනාව | 663 |
| 5-14 | පොසාල සූත්‍ර වර්ණනාව | 664 |
| 5-15 | මෝඝරාජ සූත්‍ර වර්ණනාව | 666 |
| 5-16 | පිංගිය සූත්‍ර වර්ණනාව | 667 |

# පරමත්ථජෝතිකා නම් වූ

# සුත්ත නිපාත අටුවාව

## (සිංහල පරිවර්තනය)

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස**

**ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා !**

"සසරින් නිදහස සොයන ලෝකවාසීනට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද, කුඩා දහම් සූත්‍ර ඇතුලත්ව ඇතැයි සැළකෙන, ඛුද්දක නිකායෙහි සුත්තනිපාත නම් වූ (සූත්‍ර එකතුවට), වන්දනීය වූ උතුම් තෙරුවන් නැමද අරුත් විවරණයක් කරන්නෙමි."

"සිය ගණනකටත් වැඩි ගාථා විස්තර කෙරෙමින් පැහැදිලිව කරුණු විවරණය කෙරෙන (එයට) සුත්ත නිපාත යැයි හඳුන්වන ලද්දේ කවර හෙයින් ද?"

මැනවින්, පැහැදිලිව පවසන ලද බැවින් ද, (දහමෙහි) අරමුණ ඉටුවන බැවින් ද, අරුත මැනවින් පිහිටා ඇති බැවින් ද ඇසීමට කැමැත්ත ඇතිකරන, නූලක් සේ එකම සබඳතාවක් පවත්නා බැවින්, සුත්ත යැයි කියනු ලැබේ.

ඒ ඒ තැන පැවති, එබඳු සූත්‍ර එක්තැන් කොට, (ඒ ඒ යතිවරුන් විසින් අසා දරාගෙන ආ එබඳු සූත්‍ර සංගායනාවේදී එක්තැන් කරන ලදුව) ඒ පරිදි සුදුසු තැනට යොදා එපමණම වූ වචනද ඒ අයුරින්ම සඳහන් කරමින්, (නිවන් මග පිලිවෙතට) වෙනස් වූ වෙනත් අදහස් නොමැතිව 'සුත්ත නිපාත' යයි හඳුන්වනු ලැබීය.

'උත්තමං වන්‍දනෙය්‍යානං වන්‍දිත්වා රතනත්තයං
යො ඛුද්දක නිකායම්හි ඛුද්දාචාරප්පහායිනා

දෙසිතො ලොකනාථෙන ලොකනිස්සරණෙසිනො
තස්ස සුත්තනිපාතස්ස කරිස්සාමත්ථවණ්ණනං

ගාථා සතසමාකිණ්ණො ගෙය්‍යව්‍යාකරංකිතො
කස්මා සුත්ත නිපාතොති සංඛමෙස ගතොති චෙ

සුවුත්තතො සුවනතො අත්ථානං සුට්ඨු තාණතො
සවණ සූදනාචෙව යස්මා සුත්තං පවුච්චති

තථාරූපානි සුත්තානි නිපාතෙත්වා තතො තතො
සංගීතොච අයං තස්මා සංඛමෙවමුපාගතො

සබ්බානිචාපි සුත්තානි පමාණන්තෙන තාදිනො
වචනානි අයං තෙසං නිපාතොච යතො තතො

අඤ්ඤඤ්ඤසංඛානිමිත්තානං විසෙසානමභාවතො
සංඛං සුත්තනිපාතොති එතමෙව සමජ්ඣගා'

මෙසේ එක්තැන් කරන ලද මෙහි උරග, චූල, මහා, අට්ඨක, පාරායණ යයි වග්ග හෙවත් කොටස් පහකි. එහි උරග වග්ගයෙහි සූත්‍ර දොළහකි. චූලවග්ගයෙහි දහ හතරකි. මහා වග්ගයෙහි දොළහකි. අට්ඨක වග්ගයෙහි දහසයෙකි. පාරායණ වග්ගයෙහි දහසයකැයි මුළු සූත්‍ර හැත්තෑවකි. උරග සූත්‍රයෙහි පටන් උගත යුතු බණවර අටකි.

"සපුන්ගේ විස බෙහෙත්වලින් නසන්නා සේ, පැවිදි වූ යම් තැනැත්තෙක් හටගත් තරහ දුරු කරත් ද, දිරාගිය, පරණ හැවය ඉවතලන උරගයකු මෙන් (සසර සයුරෙන්) එතර යයි."

යො උප්පතිතං විනෙති කොධං
විසටං සප්පවිසංච ඔසධෙහි
සො භික්ඛු ජහාති ඔරපාරං
උරගො ජිණ්ණමිව තචං පුරාණං' මේ ආදී ගාථා ඇතුලත් සූත්‍රවල අරුත් විස්තර මෙතැන් සිට මෙසේ පැහැදිලි කරනු ලැබේ.

# 1-1

මෙම ගාථා, යම් කෙනෙකු විසින්, යම් තැනකදී, යම් හේතුවක් නිසා කියන ලද ද, ඒ ආකාරයෙන් කරුණු සඳහන් කොට අරුත් පිළිබඳව විස්තර කරන්නෙමි.

කවරෙකු විසින් මෙම ගාථා කියන ලද්දේ ද? කොතැනදී කවදා, කුමක් නිසා කියන ලද ද? (ඊට අදාල කරුණු) මෙසේ කියනු ලැබේ.

ඒ (ගොතම) බුදුරජාණන් වහන්සේ, (බෝසත් කල) බුදුවරුන් විසිහතර නමකගෙන් (අනාගතයේදී) බුදුබව ලබන බවට විවරණ ලැබ, වෙස්සන්තර ජාතකයෙහි දැක්වෙන පරිදි, එතෙක් පාරමිතා පුරා තුසිත දෙව්ලොව ඉපදුණාහ. එයින් ද චුතව, සැකි රජ කුලයෙහි උපත ලැබ, අනුපිළිවෙළින් ගිහිගෙයින් නික්ම, බෝරුක් මුල්හි සම්බුදු බව අවබෝධ කොට, දම්සක් පවත්වා දෙව් මිනිසුනට හිතසුව පිණිස දහම් දෙසූ සේක. ඒ බුදුරදුන් විසින් ගුරුවරයෙකු නොමැතිව තම නුවණින්ම දැන පවසන ලදී. අලව් නුවර දී, (ගස්වැල් තණ ආදියට අදාල වූ) භූතගාම නම් වූ සික පදය පනවන විට එහි පැමිණ සිටි පිරිසට දහම් දෙසනු පිණිස පවසන ලදැයි කෙටියෙන් සඳහන් කළ හැකිය. විස්තර කරන විට (ඊට මුල් වූ) අතීත, ආසන්න හා ඉතා සමීප හේතු ලෙස තුන් ආකාරව දත යුතුය. එහි අතීත හේතුව නම්, දීපංකර බුදුරජාණන් වහන්සේගේ පටන් වත්මන් කතාව දක්වාය. ආසන්න හේතුව නම් තුසිත දෙව්ලොව සිට වත්මන් කතාව දක්වාය. බෝමැඩ සිට වත්මන් කතාව දැක්වෙන කොටස සමීප හේතුවයි.

මේ අයුරින් අතීත, ආසන්න හා සමීප හේතු සම්බන්ධය අතීත හේතු පිළිබඳ විස්තර අනුව දතයුතුය. එය ජාතක අටුවාවෙහි කියන ලද බැවින්, මෙහි විස්තර නොකරන ලදී. එබැවින් එම කරුණු එහි විස්තර අනුව දත යුතුය. එහෙත් මෙහි දී අමුතුවෙන් සඳහන් කළයුතු කරුණු ඇත. එහි මුල් ගාථාව සම්බන්ධ වන්නේ සැවැත් නුවර මුල් වූ කතාවට වුවත්, මෙහි දැක්වෙන්නේ අලව් නුවර මුල්කොටගෙනය. 'එසමයෙහි භගවත් සම්බුදුරජාණන් වහන්සේ අලව් නුවර අග්ගාලව චෛතිය නම්

තන්හි වැඩ වසති. එකල එහි වැඩ වසන හිමිවරු නව (පිළිසකර ආදී) කටයුතු කරද්දී ගස් කපති. (වෙනත් තැනැත්තන් ලවා) කප්පවති. ආලවක නුවර වැසි එක්තරා හිමිනමක් ගසක් කපයි. ඒ ගසෙහි වසන දේවතාවා, 'හිමියනි, තමන්ට නිවසක් සාදනු කැමතිව, මගේ නිවස නොකඩනු මැනව'යි (අයැදීය) ඒ හිමි එය නොඅසා ගස කැපුවේය. ඒ දේවතාවාගේ දරුවාට ද අතින් පහර දුනි. 'මෙතැනදීම ඒ හිමිගේ ජීවිතය තොර කරන්නෙමි'යි ඒ දේවතාවාට සිතුණි. (නැවත) 'ඒ හිමිගේ ජීවිතය මෙහිදීම මම තොර කරන්නෙම් නම්, එය මට සුදුසු නොවේ. භාග්‍යවතුන් වහන්සේට මෙම කරුණ දන්වන්නෙම් නම් මැනවැ'යි දේවතාවාට සිතුණි. දේවතාවා භාග්‍යවතුන් වහන්සේට එය සැළ කළේය. 'දේවතාවෙනි, ඔබ ඒ හිමිගේ ජීවිතය තොර නොකිරීම ඉතා යහපත්ය. එසේ තොර කරන ලද නම්, ඔබ බොහෝ පව් රැස් කරගන්නෙහිය. දේවතාවනි, අසවල් තැන හිරිහැරයෙන් තොරව විසිය හැකි ගසක් ඇත. එතැනට යව'යි වදාළහ. එසේ පැවසූ භාග්‍යවතුන් වහන්සේ, දේවතාවාගේ තරහ දුරුකරනු පිණිස 'යම් කෙනෙකු තරහ සිතුවිලි ඇතිකර ගන්නේ නම්, එය පාලනය නොකරන ලද රියක් මෙන්'යැයි අදහස් ඇති මේ ගාථාව දේශනා කළහ. 'කෙසේ නම් සැකි කුල පැවිදි හිමිවරුන් ගස් කපන්නාහුද, කප්පවන්නාහු වෙත්ද? එක් ඉන්‍ද්‍රියක් ඇති ජීවයකට පීඩා කරතියි, මිනිසුන්ගේ දොස් කීම අසා, භාග්‍යවතුන් වහන්සේට හිමිවරුන් විසින් සැළකළවිටදී 'පැළෑටි සිඳහෙලීම පාචිත්තියකැයි මෙම සිකපද පනවා එහි රැස්වූ පිරිසට දහම් දෙසන සේක්, යම් තැනැත්තකු, තරහ හටගත් විට, එය බෙහෙතින් සපුන්ගේ විස හරින්නා සේ දුරු කරන්නේ යැයි මෙම ගාථාව වදාළහ.

මෙසේ එකම කතාව විනයෙහි, ධම්මපදයෙහි සහ සුත්ත නිපාතයෙහි යන තුන් තැනක ඇත. මෙපමණකින් ඒ මාතිකාව දක්වන ලදී. එය කෙටියෙන්ද සවිස්තරවද පදගත විවරණ හැර සඳහන් කරන ලදී

මෙතැන් සිට පදගත විවරණ කරනු ලැබේ. යො යනු ක්ෂත්කුලයෙන් හෝ බමුණු කුලයෙන් හෝ පැවිදි වූවෙකු හෝ - නවක හෝ මැද වියෙහි වූ තෙර කෙනෙකු (අදහස් වේ) **උප්පතිතං** - උස්ව නැගී පවත්නා සොබාවය, හටගන්නා ලදැයි කියන ලදී. හටගත් (තරහ තවදුරටත්) පවතිමින්, ඉදිරියට වැඩිදියුණු වන පරිදි රඳවා ගැනීමට ඉඩ ලැබෙන අයුරුැයි. එසේ සියළු ආකාරයෙන්ම සකස්වීම - පැවතීමට කරුණු වේ. යම් දෙයක් උදෙසා '**උප්පන්නා ධම්මා** - **අනුප්පන්නා ධම්මා, උප්පාදිනො**

**ධම්මා** යැයි කියන ලද්දේද, එය අරමුණු කොට ගත්තද (රඳවා) පවත්වා ගනිමින් කුසල අකුසල ලෙසින් හටගැනීමට ඉඩදීමේ ගතිය 'උප්පන්න' නම් වේ. ඊට හේතුවන සියළුම කරුණු අනුව, තවත් අතුරු හේතු ඉදිරිපත් වීමට ඇති 'ඉඩකඩ' 'අනුප්පන්න' නම් වේ. තරහ නිසා බලාපොරොත්තු වන දේ හෙවත් අරමුණ අනුව (එය ඉටු නොවීමෙන්) එහි පල නොවින්දත්, එහි කුසල අකුසල සේ පැමිණීමක් නොලැබුණත්, (මුලදී තරහ ඇතිවීමට ඉවහල් වූ සිතිවිලිවලම බලපෑමක් බැවින්) 'උප්පන්නං' යනුවෙන් දක්වේ. '**එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති**' මෙවැනි පවිටු හැඟීමක් හටගත්තේ වෙයි. '**යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣංගස්ස භාවනාපාරිපූරිහොති**' යම් සේ මැනවින් සිහිය පිළිබඳ වූ අවබෝධයට - වැඩිදියුණු කරන ලද්දේ වේ... යන මේ ආකාරයෙන් සූත්‍රවල සඳහන් වූ ලෙසින් දතයුතුය. '**යානිස්ස තානි පුබ්බෙකතානි කම්මානි**' යැයි කියන ලද පරිදි කම්ම යන්න අතීතයට ගැනෙන වෙනත් විපාකයක් වළකා තමන් කරන ලද දෙයෙහි විපාක දීමට ඉඩ ලැබෙන බැවින්, එසේ සුදුසු විටක විපාක ලැබීම '**ඔකාසකත උප්පන්න**' නම් වේ. ඒ ඒ භූමි හෙවත්, ඉපිද ඇති ගතිවලදී ඉවත් නොවූ අයහපත් විපාක ලැබෙන තන්හී ලබන උපතයි. එහිදී එසේ (ඉපදුනු තැන්හි) වෙනස් බව පැහැදිලි විය යුතුය. ඒ කෙසේද යත්? භූමිය නම් විදසුන් අරමුණ වූ 'තෛ්‍රභූමක' හෙවත් කාමාවචර, රූපාවචර, අරූපාවචර තත්වයෙහි පැවත්මයි. 'භූමිලද්ධ' යනු ඒවායෙහි උපත ලබනට සුදුසු කෙලෙස් හටගැන්මයි. එයද අරමුණු ලෙස නොවේ. අරමුණු ලෙසින් නම්, අතීතය හා බැඳුණු ලෙසින් රහතන් වහන්සේලාගේ සිරුර අරබයා කෙලෙස් උපදී. මහාකච්චාන, තෙරුන්ගේත්, උප්පලවණ්ණා තෙරණියගේත් සිරුර කෙරෙහි සොරෙය්‍ය සිටුපුත් හා නන්ද තරුණයා (ඇළුම් කළ අයුරු මෙනි.) එසේ ඇළුම් කිරීමේ පවත්නා තත්වය අනුව, කිසියම් ආකාරයකින් ඒ හටගැනීමේ මූලික අවස්ථාවේම අත්නොහළේ නම්, එය 'වත්ථු' හෙවත් ඊට පදනම සේ දතයුතුය. විදසුන් වැඩීමෙහි මනාව නොදන්නා බැවින් (රූපාදී) ඛන්ධ සමූහය හටගනී. ඒ ඒ අයුරින් (ඒවා කෙරෙහි සිත බැඳීමේදී) සසර ගමනෙහිලා කෙලෙස් අත් නොහැර පවතී. එසේ ඉවත් නොවූ අරුතින් (ඒවා) හටගැනීමට ඉඩ ලද්දේ යැයි දතයුතුය. යම්හෙයකින් රූපාදි සමූහය කෙරෙහි නොනැසුනු කෙලෙස් වේද, එය (තවදුරටත්) පැවතීමට පදනම වේ. අතීත (හැඟීම්) ලෙසින් රූපාදී සමූහයෙක නොනැසුනු කෙලෙස් අතීත රූපාදියෙහිම පදනම වේ. අන් දෙයක් නොවේ. අනාගත රූපාදී සමූහයටද මේ ආකාරය.

එසේ කාමාවචර රූපාදී සමූහයට අයත් නොනැසුනු කෙලෙස් කාමාවචර රූපාදී සමූහයටම පදනම වේ. රූපාවචර, අරූපාවචර ආදියෙහිද මෙබඳුය. සෝවාන් ආදී මගපල පත් වූ උතුම් තැනැත්තන් සසර ගමනට මුල්වන රූපාදී සමූහය (ඛන්ධ) කෙරෙහි හටගත්තා වූ කෙලෙස්, ඒ ඒ මගපල ලබමින් දුරු කෙරෙන බැවින් (ඒ ඒ මගපල අනුව 'සංයෝජන' දුරු කෙරෙන බැවින් ඉහත දැක්වූ පරිදි) භූමි ලෙස මෙහිදී නොසැළකේ. මගපල නොලත් පුද්ගලයන් සසර ගමනට මුල්වන සියළු කෙලෙස් නොනසන ලද බැවින්, කරනු ලබන යහපත් හෝ අයහපත් දේට අනුරූප වූ පරිදි කෙලෙස් ඇතිවීම හේතුකොට සසර දිගු වේ. ඒ පුහුදුන් පුද්ගලයාගේ සසර ගමනට මුල් වූ රූපක්ඛන්ධයමය. වේදනාදී ඛන්ධවල..... විඤ්ඤාණක්ඛන්ධයෙහි නොවේ. රූපක්ඛන්ධාදියෙහි නොවේම යැයි නොකිව යුතුය. කවර හෙයින්ද? සාමාන්‍යයෙන් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ සමූහයෙහිම පවතින බැවිනි. පොළවෙහි සාරය ගසෙහි තිබෙන්නාක් මෙනි. පොළෝ තලයෙහි පිහිටි මහ ගසක පොළවෙහි සාරය හා තෙතමනය හේතුකොට මුල, කඳ, අතු, කුඩා අතු, කොළ, දළු, මල්පල හටගැනී, උසට වැඩී කල්පය අවසානය තෙක් බීජ පරම්පරාවෙන් ගසේ පැවැත්ම නොනැසේ. එසේ වූ විට, පොළවෙහි රසය කඳෙහි නොව මුලෙහිය. මුල්වල නොව ගෙඩියෙහි යැයි නොකිව යුතුය. කුමක් නිසාද? පොදුවේ ගත්කල (ගසෙහි) සියළුම දේ මුල් ආදියට අනුව යන බැවිනි. මෙසේ එම ගසෙහිම මල් ගෙඩිවලට කලකිරුණු කිසියම් මිනිසෙක් සතර වටටම 'මණ්ඩූක කණ්ටක' නම් වූ ගසෙහි විස යොදන්නේ නම්, (මුල්) ගස එම විස පහසින්, පොළවෙහි රසය, තෙතමනය නොලැබීමෙන් (තවදුරටත්) පවත්නා සොබාවට නොපැමිණ, ඉදිරි පැවැත්ම ගෙන යා නොහැකි වේ. එසේම (රූපාදි) සමූහ පැවැත්මෙහි කලකිරුණු තැනැත්තෙක්, සතරවටින් ගසට විස යෙදූ මිනිසා මෙන් තම සිත සිවු ආකාර වූ භාවනා මගට යොමු කරයි. ඉක්බිති ඔහු ඒ රූපාදි සමූහයෙහි සිවුමග භාවනා (නමැති) විස පහසින් සියළුම සසර ගමනට මුල්වන කෙලෙස් හාත්පසින් මඩනා ලද බැවින්, තමා විසින් කරනු ලබන, සසරෙහි පැවතීමට හේතුවන, සියළු කටයුතු නැතිකළ හෙයින් නැවත නූපදීමේ සොබාවට පත්ව, භවරසය (තවදුරටත්) හටගැන්වීමට සමත් නොවේ. හුදෙක්ම විඤ්ඤාණ (පැවැත්ම) ඊළඟ භවයට වැළක්වීමෙන් ගින්න නිවුණ සේ (ගිනි දැල්වීමට අවැසි දර ආදී ඉන්ධන නොලද විට) රූපාදී පස්කඳෙහි රැඳීම් රහිතව පිරිනිවනට පත්වෙයි. මෙසේ 'භූමියෙහි ද භූමි ලද තැනැත්තාගේ ද වෙනස දත යුතුය. තවද, වෙනත් ලෙස දක්වතොත්,

නිතර පවත්නා ලෙසට අයත් කරගත් අරමුණු යටපත් කොට (ඒවා) උදුරා දැමීම සතරාකාරය. එහිලා දැනට හටගෙන පවත්නා ඇස ආදී ලෙසින් කියනු ලබන ඉඳුරන්ට මුලදී අරමුණු හමු නොවූවත්, පසුව කෙලෙස් හැඟුම් මුල්කොටගෙන අරමුණු අයත් කරගත් බැවින් '**උප්පත්තිතො ආරම්මණ උප්පන්නං**' යැයි කියනු ලැබේ. කැළණි ගමෙහි පිඬු පිණිස හැසිරුණු මහාතිස්ස තෙරුන්ට නුසුදුසු රූපයක් දැකීමෙන් කෙලෙස් හටගැනීම මෙහිලා නිදසුන්ය. එහිදී කාම සිතිවිලි ආදිය ඇතිවන අයුරු දතයුතුය. සමථ මගින් හෝ විදසුන් මගින් හෝ වෙන් වෙන්ව නොමඬනා ලද කෙලෙස් සිතෙහි (වැඩිදුරටත්) නොපැවතුනද ඇතිවන විටම වලකාලීමෙන් නැතිකිරීම - කෙලෙස් ඇතිවීමට ඉඩ ලබා නොදීම' '**අවික්ඛම්භිත උප්පන්න**' නම් වේ. එය 'අයම්පි ඛො භික්ඛවෙ, ආනාපානසති සමාධිභාවතො, බහුලීකතො, සන්තො චෙව පණීතොච අසෙචනකොච සුඛොච විහාරො උප්පන්නුප්පන්නෙ ච පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධායති' යනුවෙන් 'මහණෙනි, හුස්ම ගැනීම හා පිටකිරීම සිහියෙන් යුතුව පුරුදුකොට, නිරතුරුවම සිත එකඟ කිරීමෙන්, සිත සංසුන් බවට - උසස් බවට පත්වේ. (කාමාදී) සිතිවිලිවලින් බැහැරව සුවසේ සිටිමින්, හටගන්නා වූ අයහපත් අකුසල හැඟීම් එකෙණෙහිම නැතිවී යයි. (මේ බුදුවදන අනුව) දතයුතුය. සමථ-විදසුන් ලෙසින් කෙලෙස් මඬනා ලද නමුත්, (සෝවාන් ආදී) උතුම් මගපිළිවෙතින් උදුරා නොහළ බැවින් කෙලෙස් හටගන්නා සොබාවය එසේම පවතී යැයි 'අසමූහතා උප්පන්නං' යැයි කියනු ලැබේ. අහසෙන් යන, සමාපත්ති අටක් ලද තෙර නමකට මල් උයනක මල් නෙලන කාන්තාවක මිහිරි හඬින් ගී ගයනු අසා කෙලෙස් හටගත් අයුරු ද මෙහිලා නිදසුන්ය. 'අරියං අට්ඨංගිකං මග්ගං -පෙ- බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අන්තරායෙව අන්තරාධාපෙති' - අරි අටඟිමග බොහෝසෙයින් වැඩීමෙන්, පාපී අයහපත් හැඟුම් ඒ අතරතුරම 'අතුරුදහන්' වේ යැයි කියා ඇති පරිදි දතයුතුය. මෙසේ අරමුණු දැඩිව ගැනීමත්, යටපත් කිරීමත්, මුළුමනින් යටපත් නොකරන ලදින් හටගැනීමත්, යටපත් කිරීමත්, මුළුමනින් යටපත් නොකරන ලදින් හටගැන්මත් යන තුන් ආකාරයම 'භූමිලද්ධ' යන්නෙහි ඇතුලත් වන බව දතයුතුය. එසේම ඉහත දක්වන ලද තුන් ආකාරයට තරහ-කෝපය හටගනී. කවර හෙයින්ද යත්? මෙසේ මෙහිදීම දුරු කළයුතු බැවිනි. මෙසේ, ඇතිවූ (කෝපය) කිසියම් අයුරකින් නැතිකිරීමට හැකිවෙයි. හටගත් කෝපය තවදුරටත් පැවතීමේදී එය ඉවත් කිරීමට උත්සාහ

ගැනීමෙන්ම එය සංසිඳවීමට හැකිය. එසේම, ඒ පවත්නා අයුරු කෙලෙස් සහිත යැයි (දැන) එය දුරුකිරීමේ එකම අදහස ද ඇතිවෙයි. **විනෙති** යනුඃ

**'දුවිධො විනයො නාම එකමෙකෙත්ථ පඤ්චධා**
**තෙසු අට්ඨවිධෙනෙස විනෙතීති පවුච්චති'**

විනය දෙආකාරය, එකින් එක සළකනවිට පස්වැදෑරුම්ය. ඒ අතුරෙන් අට ආකාරයෙන් දුරු කරන්නේ යැයි කියනු ලැබේ.

මෙහිදී හික්මීම (සංවරය) සහ දුරුකිරීම යැයි විනය දෙවැදෑරුම්ය. සංවර විනයද, සීල, සති, ඤාණ, ඛන්ති, විරිය යැයි (ඉහත කී) පස් ආකාරයි. දුරුකරන ආකාරය හෙවත් පහාණ විනයද තදංග, වික්ඛම්භන, සමුච්ඡෙද, පටිප්පස්සද්ධි, නිස්සරණ යැයි පස්වැදෑරුම් වේ. 'මේ අයුරින් පාමොක් සංවරයට පැමිණේද, මැනවින් එහි පිහිටියේද හික්මීමෙන් ලද සංවරය ගැන (දක්වේ.) 'ඇස නමැති ඉන්ද්‍රිය සංවර කරගැනීම සිහියෙන් යුතු හික්මීමයි.

**'යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)**
**සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිථීයරෙ'**

"අජිත බමුණාට, භාග්‍යවතුන් වහන්සේ විසින්, කනට බැඳෙන හඬ අරමුණු කොට (අයහපත් දෙයකට නම්) සිහිනුවණ පෙරදැරිව කන ආවරණය කරගැනීම සුදුසු යැයි වදාළ පරිදි නුවණින් ලබන හික්මීමය. සීතල, උණුසුම විඳ දරාගැනීමේ හැකියාව ඉවසීමේ සංවරයයි. හටගත් රාගික සිතිවිලි සිතට නොගෙන ඉවත් කෙරේද, දුරු කෙරේද එය උත්සාහයේ සංවරයයි. මේ සියළු සංවරතා තම තමාට සරිලන පරිදි, කය වචනය දුසිරිතෙහි යෙදීම වැළකීම ලෙස දතයුතුය. මෙසේ ඒ සංවර විනය පස් ආකාරයකට බෙදා ඇතැයිද දතයුතුය. එසේම, යම් අයුරින් නාම, රූප ආදී කොටස් විදසුන් මගට යොමුවන තාක් තමා කෙරෙහි නොපිරිහෙන ලෙස පවතීද, එකෙණෙහිම ඒ ඒ නුවණින් ඒ ඒ සිත කිලිටි වන කරුණු ඉවත් කෙරේ. ඒ කෙසේද යත්, මමය, මාගේ ය යන හැඟීම්-නාමරූප ලෙස වෙන්කර දැකීමෙන්, ඇතිවන වැරදි හැඟීම් හා (ඊට මුල්වන) හේතු සළකා බැලීමෙන්, එහිම ඊට පසුව ඇතිවන සැකය දුරු කිරීමෙන්, මම-මගේය යන හැඟීම සිරුරේ ඒ ඒ කොටස් අනුව විමසා බැලීමෙන්, වැරදි මග නිවැරදි කොටගෙන (අරිය මග අනුව) පවත්වා

ගැනීමෙන් වැනසෙන්නේය යන වැරදි හැඟීම (උච්ඡෙද) හටගන්නා අයුරු, ඇතිවන අයුරු විමසා බැලීමෙන්, සදාකල්හිම පවතී යන හැඟීම, (සස්සත) හැමදෙයකම වෙනස්වන ගතිය (අනිච්ච) දැකීමෙන්, බයට පත්වූවන් අතර (සසරෙහි) බිය ඇතිකර ගැනීමෙන්, (සැපයෙහි) ආස්වාදය තුලින් එහි (දුක් ආදී) ආදීනව දැකීමෙන්, (සැපයෙකැයි) ඇලී සිටීමෙහි කළකිරීමෙන්, අත්හැරීමට අකැමති දේ අත්හළ යුතු යැයි නුවණින් සිත මෙහෙයවීමෙන්, මැදහත්ව නුවණ මෙහෙයවීමෙන්, මුල සිටම නිවනට යොමු වූ කරුණුවල පිහිටීමෙන්, කුසල අකුසල රැස්කිරීමේදී සෝවාන් ආදී මගට පැමිණෙන නුවණින්, මෙසේ කෙලෙස් යටපත් කිරීම 'තදංගප්පහාණ' නම් වේ.

උපචාර-අප්පණ සමාධි අනුව, යම්තාක් තම සිතෙහි එකඟ බවෙහි පිරිහීමක් නොපවතීද, ඒතාක් විතක්ක ආදී නිවනට සතුරුවන කරුණු තමා කෙරෙහි හට නොගන්නා ලෙසට නැතිකිරීම 'වික්ඛම්භනප්පහාණ' නම් වේ. සතරාකාර අරියමග වඩනා ලද බැවින්, තම සිතේ පැවති කෙලෙස් හැඟීම් නැතිකරන අදහසින්, ඒ කෙලෙස් ඇතිවීමට හේතු දැන, ඒ ඒ මගපල ලබමින් නැවත හට නොගන්නා පරිදි නැතිකිරීම 'සමුච්ඡෙදප්පහාණ' යයි. මගපල ලැබීමෙහිදී මුළුමනින්ම කෙලෙස් සංසිඳීම 'පටිප්පස්සද්ධි පහාණ'යයි. හැම අයුරින්ම (හේතුපල සබඳතාවෙන්) සකස්වන දේ - එකතුවන දේ මුළුමනින්ම නැතිකිරීම 'නිස්සරණ පහාණ' නම් වේ. මෙම සියළුම කෙලෙස් දුරු කරන්නේ (නැවත හටගැනීමට ඇති ඉඩකඩ) අත්හැර දැමීම යන අදහසිනි. හික්මීම යන අදහස විනය යන්නෙන් හැඟේ. එහෙයින් විනය (යන වචනය යෙදෙන අයුරින්) 'පහාණ විනය' යයි ද කියනු ලැබේ. 'පහාණ විනය'ද පස් ආකාරයකට බෙදේ යැයි දතයුතුය. එයද හික්මීම හා බැහැර කිරීම යයි දෙගුණව දස ආකාර වේ. ඒ අතුරින් පටිප්පස්සද්ධි, නිස්සරණ විනය හැර, ඉතිරි අටආකාර වූ විනයට (අදාලව ගැනෙන) කරුණු ඒ ඒ ආකාරයට දුරු කෙරේ යැයි කියනු ලබයි. ඒ කෙසේද යත්, සීල සංවරයෙන් කය, වචනයෙහි දුසිරිත දුරුකිරීමෙහි දී ඒ හා බැඳුනු තරහ ද නැතිවේ. සිහි නුවණින් කටයුතු කිරීමෙන් ලබන සංවරයෙන් දැඩි ලෝභය හා දොම්නස දුරු කෙරෙමින්, දොම්නස හා බැඳුනු තරහද දුරු කෙරේ. ඉවසීමේ සංවරයෙන් සීතල ආදිය නිසා ඇතිවන තරහ දුරුවේ. උත්සාහ සංවරයෙන් (නපුරු අදහස් අනුව කටයුතු නොකිරීමෙන්) ඊට මුල්වන තරහ නැතිවේ. මේ කරුණු අනුව තදංග, වික්ඛම්භන, සමුච්ඡෙද පහාණ පරිදි, එසේ තමා කෙරෙහි වූ

ඒ අයහපත් තරහ දුරු කරයි. පහාණ විනය යටතේ මෙහි කාමයෙහි (කැමැත්ත) දුරුකිරීම ගැන සඳහන් නොවූවත්, එයද සංවරයෙහි ඇතුලත් වේ. ඉහත කී පරිදි පටිප්පස්සද්ධ විනය හා නිස්සරණ විනය හැර, ඉතිරි අටවැදෑරුම් වූ හික්මීම පිළිබඳව ඒ ඒ ආකාරයෙන් සංවර වේයැයි කියා ඇත.

'පඤ්චිමෙ භික්ඛවෙ ආඝාත පටිවිනයා, යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බො කතමෙ පඤ්ච? යස්මිං භික්ඛවෙ පුග්ගලෙ ආඝාතො ජායෙථ, මෙත්තා තස්මිං පුග්ගලෙ භාවෙතබ්බා, කරුණා -පෙ-මුදිතා-උපෙක්ඛා-අසති අමනසිකාරො තස්මිං පුග්ගලෙ ආපජ්ජිතබ්බො, එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො, කම්මස්සකතා එව වා තස්මිං පුග්ගලෙ අධිට්ඨාතබ්බා, 'කම්මස්සකො අයමායස්මා -පෙ- දායාදො භවිස්සතී'ති. එවං පඤ්ච ආඝාතපටිවිනයා වුත්තා.. යෙ වා 'පඤ්චිමෙ ආවුසො ආඝාතපටිවිනයා, යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බො, කතමෙ පඤ්ච ඉධාවුසො එකච්චො පුග්ගලො අපරිසුද්ධ කායසමාචාරො හොති, අපරිසුද්ධවචී සමාචාරො හොති, එවරූපෙපි ආවුසො පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බොති - 'මහණෙනි, පැවිද්දකු යම්විටක තදබල නපුරු තරහ ඇතිවූ විට පස් ආකාරයකින් මුළුමනින්ම ඒ තරහ දුරුකළ යුතුයි. ඒ කරුණු පහ කවරේද? මහණෙනි, යම් පුද්ගලයෙකු කෙරෙහි තදබල තරහ හටගත්තේද ඔහුට මෙත් වැඩිය යුතුය. (ඔහු) එසේ නොවූවත්, නොසිතුවත් කරුණාව-මුදිතා-මැදිහත් බව ඇතිකරගත යුතුය. කරන දෙයෙහි (කම්ම) පලය ඔහුට උරුම වන්නේ යැයි ඒ පුද්ගලයා කෙරෙහි සැළකිය යුතුය. මෙසේ පස් ආකාරයට තරහ දුරුකරන සැටි දේශනා කරන ලදි. එමෙන්ම, 'පඤ්චිමෙ ආවුසො ආඝාත පටිවිනයා, යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බො, කතමෙ පඤ්ච? ඉධාවුසො එකච්චො පුග්ගලො අපරිසුද්ධ කායසමාචාරො හොති, අපරිසුද්ධ වචී සමාචාරො හොති, එවරූපෙපි ආවුසො පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො'............... මහණෙනි, ඇතැම් පුද්ගලයෙක් අපිරිසිදු ලෙස, අයහපත් ලෙස කය හසුරුවයිද, අයහපත් ලෙස වචන හසුරුවයිද එබඳු පුද්ගලයා කෙරෙහිද තරහ දුරුකළ යුතුය. මෙසේ කිනම් ආකාරයෙන් හෝ තරහ දුරුකිරීම විනෙති යැයි කියනු ලැබේ. 'උභතොදණ්ඩකෙන චෙපි භික්ඛවෙ කකචෙන චොරා ඔචරකා අංගමංගානි ඔකන්තෙය්‍යුං, තත්‍රාපි යො මනො පදොසෙය්‍ය, න මෙ සො තෙන සාසනකරො', තව ද, 'මහණෙනි, දෙපසට අඳිනු ලබන

කියතකින් පහත් ගති ඇති සොරු අඟපසඟ කපන්නාහු නම්, එවිට ඔවුන් කෙරෙහි සිත කිලිටි කර ගන්නේ නම්, (නපුරු තරහ සිතක් ඇති කරගන්නේ නම්) එබඳු තැනැත්තා මගේ අවවාදය පිළිපදින්නෙක් නොවේ.' බුදුරජාණන් වහන්සේගේ අවවාදය මෙයයි.

'තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති
කුද්ධං අපපටිකුජ්ඣනෙතා සංගාමං ජෙති දුජ්ජයං

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මති'

'යම් තැනැත්තෙක්, කිපෙනසුළු පුද්ගලයෙකුට පෙරළා කෝප කෙරෙත්ද, එයින්ම ඔහුද පාපියෙකි වෙයි. කෝප වූ තැනැත්තාට නොකිපේද එය යුද්ධයක් ජයගැනීම මෙන් ඉතා අපහසුය.'

'අනිත් තැනැත්තා තදින් කෝප වී යැයි දැන, යම් කෙනෙක් සිහියෙන් යුතුව සන්සුන්ව සිටිත්ද, ඔහු තමාටත්, අනුන්ටත් යන දෙදෙනාටම දියුණුවට කටයුතු කරන්නෙකි.'

'සත්තිමෙ භික්ඛවෙ ධම්මා සපත්තකන්තා සපත්තකරණා කොධනං ආගච්ඡන්ති. ඉත්ථිං වා පුරිසං වා, කතමෙ සත්ත? ඉධ භික්ඛවෙ සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති. අහොවතායං දුබ්බණ්ණො අස්සාති තං කිස්ස හෙතු? න භික්ඛවෙ සපත්තො සපත්තස්ස වණ්ණවතාය නන්දති, කොධනායං භික්ඛවෙ පුරිස පුග්ගලො කොධාභිභූතො, කිඤ්චාපි සො හොති සුනහාතො සුවිලිත්තො කප්පිත කෙසමස්සු ඔදාතවත්ථවසනො, අථ ඛො සො දුබ්බණ්ණොව හොති කොධාභිභූතො, අයං භික්ඛවෙ පඨමො ධම්මො සපත්තකන්තො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා. පුනච පරං භික්ඛවෙ සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං දුක්ඛං සයෙය්‍යාති -පෙ- න පචුරත්ථො අස්සාති - න භොගවා අස්සාති - න යසවා අස්සාති - න මිත්තවා අස්සාති - කායස්ස - භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යාති, තං කිස්ස හෙතු? න භික්ඛවෙ සපත්තො සපත්තස්ස සුගතිගමනෙන නන්දති. කොධනායං භික්ඛවෙ පුරිසපුග්ගලො කොධාභිභූතො කොධපරෙතො කායෙන දුච්චරිතං චරති වාචාය -පෙ-

මනසා දුච්චරිතං චරති, සො කායෙන දුච්චරිතං චරිත්වා -පෙ- වාචාය - මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා -පෙ- නිරයං උපපජ්ජති. කොධාභිභූතො' - 'මහණෙනි, ගැහැණියකට හෝ මිනිසකුට හෝ තරහ ඇතිවන කරුණු හතකි. ඒ කරුණු හත මොනවාද? මහණෙනි, සතුරා (අනික්) සතුරා ගැන 'මොහුගේ, සිරුර පැහැපත් නොවන්නේ නම් මැනවැයි සිතයි. මහණෙනි, සතුරා අනිකාගේ පැහැපත් බවට සතුටු නොවේ. කෝපයෙන් මඩනා ලද තැනැත්තෙක් මනාව දිය නා, සුවඳ ගල්වා, හිසකෙස් රවුල් කපා සුදුවතින් සැරසුනද පැහැපත් නොවේමය. මහණෙනි, මෙය තරහින් පෙළුණු ගැහැණියකගේ හෝ මිනිසකුගේ හෝ පළමු කරුණයි. 'මේ සතුරා දුකටම පත්වේවා! බොහෝ සම්පත් නොලැබේවා! යසසට පත් නොවේවා! මිතුරන් නොසිටීවා! කය බිඳී මරණින් පසු සැප නොමැති තන්හි හෝ නිරයෙහි ඉපිදේවා! යැයි තරහ ඇති තැනැත්තා මෙසේ සිතයි. ඊට හේතු කුමක්ද? සතුරා අනෙක් සතුරාගේ ජීවිතය යහපත් වනු දැකීම නොකැමති වීමයි. මහණෙනි, තරහින් මැඩුණු පුද්ගලයා කයින් දුසිරිතෙහි හැසිර, වචනයෙන් දුසිරිතෙහි හැසිර, සිතින් දුසිරිතෙහි හැසිර තරහෙන්ම මියගොස් නිරයෙහි උපදී.'

කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති -පෙ-
යෙන කොධෙන කුද්ධාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං කොධං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො

කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය,

අනත්ථජනනො කොධො කොධො චිත්තප්පකොපනො
එකාපරාධං ඛම භූරිපඤ්ඤ! පණ්ඩිතා කොධබලා භවන්ති'

කෝප වූ තැනැත්තා යහපත නොදනී. (කෝපය නිසා ඔහුට සිදුවන දේ නොදනී.) නිවැරදිව කරුණු නොදකී. කෝපයෙන් සිටින තැනැත්තෝ දුගතියට යති. කෝපයෙහි වැරදි නුවණින් නිවැරදිව දකින්නෝ කෝපය දුරු කරති.

කෝපය අත්හැර-දුරුකොට (එයින් ඇතිවන) මානයද දුරු කරන්නේය.

කෝපය අවැඩදායී ලෙස අයහපත උදා කරයි. තදබල ලෙස සිත තව තවත් කෝපයට පත් කරයි. මහා නුවණැත්තාණනි, එක් වරදකට කමා කරනු මැනවි. නුවණැත්තෝ කෝපයෙන් බලවත් නොවෙති.

මේ ආකාරයෙන් කෝපයෙහි පල විපාකද නුවණින් මෙනෙහි කිරීමෙන් ද කෝපය දුරුකිරීමට කටයුතු කරයි. එහෙයින් මෙසේ නුවණින් විමසා බලා දුරු කෙරේද '**විනෙති**' යැයි කියනු ලැබේ. '**කොධ**' යනු 'මට අයහපත කළේ යැයි තදබල තරහක් හටගනී.' ආදි ලෙසින් සූත්‍රයෙහි කියන ලද පරිදි නව ආකාර වේ. 'මට යහපතක් නොකළේ යැයි ඊට නැවත විරුද්ධ වීමෙන් නව ආකාර ලෙස දහඅට වැදෑරුම් වේ. කැටකැබලිති ආදියද (කෝපය බලවත් වීම නිසා අඩදබර වීමේදී) යොදාගැනීමත් සමග දහනව ආකාරයට ඇතිවන කෝපය (මුලදී) හටගැනීමට එම හේතු අතරින් එක් හේතුවක් මුල්විය හැකිය. '**විසට**' පැතිරුණු යන්නයි. '**සප්ප විසං**' සපුන්ගේ විසය. '**ඉව**' උපමාව දැක්වීමට යෙදූ වචනයයි. 'ඉ' අකුර ලොප්කොට 'ව' යනුවෙන් කියන ලදී. '**ඔසධෙහි**' බෙහෙතින් යන අදහසයි. එය මෙසේ දක්වන ලදී. විස වෙදෙකු සපෙකු ඩසින ලද තැනැත්තකුගේ සිරුර පුරාම පැවති විස, මුල්-කඳ-පොතු-කොළ-මල්-ගෙඩි ආදී නොයෙක් දේ යොදා සකස් කරන ලද බෙහෙතින් ඉක්මණින්ම ඉවත් කරන්නා සේ, යම් තැනැත්තෙක් ඉහත කියන ලද පරිදි සිත් සතන්හි වසා පැතිර පැවති කෝපය සඳහන් වූ කිසියම් ආකාරයකින් දුරු කරයි. (කෝපය) නො ඉවසයි, අත්හරියි, ඉවතලයි, විනාස කරයි. **සො භික්ඛු ජහාති ඔරපාරං** මෙසේ කෝපය දුරුකිරීමෙහි උත්සාහවත්වන පැවිද්දා අනාගාමී මගින් මුළුමනින්ම තරහ ඉවත් කරයි. එහෙයින් සසරින් එතරවීමට අවැසි 'ඔරම්භාගිය සංයොජන පහ අත්හරින්නේ යැයි දතයුතුය. පොදුවේ ගත්කල **පාරං** යනු තීරයට නමකි. එහෙයින් සසර සයුරෙහි මෙතෙර සිට එතෙරට ගියේ යැයි සළකා **ඔරපාරං** යැයි කියනු ලබයි. නැතහොත් යම් පැවිද්දෙක්, හටගත් කෝපය, බෙහෙත් බලයෙන් සප් විස ඉවත් කරන්නා සේ අනාගාමී පලයට පත්ව මෙතෙර අත්හරීද, එහි **ඔර** යැයි කියනු ලබන්නේ තමා (දැන් ලබා ඇති) ජීවිතයයි. **පාර** යනු අනුන්ගේ ජීවිතයයි. **ඔරං** යනු තම සිරුරෙහි ඇස් ආදී ආයතන හයයි. **පාරං** බාහිර ආයතන හයයි. එසේම **ඔරං** යනු මිනිස් ලොවයි. **පාරං** දෙව්ලොවයි. **ඔරං** කාම ලෝකයයි. **පාරං** රූප අරූප ලෝකයයි. **ඔරං** කාමරූප භවයයි. **පාරං** අරූප භවයයි. ඔරං (දැනට ලබා

ඇති) උපතයි. පාරං එය පවත්වා ගැනීමට අවැසි දේය. අරහත් මගින් සසරෙහි ඡන්‍දරාගය ඉවත් කිරීම ජහාති ඔරපාරං යැයි කියනු ලැබේ. එහිදී අනාගාමීව කාමරාගය මුළුමනින්ම නසන ලද බැවින් ජීවත්වන තෙක්ම ඡන්‍දරාගය නැත්තේය. එනමුදු අනාගාමී මඟ මෙන්, එහි අගය-ගුණය සඳහන් කරනු වස් මුළුමනින්ම ඔරපාර කොටසට ඇතුලත් කොට එහි ඡන්‍දරාගය උදුරාදැමීම ජහාති ඔරපාරං යැයි කියන ලදී. මීළඟට එහි අරුත වඩාත් පැහැදිලි කිරීමට උපමාවක් දක්වයි. උරගො ජිණ්ණමිව තචං පුරාණං එහි බඩගා යන තේරුමෙන් උරග නම් වේ. සර්පයාට සමාන වචනයකි. එය කාමරූපී හා කාමරූපී නොවන යනුවෙන් දෙයාකාරය. දියෙහි හා ගොඩබිමෙහි වසන යනුවෙන්ද කාමරූපී දෙයාකාරය. ජලයෙහි උපන්නෝ එහිම, අදාල රූපීබව ලබති. ගොඩබිමෙහි උපන්නෝ අදාල රූපීබව ලබති. ගොඩබිමෙහි උපන්නෝ අදාල රූපීබව ලබන්නේ ගොඩබිමෙහිමය. දියෙහි නොවේ. එබඳු උරගයෙකු මහළුබවට පත්වීම ජිණ්ණං කල්ගතවීම නිසා පුරාණඤ්ච යැයි හැඳින්වේ. සජාතියං, නිසසාය, ජිගුචඡනෙතා, ඨාමෙන යැයි - තචං හැවය සතරාකාරයකට හැරදමයි. සජාති නම් දිග සපුන් ය. උරගයෝ අවස්ථා පහකදී තම හැඩය-ගතිය ඉක්මවා නොයති. උපතේදී මරණයේදී, සැකරහිත නින්දේදී, තම ජාතිය සමග මෙවුන්දම් සේවනයේදී හා දිරූ හැවය හැර දැමීමේදී ය. සර්පයා හැවය හැර දැමීමේදී තම ස්වභාවය වෙනස් නොකරයි. පිළිකුලෙන් හැවය ඉවත දමයි. යම්විටක එය අඩක් ගැලවී (සිරුරෙන්) එල්ලෙමින් ඇතිවිට පිළිකුල් කරමින් ලී දඬු අතරට හෝ මුලක් අතරට හෝ ගොස් ඒ ආධාර කොටගෙන - වෙර යොදා, උත්සාහකොට, වලිගය නමා, බලා සිටියදීම පෙණය විදහා හැවය හැරදමා කැමති තැනකට යයි. එසේම පැවිද්දා ද (සසරින්) එතරට යනු කැමතිව සතරාකාරයෙන් (කෙලෙස්) හැරදමයි. එයද සජාති, ජිගුචඡනෙතා, නිසසාය, ඨාමෙන යනුවෙනි. සජාති නම් 'අරියාය ජාතියා ජාතො.........' පරිදි උතුම් පැවිදි ජීවිතයට පත්වූ දින පටන්....දක්වා ඇති මෙහි වචනයේ තේරුම සීලයයි. 'සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො' නුවණැති තැනැත්තා සීලයෙහි පිහිටා යයි දක්වා ඇති පරිදි ඊට සුදුසු ලෙස කටයුතු කොට (සජාතියං) තම ජීවිත ස්වභාව සළකා පරණ හැවය හැරලන්නා සේ (සසරින්) එතරට යයි. දුක් උපදවන, ඒ ඒ තැන්හි ඇතිවන දොස් දැක, පිළිකුල් කරමින්, යහපත් මිතුරන් හේතුකොට යහපත් වීරිය බලවත් ලෙස යොදවමින් 'දවසක් සක්මනෙහි යෙදෙමින්, නිවනට බාධා කරන කරුණුවලින් සිත පිරිසිදු කරයි' - දිවසං චංකමෙන නිසජ්ජාය ආවරණියෙහි ධමෙමහි චිත්තං පරිසොධෙති'

යනුවෙන් කියන ලද පරිදි දිවා රෑ කොටස් හයකට බෙදා ගනිමින් දැඩි උත්සාහවත්ව උරගයකු වල්ගය නවා හරවන්නා සේ, පලක් බැඳ උරගයා මෙන් හුස්ම පිටකරමින්, දැඩිව වෙර යොදමින්, උරගයා පෙණය කරන්නා සේ නුවණ පැතිරවීමෙන්, උරගයා හැව ඉවතලන්නා සේ සසර ගමන අත්හරියි. හැව ඉවතලූ උරගයා මෙන් ඒ පැවිද්දා ද (කෙලෙස්) බර බහාතබා මතු නූපදනා ලෙස අනුපාදිසේස නිවන වෙත එළඹේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ -

**යො උප්පතිතං විනෙති කොධං**
**විසටං සප්පවිසංව ඔසධෙහි**
**සො භික්ඛු ජහාති ඔරපාරං**
**උරගො ජිණ්ණමිව තචං පුරාණං**' යැයි මෙසේ අරහත් බව කුළුගන්වමින් මුල් ගාථාව වදාළහ.

මීළඟට දෙවන ගාථාවෙහි තේරුම් විස්තර දක්වෙයි. එහිද

**යෙන යත්‍ථ යදා යසමා වුත්තා ගාථා අයං ඉමං**
**විධිං පකාසයිත්වාසසා කරිස්සාමත්‍ථවණ්ණනං** යනුවෙන් සිරස්තලයයි මේ. මුලින් මෙන් කවදා කොතැනදී කුමක් නිසා දේශනා කරන ලද්දේ දැයි විස්තර දක්වීමෙන් (අටුවාව) විශාල වේයැයි ඇති බිය නිසා, මින්පසුව සියළුම ගාථාවල සිරස්තලවලට අදාල වන පරිදි නිදාන කතා දක්වන අතරම, එහි අරුත් විස්තර කරන්නෙමි.

**යො රාගමුදච්ඡිදා අසෙසං** මේ දෙවන ගාථාවයි. එය දේශනා කිරීමට හේතු වූ කතා පුවත මෙයයි.

එක් කලක භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු සිටුවරයා විසින් කරවන ලද ජේතවන අරමෙහි වැඩවසති. එකල්හි ගරුකටයුතු සැරියුත් තෙරුන් වහන්සේගේ උවටැන්කරුවෙකු වූ එක්තරා රත්රන් වැඩ කරන්නකුගේ පුතෙක් උන්වහන්සේ වෙත පැවිදි විය. තෙරුන් වහන්සේ ඒ තරුණ හිමිට (සිරුරේ) අසුභ බව (මෙනෙහි කරවීම) ගැළපේ යැයි දැන රාගය දුරුකරනු පිණිස (පස්කම්හි ඇලීමේ ගැහැට මතුවන) අසුභ කමටහන වැඩීමට උපදෙස් දුන්හ. එය මෙනෙහි කරන තරමටවත් සිත තැන්පත් නොවේ. තරුණ හිමිනම එම කමටහන උපකාර නොවන බව

තෙරණුවන්ට සැළ කළේය. තෙරුන් වහන්සේද 'තරුණ හිමිට එය සුදුසු යැ'යි නැවත ද එම කමටහන වඩන ලෙසම කීහ. මෙසේ සිව් මසක් ඉක්ම ගියද සිතෙහි කිසිදු උසස් වෙසෙස් බවක් නොවීය. එවිට සැරියුත් තෙරුන් වහන්සේ ඒ මහණ භාග්‍යවතුන් වහන්සේ වෙත කැඳවාගෙන ගියේය. භාග්‍යවතුන් වහන්සේ, 'සාරිපුත්ත, මේ මහණුන්ට ගැලපෙන කමටහන (තෝරාගැනීමට) ඔබට නොහැකිය. එය බුදුවරයෙකුම දැනසිටිය යුතු' බව වදාරා, පැහැපත් පියුමක් ඉඳු බලෙන් පෙන්වා ඒ හිමියන්ගේ අතට දුන්හ. 'මහණ, මේ පියුම නටුව කඩා විහාරය පිටුපස වැලිතලයෙහි තබව, එය ඉදිරියේ රතු පැහැය - රතු පැහැය යනුවෙන් මෙනෙහි කරමින්, එරමිණිය ගොතාගෙන හිඳුව'යි වදාළහ. මේ හිමි පෙර පන්සිය වරක්ම ඉපදුනේ රන්කම් කරන පවුල්වලය. එහෙයින් ඒ හිමිට සුදුසු නිමිත්ත රතු පැහැය දැක්වීම බව දත් භාග්‍යවතුන් වහන්සේ 'ලොහිත කමටහන' වඩන ලෙස උපදෙස් දුන්හ. ඒ අනුව කටයුතු කොට ඒ හිමි මොහොතකින් ඊට අනුරූපව සිවුවන දැහැනට පැමිණ අගසිට මුලටත්-මුලසිට අගටත් දැහැන් වැඩීමට පටන් ගත්තේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'ඒ පියුම මැලවේවා'යි අදිටන් කළහ. තෙරණුවෝ දැහැනින් නැගිට ඒ මැලවුණු පියුමෙහි කළු පැහැය දැක, පැහැපත් වූ රූපයක් ජරාවෙන් මනාව මඩනා ලදැයි අනිස බව වටහාගත්හ. එම හැඟීම තම සිරුර ගැනද සමකොට බැලීය. එහිදී යම්දෙයක් එක් ආකාරයෙන්ම නොපවතී නම්, එය දුක බවත්, යම් දුකක් වේනම් එය තිර නොමැති බවත් දැන තුන්ලොවම ගිනි ඇවිලගත් සේ දුටුවේය. මෙසේ දකින අතරම, ඒ අසල වූ පියුම් විලකට බැස දරුවන් නෙළුම් මල් නෙල නෙලා මිටි බඳින සැටිත්, දියෙහි ඇති නෙළුම් මල් බටකැළයක ගිනිදැල් මෙන්ද වැටහිණ. (දැවී) වැටෙන වැටෙන මල්පියලි දරුණු අගාධයකට පිවිසෙනු සේ පෙනිණ. ගොඩබිමෙහි තිබූ නෙළුම් මල් අගින් මැලවුණු, ගින්නෙන් දැවුණු සේ වැටහිණ. මේ ආකාරයෙන් උන්වහන්සේට හැමදෙයක තතු යළි යළිත් මෙනෙහි කරනවිට පෙරටත් වඩා තුන්ලොවම ඇවිලගත්තා සේ, පිළිසරණක් නොමැති සේ දැනිණ. එහිදී භාග්‍යවතුන් වහන්සේ සුවඳ කුටියෙහි වැඩහිඳිමින්ම ඒ තෙරුන්ගේ සිරුර මත්තෙහි ආලෝකයක් මුදාහළ සේක. එම ආලෝකය ඒ හිමිගේ මුහුණම වසා පැතිරිණි. එවිට ඒ හිමියන් 'මේ කුමක්දැයි විමසන්නේ', භාග්‍යවතුන් වහන්සේ තමා අසලටම පැමිණිසේක් වනැ'යි දැක අසුනින් නැගිට ඇඳිලි බැඳ නමස්කාර කළේය. භාග්‍යවතුන් වහන්සේ ඒ හිමියන් දහම් අවබෝධයට සුදුසු බව

දැන 'යො රාගමුදච්ඡිදා අසෙසං' යන මෙම 'ආලොක කිරණ මගින් ගාථාව වදාළහ.

එහි රාගො යනු ඇලීමයි. පස්කම්හි සැපයෙහි ඇලීමට සමාන අදහසයි. උදච්ඡිදා - සිඳ දමයි, කඩා දමයි, වනසයි. 'සිඳ දැමුවේය යන අතීත කාලය හැඟවීම සඳහා වත්මන් කාලීනව යොදා ඇතැයි අකුරු බස්වහර ගැන සැළකිලිමත් වන්නෝ අදහස් කරති. අසෙස - සිතෙහි නොපෙනී පවත්නා රාගාදී කෙලෙස්, භිසපුප්ඵංව සරොරුහං විලෙහි වැඩුණු නෙළුම් මලක් මෙන්, විගයහ බැස, පිවිස යන අදහසයි. ඉතිරි වචන පෙර සඳහන් වූ පරිදිමය. කුමක් නිසා කියන ලදද? යම්සේ ඒ දරුවෝ විලට බැස, නෙළුම් දැලි හා නෙළුම් මල් නෙලත් ද, එසේම ඒ මහණ ද මේ තුන්ලොව හා එක්වන සබඳතා ගැඹුරින් විමසමින්ද 'රාගය සමාන ගින්නක් නැත.' 'නත්ථි රාගසමො අග්ගි', 'කාමරාගයෙන් දැවෙමි, මසිත තදින් දවයි' - 'කාමරාගෙන ඩයහාමි, චිත්තං මෙ පරිඩයහති', තමා විසින්ම කරන ලද දැලට පැටලෙන මකුළුවා සේ, රාගයෙන් රත් වූ තැනැත්තෝ කෙලෙස් සැඩ පහරට ඇද වැටෙති. 'යෙ රාග රත්තානුපතන්ති සොතං සයං කතං මක්කටකො'ව ජාලං' - 'ඇවැත්නි, රාගයෙන් සිත දැඩිව මැඩගෙන සිටින තැනැත්තෝ අනුන්ගේ දිවි වුවද තොර කරති.' - 'රත්තො බො ආවුසො, රාගෙන අභිභූතො පාණමපි හනති' මේ ආකාරයෙන් සඳහන් වූ පරිදි රාගාදිය පිළිබඳ විමසමින් ඉහත කී ලෙසට සීල සංවරයෙන් යුතුව පණ ඇති පණ නැති සියළු දේ කෙරෙහි අසුබ ලෙස බලා (අනිස බව හා දුක් බව) මඳින්මඳ රාගය දුරුකරමින් අනාගාමී මගින් ද ඉතිරි සියළුම කෙලෙස්, අරහත් බවට පත්වීමෙන්ද නැති කරයි. ඉහත කී අයුරින්, ඒ මහණ උරගයා පරණ හැවය ඉවතලන්නා සේ සසරින් එතරට යති'යි අරහත් බව කුළුගන්වමින් ගාථාව දේශනා කරන ලදී. දේශනය අවසන ඒ තරුණ හිමියෝ රහත් පල ලදහ.

යො තණ්හමුදච්ඡිදා යන මේ ගාථාව දේශනා කිරීමට මුල්වූයේ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයෙහි එක් හිමිනමක් ගඟගරා පොකුණු තෙර වසමින් තණ්හා පෙරටුව අකුසල සිතිවිලි මෙනෙහි කරයි. භාග්‍යවතුන් වහන්සේ එම අදහස දැන ආලෝක කිරණ මගින් මෙම ගාථාව වදාළහ. ආසාව-ආසා පිපාසය තණ්හා නම් වේ. ආසාවෙහි සෑහීමකට පත් නොවීම අදහස් වේ. කාම, භව, විභව තණ්හාවද මෙයට සමාන වචනයි. පවත්නා ස්වභාවය සරිත වේ. සසර

සැරිසරන තෙක් භව කෙළවර දක්වා උපත ලබන තැන්වල තදින් මුල්බැස ගෙන සිටින බව කියන ලදී. **සීඝසර** ඉක්මන් ගමනින්, ජීවත්ව සිටින කාලය හා මරණින් පසුව ලබන විපාක සළකා, මොහොතකින්ම පරසක්වළටද භව කෙළවරටද පැමිණීමට හැකිබව කියා ඇත.

**'උපරි විසාලං දුපපූරං ඉච්ඡං විසටගාමිනිං**
**යෙච තං අනුගච්ඡනති තෙ හොනති චකකධාරිනො**

**තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං**
**ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති'**

'මතුයෙහි (අනාගතයෙහි) බොහෝ ඉටුකර ගත නොහැකි, කැමති වන දේවල් පතුරුවාගෙන-පුරවාගෙන ඒවා අනුව පවතීද, ඔවුහු සසර නැමති රෝදය අනුව යති. (සසර යළි යළිත් ඉපදී-මැරී-උපදිති.)

තණ්හාව දෙවැනිකොට ඇති මිනිසා කෙළවරක් නොපෙනෙන දිගු සසර ගමනට පිළිපන්නේ ලද මේ ජීවිතය එක් ආකාරයටත්, මරණින් පසු ඊළඟ ජීවිතය වෙනස් ආකාරයටත් (පත්වෙමින්) සසර ඉක්මවා නොයති.'

'ඌනො ලොකො අතිතෙතා තණ්හාදාසොති ඛො මහාරාජාතිච' 'මහරජ, ලෝකයා (තමනට තවත් ලැබිය යුතු යැයි) තමාට අඩු දේවල් පිරිමසාගැනීමේ සෑහීමකට පත් නොවී, තණ්හාවට වහලකු වී ඇත.' මෙසේ ආදීනව විමසා බලමින්, ඉහත සඳහන් කළ පරිදි සීල සංවරයෙන් යුතුව යම් කෙනෙක් (ගිහි-පැවිදි) තණ්හාව ටිකෙන් ටික, **විසොසයිත්වා** වියළවා (තණ්හා සැඩපහර වියලවමින්) අරහත් මගින් ඉතිරි සියළු කෙලෙස් මුලින් සිඳ දමයි. ඒ මහණ එකෙණෙහිම මුළුමනින්මද සසරින් එතර වෙයි. දේශනාව අවසානයේ අකුසල සිතිවිලි මෙනෙහි කළ ඒ හිමි රහත් බව ලැබීය.

**යො මානවබුද්ධඛධී** - මේ ගාථාව දේශනා කිරීමට මුල්වූයේ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩ වසති. එක් හිමිනමක් ගංතෙර වාසය කරන අතර, ජලය අඩු දියපහර හරහා තනන ලද බට ඒදණ්ඩක් පසුව ගලා ආ මහ සැඩපහරින් ගසාගෙන යනු දැක, 'සකස්වන

හැමදෙයක්ම තිර බවක් නැතැ'යි (අනිච්චා වත සංඛාරා) සංවේගයට පත්විය. එම අදහස භාග්‍යවතුන් වහන්සේ දැක, ආලෝක කිරණ මගින් මෙම ගාථාව වදාළහ. එම ගාථාවේ මානො ඉපදුණු කුලය, පවුල ආදී සම්පත් ගැන උඩඟු සිතිවිලි ඇතිකර ගැනීමයි. 'මම (වෙනත් කෙනෙකු හා) උසස් වෙමි. සමාන වෙමි. පහත් කෙනෙක් වෙමි'යි මානය තුන් ආකාරය. නැවතද උසස් වෙනත් කෙනෙකු සේ උසස් වෙමි. උසස් වූවකු හා සම වෙමි. උසස් වූවකුට වඩා පහත් කෙනෙකු වෙමි. සමාන තත්වයේ කෙනෙකු හා සම වෙමි. සමාන කෙනෙකු හා පහත් වෙමි. පහත් කෙනෙකුට වඩා උසස් වෙමි. පහත් කෙනෙකු හා සමාන වෙමි. පහත් කෙනෙකු හා පහත් වෙමි' ලෙසින් මානය නව ආකාරය. ඒ සියළු ආකාර වූ මානයයි. 'යෙන මානෙන මත්තාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං' යම් ආකාර වූ මානයෙන් මත් වූවෝ දුගතියට යති. මේ ආදී ලෙසින් එහි ආදීනව විමසීමෙන්, ඉහත කියන ලද පරිදි සීල සංවරාදියෙන් යුතුව මඳින් මඳ (මානාධික සිතිවිලිවලට) වද දෙමින් කෙලෙසුන් දුබල බවට පත්කිරීම බට ඒදණ්ඩ වැනිය. නව ලොවුතුරා දහම ඉතා බලවත් බැවින් මහා සැඩපහරක් බඳු අරහත් මගෙන්, අසෙසං උදබ්බධී සහමුලින්ම නැතිකිරීමෙන් සිඳ දැමීම වධෙති යනුවෙන් කියන ලදී. ඒ මහණ එකෙණෙහිම සසර ගමන හැර දමයි. දේශනාව අවසානයෙහි ඒ හිමි අරහත් පලයෙහි පිහිටියේය.

යො තාණ්හමගමා මේ ගාථාව දේශනා කිරීමට මුල්වූයේ කුමක්ද? මෙම ගාථාවටද, පසුව දැක්වෙන ගාථා දොළහටද එකම හේතුවකි. එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩ වසති. එකල්හි එක් බමුණෙක්, තම දුවගේ විවාහ මංගල්‍යයේදී 'පහත් යැයි සැළකෙන කිසියම් කෙනෙකු (වසලයෙකු) මුලසිටම පරිහරණය නොකරන ලද මල්වලින් දූරිය අලංකාර කොට පතිකුලයට යවන්නෙමි'යි සිතීය. ඔහු සැවැත්නුවර ඇතුලතත්, නුවරින් පිටත්, එසේ පරිහරණයට නොගත් කිසිදු මලක්, තණ මලක්වත් නුදුටුවේය. මේ අතර නොමනා ගති පැවතුම් ඇති බමුණු තරුණයන් රැස්ව සිටිනු දැක, 'උවමනා දේ ඒ බොහෝ දෙනාගෙන් කවුරුන් හෝ දන්නාහ'යි සිතා 'ඔවුන්ගෙන් විමසන්නෙමි'යි, ඒ පිළිබඳව ඇසුවේය. ඔවුහු බමුණා විහිළුවට ගනිමින්, 'බමුණානෙනි, දිඹුල් මල ලොව කිසිවකු විසිනිදු පරිහරණයට ගෙන නැත. එම මල්වලින් දුව සරසා දෙව'යි කීහ. බමුණා පසුදා උදෑසනින් පිබිද ආහාර ගෙන, අචිරවතී ගංතෙර, දිඹුල් වනයට ගොස් දිඹුල් ගස් එකින් එක පිරික්සමින්, මලක

නටුවක් පමණකුදු නොදුටුවේය. දහවල ඉකුත්වද්දී අනික් ගංතෙරට ගියේය. එහි එක් මහණෙක් එක්තරා සිත්කළු ගසක් මුල දිවා කාලය ගත කරමින් කමටහන් මෙනෙහි කරයි. බමුණ එහි පැමිණ, ඒ හිමියන් ගැන නොසළකා වරෙක හිඳිමින්ද බිම ඇන බා ගනිමින්ද (උක්කුටිකව හිඳිමින්ද) වරෙක නැගී සිටිමින්ද සියළු අතුපතර දෙස විමසා බලමින් වෙහෙසට පත්වෙයි. එහිදී ඒ හිමි 'බමුණ, වටිනා දෙයක් මෙන් කුමක් සොයන්නේ ද'යි? ඇසීය. 'දිඹුල් මල්' යැයි කීය. 'බමුණ, ලෝකයෙහි දිඹුල් මල් නැත. ඔවුන්ගේ වචන බොරුය. වෙහෙස නොගනුව'යි හිමි කීය. එහිදී භාග්‍යවතුන් වහන්සේ ඒ හිමියන්ගේ අදහස දැන ආලෝකයක් විහිදුවා, සිත එක් අරමුණක පිහිටවූ පසු ආලෝක කිරණ මගින් මෙම ගාථව වදාළහ. එහි **යො නාජ්ඣගමා භවෙසු සාරං** - සියළු කරුණු කිවයුතුව ඇත.

එහි පළමු ගාථාවෙහි නජ්ඣගමා - එතෙක් අවබෝධ නොකළේය, හෝ නොලැබුවේය යන්නයි. **භවෙසු** - කාම, රූප, අරූප, සඤ්ඤී, අසඤ්ඤී, නෙවසඤ්ඤා, නාසඤ්ඤා ආදී රූප-වේදනා සමූහයෙහි එකක්, සතරක්, පහම සහිතව උපත ලබන තැන්ය. **සාරං** තිර බව හෝ ආත්මය ලෙස දැඩිව ගැනීමය. **විචිනං** නුවණින් සොයා බැලීමය. **පුප්ඵමිව උදුම්බරෙසු** යම්සේ දිඹුල් ගස්වල මල් සොයන ඒ බමුණාට එය නොලැබුණේද, එසේම භාවනා වඩන්නා ද නුවණින් සොයාබලමින් ඉපදීමට අයත් හැමතන්හිම (භව) කිසිදු හරයක් නොලැබ, ඒ නිසරු බව නිසාම, ඒ සියළුම දේවල් තිරව නොපවත්නා (තමාට) අයත් නොවන්නේ යැයි මැනවින් මෙනෙහි කරමින් අනුපිළිවෙළින් ලොවුතුරු මගෙන් (නිවන) අවබෝධය ලබා, උරගයා පරණ දිරූ හැවය හැරලන්නා සේ සසර ගමන හැරදමයි. මේ එහි අදහසයි. ඉතිරි ගාථා විස්තරවලදී, එම අදහස නැවත) සඳහන් නොකොට, කිවයුතු වෙසෙස් කරුණු ඇතොත් කියමු.

**යස්සන්තරතො න සන්ති කොපා**

**ඉති භවාභවතඤ්ච වීතිවත්තො'** යමෙකුගේ සිත තුල කෝපය හට නොගනීද, එය සසර ගමනද ඉක්මවන තරම් ය. එහි අන්තර යන වචනය යෙදුනු තවත් තැන් කීපයකි.

**නදී තීරෙසු පණ්ඨානෙ සභාසු රථිකාසු ච**
**ජනා සංගම්ම මන්තෙන්ති මඤ්ච තඤ්ච කිමන්තරං'**

ගංතෙරවලදී ද, මහ මගෙහිද, රැස්වීම්වලදී ද, වීදිවලද මිනිස්සු එකතු වූ විට 'මේ දෙය - ඒ දෙය අතර' වෙනස කුමක්දැයි සාකච්ඡා කරති. මෙසේ අන්තර යන වචනය - සුළු දෙයකින් බොහෝ දෙයක් දැනගන්නා අතරතුර අවසානයට පැමිණීම ගැනද අදහස් වේ.

**අනත්‍ථජනනො කොධො කොධො චිත්‍තප්පකොපනො**
**භයමන්‍තරතො ජාතං තං ජනො නාවබුජ්‍ඣති'**

කෝපය අයහපත උපදවයි. තව තවත් තදින් කෝපය සිත පීඩා කරයි. (සිත) ඇතුළත බය උපදවා ගත් මිනිස්සු එය අවබෝධ නොකරති.'

මෙසේ සිත අතරමැද ආදී සේ බොහෝ තැන්වල මෙය යෙදෙන අරුත් දක්වේ. මෙහි යෙදී ඇත්තේ සිත යන වචනයට අදාළවය. **යස්සන්‍තරතො න සන්‍ති කොපා** තෙවැනි මගපලයෙන් මුළුමනින්ම නසන ලද බැවින් එබඳු තැනැත්තකුගේ සිතෙහි කෝපය නැතැයි අදහසයි. **භවො** - සම්පත්, **විභවො** - විපත්, එසේම **භවො** - දියුණුවයි. **විභවො** - පාඩු, **භවො** හැමකල්හිම පැවැත්ම, **විභවො** වැනසීම. **භවො** පින, විභව පව්, විභව-අභව යනු එකම තේරුමයි. එහෙයින් **ඉති භවාභවතඤ්ච වීතිවත්තො**, මෙහිලා ඒ සම්පත්, විපත්, දියුණුව, පිරිහීම, සදාකල් පැවැත්ම, වැනසීම, පින, පව ලෙස නොයෙක් ආකාරයෙන් භවයෙන් භවය ගැන කියනු ලබයි. සිවුවන මගපලයෙන් ඇති පරිදිම ඒ ඒ කරුණු දැන භවයෙන් භවය හෙවත් සසර ගමන ඉක්මවූයේ යැයි මෙසේ අරුත් දතයුතුය.

**යස්ස විතක්කා** - මෙහි, යම් පැවිද්දෙකුට තුන් ආකාර වූ කැමැත්ත, නපුරු සහගත හා හිංසාත්මක සිතිවිලි ඇති වේද, නෑදැයින් රටක් හෝ දෙවියන් යන තුන් ආකාර සිතිවිලි වේද, අනුන් කෙරෙහි කරුණා සහගත සිතිවිලි, ලාභ සත්කාර කීර්තිය ගැන, නිවැරදි යැයි දැනෙන පරිදි ඊට අනුව මතුවන සිතිවිලි යැයි නව ආකාරය. (මෙසේ විතක්ක නවයකි.) හැම අයුරින්ම, යහපත් ලෙස කියන ලද පරිදි ඒ ඒ දෙයෙහි පලවිපාක විමසා බලා, එකිනෙකට ගැටුම් ඇතිවන අයුරු-සතුරුවන අයුරු විභාග කිරීමෙන්, ඒ (සිතිවිලි) හටගැනීම නැතිකිරීමට සමත් වූවන් විසින් සෝවාන් ආදී මුල් මගපල තුනෙන් ද **විධූපිතා** - බොහෝ සෙයින් දුම් ගස්වන ලද්දේ, තවන ලද්දේ, දවන ලද්දේ ය යන අදහසයි. මෙසේ දුම් ගස්වා, **අජ්ඣත්‍තං සුවිකප්පිතා අසෙසා** - තමාට අයත්, තමා පිළිබඳ, තමාගේ

(රූපාදී) බන්ධ සමූහයට අයත් (සිරුරෙහි) තමා වෙනුවෙන් හටගත් (ඒ සිතිවිලි) නැත ඇති නොවේද, මෙසේ අරහත් මගෙන් ඉතිරි නැතිව සිඳින ලදී. සිඳීම යන්නට කැපීම යයිද කියනු ලැබේ. 'රවුල් කෙස් කපන ලදි' යයිද කියා ඇති පරිදි මෙහි අරුතද සුදුසු සේ දතයුතුය.

මීළඟට යො නාච්චසාරි යන ගාථාවයි. එහි **යො නාච්චසාරී** යමෙක් වේගයෙන් නොදුවති. **න පච්චසාරි** නොනවතී යනුයි. කුමක් නිසා කියන ලද්දේ ද? පටන් ගන්නා ලද දැඩි උත්සාහයෙන් යුතුව එයින් උඩඟු වෙමින් වඩාත් සිතයි. මඳ උත්සාහවත් වූයේ කුසීතව පසුවට තබා කල්පනා කරයි. එසේම භව තණ්හාවෙන් තමන් වෙහෙසට පත්වෙමින් (ඉදිරි ජීවිතය ගැන) වැඩියෙන් සිහිකරයි. කාම තණ්හාවෙන් කම්සුවයෙහි යෙදෙමින් මඳ වශයෙන් සිතයි. හැමදෙයක්ම (තමාම අයත්කොට) තිර පැවැත්මක් ඇතැයි වැඩියෙන් සිතයි. එහි වැනසීම, අහිමිවීම ගැන පසුබටව (දුක්මුසුව) සිතයි. පසුවූ දේ ගැන දුක්වෙමින් නැවත වැඩියෙන් සිහිකරයි. අනාගතය බලාපොරොත්තුවෙන් පසුගාමීව සිතයි. අතීත පටන්ගැන්ම පිළිබඳ (තමාගේ ඉපදීම අතීතය) වැඩියෙන් සිහිකරයි. අවසානය ගැන පසුගාමීව සිතයි. එහෙයින් යම් කෙනෙක් මෙම අනත හෙවත් දෙකෙළවරම අත්හැර, මැදහත් පිළිවෙත පිළිපදිමින්, වැඩියෙන් නොසිතීම හෝ පසුගාමීව නොසිතීම ගැන මෙසේ කියන ලදී. **සබ්බං අච්චගමා ඉමං පපඤ්චං**, එහිලා අරහත් මග අවසන්කොට ඇති මැද පිලිවෙතින් සියළු ආකාර වූ වින්දන (වෙදනා) හැඟීම් හා කාමාදී සංකල්පනා මුල් වූ ආසා, දැඩිව එල්බ ගැනීම්, තුන්ආකාර වූ මානය හා (ඒ ඒ පුද්ගලයාට ආවේණික වූ කෙලෙසින් පිරි පුද්ගලිකත්වය (පපඤ්ච) ඉක්මවන්නේ, මැනවින් ඉක්මවන්නේ යන තේරුමයි.

ඒ ගාථා අතරින් **සබ්බං විතථමිදනති ඤත්වා ලොකෙ** - මේ ගාථා සඳහන ගැන වෙසෙසින් දැක්වේ. එහි තේරුම නම්, **සබ්බං** යනු ඉතිරි නැතිව, කිසිවක් අඩු නැතිව, මෙහිදී මෙලොව බන්ධ පහට අයත් (සිරුර හා බැඳුණු දේ හා අන් සියල්ල) - ආපෝ ආදී ධාතු ලෙසින් නුවණින් විමසා බැලීම අදහස් වේ. **විතථ** - නැති හෝ ඇති බවයි. වෙනස් නොවේ, හෝ සැපයි හෝ යහපතැයි හෝ ආත්ම ලෙස හෝ ඒ මේ ආකාරයට කෙලෙස් ලෙසින් අනුවණ මිනිසුන් සළකනු ලබයි. විතථ යැයි කියන ලද්දේ කුමක් නිසාද? **ඉදං** ඒ සියළුදේම (ඇස් ආදී ඉඳුරන්ට) දකින අයුරින්, යොමුවන අයුරු කීය. **ඤත්වා** මගපල නුවණින් දැන, ඒවාට

මුලා නොවී, ගොදුරු නොවී ලොකෙ (තමා හා) බැඳුනු ලෝකය, සියළු දේ (ඛන්ධ) සමූහ ලෙස හටගැනීම කෙලෙස් ලෙස නොගැනීම අදහස් වේ.

මීළඟට දක්වෙන ගාථා හතරෙහි **වීතලොභො, වීතරාගො, වීතදොසො, වීතමොහො** යන්නෙහි වෙනසක් ඇත. **ලොභො** - ඇලීම, ආසා කිරීමයි. (කෙලෙස්) සියල්ලටම ඇතුලත් එය මුල්ම අකුසල මූලයට සමාන වචනයකි. දැඩි ලෝභය හෝ ගැනේ. 'අපෙපකදා භාරවාජ, මාතිමත්තීසුපි ලොභධම්මා උප්පජ්ජති, භගිනිමත්තීසුපි ධීතුමත්තීසුපි ලොභධම්මා උප්පජ්ජති' - භාරවාජ, ඇතැම්විටක ඒ ලෝභ ගතිය මව්වරුන්, සොහොයුරියන්, දූවරුන් සම්බන්ධයෙන්ද හටගනී'යැයි ලෝභයේ එබඳු ගති ගැන කියා ඇත. ඇලෙන සුළු බව **රාගො** පස්ආකාර වූ කාමයෙහි ඇලීමට සමාන වචනයකි. කිපෙන, සිත නපුරට පත්කෙරෙන බැවින් **දොසො** වේ. මුලදී සඳහන් කරන ලද කෝපයට සමානය. මුළාවට පත්කරන බැවින් **මොහො** නම් වේ. සිවුසස් නොදැනීමට එය සමාන වචනයකි. එහෙයින් මේ මහණ 'කෙසේ නම්, මම ලෝභය දුරුකොට වාසය කරන්නෙම්දැ'යි ලෝභය පිළිකුල් කරමින් විදසුන් වැඩීම අරඹයි. එවිට ඒ මහණ හට ලෝභය නැති කිරීම පිණිස, සියළු සංඛාරවල මුසාබව දක්වමින්, සසර ගමන වළකාලීම පිණිසත් මෙම ගාථා වදාළහ. මීට පසුව ඇති ගාථාද මේ අයුරිනි. කියන ලද පරිදි, ඒ ඒ කරුණු විදසුන් භාවනා ඇරඹූ, ඒ මහණුන්ට මේ ගාථා එකින් එක වදාරන ලද බව ඇතමෙක් කියති. එය කැමති අයුරින් සළකා ගතයුතුය. ඉතිරි ගාථා සතර ගැනද එසේය.

මේ එහි තේරුම් දැක්වීමයි. ඉවත් නොකරන ලද බැවින්, සිතෙහි ඉතිරිව ඇතැයි යන්නෙන් **අනුසයා** නමි. කාමරාග, තරහ, මාන, මම මගේය ආදී දැඩිව ගත් හැඟීම්, සැකය, කාමාදී භව ආසාව, මුලාව ආදියට සමාන වචනයකි. මේ දේවල්, තමා කෙරෙහි යෙදෙන අයුරු **මූලා** නම් වේ. රැකවරණ නොමැති අරුතින් **අකුසලා** ය. එය ඇතිවීමට පදනම වන හෙයින්ද **මූලා** වේ. වැරදි සහිත, දුක් විපාක ලැබ දෙන තේරුමෙන් **අකුසලා** ය. මේ කරුණු දෙකම ලෝභ, දෝස, මෝහයට සමාන වචන වේ. 'මහණෙනි, ලෝභය අකුසලයකි. අකුසලයට මුල්වේයැයි, ආදී ලෙසින් 'ලොභො භික්ඛවෙ අකුසලඤ්ච, අකුසල මූලඤ්ච' මෙය දක්වන ලදී. මෙසේ ඒ කෙලෙස් (සෝවාන් ආදී) ඒ ඒ මගපල මගින් නසන ලද බැවින්, යම් පැවිද්දෙකුට ඒවා හටනොගනීද, එම

අකුසල මුල් මුලින්ම උදුරා දමන ලද්දේ යැයි **සමූහතාසෙ** අදහසයි. වෙන් වෙන් වශයෙන් බහු වචනයට 'ස' ආගම වීයැයි වියරණ ඇදුරෝ දක්වති. අටුවාචාරීහු සෙ යන්න නිපාත පදයකැයි විස්තර කරති. කැමති පරිදි තීරණය කළයුතුය. මේ ආකාරයෙන් ඒ මහණ කෙලෙසුන් නසන ලදද, කෙලෙස් නසන ලද්දේය යනුවෙන් ද දැඩිව නොගනී. එම අදහස ඉවත් කළේද නොවේ. (කෙසේ වුවත්) කෙලෙස් දුරුකොට සිටියේ යැයි කියන ලදී. එහෙත් දැන් පවත්නා කාලය අනුව ජහාති ඔරපාරං යනුවෙන් කියනු ලබයි. නැතහොත් අනුපාදිසෙස නිවනින් පිරිනිවනට පත්වන්නේ, තම සිරුර හා බාහිරව බැඳුනු ආයතනික දෙයෙහි අත්හැර දැමීම ඔරපාරං යනුවෙන් දතයුතුය. එය කෙලෙස් අනුපිලිවෙලින්ද, මගපිලිවෙලින්ද යන දෙයාකාරයෙන් සිතෙහි පවත්නා රාගාදිය නැතිවීම දතයුතුය. කෙලෙස් පිලිවෙල අනුව කාමරාග, පටිඝ යන කෙලෙස් අනාගාමි මගින් නැතිවේ. මානය අරහත් මගිනි. මගපිලිවෙලින් ගත්විට, සෝවාන් මගින් (මම-මගේය) ආදී හැඟීම් හා සැකය, දුරුවේ. භව ඇල්ම හා නොදනුවත් බව (අවිජ්ජා) අරහත් මගින් නැති වේ. මග පිළිවෙළින් (නැවත) සඳහන් කළොත්, සෝවාන් බවට පත්වීමෙන් දැකීම් හා සැකය දුරුවේ. සකදාගාමී බවට පත්වීමෙන් කාමරාග, පටිඝ කෙලෙස් සහගත බව අඩු කෙරේ. රහත් පලයට පත්වීමෙන් මාන, භවරාග, නොදැනීම හෙවත් අවිජ්ජා නැති කෙරේ. එහි යම් ආකාරයකින් සියළුම කෙලෙස් අකුසල මුල් සේ නොගත්තද, කාමරාග, භවරාග ආසාව අකුසල මූල යටතට ගැනේ. පටිඝ, අවිජ්ජා සහ දෝස මෝහ යන අකුසල මූලයෙහිම ලා සැළකේ. දිට්ඨි, මාන, විචිකිච්ඡා ආදියෙහි කිසිදු අකුසල මූලයක් සේ නොවූවත්, යම් ආකාරයකින් ඒවා දුරුකිරීමෙන් ද, අකුසල් මුල් සහමුලින්ම නැසීමෙන් කෙලෙස් නැතිකිරීම බලාපොරොත්තු වීද, එහෙයින් 'යම් පැවිද්දකු අකුසල් මුල් සහමුලින්ම උදුරා දමන ලද්දේ ද, නසන ලද්දේ ද කාමාදි අනුසය හෙවත් කෙලෙස් කිසිවක් නැතැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**යසස දරථජා** යන ගාථාවෙහි - දරථ යන්නෙන් මුලින් මුලින් හටගන්නා කෙලෙස්වලින් දවන ගතිය පහදයි. ඒ දැවීම් ගති තුලින් ඇතිවූ බැවින් දරථජා නම් වේ. ඔර යයි තම සිරුරට කියනු ලැබේ. ඔරීමං තීරන්ති බො භිකබූ සකකායසෙසතං අධිවචනං' මෙතෙර පැවිද්දකුගේ තම සිරුරට සමාන වචනයකැයි කියන ලදී. **ආගමනාය** යනු උපතයි. **පච්චයාසෙ** - හේතුවමය. කුමක් නිසා කියන ලද්දේ ද? යම් පැවිද්දෙකුට දැඩි සේ ඇළුම් කිරීමට ඇති හේතු සෝවාන් ආදී මගපලවලට පත්වීමෙන්

නැති කරන ලද හෙයින් දරථජා යැයි දක්වූ පරිදි කෙලෙස් කිසිවක් හට නොගනී. පෙර කියන ලද පරිදි ඒ පැවිද්දා සසර ගමන අත්හරී.

**යස්ස වනථජා** - මෙහිද දරථජ මෙන් වනථජ ගැන ද දතයුතුය. වචනයේ අරුතෙහි වෙනසක් ඇත. **වන** යනු ඇළුම් කරන්නේ, ආසා-බලාපොරොත්තු ඇති කරන්නේය යන අදහසයි. ඉල්ලයි, සේවනය කරයි යන තේරුමයි. තණ්හාව සමාන වචනයකි. එසේ අරමුණු වන යම් දෙයක් පතමින්, ඇසුරු කරන යන තේරුමෙන් **වනං** යැයි කියනු ලැබේ. වනථො තණ්හා කෙලෙස් හා සමානය. එයින් ඇති වූයේ, හටගත්තේ වනථාජාත = **වනථජා** නම් වේ. ඇතැමෙක් සියළුම කෙලෙස්වලටම 'වනථ' යැයි කියති. පසුව හටගන්නා කෙලෙස්ද වනථජා යැයි උරග සූත්‍රයෙහිදී අදහස් වේ. අනෙක් අදහස ධම්මපද ගාථාවලට අදාලය. **විනිබන්ධාය භවාය** - සසර එකට බැඳී ඇති බවයි. නැතහොත් සිතෙහි පහළවන කෙලෙස් අරමුණුවල සබඳතාවයි. නැවත උපතකට හේතුවේයැයි අදහසයි. හේතුවම **හෙතුකප්ප** යයි දක්වේ.

**යො නීවරණෙ** - මෙම ගාථාවෙහි නීවරණ යනු සිතට හිතවත් පිළිවෙතක් හෝ වළකාලීමයි. සඟවති, ආවරණය කරති යන තේරුමයි. **පහාය** - ඉවතලා, **පඤ්ච** යනු නීවරණ සංඛ්‍යාවයි. දුක්රහිත බව අනීඝො, කථාවෙන් කථාව - සැකය ඉක්මවූ බැවින් **තිණ්ණකථංකථො**, උල් ඉවත්කළ බැවින් **විසල්ලො** - මෙසේ කියන ලද්දේ කුමක් නිසාද? යම් පැවිද්දෙකු නීවරණයන්හි පලවිපාක දක, මහණකමෙහි යහපත් වූ උසස් බවක් ලෙසට, ඒ කාමච්ඡන්ද ආදී නීවරණ පහ ඒ ඒ මගපල ලබමින් මුළුමනින්ම හැරදමන ලද බැවින්, කෙලෙස් දුක් රහිත බැවින්, 'මම අතීත භවයන්හි සිටියෙම්ද'යි? ආදී ලෙසින් සැකයෙන් තොරවීමෙන් **තිණ්ණකථංකථො** වෙයි. (ඉහත සඳහන් පරිදි) උල් පහ කවරේද? රාගය නැමති උල, දොස උල, මොහ උල, මාන උල සහ දිට්ඨි උල ය. මෙම උල් පහ උදුරා ඉවත ලූ බැවින් **විසල්ල** නම් වේ. මෙබඳු පැවිද්දා පෙර කී අයුරු සසර නවතයි. තවද නීවරණ නැති කිරීම කෙලෙස් දුරුකරන පිළිවෙළින් ද මගපිළිවෙතින් ද යන දෙ ආකාරයෙන්ම දතයුතුය. කෙලෙස් පිළිවෙළින් වූ කාමච්ඡන්ද, ව්‍යාපාද නීවරණ සකදාගාමී මගින් නැති වෙයි. ථීනමිද්ධ උද්ධච්ච අරහත් මගින් නැසේ. 'මා විසින් ඒකාන්තයෙන්ම කුසල් නොකරන ලදී' ආදී ලෙසින් වන විපිළිසර වූ කුකුස් ඇති විචිකිච්ඡා නීවරණය සෝවාන් මගින් නැතිවේ. කාමච්ඡන්ද ව්‍යාපාද නීවරණ සකදාගාමී මගින් ලිහිල් වේ.

අනාගාමී මගින් ඉතිරි නැතිවම - මුළුමනින්ම නසයි. ථීන මිද්ධ හා උද්ධච්ච නීවරණ රහත් මගින් නැති කෙරේ. මෙසේ:

> යො නීවරණෙ පහාය පඤ්ච අනීඝො තිණ්ණ කථං කථො විසල්ලො
> සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං'

යනුවෙන් නීවරණ නැතිකොට, දුක් රහිතව, සැය දුරුකොට, රාගාදී උල් උදුරා හළ ඒ මහණ පැරණි හැවය හැර දමන උරගයකු සේ (සසරින්) එතර වේ'යැයි අරහත් මග කුළුගන්වමින් දේශනාව නිම කළහ. දේශනාව අවසන ඒ මහණහු අරහත්පලෙහි පිහිටියහ.

උරග සූත්‍ර විස්තරය නිමි.

## 1.2

පක්කොදනො - ධනිය සූත්‍රයයි. එයට හේතු වූ කරුණ කුමක් ද? භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර වැඩවසති. එකල ධනිය නම් ගව පාලකයා මහී ගං තෙර වාසය කරයි. ඔහුගේ පෙර භවයක තතු මෙසේ වෙයි. කසසප බුදුරදුන්ගේ සසුන බබළන කල්හි, වසර විසිදහසක් දවස් පතා සංඝයා වහන්සේලාට සලාක බත් විස්සක් දුන්නේය. ඔහු එයින් චුතව දෙවියන් අතර ඉපිද දෙව්ලොවම තවත් බුදුවරයකු පහළ වන තෙක් කල්යවා අප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි විදේහ රට මැද පබ්බත රට්ඨ පෙදෙසෙහි ධම්මකොණ්ඩක නම් නගරයෙහි සිටු පුතකුව ඉපිද ගව පාලනයෙන් ජීවත් වෙයි. ඔහුට ගවයෝ තිස්දහසක් පමණ වෙති. විසිහත්දහසක් එළදෙනුන්ගෙන් කිරි දොවති. ගොපල්ලෝ නිතර එක්තැනම නොවසති. වැසි සහිත මාස සතරෙහි ගොඩබිම වසති. ඉතිරි අට මාසයෙහි තණකොළ, ජලය පහසුවෙන් ලබන තැනක වසති. එතැන ගංතෙරක හෝ ස්වභාවික විල්තෙරක් හෝ වෙයි. ඉක්බිති ධනිය ද

වැසිකාලයෙහි තමා විසූ ගමෙන් නික්ම ගවයන්ට පහසුවෙන් විසිය හැකි, ඉඩ ඇති තැනක් සොයන්නේ, එක් කලක මහපොළව විවරව (මතු වූ) මහාමහි නමින් හඳුන්වන ලද ගලායන (දිය පහරින් වටවූ) ඉඩ ඇති පරිදි මුහුද ආසන්නයම පැවති අතුරු දූපතක් සේ සකස්ව තිබුණු කිසියම් තැනකට පිවිස ගව හලක්ද, තමන්ට නිවසක්ද තනා වාසය කළේය. ඔහුට පුත්තු හත් දෙනෙක් ද, දූවරු සත්දෙනෙක් ද, ලේලියෝ සත්දෙනෙක් ද, නොයෙක් කම්කරුවෝ ද වෙති. කුරුල්ලන් රුක් මුදුන්හි කූඩු තනත් ද කකුළුවන් ජලයට ළංව තිබූ (බෙණ) සිදුරු වසා, ගොඩබිමට ළංව බෙණ සාදත්ද එවිට වැසිකාලයට පෙරනිමිති බව ගව පාලකයෝ දනිති. එමෙන්ම කුරුල්ලන් දිය මතුපිටට පහත් තැනක කූඩු තනත් ද, කකුළුවන් ගොඩබිම ආසන්න වූ බෙණ සිදුරු වසා ජලයට ආසන්නව බෙණ සාදත්ද එවිට වැසි නොමැති කාලය බවද දනිති. ඒ ධනිය ගව පාලකයාද වැසි ඇතිවන ලකුණු සළකා, වැසි කාලය ළංවූ විට අතුරු දූපතින් නික්ම මහාමහි ගඟෙන් එතරව, ගංවතුරෙන් යට නොවන තැනක තම වාසයට (සුදුසු තැනක්) හාත්පස අවුරා ගවහල්ද තනා සති හතක්ම වැසි වසිද්දී, එහි වාසය කළේය. දර, තණකොළ ආදිය රැස් කොටගෙන, සියළුම දූපුතුන්, දාසයන්, කම්කරුවන් එක්රැස්ව නොයෙක් අයුරින් කෑම සහ ආහාර පිළියෙල කොට තිබියදී සතරවටින් වැසි වළාකුළු හටගැනිණ. ඔහු දෙනුන් දොවා, ගවහල්හි ගවයන් බන්දවා, ගවයන්ට සිවුදෙසින්ම දුම් ගස්සවා, සියළුම සේවක පිරිස අනුභව කරවා, සියළු කටයුතු නිම කරවා, ඒ ඒ තැන පහල් දල්වවා තමන් කිරි හා බත් අනුභව කොට යහනට පිවිස, තම සිරිසම්පත් දැක සතුටු සිතින් යුතුව, බටහිර දෙසින් අහස ගොරවන හඬ අසා **පක්කොදනො දුද්ධඛීරො හමස්මි** ආදී ලෙසින් මෙම සතුටු හැඟුම් පළ කළේය.

මේ එහි තේරුම් හා විස්තරයි. **පක්කොදනො** බත පිසන ලදී. **දුද්ධඛීරො,** දෙනුන්ගෙන් කිරි දොවා ඇත. **අහං** යන්නෙන් තමා දක්වන ලදී. **අස්මි** තමා එසේ කළ බවයි. 'මම බත් පිස, කිරි දොවා ඇත්තෙමි යන තේරුමයි. **ඉති** මෙසේ කීය. තිදෙසයෙහි 'ඉති' යනු වචන සන්ධි කිරීමෙහි, වචන එක් කිරීමෙහි, වචනයෙහි අඩුබවක් පිරවීමේදී අකුරු එකතු කිරීමෙහි සිලුටු බව හා පිළිවෙලකට යෙදීමේදී භාවිත කරන බව සඳහන්ව ඇත. මෙසේ එහි අරුත් පෙන්වන ලදී. එය මෙහි සන්ධි වීමක් ලෙස දතයුතුය. පෙර පදයෙන් යම් දෙයක් කියන ලදද, ඒ ඒ කියන ලද දෙය වෙනුවෙන් 'මෙසේ කීය යැයි' (එවං+ආහ+ඉති) යන අදහස දක්වමින් 'ඉති' යනුවෙන්

පසු පදය සමග 'මෙත්තෙයොයා ඉති හෝ භගවා ඉති හෝ ආදී ලෙසින් පද සන්ධි වේ. වෙනත් ආකාර නොවේ. **ධනියො ගොපො** යනු ඒ සිටුපුත් හඳුන්වන නමයි. දාන සීල ආදී (මෙලොව පරලොව) වැඩදායක ධනය හැර, කෙත්වත්, උයන් වත් ආදී නොසෙල්වෙන (ථාවර) ධනයෙන්ද, ගවයන් අසුන් ආදී ජංගම ධනයෙන්ද, අමුරන්, රත්රන් ආදී එක්රැස් කරගන්නා ධනයෙන්ද, සිප් නිපුණතාවෙන් අතපය වෙහෙසා ලබන ධනය වැනි මේ පස් ආකාර වූ ධනයට වඩා පස්ගෝරස ලබා දීමෙන් ලෝකයාට සිදුවන උපකාරය සළකා 'ගවයා හා සමාන ධනයක් නැතැ'යි කියන ලද පරිදි මෙහි ගව සම්පත උසස්කොට දැක්වේ. එවන් ගව සම්පතක් අයිති ධනිය ගව පාලනය කරන බැවින් ගොපො නම් වෙයි. යමෙක් තමන්ට අයත් ගවයන් පාලනය කරත් ද ඔහු ගොපො යයි හඳුන්වනු ලැබේ. යමෙකු අනුන්ට බැලමෙහෙ කොට ගවයන් රැකබලා ගනීද ඔහු ගොපල්ලාය. මෙහි තමාම එම කටයුතු කරන බැවින් **ගොපො** යැයි කියන ලදී. **අනුතීරෙ** ඉවුර සමීපයෙහි, **මහියා** මහාමහී නම් වූ ගඟයි. සමාන වූ තමාට අනුකූලව සිටින පිරිවර ජනයා සමග වාසය කරන තැනැත්තා **සමානවාසො** මෙහිද ඒ ආකාර බැවින් **සමානවාසො** යනුවෙන් දක්වා ඇත. **ඡන්නා** යනු වැස්සෙන් නොතෙමෙන සේ (ඉළුක්, පිදුරු ආදී) තණකොළ හා කොළ ආදියෙන් සෙවිලි කරන ලද, **කුටී** වාසය කරන ගෙයට සමාන වචනයකි. **ආහිතො** බැබලෙන හෝ දල්වන ලද හෝ තේරුමයි. **ගිනි** ගින්දර, ඒ ඒ තැන්වල ගින්දර **ගිනි** යනුවෙන් වහරනු ලබයි. **අථ චෙ පත්ථයසි** දූත් යම් අයුරින්, කැමැත්තෙහි නම් යන අදහසයි. **පවස්ස** ජලය ඉසින්න, වගුරුවන්න, ජලය මුදා හරින්න යන අරුතයි. **දෙව** යනු වලාකුලට ඇමතීමයි. මේ එහි වචනවල තේරුමයි. මෙසේ මේ ධනිය ගව පාලකයා තම ඇඳෙහි වැතිර, අහස ගොරවන හඬ අසා **පක්කොදනො 'හමසම්'** යැයි කියමින් කයෙහි වෙහෙස නැති කරගනු පිණිසත්, කයෙහි සුව පහසුව සලසා ගැනීමටත් තම සිත තැන්පත් බව පෙන්වයි. **අනුතීරෙ මහියා** යනු වසන තැනින් ලබන සතුටයි. **සමානවාසො** එබඳු කැමති වූවන් හා වෙන්වීමෙන් ඇතිවන සෝකය නොමැති වීමයි. **ඡන්නා කුටී** සිරුරෙහි දුක්පීඩාදිය වැළකීමයි. **ආහිතො ගිනී**, ගොපල්ලන් යම් ආකාරයෙන් වටකොට, දුමෙන් හා දරවලින් යන තුන් අයුරකින් ගිනි දල්වත්ද, මොහුද එපරිදිම ඔහුගේ ගෙයිද ඒ සියල්ලම කරන ලදී. එහෙයින් සියළු දිසාවම (හැම පැත්තකම) වටකොට ගිනි (දැල්වීම) නිසා. **ආහිතො ගිනී** වල්සතුන් පැමිණීම වැළැක්වීම අදහස් වේ. ගවයන් මැදිකොට, ගොම ආදියෙන් දුම්ගිනි ගැසීමේදී මැසිමදුරුවන්ගෙන්

උන්ට පීඩා ඇති නොවේ. ගොපල්ලන් නිදන තන්හි දරවලින් ගිනි (දැල්වීම) නිසා ඔවුන්ට සීතල උවදුරු වැළකේ. මෙසේ, තමන්ට හෝ ගොණුන්ට හෝ සේවක පිරිසට හෝ වැස්සෙන් කිසිදු උවදුරක් නොවන බැවින්, මහත් සතුටට පත් ධනිය '**අථ චෙ පත්‍ථයසි පවසස දෙව**' යැයි කීය.

ධනිය මෙසේ කියන ගාථා, භාග්‍යවතුන් වහන්සේ, ජේතවන මහා විහාරයෙහි සුවඳවත් කුටියෙහි වැඩසිට, මිනිස් ගතිය ඉක්මවා යන ඉතා පිරිසිදු දිව කණින් ඇසූහ. ඒ අසා, බුදුඇසින් ලොව බලන සේක්, 'ධනියත් බිරිඳත් දෙදෙනාටම හේතුසම්පත් ඇත. මා ගොස් දහම් දෙසුවහොත් දෙදෙනාම පැවිදිව රහත් පලයට පැමිණෙන්නාහ, මා නොගියහොත් හෙට මහාජල ගැලීමෙන් වැනසෙන බවදැන, එකෙණෙහිම සැවැත් නුවරින් යොදුන් හත්සියයක් දුර, ධනියගේ නිවසට අහසින් වැඩමකොට ඔහුගේ කුටිය මත්තෙහි සිටියහ. ධනිය ඒ ගාථාව නැවත නැවතත් කියයි. භාග්‍යවතුන් වහන්සේ එහි ගියකල්හිද නොනැවතීම ගාථාව කියයි. 'එපමණකින් සතුටක් හෝ තහවුරු බවක් ඇති නොවේ, එය මෙසේ විය යුතු යැයි' පෙන්වාදීමට බුදුරජාණන් වහන්සේ **අක්කොධනො විගතඛීලො හමසමී** යන පිළිතුරු ගාථාව වදාළහ. එහි අකුරු සමතාවක් ඇතත් අදහස (ධනිය සිතන ලද දෙයට) සමාන නොවේ. පක්කොදන, අක්කොධන ආදී පදවල තේරුම මහ මුහුදෙහි එතෙර මෙතෙර මෙන් සමාන නොවේ. අකුරුවල කිසියම් සමානතාවක් ඇත. එහි මුල් ගාථාවේ සමාන පදවල තේරුම (කලින්) දක්වා ඇති පරිදි දතයුතුය. වෙසෙසින් දැක්විය යුතු පද ගැනද තේරුම්ද විස්තර කෙරේ.

**අක්කොධනො** නොකිපෙන බවයි. කෝපය ඇතිවූ විට, කලින් කියා ඇති පරිදි, ඇතමෙකුට එය දැඩිවම හටගෙන, හදවත තැවුල් ඇති කරමින් සංසිඳෙයි. කෝපය ඊට වඩා බලවත් ලෙස හටගත් කල ඇතමෙක් මුහුණ රැවීම් පමණක් කරති. වඩාත් බලවත් වූවිට, නපුරු වචන කියනු කැමතිව, හකු සෙලවීම පමණකුදු කරයි. ඊටත් වඩා බලවත් වූ විට නපුරු වචන කියයි. පසුව තවත් කෝපය බලවත් වීමෙන්, ලී කැබැල්ලක් හෝ ආයුධයක් හෝ සොයමින් වටපිට බලයි. පසුව තවත් බලවත් වූ විට දඬුමුගුරු ආදිය ගෙන එහා මෙහා දුවයි. තවත් බලවත් වූ විට එක් අයකුට හෝ දෙදෙනෙකුට හෝ පහර දෙයි. පසුව තවත් බලවත් වූ විට සහ ලේ නෑයන්ගේ වුවත් ජීවිත තොර කරයි. ඇතැම්විට, තවත් කෝපය

බලවත් වූ විට, සිංහල දිවයිනෙහි කාල නම් ගමෙහි විසූ ඇමති මෙන්, තම ජීවිතය වුවද තොර කර ගනී. කෝපය ඉතාම බලවත් වූ විට ඇත්තේ මෙපමණයි. එය භාග්‍යවතුන් වහන්සේ බෝමැඩදීම මුල් සිඳලන ලද තල්ගසක් මෙන් මුළුමනින්ම නැති කළ සේක. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **අක්කොධනො** 'හමසමී' යැයි කීහ. **විගතඛීලො** - උල් ඉවත් කරන ලද, සිතෙහි තද ගතිය අනුව එය පස් ආකාරයැයි කියන ලදී. සතර මසක් පුරා වැසි වැස්සත් වලගොඩැලි උල් සහිත බිමෙහි ධාන්‍ය නොවැඩේද, එසේම (කොධ ආදී) උල් ඇති සිතෙහි, සදහම් ඇසීම වැනි කුසලට හේතුවන වැසි වැස්සත් කුසල් නොවැඩේ. එබඳු උල් භාග්‍යවතුන් වහන්සේ බෝමැඩදීම සහමුලින්ම නැතිකරන ලදහ. එහෙයින් - **විගතඛීලො** හමසමී යැයි කීහ. එක් රැයක් වාසය කරන්නේය යන අරුතින් **එකරත්තිවාසො** වැසි පවත්නා මාස හතර පුරාම ධනිය එහි වාසයට පැමිණි සේ, භාග්‍යවතුන් වහන්සේට එසේ වාසය කිරීම අවැසි නොවේ. ඒ රැයෙහිම ඔහුට යහපත පිණිස එහි වැඩියහ. එහෙයින් **එකරත්තිවාසො** යැයි කීහ. විවටා සෙවිලි නොකරන ලද, **කුටී** සිරුරය. ඒ ඒ තේරුම් අනුව කය, ගුහා, දෙහ, සන්දෙහ, නැව, රිය, කොඩිය, තුඹස, පැල, කුඩාගෙය යනුවෙන් කියනු ලැබේ. මෙහිදී ලී දඬු ආදියෙන් (සකස් කරන ලද) ගෙය නමින් හැඳින්වෙන කුටිය මෙන්ම, ඇට ආදිය නිසා (සිරුර) කුටිය යැයි හඳුන්වා ඇත. 'ඇවැත්නි, ලී දඬු ද, වැල් ආදියද, මැටිද තණ (පිදුරු ආදිය) කොළද යොදා ගනිමින් ඉඩ ඇති තැනක සකස් කරන ලද දේ 'ගෙය' නමින් හඳුන්වනු ලැබේද, එසේම, ඇවැත්නි, ඇට, නහර, මස් හා සම හේතුකොට හිස් පරිසරයෙහි සකස්වන ලද දෙය 'රූපය' ලෙස හඳුන්වනු ලබයි. 'සෙය්‍යථාපි ආවුසො කට්ඨඤ්ච පටිච්ච වල්ලිඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච - තිණඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො අගාරන්තෙව සංඛං ගච්ඡති, එවමෙව ඛො ආවුසො අට්ඨිඤ්ච පටිච්ච නහාරුඤ්ච පටිච්ච මංසඤ්ච පටිච්ච චම්මඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො රූපන්තෙව සංඛං ගච්ඡති' යනුවෙන් වදාරා ඇති පරිදිය. සිත නම් වූ වඳුරාට වාසය වූ බැවින් කුටි නම් වේ. එහෙයින් මෙසේ වදාළහ.

සිරුර 'ඇට සැකිල්ලෙන් බැඳුනු කුටියක් ලෙසද එහි වාසය කරන වඳුරා පස් ඉඳුරන් නැමති දොරටුවලින් කුටිය දෙස බලමින්, ඒ දොරටුවල හැපෙමින් නැවත එහා මෙහා යයි.

අට්ඨිකංකලකුටිවෙසා මක්කටාවසථො ඉති
මක්කටො පඤ්චද්වාරාය කුටිකාය පසක්කිය,
ද්වාරෙන අනුපරියාති ඝට්ටයන්තො පුනප්පුනං

ඒ කුටිය, තණ්හා-මාන-දිට්ඨි නැමති වහලෙන් පුද්ගලයන් විසින් සෙවිලි කරන ලදින් නැවත නැවත රාගාදී කෙලෙස් වැස්සෙන් මැනවින් තෙමේ, එහෙයින් මෙසේ වදාරා ඇත.

ඡන්නමතිවස්සති විවටං නාතිවස්සති
තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සතී'

මේ ගාථා ඛන්ධකයෙහිද ථෙරගාථාවෙහිද යන දෙතැනක කියන ලදී. ඛන්ධකයෙහි, 'යමෙකු ඇවත සඟවත්ද, ඔහු කෙලෙස්වලින්ද නැවත නැවත ඇවැත්වලින්ද වඩාත් තෙමේ යමෙක් ඒවා නොසඟවත්ද (එයින්) නොතෙමේ. 'යො ආපත්තිං පටිච්ඡාදෙති, තස්ස නාතිවස්සන්ති' මේ තේරුම සඳහා කියන ලදී. ථෙරගාථාවෙහි, යමෙකු රාගාදියෙන් 'සෙවිලිකොට තිබේද, නැවත ඇතිවන බලාපොරොත්තු නම් වූ රාගාදියෙන් තෙමේ යැයි කියන ලදී. යමෙක් හටගත් කෙලෙස් ඉවසා සිටිත්ද එසේ ඉවසන ලද (ඇත් නොකරන ලද) කෙලෙස් නම් වූ (ඒ ආවරණයෙන්) සෙවිලි කිරීමෙන් සිරුර නම් වූ කුටිය නැවත නැවත කෙලෙස් වැස්සටම තෙමෙයි. අරහත් මග නුවණ නම් වූ සුළඟින් කෙලෙස් නැමති වහල සිඳ බිඳ දමන ලද තැනැත්තෙකුගේ 'කුටිය' විවරව ඇත. ඔහු (රාගාදි) වැස්සෙන් නොතෙමෙයි යනු මෙහි අදහසයි. භාග්‍යවතුන් වහන්සේ, යම්සේ වහලකට සමාන යැයි කියා ඇති දේ (හෙවත් කෙලෙස්) කියන ලද පරිදි සිඳ බිඳ දමන ලදහ. එහෙයින් විවටා කුටී යැයි කීහ. නිබ්බුතො, මැනවින් සන්සුන්-නිවුනු බවයි. ගිනි - ගින්නයි. එකොළොස් ආකාර වූ ගින්නෙන් මේ සියල්ල ඇවිල ගෙන ඇත. රාගාදි ගිනිවලින් ඇවිලීගෙන ඇතැයි එය විස්තර වේ. එම ගිනි භාග්‍යවතුන් වහන්සේ විසින් බෝමුල්හිදීම උතුම් මගපල නැමති සිහිල් දියෙන් නිවාලන ලදී. එහෙයින් නිබ්බුතො ගිනී යැයි වදාළහ. මෙසේ වදාරන අතරම, ධනිය පැහැදෙන අයුරින්, අවමන් නොකරමින් වෙනත් අයුරින් අනුශාසනා කරති. ඒ කෙසේද? ධනිය, ඔබ **අපෙක්කාධනො** යැයි කියමින්, **පක්කොදනො**'හමස්මි යැයි සතුටු වෙහි? ආහාර පිසගැනීමටද දිවි ඇතිතාක් ධනය වැය කළ යුතුය. ධනය වැය කිරීමද, රැකගැනීමද දුකට හේතුවේ. කරුණු මෙසේ හෙයින්, ඔබ දුකින්ම

සතුටු වෙහි. මම තරහ නැත්තෙමි'යි සතුටු වෙමින්, මෙලොව පරලොව දුක් නොමැති නිසා සතුටුවන බව පහදති. **විගතඛීලො** යැයි කියන ඔබ **දූදධ ඛීරොහමසමී** යැයි සතුටුව කටයුතු නොකරම, කටයුතු කරන ලදැයි සතුටු වෙහි, මම **විගතඛීලො** 'හමසමී යැයි සතුටුව කටයුතු කරන ලදුව සතුටු වෙමි. **අනුතීරෙ මහියෙකරත්තිවාසො** යැයි කියන ඔබ **අනුතීරෙ මහියා සමානවාසො** යනුවෙන් ද සතුටුවෙමින් මාස හතරක් නිබඳ වාසය කරහි. නිබඳ වාසයද වැඩිදෙනා සමග එක්ව-රැස්ව සිටීමයි. එයද දුකකි. කරුණු මෙසේ නම්, දුකින්ම සතුටු වෙයි. මම **එකරත්ති වාසො** යැයි නිබඳ වාසයෙන් තොරව තුටු වෙමි. වැඩිදෙනා සමග එක්ව, රැස්ව නොසිටිමි. එය සැපයකැයි සතුටුවෙමි'යි, පහදා දෙති. ඔබ **විවටා කුටී** යැයි පවසමින්, ගෙය සෙවිලි කරන ලද නමුත් සිරුර නම් කුටිය (ජීවිතය නමැති කුටිය) කෙලෙස් වැස්සට තදින් තෙමේ. සමහරවිට සතරදිගින් එන (කාම ආදී) මහා ජල පහරින් බොහෝ විපතකට පත්විය හැකිය. කරුණු මෙසේනම්, සතුටු නොවිය යුතු විටක ඔබ සතුටු වෙහි. මම **විවටා කුටී** යැයි සතුටුව ජීවිත කුටිය කෙලෙස්වලින් සෙවිලි කර නොමැති බැවින් සතුටු වෙමි. මෙසේ, මගේ විවර කර ඇති කුටිය කෙලෙස් වැස්සෙන් නොතෙමේ. සතර දෙසින් එන මහා ජලපහරින් (කාම ආදී) බොහෝ උවදුරුවලට පත් නොවෙමි. 'කරුණු මෙසේ හෙයින් සතුටු විය යුතු දෙයින් සතුටු වෙමි'යි පහදා දෙයි. **නිබ්බුතො ගිනී** යැයි (රාගාදී) එකොළොස් ආකාර වූ ගිනිවලින් වන උවදුරු වළකාලීමෙන් සතුටු වෙමි', '**අථ චෙ පත්ථයසි පවස්ස දෙව**' යැයි ඔබ පවසන වචන, දුක ඉවත හළ, සැපයට පැමිණි, සියළු කටයුතු නිමවූ අප වැන්නවුනට හොබී. **අථ චෙ පත්ථයසි පවස්ස දෙව** යැයි 'වැසි වැස්සත්, නොවැස්සත් අපට වෙසෙස් උපකාරයක් හෝ පාඩුවක් නැතැ'යි ඔබ කුමක් නිසා කියහිදැ'යි භගවයි. මෙසේ ධනියට සතුටු නොවිය යුතු තැනකදී සතුටුවීම වෙනත් අයුරින් වැරදි බව දක්වා (ඒ ගැන) අවවාද දෙයි, කරුණු පහදා දෙයි.

මෙම ගාථා ධනිය ඇසුවත්, 'කවරෙකු ගාථා කියතිදැ'යි නොවිමසා එය යහපත් දෙකැයි බොහෝ සතුටුවී නැවතද එබඳු දෑ අසනු කැමතිව **අන්ධකමකසා** යයි තවත් ගාථාවක් කීය. **අන්ධකා** යනු කණමැස්සන්ට සමාන වචනයකි. පිඟුවන් මැක්කන් යයි ඇතමෙක් කියති. **මකසා**- මදුරුවෝ, **න විජ්ජරෙ** - නැත. **කච්ඡ නදී** හා **පබ්බත** යැයි වගුරු බිම් පෙදෙස් දෙකකි. මෙහි නදී කච්ඡ අදහස් වේ. **රූළහතිණෙ**-වැඩුණු තණකොළ, **චරන්ති** ඒ තණකොළ කෑමට සැරිසරති. **වුට්ඨිම්පි කුණාටු**

වැසි ආදී නොයෙක් ආකාර වැසි, ඒ පිළිබඳව ආලවක සූත්‍රයෙහිදී පවසන්නෙමි. මෙහිදී වහින වැස්ස සළකා කියන ලදී. සහෙය්‍යුං ඉවසිය හැකි වෙමි. (දරාගත හැකි වෙමි) ඉතිරි වචන අපහසු නොවේ. මැසි මදුරුවෝ රැස්ව, ලේ උරා බී, මොහොතකින් (වෙනත් ගවපට්ටිවල) ගවයන් බොහෝ විපතට පමුණුවති. එහෙයින් වැස්සෙන් පසු ඒ ගොපල්ලෝ පස්වලින් ද කොළ අතුවලින් ද උන් මරති. මෙසේ වෙනත් ගවයන් මැසි මදුරු පීඩා විඳිමින්, ගමනෙහිදී වෙහෙසට පත්ව, සාගින්නෙන් මැරෙමින්, එක වැස්සක් වුව දරාගත නොහැකි වෙද්දී ධනිය තම ගවරැළට එබඳු මැසි මදුරු උවදුරු නොමැති බැවින් නොබියව නදී වගුරු බිමෙහි හැසිරෙමින්, වැඩුණු තණ කමින් ඉදිරියට යාමේදී සාගිනි වෙහෙසද නොමැති බව පවසයි. මගේ ගවයන් ඉහත කියන ලද උවදුරු නොමැති බැවින් දෙවරක් හෝ තෙවරක් හෝ වැසි වැස්සත් ඉවසා දරාගැනීමේ හැකියාව ඇතැයි පෙන්වා දෙයි. මෙසේ බයෙන් ධනිය එතැන සිටියද, ඔහු පැමිණ සිටින තැනට වඩා තමන් වහන්සේ 'පැමිණි තැන' වඩා උසස් බවද, සුන්දර බවද විස්තර කරමින් බද්ධා හි භිසි.... යන මෙම ගාථාව වදාළහ. අරුත් පමණක් දක්වමි.

**භිසි** යනු පැතිර, පුළුල් ව (හතරැස් හෝ දිග ව) බැඳි පහුරකට ලෝවාසීන් කියනු ලැබේ. උතුම් දහම් විනයෙහිදී එය අරිඅටඟි මගට සමාන වචනයකි. මග, පජ්ජ, වටුම, නැව, එතරවන පාලම, පහුර, භිසි, සක්මන, අද්ධාන, මූලය, මග මාවත පාර අරුතින් ඒ ඒ තැන සඳහන්ව ඇත.

**මග්ගො පජ්ජො පථො පන්ථො අඤ්ජසං වටුමායනං**
**නාවා උත්තරසෙතු ච කුල්ලො ච භිසි චංකමො**
**අද්ධානං පභවො චෙව තත්‍ථ තත්‍ථ පකාසිතො**

බද්ධාහි භිසි ගාථාවෙන් ද භාග්‍යවතුන් වහන්සේ පෙර පරිදිම ඔහුට ඔවදන් දෙමින් මෙම අරුත වදාළ බව දතයුතුය. 'ධනිය, ඔබ පහුරක් බැඳ මහී ගඟෙන් එතරව මෙතැනට පැමිණියෙහිය. නැවතද ඔබ විසින් එම පහුර බැඳිය යුතුම වන්නේය. ගඟද තරණය කළ යුතුය. එතැන බිය නැති තැනක් නොවේ. මා විසින් එකඟ සිතින් (අරිඅටඟි) මග පිළිවෙත් එක්කොට නුවණ නැමති බැඳුමෙන් එම පහුර බද්ධා එයද පරම අවබෝධය ලබාගැනීමට හේතුවන කරුණු තිස්හතක් මැනවින් වඩන

ලදුව, එක ලෙසටම පැවති බැවින්, එකිනෙක ඉක්මවා නොයමින් නැවත බැඳ තැබීම පල රහිත බැවින් ද දෙවි මිනිසුන් කිසිවෙකු මුදවන්නට නොහැකි බැවින්ද **සුසංඛතා**. ඔබද මහි ගඟින් එතරව, කලින් බලාපොරොත්තු වූ පෙදෙසට යතොත්, එසේ යන්නේ, සෝවාන් ඵලයට පත්වූවකු මෙන් (ඊට අයත්) 'පෙදෙසට' නොවේ. ඉක්බිති, එසේ එතරට ගියේ සියළු කෙලෙස් නසා, සියළු ඇලීම් ගැටීම් (ධම්ම) වලින් දුරුව, ඉතා උසස් වූ බිය රහිත වූ නිවනටය. **තිණ්ණො** දතයුතු සියළුම දේ මනාව අවබෝධ කොටගත්, දැනගත්, **පාරගතො** අරහත් බවට පත්, එසේ අරහත් බවට පත්වූයේ නම් කුමක් දුරු කරන්නේ ද? **විනෙය්‍ය ඕඝං** කාම ආදී සතරාකාර වූ මහ සැඩපහර තරණයකොට, ඉක්මවා එතරට ගියෙමි. දැන් මා විසින් නැවත තරණය කිරීමේ උවමනාවක් නොමැති බැවින් **අත්‍ථො භිසියා න විජ්ජති** එහෙයින් මා සඳහාම **අථ චෙ පත්‍ථයසී පවස්ස** දෙව යැයි කීමට වටී. එය අසා ධනිය පෙර පරිදිම **ගොපී මම අස්සවා** යන මේ ගාථාව කීය.

එහි **ගොපී** යැයි බිරිඳ ගැන කියයි. **අස්සවා** කියන දෙයට අනුකූලව, සොයා බලා විමසා කටයුතු කරන, කීකරු තැනැත්තියකි. **අලොලා** ගැහැණිය ඇළුම් කරන, කැමතිවන කරුණු පහකි. ආහාරයට ලොල් බව, විලාසිතාවනට ලොල්බව, අන් පිරිමින්ට ලොල් බව, මුදලට ලොල් බව සහ ඇවිදීමට ලොල් බව යනුවෙනි. එසේම ගැහැණිය බත්, කැවුම් වැනි පිටි යොදා සෑදූ කෑම, සුරා ආදී ලෙසින් ආහාරයෙහි ලොල් බැවින්, යටත් පිරිසෙයින් පිළුණු බත් හෝ අනුභව කරයි. වියළි බත් අහුරක් වුව කයි. දෙගුණයක් මුදල් වැයකොට වුව සුරා බොයි. වෙනත් අලංකාරයක් නොවේ නම්, යටත්පිරිසෙයින් වතුරෙන් හෝ හිසකෙස් පීරා මුහුණ පිරිමදියි. පිරිමින්ට ලොල් බවින් යටත් පිරිසෙයින් පුතකු වුව එබඳු දෙයක කැඳවීම් කරමින් පළමුව අයහපත් සේවනය ගැන කල්පනා කරයි. මුදලට ලොල් බැවින් 'හංසරාජයා අල්ලාගෙන රත්රන් ලබාගැනීමට ගොස් පිරිහීමට පත්වෙයි. (නිකරුනේ) ඇවිදීමෙහි ලොල්වූයේ මල්උයන් වැනි තැන් කරා යාමට කැමතිව, සියළු ධනය වනසා ගනී. ධනිය, එබඳු එකඳු ලොල් බවක් මාගේ බිරිය කෙරෙහි නැතැ'යි දක්වමින් **අලොලා** යැයි කීය. **දීඝරත්තං සංවාසියා** බොහෝ කලක් ඇය හා වසමින්, ළදරු කල පටන් එකට වැඩුණු බැවින්, එහෙයින් ඇය අන් පිරිමින් ගැන නොදන්නීය. **මනාපා** එසේ අන් පිරිමින් ගැන නොදැන, මා කෙරෙහිම කැමති වන්නී යැයි දක්වයි. **තස්සා න සුණාමි කිඤ්චිපාපං** මෙබඳු නම් ඇති කෙනෙකු

සමග කතා කළ බවක් හෝ පිළිසඳරෙහි යෙදුනු බවක් හෝ ඇයගේ කිසිදු අසංවර බවක් හෝ වරදක් හෝ ඇසීමි' යැයි ද දක්වයි.

මීළඟට භාග්‍යවතුන් වහන්සේ, ධනිය බිරිඳගේ එබඳු ගුණවලින් සතුටු වනවිට, ඔහුට ඔවදන් දෙමින් පෙර පරිදිම **චිත්තං මම අස්සවං** යන අරුත් පිරුණු සැසඳිය හැකි වචනවලින් යුතු මෙම ගාථාව වදාළහ. එහි පද පැහැදිලි කර ඇත. එයින් අදහස් වන්නේ මෙයයි. 'ධනිය, ඔබ, බිරිඳ මට කීකරුය, ඇළුම් කරන්නේ යැයි සතුටු වෙහි. ඇය ඔබට කීකරු වූවා හෝ, නොවූවා හෝ අනුන්ගේ සිත (ඔබට) දැනගත නොහැකිය. ගැහැණියකගේ සිත පොදුවේ ඔබට දත නොහැකිය. ගැහැණියක නම් කුස තුල තබා පරිහරණය කරතත් රැකීමට නොහැකිය. (කෙලෙස්වලින්) සිත රැක නොගත් බැවින්, ඔබ වැනි තැනැත්තන්ට, ගැහැණිය ඇළුම් කරන බව හෝ, එක්ව වාසය කරන බව හෝ මනාප බව හෝ පාපයට යොමු නොවූ බව හෝ දැනගැනීමට නොහැකිය. මට සිත කීකරුය. අවවාද පිළිගනී. මගේ වසඟයෙහි පවතී. මම සිතට වසඟව නොපවතිමි. එසේ මගේ වසඟයෙහි පවත්නා බව යමාමහ පෙළහර පෑමේදී පාට හයකින් ගිනිදැල් ද ජලධාරා ද විහිදුවන විට හැමදෙනාටම පැහැදිලි විය. ගිනි උපදවීමේදී තේජෝ කසිණයට සමවැදිය යුතුය. ජලය උපදවීමට ආපො කසිණයටත්, තේජෝ කසිණයට සමවැදිය යුතුය. ජලය උපදවීමට ආපෝ කසිණයටත්, නිල්පැහැය (දැක්වීමට) නීල කසිණයටත් සමවැදිය යුතුය. බුදුවරුන්ට එකවර සිත් දෙකක් නොපවතී. එකම සිත කීකරු කරන ලදුව (දමනය කරන ලදුව) මෙසේ (මගේ) වසඟයෙහි පවතී. එයදසියළු කෙලෙස් බැඳුම්වලින් ඉවත් වූ බැවින් නිදහස්ය. නිදහස් වූ බැවින් එහිම ඇලීමක් ඇත. ඔබ බිරිය ගැන සිතන අයුරින් නොවේ. දීපංකර බුදුරදුන් කල පටන්ම දිගුකලක් දානසීල ආදියෙහි සිත පුරුදු කරන ලද නිසා එක්ව වාසය කොට ඇත. ඔබ බිරිය ගැන සිතන අයුරින් නොවේ. මගේ සිත උතුම් වූ දමනය කිරීමෙන් දමුනු බවට පත්කරන ලද බැවින් මනාකොට සන්සුන්ය. එසේ මනාකොටම දමනය කරන ලදින්, තම ඉඳුරන් හය (හා ගැටෙන අරමුණු) අත්හැර දමා මාගේ සිතැඟි පරිදි වසඟයෙහි පවත්නා බැවින් මනාපං, ඔබ බිරිය ගැන සිතන අයුරින් නොවේ. **පාපං පන මෙ න විජ්ජති** යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ තම සිතෙහි පාප රහිත බව - ලාමක නොවන බව පෙන්වති. ධනිය මෙන්ම බිරිඳ එසේ නොවේ. ඒ පාප රහිත බව සම්මා සම්බුදු වූ කල පමණක් නොවේ. විසිනව වසරක් ගිහිගෙයි රාගීව විසූ කාලයටද අදාල කළ

යුතුය. එකල වුවත්, ගිහි දිවියටද නුසුදුසු, පණ්ඩිතයන්ගේ අවමනට ලක්වන පරිදි කයෙන් දුසිරිතය හෝ වචනයෙන් දුසිරිතය හෝ සිතින් දුසිරිත හෝ ඇති නොවූ විරූය. ඒ හැර, සම්බුදු බවට පත් නොවූ සය වසර තිස්සේත්, සම්බුදු බව ලද පසු වසරක් ද ලෙස, සත් වසරක්ම මාරයාද හිසකෙස් අගින් විදින ලද තරම්, සුළු වැරදි දෙයක් සොයමින් තථාගතයන් වහන්සේගේ පසුපස ගියේය. ඕහු වරදක් නොදැක සංවේගයට පත්ව, මෙම ගාථාව කීය.

> සත්ත වස්සානි භගවන්තං අනුබන්ධිං පදා පදං
> ඔතාරං නාධිගච්ඡිස්සං සම්බුද්ධස්ස සතීමතො

'සත් වසරක් තිස්සේම පියවරක් පියවරක් පාසා භාග්‍යවතුන් වහන්සේගේ පසුපස ගියෙමි. මනා සිහියෙන් යුතු සම්බුදුන් වහන්සේගේ (කිසිදු දොසක්) සොයාගැනීමට නොහැකි වීමි.

උත්තර නම් තරුණයෙක්, උසස් පැවිදි හැසිරීමෙහි වැරදි සොයමින්, සත් මසක්ම බුදුරජාණන් වහන්සේ පසුපස ගියේය. කිසිදු වරදක් නොදුටු ඔහු 'භාග්‍යවතුන් වහන්සේ පිරිසිදු හැසිරීම් ඇත්තාහ'යි (ආපසු) ගියේය. තථාගතයන් වහන්සේ නොරකින කරුණු හතරකි. එය මෙසේ කියා ඇත. 'චත්තාරි මානි භික්ඛවෙ තථාගතස්ස අරක්ඛෙය්‍යානි, කතමානි චත්තාරි?

පරිසුද්ධකායසමාචාරො භික්ඛවෙ තථාගතො නත්ථි තථාගතස්ස කාය දුච්චරිතං, යං තථාගතො රක්ඛෙය්‍ය, මා මෙ ඉදං පරො අඤ්ඤාසීති, පරිසුද්ධවචී සමාචාරො -පෙ- පරිසුද්ධ මනොසමාචාරො -පෙ- පරිසුද්ධාජීවො තථාගතො, නත්ථි තථාගතස්ස මිච්ඡාජීවො, යං තථාගතො රක්ඛෙය්‍ය, මා මෙ ඉදං පරො අඤ්ඤාසී'ති.....

'මහණෙනි, තථාගතයන් විසින් රැක නොගන්නා කරුණු සතරකි. ඒ කරුණු සතර කවරේද? මහණෙනි, තථාගතයන්ට කය පිළිබඳ වූ හැසිරීම් සමුදායක් ඇත. 'වෙනත් තැනැත්තන් මෙය දැන නොගනිත්වා'යි දුසිරිත් රැකගැනීමත් තථාගතයන්ට නැත. පිරිසිදු වචන හැසිරවීමත්, පිරිසිදු සිත් හසරත් ඇත. තථාගතයන්ට පිරිසිදු දිවි පැවතුම් ඇත. වෙනත් තැනැත්තන් මෙය දැන නොගනිත්වා'යයි වැරදි දිවි පෙවතක් තථාගතයින්ට නැත. මෙසේ තථාගතයන් වහන්සේගේ සිතට යම්බඳු වූ අයහපත් දේ

සම්මා සම්බුදු කාලයේ පමණක් නොව, ඊට පෙරද නැත්තේමය. එහෙයින් **පාපං පන මෙ න විජ්ජති** යැයි වදාළහ. එහි අදහස නම්, මගේ සිතෙහි අයහපත ගැන ඇසිය නොහැකිය. ඔබගේ බිරිය එසේ නොවේ. එහෙයින් එබඳු ගුණයෙන් සතුටුව **අථ චෙ පත්‍ථයසි පවස්ස දෙව** යැයි කිවයුතු නම්, කිවයුත්තේ මා විසින්මය. එයද ඇසූ ධනිය තවදුරටත් යහපත්, මිහිරි දෙයක් පානය කරනු කැමතිව, තමාගේ නිවහල් බව දක්වමින් **අත්තවෙතනභතො හමස්මි** යැයි කීය.

එහි **අත්තවෙතන භතො** යනු තමාම කෑම, ඇඳීම උපයාගෙන යැපෙන, තමන්ම අදාල කටයුතුවල යෙදී ජීවත්වෙමි. වැටුපක් ලබාගෙන අනුන්ට වැඩ නොකෙරෙමි'යි දක්වීය. **පුත්තා** යනු දූවරු හා පුත්තු ද වෙති. ඔවුන් සියල්ලන්ටම පුතුන් ලෙස එක වචනයෙන් කියනු ලැබේ. **සමානියා**, සන්සුන්ව, තැන්පත් වූ ගති ඇති, වෙන්ව-පිටත නොවසන, **ආරොගා** ආබාධවලින් තොර බව, ඒ සියළුදෙනාම අත් පා වෙර වීරිය ඇත්තාහ. **තෙසං න සුණාමි කිඤ්චි පාපං** ඔවුන්ට සොරුන් යැයි හෝ, අන් අඹුවන් කරා යන බවක් හෝ අවිනීත යැයි හෝ කිසිදු අයහපත් දෙයක් කියනු නො අසමි. ධනිය මෙසේ කීවිට භාග්‍යවතුන් වහන්සේ පෙර පරිදිම ඔහුට ඔවදන් දෙමින් **නාහං භතකො** මේ ගාථාව වදාළහ.

මෙහි පද අරුත් පැහැදිලි කර ඇත. එයින් අදහස් වන්නේ මෙයයි. ඔබ 'මම නිවහල් වෙමි'යි කියා සතුටු වෙහි. නියම ලෙස, නිවැරදිව තමන්ගේම කටයුතු සොයා බලා කරමින් ජීවත් වුවත්, තණ්හාවට දාස වූ බැවින් දාසයෙක්ම වෙහි. මෙහෙකරුවකු නොවන්නේ යැයි කීමෙන්ද නොමිදුනේ වෙහි. 'ලෝකයා හැමවිටම ලැබෙන දේ අඩුයැයි සිතා, තණ්හාවට වසඟව, සෑහීමකට පත් නොවේ. ඌනො ලොකො, අතිතෙතා තණ්හාදාසො' යැයි එහෙයින් කියන ලදී. **නාහං භතකො** හමස්මි ඇත්තෙන්ම මම කිසිම කෙනෙකුගේ හෝ තමන්ගේ හෝ මෙහෙකරුවකු නොවෙමි. කුමක් හෙයින්ද? **නිබ්බිට්ඨෙන චරාමි සබ්බලොකෙ** මම දීපංකර බුදුරජාණන් වහන්සේ පාමුල විවරණ ලත් තැන් සිට සම්බුදු බව ලබනතාක් සියල්ල දන්නා වූ නුවණ ලබාගැනීමට කටයුතු කළෙමි. එම නුවණ ලද පසු, අවුල් නිරවුල් කරන රාජ භටයකු මෙන්, අවුල් බේරා, සියල්ල දන්නා නුවණින්, මෙලොව ජීවිතයෙන් එහා වූ, ලොව්තුරු සමාධි සුවයෙන්ද ජීවත් වෙමි. ඒ මට මීට වඩා කළයුතු කිසිවක් නොමැතිව නැවත ඉපදීම නැතිකළ තැනැත්තන්ගේ තත්ත්වයට පත්විය යුතුය. **අත්‍ථො භතියා න**

විජ්ජති (ඒ අදහසයි) **භරියා** යනුවෙන් ද සඳහන්ව ඇත. එසේ වහල් බවෙන්, දාස බවෙන් නිදහස් වූ සතුටින් 'කැමති නම් වැස්ස වසිනු මැනවැ'යි කිවයුතුය. එය කිවයුත්තේ මා විසිනි. ඒ අසා ධනිය, යහපත් වූ කරුණු ඇසීමෙන් සෑහීමකට පත් නොවී, තමාගේ පස් ආකාර වූ ගව පට්ටියේ මනා පිරිපුන් බව දක්වමින් **අත්ථි වසා.........** ගාථාව කීය.

එහි **වසා** යනු දමනය නොවූ වැඩිවයස් වූ වස්සන්ය. **ධෙනුපා** දෙනුන්ගෙන් කිරි උරා බොන තරුණ පැටවුන් හෝ කිරි ලබාදෙන එළදෙනුන් හෝ ගවයන් ය. **ගොධරණියො** ගැබිණි දෙනුන් ය. **පවෙණියො** වැඩිවියට පත් ගොනුන් සමග මෙවුන්දම් පතන වැස්සියන්ය. **උසභො ගවම්පතී** - නායක ගවයා ය. ගොපල්ලන් විසින්, නායක ගවයා උදෑසනින්ම නහවා, කවා, සඳුන් කල්කයෙන් ඇඟිලිපහේ සලකුණු තබා (ගෙල) මල් පළඳවා, 'එන්න දරුව, ගවයන් තණබිම් කරා කැඳවාගෙන ගොස්, රැක බලාගෙන ආපසු ගෙන එව'යි පිටත් කර යවනු ලබයි. එසේ යවන ලද නායක ගවයා නුසුදුසු තැන් වළකා, ගොදුරු බිම්හි හසුරුවා, සිංහ, වලස් ආදීන්ගෙන් වන බිය වළකා, රැකවරණය සලසා ආපසු සිටි තැනටම ගෙන එයි. එබඳු නායක ගවයෙකු මගේ මේ ගවරැළෙහි සිටී යැයි දක්වයි. එසේ කී කල භාග්‍යවතුන් වහන්සේ ධනියට අවවාද දෙමින් මෙම (පිළිතුරක් බඳු) වෙනත් ආකාර අදහස් ඇති **නත්ථි වසා** යන ගාථාව වදාළහ.

මෙහි අදහස මෙබඳුය. අප සසුනෙහි (කෙලෙසුන් තවමත්) දමනය නොවූ, වැඩිහිටි හා (කෙලෙසුන් මැඩ) නැගී සිටි (සඟ පිරිස) ඇත. තරුණ වස්සන් හා සසඳමින් එහි මුල් අරුත ගැනේ. කෙලෙස් වැගිරෙන ගතිය නිසා (පැවිදි පිරිසෙන් කොටසක්) කිරි එළදෙනුන් වැනිය. සැඟවී ඇති රාගාදි (අනුසය) දෙනුන් මෙනි. නැවත භවයක පිළිසිඳ ගැනීමක් (මවුකුස රැඳීමක්) හෝ එසේ සසර ගමන ඇතිකරවන ගොධරස නම් වූ පුඤ්ඤ, අපුඤ්ඤ, ආනෙඤ්ජ නම් වූ සකස් වූ හේතු (සංඛාර) හෝ පැතුම් රැසකින් යුතු ආසා හෝ අධිපති බවින් මුල්තැන ගනු ලබන උසස් නායකයකු බඳු ගවම්පති උසභ ලෙස සැලකෙන (පසු භවයකට එක්වන) විඤ්ඤාණයක් හෝ මට නැත. මම මේ කාම ආදී සියළු එක්රැස් කිරීම් හා නොබැඳෙන හෙයින් ඒවා නැතැයි සතුටු වෙමි. ඔබ සෝකය ඇතිවන සම්පත් ආදිය ඇතැයි සතුටු වෙහි. එහෙයින් සියළු බැම්වලින් මිදී සතුටුවන මට ම 'කැමති නම් වැස්ස වසිනු මැනවැ'යි කීම සුදුසුය. ඒ

අසා ධනිය, තවදුරටත් යහපත් දෙයෙහි වටිනා හරයක් ලබනු කැමතිව, තම ගවරැළ කණුවල බැඳ ඇති අයුරු බීලා නිඛාතා ආදී ලෙස කීය.

එහි **බීලා** යනු ගවයන් බැඳ ඇති කණු ය. **නිඛාතා** පොළව සාරා තදට සවිකොට ඇති (ඒ ඒ ගවයන්ට ගැලපෙන පරිදි) කුඩා, මහත් කණු, **අසම්පවෙධී** නොසෙල්වෙන, දාමා වස්සන් බඳිනු පිණිස ගොතා සකස් කරන ලද ලණු වෙසෙසකි. **මුඤ්ජමය** (බට වැනි) තණකොළ වර්ගයකින් කරන ලද, **නවා** අළුත්, **සුසණ්ඨානා** මනාව පිහිටුවා ඇත. **නහි සක්ඛිනති** නොහැකි වන්නේමය. **ධෙනුපාපි ඡෙත්තං** තරුණ වස්සන්ට වුවද කැඩීමට (නොහැකිය.)

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ, (දහම්) කරුණු අවබෝධ කරගැනීමට තරම් ධනියගේ සිත සකස් වූ බව දැන, පෙර පරිදිම ඔහුට ඔවදන් දෙමින් මෙම සිවුසස් දහම ඇතුලත් '**උසභොරිව ඡෙත්වා**' යන ගාථාව වදාළහ.

**උසභ** නම් ගවරැළ රකින, උන් පාලනය කරන, උන්ට නායක වූ ගොනාය. ඇතමෙක්, ගවයන් සියයකට දෙටු වූයේ උසභ යැයි ද, ගවයන් දහසකට දෙටු වූයේ වසභ යැයි ද ගවයන් සියදහසකට දෙටු වූයේ නිසභ යැයි ද කියති. තවත් සමහරෙක් එක් ගම්කෙතකට නායක ගවයා උසභ බවත් ගම් කෙත් දෙකකට නායක ගවයා වසභ බවත් කියති. බොහෝවිට නිසභ යන්න සඳහන් නොවීම අතපසුවීමකි. එසේ වුවත්, උසභ හෝ වසභ හෝ නිසභ යැයි සියළු වචන යෙදෙන අයුරු ගළපා දතයුතුය. 'පින්වත් සමණ ගොතම ඉතා උසස් ගවයෙකි. 'නිසභො වත භො සමණො ගොතමො' යැයි කියා ඇති පරිදිය. (උසභොරිව) මෙහි 'ර' වචනය සන්ධි කිරීමෙහි යොදා ඇත. **බන්ධනානි** ලණුවෙන්, කඹයෙන් බැඳීමය. කෙලෙස්වලින් බැඳීමද ගැනේ. **නාගො** ඇතා ය. **පූතිලතං** රසකිඳ වැනි වැලකි. සිරුර රන්පැහැ වුවත් කුණු කයකි. සියවසක් ගතවුවත් බල්ලාමය. එදවසම උපන් සිවලා වුවත් ජරසිවලාය. මෙසේ අළුතින් හටගත් රසකිඳ වැනි වැලක් වුවත් හරයක් නැති අරුතින් පූතිලතා යැයි කියනු ලැබේ. **දාලයිත්වා** සිඳ, (කලලය මවුකුසෙහි නිදා සිටින ලෙස **සැකසී** ඇති පරිදි ගැබ ද නිදාගන්නා ඉරියව්ව හෙවත් සෙය්‍යාවද) **ගබ්භසෙය්‍යං** නම් වේ. එහි **ගබ්භ යනුවෙන්** වැදූමහෙන් **ඉපදීම සැළකේ**. **සෙය්‍ය යන්නෙන් වෙනත් ඉපදීම් සැළකේ.** ගබ්භසෙය්‍ය යන වචනයෙන්

ඒ සියළුම උපත් අදහස් වන බව දතයුතුය. එහි වචනවල තේරුම් දක්වා ඇත. මෙසේ විස්තර කළ හැකිය. 'ධනිය, ඔබ බැඳීමෙන් සතුටු වෙහි, මම බැඳුම් පිළිකුල් කරමින්, බලවත් වෙර වීරියෙන් යුතු මහා උසභයෙකු මෙන් උද්ධම්භාගිය සංයෝජන පහ - සිවුමග (රහත්ඵල) බලාපොරොත්තුව නැමති වෙර යොදා කඩා ඇතෙකු රසකිඳ වැල කඩන්නා සේ එබඳු වැලක් හා සමාන ඔරම්භාගිය සංයොජන පහ සකදාගාමී නම් වූ තුන්වන මග දක්වා වූ වෙර වඩමින්, කපා-කඩා දමා (සිටිම්) නැතහොත්, කෙලෙස් බැඳීම් ඇති හරකෙකු මෙනි. ඇතා රසකිඳ වැල සිඳබිඳ දමන්නා සේ කෙලෙස් සිඳ බිඳ දැමූ බැවින් නැවත මවුකුසකට නොපැමිණෙමි. ඒ මම ඉපදීම ආදී කොට ඇති සියළු දුක්වලින් මිදීමෙන්, තුටුව, කැමති නම් වැස්ස වසින්න යයි කියමි. එහෙයින් ඔබද මා පරිදිම එසේ කීමට කැමැත්තෙහි නම්, ඒ බැඳීම් කඩාබිඳ දමව. මෙහි බැඳීම් (සසර ගමනෙහි) හේතු - සමුදය සච්ච වේ. (ඉහත දැක්වූ පරිදි) ගබ්භ සෙය්‍ය - දුක්ඛ සච්චය නොපැමිණෙන්නාහ යනුවෙන් රූපාදි සමූහ පහ (පංචක්ඛන්ධ) සමගම පිරිනිවනට පත්වීම අනුපාදිසෙස වේ. කෙලෙස් සිඳ බිඳ දමා ජීවිතය පවත්වා ගැනීමෙන් පසුව පිරිනිවීම සඋපාදිසෙස නම් වූ නිරෝධයයි. යම් දෙයකින් (කෙලෙස්) සිඳී ද, පලයි ද එය මග්ග සච්චයයි. මේ ආකාර වූ සිවුසස් දක්වෙන ගාථාව අසා අවසානයෙහි ධනිය ද බිරිය ද දූවරු දෙදෙනා ද යන සතර දෙනාම සෝවාන් පල ලදහ. ඉක්බිති ධනිය, බෙහෙවින් පැහැද තථාගතයන් වහන්සේ කෙරෙහි මුල සිටම පිහිටි සැදැහැවෙන් (ඇති සේ ඇති සැටියෙන් දකින) නුවණැසින් (පඤ්ඤා) භාග්‍යවතුන් වහන්සේගේ දහම් කය (හඳුනා) දැක දහමෙන් පිබිදුනු හදවතින්, 'බැඳුම් සිඳබිඳ දැමීම්, නැවත මවුකුසක පිළිසිඳීමක් මට නැත. 'අවීචිය කෙළවරකොට ඉහළම බඹලොව තෙක් (භවග්ග) භාග්‍යවතුන් වහන්සේ හැර අන් කවරෙක් මෙබඳු උසස් සිහනදක් පවත්වන සේක්ද? ඒ උතුම් මග පෙන්වන නායකයාණන් වැඩිසේක් නොවෙත්ද'යි සිතුවේය. මේ අතර, භාග්‍යවතුන් වහන්සේ, රන් රස වගුරුවන්නාක් වැනි සවණක් රැස් මාලාවෙන් විසිතුරු වූ සිරුරෙන් ආලෝකයක් ධනියගේ නිවෙස්නට මුදාහළ සේක් 'නියම සුවය දකින්නැ'යි කියන්නාක් මෙනි. ඉක්බිති ධනිය, සඳහිරු ඇතුලට පිවිසියා සේ, හාත්පස දැල්වෙන පහන් දහසකින් බබලන්නාක් වැනි වූ නිවහන දැක, 'භාග්‍යවතුන් වහන්සේ පැමිණිසේකැ'යි සිතුවේය. එකෙණෙහිම මහ වැස්සක්ද ඇදහැළුණි. **නින්නඤ්ච ථලඤ්ච පූරයන්තො** යැයි සංගායනාවට සහභාගි වූ හිමිවරු ඒ ගැන කීහ.

**නින්නං** කුඩා විල් වැනි වතුර රැඳෙන තැන් හෝ මඩ වගුරු, ථලං බෑවුම් තැන්, මෙසේ උස් බෑවුම් හා පහත් ඉවුරු ඇති සියළු තැන් සමකොට පුරවමින් - උතුරා යමින් මහා වැසි වැස්සේය. වසින්නට පටන් ගත් බව කියන ලදී. **තාවදෙව** යම් මොහොතකදී භාග්‍යවතුන් වහන්සේ රැස් ආලෝකය මුදාහළ සේක්ද, ධනිය ද 'මාගේ නායකයාණන් වහන්සේ පැමිණිසේකැ'යි තම සිත පිරුණු සැදැහැ ආලෝකය මුදාහළේය. එවේලෙහිම වැසි ඇදහැලිණ. ඇතමෙක් එවිටම හිරු උදාවූයේ යැයි ද පවසති. මෙසේ ධනිය ඒ සැදැහැ උපදවන බුදුරැස් ආලෝකය නැමති හිරු උදාවන කලක මෙන් වැසි වසින හඬ අසා බොහෝ සතුටුව **ලාභො වත නො අනප්පකො** යන මෙම අරුත් බර ගාථා දෙක කීය. මෙහිදී ධනිය දූ පුතුන් සමග, මෙලොවදී ලද මසැසින් භාග්‍යවතුන් වහන්සේගේ රූපකාය දැක, සැදැහැ බව ලැබ, ලොවුතුරු ඇසින් ලද උතුම් මගපල අවබෝධයෙන් දහම් කය දැක, 'ඒකාන්තයෙන්ම භාග්‍යවතුන් වහන්සේ අප දුටුවෙමු, එය අප ලැබූ මහත් ලාභයකැයි කීය.

එහි **වත** පුදුමය හඟවන නිපාත පදයකි. නො - අපට - අපගේ, අනප්පකො බොහෝ, ඉතිරි පද කලින් පැහැදිලි කරන ලද පරිදිය. **සරණං තං උපෙම** - මගපල ලබනු පිණිස සරණගමනය සිදුකරන්නේ නම්, එහි තිර ලෙසම සරණයෙහි පිහිටා, වචනයෙන් කියා තමා කෙරෙහි දරාගෙන, හෝ තමාට අයිති සේ තහවුරු කරගනී. (දහම දකින) මගක් ලෙස හෝ තමා කෙරෙහි පිහිටා ගත් සරණ යෑම වෙනස් නොකොට, එය අනුන්ටද වචනයෙන් තහවුරු කරන නමස්කාර කොට ගරු කිරීමකි. මසැස, දිවැස, පැණැස, හාත්පස පැතිරුණු නුවණ හා බුදුඇස යන පස්ආකාර වූ ඇස් ඇති **චක්ඛුමා**, එබඳු වූ බුදුරජාණන් වහන්සේට අමතමින් **සරණං තං උපෙම චක්ඛුමා** යැයි කීය. **සත්ථා නො හොති**, **තුවං මහාමුනී** යන මෙම වචන සිසුවකු බවට පත්ව සරණයාම සපුරාලන්නට කීය. **ගොපී ච අහඤ්ච අස්සවා බ්‍රහ්මචරියං සුගතෙ චරාමසෙ** යනු වෙනස් නොවන සමාදන් වීමකි. **බ්‍රහ්මචරියං** මෛථුන වැළකීම, මග, සසුන, එකම අඹුසැමි සැහීමකට පත්වීම යන කරුණුවලට සමානව යෙදේ. 'බ්‍රහ්මචාරී ආරාචාරී' යන තන්හි බඹසර හැසිරෙයි. දුරුකොට හැසිරෙයි යනුවෙන් ලිංගික සබඳතාවෙන් වැළකීම අදහස් වේ. 'ඉදං ඛො පන පඤ්චසික්ඛ, බ්‍රහ්මචරියං එකන්ත නිබ්බිදාය, පඤ්චසිඛය, මේ බඹසර හැසිරීම (සසර දුකෙහි) නියත කලකිරීමට හේතු වේ. මේ ආදී තන්හී (පිළිපැදිය යුතු) මගයි. 'අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත, චතුරංග සමන්නාගතං බ්‍රහ්මචරියං චරිතා' සාරිපුත්ත,

මම සිවු ආකාර වූ බඹසර හැසිරුන බව දනිමි යන තැන මහණදම් පිළිවෙතට අදාළ වේ. 'තයිදං බ්‍රහමචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච' මේ බඹසර දියුණුව පිණිස වැඩිදියුණුව යහපත පිණිස පවතී. මේ ආදී තැන සසුන අදහස් වේ.

"මයඤ්ච හරියා නාතික්කමාම - අම්හෙ ච හරියා නාතික්කමන්ති
අඤ්ඤත්‍ර තාහි බ්‍රහමචරියං චරාම තස්මා හි අම්හං දහරා න මීයරෙ"

'අපි ද (අපේ) බිරියන් ඉක්මවා නොයමු. බිරින්දෝද අප ඉක්මවා නොයති. ඔවුන් හැර අපි බඹසර හැසිරෙමු. එහෙයින් අපගේ (ළමා-තරුණ කල) දරුවෝ නොමියෙති.' මෙම ගාථාවෙහි බ්‍රහමචරියං යෙදුනේ අඹුසැමි සෑහීමට පත්වීම ගැනයි. 'ඉධ පන සමණධම්ම බ්‍රහමචරිය පුබ්බංගමං' 'මහණ, මෙම මහණදම් සඳහා බඹසර පෙරටු වෙයි. 'පිළිවෙත් මග හැසිරීම අදහස් කෙරේ. සුගතෙ බුදුරදුන් සමීපයෙහි භාග්‍යවතුන් වහන්සේ දුකසැප දෙමගෙහිම අන්තගාමී නොවී, මැනවින් ගිය බැවින්, මනහර වූ අරිඅටඟි මගෙහි ගමන් කළ බැවින්ද, යහපත් වූ 'නිවන' යැයි හඳුන්වන 'තැනට' ගිය බැවින්ද සුගත යැයි කියනු ලැබේ. සමීප අරුතෙහි සත්තමී විබත්ය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ සමීපයෙහි යන තේරුමයි. චරාමසෙ හැසිරෙමු. ගරු බව දක්වෙන අයුරින් 'චරාමසී' යැයි කියනු ලබයි. එය මෙහි 'චරාමසෙ' යයි කියනු ලබයි. අටුවා ඇදුරෝ 'සෙ' නිපාතයකැයි කියති. මෙහි එය ඉල්ලීමක් සඳහා චරෙම සෙ යනුවෙන් යෙදුණැයිද කල්පනා කරති. කැමති පරිදි යොදාගත හැකිය. මෙසේ ධනිය බඹසර හැසිරීම සළකමින් භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිදි කරන ලෙස ඉල්ලා පැවිදි වීමේ පලය බලාපොරොත්තුවෙන් ජාතිමරණස්ස පාරගා දුක්ඛස්සන්තකරා භවාමසෙ යැයි කීය. ඉපදීම-මරණයෙහි එතරවීම නම් නිවනය. එය අරහත් මගින් ළඟා කරගනිමු. දුක්ඛස්ස සසර දුක, අන්තකරා අවසන් භවාමසෙ වෙමු. නැතහොත් ඒකාන්තයෙන්ම අපි එසේ වන්නෙමු. චරාමසෙ ගැන කී ලෙසින්ම එය දතයුතුය.

මෙසේ කියා, නැවත ඔවුහු දෙදෙනම භාග්‍යවතුන් වහන්සේට වැඳ 'අප පැවිදි කරන සේක්වා'යි ඉල්ලූහ. ඉක්බිති පව්ටු මාරයා ඒ දෙදෙනා නමස්කාර කරමින් පැවිද්ද ඉල්ලනු දැක, 'මොවුන් මගේ බලය ඉක්මවනු කැමති වෙති. ඒ නිසා ඔවුන්ට අනතුරක්, බාධාවක් කරමි'යි

අවුත් ගිහිගෙයි ගුණ දක්වමින් **නන්‍දති පුත්‍තෙතහි පුත්‍තිමා** යන මේ ගාථාව කීය.

**නන්‍දති** සතුටු වෙයි. **පුත්‍තෙහි** පුතුන්ගෙන්ද දූවරුන්ගෙන්ද, සම සහයෝග අරුතෙහි හෝ කරණ කොටගෙන අරුතෙහි කරණවිබත්ය. **දූපුතුන් සමග සතුටු වෙයි.** දූ පුතුන් නිසා සතුටු වෙයි. **පුත්‍තිමා** දූ පුතුන් ඇති තැනැත්තා, **ඉති** මෙසේ කීය යන අදහසයි. මාරො වසවත්ති දෙව්ලොවෙහි එක්තරා දාමරික දෙව්පුතෙකි. ඔහු ඔහුගේ බලය ඉක්මවා කටයුතු කරන කෙනෙකු වෙත්ද ඔහු මරයි. එය කළ නොහැකිවිට එබඳු කෙනෙකුගේ මරණය වුව කැමති වෙයි. එහෙයින් මාරයා යැයි කියනු ලැබේ. **පාපිමා** අයහපත් ගති පැවතුම් ඇති පහත් තැනැත්තෙකි. එම වචන සංගායනාවට සහභාගී වූ හිමිවරුන්ගේය. සියළු ගාථා එබඳුය. දූපුතුන් ඇති තැනැත්තා දූපුතුන් ඇතැයි සතුටුවන්නා සේ ගොමියො **හොති, තථෙව නන්‍දති** ගවයන් හිමි තැනැත්තා ද තමාට ගව සම්පත ඇතැයි එසේම සතුටු වේ. මෙසේ කියා මීළඟට ඒ අදහස තහවුරු කරනු පිණිස **උපධී හි නරසස නන්‍දනා** යැයි කරුණු දක්වයි. කාම උපධි, ඛන්‍ධූපධි, කිලෙස උපධි, අභිසංඛාර උපධි යැයි සිවු ආකාරය. 'යං පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං කාමානං අස්සාදො' - පස්කම්හි සැප ඇතැයි සළකා, එයින් මිහිරක් සතුටක් ලබයිද, මේ කාම වින්දනයයි. මෙසේ සැපයකැයි සළකා ඒ අදහස් (රඳවා ගැනීම) උපධි ලෙස ගැනේ. රූපාදි පස්කඳෙහි දුක පැවතියද එහි සැපයැයි සිතීම ඛන්‍ධූපධි නම් වේ. කෙලෙස් සහගත බව අපා දුකට හේතුවෙන් කිලෙසූපධි වේ. (කරන, කියන, සිතන කටයුතුවලින්) එකතු වන සංඛාර ආදීකොට සසර දුකට හේතුය. මෙහිදී කාම උපධි හෙවත් පස්කම්හි ආසා අදහස් කරන ලදී. එය පුද්ගල සංඛාර යැයි දෙආකාරය. එහි සසර සැරිසරන පුද්ගලයා අතර ඇති සබඳතාව මූලික වේ. එය දක්වමින් පුතුන් හා ගවහිමියා ගැනද **උපධි හි නරසස නන්‍දනා** යැයි කීය.

එහි තේරුම මෙසේය. මේ ලෙසකින් මෙම කාම ආසා මිනිසා සතුටට පත්කරයි. මිනිසාට සතුට - සොම්නස එක්තැන්කොට ලබාදීමෙන් සතුට දනවනු ලබයි. එපරිදිම දූපුතුන් ඇති තැනැත්තා දූ පුතුන්ගෙන්ද ගව හිමියා ගවයන්ගෙන්ද සතුටු වෙතියි, ඒ ආකාරයෙන් දත යුතුයි. ඔබ ද දූපුතුන් ඇත්තෙකි, ගව හිමියෙකි. එහෙයින් ඒවායින් සතුටුවන්න. පැවිද්ද බලාපොරොත්තු වන්නට එපා. පැවිදි වූ කෙනෙකුට එසේ සතුටුවීමට

කරුණු නැත. එසේ හෙයින් ඔබ දූක කෙළවර කිරීම පතමින්ම, දූකට පත්වන්නෙක්ම වන්නෙහි? දූන් ඒ කරුණුවලට හේතු දක්වමින්ම **න හි සො නන්‍දති යො නිරූපධී** යනුවෙන් කීය.

එහි තේරුම මෙසේය. යම් තැනැත්තකුට එවැනි උපධි නැත්ද ඔහු කැමති නෑදෑයන්ගෙන් වෙන්ව, සැප සම්පත් පල නොලැබ සතුටු වන්නේ නැත. එහෙයින් ඔබ එවැනි දේ අතහැර දමා පැවිදි වේනම්, දූකටම පත්වන්නෙහිය. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ, 'මේ පාපී මාරයා මොවුන්ට අනතුරු පිණිසම පැමිණියේ යැයි දූන, ගෙඩියකින් (ගසා) ගෙඩියක් (බිම) පතිත කරන්නාක් මෙන් ඒ මාරයා විසින්ම ගෙනහැර දක්වන ලද උපමාවම දක්වා මාරයාගේ මතය බිඳලමින් පෙරළා එම ගාථාවටම උපධි යන්නට අරුත් දක්වමින්, එය සෝකයට හේතුවන අයුරු **සොචති පුත්තෙහි** යැයි වදාළහ.

පද අරුත් ලෙස එහි සියළු කරුණු ඉහත දක්වා ඇත. මේ එහි විස්තරයි. 'පවිටු මාරය, **නන්‍දති පුත්තෙහි පුත්තිමා** යැයි මෙසේ නොකියව. සතුට දනවන, මනාප වූ සියළු දෙයෙහි වෙනස්වීම හා නැතිවන ගතිය ඇත. මෙම නියමය ඉක්මවාලිය නොහැකිය. එබඳු පියමනාප වූ අඹුසැමි, දූ දරුවන්, ගවයන්, අසුන් ආදී සතුන් මෙන්ම, අමුරන්, රත්රන් ආදියද වැනසීමෙන්, නැතිවීමෙන් හටගැනෙන සෝක නමැති උලින් (අනිනු ලැබ) බෙහෙවින් කම්පා වී බොහෝදෙනා අවුල් සිතින් උමතු බවට පත් වෙති. මරණයට හෝ මරණය හා සමාන දූකට පත්වෙති. එහෙයින් දූ පුතුන් ඇති තැනැත්තා දූපුතුන් නිසා සෝක කරයි. එමෙන්ම ගව හිමියා ගවයන් නිසා ශෝක කරයි. කුමක් නිසාද? එබඳු ආසා (කාම උපධි) මිනිසාගේ සෝකයට හේතුවන බැවිනි. එහෙයින් **න හි සො සොචති යො නිරූපධි.** යම් තැනැත්තෙක් එබඳු ආසා (උපධි) මුළුමනින්ම ඉවත් කරන්නේ නම්, 'ඔහු සිරුර පරිහරණයෙහිදී සිවුරෙන්ද කුසට සරිලන පරිදි පිඬු සිඟා ලද ආහාරයෙන්ද සෑහීමට පත්ව, කුරුල්ලකු සේ සැහැල්ලුවෙන් පාසිවුරු දරාගෙන කැමති තැනකට යයිද......... සො සනතුට්ඨොහොති කායපරිහාරියෙන චීවරෙන, කුච්ඡි පරිහාරියෙන පිණ්ඩපාතෙන, යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති, සෙය්‍යථාපි නාම පක්ඛීසකුණෙ -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති' 'මෙම භවයෙන් එහාට නැවත ඉදිරි පැවැත්මක් නැතැයි දූනගනී. මෙසේ සෝකයට හේතුවන සියළු කරුණු මුළුමනින්ම උදුරා හළ බැවින් **නහි**

**සො සොචති යො නිරූපධි** වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අරහත් මග කුළුගන්වා දේශනය නිමකළහ. නැතහොත් **යො නිරූපධි** යමෙක් කෙලෙස් රහිතද ඔහු සෝක නොකරයි. යම් තරමක් කෙලෙස් වේද ඒ තාක් සියළුම කාමාදි උපධි සෝකයට මුල් වේ. කෙලෙස් නැතිකළ තැනැත්තෝ සෝක නොකරති. මෙසේ අරහත් මග කුළුගන්වමින් දේශනය නිම කළහ. දේශනය අවසන ධනිය ද බිරියද දෙදෙනාම පැවිදි වූහ. භාග්‍යවතුන් වහන්සේ අහසින්ම ජේතවන විහාරයට වැඩියහ. පැවිදි වූ ඔවුහු අරහත් බව පසක් කළහ. වාසය කරන තැන, ගොපල්ලෝ විහාරයක් කළහ. එය අද ද 'ගොකුලංක විහාරය' නමින්ම පතළව ඇත.

ධනිය සූත්‍ර විස්තරය නිමි.

# 1.3

**සබ්බෙසු භූතෙසු** යනු ඛග්ග විසාණ සූත්‍රයයි. එයට හේතු වූ කරුණු කුමක්ද? සියළුම සූත්‍ර දේශනා කිරීමට හේතු සතරාකාර වේ. ඒ තම අදහස අනුව, අන් තැනැත්තකුගේ අදහස අනුව, සුදුසු වේලාවකදී හා කරුණු විමසූ විටකදී යනුවෙනි. ද්වයතානුපස්සනාදි සූත්‍ර තම අදහස පරිදි ද, මෙත්ත ආදී සූත්‍ර වෙනත් තැනැත්තන්ගේ අදහස් පරිදිද, උරග සූත්‍රාදිය අදාළ අවස්ථා අනුවද, ධම්මික සූත්‍ර ආදිය විමසීම් ලෙසින්ද (දේශනා කොට ඇත) ඛග්ග විසාණ සූත්‍රය කරුණු විමසීමක් ලෙස පොදුවේ දේශනා කළද, එහි ඇතැම් ගාථා ඒ ඒ පසේබුදුවරුන් වහන්සේලා විමසන ලදුව, වදාරා ඇත. ඇතැම් ගාථා, එසේ විමසීම් නොකළ ද තම තමන්ගේ අවබෝධය අනුව උදාන ලෙසින් පළකරන ලදී. එහෙයින් ඇතැම් ගාථා විමසා ඇති නිසාද, ඇතැම් ගාථා තම අදහස් පරිදිද දේශනා කොට ඇත. මෙහි ගාථා පොදුවේ විමසා ඇති පරිදි දේශනා කළද, එය මුල පටන්ම මෙසේ දතයුතුය.

එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩ වසති. ඉක්බිති, ගරු කටයුතු ආනන්ද හිමිට හුදකලාවේ විවේකයෙන් සිටිද්දී 'බුදුවරුන්ගේ (බෝසත් කල) පැතුම් ද, ඉදිරි (අරමුණ) ඉටුකර ගැනීමේ බලාපොරොත්තුද, සච්චන් (පිළිබඳ එබඳු කරුණුද පැහැදිලි අතර) පසේබුදුවරුන් වහන්සේලා ගැන එසේ නොඇසූ බැවින් භාග්‍යවතුන් වහන්සේගෙන් විමසන්නෙම් නම් මැනවැයි මෙබඳු අදහසක් ඇති විය. විවේකයෙන් නැගිට, ආනන්ද හිමි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, එම කරුණ විචාළහ. භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමිට පුබ්බ යොගාවචර සූත්‍රය වදාළහ. 'ආනන්ද, භාවනාවෙහි යෙදුනු තැනැත්තකු මුලසිටම ලබන අනුසස් පහකි. ජීවිත කාලය තුල, කලින්ම - අන් තැනැත්තන්ගේ සිත දිනා ගනී. එසේ නොමැති නම්, පසුව ජීවිත කාලය තුලදීම එසේ සිත දිනාගනී. මැරෙන මොහොතෙහි අන් තැනැත්තන්ගේ සිත් ගනී. දෙව් පුතකුව අන් තැනැත්තන්ගේ සිත් ගනී. බුදුවරුන් හමුව, ඉක්මනින් පිරිපුන් උසස් නුවණ (අභිඤ්ඤා) උපදවා ගනී. පසුව (සසර ගමන අවසන් භවය) පසේබුදුවරයකු වෙති.' 'පඤ්චිමෙ ආනන්ද! ආනිසංසා පුබ්බයොගාවචරෙ - දිට්ඨෙව ධම්මෙ පටිගච්චෙව අඤ්ඤං ආරාධෙති, නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්චෙව අඤ්ඤං ආරාධෙති, අථ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, අථ දෙවපුත්තො සමානො අඤ්ඤං ආරාධෙති, අථ බුද්ධානං සම්මුඛීභාවෙ ඛිප්පාභිඤ්ඤො හොති, අථ පච්ඡිමෙ කාලෙ පච්චෙක සම්බුද්ධො හොති' ති. මෙසේ වදාරා, නැවත ද, 'ආනන්ද, පසේබුදුවරුන් නම්, දහම් අවබෝධය ලබන හේතුසම්පත් ඇති, මුලසිටම ඒ සඳහා භාවනානුයෝගීව කටයුතු කරන්නෝ වෙති. එහෙයින් බුදුවරුද, පසේබුදුවරුද, සාවක (මහරහත්) සියල්ලෝම පැතුම් ද දහම් අවබෝධයද කැමති වෙති'යි වදාළහ. 'හිමියනි, බුදුවරුන්ගේ බලාපොරොත්තු පැතුම කොපමණ කලක සිට තිබිය යුතුද?' අනඳ හිමියෝ ඇසූහ. 'ආනන්ද, බුදුවරුන්ට අඩුම වශයෙන් අසංඛෙය්‍ය සතරකුත් කල්ප සියදහසක්ද, අතරමැද අසංඛෙය්‍ය අටකුත් කල්ප සිය දහසක්ද වැඩිම වුවහොත් අසංඛෙය්‍ය දහසයකුත් කල්ප සියදහසක්ද වෙයි. 'එයද නුවණින් වැඩි, සැදැහැයෙන් වැඩි, උත්සාහය වැඩිවන අයුරින් දතයුතුය. නුවණ වැඩිවූවන්ට සද්ධාව අඩුවේ. නුවණ සියුම්, බලවත්ය. (උත්සාහය අතරමැද ලෙසිනි.) සැදැහැ බව වැඩි වූවන්ට නුවණ මද පමණට වේ. උත්සාහය වැඩි වූවන්ට නුවණ මද වේ. අසංඛෙය්‍ය සතරකුත් කල්ප සියදහස නොපිරුණහොත්, දිනපතා වෙසතුරු දානය හා සමාන දාන පිරිනැමූවත්, එයට අනුරූප සීල ආදී පිරිය යුතු පාරමී දහම් රැස් කළද, ඒ අතර කාලයෙහි බුදුබවට පත්වීම සිදුවන්නේ නැත. කවර හෙයින්ද?

මැනවින් නුවණ තහවුරු නොවූ බැවිනි. වැඩි දියුණුවට පත් නොවූ බැවිනි. පිරිපුන් නොවූ බැවිනි. යම්සේ, තෙමසක්, සිවුමසක්, පස්මසක් ගතවූ පසු නෙලාගත යුතු අස්වැන්න, දවසින් දවස පිරික්සමින්, ජලය සපයමින් ඊට කලින් හෝ මාසයකින් හෝ නෙලා ගැනීමට (බලාපොරොත්තු වුවත්) නියමිත කල් නොපැමිණ එය සිදුවන්නේ නැත. මක්නිසාද? අස්වැන්න මනාව සකස් නොවීමයි. සුදුසු පරිදි නොවැඩීමයි. නොපැසුණු, නොමේරූ බවයි. එමෙන්ම අසංඛෙය්‍ය සතරකුත් කල්ප.... බුදුබවට පත්වීම සිදුවන්නේ නැත. එහෙයින් ඉහත කියන ලද පරිදිම නුවණ මේරීමට සුදුසු කාලයම පෙරුම් පිරිය යුතුය. එපමණ කලක් බුදුබව පතමින් එය ඉටුකර ගැනීමෙහි අවැසි කරුණු අට සපුරාගත යුතුය.

"**මනුස්සත්තං ලිංගසම්පත්ති හෙතු සත්ථාරදස්සනං**
**පබ්බජ්ජා ගුණ සම්පත්ති අධිකාරොච ඡන්දතා**
**අට්ඨධම්ම සමොධානා අභිනීහාරො සමිජ්ඣති**"

**අභිනීහාරො** යනු බුදුවීමේ අදිටන ඉදිරියට ගෙනයෑමට මුලසිටම සිත දරා ගැනීමට සමාන වචනයකි. **මනුස්සත්තං** මිනිස් භවයක් ලැබීමයි. මිනිසෙකු හැර දෙවියකු වැනි වෙනත් ලෙස ඉපිද සිටියද ඒ අදහස ඉටු නොවේ. එබඳු භවයක ඉපදුන කෙනෙකු විසින් දානාදී පින්කම්කොට මිනිසත් බවම පැතිය යුතුය. එහි සිට අදිටන් කළයුතුය. එසේ ඉටුවේ. **ලිංග සම්පත්ති** පිරිමියෙකු වීමයි. කාන්තාවක, නපුංසක, ගැහැණු-පිරිමි ලිඟු දෙකින්ම යුතු වූවකුට මිනිසකුව සිටියත් එය ඉටු නොවේ. බුදුබව පතමින් දන් පින් කොට පිරිමි බව පැතිය යුතුය. බලාපොරොත්තු තැබිය යුතුය. එසේ ඉටුවේ. **හෙතු** යනු අරහත් බව ලැබීමට හේතු සම්පත්ය. යම් කෙනෙකුට (පිරිමියෙකුව) ඒ ඉපිද ඇති භවයේම වෑයම් කරමින්, අරහත් බවට පත්වීමට හැකිවේද, සුමේධ පණ්ඩිතයනට මෙන් ඔහුගේ අදහස ඉටුවේ. සුමේධ පණ්ඩිතට දීපංකර බුදුහිමි හමුවෙහි පැවිදිව ඒ ජීවිත කාලය තුළදීම රහත්පල ලැබීමට හැකියාව තිබුණි. **සත්ථාර දස්සනං** බුදුවරුන්ගේ හමුවීමයි. සුමේධ පණ්ඩිතයනට මෙන් මෙසේ බුදුවරුන් හමුවූ කෙනෙකුගේ එම අදහස ඉටුවේ. දීපංකර බුදුරදුන් හමුව සුමේධ පණ්ඩිත බුදුබව අදිටන් කළේය. **පබ්බජ්ජා** ගිහිගෙය හැරදැමීමයි. බුදුබව පතන තැනැත්තා (බුදු) සසුනෙහි හෝ කම්පල පිළිගන්නා තවුස් හෝ පිරිවැජියෙකු හෝ වීම සුදුසුය. සුමේධ පණ්ඩිත මෙනි. ඔහු තවුසෙකුව අදිටන් කළේය. **ගුණ සම්පත්ති** යනු ධ්‍යාන් ආදී ගුණ ලබාගැනීමයි.

සුමේධ පණ්ඩිතයන්ට මෙන් පැවිදි වූවකුට ඒ උසස් ගුණ ඉටුවනු ඇත. සුමේධ පණ්ඩිත අභිඥාඥා පහ, සමාපත්ති ලැබූ කෙනෙකුව සිට බුදුබව අදිටන් කළේය. අධිකාරො ඉතා උසස් ලෙස යහපත් දේ කිරීමයි. ඉතා මාහැඟි වූ දේවල් කැපකිරීමයි. තම ජීවිතය වුව පූජාකොට අදිටන ඉදිරියට ගෙනයෑමෙන් බලාපොරොත්තුව ඉටුවේ. එයින් බාහිර අදහස් ඇතිවුනට නොවේ.

"අකකම්ත්‍වාන මං බුදෙධා සහ සිසෙසහි ගචඡතු
මා නං කලලෙ අකකමිතෙථා සුඛාය මෙ භවිසසති"

'බුදුරජාණන් වහන්සේ (පැවිදි සාවක) සිසු පිරිස සමග මා පාගාගෙන (මා මතින්) මඩ නොපාගමින් වඩිත්වා! (එය) මට හිතසුව පිණිස පවතීවා! යයි මෙසේ සුමේධ පණ්ඩිතයෝ ජීවිතය කැපකොට අදිටන් කළහ. ඡන්‍දතා කිරීමට කැමති බවය. එම අදිටන බලවත් වූ තරමට ඉටුවේ. ඒ පිළිබඳව යම් කෙනෙකු 'අසංඛෙය්‍ය සතරකුත් කප් සියදහසක් නිරයේ පැසී බුදුබව කැමති වන්නේ කවුරුදැයි' කියනවිට 'මම ඊට උත්සාහ කරමි'යි කිව හැකිනම්, ඔහුගේ (එම) අදහස බලවත් බව කිවයුතුය. 'මුළු සක්වල පුරා දැල්වෙන ගිනිඅඟුරු පිරී ඇත්නම්, ඒවා මැඩගෙන, බුදුබව කැමති වන්නේ කවුද? කවරෙක් සැත්හුල්වලින් ගැවසුණු මුළු සක්වළම ඒවා පාගමින් බුදුබව කැමති වෙත්ද? මුවවිට දක්වා ජලය පිරුන මුළු සක්වළින් එතරව බුදුබව කැමති වන්නේ කවුද? නිරතුරුවම එකිනෙක වෙළුණු උණපඳුරක් වන් සක්වළ මැඩ - ඉක්මවා බුදුබව පතන්නේ කවුද'යි? මේ මේ ආකාරයෙන් ඇතැම් කෙනෙකු කියන්නේ නම්, ඒ අසා යම් තැනැත්තෙක් 'මම උත්සාහ කරමි'යි කීමට හැකිවේද, ඔහුගේ එම අදහස බලවත් බව දතයුතුය. මෙබඳු අදහස ඉටුකර ගැනීමේ කැමැත්තෙන් යුතුවූ සුමේධ පණ්ඩිත උත්සාහ කළේය. අදිටන් කළේය. මෙසේ එම අදහස පෙරදැරි කොටගත් (සුමේධ) බෝසතාණෝ මෙම නුසුදුසු තැන් දහඅටෙහි නොපවතී. එතැන් පටන් ඔහු උපතින්ම නෙත් අඳ නොවේ. උපතින් බිහිරි නොවේ. උමතු නොවේ. ගොළු-බිහිරෙක්ද නොවේ. කොරකු නොවේ. පහත් වනචාරී පෙදෙසක නූපදී. දාසියක කුස පිළිසිඳ නොගනී. නියත මිසදිටුවකු නොවේ. ලිංග පෙරළියක් ඇති නොවේ. මව් මැරීම ආදී ගෙවා නිම කළ නොහෙන පව්කම් නොකරයි. දද-වණ ඇති නොවේ. කුඩා බවින් වටු කුරුල්ලකු පමණටද මහත් බවින් ඇතකු පමණටද හැර තිරිසන් යෝනියක උපත නොලබයි. සාපිපාසාවෙන්

පෙළෙන හා දිය පිපාසාවෙන් දැවිල්ලෙන් පෙළෙන ප්‍රේතයන් අතර නූපදී. කාලකඤ්ජක අසුර ලොවෙහිද නූපදී. අවීචිය, ලෝකාන්තරික නිරයවලද උපදින්නේ නැත. කාමාවචර ලෝක අතරෙහි මාර දෙව්පුත්ව නූපදී. රූපාවචර ලෝක අතර අසඤ්ඤ භවයෙහිද, සුද්ධාවාසයෙහිද අරූප ලෝකවලද නූපදී. වෙනත් සක් සක්වළකට මාරු නොවේ.

**උස්සාහ, උම්මග්ග, අවත්ථාන, හිතචරියා** යන බුදුබවෙහි පිහිටිය යුතු තැන්' (බුද්ධභූමි) සතරින් යුතුය.

> "උස්සාහො විරියං වුත්තං උම්මග්ගො පඤ්ඤා පවුච්චති
> අවත්ථානං අධිට්ඨානං හිතචරියා මෙත්තභාවනා"

උත්සාහය විරිය ලෙසත්, උම්මග්ග තියුණු නුවණ ලෙසත්, එහි මනා අවැසිතාව (පදනම) දැඩි අදිටන ලෙසත්, මෙත් වැඩීම හිතසුව සැලසීම ලෙසත් දතයුතුය. එමෙන්ම, (ගිහිගෙයින්) නික්ම අනගාරිය ජීවිතයට පත්වීම, විවේකීම සිටීම, ආසාවෙන් (ලෝභ) තොර වීම, තරහ නැති බව, මුළා නොවීම සහ සසරින් මිදීම යන කරුණු හය බුදුබව ලැබීමට උපකාර පිණිස පවතී. බෝසතුන් වහන්සේ ගිහිගෙයින් නික්මීමේ අදහසින් පස්කම් සැපයෙහි වරද දකිති. බොහෝදෙනා හා එක්වීමේදී - බැඳීමේදී ඇතිවන දොස් විවේකීව සිටීමෙන් දකිති. අලෝභ අදහසින් දැඩි ඇලීමෙහි - ආසාවෙහි වැරදි දකිති. තරහ නොමැති අදහසින් කෝපයෙහි දොස් ද, මුළා නොවීමේ අදහසින් මුළාවේ දොස් ද, සසර උපදනා භවයන්හි ඇති වැරදි සසරින් මිදීමේ අදහසින්ද බෝසත්තුමා වටහාගනී. මෙබඳු ගුණවලින් සමන්විත වේ.

පසේ බුදුවරුන් වීමට කොපමණ කලක් බලාපොරොත්තු විය යුතුද? අසංඛෙය්‍ය දෙකකුත් කප් සියදහසකි. එම කාලය අඩුවෙන් පසේ බුදුබවට පත්විය නොහැකිය. ඊට අදාළ කරුණු ඉහත කියන ලද පරිදි දතයුතුය. එපමණ කාලයක් පසේ බුදුබව පතමින් කටයුතු කිරීමේදී කරුණු පහක් සපුරා තිබිය යුතුය.

> **මනුස්සත්තං ලිංගසම්පත්තිං විගතාසවදස්සනං**
> **අධිකාරො ඡන්දතා එතෙ අභිනීහාරකාරණා**

**විගතාසවදසසනං** බුදු-පසේබුදු-මහ රහත් වැනි යම්කිසි උතුමෙකුගේ දැකීමයි. ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය. සාවකයන් වහන්සේලා වීමට කොපමණ කලක් බලාපොරොත්තු ඇතිව කටයුතු කළ යුතුද? අගසවු දෙදෙනාගෙන් එක් කෙනෙකුට එක් අසංඛෙයකුත් කල්ප සියදහසකි. අසූමහාසාවක බවට කල්ප සියදහසකි. බුදුවරයකුගේ මව්පියන් වීමට, බුදුවරයකුගේ උවටැන් කරන්නා බවට පත්වීමට (ගිහිකල බෝසතුන්ගේ) පුතකු වීමටද එපමණ කලක් පැතුම් සපුරාගත යුතුය. එයින් අඩු කාලයකදී නොහැකිය. මෙහි මේ පිළිබඳව කිවයුතුය. ඒ සියළු බලාපොරොත්තු ඉටුකර ගැනීම සහ කැමැත්ත යන කරුණු දෙක ඉදිරියට ගෙනයා යුතුය. මෙසේ මෙම පැතුම් මේ ආකාරයෙන් ඉටුකර ගැනීමේ අදහස මත, ඉදිරියට කටයුතු මෙහෙයවීමෙන් ඒ කියන ලද කාලය තුල පාරමිතා පුරා, ලොව කැත් කුලයක හෝ බමුණු කුලයක හෝ බුදුවරු (බෝසත්හු) උපදිති. පසේ බුදුවරු කැත්කුල, බමුණු හෝ ගැහැවි කුල හෝ උපදිති. අගසවුවෝ කැත්, බමුණු කුලවලම උපදිති. සියළු බුදුවරුන් නොමැති කල්පයෙහි නූපදිති. අගසවුවෝ බුදුවරු පහළවන කල්පය තුලම උපදිති. පසේබුදුවරු, බුදුවරුන් පහළ නොවූ, එහෙත් බුදුවරුන් උපදනා කාලයේම උපදිති. බුදුවරු තමන්ම (සිවුසස්) අවබෝධ කරති. අනුන්ටද අවබෝධය ලබාගැනීමට මගපෙන්වති. පසේබුදුවරු තමන්ම අවබෝධ කරති. අනුන්ට අවබෝධ නොකරති. අරුත් රසයම අත්විඳිති. දහම් රස නොවිඳිති. උන්වහන්සේලාට (සිවුසස් ආදී) ලොවුතුරා කරුණු වහරෙහි අනුව ගළපා විස්තර කොට පහදා දෙන්නට නොහැකිය. සිහිනයක් දුටු ගොළුවකු සේ, නගරයෙන් පැතිරෙන එළවළුවක පිසින සුවඳ හඳුනාගත්තකු සේ, පසේ බුදුවරු දහම අවබෝධ කරගනිති. ඉද්ධි, සමවත්, සිවු පිළිසිඹියා ආදියටද පැමිණෙති. ගුණ වෙසෙස් බවින් සම්මා සම්බුදුවරුනට වඩා පහළ මට්ටමේය. සාවක (මහරහත්)වරුනට වඩා ඉහළය. අනුන් පැවිදි කරවා උසස් හැසිරීමෙහි (ආභිසමාචාරික) හික්මවති. 'සිතෙහි කෙලෙස් දුරුකළ යුතුය, පිරිසිදු කටයුතු ඇතිව, වැරදිවලට නොපැමිණිය යුතුයැ'යි මේ අයුරින් උපදෙස් දෙමින්, 'අද උපොසථ දිනයැයි' කීමෙන් පමණක් පොහොය කරති. ගන්ධමාදන පව්වෙහි මඤ්ජූසක නම් රුකමුල, රුවන්මය සාලාවක, එසේ පොහොය කරති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ, ගරුකටයුතු ආනන්ද හිමියන්ට, පසේ බුදුවරුන්ගේ පැතුම් බලාපොරොත්තු සහ කටයුතු මුළුමනින්ම දේශනා කොට, ඒ ඒ පසේ බුදුවරුන් ගැන පැවසීමට **සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං** ආදී මෙම ඛග්ගවිසාණ සූත්‍රය වදාළහ. මේ මෙතෙක් විචාරණ ලද

කරුණුවලට ඛග්ගවිසාණ සූත්‍රයේ නිදානයයි. මෙතැන් සිට වෙසෙස් කරුණු කිව යුතුය.

## 1.

මෙහිදී ඒ මුල් ගාථාවෙහි නිදාන කථාව මෙසේ දතයුතුය. (මෙම ගාථාවට සම්බන්ධ) පසේබුදුවරයන් වහන්සේ පසේ බෝසතුන් ලෙස අසංඛෙය්‍ය දෙකකුත් කප් සියදහසක් පාරමිතා පුරා, කසුප් බුදුසස්නෙහි පැවිදිව, වනගතව 'ගතපච්චාගත වත' පුරමින් මහණදම් කළහ. එබඳු වත් සපුරා නොමැතිව, පසේ බුදුබවට පැමිණෙන්නේ නැත. ගත පච්චාගත වත යනු කුමක්ද? ගෙනයෑම සහ ආපසු ගෙනඒමයි. එය සිදුවූ පරිද්දෙන් කියන්නෙමි. ඇතැම් පැවිද්දෙක් ගෙනයති. ආපසු නොගෙනෙති. ඇතැම් පැවිද්දෙක් ගෙන එයි. එහෙත් ගෙන යන්නේ නැත. ඇතැම් පැවිද්දෙක් ගෙන නොයති. ආපසුද නොගෙනෙති. ඇතැම් පැවිද්දෙක් ගෙන යති. ආපසු ගෙන යති. මෙහි ඉහත සඳහන් මහණු කලින්ම පිබිද, සෑමළුවෙහි - බෝමළුවෙහි වතාවත්කොට බෝරුකෙහි පැන් වත්කොට, පැන්කල පුරවා, පැන්හලෙහි තබා, ආචරිය-උපාධ්‍යාය වත් ඉටුකොට, කුඩා වත් අසූ දෙකක්ද, මහවත් දහහතරක්ද සමාදන්ව සිටිති. උන්වහන්සේ සිරුරු කටයුතු කොට, සෙනසුනට පිවිස, පිඬු පිණිස විවේකීව අසුනක හිඳ වේලාව දැන, සිවුරු හැඳ, පටිය බැඳ, සඟල සිවුර උතුරුසළුවක් සේ කරෙහි දමා, පාත්‍රය උරහිසෙහි එල්ලාගෙන, කමටහන් මෙනෙහි කරමින්, සෑමළුවට පැමිණ, සෑයද-බෝධියද වැඳ (පිටත්වී) ගම සමීපයෙහිදී සිවුර පොරවා, පාත්‍රය අතින් ගෙන, පිඬු පිණිස ගමට පිවිසෙති. එසේ පිවිස, ආහාර ලද මහණුන් වහන්සේ පින්වත් උපාසකවරුන් විසින් සත්කාර කරන ලදුව, උවටැන් කරන නිවසකට හෝ සම්භාවනීය සාලාවකට හෝ ආපසු පැමිණ, උපාසකවරුන් සමග ඒ ඒ ගැටළු විමසමින්, ගැටළු විසඳීමෙහිද දහම් දෙසීමෙහි ද අවුල් සහගත සිතින්, ඒ මෙනෙහි කිරීමද හැරදමා නික්මෙති. විහාරයට පැමිණියත්, අනෙක් පැවිදි හිමිවරුන් ගැටළු විමසුවහොත් කියාදෙයති. කරුණු කියති. පසුබත් කලද, පෙරයමෙහි ද ඒ මහණුන් වහන්සේ ඒ ඒ කටයුතුවල යෙදෙති. මෙසේ අනෙක් හිමිවරුන් සමග එක්ව (තම භාවනාදි කටයුතුවල) පමාවී, වැරදි කය වචන ආදියෙන් මඩනා ලදුව, කමටහන් මෙනෙහි නොකොටම පැසුළුයම්හි නිදයි. මෙයට 'හරති න පච්චාහරති' යැයි කියනු ලැබේ. යම් මහණකුට බොහෝ

ලෙඩරෝගවලින් පෙළෙත්ද, උදය කාලයෙහි අනුභව කරන ලද ආහාරය මනාව දිරවන්නේ නැත. එසේම, පිබිදිවිට, කියන ලද පරිදි වතාවත් ඉටුකිරීමට හෝ කමටහන් මෙනෙහි කිරීමට නොහැකි වේ. හුදෙක්ම කැඳ හෝ බෙහෙත් හෝ ලැබේවි යැයි සිතමින් කලින්ම පිබිද පාසිවුරු ගෙන ගමට පිවිසෙයි. එහිදී කැඳ හෝ බෙහෙත් හෝ බත් හෝ ලැබ, බත් කිස නිමවා, පනවන ලද අසුනෙහි හිඳිමින් කමටහන් මෙනෙහිකොට, සිත උසස් බවකට පමුණුවාගෙන හෝ නැතිව, විහාරයට අවුත්, එයම මෙනෙහි කරමින් වසයි. මෙය 'පච්චාහරති න හරති' යනුයි. කැඳ පානය කොට, විදසුන් වැඩීම අරඹා බුදුසසුනෙහි අරහත් බව පසක් කළ මෙබඳු මහණුන් වහන්සේලා මෙපමණයැයි දැක්වීම අපහසුය. සිංහල දිවයිනෙහිම, ඒ ඒ ගම්වල ආසන සාලාවෙහි, (පැනවූ) ආසන නොමැතිනම්, එහි යම් යම් තැනක සිට කැඳ පානය කරමින්ම, අරහත් බවට පත් මහණකු නැත. යම් මහණකු භාවනාදියෙහි පමාවෙමින්, උත්සාහය අත්හැර, සියළු වත් බිඳ පස්ආකාර වූ කෙලෙස් සිතිවිලිවලින් බැඳුණු සිතින් වසමින් කමටහන් මෙනෙහි නොකරමින්, ගමට පිඬු පිණිස පිවිස, ගිහිපිරිස හා එක්වෙමින් කෙලෙස් බරව හිස් (මනසින්) නික්මෙයි. මෙයට 'නෙව හරති, න පච්චාහරති' යැයි කියනු ලැබේ. යම් මහණක් කලින්ම පිබිද, පෙර කී පරිදි සියළු වත් පුරා, පිඬු පිණිස වේලාව එළඹෙන තුරු පලක් බැඳ කමටහන් මෙනෙහි කරයි. සබ්බත්ථක, පාරිහාරිය යනුවෙන් කටමහන් දෙආකාරය. සබ්බත්ථක යනු මෙත් වැඩීම සහ මරණය සිහි කිරීමයි. එය හැමතැනකදීම වැඩිය හැකි බැවින් ද සබ්බත්ථක නම් වේ. මෙත් වැඩීම ආවාස වැනි ඕනෑම තැනක සිට කළ හැකිය. ආවාසවල වැඩ සිට මෙත් වඩන මහණුහට එක්ව බඹසර හැසිරෙන-මහණදම් පුරන අනෙක් හිමිවරු කැමති වෙති. එහෙයින්, වෙනත් තැනැත්තන් හා නොගැටී පහසුවෙන් වාසය කරයි. මෙත් වඩන්නා, දේවතාවුන් විසින්ද රැකවරණ ලදුව සුවෙන් වාසය කරයි. රාජරාජ මහඇමතිවරුන්ද මෙත් විහරණයෙන් යුතු තැනැත්තා තමාගේම කෙනෙක් සේ සළකනු ලබන බැවින් සුවෙන් වෙසෙයි. ගම් නියම් ගම්වල හැමතැනකම අහර සොයා හැසිරෙන විටද, මිනිසුන් විසින් ගරුසත්කාර කරන ලදුව සුවසේ වෙසෙයි. මරණය සිහිකිරීමෙන්ද ජීවිත ඇලීම අත්හැර පමානොවී වසයි. දස අසුභ, කසිණ, අනුස්සති හෝ සතරාකාර ධාතු කොටස් හැමවිටම තම චරිතයට ගැලපෙන පරිදි පවත්වා ගතයුතු බැවින්, රැකගත යුතු බැවින් ද, භාවනා ලෙස වැඩිය යුතු බැවින්ද 'පාරිහාරිය' යැයි කියනු ලැබේ. මුල් කමටහන ගැන ද එසේමය. මේ අනුව යම් (යෝගාවචරයෙකු හෝ පැවිද්දෙකු)

පළමුව සබ්බත්‍ථක කමටහන් මෙනෙහි කොට, පසුව පාරිහාරිය කමටහන් මෙනෙහි කරයිද, ඒ ගැන සතරාකාර ධාතු විභාගයෙන් පැහැදිලි කරන්නෙමු. මෙහිදී පවත්නා වූ, සකස් වූ (වැඩුණු) කය ධාතු කොටස් ලෙසින් විමසා බලයි. මේ සිරුරෙහි විසි ආකාර වූ කොටස්වල තද රළු බවක් වේද, එය පඨවී ධාතුය. එකට බැඳෙන, වැගිරෙන, තෙල් වැනි දොළොස් ආකාර කොටස් ආපෝ ධාතු නම් වේ. මේරූ බවින්, උණුසුම් බවින් වූ සතරාකාර කොටස් තේජෝ ධාතුය. සයආකාර පිම්බෙන සුළු, පැතිරෙන සුළු බව වායෝ ධාතුය. මෙම සතරමහා භූතවලින් නොගැටුණු, පහස නොලද සිදුරු වූ පැතිරුණු ඉඩකඩ ඇති (තැන්) ආකාස ධාතුය. යම් දෙයක් දැන-හඳුනාගන්නා සිත විඤ්ඤාණ ධාතුය. මේ හැරුණවිට වෙනත් සතෙකු හෝ පුද්ගලයෙකු හෝ නැත. හුදෙක්ම ඒ ඒ ධාතු කොටස් එක්වීමෙන් සකස් වූ මිටියක්-පිඩුවක් ලෙස මුල, මැද, අවසාන ලෙසින් කමටහන් මෙනෙහිකොට, වේලාව දැන, අසුනින් නැගිට සිවුරු හැඳ පෙර කී අයුරින්ම පිඬු පිණිස ගමට යයි. යම්සේ (මේ සිරුරෙහි) ඇති තතු නියමාකාරයෙන් නොදන්නා බැවින්, අන්‍ධ වූ බොහෝ දෙනා (මගපල නොලැබූවෝ) ඉදිරියට ගමන් කිරීමේ ආදියෙහිදී 'තමා ඉදිරියට යයි, තමන් විසින් උපදවන ලදී හෝ 'මම ඉදිරියට යමි, මා විසින් උපදවන ලදැ'යි බලවත් සේ මුළාවෙති. එසේ මුළාවෙමින් 'ඉදිරියට යමි'යි සිත ඇතිවන විට, ඒ සිත සමග හටගැනෙන, රඳවාගනු ලබන, දරාගනු ලබන වායෝ ධාතුව උපදී. එය පඨවී ආදී ධාතුන්ගේ එකතුවක් වන කය යයි සම්මත ඇටසැකිල්ලෙහි පැතිරී යයි. එයින් සිත හා බැඳෙන කරනු ලබන දෙයට එක්ව-පැතිරී මෙම කය යැයි සම්මත ඇටසැකිල්ල ඉදිරියට ගෙන යයි. එසේ ඉදිරියට යනවිට, පාද ඔසවනු ලබන එක් එක් පියවරක් පාසා ධාතු කොටස් සතරින් වායෝ ධාතුව අනුව යන තේජෝ (උණුසුම්) ධාතුව වැඩියෙන් උපදී. අනෙත් ධාතු කොටස් අඩු ලෙසිනි. ඔසවා පහළට තැබීමේදී (සිරුරෙන්) ගෙනයන (පාද) එකිනෙක මාරුකරමින් ඉදිරියට ගමන් කිරීමේදී, පහර දීමේදී තේජෝ ධාතු අනුව යන වායෝ ධාතුව වැඩියෙන් උපදී. අනෙක් ධාතු කොටස් මඳ ලෙසිනි. පහළට බැසීමේදී (පහත හෙළීමේදී) පඨවී ධාතු අනුව යන ආපෝ ධාතුව වැඩියෙන් උපදී. අනෙක් ධාතු කොටස් මඳ ලෙසිනි. (මුලින් කළ දේ) හැර දැමීමේදී හෝ තදින් පීඩාවට පත්වීමේදී වැඩියෙන් උපදින්නේ ආපෝ ධාතු අනුව යන පඨවී ධාතුවයි. අනෙක් ධාතුකොටස් අඩු ලෙසිනි. මේ දැක්වූ ධාතු කොටස්, තම තම සිත් හා ඒ ඒ ආකාරයෙන් හටගන්නා සේම, ඒ ඒ තැන්හිම බිඳෙයි. (ඉවත් වෙයි.) ඒ

අනුව කවරනම් තැනැත්තකු ඉදිරියට යයිද? කවරකුගේ ඉදිරි ගමනක්ද? මෙසේ එක් එක් පා ඔසවමින්, පා තබමින් ආදී (ඉරියව්වලදී) එක් එක් ආකාරයට හටගත් ධාතුකොටස් වෙන් කළවිට, ඉතිරි (අවස්ථා) රූප සේ ගැනේ. එය සිත උපදවයි. ඒ හා එක්ව යෙදේ. (ඒ අතරතුර) නොයෙදෙන්නේ 'අරූප' සොබාවයි. එම රූප-අරූප ගති (සිරුර) එහා මෙහා ගෙනයාම, ආපසු ඒම ආදියෙහිදී වෙනත් වෙනත් ආකාරයට නොපැමිණේ. එය එහිම ඉවත්වෙයි. එහෙයින් තිර පැවැත්මක් නැත. තිර පැවැත්මක් නොමැතිනම්, එය දුකකි. යම් දුකක් වේනම්, එය (තමාට) අයත් නොවේ. (අනත්තා) මෙසේ කමටහන් මෙනෙහි කරමින්ම යයි. කමටහනින් බැහැර වූ සිතින් පාදය ඔසවන්නේ නැත. යම් ලෙසකින් කමටහනින් බැහැරව පාදය ඔසවන්නේ නම්, සිහල දිවයිනෙහි ආලින්දක ගමෙහි වැඩසිටි මහාඵුස්සදෙව තෙරුන් මෙන් ආපසු හැරී කලින් සිටි තැනටම එයි. ඵුස්සදෙව තෙරුන් වහන්සේ, වසර දහනවයක් මෙම 'ගතපච්චාගත' වත පුරමින් වාසය කළහ. අතරමග, වැපිරීමෙහි බිම් සැකසීමෙහි හා වෙනත් කටයුතුවල නියැලි මිනිස්සුද තෙරුන් වහන්සේ එසේ ආපසු යනු දැක, 'මේ තෙරුන් නැවති නැවතී යති. මග මුළාවී වත්ද? නැතිනම් කිසියම් අමතක වීමක්ද'යි කතාබහ කරති. උන්වහන්සේ ඒ නොසළකා කමටහන් වඩනා සිතින්ම මහණදම් පුරා විසිවන වසර ඇතුලත අරහත් බවට පත්වූහ. අරහත් පල ලද දවසෙහිම සක්මන් මළුව කෙළවර අරක්ගත් දේවතාවා උන්වහන්සේට ඇඟිලිවල පහන් දල්වා සිටියේය. සතරවරම් දෙව්මහ රජහුද, සක්දෙවිඳුද, සහම්පතී බ්‍රහ්මයාද උවටැන් කිරීම පිණිස පැමිණියහ. ඒ ආලෝකය දුටු වනවාසී මහාතිස්ස තෙරුන් වහන්සේ පසුදින ඵුස්සදේව තෙරුන්ගෙන්, 'ඔබවහන්සේ සමීපයෙහි, රෑ කාලයෙහිදී ආලෝකයක් තිබිණ. ඒ ආලෝකය කුමක්දැයි ඇසූහ. තෙරුන් වහන්සේ පැහැදිලි පිළිතුරක් නොදී "ආලෝකය පහනින්ද, මැණිකකින්ද ඇතිවිය හැකි" යැයි කීහ. වනවාසී හිමියන් 'ඔබවහන්සේ (කරුණු) සඟවන සේක්දැයි නිතර අසනු ලබන බැවින් 'එසේයැයි' දන්වා (නිසි තතු) හෙළි කළහ. කාලවලලී මණ්ඩපයෙහි විසූ මහානාග තෙරුන් වහන්සේ (ගැනද කිවයුතුය) උන්වහන්සේ ගතපච්චාගත වත පුරමින්, 'පළමුකොට භාග්‍යවතුන් වහන්සේ බුදුබවට පත්වීමට ගන්නා ලද මහත් උත්සාහයට පූජාවක් කරමි'යි සත් වසරක්ම එකම තැන සක්මනින්ම සිටීම අදිටන් කළහ. නැවතත් ගතපච්චාගත වත දහසය වසරක්ම පුරා රහත්පල ලැබූහ. මෙසේ කමටහන් වඩමින් පා තබද්දී, කමටහන් ගිලිහුණු සිතින් පා ඔසවූයේ නම්, ගම අසළට ගොස්, 'ගවදෙනෙකු නොවේද,

(නැතිනම්) මහණකු නොවේදැයි සැක කෙරෙන පෙදෙසක සිට සඟල සිවුර පොරවා, පාත්‍රය ගෙන ගම්දොරට පැමිණ, ආහාර දීමට හෝ වැඳීමට හෝ පැමිණි මිනිසුන්ට දිගුකලක් ජීවත්වේවා'යි කියන වචනයකින් වුවත් කමටහන වෙනස් නොවනු පිණිස, දිය බඳුනෙන් ගත් වතුරෙන් කට පුරවා ගමට පිවිසෙයි. (කවරකු විසින් හෝ) අද (සඳ උදාවන) හත්වන දවසද? නැතිනම් අටවකදැයි අසන ලදවිට (මුව තුල වූ වතුර) ගිල දිනය ගැන කියයි. දවස ගැන විමසන්නන් නොවෙත් නම්, නික්මෙන වේලාවෙහි, ගම්දොර ළඟදී මුව තුල තිබූ වතුර ඉවතලා විහාරයට පිවිසෙති. සිංහල දිවයිනෙහිම ගලම්බතිත්ථ විහාරයෙහි වස් එළඹුණු හිමිවරුන් පනස්දෙනා මෙනි. උන්වහන්සේලා වස් සමාදන් වන පොහෝ දිනයෙහි 'අරහත් බවට' නොපැමිණ, එකිනෙකා හා කතාබහ නොකරන්නෙමු'යි එකග වූහ. පිඬු පිණිස ගමට පිවිසෙන විට ගම් දොරදී වතුරෙන් කට පුරවා ගත්හ. දවස ඇසූ විට, වතුර ගිල ඒ ගැන කීහ. එසේ නොඇසූ විටකදී (ආපසු එන අතර) ගම්දොර අසළදී වතුර ඉවත දමා විහාරයට ගියහ. ඒ දුටු මිනිස්සු 'අද එක් පැවිදිනමක් ආවේය. අද දෙනමක් ආවෝය, යැයි' දත්හ. 'අප සමග මේ හිමිවරුන් කතා නොකරන්නේ කුමක් නිසාද? නැතිනම්, උන්වහන්සේලා එකිනෙකා අතරද කතා නොකරත් නම්, නිසැකවම මතභේදයට පත්වූවාහුයැ'යි සිතූ මිනිස්සු උන්වහන්සේ කමාකරවා ගන්නෙමු'යි සියල්ලෝම විහාරයට ගියහ. එහි පනස්නමක් වස් එළඹ සිටියත්, දෙනමක් එකම තැනක නොදුටුවහ. ඔවුන් අතර සිටි එක් නුවණැති තැනැත්තෙක් 'පින්වතුනි, කලහකරුවන් වසන තැනක නම් මෙසේ විය නොහැකියි, සෑමළුව, බෝමළුව කසළ ඉවත්කොට මැනවින් අතුගා ඇත. පැන් ආදී පරිහරණය කරන බඳුන් මනාව තබා ඇත, යනුවෙන් ඔවුන්ට පැහැදිලි කළේය. ඔවුහු එතැනින් නැවතුණහ. ඒ හිමිවරු වස් තෙමසදීම විදසුන් වඩා, අරහත් බවට පත්ව මහා පවාරණයෙන් වස් අවසන් කළහ. මෙසේ කාලවලලි මණ්ඩප වැසි මහානාග තෙරුන් වහන්සේ මෙන්, ගලම්බතිත්ථ විහාරයෙහි වස් එළඹුණු හිමිවරුන් මෙන්, යම් මහණක් කමටහන් වඩනා සිතින් පා නගමින් ගම අසළට පැමිණ, වතුර මුව පුරවාගෙන, සුරා සොඬුන්, සලෙලුන් ආදී කලහකාරීන් හෝ, නපුරු ඇතුන් හෝ අසුන් හෝ නොවෙත්ද, යා යුතු වීදිය සළකා ඒ වීදියට පැමිණේ. එහි පිඬු පිණිස හැසිරෙන විට වහ වහා, වේයෙන් නොයයි. ජවන පිණ්ඩපාතික හෙවත් දුවගෙන පිඬු පිණිස යාම නමින් ධුතාංගයක් නැත. සමතලා නොවූ බිමක ගියද, ජලය පිරුණු කරත්තයක් මෙන් නිසලව (සන්සුන්ව) යයි. ගෙපිළිවෙලින් පිවිසියද,

දෙනු කැමති බව නොදෙනු කැමති බව සලකා ගැනීමට සුදුසු පරිදි සුළු මොහොතක් ඉවසා, ලැබුණු ආහාර, සුදුසු තැනක හිඳ, කමටහන් මෙනෙහි කරමින් ආහාරයෙහි පිළිකුල් හැඟීම්ද සිහිකොට, කඩ ඇණයට තෙල් යෙදීම, තුවාලයකට ආලේප ගැල්වීම සහ පුතුගේ මස් ආහාරයට ගැනීම, අනුව සළකා, එය විමසා-මෙනෙහි කරමින්ද, සෙල්ලම් පිණිස, සවිය පිණිස ආදී ලෙස නොගනිම්'යි ද සිතා කරුණු අටකින් යුතු අහර වළඳයි. වළඳා අවසන් වූ පසුවද අත සෝදා පැන් පානයකොට, මොහොතක් විවේකීව සිට, පෙරබත් කාලයෙහි මෙන්ම, පසුබත් කාලයේද පෙරයම, මැදියම සහ පැසුළු යාමයෙහිද කමටහන් මෙනෙහි කරයි. මෙය 'හරති පච්චාහරති' නම් වෙයි.

මේ ආකාරයට (ගෙන යන - නැවත ගෙන යන - ගිය නැවත ගිය) හරණ පච්චාහරණ - ගත පච්චාගත වත යැයි කියනු ලැබේ. වත් පිරීමේදී හේතුසම්පත් තිබේනම්, මුල් වයසේදීම අරහත් බවට පැමිණේ. එසේ මුල් වයසේදී නොවේ නම්, මැදි වයසේදී ද, මැදි වයසේ නොවේ නම්, මැරෙන මොහොතෙහිද, එසේ නොවේනම් දෙව් පුතකුවද, එසේත් නොවේනම්, පසේ බුදුවරයෙක්ව පිරිනිවන්පාති. පසේ බුදුවරයකු නොවීනම්, සම්බුදුවරුන් වෙතින් ඉක්මණින්ම මැනවින් (දහම්) අවබෝධය ලබන්නේ බාහිය තෙරුන් වහන්සේ මෙනි. සැරියුත් තෙරුන් වහන්සේ මෙන් මහා නුවණ ඇතියහ. (මෙම ගාථාවට අදාල වන) පසේ බෝසතුන් වහන්සේ, කසුප් බුදුසස්නෙහි පැවිදිව, වනගතව අවුරුදු විසිදහසක් එම 'ගතපච්චාගත' වත පුරා කළුරිය කොට කාමාවචර දෙව්ලොවෙහි උපන්නේය. එතැනින් චුතව බරණැස් රජුගේ අග මෙහෙසිය කුස පිළිසිඳ ගත්තේය. මේ ගැන දැනුම්-තේරුම් ඇති කාන්තාවෝ එකෙණෙහිම ගැබ් පිහිටි බව දනිති. අග මෙහෙසියද එවන් දැනුම් ඇති තැනැත්තියන්ගෙන් එකියකි. එහෙයින් ඒ බව දැන, රජුට දැන්වූවාය. පින්වත් කෙනෙකු කුස පිළිසිඳ ගත්විට ඒ කාන්තාව ගැබ් පෙරහර - ගැබට හා මවට සියළු පහසුකම් හා රැකවරණය ලැබීම සොබා නියමයකි. එහෙයින් රජු ඇයට ගැබ් පෙරහර දුන්නේය. ඇයට එතැන් පටන් දැඩි උණුසුම් වූ, ඉතා සීතල වූ, තද ඇඹුල් රසැති, ලුණු වැඩි, දැඩි සැර ගතියෙන් යුතු, ඉතා තිත්ත වූ ආහාරපාන කිසිවක් නොලබන්නීය. මව විසින් දැඩි උණුසුම් අහරක් ගතහොත් දරුගැබ ලෝහ සැළියක වාසය කරනු මෙනි. තද සීතල ආහාර ගතහොත් ලෝකාන්තරික (අඳුරු නිරයෙක) වාසය මෙනි. තද ඇඹුල්, ලුණු වැඩි, සැර, තිත්ත ආහාර අනුභව කළවිට, සැතකින් පලා

ඇඹුල් ආදිය ඉසින්නාක් මෙන් දරු කලලයෙහි කොටස් දරුණු වේදනාවට පත්වෙයි. සෙලවෙන විට පවා දරුගැබට දුකක් නොවේවා'යි වේගයෙන් සක්මන් කිරීම, හිඳගැනීම හෝ (නුසුදුසු පරිදි) නිදා ගැනීමෙන් ද ඇය වළක්වති. මුදු ඇතිරිලි ඇතිරූ බිමෙහි සක්මන් කිරීමට පමණක් ඉඩ ලබන්නීය. මනාව සැකසුණු, පැහැයෙන් හා සුවඳවත් ආහාරපාන ලබන්නීය. (ආවතේව කරුවෝ) ඇය අල්වාගෙනම සක්මන් කරවති. හිඳුවති. නැගිටුවති. ඇය මෙසේ රැකවරණ ලබමින්, දරුගැබ මේරූ කල්හි සූතිකාගාරයට පිවිස, අළුයම් කාලයෙහිදී, සපුතෙලින් පිරිමැදි හිරියල් පිඩක් වන්, සිරිපින් ලකුණින් හෙබි පුතකු වැදුවාය. එයින් පස්වන දින, අලංකාර ලෙස සැරසූ ළදරුවා රජුට පෙන්වූහ. සතුටු වූ රජු කිරි මවුවරුන් හැටහය දෙනෙකු උවටැන් පිණිස යෙදවීය. සියළු සැප සම්පතින් යුතුව වැඩෙන ඒ ළදරුවා, නොබෝ කලකින්ම නුවණැති බවට පත්විය. පියරජතුමා ඔහුට සොළොස් විය සමවූ කල රජකමෙහි ඔටුනු පැළඳවීය. තුන්ආකාර වූ නළඟනන් ඔහුට ලබාදුනි. මුළු දඹදිව නගර විසිදහසක බඹදත් නමින් (ඒ කුමරු) අබිසෙස් ලැබීය. පෙර දඹදිව නගර අසූහාරදහසක් තිබුණි. එය පිරිහෙමින්, හැටදහසක්ද, හතළිස් දහසක්ද, මුළුමනින්ම පිරිහී ගොස් නගර විසිදහසක් විය. මෙම බඹදත් රජුද සියලු නගර පිරිහෙන කාලයෙහි අබිසෙස් ලැබීය. එයින් ඔහුට නගර විසිදහසක්ද පාසාද විසිදහසක්ද ඇත්, අස්, රිය, පාබල හමුදා, කාන්තාවෝ, ඇතුළු පුර අඟනෝ, නළඟනෝ ද ඇමතිවරු ද විසිදහස බැගින් වූහ. ඔහු රජය විචාරද්දීම, කසිණ පිරියම් කොට අභිඤ්ඤා පහ ද සමාපත්ති අටද උපදවා ගත්තේය. අබිසෙස් ලත් රජු අවැසි තන්හිදී නඩු විසඳීමෙහිද නිරත විය යුතුය. එක් දවසක් උදෑසනින්ම අනුභව කොට, රජු විනිසුරු අසුනෙහි සිටියදී මහත් කලබලකාරී හඬක් ඇසුණි. මෙම මහත් කලබලකාරී හඬ සමවතට බලවත් කෙලෙස් වේ යැයි සිතා පහයෙහි උඩු මහලට නැගී සමවතට සමවැදීමට හිඳගත්තද නොහැකි වූයේය. රජපාලන කටයුතුවල අවුල් බව නිසා සමාපත්ති පිරිහිණ. වඩා උතුම් රජකමද? නැතිනම් මහණ දහම්ද'යි ඔහු සිතුවේය. රජසැප අල්ප බවත් නොයෙක් (අයහපත්) විපාක ඇති බවත්, මහණදම් පිරීම මහත් ඵලදායී මෙන්ම උසස් තැනැත්තන් ගත් මඟ යැයි දැන, 'මේ රජකම දැහැමින් සෙමෙන් කරනු, අයහපත් දෙයක් නොකරව'යි කියා එක් ඇමතිවරයකුට සියල්ල පවරා දී පහයට නැගී සමවත් සුවෙන්ම වාසය කරයි. මුව දෝවනයට දැහැටි සපයන, ආහාර ගෙනෙන සේවකයන්ට හැර වෙනත් කිසිවෙකුට රජු හමුවට ඉඩ නොලබයි. එයින් අඩමසක් ගත වූ පසු 'රජු

උයනට යාම හෝ බලසෙන් අතර හෝ රඟමඬලෙහි ආදී කිසිතැනක නොදක්නා බැවින් කොහි ගියේ දැයි බිසව විචාළාය. ඒ තොරතුරු එවිට ඇයට සැළවිය. රජකම පිළිගන්නා ලද නම්, මා ද පිළිගනු ලැබුවෙමි. මා හා එක්ව විසීමට පැමිණේවා'යි ඇමති වෙත දන්වා යැවූවාය. ඔහු දෙසවන් වසා, නොඇසිය යුතු දෙයකැයි එය පිළිකෙව් කළේය. ඇය නැවත දෙවරක්ම එම (පණිවුඩය) දැන්වූවද එකඟ නොවනවිට, 'එසේ නොකරන්නේ නම්, ඔබ සිටින තැනින් ද ඉවත් කරමි. ජීවිතයද තොර කරවමි'යි තැති ගැන්වූවාය. ඔහු බියවී, 'ගැහැණිය නම් දැඩි තීරණ ගන්නීය, කවදා හෝ එසේ කිසිවකු ලවා හෝ කරනු ඇතැ'යි (සිතා) එක්දවසක් රහසිගතව ඇය සමග සිරියහන් ගතවිය. සුවදායී රසපහස ලබාදීමට ඈ පින්වන්තියකි. ඔහු ඇගේ පහසට ගිජුව, රාගයෙන් රත්ව, සැකයෙන් යුතුවම නිතර නිතර ඇය වෙතට ගියේය. මද කලකින්, තම ගෙහිමියා මෙන් සැක රහිතවම එහි යාමට පටන් ගත්තේය. පසුව රජගෙයි මිනිස්සු ඒ පුවත (බඹදත්) රජුට සැළකළහ. රජු එයට සැළකිලිමත් නොවීය. දෙවන වරටත්, තුන්වන වරටත් එය දැන්වූහ. ඉන්පසු සැඟවී සිට තමාම දැක, ඇමතිවරුන් රැස්කරවා සැළ කළේය. ඔවුහු 'මොහු රාජ අපරාධකරුවෙකි. අතක් කැපීම සුදුසුය. පාදයක් කැපීම සුදුසුය. උල තැබීම දක්වා වූ සියළු (දඬුවම්) පෙන්වා දුන්හ. රජු, 'එබඳු වද දීම්, කැපීම්, තැළීම් ආදියෙන් මට හිංසා ඇතිවන්නේය. ජීවිතය නැසීමේදී, පරපණ නැසීම වන්නේය. ධනය ගැනීමේදී නුදුන් දේ ගැනීමද වන්නේය. මෙබඳු දේ කිරීම නුසුදුසුය. මොහු මගේ රජයෙන් නෙරපව'යි කීය. ඇමතිවරු ඔහු රජයෙන් ඉවත් කළහ. ඔහු තම ධනය ආදී වටිනා දේද, අඹුදරුවන්ද රැගෙන වෙනත් පෙදෙසකට ගියේය. එම පෙදෙසෙහි රජු ඒ බව අසා, 'කුමක් නිසා පැමිණියෙහිද'යි විචාළේය. 'දේවයන් වහන්ස, ඔබට උවටැන් කරනු කැමැත්තෙමි'යි කීය. ඔහු එය පිළිගත්තේය. කිහිප දිනකින් විශ්වාසය ඇතිකරගත් ඇමති 'මහරජ, පිළවුන් නැති මීවදයක් දුටිමි. එය අනුභව කරන්නෙකු නැතැ'යි තමන් පැමිණි පෙදෙසෙහි රජුට සැළකළේය. රජු 'එය රවටනු කැමතිව කියන දෙයක්ද'යි සවන් නොදෙයි. ඔහු සුදුසු වේලාවක නැවත ඒ ගැන වඩාත් හොඳින් සවිස්තරව කීය. රජු ඒ කුමක්ද'යි ඇසීය. 'දේවයන් වහන්ස, බරණැස් නුවර රජකම' යැයි පැවසීය. 'මා ගෙනගොස් මරවනු කැමැත්තෙහිද'යි රජු කීවේය. 'දේවයන් වහන්ස, එසේ නොකිව මැනවි. පිළිනොගන්නේ නම්, මිනිසුන් යවා ඒ බව තහවුරු කරගන්නැයි කීය. රජු මිනිසුන් යැවීය. ඔවුහු ගොස් දොර කොටුව සාරා රජුගේ නිදන කාමරයෙන් මතුව නැගී සිටියහ. බඹදත් රජු ඒ දැක 'කුමක්

නිසා ආවාහුදැ'යි ඇසීය. 'මහරජ අපි සොරු වෙමු'යි කීහ. රජ ඔවුනට ධනය දී 'නැවත මෙසේ නොකරව'යි අවවාද කොට මුදාහළේය. ඔවුහු ආපසු අවුත් එය ඔවුන්ගේ රජුට දැන්වූහ. ඔහු නැවත දෙතුන් වරක් එසේම විමසා, එහි රජු සිල්වත්ය. බලවත් නොවේ' යැයි සිවුරඟ සේනා රැස්කරවා මායිමෙහි එක් නගරයකට අවුත් 'මට නගරය දෙනු, නැතිනම් යුද්ධය වේ'යැයි ඇමතියකු යැවීය. ඔහු බ්‍රහ්මදත්තයනට 'කුමක් නිසා යුද කරම්ද, නගරය දෙමි. දේවයිනි අණ ලැබේවා'යි එම කරුණ සැළ කරවීය. රජු 'යුද නොකළ යුතුය, නගරයදී මෙහි එනු'යි දන්වා යැවීය. ඔහු එසේ කළේය. සතුරු රජද ඒ නගරය අයත් කොටගෙන, ඉතිරි නගරවලටද එසේම දූතයකු යැවීය. ඒ ඇමතිවරුද එසේම බ්‍රහ්මදත්තට දන්වා යවා ඔවුන් 'යුද නොකළ යුතුය, මෙහි පැමිණිය යුතු යැ'යි කියන ලදුව බරණැසට ගියහ. එහිදී ඇමතිවරු 'මහරජ, ඔහු හා යුද කරමු'යි බ්‍රහ්මදත්තට කීහ. රජ, 'මා පරපණ නසන්නෙක් වේ'යැයි කියා එය වළකාලීය. ඇමතිවරුද 'මහරජ, අපි ඔහු පණ පිටින්ම අල්ලාගෙන මෙතැනටම ගෙනෙන්නෙමු'යි බොහෝ උපා රජුට හඟවා 'මහරජ (අප හා) එනු මැනව'යි ගමන් ඇරඹූහ. රජු 'මිනිසුන් මැරීම-දරුණු පහරදීම්, මංකොල්ලකෑම නොකරන්නෙවු නම් එන්නෙමි'යි කීය. ඇමතිවරු 'දේවයන් වහන්ස, එසේ නොකරමු, බිය ගන්වා පලවා හරිමු'යි සිවුරඟ සේනා සූදානම් කොට, කළගෙඩිවල පහන් තබා රැයෙහි ගියහ. සතුරු රජු බරණැස සමීපයෙහි නගරයක් අල්ලාගෙන, 'දැන් කුමක් නිසා (වෙහෙසිය යුතුදැයි) රෑ කාලයේදී යුද සෙනග එයින් නිදහස් කොට බලකාය සමග නිදන්නට විය. එහිදී ඇමතිවරු බරණැස් රජු අල්ලාගෙන සතුරු රජුගේ කඳවුරට ගොස්, කළගෙඩිවල තිබූ සියළු පහන් ඉවතට ගෙන එකවර දල්වමින් සේනාවෙහි මහත් හඬක් නැංවූහ. සතුරු රජුගේ ඇමති මහා බලසේනාව දැක, බය වී, තම රජු වෙත පැමිණ, 'නැගිටිනු මැනවි, පිළවු නොමැති මීවදය කන්නැ'යි මහත් හඬකින් කීය. දෙවන, තෙවන වරටද එසේ කෑගැසීය. සතුරු රජු ඒ හඬින් වහා පිබිද භයට-තැතිගැනීමට පත්විය. සියක් ගුණයෙන් මහා හඬ පැතිරුණි. ඔහු 'අනුන්ගේ වචන අදහාගෙන සතුරන් අතට පත්වුනෙමි'යි මුළු රැයම විලාප නගා පසුදින 'දැහැමි රජතුමාට අවහිර නොකරමි, ගොස් කමාකරමී'යි සිතා රජු වෙත එළඹ දනින් වැටී 'මහරජතුමනි, සමාවුව මැනව, වරද මගේ' යැයි කීය. රජු ඔහුට අවවාද දී 'නැගිටුව, සමාව දෙමි'යි කීය. එසේ කීවිටම ඔහු බොහෝ අස්වැසිල්ලක් ලැබීය. බරණැස් රජයටම සමීප වූ ජනපදයක රජ බවට පත්විය. ඔවුහු එකිනෙකා යහළුවන් බවට පත්වූහ.

ඉක්බිති බඹදත් රජු සේනා දෙකොටසම සතුටින් එක්ව සිටිනු දැක 'මා වැනි එක් අයෙකුගේ සිත සුරැකි අයුරින් මෙම මහාජන සමූහයෙහි කුඩා මැස්සකු උරාබොන ලේ බිඳකුදු තරමවත් සෙලවීමක් නොවීය. 'අහා! ඉතා යහපත්ය, ඉතා හොඳය. සියළු ජීවීහු සැපවත් වෙත්වා! තරහ නැත්තෝ වෙත්වා! නපුරු තරහ සිත් නැත්තෝ වෙත්වා!'යි මෛත්‍රීදැහැන උපදවා එයම මූලික කොට, ඒවා ඇතිවන අයුරු විමසා නුවණින් මෙනෙහි කොට පසේ බුදුනැණ තමා විසින්ම අවබෝධ කොට ගත්තේය. එසේ මගපල සුවයෙන් සිත සැනසුම ලැබ, ඇතු පිට නැගී සිටි රජුට නමස්කාර කළ ඇමතිවරු 'මහරජතුමනි, යාමට කාලය පැමිණ ඇත. ජයගත් බල සෙනඟට සත්කාර කළ යුතුය. පැරදුන බල සෙනඟට බත් පිරිවැය දිය යුතුයැයි ද පැවසූහ. 'පින්වත් දරුවනි, මම රජ නොවෙමි. පසේබුදු වෙමි'යි කීය. 'දේවයන් වහන්ස, කුමක් කියන්නෙහිද? පසේ බුදුවරුන් ඔය ආකාර නොවෙති'යි කීහ. 'දරුවනි පසේ බුදුවරුන් කෙබඳුද? පසේ බුදුවරු දෑගුල් තරම් වූ කෙස් රවුළු ඇති, අටපිරිකර දරන්නෝ වෙති'යි පිළිතුරු දුන්හ. ඔහු දකුණතින් හිස පිරිමැදීය. එකෙණෙහිම ගිහි විලාසය අතුරුදහන් විය. පැවිදි විලාසය පහළ විය. දෑගුල් කෙස්රවුල් යුත්, අටපිරිකර දරන සියවස් පිරුණු තෙරනමක සේ පෙනිණ. සිවුවන දැහැනට සමවැද ඇතු පිටින්ම අහසට පැන නැගී නෙළුම් මලක් මත සිටියහ. ඇමතිවරු නමස්කාර කොට 'හිමියනි, කමටහන කුමක්ද? කෙසේ අවබෝධ කරගත්තෙහිදැ'යි ඇසූහ. පසේ බුදුවරයාණෝ 'මෛත් අදිටන කමටහන වූ අයුරුත්, එය විදසුන් ලෙස මෙනෙහි කොට ලැබූ අයුරුත් පැහැදිලි කරමින් උදානයක් ලෙසත්, විවරණයක් ලෙසත් **සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං** යන ගාථාව කීහ.

සබ්බෙසු - වෙන්කොට දක්වීමක් නැතිව **භූතෙසු** හැම ජීවීන් කෙරෙහි මෙය කෙටියෙන් සඳහන් කිරීමයි. විස්තර රතන සූත්‍ර විවරණයෙහිදී කියමු. **නිධාය** බැහැරකොට, **දණ්ඩං** යනු කයෙන් වචනයෙන් සිතින් කරන (වැරදි) දේ කයෙහි දුසිරිත් ආදියට සමාන තේරුමකි. කයෙහි ආදී දුසිරිත් නිසා ලබන දුක්ගැහැටවලින් වන විපාක දඬුවමක් මෙන් සළකා දණ්ඩ යැයි දැක්වේ. හිරිහැර හා නොයෙක් විපත්වලට පැමිණෙන අයුරු කියන ලදී. වචනයෙන් හා සිතින් දුසිරිතට යොමුවීමද මෙසේම දතයුතුය. පහරදීමද මෙහිලා ගැනේ. එය හදවතෙහි නිදන්කොට තබාගත් බඳුය. **අවිහෙඨයං** හිංසා නොකරන බවයි. **අඤ්ඤතරමපි** කිසියම් තැනැත්තෙක් **තෙසං** ඒ සියළුම දෙනාට **න පුත්ත මිච්ඡෙය්‍ය** තමන්ට දා වූ පුතු, කැත්

කුල කතකගෙන් උපන් පුතු, හදාවඩා ගත් පුතකු, අතවැසි යන සිවු ආකාර වූ පුතුන් අතර, කිසිම පුතකුට කැමති නොවන්නේය. **කුතො සහායං** (එසේනම්) තවත් කෙනෙකු සහායකයක් ලෙස කෙසේ කැමති වෙත්ද? **එකො** එකම දෙය පැවිදි වීම යැයි කියන ලද පරිදි, තවත් කෙනෙකු (දෙවැන්නකු) නොමැති වීමෙන්, තනිවම තණ්හාව නැති කිරීමෙන්, නිසැකවම කෙලෙස් දුරු කිරීමෙන්, තනිවම පසේ බුදුබවට අවබෝධය ලැබීමෙන්, පැවිදි වූවත් දහසක් මැද වුවද පවත්නා ගිහියන් හා ගිහි ජීවිතයට අදාළ බැඳීම් සිඳ බිඳ දමන ලද බැවින්ද එකො යැයි අදහස් වේ. එයින් පැවිදි වීමෙන් තනිවම සිටින බව දක්වේ. තනිවම සිටී. තනිවම යයි. තනිවම හිඳී. තනිවම නිදාගනී. තනිවම ඉරියව් පවත්වයි. මේ අනුව දෙවැන්නකු නොමැති බැවින් එකො යනුවෙන් දක්වේ.

> "තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං
> ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති
> එතමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං
> වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ"

'තණ්හාව දෙවැනි කොටගත් තැනැත්තා මේ ආකාර වූ මිනිසත් බව හෝ වෙනත් ආකාර උපත් ලබමින් දිගුකලක් සසර සැරිසරමින්, සසර ගමන නොඉක්මවයි. තණ්හාව, දුකට හේතුවන බැවින්, එහි විපාක දැන කිසිම දෙයක නොඇලෙමින්, තණ්හාව දුරුකරන, සිහියෙන් යුතු වූ පැවිද්දා සසර ද දුරුකරයි' - මෙසේ තණ්හාව දුරුකරන හෙයින් එකො නම් වේ. මුලින්ම කපා දමන ලද තල් ගසක් මෙන් නැවත හට නොගන්නා සේ සියළු කෙලෙස් සිඳ දමන ලදැයි 'සබ්බ කිලෙසාසස පහීණා උච්ඡින්න මූලා තාලාවත්ථුකතා -පෙ- ආයතිං අනුප්පාද ධම්මා' මෙසේ නිසැකවම කෙලෙසුන් ඉවත හළ බැවින් 'එකො'ය. ගුරුවරයෙකු නොමැතිව, තමාම තම දැනුම මෙහෙයා නුවණින් පසේබුදුබව අවබෝධ කරන ලද බැවින්ද 'එකො' යනුවෙන් ගැනේ. චරෙ මෙම අටවැදෑරුම් හැසිරීමයි. ඒ කෙසේද? කෙලෙස් දුරුකොට බලාපොරොත්තු අරමුණ ඉටුකර ගැනීමේ සිවුආකාර වූ ඉරියව් පවත්වා ගැනීම නම් වූ ඉරියාපථ චරියාව, තම ඉඳුරන් සංවර කරගැනීම සංවරය නම් වූ ආයතන චරියාව, පමා නොවී හැමවිටම කය මෙනෙහි කිරීම ආදී සිවු වැදෑරුම්ව සිහිය පිහිටුවා ගැනීම වූ සති චරියාව, පවත්නා සිත අභිබවා යන සිවු දැහැන් ලබා එකඟ බවට පත්කරන සමාධි චරියා, බුද්ධිසම්පන්න වූ සිවුසස් මගින් යුතු ඤාණ චරියාව, උතුම්

සිවු මගෙහි මනාව පිළිපන් පරිදි වූ මග්ග චරියාව, මහණකමෙහි පල ලැබීම වන සිවුමග පලවලට පත්වීම නම් වූ පත්ති චරියාව, සියළු සත්වග කෙරෙහි තුන් බුදුවරුන්ගේ හිතසුව සැලසීම නම් ලොකත්ථ චරියාවයි. එහි කොටස් පසේ බුදුසච්චනටද අදාළ වේ. අටවැදෑරුම් හැසිරීම ගැන කියන ලද්දේය. එය ඉරියාපථ චරියා ඉරියව් හැසිරවීම ආදී ලෙස විස්තර වෙයි. එබඳු හැසිරීම්වලින් යුතු වන්නේය යන අදහසයි. නැතහොත් ඒවා මැනවින් සිත දරා හැසිරෙයි. ධෘති උත්සාහවත්ව හැසිරෙයි. එළඹ සිටි සිහියෙන් යුතුව (මනා සිහියෙන්) හැසිරෙයි. නොසැලෙන එකඟතාවෙන් සිත පිහිටුවා හැසිරෙයි. එය මනාව දන්නා තියුණු නුවණින් හැසිරෙයි. මෙසේ අනුගමනය කරමින් ඉඳුරන් මනා සංවරව රැකගනිමින් 'ආයතන චරියාවේ' හැසිරෙයි. මෙසේ පිළිපදින්නා වූ කෙනෙකුගේ සිත උසස් බවක් - වෙසෙස් බවක් ලැබ ගනී. මෙසේ 'විසෙස චරියා'වෙහි හැසිරෙයි. මෙසේ වෙනත් ලෙසකින්ද හැසිරීම් අට ගැන කියන ලදී. ඒවායින් යුතු වන්නේ යැයි තේරුමයි. **ඛග්ග විසාණ කප්පො** යනු කඩුවක් බඳු දිගු අඟක් නළලේ ඇති සතෙකි. (කඟවේණාය) කප්ප යන වචනයෙහි විස්තර මංගල සූත්‍ර වැණුමෙහිදී පවසන්නෙමු. තම සව්වන් හා සාකච්ඡා කරමින් මගපෙන්වන ගුරුවරුන්, නායකයන් මෙන් යෙදෙන තන්හි සමාන බවින් සළකා ගතයුතුය. ඛග්ගවිසාණ කප්පො කඟවේණ අඟ හා සමාන යැයි කියන ලදී. මෙය වචනයෙහි තේරුම පමණි. එයින් අදහස් කරන ලද කරුණු මෙසේ දතයුතුය. මෙහි කියන ලද ආකාරයට දුසිරිතෙහි යෙදීම හැමදෙනා කෙරෙහිම අහිත පිණිස පවතීද, ඔවුන් එසේ පැවතුනත් (තමන්) එසේ නොකොට, එයට වෙනස් වන පරිදි මෙන් සිතිවිලි පැතිරවීමෙන්ද, දඬුමුගුරු නොගෙන සිටියද ඔවුන් දඬුවලින් හෝ ආයුධයකින් හෝ අතින් හෝ ගල්කැට කැබලිති ආදියෙන් හෝ හිංසා කරත්ද, එසේ හිංසාවෙන් තොරව ඔවුන් කෙරෙහි මේ මෙත් සහගත කමටහන වඩා එහි වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ ලෙසට සළකා, ඒ අනුසාරයෙන් ඒ වෙනත් දේවල්ද සංඛාර බවට (හේතු නිසා හටගත් දේ තිර නැති බව) විදසුන් වඩා මෙම පසේ බුදුබව අවබෝධ කළෙමි. මේ එහි අදහසයි. මීළඟට මෙය (අනෙක් කරුණු හා) ගැළපීමයි. මෙසේ කී විට ඒ ඇමතිවරු 'හිමියනි, දැන් කොහි යන්නෙහිද?' ඇසීය. එවිට පෙර පසේ බුදුවරුන් කොතැන වැඩ සිටියාහුද්ද'යි මෙනෙහි කොට ගන්ධමාදන පව්වෙහි යැයි දැන ඒ බව වදාළ විට, 'හිමියනි, අපත් (එමු'යි) කීහ. පසේ බුදුන් වහන්සේ 'ඒ අදහස ඉවත් කරව, එසේ කිරීමට කැමති නොවවු' කීහ. **න පුත්ත මිච්ඡෙය්‍ය** සියළු දෙයම - එහි අදහස මෙයයි. 'මම දැන්

මගේම පුතුන් ආදීන් මෙන්ම, පුතකු සේ සැළකෙන කිසිදු දෙයකට (කිසියම් දෙයක හිමිකමට) කැමති නොවෙමි. එසේනම් ඔබලා වැනි සහායකයන් ගැන කුමක් කියන්නද? එහෙයින් මා සමග යාමට හෝ මා වාගේ සිටීමට ඔබලා අතුරෙන් යම් කෙනෙකු කැමති වෙත්නම්, ඔහු තනිව හැසිරෙන කඟවේණකු මෙන් විය යුතුය. නැතහොත්, ඔවුන් විසින් 'හිමියනි, අප අත්හැර දැමීමට කැමති නොවනු මැනවැ'යි කී විට, ඒ පසේ බුදුන් වහන්සේ 'පුතුන්ද කැමති නොවෙමි. සහායකයන් ගැන කුමකට කියම්දැ'යි, අසා තමා පෙර කියන ලද පරිදිම තනිව හැසිරීමෙහි යහපත දැක සතුටු සොම්නසින් ප්‍රමුදිතව **එකො චරෙ ඛග්ග විසාණකපෙපා** යන මෙම උදානය පහළ කළහ.

මෙසේ කිවූ පසේබුදුන් වහන්සේ මහජනතාව බලා සිටියදීම අහසට නැගී ගන්ධමාදන පව්වට වැඩියහ. ගන්ධමාදන පව්ව, හිමාලයෙහි සුළුකළු පව්ව, මහකළු පව්ව, නාවෙළුම, සඳගැබ, හිරුගැබ, රන් පස, හිමවත යන පව් හතම ඉක්මවා පිහිටියේය. එහි නන්දමූලක නම් තැන පසේ බුදුවරයන් වසන තැනයි. රන් ගුහාව, මැණික් ගුහාව, රිදී ගුහාව යැයි ගුහා තුනකි. එහි මැණික් ගුහා දොරටුවෙහි යොදුනක් උස, යොදුනක් පළල 'මඤ්ජූසක' නම් ගසක් වේ. එම ගසෙහි දියෙහි හෝ ගොඩබිමෙහි හැමතැනකම මල් පිපේ. පසේ බුදුවරයකු පැමිණෙන දින මල් පිපෙනු වෙසෙසින් පෙනේ. එහි හාත්පස හැමතැන රන්මල් ඇත. පිසදමන සේ හමායන සුළඟින් එහි කසල ඉවත් වෙයි. සමව හමන සුළඟින් සියළු රුවන්මය වැලිගොඩැලි සමතලා කරයි. දියපොද මුසුව හමනා සුළඟෙන් අනොතත්ත විලෙන් දිය ගෙනවුත් ඉසියි. සුවඳවත් සුළඟින් හිමාලයෙහි සියළු සුවඳවත් ගස්වලින් සුවඳ ගෙන එයි. එක්රැස් කරන්නා සේ හමන සුළඟින් මල් කඩා බිම හෙළයි. අතුරා යන පරිදි හමන සුළඟින් ඒ මල් හැමතැන විසුරුවයි. හැමවිටම එහි ආසන පනවා ඇත. පසේ බුදුවරයකු පහළවන දවසෙහි සහ උපෝසථ දවසෙහි ද සියළුම පසේ බුදුවරු රැස්ව ඒ ආසනවල හිඳගනිති. ඉක්බිතිව එසේ පැමිණි කල (නව) පසේ බුදුවරයන් වහන්සේ එහි ගොස් පනවන ලද අසුනෙහි හිඳිති. එමෙන්ම ඒ කාලයෙහි තවත් පසේ බුදුවරු පහළ වෙත්ද, උන්වහන්සේලාද රැස්වී පනවන ලද අසුන්වල හිඳිති. කිසියම් සමවතකට සමවැද නැගී සිටිති. එහිදී (දෙටු) සංඝතෙරුන් වහන්සේ නවක පසේ බුදුවරයන් වහන්සේගෙන් සියළු පසේ බුදුවරුනට අනුමෝදන් වනු පිණිස 'අවබෝධය ලබන ලද්දේ කෙසේදැ'යි කමටහන විචාරති. එවිට උන්වහන්සේ එයම තම උදාන ගාථාව ලෙස කියති. පසුව

නැවත, ආනන්ද තෙරුන් වහන්සේ විසින් විමසන ලදුව, භාග්‍යවතුන් වහන්සේද එම ගාථාව කියති. නැවතත් සංගායනාවෙහිදී ආනන්ද තෙරුන් වහන්සේ කීහ. මෙසේ එම ගාථාව පසේ බුදු වූ කලද, මඤ්ජුසක නම් තැනදීද, ආනන්ද තෙරුන් විමසූ විටද, සංගායනාවේදී දැයි සිවු වරක්ම කියා ඇත.

පළමු ගාථා විස්තරය නිමි.

## 2.

**සංසගග ජාතසස** යන මෙම ගාථා දේශනාවට හේතුව කුමක්ද? මෙම පසේ බෝසතුන් වහන්සේද කසුප් බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි අවුරුදු විසිදහසක් කල් මහණදම් පුරමින්, මුල් පුවතෙහි දැක්වූ සේ, කසිණ බවුන් වඩා පළමු දැහැන් ලැබ නාමරූප පිළිබඳව නුවණින් මෙනෙහි කොට එහි තතු විමසා, මගපලයක් නොලැබ බඹලොව උපනි. ඔහු එතැනින් චුතව, බරණැස් රජුගේ අග මෙහෙසියගේ කුස පිළිසිඳ, පෙර දැක්වූ පරිදි වැඩෙමින්, 'මේ ගැහැණියකි, මේ පිරිමියෙකි' යැයි වෙනස හඳුනාගත් තැන් පටන් කිරිමවුන්ගේ අතෙහි සිටීමට ඇළුම් නොකරයි. කිරිමවුන් ඇඟ ඉලීම්, නෑවීම, අලංකාර කරනු නො ඉවසයි. පිරිමි පමණක් දරුවා ඇතිදැඩි කරති. තනකිරි පොවනවිට, කිරි මව්වරු ආවරණය කරන ලද තැනකට පිවිස පිරිමින් වෙස් ගෙන කිරි පොවත්. දරුවා කාන්තාවන්ගේ සුවඳ දැන, ඔවුන්ගේ කටහඬ අසා හෝ හඬයි. වැඩිවියට පත් වුවද කාන්තාවන් දකින්නට අකමැතිය. එහෙයින් ඔහු 'අනිත්ථිගන්ධ' යැයි හැඳින්වූහ. ඔහුට සොළොස්විය පිරුණුවිට පිය රජු 'කුල පරපුර ඉදිරියට පවත්වා ගනිමි'යි නොයෙක් පවුල්වලින් ඔහුට සුදුසු අවිවාහක තරුණියන් ගෙන්වා, කුමරු 'කම්සුවයට සතුරු කරවන්නැ'යි එක්තරා ඇමතියකුට අණ කළේය. උපායකින් කුමරු ඊට පෙළඹවීමට සිතූ ඇමති ඔහු සමීපයෙහි තිරවලින් වට කරවා නළඟනන් එහි යෙදවීය. ගී හඬ, වාදන හඬ ඇසූ කුමරු ඒ හඬ කාගේදැ'යි විචාළේය. 'දේවයන් වහන්ස, ඒ නළඟනන්ගේ හඬය. එවන් නළඟනෝ පින්වන්තයන්ටම වෙති. ඔබතුමා මහා පින් ඇත්තෙකි. ඔවුන් හා සතුටුවනු මැනව'යි කීය. කුමාරයා ඇමතියාට පොල්ලකින් තලවා බැහැර කළේය. ඇමති ඒ බව රජුට දැන්වීය. රජු කුමරුගේ මව සමග ගොස් කුමරු කමා කරවා වෙනත්

ඇමතියකුට ඒ කටයුතු පැවරීය. ඇමතිවරුන් විසින් වඩාත් අපහසුතාවට, පීඩනයට පත් කුමාරයා, රන්කරුවන්ට උසස්ම රත්රන් සපයා දී සොඳුරු කාන්තා රුවක් කරව'යි අණ කළේය. ඔවුහු විස්කම් දෙව්පුතුන් නිමවන ලද්දාක් වැනි සියළු අලංකාරයෙන් හැඩ වූ කාන්තා රුවක් තනා පෙන්වූහ. ඒ දුටු කුමරු පුදුමයෙන් හිස සලා, 'මෙබඳු කාන්තා රුවක් ලදොත් විවාහ කර ගනිමි'යි මව්පියන්ට දන්වීය. මව්පියෝ 'අපගේ පුතු මහා පින් ඇත්තෙකි, ඔහුට ගැලපෙන පරිදි පින් ඇති කිසියම් දැරියක ලොව ඉපදී ඇතැ'යි ඒ රන්රුව රියක නංවා 'යව, මේ රන් රුව හා සමාන දැරියක සොයව'යි ඇමතිවරුන් පිටත්කර යැවූහ. ඔවුහු එය රැගෙන සොළොස් මහා ජනපදයෙහි සැරිසරමින් ඒ ඒ ගම්වලට පැමිණ, නාන තොටුපල ආදී තැන්වල ගැවසෙන මිනිසුන්ට දැකිය හැකි ලෙස (සුදුසු තැනක) වියනක් බැඳ දේවතාවියක මෙන් ඒ රන්රුව තබා, නොයෙක් මලින් රෙදි පිළියෙන් අලංකාර කොට පූජා පවත්වමින්, 'කිසිවකු විසින් මෙබඳු තැනැත්තියක් දැක ඇතොත් (ඒ ගැන) කතාබහ කරති'යි පසකට වී සිටියහ. මද්‍රරට කුඩා රටකැයි මුලදීම අවමන් කරමින් එහි නොගොස්, මද්‍රරට හැර මුළු ජනපදයෙහිම මේ ආකාරයෙන් ඇවිද්දාහ. 'මද්‍රරට දක්වාම යමු, අප බරණැසට ගියද, රජු නැවත මෙසේ යවන්නේ යැ'යි ඔවුනට සිතුනි. ඔවුහු මද්‍රරට සාගල නුවරට ගියහ. සාගල නුවර මද්‍ර රජුගේ දුවද සොළොස්විය සපිරි රූමතියකි. ඇයගේ (සේවයෙහි නියුතු) සුන්දර දාසීහු දිය නෑමට තොටුපළට ගියවිට, ඇමතිවරුන් එහි තබන ලද ඒ රන්රුව දුරදීම දැක, 'අප දිය නෑමට එවා, රජ කුමරිය තමන්ම පමණක් ආවා' යැයි කියමින් ඒ අසළට ගොස් 'මේ අපේ සාමිදූව නොවේ. අපේ සාමිදූව මීට වඩා ඉතා රූමත් යැයි' කීහ. ඇමතිවරු ඒ අසා රජු වෙත ගොස්, සුදුසු ආකාරයෙන් දැරිය ඉල්ලූහ. රජු දුන්නේය. ඇමතිවරු (සුදුසු) දැරිය ලැබුණි. තමන්ම පැමිණේද, නැතිනම් අපිම කැඳවාගෙන එන්නෙමුද'යි බරණැස රජුට පණිවුඩ යැවූහ. රජුද 'මා එනවිට ජනපදවාසීන් අපහසුතාවට පත් වන්නේය. තොපම කැටුව එව'යි දන්වීය. ඇමතිවරු දැරිය කැටුව නගරයෙන් නික්ම, 'රන් රුව හා සමාන දැරියක ලැබුණි'යැයි කුමාරයාට දන්වූහ. කුමාරයා ඒ ඇසූ පමණින්ම කාමරාගයෙන් පෙළී පළමු දැහැනින් පිරිහිණ. ඉක්මණින්ම කැඳවාගෙන එව'යි දූතයන් යැවීය. ඇමතිවරු එක රැයකින්ම මුළු දුර ගෙවා බරණැසට පැමිණ, පිට නුවර සිට 'අද දිනම පැමිණිය යුතුද? නැද්ද'යි රජු විමසා යැවූහ. රජු, 'උසස් කුලයෙන් කැඳවා ගෙනෙන ලද දැරියකි, මංගල කටයුතු ඉටුකොට, මහත් හරසරින් (මැදුරට) පිවිසවන්නෙමු, එතෙක්

ඇය උයනට ගෙන යව'යි අණ කළේය. ඔවුහු එසේ කළහ. ඇය ඉතා සියුමැලි බැවින්, යානයෙන් පැමිණීමෙන් වූ පීඩාවෙන් හා ගමන් වීඩාවෙන් හටගත් වාත රෝගයෙන් මැලවුණු මල්දමක් මෙන්ව රියෙහිම කළුරිය කළාය. ඇමතිවරු (අපිද) සත්කාරයෙන් ගිලිහුණෙමු'යැයි වැළපුණහ. රජුද නගර වාසීහුද 'කුලවංසය වැනසුනේ' යැයි වැළපුණහ. නගරයෙහි මහත් කලබලකාරී විය. කුමාරයාට ඇසූ පමණින්ම මහත් සෝකයක් ඇතිවිය. එවිට කුමාරයා සෝකයට මුල්වන කරුණු ගැඹුරින් විමසන්නට විය. ඔහු මෙසේ සිතුවේය. 'මෙම සෝකය නම් නූපන් කෙනෙකුට නැත. උපන් කෙනෙකුටම වෙයි. එහෙයින් ඉපදීම නිසා සෝකය ඇතිවේ. ඉපදීම කුමක් නිසා වේද? එයට භවය හෙවත් සසර හේතුවේ' මෙසේ පෙර (පුරුදු කරන ලද) භාවනා බලයෙන් නුවණින් මෙනෙහි කරමින් අග සිට මුලටත්, මුල සිට අගටත් හේතුපල දහම දක සංඛාර ගැන විමසා බලමින් එහිම හිඳිමින් පසේ බුදුබව අවබෝධ කළේය. ඒ මගපල සුවයෙන් සුවපත්ව, සන්හුන් ඉඳුරන් ඇතිව, එකඟ වූ සිතින් හිඳිනු දක, ඇමතිවරු නමස්කාර කොට, 'දේවයන් වහන්ස, සෝක නොකරනු මැනව, දඹදිව ඉතා මහත්ය. ඊටත් වඩා සොඳුරු එකියක ගෙනෙන්නෙමු'යි කීහ. 'මම සෝක කරන්නෙක් නොවෙමි. සෝකය ඉවත හළ පසේබුදුවරයෙක් වෙමි'යි පැවසීය. මෙයින් පසු ගාථා විස්තරය හැර අන් සියල්ල මුල් ගාථාව හා සමානය.

මෙම ගාථා විස්තරයෙහි **සංසග්ග ජාතස්ස** යනු ජාත සංසග්ග හෙවත් ඇතිකරගන්නා ලද සබඳතාවයි. එය දකීම, ඇසීම, සිරුරෙන්, කතාබහෙන්, එක්ව කටයුතු කිරීමෙන් පස් ආකාරය. එකිනෙකා දක, ඇසින් හැඳිනීමේදී ඇතිවන ඇලීම දකීම නිසා ඇතිවන සබඳතාවයි. සිහල දිවයිනෙහි 'කළුදිග්' ගමෙහි පිඬු පිණිස හැසිරෙන කැලණි වෙහෙර වාසී (සඟි ආදිය) කටපාඩමෙන් දත්, තරුණ හිමි නමක දක, ආදර සිත් ඇතිව කිසියම් මගකින් ඒ හිමියන් නොලැබ, එහි කෙළෙඹි දුවක් කළුරිය කළාය. ඇයගේ ඇඳ සිටි ඇඳුමෙහි රෙදිකඩක් දක, 'මෙබඳු වතක් දරා සිටි තැනැත්තිය සමග ඇසුරක්, එක්වීමක් නොලැබුණේ' යැයි හද පැලී අපවත් වූ ඒ තරුණ හිමිනමම නිදසුනයි. තමන් හෝ අනුන් කියනු ලබන රූපාදී සම්පත් ගැන හෝ සිනාසෙන, කතාබහ කරන, ගී ගයන හඬ හෝ අසා, සවනට දනීමෙන් ඇතිවන ඇලීම 'සවණසංසග්ග' නම් වේ. ගිරි නම් ගමෙහි විසූ ලෝකුරුවකුගේ දියණියක, තරුණියන් පස් දෙනෙකු සමග නෙළුම් විලට ගොස් දිය නා, මල් උඩට නංවමින්, උස්හඬින්

ගායනා කරනවිට, පස් අඟුල්ලෙන වැසි තිසස නම් තෙරුන් අහසින් යද්දී, ඒ ගී හඬ ඇසී කාම රාගයෙන් දැවී දැහැනින් පිරිහී බොහෝ විපතට පත්වීම මෙහිලා නිදසුන්ය. එකිනෙකා අතර අඟපසඟ අතපත ගෑමෙන් උපන් රාගය කාය සංසග්ග නම් වේ. දහම් දෙසන තරුණ මහණකගේ කථාව මීට නිදසුන්ය. මහා විහාරයෙහි තරුණ හිමිනමක් දහම් දෙසයි. මහජනයා එහි රැස්වූ විට ඇතුළු නුවර රජමැඳුරෙහි ළඳුන් සමග රජතුමාද පැමිණියේය. දහම් දෙසන ඒ තරුණ හිමිගේ රුවට ද කටහඬට ද රජ දියණියට බලවත් රාගයක් උපන. තරුණ පැවිදි හිමිටද එබඳුම හැඟීමක් ඇතිවිය. ඒ බව දුටු රජ, (කරුණු) සළකා බලා තිර රෙදිවලින් වටකරවූයේය. ඔවුහු එකිනෙකා අතපත ගාමින් වැළඳගත්හ. නැවත තිර රෙදි ඉවත්කොට බලනවිට දෙදෙනාම මියගොස් සිටි බව දුටුවාහ. එකිනෙකා ඇමතීමෙන්-කතාබහ කිරීමෙන් හටගන්නා රාගය **සමුල්ලපන සංසග්ග** යයි. මහණ මෙහෙණියන් සමග (යම් යම් සුළු භාණ්ඩ ආදිය) පරිහරණය කිරීමේදී හටගන්නා රාගය **සම්භොග සංසග්ග** වේ. මෙම දෙආකාර වූ ඇලීම් පිළිබඳව, පාරාජික බවට පත්වූ මහණ මෙහෙණ දෙදෙනාගේ කතාව නිදසුන්ය. මිරිසවැටි මහා විහාරයෙහි උත්සව පවත්නා කල, දුටුගැමුණු අභය මහරජු මහදන් පිළියෙල කොට මහණ-මෙහෙණ දෙකොටසම වළඳවයි. එහිදී ළඟදී පැවිදිවූ මෙහෙණියක් උණු කැඳ දෙනු ලබද්දී, (භාජනය තබා ගැනීමට) ආධාරකයක් නොමැති වූ අළුත පැවිදි වූ සාමණේර හිමිනමකට (ඇත්දතින්) සාදන ලද දරණුවක් දී සතුටු සාමීචියෙහි යෙදුණාය. පසුව, උපසම්පදා ලැබ, සැටවයස් ව වෙනත් රටකට ගියවිට, එකිනෙකා හමුව කතාබහ කිරීමේ පෙර හැඳුනුම්කම් සිහිවී, එකෙණෙහිම හටගත් ආදරයෙන් සිකපදය ඉක්මවා පාරාජිකා වූහ. මෙසේ පස්ආකාර වූ සබඳතාවලින් කිසියම් සබඳතාවකින් සෙනෙහස ඇතිවේ. කලින් පැවති රාගය යළි මතුවීමේ හේතුවෙන් බලවත් ලෙසට රාගය පහළ වේ. එහෙයින් **සෙනහන්වයං දුක්ඛමිදං පහොති** එම සෙනහසට-ආදරයට අනුව යන මෙලොවත්, පරලොවත් සෝක කිරීම්, විලාප නඟමින් හැඬීම ආදී නොයෙක් ආකාර වූ දුක් - **පහොති** උපදී, ඇතිවෙයි, හටගනී. තවත් කෙනෙක් අරමුණෙහි සිත යොමුවීම සංසග්ග යැයි කියති. ඒ අනුව ඇතිවන ආදරයත්, ආදරයෙන් දුකත් ඇතිවේ යැයි මේ අරුතින් - මෙම ගාථා පද දෙක කී පසේ බුදුවරයාණෝ 'මම මෙම ආදරය අනුව යන සෝකය ආදී දුකෙහි මුල සිඳිමින් පසේ බුදුබව අවබෝධ කළෙමි' යැයි වදාළහ. එවිට ඇමතිවරු 'අප දැන් කළයුතු කුමක්ද'යි ඇසූහ. වෙනත් කෙනෙක් හෝ ඔබලා හෝ මෙම දුකින් මිදෙනු කැමැත්තෙහු නම්, ඒ

සියල්ලෝම **ආදීනවං සෙනහජං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණ කප්පො** යැයි වදාළහ. එම ගාථාවෙහි **සෙනහන්වයං දුක්ඛමිදං පහොති** කියන ලද පරිදි ආදරය නිසා හටගන්නා ආදීනව විමසා බලමින් පැහැදිලි කර ඇතැයි දතයුතුය. එමෙන්ම, ඉහත සඳහන් කරන ලද අයුරු සබඳතාවලින් බැඳුණු තැනැත්තාට ආදරය හටගනී. ඒ ආදරය අනුව මෙම දුක බලවත් වේ. එම ආදරයෙහි ආදීනව ඇති සැටියෙන් දැන, 'මම අවබෝධ කළෙමි'යි තවදුරටත් තහවුරු වන සේ සතර පද (ගාථාව) උදාන ලෙසින් කියන ලදැයි දතයුතුය. ඉතිරි සියළු කරුණු මුල් ගාථාවට අදාලව කියා ඇති පරිදිය.

**සංසග්ග ගාථා විස්තරය නිමි.**

# 3.

**මිත්තෙ සුහජ්ජෙ** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? මෙම පසේ බෝසතාණන් වහන්සේ පෙර ගාථාවෙහි කී අයුරින්ම බරණැස රජව, පළමු දැහැන උපදවා 'කුමක්ද? උතුම් මහණ දම්ද? රජකමද්ද'යි විමසා, ඇමතිවරුන් සිවුදෙනෙකු වෙත රජකම පවරා, මහණදම් පුරයි. 'දැහැමෙන් සෙමෙන් රජකම් කරව'යි උපදෙස් දුන්නත් (ඔවුහු) අල්ලස් ආදිය ගෙන අදැහැමින් පාලනය කරති. අල්ලස් ගෙන හිමිකරුවා (තීරණ දෙමින්) එක් දවසක් රජුට හිතවත් එක්තරා තැනැත්තෙකුද පරාජය කළහ. ඔහු රජුට ආහාර ගෙන එන්නන් සමග (මැදුරට) පිවිස, සියල්ල සැළ කළේය. දෙවන දවසෙහි රජු (නඩු) විසඳන තැනට ගියේය. එහිදී මහජනයා 'ඇමතිවරුන් විසින් හිමිකරුවෝ අහිමිකරුවෝ බවට තීරණය කරනු ලබති'යි කෑකෝ ගසමින් මහා යුද්ධයක් සේ (කළබල) කළහ. එවිට රජතුමා එතැනින් නැගිට පහයට නැගී සමවත් උපදවා ගන්නට හිඳගත්තද, කලබල හඬින් හා අවුල් සිතින් එය කළ නොහැකි විය. ඔහු 'රජකම කුමක්ද? මහණදම් උතුම්'යැයි රජකමෙහි උත්සාහය හැර, නැවත සමවත් උපදවා පෙර කී පරිදි විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළේය. කමටහන් ගැන විමසන ලදුව, මෙම ගාථාව කීය.

එහි මෙත් පැතිරවීම හේතුවෙන් **මිත්තා** නම් වේ. ලෙන්ගතු බව **සුහජ්ජා** වේ. ඇතැම්හු එක්බඳු හිතවත්කමින් යුතුව මිතුරෝම වෙති.

සුහද නොවෙති. ඇතමෙක් පැමිණෙන, යන, හිඳින තැන්හි කතාබහ කරනවිට හදවතට සුව දනවන ගතිය වූ සුහජ්ජා හෙවත් සුහදතාව පෙන්වති. මිතුරෝ නොවෙති. ඇතමෙක් සුහද බවත්, මිතුරු බවත් දෙකක් ලෙස දක්වති. ගිහි ජීවිතයට අදාලව සහ පැවිදි ජීවිතය ලෙසිනි. එය ගිහි දිවියට අදාලව උපකාරක, සමානසුඛදුක්ඛ, අනුකම්පක යැයි තුන් ආකාරය. පැවිදි අත්ථක්ඛායී වැදගත් වේ. ඒ මිතුරෝ කරුණු හතරකින් යුතු වෙති. ඒ අනුව මෙසේ කියා ඇත. 'ගහපති පුතුනි, උපකාරක නම් සුහද මිතුරාද කරුණු හතරකින් දතයුතුය. ඔහු මිතුරාට කරදර-පමාවක් ඇතිවිටකදී රැකවරණ දෙයි. එවැනි විටකදී මිතුරාගේ වස්තුව රැක දෙයි. බියට පත්වූ විට පිහිට වෙයි. කිසියම් අවැසි කටයුත්තක් ඇතිකල දෙගුණයක් සේ ධනය ආදී සම්පත් ලබා දෙයි. එසේම ගහපති පුතුනි, සමාන සුඛ දුක්ඛ සුහද මිතුරාද කරුණු සතරකින් දත යුතුය. රහසිගත කරුණු ඔහුට කියයි. ඔහුගේ රහස් හෙළි නොකරයි. කරදරවලදී අත් නොහරියි. තම ජීවිතය වුවද මිතුරාගේ හිතසුව පිණිස කැප කරයි. ගහපති පුතුනි, එසේම අනුකම්පක සුහද මිතුරාද කරුණු සතරකින් දතයුතුය. ඔහු මිතුරාගේ යම් දෙයක් පාඩුවීමේදී විනාසවීමේදී සතුටු නොවේ. යම් යම් දෙය (මිතුරාගේ දියුණුව) ඇතිවන විටදී සතුටු වෙයි. ඔහුගේ නුගුණ කියනවිට වළක්වයි. ගුණ කියනවිට අගය කරයි. එසේම කරුණු සතරකින් අත්ථක්ඛායී සුහද මිතුරාද දතයුතුයි. ඔහු මිතුරා යහපතෙහි යොදවයි. අයහපත් දෙයින් වළකයි. නොඇසූ (යහපත්) දෙයක් ඇසීමට සලස්වයි. (මරණින් මතු යහපත් තැනකට) දෙව්ලොව මග කියා දෙයි. මෙම කරුණු ගිහි දිවියට අදාලව අදහස් කරන ලදී. එම කරුණු (පොදුවේ) සුහද-යහපත් මිතුරන්ටද අදාල වේ. **අනුකම්පමානො** කරුණාසහගත බවයි. එම ගුණය ඔවුන්ට සැප ලඟාකර දීමට, දුක ඈත්කරලීමට යොමු කරයි. **හාපෙති අත්ථං** මෙලොව, පරලොව සහ ඉන් එහා ලද හැකි උසස් උත්තරීතර බව යනුවෙන් තුන් ආකාරය. එසේම තමා කෙරෙහි, අනුන් කෙරෙහි, සහ තමාටත්-අනුන්ටත් ලෙස තුන් ආකාරය. ලැබුණු දේ නැතිකර ගැනීමෙන්ද, නොලද දේ උපදවා නොගැනීමෙන්දැයි දෙයාකාරව පිරිහෙයි. නැසෙයි. **පටිබද්ධචිත්තො** මම මොහු නැතිව ජීවත් නොවෙමි. එය මගේ හැටියි. ඒ තැනැත්තා මට පිහිට වේයැයි මෙසේ පහත් තැනක තබද්දීත්, බැඳුණු සිත් ඇත්තේ වෙයි. මොවුහු මා හැර ජීවත් නොවෙති. මම ඔවුනට අයත් වෙමි. මා පිහිටකොට ඇත්තාහ'යි මෙසේ තමන් උසස් තන්හි තැබීමද ඇළුණු-බැඳුණු සිත ඇති බවට අදහස් වේ. **එතම්භයං** - මේ ලබන දේ නැතිව යනු ඇතැ'යි බියය. තමාගේ සමවත් හානිය ගැන මෙයින් කියයි.

සඤ්ඤාවෙ තණ්හා, දිට්ඨි, මිත්ත, සඤ්ඤා යැයි තුන් ආකාරය. එහි එකසිය අටක් සේ දැක්වෙන තණ්හාවේ කොටස්වල ඇලීම තණ්හා සඤ්ඤාවයයි. සැටදෙකක් වැරදි දැකීම්වල ඇලීම දිට්ඨි සඤ්ඤාවයයි. ඇළුණු, බැඳුණු සිතින් වන මිතුරු අනුකම්පාව මිත්ත සඤ්ඤාවයයි. එය මෙහි අදහස් කෙරේ. ඒ පිළිබඳව ඇතිවන බිය නුවණින් මෙනෙහි කරමින් මම අවබෝධ කළෙමි. ඉතිරි කරුණු මුල් ගාථාවෙහි කියා ඇති පරිදි වේ.

මිත්තසුහජ්ජ ගාථා විස්තරය නිමි.

## 4.

වංසො විසාලො යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? පෙර කසුප් බුදුරජාණන් වහන්සේගේ සාසනයෙහි පසේ බෝසත්හු තුන්දෙනෙක් පැවිදිව, වසර විසිදහසක් ගතපච්චාගත වත පුරා දෙව්ලොව උපන්හ. ඔවුන් අතුරෙන් දෙටු තැනැත්තා, එයින් චුත ව, බරණැස රජකුලයෙහි උපන්නේය. අනික් දෙදෙනා ඈත පිටිසර පෙදෙසක රජකුලවල උපන්හ. දෙදෙනාම කමටහන් ඉගෙන, රජකම හැර පැවිදිව අනුපිළිවෙළින් පසේ බුදුවරුව නන්දමූලක කඳු ගුහාවෙහි වසද්දී, එක් දවසක් සමවතින් නැගී 'අපි කිනම් පින්කමක් කොට, මෙම ලොවුතුරු සුවයට පැමිණියෙමු'දැයි විමසා බලනවිට, කසුප් බුදුසස්නෙහි තම හැසිරීම් රටාව දුටුවාහ. ඉක්බිති, 'තුන්වැන්නා කොහිද'යි සිතා, බරණැස රජ බව දැන, ඔහුගේ ගුණ සිහිකොට 'සැබවින්ම ඔහු අපිස් බව ආදී ගුණයෙන් යුතු විය, අපටද අවවාද දෙමින්, ඔහුගේ වචනය ඉක්මවා නොයන ලෙස (අප මෙහෙයවමින්) සිටියේය. අපි අරමුණක් පෙන්වා (දැන් ගතකරන ජීවිතය සේ, කෙලෙසුන් ගෙන්) මුදාගනිමු'යි සුදුසු වේලාව සළකා, එක් දවසක සියළු අලංකාරයෙන් සැරසී උයනට යනු දැක අහසෙන් අවුත් උයන් දොරටුවෙහි උණපඳුර මුල සිටියහ. මහජනයාද රජු දැකීමෙහි සෑහීමකට පත්නොවී ඒ දෙසම බලයි. එවිට රජු ද 'මා දෙස නොබලන කිසියම් කෙනෙකු වෙත්ද'යි බලද්දී පසේ බුදුවරුන් දුටුවේය. උන්වහන්සේලා දැකීමත් සමගම ඔහුට සෙනහස ඇතිවිය. රජු ඇතුපිටින් බැස, ගරුසරු ඇතිව උන්වහන්සේලා වෙත එළඹ, හිමිවරුනි, ඔබලාගේ නම් කුමක්දැයි? ඇසීය. මහරජ, අපි 'නොගැටෙන' යන නම දරන්නෝ වෙමු'යි කීහ. 'හිමිවරුනි, එහි තේරුම

කුමක්ද'යි රජු ඇසීය. 'මහරජ, (කිසිම දෙයකට) නොඇලෙන ගතිය' යැයි (පිළිතුරු දුන්හ) එහිදී ඒ උණපඳුර පෙන්වමින්, 'මහරජ, මේ උණපඳුර හැමතැනම මුල්වලින් කඳ, අතු හා කුඩා අතුරිකිලිවලින් එකට වෙළී පැටලී තිබියදී මිනිසෙකු කඩුවක් අතින් ගෙන, මුල කපා පිටතට ඇදීමට (උත්සාහ දරත්ද) ඔසවා ඉවතට ගැනීමට නොහැකි වන්නා සේ, ඔබද ඇතුලත පිටත අවුලෙන් අවුලට පත්ව, හැමදෙයකම තදින් ඇලී, එහිම ගැලී සිටින්නෙහි යැයි කීහ. මෙහි මැද (පැළවී ඇති) මෙම උණ ගොබය (තවම) අතුරිකිලි නොවැඩුණු බැවින්, කිසිතැනක නොබැඳී පවත්නා නිසා, අගින් මුලින් හෝ කපා පිටතට ගතහැකි සේ අපද කිසිම දෙයක නොඇලී හැමතැනකම යමු'යි කීහ. එකෙණෙහිම සිවුවන දෑහැනට සමවැදී රජ බලා සිටියදීම අහසින් නන්දමූලක පබ්බට වැඩියහ. 'කවදා මම ද මෙසේ කිසිම දෙයක නොඇලී ඉන්නෙම්ද'යි රජු සිතුවේය. එහිම හිඳ විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළේය. පෙර පරිදිම, කමටහන් ගැන විමසන ලදුව මෙම ගාථාව කීය.

එහි **වංස** උණ ගසය. **විසාලො** - පුළුල්ව අතුරිකිලි විහිද ගිය තේරුමයි. 'ව' අකුර අවධාරණ අරුතිනි. **එව** පදය මේ යන තේරුමටයි. පද එක්වීමේදී 'එ' අකුර ඉවත් විය. පසු පදය හා බැඳුණි. එය පසුව දක්වන්නෙමි. **යථා** සමාන කොට දක්වයි. **විසත්තො** ඇළුණු, අවුල් වූ, එකට පැටළුණු යනුයි. **පුත්තෙසු දාරෙසු ච** පුතුන්, දූවරු, බිරිඳ කෙරෙහි, **යා අපෙක්ඛා** යම් ආසාවක්, යම් ආදරයක්, **වංස කළීරොව අසජ්ජමානො** නොපැටළුණු උණගොබයක් මෙන්, එසේ කියන ලද්දේ කුමක් නිසාද? උණගස මහත්ව වැඩී, අතු රිකිළි පැතිරී යයිද එසේම අඹුදරු ආදීන්ට ඇති බලාපොරොත්තු නිසා ඔවුන්ට ඇති බැඳීමයි. ඇලීමයි. මම මහත් ලෙස පැතිරී ගිය උණගස් මෙන් වූ එම බලාපොරොත්තු තබාගැනීමේ මතු විපාක දැක, සිවුසස් මග නැණින් සිඳිමින් මෙම උණ ගොබය බඳු රූපාදියට හෝ දෘෂ්ටිවලට හෝ කාමලෝකවල හෝ ආසා-මාන හා දෘෂ්ටි ලෙසට නොඇලෙමින් පසේ බුදුබවට පත්වීමි' ඉතිරි කරුණු පෙර කී පරිදි දතයුතුය.

**වංසකළීර ගාථා විස්තරය නිමි.**

# 5.

මිගො අරඤ්ඤම්හි යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? කසුප් බුදු සසුනෙහි, එක් භාවනායෝගියෙක් කළුරියකොට, බරණැස, මහත් ධන සම්පත් ඇති සිටු කුලයෙක උපන්නේය. ඔහු මහත් පින් ඇත්තෙක් විය. එහෙත් ඔහු අන් අඹුවන් ඇසුරු කරන්නෙකු වී ඉන් කළුරිය කොට නිරයෙහි දුක්විඳ ඉතිරි (කම්පල) විපාක ලෙසින් සිටු බිරිඳගේ කුස පිළිසිඳ ගත්තීය. නිරයෙහි සිට (මනුලොව) උපත ලබන්නන්ගේ සිරුරු උණුසුම් වේ. සිටු බිරියද එසේ දැවෙන කුසින් යුතුව ඉතා අපහසුවෙන් ඒ ගැබ දරා, නිසිකල දූරියක වැදුවාය. ඇය බිහිවූ දින පටන්, මවුපියන්ටද අනෙක් නෑදෑ පිරිවර ජනයාටද අසතුටු-නුරුස්නා බවක් පෙන්වූවාය. වැඩිවිය පත්වූ විට, පතිකුලයට ගියද, එහිදී හිමියාට, නැදිමයිලන්ටද නුරුස්සන්නියක වූවාය. අසතුටු අමනාප තැනැත්තියක් වූවාය. ඉක්බිති නැකැත් උළෙල පවත්වන විට, සිටු පුතු ඇය සමග සතුටුවන්නට - විනෝද වන්නට නොකැමතිව, ගණිකාවක ගෙන්වාගෙන කෙළිදෙළින් පසුවෙයි. බිරිඳ දාසීන්ගෙන් ඒ බව අසා සිටුපුතු වෙත ගොස්, නොයෙක් ලෙසින් සුහද කීකරු බව පෙන්වා, 'උතුම් වූ හිමියනි, කාන්තාව නම්, රජවරුන් දහ දෙනෙකු අතර, කණිටු තැනැත්තිය වුවත් සක්විති රජුගේ දියණියක වුවත් සැමියාගේ මෙහෙකාරිය වන්නීය. සැමියා (බිරියට) කතාබහ නොකරනවිට - උලක හිඳිනා සේ දුකට පත්වන්නීය. මම උපකාර ලබන්නට සුදුසු වන්නෙම් (ඔබතුමා මට) උදව්, උපකාර කළ යුතුය. නැතිනම් මා බැහැර කළ යුතුය. මවුපියන් වෙත හෝ යන්නෙමි'යි කීවාය. එවිට සිටුපුතු 'සොඳුරු කණගාටු නොවන්න, ඔබ කෙළිදෙලෙන්, සතුටින් සිටීමට කැමතිනම්, එසේ, නැකැත් උළෙලෙහි සතුටු වෙමු'යි කීය. සිටු බිරිය ඒ කතාබහ පමණින්ම උත්සාහවත්ව, 'හෙට නැකැත් කෙළියෙහි විනෝද වන්නෙමි'යි බොහෝ ආහාර පාන, කැවිලි පිළියෙළ කළාය. සිටුපුතු පසුදින (ඇයට) නොදන්වාම නැකැත් කෙළි පවත්වන තැනට ගියේය. ඇය 'දූත් දූත් පැමිණෙන ලෙස පණිවිඩයක් එවනු ඇතැ'යි මගබලා සිට දහවල් වන බව දැන, (පමාව දැනගැනීමට) මිනිසුන් යැව්වාය. ඔවුහු ආපසු පැමිණ 'සිටු පුතු (නැකැත් කෙළියට) ගිය බව සැළකළහ. ඇය ඒ පිළියෙල කරන ලද සියළු දේ රැගෙන රියකට නැගී උයනට පිටත් වූවාය. මේ අතර, නන්දමූලක පබ්බෙහි පසේ බුදුවරයන් වහන්සේ, ඒ සත්වන දිනෙහි නිරෝධ සමවතින් නැගිට, අනෝතත්ත විලෙන් මුව දොවා

බුලත් දෑහැටි වළඳා, 'අද පිඬු පිණිස කිනම් තැනක හැසිරෙම්ද'යි විමසා බලනවිට එම සිටු දියණිය දැක, 'මේ තැනැත්තිය මට සත්කාර කොට, ඒ (පව්) කම්හි විපාකය අවසන් වන්නේ' යැයි දැන, පාසිවුරු ගෙන අභිඥාඥා පාදක දෑහැනට සමවැද අහසින් අවුත් බැස ඇය හමුවන පරිදි බරණැස දෙසට වැඩියහ. ඒ දුටු දාසීහු සිටු දුවට දැන්වූහ. ඇය රියෙන් බැස, ගරුසරු ඇතිව වැඳ, සියළු රසයෙන් පිරුණු බොජුනින් පාත්‍රය පුරවා, නෙළුම් මල්වලින් වසා පතුලටද නෙළුම් මලක් තබා, මල් පොකුරක් අතින් ගෙන, පසේ බුදුරදුන් වෙත පැමිණ, උන්වහන්සේ අතට පාත්‍රය දී වැඳ, මල්පොකුර අත තබා ගෙනම 'හිමියනි, මම යම්තැනක උපදිම්ද, ඒ ඒ තන්හි මේ මල සේ මහජනතාවට පියමනාප වන්නෙමි'යි පැතුවාය. 'හිමියනි, මව්කුසක ඉපදීම දුකකි. මව්කුසකට නොපැමිණ නෙළුම් මලකම පිළිසිඳ ගනිම්'යි දෙවනුව පැතුවාය. 'හිමියනි, කාන්තාව පිළිකුල් කටයුතුය. සක්විති රජුගේ දුවක වුවත් අන් කෙනෙකුගේ වසඟයට (පතිකුලයට) යන්නීය. එහෙයින් මම ගැහැණියක නොවී, පිරිමියෙක් වන්නෙමි'යි තුන්වනුව පැතුවාය. 'හිමියනි, මේ සසර දුක ඉක්මවා, අවසන, ඔබවහන්සේ පැමිණ සිටින උසස් බවටම පැමිණෙන්නෙමි'යි සිවුවන වරට පැතුවාය. මෙසේ පැතුම් සතරක් පතා ඒ නෙළුම් මල් පොකුර පසේ බුදුන් වහන්සේගේ අත්හි තබා, පසඟ පිහිටුවා වැඳ ඒ මල් සමාන වූ සුවඳ ද පැහැයද ලැබේවා'යි පස්වන පැතුමද කළාය. එවිට පසේ බුදුන් වහන්සේ පාත්‍රයද මල් පොකුරද ගෙන අහසෙහි සිට

**ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු**

**සබ්බෙ පූරෙන්තු සංකප්පා චන්දො පණ්ණරසො යථා** යනුවෙන් 'ඔබ කැමති, පතන ලද දේ ඉක්මණින්ම ඉටු වේවා! පසළොස් කලා පිරි සඳ මෙන් සියළුම අදහස් සපිරේවා'යි මේ ගාථාවෙන් සිටු දුවට අනුමෝදනා කොට, 'මා යන අයුරු සිටුදුව දකීවා'යි අදිටන් කොට, නන්‍දමූලක පබ්වෙහි ගුහාවටම වැඩියහ. සිටුදුව ඒ දැක මහත් සතුටට පත් වූවාය. සසර මෙතෙක් කරන ලද' අයහපත් දෙයෙහි විපාක ලැබීමට ඉඩ නොතබාම අවසන් විය. සියඹලා ඇඹුල් යොදා සේදූ තඹ බඳුනක් මෙන් පිරිසිදු බවට පත් වූවාය. එකෙණෙහිම ඇය විවාපත් සැමියාගේ පවුල්වල නෑදෑයෝද සියළු ජනයාද සතුටුව, 'කුමක් කරමුද?' ආදී තුටු වදන් තෙපළමින් ඇයට තෑගි-පඬුරු යැවූහ. සිටුපුත් ද, 'ඉක්මණින්ම සිටු දුව කැඳවාගෙන එව, මා ඇය අමතකව උයනට ආවෙමි'යි මිනිසුන් යැවීය. එතැන් පටන් සිටුපුත් ඇය රැකබලා ගත්තේ ළය තැවරූ සඳුන් මෙනි.

මුතුහරක් මෙනි. මල්දමක් ලෙසිනි. ඇය එහි ආයු ඇතිතාක් ඉසුරු සැපසම්පත් විඳ, මියගොස්, දෙව්ලොව දෙවියෙක්ව නෙළුම්මලක් තුළම ඉපදුණි. ඒ දෙව්පුත් යනවිටද, සිටිනවිටද, හිඳින විටද, නෙළුම තුළම සිටී. නිදන්නේද නෙළුම තුළමය. 'මහාපදුම දෙව්පුතු' යැයි නම් කළහ. මෙසේ මහාපදුම දෙවියා උඩ සිට පහළට, පහළ සිට උඩට දෙව්ලෝ සයෙහිම සැරිසරයි. එසමයෙහි බරණැස් රජුගේ විසිදහසක් කාන්තාවෝ වෙති. ඉන් එක් තැනැත්තියකගේ කුසකවත් පිරිමි දරුවකු නොපිහිටයි. 'දේවයන් වහන්ස, කුල පරම්පරාව පාලනයට පුතකු ගැන ඔබතුමා කැමතිවිය යුතුය. තමාට දාව පුතකු නොමැතිවිට රජකමට සුදුසු කෙනෙකුද කුල පරම්පරාවේ ඉදිරි පැවැත්මද නැතැ'යි ඇමතිවරු රජුට දැන්වූහ. රජු, අග බිසව හැර, ඉතිරි නළඟනන් සත්දිනක් 'ධම්මනාටක' කරව'යි කැමති පරිදි පිටත සංචාරය කරවීය. එහෙත් (ඒ කිසිම තැනැත්තියකට) පුතකු නොලැබුණි. 'මහරජ, අගබිසව නම් පිනෙන්ද නුවණින්ද සියළු කාන්තාවන්ට වඩා උසස්ය. දේවයන් වහන්ස, බිසවගේ කුස පුතකු ලබන සේ කටයුතු සිදුවන්නේ නම් මැනවැ'යි නැවතද ඇමතිවරු කීහ. රජ අග බිසවට ඒ කරුණ පැවසීය. 'මහරජතුමනි, යම් තැනැත්තියක් ඇත්ත කියන්නීද, සිල්වත්ද ඇය පුතකු ලබන්නීය. හිරිඔතප් නැති විට පුතකු කොයින්දැ'යි කියා පහයට නැගී පන්සිල් සමාදන්ව එම අදහස යළි යළිත් අවධාරණයෙන් සිහිකරන්නීය. සිල්වත් රජ දියණියක වූ අගබිසව, පන්සිල් සිහිපත් කරමින්, පුතකු පතන සිත පහළ වූ කෙණෙහිම, සක්දෙව්ගේ අසුන උණුසුම් විය. ඉක්බිති සක්දෙව් අසුන උණුසුම් වූ කරුණ මෙනෙහි කරනවිට ඒ බව දැන, 'සිල්වත් රජදුවට පුතකු ලැබීමට වරයක් දෙමි'යි අහසින් අවුත් දේවිය ඉදිරියේ සිට 'දේවිය, කුමක් බලාපොරොත්තු වෙහිදැ'යි ඇසීය. 'මහරජ, පුතෙකු'යැයි කීවාය. 'ඒ ගැන නොසිතුව මැනව, දේවිය, ඔබට පුතකු දෙමි'යි කියා දෙව්ලොවට ගොස්, 'මෙහි ආයු පිරිහුණු කෙනෙකු සිටිත්දැ'යි විමසා 'මේ මහා පදුම ඉහළ දෙව්ලොවක ඉපදීමට මෙතැනින් චුත වේ'යැයි දැන, ඔහුගේ විමනට ගොස්, 'දරුව, මහාපදුම, මිනිස් ලොවට යන්නැ'යි ඉල්ලීය. 'මහරජ, එසේ නොකිව මැනවි. මිනිස් ලොව පිළිකුල් යැයි' කීය. 'දරුව, ඔබ මිනිස් ලොවෙහිදී පින්කොට මෙහි උපත ලැබුවෙහිය. එහිම සිට පාරමී පිරිය යුතුයි. යව දරුව'යැයි සක්දෙව් පැවසීය. 'මහරජ, මවුකුස විසීම දුකකි. එහි විසීමට නොහැකි වෙමි'යි (මහා පදුම කීය.) 'දරුව, මවු ගැබකින් ඔබට ඇති එලය කුමක්ද? ඔබ යම් දෙයක් කළෙහිද? එසේ පියුම් ගැබකම ඉපදෙන්න, යන්න දරුව'යැයි නැවත නැවතත් සක්දෙව් කියද්දී එය පිළිගත්තේය.

මහාපදුම දෙව්ලොවින් චුතව, බරණැස් රජුගේ උයනෙහි ගල්තලා සහිත පොකුණෙහි පියුම් ගැබක උපන්නේය. එදින රැයෙහි අළුයම් වේලෙහි සිහිනයෙන්, විසිදහසක් කතුන් පිරිවරා උයනට ගොස් ගල්තලා යුතු පොකුණෙහි පියුමක පුතකු ලැබුවාක් මෙන් දුටුවාය. ඈ පසුදා උදැසන සිල් රකිමින්, එපරිදිම එහි ගොස්, පොකුණු තෙරටද ළං නොවූ, එහෙත් වැඩි (ඈත) ගැඹුරෙහිද නොවූ එක් නෙළුම් මලක් දකීමත් සමගම ඇයට පුතු සෙනෙහස ඇතිවිය. ඇය තමාම ගොස් ඒ මල අල්ලා ගත්තීය. එකෙණෙහිම පෙති විහිදිණි. එහි (මැද) තටුවෙහි (කෙමියෙහි) රන් පිළිමයක් වන් දරුවකු දුටුවාය. දුටුවිටම 'මට පුතෙකු ලැබුණේ'යැයි හඬ නගා කීවාය. 'සාදු! සාදු! යැයි දහස් ගණනින් හඬ පැතිරිණ. රජුටද තොරතුරු දන්වීය. රජු එය අසා කොතැනදී ලැබුණේද'යි විමසා, ලැබුණු අයුරුද විමසා උයනත්, පොකුණත්, නෙළුම් මලත් අපගේමය. එහෙයින් අපට අයිති බිමෙහි හටගත් බැවින්, පුතු 'ඛෙත්තජ' නම් වේ යැයි කියා නගරයට ගෙන්වා විසිදහසක් කාන්තාවන් කිරිමවුන්ගේ කටයුතු සඳහා යෙදවීය. ඒ ඒ කාන්තාව කුමාරයා කැමති දේ දැන, බලාපොරොත්තුවන, අයුරු කෑයුතු දේ කවයි. ඒ ඒ තැනැත්තිය (මසු) දහසක් ලබයි. මුළු බරණැසම කලබලයට පත්විය. සියළු ජනයා කුමාරයාට පඬුරු පිණිස (මසු) දහස බැගින් යැවීය. කුමරු ඒ ඒ දේවල් නොගෙන, 'මෙය කන්න, මෙය අනුභව කරනු මැනවැ'යි කියනවිට, ආහාර අනුභවයෙහිද කරදර කරනු ලබන්නේ යැයිද කළකිරී ගෙය දොරටුව ළඟ ලාකඩ ගුලියක් (බෝලයක්) ගෙන සෙල්ලම් කරයි. එකල එක්තරා පසේබුදුවරයෙක් බරණැස ඉසිපතනයෙහි වසති. උන්වහන්සේ අළුයම පිබිද සෙනසුන්වත්-සිරුරු කිස (නිමවා) කමටහන් මෙනෙහිකොට, විවේකයෙන් නැගිට, 'අද කොතැනින් පිණ්ඩපාතය ලබම්දැ'යි (යහපත්) දෙයක් කරන ලදැ'යි සළකා බලද්දී, 'මා වැනි පසේ බුදුවරයකුට පිඬු අහර දී පැතුම් හතරක් පතන ලද අතර, ඉන් තුනක් ඉටුවී ඇත. එක් පැතුමක් ඉටු නොවීය, සුදුසු අයුරින් ඔහුට (ඊට) අරමුණක් දක්වන්නෙමි'යි කුමරු අසලින් වැඩියහ. කුමරු ඒ දැක, 'මහණ, මහණ, මෙහි නොඑනු, මොවුන් (මෙහි සිටින මිනිසුන්) ඔබටද 'මෙය කන්න, මෙය අනුභව කරන්නැ'යි කියා කරදර කරති'යි කීය. පසේ බුදුන් වහන්සේ එක් වචනයකින්ම එතැන නැවතී (ආපසු) තම සෙනසුනටම වැඩියහ. 'මේ මහණ මා කියන ලද පරිදිම නැවතුණේය. මා හා කෝප වීදැයි'? තම පිරිවර ජනයාගෙන් ඇසීය. 'දේවයන් වහන්ස, පැවිද්දන් නම් තරහ සිත රඳවා ගන්නන් නොවෙති. අනුන් සතුටු සිතින් දෙන දෙයකින් යැපෙති'යි ඔවුහු කීහ. එසේ කීවත්, 'මේ සමණා මා

සමග කෝප වන්නට ඇත. 'කමා කරගන්නෙමි'යි මවුපියන්ටද සැළකොට ඇතු පිට නැග මහත් රාජ තේජසින් යුතුව ඉසිපතනයට ගොස්, මුව රැළක් දැක, 'අර සතුන්ගේ නම කුමක්දැ'යි විචාළේය. හිමියනි, ඒ මුවන් යැයි (ඔවුහු කීහ.) එසේනම් ඒ මුවන් 'මෙය කව, මෙය අනුභව කරව, මෙය රසවිඳුව'යි කියද්දී එය පිළිගන්නේද? නැද්දැ'යි ඇසීය. 'නැත, හිමියනි, යම්තැනක තණ, ජලය පහසුවෙන් ලැබේද එහි වාසය කරති'යි කීහ. මේ මුවන් රැකවරණයක් නැතිවම කැමති තැනකම වසති. කවදා මමත් එසේ පවතින්නෙම්දැ'යි සිතා කුමාරයා එය අරමුණුකොට ගත්තේය. පසේ බුදුන් වහන්සේද ඔහුගේ පැමිණීම දැන, සෙනසුන් මගද, සක්මන්මළුවද ඇමද, සමකොට, වරක් දෙවරක් සක්මන් කොට පා සලකුණු දක්වා, දිවා විහරණ තැන ද පන්සලද ඇමද, පිවිසුම් පා සටහන් තබා, නික්මුණු පා සටහන් නොදක්වා වෙනත් තැනකට වැඩියහ. කුමාරයා එහි ගොස්, ඒ පෙදෙස ඇමද සමකොට ඇති බව දැක, 'මෙහි ඒ පසේබුදුන් වහන්සේ වැඩසිටිනු ඇතැ'යි පිරිවර ජනයාගේ කීම අසා, උදෑසනද ඒ සමණයන් කිපුණෝය. දැන් ඇතුන් අසුන් සමග තමන්ගේ අඩවියට (බලෙන් මෙන්) පිවිසෙනු දැක තවත් කිපෙන්නේය. ඔබලා මෙතැනම නැවතී සිටිවු' කියා ඇතු පිටින් බැස, තනිවම සෙනසුනට පිවිසියේ, වත පිළිවෙත අනුව මැනවින් සමව පිරිසිදු කොට ඇති තැන පා සලකුණු දැක, 'මේ මහණ මෙහි සක්මන් කරනු මිස වෙළඳ කටයුතු ගැන නොසිතුවේය. ඒකාන්තයෙන් තම යහපතම සිතුවේ'යැයි (තවදුරට) විමසමින් දිවා විහරණය කරන තැනට ගියේය. එහිද පා සලකුණ දැක, එසේම අදහස්කොට, නැවත පයෙන් පය තබමින් දොර විවර කොට පන්සල තුලට පිවිස, පසේබුදුන් වහන්සේ නොදැක, වටපිට බලද්දී උන්වහන්සේගේ ආසනය වන ගල්තලාව දුටුවේය. එයද දුටු කුමරු 'මේ මහණ මෙහි හිඳිමින් වෙළඳ කටයුතු ආදිය ගැන නොසිතුවේය. ඒකාන්තයෙන් තම යහපතම මහණදම් ගැන සිතුවේ යැයි එහිම හිඳ නුවණින් මෙනෙහි කොට සමථ විදසුන් පුරා පසේබුදුබව අවබෝධ කළේය. ලොවුතුරු සුව විඳින (මෙහි පැමිණි ඒ කුමරු) බැවින් එතැනින් ඉවත් නොවේ. ඇමතිවරු, රජුගේ අණට ගරු කළ යුතුයි, මගේ පුතු බොහෝ වේලාවක් අරණෙහි පමා කළාහුදැ'යි, අපට දඬුවම් පමුණුවන්නේය. කුමාරයා කැඳවාගෙන යමු'යි පන්සලට පිවිස පසේබුදුන් වහන්සේ නොදැක, කුමරු (පමණක්) එසේ හිඳිනු දැක 'මොහු පසේ බුදුන් වහන්සේ නොදුටු නිසා (ඒ ගැන) සිතමින් සිටී'යැයි කතිකා කොට, 'දේවයන් වහන්ස, පසේබුදුන් වහන්සේ මෙහිම වැඩවසති. වෙනත් කිසිතැනකට ගොස්

නැත. හෙට මෙහි අවුත් කමා කරවන්නෙමු. පසේබුදුන් වහන්සේ නොදක්නා ලදැ'යි (ඒ ගැන) නොසිතනු මැනවි. එන්න (ආපසු) යමු'යි පැවසූහ. 'මම නොසිතමි. මම නොසිතන කෙනෙක් බවට පත්වීමි'යැයි (කුමරු) කීය. 'හිමියනි, කුමක් කරන ලදදැ'යි ඇසූවිට 'පසේ බුදු වූයෙමි'යි පිළිතුරු දුන්නේය. පෙර පරිදිම කමටහන් ගැන විමසන ලදුව **මිගො අරඤ්ඤම්හි** යන මෙම ගාථාව කීය.

**මිගො** තිණමිග හා පසදමිග යනුවෙන් මුවන් ජාති දෙකකි. එසේ වුවත් වනයෙහි වසන සියළුම සිවුපාවුන්ට මෙය සමාන වචනයකි. මෙහි 'පසද' මුවා අදහස් වේ. **අරඤ්ඤම්හි** ගම හා ගම සමීප පෙදෙස හැර ඉතිරි කොටස කැලයයි. මෙහි උයන අදහස් වේ. යථා සමාන කොට දක්වීමයි. අබදෙධා රැහැනින් ආදී කිසියම් බැඳුම්වලින් නොබැඳුණු මෙයින් නිසැක හැසිරීම් රටාවක් දක්වයි. **යෙනිච්ඡකං ගච්ඡති** ගොචරාය කැමති දිසාවකින් ගොදුරු පිණිස යයි. එහෙයින් කැමති දුරක් යයි. කැමති දෙයක්ම කයි. 'මහණෙනි, කැලයෙහි වසන මුවා එම මහ වනයෙහි සැක රහිතව යයි. සැක රහිතව සිටී. සැක රහිතව හිඳී. සැක රහිතව නිදයි. එයට හේතු කවරේද? මහණෙනි, එහි වැද්දකු හමු නොවන හෙයිනි. එමෙන්ම පැවිද්දා ද කාමයන්ගෙන් දුරුව, පළමු දැහැන ලැබ වාසයකරයි. මහණෙනි, මෙයට පැවිද්දා විසින් මාරයා අඳ බවට පත්කරනු ලදැයි කියනු ලබයි. හේතු රහිතවම පාපී මාරයාට දැකිය නොහැකි ලෙස ගියේ' යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. 'සෙය්‍යථාපි භික්ඛවෙ ආරඤ්ඤකො මිගො අරඤ්ඤෙ පවනෙ චරමානො විස්සත්ථො ගච්ඡති, විස්සත්ථො තිට්ඨති, විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පෙති, තං කිස්ස හෙතු? අනාපාථගතො භික්ඛවෙ ලුද්දස්ස, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරස්ස චක්ඛුං අදස්සනං ගතො පාපිමතො' යැයි විස්තරකොට ඇත. **විඤ්ඤූ නරො** දැනුම් තේරුම් ඇති පණ්ඩිත තැනැත්තා **සෙරිතං** තමා කැමති සේ, නිදහස්ව, අනුන්ට යටත් නොවූ, **පෙක්ඛමානො** නුවණැසින් බලමින්, නැතහොත් දහමෙහි නිදහස් බව හෝ පුද්ගල නිදහස් බවයි. ලොවුතුරු දහම්හි කෙලෙසුන් වසඟයට නොගිය බැවින් නිදහස්ය. එසේ යුතු වූ තැනැත්තෝ, ඔවුන්ගේ සොබාවය දක්වීම **සෙරිතා** යැයි කියන ලදී. එය බලාපොරොත්තුවෙමින්, කුමක් හෙයින් කියන ලදද? මුවා කැලයෙහි කිසිදු බැඳීමකින් තොරව, ගොදුරු සොයා කැමති තැනකට යයිද, මමද

කවදා එසේ (සසරින්) යන්නෙම්ද? මෙසේ ඔබලා මාගේ පිරිවර ලෙස බැඳ තබා ගැනීමෙන් කැමති තැනක යාමට නොලැබේ. (එහෙත්) කැමති තැනකට යාමට හැකි පරිදි ලැබෙන පහසුව සළකා අනුපිළිවෙලින් සමථ විදසුන් වැඩීමෙන් පසේබුදුබව ලැබූවෙමි. එහෙයින් නිදහස බලාපොරොත්තු වන අනෙක් නුවණැති තැනැත්තා එකො චරෙ ඛග්ගවිසාණකප්පො ඉතිරි කරුණු ඉහත කියා ඇති පරිදි දතයුතුය.

මිග ගාථා විස්තරය නිමි.

## 6.

ආමන්තණා යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? පෙර මොළොක් ගතිගුණ ඇති 'එකවජ්ජික' බඹදත් නම් රජෙක් විය. රාජ භටයෝ රජු සමග සුදුසු දෙයක් හෝ නුසුදුසු දෙයක් හෝ (යුතු-අයුතු දේ) සාකච්ඡා කිරීමේදී වෙන් වෙන්ව එක් තැනකට (ඒ ඒ තැන්වලට) ඔහු කැඳවාගෙන යති. එක්දිනක් රජු දිවාකල නිදා සිටියදී එක්තරා මිනිසෙක් 'දේවයන් වහන්ස, මට ඇසිය යුතු දෙයක් ඇතැ'යි එක් තැනකට පැමිණෙන ලෙස ඉල්ලා සිටියේය. රජු නැගිට (එතැනට) ගියේය. නැවත එක් අයෙක් (යම් කරුණක් දැන්වීම සඳහා) මහ උවටැන් හලෙහි හිඳින ලෙස ඉල්ලීය. එක් අයෙක් (රජු) ඇතුපිට සිටින විටද, තවත් අයෙක් (රජු) අසුපිටෙහි සිටින විටද, තවත් විටෙක රත්රියෙහි නැගී සිටින විටද, තවත් කෙනෙක් දෝලාවෙහි හිඳ උයනට යද්දීද (එසේ) ඉල්ලා සිටී. රජු දෝලාවෙන් බැස එක් තැනකට (පසෙකට) ගියේය. වෙනත් අයෙක් (රජු) ජනපදයෙහි සැරිසරනවිට (එසේ) ඉල්ලා සිටියේය. ඔහුගේද කීම අසන්නට ඇතුපිටින් බැස එක් තැනකට ගියේය. මෙසේ ඔහු එක වැරදිකරු යැයි පසිඳුව, කලකිරී, පැවිදි විය. ඇමතිවරු යස ඉසුරින් වැඩුණහ. එක් ඇමතියෙක් රජු වෙත ගොස්, 'මහරජ, අසවල් නම ඇති ජනපදය මට දෙනු මැනවැ'යි ඉල්ලීය. රජු මේ නම් ඇති තැනැත්තා ඒ ජනපදයෙහි (අයබදු ආදිය ලබමින්) පරිහරණය කරන බව කීය. ඇමති රජුගේ වචන නොඅදහා මම ඒ ජනපදයට යමි. එය අල්ලාගෙන එහි (සම්පත්) පරිහරණය කරමි'යි

කලහ කොට, නැවත දෙදෙනාම රජු වෙත පැමිණ එකිනෙකාගේ වරද සැළකරති. රජු 'මොවුන් සතුටු කිරීමට, සෑහීමකට පත් කිරීමට නොහැකි'යැයි ඔවුන් ලෝභී සිතිවිලිවල දොස් දැක, විදසුන් වඩමින් පසේබුදුබව අවබෝධ කළේය. පෙර සඳහන් අයුරු මෙම උදාන ගාථාව කීය.

එහි තේරුම මෙසේය. 'සහායකයන් මැද සිටියද, දහවල් සැතපෙන විටද, මහා උවටැනෙහිද, උයනට යන අතරද, ජනපද චාරිකාවේදීද 'මේ කියන දේ අසනු මැනව, මෙය මට දෙනු මැනව' ආදී ලෙසින් ඒ ඒ අයුරු ඇමතුම් වෙයි. එහෙයින් මම එහි කලකිරී, ලෝභයෙන් ඉහවහා ගිය සියළු මිනිසුන් මැද ඇලීම්, ආසා රහිතව, උතුම් ජනයා විසින් ඇසුරු කරන ලද, නොයෙක් යහපත් පලවිපාක ඇති, ඒකාන්ත සුව ඇති, අන් වසඟයෙහි නොපවත්නා, බොහෝ පැතුම් නැති පැවිද්ද හඳුනා දහමෙන්ද පුද්ගල ලෙසින්ද නිදහස බලාපොරොත්තුවෙන් විදසුන් වඩා පිළිවෙළින් පසේ බුදුබව අවබෝධ කළෙමි. ඉතිරි කරුණු කලින් කී පරිදිමය.

ආමනතණ ගාථා විස්තරය නිමි.

## 7.

**ඛිඩ්ඩාරතී** ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස බඹදත් නම් එකම පුතකු ඇති රජෙක් විය. ඒ එකම පුතුට රජු (තම) පණ හා සමානව පියමනාප විය. ඔහු හැම තැනකටම පුතු රැගෙනම යයි. ඔහු දිනක් (මාලිගයෙහි) නවතා උයනට ගියේය. කුමාරයාද එදිනම වැළඳුණු රෝගයකින් මළේය. 'පුතු සෙනහසින් රජුගේ ළය පැලේවි'යැයි රජුට නොදන්වාම ඇමතිවරු කුමරු දවාලූහ. රජුද උයනෙහිදී සුරාවෙන් මත්ව, පුතු ගැන සිහි නොකළේය. පසුදින ද දිය නාන විටද, ආහාර අනුභව කරන වේලාවේද (පුතු අමතක වුවත්) අනුභවයෙන් පසු, හිඳගෙන සිටින අතර, 'පුතු මා වෙතට ගෙන එව'යි කීය. ඔහුගේ අණ පරිදි ඒ පුවත සැළ කළහ. එයින් සෝකයෙන් පෙළී, 'මේ දේ ඇතිකල්හි මෙසේ වෙයි. මේ දෙය හටගත් කල මෙය හටගනී' යනුවෙන් එහි හිඳිමින්ම නුවණින්

මෙනෙහි කළේය. මෙසේ ඔහු මුල සිට අගට - අග සිට මුලට හේතුපල සබඳතාව මෙනෙහි කරමින් පසේබුදු බව අවබෝධ කළේය. මෙහි අදාල ගාථාවේ අරුත හැර ඉතිරි කරුණු සංසගග ගාථාවෙහි සඳහන් පරිදිමය.

පදවල තේරුම් විස්තර අනුව ඛිඩ්ඩා සෙල්ලම් ගතිය, කෙළි බවයි. එය කයින්, වචනයෙන් යැයි දෙයාකාරය. කායික යනු ඇතුන්ගෙන්, අසුන්ගෙන්, දුනුවලින්, කඩු ආදියෙන් කරන සෙල්ලම්ය. ගී සිලෝ කීමෙහිද මුවින් බෙරහඬ වැනි නාද නැංවීම වාචසිකය. රතී පස්කම්හි ඇලීමයි. විපුලං තම සිරුරෙහි ඇට මිදුළු දක්වා විනිවිද යන සියළු තැන් මතුකරන ලදී. ඉතිරි කරුණු පැහැදිළිය. ඉන්පසු සියළු විස්තර සංසගග...... ගාථාවෙහි සඳහන් පරිදි දතයුතුය. ඉදිරියට ඒ කරුණු එපරිදිම සැළකිය යුතුය.

ඛිඩ්ඩා රති ගාථා විස්තරය නිමි.

# 8.

චාතුද්දිසො ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? පෙර කසුප් බුදු සසුනෙහි පසේ බෝසත්වරු පස්දෙනෙක් පැවිදිව, අවුරුදු විසිදහසක් 'ගත පච්චාගත' වත පුරා දෙව්ලොව උපන්හ. ඔවුන්ගේ දෙටු තැනැත්තා (පසුව) බරණැස රජ විය. අනෙක් තැනැත්තෝ රජවරු වූහ. ඒ රජවරු සතරදෙනාම කමටහන් උගෙන, රජකම හැර පැවිදිව පිළිවෙලින් පසේ බුදුබවට පත්ව, නන්දමූලක පබ්බේ ගුහාවෙහි වසමින්, එක්දිනක් සමවතින් නැගී, 'වංසකළීර' ගාථාවෙහි කී පරිදි තමන්ගේ (පෙර) කටයුතුද, සහායකයා ගැනද සළකා බලා (දෙටු වූ) බරණැස් රජුට, උපායෙන් අරමුණක් දක්වීමට සුදුසු මගක් සොයති. ඒ රජුද රෑ යාමයෙහි තෙවරක්ම තැති ගනී. බිය වී දුකින් හඬ නගයි. විසල් උඩුමහලෙහි දුවයි. පුරෝහිත විසින් උදෑසන පිබිද රජුගෙන් 'සැපසේ නින්ද ලැබුණේද'යි විචාළද, 'ඇදුරුතුමනි, මට සැපක් නම් කොයින්ද'යි කියා ඒ සියළු පුවත් සැළ කළේය. පුරෝහිතද 'මේ රෝගය කිසියම් වමන, විරේක ආදී බෙහෙතින් සුවකළ නොහැකියි,

මට 'වවාගත කෑ හැකි මගක්'• පහළ වී යැයි සිතා 'මහරජ, එය රජකමට හානි මෙන්ම ජීවිතයට ද අනතුරුදායක පෙරනිමිති' යැයි රජු තවත් තැති ගන්වා, එය වළක්වා ගැනීමට මෙපමණ, මෙපමණ ඇත්, අස්, රිය ආදියද, දඹරන්, රත්රන් සහ වෙනත් දියයුතු දෑ දී යාගයක් පවත්වා ආයාචනා කළයුතු යැ'යි රජුට තහවුරු කළේය. එහිදී පණ ඇති නොයෙක් සතුන් දහස් ගණනක් යාගය පිණිස සූදානම් කරනු දුටු පසේ බුදුවරු 'මෙබඳු දේවල් කළොත්, (රජුට) පසේ බුදුබව අවබෝධ කළ නොහැකි වෙයි. එහෙයින් කලින්ම ගොස් ඔහු ගැන බැලීම මැනවැ'යි වංසකළීර ගාථා කථාවෙහි කී අයුරින් අවුත් පිඬු පිණිස රජමිදුලෙහි පේලියකට වැඩියහ. රජු සීමැදුරු කවුළුවෙන් රජමිදුල දෙස බලද්දී පසේ බුදුවරුන් දුටුවේය. දකිනවාත් සමගම ඔහුට සෙනෙහස ඇතිවිය. එහිදී උන්වහන්සේලා කැඳවා, උඩුමහලෙහි පණවන ලද ආසනවල හිඳුවා මනාව වළඳවා අවසානයෙහි 'ඔබලා කවුරුන්ද'යි විමසීය. 'මහරජ, අපි 'සිවුදිසා' නම් වෙමු'යි කීහ. 'හිමියනි සිවුදිසා යන්නෙහි තේරුම කුමක්ද'යි රජු ඇසීය. 'මහරජ, සිවුදිසාවෙන් අපට කිසිදු බයක් හෝ සිතෙහි තැතිගැන්මක් හෝ නැතැයි පිළිතුරු දුන්හ. 'හිමියනි, කුමන කරුණක් නිසා ඔබලාට ඒ බිය නැත්තේද'යි රජු විමසීය. 'මහරජ, මෙත් වඩමු, කරුණාව, මුදුබව, මැදහත් බව වඩමු. ඒ නිසා අපට බියක් නැතැ'යි කියමින්ම අසුනින් නැගිට තමන් වසන තැනට ගියහ. 'මේ මහණහු මෙත් ආදිය වැඩීමෙන් බයක් නැතැ'යි කියති. බමුණෝ පණ ඇති නොයෙක්, දහස් ගණන් සතුන් මැරීම අගය කොට කතා කරති. කවරකුගේ කීම ඇත්තද'යි රජුට සිතුණේය. නැවත රජුට මෙබඳු අදහස් විය. 'සමණහු පිරිසිදුබවින් අපිරිසිදු බව සෝදා හරිති. බමුණෝ අපිරිසිදු බවෙන් පිරිසිදු බව සෝදති. අපිරිසිදුව අපිරිසිදු බව සේදීමට නොහැකිය. පැවිදි වූවන්ගේ වචනම ඇත්තය. 'රජු සියළුම ජීවත්වන්නෝ සැපවත් වෙත්වා'යි ආදී ලෙසින් මෙත් ආදී සිවු බඹ විහරණ වඩා, හිතසුව පිරුණු සිතින්, 'සියළු සතුන් මුදාහරිවු' යැයි ඇමතියන්ට අණ කළේය. සිහිලැල් දිය බීමට ලැබේවා! කොළ පැහැති තණකොළ කෑමට ලබත්වා! සිහිලැල් සුළඟ උන්ට හමාවා! ඇමතිවරු අණ ඉටුකළහ. රජු, යහපත් මිතුරු වචනයෙන්, අයහපත් කටයුතුවලින් මිදුණෙමි'යැයි සිතා එහිම හිඳ විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළේය. ඇමතිවරුන් විසින් කෑම වේලාවෙහි 'මහරජ, අනුභව කළ මැනවැ'යි කාලය දැන්වූ විට, 'මම රජ නොවෙමි'යි පෙර

• ඛාදනූපායො

(කතාවල) සඳහන් වූ පරිදි සියල්ල කියා මෙම උදාන විස්තර ගාථාව කීය.

චාතුද්දිසො - සතර දිසාවෙහිම සැප විහරණයෙන් යුතු බවයි. (මෙත් සිත) එක් දිසාවක් පතුරුවා වාසය කරයි' එකං දිසං ඵරිත්වා විහරති' ආදී ලෙසින් බඹ විහරණ භාවනාව සිවු දිසාවටම වඩන බවද චාතුද්දිසො යන්නෙන් අදහස් වේ. ඒ ඒ දිසාවන්හි කිසියම් ජීවියෙකු හෝ බය ඇතිකරවන ඕනෑම දෙයකින් පීඩා විඳීම - වෙහෙසට පත් නොවීම අප්පටිඝො නම් වේ. සන්තුස්සමානො යනු දොළොස් ආකාර වූ සතුටු වීමයි. ඉතිරීතරෙන (ආහාර, ඇඳුම් පැළඳුම්, ආදී ජීවත්වීමට අවැසි දේ) පරිස්සයානං සහිතා අජම්භී - මෙහි පරිස්සය හෙවත් උවදුරු කය සිත ලෙස දැක්වේ. එම සම්පත් අඩුවී යයිද ඒවා හැර දැමීමද පරිස්සයා වේ. සිංහ වගවලස් ආදීන්ගෙන් වන උවදුරු පිටතින් පැමිණෙන ලෙසද, කාමච්ඡන්ද ආදී කයට සිතට වන උවදුරු ඉවසා දරාගෙන, දැඩි උත්සාහයෙන් කටයුතු කිරීම පරිස්සයානං සහිතා දැඩි බිය ඇති නොවන ලෙස සිටීම අජම්භී වෙයි. කුමක් නිසා කියන ලදද? (යමෙක්) එම පැවිදි සතර නම මෙන්, සිවුපසය ලැබෙන අයුරින් සෑහීමට, සතුටට පත්ව, මෙහි දක්වන ලද සතුටින් යුතුව, සිවු දිසාවෙහිම මෙත් ආදී භාවනාවෙන්, සියළු දේවල් කෙරෙන් මතුවන බිය නොමැති බැවින්, කලින් සඳහන් කළ පරිදි සිවු දෙසින්ම උවදුරු නොමැතිව, තැති නොගෙන සිට, ඒ පිළිවෙත් ගුණ දැක-නුවණින් පිළිපැද-අනුගමනය කොට පසේ බුදුබව අවබෝධ කළෙමි. නැතහොත් ඒ පැවිදි වූවන් මෙන්, ලැබෙන දෙයින් සතුටුව 'සිවුදිසා ඵකවරණ' පතමින්, නුවණ මෙහෙයා අවබෝධ කොට ගතිමි. එහෙයින් අනෙක් තැනැත්තන් ද මෙබඳු තැනකට (පැමිණීම) පතමින්, සිවු දෙසින්ම වන උවදුරු ඉවසා - ඒවා දුරුකොට බිය නොවේ. එකො චරෙ ඛග්ග විසාණ කප්පො ඉතිරි කරුණු කලින් දන්වා ඇති පරිදිය.

චාතුද්දිස ගාථා විස්තරය නිමි.

# 9.

**දුසසංගහා** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස් රජුගේ අග බිසව කළුරිය කළාය. සෝක කාලය ඉකුත් වූ කල එක් දවසක් ඇමතිවරු 'රජුන්ගේ ඒ ඒ කටයුතුවලදී අග මෙහෙසියකගේ සහාය පැතිය යුතු' බව සැළකොට 'රජතුමා වෙනත් දේවියක කැඳවා ගන්නේ නම් මැනව'යි ඉල්ලා සිටියහ. රජු 'ඇත්තමද?' (සුදුසු දේවියක ගැන සොයා බලා) දැනගනිවු' යැයි කීය. එසේ සොයා බැලීමේදී, සමීප වූ (කුඩා) රජයෙක රජු මළබවත්, ඔහුගේ දේවිය පාලනයෙහි උපදෙස් දෙන බවත්, ඇය ද ගැබිනියක වුව රජුට සුදුසු යැයි දැන, ඇයගෙන් (කැමැත්ත) ඉල්ලූහ. 'ගැබිනියක නම් මිනිසුන් අනුමත නොකරනු ඇත. දරුවා ලැබෙන තෙක් පමා කරන්නේ නම් එසේ වේවා! එසේ නොහැකි නම්, වෙනත් තැනැත්තියක සොයව'යි ඇය කීවාය. ඇමතිවරු ඒ බව රජුට සැළ කළහ. 'ගැබිනියක වුව කම් නැත, කැඳවාගෙන එව'යි රජු කීය. ඔවුහු කැඳවාගෙන ආහ. රජු ඇ අගමෙහෙසිය බවට පත්කොට, අග බිසවකට හිමි සියළු සම්පත් දුන්නේය. පිරිවර ජනයාද නොයෙක් ආකාර පඬුරු එකතුකොට දුන්නේය. ඇය තිසි කල පුතකු වැදුවාය. රජු තමාගේම පුතකු මෙන්, හැම විටකදීම උකුලෙහි හොවාගෙන වඩාගෙනද සිටී. එවිට දේවියගේ පිරිවර ජනතාව, 'රජු කුමාරයාට බොහෝසෙයින් ආදරයෙන් උපකාර කරයි. රජකුගේ හදවත නම් එකලෙසම නොපවතී. එහෙයින් ඔහු භේද කරමු'යි සිතුවේය. 'දරුව, ඔබ අපගේ රජතුමාගේ පුතාය, මේ රජුගේ නොවේ, මොහු අදහා නොගන්නැ'යි ඔවුහු කුමරුට කීහ. 'පුත, මෙහි එන්න' යැයි රජු කුමරුට අමතන විට, අතින් අල්ලා තමා වෙතට කැඳවන විටත්, පෙර දී මෙන් රජුට ඇල්මක් නොපෙන්වයි. රජු මේ කුමක්දැ'යි විමසා ඒ තොරතුරු දැන, 'බොල! මොහුට මා මෙසේ සළකතත්, පිළිකුල් කරන්නේම'යැයි කලකිරී රජකම හැර පැවිදි විය. රජ පැවිදි වූ නිසා බොහෝ ඇමති පිරිවර ජනයාද පැවිදි වූහ. පිරිවර ජනයා සමග රජු පැවිදි වූ බව අසා මිනිස්සු රසවත් ආහාර එහි ගෙන ගොස් දෙති. පැවිදි වූ (රජු) ඒ මිහිරි මිහිරි ආහාර පැවිදිව සිටින වයසින් වැඩි දෙනාට දීමට සලස්වයි. එහිදී හොඳ රසවත් ආහාර ලබන්නෝ සතුටු වෙති. 'අපි මෙම සිටින තැන්හි මිදුල්, සක්මන් මළු ඇමදීම් ආදී සියළු කටයුතු කරමින්, නීරස, රළු බත්, ආහාර, පරණ රෙදි ලබමු'යි ඉතිරි පිරිස දොස් කීහ. (නායක) පැවිද්දා (රජු) එය දැන 'වැඩිමහළු වූවන්ට දෙනවිට

දොස් කියති. අහෝ! මේ පිරිසට උපකාර කිරීම අපහසු'යැයි පා සිවුරු ගෙන තනිවම කැලයකට පිවිස විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළේය. (පසුව) එහි ගිය පිරිස විසින් කමටහන විමසන ලදුව මේ ගාථාව කීය.

එහි අරුත පැහැදිලිය. මේ එයින් පහදා දෙන කරුණුයි. උපකාර, සත්කාර කළ නොහැකි වූ විට පැවිද්දන් අතරද ඇතැම්හු අසතුටින් පෙළෙති. එමෙන්ම ගෙවල්වල වසන ගිහියෝ ද, එබඳුම වෙති. මම ඒ උපකාර-සත්කාරයෙන් සතුටු නොවන බව පිළිකුල් කරමින් විදසුන් වඩා (ඇති තතු) අවබෝධය ලැබීය. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදි දතයුතුය.

දුස්සංගහා ගාථා විස්තරය නිමි.

## 10.

ඔරොපයිත්වා ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස සිවුමාසික බඹදත් නම් රජ, ග්‍රීෂ්ම ඍතුවේ පළමු මාසයේ උයනට ගියේ, එහි සිත්කළු බිම් පෙදෙසක, තද නිල් පැහැ කොළවලින් ගැවසී ගත් කොබෝලීල ගසක් දැක, 'කොබෝලීල ගස මුල මගේ යහන පණවව'යි කියා උයනෙහි කෙළිදෙළින් ගතකොට සවස් කාලයෙහි එහි නිදන්ට විය. නැවත, උණුසුම් කාලයේම අතරමැද මාසයේ (දිනක) උයනට ගියවිට කොබෝලීල ගසෙහි මල් පිපී තිබුණි. (රජු) එදිනද පෙර ලෙසම ගත කළේය. නැවතත් උණුසුම් කාලයේ අවසන් මාසයේ උයනට ගියවිට කොබෝලීල ගස කොළ හැලී වියළී ගසක් සේ තිබිණ. රජු එය නොදැකම, පෙර පරිද්දෙන් එහිම නිදා ගැනීමට (පිළියෙල කරන ලෙස) අණ කළේය. ඇමතිවරු ඒ බව දැනසිටියත්, රජ අණ නිසා බියනේ එහිම යහන පැණවූහ. ඔහු උයනෙහි කෙළිදෙළින් ගතකොට, සවස් කාලයෙහි එහි නිදන විට ඒ ගස දැක, 'මෙය පෙර කොළවලින් පිරී ගැවසී මැණික්වලින් සෑදුවාක් මෙන් ඉතා සොඳුරු දැක්මක් විය. එසේම මැණික් පැහැගත් අතුපතර තැබූ පබළු කැට මෙන් මලින් පිරී, සිරියාවත් බව පෙනිණ. නටුවෙන් ගිලිහුණු මල් වැටී, මුතු

දලක් බඳු වැලිවලින් පිරුණු බිම රත් කම්බිලියක් ඇතිරූ සේ විය. ඒ ගස අද වියළී, අතු පමණක්ම ඉතිරිව පවතී. අහෝ! ඒ සුන්දර කොබෝලීල ගස ජරාවට පත් වූ සැටි!'යැයි සිතා ඉපදීම ඇතිතාක්ම ජරාවෙන් නැසේ. ඉපදීමෙන් පල කිමැ'යි? කිසිම දෙයක් තිර පැවැත්මක් නොවන බව අවබෝධ විය. ඒ අනුව යම් යම් හේතු නිසා ඇතිවන සියළු දෙයෙහි දුක ද නොතිර බව ද විදසුන් කොට සිතමින්, 'අහා! මමත් කොළ හැලුණු කොබෝලීල ගස මෙන්, (සසරෙහි) ගිහි බවින් ඉවත් වන්නෙම් නම් මැනවැයි පතමින්, එම නිදා සිටි තැනම දකුණු පසට හැරෙනවිටම පසේ බුදුබව අවබෝධ කළේය. ආපසු (රජ මැදුරට) යන වේලාවේදී ඇමතිවරුන් 'මහරජ, යාමට කාලය'යැයි දන්වූ විට 'මම රජෙක් නොවෙමි' ආදී ලෙස කියා පෙර පරිදිම මේ ගාථාව කීය.

**ඔරොපයිත්වා** ඉවත්කොට, ගිහි ව්‍යඤ්ජනානි, කෙස් රවුල්, සුදු ඇඳුම් අලංකාර කෙරෙන මල් සුවඳ විලවුන් කාන්තාවන්, අඹුදරු දාස දාසීන් මේවා ගිහි ජීවිතයෙහි සලකුණුය. එහෙයින් ගිහි ව්‍යඤ්ජන යැයි කියනු ලැබේ. **සංසීන පත්තා** කොළ හැලුණු, **ජෙත්වා** මගපල නුවණින් සිඳ දමා, **වීරො** එයට උත්සාහ වූ, ගිහි බන්ධන කැමති කැමති දෙයෙහි ඇති බැඳීමයි. කාමය හෙවත් පස්කම් ගිහි ජීවිතයෙහි බැඳුමකි. මෙය වචනයේ තේරුමයි. එයින් අදහස් වන්නේ මෙයයි. 'මමත් ගිහි ජීවිතයෙහි සියළු බැඳීම් අත්හැර දමා - කොළ හැලුනු කොබෝලීල ගසක් මෙන් වන්නේ නම් මැනවැයි සිතමින් විදසුන් වඩා පසේ බුදු බවට පත්වීමි' යනුයි. ඉතිරි කරුණු පෙර පරිදිම දතයුතුය.

**කෝවිලාර ගාථා විස්තරය නිමි.**

**පළමු වග (කොටස) අවසන්.**

## 11

**සචෙ ලභෙථ** යන ගාථාවන්ට හේතු වූ කරුණ කුමක්ද? පෙර කසුප් බුදු සස්නෙහි පසේ බෝසත්වරු දෙදෙනෙක් පැවිදිව අවුරුදු විසිදහසක් 'ගතපච්චාගත වත' පුරා දෙව්ලොව උපන්හ. එයින් චුතව,

වැඩිමහල් තැනැත්තා බරණැස රජුගේ පුතුව උපන්නේය. බාල තැනැත්තා පුරෝහිතගේ පුතාව ඉපදුණේය. ඔවුහු එකම දිනෙහිම කුස පිළිසිඳ ගෙන, එකම දිනයෙහිම මවුකුසින් බිහිව වැළිකෙළියේ පටන් යහළුවෝ වූහ. පුරෝහිත පුතු නුවණැත්තේ 'මිතුර, ඔබ පියා ඇවෑමෙන් රජ වෙහි, මම පුරෝහිත තනතුර ලබමි. මනා සංයමයෙන්ද, යහපත් ලෙසද රජය විචාරීමට හැකිය. එම, සිප් උගනිමු'යි යාග පූජා නූලක් ගෙල පැළඳ ගම් නියම්ගම්හි අහර පිණිස හැසිරෙමින්, පිටිසරබද ජනපදයකට ගියහ. එම ගමට සුදුසු කල්හි පසේ බුදුවරු පිඬු පිණිස පැමිණෙති. එවිට මිනිස්සු පසේ බුදුවරුන් දැක, උනන්දුවෙන් ආසන පණවති. රසවත් ආහාරපාන පිළිගන්වති. ගරු බුහුමන් කරති. පූජා පවත්වති. මේ මිනිස්සු අප හා සමාන උසස් කුලයක නොවූවත්, ඒ මිනිසුන් කැමති යම් දෙයක් අපට ආහාරයට දෙති. අකමැති නම් නොදෙති. මේ පැවිද්දන්ටද මෙබඳු සත්කාර කරති. නිසැකවම මොවුහු කිසියම් ශිල්පයක් දනිති. අපි ඔවුන් ළඟ හිඳ සිප් උගනිමු නම් මැනවැ'යි ඔවුන් දෙදෙනාට සිතුණි. ඔවුහු මිනිසුන් ඉවත් වූ විට, අවසර ලැබ, 'හිමියනි, ඔබලා දන්නා යම් සිප් සතරෙක අපද හික්මවුව මැනවැ'යි (අපට උගැන්වුව මැනවැ'යි) ඉල්ලූහ. 'පැවිදි නොවූවන්ට ඉගැන්විය නොහැකි'යයි පසේ බුදුවරු කීහ. ඔවුහු පැවිදි කරන ලෙස ඉල්ලා සිටියහ. ඉක්බිති පැවිදි වූහ. එහිදී පසේ බුදුවරු එම දෙනමට ඔබලා මෙසේ (සිවුරු) හැඳිය යුතුය. මෙසේ (සිවුරු) පෙරවිය යුතුය ආදී උසස් හැරීම් පිළිබඳ වත් පිළිවෙත් කියා දී 'මෙම ශිල්පයෙහි පල ලබාගැනීමට නම්, තනිවම හිඳිය යුතුය. තනිවම සක්මන් කළ යුතුය. තනිවම සිටිය යුතුය. නිදිය යුතුයැ'යි වෙන වෙනම පන්සල් (කොළ සෙවිලි කරන ලද කුටි) ලබා දුන්හ. පැවිදි දෙනම තම තමන්ගේ පන්සලට පිවිස හුන්හ. පුරෝහිත පැවිදි හිමි හිඳ ගත් වේලෙහි සිටම සිත එකඟ බවට පත්ව දැහැනක් ලැබීය. අනෙක් හිමිනම (රජ පුතු) මොහොතකට පසුව, කලකිරී තම සහායක හිමි නම වෙත ආවේය. 'මිතුරු හිමියනි, කිමෙක්ද'යි විමසීය. කළකිරුණෙමි'යි පිළිතුරු විය. 'එසේ නම් මෙහි හිඳුවයි කීය. මොහොතක් එතැන හිඳ සිටි ඒ හිමිනම 'මිතුරු හිමියනි, මේ ඉගෙනීමෙහි එකම තැනකට පත්වන අවසානයක් තිබේද'යි ඇසීය. 'එසේනම් ඔබ සිටි තැනටම යව, මෙම සිප්හි අවසානයක් ලබනතුරු උගනිමු'යි පැවසීය. (රජපුත්) පැවිදි නම, එහි ගොස් මොහොතකට පසු කලකිරී පෙර පරිදිම - තෙවරක්ම පැමිණියේය. එහිදී (පුරෝහිත) හිමි පෙර සේම උනන්දු කරවා (රජපුත්) හිමි තමා වෙතින් ඉවත්ව ගියවිට 'මොහු තමන් ද, වැඩ කටයුතු ද වනසා ගනී. මා වෙතට නිතර

පැමිණෙන්'යැයි සිතුවේය. ඒ හිමි පන්සලින් නික්ම කැලයට පිවිසියේය. අනෙක් පැවිදි නම තම පන්සලෙහි හිඳ මොහොතකින් කලකිරී, (පුරෝහිත) හිමි නමගේ පන්සලට අවුත්, එහා මෙහා යමින්, ඒ හිමියන් නොදැක, 'යමෙකු ගිහිකල තෑගි රැගෙන ආවත් මා දැකීමට ඉඩ නොලබයි. (ඔහු) නම් මා පැමිණි විට, දැකීමටවත් ඉඩක් නොදී ඉවත්ව ගියේය. අනේ, පව්වූ සිත, ලජ්ජා නැත්තෙහි? දැන් මා සිවු වාරයක්ම මෙහි කැඳවා ආයේය. මම දැන් ඔබේ වසඟයෙහි නොපවතින්නෙමි. ඔබම මා වසඟයෙහි තබාගන්නෙමි'යි සිතා තම සෙනසුනට පිවිස, විදසුන් වඩා පසේ බුදුබව අවබෝධකොට අහසින් නන්දමූලක ගිරි ගුහාවන්ට ගියේය. ආරණ්‍යයට පිවිසි අනෙක් නම ද, විදර්ශනා අරඹා පසේ බුදුබව අවබෝධ කොට එහිම වැඩියහ. ඒ පසේ බුදුවරු දෙදෙනාම රත්හිරියල් ගල්තලාවෙහි හිඳ වෙන වෙනම මෙම උදාන ගාථා කීහ.

එම ගාථාවෙහි **නිපකං** යනු දැනුම් තේරුම් ඇති, නුවණැති, කසිණ පිරියම් ආදියෙහි හැකියාව ඇති, **සාධුවිහාරිං** කෙලින්ම සිත සමාධියට යොමු කිරීමෙන් හෝ, ඊට පියවරෙන් පියවර සිත පුරුදු කිරීමෙහි නියැලී, **ධීරං** උත්සාහයෙන් යුතු, එහි නිපක ලෙසද උත්සාහයෙහි අගය කියන ලදී. මෙහි උත්සාහවත්ව යන අරුතයි. ධිති යනු (සිතෙහි) දැඩි, ලිහිල් නොවූ බලයයි. 'සම-නහර වියලුණත් උත්සාහය අත් නොහැරීමේ කැමැත්තෙන් කාමං තචො ච නහාරු චා'ති යැයි දක්වා ඇති පරිදි, පවත්නා උත්සාහය, දිරිය ගැන සමාන වචනයකි. එමෙන්ම පවට නින්දා කරන අරුතින්ද ධීර නම් වේ. **රාජා ව රට්ඨං විජිතං පහාය** 'සතුරු රජවරුන් (තමන්) පාලනය කරන රටට අයහපත කරති'යි දැන රජකම හැරදමා තනිවම හැසිරෙයි ද එසේම අනුවණයාගේ ඇසුර හැර තනිව හැසිරෙන්නේය. නැතහොත් **රාජාව රට්ඨං** යනු සුතසෝම රජු, මහාජනක රජු තම පාලන රට හැර දමා තනිව හැසිරුණු සේ තනිව හැසිරෙයි. මෙයද එහි අදහසයි. ඉතිරි කරුණු කියා ඇති බැවින් විස්තර නොකරන ලදී.

**සහාය ගාථා විස්තරය නිමි.**

# 12.

අදධා පසංසාම යන මේ ගාථාවට හේතුවද, අහස් තලයෙහි පනවන ලද අසුනෙහි වැඩහිඳ පසේ බුදුවරුන් දේශනා කරන ලද 'චාතුද්දිස ගාථාවේ නිදාන කථාව මෙනි. මෙතැන් සිට දක්වෙන්නේ අමුතුවෙන් සඳහන් කළයුතු කරුණුය. එම කතාවෙහි බරණැස් රජු රැ කල තෙවරක්ම තැතිගත් බව සඳහන් වුවද මෙම කතාවෙහි එසේ නොවේ. මෙහි රජුට යාග කිරීමට සිදු නොවීය. රජු අහස් තලයෙහි පනවන ලද ආසනවල පසේ බුදුවරුන් වැඩහිඳුවා 'ඔබලා කවරහුද'යි ඇසීය. 'මහරජ, අපි 'වැරදි ලෙස ආහාර නොගන්නෝ' 'අනවජ්ජභොජී' නම් වෙමු'යි වදාළහ. 'මේ කීමෙහි තේරුම කුමක්ද'යි රජ ඇසීය. 'මහරජ, රස හෝ කටුක ආහාරයක් හෝ ලැබ, එක ලෙස සළකා නොවෙනස් සිතින් අනුභව කරමු'යි වදාළහ. 'ඒ කීම නිවැරදි ද, නැද්ද'යි' මොවුන් පිරික්සීම මැනවැ'යි රජුට සිතුණි. එදින ඇඹුල් කාඩි හොදි සමග සුන්සහල් බත් වැළඳවීය. පසේ බුදුවරු අමා බොජුන් සේ නොවෙනස් ව වැළඳූහ. 'පසේ බුදුවරුන්, පොරොන්දු වූ පරිදි එක් දවසක් කී පරිදි එසේ කරති. හෙට දවසේදී එය දැනගන්නෙමි'යි පසුදිනට ද ආරාධනා කළේය. එදිනද ඇඹුල් කාඩි හොදි ආහාර වැළඳවීය. පසේ බුදුවරු පෙර පරිදිම වැළඳූහ. ඊට පසු රජු 'දැන් ඉතා රසවත් ආහාර දී විමසන්නෙමි'යි සිතා නැවතද, ආරාධනා කොට, මහත් සත්කාරයෙන් ඉතා මාහැඟි රසවත් ආහාරපානවලින් වැළඳවීය. පසේ බුදුවරු එදිනද වෙනසක් නැතිවම වළඳා 'රජුට යහපතක් වේවා'යි පතා වැඩියහ. රජු පසේ බුදුවරුන් නික්ම ගොස් මඳ වේලාවකට පසු 'මෙම මහණුන් ආහාරයෙහි රස නීරස නොසොයති, මමත් ඇත්තෙන්ම එසේ ආහාර ගැන පිළිවෙතත් අනුගමනය කරමි'යි සිතා රජකම හැර, පැවිදි වත් සමාදන්ව, විදසුන් වඩා පසේ බුදුබවට පත්ව, 'මඤ්ජූසක' රුක් මුල්හී, අනෙක් පසේ බුදුවරුන් මැද තම අරමුණ දක්වමින් මේ ගාථාව කීහ.

එහි (ඇතැම්) වචනවල අරුත් (කලින් කියා ඇති බැවින්) පැහැදිලිය. **සහායසම්පදං** හුදෙක්ම සීලාදී ගුණ සමූහයෙන් යුතු, රහත් ඵලයට පැමිණි උතුමන් සහායම මෙහි ලා දතයුතුය. මෙය එහි විස්තරයි. මේ කියන ලද සසහායකයකු ලැබීම **අද්ධා පසංසාම** ඒකාන්තයෙන්ම තුති කළයුතු - අගය කළයුතු යැයි කියන ලදී. ඒ කෙසේද? **සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා** කවර හෙයින්ද? තමන් කෙරෙහි සීලාදී උතුම් ගුණදහම් කලින්

නොතිබුණද (දුන්) ඇත. එසේ ඇති කරගත් ගුණදහම් වැඩි දියුණුවට, මහත් බවට පැමිණේද, තමා හා සමාන සහායකයකු ඇසුරු කරනවිට, එකිනෙකා කෙරෙහි කතාකොට සැක දුරුකර ගැනීමෙන් ගුණදහම් නොපිරිහේ. එබඳු උසස් හෝ සමාන සහායකයෙකු ලැබුවද, නොලැබුණද, කුහක, වැරදි දිවිපැවැත්ම හැරදමා - දැහැමින් සෙමින් ලැබෙන ආහාර අනුභව කරමින් එහි නොසතුටක්, තරහක් ඇතිකර නොගනිමින් නිවැරදි ආහාර ලබන්නකු හෙවත් 'අනවජ්ජභොජී ව, හිතවැඩ කැමති කුලපුතකුව තනිව හැසිරෙන ඛග්ගවේණකු මෙන් වන්නේය. මමද එසේ හැසිරෙමින් මේ උතුම් බව අවබෝධ කළෙමි යනුයි.

අනවජ්ජභොජී ගාථා විස්තරය නිමි.

## 13.

**දිසවා සුවණ්ණස්ස** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස එක්තරා රජෙක් ග්‍රීෂ්ම කාලයෙහි දහවල් නිදාගැනීමට එළඹියේය. රජු සමීපයෙහි සිටි එක් (ගණිකා) දාසියක් රන්වන්-සඳුන් කුඩු කරන්නීය. ඇගේ එක් අතක රන් වළල්ලකි. අනික් අතෙහි රන්වළලු දෙකකි. එම වළලු (එකට ගැටෙනවිට) හඬ නගයි. තනි වළල්ල හඬ නොනගයි. රජු එය දැක 'සමූහයක් හා එක්ව විසීම ගැටුමකි. තනිව වාසය කිරීම ගැටුම් ඇති නොවේ' යැයි නැවත නැවත ඒ දාසිය දෙස බලමින් සිතයි. මේ වෙලාවෙහි දේවිය සියළු අබරණින් සැරසී රජුට පවන් සලමින් සිටියාය. 'දාසිය කෙරෙහි රජුට ආදර සිතක් ඇතිවී යැයි' සිතූ දේවිය, දාසිය නැගිටුවා තමන්ම රන්සඳුන් කුඩු සකස් කිරීමට පටන් ගත්තාය. දේවියගේ දෑතෙහිම නොයෙක් ආකාර වූ රන් වළලුය. ඒවා එකිනෙක ගැටෙමින් මහහඬ නැගීය. රජු වඩාත් කලකිරී, දකුණුපසට හැරී හිඳිමින්ම විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළේය. ඔහු ලොවුතුරු සුවෙන් සුවසේ වැතිර සිටිනු දැක, සඳුන් සුණු අතැතිව ආ දේවිය 'මහරජ (සඳුන් සුණු) ආලේප කරමි'යි කීවාය. 'ආලේප නොකරව, ඉවත් වනු'යැයි රජු කීය. 'මහරජ, කුමක් නිසාදැ'යි ඇසුවාය. 'මම රජ නොවෙමි' කියන කතාබහ ඇසූ ඇමතිවරු ද පැමිණියහ. ඔවුන්ද 'මහරජ' යැයි අමතන ලදුව,

'දරුවනි, (දැන්) මම රජෙක් නොවෙමි'යි පැවසීය. ඉතිරි විස්තර මුල් ගාථාවෙහි දක්වා ඇති පරිදිය.

මේ ගාථාවේ (වචනවල) අදහස නම්, දිසවා බලා, සුවණ්ණස්ස රත්රන්වල වලයානි අතිරේක වචනයකි. පභස්සරානි පැහැපත් වූ, දීප්තිමත් බබළනසුළු (වලය යන්න වළලු හා බැඳේ) ඉතිරි වචන කලින් දක්වා ඇති පරිදිය. මේ ගාථාවේ අදහසයි. අතෙහි රන් වළලු දැක, සමූහයක් ලෙස එක් වූ විට, හඬ නැගීමත්, තනි වළල්ලක් (අතෙහි තිබූ විට) හඬක් නොවීමත් සිතමින්, (සමූහයක් සිටීමේදී ඇතිවන ගැටුමත්) සළකා විදසුන් වඩා (පසේ බුදුබව) අවබෝධ කළෙමි'යි කීහ. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිමය.

සුවණ්ණාවලය ගාථා විස්තරය නිමි.

## 14.

එවං දුතියෙන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස එක්තරා රජෙක් තරුණ වියෙහිදීම පැවිදිවනු කැමතිව, 'මම පැවිදි වන්නෙමි, දේවියද ගෙන රජයෙහි අදාල කටයුතු කරව'යි ඇමතිවරුන්ට අණ කළේය. 'මහරජ, රජ කෙනෙකු නැතිව අපට රජය රැකිය නොහැකිය. අවට රජවරුන් පැමිණ, රජය පැහැර ගන්නාහ. එක පුතකු හෝ උපදින තාක් ඉවසනු මැනවැ'යි ඇමතිවරු රජුට දැන්වූහ. මුදු සිතැති රජ එය පිළිගත්තේය. ඉක්බිති දේවිය ගැබ් ගත්තීය. 'දේවිය ගැබිනියකි, පුතකු උපන්විට රජකමෙහි ඔටුනු පළඳවා රජය විචාරව, මම පැවිදි වන්නෙමි'යි රජු නැවත ඔවුන්ට කීය. ඇමතිවරු, 'මහරජ, දේවිය පුතකු හෝ දුවක හෝ ලබාවි'යැයි දැනගැනීමට නොහැකියි, දරුවා බිහිවනතුරු ඔබතුමා ඉවසනු මැනවැ'යි නැවතද දැන්වූහ. ඇය පුතකු වැදුවාය. එවිට රජු එපරිදිම ඇමතිවරුනට අණ කළේය. ඔවුහු 'කුමරුගේ සුදුසු කාලය එළඹෙන තෙක් ඉවසනු මැනවැ'යි බොහෝ කරුණු කියාපෑහ. කුමාරයා රජය විචාරීමට සුදුසු වූ විට ඇමතිවරුන් රැස් කරවා, 'දැන් මොහුට හැකියාව ඇත, කුමරු රජ බවට ඔටුනු පළඳවා ඒ අයුරින් කටයුතු

කරව'යි (අණ කොට) ඇමතිවරුනට (තම අදහස කල් දැමීමට) ඉඩක් නොදී, සල්පිලෙන් සියළු පිරිකර ගෙන්වාගෙන ඇතුළු පුරයෙහිදීම පැවිදිව මහාජනක රජු මෙන් නික්මුණේය. සියළු පිරිවර ජනයා නොයෙක් ලෙසින් වැළපෙමින් රජු පසුපස ගියේය. රජු තම රජයේ පාලන සීමාව තෙක් ගොස්, සැරයටියෙන් ඉරක් ඇඳ 'මෙම රේඛාව ඉක්මවා නොආයුතු' යැයි කීය. මහජනයා එම රේඛාවට හිස තබා, බිම වැතිරී, වැළපෙමින් 'දරුව, දැන් මෙය, ඔබගේම පිය රජුගේ අණයි. කුමක් කරන්නද'යි කුමරු ලවා රේඛාව ඉක්මවාලීය. කුමරු ද 'පියාණනි, පියාණනි' යැයි කියමින් දිව ගොස් රජු ළඟට පැමිණියේය. රජ කුමරු දැක, 'මම මෙම මහජනතාව රැක ගනිමින් රජ කළෙමි. දැන් එක දරුවකු රැක ගැනීමට නොහැකි වෙම්ද'යි (සිතා) කුමාරයාද ගෙන කැලයට පිවිසියේය. පෙර පසේ බුදුවරුන් විසූ පන්සල් දැක, පුතු සමග එහි වාසය කළේය. සුවපහසු උසස් යහන් ආදියට පුරුදුව සිටි කුමරු, තණ ඇතිරියක හෝ ලණුමැස්සක හෝ නිදමින් හඬයි. සීත සුළං හමනවිට 'සීතලයි පියාණනි' කියයි. (එමෙන්ම ඒ ඒ වේලාවට) 'රස්නෙයි, පියාණනි, 'මදුරුවන් (ඇඟ විදිති) පියාණනි, බඩගිනියි, පියාණනි, පිපාසයි පියාණනි' යැයිද කියයි. රජු ඔහු සනසවමින්ම මුළු රැයම ගතකරයි. දිවා කාලයේ පිඬු පිණිස හැසිර ආහාර සපයා දෙයි. ඒ ආහාර තණහාල්, කඩල, මුංඇට ආදියෙන් එකට කලවම් වූ බත් ය. කුමාරයා ඊට අකමැති වුවත්, කුසගිනි නිසා අනුභව කරන්නේ, කිහිප දිනකින්ම අව්වෙහි තිබූ පියුමක් මෙන් මිලාන විය. පසේ බෝසත් නුවණින් සළකා බලමින් රසය නොවිමසා, ජීවිතය පවත්වාගෙන යෑමේ අරමුණින් වෙනසක් නොසිතා අනුභව කරයි. එතුමා, දරුවා ගැන සළකමින්, 'දරුව, නගරයෙහි රසැති ආහාර ලැබේ, එහි යමු'යි කීය. 'එසේය පියාණනි' කුමරු කීවේය. එහිදී කුමාරයා පෙරටු කොට (කුමරු තමා හා එක්වූ තැනට) ආ මගින්ම ගොස් නැවතුණේය. කුමරුගේ මව් දේවියද 'රජු කුමාරයා හා වැඩි කාලයක් කැලයේ වසන්නේ නැත. කිහිප දිනකින්ම ආපසු හැරෙන්නේ යැ'යි සිතා, රජු විසින් සැරයටියෙන් ඉරක් සලකුණු කරන ලද තැනම රැකවරණ සලස්වා වාසය කළාය. රජු ඇය වසන තැනට ආසන්නයේ සිට, 'දරුව, එන්න, ඔබේ මව සිටින තැනට යන්නැ'යි එහි යැවීය. කිසි හිරිහැරයක් නොවේවා'යි එතැනට යනතුරු බලා සිටියේය. කුමාරයා දුවමින් මව ළඟට ගියේය. රැකවල්කරුවෝද කුමරු දැක දේවියට සැළ කළහ. ඇය නළඟනන් විසිදහසක් පිරිවරා ගොස් කුමරු පිළිගත්තාය. රජු ගැනද තොරතුරු විමසුවාය. පසුපසින් පැමිණෙන්නේ යැ'යි අසා මිනිසුන් යැවුවාය. එවිට රජුද තමා වසන තැනටම ගියේය. මිනිස්සු රජ

නොදක නැවතුණහ. දේවියද ඒ ගැන ආසාවක් නැතිව, පුතු සමග නුවරට ගොස්, රජ බවට ඔටුණු පැළඳවීය. රජුද තමා වසන තැනට පැමිණ, එහි හිඳිමින් විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට මඤ්ජූසක රුක්මුලදී පසේ බුදුවරුන්ට මෙම උදාන ගාථාව වදාළහ.

ඊට අදාල වචනවල තේරුම් කලින් සඳහන්ව ඇත. මෙම ගාථාවෙන් අදහස් වන්නේ මෙයයි. යම් ලෙසින් දෙවැන්නකු සේ ඒ කුමාරයා සමග විසීමෙන් සීතල උණුසුම දනෙන බව කියනවිට, ඒ ගැන හැඟවීමේදී මා හා ඇතිවන කතාබහ ඔහු කෙරේ ආදරය ඇතිවී, තද ඇලීමක් ඇති කරයි. මම මොහු අත්හැර නොදමන්නෙම් නම්, නැවතද එසේම වෙයි. මෙසේ තවත් කෙනෙකු සමග කතාබහෙන් ඇල්මක් හෝ වෙයිද, එය දෙදෙනාටම සිතෙහි උසස් බවක් - අවබෝධය ලබාගැනීමට අනතුරුදායක වෙයි. ඒ බය නැවතත් ඇතිවේ යැයි බලාපොරොත්තුවෙන් එය හැරදමා නුවණ මෙහෙයා පසේ බුදුබව අවබෝධ කළෙමි. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිය.

ආයතිභය ගාථා විස්තරය නිමි.

## 15.

කාමා හි චිත්‍රා යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස සිටු පුතෙක් බාල කාලයෙහිම සිටු තනතුර ලැබුවේය. ඔහුට සීත, උණුසුම්, වසන්ත යන කාල තුනටම තුන් පහයක් විය. ඔහු එහි සියළු සැපතින් පිරිපුන්ව, දෙව් කුමරෙක් මෙන් සහපිරිවරින් වසයි. ඔහු බාලකල්හිම පැවිදිවන්නෙමි'යි මව්පියන් විචාළේය. ඔවුහු වළක්වති. ඔහු පැවිදි වීමටම කැමති වෙයි. නැවතද (ඇසූ විට) මව්පියෝ, 'දරුව, ඔබ සියුමැළිය, පැවිද්ද පහසු නැත. දලි පිහියෙන් (හිසකෙස් බූ ගෑම) පටන් සක්මන් කිරීම් ආදී කරුණු දක්වා නොයෙක් අයුරින් වළක්වති. ඔහු පැවිද්දටම කැමති වෙයි. 'යම් ලෙසකින් මොහු පැවිදි වේද, එය අපට දොම්නසකි. එය වළක්වන්නේ නම් ඔහුට දොම්නසකි. අපට දොම්නසක් වුවත්, ඔහුට එසේ නොවේවා'යි පැවිදිවීමට කැමැත්ත දුන්හ. ඔහු සියළු පිරිවර

හිතමිතුරන් වැළපෙමින් සිටියදී, එය නොසළකා ඉසිපතනයට ගොස් පසේ බුදුවරුන් ළඟ පැවිදිවිය. මැනවින් සකස් කරන ලද සෙනසුනක් නොවීය. මැස්සෙහි පත්කඩක් අතුරා නිදාගත්තේය. සැපදායී, වටිනා යහනාවක් පුරුදුව සිටි බැවින් මුළු රැයම බොහෝ දුකට පත්විය උදය කාලයේම සිරුර කිස කොට පා සිවුරු ගෙන, පසේ බුදුවරුන් සමග පිඬු පිණිස ගියේය. එහිදී වැඩිහිටි පසේ බුදුවරුනට මුල්ම ආසනද, මුලින්ම ආහාරද පිරිනමති. ළඟදී පැවිදි වූවන්ට කිසියම් අසුනක්ද, රළු ආහාරද ලැබේ. අළුත පැවිදි වූ ඒ හිමිද රළු අහරින් බලවත් දුකට පත්විය. කිහිප දිනකින්ම කෙට්ටු වී, සිරුර කළු පැහැගැන්වී මහණදම් පිරීමෙහි පළපුරුද්ද නොමැති බැවින් කලකිරුණේය. මව්පියන්ට පණිවුඩයක් යවා උපැවිදි විය. ඔහු කිහිප දිනකින් සිරුර සවිබල ලද විට පැවිදිව, යළි උපැවිදිව, තෙවන වරටද පැවිදිව මනා පිළිවෙත් සපුරා පසේ බුදුබව අවබෝධ කොට, මෙම උදාන ගාථාව කියා, නැවත පසේ බුදුවරුන් මැද මෙම විස්තර දක්වෙන ගාථාවද කීහ.

කාමා යනු දෙයාකාරය. වත්ථුකාමා සහ කිලෙස කාමා යනුවෙනි. වත්ථුකාම යනු කැමැත්ත ඇති කරවන, සතුට දනවන රූප ආදියයි. කිලෙසකාම යනු ඡන්ද ආදී රාගයද කොටසක් වන කෙලෙස් සහගත දේය. මෙහි අදහස් කරන්නේ වත්ථුකාමයයි. රූප ආදී නොයෙක් ආකාර ලෙසින් චිත්‍රා වේ. ලෝකයා අතර රසවිඳිය හැකි යයි සිතන, විඳින - වින්දනය කරනු ලබන අදහසින් මධුරා වේ. නුවණ මඳ තෙලෙස් වසඟවන ජනතාවගේ සිත් ඇලෙනසුළු බැවින් මනොරමා වේ. විරූප රූපෙන විරූප වූ රූපයෙන් නොයෙක් අයුරින්, (සිතට - ඇසට දනවන රූපවල ගතියයි) ඒවා රූප විලාශයෙන් විසිතුරු වේ. රූප ආදියද නිල් ආදී පැහැයෙන් නොයෙක් ආකාරය. එසේ නොයෙක් ආකාරයෙන්, නොයෙක් හැඩතලවලින් ඒ ඒ වින්දන පෙන්වා වසඟ කරගනී. සිත පැවිද්දෙහි නතුවීමට ඉඩ නොදෙයි. ඉතිරි කරුණු පැහැදිලිය. ඒ (කරුණුවලට අදාල) නිගමනයද දෙවන-තුන්වන පදවලට ගලපා මුල් ගාථා අනුව, පෙර කියා ඇති පරිදි දතයුතුය.

**කාම ගාථා විස්තරය නිමි.**

# 16.

ඊති ච යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස රජුගේ සිරුරේ ගෙඩියක් හටගත්තේය. දැඩි වේදනා පවතී. වෙදවරු සැත්කමකින් හැර සුව පහසුවක් නොවේ යැයි පවසති. රජ ඔවුන්ට (සුවයක් නොලදහොත් රාජ උදහසට ලක් නොකරන බවට) අභය දී සැත්කම කරවා ගත්තේය. ඔවුහු ගෙඩිය පලා ලේ සැරව ඉවත්කොට වේදනාව සමනය කොට, තුවාලය (රෙදි) පටියෙන් වෙලූහ. ගතයුතු ආහාර පිළිබඳවද මැනවින් අවවාද කළහ. රළු බොජුන් අනුභවයෙන් සිරුර සිහින් විය. ගෙඩියද මැලවී වියැකිණ. රජු සුවපත්ව, සිනිඳු, රස ආහාර අනුභව කළේය. එයින් සවිබල ලැබ තම කටයුතුවල උත්සුක විය. නැවතද ගෙඩිය පෙර පරිදි මතුවිය. මෙසේ තුන්වරක්ම සැත්කම් කරවා, වෙදුන් විසින් අත්හැර දමන ලදුව කලකිරීමට පත් රජු රජකමද ඉවත ලා පැවිදිව කැලයට ගොස් විදසුන් වඩා සත්වන වසරෙහි පසේ බුදුබව අවබෝධ කොට මෙම උදාන ගාථාව කියා නන්දමූලක හිරිගුහාවට ගියහ.

එම ගාථාවේ ඊති යනු විනාශයට පමුණුවන, පිටතින් (තමාට) පැමිණෙන, අයහපතට හේතුවන දේවලට සමාන වචනයකි. එහෙයින් නොයෙක් ලෙසින් කැමැත්ත ඇතිකරවන, කාමයද එසේ නොයෙක් විපත් ලඟා කරවන, දැඩි සේ එක්රැස්වන අදහසින්ද ඊති නම් වේ. සැරව ආදී අපිරිසිදු දේ ගෙඩියෙන් වැගිරෙයි. ඉදිමුණු ගතියෙන්, මේරූ බවට පත්ව (සිරුරේ) බිඳී ගියා සේ වෙයි. එහෙයින් කෙලෙස් නැමති අපිරිසිදු වැගිරෙන දෙයින් හටගත් ජරා නම් වූ කැඩී බිඳී ගිය තැන්වලින් ඉදිමුණු, ඉල්පුණු ගතියෙන්ද, (අඟ පසඟ නියම ලෙසින් නොපවත්නා හෙයින්) ගණ්ඩා වෙයි. උපදවනු, හටගනු ලබන්නේ උපද්දවො අයහපත ගෙනදෙමින්, තදින් පීඩා පමුණුවමින් යන තේරුමයි. රජ අණින් (අධිකරණයෙන්) ලබන දඬුවම් ආදියට සමාන වදනකි. එහෙයින් කැමැත්ත නිසා උදාකරන ලදුව (කලින්) නොවිඳිනා ලද දරුණු විපත්වලට - සියළුම උවදුරුවලට හේතුවන අයුරින් උපද්දවො නම් වේ. එහෙයින් කෙලෙස්වලින් රෝගී බවට පත් කරමින් 'සීල' යැයි කියනු ලබන නිරෝගී සුවතාව උදුරා ගනී. මුළුමනින්ම කෙලෙස්වලින් රෝගී බවට පත්කරයි. එහෙයින් නිරෝගී බව පැහැරගන්නා අරුතින් රෝග නම් වේ. ඇතුලතට යාමෙන්, (සම් මස්) පසාරු කරගෙන යාමෙන්, ඇතුළතින් පැටලී, ඉවතට

ඇද ගැනීමට නොහැකි අරුතින් **සලලං** නම් වේ. මෙලොව-පරලොව බිය ගෙන දෙන හෙයින් **භයං** වෙයි. එය මට = **මෙතං**, ඉතිරි කරුණු පැහැදිලිය. නිගමනයද කලින් කියා ඇති පරිදි දතයුතුය.

**ඊති ගාථා විස්තරය නිමි.**

## 17.

**සීතඤ්ච** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස සීතාලුක බඹදත් නම් රජෙක් විය. ඔහු පැවිදිව කැලයෙහි කුටියක වසයි. ඒ පෙදෙසෙහි සීත කාලයට සීතලත්, උණුසුම් කාලයට උණුසුමත් වෙයි. එළිමහත් පෙදෙසක ගොදුරු ගමෙන් සරිලන පමණට ආහාර නොලැබෙයි. පානය සඳහා පැන් ද දුලබය. සුළඟින්, අව්වෙන්, ලේ උරා බොන මැසි මදුරුවන්ගෙන්, සපුන්ගෙන් ද හිරිහැර පැමිණේ. 'මෙයින් අඩ යොදුනකට ඈත පෙදෙසෙහි මෙතරම් උවදුරු නැත. පහසු විහරණය එහි ඇත, දහැන් ආදී වෙසෙස් බවක් ලබාගැනීමට ද හැකි බැවින්, එහි යන්නෙම් නම් මැනවැ'යි සිතුණේය. එමෙන්ම, 'පැවිද්දෝ නම් සිවුපසයටම වසඟ නොවිය යුතුය. එසේ (තම) වසඟයට සිත පත්කර ගැනීම මිස, සිතට (ඕනෑ පරිදි) වසඟ විය යුතු නොවේ. මම නොයන්නෙමි'යි (සිතා) නොගියේය. මෙසේ තෙවරක්ම සිතට නැගුණු අදහස නුවණින් විමසා බලා, එහිම නැවතුනේය. එහිම සත් වසරක් වාසය කොට, මනා පිළිවෙත් පුරමින්, පසේ බුදුබව අවබෝධ කොට, මෙම උදාන ගාථාව කියා නන්දමූලක නම් ගිරිගුහාවට වැඩියහ.

එම ගාථාවෙහි **සීතං** යන්න දෙ ආකාරය. (සිරුර) ඇතුලත ධාතු සමව නොපැවතීමෙන් (කිපීමෙන්) සහ බාහිර (සොබාදහම හා බැඳුණු) ධාතු කොටස්වල සමතාව බිඳීමෙන්, උණුසුම හේතුකොටගෙනද මේ ආකාරම වෙයි. ඩංසා පිඟුවන් පැහැති මැස්සන් කොටසකි. සිරිංසපා දික්වූ, බඩගා යන ඇතැම් සතුන්, ඉතිරි කරුණු පැහැදිලිය. නිගමනයද මුලින් කී අයුරින් දතයුතුය.

**සීතාලුක ගාථා විස්තරය නිමි.**

# 18.

නාගොවා යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස එක්තරා රජෙක් විසි වසරක් රජකම් කොට, මරණින් පසු නිරයෙහි ඉපිද, විසිවසරක් දුක් විඳ, පසුව හිමවත් පෙදෙසෙහි, ඇතකුව ඉපදී මනාව වැඩුණු, පියුම් පැහැ යුතු සිරුරින් යුතුව, බොහෝ අලි ඇතුන් රැළකට නායක විය. ඇත් රජු විසින් පහතට නවන ලද අතු ඉති පැටවු කති. දියට බැස්ස විට ඇතින්නියෝ ඇතුගේ සිරුරෙහි මඩ තවරති. සියළුම දේ සිදුවූයේ පාරිලෙය්‍යක ඇතුට මෙනි. නායක ඇතා කලකිරී ඉවත්ව ගියේය. උගේ පා සටහන් අනුව රංචුවම උඟ ලුහුබැඳ ගියහ. මෙසේ තෙවරක්ම කලකිරී ඉවත්ව ගියද, ලුහුබැඳ ඒම නිසා (ඇතාගේ අරමුණ ඉටු නොවීය.) 'දැන් මගේ මුණුබුරෙක් බරණැස රජකම් කරයි. (පෙර උපතකදී රජව සිටි මට හිමි වූ) උයනට යන්නෙම් නම්, ඔහු මා රැක ගන්නේ යැ'යි සිතා, තම රැළෙහි අලි ඇතුන් නිදාගත් වේලෙහි ඒ උයනටම ඇතා ආවේය. උයන්පල්ලා ඒ දැක රජුට සැළකළේය. රජුද 'ඇතු අල්ලා ගන්නෙමි'යි සේනාව හැසිරවීය. ඇතා ද රජුගේ ඉදිරියටම යයි. රජ ද ඇතා 'මා ඉදිරියට එති'යි දුනු හී සකසාගෙන සිටියේය. එවිට ඇතු, 'මොහු මට හීයක් විද්දොත්'යැයි සිතා මිනිස් බසින් 'බඹදත් මට නොවිදුව, මම ඔබේ වැඩිමහල් නෑයෙක්මි' (සීයා වෙමි) කීවේය. 'කුමක් කියහිදැ'යි රජු විමසූ විට, ඇතා ද රජකමෙහි ද නිරයෙහි ද තිරිසන් ජාතියෙහි ද තම සියළු පුවත් සැළ කළේය. 'හොඳයි, භය නොවන්න. කිසිවකු හිංසා නොකරවයි' ඇතුට රැකවරණයද, උවමනා දේවල්ද ලබාදීමට සැලැස්වීය. එක් දවසක් රජ ඇතුපිට යද්දී 'මේ ඇතු විසිවසක් රජකම් කොට, නිරයෙහි ද දුක් විඳ, ඉතිරි විපාක අනුව තිරිසන් යෝනියෙහි ඉපදුණේය. එහිදී සමූහයක් සමග ජීවත්වීමේදී වන ගැටුම් නොඉවසමින් මෙහි ආවේය. සමූහ වාසය බොහෝ දුකකි. තනිව සිටීම සැපයෙකැ'යි සිතා එහිම විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළේය. මෙසේ ලොවුතුරු සුවයෙන් සිටින රජු වෙත ඇමතිවරු පැමිණ 'මහරජ, යාමට කාලය පැමිණ ඇතැ'යි කීහ. එවිට 'මම රජ නොවෙමි' කියා පෙර කතාවලදී දැක්වූ අයුරින්ම මෙහිද නාගොවා...... ගාථාව පවසන ලදී.

ඒ ගාථාවෙහි වචන අරුත් පැහැදිලිය. මේ එහි අදහස විස්තර කිරීමයි. එය යෙදෙන ආකාරයෙන් මිස, අසා ඇති අයුරින් නොවේ. මේ

ඇතා මිනිසුන් කැමති වන හික්මීමෙන්, දැමුණු බැවින්, නැවත නොදැමුණු බවට පත් නොවී, එසේ නොවන අරුතින්ද, මහත් සිරුරක් ඇති බැවින්ද **නාගො** වෙයි. එසේම කවදා මමත්, බුද්ධාදී උතුමන් කැමතිවන සීලයෙහි මැනවින් හික්මී, (සිත) දමනය කොට, නැවත නොදැමුණු කෙනෙක් නොවී, අයහපත්-වැරදි-අපරාධ නොකොට, නැවත ගැහැණියකට නොඉපදීමෙන්ද, ගුණයෙන් මහත් වූ සිරුරකින් යුතු **නාගො** නමින් හඳුන්වන්නෙක් වන්නෙම්ද? සමූහයෙන් වෙන්ව, තනිව හැසිරීම අගය කොට, කැමති පරිදි කැලයෙහි වෙසෙන කඟවේණකු මෙන්, මම ද මේ පිරිවර හැරදමා ඇළුම් කරන එකම සුවය වූ දැහැන් සුවයෙන් කවදා කැලයෙහි වෙසෙම්ද? යම් තරමකින් කැලයෙහි විසීම සුවදායී නම්, ඒ තරමටම දැහැන්සුවය (අගය කරමි) එසේ කැමතිතාක් කල් තනිව හැසිරෙන කඟවේණකු මෙන් කැලයෙහි වෙසෙමි යන අදහසයි. මනාව පිහිටි කඳක් ඇති බැවින්, **සඤ්ජාතක්ඛන්ධො** කවදා මමත් මෙසේ මැනවින් හික්මුණු සිල් සමූහයෙන් වඩනා ලද කඳකින් (සිරුරකින්) යුතු වෙම්ද? යම් ආකාරයෙන් පියුමක් හා සමාන (පැහැ) සිරුරක් ඇති හෝ පියුම් කුලයෙහි උපන් බැවින් හෝ **පදුමී** වේ. කවදා මම ද පියුමක් බඳු අවබෝධය ලබා ගැනීමෙන් හෝ, උතුම් පියුම් කුල උපන් බැවින් හෝ **පදුමී** නම් වන්නෙම්ද? එබඳුම මහත් සවි බලයෙන් යුතුවීම **උළාරෝ** නම් වෙයි. කවදා නම් මමත්, මෙසේ පිරිසිදු, නිවැරදි කය හැසිරවීම් ආදියෙන් යුතු සීල, සමාධි හා තියුණු නුවණින් යුතුව උළාරෝ නම් වන්නෙම්දැ'යි සිතමින්ම විදසුන් වඩා පසේ බුදුබව ලැබුවෙමි යනුයි.

**නාග ගාථා විස්තරය නිමි.**

# 19.

**අට්ඨානතං** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස් රජුගේ පුතා ළමා කල්හිම පැවිදිවනු කැමතිව, මව්පියන්ට එය දැන්විය. මව්පියෝ ඔහු වළකති. එසේ වළකනු ලබද්දීත්, ඔහු පැවිදි වීමටම සිතයි. එවිට ඔහු කලින් කතාවක සඳහන් වූ සිටු පුතු මෙන්, සියලු දෙයම කියා අවසර ලබා ගත්තේය. පැවිදි වූ පසු උයනෙහිම විසිය යුතු බවට එකඟ

කරවා ගත්හ. ඔහු එසේ කළේය. ඔහුගේ මව විසිදහසක් නළඟනන් පිරිවරා උයනට ගොස් (පැවිදි) පුතුට කැඳ පොවා අතරතුර කැවිලි ආදිය කවා දහවල වනතුරු සතුටු සාමීචි කතාබහ කොට, නගරයට පිවිසෙන්නීය. පියා ද දහවල අවුත් පුතුට කවා තමාද අනුභවකොට (ඉතිරි) දවස ඔහු හා සතුටු සාමීචි කතාබහ කොට සවස් කාලයෙහි (රැයෙහිද) නොනිදන මිනිසකු නවතා නගරයට යයි. කුමරු මෙසේ දිවා රෑ හුදකලා නොවී වසයි.

එකල්හි ආදිච්චබන්ධු නම් පසේ බුදුන් වහන්සේ නන්‍දමූලක ගිරි ගුහාවෙහි වසති. 'මේ කුමරුවාට පැවිදිවීමට නොහැකිය. අවුල විසඳා ගැනීමට ද නොහැකි'යැයි දිවැසින් දුටහ. කුමරු තම අදහසට අනුකූලව කලකිරෙන්නේද, නැද්ද'යි තවදුරටත් විමසා බලනවිට, ඔහුට කලකිරීම පිණිස බොහෝ කාලයක් ගතවන්නේ යැයි දැන, 'අරමුණක් පෙන්වන්නෙමි'යි, කලින් කියන ලද ආකාරයට හිරියල් ගල් තලයෙන් පැමිණ උයනෙහි වැඩ සිටියහ. රාජ සේවකයෙක් ඒ දැක 'මහරජ, පසේ බුදුවරයකු'යැයි සැළ කළේය. 'මගේ පුතා දැන් පසේ බුදුන් සමග කලකිරුණු බවක් නොමැතිව, වසන්නේයැයි සතුටු වූ රජු පසේ බුදුහිමිට මැනවින් උවටැන් කොට එහිම වැඩසිටින ලෙස ඉල්ලා, පන්සල්, දිවාකාලය ගතකිරීමට සුදුසු තැන්, සක්මන් මළු ආදිය කරවා, වාසය කිරීමට සුදුසු පරිදි සැලැස්වීය. එහි වැඩවසන පසේ බුදුහිමි, පහසු විවේක වේලාවක 'ඔබ කවුද'යි කුමරුගෙන් ඇසූහ. 'මම පැවිද්දෙක්මි'යි කුමරු කීය. 'පැවිද්දෝ නම් ඔය ආකාර නොවෙති.' 'එසේනම් හිමියනි, කෙබඳු වෙත්ද? මට සුදුසු නොවන්නේද'යි කී විට, ඔබ (ඊට) සුදුසු නොවන බව නොසැලකුවෙහිද?' ඔබේ මව විසිදහසක් නළඟනන් සමග උදෑසන පැමිණෙන අතර, පියා මහත් බලසෙන් පිරිවරා සවසට පැමිණ හුදකලා බව නැතිකරයි. රෑ කාලයෙහි මිනිසකු නොනිදා රඳවා තබා හුදකලා බව නැති කරයි. පැවිද්දෝ නම් ඔබ මෙන් නොවෙති. මේ ආකාර වෙති'යි එහි වැඩසිටින අතරම, ඉඳු බලයෙන් හිමාලයෙහි එක්තරා විහාරයක් (වැඩසිටින තැනක්) පෙන්වූහ. එහි පසේ බුදුවරු අත්වාරු රැගෙන සිටගෙනද සක්මන් කරමින්ද සිවුරු (පඬු) පෙවීම්, සිවුරු මැසීම ආදී කටයුතු කරනු දැක, 'ඔබ (වහන්සේ) මෙහි නො පැමිණියෙහු (නම්) පැවිද්ද ඒ අනුව ඔබලා අනුදන්නා ලද්දෙහුද'යි ඇසීය. 'එසේය, පැවිද්ද අනුදන්නා ලදී. පැවිදි වූ කල පටන්, මහණහු නම්, තමා (සසරින්) නිදහස් වනු පිණිස කැමති වූත්, බලාපොරොත්තු වූත් පෙදෙසකට යති. දැන් මේ

කරුණු සෑහේ'යැයි අහසෙහි සිට 'අට්ඨානතං සංගණිකාරතස්ස - යං ඵස්සයෙ සාමයිකං විමුත්තං' යන මෙම ගාථාවෙන් අඩක් කියා කුමරු බලා සිටියදීම නන්දමූලක ගිරිගුහාවට වැඩි සේක. පසේබුදුන් වහන්සේ නික්ම ගියකල්හි, කුමරු තම කුටියට පිවිස වැතිර ගත්තේය. රැකවල්කරුද කුමරු දූන් කොහි යන්නේද'යි නොසළකා නිදන්ට වන්නේය. කුමරු ඔහුගේ නොසැළකිලිමත් බව සළකා, පාසිවුරු ගෙන කැලයට පිවිසියේය. එහි හුදකලාව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළහ. එහිදී 'අවබෝධ කළේ කෙසේද'යි විචාළ විටදී ආදිච්චබන්ධු පසේ බුදුන් වහන්සේ විසින් දෙසන ලද ගාථාවෙහි ඉතිරි කොටස සපුරා කීය.

එහි අරුත නම්, **අට්ඨානකං** අදාල කරුණක් නොමැතිව සිදු නොවේය, යනුයි. අරියසච්චාන දස්සන - අරියසච්චානං දස්සනං යන වචනය මෙන් අනුනාසිකය (අට්ඨානං තං) ලොප් කරන ලදී. **සංගණිකාරතස්ස** සමූහව සිටීමෙහි ඇලුණු, යං (පැහැදිලි කරන දෙයට) අදාලව යම් අරුතින්, යං හිරියති - හිරියිතබ්බන - යම් දෙයකින් ලැජ්ජා වේද, ලජ්ජා විය යුතුය වැනි තැන්වල සඳහන් ලෙසිනි. **ඵස්සයෙ** යනු අවබෝධ කළෙමි. **සාමයිකං විමුත්ති** මේ ලෝකයට අයත් සමාපත්තිය එය (තමා) වෙතට ළඟාකර ගැනීමේදී මෙන්ම, වෙනස් අයුරින් නිදහස් වීමක් යැයි කියනු ලැබේද, එවැනි දෙයක් ඇති නොවන්නේය. 'සමූහයා කෙරෙහි ඇලීම නිසා එය නො ලද හැකිය යන ආදිච්චබන්ධු පසේ බුදුන් වහන්සේගේ වචනය අසා සමූහය කෙරෙහි ඇලීම් නැතිව නුවණින් පිළිපදිමින් අවබෝධය ලැබුවෙමි'යි කීය. ඉතිරි කරුණු කලින් සඳහන්කොට ඇති පරිදිය.

අට්ඨානගාථා විස්තරය නිමි.

දෙවන වග අවසානය

## 20.

**දිට්ඨී විසූකානි** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස එක්තරා රජෙක්, විවේකීව, තනිව සිටිනවිට, 'සීතල වැළැක්වීමට යම්සේ උණුසුම ඇත, එසේ සසර ගමන නැවතීමටත්, ඊට වෙනස් දෙයක්

තිබේද'යි සිතුවේය. ඔහු, සසරට වෙනස්ව යන දෙයක්, (සසර ගමන නවතන මගක්) ගැන ඇමතිවරුන් විචාළේය. 'දනිමු, මහරජ' යැයි ඔවුහු කීහ. 'ඒ කුමක්ද'යි රජු ඇසූවිට 'ලෝකය කෙළවරක් ඇත' ආදී ලෙසින්, හිස් අදහස් පැවසූහ. ඉක්බිති රජු 'මොවුන් නොදනිති. සියල්ලන්ම නොයෙක් වැරදි දැකීම්වලට හසුව සිටිති'යි තමාම ඔවුන්ගේ අදහස්වල වෙනස සහ නොගැලපෙන බව දැන 'සසර ගමන වළකන මගක් ඇත. එය සෙවිය යුතු'යැයි සිතා, රජකම හැර පැවිදිව, විදසුන් වඩමින් පසේ බුදුබව අවබෝධ කළේය. පසේ බුදුවරුන් හමුවෙහි පහත විස්තර ඇතුලත් වන ගාථාවද කීහ.

එහි තේරුම නම්, **දිට්ඨී විසූකානි** සැටදෙකක් වූ තදින් මුල්බැස ගත් මිසදිටු අදහස්, එයින්, මගපල ලදහැකි යහපත් දැකීමට එකඟ නොවන, අනුකූල නොවන, සිත නොසන්සුන් කරන, කලබලයට පත්කරන බැවින්, එසේ යෙදුණි. මෙසේ දැකීම විකාර බවට පත්කරන හෙයින් **දිට්ඨී විසූකානි**, විසුළු හැඟීම්ම **දිට්ඨී විසූකානි**, උපාතිවත්තෙතා මගපල දැනීම මගින් ඉක්මවන, **පත්තො නියාමං** සතර අපාය ආදී දුක්ලබන තැන් වළක්වන, (සිවුසස්) අවබෝධය පිහිටකොට ඇති, නියත බවම ලදිමි. නිවැරදි වූ, යහපත් යැයි කියන ලද පළමු මග (සෝවාන්) හෝ, මෙපමණකින් ඒ පළමු මගට පත්වීමේ කටයුතු නිමාව හෝ, එය ලැබීම දක්වීය. මීළඟට **පටිලද්ධ මග්ගො** යන මෙයින් ඉතිරි මගපල ලැබීම පෙන්වයි. **උප්පන්න ඤාණොම්හි** යනු පසේ බුදුනුවණ ලබාගත් කෙනෙක් වෙමි. එයින් ලද පලය දක්වයි. **අනඤ්ඤනෙය්‍යො** වෙනත් මහණ බමුණන් 'මෙය ඇත්තය. මෙය ඇත්ත යැයි කියන අතර, මෙයින් තමන්ම ඇත්ත යයි පසක් කළ අයුරු පහදයි. පසේ බුදු නුවණ අවබෝධ කරන ලද්දේ වෙනත් කෙනෙකුගේ හඳුන්වා දීමකින් තොරව, තමන්ම පුරුදු වූ වැඩූ විදසුන් මගින් මිසදිටු හැඟුම් මුළුමනින්ම ඉවත් කර දමා, මූලික අරමුණ ඉටුකර ගනිමින් මගපලයෙන් උපන් නුවණයි. ඒ සියල්ලම තමන් විසින් අවබෝධ කරන ලද බැවින්, වෙනත් කෙනෙකුගෙන් ලද දෙය නොවේ. ඉතිරි කරුණු කලින් සඳහන් කර ඇති පරිදි දතයුතුය.

**දිට්ඨීවිසූක ගාථා විස්තරය නිමි.**

# 21.

**නිල්ලොලුපො** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස් රජුගේ අරක්කැමියා මිහිරි රසැති, දුටුවිට කැමැත්ත වඩවන අතුරුබතක් පිස, 'රජු මට ධනය ලබාදෙන්නේ නම් මැනවයි සිතා රජුට පිළිගැන්වීය. එහි සුවඳින්ම අනුභව කිරීමට කැමතිව, රජුගේ කටට කෙළ ඉනුවේය. මුවෙහි තැබූ මුල් බත් පිඩෙන්ම රස නහර සත්සියයම අමාවෙන් පහස ලද්දාක් මෙන් විය. අරක්කැමියාද 'දැන් මට ධනය දේ'යැයි සිතීය. රජුද අරක්කැමියා සත්කාර ලැබීමට සුදුසු යැයි සිතුවේය. රස විඳ, සත්කාරයක් කළහොත් 'මේ රජු රසයට ගිජුවන කෙනෙකැ'යි තමා ගැන අපහාසාත්මක රාවයක් පැතිරේ'යැයි සිතූ රජ කිසිත් නොකීවේය. අරක්කැමියාද 'දැන් මට ධනය දෙයි, දැන් මට ධනය දෙයි' යනුවෙන් ආහාර අනුභවය අවසන් වනතුරුම සිතුවේය. රජුද තමාට අවගුණයක් වේ යැයි බියෙන් කිසිවක් නොපැවසීය. එවිට අරක්කැමියා 'මේ රජුට රස විඳගැනීමේ හැකියාවක් නැතැයි' පසුදින නීරස අහරක් පිළිගැන්වීය. රජු, අනුභව කරමින්, 'අද අරක්කැමියාට තරවටු කිරීමට හෝ දොස් කීමට සුදුසු යැයි දැනගෙනම, පෙර මෙන් කල්පනාකාරීව, තමාට අවමානයක් වේ යැයි බියෙන් කිසිවක් නොකීවේය. එවිට අරක්කැමියා, 'රජු යහපත් රසවත් බව හෝ නීරස බව නොදනී' යැයි සිතා සියළු වියදමට අවැසි දෑ තමන්ම ලබාගෙන, යම්කිසිවක් පිස රජුට අනුභව කිරීමට දෙයි. රජ 'අනේ ධනයට ඇති තද ආසාවක තරම! මා නගර විසිදහසක (අයබදු ලබාගනිමින් - රජ බොජුන්) වැළඳුවත් මොහුගේ ලෝභකම නිසා, බත් පමණකුදු (දැන්) නොලබමි'යි කලකිරී රජකම හැර පැවිදිව විදසුන් වඩමින් පසේ බුදුබව අවබෝධ කළේය. පෙර දක්වා ඇති පරිදිම මෙම ගාථාව කීය.

එම ගාථාවෙහි **නිල්ලොලුපො** - ලොල් බවින් තොර වීමයි. යමෙක් රසයෙහි දැඩිව ඇළුණේ වේත්ද, ඔහු වඩ වඩාත් එහිම ඇලෙයි. එයටම ආසා කරයි. නැවත නැවතත් එයට ඇළුම් කරයි. එහෙයින් 'ලොලුප' යැයි කියනු ලැබේ. මෙහිදී එම ඇළුම් කිරීම පිළිකෙව් කරමින්, නිල්ලොලුපො යැයි කීය. **නිකකුහො** යමෙකුට තුන්ආකාර වූ කුහක ගති නොමැතිනම් එසේ හැඳින්වේ. මෙම ගාථාවෙහි සිත් අලවන ආහාර ආදියෙහි පුදුමසුළු ඒවාට ගිජුවන බවක් ඇතිකර නොගැනීම එයින් අදහස් කෙරේ. **නිපපිපාසො** පානය කිරීමට කැමැත්ත පිපාසා ය. එයට

නොකැමති බව නිපපිපාසො නම් වේ. ඉමිහිරි රසයට ගිජුව අනුභවයට කැමති නොවීම තේරුමයි. **නිමමකෙඛා** අනුන්ගේ යහපත් ගුණ වනසන අදහසින්, එම ගුණ මකා දැමීමයි. එසේ ගුණ යටපත් කොට කතා නොකිරීම මෙහි අදහස් වේ. තමා රජව සිටිකල අරක්කැමියාගේ ගුණ යටපත් කළ ආකාරය ගැන (සිතා) මෙසේ කියන ලදී. **නිදධනතකසාවමොහො.** කයෙන් වන දුසිරිත් ආදිය තුන් ආකාරවද එය සයආකාර වන හැටිද (ඇස් ආදී ආයතන අනුව) නියම ආකාරයෙන් නොදැක, අනුන් කෙරේ දකින ආකාරය කහට සේ දතයුතුය. එසේ හෙයින් කියන ලදී. 'තත්‍ථ කතමෙ තයො කසාවා? රාග කසාවො, දොස කසාවො, මෝහ කසාවො, ඉමෙ තයො කසාවා - තත්‍ථ කතමෙ අපරෙපි තයො කසාවා? කවරේද? රාග කහට දෝස කහට සහ මෝහ කහටය. මේ හැර තුන්ආකාර වූ කහට වේ. එය කයෙහි, වචනයෙහි සිතෙහි කහට ගැනය. ඒවා අතරින් මෝහය හැර, අනෙක් පස්ආකාර වූ 'කහට'වලටද සියළු ආකාරයෙන් මුල්වන මෝහයම (දුරුකොට) පිරිසිදු කරන ලද බැවින්, මෝහය නමැති කහට දුරුකොට පිරිසිදු කරන ලදැයි කියන ලදී. (වෙනත් අයුරින් කිවහොත්) කයෙහි, වචනයෙහි, සිතෙහි අපිරිසිදු, කහට බව ඇතිකරන, මෝහය හැර, පිරිසිදු කරන ලද බැවින් එසේ කියන ලදී. ලොල් බවින් තොරව, රාග කහට නැතිව, අනුන් හෙළා නොදකින බැවින්, තරහව හෙවත් දෝස කිලුටෙහි පිරිසිදු බවද ඇතිවන්නේමය. **නිරාසයො** ආසා නොමැති වීමයි. සබ්බලොකෙ කාමාදී තුන් භවයෙහිද, දොළොස් ආයතනවලද යන සියළු තැන්හිම භවවිභව ලෙස පවත්නා ආසා නොමැති යනු තේරුමයි. ඉතිරි කරුණු පෙර කී අයුරු දතයුතුය. නැතහොත් ගාථාවේ පද තුන කියා 'තනිව හැසිරෙයි', යනුවෙන් හෝ 'තනිව හැසිරීමට හැකිවේ' යැයි ද මෙසේ එහි සම්බන්ධතාව එක් කළ යුතුය.

**නිල්ලොලුප ගාථා විස්තරය නිමි.**

# 22.

**පාපං සහායං** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? **බරණැස** එක්තරා රජෙක් මහත් රාජ අනුහස පෙන්වමින් නගරය වටා සංචාරය

කරද්දී, මිනිසුන් ගබඩාවල රැස්කොට තිබූ අස්වැන්න පිටතට ගෙනයනු දැක, 'දරුවනි, මේ කුමක්ද'යි ඇමතිවරුන්ගෙන් විචාළේය. 'මහරජ, දැන් ලබාගන්නා ලද අළුත් අස්වැන්න ගබඩා කිරීමට ඉඩ ලබාගැනීමට මේ මිනිසුන් කලින් තිබූ අස්වැන්න ඉවත දමති'යි ඔවුහු කීහ. 'දරුවනි, බිසෝ ගෙවල් සහ බලසේනා වෙනුවෙන් (එයින්) නො අඩුව සපුරා ඇත්ද'යි රජු විමසීය. 'එසේය, මහරජ, ඒවා සපුරා ඇතැයි කීහ. 'එසේනම් දරුවනි, දන්සැලක් පිළියෙල කරව, දන් දෙමි, මේ අස්වැන්න නිකරුණේ විනාශ නොකළ යුතු යැ'යි කීය. එහිදී එක් මිසදිටු ඇමතියෙක් 'මහරජ, දීමෙන් පල නැතැ'යි කියා නුවණැත්තාද, පණ්ඩිතයාද සසරෙහි සැරිසරමින් දුක් කෙළවර කරන්නේ යැයි කියා එය වැළැක්වීය. දෙවන, තෙවන වරටත් ගබඩාවලින් එසේ අස්වැන්න ඉවත ගෙනයනු දුටු රජු පෙර ලෙසම අණ කළේය. ඇමතියාද 'මහරජ, දීමෙහි ඇත්තේ, දැකිය හැක්කේ දෙනු ලබන දෙය පමණකි. (වෙන කිසිදු පලක් නැත) ආදී ලෙස කියා තෙවන වරටද වැළැක්වීය රජු, 'බොල, මට අයිති දෙයක්වත් දීමට මම ඉඩක් නොලබමි, මේ පවට උදව් කරන්නන්ගෙන් ඇති පලය කුමක්ද'යි කලකිරී, රජකම හැර පැවිදිව, විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළහ. ඒ පවිටු සහායකයන්ගේ දොස් දකිමින් මේ උදාන ගාථාව කීහ.

මේ එහි කෙටි අදහසයි. යමෙකු කරුණු දහයකින් යුතු පවිටු, මිසදිටු, ලාමක අදහස් දැඩිව සිත දරා සිටින බැවින් පාපො නම් වෙයි. අනුන්ටද අයහපතම උදාකරයි. එහෙයින් අනත්‍ථදස්සී නම් වෙයි. කයෙන් කෙරෙන දුසිරිතෙහි තදින්ම යෙදෙයි. හිතවැඩ කැමති කුලපුතෙක් **පාපං සහායං පරිවජ්ජයෙථ, අනත්‍ථදස්සිං විසමෙ නිවිට්ඨං, සයං න සෙවෙ** යනුවෙන් පවට සහය වන්නකු අත්හැර දමන්නේය. අනුන් කෙරෙහි යම් බලපෑමක් වේද (ඒ ගැන) කළ හැකිදැයි කියන ලද්දේ වෙයි. **පසුතං** සහිත හෙවත් තදින් එල්බ ගත් හැඟීම් වශයෙන් ඒ ඒ තන්හි ලඟින, රැඳෙන යන තේරුමයි. **පමත්තං** යනු කාමයන්හි හිරවුණු සිතයි. යහපත් භාවනා ආදිය පුරුදු නොමැතිවීමයි. එබඳු තැනැත්තන් ඇසුරු නොකරන්නේය. සබඳතා නො පවත්වන්නේය. ඉතා ළඟින් සුහද ඇසුරක් නොකරන්නේය. හුදෙක් තනිව හැසිරෙන කඟවේණකු මෙනි.

**පාපසහාය ගාථා විස්තරය නිමි.**

# 23.

බහුස්සුතං යන ගාථාවට හේතුවූ කරුණ කුමක්ද? පෙර කස්සප බුදුසසුනෙහි පසේ බෝසත්වරු අටදෙනෙක් පැවිදිව, ගත පච්චාගත වත පුරා දෙව්ලොව උපන්නාහ. ඉතිරි සියල්ල අනවජ්ජභොජී ගාථාවට අදාළ කථාවෙහි කියා ඇති අයුරිනි. මේ දක්වෙන්නේ වෙනස්වන කරුණුය. පසේ බුදුවරුන් වඩා හිඳුවා 'ඔබලා කවරහුද'යි රජු විමසීය. 'මහරජ, අපි බහුස්සුත නම් වෙමු'යි කීහ. රජු, 'මම සුතබ්‍රහ්මදත්ත වෙමි, (එහෙත්) ඇසීමෙන් සෑහීමකට පත් නොවෙමි'යි කීය. 'මොවුන්ගෙන් මිහිරි, අරුත්බර දහම් දෙසුමක් අසන්නෙමි'යි සතුටුව පැන් පිළිගන්වා, බත් වළඳා අවසානයෙහි (වැඩිහිටි) තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙන, වැඳ 'හිමියනි, දහම් කතාවක් කරන සේක්වා'යි කියා ඉදිරියෙහි හුන්නේය. උන්වහන්සේ, 'මහරජ, සුවපත් වේවා! රාගය නසනු පිණිස හේතුවේවා'යි කියා (අසුනින්) නැගිටි සේක. 'රජු, 'මොහු බහුස්සුත නොවේ, දෙවැනි තෙරුන් වහන්සේ එසේ විය හැකි යැයි සිතා, 'හෙට මනහර දහම් දෙසුමක් අසන්නෙමි'යි, පසුදින දානයට ආරාධනා කළේය. මෙසේ සියළුම පසේ බුදුවරුන්ට අවසානය තෙක් පිළිවෙලින් ආරාධනය කළේය. ඒ සියල්ලෝම 'දෝසය නසනු පිණිස හේතු වේවා! මෝහය නසනු පිණිස හේතු වේවා! ඉපදීම-සසර ගමන - කෙලෙස් - තණ්හාව නසනු පිණිස හේතු වේවා'යි එක් එක් වචනයක් වෙන්කොට දක්වා, පෙර පරිදිම කියා අසුනින් නැගිට්ටාහ. එවිට රජු, 'මොවුන් බහුස්සුත' යැයි කියති. මේ හිමිවරුන්ගේ විසිතුරු දෙසුම් නැත. එසේ වුවත් 'කුමක් කියන ලදද'යි, වචනවල තේරුම් මෙනෙහි කිරීමට පටන්ගත්තේය. එවිට 'රාගය නැතිකිරීමට හේතු වේවා'යි නුවණින් මෙනෙහි කරමින් රාගය දුරු වූ කල, තරහවද, මුලාවද, අනෙක් අනෙක් කෙලෙසුන් ද නැතිවේයැයි දැන සතුටු විය. 'පිළිවෙලකට කරුණු නොකීවත්, මේ මහණුන් බහුස්සුතයහ. යම්සේ මිනිසකු විසින් මහපොළවට හෝ අහසට හෝ ඇඟිල්ලක් දිගුකොට (කුඩා) පෙදෙසක් පෙන්වන ලද්දේද, එයින් පොළවත්, අහසත් (මුළුමනින්ම) පෙන්වාදීම ආවරණය වේ. එසේම මේ මහණුන් එක් එක් අරුත් පෙන්වාදීමේදී, එහි කිව නොහැකි තරම් කරුණු ඇතුලත්ව ඇත. ඒ අනුව මාද කවර ආකාරයකින් 'බහුස්සුත' වෙම්දැ'යි පතමින්, රජකම හැරදමා පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට මේ උදාන ගාථාව කීය.

**බහුස්සුතං** යනු දෙආකාරය. තුන්පිටකයෙහි අරුත් මැනවින් දැන සිටීම පරියත්ති බහුස්සුත යැයි හැඳින්වේ. මගපල, විදුනැණ හා අභිඥාඥා අවබෝධය ලැබීම පටිවෙධ බහුස්සුත නම්. ධම්මධර හෙවත් දහම සිත්හි දරාගැනීම අරුතද මීට සමානය. කයෙන්, වචනයෙන්, සිතින් කෙරෙන යහපත් කටයුතු පිළිබඳව වටහාගැනීම හා අයහපත් දෙයක් වේනම් අත්හළ යුතුය යන වැටහීම හා තවදුරටත් පවත්වා ගතයුතු හා හළ යුතු දේ ගැන වැටහීම පටිභාන ලෙස දැක්වේ. දහම් කොටස් ඉගෙනීම හා විචාරීමෙන්ද අවබෝධයද යනුවෙන් පටිභාන හෙවත් වටහාගැනීම තුන් ආකාරය දතයුතුය. දහම් කොටස් ඉගෙන, එහි මනා වැටහීමක් ලබන තැනැත්තා 'පරියත්ති පටිභාන' නම් වේ. විමසූ විටක, එහි අරුතද (තම) දැනීම අනුව විස්තර ලෙස සඳහන්ව ඇති ආකාරය (සඳහන් වන තැන්) පහදා දීමේ වැටහීමක් ඇති තැනැත්තා 'පරිපුච්ඡා පටිභාන' නම් වේ. සෝවාන් ආදී මගපල අවබෝධ කරන තැනැත්තා 'පටිවේධ පටිභාන' වේ. එබඳු වූ **බහුස්සුතං ධම්මධරං භජේථ මිත්තං උළාරං පටිභානවන්තං** කෙනෙකුගේ ඇසුර මගින් තමාටත් අනුන්ටත් යන දෙකොටසටම හෝ මෙලොව පරලොව නොයෙක් ලෙසින් හිතසුව පිණිස හේතු වේය යනුවෙන් **අඤ්ඤාය අත්ථානි** කියා තිබේ. එහිදී 'මම අතීතයෙහි සිටියෙම්?'ද ආදී ලෙස **විනෙය්‍ය කංඛං** - සැකය, දෙගිඩියාව දුරුකොට, මුළුමනින්ම ඉවත්කොට මෙසේ (සසරෙහි) සියළු කටයුතු අවසන් කරන ලදුව, (නිවන අවබෝධ කොට) තනිව හැසිරෙන කඟවේණකු ලෙස වන්නේය.

**බහුස්සුත ගාථා විස්තරය නිමි.**

## 24.

**ඛිඩ්ඩං රතිං** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස විසූසක බ්‍රහ්මදත්ත නම් රජු උදෑසනම කැඳ හෝ බත් හෝ අනුභවකොට, නොයෙක් අලංකාරයෙන් මනා ලෙස සැරසී විශාල කැඩපතින් තමාගේ මුළු සිරුරම දැක, අකමැති දෙයක් වේනම් එය ඉවත්කොට, වෙනත් වෙනත් අලංකාරවත් ආභරණාදියෙන් සැරසෙයි. එක්දිනක ඔහු එසේ අලංකාරවත්ව සැරසෙන අතර දිවා ආහාර වේලාව එළඹිණ. ඉක්බිතිව සිරුර සැරසීම් අවසන් නොකොට, දුහුල් රෙදිපටින් හිස වෙලාගෙන,

අනුභවකොට, සැතපෙනු පිණිස ගියේය. පිබිදී, නැවත එසේම අලංකාරවත්ව සැරසෙනවිට හිරු බැසයන වේලාව විය. දෙවන දිනයෙහිද, තෙවන දිනයෙහිද මෙසේම සිදුවූයේය. අලංකාරය ගැනම වෙහෙසී කටයුතු කරන ඔහුට පිටෙහි අපහසුතාවක් හටගත්තේය. 'අහෝ ලාමක වූ මම හැකි හැම ආකාරයෙන්ම අලංකාරයෙන් සැරසුණද මේ මෝස්තර නිමැවුම්කරුගේ අලංකරණයෙහි නොසතුටුව, (ඊට වැඩි අලංකාර සැරසීම්) වැඩි ඇල්මක් ඇතිකරගතිමි. එබඳු ලෝභයක් අපායට හේතුවන කරුණකි. එබැවින් මම ලෝභය දුරුකරමි'යි රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට මේ උදාන ගාථාව කීහ.

එම ගාථාවෙහි ඛිඩ්ඩාරති පද ගැන පෙර කියන ලදී. කාමසුඛං තමාට අයත් දේවල්වල ඇලීමෙන් (වත්‍ථුකාම) සැපයක් ඇතැයි සැළකීමයි. 'රූපය සැපයකි, එහි සැපයම ඇතැ'යි එහෙයින් කියන ලදී. **ඛිඩ්ඩං රතිං** කාමසුඛඤ්ච එපරිදිමය. මේ අයුරින් පැතිර පවත්නා ලෝකයෙහි හෙවත් (තමන් ඇතුළු වටපිටාවෙහි) **ලොකෙ අනලං කරිත්‍වා** ඒවා ඉතා මැනව, සෑහේ යැයි නොසළකා, හරවත් යැයි නොගෙන. **අනපෙක්‍ඛමානො,** එසේ අලංකාරවත් සැරසීම් ගැන නොසළකමින්, ආසා නැතිව, දැඩි ඇලීමක් නොමැති බවයි. **විභූසණට්ඨානා විරතො සච්චවාදී එකො චරෙ** එහි අලංකරණය ගිහි-පැවිදි යයි දෙආකාරය. සළු (රෙදිපිළි) අඳින, පොරවන රෙදි, හිස්වැසුම්, මල් සුවඳ විලවුන් ආදිය ගිහි දිවියටද පාසිවුරු ආදිය පැවිදි දිවියටද අදාළය. මේවායින් සැරසීම විභූසනට්ඨාන නම් වේ. එබැවින් එම අලංකාර සැරසීම්වලින් තුන් ආකාරයෙන්ම වෙන් වී, ඇදහිය යුතු, ඇත්ත කතා කරන තැනැත්තෙකැයි මෙසේ තේරුම දත යුතුය.

විභූසනට්ඨාන ගාථා විස්තරය නිමි.

## 25.

පුත්තඤ්ච දාරං යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස් රජුගේ පුතා තුරුණු වියෙහිම ඔටුනු පළඳා රජකම් කරයි. ඔහු, මුල් ගාථාවට අදාළ පසේ බෝසතුන් මෙන් රජසිරි විඳින අතර, එක් දවසක්

මෙසේ සිතීය. 'මම රජකම් කරමින් බොහෝ දුක් විඳිමි. එක් අයෙකුගේ යැපීම වෙනුවෙන් මෙම පවිටු බවින් මට ඇති පලය කුමක්ද? එහෙයින් සැප උපදවා ගනිමි' (එසේ සිතා) රජකම හැර පැවිදිව, විදසුන් වඩමින් පසේ බුදුබව අවබෝධ කොට මෙම උදාන ගාථාව කීහ.

එහි ධනානි මුතු, මැණික්, වෙරළු, මිණි, සක්, පබළු, රන්, රිදී ආදී වටිනා රුවන් ය. ධඤ්ඤානි ඇල් වී, වී, යව, තිරිඟු, තණහාල්, කඩල, කුරහන් වැනි මූලික දේ මෙන්ම එයින් බාහිර ආහාර, බන්ධවානි නෑකමින්, පරපුරෙන්, යහළුකමෙන්, උගත් හැකියා ලෙසින් ඇතිවන සතරාකාර වූ සබඳතාව, යථොධිකානි තම තම සීමා පමණ ලෙස තිබෙන අයුරුය. ඉතිරි කරුණු කලින් සඳහන්ව ඇත.

පුත්තදාර ගාථා විස්තරය නිමි.

## 26.

**සංගො එසො** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස පාදලොල බ්‍රහ්මදත්ත නම් රජෙක් විය. ඔහු උදෑසනම කැඳ හෝ බත් හෝ අනුභව කොට මන්දිර තුනකදී තුන් ආකාර වූ නැටුම් බලයි. මෙයින් අදහස් වන්නේ පෙර රජ පරපුරෙන් පැවතෙන, අතුරු රජ පරපුරෙන් පැවතෙන, තම (පාලන) කාලය තුල සකස්වන නැටුම්ය. රජු එක් දවසක් උදෑසනම තරුණියන් රඟන පහයට ගියේය. ඒ නළඟනෝ 'රජු සතුටු කරන්නෙමු'යි සක්දෙවිඳුගේ සුරඟනන් මෙන් ඉතා මනහර රැඟුම්, ගැයුම්, වැයුම් දැක්වූහ. රජු 'තරුණියන්ගේ මේ රැඟුම් අමුතු පුදුම දෙයක් නොවේ' යැයි අසතුටුව මැදිවියේ නළඟනන් රඟන පහයට ගියේය. ඒ නළඟනෝද මනහර රැඟුම් ආදිය දැක්වූහ. රජු ඊටද නොසතුටුව, (වැඩිහිටි නළඟනන් රඟන) මහ නළු රඟන පහයටද ගියේය. එහිද නළඟනෝ මනහර රැඟුම් දැක්වූහ. දෙවන, තෙවන රජ පරපුරෙහි පටන් රංගනයෙහි යෙදෙන මහළු වූ නළඟනන් ඇටසැකිළි ගොඩක් නටනු මෙන් දැක ගීත ගායනයෙහි ද අමිහිරි බව අසා, නැවත තරුණියන් රඟන පහයටත්, නැවත මැදිවියේ

නළඟනන් රඟන පහයටද ගොස් කිසිදු සතුටක් නොලැබ මෙසේ සිතුවේය. 'මේ නළඟනෝ සක්දෙවිඳුගේ සුරලඳුන් මෙන් හැකි හැම අයුරින්ම නැටුම්, ගැයුම්, වැයුමෙහි නිරත වූයේ මා එහි ඇළුම් කරවනු පිණිසයි. මම ඒ කිසි දෙයකින් නොසතුටු වුව ලෝභයම වඩමි. ලෝභය නම් අපායට මගකි. එහෙයින් මම ලෝභය දුරුකරමි'යි රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධකොට මේ උදාන ගාථාව කීහ.

එහි අරුත නම් **සංගො එසො** යනුවෙන් තමන් පරිහරණය කරන සම්පත් ගැන සඳහන් කරයි. මඩෙහි ගැලුණු ඇතු මෙන් මිනිස්සු එම සම්පත්වල ඇලෙති. **පරිත්තමෙත්ථ සොඛ්‍යං** පස්කම්හි විඳිනා කල්හි එය සැපයකැයි සිතන, අවුල් වූ හැඟුමෙන් හටගැනෙන කාමයන් හසුරුවන තැනැත්තකු බවට පත්ව, බොළඳව, ලාමක ව (කායික මානසික) සුවතාව අඩුවේ. සුළු මොහොතක විදුලිඑළියෙන් දකින නැටුමක් මෙන් අල්ප සුවයකි. තාවකාලික යැයි කියන ලද්දේ වෙයි. අප්පසාදො දුක්ඛමෙත්ථ භීයො. මෙහිදී 'මහණෙනි, පස්කම් නිසා සුවයක්, සතුටක් හටගනීද, මෙය කාමයෙහි ඇළුම් කරවන, ආස්වාදය වේ' යනුවෙන් 'යං බො භික්ඛවෙ ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං කාමානං අස්සාදො' ඒ ගැන දැක්වේ. 'මහණෙනි, කාමයෙහි ආදීනව කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි යම් කුල පුතකු (අතෙහි) රේඛා බලා (අනාගතය කීමෙන්) හෝ ගණිත කටයුතු වැනි තම හැකියාවෙන් ජීවිකාව ගෙන යයි. 'කො ච භික්ඛවෙ කාමානං ආදීනවො. ඉධ භික්ඛවෙ කුලපුත්තො යෙන සිප්පට්ඨානෙන ජීවිතං කප්පෙති, යදි මුද්දාය, යදි ගණනාය.....' මේ ආකාරයෙන් එහි දුක ඇතිවන අයුරු කියන ලදී. එය සළකනවිට (සුවය) දියබිඳුවක් මෙන් ඉතා අල්පය. සිවු සමුදුරෙහි දිය මෙන් දුකම වැඩිවෙයි. එහෙයින් **අප්පස්සාදො දුක්ඛමෙත්ථ භීයො** යැයි දක්වා ඇත. **ගණ්ඩො එසො** - වින්දන ආස්වාදය පෙන්වා පස්කම්වලට ඇදගන්නා ආකාරයෙන් (ඇම සහිත) බිළී කටුවක් ලෙස පහදයි. **ඉති ඤත්වා මුතීමා** එසේ දැන කරුණු වටහාගත් නුවණැති තැනැත්තා ඒ සියල්ල අත්හැර දමා කඟවේණකු සේ තනිව හැසිරෙන්නේය.

**සංග ගාථා විස්තරය නිමි.**

# 27.

**සන්දාලයිත්වා** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස අනිවත්ත බ්‍රහ්මදත්ත නම් රජෙක් විය. ඔහු යුද පිණිස ගියේ නම්, ජය ගෙන මිස හෝ, වෙනත් කටයුත්තක් ඇරඹුවහොත් එය අවසන් නොකොට හෝ නොනවතී. එහෙයින් ඔහු පසුනොබසින කෙනෙකු ලෙස හැඳින්වූහ. රජු එක්දිනක් උයනට යන අතර, ලැව් ගින්නක් හටගත්තේය. එම ගින්න වියළි, අමු තණ ආදිය දවමින් නොනැවතීම ඉදිරියම පැතිරෙයි. එය දුටු රජ, සුදුසු අරමුණක් කොට ගත්තේය. 'මේ ලැව්ගින්න මෙන්, සියළු සතුන්ම එකොළොස් ගින්නකින් නිරතුරුවම මහත් දුකට පමුණුවමින් දවයි. කවදා මමත් මේ දුක් නවතාලනු පිණිස, මෙම ගින්න මෙන්, උතුම් මග නුවණ නමැති ගින්නෙන් කෙලෙස් දවමින් නොනැවතී ඉදිරියටම යන්නෙම්ද'යි සිතීය. එතැනින් මඳක් ඉදිරියට ගියවිට, ගඟෙහි මසුන් අල්ලන ධීවරයන් දුටුවේය. 'මසකු දැල කඩාගෙන ගියේ' යැයි ධීවරයෝ කෑගැසූහ. රජු ඒ වචන ද අසා එය ද අරමුණක් කොට ගත්තේය. 'කවදා මමත් උතුම් මග නැණින්, තණ්හා-හැඟීම් නැමති දැල බිඳ, නොගැටී, නිදහස්ව යන්නෙම්ද'යි සිතීය. ඔහු රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කළේය. මෙම උදාන ගාථාව කීය.

එහි දෙවන පදයෙහි **ජාල** යනුවෙන් නූල්වලින් (බැඳුණු) සකස් කරන ලද බව කියන ලදී. අම්බු ජලයයි. එහි හැසිරෙන්නේ අම්බුචාරී ය. මාළුවාට සමාන වචනයකි. සලිලෙ අම්බුචාරී = **සලිලම්බුචාරී** ඒ ගංගා ජලයෙහි දැල කඩන ලද මාළුවා ගැන කියා ඇත. තුන්වන ගාථා පාදයෙහි දඩ්ඪං යැයි දැවුණු තැන ගැන දක්වයි. ගින්නේ දැවුණු තැනක ගින්න නොනවතින සේ, එතැන ගින්දර වැඩියෙන් නොතිබෙන්නා සේ, මග නුවණ නැමති ගින්නෙන් කාමගුණ දැවුණු තැනක එයට ඉඩ නැත. එහි නැවත වැඩිවීමක්ද නොවේ යැයි කියන ලදී. ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය.

**සන්දාලගාථා විස්තරය නිමි.**

# 28.

**ඔක්ඛිත්ත චක්ඛූ** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස චක්ඛුලෝල බ්‍රහ්මදත්ත නම් රජු (කලින් කී) පාදලෝල බ්‍රහ්මදත්ත රජු මෙන් නැටුම් බැලීමට කැමති වූවෙකි. මෙම කතාවෙහි වෙනසක් ඇත. පාදලොල බ්‍රහ්මදත්ත රජු අසතුටුව ඒ ඒ (පහයට) ගියද මේ රජ ඒ ඒ නාටක දැක බොහෝ සතුටුව දැඩිව ආසා කරමින් එහි හැසිරෙයි. ඔහු නාටක නැරඹීමට ආ එක්තරා කෙළෙඹි බිරියක දැක, රාගය ඉපදවීය. එයින්ම සංවේගයට පැමිණ, 'අහෝ, මම මෙම තණ්හාව වඩමින් අපාගත වන්නෙක් වෙමි. එහෙයින් ඊට අපහාස කරන්නෙමි, නම් මැනවැ'යි පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට, තමාගේ මුල් පිළිවෙතට ගරහමින්, ඊට වෙනස්වන - යහපත් ගුණ දනවන මෙම උදාන ගාථාව කීහ.

එහි ඔක්ඛිත්ත චක්ඛූ පහත හෙළන ලද (බිමට යොමුවුණු) ඇසින්, ගෙල ඇට අටක් පිළිවෙළට තබා එය මගහැර යන අයුරින්, දුටුවිට ඉවත බලාගන්නා සේ, වියගහක් පමණ දුර බලන බව කියන ලදී. එසේ බලන්නේද හකු ඇටයෙන් හද ඇටය හා ගැටීමක් ඇති නොවන පරිදිය. එසේ ගැටෙන අයුරින් පහතට ඇස් යොමුකිරීමද පැවිද්දකුට සුදුසු නොවේ. න ච පාදලොලො එක් අයෙකුට දෙවැන්නකු ලෙසටද, දෙදෙනෙකු සමග තුන්වැන්නකු ලෙසටද සමූහයා මැදට පිවිසෙනු කැමතිව, පාදයෙහි කැසිල්ලක් හටගත්තා සේ, ඉක්මන් ගමනින් හෝ (එකිනෙකා) පසුබා යාමෙන් තොරවීමයි. **ගුත්තින්ද්‍රියො** මෙහි වෙන්ව කියන ලද (ඇස ද ඇතුළුව) ඉඳුරන් සයෙහි සංවරව පවත්වාගෙන, **රක්ඛිත මානසානො** අදහස් - හැඟීම් ඇති බැවින් මනසයි. එය රැකගන්නේ යැයි තේරුමයි. කෙලෙස්වලට පැහැරගත නොහැකි පරිදි සිත රැකගත යුතු යැයි ද කියන ලදී. **අනවස්සුතො** මේ පිළිවෙත් මගින්, ඒ ඒ අරමුණුවල කෙලෙස් මුල්බැස නොගැනීමයි. **අපරිඩයහමානො** මෙසේ කෙලෙස් මුල්බැස නොගැනීමෙන් සිත නොතැවෙමින්, නොදැවෙමින්, බාහිරව හෝ කෙලෙස් වසඟ නොවමින් එයින් තැවුලට පත් නොවේ. ඉතිරි කරුණු කලින් සඳහන් කළ පරිදිය.

**ඔක්ඛිත්ත චක්ඛු ගාථා විස්තරය නිමි.**

# 29.

**ඔභාරයිත්වා** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස, චාතුමාසික බ්‍රහ්මදත්ත නම් වෙනත් රජෙක් සිවු මසින් සිවු මස උයන්කෙළි පිණිස යයි. ඔහු එක්දිනක් (ග්‍රීෂ්ම ඍතුව) මැද මාසයේ උයනට පිවිසෙන විට උයන් දොරටුවෙහි කොළවලින් පිරුණු කොබෝලීල මල් ඉත්තක් දැක එක් මලක් රැගෙන උයනට ගියේය. එවිට, 'රජු වටිනා මලක් රජු ගත්තා ලදැ'යි එක්තරා ඇමතියෙක්ද ඇතු පිට සිටම එක් මලක් ගත්තේය. මේ ආකාරයෙන් මුළු බලකායම මල් ගත්තේය. මල් නොමැති වූ විට කොළද ගත්හ. මුළු ගසම මල්, කොළ නැති කඳ පමණක් ඉතිරි විය. රජු සවස්කල උයනෙන් නික්මෙද්දී, ඒ දැක 'මේ ගසට කුමක් කළේද? මා උයනට පැමිණෙද්දී (මේ ගස) මිණිවන් අතු ඉති අතර, පබළු මෙන් මලින් අලංකාර විය. දැන් කොළ, මල් නැතැ'යි සිතමින් ඊට නුදුරින් වූ කොළවලින් ගැවසුනු මල් නොපිපුණු ගසක් දුටුවේය. එවිට රජුට මෙසේ සිතුණි. 'මේ ගස මලින් පිරී අතු පතරින් යුතු වූ බැවින් බොහෝ දෙනාට ආසා ඇතිවිය. එය මොහොතකින් වැනසීමට පත් විය. මේ අනික් ගසට ආසා ඇති නොවන බැවින් එසේම තිබේ. මේ රජකමද මල් පිපුණු ගස මෙන් ආසාවම වඩවයි. පැවිදි බව මල් නොපිපුණු ගස මෙන් ආසා ඇති නොකරයි. එහෙයින් මේ ගස මෙන් ඇළුම් නොවේද, කොළවලින් ගැවසුණු අනෙක් කොබෝලීල ගස මෙන්, කහවතින් (සිරුර) වසා, පැවිදිවිය යුතුය. 'ඔහු රජකම හැර පැවිදිව විදසුන් වඩමින් පසේ බුදුබව අවබෝධ කොට මෙම උදාන ගාථාව කීය.

**එහි කාසායවත්ථො අභිනික්ඛමිත්වා** මේ (තැබූ) පියවරෙන්ම ගිහි ගෙයින් නික්ම, කහවත් දරන්නෙකු වී යැයි තේරුම දතයුතුය. ඉතිරි කරුණු කලින් සඳහන් වූ බැවින් වටහා ගැනීමට හැකි වේ. එහෙයින් විස්තර නොදක්වන ලදී.

**පාරිච්ඡත්තක ගාථා විස්තරය නිමි.**

**තුන්වන වග අවසානය**

# 30.

රසෙසු යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? එක්තරා බරණැස රජෙක් ඇමති පුතුන් පිරිවරා උයනෙහි ගල්තලා පොකුණෙහි කෙළිදෙළෙන් පසුවෙයි. රජුගේ අරක්කැමියා සියළු මස්වල රස ඇතුළත්, මනාව පිළියෙල කරන ලද, අමාවක් බඳුඅතුරු අහරක් අහරක් පිස රජුට පිළිගැන්වීය. ඔහු එහි ගිජුව ආසාවට පත්ව, කිසිම කෙනෙකුට මදක් හෝ නොදී තමන්ම අනුභව කළේය. ජල කෙළියෙහිද බොහෝ වේලාවක් ගතකළ බැවින්, ඉක්මණින්, ඉක්මණින් අනුභව කළේය. මුලදී ඔහු සමග අනුභව කළවුන් ගැනද කිසිදු සිහිකිරීමක් නොකළේය. පසුව ඒ ගැන ගැඹුරින් සිතනවිට 'අනේ! මා අයහපත් දෙයක් කරන ලද්දේය. මම රස තණ්හාවෙන් වෙළී, සියළු දෙනා අමතක කොට තනිවම අනුභව කළෙම්ද, ඒ රස තණ්හාවට නින්දා කරමි'යි රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදු බව අවබෝධ කොට තම මුල් පිළිවෙතට ගරහමින් දුන් ලද වෙනස පහදමින් මෙම උදාන ගාථාව කීය.

එම ගාථාවෙහි **රසෙසු** යනු ඇඹුල්, මිහිරි, තිත්ත, රළු, ලුණු, කර, කහට ආදී (දිවට) දැනෙන නොයෙක් රසයි. **ගෙධං අකරං** - ගිජු බවින් තොරවීමයි. තණ්හාව නූපදනා බව කියන ලදී. **අලොලො** 'මෙය රස බලන්නෙමි, මෙය රස බලන්නෙමි'යි නොයෙක් රසයෙහිම පැටලී නොසිටීමයි. **අනඤ්ඤපොසී** ආහාර ආදිය ලබාදෙමින් හදාවඩා ගතයුතු, තමන් හා එක්ව වෙසෙන්නන් නොමැති බවයි. සිරුර පවත්වාගන යාමට තරම් වූ දෙයකින් සෑහීමට පත් වේ යැයි කියන ලදී. පෙර උයනෙහිදී යම්සේ රසයෙහි ගිජුව ආසාවෙන් වෙනත් කෙනෙකුට නොදී සිටියෙම්ද, එසේ ආසාවට ලොල්ව රසයෙහි ගිජුවෙයි. ඒ තණ්හාව හැරදමා නැවතත් එය මුල්කොට වෙනත් ආසා නූපදනා බැවින්, වෙනත් කෙනෙකු කවා පොවා ඇතිදැඩි නොකරන බව දක්වයි. නැතහොත් වෙනත් අරුතක් ලෙස කෙලෙස් (ගැන) කියනු ලැබේ. ඒවා (තවදුරටත්) හදාවඩා නොගන්නා ලෙසින් අනඤ්ඤපොසී නම් වෙයි. **සපදානචාරී** (පෙර බුදුවරුන්ගේ සිරිත නොඉක්මවමින්) අනුපිළිවෙලින් (පිඬු පිණිස) හැසිරෙයි. පොහොසත් පවුල් යැයිද දිළිඳු පවුල් යැයිද අත්නොහැර, ගෙවල් පිළිවෙලින් පිඬු පිණිස පිවිසීම යනු තේරුමයි. **කුලෙ කුලෙ අප්පටිබද්ධ චිත්තො** කැත් කුල ආදී ලෙසින් යම් කිසිතැනක කෙලෙසින් නොඇළුණු සිතින් සඳ

උපමා කොට නිති අළුත (පැවිදි වූවකුව) - නිති නවකයෙකුව යන තේරුමයි. ඉතිරි කරුණු කලින් සඳහන් කර ඇති අයුරිනි.

රසගෙධ ගාථා විස්තරය නිමි.

## 31.

**පහාය පඤ්චාවරණානි** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස එක්තරා රජෙක් පළමු ද්‍යානය ලැබීය. රජු ද්‍යානය රැකගැනීම පිණිස රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට තම පිළිවෙත් සම්පත් මහිමය පහදමින් මෙම උදාන ගාථාව කීය.

එහි **ආවරණානි** නීවරණයි. ඒ ගැන උරග සූත්‍ර විස්තරයෙහි සඳහන් විය. වලාකුලින් සඳ හිරු වසන්නා සේ නීවරණ සිත අහුරයි. එහෙයින් **ආවරණානි චෙතසො** යැයි කියන ලදී. එය සිත එකඟ කිරීමේ මූලික හැඩගැසීමේදී හෝ ද්‍යාන් ලැබීමෙන් හෝ (උපචාර හා අප්පණා ලෙස) **පහාය. උපක්කිලෙසෙ** සිතට බාධා කරන අයහපත්, අකුසල කරුණුවලින් යුතු, වත්ථූපම සූත්‍රයෙහි දක්වා ඇති පරිදි දැඩි ලෝභය ආදී ලෙසිනි. ව්‍යාපන්නුජ්ජා හටගැනීමට ඉඩ නොදී වනසා, විදසුන් මගින් දුරුකොට ඇතැයි තේරුමයි. **සබ්බ** ඉතිරි නොවී, මෙසේ සමථ හා විදසුන් වඩා සෝවාන් මගින් දැඩිව ගන්නා ලද දිට්ඨී හෙවත් වැරදි හැඟීම් දුරුකරන ලද බැවින් **අනිස්සිතො** (සකාදාගාමී ආදී) ඉතිරි මගපලවලින් **ඡෙත්වා**, තුන් ආකාර **සෙනහදොසං** තණ්හා රාග යැයි කියන ලදී. ඇලීම ආදරය එයට වෙනස්වන අයුරු සෙනහදොසො යැයි කියන ලදී. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිය.

ආවරණ ගාථා විස්තරය නිමි.

# 32.

විපටඨී කත්‍වාන යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස එක්තරා රජෙක් සිවුවන දැහැන ලැබුවේය. ඔහු දැහැන රැකගැනීම පිණිස රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට තම පිළිවෙත් සම්පත් පහදමින් මෙම උදාන ගාථාව කීය.

එම ගාථාවෙහි **විපිටඨී කත්‍වාන** නොපිටට හරවා, හැරදමා, අත්හැර යන තේරුමයි. **සුඛං දුක්ඛඤ්ච** කයෙහි සැප-දුකය. **සොමනසස දොමනසසං** සිතිවිලි නිසා ඇතිවන (සිතෙහි) යහපත හා අයහපතයි. **උපෙකඛං** සිවුවන දැහැනෙහි මැදිහත් බවයි. **සමථං** සිවුවන දැහැනින් ලබන (සිතෙහි) එකඟ බවය. **විසුද්ධං** නීවරණ පහෙන්ද, විතක්ක, විචාර, පීති, සුඛ යැයි කියන ලද එකිනෙකට වෙනස් කරුණු නවයෙන් මිදුණු හෙයින් ඉතා පිරිසිදුය. පිරිසිදු කරන ලද රත්රන් සේ කෙලෙස් හැරදමන ලදැයි යන තේරුමයි. මෙයින් අදහස් කෙරෙන්නේ, සැප ද දුක ද අතහැර දැමීමේදී, **පුබ්බෙව** - පළමු දැහැන ලබාගැනීමට මූලික අවදියම දුකය. තුන්වන දැහැන ලැබීමේ මූලික අවදිය සැපය යයි අදහස් වේ. නැවත මුලින්ම කියන ලද 'ච' අකුර පසුව යොදා සොම්නසද දොම්නසද හැරදමා පුබ්බෙව යැයි යෙදේ. එයින් සොම්නස සිවුවන දැහැනෙහි මුල් අවදියෙහිද දොම්නස දෙවන දැහැනෙහි මුල් අවදියෙහිද යෙදෙන අයුරු පහදයි. මේවා ඒ ඒ ආකාරයෙන් (ඒ ඒ දැහැන ලැබීමෙන්) ඉවත්වන සැටි (දක්වා ඇත.) පොදුවේ සළකතොත්, පළමු දැහැනෙහිදී දුක ද, දෙවැනි දැහැනෙහි සොම්නස, තුන්වන දැහැනෙහි සැපය, සිවුවන දැහැනෙහි සොම්නස දුරුවන අයුරුය. 'පළමු දැහැනට පැමිණ වාසය කරයි. එහි මුල දී හටගත් දුකෙහි බලපැවැත්ම මුළුමනින්ම දුරුකරයි. 'පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, එත්‍ථුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති' යනුවෙන් කියා ඇත්තේ එබැවිනි. ඒ සියළු කරුණු අත්‍ථසාලිනියෙහි ධම්ම සංගහ විස්තරයෙහි සඳහන් වේ. පුබ්බෙව යම් අයුරින්, පළමු, දෙවන, තුන්වන දැහැන්වල දී දුක, දොම්නස, සුවය නැතිකොට - හැරදමා - සතරවැනි දැහැනෙහිදී සොම්නසද හැරදමා, මේ පිළිවෙත් මගින් ලබන ලද (සොබාවය) විමසමින් පිරිසිදු සිත එකඟතාවට පත්ව තනිව හැසිරෙන්නේය. ඉතිරි කරුණු කලින් කියන ලද පරිදිමය.

**විපිටඨී ගාථා විස්තරය නිමි.**

# 33.

ආරද්ධ විරියො යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? ඇත කුඩා පෙදෙසක් යෝධයන් දහසක බලකායක් සහිතව පාලනය කරන, බොහෝ නුවණැති එක්තරා රජෙක් විය. ඔහු එක් දවසක් 'මා කුඩා පෙදෙසක් පාලනය කරතත්, නුවණින් මුළු දඹදිවම යටත් කරගත හැකි'යැයි සිතා, යාබද පෙදෙසක රජුට 'සත්දිනක් ඇතුලත මට රජය නොදුනහොත් යුද්ධය වනු ඇතැ'යි දූතයකු යැවීය. පසුව ඇමතිවරුන් රැස්කොට, 'මා ඔබලා නොවිමසාම අපරාධයක් කරන ලදී. අසවල් රජුට මෙසේ පණිවුඩ යවන ලදී. කුමක් කළ යුතුදැ'යි ඇසීය. 'මහරජතුමනි, ඒ පණිවුඩකරු නවතාලිය හැකිදැ'යි ඔවුහු ඇසූහ. 'නොහැකිය, (දැනටමත්) යන්නට ඇතැ'යි රජු කීය. 'එසේනම්, ඔබ අප වනසා ඇත. එසේනම් වෙනත් කෙනෙකුගේ අවියකින් මැරෙන්නට වීම දුකකි. අපි එකිනෙකාට පහරදී මැරෙමු. තමන් තමන්ම පහර දී හෝ මැරෙමු. ගෙල වැල ලාගෙන මැරෙමු. වස විස කමු' ආදී ලෙසින් එක් එක්කෙනා මරණයම අගය කරයි. එවිට රජු, 'මොවුන් කියන්නේ කුමක්ද? දරුවනි, මට යෝධයන් ඇත්දැ'යි ඇසීය. 'මා යෝධයෙක්මි. මා යෝධයෙක් යැයි කියමින් ඒ යෝධයෝ දහසම නැගී සිටියහ. රජු, මොවුන් විමසන්නෙමි'යි සිතා දරසෑයක් තනවා 'දරුවනි, මා මෙවන් අපරාධයක් කරන ලදී. ඒ නිසා මට ඇමතිවරු දොස් කියති. මම දරසෑයට පිවිසින්නෙමි. කවරකු මා සමග එත්ද? කවුරු මට (මා වෙනුවෙන්) ජීවිතය දෙත්දැ'යි ඇසීය. මෙසේ කී කල, යෝධයෝ පන්සියයක් 'මහරජ, අපි (දර සෑයට) පිවිසෙමු'යි කීහ. එහිදී රජු අනිත් යෝධයන් පන්සියයගෙන් 'ඔබලා කුමක් කරවුද? දරුවනි'යි ඇසීය. 'මහරජ, එය පිරිමි ගතියට සුදුසු දෙයක් නොවේ. ගැහැණු ගතියකි. මේ වනවිට මහරජු විසින් සතුරු රජෙකුට දූතයෙකු යවා ඇත. එහෙයින් අපි ඒ රජු සමග යුදකොට මැරෙන්නෙමු'යි ඔවුහු කීහ. එවිට රජු 'ඔබලා මා වෙනුවෙන් ජීවිතය හැරදමන ලදැ'යි කියා සිවුරඟ සෙනග රැස්කොට ඒ යෝධයන් දහස පිරිවරා ගොස් පාලන සීමාවෙහි හුන්නේය. සතුරු රජු ද ඒ පුවත අසා 'බොල, ඒ කුඩා රජු මගේ මෙහෙකරු බවටද නොසෑහේ යැයි කිපී සියළු බල සේනාව සමග යුද පිණිස නික්මියේය. කුඩා රජුද ඒ සේනාව ඉදිරියට එනු දැක, 'දරුවනි, ඔබලා බොහෝ පිරිසක් නොවේ. සියළු දෙනාම එක්ව කඩු පලිහ ගෙන, ඉක්මණින්ම, එකවරටම ඒ රජු ඉදිරියට යවු' යැයි (අණ කළේය.) ඔවුහු එසේ කළහ. ඊට පසු ඒ සේනාව

දෙකොටසකට බෙදී නොපෙනී ගියේය. ඔවුහු සතුරු රජු පණ පිටින්ම අල්ලා ගත්හ. කුඩා රජුද, 'සතුරු රජු මරමි'යි කියමින් ඉදිරියට දුවයි. සතුරු රජු තමා නොමරන ලෙස අයැදීය. ඔහුට ජීවිතය දී, තමා හා එකඟතාවයකට පොරොන්දු කරවා ගෙන, අවනතකොට, ඔහු සමග වෙනත් රජකුගේ පාලන සීමාවට ගොස් 'රජකම දෙව, නැතිනම් යුද්ධය' යැයි දැන්වීය. එහි රජු 'මට එක යුද්ධයකට හෝ උත්සාහ නොවෙමි'යි රජකම පැවරීය. මේ උපායෙන් සියළුම රජවරුන් තම යටතට ගෙන, පසුව බරණැස රජුද අල්ලා ගත්තේය. ඔහු එක්සියයක් (යටත් වූ) රජවරුන් පිරිවරා මුළු දඹදිවටම අගරජ බවට පත්ව, 'මම පෙර කුඩා පාලකයෙක් වූයෙමි. මම මගේ නුවණ නමැති සම්පතින් මුළු දඹදිවම අධිපති වෙමි. ඒ නුවණ එදිනෙදා පැවැත්මට - මෙලොවට උත්සාහයක් වුවත් එය සැනසීමට හෝ ඇලීම් නැති කරලීමට හේතු නොවේ. මම නුවණ මෙහෙයා ලොවුතුරා දහම සොයන්නෙමි'යි සිතුවේය. බරණැස රජුට රජකම පවරා දී අඹුදරුවන්ද තම ජනපදයටම යවා පැවිදිවත සමාදන්ව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට, තම උත්සාහයේ අගය පහදා දෙමින් මෙම උදාන ගාථාව කීහ.

පටන් ගන්නා ලද උත්සාහය වේ නම් එය **ආරද්ධවිරියො** - එයින් තමාගේ උත්සාහයේ මුල් පටන්ගැන්ම දක්වයි. පරමත්ථ යයි නිවනට කියනු ලැබේ. නිවනට පැමිණීම **පරමත්ථ පත්තියා** ඒ අරඹන ලද උත්සාහය උපදවන සිතත්, සිතිවිලිත් නොහැකිළුනු බව දක්වයි. **අකුසීත වුත්ති** යනුවෙන් සිටින තැන්, සක්මන් ආදියෙහි කයෙහි අලස බව දුරුකර ගැනීමයි, **දළ්හනික්කමො** - එයින් 'සම්, නහර (ඉතිරි වුවත්) 'කාමං තචො නහාරු චා'ති පවත්නා වූ බලවත් උත්සාහය (නිවන අවබෝධය සඳහා) පැහැදිලි කරයි. පවත්නා වූ බලවත් උත්සාහය (නිවන අවබෝධය සඳහා) පැහැදිලි කරයි. අනුපිළිවෙලින් වූ සිකපද අනුගමනය කරමින්, කයින් ද එකම ඇත්ත අවබෝධ කරතියි කියනු ලැබේ. නැතහොත් ඒ මග සඳහා වූ උත්සාහය පෙන්වයි. එය දැඩිසේ තවදුරටත් භාවනා ලෙසින් පිරිපුන් බවට ගිය බැවින්, ඒ ආකාරයෙන් උත්සාහවත්ව, මුළුමනින්ම අයහපත් කරුණු බැහැර කරන ලද බැවින්, **දළ්හනික්කමො** යයි කියනු ලැබේ. **ථාමබලූපපන්නො** පිළිවෙත් මග උත්සාහවත්ව කාය බලයෙන් ද නුවණ බලයෙන් ද නැතහොත් සවි බලයෙන් හා නොසැලෙන නුවණ ලැබී යැයි කියන ලද්දේය. ඒ අයුරින් විරිය වඩා, විදසුන් නුවණ ලබන සැටි පෙන්වා දෙමින් නුවණ මෙහෙයා කෙලෙස් දුරු කරයි. ගාථාවෙහි පද

තුනෙහිම ඉතා උසස් උත්සාහය ලෙස මුලදී හෝ මැදදී යොදාගත යුතුය. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිය.

**ආරද්ධවීරිය ගාථා විස්තරය නිමි.**

# 34.

**පටිසල්ලානං** ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? මෙම ගාථාවට මුල් වූ කරුණු ආවරණ ගාථා (32) කතා පුවත හා සමානය. අමුතුවෙන් දැක්විය යුතු කරුණක් නැත.

ගාථාවෙහි අරුත් විවරණය මේය. **පටිසල්ලානං** ඒ ඒ ජීවිත් කෙරෙහි සකස්වන්නා වූ හේතු පිළිබඳ නැවත මෙනෙහි කරමින්, රාගාදි ගති සොබා ගැනද තනිව - පසෙකට ව සළකා බැලීම - කයෙහි සන්සුන් බව අදහස් වෙයි. **ඣානං** පිළිවෙලට නොවඩනා ලද දැහැනින් ද අරමුණු අනුව සිහිපත් කර පිළිවෙලකට දැහැන් වැඩීමෙන්ද, ඇතිවන සිතෙහි විවේකයයි. එහිදී සිතෙහි උසස් බව වළකන නීවරණ ආදිය ඉවතලා ලබන සමාපත්ති අට අරමුණු කොට ගැනීමද ඣාන යැයි කියනු ලබයි. **සඤ්ඤා** දැහැනින්ද එයින් නොනැවතී නැවත නැවත සිහිපත් කිරීමෙන්ද ඉදිරියට යමින් විදසුන් මගින් ලබන මගපලද මෙහි දැහැන් ලෙස ගැනේ. මෙහිදී අරමුණු අනුව වටහාගැනීම අදහස් වේ. මෙසේ විවේකී බවද - දැහැන් මගද **අරිඤ්චමානො** අත්හැර නොදමමින්, ධම්මෙසු විදසුන් අනුව සළකා බලන රූප, වේදනා ආදී සමූහ පහේ පැවැත්ම හෙවත් ගතිසොබාවයි. **නිච්චං** නිතර, නිරතුරුව, ඒ අනුව පැවතෙන, **අනුධම්මචාරී** ඒ කරුණු අනුව යන විදසුන් වඩමින්, ඒ අනුව හැසිරෙමින්, නැතහොත් **ධම්මා** නව ලොවුතුරා දහමයි. ඒ කරුණුවලට සුදුසු පරිදි පැවතීම **අනුධම්මො**. විදසුන් සඳහාම සමාන වචනයකි. එහි ධම්මානං නිච්චං අනුධම්මචාරී යනුවෙන් කිවයුතු නමුදු ගාථා සැකසීමේ පහසුව අනුව විබත් වෙනසකින් ධම්මෙසු යැයි කියා ඇත. **ආදීනවං සම්මසිතා භවෙස** ඒ දහමෙහි අනුව හැසිරෙතැයි කියන ලද විදසුන් වඩමින් කිසිවක් ඇති

පරිද්දෙන් නොපවතී යැයි කාමාදී භව තුනෙහිම මැනවින් දකිමින් මෙම කයෙහි සිතෙහි විවේක බව ලබන පිළිවෙත ලබන ලද්දේ යැයි කිවයුතුය. තනිව හැසිරෙයි යනුවෙන් අදහස් වේ යැයි ද දතයුතුය.

පටිසල්ලාන ගාථා විස්තරය නිමි.

# 35.

තණ්හක්ඛයං යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? බරණැස එක්තරා රජෙක් මහත් රාජ අනුභසින් යුතුව නගරය වටා සංචාරය කරයි. රජුගේ සිරුරෙහි සොඳුරු බවින් කුල්මත්ව, ඉදිරියෙන් යන්නා වූද, පසුපසින් යන්නා වූද මිනිස්සු නැවතී රජු දෙසම බලා සිටිති. බුදුකෙනෙකු, පුන්සඳ, මුහුද, රජෙකු දැකීමෙන් සෑහීමකට පත්නොවීම මිනිසාගේ පොදු ගතියකි. ඉක්බිති එක් ධනවත් පවුලක බිරියක්ද තම පහයෙහි ඉහළ මාලයට ගොස් සීමැදුරු කවුළුව හැර, (රජු දෙස) බලමින් සිටියාය. රජු ද ඇය දැක, ආදර සිතැතිව, 'දරුව, මේ කාන්තාව විවාහකද, අවිවාහකද'යි දැනගනුව'යි ඇමතියකුට අණ කළේය. ඔහු ඇය විවාහක බව දැන රජුට සැළකළේය. රජු 'මෙහි විසිදහසක් නළගනන්, සුරඟනන් මෙන් මා සමගම එක්ව සතුටින්-ඇල්මෙන් කල්ගත කරති. එසේ වූ මා දැන් ඊටත් දුරට සිතා අන් ගැහැණියකට ආසා කළෙමි, ඒ ආසාවට මා නිරයටම ඇදගෙන යනු ඇතැ'යි ආසාවෙහි දොස් දැක, 'අහෝ එය පිළිකුල් කොට පහ කරන්නෙමි'යි, රජකම හැරදමා පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට මෙම උදාන ගාථාව කීය.

එම ගාථාවේ **තණ්හක්ඛයං** නිවනයි. මෙසේ තණ්හා ආසාවෙහි දොස් දැකීම තවදුරටත් එය නොපැවතීමට (හේතු වේ) **අප්පමත්තො** නොනැවතී මැනවින් කටයුතු කිරීමයි. **අනෙළමූගො** නිතර නොදොඩනසුළු මුවින් යුතු නැතහොත් කෙළතොළු නොවූයේ, ගොළු නොවූයේ, වියත් (සුදුසු වචන කතා කරන) දැනුම් තේරුම් ඇති, නුවණැති කෙනෙකු ගැන කියා ඇති අයුරුය. හිතසුව සැලසෙන, යහපත් දේ අසා ඇත්තෙකු යයි

සූතවා වේ. දහම් කරුණු හෝ තෙවළා දහම දැන පිළිපදින යන තේරුමයි. **සතිමා** බොහෝ කලක් එසේ සිත දරාගත යුතු දේ සිහිකරන බවයි. **සංඛත ධම්මො** දහම් විමසා දැන, මැනවින් වටහාගන්නා ලද, **නියතො** උතුම් මගපලයෙන් නියමිත තැනට පත්වූයේ, **පධානවා** මුලසිටම මනා අයුරින් පවත්නා වූ උත්සාහය අනුපිළිවෙලකට නැතිව ඒ පදය යෙදිය යුතුය. මෙසේ, (යහපතට) පමා නොවීම් ආදී ගුණයෙන් යුතුව, යහපත් අරමුණු ඉටුකර ගැන්මෙහි උත්සාහයෙන් යුතුව, (කිසිවක් තිර නැත, නැසෙනසුළු යයි සිතමින්) නියම තැනට පත්වූයේ, එයින් අරහත් බවට පැමිණියේ යන අදහසයි. එසේ හෙයින් (සුත්තනිපාත-පාරායණ වග්ග අජිත පඤ්හයෙහි) 'යම්දෙයක් තිරව පැවැත්මක් නැතැ'යි හෙවත්, අනිච්චතාවයෙන් සලකා මේ ලෝකයෙහි ඒ අනුව (සික පද සමාදන් වේ) හික්මෙන.......... 'යෙච සංඛාතධම්මාසෙ යෙ ච සෙඛා පුථූ ඉධ' කියා ඇත. ඉතිරි කරුණු කලින් සඳහන් කර ඇති පරිදිය.

**තණ්හක්ඛය ගාථා විස්තරය නිමි.**

# 36.

**සීහො වා** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? එක්තරා බරණැස රජෙකුට අයත් දුරින් පිහිටි උයනක් විය. ඔහු උදෑසනින්ම පිබිද උයනට යන අතරමගදී 'මුව දෝවනය කරමි'යි රියෙන් බැස වතුර ඇති තැනකට පැමිණියේය. ඒ පෙදෙසෙහිම සිංහ ධේනුවක් පැටවුන් හැරදමා ගොදුරු පිණිස ගියාය. රජුගේ මිනිසෙක් ඒ දැක 'දේවයන් වහන්ස, සිංහපැටවෙකි'යි සැළකළේය. රජු, සිංහයා කිසිවකට බිය නොවන බව විමසීමට බෙර ආදිය වාදනයට සැලැස්වීය. සිංහ පැටවා ඒ හඬ අසා එහිම නිදා සිටියේය. රජු තෙවරක්ම බෙර ආදිය වැයීමට සැලැස්වීය. සිංහ පැටවා තුන්වන වරට (ඒ හඬට) හිස එසවා මුළු පිරිස දෙස බලා පෙර පරිදිම නිදා ගත්තේය. එවිට රජු, 'සිංහ ධේනුව ඒමට කලින් යමු'යැයි පිටත්ව යන අතර, 'ඒ දවසෙහිම උපන් සිංහ පැටවාද තැති නොගනී. බිය නොවේ. කවදා නම් මමත් ආසාව, දෘෂ්ටි ගත් නොයෙක් හැඟීම්, මතවාද, බිය-තැතිගැනීම නසා, බිය නොවන්නෙක්ව සන්හුන්ව සිටින්නෙම්දැ'යි

සිතුවේය. ඔහු එම අරමුණ ගෙන ඉදිරියට යද්දී, ධීවරයන් මසුන් අල්ලා අතුවල බැඳ විසිදූල දිගහළ විට, වාතයෙහි නොගැටී (විහිදී) යන අයුරු දැක එයද නිමිතිකොට ගත්තේය. කවදා නම් මමත් ආසා-දෘෂ්ටිව ගත් හැඟීම් දූල හෝ මෝහ දූල ඉරා, මෙසේ නොගැටී යන්නෙම්දැයි සිතීය. ඊට පසු උයනට ගොස් පොකුණු තෙර ගල්තලාවෙහි හිඳිමින්, සුළඟින් (ඇලලුණු) නැමුණු නෙළුම්, ජලයෙහි තැවරී, සුළඟ පහවූ පසු නැවත පෙර පරිදි දියෙහි නොතැවරී තිබෙනු දැක, එයද නිමිති සේ ගෙන, 'කවදා නම් මමත් ජලයෙහි හටගත් නෙළුම් ජලයෙහි නොතැවරී ඇත්තා සේ, ලෝකයෙහි (උපන්) මම ලෝකය හා නොඇලී සිටිම්දැ'යි, සිතුවේය. ඔහු යළි යළිත්, සිංහයා, සුළඟ හා පියුම මෙන් තැති නොගෙන, නොගැටෙමින්, නොඇලෙමින් සිටිය යුතුයැයි සිතා රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට, මේ උදාන ගාථාව කීය.

එම ගාථාවෙහි **සීහො** සතරාකාර සිංහයෝ (වෙති) තණ සිංහයා, පඬු සිංහයා, කළු සිංහයා සහ කේසර සිංහයා යනුවෙනි. උන්ගෙන් කේසර සිංහයා උසස් යැයි කියනු ලැබේ. මෙහි අදහස් වන්නේ කේසර සිංහයාය. **වාතො** නැගෙනහිර දිසාවෙන් ආදී ලෙස නොයෙක් ආකාරය. **පදුමං** රතු සුදු ආදී පැහැයෙති. මේ පැහැ ඇති නෙළුම් මලක් අදහස් වේ. එහි යම් තැතිගැන්මක් තම සෙනහසින් හටගනීද, ඒ සෙනහසද තණ්හා ආලේපනයක් වේ. ඒ තණ්හාවෙහි අදහසක් ඇතිව හෝ නැතිව හෝ ලෝභයම බලපවත්නේය. එය ද තණ්හාවමය. විමසා නොබලා ඇලෙන ගතිය මෝහය ලෙස ඇතිවේ. මෝහයද අවිජ්ජා හෙවත් කරුණු ඇතිසැටියෙන් නොදැනීමය. එහිදී සමථ භාවනාවෙන් තණ්හාවද විදසුන් මගින් අවිජ්ජාද නැතිකරයි. එහෙයින් සමථ භාවනාවෙන් තමාට ඇති ආදරය හැර **සීහොව සද්දෙසු** අනිච්ච දුක්ඛ ආදියෙහිදී (තැති නොගනී) **අසන්තසන්තො** විදසුන් මගින් මෝහය හැර, **වාතොව ජාලම්හි** බන්ධ (රූප වේදනාදිය) හා ආයතන (ඇස්-කන්) ආදියෙහි **අසජ්ජමානො** සමථයෙහිදී ලෝභයත්, ලෝභය ඇති බැවින් සිදුවන දෘෂ්ටිව ගන්නා ලද දැකීම්-මතවාද හැරදමා, **පදුමංව තොයෙන** සියළුම සැප සම්පතට ඇති ආසාවේ නොගැලෙමින්, මෙහිලා සීලයෙහි පිහිටීම සමථයටත්, සමථ වැඩීම හිත එකඟ බවටත්, විදසුන් වැඩීම සියුම් නුවණටත් (පඤ්ඤා) හේතුවේ. මෙසේ කරුණු දෙකක් ඇතිකල (තවත්) කොටස් තුනක් සිදුවේ. එහි සීල සමූහයෙන් මනාව හික්මීම ලද්දේ වෙයි. ඔහු, හඬට තැති නොගන්නා සිංහයා සේ, තරහ හටගැනෙන කරුණුවලදී කෝපව තැති

නොගනී. නුවණින් සිත පිරිසිදු බවට - නිරවුල් බවට පත්කොට, වාතයට නොගැටෙන දැල මෙන් රූප වේදනා සමූහයෙහි නොගැටේ. (සබඳතාවක් නොපවතී) ජලයෙහි නොගැටෙන පියුමක් මෙන්, සමාධියෙන් රාගය ඉවත්කොට, රාගයෙහි නොඇලෙයි. මෙසේ සමථ-විදසුන් මගින් ඇතිවන, සීල, සමාධි, පඤ්ඤාවෙන් අවිජ්ජා ලෝභය හා අකුසල මුල් තුනම නැති කිරීමෙන් තැති නොගනිමින්, නොගැටෙමින්, නොඇලෙමින් (වාසය කරයි.) ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිය.

**අසන්තසන්ත ගාථා විස්තරය නිමි.**

# 37.

**සීහො යථා** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? එක්තරා බරණැස් රජෙක් මිනිසුන් කුපිත වීමෙන් දුර පළාතක ඇතිවූ කලබලකාරී බව සංසිඳවීමට ගම්නියම්ගම් පසුකොට යායුතු වූ නියම මග හැරදමා, කෙළින්ම කැලෑ පාරකින් මහත් සේනාව සමග යයි. ඒ අතර එක් පව්වක් පාමුල සිංහයෙක් ලහිරු රැස් විඳිමින් වැතිර සිටියේය. ඒ දැක රජුගේ සේවකයෙක් රජුට සැළ කළේය. රජු, 'සිංහයා හඬින් තැති නොගනී' යැයි බෙරවැයීම් - සක් පිඹීම් ආදියෙන් නාද පැවැත්වීය. සිංහයා එලෙසම වැතිර සිටියේය. දෙවනුවද එසේ නාද කරවීය. සිංහයාද එලෙසම සිටියේය. තෙවන වරද හඬ පැවැත්වීය. එවිට සිංහයාද 'මටද සතුරකු ඇතැ'යි (සිතා) පා සතරම මනාව පොළවට තබා නැගිට, සිංහ නාද කළේය. ඒ හඬ ඇසූ පමණින්ම ඇතුන් පිට සිටියෝ ඇතු පිටින් බැස තණ පඳුරු ආදියෙහි සැඟවුණහ. ඇත් අස් රංචු පිටින් ඒ ඒ දෙසට පලා ගියේය. රජුගේ ඇතා ද, රජු පිට මත හිඳුවාගෙනම කැලය දෙවනත් කරමින් පලාගියේය. රජුට ඉවසා දරාගත නොහැකිව, ගසක අත්තක එල්ලී බිමට පැන, එක් අඩිපාරකින් යන අතර පසේ බුදුවරුන් වසන තැනකට පැමිණියේය. 'හිමිවරුනි, හඬ ඇසුණේදැ'යි පසේ බුදුවරුන්ගෙන් රජු ඇසීය. 'එසේය, මහරජ' යැයි පිළිතුරු දුන්හ. 'ඒ හඬ කවරකුගේද?' මුලදී බෙර, සක්හඬත්, පසුව සිංහ නාදයත් ඇසුණි.' (උන්වහන්සේලා පැවසූහ.) 'හිමිවරුනි, භය වූයේ නැද්ද?' 'මහරජ, අපි කිසිම හඬකට බිය නොවෙමු',

'හිමිවරුනි, මටද එසේ විය නොහැකිද?' (රජු විමසීය) 'මහරජ, ඔබ පැවිදි වන්නෙහි නම් හැකිවන බව පැවසූ විට 'පැවිදි වෙමි'යි රජු කීය. රජු පැවිදිකරවා පෙර සඳහන් කළ පරිදි, උසස් සිල්පිලිවෙතෙහි පිහිටවූහ. උන්වහන්සේද (රජු) මුලදී දක්වා ඇති පරිදිම විදසුන් වඩා, පසේ බුදුබව අවබෝධ කොට මෙම උදාන ගාථාව කීහ.

ඉවසා දරා ගැනීමද, නැසීමද වේගයෙන් දුවන බැවින්ද **සීහො** නම් වේ. කේසර සිංහයා මෙහිදී අදහස් වේ. දත්වල සවිබල ඇත්තේ දාඨාබලී, මැඩපවත්වා-අබිබවා යන වචන දෙකම 'චාරී' වචනය සමග යෙදිය යුතුය. **පසය්හ චාරී, අභිභුය්‍ය චාරී** ලෙසිනි. හැසිරීමෙන් බලය යටකොට දැඩිව ගෙන සිටීම **පසය්හ චාරීය**. මැඩපවත්වා, තැතිගන්වා, වසඟ කොට හැසිරීම **අභිභුය්‍යචාරී** ය. මේ තැනැත්තා සිරුරේ සවිබලයෙන් දැඩි ගතියෙන් හැසිරෙයි. තෙද බලයෙන් (අන් තැනැත්තන්) මැඩ පවත්වාගෙන සිටී. මෙහිදී යම් කිසිවකු විසින් 'බලයෙන් මැඩ පවත්වා හැසිරෙන්නේ කුමක්ද'යි කියනු ඇත. එහිදී **මිගානං** ආධාර විබත් අරුතෙහි ද්‍රිතියා විබත් යොදා 'මිගෙ පසය්හ **අභිභුය්‍යචාරී** යනුවෙන් නැවත කිවයුතුය. **පන්තානි දූරින්** - **සෙනාසනානි** වාසය කරන, සිටින තැන් ගැනේ. ඉතිරි කරුණු කලින් කියන ලද අයුරින් දැනගැනීමට හැකි බැවින් විස්තර නොකරන ලදී.

දාඨාබලී ගාථා විස්තරය නිමි.

## 38.

**මෙත්තං උපෙක්ඛං** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? එක්තරා රජෙක් මෙත් ආදි කොට ඇති දැහැන ලැබීය. ඔහු 'රජකම දැහැන් සුවයට අනතුරකැ'යි සිතා එය රැකගනු පිණිස රජකම හැර පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට මේ උදාන ගාථාව කීය.

සියළුම ජීවිහු සැපවත් වෙත්වා'යි හිතසුවයට පත්වනු දැකීම **මෙත්තා** වේ. 'අනේ, මේ දුක්වලින් මිදෙන්නේ නම් මැනවැ'යි අහිත වූ දුකට

පත්වනු නොදක්ම කරුණා වේ. මේ පින්වත් සියල්ලෝම හිතසුවයට පත්වීමෙන් සතුටු වෙති. එය ඉතා යහපත් යැයි සිතීම මුදිතා වේ. තමන් කරන කියන දෙයින් හැඟෙයි. පෙනෙන්නේ යැයි සැප දුකෙහි මැදිහත්ව සිටීම උපෙක්ඛා වේ. ගාථාව සකස් වීමෙහි පහසුව සළකා, අනුපිළිවෙල හැර මෙත ගැන කියා, උපෙක්ඛාවද පසුව මුදිතාවද සඳහන් කරන ලදී. විමුත්ති යනු තමා කෙරෙහි වූ නුසුදුසු කරුණු සතරින් මිදුණු බවයි. **මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං ආසෙවමානො මුදිතඤ්ච කාලෙ** යැයි එහෙයින් කියන ලදී. එහි ආසෙවමානො මෙත්, කරුණා, උපෙක්ඛා තෙවැනි, සතරවැනි දැහැන් ලෙස වඩමින්, උපෙක්ඛාව සිවුවැනි දැහැන ලෙස වැඩීම කියන ලදී. **කාලෙ** යනු මෙත ඇසුරුකොට, එයින් ඉදිරියට මුදිතාවත්, ඉන් එහා කරුණු ලෙස පීතිය රහිත දැහැනින් ඇත්ව උපෙක්ඛාව ඇසුරු කරමින් (ඊට සමවැද සිටීමෙන්) පසුවන කාලය ආසෙවමාන යැයි කියනු ලැබේ. (නොඑසේ නම්) එසේ සිටීමට පහසු වේලාවයි. **සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො** දස දිසාවෙහිම ජීවත්වන සියළුම ලෝකවාසීන් කෙරෙහි තරහ නොවී, මෙත් ආදී (ගුණ) වඩන ලද බැවින් ජීවත්වන්නෝ (ඔහුට) පිළිකුල් නොවෙති. සියළු ජීවීන් කෙරෙහි තරහක්-නොකැමති බවක් දිගින් දිගටම බැඳී ඇති තරහද සංසිඳේ. **සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො** යැයි එහෙයින් කියන ලදී. මේ එහි කෙටි සඳහනයි. මෙත ආදී විස්තර ගැන අත්‍ථසාලිනී ධම්මසංගණී අටුවාවෙහි දක්වා ඇත. ඉතිරි සියළු කරුණු මෙහි කලින් කියා ඇති පරිදිය.

**අප්පමඤ්ඤාගාථා විස්තරය නිමි.**

## 39.

**රාගඤ්ච දොසඤ්ච** ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? සියළුම පසේ බුදුවරුන් අතර මාතංග නම් වූ පසේ බුදුන් වහන්සේ රජගහ නුවර ඇසුරු කොට වැඩ වසති. ඉක්බිති අපගේ බෝසතුන් වහන්සේ උපන් කල්හී, දේවතාවෝ බෝසතුන්ට පුද පූජා කිරීමට පැමිණෙන අතර, මාතංග පසේ බුදුන් දැක, 'නිදුකාණනි, නිදුකාණනි, 'බුදුවරයකු ලොව උපන්' බව පැවසූහ. නිරෝධ සමවතින් නැගී, ඒ හඬ අසා තමාගේ ජීවිතයද, අවසානය

දැක, හිමාලයෙහි 'මහා බෑවුම' නම් පව්වෙහි පසේ බුදුවරුන් පිරිනිවන්පානා තැනට අහසින් වැඩමකොට, පෙර පිරිනිවි පසේ බුදුවරුන්ගේ ඇටසැකිලි පහළට දමා ගල්තලාවෙහි හිඳ මෙම උදාන ගාථාව කීහ.

එම ගාථාවෙහි **රාගදොසමොහා** උරග සූත්‍ර විස්තරයෙහිදී සඳහන් කර ඇත. **සඤ්ඤොජනා** දස සංයෝජනය. ඒවා ඒ ඒ මගපලයෙන් **සන්දාලයිත්වා අසනතසං ජීවිතසංඛයමහි** ජීවිත සංඛය යනු චුති සිතෙහි බිඳී යාමයි. තවදුරටත් (සසර) ජීවිත පැවැත්ම නැතිකරන ලද බැවින්, තැති නොගනී. මෙපමණකින් සොපාදිසෙස නිවනට තමා (පැමිණි බව) දක්වා ගාථාව අවසන් වත්ම නැවත සසර නූපදනා ලෙසින් පිරිනිවන්පෑසේක.

**ජීවිත සංඛය ගාථා විස්තරය නිමි.**

## 40.

**භජනති** යන ගාථාවට හේතු වූ කරුණ කුමක්ද? කලින් ගාථාවකට අදාලව කියන ලද පරිදිම, බරණැස එක්තරා රජෙක් යසඉසුරින් පිරුණු එක් පෙදෙසක් පාලනය කරයි. ඔහුට දරුණු ආබාධයක් වැළඳුණේය. බොහෝ දුක් වේදනා ගෙන දුනි. කාන්තාවෝ විසිදහසක් පිරිවරා අත්පා මිරිකීම් ආදිය කරති. ඇමතිවරු 'දැන් නම් රජු ජීවත් නොවන්නේය. අපි අපට පිහිටක් සොයමු' යැයි සිතා වෙනත් රජකු වෙත ගොස් සේවය කිරීමට අවසර ඉල්ලූහ. ඔවුහු ඒ රජුට උවටැන් සේවා කළද කිසිවක් නොලබති. සුවපත් වූ රජුද 'මේ නම් ඇති තැනැත්තා කොහිද? මේ නම් ඇති තැනැත්තා කොහිද'යි' විමසීය. එවිට ඒ තොරතුරු ඇසූ (රජු) හිස සලා නිහඬ විය. කිසිවක් නොලබන, (ධනයෙන්) පිරිහීමට පත් ඒ ඇමතිවරුද රජු සුව වූ බව අසා නැවත අවුත් රුට වැඳ එකත්පසක සිටියහ. එවිට රජු 'දරුවනි, ඔබලා කොහි ගියෙහුද'යි ඇසූවිට 'අපි දේවයන් වහන්සේගේ දුබලතාව දැක, ජීවත්වීමට නොහැකිවේය යන බියෙන් අසවල් ජනපදයට ගියෙමු'යි කීහ. රජු හිස සලා 'මොවුන් නැවත මෙසේ කරන්නේද'යි විමසන්නෙම් නම් මැනවැ'යි සිතුවේය. රජු පෙර මෙන් රෝගී බව අඟවා දැඩි වේදනාවක් පෙන්වමින් ගිලන් බවම දැක්වීය.

කාන්තාවෝ පිරිවර (අවුත්) සියළු දේම පෙර පරිදිම කළහ. ඒ ඇමතිවරු ද, එසේම බොහෝ ජනයාද කැටුව ඉවත්ව ගියහ. රජු තෙවරක්ම රෝගී බව පෙන්වීය. ඇමතිවරුද නැවත පැමිණ ආපසු ගියහ. සිවුවන වරටද ඇමතිවරුන් පැමිණෙනු දැක, 'අනේ මොහු අපහසු දෙයක් කළහ. මා ගිලන් බව දැන බලාපොරොත්තු හැර, මගෙන් ඈත්ව ගියහ'යි කලකිරී රජකම ඉවත ලා පැවිදිව විදසුන් වඩා පසේ බුදුබව අවබෝධ කොට මෙම උදාන ගාථාව කීය.

එම ගාථාවෙහි **භජන්ති** සිරුරෙන් ඇලෙති, ඇසුරු කරති. **සෙවන්ති** ඇඳිලි බැඳ වැඳීම් ආදියෙන් යටහත් පැවතුම් ඇතිව, ගරුකරමින් හැසිරෙති. කරුණක් ඇත්තේ **කරණත්‍ථා** නම් වේ. සබඳතා පැවැත්වීමෙන්, ඇසුරු කිරීමෙන් වෙනත් හේතුවක් නැත. එහි තේරුම නම්, තමන්ට ඇතිවන උපකාර (වාසි) සළකා ඇසුරු කරති'යි කී අයුරුයි. **නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තා** මෙයින් කිසිවක් ලබමු'යි මෙසේ වාසි, ලාභ හේතුවෙන් නිකරුණේ ඇසුරු නොකෙරේ. හුදෙක්ම 'උපකාරක නම් මිතුරෙකු වෙත්ද, සැප දුකෙහි එක්වන යහළුවෙකු වෙත්ද, දියුණුව කැමති යහළුවෙකු වෙත්ද, අනුකම්පා සහගත යහළුවකු වෙත්ද කියා ඇති පරිදි (නියම) මිතුරු බවින් යුතු යහළුවෝ අද දුලබ වෙති. තමන්ට ඇති නුවණින් වටහාගෙන තමන්ම (සසඳා) බලති. වෙනත් අයුරකින් නොවේ. **අත්තට්ඨ පඤ්ඤා, දිට්ඨට්ඨ පඤ්ඤා** යන මෙයද පැරණි සඳහනකි. ලාභයක් ඇතිවිට, එය දැන කටයුතු කිරීම මොවුන්ගේ නුවණයි. ඉදිරියට මොවුන් ගැන බලාපොරොත්තු නොවන බව කියන ලදී. **අසුචි** යනු අපිරිසිදු, ලාමක වූ, කය, වචන, මනසින් යුතුව, කටයුතු කරන්නෝය. ඉතිරි කරුණු කලින් සඳහන්ව ඇති පරිදි දතයුතුය.

**කාරණත්‍ථගාථා විස්තරය අවසානය.**

**ගාථා එකොළහකින් යුතු (ඛග්ගවිසාණ සූත්‍ර හතරවන කොටස නිමි.)**

මෙසේ ගාථා හතළිස් එකක් වූ ඛග්ගවිසාණ සූත්‍රය, කියන ලද ආකාරයට වචනවල අරුත් වටහා ගනිමින්, සියල්ල සුදුසු පරිදි යොදාගෙන, ගලපා තේරුම් ගත යුතුය. විස්තරය ඉතා දිගුවේයැයි බියෙන් අප විසින් හැම කරුණක්ම වැඩි විස්තර නොදක්වන ලදී.

**ඛග්ගවිසාණ සූත්‍ර විස්තරය නිමි.**

# 1.4

එවං මෙ සුතං යනු කසීභාරද්වාජ සූත්‍රයයි. එයට හේතුවූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ මගධයෙහි දකුණුගිරි පෙදෙසෙහි ඒකනාලා නම් බමුණු ගමෙහි (වැඩ වසද්දී) පෙර බත්කිස හා පසුබත්කිස යන බුදුරදුන්ගේ වැඩපිළිවෙල අතුරින්, පසුබත්කිස අවසානයෙහි, බුදුඇසින් ලොව බලනවිට භාරද්වාජ පෙළපතට අයත් කසී නම් බමුණා අරහත් ඵල ලැබීමට නුවණ මුහුකුරා ඇතැයි දැන 'එහි මා ගිය කල, සංවාදයක් පවත්නේය, ඒ කතාව අවසානයෙහි දහම් දෙසුම අසා ඒ බමුණා පැවිදිව රහත් බවට පත්වන්නේ යැයි' එහි ගොස් කතාබහ කොට මෙම සූත්‍රය වදාළහ.

බුදුවරුන්ගේ පෙරබත් කිස කවරේද? පසුබත්කිස කවරේද? එය මෙසේ විස්තර කරනු ලැබේ. භගවත් බුදුරජාණන් වහන්සේ උදෑසනම පිබිද, උවටැන් කරන්නවුන්ට උපකාර පිණිසද, සිරුරට පහසුව පිණිසද, මුව සේදීම් ආදී සිරුරු කටයුතු කොට, පිඬු පිණිස කාලය එළඹෙන තෙක් විවේකීව අසුනක හිඳ සුදුසු කාලයෙහි (අඳනය) හැඳ පටිය බැඳ සිවුරු පොරවා පාත්‍රය ගෙන, ඇතැම්විටක තනිවමද, තවත් විටක භික්සඟන පිරිවරා ද වරෙක නොයෙක් පෙළහර සිදුවෙමින් පවත්නා අතරද, වරෙක එවන් වෙසෙස් බවක් නොමැතිවද ගමකට හෝ නියම්ගමකට හෝ පිවිසෙති. ඒ තතු කෙසේද යත්, ලොවට පිහිටවන බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස වඩිනාවිට මුදු සුළං ඉදිරියෙන් ඉදිරියෙන් හමමින් බිම පිරිසිදු කරයි. වළාකුළු දිය මුදාහරිමින් මගෙහි දූවිලි ඉවත්කොට (අහසෙහි) මුදුන්හි වියනක් සේ පැතිර සිටී. සුළඟට පාවී එන මල් මගෙහි විසිරෙයි. බිම උස්ව පිහිටි තැන් පහත් වේ. වලගොඩැලි තැන් උඩට මතුව සම වෙයි. පා තබනවිට බිම සමව පිහිටයි. සුව පහස දෙමින් පියුම් හෝ මතුව පා පිළිගනී. එළිපත්ත අතරෙහි දකුණු පා තැබූ විට සිරුරෙන් සවණක් රැස් නික්ම, මැදුරු, කුළුගෙවල් රන්වන් රත්පැහැ මුසු ගුලාවක් කරමින්, එහා මෙහා දිවෙයි. ඇත් අස් කුරුළු ආදීහු තමන් තමන් සිටි තැන්වලම සිටි මිහිරි ලෙස නාද කරති. එසේම බෙර වීණා ආදී වාදන භාණ්ඩද මිනිසුන් පැළඳි අබරණ ද නද දෙයි. ඒ සළකුණින් මිනිස්සු 'අද බුදුරදුන් මෙහි පිඬු පිණිස වැඩිසේකැ'යි දැනගනිති. ඔවුහු මැනවින් ඇඳුම් හැඳ-පෙරව සුවඳ මල් ආදිය ගෙන, නිවෙස්වලින් නික්ම,

අතුරු වීදියට පිවිස, සුවඳ මලින් බුදුන්වහන්සේ ගරු බුහුමනින් පුදා, වැඳ 'හිමියනි, අපට දසනමක්, අපට විසිනමක්, අපට සියක් නමක් ලබාදෙනු මැනව'යි ඉල්ලා, බුදුරදුන්ගේ පාත්‍රය ද ගෙන, ආසන පනවා මනාව ආහාර පිළිගන්වති. භාග්‍යවතුන් වහන්සේ වළඳා අවසන, සිත්සතන් බලා දහම් දෙසති. එවිට ඇතමෙක් තෙරුවන් සරණ යති, ඇතමෙක් පන්සිල්හි පිහිටති. ඇතමෙක් සෝවාන්, සකදාගාමි, අනාගාමි ඵල අතරින් එක් ඵලයකට පත්වෙති. ඇතමෙක් තෙරුවන් සරණ යති, ඇතමෙක් පන්සිල්හි පිහිටති, ඇතමෙක් සෝවාන්, සකදාගාමි, අනාගාමි ඵල අතරින් එක් ඵලයකට පත්වෙති. ඇතමෙක් පැවිදිව උසස්ම පලය වූ අරහත් බව ලබති. මෙසේ ඒ ඒ අයුරින් ජනතාවට උපකාරකොට, අසුනින් නැගිට විහාරයට වඩිති. අනෙක් හිමිවරුන් වළඳා අවසන් වනතුරු එහි රවුම් හැඩයට තනා ඇති සාලාවෙහි පනවා ඇති උතුම් බුදු අසුනෙහි වැඩ හිඳිති. හිමිවරුන් වළඳා අවසන් බව උවටැන් කරනු ලබන හිමියෝ උන්වහන්සේට දන්වති. එවිට උන්වහන්සේ සුවඳ කුටියට පිවිසෙති. මේ පෙර බත් කිසයි. මෙහි සඳහන් නොකරන ලද කරුණු බ්‍රහ්මායු සූත්‍රයෙහි දක්වා ඇති අයුරින් දතයුතුය.

මෙසේ පෙරබත් කිස අවසන් වූ පසු භාග්‍යවතුන් වහන්සේ සුවඳ කුටියෙහි උවටැන් කරන තැන්හි හිඳ පා සෝදා පා පුටුවෙහි තබා පැවිදි පිරිස අමතා, 'මහණෙනි, නොපමාවම සාසන කටයුතුවල නියැලෙවු. බුදුකෙනෙකුගේ පහළවීම, මිනිසත් බව (යහපත් දෙයකට) සුදුසු මොහොත පැවිදි බව, සදහම් ඇසීම ලොවෙහි දුලබයැයි අවවාද කරති. එහිදී හිමිවරු භාග්‍යවතුන් වහන්සේට වැඳ කමටහන් විමසති. එවිට භාග්‍යවතුන් වහන්සේ සුදුසු පරිදි කමටහන් දෙති. උන්වහන්සේලා කමටහන් ඉගෙන, බුදුහිමිට වැඳ තම තමන් වසන තැන්වලට යති. ඇතැම් හිමිවරු කැලයටද, ඇතැම්හු රුක්මුල් කරාද, ඇතැම්හු ගිරිගුහා වෙතද, ඇතැම්හු චාතුම්මහා රාජිකයටද, වසවත් භවනටද යති. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ, කැමති සේක්නම්, මැනවින් සිහිය පිහිටුවාගෙන, දකුණු පසට හැරී සිංහයකුගේ විලාසයෙන් මොහොතක් සැතපෙති. ඉක්බිති සිරුර සනහා පිබිද දෙවන වර ලොව බලති. (මෙම කාලයෙහි) තෙවන කොටසෙහිදී, බුදුහිමි (එවකට) වැඩවසන ගමෙහි හෝ නියම්ගමෙහි හෝ ගම්වාසීහු පෙර බත් කාලයෙහි දානය දී මනාව හැඳ පෙරව, සුවඳමල් ආදිය රැගෙන විහාරයට රැස් වෙති. එහිදී භාග්‍යවතුන් වහන්සේ පැමිණි පිරිසට අනුරූප වන අයුරු පෙළහරින් ගොස් දම්සභාවෙහි පනවන ලද උතුම් අසුනෙහි වැඩහිඳ

කාලවේලාවට සීමාවන පරිදි දහම් දෙසති. සුදුසු කල් දන පිරිස කුසල් දහම්හි යොදවති. ඉක්බිතිව සිරුර දියෙන් සිහිල් කරනු කැමැත්තේ නම්, අසුනින් නැගිට, උවටැන් කාරක හිමියන් විසින් පිළියෙල කරන ලද තැනට ගොස්, උවටැන් කාරක හිමි අතින් දිය සළුව ගෙන, නාන කොටුවට පිවිසෙති. උවටැන් කාරක හිමි ද බුදුඅසුන ගෙනැවිත් සුවඳ කුටියෙහි ආලින්දයෙහි තබයි. භාග්‍යවතුන් වහන්සේ ගත සිහිල්කොට, රත්පැහැ දෙපට සිවුර පොරවා, පටිය බැඳ තනිපට සිවුර සකසාගෙන, එහි අවුත් මොහොතක් තනිවම විවේකීව හිඳිති. එවිට හිමිවරු ඒ ඒ තැන් සිට පැමිණ භාග්‍යවතුන් වහන්සේට උවටැන් පිණිස කටයුතු කරති. ඇතැම් හිමිවරු පැණ විචාරති. කමටහන් අසති. දහම් දෙසන ලෙස ඉල්ලති. උන්වහන්සේ ඒ හිමිවරුන්ගේ අදහස් ඉටුකරමින් (රැයේ) මුල් කොටස ගතකරති. මැදියමෙහි සියළු දසදහසක් සක්වළ දේවතාවෝ අවසර ලැබ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පැන විචාරති. යටත් පිරිසෙයින් තම සිතැඟි පරිදි අතුරු (වචන) හතරක් හෝ (කතාබහ කරති) බුදුහු ඒ දේවතාවුන්ගේ පැන විසඳමින් මැදියම ගතකරති. අවසාන යාමට කොටස් සතරකට බෙදාගෙන, එක් කොටසක් සක්මනෙහි යෙදෙති. දෙවැනි කොටසලෙස, සුවඳ කුටියට පිවිස, සිහිනුවණින් යෙදී දකුණු පසට හැරී, සිංහයකුගේ විලාසයෙන් සැතපෙති. තෙවන කොටස ඵල සමවතින් ගතකරති. සිවුවන කොටස තුල (අළුයම) මහා කරුණා සමවතට පිවිස, කෙලෙස් අඩු, කෙලෙස්බරව ජීවත් වන්නන් දකීම පිණිස බුදුඇසින් ලොව බලා වදාරති. මේ පසුබත් කිසය.

මෙසේ පසුබත් කිසෙහි සිවුවන කොටස අවසන ලොව බලනසේක්, තෙරුවනෙහි පිහිටා දන් සිල් භාවනාදියෙහි බෙහෙවින් හෝ අල්පව හෝ නියැලෙන හා (දහම් දකීමට) හේතු සම්පත් ඇති හෝ නැති හෝ සත්වග දකීමට බුදුඇස යොමු කරද්දී කසීභාරද්වාජ බමුණාට රහත්ඵල ලැබීමේ වාසනාව දක, 'මා ගියකල කතා සංවාදයක් ඇති වන්නේය. එය අවසානයෙහි දහම් අසා ඒ බමුණු පැවිදිව රහත් බවට පත්වන්නේ යැයි දන, එහි ගොස් කතා සල්ලාපය අරඹා මෙම සූත්‍රය දෙසූහ.

එහි **එවමෙමසුතං** යනු පළමු මහා සංගීතියෙහිදී දහම් සංගායනාව මෙහෙයවන ගරු කටයුතු මහා කසුප් තෙරුන්වහන්සේ විසින් විචාරන ලදුව, ගරුකටයුතු ආනන්ද තෙරුන් වහන්සේ විසින් පවසන ලදී. **අහං ඛො සමණ, කසාමි ච වපාමි ච** යැයි කසීභාරද්වාජ විසින් ද **අහමපි ඛො**

**බ්‍රාහමණ, කසාමි ච** යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ ද පවසන ලදී. ඒ සියල්ල එක්කොට කසීභාරද්වාජ සූත්‍රය යැයි කියනු ලැබේ.

**එවං** යනු ආකාරය, නිදසුන හා දැඩි උවමනාවෙන් පැවසීමේ දී යෙදී ඇත. ආකාරය යන්නෙන් එහි ඒ කාරණය පෙන්වයි. නොයෙක් නොයෙක් ලෙසට අදහස් ඉදිරිපත් කරමින්, ඒ ඒ අසන්නන්ගේ සිත් හසර දැන, ඔවුන්ට ගැළපෙන සේ වෙන් වෙන් පිළිවෙළින් යුතුව, පිළිවෙත් මග සහිත ගැඹුරු දහම් කරුණු තම තමන්ගේ බස්වහර අනුව වටහාගත හැකි පරිදි වූ ඒ භගවත් බුදුරදුන්ගේ වචනය මුළුමනින්ම හඳුන්වා දීමට කවුරු සමත් වේද? එහිදී 'මා මෙසේ අසන ලද්දේය, යනු 'ම විසින්ද (ආනන්ද තෙරුන්) එක් ආකාරයකට අසා ඇතැ'යි අදහස් වේ. නිදසුනක් ලෙස 'මම සියල්ල දන්නා කෙනෙක් නොවෙමි, මෙය මා විසින් (මාගේ නුවණින්) අවබෝධ නොකරන ලද දෙයකැයි (තමන් වෙත එන චෝදනා ඇතොත්) තමන් (ආනන්ද තෙරුන්) නිදහස් වෙමින් එවං මෙ සුතං මා විසින් මෙසේ අසන ලදැයි දැන් කිවයුතු යැයි මුළු සූත්‍රයම පෙන්වා දෙයි. වෙන්ව, පැහැදිලි කොට කිවහොත්, 'මහණෙනි, මගේ පැවිදි සව්වන් අතර, ආනන්ද හිමි, බොහෝ (දහම් කරුණු) අසා, ඒ අනුව ජීවිතය සකසාගත් යහපත් පැවතුම් ඇති, මනා සිහි නුවණින් යුතු, උවටැන් කරන්නන්ගෙන් මුල්තැන ගනිති. 'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං ආනන්දො, ගතිමන්තානං, සතිමන්තානං, ධිතිමන්තානං, උපට්ඨාකානං යදිදං ආනන්දො' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේගෙන් පැසසුම් ලැබ, ඇසූ කරුණු සිත දරාගැනීමේ තම හැකියාව පෙන්වමින් මෙය මා අසා ඇති පරිදි යැයි ජනතාවට (ඒ දහම් කරුණු) ඇසීමට කැමැත්ත ඇති කරයි. එයද අරුතින් හෝ පද යෙදීම් ලෙසින් හෝ අඩුවීමක්, වැඩිවීමක් නොමැතිව ඒ ආකාරයෙන්ම මිස වෙනසක් නොවන ලෙස බව දතයුතුය.

**මෙ සුතං** යනු මෙහි මා විසින් තේරුමයි. කණ නමැති දොරෙන් (හඬ) හඳුනා ගැනීමේ අරුතින් අසන ලදී. එහෙයින් **එවං මෙ සුතං** යනු මා විසින් මෙසේ කණින් හඳුනා ගැනීමට මුල්තැන දී සැළකීම යැයි කියන ලදී. **එකං සමයං** එක් කාලයක, **භගවා** (සිවුසස් අවබෝධයෙන්) උසස් බවට පත්, කෙලෙස් සිඳ බිඳ දැමූ, උසස් ගුණ දහමින් යුතු බව කියන ලදී. **මගධෙසු විහරති** මගධ නම් ජනපදයෙහි රජකුමරුවෝ, ඔවුන් වාසය කරන බවද සළකා එකම නමින්ම 'මගධා' යැයි කියනු

ලැබේ. එම මගධ ජනපදයෙහි (යන අදහසයි) චේතිය රජු බොරුවක් කියා (අහසින්) බිමට වැටෙන විට 'ගැඹුරු වළකට වැටෙන්නට එපා'යයි (මා ගධං පවිස) කියන ලද බැවින්, 'මගධ' නම් වූ බව ඇතමෙක් (අදහස් කරති) මග කෙළවර බිම සාරමින් සිටි මිනිසුන් ඒ රජුට 'වළක් සකසන්නට එපා' යැයි (මා ගධං කරොථ) කියා ඇති බැවින් (මගධ නම් වී යැයි ද අදහසකි.) කැමති අයුරින් එය පිළිගත යුතුය. **විහරති**, එක් ඉරියව්වකින් වන අපහසුතාව වෙනත් ඉරියව්වකින් වළක්වා බිඳ නොවැටෙන පරිදි ජීවිතය පවත්වාගැනීම කියන ලදී. දෙව්, බඹ, රහතුන්ගේ විහරණයෙන් හෝ ජීවීන් කෙරෙහි නොයෙක් අයුරින් හිතසුව සලසන බැවින් ද **විහරති** නම් වේ. ගෙනයයි, උවමනාවෙන් ගෙනයයි, පමුණුවනු ලබයි, බිහිකරයි, උපදවයි යනුවෙන් ද කියන ලද්දේ වෙයි. යම්විටක මිනිසුන් සිය කැමැත්ත වැරදි ලෙස හසුරුවත්ද, එවිට භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අලෝභ ආදී නිදොස් වූ කුසල් වැඩෙනු පිණිස 'මේ පිළිවෙත දැක එහි ඇල්ම උපදවා කාමයෙහි නොගැලෙන්නාහ'යි දෙව් විහරණයෙන් වෙසෙති. යම්විටක සත්වග සැප සම්පතෙහි වැරදි මගට පත්වනවිට ඔවුන්ගේ අදෝස කුසල් මුල් උපදවනු පිණිස, 'මේ පිළිවෙත දැක එහි කැමැත්ත උපදවා අදෝසයෙන් දෝසය දුරු කරන්නාහු නම්, මැනවයි බඹ විහරණයෙන් වෙසෙති. යම්විටක පැවිදි වූවන් දහම් විනය කරුණු ගැන විවාද කරත්ද, ඔවුන්ගේ අමෝහ කුසල් මුල් උපදවනු පිණිස 'මේ පිළිවෙත දැක එහි කැමැත්ත උපදවා මුළා නොවීමෙන් මුළාව නැති කරන්නාහු නම් මැනවැ'යි අරිය විහරණයෙන් (බුදු පසේබුදු මහරහත් උතුම් මග අනුව) වෙසෙති. ඉරියාපථ විහරණයෙන් හෙවත්, සිහි නුවණින් ඉරියව් පැවැත්වීම (සොපදිසෙස) පිරිනිවනින් හැර වෙන කිසිවිටකත් අත් නොහරිති. මේ එහි කෙටියෙන් සඳහන් කිරීමයි. වැඩි විස්තර මංගල සූත්‍ර විස්තරයෙහි කියමු. **දක්ඛිණගිරිස්මිං** රජගහනුවර වටා පිහිටා ඇති පව්වෙහි, එයට දකුණුපසින් වූ ජනපදය දක්ඛිණගිරි හෝ දක්ඛිණාගිරි යැයි කියනු ලැබේ. එම නම ඇති ජනපදය, එහි විහාර ආදියද ඒ නමින්ම වේ. **ඒකනාලායං බ්‍රාහ්මණගාමෙ**, ඒකනාලා යනු ඒ ගමෙහි නමය. බොහෝ බමුණෝ එහි වාසය කරති. බමුණෝ ආදායම් ලබමින් එහිම වෙසෙති. එහෙයින් බමුණු ගම යැයිද කියනු ලබයි. **තෙන ඛො පන සමයෙන** යම් කලක භාග්‍යවතුන් වහන්සේ නොපරදින පලඟ හිඳ උතුම් වූ සම්මා සම්බුදු බව මැනවින් අවබෝධ කොට, උතුම් දම්සක් පවත්වා මගධ රට ඒකනාලා නම් බමුණු ගමෙහි දකුණු ගිරි මහ වෙහෙරෙහි, (**කසීභාරද්වාජ**) බමුණාගේ ඉඳුරන් මේරූ බවට (දහම් අවබෝධයට සුදුසු) පරිදි මනස

සැකසෙන තුරු) පත්වන අයුරු සළකමින් වැඩවසති. ඒ කාලය සළකා කරණ විබතින් සඳහන් කර ඇත. **ඛො පන** නිපාත දෙක පද පූරණයෙහිලා යොදා ඇතැයි දතයුතුය. **කසීභාරද්වාජ බ්‍රහමණසස** ඒ බමුණා කුඹුරු ගොවිතැනින් ජීවත් වෙයි. භාරද්වාජො ඔහුගේ පෙළපත බැවින් එසේ කියයි. **පඤචමතතානි** යම්සේ ආහාරයෙහි (තමන්ට සෑහෙන) පමණ දැනගැනීම (භොජනෙ මතතඤඤු) මෙන් මෙහි මතත ගණන දැක්වීමට යෙදෙයි. මෙහිද එසේ යෙදුණු අයුරින් පහක් පමණි. ඒ අනුව නො අඩුවද, නොවැඩිවද නගුල් පන්සියයක් පමණ යැයි කියන ලද්දේය. **පයුතතානි** යොදන ලද, ගොනුන් (නගුලට සසම්බන්ධ වන සේ) කදෙහි තබා වියදඬුවෙහි රැහැනින් බඳින ලද යන තේරුමයි. **වපපකාලෙ** වපුරන කාලය - බීජ (කෙතෙහි) ඉසීම ගැන කියන ලදී. එහි මඩෙහි වැපිරීම සහ පසෙහි (ගොඩ) වැපිරීම යැයි දෙකොටසකි. මෙහි පසෙහි වැපිරීම අදහස් වේ. එහිද මුල් දිනයෙහි මංගල වැපිරීමය. එයට යොදා ගන්නා උපකරණ මේවාය. ගොනුන් තුන්දහසක මෙහෙයුමකි. සියළුම ගොනුන්ගේ අංවල රනින් කළ (කොපු, මුදු) අබරණ පළඳා ඇත. කුර රිදියෙන් සරසා ඇත. සුදුමලින් සරසා, සියළු සුවඳ ජාති වලින් පසැඟිලි ලකුණු තැවරූ, අලංකාර කරන ලද පිරිපුන් අඟපසඟින් යුතු වෙති. ඇතැම් ගොන්නු අඳුන් මෙන් කළු පැහැ වෙති. ඇතැම් ගොන්නු වළාකුළු මෙන් සුදුපැහැ වෙති. පබළුවන් රත්පැහැ ගොන්නුද සිටිති. ඇතැම් ගොන්නු පළිඟු මෙන් නොයෙක් පැහැ වෙති. ගොවිතැනෙහි නියුතු පන්සියයක් මිනිස්සු හැමදෙනාම අළුත් සුදුවතින් සැරසී, මලින් හැඩව, හිසෙහි දකුණුපස තබන ලද මල්කළඹින් හා සිරුරෙහි අඩක රත්සිරියල්, රන් සිරියල් ලකුණින් බබලමින්, නඟුල් දහය දහය බැගින් ගෙන එක් එක් සමූහයක් සේ යති. නගුල්වල මුදුනද, වියදඬුව හා කෙවිටිද රනින් වෙළා ඇත. මුල් නගුල ගොනුන් අටදෙනෙකුගෙන් යුතුය. අනික් නගුල්වල ගොනුන් සිවුදෙනා බැගිනි. ඉතිරි ගොනුන් වෙහෙසට පත්වන ගොනුන් වෙනුවටද, කොටස් කොටස් ලෙස යෙදවීමටද ගෙන එන ලදහ. එක් එක් සමූහයකට එක් එක් බිත්තර වී කරත්තයකි. එක් සමූහයක් සී සායි. එක් සමූහයක් වපුරයි. බමුණාද කලින්ම රැවුල සකසවාගෙන, දිය නා සුවඳ ගත තවරා, පන්සියයක් අගනා වත් හැඳ, දහසක් අගනා සළුවක් එක් පසකින් පොරවාගෙන, එක් එක් ඇඟිල්ලක මුදු දෙක බැගින්, ඇඟිලිවල මුදු විස්සක්ද, කන්පෙතිවල සිහ කොඩොල් අබරණද හිස අගනා වෙළුමක් දරා, රන් මාලයක් ගෙල පැළඳ, බමුණු පිරිස පිරිවරා සී සෑමේ කටයුතු පිරික්සා බලයි. මේ අතර, ඔහුගේ බැමිණියද සුවඳ පැනින් නා සියළු

අබරණ පැළඳ, බැමිණි පිරිස පිරිවරා, නොයෙක් සිය ගණන් බඳුන්වල කිරිබත් පිසවා, ලොකු කරත්තවල පුරවා සීසානා තැනට ගියාය. ඔහුගේ නිවස ද සියළුම සුවඳින් සුවඳවත් කොට ඇත. මනාව මලින් සරසන ලද්දේය. කුඹුරෙහි ද ඒ ඒ තැන්වල කොඩි ඔසවන ලද්දේය. පිරිවර කම්කරුවන් සහ සී සෑමෙහි යෙදුනු පිරිස දෙදහස් පන්සියයකි. සියල්ලෝම අළුත් ඇඳුම් හැඳ සිටියහ. හැමදෙනාටම කිරිබත් පිළියෙල කරන ලදී. බමුණා තමා අනුභව කරන තැන හිඳ රන් තලිය සෝදවා කිරිබතින් පුරවා ගිතෙල් මීපැණි ආදියෙන් මුසුව පිළියෙල කොට නල් යෙදවීමට අදාල පූජාවිධි කටයුතු කරවීය. රන්, රිදී, ලෝකඩ, තඹ බඳුන් ගෙන සිටි පන්සියයක් ගොවීන්ට බැමිණිය රන් හැන්දෙන් බෙදන්නීය. බමුණා පූජා පවත්වා, රත්පැහැ රත්රන් සෙරෙප්පු පැළඳ, රත්පැහැ රන් සැරයටියක් ගෙන, 'මෙතැනට කිරිබත් දෙව, මෙතැනට ගිතෙල් දෙව, මෙතැනට හකුරු දෙව'යි අඩුපාඩු පෙන්වා උපදෙස් දෙමින් හැසිරෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, සුවඳ කුටියෙහි හිඳිමින්ම, බමුණු ආහාර පිරිනැමීමෙහි යෙදුනු දැක, 'බමුණ දහමෙහි හික්මවීමට මේ කාලය' යැයි හැඳ පටිය බැඳ, සඟල සිවුර පොරවා පාත්‍රය ගෙන, 'මිනිසුන් දමනය කරන, අති උතුම් මග පෙන්වන්නකු ලෙස නික්මුණු සේක. එහෙයින් අථ ඛො භගවා පුබ්බණ්හ සමයං නිවාසෙත්වා යැයි ගරුකටයුතු ආනන්ද හිමි (සංගීතියෙහිදී) කීහ.

අථ යනු වෙනත් කරුණක් ගැන දැක්වීමේදී ආරම්භයේදී යොදන නිපාත පදයකි. භගවා කලින් සඳහන් කරන ලද පරිදියි. පුබ්බණ්හසමයං දවසෙහි මුල් කොටසයි. උදය කාලයෙහි එක් මොහොතක් ගැන කියන ලදී. මෙසේ එකිනෙක ආසන්න සිදුවන කරුණු දැක්වීමකදී (පාලි වියරණයේ) දුතියා - විබත් (කමම) යෙදේ. නිවාසෙත්වා හැඳ, විහාරයෙහි වැඩ සිටින විට සිවුරු හැඳ සිටීම හා සිවුර මාරු කිරීම (තනිපට සිවුර - දෙපට සිවුර හැඳීම) ලෙසින් එය දතයුතුය. ඊට පෙර භාග්‍යවතුන් වහන්සේ සිවුර නොහැඳ නොසිටි බවක් මෙයින් අදහස් නොකෙරේ. භාග්‍යවතුන් වහන්සේ පිඩු පිණිස පිවිසීමට කැමති වූවිට, පිපුණු නෙළුම් මල් දෙකක් මැදට එන බඹරකු මෙන්, ඉඳුනිල් මිණිපැහැ ගලින් නිමවූ පාත්‍රය අත්දෙක මැදට පැමිණේ. එසේ ආ පාත්‍රය අතින් පිළිගෙන, සිවුර සිරුරේ පිරිමඬුලු කොට, දරාගෙන යනුවෙන් මෙසේ එහි අරුත දතයුතුය. යම්තැනකට හෝ, ඒ තැනකට හෝ එසේ එය රැගෙනයෑම මෙලෙසම කියයි. 'එය ගෙන යයි' (සමාදායෙව පක්කමති) කියා ඇති පරිද්දෙනි. යෙන යම්

මගකින්, **කම්මන්තො** (අදාල) කටයුතු කරන තැනට, **තෙන** ඒ මගින්, **උපසංකමි** ගියේ, යම් මගකින් කසීභාරද්වාජ බමුණාගේ කටයුතු සිදුවන තැනට (සීසාන තැනට) ළඟාවිය හැකිද, එමගින් ගියේ යැයි කී සැටියි. මෙහිදී කවර හෙයින් අනෙක් හිමිවරු භාග්‍යවතුන් වහන්සේ අනුව නොගියාහුද, යම් වේලාවක භාග්‍යවතුන් වහන්සේ තනිවම කිසියම් තැනකට වඩිනු කැමැත්තේ නම්, පිඬු පිණිස යන වේලාවෙහි දොර වසා ඇතුළු සුවඳ කුටියට පිවිසෙති. හිමිවරු, ඒ සළකුණින් 'අද භාග්‍යවතුන් වහන්සේ තනිවම ගමට පිවිසෙනු කැමති වෙති. නිසැකවම කිසියම් හික්මවිය යුතු තැනැත්තකු දුටහ'යි දැනගනිති. හිමිවරු තම පා සිවුරු ගෙන සුවඳ කුටිය පැදකුණු කොට පිඬු පිණිස යති. එදා භාග්‍යවතුන් වහන්සේ එසේ කළ හෙයින්, හිමිවරු උන්වහන්සේ අනුව නොගියහ. **තෙන ඛො පන සමයෙන** යම් වේලාවක භාග්‍යවතුන් වහන්සේ, ඒ කටයුතු පවත්නා තැනට එළඹියේද ඒ කාලයෙහි **බ්‍රාහ්මණස්ස පරිවෙසනා වත්තති** එම බමුණාගේ බත් බෙදාදීම සිදුවෙමින් පවතී යැයි තේරුමයි. රන්, රිදී, ලෝකඩ, තඹ බඳුන් ගෙන සිටි ගොවීන් පන්සියයට බැමිණිය රන් හැන්දෙන් කිරිබත් බෙදා දෙන්නී යැයි කලින් කීවෙමු. **අථ ඛො භගවා යෙන පරිවෙසනා තෙනුපසංකමි** කුමක් නිසාද? බමුණාට උපකාර පිණිසය. භාග්‍යවතුන් වහන්සේ දිළිඳු මිනිසකු මෙන් කෑමට ආසාවෙන් එතැනට නොවැඩිසේක්මය. උන්වහන්සේට සැකි-කෝලිය රජ පරපුර දෙකෙහිම අසූදහසක් අසූදහසක් තරම් නෑදෑයෝ වෙති. ඔවුහු තම තම වත් පොහොසත්කම් අනුව නිතර දානය පිරිනැමීමට උත්සාහ කරති. භාග්‍යවතුන් වහන්සේ ආහාරය උදෙසා පැවිදි නොවූහ. එහෙත් කිවනොහැකි තරම් කාලයක් පස් ආකාරයෙන් (ඇස්, ඉස්, මස්, ලේ, ජීවිතය) හැර දමමින්, දානාදි පාරමී පුරා (සසරින්) මිදුණෙමි, මුදන්නෙමි, දමනය වූයෙමි, සැනසුණෙමි, සැනසීම දෙමි, කෙලෙස් දුරු කළෙමි, කෙලෙස් දුරුකරවන්නෙමි'යි පැවිදි වූ සේක. එහෙයින් තමන් (කෙලෙස්වලින්, සසරින්) මිදුණු බැවින්, දුරුකරන ලද බැවින්, අනෙක් හැමදෙනාද මුදවමින්, කෙලෙස් නැති කරවමින් ලොවට (හිතසුව පිණිස) සැරිසරමින්, බමුණාටද උපකාර කරනු පිණිස ඒ ආහාර බෙදන තැනට පැමිණිසේකැ'යි දතයුතුය. **උපසංකමිත්වා එකමන්තං අට්ඨාසි** මෙසේ පැමිණ එකත්පසෙක සිටි සේක. **එකමන්තං** භාව නපුංසක යෙදුමකි. එක් ඉඩ ඇති තැනක, එක් පැත්තක් යැයි කියන ලදී. ආධාර විබත්හි කම්ම විබත් යෙදින. දැකීමට පහසු පරිදි, කතාබහ ඇසෙන පරිදි යම්තැනක සිට බමුණා දකීද, එබඳු උස්තැනක සිටි සේක. එහිදී රන් රස ගුලාවක්ව,

සඳහිරු දහසක ආලෝකය සේ බොහෝ සෙයින් බබළන, හාත්පස අසූරියන් පමණ වන පරිදි රැස් දහරක් බුදු සිරුරින් නිකුත් වීය. බමුණාගේ සීසෑමේ කටයුතු සිදුවන තැන (අවට) වූ සාලා, බිත්ති, ගස්, නගුල්වලින් ගොඩගැසුණු මැටි පස් ආදිය ඒ ආලෝකය විනිවිදව ගොස්, රනින් නිමා වූ සේ වී ඉක්බිති මිනිස්සු කිරිබත් අනුභව කරමින්ම, අසූවක් අනු ලකුණු පිරිවරා, දෙතිස් උතුම් ලකුණින් හෙබි, සිරුරින් හා, බඹයක් පමණ වටා කාන්තිය විහිදෙන දැතින්ද, සිරියාවෙන් බබළන කේතුමාලාවෙන්ද, සරන පියුම් විලක් බඳු රැස් දහරින් බබළන අහසෙහි තරු කැලක් බඳු, කාන්තිමත් රන්වන් ගිරිකුලක් බඳු සම්මා සම්බුදුරජාණන් වහන්සේ එක්පසෙක වැඩසිටිනු දැක, අත් පා සෝදා ඇඳිලි බැඳ පිරිවරා සිටියහ. මෙසේ (බුදුහිමි වටා) ඔවුන් පිරිවරන ලදුව, අද්දසා ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං පිණ්ඩාය, ඨිතං, දිස්වාන භගවන්තං එතදවොච, අහං ඛො සමණ කසාමි ච වපාමි ච යනුවෙන් කවර හෙයින් කියන ලද ද? හැම දෙයින්ම පහදින සුළු, දමනය කරන ලද (ඉඳුරන් යුතු) එකඟ සිත ඇති උතුම් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අසතුටෙන්ද? නැතිනම් දෙදහස් පන්සියක් වූ පිරිසට කිරිබත් පිළියෙල කොටදීත්, බත්හැන්දක් දීමට මසුරු වීද? මේ කරුණු දෙකම නොවේ. කෙසේ වුවත් භාග්‍යවතුන් වහන්සේ දැකීමෙන් සෑහීමකට පත් නොවූ, කරමින් සිටි වැඩකටයුතු නවතා (උන්වහන්සේ දෙසම බලා සිටි) පිරිස දැක, 'මාගේ වැඩ අඩාල කිරීමට පැමිණියේ යැ'යි බමුණා නොසතුටට පත්වූ බැවින් එසේ කීය.

භාග්‍යවතුන් වහන්සේගේ හැඩරුව ලකුණු දැක, 'මේ තැනැත්තා කිසියම් (ආදායමක් ලබන) කටයුත්තක යෙදෙන්නාහු නම්, මුළු දඹදිව් වාසීන්ගේ හිස්වල සිළුමිණක්ව උසස් බවට පත්වන්නේමය. එසේ නොකිරීමෙන් ඇතිවන පලය කුමක්ද? මෙසේ අලසව, කිසියම් වැඩක නොයෙදී වප්මඟුල් ආදී තැන්වල ආහාර ඉල්ලමින්, අනුභව කරමින්, සිරුර සවිමත්ව වඩවා ගැනීමට කල්ගත කරති'යි බමුණාට සිතුණි. එසේ හෙයින්, අහං ඛො සමණ කසාමි ච, වපාමි ච වපිත්වා ච භුඤ්ජාමි යැයි කීය. 'යම්සේ ඔබට මෙන් මෙබඳු උසස් ලකුණු (මට) තිබේනම් මගේ වැඩකටයුතු සඵල නොවෙති'යි නොසිතමි යන අදහසයි. ත්වම්පි සමණ -පෙ- භුඤ්ජස්සු මෙබඳු ලකුණුවලින් යුතු වුවත්, එසේ නොයෙදෙන්නෙහු නම් ඔබට ඇති යහපත කුමක්ද? එසේ වුවත් සැකි රජ කුලයෙහි කුමාරයෙකු උපන්නේය. සක්විති රජකම හැර පැවිදි වූයේ යැයි මෙසේද අසා ඇත. එහෙයින් මේ එතුමා යැයි දැන, 'සක්විති රජකම හැර, වෙහෙසට-

පීඩාවට පත්වූයෙහිද'යි දොස් නගමින්, **අහං ඛො සමණ** යැයි කීය. එසේ වුවත් තියුණු නුවණැති බමුණ භාග්‍යවතුන් වහන්සේට වචනයෙන් 'දමාගසන' ලෙසින් නොකියයි. උන්වහන්සේ ගේ රූසිරි දැක, නුවණින් සළකා බලමින්, කතා සල්ලාපයට **අහං ඛො සමණ** යැයි කීය. එවිට භාග්‍යවතුන් වහන්සේ (ලෝවාසීන්) හික්මවන කෙනෙකු ලෙසට දෙවියන් සහිත ලෝකයෙහි උතුම් (කෙත) සීසාන, වපුරන බවට තමන් දක්වමින්, **අහමපි ඛො බ්‍රාහමණ** යැයි කීහ. බමුණාට මෙබඳු සිතිවිලි පහළ විය. 'මේ මහණ සීසාමි, වපුරමි'යි කියයි. ඊට අවැසි වියදඬු, නඟුල් ආදී ගොවි උපකරණ නොදකිමි. ඔහු බොරු කියත්ද, නැද්ද'යි උන්වහන්සේගේ දෙපතුල පටන් හිසකෙස් කෙළවරටම මැනවින් විමසා බලමින්, අඟපසඟ පිළිබඳ වූ විදු දැනුමෙහිද මනා දැනුමක් ඇති බැවින්, උතුම් දෙතිස් ලකුණු හඳුනා, 'මෙබඳු කෙනෙකු බොරු කීමට කිසිදු හේතුවක් නැතැ'යි එකෙණෙහිම, ගරුබුහුමන් දක්වන සිතැතිව, 'මහණ' යැයි ඇමතීම හැර පරපුරේ නමින් කතාබහ කරමින්, **න ඛො පන මයං භොතො ගොතමසස** කීය. 'පින්වත්, ගොතමයාණනි, ඔබගේ (ගොවි උපකරණ) අප නොදකිමු'යි කීය. මෙසේ ද කියූ තියුණු නුවණැති බමුණා 'මෙතුමන් විසින් එසේ කියන ලද්දේ ගැඹුරු තේරුමක් ඇතිව බව දැක, එය විමසා දැනගනු කැමතිව, භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් කරුණු සැළකළේය. එහෙයින් ගරු කටයුතු ආනන්ද තෙරුන් වහන්සේ **අථ ඛො කසීභාරදවාජො බ්‍රාහමණො භගවනතං ගාථාය අජඣභාසි** යැයි කීහ.

එහි **ගාථාය** යනු අකුරු පද සහිත වචනයෙන් **අජඣභාසි** කීවේය. එහිදී බමුණා **කසිං** යනුවෙන් කුඹුරෙහි වැඩකටයුතුවලට උපකාර වන වියදඬු නඟුල් ආදිය කියයි. 'පුබබධමම සභාගයෙන් ගලපා කතා කිරීම බුදුවරුන්ගේ උසස් බව පෙන්වීමකි. එහෙයින් උසස් බුදුබලය පෙන්වමින් **සදධා බීජං** යැයි 'පුබබධමම සභාගයෙන්' ගලපා කීහ. ඒ පුබබධමම සභාගය නම් කුමක්ද? බමුණා විසින් වියදඬු නඟුල් ආදී ගොවි උපකරණ ගැන විමසනු ලැබීය. එහෙත් නො අසන ලද වපුරන දෑ හෙවත් බීජ සම්බන්ධකොට **සදධා බීජං** යැයි (දහම් කරුණු රූපක හා ගලපමින්) කීහ. මෙසේ කරුණු දැක්වීමේදී ඒ විස්තර නොගැළපෙන අයුරු වේද'යි (මතු වුවහොත්) මේ ඊට කිවයුතු ආකාරයයි. බුදුවරුන්ගේ නොගැලපෙන කතා නැත. දහම් කරුණු මුලදීම රූපක හා ගලපමින්ද හැමවිටම කතා නොකරති. මේ අයුරින් එහි ගැළපෙන සැටි දතයුතුය. ඒ බමුණා වියදඬු, නඟුල් ආදී ගොවි උපකරණ සඳහන් කොට, ගොවිතැන ගැන එසේ

අසන ලද්දයි පරිහාස නොකොට, ඔහුට අනුකම්පාවෙන්, නොසැලෙන පල සහිත වූ (නියම) ගොවිතැන අවබෝධ කරවීමට මුල පටන්ම ඒ ගැන පැහැදිලි කරමින් සද්ධා බීජං යැයි කීහ. බීජ හෙවත් වපුරන දේ (බිත්තර වී) ගොවිතැනෙහි මූලය. බීජ ඇති කල ඉදිරි කටයුතු කළ යුතුය. එය නැති විට නොකළ යුතුය. එයද නිසි පරිදි පමණ දැන කළ යුතුය. බීජ ඇති කල ගොවිතැන ඇරඹිය හැකිය. උවමනා පමණ බීජ ගැන දන්නා ගොවියෝ කෙත සීසාති. 'අපගේ අස්වැන්න - කෙත නොපිරිහේවා'යි අඩුවෙන් නොයොදති. 'අපගේ උත්සාහය හිස් නොවේවා'යි වැඩියෙන් ද නොයොදති. භාග්‍යවතුන් වහන්සේ, ගොවිතැනට බීජය මුල් හේතුව වන පරිදි මුල පටන්ම ඒ බමුණාට ගොවිතැන සඳහන් කරමින්, ඒ සමග බමුණාගේ ගොවිතැන් කටයුතු ද සසඳමින් සද්ධා බීජං යැයි කීහ. ඒ අයුරින් පුබ්බධම්ම සභාග හෙවත් පෙර කරුණ හා සම්බන්ධකොට දහම් නයින් සසඳා දැක්වීම දතයුතුය. ඇසූ දෙයම කියා, නොඅසන ලද දෙය පසුව නොකීවේ කුමක් නිසාද? ඔහුට උපකාර වන පරිදි හා දහම් කරුණ පෙන්වා දීමේ හැකියාවද නිසාය. මේ බමුණා නුවණැත්තෙකි. මිසදිටු පවුලක උපන් බැවින් සැදැහැවත් බව නැත. සැදැහැ නොමැති වූ නුවණැත්තා අනුන් කෙරෙහි සැදැහැවත්ව තමාගේ අරමුණ හා එක් නොවන්නේ නම්, උසස් බවට පත් නොවේ. කෙලෙසින් කිලිටි වූ බැවින්, පැහැදෙන පමණකුදු ලකුණු නොමැතිව, නුවණ පමණක් බලවත්වීම යහපත සිදු නොකරයි. එක වියගහක බැඳි ඇතකු හා ගොනකු මෙනි. එහෙයින් බමුණාට සැදැහැ බව උපකාරී වෙයි. මෙසේ ඒ බමුණාට උපකාර වන බැවින්, ඒ බමුණා සැදැහැ බවෙහි පිහිටුවීමේදී (කරුණු) පසුව කිවයුතු වුවත්, දෙසන කුසලතාව නිසා, මුලදී කියන ලද්දේය. යම්සේ වෙනත් තැන්වලදී 'සැදැහැ බව (සසර ගමනට) උපකරණ සපයා දෙයි', 'සද්ධා බන්ධති පාථෙය්‍යං', 'සැදැහැ බව මිනිසාට දෙවැනි වේ', 'සද්ධා දුතියා පුරිසස්ස හොති', 'මේ ලෝකයෙහි සැදැහැ බව මිනිසාට ඇති සම්පතයි. 'සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං' 'සැදැහැයෙන් සසර සැඩපහර තරණය කරයි' - 'සද්ධාය තරතී ඔඝං', 'සැදැහැව නම් අත මහා ඇතෙකි', 'සද්ධා හත්ථො මහා නාගො', 'මහණෙනි, සැදැහැ ඇත්තා බුද්ධාදී උතුමන්ගේ සව්වකු වේ.' 'සද්ධායිකො භික්ඛවෙ අරියසාවකො' යනුවෙන් සඳහන්ව ඇත. බීජය වැඩීමට ද වැස්ස උපකාරී වේ. 'බීජස්ස ච උපකාරිකා වුට්ඨී' එය ඒ ඒ කරුණුවලට අදාලව වෙනස් අයුරින් ද කිවහැකි වේ. මෙසේ දහම් කරණු හා දැක්වීමට හැකි බැවින් පසුව කිවයුතු මෙම අරුත් මෙහි කලින් කියන ලදී. මේ අයුරුම ඒරියා කඳ, රැහැන ආදී සේ වෙනත් තැනක සඳහන් පරිද්දෙනි. සද්ධා යනු

පැහැදෙන සුළු බව හෝ හිතට එකඟව පිළිගැනීමයි. තමා තුළ පිහිටුවා ගැනීමයි. දැඩිව එල්බ ගන්නා ලද එම අදහසින් (සිත) නොකිළිටි බවට පත්කර ගැනීම හෝ, සෝවාන් ආදියෙහි පිහිටුවීමට හෝ ඇදහිය යුතු හෙවත් නොවෙනස්වන අයුරු දහමෙහි පිහිටීම හෝ කැඩපතක පැහැදිලි බව මෙන් ද, කැළඹුණු ජලය පෑදෙනු පිණිස ජලයට දමන දිය පහදන මැණික මෙන් ද, පහන් සිතිවිලි ඇති බවයි. බීජං (මෙය) පස් ආකාරය. මුලෙන්, කඳෙන්, ගෙඩියෙන්, මුදුනින්, ඇටවලිනි. ඒ සියල්ලම වැඩෙන තේරුමෙන් බීජ නමින්ම හැඳින්වෙයි. එසේ හෙයින් 'බීජඤ්චතං විරූහනට්ඨෙන' යනුවෙන් කීය. එහි බමුණාගේ ගොවිතැනෙහි මූලික වන බීජ කරුණු දෙකක් ඉටු කරයි. (මඩ) යට මුල් ඇදී පිහිටීමත්, මතුපිටට පැලය මතුවීමයි. එපරිද්දෙන්ම, භාග්‍යවතුන් වහන්සේ සීසෑමෙහි මුල බීජය මෙන්, සැදැහැවත් බව (සිත) යට සිල් නැමති මුලෙන් පිහිටුවන අතර, මත්තෙහි සමථ විදසුන් නැමති පැල හටගන්වති. (වපුරන ලද) බීජය මුල්වලින් පොළවෙහි රසය, දිය රසය (උරා) ගෙන කරල් බරව, අස්වනු පැසී වැඩෙන අයුරින් සැකසේ. එපරිද්දෙන්ම මොහු සිල් නැමති මුලෙන් සමථ විදසුන් නැමති රසය උරාගෙන, උතුම් මගපිළිවෙත් නමැති කරලින් උතුම් (සෝවාන් ආදී) පල නැමති අස්වැන්න පැසුණු බවට සලස්වයි. බීජය පොළවෙහි පිහිටුවා, මුල්, පැල, කොළ, දඬු, ඇට ආදියෙන් මනාසේ වැඩී, කිරිවැදී, නොයෙක් හැල් වී අස්වනු නිපදවයි ද එසේම මොහුගේ සිත් සතන්හි, සීලයෙහි සුපිරිසිදු බව, (සීල විසුද්ධි) සිතෙහි පිරිසිදු බව (චිත්ත විසුද්ධි) ඇති සැටියෙන් දැකීමේ පිරිසිදු බව (දිට්ඨි විසුද්ධි) සැක දුරුවීමෙහි පිරිසිදු බව (කංඛා විතරණ විසුද්ධි) මග නොමග දැනීමේ පිරිසිදු බව (මග්ගාමග්ග ඤාණ දස්සන) පිළිවෙත් නුවණින් දැකීමේ පිරිසිදු බව (පටිපදා ඤාණ දස්සන) යන කරුණුවලින් වැඩිදියුණු කොට, තියුණු නුවණ වූ විදසුන් මගින් ලබන පිරිසිදු බව (ඤාණ දස්සන විසුද්ධි) නැමති කිරි උපදවා, පිළිසිඹියා හා උසස්තම නුවණින් (පටිසම්භිදා අභිඤ්ඤා) බර වූ අරහත් ඵලය නිපදවයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **සද්ධා බීජං** යැයි වදාළහ. එසේ නම්, නුවණ කුසල-දහම් හා යෙදෙමින්, මතු මතුත් ඇතිවන විට සැදැහැ බවම බීජය ලෙස කියනු ලැබුවේද? මෙහිදී බීජයක වැඩෙන පිළිවෙල (නිදසුන්ය.) එම කුසල දහම් පිළිබඳව හැඳිනීමක්, හැඟීමක් දැනගැනීමට සැලසේද, සැදැහැව නම් වූ බීජයද එබඳුය. එයද සියළුම යහපත් දෙයට මුල් වෙයි. එහෙයින් මෙසේද සඳහන් වේ. 'සැදැහැවත් බව ඇතිවූ විට පැමිණෙයි. පැමිණ ඇසුර කරයි. ඇසුරු කිරීමෙන් සවන් යොමයි. එසේ සවන් යොමා දහම් අසයි. දහම්

අසා සිතෙහි මතක තබා ගනී. මතක තබාගත් දහම්හි අරුත් මෙනෙහි කරයි. අරුත් මෙනෙහි කරමින් දහමෙහි වැටහීමක් ලබයි. වැටහීමෙන් (ඒ පිළිබඳ තවදුරටත්) කැමැත්ත හටගනී. කැමැත්ත නිසා උත්සාහවත් වෙයි. උත්සාහවත්ව කරුණු සසඳා බලයි. සසඳා බලා තමා තුළින්ම (කායෙන) ඇති තතු තමාම අවබෝධ කරයි. තියුණු නුවණින් ද ඇත්ත විනිවිද දකියි. 'සද්ධාජාතො උපසංකමති, උපසංකමන්තො - පයිරුපාසති, පයිරුපාසන්තො සොතං ඔදහති, ඔහිතසොතො ධම්මං සුණාති, සුත්වා ධම්මං ධාරෙති, ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති, ධම්ම නිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති, ඡන්දජාතො උස්සහති, උස්සහිත්වා තුලයති, තුලයිත්වා පදහති. පහිතත්තො සමානො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති, පඤ්ඤායච නං අතිවිජ්ඣ පස්සති'.

අයහපත් කරුණු සිරුරෙන් ද තැවීමට පත්කරන අරුතින් තපො නම් වේ. ඉඳුරන් සංවරය, උත්සාහය, කෙලෙසුන් දුරු කිරීමට අනුගමනය කරන වත් හෙවත් ධූතාංග, දුක් සහිත අපහසුතාවට යොමුවීම එයට සමාන වචනයි. මෙහිදී අදහස් වන්නේ ඉඳුරන් සංවරයයි. වුට්ඨී සුළං වැසි හා වහින වැස්ස යනුවෙන් නොයෙක් ආකාරය. මෙහි අදහස් කෙරෙන්නේ වහින වැස්ස යි. මෙසේ වසින වැස්සෙන් බීජ මුල් ඇදී වැඩේද, මැලවී නොයේද බමුණා බලාපොරොත්තු වන පරිදි ඉටු වේද, එපරිදිම භාග්‍යවතුන් වහන්සේගේ ද ඉඳුරන් සංවරයෙන් උපකාර වන සැදැහැ බවද සැදැහැ බවට මුල් වූ සීලාදී ගුණදහම් වැඩේ. මිලාන නොවේ. බලාපොරොත්තු ඉටුවෙයි. එහෙයින් තපො වුට්ඨී යැයි වදාළහ. පඤ්ඤා මෙ යන තැන 'මෙ' පදය - සද්ධා මෙ බීජං, තපො මෙ වුට්ඨී - සැදැහැ බව මගේ වපුරන බීජ යයි. ඉඳුරන් සංවරය මගේ වැස්ස යයි, මේ අයුරු යෙදිය යුතුය. (ඉඳුරන් සංවරය මට වැස්ස වෙයි.) එයින් කුමක් හැඟේද? බමුණ, ඔබ වපුරනු ලබන බීජයට වැස්ස ලදොත් හොඳය, ජලය නොලැබේ නම්, ජලය සැපයිය යුතුය. එසේම මා විසින් ලජ්ජාව නැමති නඟුල් හිසින්, නුවණ නැමති වියදඬු නඟුලෙන්, සිත නැමති රැහැනින් එකට බැඳි, උත්සාහය නැමති ගොනුන් යොදා සිහිය නැමති කෙවිටෙන් ඇන, තම සිත නැමති කෙතෙහි සැදැහැ බිජු වැපිරූ විට, වැසි නොලැබීමක් නම් නැත. මගේ මේ ඉඳුරන් දමනය නිරතුරුවම වැස්සය. (ඒ බව) වෙනත් කෙනෙකු හෝ තමා විසින් හෝ එය දැනගනී ද පඤ්ඤා නම් වේ. එය කාමාවචර ආදී ලෙසින් නොයෙක් ආකාරය. මෙහිදී ඒ කාමාවචර

ලෙසින්ද, විදසුන් මගින් ලබන මගපල නුවණද අදහස් වේ. යුගනංගල- වියගහ සහ නගුලය. බමුණාගේ වියගහ සහ නගුල සේම, භාග්‍යවතුන් වහන්සේගේ දෙආකාර වූ ඒ නුවණය. යම්සේ වියගස නගුල් ඉස මත්තෙහි (පිහිටාද) ඉදිරියෙහි වේද, නගුල් ඉසට බැඳී තිබේද, රැහැන ඊට ඉවහල් වෙයි. එයින් ගොනුන් එක්තැන්ව ගමන් කිරීම වළකී. මෙසේම නුවණ ලජ්ජාව මුල්ව ඉදිරියට යයි. 'සියළු යහපත් කරුණු අතර නුවණ උසස්ම වේ.' 'පඤ්ඤුත්තරා සබ්බෙ කුසලා ධම්මා', නකත් තාරකාවලට සඳ මෙන් නුවණින් උතුම් බවට පත්වීම ඉතා යහපතැ'යි 'පඤ්ඤාභිසෙට්ඨා කුසලා වදන්ති, නක්ඛත්තරාජාරිව තාරකානං' කියති. නුවණ කුසල දහම්වලට මුල්ව ඉදිරියෙන්ම සිටීයැයි එසේ හෙයින් කියන ලදී. එමෙන්ම සීලය හා ලජ්ජාව අනුව යන යහපත් කරුණින් නුවණැත්තකු වෙතියිද කියා ඇත. 'සීලං හිරිචාපි සතඤ්ච ධම්මා අන්වායිකා පඤ්ඤවතො භවන්ති' ලජ්ජාව නැතිවිට නොබැඳි නගුලිස මෙනි. සිත යැයි කියන ලද සමාධි නම් වූ රැහැන නගුල හා ගොනුන් බැඳෙන රැහැනද මෙනි. දැඩිව පටන් ගත් උත්සාහයෙන් කුසීත බව වැළකීමෙන් උත්සාහය නැමති ගොනුන්ගේ එකවිට (වේගයෙන්) යන ගමන ද වළකී. සීසාන විට නගුල් තලයෙන් පොළව මතුපිට බිඳෙන්නා සේ ම, වැඩී ඇති (තණ ආදිය) පැළෑටි මුල පිටින්ම උදුරා විසුරුවාලයිද, මෙසේම, සිහිය නැමති නගුල් තලයෙන් යුතු විදසුන් නුවණ වඩන කල්හී, සිතිවිලි පරම්පරාවේ එකතුවන අරමුණ මතුපිට බිඳී සියළු කෙලෙස් මුල් පරපුරම උදුරා දමයි. එය ලොවුතුරු ලෙසින්ද (මගපල-නිවන) ජීවිත වටපිටාව තුලද (මෙලොව) වෙයි. එහෙයින් **පඤ්ඤා මෙ යුග නංගලං** යැයි කීහ.

ඒ තැනැත්තා තමන්ම හෝ ලජ්ජාවට පත්ව, අයහපත් පැවතුම් කෙරෙහි පිළිකුල් කරයි යනු **හිරි** නම් වෙයි. එයට බැඳුනු, එකට හැසිරෙන හෙවත් එක්ව යෙදෙන, අදහසින් පවට ඇති බියද මෙහිදී සැළකේ. **ඊසා** වියනගුල සවිවන ලී දඬුවය. බමුණාගේ වියනගුල සවිවන ලී දඬුවෙන් හෙවත් විය බානෙන් උසුළයිද එසේම භාග්‍යවතුන් වහන්සේද අයහපත් පැවතුම් පිළිකුල්කොට, ලොවී ලොවුතුරා නුවණ යැයි කියන ලද වියනගුල උසුළති. ලජ්ජාව = (පවට) බිය නොමැති නම් නුවණද නැති, යම්සේ ලී දඬුව හා මනාව බැඳුණු නගුල නොවෙනස්ව, මැනවින් (සීසෑමේ) කටයුතු කෙරේද, එසේම ලජ්ජා බිය හා මැනවින් බැඳුණු නුවණද නොසෙල්වී, තිරව, ලජ්ජා නොමැති බවට මුසු නොවමින් නුවණින් කටයුතු මෙහෙයවයි. එහෙයින් **හිරි ඊසා** යැයි කීහ. දැනගනී යන අරුතින් **මනො** වේ. එය

සිතට සමාන වචනයකි. මෙහිදී මනස මුල්කොට යෙදුනු සිත එකඟ බව අදහස් කෙරේ. **යොත්තං** යනු රැහැනින් බැඳීමයි. එය තුන් ආකාරය. ලීඳඬු තද හා නගුලේ බැඳීම, නගුල හා ගොනුන්ගේ බැඳීම, ගොනුන් හා නගුල ගෙනයන්නා හා බැඳීම යනුවෙනි. එහිදී බමුණා, රැහැන, ලීඳඬුව නගුල එකට බැඳ තම සීසෑමේ කටයුතු මනාව සිදුකරයි. එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ ලජ්ජාබිය, නුවණ, උත්සාහය යන සියල්ලම නොවෙනස්වන සේ එකතුකොට සිතෙහි එකඟබවින් තම කටයුතු පිළියෙල කරති. එසේ හෙයින් **මනො යොත්තං** යැයි කීහ. යම් තැනැත්තෙකු කලක් තිස්සේ කරන ලද දේ සිහිකරයි. තමා කළ දේ හෝ සිහිකරයි යන තේරුමෙන් **සති** නම් වේ. එය මුළා නොවීම දක්වයි. පතුරුවයි, විවර කරයි = **ඵාලො**, එයින් ගෙනයයි, පදවයි, දක්කයි යන අදහසින් **පාජනං** වෙයි. කෙවිට යන්නට සමාන වචනයකි. ඵාල ද පාචනද යන්න සමාසවීමෙන් **ඵාලපාචනං** යැයි කියනු ලැබේ. බමුණාගේ හීවැල හා කෙවිට මෙන්, භාග්‍යවතුන් වහන්සේගේ විදසුන් මගින් යුත් සිහිය ගැන දක්වෙයි. හීවැල යම්සේ නගුල රැකගෙනම ඉදිරියෙන් යයි ද, එසේම, කුසල දහම්හි පැවැත්ම විමසමින් (එක්) අරමුණෙහි හෝ පිහිටුවමින්, නුවණ නැමති නගුල රකියි. එසේම, 'සිහිය පවත්වා ගැනීමේ, රැක ගැනීමේ සිතිවිල්ලෙන් යුතුවම වැඩවසයි.' - සතාරකෙබන චෙතසා විහරති' ආදී තැන රැකීම යනුවෙන් කියන ලදී. මුළා නොවූ සිහිය ඉදිරියෙන්ම වෙයි. මනා සිහිය ඇති කල දහම මැනවින් වටහා ගනී. මුළා වූ සිහියෙන් නොවේ. ගොනුන්ට කෙවිටෙන් අනින විට, බිය දක්වමින්, පසුබට නොවෙත්ද, වැරදි මග නොයත්ද, එසේම සිහිය, උත්සාහය නැමති ගොන්නු අපායට බිය දක්වමින්, කුසීත වීමට, පසුබට වීමට ඉඩ නොදෙති. පස්කම් සැපයයි කියන ලද නුසුදුසු දොරටු වළකා, කමටහනෙහි යොදවති. වැරදි (ජීවන) මගද වළකයි. එහෙයින් **සති මෙ ඵාලපාචනං** යැයි කීහ.

**කායගුත්තො** තුන්ආකාර වූ කාය සුචරිතයෙන් රක්නා ලද **වචීගුත්තො** සිවුආකාර වූ වචනය හික්මවීමෙන් රක්නා ලද, මෙපමණකින් පාමොක් සංවර සීලය ගැනකියන ලදී. **ආහාරෙ උදරෙ යතො** මෙහි ආහාර මුල්කොට, සිව්පසයම ඇතුලත් වන බැවින්, එහි සංයමයෙන් යුතුව කෙලෙස් බවින් තොරවීමයි. මෙයින් ආජීව පාරිසුද්ධි සීලය හෙවත් දිවි පැවැත්මේ පිරිසිදු බව කියන ලදී. **උදරෙ යතො** කුසෙහි පමණ සළකා අනුභව කිරීමයි. ආහාරයෙහි තමන්ට සෑහෙන පමණ දන්නා බව කියන

ලදී. එයින් කුමක් අදහස් කෙරේද? 'බමුණ, ඔබ බීජ වපුරා (සරු) අස්වනු ලබා ගැනීමේ අදහසින්, එය රැකගනු සඳහා කටු වැටක් හෝ ගස් අතු යෙදූ වැටක් හෝ දඬු වැටකින් හෝ වටකරයිද, එයින් හරකුන්, මීමුන්, වෙනත් සිවුපාවුන්ට පිවිසීමට නොලැබීමෙන් ගොයම රැකෙයි. ඒ අයුරින් මමද සැදැහැ බීජ වපුරා, නොයෙක් ආකාර වූ කුසල දහම් නැමති අස්වැන්න මනාව පාලනය පිණිස කය-වචන-ආහාර යන තුන්ආකාර ආවරණයෙන් වට කරමි. එයින් මා කෙරෙහි අයහපත් රාගාදිය නමැති ගොණුන්, මීමුන් හා වෙනත් සිවුපාවුන් පිවිසීමට ඉඩක් නොලබමින් නොයෙක් ආකාර වූ කුසල් නැමති (ගොයම) අස්වනු වැනසීමට පත් නොවේ. **සච්චං කරොමි නිද්දානං** මෙයින් දෙආකාර වූ බොරු නොකීම හා ඇත්ත සැළකේ. **නිද්දානං** යනු කැඩීම-කැපීම-උදුරා දැමීමයි. කරණ අරුතෙහි කමම විබත් යැයි දතයුතුය. එහි අරුත මෙසේය. සචෙවන කරොමි නිද්දානං යැයි කුමක් හෙයින් කියන ලදද? 'යම් සේ ඔබ සී සා, බාහිරව ගොයම වනසන තණ ආදී (වල් පැළෑටි) අතින් හෝ දෑකැත්තකින් හෝ උදුරා දැමීම කරහි, මම ද එසේම (සිරුර හා) සිත නම් වූ මට අයත් (කොටස) සී සා, යහපත විපතට පත් කරන, බොරුව නැමති නොගැළපෙන තණකොළ ඇත්ත කීමෙන් උදුරා දමමි. එහිදී නුවණ ඇත්ත සේ දතයුතුය. එයට සියළු දේ ඇති සැටියෙන්ම දන්නා නුවණ හෙවත් යථාභූත ඤාණ යැයි කියනු ලබයි. එයින් තමාගේ වැනි හැඟීම් ආදිය නැමති වල්පැළෑටි උදුරා දැමීම කරමියි යෙදිය යුතුය. නැතහොත් **නිද්දානං** යනු කඩන්නා, කපන්නා, උදුරා දමන්නා යන තේරුම වේ. එවිට, 'යම්සේ ඔබ දාසයකු හෝ කම්කරුවකු හෝ ලවා තණකොළ ආදිය උදුරවන්නෙහි නම්, තණකොළ අතින් හෝ දෑකැත්තකින් හෝ උදුරවයි. (උපදෙස් දෙයි) මෙසේ මම ඇත්ත කියමි' කරමි'යි කමම විබත් වචනයෙන්ම යෙදීම නුසුදුසුය. නැතහොත් **සච්චං** ඇත්ත දැකීමයි. එසේ මම (අයහපත) උදුරා දමමි. සිඳිය යුතුය. කැපිය යුතුය, උදුරා දැමිය යුතුවෙමි'යි මෙසේ දුතියා විබතින්ම කීම සුදුසුය. **සොරච්චං මෙ පමොචනං** මෙහි කය ඉක්මවා වචනය ඉක්මවා නොයාමයි. හෙවත් කයෙන් කෙරෙන කටයුතු හා වචනය නිවැරදි ලෙස යොදා ගැනීමයි. මෙසේ සීලයම සුවච බව යැයි කියන ලදී. එහෙත් එය එකවරම අදහස් නොකොට කය රැකගැනීම ආදී ලෙස සඳහන් කරන ලද්දේමය. රහත්ඵලය අදහස් වෙයි. එයින්ද යහපත් නිවණෙහි ඇළුණු බව **සොරච්චං** යනුවෙන් කියනු ලැබේ. **පමොචනං** ගොනුන් මුදාලීමයි. කුමක් නිසා කියන ලදද? යම්සේ ගොනුන් ඔබ මුදාහැරියද, නැවත සවස් කාලයෙහි හෝ පසුදින හෝ ඉදිරි දින

හෝ ඊළඟ වසරෙහි හෝ (ඊළඟ සීසාන කාලය) නගුලෙහි යෙදිය යුතුය. ගොනුන් මුදාලීම ටික කලකටය. (තාවකාලිකය) මට එසේ නොවේ. මගේ (එබඳු) අතරතුර මුදාහැරීමක් නැත. මම දීපංකර බුදුසසුනෙහි පටන්, නුවණ නැමති නගුලෙහි උත්සාහය-වීරිය නැමති ගොනුන් යොදා අසංඛෙය්‍ය සතරකුත් කප් සියදහසක් මහා පරිමාණයෙන් ගොවිතැනෙහි යෙදෙමින්, (සසර ගමනෙහි) යම් කලක සම්මා සම්බුදු බව අවබෝධ නොකෙළෙම්ද, ඒතාක් ගොනුන් මුදා නොහළෙමි. යම්කලක ඒ මුළු කාලයම අවසන්කොට, ඇසතු රුක් මුල්හි, නොපැරදුණු පලගෙහි හිඳ සියළු ගුණයෙන් පිරිවරන ලද අරහත් බව මට අවබෝධ විය. එදා මා විසින් ඒ සියල්ල උත්සාහයෙන් සත්සිඳීමට පැමිණ, මුදාහරින ලදී. දැන් නැවත යෙදිය යුතු නොවන්නේ යැයි දැක්වීමට **සොරච්චං මෙ පමොචනං** යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

වීරියං මෙ ධුරධොරයහං මෙහි කායික, මානසික ලෙසින් පටන් ගන්නා ලද උත්සාහය වීරිය වේ. වියගසෙහි බර දැරීම, උසුලා සිටීම යන තේරුමයි. යම්සේ බමුණාගේ වියගහ දරමින් ඇදගෙන යන නගුල පොළව මතුපිට (පස්) බිඳියිද, මුල් පස්කැට ආදිය කුඩා කැබලිවලට පත් කරයිද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේගේ උත්සාහයෙන් අදින ලද නුවණ නැමති නගුලෙන් ඉහත කී (සසර ගමන) මතුපිට බිඳියි. ඇතුලත රැඳුන කෙලෙස් කැබලි කර (පොඩිකර) දමයි. **වීරියං මෙ ධුර ධොරයහං** යැයි එහෙයින් කියන ලදී. එසේ නැතිනම්, මුලින් උසුළන බැවින්ද, මුලින් වියගහ දරන බැවින්ද (වචන දෙකම එක්කොට) ධුරධොරයහ නම් වේ. බමුණා එක් එක් නගුලෙහි ගොනුන් සිවුදෙනා බැගින් වියනගුල් දරා (ඇදගෙන යමින්) වැඩී ඇති තණකොළ ආදියද නොවැඩෙන ලෙස මුළුමනින්ම නසාදමා අස්වනු සරු කර ගනීද, එසේම භාග්‍යවතුන් වහන්සේද සිවු ආකාර වූ වෑයම-උත්සාහය නම් වියනගුල් දරමින්, උපන් නූපන් අකුසල මුල් නිසා කුසල සම්පත ලබා ගනිති. එසේ හෙයින්ද **වීරියං මෙ ධුර ධොරයහං** යැයි කීහ. **යොගක්ඛෙමාධිවාහනං** මෙයින් අදහස් වන්නේ කුමක්ද? යම්සේ ඔබගේ වියනගුල නැගෙනහිර දෙසට හෝ, බටහිර දෙසට හෝ වෙනත් දෙසකට ඉදිරියටම ගෙනයනු ලබයිද, එසේම උත්සාහය-වීරිය නැමති මගේ වියනගුල නිවන ඉදිරියට ගෙනයනු ලබයි. එසේ ගෙනයනු ලැබීම **ගච්ඡති අනිවත්තන්තං** වෙයි. ඔබේ නගුල ගෙන යන ගොනුන් කෙත කෙළවරට පැමිණ නවතින්නාක් මෙන් මා එසේ (සසරෙහි) නොනවතිමින්, දීපංකර බුදුකල පටන් ඉදිරියට ගියේමය.

යම් ආකාරයෙන් ඒ ඒ මගපලින් නැති කළ කෙලෙස් නැවත නැවත ඉවත හළ යුතු නැත. එහෙත් ඔබේ වියනගුලින් සිඳුණු, කැඩුණු තණකොළ නැවතද පසුකලක (වැඩෙන බැවින්) සිඳිය යුතු වේ. එසේ මා පළමු මගෙන් (සෝවාන්) මගේය යන හැඟීම් ආදී කෙලෙස්ද, දෙවැනි මගින් (ඉතිරි කෙලෙස්) දළ ලෙසින්ද, තෙවැනිව අඩු ලෙසටද, සිවුවන මගෙන් සියළුම කෙලෙස් දුරුකරන තුරු නොනැවතී යෑම **ගච්ඡති අනිවත්තන්තං** හෙවත් නොනැවතී යයි. තං වියනගුල් ඉසිලීමයි. මෙසේ මෙහි වචන යෙදුණු අයුරු දතයුතුය. මෙසේ ගෙනයනවිටදී ඔබේ වියනගුල් අදාල තැන් කරා නොයයි ද (අදාල පරිදි වියනගුල් ගෙනයා නොහැකි වූ විට) ඔබට එයින් සෝකය ඇතිවිය හැකිය.) යම් ලෙසකින් ගොවියා සෝක රහිතව, දූවිලි රහිත තැනකට ගොස් සිටීද **යත්‍ථ ගන්ත්වා න සොචති** යයි වදාළහ. සිහිය නැමති කෙවිටෙන්, එම උත්සාහය - වීරිය නැමති වියනගුල් යොදව යොදවා ගෙන ගොස්, මා වැනි ගොවියෙක් සෝක නොවී (කෙලෙස්) දූවිලි නැති, සෝක උල් සියල්ල මුලින්ම උදුරා හළ අමා නිවණ යැයි හඳුන්වන (තැනට) පත්වෙයි.

මීළඟට එය පහදා දෙමින් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළහ.

**එවමෙසා කසී කට්ඨා සා හොති අමතප්ඵලා**
**එතං කසිං කසිත්වාන සබ්බ දුක්ඛා පමුච්චතී**

මේ එහි කෙටි අරුතයි. 'බමුණ, බලව (වටහාගනුව) එසා ඒ සැදැහැ නැමති බීජ තපස (සීලය) නම් වැස්සෙන් උපකාර ලැබ, කසී කෙත නුවණින් හෙබි විය නගුලෙන් ලජ්ජා බිය නම් නගුලිසින්, සිත් රැහැනින් එකට බැඳ නුවණ නම් හීවැලෙන්, පහරදී සිහිය නම් කෙවිට ගෙන කයින් සිතින් හා ආහාරයෙන් රැකගෙන, මුසා නොකීම නැමති වල්පැළැටි නෙලීමෙන් නිවනෙහි ඇලුනේ, උත්සාහය නම් වියනගුල් උසුළමින්, නිවන ඉදිරියටම නොනැවතී යමින්, කට්ඨා ගොවිතැන් කටයුතු අවසානයේදී සිවුආකාර වූ මහණකමේ පලය ලදිමි. (සෝවාන් ආදී මගපල අදහස් වේ.) **සා හොති අමතප්ඵලා** එලෙස සීසා කරන ගොවිතැන අමාපල ලබයි. අමතං යනු නිවනට කියනු ලබයි. නිවන ලබන හේතු සම්පත් ඇතැයි තේරුමයි. මෙබඳු කෙතක් සී සා අස්වනු සේ ලබන අමාපලය මට පමණක් නොවේ. එසේ වුවත් කිසියම් කැත් කුල හෝ

බමුණු කුල හෝ වෙළඳ කුල හෝ සුද්ද කුල හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ මේ කෙත සීසාත්ද ඒ සියල්ලෝම **එතං කසිං කසිත්වාන සබ්බදුක්ඛා පමුච්චතී** යනුවෙන් සියළුම සසර දුක්, උපත ලද භවයෙහි දුක්, ජීවත්වීමේදී කරන කියන දේ නිසා ඇතිවන දුක්, වෙනස්වීම නිසා ලබන දුකින් මිදෙති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වමින් නිවන අවසන්කොට දෙසුම නිමා කළහ.

එවිට බමුණා, ගැඹුරු අරුත් සහිත වූ දෙසුම අසා 'මම ගොවිතැන් බත් අනුභවකොට, පසුදාටත් කුසගිනි ඇත්තේ වෙමි. මෙතුමාට ගොවිතැන් බත් අමා පලයකි. ඒ පල අනුභවකොට සියළු දුකින් මිදේ යැයි දැන, පැහැදී සතුටු වූ අයුරු දක්වන්නට කිරිබත් දීමට පටන් ගති. **අථඛො කසීභාරද්වාජො** යැයි එසේ හෙයින් කීහ. එහි **මහතියා** යනු ලොකු **කංසපාතියා** රත්රන් පාත්‍රයකි. සියදහස් ගණනින් වටිනා තම රන්තලියෙහි, **වඩ්ඪෙත්වා** බහා, අතුරා යැයි කියන ලදී. **භගවතො උපනාමෙසි** ගිතෙල්, මීපැණි ආදියෙන් විසිතුරුකොට, පටසළුවෙන් වසා (දෝතින්) ඔසවා මනාව තථාගතයන් වහන්සේට පුද පිණිස ගෙනාවේය. කෙසේද? **භුඤ්ජතු භවං ගොතමො පායාසං කස්සකො භව** යැයි පවසමිනි. එයින් ගොවියකු ලෙසට කරුණු කීය. **යං හි භවං -පෙ- කසති**, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **ගාථාභිගීතං මෙ** යනුවෙන් කීහ.

එහි **ගාථාභිගීතං** යනු ගාථාභි අභිගීතං, ගාථා කියන ලද දෙයක් යැයි කියන ලදී. මෙ මා විසින්, **අභොජනෙය්‍යං** අනුභවයට සුදුසු නොවේ. **සම්පස්සතං** මැනවින් දිවි පැවැත්ම දක්නා වූ, හාත්පසින්ම දක්නා වූ (හැම ලෙසින්ම ඒ බව දක්නා සුළු වූ) **සම්පස්සතං** බුදුවරුන්ගේ යන (තේරුමෙන්) කියන ලදී. නෙස ධම්මො ගාථා කියා ලද දෙය අනුභව කළ යුතුය යන්න බුදුවරුන් (අනුගමනය කරන) සිරිතක් නොවේ. එහෙයින් ගාථාභිගීතං පණුදනති බුද්ධා පිළිකෙව් කරති. අනුභව නොකරති. භාග්‍යවතුන් වහන්සේ කුමක් නිසා ගාථා කියා ලබන කිරිබත ගැන මෙසේ කී සේක්ද? එම අදහසින් කියන ලද්දේ නොවේ. එහෙත්, උදෑසන පටන් කුඹුර අසළ සිට හැන්දක තරම් වත් ආහාරයක් නොලැබ, නැවත සියළු බුදුගුණ පවසා ලබන දෙයක් වේ නම්, එය නළුවන් නැටුම් ආදිය රඟපා, ගී ගයා ලබන ආහාරයක් වැනිය. එහෙයින් ගාථාභිගීතං යැයි කියා ඇත. එබඳු දෙයක් බුදුවරුනට අකැපය. එය අපිස් දිවිපැවැත්මට සුදුසු නොවේ. එබැවින් පොදු ජනතාවට අනුකම්පාවෙන් එසේ කියන

ලදී. තමන්ගේ ගුණ පිළිබඳව අනුන් පවසන ලද දෙයින්ද ලාභ සත්කාරද අපිස් දිවි ගෙවූ වළං තනන්නෙකු වූ ඝටීකාර මෙන් පිළිකෙව් කරති. අපිස් දිවියෙහි කෙළවරටම පත් භාග්‍යවතුන් වහන්සේ තමන්ම, තමන්ගේ ගුණ පැවසීමෙන් ලද ලාභ කෙසේ ඉවසන සේක්ද? උන්වහන්සේ ගැනද එසේ කිවයුතු වේ. 'මෙපමණකින්, නොපැහැදුණු, දීමට අකමැති බමුණ, ගාථා කීමෙන් දීමට පොළඹවා, කැමති කරවා, සමණ ගොතමයන් ආහාර පිළිගත්හ. ලාභ වාසි බලාපොරොත්තුවෙන් දේශනා කරන්නාහ'යි ලෝකයාගේ අපවාදයෙන් තමන් නිදහස් වීමට, පිරිසිදු දහම් දේශනා පිළිවෙත පැහැදිලි කරමින්, මීළඟට පිරිසිදු දිවිපැවැත්ම ගැන ධම්මෙ, **සති බ්‍රාහ්මණ වුත්ති රෙසා** යැයි කීහ. දස ආකාර වූ සුසිරිත් කරුණු හෝ, බුදුවරුන්ගේ පිළිවෙත ධම්මෙ යන්නෙන් අදහස් වේ. **සති** ඇතිකල්හී, ඉවත් නොවූ, පවත්නා කල්හී, **වුත්තිරෙසා** යනු නිසැකවම, අහසෙහි අත් දිගුකරන අයුරින් - සෙවීම, මැනවින් සොයාබැලීම බුදුවරුන්ගේ දිවිපැවැත්ම වේ. **බ්‍රාහ්මණ** ඇමතීමයි.

මෙසේ වදාළ කල්හී, බමුණ, 'මාගේ කිරිබත පිළිකෙව් කරයි. ඒ ආහාරය අකැපය. ඇත්තටම මම දිළින්දෙක් වෙමි. දානය දීමට නොලැබීමි' යැයි කණගාටුවට පත්විය. 'වෙනත් කෙනෙකුට පිළිගන්වන්නෙම් නම් මැනවැ'යිද සිතුවේය. ඒ දැන, භාග්‍යවතුන් වහන්සේ 'මම පිඬු පිණිස කාලය සළකා මෙපමණ වේලාවකින් මේ බමුණා පහදවන්නෙමි'යි පැමිණියෙමි. බමුණාද දොම්නස පළ කළේය. දැන්, ඒ අසතුටින් මා කෙරෙහි සිත කෝපයට පත්ව, උතුම් දහම අවබෝධයට නොහැකිවන්නේ යැ'යි බමුණා පහදවන අයුරින්, ඔහුගේ අදහස ඉටුකරමින්, **අඤ්ඤෙන ච කෙවලිනං** ගාථාව කීහ. **කෙවලී** සියළු ගුණයෙන් පිරිපුන් බවයි. සියළු කාමාදි සංයෝගවලින්' තොරවීම යන තේරුමයි. සීලාදී බොහෝ ගුණ සමූහය සෙවීමෙන් - ඇසුරෙන් **මහෙසිං** වෙයි. සියළුම කෙලෙස් නැතිකළ බැවින් **ඛීණසවං** අත් පා හැසිරවීම් ආදීකොට ඇති, සියළු ආකාර වූ සැක - පසුතැවීම් සංසිඳවන ලද බැවින්, **කුක්කුච්ච වූපසන්තං** වෙයි. **උපට්ඨහස්සු** සේවය කරන්න, උවටැන් කරන්න, මෙසේ බමුණාගේ සිතෙහි පහළ වූ අදහස් අනුවම පවසති. ආහාර දෙන්නැ'යි ඉල්ලීමට නොවේ. ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

'මේ කිරිබත භාග්‍යවතුන් වහන්සේට ගෙනාවෙමි. මගේ කැමැත්තෙන්, එය වෙනත් කිසිවෙකුට දීමට මම සුදුසු නොවෙමි' යැයි

සිතු බමුණා අථ **කසසචාහං** යැයි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ, තථාගතයන් හෝ, තථාගත සව්වකුට හැර හෝ වෙනත් කෙනෙකුට දිරවිය නොහැකි බව දැන, **නඛාහං** යැයි කීහ. එහි **සදෙවක** වචනයෙන් කම්සැපයෙහි හැසිරෙන (දෙව්ලෝ පහට අයත්) දෙව් පිරිස සැළකේ. **සමාරක** වචනයෙන් සයවන කාමාවචර (පරනිම්මිත වසවත්ති) දෙව් පිරිස ගැනේ. **සබහමක** වචනයෙන් රූපාවචර බඹ පිරිස අදහස් වේ. අරූපාවචර බ්‍රහ්මයන් අනුභව කරතියි සිදුවිය නොහැක්කකි. **සසසමණ බ්‍රාහමණි** යන වචනයෙන් සසුනෙහි නොපැහැදුණු, පසමිතුරු (වෙනත් සමයවාදී) මහණ බමුණන් සැළකේ. පව් දුරු නොකළ මහණ බමුණු පිරිසය. **පජා** යන වදනින් සත්වග ගැනේ. **සදෙව මනුසස** වචනයෙන් දෙවියන් ලෙස පිළිගෙන ඇති හා ඉතිරි මිනිස් සමූහය (අදහස් වේ.) මෙසේ මුල් වචන තුනෙන් දක්නට ලැබෙන ලෝකයත්, දෙවන වර පජා ලෙසින් ඉතිරි සජීවී ලෝකයත් ගන්නා ලදැයි දතයුතුය. මේ කෙටියෙන් සඳහන් කිරීමයි. විස්තර ආලවක සූත්‍රයෙහිදී සඳහන් කරන්නෙමි. දෙවියන් ආදී කවරකුට හෝ මැනවින් දිරවිය නොහැක්කේ කුමක් නිසාද? සියුම් දෙව් රසඕජා බහාලන ලද බැවිනි. භාග්‍යවතුන් වහන්සේ උදෙසා මෙම කිරිබත වෙන්කොට ගත් විගසම දෙවියන් විසින් දෙව් රස ඕජා බහාලන ලද බැවිනි. සුජාතාවගේ කිරිබතෙහිද චුන්ද සූකරමද්දව පිසිනවිටද වෙරඤ්ජාවෙහිදී භාග්‍යවතුන් වහන්සේ විසින් අතට ගත්, අතට ගත් ආහාර පිඬුවලද, හෙසජ්ජකඛන්ධකයෙහි සඳහන් කචචාන හිමියන්ගේ හකුරු තිබූ කළයෙහි ඉතිරි වූ හකුරුවලද එසේ සියුම් රස ඕජා බහාලන ලද ඒ ආහාර දෙවියන්ටද දිරවන්නේ නැත. දෙව් සිරුරු සියුමැලිය. දෙවියන්ට මිනිසුන්ගේ දළ ආහාර මැනවින් දිරවිය නොහේ. මිනිසුන්ගේ සිරුරු රළුය. ඔවුන්ට සියුම් දිව රස ඕජා බහාලූ ආහාර මැනවින් දිරවාගත නොහැකිය. තථාගතයන් වහන්සේට (කුස තුළ ඇති) උණුසුමෙන් සොබාවිකවම ආහාර දිරවීමට පත්වෙයි. ඇතැම් කෙනෙක් කාය බලයෙන් හා නුවණ බලයෙන් (දිරවන බව) කියති. තථාගත සව්වන් වූ රහතන් වහන්සේලාට සිත එකඟතා බලයෙන්ද, පමණ දැන වැළඳීම නිසාද දිරවාගත හැකිය. අනෙක් ඉඳුබල ඇත්තවුනටද එසේ ආහාර දිරවාගත නොහැකිය. මේ කරුණ සිතිය නොහැකි තරම් වුවත් බුදුවරුන්ගේ වෙසෙස් බව එයයි.

**තෙන හි ත්වං** යම්සේ වෙනත් කෙනෙකුද නොදක්නෙම් නම්, මටද කැප නොවේ නම්, මගේ සව්වන්ටද අකැපය. 'එහෙයින් බමුණ,

ඔබ' යැයි වදාළහ. **අප්පහරිතෙ** කොළපැහැ තණකොළ අඩු, තණකොළ නොවැඩුණු තැනක හෝ ගල්තලාවක් බඳු තැනක හෝ **අප්පාණකෙ** කිරිබත ඉවතලීමෙන්, ඒ නිසා මැරෙන ජීවීන් නැති තැනක හෝ බොහෝ ජලය ඇති තැනක, තණකොළ ඇසුරුකොට වසන ජීවීන්ද තණකොළද රැකෙනු පිණිස එසේ කියන ලදී. **චිච්චිටායති චිටචිටායති** එසේ හඬ නැගේ. **සන්ධූපායති** හාත්පස දුම් දමනු ලබයි. **සමපධූපායති** එතැනම වඩ වඩාත් දුම් දමනු ලබයි. කුමක් නිසා මෙසේ සිදුවීද? භාග්‍යවතුන් වහන්සේගේ බලමහිමයෙනි. ජලයෙහි, කිරිබතෙහි, බමුණාගේ, වෙනත් දෙවියන්ගේ, යකුන්ගේ බලයෙන් නොවේ. භාග්‍යවතුන් වහන්සේ බමුණාට දහම් සංවේගය (කුතුහලය) පිණිස එසේ අදිටන් කළහ. **සෙය්‍යථාපි නාම** උපමා නිදසුන් කොට දැක්වීමක් පමණි. යම්සේ ඵාලො (නගුල් තලය) උපමා කොට එපමණකින් කියන ලද පරිදිය. **සංවිග්ගො** සිතින් **ලොමහට්ඨජාතො** සිරුරෙහි ඇති අනූනවදහසක් ලෝමකූප රන් බිත්තියෙහි සවිකළ මැණික් කොකු මෙන් උඩට නැංගේය. ඉතිරි කරුණු පහසුය. **පාදෙසු නිපතිත්වා** (පා මුල්හි වැතිර) භාග්‍යවතුන් වහන්සේගේ දහම් දෙසුම මැනවින් සතුටුව පිළිගනිමින්, **භගවන්තං එතදවොච, අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම** යැයි කීය. මෙම අභික්කන්ත වචනය ගැන විස්තර මංගල සූත්‍ර කතාවේදී දැක්වේ. මෙහිදී ඉතා මැනවින් එම කරුණු පිළිගන්නා අයුරු 'පින්වත් ගොතමයන් වහන්ස, ඉතා යහපත්ය, ඉතා අගනේ'යැයි කියන ලදැයි දතයුතුය.

**භයෙ කොධෙ පසංසායං තුරිතෙ කොතුහලච්ඡරෙ**
**හාසෙ සොකෙ පසාදෙ ච කරෙ ආමෙණ්ඩිතං බුධො**

භය, තරහ, පැසසුම, ඉක්මන් බව, කුතුහලය, පුදුමය, සතුට, දුක, පැහැදීම දැක්වීමට එකම වචනය කිහිප වරක්ම කියන්නේය. 'මේ අනුව මෙහිදී එම වචනය දෙවරක් කියන ලද්දේ පැහැදුනු සතුටින්ද, පැසසුම් ලෙසදැයි දතයුතුය. නැතහොත් අභික්කන්ත යනු බොහෝ සිත් අලවන, වඩාත් සිත්ගත්, මනාප වූ ඉතා සොඳුරු අදහසින් කියන ලදී. එහි අභික්කන්ත යැයි එක් වචනයකින් දෙසුමට තුති කරයි. නැවත, ඒ වචනයෙන්ම තම පැහැදීම පළ කරයි. මෙහිදී අදහස් කරන්නේ මෙයයි. 'ඉතා හොඳින් වැටහුණ, පින්වත් ගොතමයන් වහන්ස, දහම් දෙසුම ! මා පැහැදුණ පින්වත් ගොතමයන් වහන්ස, ඔබ වහන්සේගේ දහම් දෙසුම ඇසීමෙන් ! මෙසේ එක වචනයෙන් අදහස් දෙකක් දැක්වෙන පරිදි

භාග්‍යවතුන් වහන්සේට තුති කළ සැටියි. පින්වත් ගොතමයන් වහන්සේගේ වචනය මැනවින්ම වැරදි නසන සුළුය. මැනවින් යහගුණ වඩන සුළුය. එසේම සැදැහැ වැඩීමෙන්, නුවණ වැඩීමෙන්, අරුත් සහිතව, පැහැදිලිව, වැටහෙන වචනවලින්, ගැඹුරු ලෙසින්, සවනට සුව දෙමින්, ලෙන්ගතු බැවින්, තමන් උසස් යැයි නොදක්වමින්, අනුන් පහත් කොට නොසළකමින්, කරුණා දයා සිහිලසින්, තියුණු නුවණ ලැබීමට යොමු කෙරෙමින්, හමුවීම (හමුවූ මොහොත) සොඳුරු බවද, වැරදි මත දුරු කෙරෙමින්ද, ඇසීමේ මිහිරි බවද තවදුරටත් විමසා බැලීමට හැකිවීමද ආදී ලෙසින් යොදාගත යුතුය. එයින් පසුවද උපමා සතරකින් දේශනයට පසසයි. **නික්කුජ්ජිතං** යටිකුරු කොට තබන ලද දෙයක්, මුණින් හරවා තිබූ දෙයක්, **උක්කුජ්ජෙය්‍ය** උඩට හරවන්නේය. **පටිච්ඡන්නං** තණකොළ ආදියෙන් වසා ඇති දෙයක්, ආවරණය කොට ඇති දෙයක්, **විවරෙය්‍ය** විවර කරන්නේය, **මූළ්හස්ස** යා යුතු දිසාව නිවැරදිව නොදන, **මග්ගං ආචික්ඛෙය්‍ය** අතින් අල්ලාගෙන, මේ මග යැයි කියන්නේය, **අන්ධකාරෙ** අවපස දහහතරවන දින රැයෙහි - රැය අඩක් ගෙවුනු පසු, අතුපතුර ඝනව වැඩුණු කැලෑවක, වැසි වළාකුලෙහි සිවු ආකාර මහ අඳුර, මේ එහි වචනවල තේරුමයි. අදහස් වන කරුණු මෙසේය. කිසියම් කෙනෙකු යටිකුරු කළ දෙයක් උඩට හරවනු ලබයිද එසේම යහපත් දහමෙන් ඉවත්ව අදහමට යොමුවුණු මා අදහමින් නගා සිටුවමින්, සැඟවූ දෙයක් විවර කරන්නා සේ කසුප් බුදුසසුන අතුරුදන් වූ කාලයේ පටන් මිසදිටු බවින් වැසුනු සසුන හෙළිදරවු කොට දක්වමින්, මං මුළා වූවෙකුට මග පහදා දෙන්නා සේ වැරදි මිසදිටු මග යමින් සිටි මට සගමොක් මග පහදා දෙමින්, අඳුරෙහි තෙල් පහනක් දරන්නා සේ මෝහය නැමති අඳුරෙහි ගැලී සිටි මට බුදුන් ආදී කොට ඇති රුවන් රූ නොදකිමින් වැසී තිබුණු මොහඳුර දුරු කිරීමට දේශනා පහන දරමින් පින්වත් ගොතමයන් වහන්සේ නොයෙක් ආකාරයට දහම් කරුණු පෙන්වා දෙමින්, ඒ අසුබ දෙයම (පසුව දහම දැන ගැනීම නිසා) සුබ යැයි, යහපතකැයි වෙනස් අයුරින් වටහා දීම, යටිකුරු කළ දෙයක් උඩුකුරු කොට දැක්වීම වැනිය. එහි ඇතිවීමට හේතු දැක්වීමෙන් දුකෙන් සැපය වේයැයි වෙනස් අයුරින් වටහා දීම සඟවන ලද දෙයක් විවරකොට දැක්වීම වැනිය. එහි හේතුව නැතිකිරීම දැක්වීමෙන් 'පවත්නා බව' (අරමුණ වූ නිවන) වෙනස් අයුරින් වටහාදීම මුළා වූ කෙනෙකුට මඟ පෙන්වීම වැනිය. එසේ මග පෙන්වීමෙන් 'මම ය මාගේය' යනුවෙන් වූ ආත්මීය හැඟීම' තමාට ද අයත් නොවන බව වෙනස් අයුරින් වටහාදීම අඳුරෙහි පහනක් දැල්වීම

බඳුය. එහෙයින් **සෙය්‍යථාපි නිකකුජ්ජිතං වා උකකුජ්ජෙය්‍ය -පෙ- පජ්ජෝතං ධාරෙය්‍ය චකඛුමනෙතා රූපානි දකඛිනතී** යැයි මෙසේ පවසන ලද්දේ වෙයි. මෙහි සැදැහැව, තපස හා කාය සංවරයෙහි පිහිටීම මගින් සීල සමූහයම (ඇතුලත් කොට) කියන ලදී. නුවණින් (පඤ්ඤා) එහි සියළුම කොටස් ද ලජ්ජා (බය) හා සිත ආදියෙන් සමාධිය (සියළුම කොටස් ද) හෙවත් සිත එකඟ බවද, කෙලෙසුන් දුරු කිරීමෙන් නිවන ද යනුවෙන් මෙසේ කොටස් (සමූහ) තුනක් ලෙස ද, බුදධාදී උතුමන් ගත් ඒ මග නිවන ද යනුවෙන් සමානරූපීව - ගැළපෙන පරිදි (සිවුසස් අතුරෙන්) දෙකක් සඳහන් කරන ලදී. එහි මග හේතුවට (සමුදය) පටහැනි වේ. (නොගැළපේ) නිවන දුකට පටහැනි වේ යැයි මේ ආකාරයෙන් සිවුසස් දහමම පැහැදිලි කරන ලදී. එහෙයින් **අනෙක පරියායෙන පකාසිතො හොති** යැයි දතයුතුය. **එසාහං** ආදී තැන්වල එසො අහං = එසාහං, **සරණං ගච්ඡාමි** දෙපා මුල වැතිරී, නමස්කාර කොට බුදුසරණ ගියද, දූත් වචනයෙන්ද සමාදන් වෙමින්, බුදුසරණ මුල්කොට, ඉතිරි දහම් සඟුන්ද සරණ යමි'යි කීය. **අජ්ජතගෙග** අද පටන් අජ්ජදගෙග යන වචනයෙහි 'ද' පද සන්ධි කිරීමට යොදා ඇත. පාණෙහි උපෙතං = **පාණුපෙතං** යම්තාක් කල් මා ජීවත්වෙම්ද, ඒතාක්ම වෙනත් සමයවාදයකට නොපැමිණ තෙරුවණෙහි සරණ යමි. **සරණං ගතං මං භවං ගොතමො ධාරෙතු** තිසරණ සමාදන් වූ කෙනෙකු ලෙස සළකා ගන්නා සේක්වා! මෙපමණකින්, ඔහු විසින් අසන ලද කරුණට (අදාලව බුදුරදුන් විසින් පැහැදිලි කරන ලද පරිදි සතුටුව) ඔහුගේ පටිචාරය - පිළිවෙත දක්වන ලදී. 'යටිකුරු කරන ලද දෙයක්' ආදී ලෙසින් ගුරුවරයෙකු හෝ නිවැරදි මගපෙන්වන නායකයෙකු සේ අගයමින් ඒ මග අනුව යන සිසුවෙකු බව ද දක්වන ලදී. ඔහු විසින් මැනවින් නුවණ ලදැයි ද දක්වා මෙයින් (කරුණු විමසා බලා අචල වූ) සැදැහැති කෙනෙකු බවද තහවුරු කරන ලදී. දූත් මෙසේ සැදැහැවත් වූ නුවණින් යුතු කෙනෙකු විසින් කළයුතු යම් දෙයක් වෙත්ද, එය සිදුකරනු කැමතිව **ලභෙය්‍යාහං** යනුවෙන් ඉල්ලීමක් කරනු ලැබීය. එහිදී භාග්‍යවතුන් වහන්සේගේ ඉඳුබල ආදියට වඩාත් පැහැදුණු සිතින් උන්වහන්සේද සක්විති රජකම හැර පැවිදි වූ සේක. (එසේනම්) මා වැනි කෙනෙකු මෙපරිදිම සිටිය යුතුදැ'යි සැදැහෙත්ම **පබ්බජ්ජං** ඉල්ලයි. එහි පිරිපුන් බව පතන නුවණින් **උපසමපදං** ඉතිරි වචන පහසුය. **එකො වුපකටෙඨා** ආදී සඳහන් තැන්වල **එකො** කාය විවේකයෙන්, (යැයි තේරුම්ගත යුතු) **වූපකටෙඨා** සිතෙහි විවේකයෙන්, **අපපමතෙතා** කමටහනෙහි සිත නොවෙනස්ව, **ආතාපී** කායිකව, මානසිකව හා

උත්සාහයෙන් (කෙලෙස් හට නොගන්නා පරිදි) **පහිතතෙතා** සිරුරෙහිද, ජීවිතයෙහිද බලාපොරොත්තු නැතිව, විහරනෙතා එක්තරා ඉරියව් පැවැත්මෙන්, **න චිරසෙසව** පැවිද්ද හා සමානකොට කියයි. **කුලපුත්තා** ඉපදීමෙන් ද යහපත් හැදියාවෙන් යුතු ද යනුවෙන් කුලපුතුන් දෙයාකාරය. මෙහිදී ඒ දෙකොටසසම සැළකේ. **අගාරසමා** ගෙදරින්, ගිහිගෙයට සිත ඇලුනේ, අගාරානං හිතං = අගාරියං ගොවිතැනින්, ගව පාලනය ආදියෙන් පවුල් හදාවඩා රැකගැනීම (අඹුදරු රැක්ම) අදහස් කරයි. එහි නොඇලුනේ 'අනගාරියං' වේ. පැවිදිබවට සමාන වචනයකි. **පබ්බජනති** පැමිණෙති. එළඹෙති. තං අනුත්තරං **තදනුත්තරං** එය උතුම්ය, **බ්‍රහමචරිය පරියොසානං** මගපිළිවෙත් බඹසර අවසානයේ රහත්ඵලය සඳහා කියන ලදී. එය ලබනු පිණිස කුලපුත්තු පැවිදි වෙති. **දිටෙඨව ධමෙම** ඒ ජීවිත කාලය තුලදීම, **සයං අභිඤ්ඤා සච්ඡිකත්වා** තමා විසින්ම නුවණින් පිරිසිඳ දැන, එයින් ඔබ්බට (සසර ගමන ගැන) කළයුතු දේ නැති බව දැන, **උපසම්පජ්ජ විහාසි** පැමිණ, කටයුතු සම්පාදනය කොට වසයි. මෙසේ වාසය කරමින්ද, **ඛීණ ජාති -පෙ- අබ්භඤ්ඤාසි** එයින් (කසී) භාරද්වාජ හිමිගේ නුවණින් විමසා බැලීමේ නියැලි බව පෙන්වයි. කෙසේ ඉපදීම නැති කළේද? භාරද්වාජ තෙරුන් වහන්සේ එය කෙසේ වටහාගත් සේක්ද? එය මෙසේ දක්වනු ලැබේ. පෙර භවයට අදාල කමම සිඳලන තෙක් අතීත ඉපදීම් (සබඳතා) නැති වූයේ නොවේ. සෝවාන් ආදී මගපලයකට සිත නොවැඩූ විට රූපී, අරූපී කාමාවචර භවයන්හි යම් ඉපදීමක් වන්නේ ද, රූප, වේදනා ආදී පස් ආකාර වූ සමූහයෙන් එක් කොටසක්, එයින් සතර කොටසක් හෝ පස්කොටසම එකතුවෙන් (එකවතු පඤ්චවොකාර භව) උපත වේ. එහෙත් (තමන්) මගපලයට පත්වන අයුරින් වඩන ලද බැවින් (සසරෙහි පුරුදු කරන ලද බැවින්) නැවත හට නොගන්නා ලෙසටම සකස් වූ බැවින් නැතිකර දමන ලදී. භාරද්වාජ තෙරුන් වහන්සේ ඒ මගපල වැඩීමෙන් නැතිකර දැමූ කෙලෙස් ගැන නුවණින් විමසා බලා කෙලෙස් රහිත වුවද, නැවත භවයක පිළිසිඳ නොගන්නා බව දැනගැනීම ජානාති (යන්නෙන් හැඟේ) **වුසිතං** ආවරණය කරන ලද - වසන ලද, (සිත, කය වචනය) මැනවින් හසුරුවන ලදී. (සසර ගමන) නිමවී යැයි තේරුමයි. **බ්‍රහමචරියං** මගපල සඳහා වූ උතුම් හැසිරීමයි. **කතං කරණීයං** සිවුසස් දහම සිවු මගින් පිරිපුන්ව දැනීම නැතිකිරීම, අවබෝධය හා වැඩීම යනුවෙන් සොළොස් ආකාර වූ කටයුතු නිමවීය යන තේරුමයි. (ඒ ඒ මගපල අනුව දුරුවන කෙලෙස් පිළිබඳව සිවු ආකාරයට බලන අයුරුය.) **නා පරං ඉත්ථත්තාය** දැන් මෙම ජීවිත කාලය තුල මෙසේ සොළොස් ආකාර

කටයුතු පරිදි කෙලෙස් නැති කිරීම හෝ මග අරමුණු කොට වැඩීමක් නැත. නැතහොත් **ඉත්ථත්තාය** - මෙම ජීවිතයෙන් පසු, දැන් පවත්නා මෙබඳු රූපාදී සමූහයක පැවැත්ම හෝ ඊට පසු එහි පවත්නා බවක්ද නැත. ඒ පිළිබඳව මනා දැනීමෙන් සිටින හෙයින්, මුල සිඳින ලද ගසක් මෙන් (නැවත නූපදිනා බව) මැනවින් දැනගත්තේය. **අඤ්ඤතරො** එක්තරා **අරහතං** රහත් බවට පත් උතුමන්, මහ සව්වන් අතරෙහි ගරු කටයුතු භාරද්වාජ තෙරුන් වහන්සේද වූහ යයි මෙහි අදහස් කෙරේ.

**කසීභාරද්වාජ සූත්‍ර විස්තරය නිමි.**

# 1.5

**පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං** යනු චුන්ද සූත්‍රයයි. එය දේශනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? තම අදහස පරිදි, අනුන්ගේ අදහස පරිදි, අදාල තැනට ගැළපෙන පරිදි, විමසීමකට පිළිතුරු ලෙස යන සිවු ආකාරයෙන් වූ (දහම් දෙසුම් අනුව) කෙටියෙන් සඳහන් කළොත්, මෙම සූත්‍රය විමසූ කරුණකට පිළිතුරකි. සවිස්තරව දක්වතොත් මෙසේය. එක් කලක භාග්‍යවතුන් වහන්සේ මල්ල ජනපදයෙහි චාරිකා කරද්දී, බොහෝ පැවිදි පිරිසක් සමග පාවා නුවර වැඩ විසූහ. භාග්‍යවතුන් වහන්සේ පාවා නුවර චුන්ද නම් ලෝකුරු පුතුගේ අඹවනයෙහි වෙසෙති. 'ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පා සිවුරු ගෙන, බික්සඟන සමග චුන්ද නම් ලෝකුරු පුතුගේ නිවසට වැඩියහ. පැමිණ පනවන ලද අසුනෙහි වැඩහුන්හ' යනුවෙන් මෙතැන් පටන් (උදාන) සූත්‍රයෙහි සඳහන් අයුරින්ම විස්තර කළ යුතුය. මෙසේ බික්සඟන හා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කල චුන්ද ලෝකුරු පුතු උන්වහන්සේලා මනාව වළඳවමින්, එළවළු හොදි ආදිය සඳහා රත්රන් බඳුන් පිළිගැන්වීය. (මේ පිළිබඳ) සිකපද පනවා නොතිබූ බැවින්, ඇතැම් හිමිවරු රන් බඳුන් පිළිගත්හ. ඇතැම් හිමිවරු නොපිළිගත්හ. භාග්‍යවතුන් වහන්සේගේ එකම බඳුන ගලින් කරන ලද පාත්‍රයයි. ඒ හැර වෙනත් බඳුනක් බුදුවරු පරිහරණය නොකරති. එහිදී එක් පව්ටු මහණෙක්, සොර සිතින් තමන්ට ලබාදුන් දහසක් අගනා රන් බඳුන යතුරු බහාලූ පසුම්බියෙහි තැබුවේය. වළඳා අත සෝදා සිටි

භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරන චුන්ද, බික්සඟන දෙස බලනවිට ඒ මහණ දැක, නොදුටුවාක් මෙන්, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහිත්, තෙරුන් වහන්සේලා කෙරෙහිත් ඇති ගරුසරු බව නිසාත්, මිසදිටුවන්ට දොස් නොනැගීම පිණිසත් කිසිවක් නොපැවසීය. චුන්ද සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, 'පැවිදි වූවන් සංවර විය යුතු නොවෙත්ද? නැතහොත් බිඳුනු සංවරය ඇත්තේ මෙබඳු පැවිද්දන් දැ'යි පුච්ඡාමි මුනිං යනුවෙන් විමසීය.

පුච්ඡාමි විමසීම් තුන් ආකාරය. ඒ පිළිබඳව, නොදුටු දෙයක් එළිදරව් කරගැනීම ආදී ලෙසින් නිද්දෙසයෙහි දක්වා ඇති පරිදි වේ. මෙහිදී මුනි යන වචනයට 'මොන යනු නුවණට කියයි, යහපත් දැකීම ආදිය තියුණු නුවණින් දැනීමෙන් යුතු වූයේ 'මොන බවට පත්' - නුවණැති බවට පත් මුනිවරයා මේ, කය පිළිබඳ නුවණින් දැනීම ආදී ලෙස එය තුන් ආකාරය. 'මේ එහි සඳහන්ව ඇති පරිදි කෙටියෙන් දැක්වීමයි. පුච්ඡාමි අවසර ලබා ගැනීම පිණිස, **මුනිං** මුනිවරයාණෙනි, භාග්‍යවතුන් වහන්සේට ඇමතීමයි. **පහූත පඤ්ඤං** ආදිය තුති වචනයි. අගය කිරීමයි. එහි **පහූත පඤ්ඤං** - මහත් නුවණැති බවයි. දැනීම කෙළවර කොට ඇති බැවින්, බුදුරදුන්ගේ නුවණෙහි පිරිපුන් බව දතයුතුය. **ඉති චුන්දො කම්මාර පුත්තො** මෙය ධනිය සූත්‍රයෙහි කියන ලද පරිදිය. මෙයින් පසු එපමණ කරුණු නොදක්වා, කලින් විස්තර වූ කරුණු අත්හැර සඳහන් නොකළ කරුණු දක්වන්නෙමි. බුද්ධං තුන් බුදුවරුන් අතුරෙන් සම්මා සම්බුදුරජාණන් වහන්සේ, ධම්මසාමි මගපල දහම උපදවන ලද බැවින්, පුතකුට පියකු මෙන්, සිප්හල් ආදියට ගුරුවරයෙකු මෙන්, දහමට හිමිකරු වූ, දහමට ඉසුරු වූ දහමෙහි රජ වූ දහමෙහි වසඟයෙහි පවත්නා වූ යන තේරුමයි. මෙසේ ද කියන ලදී. 'සො හි බ්‍රාහමණ, භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ, මග්ගකොවිදො, මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති, පච්ඡා සමන්නාගතා' - බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ, නොතිබූ මගක් සකස් කරන ලදහ. හඳුනා නොගත් මගක් හඳුන්වා දෙමින්, නොකියූ මගක් පහදා දෙමින්, ඒ මග දන්නා වූ, එහි නුවණැති වූ, එම මගෙහි සමත්කම් දැක්වූ සේක. දැන් උන්වහන්සේගේ සව්වෝද ඒ මග අනුගමනය කරති. **වීතතණ්හං** කාම, භව, විභව තණ්හා දුරු කරන ලද, **දීපදුත්තමං** දෙපා ඇත්තවුන් අතුරෙන් උතුම්, භාග්‍යවතුන් වහන්සේ දෙපා ඇතියවුන් අතුරෙන් පමණක් උතුම් නොවේ. යම්තාක් හිඳ නොමැති හෝ හැඟීම්

රහිත (බ්‍රහ්මාදීන්) දක්වාම ඒ සියල්ලන්ටම වඩා උතුම්ය. එමෙන්ම සියළුම ලෝකවාසීනට වඩා උසස්ම යැයි දක්වීමට දෙපා ඇත්තවුන් අතුරෙන් උතුම්ම යැයි කියති. දෙපා ඇත්තවුන් අතර, උසස් වූ සක්විති රජු, පසේ බුදුවරුන් උපදනා බැවින් ඔවුන් අතුරෙන් ද, හැමදෙනාටම වඩා උසස්ම යැයි කියන ලදී. **සාරථීනං පවරං** හසුරුවයි, හසුරුවන්නා යන තේරුමෙන් සාරථී ය. ඇතුන් හික්මවන්නන් ආදීනට සමාන වදනකි. භාග්‍යවතුන් වහන්සේ සියළු කෙලෙසුන් දමනය කරන ලද බැවින්, මිනිසුන් ඇතුන් ආදීන්ද හික්මවීමට හැකියාව ඇති බැවින්, ඔවුන්ටද වඩා උසස් වෙති. 'හත්‍ථිදමකෙන භික්ඛවෙ හත්‍ථිදම්මො සාරිතො එකං එව දිසං ධාවති පුරත්‍ථිමං වා පච්ඡිමං වා උත්තරං වා දක්ඛිණං වා, අස්ස දමකෙන භික්ඛවෙ අස්සදම්මො, -පෙ- ගොදමකෙන භික්ඛවෙ ගොදම්මො -පෙ- දක්ඛිණං වා, තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මා සම්බුද්ධෙන පුරිසදම්මො සාරිතො අට්ඨ දිසා විධාවති, රූපී රූපානි පස්සති, අයමෙකා දිසා -පෙ- සඤ්ඤාවෙදයිත - නිරොධං උපසම්පජ්ජ විහරති, අයං අට්ඨමී දිසා 'මහණෙනි, ඇතුන් හික්මවන, ඇතුන් හසුරුවන්නෙක්, නැගෙනහිර දිසාවට හෝ බටහිර දිසාවට හෝ උතුරු දිසාවට හෝ දකුණු දිසාවට හෝ එවන් එක් දිසාවකට දුවයි ද, මහණෙනි, අසුන් දමනය කරන්නෙක් එම ගවයන් හික්මවන්නෙක්........ දුවයිද, මිනිසුන් දමනය කරන, හික්මවන, තථාගත අරහත් සම්මා සම්බුදුවරයාණන් විසින් (සත්වග හික්මවමින්, හසුරුවමින්) අට දිසාවටම යොමුවෙති. රූපී (ලොවෙහි) රූ දකී. මේ එක් දිසාවකි.... දුනීම් විරහිතව, ඒ බව දන්නා සමවතට පැමිණ වාසය කරයි. මේ අටවන දිසාවයි' යනුවෙන් එහෙයින් කියන ලදී. **කත්‍ථි** විස්තර සහිතව තේරුම විචාරීමයි. **ලොකෙ** ජීව ලෝකයෙහි **සමණ** යනුවෙන් විචාරීමට අදාල වන කරුණ දක්වයි. **ඉංඝ** - පවසන ලෙස හඟවන නිපාත පදයකි. **තදිංඝ** එය කියනු මැන. බෲහි කියනු මැන, පවසනු මැනවි.

මෙසේ කී කල භාග්‍යවතුන් වහන්සේ, චූළ ලෝකුරු පුතු විසින්, හිමියනි, කුසලය කුමක්ද? අකුසලය කුමක්ද? ආදී ලෙසින් ගිහි ජීවිතයට අදාල පැනයක් නො අසා, මහණකමට අදාල පැනයක් විචාරනු ද විමසා බලනවිට, 'ඒ පාපී පැවිද්දා නිසා මෙසේ අසන' බව දුන, වහරට අනුව මහණකු නොවන අයුරු **චතුරො සමණා** යැයි වදාළහ. චතුරො යනු ගණනින් දක්වීමයි. (සිවු ආකාරයැයි කීහ) **සමණා** මේ වචනයෙන් ඇතැම්විට භාග්‍යවතුන් වහන්සේද, තීර්ථකයන් හඳුන්වනු ලබති. 'බොහෝ මහණ බමුණන්ගේ ඒ ඒ වත් පුදුම එළවන සුළු යහපත් දේය' යානි තානි

පුථු සමණ බ්‍රාහමණනං වතකුතුහලමංගලානි' යැයි එසේ දක්වේ. ඇතැම්විට පොදු ජනතාව මෙසේ කියනු ඇත. 'මහණෙනි, මහණුන් මහණුන් ලෙස ඔබලා ජනයා හඳුන්වයි' 'සමණ සමණති වො භික්ඛවෙ ජනො සඤ්ජානාති' 'මහණෙනි, පළමු මහණ ද මේ සසුනෙහිමය. දෙවන මහණද මේ සාසනයෙහිය.' 'ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො' එයින් මගපල ලැබීම පිණිස දහමෙහි හික්මෙන අරුතින් යෙදේ. ඇතැම්විටක කෙලෙසුන් දුරුකරන ලද උතුමන් හැඳින්වීමටද 'ආසවානං ඛයා සමණො හොති' යැයි සමණ වචනය සඳහන්ය. තවත් තැනක තමන් වහන්සේ ගැන දක්වීමටද සමාන වචනයක් ලෙස 'සමණොති, භික්ඛවෙ තථාගතස්සෙතං අධිවචනං' යොදති. මෙහි පද තුනකින්, උතුම් සිල්වත් මගපල නොලත් සියල්ලන් ද, සිවුවන පදයෙන් නියම පැවිදි දිවිය නොවූවත්, හිස බූ ගා කහවතක් කරෙහි දමූ, නමින් පමණක් සමණයෙකැයි වහරට අනුව සැළකෙන බැවින්, **චතුරො සමණ** යැයි කීහ. **න පඤ්චමත්ථි** මේ දහම් විනයෙහි නමින් පමණක් හඳුන්වන හෝ, මහණකු නොවී හැඳින්වීමක් ලෙස හෝ පස්වැනි මහණ කෙනෙකු නැත. **තෙ තෙ ආවිකරොමි** ඒ මහණුන් සිවුදෙනා ගැන ඔබට පැහැදිලි කරමි. **සක්ඛි පුට්ඨො** හමුවී විමසන ලද්දෙ, **මග්ගජිනො** මගපලයෙන් සියළු කෙලෙස් පරදවන ලදැයි යන තේරුමයි. **මග්ග දෙසකො** අනුන්ට ඒ මග පෙන්වාදෙන **මග්ගෙ ජීවති** (සතරමග සතර පලයෙහි) හික්මෙන්නා වූ සත් කොටසම ලොවුතුරා බවට පත්වුවත්, (රහත් පලය ලබන තෙක්) මුළුමනින් ගමන් මග අවසන් නොකරයි. මගපල නොලත් සිල්වත් ජනයා ලෝකයෙහි (සසර) ගමන් මගෙහිම ජීවත් වෙයි. (සසර සැරිසරයි) ඔවුන් ලොවුතුරා මග නිමිතිකොට කටයුතු කරත්ද මගෙහි ජීවත් වෙතියි දතයුතුය. **යො ච මග්ගදූසී** සිල්වත් නොවූ මිසදිටු තැනැත්තෙකු නොමග පිළිවෙතෙහි හැසිරීම මග අපිරිසිදු කරන්නේ යැයි තේරුමයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, 'මේ මග දිනූ තැනැත්තාය, මේ මග පෙන්වාදෙන තැනැත්තාය, මේ මග ජීවත්වන තැනැත්තාය, මේ මග අපිරිසිදු කරන තැනැත්තා යැයි කෙටියෙන් පෙන්වා දුන්විට, එය වටහාගත නොහැකි වූ චුන්ද **කං මග්ගජිනං** යනුවෙන් ඇසීය. එම ගාථාවෙහි **මග්ගෙ ජීවති** මෙ ඒ මගෙහි ජීවත්වන තැනැත්තා ගැන මට **බෲහි පුට්ඨො** වදාළ මැනවි. ඉතිරි කරුණු පැහැදිලිය.

මීළඟට භාග්‍යවතුන් වහන්සේ සමණ හතරදෙනා ගැන ගාථා

හතරකින් පෙන්වා දෙමින් යො **තිණ්ණකථංකථො** යැයි කීහ. එහි **තිණ්ණකථංකථො විසල්ලො** යන්න උරග සූත්‍රයෙහි සඳහන් වූ පරිදිය. වෙනස් මෙයයි. යම්හෙයකින් මේ ගාථාවෙහි **මග්ගජිනො** යැයි සමණයෙකු වූ බුදුරදුන් වහන්සේ අදහස් කරන ලද්දේද (බුද්ධ සමණ) ඒ අනුව සියල්ල දන්නා නුවණින් සැක දුරු කිරීමට සුදුසු සියළු කරුණු මනාව දත් බැවින්ද සැකයෙන් වෙන්වී ඇතැයි දතයුතුය. පෙර කියන ලද පරිදි, සැක දුරු කරන ලද මුත්, සෝවාන් පල ලද්දෝ, පසේ බුදුබවට පත්වූවෝ, සකෘදාගාමි බවෙහි හෝ, බුදුබවට අදාලව ලබන ලද නුවණ අනුව ඒ ඒ ආකාරයෙන් සැක දුරු කරති. (බුදු බව ලත් බැවින්) භාග්‍යවතුන් වහන්සේ මුළුමනින්ම සැක දුරුකරන ලදහ. **නිබ්බාණාභිරතො** නිවණෙහි ඇලුණේ, පල සමවත් ලෙසින් හැමකල්හිම, නිවණට නැඹුරු සිත ඇතැයි යන අරුතයි. භාග්‍යවතුන් වහන්සේ එබඳු වෙති. 'අග්ගිවෙස්සන, ඒ මම ඒ කතාව අවසානයෙහි, මුලින්ම වූ ඒ සමාධි නිමිත්තෙහි මම ම සිත පිහිටුවමි. එක්තැන් කර ගනිමි. රඳවා තබා ගනිමි'යි එසේ පරියොසානෙ තස්මිං යෙව පුරිමස්මිං සමාධිනිමිත්තෙ අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙමි, සන්නිසාදෙමි, එකොදිකරොමි, සමාදගාමි' **අනනුගිද්ධො** කිසියම් දෙයක් පිළිබඳව ආසාවෙන්, ගිජුබවෙන් නොඇලෙයි. **ලොකස්ස සදෙවකස්ස නෙතා** කෙලෙස් දුරුවෙන අයුරින් දහම් දෙසා පාරායණ, මහාසමය ආදී නොයෙක් දේශනාවලදී අපමණ දෙවි මිනිසුන්ට සිවුසස් අවබෝධයට මගපෙන්වා දෙමින් දෙවියන් සහිත ලෝකයා නිවණට යොමු කරවමින්, සසරින් එතර කරනු ලබන බැවින්, එතරට පමුණුවනු ලබන්නේය යන තේරුමයි. **තාදී** (ඉහත) කියන ලද පරිදි (අට)ලෝදහම්හි වෙනස් නොවන, කම්පා නොවන යන අදහසයි. ඉතිරි කරුණු පැහැදිලිය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මග ජයගෙන යන්නට මහණ වූ බුදුවරයා දක්වා මීළඟට කෙලෙස් නැතිකරන ලද මහණ ගැන කරුණු පහදමින්, **පරමං පරමන්ති** යැයි වදාළහ. **පරමං** නම් නිවනය. සියළුම කරුණකින්ම උතුම් යන අදහසයි. **පරමන්ති යොධ ඤත්වා** යම් කෙනෙක් ඒ උතුම් බව දන මෙම සසුනෙහි විමසුම් නුවණ මෙහෙයා, **අක්ඛාති, විභජති ඉධෙව ධම්මං** නිවන තමා විසින් අවබෝධ කරන ලද බැවින්, අනුන්ටද 'මේ නිවන' යැයි මගපිළිවෙත විස්තරකොට දක්වයි. 'මේ සිවු ආකාර වූ සිහිය පිහිටුවා ගන්නා අයුරුය, මේ අරි අටැඟි මගයැ'යි අවබෝධ කරගත හැකි නුවණැත්තන්ට මේ දෙආකාරයටම කෙටියෙන් පෙන්වා දෙයි. නුවණ මෙහෙයවිය හැකි තැනැත්තන්ට වැඩියෙන් කරුණු

සවිස්තරව බෙදා දක්වයි. මෙසේ පහදා දෙමින්, කරුණු බෙදා පැහැදිලි කරමින්ද 'මේ දහම මෙම සසුනෙහි මිස වෙනත් බාහිර සසුනෙක නැතැ'යි සීහනාද දෙමින් පහදයි. අකඛාති විභජති ඉධෙව ධම්මං යැයි එහෙයින් කීහ. තං කංඛච්ඡිදං මුනිං අනෙජං මෙබඳු සිව්සසු දැනවෙන - අවබෝධ වන තම දේශනයෙන්, අනුන්ගේ සැක දුරුවීමෙන් සැක පහව යයි. උසස් හික්මීමෙන් යුතු මුනිවරයා 'එජා' යැයි කියන ලද තණ්හාව නැති කළ බැවින් 'අනෙජ' නම් වේ. දුතියං භිකඛුනමාහු මගගදෙසි යැයි මේ ගාථාවෙන් මෙසේ උතුම් මග පහදා දෙන්නෙක් හා සමාන වේ. ලියකියවිලි කියවන රාජදූතයෙකු මෙන්, තම සසුන පවත්වාගෙන යමින්, සසුන බබුළුවයිද, මගගදෙසී යැයි රහත් සමණයෙකුද පෙන්වා දී මීළඟට මගපිළිවෙතෙහි හික්මෙන සමණයාද සිල්වත්, මගපල නොලත් සමණයාද සඳහන් කරමින් යො ධම්මපදෙ යන ගාථාව වදාළහ.

එහි පද විස්තර පැහැදිළිය. මේ තේරුම් දක්වීමයි. යො නිවන් දහම දෙන ලද, ධම්මපදෙ අන්ත දෙකම හැර, දේශනා කරන ලද බැවින් හෝ ඒ ඒ පුද්ගල අදහස් අනුව හෝ සිහිය පිහිටුවා ගැනීම ආදී ලෙස, නොයෙක් ආකාරයෙන් දේශනා කරන ලද පරිදි සුදෙසිතෙ, මගෙහි මනාව පිළිපන් බැවින් මගෙග ජීවති වේ. සීල සංවරයෙන් යුතු වූයේ සංයතො, කය ආදී (දොරටු) මනාව පිහිටුවා ගත් (මනාව හික්මවා ගෙන) බැවින් සිහියෙන් යුතුව සතිමා ඉතාම සුළු වරදක් වුව සිදු නොවී නිවරද බැවින්, කොටස් ලෙසින්ද පැමිණ අවබෝධය සඳහා වන කරුණු තිස්හතක්, අනවජ්ජපදානි (යැයි දක්වෙයි) කෙලෙස් දුරුවන අයුරු නුවණින් දැනගැනීමේ පටන් භාවනාවෙහි ඇසුර ලබන්නේ, එහි යෙදෙන්නේ සෙවමානො එබඳු මහණ භිකඛූනං තතියං මගගජ්විං යැයි ආහු කීහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාවෙන් මගගජීවිං යනුවෙන් 'සෙඛ, සීලවනත පුථුජ්ජන සමණ ගැන පෙන්වා දී දැන්, හිස බූ ගෑ කහවතක් කරෙහි දරූ නමට පමණක් හඳුන්වන මහණකු ගැන ඡදනං කතවා යනුවෙන් කීහ.

එම ගාථාවේ ඡදනං කතවාන යනු සුදුසු ලෙස පැවිද්දෙකු යැයි හැඟවෙන ආකාරයට, හඳුනාගැනීමට හැකි පරිදි පැවිදි ලකුණු දරා, සුබබතා බුදු පසේබුදු සව්වන්ගේ සොඳුරු පිළිවෙත් කියනු ලැබේ. පකඛන්දී ඉදිරියට පනින ඇතුලට පිවිසෙන්නා යන අරුතය. සිල්වත් නොවූ තැනැත්තා තම දුසිල් බව වසාගනු පිණිස, තණකොළ ආදියෙන් අසූචි

වසාලන්නා සේ මනා පැවතුම් ඇති බව ආවරණය කොට, 'මමත් පැවිද්දෙක්මි'යි පැවිදි පිරිස මැදට පිවිසෙයි. ලාභ හෙවත් ලැබුනු දේවල් බෙදා දෙන කල්හී 'මෙපමණ වස් ඇති පැවිද්දා මෙපමණ ගතයුතුය, මා මෙපමණ වස් ඇතියෙමි'යි ලබාගැනීමට ඉදිරියට පැන එයි. **ඡදනං කතාවාන සුබ්බතානං පක්ඛන්දි** යැයි එහෙයින් කියන ලදී. කැත් කුල ආදී කුල සතරෙන් ලද පැහැදීමට නුසුදුසු වන පිළිවෙතින් කිලිටි වේ යැයි **කුල දූසකො** වේ. පගබෙහා අට ආකාර වූ කයෙහි උඩඟු බවින්, සතර ආකාර වූ වචනය නිසා වන උඩඟු බවෙන්, නොයෙක් ලෙසින් වන සිතෙහි උඩඟු බවින් යුතු යැයි තේරුමයි. මේ මෙහිදී කෙටියෙන් සඳහන් කිරීමයි. වැඩි විස්තර මෙත්ත සූත්‍රයෙහිදී කියමු. තමා කරන දෙය සඟවන ලෙස කටයුතු කරන කපටි බවින් යුතු වූයේ **මායාවී**, සීලයෙන් හික්මුණු බවක් නැති, සංවරය නොමැති බැවින් **අසංයතො** වේ. හරයක් නැති කතාබහ **පලාපො**, ඇතුලත සහල් ඇටය නැති වුවත්, දහයියා පොත්ත නිසා වී ඇටය මෙන් දක්නා සේ, ඇතැම් කෙනෙක් ඇතුලතින් සීලාදී හරවත් ගුණදහම් නැතිවද, බාහිරව, හික්මුණු සිල්වතුන් සේ කය වසා පොරවා සමණ වෙස් ගෙන පෙන්වයි. ඒ මහණ හරයක් නොමැති බැවින් පලාපො යැයි කියනු ලැබේ. ආනාපාන සූත්‍රයෙහිදී 'මහණෙනි, පලාප බවින් තොරය. මහණෙනි, පලාප බවින් තොර වූ මේ පිරිස පිරිසිදුය. හරවත් බවෙහි පිහිටියේ යැයි 'අපලාපායං භික්ඛවෙ පරිසා, නිප්පලාපායං භික්ඛවෙ, පරිසා සුද්ධා සාරෙ පතිට්ඨිතා' වදාළහ. මෙසේ මගපල නොලද යහපත් තැනැත්තාද පලාප යැයි කියන ලදී. කපිල සූත්‍රයෙහිදී 'නියම අයුරින් මහණකු නොවී මහණකැයි සිතන බොල් අදහස පලවා හරිවු' 'තතො පලාපෙ වාහෙථ, අස්සමණෙ සමණමානිනො' - මෙසේ (මහණදමින්) පැරදුන තැනැත්තාටද පලාපො යැයි කියා ඇත. **පතිරූපෙන චරං ස මග්ගදූසී** ඒ යහපත් හික්මුණු බව සෙවනක් කොට හැසිරෙන තැනැත්තෙකු වෙත්ද, 'මොහු කැලයෙහි වාසය කරන්නෙකි, ගස්මුල්හි වසන්නෙකි, කසළ ගොඩවලින් සොයාගත් රෙදිවලින් සකස් කරගත් සිවුරු දරන්නෙකි. පිණ්ඩපාතයෙන් යැපෙන්නෙකි. අල්ප දිවිපෙවතක් ගතකරන, ලද දෙයින් සෑහීමට පත්වන්නෙකි යැයි ජනතාව දනී. මෙසේ මහණකමට සුදුසු පිළිවෙත පිටතට පෙනෙන පරිදි යහපත් හැසිරීම ඇතත්, නිසි ලෙස එසේ නොහැසිරෙන ඒ තැනැත්තා තමාගේ ලොවුතුරු මගටද, අනුන්ගේ යහපත් මගටද කෙලෙසන බැවින් මග කිලුටට පත් කරන්නේ යැ'යි දතයුතුය. මෙසේ මේ ගාථාවෙන් මග කිලිටි කරන්නේ යැයි දුසිල් යැයි හඳුන්වනු ලබන මහණකු දක්වා, දැන් ඒ මහණුන්

එකිනෙකට නොගැලපෙන බව සඳහන් කරමින්, **එතෙ ච පටිවිජ්ඣ** යැයි කීහ.

එහි අරුත මෙසේය. **එතෙ** සතරාකාර වූ මහණුන් ගැන ඉහත කියන ලද කරුණු අනුව **පටිවිජ්ඣ** දැනගත්තේය, වටහා ගත්තේය. **යො** ගහට්ඨො කැත් කුල හෝ බමුණකු හෝ වෙනත් කිසියම් කුලයකට අයත් තැනැත්තෙක්, මේ මහණුන් සතරදෙනාගේ ගති ලකුණු ඇසූ පමණින්ම සුතවා එම ලකුණුම බුද්ධාදී උතුමන්ගෙන් අසන ලද, බැවින්, **අරියසාවකො** ඒ සමණුන්ම මේ මේ ලකුණුවලින් හඳුනාගැනීමෙන් **සපඤ්ඤො** මේ පසුව කියන ලද මග කිලිටි කරන්නා, අනික් සමණයන්ද **සබ්බෙ නෙතා** දිසාති ඤත්වා **ඉති** දිසවා මෙසේ පව් කරන්නා වූද එම පවිටු මහණ දැක, එයින් අදහස් කරන්නේ මෙම කරුණය. ඇසූ පිරූ තැන් ඇති තෙරුවන් සරණ ගිය යම් නුවණැති ගිහියෙක් ඒ අයුරින් මුළුමනින්ම දැනගනී. **තසස** ඒ නුවණින්, සියල්ලන්ම එසේ නොවී වාසය කරති'යි දැන, **න හාපෙති** සද්ධා මෙසේ පව්කම් කරන පවිටු මහණකු දැක සැදැහැ බව (සිතින්) ඉවත් නොකරයි. නොනසයි. මෙසේ මේ ගාථාවෙන් ඒ ඒ වෙනස් බව දක්වා, එසේ දුටුවද, මෙබඳු නොවේ යැයි දන්නා වූ උතුම් - අරිය සාවකයා අගයමින් **කථං හි දුට්ඨෙන** යැයි කීහ. එහි අරුත් සබඳතාව නම්, මෙසේ ඇසූ පිරූ තැන් ඇති, කරුණු දන්නා අරියසාවකයාට, එබඳු එක් පවිටු දෙයක් කරන්නකු දැකද, සියල්ලන්ම එසේ නොවන බව දැනගනී. ඊට හේතු කවරේද? **කථං හි දුට්ඨෙන අසම්පදුට්ඨං සුද්ධං අසුද්ධෙන සමං කරෙය්‍ය** එහි අදහස නම් දහම් අසා පුරුදු, තෙරුවන් සරණ ගිය නුවණැති සාවකයෙක්, දුසිල් වූ, කිලිටි පිළිවෙතින් යුතු, අපිරිසිදු කය වචන හැසිරීමෙන් යුතු යැයි හඳුන්වනු ලබන මහණකු සහ අනෙක් පිරිසිදු මහණුන් සමග කෙසේනම් සමාන කෙරෙත්ද? **සමං කරෙය්‍ය** සූත්‍ර දේශනය අවසානයෙහි චුන්ද උපාසක මග හෝ පලයක් හෝ ලද බව නො කියැවේ. ඔහුගේ සැක දුරුවීම පමණක් ඉටුවීය.

චුන්ද සූත්‍ර විස්තරය නිමි.

# 1.6

**එවං මෙ සුතං** යනු පරාභව සූත්‍රයයි. එය දේශනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? 'භාග්‍යවතුන් වහන්සේ මංගල සූත්‍රයෙන් මිනිසුන්ගේ දියුණුවද සැප ලබන මගද ලෙස එක් කොටසක් පමණක් පවසන ලදී. පිරිහෙන කරුණු පෙන්වා දී නැත. මිනිසුන් පිරිහී, විපතට පත්ව වැනසෙන හේතු විමසන්නෙමු නම් මැනවැ'යි මංගල සූත්‍රය ඇසූ දෙවියන්ට සිතුණි. ඉක්බිති, මංගල සූත්‍රය දේශනා කරන ලද දිනට පසුදින දස දහසක් සක්වළ දෙවියෝ පිරිහීමට හේතු අසනු කැමතිව, මෙම එකම සක්වළෙහි රැස්ව, එක හිසකේ අගක තරම් තැනක දහසක්, විස්සක්, තිහක්, හතළිහක්, පනහක්, හැටක්, හැත්තෑවක්, අසූවක් සියුම් රූ මවාගෙන, සියළු දෙව් බඹ මිනිසුන්ගේ සිරියාවද තේජසද වඩාත් මැඩලමින්, පිරිහීමට හේතු අසනු පිණිස, පනවන ලද උතුම් අසුනෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටියහ. එහිදී සක්දෙවිඳුගෙන් අණ ලද එක්තරා දෙව්පුතෙක් භාග්‍යවතුන් වහන්සේගෙන් පිරිහීමේ කරුණු විචාළේය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඇසූ දෙයට පිළිතුරු ලෙසින් මෙම සූත්‍රය දේශනා කළහ.

එහි **එවං මෙ සුතං** යයි ගරුකටයුතු ආනන්ද හිමි විසින් කියන ලදී. **පරාභවන්තං පුරිසං** යනුවෙන් කරුණු ඇතුළත් එක් ගාථාවක් කියන ලද්දේ දෙව් පුතු විසිනි. **සුවිජානො භවං** හොති ආදී ලෙස එක් ගාථාවක් අතර ඇති ගාථා මෙන්ම අවසාන ගාථාවද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. ඒ සියල්ල එක්කොට **පරාභව සූත්‍රය** යැයි කියනු ලැබේ.

**එවං මෙ සුතං** ආදී තන්හි කිවයුතු සියළු කරුණු මංගල සූත්‍ර විස්තරයෙහිදී කියමු. **පරාභවන්තං පුරිසං** යන්නෙහි **පරාභවන්තං** පිරිහීමට-විනාශයට තේරුමයි. **පුරිසං** කිසියම් පුද්ගලයෙකු පිළිබඳ දැනගැනීමට, **මයං පුච්ඡාම ගොතමං** අනෙක් දෙවියන් සමග තමන් දක්වමින් අවසර ලබාගැනීමට ඒ දෙව්පුතු 'ගොතම' යන පරම්පරා නමින් භාග්‍යවතුන් වහන්සේ අමතයි. **භගවන්තං පුට්ඨුමාගම්ම** 'අපි භාග්‍යවතුන් වහන්සේගෙන් විමසන්නෙමු'යි ඒ ඒ සක්වළින් පැමිණියෙමු යන තේරුමයි. එයින් (උන්වහන්සේට ඇති) ඇල්ම ආදරය දක්වෙයි. **කිං පරාභවතො මුඛං** එසේ පැමිණි අපට මිනිසාගේ පිරිහීමට හේතු මොනවාද? පිරිහීමට පිවිසෙන දොරටු මොනවාද? පිරිහීමේ මුල කුමක්ද? ඒ කරුණු මොනවාද?

ඒ ආකාරයෙන් අපි මිනිසා පිරිහෙන අයුරු දැනගන්නෙමු යන තේරුමයි. **පරාභවන්තං පුරිසං** එසේ කියන ලද පිරිහීමට පත්වන මිනිසාට ඊට මුල්වන කරුණු විමසයි. පිරිහෙන කරුණු දැනගත් විට, ඒ කරුණු සමානකොට, පිරිහෙන කිසියම් මිනිසකු ගැන වටහා ගැනීමට හැකිවෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම කරුණු පහදා දීමේ පහසුව සළකා ඊට වෙනස්වන කරුණුවලට පුද්ගලයකු යොමුවන අයුරු **සුවිජානො භවං** යන ගාථාවෙන් (මුලදී) පැවසූහ.

එහි තේරුම මෙසේය. **භවං** (ගුණ දහම් වැඩෙන, නොපිරිහෙන මිනිසා, **සුවිජානො හොති** පහසුවෙන්, නිසැකවම මනාව දැනගැනීමට හැකිවේ. යම්කෙනෙක් පිරිහීමට පත්වේද, **පරාභවො** ඔහු පිරිහෙයි. වැනසෙයි. ඔබලා මිනිසා පිරිහීමට පිවිසෙන දොරටු මගෙන් විමසවෙහු නම්, එය ද **සුවිජානො** ඒ කෙසේ ද? ඒ තැනැත්තා **ධම්මකාමො භවං හොති** (නොපිරිහෙන තැනැත්තා) දසකුසල දහමෙහි යෙදීමට කැමති වෙයි. සතුටු වෙයි. අසයි. පිළිපදියි. ඔහු ඒ පිළිවෙත දැක, දැනගත යුතු දේ මැනවින් දැනගන්නේය. අනෙක් තැනැත්තා **ධම්මදෙසසී පරාභවො** ඒ යහපත් දහමට රුචි නොකරයි. කැමති නොවෙයි. බලාපොරොත්තු නොවෙයි නො අසයි. පිළිනොපදී. ඒ දුසිරිත් පිළිවෙත දැකීමටත්, ඇසීමටත් (ලැබෙන අතර) පහසුවෙන් දැනගත යුතු බැවින් සුවිජානො නම් වෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ (දියුණුවට) සතුරු වන කරුණු දක්වමින්ද, දහමට කැමති සැටිද වැටහෙන අයුරු පෙන්වා දුන් බව දතයුතුය. ඉක්බිති ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ වදාළ දෙයට සතුටුව **ඉතිහෙතං** යන ගාථාව කීය.

එහි තේරුම මෙසේය. **ඉති හි** භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද පරිදි, එසේම **එතං විජානාම** පිළිගනිමු, දරාගනිමු. **පඨමො සො පරාභවො** ඒ යහපත් දහමෙහි දොස් දැකීම, රුචි නොවීම පළමු පිරිහීමේ ලකුණයි. අප පිරිහීමට පිවිසෙන දොරටු දැනගැනීමට පැමිණියෙමු ද, ඒවා අතරින් මෙය එක් පිරිහීමේ හේතුවකැයි කියන ලද පරිදිය. එහි කරුණු තවත් විස්තර කළොත්, එය පිරිහීමට හේතුවේ යනුවෙන් **පරාභවො** කුමකින් පිරිහෙත්ද, ඒ පිරිහීමට හේතුවන කරුණකි. ඒ එකම වචනය වුවත් (පරාභව) ඊට නොයෙක් වෙනස් කරුණු ඇත. එහෙත් **පරාභවො** යන වචනය හෝ **පරාභවතො මුඛං** යන්නෙහි වෙනසක් නැත. මෙසේ පිරිහීමට හේතුවන එක් කරුණක් දනිමු'යැයි බොහෝ සතුටුව, තවදුරටත් දැනගනු

කැමතිව, **දුතියං භගවා බ්‍රෑහි, කිං පරාභවතො මුඛං** යැයි කීය. මෙයින් පසු **තතියං චතුත්‍ථං** ආදී වචනවලදී මේ අයුරින්ම අරුතද, වියරණයද (වාර ගණන - තුන්වන, සතරවන ආදී සේ) දතයුතුය. යම් ලෙසකින් (පොදුවේ) මිනිසුන් ඒ ඒ පිරිහෙන කරුණුවලින් යුතු වෙත් ද, ඉන් එක් අයෙකු පිරිහීමට හේතු වන සියළුම කරුණු අනුගමනය නොකරනු ඇත. එමෙන්ම සියළුම දෙනා පිරිහෙන එකම කරුණින්ද යුතු නොවේ. එහෙයින් මිනිසුන් පිරිහීමට පත්වන ඒ ඒ කරුණු දැක්වීමට **අසන්තස්ස පියා හොන්ති** ආදී ලෙසින් පුද්ගලයාට තීරණය කළ හැකි පරිදි නොයෙක් අයුරින් පිරිහෙන කරුණු වදාළ බව දතයුතුය. මෙය එහි කෙටියෙන් සඳහන් කිරීමයි. අසන්තා නම් සාමයික ගුරුවරුන් ලෙස සිටි (පූරණ කස්සප ආදී) හයදෙනා එමෙන්ම, අසංවර වූ කය, වචන, සිත මෙහෙයවන කටයුතු කරන වෙනත් පිරිස්ය. ඔවුහු **අසන්තා අස්ස පියා හොන්ති** සුනක්ඛත්ත ආදීන් හා අචේලක කෝරක්ඛත්තිය ආදීන් මෙන්, සන්තා නම්, බුදුවරුන්, පසේ බුදුවරුන් හා (අරිය) සාවකවරුන්, කය, වචන, සිත සංවරව කටයුතු කරන වෙනත් පිරිස්, **සන්තෙ න කුරුතෙ පියං** ඒ බුද්ධාදී යහපත් උතුමන්ට තමන්ගේ කැමැත්තක්, මනාපයක් නොපෙන්වයි, හික්මවීම් ලෙසින් මෙහිදී වචන වෙනසක් කරන ලදැයි දතයුතුය. නැතහොත් **සන්තෙ න කුරුතෙ** එබඳු යහපත් තැනැත්තන් ඇසුරු නොකරයි යන තේරුමයි. යම්සේ රජෙකු ඇසුරු කිරීමෙන් (රජුගේ) අදාල කටයුතු පිළියෙල කිරීමේදී අරුත් දැක්වීමට පකුරුතෙ යැයි යෙදුම ගැන බස්වහර ගැන වියත්හු කථාකරති. **පියං** කැමතිවෙමින්, සතුටුවෙමින්, තුටුවෙමින් යැයි තේරුමයි. අයහපත් දහම නම් සැටදෙකක් වූ මිසදිටු අදහස් හෝ දස අකුසල්ය. **අසතං ධම්මං රොචෙති** එබඳු දේ කැමති වෙයි. බලාපොරොත්තු වෙයි. අයහපත් පුද්ගලයන්ට කැමතිවීම, යහපත් පුද්ගලයන්ට කැමති නොවීම, අයහපත් පුද්ගලයන්ගේ අයහපත් කටයුතුවලට කැමතිවීම යැයි, මේ ගාථාවෙහි තුන්ආකාර වූ පිරිහෙන කරුණු කියන ලදී. මේ කරුණුවලින් යුතු තැනැත්තා පිරිහෙයි, පිරිහීමට පත්කරනු ලබයි. මේ ජීවිතයෙහිදී හෝ පරලොව ජීවිතය හෝ දියුණුවකට නොපැමිණෙයි. එහෙයින් පිරිහීමේ පිවිසුම් දොරටුව යැයි කියනු ලැබේ. මෙහි විස්තර, 'අසෙවනා ච බාලානං......... යන ගාථාවෙහිලා කියමු.

**නිද්දාසීලී** නම්, යම් තැනැත්තකු යමින් ද, හිඳින විටදී ද, සිටගෙනද, ඇඳෙහි ද නිදාගනු ලබන්නේමය. **සභාසීලි** නම්, පිරිසක් හා එක්ව, දොඩමළු වීමෙහි යෙදීමයි. **අනුට්ඨාතා,** උත්සාහයෙහි බලවත් බවක්

නැතිව, උත්සාහයෙන් කටයුතු නොකරන බවයි. කිසියම් විටකදී වෙනත් කෙනෙකුන් විසින් දොස් නගනු ලැබූ කල්හි ගිහියෙක් නම්, ගිහි ජීවිතයට අදාල කටයුතුවලදී ද, පැවිද්දෙක් නම්, පැවිදි බවට අදාල කටයුතුවලදීද උනන්දු නොවෙති. **අලසො** යනු සහජයෙන්ම කම්මැලිව, තදින්ම කම්මැලි බවෙහිම ඇලී, කුසීතවම, සිටිතැනම සිටියේ වෙයි. හිඳිනා තැන හිඳින්නේමය. තම උත්සාහයෙන් වෙනත් ඉරියව්වකට හෝ නොයයි. පෙර, කැලයෙහි ගිනි හටගත් විට, එතැනින් ඉවත්ව පලා නොයන කම්මැලියා මෙහිලා නිදසුන්ය. මෙය කලකිරීමෙන් ඇතිවන දෙයකි. ඒ අනුව, ලාමක වීමද ඒ තැනැත්තා කම්මැලියෙක්ම වේ යැයි දතයුතුය. රියට කොඩිය මෙන්ද ගින්නට දුම මෙන්ද තරහ බව (පැහැදිලිව) හඳුනාගත හැකිවීම **කොධපඤ්ඤාණො** නම් වෙයි. නිති තරහව චරිතයෙහි අංගයක් කොටගත් ඉක්මණින් කෝපවන (එයින් පෑරෙන) තුවාලයක් වන් සිත් ඇති තැනැත්තා මෙබඳුය. මෙම ගාථාවෙහි නිදනසුළු බව, දොඩමළු වීමේ ඇළුණු බව, උත්සාහ නොවීම, කුසීත බව හා කෝපය යන කරුණු පහ පිරිහෙන පිවිසුම් දොරටු ලෙස කියන ලදී. මේ කරුණුවලින් යුතු ගිහියෙක් නම්, ගිහි ජීවිතයට අදාල කටයුතුද, පැවිද්දෙක් නම්, පැවිදි දිවියෙහිද දියුණුවක් නොලබන්නේය. හුදෙක්ම පිරිහීමටම පත්වෙයි. පිරිහේමය. එහෙයින් **පරාභවතො මුඛං** යැයි කියනු ලැබේ.

මාතා යනු බිහිකරන තැනැත්තිය යැයි දතයුතුය. **පිතා** යනු බිහිකරන තැනැත්තාය. **ජිණ්ණකං** සිරුරෙහි බර ලිහිල්වීම හෙවත් වයස්ගත වීමය. **ගතයොබ්බනං** යොවුන් බව ඉක්මවා අවුරුදු අසූවක් හෝ අනූවක්ව තම කටයුතු කරගැනීමට නොහැකි බව. **පහු සනෙතා** (තමන්ට) යම්දෙයක් කරගැනීමට හැකියාව ඇති, ඉසුරුමත්, සැපසේ ජීවත්වන, **න භරති** - ආහාරපාන ලබා දී රැකබලා නොගනී. මේ ගාථාවෙන් මව්පියන්ට, ඇඳුම් පැලඳුම්, ආහාර, බෙහෙත් ආදිය නොදී, උවටැන් නොකිරීම, එක් පිරිහෙන පිවිසුම් දොරටුවක් ලෙස වදාරන ලදී.

> **"තාය නං පාරිචරියාය මාතාපිතුසු පණ්ඩිතා**
> **ඉධ චෙව නං පසංසනති පෙච්ච සගෙගච මොදති"**

නුවණැත්තෝ මවුපියන් කෙරෙහි උවටැන් කිරීම් ආදී සේවය කිරීමෙන් මෙලොවදීම ඔවුහු පැසසුම් ලබති. මියගිය පසුව දෙව්ලොව ඉපිද සතුටු වෙති' යනුවෙන් මව්පියන්ට ගරු සත්කාරයෙහි, උවටැන්

කිරීමෙහි ඵලවිපාක කියන ලදී. 'එසේ හුදෙක්ම මවුපියන්ට සත්කාර නොකොට වෙන කවරකුට කරන්නේද'යි අපහාසයට ද දොස් නැගීමට ද දුගතියට ද පත්ව, පිරිහෙයි. යහපත් පලවිපාක නොපැමිණෙයි. එහෙයින් **පරාභවතො මුඛං** යැයි කියනු ලැබේ. පව් බැහැර කරන ලද බැවින් **බ්‍රාහමණ** පව් සංසිඳවන බැවින් **සමණං**, බමුණු කුලයෙන් පැවත ඒමද **බ්‍රාහමණං** පැවිදි බවට පත්වූවන් **සමණං**, එමෙන්ම **අඤ්ඤං වාපි** යම්කිසි ඉල්ලනු ලබන දෙයක්, **මුසාවාදෙන වඤ්චෙති** 'කියනු මැනව, හිමියනි', යැයි සිවුපසය පවරා දී, එසේ ඉල්ලා ගැනීමෙන් හෝ දැනගෙන, පසුව අඩුවෙන් දී ඔහුට ඇතිකරන ලද ඒ බලාපොරොත්තුව - ආසාව - ඉටු නොවන පරිදි මුළාකොට රවටා බොරු කියයි. මේ ගාථාවෙන් මහණ බමුණන් ආදීන් බොරුවෙන් රැවටීම එක් පිරිහෙන පිවිසුම් දොරටුවක් සේ කියන ලදී. මේ ආකාර වූ තැනැත්තා මෙම ජීවිතයෙහි අපහාසයටත්, මරණින් පසු දුගතියටත්, සැප ඇති තැනක උපත ලදොත්, අදහස් වූ පරිදිම විපතටද පැමිණේ. 'සිල් වරදවා ගත් දුසිල්වතා ගැන නරක, අයහපත් රාවයක් පැතිරේ'යැයි එසේ හෙයින් කියන ලදී. 'දුසසීලසස - සීල විපනනසස පාපකො කිතතිසදෙදා අබභුගගචඡති' එසේම, 'මහණෙනි, කරුණු සතරකින් යුතු තැනැත්තා, ගෙනෙන ලද බර බිම තබනනා සේ, (මරණින් මතු) නිරයට යයි. ඒ කරුණු සතර කවරේද? බොරු කීම.....' ආදී ලෙසින් වදාරා ඇත. 'චතුහි භිකඛවෙ ධමෙමහි සමනනාගතො යථාභතං නිකඛිතෙතා එවං නිරයෙ, කතමෙහි චතුහි? මුසාවාදී හොති' එසේම, 'සාරිපුතතය, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් පැවිද්දකු හෝ බමුණකු වෙත එළඹ, 'කියන්න, හිමියනි, යැයි සිවුපසය දෙන බව කියා, ඒ පවරන ලද යම් දෙයක් නොදෙයි ද, ඔහු මියගොස් මේ මිනිස් බවයම ලබයිද, යම් පමණකට වෙළඳ කටයුතු ආදියෙහි යෙදෙයිද, එයම ඔහුගේ අත්පාදිය කැපීමේ (විපතට) පත්වෙයි. සාරිපුතතය, යමෙක් යම් දෙයකින් මහණ බමුණන් පවරා (දෙන බව දන්වා) එය අදහස් කළ පරිදි නොදෙයිද, ඔහු මියගොස් මිනිසත් බව ලබයිද, යම් දෙයක් වෙළඳ කටයුතුවල යොදවයිද, එය අදහස් කළ පරිදි සිදුනොවේ'යැයි (වදාළහ.) 'ඉධ සාරිපුතත, එකචෙචා සමණං වා බ්‍රාහමණං වා උපසංකමිත්වා පවාරෙති, වද භනෙත, පචචයෙනාති, සො යෙන පවාරෙති, තං න දෙති, සො චෙ තතො චුතො ඉත්ථතතං ආගචඡති, සො යං යදෙව වණිජජං පයොජෙති, සංඝහොති ඡෙජජගාමිනී, ඉධ පන සාරිපුතත යො යෙන පවාරෙති, තං න යථාධිපපායං දෙති සො චෙ තතො චුතො ඉත්ථතතං ආගචඡති, සො යං යදෙව වණිජජං පයෙජෙති, සාසස හොති න යථාධිපපායා' මෙසේ තින්දා

අපහාසයට පැමිණෙමින් පිරිහීමට පත්වේමය. එහෙයින් **පරාභවතො මුඛං** යැයි කියන ලදී.

**පහූත විත්තො** බොහෝ රන් රිදී මුතු මැණික් ඇති, **සහිරඤ්ඤො** කහවණු සහිත, **සභොජනො** නොයෙක් පිසන ලද හොදි, එළවළු ආදී රසමසවුළු සමග බොජුනින්, **එකො භුඤ්ජති සාදූනි** රසවත් හොඳ ආහාර තම පුතුන්ට ද නොදී සැඟව හිඳ අනුභව කරයි. තනිවම රසවත් ආහාර අනුභව කරයි. මේ ගාථාවෙන්, ආහාරයෙහි ගිජුබවත්, ආහාරයෙහි මසුරු බවත් එක් පිරිහීමේ පිවිසුම් දොරටුවක් සේ කියන ලදී. මෙබඳු තැනැත්තා නින්දාව දුරු කරන්නට මෙන් සැප නොලබා දුකට පත්වෙමින් පිරිහේමය. එහෙයින් **පරාභවතො මුඛං** යැයි කියන ලදී. කියා ඇති පරිද්දෙන්, සියළු කරුණු සූත්‍රය අනුසාරයෙන් යොදාගත යුතුය. බොහෝ විස්තර සඳහන් කොට (අටුවාව විසාල වේයයි) බියෙන්, මෙතැන් සිට, මෙතෙක් අනුගමනය කළ පිළිවෙල නොදක්වා තේරුම පමණක්ම කියමු. **ජාතිත්ථද්ධො** නම් යමෙකු 'මම උපතින් උසස්වෙමි'යි උඩඟු බවක් උපදවාගෙන, එයින් ඔද වැඩිව, සුළං පිරුණ මයිනහමක් මෙන් පිම්බී කිසිම කෙනෙකුට හිස නොනමයි. **ධනගොත්තත්ථද්ධෙසු** මේ ගැනද එසේ සඳහන් වූ අයුරු සළකා ගතයුතුයි. **සඤ්ඤාතිං අති මඤ්ඤෙ** සැකිකුල විඩූඩභ මෙන් තම නෑදෑයින් ද උපතින් පහත්කොට සිතයි. 'මේ තැනැත්තා බැගෑපත් වන දිළිඳෙකි, දුප්පතෙකි' යැයි පොහොසත්කම අනුව, තමාට වඩා පහත්කොට සිතයි, 'ඒ නෑදෑයින් තම පිරිහීම කැමති වෙති'යි කතාබහක්වත් නොකරයි, මෙම ගාථාවෙන් කරුණු සතරක් වුවත්, (මානය) එකම අරමුණ සේ සළකා පිරිහීමේ එක් කරුණක් ලෙස පෙන්වයි. **ඉත්ථි ධුත්තො** ගැහැණුන් කෙරෙහි ඇලුනේ, තමා සතුව ඇති සියළු දෙයම වෙනත් ගැහැණියකු වසඟයට ගනී. සබඳතා ඇතිකර ගනී. එමෙන්ම තමාට අයත් සියල්ල උකසට තබා හෝ රහමෙර පානයෙහි (මත්කුඩු, මත්පෙති වැනි දෑ) ලොල්වූයේ **සුරාධුත්තො** වේ. ඇඳිවත හෝ උකසට තබා දූකෙළියෙහි, සූදු ආදියෙහි යෙදුනේ **අක්ඛධුත්තො** වේ. මේ කරුණු තුනෙන් කිසියම් (වාසිදායක) දෙයක් ලැබුවේද, එය වැනසීමට, විපතට පත්වීම **ලද්ධං ලද්ධං විනාසෙති** යැයි දතයුතුය. මෙසේ කටයුතු කරන තැනැත්තා පිරිහේමය. මේ ගාථාවෙන් ඒ පිළිබඳව පිරිහීමේ පිවිසුම් දොරටු තුනක් කියන ලදී. **සෙහි දාරෙහි** තමන්ගේ බිරිඳගෙන්, යමෙකු තම බිරියගෙන් **අසන්තුට්ඨො** සතුටු නොවී, සෑහීමකට පත් නොවී **වෙසියාසු පදිස්සති** එසේම **පරදාරෙසු** ඔහු යම් ගණිකාවනට ධනය දීමෙන් ද

අනුන්ගේ බිරියන් ඇසුරෙන්ද රජුගෙන් දඬුවම් ලැබීම ආදියෙන් (නීතිය මගින් වැරැදිවලට දඬුවම් ලැබීමෙන්) පිරිහේමය. ඒ අනුව මේ ගාථාවෙන් පිරිහීමේ පිවිසුම් දොරටු දෙකක් කියන ලදී. **අතීතයොබ්බනො** යොවුන් බව ඉක්මවූ අවුරුදු අසූවක් හෝ අනූවක් වූ **ආනෙති** ගෙන එයි. **තිම්බරුත්ථනිං** තිඹිරිඵල වන් පියයුරු ඇති යොවුන් දූරියක් **තස්සා ඉස්සා න සුපති** ඒ නව යොවුන් දූරිය එබඳු මහල්ලෙකු සමග ආලවනත බවක් හෝ ලිංගික ඇසුරද කැමති නොවන්නීය. වෙනත් තරුණයන් විසින් ඇ නොපැතිය යුතුයැයි, ඉරිසියාවෙන් ඇය රැකගැනීමට අවදියෙන් සිටී. ඔහු කාමුක රාගී බවින්ද, ඉරිසියාවෙන්ද දූවෙමින් (ආදායමක් ගෙන දෙන) බාහිර කටයුත්තක හෝ නොයෙදෙමින් පිරිහේමය. මෙසේ ඔහු ඉරිසියාවෙන් නිදිවැරීම එක් පිරිහීමේ පිවිසුම් දොරටුවක් ලෙස කියන ලදී. **සොණ්ඩිං** යනු මාළු-මස්, මත්වන දේවලට ඇලී, ගිජුවීමයි. **විකිරණිං** ඒ සඳහා ධනය පස් මෙන් විසිරුවා නැතිකරන සුළු, **පුරිසං වා පි තාදිසං** එබඳු තැනැත්තෙකු, **ඉස්සරියස්මිං ඨාපෙති** (අධිපති බව තහවුරු කරන අදාල) සංකේත, සලකුණු (සීල් තැබීමේ උපකරණ යතුරු ආදී) මුද්දක් වැනි දේ භාර දී ගෙදරක හෝ ආදායම් ලබන කටයුත්තක හෝ වෙළහෙළඳාම් ව්‍යාපාර ආදියෙහි මුලින් සඳහන් නාස්තිකාර ගති ඇති අයෙකු මුල්තැන තබයිද, ඔහු ඒ වරදින් ධනය නැතිකර ගැනීමෙන් පිරිහේමය. ඒ අනුව එබඳු වූවකු ඉසුරු තන්හි, අධිපති බවට පත්කිරීම පිරිහීමේ, එක් දොරටුවක් ලෙස කියන ලදී.

**අප්පභොගො** රැස් කරගන්නා ලද සම්පත් යොදවා නැවත ආදායමක් ලබා නොගැනීමයි. **මහා තණ්හො** දැඩිව සම්පත් ලබාගැනීමේ ආසාවෙන් යුතු ලද යම් දෙයකින් සෑහීමට පත්නොවී, **ඛත්තියෙ ජායතෙ කුලෙ** කැත් කුලයෙහි (රජ කුලයෙහි) ඉපිද **සොච රජ්ජං පත්ථයති** ඔහු ඒ සා බලවත් තණ්හාවෙන් යුතුව වැරදි ආකාරයෙන්, වැරදි වැඩ පිළිවෙලින් තම උරුම වූ දේ හෝ, නොලැබෙන අනුන්ට අයත් රජකම බලාපොරොත්තු වෙයි. ඔහු මෙසේ පතමින්, යම් ආකාරයෙන් තමාට අයිති ඉතා අඩු සම්පත් යුදභටයන් ආදීනට දී රජබවට පත් නොවීමෙන් පිරිහේමය. මෙම ගාථාවෙන් එබඳු කෙනෙකු රජකම පැතීම එක් පිරිහීමට පිවිසුම් දොරටුවක් ලෙස කියන ලදී. මෙයින් පසුවද, ඒ දේවතාවා 'දහතුන්වන පිරිහීමට හේතුවන කරුණ, භාග්‍යවතුන් වහන්ස වදාළ මැනව, සියදහස් වන කරුණ වදාළ මැනව'යි විචාරන්නේ නම්, එපමණම කරුණු පහදා දෙන්නේය. ඒ දේවතාවා 'මේ කරුණු ඇසීමෙන් (තවදුරටත්)

කිනම් පලයක්ද? මෙහි එකක්වත් දියුණුවට අදාළ බවක් නැතැ'යි ඒ පිරිහීමේ පිවිසුම් දොරටු ගැන ඇසීම (මින් ඉදිරියට) පලක් නැතැයි මෙපමණ කරුණු අසා පසුතැවිලිව නිහඬව හුන්නේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ දේවතාවාගේ අදහස දැන, දෙසුම නිමා කෙරෙමින් **එතෙ පරාභවෙ ලොකෙ** යන මේ ගාථාව වදාළහ.

එම ගාථාවෙහි **පණ්ඩිතො** මනා විමසුම් බවින් කටයුතු කරන තැනැත්තකු **සමවෙක්ඛියා** නුවණැසින් පිරික්සා, **අරියො** මගද, පලයද (හෙවත් නිවනද) නොලදත්, මෙම පිරිහීමේ පිවිසුම් දොරටු යැයි කියන ලද දෙයින් වැළකෙත් නම් විපත් නොපවතී යනුවෙන් 'අනයෙන ඉරීයති අරියො' වෙයි. ඒ දැකීමෙන්ද, නුවණින් ද පිරිහීම දැක ඒවායෙහි නොයෙදීමෙන් **දසසන සමපනෙනා, සලොකං භජතෙ සිවං** ඔහු සැනසිලිදායී, රැකවරණ බඳු, උවදුරු නැති දෙව්ලොව ඇසුරු කරයි. ඇලෙයි, පැමිණේ යැයි කියන ලදී. දෙසුම අවසන්හි, පිරිහීමේ පිවිසුම් අසා සංවේගයට පත්ව, නුවණින් මෙනෙහි කොට සෝවාන්, සකදාගාමී, අනාගාමි ඵලයට පත් දේවතාවෝ මෙතෙකැයි පමණ කළ නොහැකි වූහ. එසේ හෙයින් කියන ලදී.

"මහාසමය සුතෙත ච අථො මංගල සුත්තකෙ
සමචිතෙත රාහුලොවාදෙ ධම්මචක්කෙ පරාභවෙ

දෙවතාසමිතී තත්‍ථ අප්පමෙය්‍යා අනප්පිකා
ධම්මාභිසමයො චෙත්‍ථ ගණනාතො අසංඛියො"

මහා සමය සූත්‍ර දේශනයෙහිද, එමෙන්ම මංගල, සමචිතත, රාහුලොවාද, ධම්මචක්ක, පරාභව සූත්‍ර දේශනාවලදීද එහි රැස්වූ දේවතාවෝ ගණනින් අපමණ වෙති. (ඒ අසා) දහම අවබෝධ කොටගත් දේවතාවන්ද මෙපමණකැයි ගණනින් කිව නොහැකිය.

**පරාභව සූත්‍ර විස්තරය නිමි.**

# 1.7

**එවං මෙ සුතං** යනු අග්ගික භාරද්වාජ සූත්‍රය වසල සූත්‍රය ලෙසද හඳුන්වනු ලබයි. එය දේශනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු සිටු විසින් කරවන ලද ජේතවන අරමෙහි වැඩ වසති. කසීභාරද්වාජ සූත්‍ර විස්තරයෙහි දක්වූ පරිදි, පසුබත් කිස අවසන බුදුඇසින් ලොව බලද්දී අග්ගික භාරද්වාජ බමුණාට තෙරුවන්, සරණ සිල්හි පිහිටීමේ හේතු සම්පත් දැක, 'මා එහි ගියවිට සංවාදයක් පවත්නේය. ඒ කතාබහ අවසානයෙහි දහම් දෙසුම අසා ඒ බමුණා සරණයෙහි පිහිටා සිකපද සමාදන් වන්නේ යැයි දැන, එහි ගොස්, කතාබහ අතරතුර බමුණා දහම් දෙසන සේ ඉල්ලා සිටින ලදුව මෙම සූත්‍රය වදාළහ.

එහි **එවං මෙ සුතං** ආදිය මංගල සූත්‍ර විස්තරයෙහිදී සඳහන් කරන්නෙමි. **අථ ඛො භගවා පුබ්බණ්හසමයං** ආදී කරුණු කසීභාරද්වාජ සූත්‍ර විස්තරය අනුව දතයුතුය. **තෙන ඛො පන සමයෙන අග්ගික භාරද්වාජස්ස** යන්නෙහි විස්තර නොදැක්වූ කරුණක් වේ නම්, ඒ ගැන සඳහන් කරන්නෙමි. ඒ කෙබඳු අයුරින්ද? ඒ බමුණා ගිනි දල්වා ගරු පූජා පවත්වන හෙයින් **අග්ගිකො** නමින් පතළ විය. **භාරද්වාජො** පරම්පරාවයි. එහෙයින් **අග්ගික භාරද්වාජ** යැයි කියන ලදී. **නිවෙසනෙ** වසන ගෙයි, ඒ බමුණාගේ ගෙදර දොරටුවෙහි ඇතුළු පෙදෙසෙහි ගිනි පිදීම සඳහා සාලාවක් විය. එය ගෙදර දොරටුවේම යැයි කිවයුතු වුවත්, ඒ පිහිටි පෙදෙසෙහි ගෙයම ඇතුලත් කොට, **නිවෙසනෙ** යනුවෙන් කියන ලදී. සමීප අරුතෙහි ආධාර විබත් වචනයි. ගෙදර සමීපයෙහි යන අදහසයි. **අග්ගි පජ්ජලිතො හොති** ගිනි දල්වා, එතැන සිටියේ, ගින්න දැල්වීමට දර ඇතුළුකොට, හමන සුළඟින් දැල්වෙමින් ඉහළට නැගෙන ගිනිජාලාවෙන් ගැවසිණ. **ආහුති පග්ගහිතා** හිසෙහි පටන් දිය නා, මහත් ගරු බුහුමනින් කිරිබත්, ගිතෙල්, මීපැණි ආදිය ගෙනැවිත් (තැන්පත් කොට) ගින්නෙහි පූජා කිරීමට ගෙනෙන ලද සියල්ල **ආහූතී** යැයි කියනු ලැබේ. **සපදානං** ගෙයක් පාසා, භාග්‍යවතුන් වහන්සේ සියළු ජනයාටම උදව් කිරීම පිණිස ආහාර (ලද තරමින්) සතුටුවීමටද, උසස් පහත් යැයි සම්මත කුල නොසළකා පිඬු පිණිස හැසිරෙති. **සපදාන පිණ්ඩාය චරමානො** යැයි එහෙයින් කියන ලදී. (එසේ වැඩමවූ බුදුන් දැක බ්‍රාහ්මණයාගේ සිත සතුටු නොවී රළු නපුරු වචනයෙන් බුදුන්ට කථා කළේය.) හැම අයුරින්ම හැමදෙනා

පහදනසුළු භාග්‍යවතුන් වහන්සේ දැක, බමුණාගේ සිත නොපැහැදුනේ ඇයි? කුමක් නිසා මෙසේ නපුරු වචනයෙන් කතා කළේද? ඒ පිළිබඳ කිවයුතු මෙයයි. මේ බමුණා යහපත් කටයුතුවලදී මහණුන් දැකීම අයහපත් දෙයකැයි දැඩි අදහසින් යුතුය. මහා බ්‍රහ්මයා අනුභව කරන වේලාවෙහි කාලකණ්ණි, හිස මුඩුකරන ලද මහණුන් මගේ නිවහනට පැමිණියේ යැයි සිතා සිත කිලිටි කර ගත්තේය. හුදෙක්ම නපුරු තරහව ඇතිකර ගත්තේය. ඉක්බිති, නපුරුව, නොසතුටුව, එම හැඟීම් පිට කරන ලද්දේ **තත්‍රෙව මුණ්ඩක** ආදී ලෙසිනි.

හිස මුඩු කිරීම අසුබ අයහපත් යැයි බමුණන්ගේ හැඟීමයි. එහෙයින් මෙහි පැමිණියේ අයහපත් කෙනෙකි. එහෙයින් මොහු දෙවියන්ගේ, බමුණන්ගේ පූජකයකු නොවේ යැයි පිළිකුල් කරමින් **මුණ්ඩක** යැයි කීය. හිස මුඩු කරන ලද බැවින්, ඉතිරි වන (ඉඳුල්) ආහාර ලබාගැනීමට මොහු මේ පෙදෙසට ඒම සුදුසු නැත. මහණකු වුවත්, කයෙහි කිලිටි බව අගය නොකරත්ද'යි මහණකමටද පිළිකුල් කරමින් **සමණක** යැයි කීය. හුදෙක් තරහෙන්ම නොව, වසලයෙකු හෝ පැවිදිව ඔවුන් හා එක්ව ආහාර අනුභව කිරීම් ආදියෙන්, මේ තැනැත්තා වසලයෙකුටත් වඩා පව්කාරයෙකැයි පිළිකුල් කරමින් **වසලක** යැයිද කීය. උපතින්ම වසලයන් වූවන්ට හෝ පූජා ලැබීම, දැකීම, වේද මතුරු ඇසීම පව් සිදුවේ යැයි හඟිමින් එසේ කීය. බමුණා එලෙස කිවූවත්, භාග්‍යවතුන් වහන්සේ පහන් වූ මුහුණින් යුතුව, මිහිරි හඬින් බමුණා කෙරේ අනුකම්පාවෙන් සිහිල් වූ සිතින් තමා හැමදෙනාටම සමානතාවයෙන් නොවෙනස්ව පවතින බව පහදා දෙමින් **ජානාසි පන ත්වං** බ්‍රාහමණ යැයි කීහ.

එවිට බමුණා භාග්‍යවතුන් වහන්සේ එයින් කම්පා නොවන බව පසන් මුහුණින් පිළිබිඹු වන අයුරු දැන, අනුකම්පාවෙන් සිහිල් වූ සිතින් නිකුත් මිහිරි හඬ අසා, අමාවෙන් අබිසෙස් ලද සේ සතුටු හදින්, පැහැදුනු ඉඳුරන් ඇතිව, නිහතමානීව, බමුණකුව ඉපදීමෙන් හටගත් විස පිටකිරීමක් බඳු නිතර කී රළු වචන හැර 'මම යම් ආකාරයකට පහත් ඉපදීමකින් වසලයකැයි බලාපොරොත්තු වූයෙම්ද? ඔහු උසස් අදහස් ඇති බව පෙනෙන හෙයින් වසලයෙකු නොවේ. පහත් ඉපදීමක් ඇත්තෙකු ද නොවේ. වසලයෙකැයි මේ සළකනු ලබන කරුණු සළකා, **න බො අහං භො ගොතම** යැයි කීය. යම් කෙනෙකුට උසස් අවබෝධය ලැබීමට හේතු සම්පත් ඇත්තේ නම්, එය ලැබීමේදී නපුරු කෙනෙකු වුවත්,

මොළොක් බවට පත්වීම (සොබා) දහමට අනුකූල වූවකි. සාධූ - මෙම වචනය, ඉල්ලීම, පිළිගැනීම, සතුට පළකිරීම, එකඟතාව දැක්වීම, යහපත, අවධාරණය කොට දක්වන තැන යෙදේ. 'භාග්‍යවතුන් වහන්ස, මට සැකෙවින් දහම් දෙසන සේක්වා! සාධු මෙ භන්තෙ භගවා - සංඛිත්තෙන ධම්මං දෙසෙතු - මෙහි ඉල්ලීමක් ලෙස යෙදී ඇත. 'යහපති හිමියෙනි, ඒ බමුණා භාග්‍යවතුන් වහන්සේ කියන ලද කරුණු කෙරෙහි අනුමෝදන්ව...... 'සාධු භන්තෙ ති ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා...' ආදී තැන්වල (එම අදහස) පිළිගැනීමේදී යෙදී ඇත. 'හොඳයි, මැනවි සාරිපුත්තය, 'සාධු... සාධු සාරිපුත්ත...' සතුට දැක්වීමටය.

'සාධු ධම්මරුචි රාජා - සාධු පඤ්ඤාණ වා නරො
සාධු මිත්තාන මද්දූභො - පාපානං අකරණං සුඛං

'රජ දහමට කැමතිවීම හොඳය, නුවණැත්තෙකැයි හඳුනා ගැනීමට ලකුණු තිබීම මිනිසාට හොඳය. සුහද මිතුරු බව හොඳය. පව් නොකිරීම සුවයකි' මෙහි යහපත - හොඳය යන අදහසටය.

'සාධුකං සුණෙව මනසි කරොම' 'මැනවින් අසමු, මෙනෙහි කරමු' යන තැන අවධාරණයෙන් දැක්වීමටය. මෙම සූත්‍රයෙහි යෙදුනේ ඉල්ලීමක් ලෙසයි. තෙන හි යනු ඔහුගේ අදහස දැක්වීමයි. ඔබ දැනගැනීමට කැමතිවෙහි නම්, යන අදහසින් කියන ලදී. ඊට අදාල වන පරිදි ඔහුට දැනගැනීමට කැමති වන ආකාරයට 'බමුණ අසන්න, හොඳින් මෙනෙහි කරන්න. ඔබට දැනගැනීමට හැකිවන පරිදි ඔබට කියන්නෙමි'යි පසුපදය හා සම්බන්ධකොට දතයුතුය. එහි සුණාහි කණ නම් වූ ඉන්ද්‍රිය අසන කරුණට අදාලව මිස වෙනත් දෙයකට යොමුවීම වැළකීමයි. සාධුකං මනසිකරොහි (අසන දේ) ගැන නුවණ මෙහෙයා කල්පනා කරමින්, මනස නම් වූ ඉන්ද්‍රිය වෙනත් අරමුණකට ඇදී යාම වැළකීමයි. මෙහි මුලින් පෙන්වූයේ කරුණු වෙනස් අයුරින් තේරුම් ගැනීම වැළකීමයි. පසුව පෙන්වූයේ තේරුම් ලෙස වරදවා ගැනීම වැළකීමය. මුලදී දහම් ඇසීමෙහි (සූදානම් වීම) පෙන්වයි. පසුව, ඇසූ දහම් කරුණු සිත දරා විමසා බැලීමද ලෙසිනි. මුලින්, 'මෙම දහම කරුණුවලට අදාලව මනා පද ගැළපීම සහිතය. එබැවින් ඇසිය යුතු යැයි ද පෙන්වා දෙයි. පසුව දැක්වූයේ එහි අරුත් සහිත බවය. එහෙයින් මෙනෙහි කළ යුතුය. යහපති,

හෙවත් 'සාධු' යන්න පද දෙකෙහිම යොදා, මේ දහමෙහි ගැඹුරු බවද දේශනාවේ උසස් බවද (සළකා) හොඳින් අසන්න. තවදුරටත් ගැඹුරු අරුත්ද, අවබෝධයෙහි ගැඹුරු බවද (සළකා) හොඳින් මෙනෙහි කරන්නැයි පහදමින් **සුණාහි, සාධුකං මනසිකරොහි** යැයි වදාළහ. ගැඹුරු වූ දහමෙහි මා කෙසේ පිහිට ලබන්නෙම්ද'යි මෙසේ කලකිරීමෙන් සිටි ඒ බමුණා උත්සාහවත් කරමින්, **භාසිස්සාමී** යැයි කීහ. 'ඔබ ඒ කරුණු වටහාගන්නා ආකාරයට මම පදවහර මනාව ගළපා අදහස් මුදුන්පත් වන ලෙසින් කියන්නෙමි' යන අදහස දතයුතුය. එයින් උත්සාහවත්ව, **එවං භොති** බො අගගිකභාරද්වාජො බ්‍රාහමණො භගවතො **පච්චස්සොසි,** පිළිගත්තේ යැයි කියන ලදී. දේශනයෙන් දුක් වූ පරිදි පිළිපැදීමේ අදහසින් ඉදිරියේ සිට ඇසුවේය යනුයි. ඉක්බිති ඔහුට **භගවා එතදවොච** දූන් කිවයුතු දේ සඳහා කොධනො උපනාහි ආදී ලෙසින් වදාරන ලදී.

කොධනො යනු කිපෙනසුළු බවයි. **උපනාහි** ඒ කිපීම දැඩි ලෙස ගෙන දිගින් දිගට පවත්වා ගැනීමයි. අනුන්ගේ ගුණ මකයි. පිසදා හරියි. මක්ඛී වේ. අයහපත් පවිටු ගති ඇති එබඳු තැනැත්තා, **පාපමක්ඛී විපන්න** දිට්ඨී යහපත් දැකීම නොමැති, අත්හරින ලද බවයි. වැරදි ලෙස ගත් හෝ නිවැරදි යයි සිතාගත් කරුණු දහයක් වූ වැරදි හැඟීම්වලින් යුතු වූයේ, මායාවී තමන්ගේ ඇති දොස් සඟවන ලකුණින්, කපටිබවෙන් යුතු, **තං ජඤ්ඤා වසලො** මෙබඳු පහත් ගතිවලට වසඟව, එය ජීවිතයෙහි (ආලේපයක්) මෙන් තබාගෙන සිටින තැනැත්තා වසලයා යැයි දැනගනුව. ඉදින් බ්‍රහ්මයාගේ (මුවින් උපන්නේ) යැයි මුදුනින් පිළිගත්තද, මොහුගේ අදහස අනුව (මූලික අදහස) වසලයකුමය. (එයින්) තම හදවතේ සතුට මිස වෙනත් තැනැත්තන්ට එසේ සතුටක් ඇති නොවේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මුල් පදයෙන්ම ඒ බමුණාට කෝපයෙහි දොස් දක්වා, කෝප ආදී පවිටු ගුණවලින් යුතු තැනැත්තන්ගේ සිතැඟි පහදාදීමත්, ඒ ගැන විස්තර කරමින්, ඒ අනුව වසලයකු හා වසලයකු සේ සැළකෙන කරුණු දෙසූ සේක. 'ඔබ හා මා යැයි සැළකීමක් නොකොට, තමා උසස් බව හඟවා අනුන් පහත්කොට සැළකීමද නොකොට, දහම් නය අනුව තමන්වහන්සේ බ්‍රාහ්මණයකු වන අයුරුත්, භාරද්වාජ බමුණාගේ වසල බවත් පහදා දුන්හ.

මීළඟට 'කවර විටක හෝ පරපණ නැසීම, නුදුන් දේ ගැනීම ආදියෙහි යෙදුනත්, ඔහු බමුණකුම වේ'යැයි යන බමුණන්ගේ දැඩිව

ගන්නා හැඟීමක් වේද, ඒ හැඟීම ඉවත් කෙරෙමින්ද, හිංසා කිරීම් ආදී අයහපත් දෙයෙහි යෙදෙන කෙනෙකු එහි විපාක නොදක, ඒවා අත් නොහරින්ද, ඒ පුද්ගලයා පව්ටු වූ වසලයකු වන බවද එහි පලවිපාකද දක්වමින් වෙනත් අයුරින් වසල බව හා වසලයකු වන සැටි දේශනා කරන්නට **එකජං වා ද්විජං වා** ආදී මෙබඳු ගාථා වදාළහ.

**එකජො** යනු බිත්තරයකින් උපත ලබන්නන් හැර, ඉතිරි යොනිවලින් (වෙනත් ආකාරයට) ඉපදෙන්නන්, එය ද එක්වරක් ඉපදීමකි. **ද්විජො** යනු බිත්තරයකින් ඉපදෙන, මවුකුසින් ද බිජුවටින්දැයි දෙවරකට උපදී. ඒ **එකජං වා ද්විජං වාපි** වේ. **යොධ පාණං** මේ ලෝකයෙහි යම් ජීවියකුට **විහිංසති** සිතිවිලි අනුව කය නම් දොරටුවෙන්ද සිතිවිලි අනුව වචනය නම් දොරටුවෙන්ද එක්කොට ජීවිත තොර කරයි. (සිත කය වචන මෙහෙයා යම් කෙනෙකු නසයි) **පාණනි හිංසති** යනුවෙන්ද සඳහන්ව ඇත. එහිදී බිත්තරයකින් හැර වෙනත් ලෙස ඉපදෙන හෝ, බිජුවටින් උපදින හෝ මෙම කොටස් දෙකටම අයත් ජීවීන්ට හිංසා කරයි යනුවෙන් ගළපා ගතයුතුය. **යසස පාණෙ දයා නත්ථි** එබඳු සිතින් අනුකම්පාවක් ඇති නොවන බව කීය. මෙතැන් සිට ඉදිරියට දක්වෙන ගාථාවල, කලින් කියා ඇති පද විස්තර හැර, පැහැදිළි කළයුතු, විස්තර නොකරන ලද පද පමණක් සඳහන් කරන්නෙමි. **හනති** නසයි, හානියට පත්කරයි. **පරිරුන්ධති** සේනාව පිරිවරා සිටී. **ගාමානි නිගමානිච** මෙහි 'ච' අකුරෙන් නගරද කිවයුතුය. **නිගගාහකො සමඤ්ඤාතො** මෙසේ හානි කිරීමෙහිදී සේනාව හා වටලා, ගම්නියම්ගම් නගර අවහිර කරන්නෙකැයි ලෝකයා දැනගනු ලබයි. **ගාමෙ වා යදි වාරඤ්ඤෙ** ගම ද, නියම්ගමද නගරයද යන සියල්ලම ගම යන වචනය හා සැළකෙයි. ඒවා හැර මෙහි කැලය අදහස් වේ. ඒ ගමෙහි හෝ නැතිනම් කැලයෙහි හෝ, **යං පරෙසං මමායිතං** අනුන්ට අයිති, රැකගනු ලබන, නොදුන් යම් ඕනෑම දෙයක්, **ථෙය්‍ය අදින්නං ආදියති** (අයිතිකරුවන්) නොදෙන ලද, අනුදැනුමක් නොලද දෙයක් සොර සිතින් ගැනීමයි. යම්කිසි උපායකින්, යම්කිසි සොර මගකින් තම කොටසට එකතුකර ගැනීමයි. **ඉණ මාදාය** තමාට අයත් කිසියම් දෙයක් (ඇපයට මෙන්) තබා වෙනත් දෙයක් ලබාගැනීම හෝ, කිසියම් දෙයක් නොතබා මෙපමණ කලකින්, මෙපමණ දෙයක් වැඩියෙන් (පොලියක්) දෙම්'යි අගය වැඩිකිරීමෙන් හෝ මෙයින් යම් ලාභයක් වේද, 'එය මටය, මුදල ඔබටම වන්නේ'යැයි ලාභය දෙදෙනාටම සමවන සේ හෝ මෙසේ සම්මතයකට පැමිණ ණය ගෙන, **චුජ්ජමානො පලායති**,

න හි තෙ ඉණමත්ථි ඒ ණයහිමියා 'මගේ ණය දෙව'යි, ඉල්ලනු ලබද්දී, 'මා ඔබෙන් ගන්නා ලද ණයක් නැතැ'යි ද, කවරෙකු සාක්කි වේද'යි මෙසේ කියමින් ගෙදර සිටියද ඉවතට යයි. කිඤ්චික්ඛකම්‍යතා ඉතා අල්ප ලෙසින් වුවද කිසියම් දෙයක්ම කැමතිව, පන්ථස්මිං වජතං ජනං පාරෙහි යන කිසියම් ගැහැණියක හෝ පිරිමියකු හෝ, හන්ත්වා කිඤ්චික්ඛමාදෙති මරා කපා කොටා ඒ බඩු පැහැර ගනී. අත්තහෙතු තම ජීවිකාව පිණිස, පරහෙතු ධනහෙතු එසේම තම ධනයට හෝ අනුන්ගේ ධනය වෙනුවෙන්, 'ච' හැමතැනටම විකල්ප ලෙසින් යෙදේ. සක්ඛි පුට්ඨො 'දන්නා දෙයක් වේනම්, එය කියව'යි පවසන ලදුව, මුසා බ්‍රෑති දනගෙන 'නොදනිමි' හෝ නොදන 'දනිමි' හෝ කියයි. හිමිකරුවන් අහිමි වූවත් ලෙසට පත් කරයි. ඤාතීනං ඒ හා බැඳුණු (නෑදෑ) ආදීන්ගේ, සඛානං සමවයස් වූ යහළුවන්ගේ, දාරෙසු අයිතිවූවන් කෙරෙහි හෙවත් බිරියන් කෙරෙහි, පතිදිස්සති පිළිකුල් ලෙස කටයුතු කරයි. ඉක්මවා හැසිරෙන ඇල්මක් දක්වයි. සහසා තම බලපුළුවන්කාරකමින්, (ඒ තැනැත්තිය) නොකැමතිව, සම්පියෙන ඔවුන් විසින් ඒ බිරියන් පතමින් දෙදෙනා කෙරෙහි ඇතිවන ආදරය ගැනද කියන ලද්දේ වේ.

මාතරං වා පිතරං වා මෙසේ මෙත් හැඟීමක් නැතිව, ජිණ්ණකං ගත යොබ්බනං මෙසේ කරුණ සහගත නොවී, පහුසන්තො න භරති සම්පත්, උපකරණ ආදී සියළු පහසුකම් තිබුණද, රැකබලා නොගෙන, ආහාරපානාදිය නොදෙයි. සසු බිරියගේ, හිමියාගේ මවට, හන්ති අතින් ගෙහ් කැටකැබිලිති ආදියෙන් හෝ වෙනත් කිසියම් දෙයකින් ගසයි. රොසෙති ඔහුට තරහම උපදවයි. වාචාය නපුරු වචනයෙන්, අත්ථං මෙලොව පරලොවදී, උසස් අරමුණු ඉටුකරගත හැකි යම් දෙයක්, පුච්ඡිතො සන්තො ඇසූවිටක, අනත්ථමනුසාසති ඔහුට අයහපතක් වන ලෙසටම කරුණු කියයි. පටිච්ඡන්නෙන මන්තෙති දියුණුවට අදාල දෙයක් හෝ කියයිද, තමා නොදන්නා වුවත්, නොඇසූ, සැඟවූ අදහස් ඇති වචන යොදමින්, වටහාගත නොහැකි ලෙස කතා කරයි. ගුරුවරයකු එළිදරව් නොකරන, රහස් මෙන්, දිගුකලක් සඟවාගෙන සිට, වෙනත් කරුණු කියයි. යො කත්වා අටුවාවෙහි මුල් කොටසෙහිදී පවිටු දෙයට කැමති බවක් ගැන මා විසින් සඳහන් කරන ලද පරිදි, 'මේ ලොවෙහි ඇතැම් කෙනෙක් කයෙන්, වචනයෙන්, සිතින් දුසිරිත්හි හැසිර, එය සැඟවීමට පවිටු, ලාමක හැඟීම අනුව බලාපොරොත්තුව කටයුතු කරයි. මා මං ජඤ්ඤාති ඉච්ඡති මෙසේ සිදුවී යැයි අනුන්ට දන නොගන්නා ලෙසට,

**කරතා** ලද දේ හෙළිනොවන ලෙස රහසක් සේ තැබීම **පටිච්ඡන්නකම්මන්තො** වෙයි. **පරකුලං** යනු නෑදෑ පවුලක් හෝ මිතුරු පවුලක් හෝ, **ආගතං** - එබඳු යම් පවුලකින් අනුභවකොට, එබඳු තැනකින් කෙනෙකු තම ගෙදරට පැමිණිවිට, ආහාරපාන ආදියෙන් **න පටිපූජෙති** පෙරළා නොසළකයි. නොදෙයි. මනාව ආහාර නොදෙයි. **යො බ්‍රාහ්මණං වා** පරාභව සූත්‍රයෙහි කියන ලද පරිදිය. **භත්තකාලෙ උපට්ඨිතෙ** අනුභව කරන කල ඇතිවූ, උපට්ඨිතං යනුවෙන්ද පාඨයකි. **රොසෙති වාචා න ච දෙති** මොහු මගේ දියුණුව කැමතිව මා පොළඹවාගෙන යහපත් දේ කරවීමට පැමිණියේ යැයි නොසිතා, නොගැළපෙන, රළු වචනයෙන් දොස් කියයි. යටත් පිරිසෙයින් හමුවීමටවත් ඔහුට ඉඩ නොදේ. ආහාරයෙහිද මෙසේම සැළකිය යුතුය. **අසතං යොධ පබ්‍රෑති** මේ ලෝකයෙහි යම් තැනැත්තෙකු, 'අසවල් දින මේ මේ දේ ඔබට සිදුවන්නේ' යැයි අයහපත් වචන කියයි. **අසන්තං** යනුද පාඨයකි. සිදුනොවන, නොවිය හැකි යන තේරුමයි. **පබ්‍රෑති** කියයි, 'අසවල් ගමේ, සැපසේ ජීවත්වීමට හැකි පරිදි මෙබඳු සැප සම්පත් තිබේ. එන්න, එහි යමු, මාගේ නිවසෙහි පතිනිය වන්න. මේ මේ දේවල් ඔබට දෙන්නෙමි'යි අනුන්ගේ බිරියක හෝ අනුන්ගේ දාසියක හෝ සලෙලකු මෙන් වංචා කරමින්, **නිජිංගිසානො** බලාපොරොත්තු ඇතිකරමින්, කැමැත්ත ඇතිකරවමින්, ඇය රවටා යම් කිසිවක් ගෙන පලායාමට අදහස් කරයි. **යොච'ත්තානං** යම් තැනැත්තකු තමන්ගේ, **සමුක්කංසෙති** 'උසස් ඉපදීමක් ඇතැ'යි තමා ඉහළ තත්වයක බව පෙන්වයි. **පරඤ්චමවජානති** ඒ ආකාරයෙන් අනුන් පහත් කොට සළකා කටයුතු කරයි. 'ම' අකුර වචන සන්ධිවීමේදී වූවකි. **නිහීනො** ගුණදහම් සපුරන්නේ නැතිව, ඉතා පහත් බවට ගිය, **සෙන මානෙන** එසේ තමා උසස්කොට, අනුන් පහත්කොට සලකන මානයෙන් යුතු,

**රොසකො** කය වචනයෙන් අනුන්ට කෝපය ඇතිකරන, **කදරියො** තද මසුරුබවින්, වෙන කෙනෙකු විසින් අනෙකෙකුට යම්දෙයක් දෙනු ලබනවිට, යහපත් දෙයක් කරනවිට යම් තැනැත්තෙකු එය වළකත්ද, මෙය ඊට සමාන වචනයකි. **පාපිච්ඡො** අයහපත් පවිටු දෙයට කැමතිව, ඒ ගතිගුණවලින් යුතු වූයේ, මච්ඡරී ආවාස ආදියෙහි මසුරු බවින් යුතු **සඨො** තමා තුළ නොමැති ගුණදහම් ඇතැයි පෙන්වන, කපටිබවින් යුතු, යහපත් කතාබහක් නැති, නොකරනු කැමති වුවත් 'කරමි' ආදී ලෙසින් පවසන, ඔහුට පවෙහි පිළිකුල් කිරීමේ, ලජ්ජාවක් නැත. එහෙයින්ම එහි නැතිගැනීමක්, සංවේගයක්, බියක් නැති බැවින් **අහිරිකො අනොත්තාපී,**

බුද්ධං සම්මා සම්බුදුන් වහන්සේට, **පරිභාසති** දතයුතු සියළු දෙය නොදන්නා බවට ආදී ලෙසින් දොස් නගයි. **සාවකඤ්ච** බුදුසව්වන්ට ද දුසිල් පිළිවෙතින් යුතු බව කියමින් දොස් නගයි. **පරිබ්බාජං ගහට්ඨං වා** මෙය සව්වන්ටම අදාළ පදයකි. පැවිද්දෙකුට හෝ, උන්වහන්සේගේ සාවක ගිහි තැනැත්තකුට හෝ, සිවුපසය සපයා දෙන කෙනෙකුට, වෙනත් සස්නෙක පිරිවැජියකුට හෝ, කිසියම් ගිහියෙකුට හෝ බොරුවට දොස් කීමෙන්, චෝදනා කිරීමෙන්, නින්දා කරයිද යන අදහස පැරණි වියත්හු (පොරාණ) කැමති වෙති. **අනරහා සනෙතා** කෙලෙස් දුරු නොකළද, එසේ හඟවමින්, **අරහං පටිජානති** මා රහත් යැයි හඟවයි. අනෙක් තැනැත්තන්ටද, 'මේ පුද්ගලයා රහත් කෙනෙකැ'යි හැඟවෙන පරිදි වචන කියයි. ඉරියව් මගින් පෙන්වීමට උත්සාහ කරයි. සිතින්ද ඒ බව කැමති වෙයි. **චොරො** සොරා, **සබ්‍රහමකෙ ලොකෙ** උසස් අදහසින් කීය. මුළු ලොවෙහිම යැයි කියන ලදී. ගෙවල් බිඳීම් මංකොල්ලකෑම්, ගෙවල් කඩාබිඳ දැමීම්, සැඟව සිට අනුන්ගේ ධනය පැහැර ගන්නාට ලොවෙහි සොරා යැයි හඳුන්වනු ලබයි. සසුනෙහිදී (අදාල සාවක) පිරිසගෙන් සිවුපසය ආදිය පැහැර ගැනීම සැළකේ. එහෙයින් මෙසේ වදාළහ. 'මහණෙනි, මේ ලෝකයෙහි සොරුන් පස්දෙනෙකු දක්නා ලැබේ. ඒ පස්දෙන කවුද? 'කවදා මට සියයක් හෝ දහසක් හෝ පිරිවරා හිංසා කරමින්, මරා දමමින්, කපමින්, කප්පවමින්, තදබල පීඩා පමුණුවමින්, ගම් නියම්ගම් රාජධානිවල ඇවිදින්නෙම් දැ'යි එක් මහා හොරෙකුට සිතෙහි. පසුකලක ඔහු සියයක් හෝ දහසක් හෝ පිරිවරා, හිංසා කරමින්........ ඇවිදි. මහණෙනි, එපරිද්දෙන්ම, මේ සස්නෙහි ඇතැම් පාපී මහණුන්ටද 'කවදා මම සියයක් හෝ........ පිරිවරා ගිහියන්ගෙන්ද පැවිද්දන්ගෙන්ද සත්කාර ගරු බුහුමන් පුද පූජා ලබමින් සිවුරු පිඬු අහර පිරිකර..... ලබන්නෙම්දැ'යි සිතති. මහණෙනි, මේ ලෝකයෙහි දක්නට ලැබෙන පළමුවන මහා සොරාය. මහණෙනි, නැවතද ඇතැම් පව්ටු මහණෙකු තථාගතයන් විසින් මනාව පවසන ලද දහම් විනය ඉගෙන (තමන් පිළිනොපැද) තමන්ම දවා (වැනසෙයිද) මහණෙනි, ඒ දෙවන සොරාය. නැවතද පව්ටු මහණකු සඟ පිරිසට අයත් උයන්වතු, එහි දේපල, වසන තැන්, විහාර දේපල, ඇඳ, පුටු, කොට්ට, ගුදිරි, තඹ කළ, තඹහැලි, තඹජෝගු, තඹ තාච්චි, වෑය, පොරොව, කෙටේරිය, උදැල්ල, අලවංගුව, වැල් උණ, සැවන්න, තණකොළ, මැටි, ලී බඩු, මැටි බඩු ආදිය (සැහැල්ලු) බර බඩු බාහිරාදිය හා පිරිකර, ගිහියන් ලවා රැස්කර ගනිත්ද, ඒවා ලබාගැනීමට චාටුකමින් පොළඹවා ගනිත්ද, ඔහු මේ ලෝකයෙහි දක්නට

ලැබෙන සිවුවන සොරාය. මහණෙනි, සදෙව්ලොව හා දෙව් මිනිසුන් 'අතර, යම් කෙනෙකු තමාට නොමැති මිනිස් ගති ඉක්මවා ලබන 'මගපල ආදිය ඇතැ'යි බොරුවෙන් මුලාකොට කියත් ද ඔහු සොරුන් අතර මුල්තැන ගන්නා සොරාය.* එදිනෙදා සොරු පොදුවේ මිල මුදල් සම්පත්, අස්වනු ආදිය සොරකම් කරති. ශාසනයෙහි කියන ලද මෙම සොරුන් අතර පළමු සොරා ඒ අයුරින් සිවුපසය ආදියද දෙවැනි සොරා උගතයුතු දහමෙහිද, තුන්වන සොරා (තමා නොහැසිරෙන බඹසරෙහි) අනුන්ට පවසමින්ද, සිවුවන සොරා පැවිද්දන්ට ලැබෙන බඩු බාහිරාදියෙහිද, පස්වන සොරා 'දහැන්, සමාධි, සමවත්, මගපලවලින්ද එලොව හා මෙලොව (යහපතට හේතුවන) ගුණදහම් නැමති ධනයද, එදිනෙදා ලැබෙන සිවුරු හා පහසුකම් ආදියද සොරකම් කරයි. 'මහණෙනි, ඔබලා විසින් සොරබවෙන් යුතුව රටවැසියන් දෙන අහර අනුභව කරන ලද්දේ'යැයි එහෙයින් කියන ලදහ. 'ථෙය්‍යාය වො භික්ඛවෙ රට්ඨපිණ්ඩො භුත්තො' එහි පස්වන මහ සොරා යම් කෙනෙකු වෙත් ද, ඔහු උදෙසා භාග්‍යවතුන් වහන්සේ **චොරො සබ්‍රහ්මකෙ ලොකෙ** යැයි වදාළහ. 'මහණෙනි, යම් තැනැත්තෙකු තමාට නැති මගපල ආදිය තමන්ට ඇතැයි බොරුවෙන් උසස්කොට කියත්ද, ඔහු සදෙව්ලෝ දෙවියන් සහ මිනිසුන් අතර මහා හොරෙක් වෙති'යි (හොර දෙටුවෙකු) මෙසේ වදාළහ. 'සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සදෙව මනුස්සාය අයං අග්ගො මහාචොරො යො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපතී' මෙසේ එලොව මෙලොව ධනය හොරකමෙහි හොර දෙටුවක ලෙස කියන ලදී. එය මෙහිදීද සබ්‍රහ්මකෙ ලොකෙ යැයිද තවත් තහවුරුකොට පැවසූහ. **එසො ඛො වසලාධමො** මෙහි ඛො යනු තදින්ම තේරුම් ගතයුතු හෙවත් අවධාරණය කිරීමයි. එයින්, එය (එම කරුණ) වසලයකු බවට පත්වන බව, හැම කරුණකට පසුව යෙදීමෙන් දැඩිසේ පෙන්වා දෙයි. කවර හෙයින්ද? උසස් දෙයෙහි සොර ගතිය දක්වෙන බැවිනි. ඒ අදහස ඉවත නොහරින තාක් කල් වසල බවට හේතුවන කරුණුද පවතී.

**එතෙ ඛො වසලා** මීළඟට ඒවා, (වෙන් වෙන්ව) පළමු ගාථාවෙන් සිතේ පවත්නා විපතක් ලෙස තරහ ආදී කරුණු පහක් ද පවිටු ගුණමකු බවද වෙන්කොට හයක් ලෙසද, දෙවන ගාථාවෙහි වැරදි පිළිවෙතක්

* අටුවාවේ පාරාජිකාපාලියෙන් ගෙන ඇති පාලි පාඨයද සඳහන් වුවත් එය දිග වැඩි බැවින් අනුවාදය පමණක් දැක්වීමි.

ලෙස පණ ඇති කෙනෙකුට හිංසා කිරීම එකක් ලෙසද, තුන්වන ගාථාවෙහි වැරදි පිළිවෙතක් ලෙස ගම් නියම්ගම් පැහැරීම එකක් ලෙසද, සොරකම ලෙසින් සතරවන ගාථාවෙහි එකක්ද පස්වැන්නෙහි ණය ගෙන රැවටීම එකක්ද, හයවැන්නෙහි බලහත්කාරව, මග සැඟවී පැහැර ගැනීම එකක් ලෙසද, හත්වැන්නෙහි වංචා සහගතව කරුණු තහවුරු කිරීම එකක් ද, අටවැන්නෙහි මිතුරන් භේද කිරීම එකක්ද, නව වැන්නෙහි කළගුණ නොදැනීම එකක්ද, දසවැන්නෙහි හානිකිරීම්, හිංසා පීඩා කිරීම් ලෙසින් එකක්ද, එකොළොස්වැන්නෙහි හදවතින්ම රැවටීම එකක්ද, දොළොස් වැන්නෙහි කරන කටයුතු සැඟවීම ලෙස දෙකක්ද දහතුන් වැන්නෙහි කළගුණ නොදත් ලෙසින් එකක්ද, දහහතර වැන්නෙහි රැවටීම ලෙස එකක්ද, පහළොස් වැන්නෙහි පීඩාකිරීම් ලෙසින් එකක්ද, දහසය වැන්නෙහි රැවටීම් ලෙසින් එකක්ද දහහත් වැන්නෙහි තමා උසස්කොට අනුන් හෙළා දැකීම් ලෙසින් දෙකක්ද දහඅටවැන්නෙහි වැරදි පිළිවෙත් කටයුතු නිසා වන විපත් ලෙස කෝප කරවීම් ආදී සතකින්ද, දහනව වැන්නෙහි අපහාස ලෙස දෙකක්ද, විසිවැන්නෙහි මුල්ම සොරා ලෙස එකක්දැයි මෙසේ කරුණු තිස්තුනක් හෝ තිස්හතරක් දක්වා වසලයෙකු වන අයුරු නිදසුන්කොට පෙන්වූහ. **එතෙ ඛො වසලා වුත්තා මයා යෙ වො පකාසිතා** එහි තේරුම නම්, යෙ වො මයා බමුණ, වසලයකු වන කරුණු ඔබ කලින් දැන සිටියෙහිද? මෙසේ කෙටියෙන් (දැක්වෙයි) **වසලා වුත්තා** ඒවා විස්තර ලෙසින්, **එතෙ ඛො පකාසිතා** නැතහොත් **යෙ වො මයා** පුද්ගලයකු සළකා කියනු ලැබීය. ඒවා කරුණු ලෙසින් **එතෙ ඛො පකාසිතා** නැතහොත් **එතෙ ඛො වසලා වුත්තා** උසස්, උතුම් කටයුතු ලෙසින් මිස උපතින් නොවේ. **මයා යෙ වො පකාසිතා** යනු **කොධනො උපනාහි** ආදී වසයෙනි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ වසලයා හඳුන්වා, යම් ලෙසකින් බමුණ තම දැඩිව ගත් හැඟීමෙන්, තදින්ම ඇලී සිටිත් ද, ඒ අයුරින්ම හැඟීම ඉවත් කෙරෙමින්, **න ජච්චා වසලො** යැයි කීහ. එහි තේරුම නම්, ඇත්තටම **න ජච්චා වසලො හොති, න ජච්චා හොති බ්‍රාහමණො** එතකුදු වුවත් **කම්මනා වසලො හොති කම්මනා හොති බ්‍රාහමණො** අපිරිසිදු කටයුතුවල යෙදී ඊට වසඟ වූයේ වසලයෙක් වෙයි. පිරිසිදු කටයුතුවල යෙදී, අපිරිසිදු දෙය බහා තැබීමෙන් බ්‍රාහ්මණයෙක් වෙයි. ඔබලා වසලයකු පහත් ලෙසද බමුණකු ඉතා උසස් ලෙසද යම් ආකාරයකින් සිතවුද, එසේනම්, වසලයකු වන්නේ (ඔහුගේ) පහත් කටයුතු නිසාය. උසස් කටයුතු නිසා බමුණකු වේ යැයි මෙසේද තේරුම් කොට දෙමින් මෙසේ

කීහ. මීළඟට එම අදහසම නිදසුන්කොට තහවුරු කරන්නට **තදමිනාපි ජානාථ** ආදී ගාථා තුනක් වදාළහ. ඒවා අතරින් ගාථා දෙකක් සතර පදයි. එක් ගාථාවක් පාද හයකි. එහි තේරුම මෙසේය. **න ජච්චා වසලො හොති** යනුවෙන් මා විසින් යම් කරුණක් කියන ලද ද, **තදමිනාපි ජානාථ යථාමෙදං නිදස්සනං** එය මේ ආකාරයෙන් දැනගනුව, මාගේ මහණකම අනුව මේ නිදසුන කියන ලදී. කෙබඳු නිදසුනක්ද? **චණ්ඩාලපුත්තො සොපාකො** -පෙ- **බ්‍රහ්මලොකූපපත්තියා** සැඩොලාගේ පුතු = **චණ්ඩාල පුත්තො**, මළසිරුරු කන බල්ලන් ලවා තමන්ද කා දමනු පිණිස, **සොපාකො, මාතංගො** යනු එම නම්වලින් හඳුන්වනු ලබන, **විස්සුතො** මෙසේ පහත් උපතින්ද, දිවි පැවැත්මෙන්ද, නමින්ද පතළව, **සො** දෙවැනි පදය හා සම්බන්ධකොට, **සො මාතංගො යසං පරමං පත්තො** පුදුම ඇදහිය නොහැකි තරම්, උතුම් ඉතා උසස් කිත් පැසසුමට පත්ව, **යං සුදුල්ලභං** උසස් යැයි සම්මත කුලයක උපන්නද ලැබිය නොහැකි, පහත් යැයි සම්මත කුලයක උපන් බැවින් ඉතා දුලබ වූ මෙබඳු යසසට පත්ව, **ආගඤ්ඡුං තස්සුපට්ඨානං ඛත්තියා බ්‍රාහ්මණා බහූ** ඒ මාතංගට මෙහෙවර පිණිසද උවටැන් පිණිස ද කැත් කුලවත්හුද, බමුණෝද, වෙළඳ, සුද්ද ආදී කුලවලට අයත් (යැයි සැළකෙන) බොහෝ දඹදිව මිනිස්සු පැමිණියහ යන තේරුමයි. මෙසේ උවටැන් ලබන හේතු සම්පත් ඇති **සො මාතංගො**, කෙලෙස් දූවිලි පහකරන ලද බැවින් **විරජං**, ගරු කටයුතු බුදුවරු ආදී උතුමන්ගේ මගට පිළිපන් බැවින් **මහාපථං** බඹලොවට, දෙව්ලොවට යාමට හැකිබැවින් **දෙව ලොක යාන** යැම කියන ලද සමවත් අටනම් යානයට **අභිරුය්හ**, ඒ පිළිවෙතින්, **කාමරාගං විරාජෙත්වා** කය බිඳීමෙන් හෙවත් මරණින් පසු **බ්‍රහ්මලොකූපගො අහු** එය එසේ උසස් යැයි සම්මත නොවූවත්, **න නං ජාති නිවාරෙසි, බ්‍රහ්මලොකූපපත්තියා** බඹලොව උපත ලදැයි කියන ලදී. මේ තේරුම මෙසේ දතයුතුය.

ඒ ඒ අයුරින් සතට හිතසුව සලසන මහ බෝසතාණෝ පෙර, පහත් යැයි සම්මත සැඩොල් කුල උපන්නාහ. මාතංග නම් වූ ඔහු විරූපීව, නුවරින් පිටත, සමින් කරන ලද කුටියක වාසය කරයි. ඇතුළු නුවර ආහාර පිණිස හැසිර, ජීවිතය ගෙන යයි. මේ අතර, එක්දිනක, ඒ නුවර සුරා නැකැත් උළෙල දැන්වූ කල, සුරාලෝලීහූ තමන්ට හැකි අයුරින් පිරිවර සමග කෙළිදෙලෙන් ගත කරති. දැකුම්කළු, පහදනා සුළු රූ සපුවෙන් යුතු, දෙවඟනක බඳු දිට්ඨමංගලිකා නම් වූ, පසළොස් විය සපිරි එක් බමුණු මහසල් කුල දූවක් ද, තම කුල පරම්පරාවට සුදුසු පරිදි

කෙළිදෙලෙන් ගතකරන්නෙමි'යි රසකැවිලි ආදී බොහෝ නොයෙක් දේ ගැල්වල පටවා, සුදුපැහැ ගොනුන් යෙදූ යානාවකට නැගී මහ පිරිවරින් උයනට යන්නීය. ඇය "විරූපී දේ යහපත් නොවේ" යැයි දකීමට අකමැතිය. එහෙයින් ඇය 'දිට්ඨ මංගලිකා' නම් වූවාය. එකල මාතංග උදෑසනම පිබිද, පටරෙදිකඩක් හැඳ, පිත්තල සීනුවක් අතෙහි බැඳ, දුරසිටම මිනිසුන් දුටුවිට එය නාද කරමින්, ආහාර සඳහා නගරයට පිවිසෙයි. එවිට දිට්ඨමංගලිකාද (මොහු) 'ඉවත් කරව, ඉවත් කරව' යැයි පහත් ලෙස සිතන ජනයා ඉවත් කිරීමෙහි නියුතු මිනිසුන්ට නියෝග කරන්නී, නගර දොරටුව මැද දී මාතංග දැක 'අර කවුරුන්ද'යි ඇසුවාය. 'මා මාතංග නම් සැඩොලා වෙමි'යි ඔහු කීය. ඇය 'මෙබඳු කෙනෙකු දැක ගියවිට කිනම් යහපතක් වේද'යි රිය නැවැත්වූවාය. එවිට මිනිස්සුද 'අපට උයනට ගොස් කෑමබීම ආදිය ලැබීමටද ඉඩ තිබුණි. මාතංගයා අපට අනතුරු කරන ලද'යි කිපී 'සැඩොලා අල්ලා ගනිවු'යි කැටකැබලිතිවලින් පහර දී (ගල්මුල් ගසා) 'මළේ'යැයි පාදයෙන් ගෙන පසෙකට ඇද දමා කසළින් වසා ගියහ. ඔහු සිහිය ලැබ නැගිට, 'උතුමනි, මේ දොරටුව සියල්ලන්ටම අයත්ද? නැතිනම් බමුණන්ටම පමණක් වෙන්කරන ලද්දක්ද'යි මිනිසුන්ගෙන් ඇසීය. 'සියල්ලන්ටම පොදු යැ'යි ඔවුහු කීහ. 'මෙසේ සියල්ලන්ටම පොදු දොරටුවෙන් පිවිස, ආහාර ඉල්ලාගෙන යැපෙන මට දිට්ඨමංගලිකාගේ මිනිසුන් මේ මහ විපත කරන ලද'යි වීදියක් වීදියක් පුරා ඇවිදිමින්, ජනතාවට පවසමින්, 'දිට්ඨමංගලිකාව නොලැබ මිස නොනැගිටිමි'යි බමුණාගේ ගෙදර දොරටුවෙහි වැතිරුණේය. බමුණාද තම ගෙදර දොරටුවෙහි මාතංග වැතිර සිටිති'යි අසා 'ඔහුට තුට්ටුවක් දී (ඉතාම සුළු මුදලක්) සිරුර තෙලෙන් ආලේප කරගනුව'යි කියා ඉවත් කරන ලෙස කීය. ඔහු ඊට නොකැමති විය. දිට්ඨමංගලිකාව නොලැබ නොනැගිටිමි'යි කීය. එවිට බමුණා, තුට්ටු දෙකක මුදල් දෙව, තුට්ටුවකින් කැවුමක් කෑමටත්, අනික් තුට්ටුවෙන් සිරුරෙහි (රුදා ඇති තැන්) තෙලින් ආලේප කරගනුව'යි දන්වීය. ඔහු ඊටද නොකැමතිව, දිට්ඨමංගලිකාව ගැනම කියයි. බමුණා එය අසා, මසුරමක් දෙව, කහවණුවකින් සතරෙන් කොටසක්, අඩ කහවණුවක්, කහවණුවක්, කහවණු දෙකක්, තුනක්, සියයක් දක්වා (දීමට) අණ කළේය. මාතංගද ඊට නොකැමතිව දිට්ඨමංගලිකාවම ඉල්ලද්දී හිරු ද අවරට ගියේය.

ඉක්බිති බැමිණිය පහයෙන් බැස, තිරවලින් වටකරවා ඔහු වෙතට ගොස්, 'දරුව මාතංග, දිට්ඨමංගලිකාවගෙන් වූ වරදට කමා කරන්න.

කහවණු දහසක් ගනුව, දෙදහසක්, තුන්දහසක් බැගින් මෙසේ සියදහසක් දක්වා ගනුව'යි කීවාය. ඔහු නිහඬවම වැතිර සිටියේය. මෙසේ සතර පස් දිනක් ගත වූ විට, බොහෝ පඬුරු (තෑගි) ආදිය දුන්නත් දිට්ඨමංගලිකාව නොලද රජ කුමාරවරු 'පිරිමියෙකු නම්, අවුරුදු කීපයක් වුවත් උත්සාහ කොට කැමති දේ ලබාගනිති, ඔබ කලකිරීමට පත් නොවන්න, ඒකාන්තයෙන්ම දින දෙක තුනකින් ඔබ දිට්ඨමංගලිකා ලබන්නෙහි' යැයි මාතංගට කණට කොඳුරා කීහ. ඔහු නිහඬවම වැතිර ගත් ලෙසම සිටියේය. ඉක්බිති සත්වන දිනයෙහි ඒ අවට සිටින අසල්වාසීහු එක්ව 'ඔබලා මාතංග නැගිටුවා (ඉවත් කරව) දූරිය හෝ දෙව, අප සියල්ලන් නොනසව'යි කීහ. යම් තැනැත්තකුගේ ගෙදර දොරටුවෙහි, මෙසේ වැතිර හුන් අයෙකු මැරෙත්ද, ඒ ගෙදර සහ හාත්පස ගෙවල් හතක, ගෙවල් හතක වසන්නෝ සැඩොල් බවට පත්වෙති'යි ඔවුන්ට මෙබඳු හැඟීමක් විය. එවිට දිට්ඨමංගලිකාට නිල්පැහැ රෙදිකඩක් පොරවා, බත්හැන්දක් දෘමූ බඳුන් ආදිය අතට දී හඬද්දීම ඔහු ළඟට ගෙන ගොස්, 'එසේනම් දූරිය මෙන්න, නැගිට යව'යි (භාර) දුන්හ. ඇය පසෙක සිට 'නැගිටින්න' යැයි කීවාය. 'අතින් අල්වා නැගිටුව'යි මාතංග කීය. ඈ ඔහු නැගිටවූවාය. ඔහු හිඳගනිමින්, 'අපි ඇතුළුනුවර විසීමට ඉඩ නොලබමු, එන්න, මා නුවරින් පිටත සම් කුටියට ගෙන යන්නැ'යි කීය. ඈ ඔහු අතින් අල්වාගෙන එහි ගියාය. පිටෙහි තබාගෙන ගිය බව ජාතක භාණකයෝ කියති. මාතංග එහි ගෙන ගොස්, සිරුරෙහි තෙල් ගල්වා, උණු දියෙන් නාවා, කැඳ පිස දුන්නාය. ඔහු, 'මේ බමුණු දූරිය නොනැසේවා'යි කුල මුසුකිරීමක් නොකොට (පහස නොලැබ) අඩමසක් පමණ සිරුරට සවිබල ගෙන, 'මම කැලයට යමි, ආපසු ඒමට කල්ගත වේයැයි ඔබ කලකිරීමට පත් නොවව'යි කියා, (අවට) ගෙවල්වල වසන මිනිසුන්ට 'මැය රැකගනුව'යි අණකොට, ගෙයින් නික්ම, තවුස් වෙසින් පැවිදිව, කසිණ බවුන් වඩා, කිහිප දිනකින් සමවත් අට ද අභිඥාඥා පහ ද උපදවා, 'දූන් මා දිට්ඨමංගලිකාවගේ මනාපය වන්නේ'යැයි අහසින් අවුත් නුවර දොරටුවෙහි බැස, දිට්ඨමංගලිකාවට (තමා වෙත) පැමිණෙන ලෙස දැන්වීය. ඇය එය අසා, 'පැවිදිව සිටින කිසියම් මගේ නෑදෑයෙකු මගේ අසරණ බව දැන, දැකීමට පැමිණියාහ'යි සිතන්නී, එහි ගොස් ඔහු හඳුනා දෙපා මුල වැතිර, 'මා අනාථ කළේ ඇයිදැ'යි ඇසුවාය. මහ බෝසත් මාතංග 'දිට්ඨමංගලිකාවනි, ඔබ දුක් නොවන්න. මුළු දඹදිව වැසියන්ගෙන් ඔබට ගරු සැළකිලි ලබාදෙන්නෙමි' මෙසේද පැවසීය. 'මගේ සැමියා මහා බ්‍රහ්මය, මාතංග නොවේ. මහා බ්‍රහ්ම දින හතකින් සඳ විමන පලාගෙන මා ළඟට එන්නේයැ'යි ඔබ

ගොස් එම ආරංචිය පතුරුවා හළ මැනවැ'යි ද දන්වීය. 'හිමියනි, බමුණු මහසල් කුලදුවක් වූ මම මගේ පව නිසා මෙවන් දිළිඳු බවට පත්වීමි. එසේ කිව නොහැකි යයි ඈ කීවාය. මහ බෝසත්, 'ඔබ මාතංග ගේ බලය නොදන්නෙහි'යැයි කියා, ඇයට එය තහවුරු වන අයුරින් නොයෙක් පෙළහර දක්වා, එසේම ඇයට අණකොට තමා වසන තැනට ගියේය. ඇය ඔහු කී ලෙස කළාය. තම පව්කම්වලින් සැඩොලියක වූ මැයට, මහා බ්‍රහ්මයා (ඇගේ කුලවත් බව) කෙසේ නැවත ඇති කරන්නේද'යි අපහාස කරමින් මිනිස්සු සිනාසුණහ. ඇය තද උඩඟු බවින් යුතුව, 'මෙයින් හයවන දින, පස්වන දින, සිවුවන, තුන්වන දින, හෙට, අද එන්නේ'යැයි දවසින් දවස හඬ නගා කියමින් නගරයෙහි ඇවිදින්නීය. මිනිස්සු ඇය පවසන දේ විය හැකි යැයි දැන, තම නිවෙස් දොරටුවල වේදිකාවක් කරවා, (මහා බ්‍රහ්මගේ) අත අල්ලා ගැනීමට කටයුතු සලස්වා, වියපත් දැරියන් සරසවා 'මහා බ්‍රහ්ම පැමිණි කල, (තවමත් විවාහ නොවූ කුමරි බඹසර රක්නා) කන්‍යාදා දානයක් දෙමු'යි, අහස දෙස බලමින් හුන්හ. ඉක්බිති මාතංග මහ බෝසත්, පොහෝ දිනයෙහි අහස් තලයට නැගී, ජනයා බලා සිටියදීම, සඳෙහි සඳවිමන පලාගෙන, මහාබ්‍රහ්ම රුවෙන් පිටතට ආවේය. මිනිස්සු සඳවල් දෙකක් පායා ඇතැයි සිතූහ. එහිදී කෙමෙන් කෙමෙන් පැමිණෙනු දැක, දිට්ඨමංගලිකා කීවේ ඇත්තකි. මහාබ්‍රහ්මයාම මේ දිට්ඨමංගලිකාව හික්මවීමට මාතංග ලෙසින් ආවේ'යැයි තීරණය කළේය. මෙසේ ඔහු මහජනයා බලා සිටියදීම, දිට්ඨමංගලිකා සිටින තැනටම බැස්සේය. එදිනම ඇය ගැබ් ගැනීමට සුදුසුව සිටියාය. ඔහු ඇගේ නැබ ඇඟිලිතුඩින් පිරිමැදීය. ඒ පහසින් දරු ගැබක් පිහිටියේය. එහිදී, 'ඔබට දරුගැබක් පිහිටියේය. පුතකු ලද විට, ඔහු නිසා ජීවත් වන්නැ'යි ඇයට පැවසූ (මාතංග) මහජනයා බලා සිටියදීම සඳ විමනට පිවිසියේය. බමුණෝ, 'දිට්ඨමංගලිකාව මහා බ්‍රහ්මගේ බිරිඳය. අපගේ මව පහළ වූවායැ'යි කියා, සත්කාර කරනු කැමතිව ඒ ඒ තැනට කැඳවමින්, මිනිසුන් එක්රැස් වීමෙන් නගර දොරටු අවහිර විය. ඔවුහු දිට්ඨ මංගලිකා අමුරන් ගොඩක තබා, නහවා, සරසා අලංකාර කොට, රියක නංවා, මහත් හරසරින් නගරය වටා ගෙනගොස්, නගරය මැද වේදිකාවක් කොට, ඇය එහි 'මහා බ්‍රහ්මයාගේ බිරිඳ'යැයි දෙවඟනක මෙන් තබා, වාසය කරවීය. 'ඔබට වාසය කිරීමට සුදුසු තැනක් කරමු, එතෙක් මෙහි වාසය කරනු මැනවැ'යිද කීහ. ඈ එම වේදිකාවෙහිම පුතකු බිහිකළාය. ඒ උතුම් පිරිසිදු දවසෙහි, පුතු සමග (ඇයද) හිස පටන් නහවා, 'මණ්ඩපයෙහි උපන් බැවින්, 'මණ්ඩව්‍ය කුමරු' යැයි දරුවාට

නම් තැබූහ. එතැන් පටන් බමුණෝ 'මහා බ්‍රහ්මගේ පුතු' යැයි ඔහු පිරිවරා හැසිරෙති. එමෙන්ම, නොයෙක් සියදහස් ගණනින් පඬුරු ගෙන පැමිණෙති. ඒ බමුණෝ කුමරුට රැකවරණ සැලසූහ. එහි පැමිණෙන්නෝ ඉක්මණින් කුමරු බැහැදැකීමට ඉඩ නොලබති. කෙමෙන් කෙමෙන් වැඩෙන කුමරු දන් දීමටද පටන් ගත්තේය. දෙනු ලබන දෑ ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් පැමිණෙන දුගී දිළින්දන් ආදීන්ට නොදී, මණ්ඩව්‍ය කුමරු බමුණන්ටම දෙයි. මහ බෝසත් ද 'මගේ පුතු කෙසේ දන් දෙයිද, නොදේ දැ'යි විමසා බලද්දී, බමුණන්ටම දෙන බව දැක, 'සියල්ලන්ටම ලැබෙන පරිදි කටයුතු යොදමි'යි සිවුර පොරවා, පාත්‍රය ගෙන, අහසින් අවුත් පුතුගේ ගෙයි දොරකඩ සිටියේය. කුමරු ඔහු දැක, 'මෙබඳු විකාර රූ ඇති සැඩොලකු කොහෙන් පැමිණියේදැ'යි කිපී මේ ගාථාව කීය.

කුතො නු ආගච්ඡසි රුම්මවාසී
ඔතල්ලකො පංසුපිසාචකොව,
සංකාරචොලං පටිමුච්ච කණ්ඨෙ
කො'රෙ තුවං හොසි අදක්ඛිණෙය්‍යො

'කසල ගොඩකින් අහුලා ගත්, පිළිවෙලකට නැති පරණ රෙදි වැරහැලි සඟල සිවුරක් ගෙලෙහි සිට හැඳගෙන, නොවටිනා පාත්‍රයක් එල්ලාගත්, කසල ගොඩක පේතයකු වැනි දන් පිළිගන්නා තැනකට ඒමට නුසුදුසු බොල කොහි සිට ආවෙහිද? තා කවරෙක්ද?'

බමුණෝ 'අල්වා ගනිවු, අල්වා ගනිවු' කියමින්, ඔහු අල්ලාගෙන තලා මහත් විපතට පත්කළහ. ඔහු අහසින් ගොස්, නගරයෙන් පිටත තැනක සිටියේය. කිපුණු දේවතාවෝ කුමාරයා බෙල්ලෙන් අල්ලා, දෙපා ඉහළටත්, හිස පහළටත් තැබූහ. පිටතට නික්මුණු ඇස්දෙකින් හා මුවෙන් කෙළ වගුරුවමින්, 'සුරු සුරු හඬින් හුස්ම හෙළමින් දුක්විඳිනු ලබයි. දිට්ඨමංගලිකා ඒ අසා 'කිසිවෙකු පැමිණ ඇත්දැ'යි ඇසුවාය. 'එසේය, පැවිද්දෙකු පැමිණියේ යැයි කීය. ගියේ කොතැනටද?' 'මේ දෙසට ගියේය' ඇය ඒ අනුව ගොස්, 'හිමියනි, තමා වන් දාසයාට කමා කළ මැනවැ'යි ඔහුගේ පාමුල බිම වැතිරුණාය. එවේලෙහි මහබෝසත් පිඬු පිණිස හැසිර, ලැබුණු කැඳ පානය කරමින් සිටියේය. ඔහු ඉතිරි කැඳ ටිකක්, දිට්ඨමංගලිකාට දුන්නේය. 'යව, මේ කැඳවතුර කළයකට දමා කලතා, භූත විකාරයක් ඇති තැනැත්තාගේ මුහුණ, ඇස්, කන්, නාසා පුඩුවල

ඉසව, සිරුරෙහි ද තැවරෙන සේ කැඳ විසුරුවනු, මෙසේ සුව වන්නේ යැයි ද කීය. ඇය එසේ කළාය. කුමරුට පෙර පරිදි සිහි ලද විට, 'එන්න, පුත, පණ්ඩිතයන් කමාකරවන්නෙමු'යි පුතු ද බමුණාද ඔහුගේ පාමුල මුණින් හොවා හිඳුවා කමා කරවීය. මාතංග පඬිතුමා සියළු දෙනාටම දානය දිය යුතුයැයි අවවාද කොට, තමන් වසන තැනට ගොස්, 'දිට්ඨමංගලිකාව දමනය කරන ලද බව කාන්තාවන් අතර පතළය, මිනිසුන් අතර පතළව ඇත්තේ මණ්ඩව්‍ය කුමරු දමනය කරන ලද බවයි. දැන් කවරෙකු දමනය කළ යුතුද'යි සිතුවේය. එහිදී, බන්ධුමතී නුවර, බන්ධුමතී ගංතෙර වසන, උපතින් උසස් යැයි උඩගු තවුසෙකු දුටුවේය. ඔහු 'මම උපතින් ඉතා උසස් වෙමි. වෙනත් කෙනෙකු පරිහරණය කරන ජලය නොගනිමි'යි ගඟෙහි ඉහළ පෙදෙසේ වසයි. මහ බෝසත්, ඒ තවුසා වසන තැනටත් ඉහළ පෙදෙසක වාසයට සුදුසු සේ පිළියෙල කොට, උඩගු තවුසා ජලය පරිහරණය කරනවිට, දැහැටි සපා ජලයට දැමීය. එය ගඟෙහි පාවී එනු දුටු තවුසා, 'මෙය දැමුවේ කවුරුන්ද'යි උඩුගං බලා ගොස්, මහ බෝසත් දැක, 'මෙහි ඉන්නේ කවුදැයි ඇසීය. 'ඇදුරුතුමනි, මාතංග නම් සැඩොලාය. 'සැඩොලා ඉවත යව, ගඟ ඉහළින් වාසය නොකරව'යි කීය. මහබෝසත් ද 'යහපත, ඇදුරුතුමනි,'යැයි (පිළිගෙන) ගඟ පහළ වසයි. පහළට ගසා ගෙන යන දැහැටි දඬු ආදිය (උඩගු) තවුසා ළඟට පාවී එයි. තවුසා නැවත සැඩොලා ඉවතට යව, ගඟ පහළින් වාසය නොකරනු, ගඟ ඉහළින්ම වාසය කරනු යැයි කීය. බෝසත් තවුසා 'යහපත ඇදුරුතුමනි' යැයි එසේ කළේය. නැවත ද එසේම සිදුවිය. (උඩගු) තවුසා නැවත ද එසේම කරති'යි කිපී, 'හිරු උදාවන වේලෙහි ඔබේ හිස සත්කඩකට පැලේවා'යි බෝසත් තවුසාට සාප කළේය. 'යහපත, ඇදුරුතුමනි, මම හිරු උදාවීමට නොදෙමි'යි හිරු නැගීම වැළැක්වීය. එයින් රැය ඉක්ම නොයයි. කළුවර පවතී'යැයි බිය වූ බන්ධුමතී වාසීහු තවුසා වෙත ගොස්, 'ඇදුරුතුමනි, අපට යහපතක් වේද'යි ඇසූහ. ඔවුහු ඒ තවුසා රහත් වූවෙකැ'යි සිතති. තවුසා ඔවුන්ට සියල්ල පැවසීය. වැසියෝ මහබෝසත් තවුසා වෙත ගොස්, 'හිමියනි, හිරු මුදාහළ මැනවැ'යි ඉල්ලූහ. 'ඔබලාගේ රහත් වූ තැනැත්තා අවුත් මා කමා කරත්ද, හිරු මුදා හරිමි'යි කීය. එවිට මිනිස්සු, 'හිමියනි, එන්න, මාතංග පඬිතුමන් කමා කරගනුව, ඔබගේ කලහය අප වැනසීමට පත් නොකරනු මැනව'යි තවුසාට කීහ. (උඩගු) තවුසා 'මම සැඩොලා කමා කර නොගනිමි'යි කීය. මිනිස්සු, 'ඔබ අප වනසන ලද්දේහි' යැයි අත්පා වලින් අල්වාගෙන, මහා බෝසත් තවුසා ළඟට ගෙන ගියහ. මාතංග තවුසාද 'මගේ පාමුල

දිගාවී වැතිර, කමා කරන්නේ නම්, සමාව දෙමි'යි කීය. මිනිස්සු එසේ කරන ලෙස තවුසාට පැවසූහ. 'මම සැඩොලාට නොවඳිමි'යි (නැවත) පැවසීය. එවිට, මිනිස්සු 'ඔබේ කැමැත්තෙන් නම්, නොවඳින්නෙහි'යැයි අත්, පා, රැවුල, බෙල්ල ආදී තැන්වලින් අල්වාගෙන, බෝසත් තවුසා පාමුල නිදි කරවූහ. බෝසත් තවුසාද, 'මොහුට මම කමා කරමි, එහෙත් ඔහුට අනුකම්පාවෙන්ම හිරු උදාවීමට නොදෙමි. හිරු උදාවනවිට ඔහුගේ හිස සත්කඩකට පැලෙන්නේ'යැයි ද පැවසීය. මිනිස්සු 'දැන් කුමක් කළයුතු දැයි ඇසූහ. 'එසේනම් මොහුගේ ගෙල පමණට වතුරෙහි තබා, මැටිවලින් හිස ආවරණය කරව, හිරු රැස් පහස ලබනවිටම මැටි වැස්ම සත්කඩකට පැලෙන්නේය. එසේ පැලුනු විට, ඔහු වෙනතකට යේවා'යි මාතංග තවුසා පැවසීය. (ඔවුහු) තවුසාගේ අත් පා ආදියෙන් අල්වාගෙන එසේ කළහ. මැටි වැස්ම සත් කඩක්ව පැලී දියට වැටුණු විට තවුසා බියවී පලා ගියේය. ඒ දුටු මිනිස්සු 'පින්වතුනි, බලව, මහණකුගේ බලය' යැයි, දෑහැටි ආදිය පිරිනමා සියළු කරුණු වටහාගෙන, (කලින් සිටි තවුසා) මෙබඳු මහණකු නොවේයැ'යිද සළකා තවුසා කෙරෙහි පැහැදුණහ. එතැන් පටන් මුළු දඹදිව රජ බමුණු ආදී ගිහියෝ, පැවිද්දෝ මාතංග පඬිතුමන්ට උවටැන් සඳහා පැමිණියහ. තවුසා ආයු ඇති තෙක් ජීවත්ව, මරණින් පසු බඹලොව උපන්නේය. එහෙයින් **තදමිනාපි ජානාථ -පෙ- බ්‍රහ්මලොකුපපත්තියා** යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

මෙසේ **න ජච්චා වසලො හොති, කම්මනා වසලො හොතී** යන කරුණ පහදා මීළඟට **න ජච්චා හොති බ්‍රාහ්මණො - කම්මනා හොති බ්‍රාහ්මණො** යන්න තහවුරු කරන්නට **අජ්ඣායක කුලෙ ජාතා - දුග්ගච්චා ගරහාය වා** වදාළහ.

**අජ්ඣායක කුලෙ ජාතා** යනු වේද මතුරු ඉගෙන, ඒ අනුව කටයුතු කරන, බමුණු යයි සම්මත පවුලක ඉපිද, **අජ්ඣායකා කුලෙ ජාතා** යයිද පාඨයකි. මන්ත්‍ර ඉගෙනුම ලද, නොකිලිටි වූ බමුණු කුලයක උපන් යන තේරුමයි. මන්ත්‍ර සකස්කොට ගත්තෝ යන අරුතින්, **මන්තබන්ධවා**, වේදයෙහි නෑයෙකු බඳු, වේදය පිහිටකොට ඇති බව කියන ලදී. **තෙච පාපෙසු කම්මෙසු අභිණ්හමුපදිස්සරෙ** ඔවුහු මෙබඳු කුලයක උපත ලදද මන්ත්‍ර සකස්කොට තිබුණද, පරපණ නැසීම ආදී පව්කම්හි නැවත නැවත යෙදෙති. **දිට්ඨෙව ධම්මෙ ගාරය්හා සම්පරායෙ ච දුග්ගති** ඔවුහු මෙසේ පතළ වෙමින්, (ඒ කටයුතුවල යෙදෙමින්) මේ ජීවිත කාලය තුල මවුපියන්

විසින්ද 'මොවුන් අපගේ පුත්තු නොවෙති. ඔවුන් කුලයට නිගරු කරමින්, අවජාතකව උපන්නාහ, ඔවුන් පලවා හරිවු' යනුවෙන් ද, බ්‍රාහ්මණයන් විසින්, 'මොවුන් ගැහැවියෝය, ඔවුන් බමුණෝ නොවෙති, ඔවුන්ට මලවුන් උදෙසා දෙන දාන (සැදධ) යාග, කිරිබත් හැළි ආදිය පිරිනමන තැන්වලට පිවිසීමට ඉඩ නොදෙව, ඔවුන් හා කතාබහ නොකරව' යනුවෙන් ද, අනෙක් මිනිසුන් විසින් 'මොවුන් පව් කරන්නෝය, මොවුන් බමුණෝ නොවෙති' යනුවෙන් ද ගැරහුම් ලබති. පරලොවෙහිදී ද ඔවුන්ට දුක් ලැබේ. නිරය ආදී ලෙසින් මරණින් පසු උපත ලබයි යන තේරුමයි. සමපරායෙ වා යනුද පාඨයකි. ඔවුන්ට පරලොව ද දුක් සහිත වේ යැයි, දුක උරුම වේ යැයි අදහසයි. **න තෙ ජාති** එය එසේ උසස් යැයි සිතුවද, ඔබ එහි යම් හරයක් ඇතැයි බලාපොරොත්තු වුවද, ජාති හෙවත් (සම්මත ඕනෑම කුලයක) ඉපදීමෙන් අයහපත් කටයුතුවල යෙදීම බමුණකු වුවත්, සමපරායෙ ච දුගගතී මේ කියන ලද පරිදි දුගගච්චා හෝ ඇස් ඉදිරිපිටම ගැරහීමට පත්වීම වැළැක්විය නොහැකි සේ **ගාරයහ වා න නිවාරෙති** කියා ඇති අයුරුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, වේදය ඉගෙනීමට සම්මත කුලයක උපත ලැබුවද, ඒ බමුණන්ගේ ද ගැරහිය යුතු කරුණු ඇස් ඉදිරියෙහිම ඇතැයි දක්වමින්, (ඊට අනුකූලව) දුගතියට යාමෙන් මරණින් පසුවද බමුණු කුලයෙහි පැවැත්මක් නොමැති බව දක්වමින් **න ජච්චා හොති බ්‍රාහමණො කමමනා හොති බ්‍රාහමණො** යැයි මෙහිද තේරුම පහදා දී, දූන් තවත් අයුරින් එහි තේරුම නිගමනය කරමින් 'බමුණ මෙලෙසම

**න ජච්චා වසලො හොති න ජච්චා හොති බ්‍රාහමණො**
**කමමනා වසලො හොති කමමනා හොති බ්‍රාහමණො**

යැයි වදාළහ. ඉතිරි කරුණු කසීභාරද්වාජ සූත්‍රයට අදාලව කී පරිදි දතයුතුය. එහෙත් මෙහි අමුතුවෙන් සඳහන් කිරීමෙහිදී, **නිකකුජ්ජිතං වා** ආදී පදවලට මේ කරුණුද දතයුතුය. යම් තැනැත්තකු යටිකරු කරන ලද දෙයක් උඩුකුරු කරන්නාක් මෙන්, එසේ මට වරදවා යොමු වූ කරුණු (වසල යැයි කීම) උපතින් උසස් වේ යැයි ජාතිවාදයට නතුව, උපතින්ම බමුණකු හෝ වසලයෙකු වේ යැයි තිබූ හැඟීම ඉවත් කිරීමයි. ඒ දැඩිව ගත් හැඟීමෙන් නඟා සිටුවීම සැඟවූ දෙයක් හෙළිදරව් කිරීම වනුයේ ජාතිවාදයෙන් වැසුණු කමමවාදය පැහැදිළි කිරීම නිසාය. බමුණකු,

වසලයකු වීමට - මුසු නොවන, නොවක් මග එක එල්ලේම කියාදීම මං මුළාවූවකුට මඟ පෙන්වන්නාක් වැනිය. අඳුරෙහි තෙල් පහනක් දරන්නා සේ, මාතංග කතා ආදිය නිදසුන් කොට (මගේ) නැණ එළිය දැල්වීමෙන් පින්වත් ගොතමයන් වහන්සේ විසින් ඒ ඒ ආකාරයට මට පහදා දෙන ලද බැවින් **අනෙක පරියායෙන ධම්මො පකාසිතො** වෙයි.

**අග්ගික භාරද්වාජ (වසල) සූත්‍ර විස්තරය නිමි.**

# 1.8

**කරණීයමත්ථකුසලෙන** මෙත්ත සූත්‍රයයි. එය දේශනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? හිමාලයෙහි දී දේවතාවුන්ගෙන් හිරිහැරයට පත් පැවිදි පිරිස සැවැත්නුවර, භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ. උන්වහන්සේලාට රැකවරණය පිණිසද, භාවනාවට අරමුණ හෙවත් කමටහන් පිණිසද මෙම සූත්‍රය වදාළහ. මේ කෙටියෙනි. විස්තර මෙසේය.

එක් කලක භාග්‍යවතුන් වහන්සේ වස් එළඹ සැවැත් නුවර වැඩවසති. එහිදී, වේරඤ්ජා නුවර බොහෝ හිමිවරු භාග්‍යවතුන් වහන්සේගෙන් කමටහන් ලබා, ඒ ඒ සුදුසු තැන්හි වස් එළඹීමට කැමතිව, උන්වහන්සේ වෙතට පැමිණෙති. රාග චරිත ඇත්තවුන්ට ජීව අජීව ආදී ලෙසින්, එකොළොස් ආකාර පිළිකුල් ලෙස මෙනෙහි කිරීමේ අරමුණ ද, කෝපවන චරිත ඇත්තන්ට සිවු ආකාර වූ මෙත් සහගත අරමුණ ද, මුලාවන චරිත ඇත්තන්ට මරණය සිහිගැන්වීමේ අරමුණද, ගැටෙන අදහස් ඇත්තන්ට හුස්ම ඉහළට ගැනීම, හුස්ම පහළට හෙළීම ගැන අරමුණු කිරීමට හා කසිණ ආදී භාවනාද සැදැහැ ඇත්තන්ට බුදුගුණ සිහිකිරීම ආදියද, නුවණැත්තන්ට ධාතු කොටස් සතර පිළිබඳවද යන මේ ආකාරයෙන් අසූහාර දහසක් ගති සොබාවනට ගැලපෙන පරිදි උපදෙස් දෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වෙතින් කමටහන් ලද පන්සියයක් පමණ වූ පැවිදි පිරිස, සුදුසු සෙනසුන් ද පිණ්ඩපාතය ආදිය ලැබිය හැකි, ගොදුරු ගම්ද

පිරික්සමින්, පිළිවෙලින් ගොස්, ඈත හිමාලයෙහි නිල්මැණික් වන් එකට යාවුනු ගල්තලාවෙන් හෙබි, තද සිහිලැල් සෙවණින් යුතු, කැලෑවෙන්, අලංකාරවත් වූ, මුතුදැල් රිදී පටක් බඳු වැලිතලා බිම් පෙදෙසකින්ද යුතු මනහර සිහිල් දිය පිරි ගිරිකුළක් දුටහ. ඒ පැවිදි හිමිවරු එහි එක් රැයක් වැස, රැය පහන් වූ කල, සිරුරු කටයුතු කොට, එක් නුදුරු ගමකට පිඬු පිණිස ගියහ. ඒ ගම අධික ජනගහණයෙන් යුතු පවුල් දහසකින් යුතුය. එහි මිනිස්සුද පහන් සැදැහැතියහ. පැවිදි දසුනක් දුලබව, ඈත පෙදෙසක වසන ඔවුහු ඒ පැවිදි පිරිස දැක, සොම්නස් සිතැතිව, උන්වහන්සේලා වළඳවා, 'හිමිවරුනි, තුන් මසම මෙහිම වාසය කරනු මැනවැ'යි ඉල්ලා, භාවනා කුටි පන්සියයක් කරවා, එහි ඇඳ, පුටු ද පානයට සුදුසු පැන් කළවලද පුරවා තබා, සියළු උපකරණ පිළියෙල කළහ. උන්වහන්සේලා දෙවන දවස්හි වෙනත් ගමකට පිඬු පිණිස වැඩියහ. එහි මිනිස්සුද එසේම උවටැන් කොට වස් කාලය එහි ගතකරනු පිණිස ඉල්ලා සිටියහ. හිමිවරු 'අනතුරු නැතැ'යි ඉවසා, ඒ කැලෑ පෙදෙසට පිවිස, දිවා රෑ තිස්සේම නොපසුබස්නා උත්සාහයෙන් යුතුව, කාලය හඟවන ගෙඩිය (වත් පිළිවෙත් සඳහා දැනුම් දීමට හඬ නැංවීමට ලී කොටයකින් තැනූ එල්ලා ඇති උපකරණයකි) සකසා, කමටහන් නුවණින් මෙනෙහි කරමින් රුක්මුල් කරා එළඹ හිඳිති. සිල්වත් මහණුන්ගේ බලයෙන්, බල රහිත වූ රුක් දේවතාවියෝ තම විමන්වලින් බැස, දරුවන්ද රැගෙන එහා මෙහා සැරිසරති. රජවරුන් හෝ රජ මැති ඇමතිවරුන් ගමක වාසයට ගියවිටදී (රාජකාරි කටයුතු සඳහා තාවකාලික නවාතැන්) ගම්වාසීන්ගේ නිවෙස්වල ඉඩ ලබාගත්විට, නිවැසියන් ඒවායින් නික්ම, වෙනත් තැන්හි වසමින්, කවදා යන්නාහුදැයි දුර සිට බලා සිටිනා සේ, දේවතාවියෝ තම විමන් හැරදමා, එහා මෙහා සැරිසරමින්, හිමිවරුන් ආපසු කවදා යතිද'යි බලා සිටිති. දේවතාවියෝ එකම අයුරින් සිතූහ. මුල් වස් එළඹි මහණහු අවැසි ලෙසම තෙමසම මෙහි වසන්නාහ. අපට එතෙක් කල් දරුවන් රැගෙන ඉවත්ව විසීමට නොහැකිය. අපි මහණුන්ට බය උපදවන අරමුණු දක්වන්නෙමු නම් මැනවයි රෑ කල මහණුන් භාවනා කරනවිට බිය දනවන යක් රූප මවාගෙන ඉදිරියෙන් ඉදිරියෙන් සිටිති. බිය ගන්වන හඬ නංවති. ඒ රූප දැක, ඒ හඬද අසා හිමිවරුන්ගේ හදවත සැලිණ. සිරුර පැහැ වෙනස් විය. සුදුමැලිව නහර ඉල්පිණ. සිත එක් අරමුණක පිහිටුවා ගැනීමට නොහැකි විය. උන්වහන්සේලාගේ සිත් නොයෙක් බියෙන්ද යළි යළිත් සංවේගයට ද, මුළා බවටද පත්විය. මුලා වූ සිතින් සිටි ඒ හිමිවරුන්ට දුගඳ වහනය වන අරමුණු ද යෙදවූහ. ඒ ගඳ මැඩලීමට

(හිස්) මොළයට සිදුවූයෙන්, බලවත් හිස වේදනා ඇතිවිය. ඒ තොරතුරු ඒ හිමිවරු එකිනෙකාට නො පැවසූහ. නායක හිමියන්ට උවටැන් කරන්නට ඒ සියළු හිමිවරුන් රැස්වූ කල, උන්වහන්සේ, 'ඇවැත්නි, ඔබවහන්සේලා මේ කැලෑ පෙදෙසට පිවිස කිහිප දිනකින්ම හම පිරිසිඳුව පැහැපත්ව, බබලන සේ තිබිණි. ඉඳුරන් පැහැබරව දිස්විය. දැන් නම්, හැකිළුණු, පඬුපැහැව, නහර ඉල්පී ඇත. කිසියම් අපහසුතාවක් වේද'යි විමසූහ. මෙහිදී එක් හිමිනමක් 'හිමියනි, රෑ කාලයෙහි දී මම මෙබඳු මෙබඳු බිය දනෙන අරමුණු දකිමි. (බිය දනවන) හඬ අසමි. මෙවන් ගඳක් විඳිමි. එයින් මගේ සිත එකඟ නොවේ යැයි පැවසීය. මේ අයුරින් සියළු දෙන කරුණු සැළකළහ. එවිට නායක හිමි, 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් වස් එළඹීම් දෙකක් පනවන ලදී. අපට ද මෙම වන සෙනසුන සුදුසු නොවේ. ඇවැත්නි, යමු, භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස්, වෙනත් සුදුසු සෙනසුනක් විමසමු'යැයි පැවසූහ. 'යහපත, හිමියනි' එකඟ වූ සඟ පිරිස උන්වහන්සේට පිළිවදන් දී, සෙනසුන් පිළිවෙලකට සකසා, පා සිවුරු ගෙන, එතෙක් උවටැන් කරන ලද දායක පවුල් කෙරෙහි නොඇලෙමින්, කිසිවකුටත් නොදන්වාම, සැවැත් නුවර බලා පිටත් වූහ. පිළිවෙලින් ගම් නියම් ගම් හැසිර, සැවැත්නුවරට ගොස්, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. ඒ පැමිදි පිරිස දුටු භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, වස් කාලය තුල චාරිකාවෙහි නොයා යුතුයැයි, ම විසින් සික පදයක් පනවන ලදී. ඔබලා කුමක් නිසා මෙසේ චාරිකාවෙහි හැසිරෙවුද'යි ඇසූහ. උන්වහන්සේලා සියළු කරුණු සැළකළහ. භාග්‍යවතුන් වහන්සේ විමසා බලන සේක්, මුළු දඹදිවෙහිම, යටත් පිරිසෙයින් පා සතරකින් යුතු පුටුවක් තබන තරම්වත් සුදුසු තැනක් නොදුටුවාහ. 'මහණෙනි, ඔබලාට වෙනත් සුදුසු සෙනසුනක් නැත. එතැනම වසමින් කෙලෙසුන් දුරුකිරීමට කටයුතු කරවු, යව මහණෙනි, ඒ සෙනසුනෙහිම වාසය කරව, දේවතාවන්ගෙන් බියක් ඇති වේ යැයි බලාපොරොත්තු වේ නම්, මේ පිරිත උගනිවු. එයම ඔබලාට කමටහනක්ද වන්නේ යැයි මෙම සූත්‍රය වදාළහ. ඇතැම් කෙනෙකු කියා ඇත්තේ මෙසේ වදාළ බවයි, 'යව, මහණෙනි, ඒ සෙනසුනම ඇසුරුකොට වසව්. එසේ වදාරා, කැලෑවෙහි වසන භාවනා යෝගියකු විසින් එහි පැවතිය යුතු සැටි දතයුතුය. ඒ කෙසේද? උදේ සවස දෙවරක් මෙත් වැඩීමද, පිරිත් (සජ්ඣායන) ලෙසින් දෙවරක්ද, සිරුරේ පිළිකුල් බව දෙවරක්ද, මරණය පිළිබඳව දෙවරක්ද, අටමහා සංවේග කරුණු දෙවරක්ද මෙනෙහි කළයුතුයි. ඉපදීම, ජරාවට පත්වීම, ලෙඩවීම, මරණය සහ සතර අපා දුක හා පස්වැනිව අතීතයෙහි

සසර පිළිබඳ දුක, අනාගත සසර දුක සහ වත්මනෙහි ආහාර සෙවීම (ජීවත්වීම) මුල්කොට ඇතිවන දුකයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පැවතිය යුතු සැටි පෙන්වා දී ඒ පැවිදි හිමිවරුනට මෙත් වඩනු පිණිසද, රැකවරණය පිණිසද, විදසුන් මුල්කොට දැහැන් වඩා මගපල ලැබීමටද මෙම සූත්‍රය වදාළහ.

කරණීයමත්‍ථකුසලෙන මේ පළමු ගාථාවෙහි පටන් වචන තේරුම් දැක්වීමයි. **කරණීයං** කළයුතුය. කිරීමට සුදුසු යන තේරුමයි. **අත්‍ථො** පිළිවෙතයි. තමාට යහපත පිණිස යම්කිසි දෙයක් වේද, ඒ සියල්ල අරණීයතො හෙවත් පැමිණිය යුතු, ලබාගත යුතු යන තේරුමෙන් කියනු ලැබේ. එහි හැකියාව ඇති, යහපත, (එලොව-මෙලොව) දියුණුව සඳහා සමත් වන, අත්‍ථ කුසලෙන = **අත්‍ථ කුසලෙන, යං** අනියම් වූ කරුණක් ලෙස දැනගැනීමට ඉවහල් වන වචනයකි. **තං** නියම ලෙස පැහැදිලි කරනු ලබන කරුණක සම්බන්ධතාව දැක්වීමට ඉවහල් වන වචනයකි. **සනතං පදං** එහි සම්බන්ධ කළයුතු වචනයයි. එයින් දැක්වෙන්නේ සත්හුන් බවයි. පැමිණිය යුතු අරුතින් **පදං**, එය නිවනට සමාන වචනයකි. **අභිසමෙච්ච** මනාව එක්තැන්කොට, **සක්කො** හැකිවෙයි, සමත්, ඊට හැකියාව ඇති, **උජු** අවංක බවින් යුතු, **සූජු** මනාව අවංක වීම, එම ගුණය මැනවින් පවත්වා ගැනීමය. යහපත්, සුවදායී වචන ඇත්තෙක්මි. **සුවචො**, අසස වන්නේය. මුදු මොළොක් බවින් යුතු, **න අතිමානී - අනතිමානී** උඩගු නොවූයේ, මේ එහි විස්තර දැක්වීමයි. **කරණීය මත්‍ථ කුසලෙන යනතං සනතං පදං අභිසමෙච්ච** මෙහිලා, තවදුරටත්, කළයුතු දේ ඇත. නොකළ යුතු දේ ඇත. එය කෙටියෙන් දක්වතොත්, හික්මීම පිණිසි කළ යුතුය, සීලයට විපතක් වන, තම උසස් අරමුණට - නිවැරදි දැකීමට විපතක් වන, හැදියාවට විපතක් වන, (එදිනෙදා) දිවි පැවැත්මට හානි කරන දේවල් නොකළ යුතුය. එසේම හරවත් දෙයෙහි වටහා ගැනීමට හැකියාව මෙන්ම, අසාරවත් දෙයෙහි වටහා ගැනීමටද, හැකියාව තිබිය යුතුය. මේ සස්නෙහි පැවිදි වූවෙක් මැනවින් ඊට අදාල කටයුතු නොකරයි. කැඩුණු සිල් ඇත්තේ වෙයි. විසිඑක් ආකාර වූ, නොසෙවිය යුතු නුසුදුසු දේවලින් ජීවත්වෙයි. ඒ කෙසේද? (ඇතැම් පැවිදි වූවෙක්) උණ ගස්, කොළ, මල්, ගෙඩි, දැහැටි, මුව සේදීම ජලය, දිය නෑමෙහිදී අවැසි දේ, (සිරුර තැවරීමෙහි හුණු, මැටි-ගිහියන්ගේ සිත් ගැනීමට දෙයි. චාටු බස් කීම, මුං තැම්බූ විට කොටසක් නොපැසී තිබෙන්නා සේ, සැබෑ, බොරු මුසුව කතාබහ කිරීම, කුඩා දරුවන් සුරතල් කිරීම, පණිවුඩ ගෙනයෑම,

වෙදකම, නියෝජිතයකු සේ කටයුතු කිරීම, දූත මෙහෙවර, නැවත නැවත ආහාර දීමෙහි යෙදීම, ගොඩනැගිලි තැනීම් ආදියෙහි සුබ අසුබ දක්වන නැකත් කීම, සිරුරු ලකුණු බලා සුබ අසුබ-පලාපල කීම හා සය ආකාර වූ නුසුදුසු තැන්හි හැසිරීමද වෙයි. ඒ නුසුදුසු තැන් මොනවාද? වෙසඟනුන්, වැන්දඹුවන්, වැඩිවිය පත්, විවාහ නොවූ කාන්තාවන්, නපුංසකයන්, මෙහෙණින් හා මත්පැන්හල් ඇසුරුකොට විසීමයි. රජවරුන් සමග, මැති ඇමතිවරුන් සමග, වෙනස් සමයවාදීන් (තීර්ථකයන්) ඔවුන්ගේ අනුගාමිකයන් සමගද (ගිහි) පිරිසද සමග එක්වී, තදින් ඇළුම් කරමින් නුසුදුසු පරිදි වසයි. මහණුන්ට - උපාසිකාවන්ට ආදී (සිවු පිරිසට) සැදැහැ බවක් නැති, නොපැහැදුණු, (ඕනෑළුපාකම් නොසොයන) පැන්හලක් බඳු නොවූ, නින්දා අපහාස කරන, දියුණුව නොකැමති, අහිත වූ පිළිවෙතින් යුතු කාමාදී බැම්වලින් මිදීමට අකමැති කුලගෙවල් (පවුල්) ඇසුරු කරයි. සබඳතා පවත්වයි. මැනවින් ඇසුරු කරයි. මේ සසුනෙහි පැවිදි වූවෙකු මනා ඇවතුම් පැවතුම් ඇතිව තම කටයුතු කරත් ද, නුසුදුසු දේ සෙවීමෙන් තොරව, සිවු පිරිසිදු සිල්හි පිහිටීමේ කැමැත්ත ඇතිව (තිසරණ) සැදැහැ නොවෙනස් වූ පාමොක් සංවරයෙන් ද, මැනවින් සිහිය පවත්වාගැනීම මුල්කොට ඉඳුරන් සංවරයද, උත්සාහය මුල්කොට ජීවිතයෙහි යහපත් හැසිරීම් රටාවද, නුවණ මුල්කොට සිවුපසය ද පරිහරණය කරයි. මෙය දියුණුවෙහි සමත්කම හෙවත් අත්‍ථකුසල නම් වෙයි. යම් පැවිද්දෙකු ඇවැත් සතකට හසුනොවන සේ පාමොක් සංවරයෙන් ද, සිරුරේ දොරටු සයෙහි ගැටෙන අරමුණු කෙරෙහි දැඩි ලෝභය ආදිය හට නොගන්නා ලෙසින් ඉඳුරන් සංවරයද, නුසුදුසු දේ දුරුකරන ලෙසින් බුදු මහරහත් ආදී පැණවත් සච්චන් විසින් අගයන ලද සිවුපසය මනා පරිහරණයද, සතර ඉරියව් පැවැත්ම ජීවිතයට වැදගත් වන සිවුපසය මනා පරිහරණයද, සතර ඉරියව් පැවැත්ම ජීවිතයට වැදගත් වන සැටි නුවණින් මෙනෙහිකොට පිරිසිදුව සිටිත්ද, එය අත්‍ථකුසලයයි. යම්කෙනෙක් ලුණු මුසු දියෙන් ඇඳුමක් පිරිසිදු කරයිද, අළුවලින් කැඩපතද, ගිනි උදුනක් නිසා රන් රිදී පිරිසිදු කරයිද, එපරිදිම නුවණ හේතුවෙන් සීලය බබලන්නේ යැයි දැන, නුවණ නැමති දියෙන් සෝදමින් සීලය පිරිසිදු කරගනී. කිරල් දෙන බිත්තර රකිනා සේ, සෙමර මුවා වල්ගය රක්නා සේ, එක් ඇසක් ඇති මිනිසා ඒ ඇස රකිනා සේ, නිරතුරු නොපමාවම (සිකපද) සියල්ල රැක ගනී. උදේ සවසද නුවණින් මෙනෙහි කරමින්, ඉතා සුළු හෝ වරදක් (තම සීලයෙහි) නොදකී. මෙය ද අත්‍ථකුසලයයි. යම් පැවිද්දෙක් පසුතැවිලි නොවන අයුරු, සීලයෙහි පිහිටා, කෙලෙස් යටපත් කරන පිළිවෙතෙහි

දැඩි උත්සාහවත්ව යෙදෙයි. එසේ උත්සාහවත්ව කසිණ අරමුණ කරා සිත මෙහෙයයි. කසිණ වඩා සමාපත්ති උපදවා ගනී. මෙයද අත්‍ථ කුසලයයි. යම් පැවිද්දෙක් සමවතින් නැගී (යම් දෙයක ඇතිවීමේ හේතු තිර පැවැත්මක් නැතැයි අනිස ලෙස බලා) සංඛාර නුවණින් විමසා අරහත් බවට පැමිණෙයි. මෙය අත්‍ථ කුසලයෙහි උසස්ම තැනයි. මෙයින් අදහස් වන්නේ යම් කෙනෙක් (පැවිදි-ගිහි) පසුතැවිලි නොවන පරිදි සීලයෙහි පිහිටා, කෙලෙස් දුරුකරන පිළිවෙතෙහි දැඩි උත්සාහයෙන් යෙදී මගපලයට පත්වීම හරවත් වූ දියුණුවේ සමත්කම ලෙස අගය කරන බවයි. මේ අදහසින් ඔවුන් අත්‍ථකුසල යැයි අදහස් කරනු ලබයි. ඒ පැවිදි පිරිස එසේ වෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ පැවිදි පිරිස සළකා, එක් පුද්ගලයකුට ගැලපෙන පරිදි ද **කරණීයමත්‍ථ කුසලෙන** යැයි දේශනා කළහ. ඒ අනුව කළ යුත්තේ කුමක්ද? ඒ ගැන නොදැන සිටි ඒ පැවිදි හිමිවරුන්ට **යනතං සනතං පදං අභිසමෙච්ච** යැයි වදාළහ. එහි අදහස මෙසේය. බුදු අනුබුදුවරයන් වහන්සේලා විසින් පසස්නා ලද ඒ සාන්ත වූ නිවන අවබෝධයෙන් දැන, වාසය කරනු කැමති වූවකු විසින් **යං කරණීයං** එහි **යං** යනුවෙන් මේ ගාථාපදයෙහි මුලදීම කියන ලද්දේ **කරණීයං** යනුවෙනි. කරුණු පැහැදිලි කිරීමට උදව් වන ලෙසින් පවතී. ඒ සාන්ත පදය දැනගෙන - මෙය ඉතිරි පාඨයක අරුතයි. එලෙස වාසය කරනු කැමතිවන කෙනෙකු විසින් යන අදහසට කියන ලදැයි දතයුතුය. නැතහොත් **සනතං පදං අභිසමෙච්ච** යනු අසා ඇති පරිදි ලද දැනුමෙන් නිවන සාන්ත යැයි පිළිගෙන, එය අවබෝධය පිණිස එයට හේතුකාරක වන කටයුතු කළයුතුයැයි අදහසයි. නැතහොත් කරණීයමත්‍ථකුසලෙන යැයි කී කල්හි එය කුමක්දැයි සිතන්නන්ට **යනතං සනතං පදං අභිසමෙච්ච** යනුවෙන් වදාළහ.

එහි අදහස මෙසේ ද දතයුතුය. පවත්නා නුවණින් - දැනීමෙන් සාන්ත වූ නිවන පිළිගෙන, **යං කරණීයං, තං,** යම් දෙයක් කළයුතු වේද එය කළ යුතුය. 'තං' යනුවෙන් හැඟෙන්නේ කුමක් ද? ඒ ආකාරයට හැර, එය අවබෝධ කරගත හැකි වෙනත් මගක් ඇත්ද? මේ කරුණුවලට සුදුසු පරිදි තමන් තමන් හික්මීමට පත්වන අයුරු දැක්වීම, නිසැකවම මුල් පදයෙන්ම කියන ලදී. එහි තේරුම් විස්තර (මෙතෙක්) කීවෙමු. කළයුතු දේ ඇත. නොකළ යුතු දේ ඇත. එය කෙටියෙන් දක්වතොත්, හික්මීම පිණිස කළයුතු දේය. ඉතා කෙටියෙන් දේශනා කරන ලද බැවින්, එය ඇතැම් මහණුන්ට වැටහුනේ නැත. ඇතැම් මහණුන්ට වැටහුණි. එහෙයින් නොවැටහුණු මහණුන්ගේ වැටහීම පිණිසත්, වෙසෙසින්ම වනවාසී මහණුන්

විසින් කළයුතු කටයුතු විස්තර කරමින්, **සක්කො උජූ ච සූජූ ච සුවචො චස්ස මුදු අනතිමානී** යැයි මේ ගාථා කොටස වදාළහ. කුමක් නිසා කියන ලදද? සාන්ත පදය හෙවත් නිවන (ඇතැයි) දැන වාසය කරනු කැමතිව, තම දැනුම-නුවණ මෙහෙයා, එය මගපල නුවණින් අවබෝධ කරගැනීමට උත්සාහ දරන වනවාසී මහණෙකුට දෙවන, සතරවන සමථ භාවනාවෙන් ලද (දියුණුවෙන්) කයෙහි හෝ ජීවිතයෙහි හෝ බලාපොරොත්තු නැතිව, උතුම් සිවුසස් දහම අවබෝධ කරගැනීමට හැකියාව තිබිය යුතුය. එසේම, කසිණ පිරියම්, වත් සමාදන්වීම, තමන්ගේ පාසිවුරු සකසා ගැනීමෙහි, පරිහරණයෙහි ද, තමා හා එක්ව වාසය කරන අනෙක් මහණුන්ටද කුඩුමහත් කටයුතු කිරීමේදී හා වෙනත් ඒ හා සමාන කරුණු ඉටුකිරීමේදී හැකියාව තිබිය යුතුය. එහි සමත් විය යුතුය. අලස නොවිය යුතුය. එසේ හැකියාව තිබීම මෙන්ම, තුන්වන පදන් අංගයෙන් අවංක තැනැත්තෙක් වන්නේය. අවංක වීමේදී එක් වරක් පමණක් එයින් සතුටට නොපැමිණ, දිවි ඇතිතෙක් නැවත නැවතත් පිළිවෙත් මගෙහි තදින්ම නියැලෙමින් තව තවත් මැනවින් අවංක වන්නේය. කපටිකමෙන් තොර වූයේ අවංක වේ. මුළා කිරීමෙන්, රැවටීමෙන් තොරවූයේ වඩාත් අවංක වේ. කයෙහි පැවැත්ම සහ වචනයෙහි නිවැරදි බව ද උජූ සේ ගැනේ. අවංක සිත ඇති බව සූජු ද වේ. නැති ගුණ දහම් (මගපල) හෙළිදරව් නොකිරීමද 'උජූ' වේ. නැති ගුණදහම් නිසා ලැබෙන ලාභ-වාසි ආදිය නොඉවසීමත් සූජු ය. මෙසේ අරමුණ, එහි පවත්නා සොබාව සහ දැහැන් වැඩීමෙන් මුලින්, දෙවන හෝ තුන්වන දැහැන්වල හික්මීමට පත්වීම මනා පිරිසිදු බවට පත්වීමද අවංක හා මැනවින් අවංක වීමද වෙයි. එපමණක්ද නොවේ. එසේම, සුවචො ච'ස්ස යම් තැනැත්තකු විසින්, 'මෙය නොකළ යුතු'යැයි කී විට, එය ඔබ දුටුවෙහිද? ඇසුවේ කුමක්ද? කවරෙක් මට (එසේ විය යුතු යැයි) කියත්ද? අවවාද දෙන්නේ කවුද? (ඔබ මගේ) ගුරුවරයාද, දැක පුරුදු මිතුරෙක්ද? එක්ව සිටි යහළුවෙක්ද?' යනුවෙන් කියයි. නිහඬව සිට හෝ අවවාද දෙන තැනැත්තා අපහසුතාවට පත්කරයි. පිළිගන්නා බවක් හෝ නොදක්වයි. මෙබඳු තැනැත්තා මගපල ආදී වෙසෙස් ලැබීමෙන් ඈත් වෙයි. යම්කෙනෙකු විසින් අවවාද දෙනු ලබන විට, 'හොඳයි හිමියනි, පහදා දුන මැනව, තමගේ වරද තමාට දැකිය නොහැකියි. නැවතත් මෙබඳු වරදක් දැක, අනුකම්පා උපදවා මට පෙන්වා දුන මැනව, ඔබගෙන් බොහෝ කලක්ම අවවාද ලැබුණේ' යැයි පවසයි. ඒ අවවාද අනුශාසනා පිළිපදියි. ඒ තැනැත්තා මගපල ආදී උසස් බවක් ලැබීමට ආසන්න වෙයි.

එහෙයින්, මෙසේ අනුන්ගේ යහපත් අවවාද පිළිගෙන කටයුතු කරන්නේ සුවචො නම් වෙයි. එසේ කීකරු වීම මෙන්ම මුදුගති ඇත්තෙකු ද වන්නේය. මුදු යනු, ගිහියන් විසින් දූතයන් ලෙස පණිවුඩ යැවීමාදියෙහි යොදවන්නේ නම්, එහි මොළොක් බව නොපෙන්වා, දැඩිව මුළු සසුන් බඹසර වත්පිළිවෙතෙහි මොළොක් ගති තිබිය යුතු වෙයි. මනාව පිරිසිදු කරන ලද රත්රන් මෙන් ඒ ඒ තන්හිදී කටයුතු කළයුතු වන්නේය. නැතහොත් මුදු යනු ඇහිබැම හකුළුවන්නේ නැතිව, (රවා බැලීම් පමණකුදු නැතිව) එකළුල්ලේ මුහුණ යොමුකරමින් සුව දනවන කතාබහෙන්, පිළිසඳරින් යුතුව, සුවසේ බැසිය හැකි මනාව පිහිටි තොටුපළක් මෙන් වන්නේය. මුදුබව පමණක් නොවේ. අනතිමානි විය යුතු උපතින්, කුලගොතින් දැඩි උඩඟුකමෙන් අනුන් හෙළා නොදකින්නේය. සැරියුත් තෙරුන් සැඩොල් කුමරකුව ඉපිද සිටි කලක තිබූ සිතිවිලිවලින් යුතුව වාසය කරන්නේය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, ශාන්තපදය දැන වාසය කරනු කැමති කෙනෙකුට එය අවබෝධය පිණිස පිළිපැදිය යුතු සැටි හා වෙසෙසින්ම වනවාසීව මහණුන්ට කළයුතු එක් කරුණක් ගැන වදාරා, නැවත, එයින් ඉදිරියටද පහදා දෙනු කැමතිව **සනතුසසකො ච** යන දෙවැනි ගාථාව වදාළහ. එය **සනතුට්ඨීච කතඤ්ඤු** යැයි වදාළ පරිදි දොළොස් ආකාර වූ කරුණින් සතුටුවීම **සනතුසසකො** නැතහොත් සතුටුවෙයි. එහෙයින් **තුසසකො**, තමා පිළිබඳ සතුට, තමාට ඇති (යහගුණ) පිළිබඳ සතුට, සමව පවත්නා සැටියෙන් සතුටුවීම **සනතුසසකො** 'පිණ්ඩපාතයෙන් ලැබෙන ආහාරය නිසා පැවිදි ජීවිතය පවත්නේ'යැයි 'පිණ්ඩියාලොප භොජනං නිසසාය පබ්බජ්ජා උපසම්පදා මාලකයෙහිදී පහදා දෙන ලද පරිදි, තමා විසින් පිළිගන්නා ලද සිවුපසයෙන් හටගත්, එය හොඳ හෝ නරක හෝ මනාව පිළියෙල වූ හෝ මනාව පිළියෙල නොවූ හෝ දෙනු ලබන විටත්, එය පිළිගන්නා විටත්, අනුභව කරන විටත් වෙනසක් නොපෙන්වා යැපෙන පමණට සතුටුවීම - සෑහීමට පත්වීම 'තමාගෙන් සතුටුවීම' යැයි කියනු ලැබේ. සනතං යනුවෙන් අදහස් වන්නේ, යම් දෙයක් ලැබුණද, තමාට එය ලැබී ඇති නිසා (අමුතු) සතුටක් නොවෙමින් ද, මතුවට බලාපොරොත්තු නොමැති වීමද, ඇති දෙයක් වුවත් එහි කැමැත්ත දුරු කරමින්, ලද පමණින් සෑහීමට පත්වීමයි. ඉටු අනිටු දේවල් කෙරෙහි තරහ දුරුකිරීම 'සමාන' යනුවෙන් ගැනේ. ඒ ආකාරයට ලැබෙන සියළු දේ කෙරෙහි සමානව සතුටුවීම එයින් අදහස්

වේ. පහසුවෙන් ඇතිදැඩි කළහැකි අරුතින් **සුභරො** හොඳින් ආහාරදියෙන් වැඩෙන අයුරු එයින් දැක්වේ. යම් මහණකු ඇල්සහල් බත් හා රසමසවුලෙන් පිරි අහරින් පාත්‍රය පුරවා දුන්නත්, නොපහන් මුහුණින් අසතුටු බවම දක්වත්ද, ඔවුන් හමුව හෝ 'කුමක් නිසා ඒ පිණ්ඩපාතය දෙනු ලැබුවෙහිදැ'යි, අසතුටු බව පළකොට, එය සාමණේර ගිහි ආදීන්ට දෙයි. එය පහසුවෙන් ඇතිදැඩිවීම නොවේ. මිනිස්සු ඒ බව දැක, 'මේ මහණට ආහාරපාන ලබාදීම අපහසුයැ'යි දුරසිටම ඉවත් වෙති. යම් මහණකු, කිසියම් දෙයක් රළු හෝ මිහිරි හෝ, මඳ හෝ බෙහෝ සෙයින් හෝ ලැබ ලද පමණින් සතුටුව, පහන් මුහුණෙන් යුතුව සිටිත්ද පහසුවෙන් පෝෂණය කළ හැකිය. ඒ දන්නා මිනිස්සු 'අපේ ගරු හිමියන් පහසුවෙන් පෝෂණය කළ හැකියි. මඳ අහරකින් වුවත් සෑහීමට පත්වෙයි. අපි උන්වහන්සේ (සිවුපසයෙන්) රැකබලා ගනිමු'යැයි පොරොන්දු වී පෝෂණය කරති. මෙබඳු කෙනෙකු 'සුභරො' යනුවෙන් අදහස් වේ. අල්ප වැඩකටයුතු තිබීම **අප්පකිච්චො** විහාරයෙහි නවකම් ආදියටම ඇලීගැලී නොසිට, කෙලෙස් සහගත කතාබහෙන් නිතරම දොඩමළු නොවී, හැමදෙනා සමගම එක්ව වාසය කිරීමට කැමති නොවීම (එයින් හැඟේ) නැතහෙත් මුළු විහාරයෙහි නවකම්, විහාරයට අයත් වතුපිටි ආදී සම්පත්, සාමණේර හිමිවරුන් හා ආරාමයෙහි වැඩකටයුතුවල නිරත වුවත් ගැන හා බාහිර කටයුතු පිළිබඳ බරක් නොගෙන, තමගේ කෙස් නිය කැපීම්, පා සිවුරු සකසා ගැනීමේ කටයුතුවල යෙදී, මහණදම් පිරීමට අදාල දෙයෙහි නිරත විය යුතු බව කියන ලදී. සැහැල්ලු පැවතුම් ඇත්තේ **සල්ලහුකවුත්ති** යම්සේ බොහෝ බඩුබාහිරාදිය ඇති ඇතැම් මහණෙක් වෙනත් පෙදෙසකට යන විටකදී (දින කිහිපයක් ගතකිරීමේදී) බොහෝ පාසිවුරු, ඇතිරිලි, තෙල්, සකුරු ආදිය මහාජනයා ලවා හිසෙන් හෝ කරෙන් උසුලවාගෙන යාමට කටයුතු කරයි. යම් මහණෙකු එසේ නොව, අඩු පිරිකර ඇතිව, මහණකමට අදාල පාසිවුරු ආදී අටපිරිකර පමණක් පරිහරණය කරත්ද, වෙනත් පෙදෙසකට යනවිට, පියාපත් බර පමණක් දරන කුරුල්ලකු මෙන් සැහැල්ලුවෙන් නික්මෙයි. මෙබඳු ආකාරය මෙහි **සල්ලහුකවුත්ති** යැයි අදහස් කෙරේ.

සන්හුන් ඉඳුරන් ඇති **සන්තින්ද්‍රියො** බලාපොරොත්තු අරමුණුවල රාගාදී ලෙසින් නොසන්සුන් බවට පත්නොවූ ඉඳුරන් ඇති බව කියන ලදී. **නිපකො** දැන උගත්, නුවණැති පැණවත් වූ, සීලය රැකගත යුතුය යන දැනුමෙන් ද, සිවුරු ආදිය ගැන විචාරීමේ නුවණින් ද, ආවාස

ආදියෙහි සුදුසු නුසුදුසු බව ගැන නුවණද අදහස් කෙරේ. පගබ්භ නැති - අප්පගබ්භා ඉදිරියට පැන, කැපී පෙනෙන පරිදි නුසුදුසු ලෙස කටයුතු නොකරන, එය කය සම්බන්ධව අටවැදෑරුම්වද, වචනයෙහි සිවුවැදෑරුම්ව ද මනසෙහි නොයෙක් ආකාරවද ඉදිරියට ඒ. එයින් තොරවීම අදහස් වේ. කයෙන් එසේ නුසුදුසු ලෙස කටයුතු කිරීම, සංඝයා මැද, පිරිසක් මැද, පුද්ගලයන් කිහිපදෙනෙකු මැද, බොජුන්හලෙහි (දාන සාලාවෙහි), ගිනිහල්ගෙයි, නානතොටෙහි, පිඬු පිණිස යාමෙහි, ඇතුළුගෙට පිවිසීමෙහි යනුවෙන් අටවැදෑරුම්ය. මෙහිලා කායික නොසරුප් බව කෙසේ වේද? මෙහි ඇතැම් මහණෙක්, අත් මතුපිට තබාගෙන හෝ, ඇනබාගෙන හෝ, ඇලව, දිග ඇදී පයෙන් පය යොමුකොට (පය පිටපය දා) සඟමැද හිඳී. සමූහයක් මැද ද එසේමය. සමූහයා මැද යනු සිවුවණක් පිරිස රැස්වූ කල්හිය. වැඩිහිටි තැනැත්තන් අතරද එසේමය. භෝජන ශාලාවෙහිදී ද වැඩිහිටි හිමිවරුන්ට අසුනක් නොදෙයි. නවක පැවිදිවූවන්ට ආසන වළක්වයි. ගිනිහල්ගෙයිද එසේමය. වැඩිහිටි මහණුන්ගෙන් නොවිමසා ගිනි දැල්වීම ආදිය කරයි. නානතොටෙහි තරුණ, වැඩිහිටි යයි නොසළකා, පැමිණි පිළිවෙලට නෑම යුතුයැයි කියයි. එයද පිළිනොපදිමින්, පසුව අවුත් දියට බැස, වැඩිහිටි මහණුන්ටද නවක මහණුන්ටද අවහිර කරයි. ආහාර ලබාගැනීමට යාමේදී, මුල්ම අසුන, මුල්ම පැන්බඳුන (තමාට පිළිගැන්වේනම්) මුල්ම ආහාර කොටස ලබාගැනීමට වැඩිහිටි හිමිවරුන් අත දිගුකර, පසුපසට කරමින් (පස්සට තල්ලු කරමින්) ඉදිරියට ඉදිරියට යයි. ඇතුළු ගෙට පිවිසීමේදී වැඩිහිටි හිමිවරුන්ට පළමුවෙන් යයි. තරුණ පැවිද්දන් සමග කය වෙහෙසා කෙළිදෙලින් ගතකරයි ආදී ලෙසිනි. වචනයෙහි සිවුවැදෑරුම් නොසරුප් බව නම්, සඟ මැද, සමූහයක් මැද, පුද්ගලයන් කිහිප දෙනෙකු අතර, ඇතුළු ගෙවල නුසුදුසු වචන කතා කිරීමය. ඒ කෙසේද? මෙහි ඇතැම් මහණෙක් සඟ මැද අනවසරයෙන් බණ කියයි. එසේම පෙර සඳහන් වූ පරිදි පිරිස අතර, වැඩිමහළු පැවිද්දන් හා පුද්ගලයන් අතරද, නොවිමසා බණ කියයි. එහි මිනිසුන් පැන අසද්දී වැඩිමහළු හිමිවරුන් නොවිමසා ඒවා විසඳයි. ඇතුළුගෙයිදී 'මේ නම් ඇති දෙය තිබේද?' 'කැඳ තිබේද?' (ඇත්තේ කිනම් කැඳ ද?) නැතිනම් කැවිලි ජාති හෝ ආහාර තිබේද?' 'මට කුමක් දෙන්නෙහිද?' අද කුමක් අනුභව කරමුද? 'කුමක් පානය කරමුද?' ආදී ලෙස කියයි. නොයෙක් ආකාර වූ සිතෙහි නොසරුප් බව නම්, ඒ ඒ තැන්වල, ඒ ඒ දේ කෙරෙහි කය වචනයෙන් වැරදි ලෙස හැසිරීමක් නොවූවද, සිතෙහිම දෙගිඩියාවට පත් කාමසිතිවිලි වැනි නුසුදුසු අදහස් ඇතිවීමයි. කුලෙසු අනනුගිද්ධො

යම් කුලයකට (නිවෙසකට) එළඹීමේදී ඔවුන්ගෙන් සිවුපසය බලාපොරොත්තු ආසාවෙන් හෝ, ගිහියන් හා නොගැළපෙන සහසබඳතා සඳහා හෝ නොඇලෙන්නේය. සෝකයක් ඇතිවූ විට සෝක නොවී, සතුටක් ඇතිවූ විට සතුටු නොවී, (ඔවුන්ගේ දුකෙහිදී තමාද සෝක වන බවත් සතුටෙහිදී සතුටුවන බවක් හැඟවීම) සැපයට පත්වූවන් අතර සැපවත් නොවී, දුකට පත්වූවන් අතර දුකට පත් නොවී, (ඒ පවුල්වල) හට නොගත්තා වූ, මතුනොවූ යම් යම් තමන් මුලින්ම උත්සාහවත් නොවීම ගැන කියන ලදී. **සුවචො ච'සස** මෙහි 'අසස' යන වචනය (වන්නේය - විය යුතුය යන අදහස) ඒ සියළු පද සමග, සනතුසසකොච අසස, සුභරොච අසස යනුවෙන් මෙසේ යෙදිය යුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ නිවන දැන වාසය කරනු කැමති වූවෙකුට එය අවබෝධය පිණිස හෝ, පිළිපදිනු කැමති වූවකුට හෝ, වෙසෙසින්ම වනවාසී මහණකු හට ඉන් ඉදිරියටද කළයුතු දේ පහදා, මීළඟට නොකළ යුතු දේ ද දක්වනු කැමතිව **න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං** යන ගාථා පද දෙක වදාළහ. එහි තේරුම: මෙසේ මේ කළයුතු දේ කරනවිට, කය වචනය සිත හා බැඳෙන යම් ආකාර දුසිරිතක් වේද, එය කුඩා-පහත් (වරදක්) යැයි කියනු ලැබේද, **න ච ඛුද්දං සමාචරෙ** එබඳු දෙයෙහි නොයෙදී, හුදෙක්ම එය කුමන ආකාර වුවත් **කිඤ්චි** කිසිදු වරදක නොහැසිරෙයි. අල්ප ලෙස වුවත්, ඉතාම සුළුවෙන් වුවත් එබඳු දෙයක නොයෙදෙන්නේ යැයි කියන ලදී. එසේ වරදෙහි යෙදෙන්නාට ඇස් ඉදිරිපිටදීම ආදීනව පෙන්වයි. යෙන **විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං** පොදු ජනතාව අතර අනුවණ තැනැත්තෝ බොහෝ වෙති. ඔවුහු නිවැරදි දෙය හෝ වැරැද්දක් බවට, කුඩා වරදක් වුවත් 'මහා වරදක්' බවට පත් කරති. නුවණැත්තා එහි තරම දනී. ඔවුහු කරුණු විමසා හොඳින් වටහාගෙන වැරැද්ද වැරදි බවත්, නිවැරදි දේ නිවරද බවත් කියති. එහෙයින් නුවණැත්තෝ අනුන් කෙරෙහි..........යනුවෙන් කියන ලදී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගාථා දෙකක් සහ ගාථා අඩකින්ද නිවන නුවණින් දැන වසනු කැමති කෙනෙකුට හා නිවන අවබෝධයට හෝ පිළිවෙත් මග අනුව යන කෙනෙකුට හෝ වෙසෙසින්ම වනවාසී පැවිද්දෙකුට වනය මුල්කොටද, කමටහන ලබාගෙන ඒ අනුව වසනු කැමති සියල්ලන්ටද කළයුතු නොකළ යුතු ලෙසින් කමටහන වඩන සැටි

වදාරා, මීළඟට ඒ මහණුන්ට දේවතා බිය දුරුකරනු පිණිස රැකවරණයක් ලෙසටද, විදසුන් මුල්වන දැහැනක් ලෙසද, කමටහන අරුතින්ද **සුඛිනො වා ඛෙමිනො හොන්තු** යන අයුරින් මෙත් කතාව ඇරඹූහ.

එහි **සුඛිනො** යනු සැපයෙන් යුතු, **ඛෙමිනො** බිය රහිත, රැකවරණය ඇති, උවදුරු නැතැයි කියන ලදී. **සබ්බෙ** වෙන්කොට නොදක්වා, **සත්තා** ජීවය සහිත වූවෝ, **සුඛිතත්තා** සැපවත් සිත් ඇත්තෝ, එසේ කායික සුවයෙන්ද, මානසික සුවයද ඇති බැවින් මේ දෙයාකාරයෙන්ම සියළු උවදුරු පහවීමෙන් හෝ බියරහිත යැයි දතයුතුයි. කවරහෙයින් එසේ කියන ලදද? මෙත් වඩන අයුරු දැක්වීමටය. මේ ලෙසින් මෙත් වැඩිය යුතුයි. ජීවය ඇති සියල්ලෝම සැපවත් වෙත්වා! යැයි පටන් ගැනීමේ සිට දැහැන් ලැබීම තෙක්, සැකෙවින් දක්වා එය සවිස්තරව දැක්වීමට **යෙ කෙ චි** යයි ගාථා දෙකක් වදාළහ. නැතහොත් බොහෝ අරමුණුවලට පුරුදු කරන ලද සිත එකවරටම එකම අරමුණක නොසිටී. අරමුණ සොබාවය අනුව යෙදී (පුද්ගල සොබාව අනුව සුදුසු භාවනා අරමුණක) කෙමෙන් පිහිටයි. එහෙයින් එයට තැති ගනු ලබන, නොසෙල්වෙන (කම්පා නොවන) ආදී ලෙසින් දෙකේ කොටස්, තුනේ කොටස් යැයි අරමුණ පිහිටුවීමේ අරුතින්ද **යෙ කෙ චි** යන ගාථා දෙක වදාළහ. නැතහොත් යම්කෙනෙකුට යම් අරමුණක් ගැළපේද එහිදී ඔහුගේ සිත පහසුවෙන් සකස් වෙයි. එබැවින් ඒ මහණුන්ගේ ඕනෑම කෙනෙකුට යම් ගැලපෙන අරමුණක සිත පිහිටුවනු කැමතිව, තැතිගනු ලබන - නොසෙල්වෙන (දිග - මහත) ආදී දෙකේ කොටස්, තුනේ කොටස් ලෙස අරමුණු පෙන්වාදීමට **යෙ කෙ චි** මේ ගාථා දෙක වදාළහ.

(පසුව තේරුම් දක්වන පරිදි) මේ ගාථාවෙහි, තස-ථාවර, දිට්ඨ-අදිට්ඨ, දූර-සන්තික හා භූත-සම්භවෙසී යන පද කොටස් දෙක දෙක බැගින් සතරාකාරවද, දීඝ යන පදයේ සිට ථූලා දක්වා කොටස් හයක්ද, මජ්ඣිමා යන පදය, දීඝරස්ස මජ්ඣිම, මහන්ත අණුක මජ්ඣිම, ථූල අණුක මජ්ඣිම ලෙසද (හැඩය හා පමණ අනුව) කොටස් තුනක් ලෙසද දැක්වෙයි. **යෙ කෙ චි** යනු පොදුවේ යෙදුනකි. ජීවයක් ඇතිවූයේ **පාණ භූතා** නැතහොත් ජීවය ඇත්තේ **පාණ**, වාතය (සිරුර) ඇතුලට ගන්නා වූ නැවත පිටකරන්නා වූ රූපාදී සමූහ පහකින් යුතු ජීවීන් ගැනේ. පහළ වී ඇත්තේ **භූතා**, එයින් රූපය පමණක් ඇති සහ, අරූප තලයෙහි පහළ වූවන් ගැනේ. **අත්ථි** යනු ඇත, දක්නට ලැබේ. මෙසේ **යෙ කෙ චි පාණභූතත්ථි**

යන මේ වචනයෙන් දෙයාකාර, තුන්ආකාර සේ සියළුම ජීවින් එකසේ ඇතුලත්කොට, දැන් ඒ සියල්ලන්ම තසා වා ථාවරා වා අනවසෙසා යැයි දෙආකාරව දක්වයි. තැති ගනී යන තේරුමෙන් තසා තණ්හාව ඇති, බය ඇත්තවුන්ට සමාන වචනයකි. (නොවෙනස්ව) සිටිති යනු ථාවරා, තණ්හාව ඇතිවන මග වැළැක්වූ - නැතිකළා වූ, රහත් උතුමනට සමාන වචනයකි. මේ හැර, ඉතිරි කොටසක් නොමැති බැවින් අනවසෙසා (සියළු සතුන්ම මේ පද දෙකට ඇතුළත් වේ) එහෙයින් එසේ කියන ලදී. යම් කරුණක් දෙවන ගාථාවෙහි අවසානයෙහි සඳහන් කරන ලදද, ඒ සියල්ල ඉහත දැක්වූ දෙආකාර, තුන් ආකාර වන පරිදි සම්බන්ධ විය යුතුය. ජීවය ඇති, තැති ගන්නා සුළු වූද, ජීවය ඇති තැති නොගන්නා වූද සියළුම ජීවීහු (සත්තු) සැපවත් වෙත්වා! යනුයි. මෙසේ රූපී අරූපී වූ ලොව පහළ වූ සියළුම සතුන්ගේ පටන්, උපතක් බලාපොරොත්තුවෙන්, සොයමින් සිටින්නෝද සැපවත් වෙත්වා'යි (ඒ සම්බන්ධවන අයුරු දතයුතුය) මීළඟට දීඝරසස මජ්ඣිම ආදී කොටස් තුනකට අදාල පද විස්තර වේ. දීඝා වා ආදී වචන හය අතරින් දීඝා යනු සොබාවයෙන් දිග වූ නාගයන් මසුන් තලගොයි වැනි සතුන්, මහමුහුදෙහි බඹ සිය ගණනින් යුත් නොයෙක් නාගයෝද, යොදුන් ගණන් නොයෙක් මසුන් තලගොයින්ගේ උපත් ලද ගණයට අයත් වෙති. මහන්තා යනු ජලයෙහි මහත්-මාළු ආදීන් මෙන්ම ගොඩබිමෙහි ඇතුන්, නාගයන් ද මිනිසුන් නොවන්නා වූ අසුරයන් විශාල සිරුරු ඇති සේ සැළකේ. එසේ සිරුර ඇතියවුන්ගෙන් රාහු (අසුරයා) අගතැන් ගනී. 'රාහගගං අත්තභාවීනං' ඔහුගේ සිරුර උසින් හාරදහස් අටසිය යොදුනකි. අතක දිග යොදුන් එක්දහස් දෙසීයකි. දෙබැම අතර යොදුන් පණහකි. ඇඟිලි ද එපමණය. දෙ අත්ල යොදුන් දෙසීයකි.

මජ්ඣිමා යන්නෙන් අසුන්, ගවයන්, කුළු මීමුන්, ඌරන් ආදීන් ගැනේ. රසසකා ඒ ඒ ජාතිවල, දිග හා මැද සතුන් අතර (කුරු වූ) මිටි, කොට සතුන්ය. අණුක යනු මසැසින් දැකිය නොහැකි, දිවැසින් දැකිය හැකි, ජලය ඇති ආදී තැන්වල සිටින සියුම් සිරුරු දරන්නන්, උකුණන් ආදීන්ද මෙහිලා ගැනේ. එමෙන්ම, ඒ ඒ ජාතිවල ලොකු සිරුරු ඇති සතුන් අතර ද මුදු සිරුරු ඇති සතුන් අතර ද මැද පමණට වැඩුණු මිටි සතුන් අණුක යනුවෙන් දතයුතුය. ථූලා රවුම් හැඩය බඳු යුතු සිරුරු ඇති, මසුන්, ඉබ්බන්, සක් මුතුබෙලි, කවඩි ආදී ජීවීන්ය. මෙසේ පොදුවේ තුන් කොටසක් ලෙස සියළු ජීවීන් දක්වා, දැන් දිට්ඨා වා යෙව අදිට්ඨා

ආදී යුගල තුනකට ඒවා ඇතුලත් කොට දක්වයි. **දිට්ඨා** යනු තම ඇසට හමුවන දකින ලද, **අද්දිට්ඨා** මුහුදෙන් එතෙර, පව්වෙන් එහා, පරසක්වල වසන, **යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ** මේ දෙකොටසින් තමාට දුරින් ද, ලඟින් ද වසන ජීවීන් දක්වයි. ඔවුන් පාද සහිත, පාද රහිත ලෙස ද දතයුතුය. තම සිරුරෙහි, සිරුර ඇසුරු කරමින් වසන සිතුන් අවිදූර ලෙසත්, තමාට ඈත්ව වසන සතුන් දූර ලෙසත් සැළකේ. වෙනත් අයුරකින් කිවහොත්, තම සීමවෙහි (නෙත ගැටෙන මානයෙහි) වසන ජීවීන් සමීපවද, එබඳු සීමාවකින් බැහැර වසන්නන් දූර ලෙසද දැක්වෙයි. එසේම, තම විහාරයෙහි, ගමෙහි, ජනපදයෙහි, සක්වළෙහි වෙසෙන්නෝ සමීප වෙති. වෙනත් විහාරයක... සක්වළක වසන්නෝ දූර ලෙසද ගැනෙති. **භූතා** හටගත්, උපන්, එබඳු උපන් ජීවියෙකු නැවත (සසර) ඇති නොවන්නාහයි අදහසක් ඇත. එය කෙලෙසුන් නැතිකරන ලද රහත් උතුමන්ට සමාන හැඳින්වීමකි. සම්භවයක් හෙවත් පැවැත්මට තැනක් සොයන අරුතින් **සම්භවෙසී** සසර බැඳීම් සිඳ බිඳ නොදැමූ බැවින්, නැවතද හටගැන්මක් හෝ පැවැත්මක් සොයන, (මග පලයෙහි) හික්මෙන හා කෙලෙස් දුරු නොකරන ලද සැමටම (සෙඛ-පුථුජ්ජන) සමාන වචනයකි. නැතහොත්, සතරාකාර වූ උපත් අතර, බිජුවටින් හා (මවු) කුසින් උපන්නෝ, යම්තාක් කල් බිත්තර කටුව හෝ වැදෑමස හෝ නොබිඳිත්ද ඒතාක් **සම්භවෙසී** නම් වෙත්. බිත්තර කටුවද, වැදෑමස ද බිඳ පිටතට නික්මෙන්නෝ **භූතා** නම් වෙත්. සංසේදජ, ඕපපාතික උපත් ලබන්නන් මුල් සිත පහළවන ඉතා සුළු මොහොත **සම්භවෙසී** නම් වන අතර, දෙවැනි සිත් පහළවන මොහොතේදී පටන් **භූතා** යැයි හැඳින්වේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සුඛිනො වා ආදී ලෙසින් ගාථා දෙකකින් සහ පද දෙකකින් ද ඒ මහණුන්ගේ හිතසුවය පතමින්, සතුන් කෙරෙහි මෙත් වැඩීම දක්වා මීළඟට අහිත බව - දුක නොපතමින් ඒ ගැන දැක්වීමට **න පරො පරං නිකුබ්බෙථ** යැයි වදාළහ. එය පැරණි වියතුන්ගේ පාඨයකි. දැන් **පරං හි** යයි ද කියති. මෙය සුදුසු නැත. එහි **පරො** යනු වෙනත් කෙනෙක්, පරං යනු වෙනත් කෙනෙකුට **න නිකුබ්බෙථ** වංචා, කපටිකම් නොකරන්නෝය. (නොකෙරේවා) **නාතිමඤ්ඤෙථ** ඉක්මවා නොසිතන්නේය. **කත්ථචි** ගමෙහි හෝ, කෙතෙහි හෝ (තම සීමාවෙහි) නෑයන් අතර හෝ, පිරිසක් මැද හෝ කිසියම් තැනක, න - එය **කඤ්චි** කැත් හෝ බමුණු හෝ ගිහි හෝ පැවිදි හෝ යහපත් කෙනෙකු හෝ අයහපත් කෙනෙකුට **බ්‍යාරොසනා පටිඝසඤ්ඤා** කය, වචන වැරදි ලෙස

තරහින් හසුරුවන්නේය. නපුරු ලෙස සිත වැරදි ලෙස මෙහෙයවමින්, **බ්‍යාරොසණය පටිඝසඤ්ඤාය** යැයි කිවයුතු නමුදු බ්‍යාරොසණා පටිඝසඤ්ඤා යැයි කියයි. යම්සේ 'සම්මදඤ්ඤාය විමුත්තා' යැයි කිවයුතු නමුදු සම්මදඤ්ඤා විමුත්තා ලෙසද අනුපුබ්බසික්ඛාය අනුපුබ්බකිරියාය අනුපුබ්බ පටිපදාය කිවයුතු කල්හි අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බකිරියා අනුපුබ්බ පටිපදා යැයි කියනු මෙනි. **නාඤ්ඤ මඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය** ඔවුනොවුන්ට දුකක් වනු දැකීම කැමති නොවන්නේය. කුමක් නිසා එසේ කියන ලදද? හුදෙක් සැපයට පත්වේවා, භයට පත් නොවේවා යැයි මෙනෙහි කිරීම් ලෙස මෙත් වැඩීම පමණක් නොවේ. එසේ නම් කුමක්ද? 'අහෝ, යම්කිසි වෙනත් තැනැත්තෙක් තවත් කෙනෙකු වංචාවෙන්, කපටිකමෙන් නොරවටත්ද, ඉපදීම උසස් යැයි ආදී ලෙසින් නව ආකාර වූ මානයෙන් කිසියම් පෙදෙසක වෙනත් පුද්ගලයෙකු ඉක්මවා උඩඟුව කටයුතු නොකරන්නේ නම් (මැනවි) එකිනෙකාට නපුරු වූ සිතින් රළු කතාවෙන් හෝ කෝපය මුසු හැඟුමෙන් හෝ දුකක් වීම නොකැමති වන්නේ යැයි මෙනෙහි කරමින් මෙත් වඩන්නේය.

මෙසේ අහිත වූ දුක් නොපැමිණියේ යැයි බලාපොරොත්තු ලෙසින් මෙත් වැඩීම දක්වා, දැන් එය උපමාවකින් පැහැදිලි කිරීමට **මාතා යථා නියං** යැයි වදාළහ. එහි අරුත නම්, **යථා මාතා නියං පුත්තං** තමා කෙරෙන් උපන්, තමාට දාවූ ඒ පුතු **එකපුත්තං** මෙන්, **ආයුසා අනුරක්ඛෙ** ඔහුට දුක් ඇතිවීම වළකනු පිණිස තම ජීවිතයද නොසළකා, එකම පුතු මැනවින් රකින්නීය. **එවම්පි සබ්බභූතෙසු** මේ මෙත, **මානසං භාවයෙ** නැවත නැවත උපදවා ගන්නේය. වඩන්නේය. එයද අපමණ වූ සතුන් අරමුණු කොට, එකම සතකු හෝ ඉවත් නොවන සේ, පැතිරෙන අයුරින් වැඩිය යුතුය. **අපරිමාණං.**

මෙසේ මුළුමනින් මෙත් වඩන අයුරු දක්වා මීළඟට ඒ කරුණාව (තවදුරටත්) පෙන්වා දෙමින් **මෙත්තඤ්ච සබ්බලොකස්මිං** යැයි කීහ. ආදරයෙන් සිතයි, රකියි යන අරුතින් මිතුරා නම් වෙයි. හිතවත් අදහස්වලින් සෙනෙහස ඇතිකරයි. අහිත වූ දෙයට යොමු නොකොට රැකගනී යන තේරුමයි. එවැනි හිතමිතුරු බව **මෙත්තං, සබ්බස්මිං** කිසිවක් වෙන් නොකොට, හැමදෙනා කෙරෙහිම ලොකස්මිං - සියළු ජීව ලෝකයෙහි, මෙනෙහි කරයි, **මානසං** එහි සිතම ඇතුලත් වන බැවින්, යෙදෙන බැවින් එසේ කියන ලදී. **භාවයෙ** එසේ වඩන්නේය. මෙපමණ

යැයි නොවන්නේ අපරිමාණං අපමණ වූ ජීවීන් අරමුණුකොට මෙසේ කියන ලදී. උද්ධං උඩ, එයින් අරූපභවය සැළකේ. අධො පහළ එයින් කාමභවය සැළකේ. තිරියං මැද, එයින් රූප භවය සැළකේ. අසමබාධං හිරිහැර නැති, සීමා බිඳ දමන ලද බව කියන ලදී. සීමා නම් සතුරාට කියනු ලබයි. සතුරා කෙරෙහි ද මෙත් පතුරුවයි. පවත්වයි යන තේරුමයි. අවෙරං - තරහ නොමැති බවයි. වරින් වර වුවද අතරින් පතර තරහ සිතිවිලි පහළ නොවන බව කියන ලදී. අසපත්තං සතුරකු නැති, මෙත් සිතින් වාසය කරන තැනැත්තා මිනිසුන්ට පිය වෙයි. නොමිනිස් කැලටද පියවෙයි. ඔහුට කිසිම සතුරෙක් නැත. සතුරන් නොමැති ඔහුගේ සිත අසපත්ත යනුවෙන් කියනු ලබයි. පච්චත්ථික, සපත්ත හෙවත් පසමිතුරු, සතුරු යනු ඊට වෙනස් වචනයි. මෙය වචනය අනුව තේරුම් කිරීමයි. මීළඟට සඳහන් වන්නේ එයින් අදහස් කෙරෙන විස්තරයයි. මෙසේ සියලු සතුන් කෙරෙහි සමව, අපමණ මෙත් සිත වඩන අයුරු කියන ලදී. ඒ අපමණ වූ මෙත් පිරි සිත මුළු ලොවෙහිම පතුරුවන විට, එය වැඩි දියුණුවට මහත් බවට පත් වන්නේය. ඒ කෙසේද? උද්ධං අධොච තිරියඤ්ච උඩින් භව මුදුන්හි සිට යටින් අවීචියද අතරමැද වූ සියළු පෙදෙස් ද, උඩින් අරූපී තලයේ සිට යට කාමලෝකය දක්වාද, මැද රූප ලෝකයෙහිද ඇතුලත් වන පරිදි ඉතිරි නොකොට (මෙත) වැඩීමෙන් කරදර නැති, තරහක් නැති, සතුරන් නොමැති බවට පත්වෙයි. මෙසේ භාවනාවෙන් ලබන උසස් බවක් වුවද හැමතැන්හිම හිරිහැර නොමැති, අනුන් කෙරෙහි කෝපය දුරුවීමෙන්, තමාටද සතුරන් නොමැති බවටද පත්වේද, ඒ කරදර බාධා නොමැති, තරහ නැති, සතුරුබල රහිත අපමණ වූ මෙත් සිත මුළු තුන්ලොව වසා පැතිර යන පරිදි වඩන්නේය.

මෙසේ මෙත් සිත වඩන අයුරු දක්වා, මීළඟට එය වඩනා විට ඉරියව් පැවතිය යුතු අයුරු ද පහදමින් තිට්ඨං චරං -පෙ- අධිට්ඨෙය්‍ය යැයි වදාළහ. එහි තේරුම මෙසේය. ඒ මෙත වඩන තැනැත්තා (මහණක්) පලඟ බැඳ (එරමිණිය ගොතාගෙන) කය කෙළින්ව තබාගෙන........ආදී ලෙස නිසීදති පලලංකං ආභුජිත්වා උජුං කාය පණිධාය සඳහන් කරන ලද පරිදි ඉරියව් නියමයක් නොකොට, පහසු පරිදි, ඒ ඒ ආකාර වූ ඉරියව් (ආයාසයෙන් පිහිටුවා ගැනීමෙන් වන) අපහසුතා දුරුවන ලෙසද තිට්ඨං වා චරං වා සයානො වා යාවතා විගතමිද්ධො අසස යැයි වදාළහ. ඉක්බිතිව එතං ඒ මෙත් අදහස සතිං අධිට්ඨෙය්‍ය නැතහොත් එම මෙත් වැඩීම දක්වා දැන් එහි මැනවින් පුරුදු වූ, හුරු වූ බව පහදමින් තිට්ඨං

**චරං** යයි දැක්වූහ. එසේ හුරු බවට පත් මෙත් වැඩුම සිටගෙන සිටිනවිට හෝ ඇවිදිමින් හෝ යම් යම් ඉරියව්වකින් මෙම මෙත් සිත අදිටන් කරනු කැමති වේද, නැතහොත් සිටගෙන හෝ ඇවිදිමින් සිටියදී ඔහුට එහි අනතුරුදායී හිරිහැරයක් (කායික අපහසුතා) නොවේද, ඒ තාක් මෙත් සිත පෙරදැරිව, මැලි බව දුරුකොට උනන්දුවෙන් මෙත් අදිටන කරයි. එය වඩන තැනැත්තාට මුළාවීමක් නැත. එබැවින් **තිට්ඨං චරං නිසින්නොවා සයානො වා යාවතස්ස විගතමිද්ධො එතං සතිං අධිට්ඨෙය්‍ය** යැයි වදාළහ. එහි අදහස මෙසේය. මුළු ලොව පුරාම ආවරණය වන පරිදි, (ඉහත) කී අයුරු මෙත් සිත වඩන්නේය. යම්සේ පිබිදි මොහොතේ සිටම මෙත් සිත පිහිටුවා ගැනීමට අදිටන් කරන්නේය යනුයි.

මෙසේ මෙත් වැඩීමෙහි නියැලීම හුරුවන බව පහදමින් **එතංසතිං අධිට්ඨෙය්‍ය** යැයි මෙත් විහරණයෙහිද යොදවා දැන් එසේ වාසය කිරීම අගය කරමින්, **බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු** යැයි වදාළහ. එහි තේරුම නම්, යම් කෙනෙකු 'සැපවත් වෙත්වා! බිය නැත්තන් වෙත්වා!යි මුලින් පටන්ගෙන, ඒ සිහිය අදිටන් කරන්නේය යනුවෙන් මෙත් විහරණය අගයන ලදී. **එතං** දෙව්, බඹ, සම්බුදු ආදී උතුමන්ගේ ද සිවු ආකාර වූ නිවැරදි ඉරියව් පැවතුම්වලින් තමන්ටද අනුන්ටද යහපතක් සිදුවන බැවින්, **ඉධ** උතුම් දහම් විනයෙහි **බ්‍රහ්ම විහාරමාහු** උසස් විහරණය යැයි කීය. නිතර රැස්වූ විට, එළිමහනෙහි සිටිනවිට, සිටගෙන සිටිනවිට, එහා මෙහා යනවිට හිඳින විට හෝ නිදාගන්නා විට මැලිබව දුරලමින් මේ සිහිය පවත්වාගැනීමට අදිටන් කරන්නේය.

භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුන්ට නොයෙක් ආකාරයෙන් මෙත් වැඩීම පහදා දී මෙත් අරමුණක් සේ ගත් බැවින් එය තමාගේ දැඩිව ගත් හැඟීමක් සේ (අත්තදිට්ඨි) සමීප වේද ඒ දැඩිව ගන්නා හැඟීම වැළැක්වීම සළකා එයම දැහැනක් කොට උතුම් තැනක උපතක් දක්වමින්, **දිට්ඨිඤ්ච අනුපගම්ම** යන දේශනය අවසන් කළ සේක. එහි තේරුම නම්, මෙම **බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු** යැයි මෙත් දැහැනින් යුතු විහරණය මැනවින් විස්තර කරන ලදී. එම දැහැනට සමවැද එයින් නැගී, එය පවත්නා ආකාරය අනුව, විතක්ක විචාරාදී ගති සොබා සළකා බලමින්, 'මෙය නාම රූප කොටස්මය. මෙය ඒවායින් සකස් වූ එකම සමූහ කොටසක් මිස 'සතෙකු' කියා කෙනෙකු නැතැයි **දිට්ඨිඤ්ච අනුපගම්ම** අනුපිළිවෙලින් ලොවුතුරු සීලයෙන් **සීලවා** යහපත් දැකීම යයි කියන ලද සෝවාන්

මගපලයෙන් යුතුව, දසසනෙන සමපනෙනා, ඉන් ඉදිරියට කාම සම්පත් ආදිය කෙරෙහි ඇලීමක්, කෙලෙස් සහිත බව ඉවත නොහරින ලද නම්, සකදාගාමි, අනාගාමි මගපල පත්ව, ඉතිරි නැතිව දුරු කිරීමෙන්, කාමෙසු ගෙධං, විනෙයය දුරුකොට, ඉවත්කොට, සංසිඳුවා න හි ජාතු ගබභසෙයයං පුනරෙති යනු එක් වාරයක් හෝ නැවත මවුකුස පිළිසිඳ නොගැනීමයි. සුදධාවාසයෙහි උපත ලැබ එහිම අරහත් බවට පත්ව පිරිනිවන් පාන්නේය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ දෙසුම නිමාකොට, 'යව, මහණෙනි, ඒ වන පෙදෙසෙහිම වාසය කරව. මෙම සූත්‍රය, මාසයෙහි දහම් අසන දවස් අටෙහි ගෙඩිය ගසා කියව, දහම් කථා (ඒ කරුණු ගැන) කරව, සාකච්ඡා කරව, ඒ පිළිබඳ තුටුපහටුව පිළිගනුව, මෙය කමටහනක් සේ දරා ඇසුරු කරව, පුරුදු කරව, වඩ වඩාත් දියුණු කරගනුව, ඒ නොමිනිසුන් ඔබලාට බිය දනවන අරමුණු නොපෙන්වනු ඇති, හුදෙක්ම ඔබලාගේ දියුණුව, හිතසුව කැමති වනු ඇතැයි ද වදාළහ. උන්වහන්සේලා 'යහපති'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී වැඳ පැදකුණු කොට එහි ගොස් එසේ කටයුතු කළහ. දේවතා දේවතාවියෝ 'මේ හිමිවරුන් අපට හිතවත් යැයි සතුටට පත්ව තමන් විසින්ම සෙනසුන් අමදිනු ලබති. උණුදිය පිළියෙළ කොට දෙති. පිට පිරිමැදීම්, පා මිරිකීම් කරනු ලබති. රැකවරණ යොදනු ලබති. ඒ මහණහු එහිදීම මෙත් වැඩීම මුල්කොට විදසුන් නුවණ මෙහෙයා ඒ තෙමස ඇතුලත අරහත් බවට පත්ව, මහා පවාරණයෙන්, සීල පවාරණයද කළහ. (සීල සමාධියෙන් නුවණ ලැබ සසර ගමන නිමා කළහ.)

'මෙසේ යහපත් කරුණු දැන දියුණුවීමේ හැකියාව ඇත්තෝ, බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද පරිදි මෙම ජීවිතයේ දියුණුවට සහ පරලොව වැඩදායී වන කටයුතුවල යෙදී පිරුණු නුවණින් හද සෙත සලසන උතුම් නිවන අවබෝධ කර ගනිති.'

'එබැවින් උතුමන් විසින් පසස්නා ලද අසිරිමත් වූ අමා නිවන දැන, අවබෝධ කොට වාසය කරනු කැමති නුවණැති ජනයා පිරිසිදු සීල, සමාධි පඤ්ඤාවෙන් යුතුව එලොව මෙලොව දියුණුව සඳහා කටයුතු කරන්නාහ.

**මෙත්තසුත්ත විස්තරය නිමි.**

# 1.9

**අජ්ජ පණ්ණරසො** යනු හේමවත සූත්‍රයයි. එම සූත්‍රයට හේතු වූ කරුණු කෙසේද? විමසීමකට කරුණු පහදා දීමකි. හේමවත විසින් විමසන ලද, විමසන ලද පරිදි භාග්‍යවතුන් වහන්සේ **ඡසු ලොකො සමුප්පනෙනා** යැයි වදාළහ. එහි **අජ්ජ පණ්ණරසො** ආදිය සාතාගිර විසින් කියන ලදී. **ඉති සාතාගිරො** සංගායනාවට සහභාගී වූ තෙරුන් වහන්සේලා විසින් පවසා ඇත. **කච්චි මනො** ආදිය හේමවත විසින් කියන ලදී. ඡසු ලොකෙ භාග්‍යවතුන් වහන්සේ විසිනි. ඒ සියළු ගාථා එක්කොට හේමවත සුත්ත යැයි කියනු ලැබේ. ඇතැමෙක් සාතාගිර සුත්ත යැයි ද කියති. එහි **අජ්ජපණ්ණරසො** යැයි ගාථාව මේ සූත්‍රයට මුල් විය. මේ යහපත් කපෙහිම අවුරුදු විසිදහසක් ආයු ඇති මිනිසුන් අතර ඉපිද, අවුරුදු දහසය දහසක් වැඩසිට පිරිනිවන් පා වදාළ කස්සප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අවසන් කටයුතු මහත් පුදසත්කාර සහිතව පැවැත්වූහ. උන්වහන්සේගේ ධාතු නොවිසිරී, රන් කඳක් මෙන් ඝනව පිහිටියේය. එය දිගුකලක් ජීවත් වූ බුදුවරුන්ට ආවේණික කරුණකි. අඩු ආයු කාලයක් ඇති බුදුවරු බොහෝ ජනයාට දැකීමට නොලැබ, පිරිනිවන් පාති. එබැවින් ධාතු පූජා පවත්වා ඒ ඒ මිනිසුන්ට පින් රැස් කරගැනීමට හැකිවෙතියි අනුකම්පාවෙන් ධාතු විසිරී යන පරිදි ඒ බුදුවරු අදිටන් කරති. ඒ අදිටන අනුව උන්වහන්සේලාගේ ධාතු රන් කුඩු මෙන් විසිරෙති. අපගේ (ගොතම) භාග්‍යවතුන් වහන්සේගේ ධාතු මෙනි. මිනිස්සු කසුප් බුදුරදුන්ගේ ධාතු තැන්පත් කිරීමට එකම දාගෙයක් (ධාතුඝරං) කොට, යොදුනක් උස, යොදුනක වටරවුමක් ඇති සෑයක්ද පිහිටවූහ. එහි එක් එක් ගවුවක දුරින් දොරටු සතරකි. එක් දොරටුවක් කිකී රජුට වෙන් විය. ඔහුගේ පුත් පඨවින්ධරට එක් දොරටුවක්ද තවත් දොරටුවක් සෙන්පති හා ඇති ඇමතිවරුන්ට වෙන්විය. අනෙක් දොරටුව සිටුවරුන් හා ජනපදවාසීන් වෙනුවෙනි. රත්පැහැ රනින් කරන ලද (මෙන්ම) එකට කැටිවූ රන් පිඬුවන්, කාන්තියෙන් බබළන, නා නා මැණික්වලින් සකසන ලද ගඩොල්, එක එකක් සියදහසක අගයක් වූ අතර, ඒවා හිරියල් රත්සිරියල් මැටියෙන් සුවඳ තෙලින් දියකිස කොට දාගැබ තැනවූහ.

මෙසේ දාගැබ පිහිටුවනු ලැබූ කල්හි, යහළු කුල පුතුන් දෙදෙනෙක් ගෙයින් නික්ම (යද්දී) හමුවූ සාවක තෙරුන් වහන්සේලා වෙත පැවිදි

වූහ. දිගුකලක් වැඩවසන බුදුවරුන්ගේ එසේ හමුවීමට ලැබෙන සාවකයන් වහන්සේලා ලවා පැවිද්ද ලබති. උපසම්පදා ලබති. නිස හෙවත් අවවාද හා උපකාරද ලබති. අඩු ආයු ඇති බුදුවරුන්ගෙන් එලෙස සිදු නොවේ. මෙහිදී ද ඒ කුලපුත්තු 'සසුනෙහි ධුර මොනවාදැයි විමසූහ. තෙරුන් වහන්සේලා 'වාසධුර, පරියත්ති ධුර යනුවෙන් දෙකක් ඇතැයි කීහ. පැවිදි වූ කුලපුතකු විසින් ගුරු හිමියන් සහ අවවාද අනුසාසනා කරන හිමියන් සමීපයෙහි පස් වසරක් වාසය කරමින් වත්පිළිවෙත් සපුරා පාමොක්ඛ, බණවර දෙකක් හෝ තුනක සූත්‍ර මැනවින් දැන, කමටහන් ඉගෙන, කුල (නෑදැයන් හෝ) (තමා හා වෙසෙන අනෙක්) පිරිස ගැන හෝ නොඇලී, වනයට පිවිස අරහත් බව අවබෝධ කරනු පිණිස උත්සාහ කළ යුතුය. වෑයම් කළ යුතුය. මෙය වාස ධූරය නම් වේ. තමාට හැකි පරිදි (දීඝ ආදී) එක් නිකායක් හෝ මනාව පුහුණු වී, නිකාය දෙකක් හෝ පහක්ම හෝ ඉතා පැහැදිලිව අරුත් වටහා ගනිමින් ඉගෙන සසුනෙහි කටයුතුවල යෙදීම පරියත්ති ධූරයයි. එවිට ඒ කුලපුත් හිමිවරු, එම ධුර දෙකින් වාස ධුරයම උසස්යැයි කියා, 'අපි තවම තරුණ වෙමු, වියපත් වූ කල වාස ධුරය මනාව පිළිපදින්නෙමු. එතෙක් පරියත්තිධුරය පුරමු' යැයි ඒ අනුව සසුනෙහි උත්සාහවත් වූහ. ඒ හිමිවරු සහජයෙන්ම නුවණැත්තෝය. නොබෝ කලකින්ම, මුළු බුදුවදනම මනාව දැන, විනයද මැනවින් ඉගෙන, විනය කරුණු තීරණයෙහිද සමත් වූහ. උන්වහන්සේලාගේ දහමෙහි පිරිපුන් දැනුම නිසා, පිරිවරද ඇතිවිය. පිරිවර නිසා සිවුපසයද පහසුවෙන් ලැබුණි. එක් හිමිනමකට පන්සියක් පිරිවර මහණහු වූහ. උන්වහන්සේලා බුදු සසුන බබළවමින් වැඩ සිටියහ. යළිත් බුදුවරයකු ජීවමාන කාලයක් මෙන් විය.

එකල දහමට ගරුකරන පැවිද්දෙක් හා අදැහැමි පැවිද්දෙක්ද ගමෙහි ආවාසයක වසති. අදැහැමි මහණ නපුරු, රළුවචන කියන, දොඩමළු සුළු වූවෙකි. ඒ මහණුගේ හැසිරීම අනෙක් මහණ හට දැනගැනීමට ලැබිණ. එහිදී 'ඔබේ මේ කටයුතු සසුනට සුදුසු නොවේ'යැයි චෝදනා කළේය. ඒ මහණ, කුමක්ද? ඔබ දුටුවෙහිද? කුමක් ඇසුවෙහිදැ'යි අවුලට පත් විය. 'විනයධර හිමිවරු එය දැනගන්නාහ'යි දැහැමි මහණ කීය. එවිට අදැහැමි මහණ, 'මේ කරුණ විනයධර හිමිවරුන් තීරණය කරන්නාහු නම්, නිසැකවම මට සසුනෙහි විසුමක් නොවන්නේ'යැයි දැන තම අදහස ඉටත් කර ගැනීමට නොකැමතිව, එකෙණෙහිම පිරිකර ගෙන, ඒ විනයධර හිමිවරුන් දෙනම වෙත පැමිණ පිරිකර දී උන්වහන්සේලා

ඇසුරෙහි වාසය කිරීමට පටන් ගත්තේය. ඒ හිමිවරුන් දෙදෙනාටම සියළු උවටැන් කරමින්, මනාව වත්පිළිවෙත් සපුරනු කැමති සේ කටයුතු කළේය. එක් දවසක් උවටැන් පිණිස ගොස් වැඳ, උන්වහන්සේලා විසින් (එතැනින්) ඉවත්ව යාමට අවසර දෙනු ලැබුවත්, නැවතී සිටියේය. විනයධර හිමිවරු, කිවයුතු කිසියම් දෙයක් ඇත්දැයි විමසූහ. 'හිමියනි, සිකපද වැරදි හැසිරීමක් නිසා, එක් මහණක සමග විවාදයක් ඇත, ඒ මහණ එම කරුණ ඔබවහන්සේලා වෙත සැළ කළහොත්, එය නියමිත අයුරින් තීරණය නොකළ යුතුයැයි කීය. විනයධර හිමිවරු කරුණු දැනගත්විට, නිවැරදි අයුරින් තීරණය කරනු මිස, වැරදි ලෙස තීරණය කිරීම නුසුදුසු බව කීහ. එවිට ඒ මහණ, 'හිමියනි, එසේ කරනු ලැබුවහොත්, සස්නෙහි මට පැවැත්මක් නැත, එහි පාපය මට ම වේවා! ඔබවහන්සේ, මා ගැන එසේ තීරණය නොකරනු මැනවැ'යි පැවසීය. විනයධර හිමිවරු දෙනම, ඒ මහණගේ ඇවිටිල්ල නිසා (ඉල්ලීම) පිළිගත්හ. මෙසේ උන්වහන්සේලා පොරොන්දු කරවාගෙන, නැවත ඒ ආවාසයට ගොස්, 'සියළු විනයධර හිමිවරුන් හමුව එය අවසාන වී' යැයි කියා, ඒ ධම්මවාදී මහණට පෙරටත් වඩා අවමන් කරමින්, නපුරු වචනයෙන් අවමන් කරයි. ධම්මවාදී වූ මහණ, 'සැකයක් මේ ගැන ඇතිවී' යැයි එකෙණෙහිම නික්ම, (විනයධර) තෙරුන් වහන්සේලාගේ පිරිවර වූ පන්සියක් මහණුන් වෙත පැමිණ, 'ඇවැත්නි, කිසියම් කරුණක් ඇතිවූ විට එය දහමට අනුකූල අයුරින් තීරණය කළයුතු නොවේද? නැවත සිහි නොකරවා හෝ එකිනෙකා අතර ඇවැත් දේසනා කරවා හෝ සමගි කළයුතුය. මේ තෙරුන් වහන්සේලා කරුණ ගැන තීරණය නොකළාහ. සමගි නොකළාහ. මෙහි තේරුම කුමක්දැ'යි පැවසීය. ඒ හිමිවරු නිහඬව සිටියහ. 'මෙය කිසියම් ගුරු හිමිවරුන් හෝ දැනසිටිය යුතු නොවේද? (එසේ සිදු නොවූ බැවින් අධම්මවාදී මහණ ඒ අවසරයෙන් 'ඔබ, කලින්ම විනයධර හිමිවරුන් ගැන දැන සිටිති'යි (මට) කියහි. එසේනම් දැන් ඒ විනයධර හිමිවරුන්ට ඒ කරුණ සැළකරව'යි ධම්මවාදී හිමි එසේ අසහනයට පත් කරමින්, 'අද පටන් ඔබ පැරදුණෙහි'ය, ආවාසයට නොපැමිණෙව'යි ඉවත්ව ගියේය. එවිට ධම්මවාදී මහණ තෙරුන් වහන්සේලා වෙත පැමිණ, 'ඔබවහන්සේලා සසුනෙහි (පැවැත්ම) නොබලා, අපගෙන් උවටැන් ලැබුවෙහු (එයින්) සතුටු වූවෙහු, එක් තැනැත්තෙක් ගැනම බලාපොරොත්තු වූවෙහු, සසුන නොරැක පුද්ගලයෙකු රකිවුද? අද මෙතැන් පටන් ඔබවහන්සේලාගේ තීරණය නොවටනේය. කසුප් බගවත් හිමි අද පිරිනිවන්පෑහ'යි මහ හඬින් හඬා, 'බුදුසසුන නැසුනේ' යැයි වැළපෙමින් ගියේය.

ඉක්බිති ඒ (විනයධර) මහණහු සංවේගයට පත්ව, 'අප පුද්ගලයෙකු රකිමින්, සසුන නැමති මැණික මඩවළෙහි දැමුවෙමු'යි කුකුස් ඉපිදවූහ. ඒ කුකුසෙන්ම එම හිමිවරුන් තම දිවි පළුදු කරගත් අතර, වැඩිමහළු හිමි කළුරිය කොට, දෙව්ලොව හෝ ඉපදීමට නොහැකි වූයේ, හිමාලයෙහි හේමවත පව්වෙහි හේමවත නම් යකෙක්ව උපන්නේය. ඒ දෙවැනි විනයධර ගුරු හිමි (කළුරිය කොට) මැද දේසයෙහි පිහිටි සාත පව්වෙහි සාතාගිර නම් (යක්ව) උපන්නේය. පිරිවර මහණහුද, දෙව්ලොව ඉපදීමට නොහැකිව, ගුරුහිමිවරුන් දෙදෙනා අනුව යමින්, පිරිවර යක්කුව උපත ලදහ. හිමිවරුන්ට සිවුපසය ලබාදුන් ගිහි පිරිස දෙව්ලොව උපන්හ. යක් සෙන්පතියන් විසිඅට දෙනෙකු අතර, හේමවත සාතාගිර ද මහත් බලවත් යක් රජවරු වූහ. යක් සේනාපතීන් මෙවන් ආවේණික කරුණක් විය. ඒ ඒ මාසයෙහි අටවන දිනයෙහි, යම් යම් කරුණු පිළිබඳ තීරණ ගැනීමට හිමාලයෙහි, රත්හිරියල් තලාවෙහි හගලවතී පව්වෙහි දෙවියන්ගේ රැස්වීමකට සහභාගි විය යුතුව තිබිණි. සාතාගිර-හේමවත එහිදී හමුවී එකිනෙකා දැන හඳුනා ගත්හ. 'මිතුර, ඔබ කොහි උපන්නෙහිද? ඔබ උපන්නේ කොහිද?' ආදී උපන් තැන් අසා, පසුතැවිලි වූහ. 'මිතුර, අපි වැනසුනෙමු. අවුරුදු විසිදහසක් මහණදම්කොට, එක පාපී සහායකයෙකු නිසා යකුන්ව උපත ලදිමු. අපට සිවුපසය දුන්නෝ කාමාවචර දෙව්ලෝකවල උපන්හ'යි කීය. 'නිදුකාණනි, හිමාලය නම්, පුදුම, ඇදහිය නොහැකි දේ සිදුවෙතැයි සම්මතව ඇත. කිසියම් අසිරිමත් දෙයක් ඇසුවොත් හෝ දුටුවොත් හෝ මට ද සැළකරනු මැනවැ'යි සාතාගිර කීවේය. 'නිදුකාණනි, හිමාලයෙහි මැද (ඔබ වසන) පෙදෙසද පුදුම, ඇදහිය නොහැකි දේ සිදුවෙතැ'යි සම්මතය, කිසියම් අසිරිමත් දෙයක් ඇසුවොත් හෝ දුටුවොත් හෝ මටද කිවමැනව'යි හේමවතද පැවසීය. මෙසේ මිතුරන් දෙදෙනා එකිනෙකා කතිකා කොට ද එසේ යක් සෙන්පතියන් ලෙස වාසය කරනවිටම, මහපොළව එක් යොදුනක් හා ගවු තුනක් වැඩුණු කලදීම, එක් බුද්ධාන්තරයක්ද ඉක්ම ගියේය.

මේ අතර, අප බෝසත් දීපංකර බුදුපාමුල විවරණ ලැබ, වෙසතුරුව ඉපදෙන තෙක් (සසර) පාරමී දම් පුරා, තුසිත භවනයෙහි ඉපිද, එහි ආයු ඇතිතාක් වැස, දෙවියන් විසින් ආයාචනා කරන ලද පරිදි, පස්මහ බැලීම් විමසා බලා, දෙවියන්ට සැළකොට පෙරනිමිති දෙතිසක් පහළ වනවිට, දසදහසක් ලෝධාතු කම්පාකොට මනුලොව පිළිසිඳ ගත්තේය. සාතාගිර, හේමවතද ඒ පෙරනිමිති දුටුවද, එයට නිසිපරිදි හේතුව නොදත්හ.

ඔවුන් කෙළිදෙළින් යුතුව සිටි නිසා එය නොදුටු බව ඇතැමෙක් කියති. මේ ආකාරයෙන් බෝසතුන් ඉපදීමේදීද, අබිනික්මණෙහිදී ද, බුදුබවට පත්වීමෙහිදී ද (බුදුබව ලබා) පස්වග මහණුන් අමතා, වට තුනකින් හා දොළොස් ආකාර වූ උතුම් දහම් සක දේශනා කරන කල්හිද, පොළව සෙලවීම හා පෙරනිමිති පෙළහරද ඒ දෙදෙනාගෙන් සාතාගිර පළමුව දුටුවේය. ඊට හේතුව දැනගත් සාතාගිර සහ පිරිස, භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ දහම් දෙසුම ඇසුවද මගපල කිසිත් නොලැබීය. ඒ කවර හෙයින්ද? ඔහු දහම් අසන විට, හේමවත සිහිව 'මාගේ සහායකයා පැමිණියේද, නැත්දැ'යි, පිරිස දෙස බලා ඔහු නොදැක, 'මෙබඳු විසිතුරු වැටහෙන සුළු භාග්‍යවතුන් වහන්සේගේ දේශනය ඇසීමට නොලැබීමෙන් මා යහළුවා රවටනු ලැබීයැයි සිත අවුලට පත්විය. (මෙබඳු විසිතුරු දෙසුමක් ඇසීමට යහළුවාට නොදැන්වීම ඔහු සිතන්නේ යහළුවා රැවටීමක් ලෙසයි.) භාග්‍යවතුන් වහන්සේද හිරු අවරට ගියද දෙසුම නිමා නොකළහ. මේ අතර, සාතාගිරද 'යහළුවා සමග එහි අවුත් දහම් දෙසුම අසන්නෙමි'යි ඇත්, අස්, ගුරුළු වාහන ආදිය මවා, යකුන් පන්සියයක් පිරිවරා හිමවත දෙසට ගියේය. එවිට හේමවතද (බෝසතුන්) පිළිසිඳ ගැනීමේදී, අබිනික්මන, බුදුවීම, පිරිනිවන්පෑමෙහිදී පහළවන දෙතිස් පෙරනිමිති බොහෝ වේලාවක් නොපැවතුනත්, දම්සක් පවත්වනවිටදී ඊට වෙනස්ව, ඒ පෙරනිමිති බොහෝ වේලාවක් තිබී අතුරුදන් වන ඒ පුදුම අසිරිය හිමාලයෙහිද දැක, 'මා උපන් කල සිටම (උපන් හඳවියක) කිසිම දිනක මෙබඳු අසිරිමත් සිත්කළු දෑ නොවූවිරූය, මාගේ යහළුවාද සමග අවුත් මේ මල් අසිරිය විඳගන්නෙමි'යි (හිමාලයෙහි) මැද (ඔහු වසන) පෙදෙසට එයි. දෙදෙනාම රජගහනුවර ඉහළ අහසෙහිදී හමුවී එකිනෙකා පැමිණෙන කරුණ විමසූහ. 'සිරිමතාණනි, මා ඉපදුණු කල පටන්ම, මේ පව්වෙහි අකාලයෙහි මල් පිපුණු ගස්වලින් මෙලෙස හැඩ වූ පෙළහරක් නොවූ විරූය. එහෙයින් මේ මල් අසිරිය ඔබ සමග විඳගැනීමට සිතා පැමිණියෙමි'යි හේමවත කීවේය. 'සිරිමතාණනි, මේ අකාලයේ මල් පිපුණු පුදුම පෙළහර සිදුවූයේ කිනම් කරුණක් නිසාදැයි දන්නෙහිදැ'යි සාතාගිර ඇසීය. 'නොදනිමි, සිරිමතාණනි' (හේමවත කීය) 'මේ පෙළහර සිදුවූයේ හිමාලයෙහි පමණක් නොවේ. දසදහසක් ලෝධාතුවෙහිම පහළවීය. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව උපන්හ. අද දම්සක් පැවැත්වූහ, ඒ කරුණ'යැයි සාතාගිර හේමවතට බුදු උපත ගැන කියා, ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත කැඳවාගෙන යනු කැමතිව, මෙම

ගාථාව කීය. ඇතමෙක්, භාග්‍යවතුන් වහන්සේ ගෝතමක චේතියෙහි වැඩවසන දිනක **අජ්ජ පණ්ණරසො** යන ගාථාව කී බව පවසති.

අජ්ජ මේ දිවා රෑ, පුරපස, අවපස ආදිය දැක්වීමේ අයුරින් **පණ්ණරසො**, පිළිපැදිය යුතු, රැකිය යුතු හෙයින් **උපසථො**, එවැනි තුන්ආකාර වූ පෙහෙවස් දින අතර අද පසළොස්(වක) දිනයි. දහහතරවන පෙහෙවස් දිනය නොවේ. පොහොය කරන දින ද නොවේ. යම් ආකාරයකින්, පාමොක් උදෙසීම, අංග අටකින් යුතු (සීල සමාදානය) (විකාලයෙහි) ආහාර නොගැනීම, පැනවීම, දවස ආදී ලෙස බොහෝ තේරුම් උපොසථ යන වචනයෙහි ඇත. 'ඇවැත්නි, කසසප, එන්න උපොසථය සඳහා යන්නෙමු' **ආයාමාවුසො කප්පින, උපොසථං ගමිස්සාම'** ආදී තැන්හි උපොසථ වචනය පාමොක් උදෙසීම අරුතින් යෙදිණ. 'විසාඛ, මේ අංග අටකින් යුත් උපොසථයෙහි විසිය යුතු - අට්ඨංගසමන්නාගතො ඛො විසාඛෙ උපොසථො උපවුත්‍ථො' ආදී තැන්හි පරපණ නැසීමෙන් වැළකීම ආදී (අටසිල්) කොටස් අදහස් වේ. 'පිරිසිදු තැනැත්තාට හැම දවසම පෙහෙවස්ය. 'සුද්ධස්ස වෙ සදා ඵග්ගු සුද්ධස්සු පොසථො සදා', උපොසථ නම් නා රජ 'උපොසථො නාම නාගරාජා' ආදී තැන්හි පැනවීමෙහි හෙවත් හැඳින්වීමෙහි ද, 'ඒ පසළොස්වක පෙහෙවස් දින හිස පටන් දිය නා 'තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස' ආදී තැන උපොසථ යන වචනයෙන් දවස අදහස් වේ. මේ අනුව, වෙනත් අරුත් හැර, ඇසළ පුණු පොහෝ දවස ගැනම සළකා **අජ්ජ පණ්ණරසො උපොසථො** යැයි කීය. පිළිවෙලින් (පසළොස්වක දිනට පසුදින සිට ගණිනවිට එළඹෙන ඊළඟ පසළොස්වක දිනය) අද පසළොස්වක දවසයි යනුයි. දෙව් විමනක් මෙන් මෙහි බබළයි, යන අරුතින් දිව්‍යා, ඒවා මොනවාද? රූප වේ. ඒ රැය දස දහසක් ලෝක ධාතුවලින් රැස්වූ දෙවිවරුන්ගේ සිරුරු, ඇඳුම්, අබරණ සහ විමන්වල ආලෝකයෙන්ද, වලාකුළු ආදී අවහිරතාවයෙන් මිදුණු සඳෙහි ආලෝකයෙන්ද මුළු දඹදිවම අලංකාරවත් විය. වෙසෙසින්ම අලංකාරවත් වූයේ, දෙවියන්ටත් වඩා අති උතුම් වූ භාග්‍යවතුන් වහන්සේගේ සිරුරේ බැබළෙන පැහැයෙනි. **දිව්‍යා රත්ති උපට්ඨිතා** යැයි එහෙයින් කීය. මෙසේ රෑ කල සොබා වැණුමෙන්ද දේශනයෙන්ද තම සහායකයාගේ සිත පැහැදීම ඇතිකරමින්, බුදුරදුන් ලොව පහළවීම ගැන කියා **අනොමනාමං සත්‍ථාරං හන්ද පස්සාම ගොතමං** යැයි කීය.

උසස් වූ, ලාමක නොවූ හැම ලෙසින්ම පිරිපුන් ගුණවලින් සඳහන් කරන අරුතින් **අනොම නාමො** එසේම 'ඇති තතු ඇති පරිදිම අවබෝධ කරන ලදින් බුද්ධ නම් වේ. අවබෝධය ලද නිසා බුද්ධ නම් වේ' 'බුජ්ඣිතා සච්චානීති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො' - රාගය බිඳින ලද හෙයින්, තරහ බිඳ දමන ලද හෙයින් භගවා යන උසස් ගුණ නාමයෙන් යුතුය. අරහ - සම්මා සම්බුද්ධ විජ්ජාචරණ සම්පන්න ආදී ගුණ පිළිබඳවද එසේමය. මෙය දුරු කරව, මෙසේ ජීවිතය පවත්වා ගනුව'යි මේ ජීවිත කාලය තුල දැහැමිව ගතකිරීමට දෙව් මිනිසුන්ට අවවාද, අනුශාසනා කරන බැවින් **සත්ථා** නම් වේ. එමෙන්ම සත්ථවාහ නමින්ද හැඳින්වේ. මඟ පෙන්වාදෙන නායකයෙකු යම්සේ කාන්තාරයේ ගමන් කරන්නන් එතර කරනු ලබන්නේ යැයි නිදෙදසයෙහි දක්වා ඇති පරිදි සත්ථා හෙවත් මගපෙන්වන නායකයෙකි. ඒ අනොම නාමං **සත්ථාරං, හන්ද** යනු යම් කටයුත්තක නියැලීමේ අදහස දෙන නිපාත පදයකි. **පස්සාම** (හේමවත) ඔහු තමන් සමග සබඳතා ඇතිකොට, වත්මන් කාලීන අදහස දෙන වචනයකි. **ගොතමං** ගොතම නම් පරම්පරාවට අයත්, කුමක් නිසා කියන ලදද? මගපෙන්වන නායකයෙකු වූ උන්වහන්සේ පිළිබඳව එසේ නොවේ යැයි සැක නොකරනු, එකම සිතින්, එකම හැඟීමෙන් යුතුව එන්න, **පස්සාම ගොතමං**

මෙසේ කී විට හේමවත, 'මේ සාතාගිර උසස් නම් ලබා ඇති, මගපෙන්වාදෙන නායකයෙකු ලෙස සියල්ල දන්නා බව පවසයි. සියල්ල දත්තවුන් ලොව දුලබ වෙත්, සියල්ල දන්නා බවට සහතික ඇති පූරණ කසුප් වැනියවුන් ලෝකයෙහි උවදුරකි. මේ කියන තැනැත්තා සියල්ල දන්නේ නම්, ඒකාන්තයෙන්ම කම්පා නොවන බවට (කෙලෙස් රහිත බවට) පත්වූවෙකු විය යුතුය. එහෙයින් මෙසේ විමසිය යුතු යැයි සිතා, ඒ ගැන විචාරමින් **කච්චි මනො** යන ගාථාව කීය. **කච්චි** විචාරීමයි. **මනො** සිත, **සුපණිහිතො** මනාව පුරුදු කරන ලද, ඊට සුදුසු ලෙස තබා ගන්නා ලද, නොසැලෙන, කම්පා නොවන, **සබ්බභූතෙසු තාදිනො** එබඳු ගුණයෙන් යුතු, 'ඔබේ ඔය කියන නායකයාණන් සියළු සතුන් කෙරෙහි සම සිතින් කටයුතු කරන්නේද නැද්දැයි' විමසයි. **ඉට්ඨෙ අනිට්ඨෙ ච** මෙබඳු අරමුණෙහි **සංකප්ප** සිතිවිලි, **වසීකතා** යටතට ගන්නා ලද, කුමක් නිසා කියන ලදද? ඔබ යම් නායක මගපෙන්වන්නකු ගැන කියහිද? ඒ තැනැත්තා කිසියම් නොවෙනස්වන, නොසැලෙන ලෙස සියළු දෙනා කෙරෙහි මනාව පිහිටුවා ගත්තේද, නැතිනම් කම්පාවන, සසලවන කරුණක් ඇතිවනතුරු පමණක්

එසේ මනාව සිත කම්පා නොවී ඇතැයිද (මට) වැටහෙයි. ඔබේ ඒ මගපෙන්වන නායකයා කෙසේ **සබ්බභූතෙසු සමසිතින් තාදී**, නැතිනම් නො, යනුවෙනි. දකින-නොදකින අරමුණු කෙරෙහි රාග දෝස ආදී ලෙසට සිතිවිලි-අදහස් ඇතිකර නොගනීද, ඔහුගේ වසඟයෙහි එසේ තබා ගත්තේද, නැතිනම් ඒවාට යටත්ව පවතීද යනුවෙනි.

එවිට සාතාගිර, භාග්‍යවතුන් වහන්සේ සියළු දෙයම පිරිසිඳ දන්නා බැවින්, සියළු (රාග දෝසාදිය) තම වසඟයෙහි පවත්නා බැවින් ඒ ගුණ අනුමත කරමින් **මනොචසස සුපණිහිතො** යැයි කීය. **සුපණිහිතො** විරුද්ධව නොයන අරුතින් මහපොළව මෙන් මනාව පවත්වා ගන්නා ලද, නොසැලෙන අරුතින් මහමෙර මෙන් මැනවින් පිහිටි, සිවුආකාර වූ මාර සේනා වැනි දොස් නගනවුන් හමුවෙහි කම්පා නොවන අරුතින් නුවර දොරටුවෙහි පිහිටුවන ලද කණුවක් සේ සවිමත්ය. මෙසේ සියළු ආකාරයෙන්ම, උසස් ගුණයෙන් යුතුව, සියල්ල දන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ සිත නොවෙනසව, මැනවින් පිහිටියේද එය පුදුමයට කරුණු නොවන්නේ, තිරිසන් භවයෙහි ඡද්දන්ත නම් කුලයෙහි ඇතකුව ඉපිද මද වැගිරෙන කාලයෙහිදී විස පොවන ලද හී පහරක් විදින ලද වධකයාටද නොවෙනස්ව අහිතක් නොසිතීමයි. හුදෙක්ම ඔහුට තමන්ගේ කැමැත්තෙන්ම දළ කපා දුන්නේය. එසේම, මහා වඳුරකුව ඉපදිකල මහා ගල් පහර හිසට වැදෙද්දීත්, ඒ පහර දුන් තැනැත්තාටද මග පෙන්වීය. එසේම විදුර පඬිව උපන් කල, දෙපයින් ගෙන කාල පව්වෙහි සැට යොදුනක් වූ මහා බෑවුමෙහි පහළට හෙළනු ලැබූ විටද, හුදෙක්ම ඒ යකුගේම හිතසුව පිණිසම දහම් දෙසීය. එහෙයින් සාතාගිර, **මනො චසස සුපණිහිතො** යැයි කීය. **සබ්බභූතෙසු තාදිනො** හැමදෙනා කෙරෙහිම, (හැම දෙයක් කෙරෙහිම) නොසැලෙන සම ගුණයෙන් යුතුව, සිත පිහිටුවා ගැනීමයි. සිවුපසය නොලැබෙන විටද එසේම තේරුම් ගත යුතුයි. එහිලා භාග්‍යවතුන් වහන්සේගේ තාදී ගුණය කරුණු පහකින් දත යුතුය. 'භාග්‍යවතුන් වහන්සේ පස් ආකාරයකින් තාදී වෙති. ඉටු අනිටු අරමුණුවලදී කම්පා නොවෙති. කෙලෙසුන් අත්හළ බැවින් සමාන සිත ඇතියහ. සසරින් එතර වූ බැවින් සමාන සිත ඇතියහ. එය පහදා දීමේදී වෙනසක් නොකරති. ඉටු අනිටු අරමුණුවලදී භාග්‍යවතුන් වහන්සේ කෙසේ සමව සිටිත්ද? සිවුපසය ලැබීම ආදියෙහිද තාදී ගුණින් යුතු බව වැනි සියළු කරුණු නිද්දෙසයෙහි කී පරිදි සළකාගත යුතුය. මහ අටුවාවෙහි සඳහන් විස්තර අනුව ලැබීම් ආදී දේ දතයුතුය. ඒ මග පෙන්වාදෙන නායකයාණන්

වහන්සේ ගැන, **සබ්බභූතෙසු තාදී** නැතිනම් නො යැයි මතය විමසීමේදී අපගේ නායකයාණෝ, සියළු සතුන් කෙරෙහි සමසිත් ඇති බැවින් තාදී ගුණයෙන් යුතු වෙති'යි පහදා දිය යුතුව ඇත. මෙම භාග්‍යවතුන් වහන්සේ, සැප එක්රැස් කරගනු කැමතිවන හෝ දුක නැතිකර ගැනීමට කැමතිවන සියළු සතුන් කෙරෙහි ද තමන් ගැන කටයුතු කරන ආකාරයටම, සමතාවයෙන් සිටිති. මහමායා දේවියට මෙන්ම, චිංචිමාණවිකාවටත් එකසේමය. පියා වූ සුද්ධෝදන (රජුට)ද සුප්පබුද්ධටද එකසේමය. රාහුල පුතුට මෙන්ම (තමාට) හිරිහැර කරන ලද, දේවදත්ත-ධනපාලක ඇතු, අංගුලිමාල හා සදෙව්ලෝ වාසී හැමටම එකසේ සම සිත පවත්වති. එහෙයින් **සබ්බභූතෙසු තාදිනො** යැයි සාතාගිර මනාව පැවසීය. **අථො ඉට්ඨෙ අනිට්ඨෙ චා** මෙහි තේරුම මෙසේ දතයුතුය. ඉටු අනිටු.....කැමති අකැමති යම් අරමුණක, මුළුමනින්ම රාගදෝස ලෙසින් **සංකප්පා** හැඟීම් හෝ සිතිවිලි උපදවා ගනීද, උතුම් වූ (ඤාණ) මගින් රාගාදිය දුරුකරන ලද හෙයින් **වසීකතා** කිසිවිටකත් ඒ හැඟීම්වලට වසඟ වී නොපවතී. ඒ භාග්‍යවතුන් වහන්සේ නොකැළඹුණු සිතිවිලි ඇතිව, කෙලෙසින් මිදුණු සිතින්, කෙලෙසින් මිදුණු බව දන්නා නුවණින් යුතු වෙති. මෙහිදී සිත මනාව පිහිටුවා ගන්නා ලද බැවින් නුවණින් මෙනෙහි කිරීම ගැනද කියන ලදී. සියළු සතුන් පිළිබඳ වූ ඉටු අනිටු අරමුණු කෙරෙහි යම් තැනැත්තෙක් පවත්නා වූ ආකාරය, ඒ ඒ පුද්ගලයන්ගේ හැඩගැසීම (හැසිරීම් රටා) අනුව දෙයාකාර අරමුණු කියන ලදී. හැඟීම්-කල්පනාවකට වසඟවන අරමුණෙහි බුදුරජාණන් වහන්සේ මෙනෙහි නොකරන බැවින් කෙලෙස් නැතිකිරීම ගැනද එයින් පැහැදිලි කරන ලදී. මනාව පිහිටුවා ගන්නා ලද සිත අනුව, පිරිසිදු සිත් හසරද, සියළු සතුන් කෙරෙහි එම සිත පවත්නා අයුරින්, පිරිසිදු කය හැසිරවීමද කල්පනාවන්ට යටත්ව මතවාදී නොවන බැවින් පිරිසිදු වචනයෙන් යුතු බැවින්ද, එසේ මනාව පිහිටුවා ගත් සිතෙහි ලෝභාදී සියළු දොස් නැති බැවින් ද සියළු සතුන් කෙරෙහි සමසිත ඇතිව, මෙත් ආදී යහගුණද, හැඟීම් යටපත් කරන ලදින් පිළිකුල් දෙයෙහි පිළිකුල් නොවී, උතුම් ඉඳුබලයද නිසා බුදුරජාණන් වහන්සේ සියල්ල අවබෝධ කරගත් බව කියන ලදැයි දත යුතුය.

මෙසේ හේමවත, මුලින් සිත නැමති දොරටුව ලෙසින් තාදී බව විචාරා, ඒ ගැන දැනගැනීමේදී මෙම කරුණුද අසා, වැඩිදුර තේරුම් ගැනීමේදී, දැන් (කය වචනයද සමග) දොරටු තුනක් සේ දැන, කලින්, කය වචන සිතෙහි පිරිසිදු බව ගැන කෙටියෙන් අසා, ඒ පිළිබඳව තවත්

දැනගැනීමට **කචචි අදින්නං** යැයි විස්තර විමසීය. එහි ගාථාව බැඳීමේ පහසුව සළකා පළමුකොට නුදුන් දෙය ගැනීමෙන් වැළකීම අසයි. **ආරා පමාදමහා** යනුවෙන් පස්කම්හි සිත තදින් මුල්බැස, එයට වසඟ වීමෙන් වැළකී, අබ්‍රහ්මචරියාවෙන් වෙන්වීම ගැන විමසයි. **ආරාපමදමහා** යැයි ද කියති. ආරා යැයි කාන්තාවන් ගැන කියන ලදී. **ඣානං න රිඤ්චති** දැහැනෙහි නියුතු කෙනෙකුට (ඒවායින්) ඇලීම් රහිත බව බලවත් වේ යැයි තුන් ආකාර වූ කයෙහි දුසිරිතෙන් වැළකීමෙන් ඇතිවන බලවත් බව අසයි. එවිට සාතාගිර, භාග්‍යවතුන් වහන්සේ වත්මනෙහි පමණක් නොව, අතීතයෙහිද සසර ගමනේදී දිගු කලක් නුදුන් දේ ගැනීම ආදියෙන් වැළකුණහ. ඒ වැළකීමේ බලයෙන් ඒ ඒ මහ පුරිස් ලකුණු ලදහ. සදෙව්ලෝ වාසීහු 'සමණ ගොතමයන් නුදුන් දේ ගැනීමෙන් වැළකුණහ' 'අදින්නාදානා පටිවිරතො සමණො ගොතමො' ආදී ලෙසින් ගුණ වනති. එහෙයින් එය තහවුරු කරන වදනින්, සිංහ නාදයක් කරන්නාක් මෙන් **න සො අදින්නං** ආදියති යැයි කීය. එහි තේරුම පැහැදිලිය. මේ ගාථාවෙහි තුන්වන පේළිවල **පමාදමහා පමදමහා** යැයි වචන දෙකකි. සිවුවන පේළියෙහි **ඣානං න රිඤ්චති** දැහැන හිස් නොකරයි, අත්හැර නොදමයි අරුත දතයුතුය.

මෙසේ කය නම් වූ දොරටුවෙහි පිරිසිදු බව අසා, මීළඟට වචනය නම් දොරටුවෙහි පිරිසිදු බව විමසමින් **කචචි මුසා න භණති** කීය. **ඛීණ** යනු හීන, හිංසා කරයි, බාධා පමුණුවයි යන අරුතයි. වචන මග හෙවත් වාචාය පථ = ව්‍යප්පථො, ඛීණව්‍යප්පථ යන වචනයට 'න' කාරයෙන් වළක්වන තේරුම දැක්වීමට යොදමින් **න ඛීණව්‍යප්පථො** යැයි කියයි. නපුරු වචන නොකියන තේරුමයි. **නා ඛීණව්‍යප්පථො** යනුවෙන්ද පාඨයකි. නපුරු වචනය අනුන්ගේ හදවතෙහි රැඳී පවතී. එවැනි වචනයක් කෙසේවත් උන්වහන්සේ විසින් නොකියන ලදී. විභූති යනු විනාශයයි. වැනසීමක් කරනු ලබයි හෝ කරයි හෝ විභූතිතං, ඒ වචනයම **වෙභූතියං, වෙභූතිකං** යැයිද කියනු ලැබේ. එය කේලමට සමාන වචනයකි. එය මිනිසුන් එකිනෙකා භේද කිරීමෙන් වැනසීමට පත් කරයි. ඉතිරි වචන පැහැදිලිය.

එවිට සාතාගිර, භාග්‍යවතුන් වහන්සේ දැන් පමණක් නොව, අතීතයෙහිදී සසර ගමනේ දිගුකලක් බොරුකීම් ආදියෙන් වෙන්වූයේ ඒ වැළකීමේ බලයෙන් ඒ ඒ මහපුරිස් ලකුණු ලද සේක. සදෙව්ලෝ වාසීහු උන්වහන්සේට 'සමණ ගොතම බොරු කීමෙන් වැළකුණහ'යි **මුසාවාදා**

**පටිවිරතො සමණො ගොතමො** යනුවෙන් ගුණ වණති. එහෙයින් එය තහවුරු කරන වචනයෙන් සිංහනාද කරමින් **මුසා ච සො න භණති** යැයි කීය. එය මුසා යනු දුටු දේ ආදියෙහි වැරදි සේ සළකා අනික් තැනැත්තන් මුළාකරන - රවටන වචනයකි. එබඳු වචන **සො න භණති** දෙවන පාදය මුලින් අරුත් ගෙන, **න ඛීණව්‍යපපථො** දෙවන අරුත ලෙසින් **නා ඛීණව්‍යපපථො** යැයිද පාඨයකි. සිවුවන පේලියෙහි **මනතා** යනු නුවණට කියයි. භාග්‍යවතුන් වහන්සේ එබඳු බොරු වචන හැරදමා, අත්‍ථං නිවැරදි දෙයම **භාසති** අරුත් සහිත, ඉවත දැමිය නොහැකි වචනම පවසති. අනුවණ බව පෙරටුවන, පලදායී නොවන වචන බුදුවරුන්ට නැත. එහෙයින් **මනතා අත්‍ථං සො භාසති** යැයි කීය. ඉතිරි අරුත් පැහැදිලිය.

මෙසේ වචනය නැමති දොරටුවෙහි පිරිසිදු බව අසා, මීළඟට සිත නැමති දොරටුවෙහි පිරිසිදු බව විමසමින් **කච්චි න රජ්ජති කාමෙසු** යැයි කීය. එහි **කාමා** යන්නෙන් වස්තුකාම හෙවත් ඒ ඒ දෙයට ඇති තදබල කැමැත්ත ගැනේ. ඒවා කෙරෙහි කෙලෙස් සිතිවිලි ඇතිව නොඇලේදැයි 'දැඩි ආසා රහිත බව ගැන අසයි. **අනාවිලං** තරහෙන් (සිත) නොකැළඹුණු බව සළකා, තරහ නොමැති වීම ගැන අසයි. **මොහං අතික්කනෙතා** යම් කෙනෙකු කරුණු හරිහැටි තේරුම් නොගැනීමෙන් මුළා වී වැරදි අදහස් දරනු ලබයි. එය ඉවත් කිරීමෙන්, නිවැරදි දැකීම පිළිබඳව අසයි. **ධම්මෙසු චක්ඛුමා** යැයි අසන්නේ, සියළු දේ කෙරෙහි නොගැටෙන නැණසින්, ඇස් කන් ආදී පසිඳුරන් හා ගෝචරවන රූපාදී අරමුණු පහ කෙරෙහි සියල්ල දන්නා බව පිළිබඳවයි. කය ආදී දොරටු තුනෙහි පිරිසිදු බවම නොවේයැයි සිතීය. ඉක්බිති සාතාගිර, භාග්‍යවතුන් වහන්සේ අරහත් බවට නොපැමිණ, අනාගාමී මගින්, කාමරාගය - තරහව නැති කළ බැවින්, මෝහය ඉක්මවමින්, තමා විසින්ම ඇති තතු - ඇත්ත අවබෝධ කොට, සියළු කෙලෙසුන්ගෙන් මිදුණු, බුද්ධ යැයි හඳුන්වන (පඤ්ඤා) ඇස් ලැබූහ. ඒ ආකාරයෙන් සිත හැසිරවීමේ නිවැරදි පිරිසිදු බවද, සියල්ල දන්නා බවද **න සො රජ්ජති කාමෙසු** යැයි හඬනගා කීය.

මෙසේ හේමවත භාග්‍යවතුන් වහන්සේගේ කය සිත වචනය යන දොරටු **තුනෙහිම** පිරිසිදු බවද, සියල්ල දන්නා බවද අසා තුටුපහටුව පෙර ජාතියෙහි බොහෝ සෙයින්ම ඇත්ත කීමටම මුල්තැන දෙමින්, **නුවණින් යුතුව**, නොගැටෙන වචන කතා කරමින්, ඇදහිය නොහැකි තරම් පුදුම සහගත සියල්ල දන්නා ගුණ අසනු කැමතිව, **කච්චි විජ්ජාය**

සමපනෙනා යැයි කීය. විජජාය සමපනෙනා යනු මෙම දක්නා ලද සඵලතාවය - ලද උසස් දැක්මෙහි අගය ගැන අසයි. සංසුද්ධචාරණො මේ (සසර) ගමනෙහි සාරවත් සඵල බවයි. ඡන්දස් ලෙසින් මෙහි 'ච' කාරය දිගුකොට කීය. පිරිසිදු හැසිරීම යන තේරුමයි. ආසවා ඛීණා මේ දැකීමෙන් හා සසර ගමනින් පැමිණිය යුතු කෙලෙසුන් නැසීම යැයි කියන ලද පළමු නිවනට පත්වීම (සෝපාදිසෙස) ගැන අසයි. නත්ථි පුනබ්භවො යැයි මෙම දෙවන නිවනට (අනුපාදිසෙස) පත්වීමේ හැකියාව විමසුම් නුවණින් හෝ පරම සැනසීමට පැමිණි බව හෝ දැන, ඒ අනුව, 'ඒ තැනැත්තා පෙර තමන් පෙර ඉපිද සිටි තැන් විමසා බැලීම' ආදී ලෙසින් 'සො අනෙක විහිතං පුබ්බෙනිවාසං.....' භයභෙරව සූත්‍රයෙහි දැක්වූ තුන් ආකාරයද, 'ඒ තැනැත්තා සිත එකඟ වූ කල්හි......කම්පා නොවන බවට පත් වූ විට නුවණින් (ඇති තතු) දැකීම පිණිස සිත යොමු කරයි'. සො එවං සමාහිතෙ චිතෙත, -පෙ- ආනෙජජපපතෙත ඤාණදසසනාය චිතතං අභිනීහරති ආදී ලෙසින් අමබට්ඨ සූත්‍රාදියෙහි දැක්වූ අට ආකාර වූ විදුනැණ (ලබයි) එහිදී සියළුම දේ නියම ලෙසින් දැනගත හැකි බවට පත්වීමට භාග්‍යවතුන් වහන්සේ (මේ කරුණුවලින්) සපුරා තිබිය යුතු බව දක්වති. 'මහානාම, මේ ලෝකයෙහි තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා සිල්වත් බවට පත්වූයේද, ඉඳුරන් නැමති දොරටු රැක ගත්තේද, ආහාර ගැනීමේදී තමාට සෑහෙන පමණ දන්නේ වේද, කෙලෙස් නැති කිරීමෙහි අවදියෙන් (මනා සිහිනුවණින්) සිටිත්ද සත්ආකාර වූ යහපත් කරුණුවලින් යුතුද, උසස් සිතිවිලිවලින් හෙබි, සිවුවන දැහැන පහසුවෙන්ම මේ ජීවිතය තුලදීම ලැබ එසේ සැප විහරණයෙහි යෙදෙන්නන් අතරට එක්වෙයි. 'ඉධ මහානාම, අරියසාවකො සීලසමපනෙනා හොති, ඉන්ද්‍රියෙසු ගුතතද්වාරො හොති, භොජනෙ මතතඤ්ඤූ හොති, ජාගරියං අනුයුතෙතා හොති, සතතහි සද්ධමෙමහි සමනනාගතො හොති, චතුනනං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධමම සුඛවිහාරානං නිකාමලාභී හොති' මෙසේ කරුණු දක්වා, 'මහානාම, තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා සිල්වත් බවට පත්වන්නේ කෙසේද?' 'කථඤ්ච මහානාම අරියසාවකො සීලසමපනෙනා හොති' යැයි සෙඛ සූත්‍රයේ දැක්වූ පසළොස් චරණ කරුණුද, සියළුම කෙලෙස් නැති කිරීමෙන්, භාග්‍යවතුන් වහන්සේගේ අති පිරිසිදු බවද, කාමයන්හි සතුටු වීමක් හෝ සතරාකාර ආසවවලින්ද තොරව, මුළුමනින්ම පෙර භවයන්හි පුරුදු පුහුණු යහගුණවලින් ඉදිරි භවයක පැවැත්මට ඇති ඉඩකඩද (වාසනා) නැති කළ සේක. මෙම විජ්ජාචරණ ගුණයෙන් කෙලෙසුන් නසන ලද උතුමෙකු බවට පත්ව, එවිට භාග්‍යවතුන්

වහන්සේ 'දැන් නැවත ඉපදීමක් නැතැ'යි තහවුරු කළහ. එහෙයින් සාතාගිර, උන්වහන්සේගේ සියල්ල දන්නා නුවණ කෙරෙහි උනන්දු වීමෙන් තවත් දිරිමත්ව, ඒ සියළු ගුණ අනුමත කරමින් **විජ්ජාය චෙව සම්පන්නො** යැයි කීය.

එවිට හේමවත, සම්මා සම්බුදුරජාණන් වහන්සේ භගවත් යැයි නිසැකවම දැන, අහසෙහි සිටම, උන්වහන්සේ පසසමින් සාතාගිරද මැනවින් සතුටු කරමින්, **සම්පන්නං මුනිනො චිත්තං** යැයි කීය. එහි තේරුම නම් බුදුරජාණන් වහන්සේ සිත මනාව පිහිටුවා ගත් අයුරු මෙහි දැක්වූ පරිදි නොවෙනස්වන, කම්පානොවන බවයි. උන්වහන්සේ නොදුන් දේ නොගන්නාහ. කය මෙහෙයා කරන එම කටයුතු **කම්මනා** (යන වචනයට) 'උන්වහන්සේ කාමයන්හි නොඇලෙති යනුවෙන් සිතින් කෙරෙන කටයුතුද (මනො) කම්මනා ද 'උන්වහන්සේ බොරු නොකියති' යනුවෙන් මෙහි කියන ලද ව්‍යප්පථෙන ච වචනයෙන් කෙරෙන කටයුතු ගැනද සඳහන් වෙයි. මෙසේ ගුණ සපිරුණු සිතද, අතිඋතුම් විජ්ජාචරණ ගුණ යුතු බැවින්ද **විජ්ජාචරණ සම්පන්නං** වෙති. මෙම ගුණවලින් 'උන්වහන්සේගේ සිත මනාව සකස් වූයේ' යැයි **ධම්මතො නං පසංසසි** ඇති සැටියෙන්, ඇති තතු පරිද්දෙන්ම, ඇත්තටම, ඔබ උන්වහන්සේ දුටුවෙහිය. ඇදහීමෙන් පමණක්ම නොවේ. එහිදී සාතාගිරද, 'එසේය, සිරිමතුනි, ඔබ මැනවින් දැනගෙනම (උන්වහන්සේ) පිළිගන්නා ලදැයි යන අදහසින් ඔහු සතුටු කරමින්, **සම්පන්නං මුනිනො -පෙ- ධම්මතො අනුමොදසි** යැයි කීය. මෙසේද කියා භාග්‍යවතුන් වහන්සේ දැකීමෙහි ඔහු යුහුසුළුව මෙහෙයවමින් **සම්පන්නං** -පෙ- **හන්ද පස්සාම** ගොතමං යැයි කීය.

ඉක්බිති හේමවත තමා වඩා කැමති ගුණවලින් හා පෙර ජාතීන්හි බොහෝ ඇසූ පිරූ තැන් ඇති හෙයින්ද භාග්‍යවතුන් වහන්සේට තුති පැසසුම් කරමින් **එණිජංඝං -පෙ- එහි පස්සාම** ගොතමං යයි කීය. එහි තේරුම නම්, එණි නම් වූ මුවකුගේ හා සමාන කෙණ්ඩා පිහිටි එණිජංඝො, බුදුවරුන්ට එණිමුවාට මෙන් අනුපිළිවෙලින් වටව පිහිටි කෙණ්ඩා ඇත. ඉදිරි කොටස මසින් නොපිරී ඇති අතර, පසු කොටස කිඹුලකුගේ උදරය මෙන් පිම්බුණු බවක් නැත. **කිසා** දික්ව, කෙටිව, සමව හා වටව පිහිටිය යුතු ඒ ඒ අඟපසඟ, බොහෝ මිනිසුන්ගේ මෙන් තරව (මහත්ව) පිහිටීමක් බුදුවරුන්ට නැත. තියුණු නුවණින් කෙලෙස් සූරා දැමීමෙන් හෝ, කිසා

නම් වේ. තමාගේද පිටත ද (කෙලෙස්) සතුරන් බිඳින ලදින් වීරා එක් වේලක් ආහාර ගැනීමද, පමණ දැන ආහාර ගැනීමද අප්පා හාරා වෙයි. අහර පිඬක් දෙවරක් අනුභව නොකෙරේ. එසේ හෙයින් කියන ලදී. 'උදායී, මම ඇතැම්විට මේ පාත්‍රයෙන් මුවවිට දක්වා පුරවා අනුභව කරමි. ඊට වැඩියෙනුත් අනුභව කරමි. සමණ ගොතම අඩු ආහාරයෙන් යැපෙයි. අඩුවෙන් ආහාර ගැනීමෙහි යහපත අගය කරතියි ශ්‍රාවකයෝ මට සත්කාර කරන්නාහ, ගරු කරන්නාහ, බුහුමන් කරන්නාහ, පූජා කරන්නාහ, සත්කාර කොට, ගරුකොට, ඒ ඇසුරුකොට වාසය කරති. උදායී, මාගේ ශ්‍රාවකයෝ කුඩා කෝප්පයක් පමණ ආහාරයෙන්ද, එයින් අඩක් පමණ ආහාරයෙන් ද, බෙලි ගෙඩියක අහරින්ද, බෙලි ගෙඩියක අඩක් පමණ ආහාරයෙන්ද (මා යැපෙන්නේ නම්) මට මේ ආකාරයෙන් සත්කාර නොකරති. ඒ ඇසුරුකොට නොවසති. 'අහං ඛො පනුදායී අප්පෙකදා ඉමිනා පත්තෙන සමතිත්තිකං භුඤ්ජාමි, භීයොපි භුඤ්ජාමි, අප්පාහාරො සමණෙ ගොතමො අප්පාහාරතායච වණ්ණවාදීති ඉති චෙ මං උදායී සාවකා සක්කරෙය්‍යුං, ගරුකරෙය්‍යුං, මානෙය්‍යුං, පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං, යෙ තෙ උදායී මම සාවකා කොසකාහාරාපි අඩ්ඪකොසකාහාරාපි බෙලුවාහාරාපි, අඩ්ඪබෙලුවාහාරාපි න මං තෙ ඉමිනා ධම්මෙන සක්කරෙය්‍යුං, -පෙ- උපනිස්සාය විහරෙය්‍යුං' ආහාරයෙහි දැඩි ඇල්මක් නොමැති බව අලොලුපා, කරුණු අටක් සපුරන ආහාර ගනිති. උසස් හික්මීමෙන් යුතු වූයේ මුනිනො ගිහිගෙයින් නික්ම, අනගාරික ජීවිතයත්, විවේකී වූ, සන්සුන් මනසින් යුතුව වනෙ ඣායන්ති එහෙයින් හෙමවත යකු එණිජංඝං -පෙ- එහි පස්සාම ගොතමං යැයි කීය.

මෙසේද කියා, ඒ භාග්‍යවතුන් වහන්සේගෙන් දහම් අසනු කැමතිව, සීහං චෙකචරං යන මේ ගාථාව කීය. එහි තේරුම නම් සීහං වා ළංවීමට අපහසු, ඉවසා දරා සිටින බැවින්ද, බය නැති හෙයින්ද කෙසුරු සහිත සිංහයෙකු වැනිය. යම් ආකාර වූ තණ්හා ආසා හැඟීම් ඇති නිසා තණ්හාව මිනිසාගේ දෙවැන්නකු 'තණ්හා දුතියො පුරිසො' ලෙස දැක්වේ. ඒ තණ්හාව නොමැති හෙයින් එකචරං, එක් ලෝක ධාතුවෙක බුදුවරුන් දෙදෙනෙකු උපදින්නේ නැති හෙයින්ද එකචරං වෙයි. ඛග්ගවිසාණ සූත්‍රයෙහි කියා ඇති පරිදි ද මෙහි තේරුම් දත යුතුය. නාගං නැවත ඉපදීමක් නොවන්නේය. නැතහොත් අපරාධයක් නොකරයි යනුවෙන් ද නාගො, බලවත් බවින්ද නාගො නම් වේ. ඒ නාගයා (හෙවත් රහතන් වහන්සේ) කාමෙසු අනපෙක්ඛිනං කැමැත්ත ඇතිකරන දෙයාකාර වූ

දෙයෙහි දැඩි ආසා, බලාපොරොත්තු නොමැති, **උපසංකමම පුචඡාම මච්චුපාසප්පමොචනං** මෙබඳු උසස් ඉසිවරයෙකු බඳු බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ, තුන් භවයෙහි සසර සැරිසරන්නන්ට මරණය නැමති උගුලෙන් මිදෙන, සසර ගමන අහුරන, නිවන ගැන අසමු. දුක හටගන්නේ යැයි කියනු ලබන මරණය නම් උගුලෙන් යම් උපායකින් මිදෙත්ද, ඒ මර උගුලෙන් මිදීම අසමුයි මේ ගාථාව හේමවත සාතාගිරටද සාතාගිර පිරිසටද, හේමවතගේ පිරිස වෙනුවෙන්ද කීය.

ඒ කාලයෙහි රජගහනුවර ඇසළ නැකැත් උළෙල දන්වන ලද්දේය. එවිට මුළු නගරය පුරාම අලංකාරව සරසන ලද්දේ ද දෙව් පුරයක් මෙනි. (උකුස්සකුගේ හැඩයට තනන ලද ගෙයක වසන) කාලී නම් උපාසිකාව පහයට නැගී සීහ කවුළුව විවරකොට සුළඟ හමන දෙසට මුහුණලා, සිසිලස විඳගනිමින් මැනවින් තම විඩාව දුරුකෙරෙමින් සිටිනවිට, ඒ යක් සෙන්පතීන්ගේ බුදුගුණ පිළිබඳ වූ කතාබහ මුල-මැද-අවසානය දක්වාම ඇසුවාය. 'බුදුරජාණන් වහන්සේ මෙබඳු ගුණවලින් පිරිපුන්හ'යි, අරමුණු කොට සතුට උපදවා, කෙලෙස් යටපත් කොට එහිම සිට සෝවාන් පලයට පත්වූවාය. එහෙයින්ම භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, ඇසීම් පමණකින් සතුටු සිතින් පැහැදුණු සාවිකාවන් අතරින් කුරරඝරික කාලී උපාසිකාව මුල්තැන ගත්තී'යැයි අග තනතුරෙහි තබන ලදී.

ඒ යක්සෙන්පතියෝද යකුන් දහසක පිරිවර සමග, මැදියමිහි ඉසිපතනයට පැමිණ, දම්සක් පවත්වන ලද අසුනෙහිම වැඩසිටි පලගෙහිම වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, වැඳ **අකඛාතාරං පවතතාරං** යන මේ ගාථාවෙන් තුති පැසසුම් කොට අවසර ලබාගත්හ. එම ගාථාවේ අරුත නම්, තණ්හාව හැර, තුන්ලොවෙහි පවත්නා කරුණු පිළිබඳව 'මහණෙනි, බුදුවරුන් විසින් අවබෝධ කරන ලද දුක පිළිබඳ ඇත්ත මේ' යැයි ඇති තතු පහදා දෙන බැවින්, 'ඉදං ඛො පන භිකඛවෙ දුකඛං අරියසචචං' - **අකඛාතාරං** වේ. 'මහණෙනි, මේ දුක පිළිබඳ ඇත්ත මා පිරිසිඳ දක්නා ලදී. 'තං ඛො පනිදං දුකඛං අරියසචචං පරිඤ්ඤෙය්‍යං' යනුවෙන් සඳහන් කරන ලද තන්හී කළයුතු හා කරන ලදැයි නුවණින් නොදැන පහදා දුන් බුදුවදන **පවතතාරං** වේ. (ඊට අදාළ කරුණු) පැවසිය යුතුනම්, එය වහරට අනුව පහදා දී ඇත. (ලොවුතුරු කරුණු ලොවෙහි පවත්නා බස් වහරින් පවසා ඇත.) ඒ ඒ කරුණු, ඒ ඒ තැනැත්තන්ට ගැලපෙන පරිදි පහදා දීම **පවතතාරං**, ඉක්මණින්ම තේරුම් ගෙන,

අවබෝධය ලද හැකි තැනැත්තාට කෙටියෙන් කියාදීමත්, විස්තර ලෙසින් කිවයුතු තැනැත්තාට විස්තර සහිතව කීමත් අක්ඛාතාරං, ඒ ඒ පුද්ගල සිත් සතන්වලට පැවතිය යුතු, සුදුසු පරිදි කරුණු පහදා දීම **පවත්තාරං,** කෙටියෙන් හෝ එකිනෙකට ගැලපෙන පරිදි ඇති තතු ඇත්ත ලෙසින්ම කීම අක්ඛාතාරං, ඉන්ද්‍රියන් සේ දැක්වෙන සද්ධාව ආදිය පිළිබඳව පවත්නා කරුණු තවදුරටත් පහදා දෙමින් 'දහම් සක'යැයි ලොව පවත්නා නියමය වෙසෙස් නුවණින් විස්තර කරමින් ඒ 'දහම් සක' ඉදිරියට ලොව පවත්වාගෙන යාමේ අදහසින් පවත්තාරං, **සබ්බධම්මානං** සිවුසස් දහමෙහි, පාරගුං කරුණු හයකින් (සසරින්) එතර ගිය බව දැක්වෙන අදහසයි. සියළු දත යුතු දේ දැනගැනීමෙන්, මැනවින් පිරිසිඳ අවබෝධයෙන් හා සමවතින් සිත එක්තැන් කිරීමෙන් යනුවෙනි. ඒ භාග්‍යවතුන් වහන්සේ සියළුම දේ දැනගැනීමෙන් එතරට ගියහයි **අභිඤ්ඤා පාරගූ** නම් වේ. රූපාදී පස්කඳ පිළිබඳව මනාව දැනගත්හයි, **පරිඤ්ඤා පාරගූ ය.** සෝවාන් ආදී සිවුමග පල වඩමින් ගියහයි **භාවනා පාරගූ ය.** (දුක) නැතිකිරීම අවබෝධයෙන් කළහයි **සච්ඡිකිරියාය පාරගූ ය.** සමවත්හි සමවදිමින් ගියහයි **සමාපත්ති පාරගූ** වේ. මෙසේ සියළු කරුණින්ම එතර ගිය බව (අදහස් වේ). **බුද්ධං වෙරභයාතීතං** නොදැනීම නමැති නින්දෙන් පිබිදුණු බැවින් බුද්ධ නම් වේ. සියළු ආකාරයෙන්ම, සසර දුකින් එතරවීමට පිහිටවන-උපකාර වන සේ මග කියා දුන් අරුතින් බුද්ධ වේ. (පරපණ නැසීම් ආදී) පස් ආකාර තරහ හා බිය ඉක්මවන ලදහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේට තුති පැසසුම් කරමින් **මයං පුච්ඡාම ගොතමං** යැයි අවසර ඉල්ලූහ.

ඉක්බිති ඒ යකුන් අතුරෙන් තේජසින් හා නුවණින් මුල්තැන ගත් හේමවත අදහස් කළ අයුරින් විමසිය යුතු කරුණු ගැන **කිස්මිං ලොකෙ** යන මේ ගාථාව කීය. එහි මුල් පදයෙහි කිස්මිං යනු පවත්නා තතු විමසීමෙහි ආධාර විබත් වචනයකි. කුමක් උපන් කල්හී, හටගත් කල්හී **ලොකො සමුප්පන්නො** යනුවෙන් අදහස් වේ. සජීවී හා එහි සබඳතාවයෙන් සකස්වන ලෝකය (සත්ත සංඛාර) පිළිබඳව අසයි. **කිස්මිං කුබ්බති සන්ථවං** මම හෝ මගේ හෝ යැයි දැඩි ආසාව හා දැඩිව ගත් හැඟීම් එකතුවෙන් කුමක් කෙරේද? හේතු දැක්වීමේ අරුත දෙන ආධාර විබත්ය. **කිස්ස ලොකො** සම්බන්ධ විබත් අරුතින් යෙදී ඇත. කුමක් නිසා **උපාදාය** ලෝකය යැයි නම වේද? මෙහි අදහස් කරන්නේ මෙයයි. කිස්මිං ලොකො යැයි පවත්නා තතු දක්වන තේරුමෙන් ආධාර විබත් යෙදී ඇත. කුමක්

පවත්නා කල්හී, කුමක් ඇතිවිට, කිනම් කරුණින් ලෝකය විහඤ්ඤති පීඩාවට පත්වේද, අවහිරතාවට පත්වේදැයි අදහසයි.

ඉක්බිතිව භාග්‍යවතුන් වහන්සේ, (ඒ ඒ තැනැත්තන් තමන් තමන් ලෙසට හා ඉන් බාහිරවද ඇස් ආදී වූ ආයතන හයෙහි සජීව ලෝකයක් ලෙසද සම්පත්, අස්වනු ආදිය රැස්කරන (සංඛාර) ලෝකය සකස් කරගනු ලැබේද, එසේ ජීව ලෝකය තුල ඒ හයආකාර වූ ආයතන පිළිබඳව (තමා හා බාහිර ලෙස) දෙවදෑරුම් සබඳතා ඇතිකර ගනීද, ඇස - මට - මගේ යැයි සළකමින් ඉතිරි ආයතන ගැන හෝ වෙනත් සේ සිතන අයුරු සඳහන් කරන්නේ මෙසේය. 'ඇස (තමාගේ හෝ) තමාට අයත් යැයි යමෙකු කියත්ද, එවැනි දෙයක් ඇතිවන්නේ නොවේ' 'චක්ඛුං අත්තාති යො වදෙය්‍ය, තං න උපපජ්ජති' ආදී ලෙසිනි. එපරිද්දෙන්ම එම ආයතන හය ඇසුරු කොට දෙයාකාරව ලෝකය යැයි හඳුන්වයි. ඒ ආයතන හය ඇති කල්හී මේ ජීව ලෝකය - ජීවීන් දුක හටගැනීමෙන්, දුකට පත්වීමෙන් වෙහෙසට පත්කරනු ලබයි. එහෙයින් මෙසේ වදාරා ඇත. 'මහණෙනි, අත් තිබෙන කල අල්ලාගැනීම, අතහැරීම සිදුවෙයි. (අත්වලින්, අල්ලා ගනී. අත හරී) පාවලින් ඉදිරියට - පසුපසට යාම වෙයි. (ඇඟිලි) ආදියෙහි සබඳතා ඇතිවිට හැකිලීම, දිගහැරීම් වෙයි. කුස ඇති කල සා පිපාසා වෙයි. මහණෙනි, මේ අයුරින්ම ඇස ඇති කල, ඇසට ගැටෙන අරමුණු පහස හේතුකොටගෙන තමා කෙරෙහි සැප දුක (විඳීම්) හටගනී' 'හත්‍ථෙසු භික්ඛවෙ සති, ආදානනික්ඛෙපනං හොති, පාදෙසු සති අභික්කම පටික්කමො හොති, පබ්බෙසු සති සමිඤ්ජනපසාරණං හොති, කුච්ඡිස්මිං සති ජිඝච්ඡාපිපාසා හොති, එවමෙව ඛො භික්ඛවෙ චක්ඛුස්මිං සති, චක්ඛුසම්ඵස්ස පච්චයා උපපජ්ජති, අජ්ඣත්තං සුඛ දුක්ඛං' - එසේ ඒවා අරමුණු හා ගැටුනු කල සංඛාර ලෝකයද පීඩාවට පත්වෙයි. 'ඇස නොපෙනෙනා කල තරහව ඇතිවීමෙන් බොහෝ පීඩාවට හෝ පත්වේ යැයි එබැවින් වදාරන ලදී. 'චක්ඛුස්මිං අනිදස්සනෙ සප්පටිඝෙ පටිහඤ්ඤී වා'.......එසේම, 'මහණෙනි, කැමති අකමැති රූප දැකීමේදී ද ඇස වෙහෙසට පත්වේ. 'චක්ඛුං භික්ඛවෙ පටිහඤ්ඤති මනාපාමනාපෙසු රූපෙසු' මේ ආදී ලෙසිනි. එසේ ඒ කරුණු එකතු වූ විට (කලින් දැක්වූ පරිදි) ලෝකයා වෙහෙසට පත්වනු ඇත. 'මහණෙනි, කැමති අකමැති රූපවල ඇස කළඹයි' යනුවෙන්ද වදාරා ඇත්තේ එහෙයිනි. 'චක්ඛුං ආවිඤ්ජති මනාපාමනාපෙසු රූපෙසු' - 'මහණෙනි, ඇස ඇවිලගෙන ඇත. රූපය ඇවිලී ඇත. එසේ ඇවිලී ඇත්තේ කුමකින්ද? රාගය නැමති ගින්නෙන්

ඇවිලගෙන ඇත.' මේ අයුරින්ද වදාරන ලදි. 'චක්ඛුං භික්ඛවෙ ආදිත්තං, රූපා ආදිත්තා, කෙනාදිත්තං? ආදිත්තං රාගග්ගිනා - එහෙයින් තමාට අයත් හා බාහිරව ආයතන හය පිළිබඳව ඒ විචාළ කරුණ පැහැදිලි කරමින් ඡසසු ලොකො සමුප්පනෙනා යැයි වදාළහ.

එවිට ඒ යකු, තමන් විසින් සසර සම්බන්ධව අසන ලද පැනය, භාග්‍යවතුන් වහන්සේ විසින් ආයතන දොළහක් ලෙසින් ගෙන කෙටියෙන් විසඳනු ලැබ, මැනවින් වෙන්කොට නොදක්වන ලදැයි, එහි අරුත හා එම කරුණ වෙනස් ලෙසින් දැනගනු කැමතිව, සසර ගමන හා එය වෙනස් වන අයුරු (සසර ගමන හා නැවතුම) විමසමින් කතමං තං යන ගාථාව කීය. දැඩිව අල්ලා ගන්නා අරුතින් උපාදානං එය දුක නම් වූ ඇත්ත හා සමාන වචනයකි. යත්‍ථ ලොකො විහඤ්ඤතී, ඡසසු ලොකො විහඤ්ඤතී යනුවෙන් මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් සවැදෑරුම් දැඩි අල්ලා ගැනීමෙන් ලෝකය වෙහෙසට පත්වන්නේ යැයි කියන ලදී. තං කතමං උපාදාන යනුවෙන් මෙසේ ගාථා දෙපදයෙන් ඇති සැටියෙන්ම දුක ගැන විචාළේය. දුකට හේතුව හෙවත් සමුදය සච්ච - ඒ කරුණටම ඇතුලත් කරන ලද්දේය. නියාාණං පුච්ඡිතො මේ ගාථාවෙහි ඉතිරි පද දෙකින් දුක නැතිකරන මග විචාළේය. බුදු වදන පිළිගත් ශ්‍රාවකයා, ඇත්ත වූ මගෙන් දුක දැන, දුකට හේතුව හැර දමමින්, එය නැති කිරීම අවබෝධ කර ගනිමින්, ඒ මග අනුව යමින් ලෝකයෙන් එතරට ගෙන යයි. එහෙයින් නියාාණං යැයි කියනු ලැබේ. කථං කිනම් ආකාරයෙන්, දුක්ඛා පමුච්චතී දැඩි අල්ලා ගැනීම යයි කියන සසර දුක්වලින් මිදීමට පැමිණේ. මෙසේ ඇති සැටියෙන්ම ඇත්ත මග පිළිබඳව ඇසීය. දුක නැති කිරීම නම් වූ ඇත්ත එහි මූලිකව ඇතුලත් වූයේමය.

මෙසේ යකු විසින් සිවුසස් ලෙසින් කරුණු (එකවරටම) සඳහන් කොට හෝ සඳහන් නොකොට, විචාරන ලද පැන, භාග්‍යවතුන් වහන්සේද ඒ ආකාරයෙන් විසඳමින් පඤ්ච කාමගුණ යන ගාථාව වදාළහ. එහි පඤ්චකාම ගුණ යනුවෙන් ඊට අදාල අරමුණු ගනිමින්, ඊට නැඹුරු වන ඇස ආදී ආයතන පහද සැළකේ. ඒ අතර, මනසද සයවැන්න ලෙසට ගෙන, මනො ඡට්ඨා, පවෙදිතා කියන ලදී. මෙහි සයවැනිව මනස සඳහන් කිරීමෙන් එයට සම්බන්ධ වන අරමුණුවල පැවැත්ම ගන්නා ලද්දේමය. මෙසේ ඒ දැඩිව අල්ලා ගැනීම කවරේද? යන පැනය විසඳමින්, නැවත ආයතන දොළහක් සේ ගෙන දුක පිළිබඳ ඇත්ත වදාළහ. මනස

ඇතුලත්ව කරුණු දැක්වීමෙන් ජීවීන්ගේ හැඟීම් සහගත බව හෙවත් 'විඤ්ඤාණ ධාතුව' ගන්නා ලදී. එබැවින් මුලදී එහි (රූපාදී) පස් ආකාර වූ හැඟීම් සහගත බව සළකා, ඒ ඒ තැන්හි ඇස ආදී කොට ඇති ආයතන පහ මනස හා බැඳී පවතින අයුරුද සළකා ඒවායෙහි අරමුණු වන ලෙසට ආයතන දොළහකට අදාළ කොට දුකෙහි ඇත්ත වදාළහ. ලොවුතුරු මනස (මගපල ලත්) හා අරමුණු එක් ආකාරයකට ගෙන, 'යම් තැනක ලෝකය වෙහෙසට පත් වේ යැයි පෙන්වා දී ඇති බැවින් ඒ පිළිබඳව මෙහිදී නොසැළකේ. **එත්ථ ඡන්දං විරාජෙත්වා** මෙහි දොළොස් ආයතනවලට අදාලව දුක නම් වූ ඇත්ත පිළිබඳව, ඒ ආයතන කොටසින්ම සමූහ ලෙසින්, ධාතු ලෙසින් හා නාමරූප ලෙසින් ඒ ඒ අයුරින් වෙන්කොට, තිලකුණු සළකා ඒ අනුවද විමසීමෙන්, අරහත් මග කෙළවර කොට ඇති විදසුන් නුවණින් තණ්හාව යැයි කියනු ලබන කැමති බව, නොඇලෙන සේ අත්හැර දමා, දුරුකොට, සිඳ බිඳ දමන ලදැයි යන තේරුමයි. **එවං දුක්ඛා පමුච්චති** යනුවෙන් මේ ආකාරයෙන් ඒ සසර දුකෙන් මිදේ. මේ ගාථා දෙපදයෙන් **නියානං පුච්ඡිතො බෲහි කථං දුක්ඛා පමුච්චති** යැයි මේ පැනය විසඳන ලද්දේය. (සිවු සස් දහම්හි) මගද පවසන ලදී. සමුදය හා නිරොධ සච්චයද පෙර පරිද්දෙන්ම ඇතුලත් වූ බැවින්, ඒ ගැනද පවසා ඇතැයි දතයුතුය. ගාථා ඉතිරි පද දෙකෙන් ඡන්ද යන්නෙන් දුකත්, හැරදමා යන්නෙන් දුක හටගැනීමේ හේතුවත්, විරාග යන්නෙන් දුක නැති කිරීමද මිදුනේය යන වචනයෙන් මගද, (තවත් අයුරකින් කිවහොත්) මෙසේ යැයි කරුණු පෙන්වා දීමෙන් මගද දුක නැතිකිරීම යන වචනයෙන් හෝ, දුකින් මිදුනේයැයි, දුකින් මිදීමෙන් දුක නැසීමද ලෙසින් මෙහි සිවුසස් වදාරන ලදැයි දතයුතුය.

මෙසේ සිවුසස් ඇතුලත් ගාථාවෙන් (ලෝකයෙන් - සසරින්) ඉවත යෑම දක්වා නැවත එයම තම බස්වහර අනුව **එතං ලොකස්ස නියානං** යැයි පැවසූහ. **එතං** කලින් දක්වා ඇති පරිදිය. **ලොකස්ස** තුන් ලෝකයෙන්, **යථාතථං** නොවෙනස් වූ (යම්සේ ද එසේ), **එතං වො අහමක්ඛාමී** දහස් වාරයක් වුවත් මගෙන් අසන්නහු නම්, මම එය ඔබලාට කියාදෙමි. වෙනත් දෙයක් නොකියමි. කවර හෙයින්ද, යම් ආකාරයකින්, **එවං දුක්ඛා පමුච්චති** වෙනත් ආකාරයකින් නොවේයැයි අදහසයි. නැතහොත්, මේ නික්මයෑම ගැන එක්වරක්, දෙවරක් හෝ තුන්වාරයක්ම මම ඔබලාට කියමි. ඉදිරියට සුවිශේෂ වූ මගපල ආදිය ගැනද මම කියමි යන තේරුමයි. කවර හෙයින්ද? මෙසේ දුකින් මිදේ යැයි කිසිවක් ඉතිරි නොකොට

(පහදා දෙමින්) අරහත් බව කුළුගන්වා දේශනය නිමකරන ලද බැවිනි. දේශනාව අවසානයෙහි යක් සේනාපති දෙදෙනා යකුන් දහසක් සමග සෝවාන් පලයෙහි පිහිටියහ.

එවිට, මුලසිටම දහමට ගරුකළ හේමවත, දැන් මගපලයෙහි හෙවත් අරිය බිමෙහි සිට වඩාත් තුටුපහටුව, භාග්‍යවතුන් වහන්සේගේ විසිතුරු හරවත් දේශනයෙහි, රහත් බව හැර, ඉතිරි මගපල ලැබූවන් සහ රහත් බව ලැබූවන් පිළිබඳ විමසමින් **කොසූධ තරතී** යන ගාථාව කීය. එහි **කො සූධ තරතී ඔඝං** යනු 'මේ සතර ආකාර වූ සැඩපහරින් කවුරු එතර වෙත්දැ'යි, පොදුවේ මගපල පත්වීම ගැන අසයි. **අණ්ණවං** පළල, ගැඹුර මෙපමණ යැයි නොදැක්වුවත්, සාගරයෙහි යම් තරමකට පළල හා ගැඹුර වේ යැයි කියනු ලැබේ ද සංසාර සාගරයද එබඳුය. මෙය හාත්පස කෙළවරක් නොමැති වූ (පළල මෙතෙකැයි ගැඹුරින් පෙන්විය නොහැකි) මත්තෙහි (ආධාරකයක් සේ) රැඳී සිටිය නොහැකි බවින්ද ගැඹුරුය. එහෙයින් මේ සාගරය කවුරු තරණය කරත්ද? එහෙයින්ම, **අප්පතිට්ඨෙ** අනාලම්බෙ ගම්භීරෙ සාගරයෙහි **කො න සීදති** රහත් පලය ගැන විමසයි.

එවිට භාග්‍යවතුන් වහන්සේ, සෝවාන් ආදී මගපල තතු පහදමින් සබ්බදා **සීලසම්පන්නො** යන සීලාදී, තෙවැදෑරුම් හික්මීම පදනම් වන ගාථාව වදාළහ. යම් මහණකු දිවි රැකගැනීමට හෝ සීලයෙහි කඩවීමක් නොකරමින් සබ්බදා **සීලසම්පන්නො**, මෙලොව මෙන්ම මගපල ආදියෙහි නුවණින් යුතු **පඤ්ඤවා**, පුරුදු කරන ලද උසස් හැසිරීමෙන් ද, සිත එකඟ කිරීමෙන්ද ලබන සමාධියෙන්ද ඉරියව් මනාව හික්මවා ගැනීමෙන් අවම මගපල වලින්ද **සුසමාහිතො** තිලකුණු වඩන විදසුන් මගින් නොවෙනස් **අජ්ඣත්ත චින්තන සීලො** සීලයෙන් යුතුව නොපසුබස්නා උත්සාහයෙන් පමා නොවූ සති සිහියෙන්, ඒ මහණ අරහත් මගෙන් මෙම **දුත්තරං ඔඝං** මුළුමනින්ම දුෂ්කර වූ චතුරෝඝය තරති, තරණය කෙරෙයි මෙම ගාථාවෙහි සීල සම්පදා යටතේ අධි සීලයෙහි හික්මීමද, සති සමාධියෙහි අධි චිත්ත හික්මීමද **අජ්ඣත්ත චින්තී** නුවණින් අධිපඤ්ඤා යන තෙවැදෑරුම් හික්මීම උපකාර වන අයුරු හා එහි වැදගත්කම (ආනිසංස) පවසන ලදී. හික්මීමෙහි උපකාරයෙන් මෙලොව දිවියට අදාලව නුවණ ලබන කල මහණකමෙහි උතුම් පල ලැබීම එහි ආනිසංසයයි. මෙසේ පළමු ගාථාවෙන් රහත් පලය තෙක් කරුණු දක්වා රහත් පලය පිළිබඳව දෙවන ගාථාව වදාළහ. එහි තේරුම නම්, **විරතො කාම සඤ්ඤාය** යම්කිසි කාම හැඟීමක්

මුළුමනින්ම ඒ සියල්ල සිවුවෙන් මගෙන් (රහත්පල පත්ව) නැවත ඇතිවීමට ඉඩ නොතබා දුරු කරන ලදී. **විරතෙතා** යනුද පාඨයකි. එවිට කාමසඤ්ඤාය යනු ආධාර විබත්ය. සගාථක වගගයෙහි **කාමසඤ්ඤාසු** යයිද සඳහන්ය. රහත්පල ලැබීමෙන් සංයෝජන දහය ඉක්ම වූ බැවින් **සබ්බසංයොජනාතිගො,** සිවුවන මගපලය වූ, රහත් බව ලැබීමෙන්, රූපරාග ආදී උද්ධම්භාගිය සියළු සංයොජන හෙවත් සසර බැඳ තබන බැම් ඉක්මවීය. ඒ ඒ භවවල ඉපදීමට ඇළුම් කරන, තණ්හාව යයි කියන ලද ආසාව කාම ආදී තුන් භවයෙහිම දුරු කරන ලද බැවින් **නන්දිභව පරික්ඛීණෙ සො** එබඳු කෙලෙස් නැසූ මහණ ගම්භීරෙ සංසාර සාගරයෙහි න සීදති තණ්හා ආසා නොමැති බැවින් නැවත නූපදනා ලෙස නිවන් පලය හා බැඳී උතුම් සැනසීමට පැමිණේ.

ඉක්බිති හේමවත සහායකද යක් පිරිස දෙසද බලා, සතුටු සොම්නසින්, ගම්භීර පඤ්ඤං ආදී ගාථාවලින් භාග්‍යවතුන් වහන්සේට තුති පුදකොට, සියළු පිරිස හා සහායකද සමග වැඳ පැදකුණු කොට තමන් වසන තැනට ගියේය. ඒ ගාථාවල තේරුම් දැක්වීමයි මේ, **ගම්භීර පඤ්ඤං** ගැඹුරු නුවණින් යුතු, එය පටිසම්භිදාවෙහි කී පරිදි දතයුතුය. 'රූපාදී සමූහ පසෙහි දැනුම ගැඹුරින් පවතින නිසා ගම්භීර පඤ්ඤා නම් වේ' යැයි 'ගම්භීරෙසු ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීර පඤ්ඤා' දක්වා ඇත. **නිපුණත්ථ දස්සිං** කැත් කුල ආදී වියත් පඬිවරුන් විසින් මනාව පිළියෙල කොට ඉදිරිපත් කරන ලද ගැටළු පැනවල තේරුම් දකින හෝ, එසේ තේරුම් හෝ වියත් බව දනවන කරුණු අන් හැම කෙනෙකුම නොදන්නා නමුදු, ඒවා විමසනවිටම උන්වහන්සේට අරුත මනාව වැටහේ. රාගාදී (කෙලෙස්) කිසිවක් නොමැති බැවින් **අකිඤ්චනං,** දෙයාකාර වූ කාමයෙහිද තුන් භවයෙහි නොඇලෙන බැවින් **කාමභවෙ අසත්තං** රූප ආදී සමූහ පසෙහි සියළු අරමුණුවල ඡන්දරාගයෙන් නොබැඳුණු හෙයින් **සබ්බධී විප්පමුත්තං දිබ්බෙ පථෙ කමමානං** සමවත් අටෙහි වෙනස්කම් අනුව, දෙව් ලෝ මගෙහිද සමවදනා අයුරින් සක්මනෙහි යෙදෙනවිට, භාග්‍යවතුන් වහන්සේ එසේ සක්මන් කරන්නේ නම් (සමවත්ලාභී) වෙනත් කිසිම කෙනෙක් ඒ කාලය තුල එසේ නොකරති. එතකුදු වුවත්, පෙර සක්මනෙහි යෙදීමෙන්, එහි යහපත් බවින් ලද මනා පුහුණු බව ගැන හෝ මෙසේ විමසයි. නැතහොත් (අපිරිසිදු කෙලෙස් වලින් තොරවීමෙන්) සුපිරිසිදු දෙවියන් බවට පත්, හෙවත් 'විසුද්ධි දෙව' වූ රහත් පල ලැබුවෝ වෙති. එහෙයින් උන්වහන්සේලාගේ දිව් පැවතුම්

මගෙහි සන්හුන් විහරණ පිළිවෙල පරිදි සක්මනෙහි යෙදීම ගැන ද කියන ලදී. උදාර ගුණ සෙවීමෙහි **මහෙසිං**, දෙවන ගාථාවෙන් වෙනත් ලෙසකින් තුති පිදීම අරඹමින් නැවත **නිපුණත්‍ථදස්සී** යැයි කීම වරදක් නොවේ. නැතහොත් උසස් අදහස් පෙන්වා දෙතියි අරුතයි. **පඤ්ඤාදදං** නුවණ ලැබීම පිණිස පවත්නා පිළිවෙත පහදා දීමෙන් එයට දායකවීමයි. **කාමාලයෙ අසත්තං** තණ්හා දිට්ඨි ලෙස මේ දෙයාකාර වූ ඇලීමක් වේද, එහි නොඇලෙන බවයි. සබ්බවිදූ දතයුතු සියළුම කරුණු දන්නා, සබ්බඤ්ඤූ යනුද මීට නමකි. සුමෙධං ඒ සියල්ල දන්නා බවට පදනම් වන මග ලෙස, පාරමී හෙවත් පුරන ලද නුවණ වූ, ඉතා තියුණු විදසුන් නුවණින් යුතු, **අරියෙ පථෙ** අටැඟි මගෙහි පල සමවත හෝ, **කමමානං** තදින් මුල්බැස ගත් නුවණම ඇති, සෝවාන් ආදී මගලකුණු දැක, දේසනයෙන් හෝ ඊට පිවිසවනු කැමති හෝ, මොහොතක් මොහොතක් පාසා පල සමවතට සමවදිමින්, භාවනාදියෙහි නිරතව සිවුආකාර වූ මගෙහි සුදුසු අයුරින් යෙදීම හෝ, **සුදිට්ඨං වත නො අජ්ජ** අද අප විසින් යහපත දකින ලදී, හෝ අද අපට සොඳුරු දැක්මකි. දැකීම යන අදහසයි. **සුප්පභාතං සුහුට්ඨිතං** උදෑසන කලින්ම යහනින් පිබිදීමේදී අද අපට සුන්දර උදෑසනක් හෝ, මනරම් උදය කාලයක් හෝ විය. අද අපගේ සොඳුරු පිබිදීමකි, ඒ කුමක් හෙයින්ද? **යං අද්දසාම සම්බුද්ධං** සම්මා සම්බුදුරජාණන් වහන්සේ දකින්නෙමු'යි තමන්ට ලැබෙන ජීවන සැනසුම පහසුව සළකා සතුට දනවයි. **ඉද්ධිමන්තා** කරන ලද යහපත් කටයුතුවලින් එහි විපාක ලෙසින් ලද ඉද්ධි බලයෙන් යුතු, **යසස්සිනො** (පුද සත්කාර) ලැබීම සහ පිරිවර සහිත වූ, **සරණං යන්ති** කුමන මගකින් ගියද, සෝවාන් බව පැහැදිලි කිරීමටත්, පැහැදීම - සතුට දැක්වීමටත් වචනයෙන් සඳහන් කරයි. **ගාමා ගාමං** දෙවියන්ගේ ගම්වලින් දෙවියන්ගේ ගම්වලට, **නගා නගං** දෙවියන් වෙසෙන උස් ගිරිකුළු වෙතින් දෙවියන් වෙසෙන උස් තැන්, හිරි කුළු වෙතට, **නමස්සමානා සම්බුද්ධං ධම්මස්සච සුධම්මතං** නිසැකවම ඒ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් නිසැකවම මැනවින් දහම පවසන ලදැයි ආදී ලෙසින් බුදුරජාණන් වහන්සේගේ සියල්ල අවබෝධයෙන් දන්නා ලද බවත්, දහමෙහි යහපත් ගැළපීමත්, සාවක පිරිස මනා පිළිවෙත් ගරුක යැයි ඒ පිළිවෙත අගය කොට, පසසා නමස්කාර කරමින් දහම් පණිවුඩය පතුරුවන දූතයන් වෙමු. විචරිස්සාම යනුවෙන් කියන ලදී. ඉතිරි කරුණු පැහැදිලි කර ඇති පරිදිය.

**හේමවත සූත්‍ර විස්තරය නිමි.**

# 1.10

එවං මෙ සුතං ආලවක සූත්‍රයයි. එම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? අරුත් විවරණය කරමින්ම, ඊට මූලික වූ නිදාන කතාවද දැක්වෙයි. අරුත් විවරණයෙහිදී **එවමෙම සුතං එකං සමයං** භගවා එය සඳහන් කොට ඇත. ආලවියං **විහරති ආලවකසස යකඛසස** භවනෙ මෙහි ආලවිය නම් කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ කුමන කරුණක් නිසා ඒ යකුගේ මැඳුරෙහි වැඩසිටි සේක්ද? මේ පිළිබඳව සඳහන් කළ යුතුයි. ආලවී යැයි ඒ රටටද, නගරයටද කියනු ලැබේ. මෙහිදී රටත්, නගරයත් යන දෙකම සැළකිය හැකිය. අලවි නගරය ආසන්නව වැඩ සිටියද, 'අලවි නුවර වැඩවසති'යි කියනු ලැබේ. ඒ නගරය ආසන්නව ගවුවක පමණ දුරින් ඒ මැදුර පිහිටියේය. අලවි රටෙහි වැඩසිටියද, ආලවියෙහි වැඩවසතියි කියනු ලබන්නේ අලවි යකුගේ මැදුරද එහි පිහිටි බැවිනි.

අලවි රජු, නොයෙක් කෙළි නළු වින්දන ඉවතලා, සොර බිය වළකා ගැනීමටත්, සතුරු රජවරුන්ගෙන් වන කරදරවලින් බේරීමටත්, දින සතකට වරක් මුව කෙළියට යද්දී, 'යම් කෙනෙකු අසළින් මුවකු පලාගියහොත්, ඌ අල්වා ගැනීම ඔහුට භාර යැයි' එක් දවසක් බලසෙන් හා කතිකාවක් කළේය. එක්වරෙක රජු අසළින් මුවකු ඉවතට දිව්වේය. වේගයෙන් දිවීමට හැකි රජු, දුනු හී ගෙන, ඒ මුවා තුන් යොදුනක්ම ලුහුබැඳ ගියේය. 'එණි' මුවෝ තුන් යොදුනක වේගයෙන් දුවති. (ඒ දුර දිවගිය) මුවා දිවීම අවසන් කොට දියට බැස සිටිනු දුටු රජු, (තමාට) මස් අවැසි නැතත්, 'මුවා අල්ලා ගැනීමට නොහැකි වීය' යන අපවාදයෙන් මිදීමට, ඌට වද දී, දෙකට කොට, කදක් බැඳගෙන එද්දී, නගරයට නුදුරු, අතුපතර විහිදි බොහෝ කොළ සහිත මහ නුග රුකක් දැක, වෙහෙස දුරු කිරීමට එහි සෙවනට ආවේය. ඒ නුග රුකෙහි ආලවක යකු (ඔහුගේ) මහ රජුගෙන් වරයක් ලැබ, මැදියම් කල එහි සෙවනැති තැනකට පිවිසි මිනිසුන් මරා කමින් වාසය කරයි. අලවි යකු රජු දැක, කෑමේ අදහසින් එතැනට ආවේය. 'මා නිදහස් කරන්න, මම ඔබට දිනපතාම මිනිසෙකුද, බත් තලියක්ද එවන්නෙමි'යි රජු* යකු හා කතිකා

* බුරුම අකුරින් ඇති සුත්තනිපාත අටුවාවේ මේ අදහස දැක්වෙන බව හේ.වි. සංස්කරණය සඳහන් කරයි. (රජු) 'දෙකඩ කොට ඇති මුවා දී තමන් නිදහස් වීමට කැමති විය. 'ඔබ මා අතට පත් වූ වේලෙහි පටන් මුවා ද මට අයිති නොවේද? එබැවින් මුවා දී ඔබ කෙසේ නිදහස් වෙහිදැයි' කී යකු රජු මුදා නොහළේය.

කළේය. අලව් යකාද, 'රජෙකු ලෙස ඔබට ඇති කටයුතු අනුව එය පමා වී අමතක විය හැකියි. මම, මගේ වසන තැනට නොපැමිණීමෙන්ම අනුමැතිය නොලද මිනිසුන් මරා කෑමට නොලබමි. මම ඔබතුමන් නිදහස් කරන්නෙම් නම්, (අද) මා ජීවත්වන්නේ කෙසේද? (එහෙයින්) නිදහස් නොකරන' බව කීය. 'මිනිසකු නොඑවූ දිනක් වේනම් එදින මා අල්ලාගෙන කව'යි තමාම අනුමැතිය දී යකුගෙන් මිදී නගරයට දෙසට ගියේය. මග කඳවුරු ලා සිටි බලසෙනග රජු දැක, 'කුමක්ද? අපවාදයට බය වී මෙතරම් වෙහෙස වූයෙහි'දැයි කියමින් පෙරගමන් කොට රජු පිළිගත්තේය. රජු ඒ තොරතුරු නොපවසා, නගරයට ගොස්, උදේ ආහාර ගෙන, නගරයෙහි රැකවල්කරුට එය සැළකළේය. 'දේවයනි කාලවේලාවක් නියමකොට කීවෙහිදැ'යි ඔහු ඇසීය. 'දරුව, එසේ නොකළෙමි.' 'දේවයන් වහන්ස, නොමනා දෙයක් කර ඇත. නොමිනිසුන් වෙන් කරන ලද දෙයම ලබති. එසේ වෙන්කොට දී නැති බැවින් ජනපදයට හිරිහැර වන්නේය. කම් නැත දේවයන් වහන්ස' (යකු) එසේ කළද, ඒ ගැන කලබල නොවී ඔබතුමන් රජසුව විඳිනු මැනව. මම එයට කළයුතු දේ කරමි'යි කීය. ඔහු උදෑසනම සිරගෙට ගොස්, (නිදහසේ) ජීවත්වීමට කැමති කෙනෙකු වෙත්නම්, පිටව යේවා'යි වරදකරුවන්ට කියයි. එවිට, පළමුව නික්මෙන තැනැත්තා තම ගෙදරට කැඳවාගෙන ගොස්, නාවා, අනුභව කරවා, 'මේ බත් තලිය යකුට දෙව'යි ඔහු පිටත්කර යවයි. ඔහු නුගරුක වෙත පැමිණිවිටම යකු අල කැබැල්ලක් සේ කයි. යකුගේ බලයෙන්, හිසකෙස්වල පටන් මුළු මිනිස් සිරුරම වෙඬරු පිඬක් මෙන් වෙයි. යකුට බත් ගෙනගිය මිනිස්සු ඒ දැක බියව ඒ බව යහළුවකුට සැළකළහ. 'එතැන් පටන් රජු, සොරුන් ගෙන ගොස් යකුට දෙති'යි මිනිස්සුද සොරකමින් වැළකුණහ. මේ නිසා ටික කලකින් (අළුත) සොරකම් කරන්නන් නොමැති වීමෙන්ද කලින් සිටි සොරුන් නොමැති වීමෙන් සිරගෙවල්ද හිස්විය. නගර රැකවල්කරු ඒ බව රජුට දැන්වීය. රජු තම ධනය නගරයෙහි වීදිවල විසිකෙරුවිවේද කිසිවෙකු හෝ ඊට ආසාවෙන් ගනීවි යැයි සිතාය. කිසිම කෙනෙකු එය පාදයවත් තැවරුවේ නැත. රජු සොරුන් නොමැති බව ඇමතිවරුන්ට දැන්වීය. සොබාවයෙන්ම (වයස්ගතව) මරණයට ළංව ඇති නිසා එක් එක් මහළු තැනැත්තකු පවුල් පවුල් පිළිවෙලකට අනුව යවමු'යි ඇමතිවරු කීහ. 'අපගේ පියා, අපගේ සීයා යවන්නේ'යැයි මිනිසුන් තමා කෙරෙහි තරහ අමනාප වෙති'යි රජු එයට නොකැමතිව වැළැක්වීය. එසේනම් දේවයන් වහන්ස, උඩුකුරුව සිටින ළදරුවකු යවමු, එවැන්නකුට මගේ මවය, මගේ පියා යැයි

සෙනහසක් නැතැ'යි කීහ. රජු එය අනුමත කළේය. ඔවුහු එසේ කළහ. නගරයෙහි ළදරුවන් සිටින මවුවරු ඒ ළදරුවන් සමගද, ගැබිණියෝද වෙනත් ජනපදයකට පලාගොස්, දරුවන් ඇතිදැඩි කොට, ආපසු රැගෙන එති. මේ සියල්ලටම දොළොස් වසරක් ගතවිය. එක් දිනක් මුළු නුවරම සොයා බැලුවත් එකදු ළදරුවකු හෝ නොලැබ, 'දේවයන් වහන්ස, ඇතොවුරෙහි ඔබතුමාගේ පුතු, ආලවක කුමරා හැර, නුවර වෙනත් ළදරුවකු නම් නැතැ'යි පැවසූහ. 'මපුතු මුළු ලෝකයාට පිය වුවත්, තමන්ට තමා තරම් කැමති වෙනත් කෙනෙකු නැත, යව, කුමරු (යකුට) දී මගේ ජීවිතය රැකගනුව'යි රජු කීය. ඒ වේලාවෙහි අලව් කුමරුගේ මව, පුතු නහවා, අලංකාර කොට, දුහුල් සළුවෙන් සැකසූ කොට්ටයක තබා ඇකයෙහි හොවා නිදි කරවමින් සිටියාය. රජ අණ ලද භටයෝ එහි ගොස්, ඇයත්, සොළොස් දහසක් දේවියන් සහ කිරි මවුන් විලාප නගද්දීම 'හෙට යකුට ආහාර වන්නේ'යැයි දරුවා ගෙන ගියහ. එදවස භාග්‍යවතුන් වහන්සේ, අළුයම් වේලෙහි පිබිද ජේතවන මහ වෙහෙරෙහි සුවඳ කිළියෙහි මහා කරුණා සමවතට සමවැද නැවත බුදුඇසින් ලොව බලන සේක්, අලව් කුමරුට අනාගාමි බවට පත්වීමට හේතුසම්පත් ඇති බවත්, යකු සෝවාන් පලයට පත්වන බවත්, දේශනාව අවසන අසූහාරදහසක් ජීවීන්ට දහම් ඇස ලබන බවත් දුටහ. එහෙයින් රැය පහන් වූ කල, පෙරබත් කිස කොට, පසුබත් කිස අවසන් නොවෙද්දීම, අමාවක පෝ දින හිරු අවරට යද්දී, පා සිවුරු ගෙන, තනිවම පාගමනින්ම සැවැත් නුවරින් තිස්යොදුන් මග ගෙවා ඒ අලව් යකුගේ විමනෙහි වැඩ සිටිති.

භාග්‍යවතුන් වහන්සේ, ආලවකගේ විමන නුග රුකෙහි වී නම්, ඒ ගස මුල වැඩ සිටිසේක්ද, නැතිනම් විමනෙහිදැයි ඇසිය හැකිය. එයට කිවයුත්තේ විමනෙහිම වැඩසිටි බවයි. යකුන් තම විමන දකින්නා සේ භාග්‍යවතුන් වහන්සේද එසේමය. බුදුහු එහි ගොස් විමන් දොරටුවෙහි සිටියහ. එකල්හි ආලවක හිමවතෙහි යකුන්ගේ රැස්වීමකට ගොස් තිබුණි. එහිදී ආලවක යකුගේ ගදභ නම් දොරටුපල්ලා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, වැඳ, හිමි, අකාලයෙහි පැමිණි සේක්දැ'යි ඇසීය. 'එසේය ගදභ, පැමිණියෙමි. ඔබට අපහසුවක් නොවේනම්, ආලවකගේ විමනෙහි එක් රැයක් වසමි'යි කීහ. 'මට අපහසුවක් නොවේ. එසේ වුවත් ඒ යකු රළු, නපුරු මව්පියන්ටද මැනවින් වැඳීම් ආදිය නොකරන්නෙකි. භාග්‍යවතුන් වහන්සේට මෙහි වාසය කැමති නොවේනම් (මැනව)යි කීය. 'ගදභ, ආලවක නපුරු, රළු බව දනිමි. මට කිසිදු අනතුරක්

නොවන්නේය. ඔබට අපහසුවක් නොවේ නම්, එක රැයක් වසන්නෙමි'යි වදාළහ. 'හිමියනි, ආලවක යකු ගින්නෙන් රත්වූ කබලක් මෙනි. මව්පියන් හෝ, මහණ බමුණන් හෝ ගුණදහමක් හෝ නොසළකයි. නොදනී. මෙහි පැමිණිවුන්ගේ සිත් වියරු බවට පමුණුවයි. හදවතද පලුදු කරයි. පාදයෙන් අල්ලා මුහුදෙන් එතෙරට හෝ සක්වළින් එතරට හෝ විසිකරයි. 'දෙවන වරට ගද්‍රභ යකු භාග්‍යවතුන් වහන්සේට පැවසීය. 'දනිමි, ගද්‍රභ, ඔබට අපහසුවක් නොවේනම්, එක රැයක් වසමි'යි දෙවන වර භාග්‍යවතුන් වහන්සේ වදාළහ. 'හිමියනි, මට අපහසුවක් නම් නොවේ. එහෙත්, ඒ යකු, ඔහුට නොදන්වා (මා ඔබවහන්සේට) අවසර දුනහොත්, මගේ දිවි තොර කරන්නේය, හිමියනි, ඔහුට දැනුම් දෙමි'යි කීය. 'ගද්‍රභ ඔබට පහසු වේනම් දන්වව'යි කීහ. 'එසේනම් හිමියනි, ඔබවහන්සේම දැනගනු මැනවැ'යි භාග්‍යවතුන් වහන්සේට වැඳ හිමවත දෙසට ගියේය. විමන් දොරටුවද විවරව උන්වහන්සේට ඉඩ ලබාදුනි. යහපත් යැයි සම්මත වෙන් වූ දිනවල ආලවක යම්තැනක හිඳ පරිසර සිරියෙන් උද්දාම වේද, බුදුරජාණන් වහන්සේද විමන තුලට පිවිස, යකුගේ ඒ දිවරුවන් අසුන්හි හිඳ රන්පැහැ ආලෝකයක් මුදාහළහ. ඒ දුටු යකුගේ කාන්තාවෝ අවුත්, වැඳ පිරිවරා හිඳගත්හ. භාග්‍යවතුන් වහන්සේ 'ඔබ හැම පෙර දන් දී සිල් සමාදන්ව, පිදිය යුත්තන් පුදා, මෙබඳු සැපතට පත්වූවෙහුය, දැනුදු එසේ කටයුතු කරව, එකිනෙකා කෙරෙහි ඉසිමසුරු බවින් පෙළී නොවසව, ආදී ලෙසින් නොයෙක් කරුණු ඇතුළත්ව දහම් කතාවක් කළහ. කාන්තාවෝ භාග්‍යවතුන් වහන්සේගේ මිහිරි කටහඬ අසා සාධුකාර දහසක් දී උන්වහන්සේ පිරිවරාම හුන්හ. ගද්‍රභ ද හිමවතට ගොස්, 'සිරිමතුනි, ඔබතුමන්ගේ විමනෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින බව දැනගන්නේ නම්, මැනවැයි ආලවකට දැනුම් දුනි. 'නිහඬ වෙව, ගොස්, කළයුතු දේ කරන්නෙමි'යි ආලවක ගද්‍රභට සන් කළේය. (තමාද) පිරිමියෙකු යන උඩඟුකමින් ලජ්ජාවට පත්විය. එහෙයින් පිරිස මැද කිසිවෙකුට නොඇසෙන සේ වැළැක්වීය.

එකල්හි සාතාගිර හා හේමවත ජේතවනාරාමයෙහිදීම භාග්‍යවතුන් වහන්සේ වැඳ 'යකුන්ගේ සමුළුවට යන්නෙමු'යි පිරිවර සහිතව, නොයෙක් යානාවලින් අහසින් යති. අහසෙහිදී යකුන්ට හැමතැනකම ගමන් මග නොවේ. අහසින් විමන්වලින් ගමන් කිරීමෙන්ම ඒ ගමන්මග සැකසේ. පොළවෙහි පිහිටි ආලවක විමන, පවුරින් වටවූ, මැනවින් රැකවල් යෙදූ, මැනවින් සකසන ලද දොරටු අටලු හෙවත්, මුරගෙවල් හා දොරකොටුද

මුදුනෙහි රන්දැලින් වැසුනු, පෙට්ටියක් බඳු තුන් යොදුනක් උස්ය. එයට ඉහළින් යාමට තිබුණත් සාතාගිර හේමවතට ඒ පෙදෙස ඉක්මවා යාමට නොහැකි විය. බුදුවරුන් වැඩහිඳිනා තැනක, ඊට ඉහළින් භව කෙළවර දක්වා යාමට හැකියාවක් නැත. ඔවුහු මේ කිමෙක්දැයි විමසා බලනවිට, භාග්‍යවතුන් වහන්සේ දැක, අහසෙහි දැමූ කැටකැබලිත්තක් සේ, එහි බැස, වැඳ, දහම් අසා, පැදකුණු කොට, හිමියනි, යකුන්ගේ රැස්වීමට යමු'යි පවසා තෙරුවනට පැසසුම්කොට ගියහ. ආලවක ඔවුන් දැක, 'මෙහි හිඳුව'යි ඉවත්ව ඉඩ ලබාදුන්නේය. 'ආලවකයනි, ඔබට මහත් වාසනාවකි, ඔබගේ විමනෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ වසති. ඇවැත්නි, උන්වහන්සේ ඇසුරු කරව'යි දැන්වූහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විමනෙහිම විසූහ. ආලවකගේ විමන පිහිටි නුගයෙහි මුල නොවේ. **එකං සමයං භගවා ආලවියං විහරති ආලවකසස යකඛසස භවනෙ** යැයි එහෙයින් කියන ලදී.

**අථ ඛො ආලවකො -පෙ- එතදවොච : නිකඛම සමණ** යැයි කුමක් නිසා මෙසේ කීවේද? නපුරු බව පෙන්වීමට යැයි කියනු ලැබේ. එහි මුල පටන් කරුණු දතයුතුය. යම් ලෙසකින්, සැදැහැ නැති කෙනෙකුට සැදැහැව පිළිබඳ කතා නපුරු-නුසුදුසු කතා ලෙස හැඟේද, දුසිල් තැනැත්තාට සීලාදි කතා නපුරු-නුසුදුසු වේද, එපරිදිම ඒ යකුන් පිරිස හමුවෙහි භාග්‍යවතුන් වහන්සේට කියන ලද පැසසුම් අසත්ම, ගින්නෙහි දමන ලද ලුණු කැටයක් මෙන්, හදතුල ඇවිලෙන කෝපයෙන් වෙවුලන ගැහෙන හදින් යුතුවම, 'මාගේ විමනට පිවිස ඇතැයි කියන ඒ 'භගවත්' යැයි කියන්නේ කවුදැ'යි ඇසීය. 'ඇවැත්නි, අපගේ නායකයාණන් වූ භාග්‍යවතුන් වහන්සේ ගැන ඔබ නොදන්නෙහිද? තුසිත භවනයෙහි සිට පස්මහ බැලීමේ පටන්, පිළිසිඳ ගැනීම් ආදී සිදුවීම්වලදී පහළ වූ දෙතිසක් පෙරනිමිති ගැන හා දම්සක් පැවැත්වීම තෙක් පවසා, 'ඇවැත්නි, ඔබ මේ පුදුම අසිරිය නුදුටුවෙහිදැ'යි දොස් නැගූහ. ආලවක ඒ අසිරිය දැක තිබුණද කෝපය නිසා නොදුටු බව කීය. 'ඇවැත්නි, ආලවක දුටුවෙහි හෝ නොදුටුවෙහි හෝ දැක්කත්, නොදැක්කත් ඔබට ඇති පලය කිම? අපට මගපෙන්වන, අපගේ නායකයාණන්ට ඔබ කුමක් කරන්නෙහිද? එතුමාණන් හා සමකරන විට, ඔබනම්, සෙලවෙන මොල්ලියක් ඇති මහා ගොනකු ළඟ එදින උපන් වසුපැටවෙකු මෙනි. තුන් පොළකින් මද වැගිරෙන මත් ඇතකු ළඟ කුඩා කුකුළු පැටවකු මෙනි. බබළමින්, පහළට වැටෙන කෙසරුවලින් ගැවසුණු මනරම් සිරුරැති සිහරදකු ළඟ කැණහිලකු

මෙනි. යොදුන් එකසිය පණහක් වට සිරුරැති ගුරුළු රදකු ළඟ පියාපත් සිඳුණු කුරුළු පැටවකු මෙන් වැටහෙයි. යව, ඔබට කළහැකි දෙයක් ඇතොත් කරව'යි කීය. මෙසේ කී විට කිපුණු ආලවක, නැගිට හිරියල් තලයෙහි වම්පයින් සිට, 'බලව, දැන් මහත් ආනුභාවය-බලය ඇත්තේ, ඔබලාගේ නායකයාණන්ගේ ද, මගේදැයි' කියා දකුණු පයින් සැටයොදුනක් වූ කෙලාස පව්මුදුන පෑගිය. යකඩ උලකින් ගසන ලද, රත්කොට පිරිසිදු යකඩ පිඩුවක් මෙන් එයින් පතුරු ගිලිහිණ. ඔහු එහි සිට 'මම ආලවක වෙමි'යි මහ හඬ නැගීය. මුළු දඹදිවෙහිම ඒ හඬ පැතිරිණ. මුළු දඹදිවම පතළ හඬ සතරකි. පුණ්ණක යක් සෙන්පති, කුරුරට ධනංජය රජු දූ කෙළියෙන් පරදවා අත්පොළසන් දී 'මම දිනුවෙමි' හඬ නැගීමද, සක්දෙවිඳු, කසුප් බුදුරදුන්ගේ සසුන පිරිහෙනවිට, විස්කම් දෙව්පුතු බල්ලකු බවට පත්කොට, 'දුසිල් මහණුන්ද, දුසිල් මෙහෙණන්ද දුසිල් උපාසක උපාසිකාවන්ද අයහපත් කටයුතුවල යෙදෙන සියල්ලන්ද (උෟ ලවා) සපා කවමි'යි හඬ නැගීමද, කුස ජාතකයෙහි (සඳහන් පරිදි) පබාවතිය නිසා රජුන් සත්දෙනා නගරය වැටලූ කල, පබාවතිය හා තමන් ඇතුපිට නැගී, නගරයෙන් නික්ම, 'මම සිහනද ඇති කුස මහ රජවෙමි'යි මහබෝසත් හඬ නැගීමද, කෙලාස පවු මුදුන්හි සිට 'ආලවක' යැයි හඬ නැගීමද (මුළු දඹදිවම ඇසූ හඬ හතරය) ආලවකගේ ඒ හඬ මුළු දඹදිව ගෙයක් ගෙයක් පාසා සිට නැගූ හඬක් මෙන් විය. යොදුන් තුන්දහසක් පළල හිමාලයද යකුගේ තෙදබලයෙන් තදින් කම්පා විය. 'මෙයින්ම සමණයා පලවා හරින්නෙමි'යි ආලවක මහා වාතයෙන් කැළඹුණු කුණාටුවක් (වාසුළි) නැංවීය. ඒ සුළි සුළඟ නැගෙනහිර ආදී දිසාවෙන් පැන නැගී, අඩ යොදුනක්, යොදුන් දෙකක්, තුනක් පමණ මහ ගල්කුළු පලා කැලෑවේ මහා ගස් පඳුරු ආදිය මුලින් උදුරා, අලව් නුවර සිසාරමින්, අබලන් වූ ඇත්හල් ආදිය සුණුවිසුණු කරමින්, වහලවල් හා ගඩොල්ද අහසෙහි පාවී කැරකී යනවිට, භාග්‍යවතුන් වහන්සේ 'කිසිවකුටත් හිරිහැරයක් නොවේවා'යි අදිටන් කළහ. ඒ සුළඟට දසබලධාරී බුදුරදුන්ගේ සිවුරු කොනකුදු සෙලවීමට නොහැකි විය. ඉක්බිති 'දියෙහි ගිල්වා මහණ මරන්නෙමි'යි මහා වැස්සක් ඇතිකර වීය. යකුගේ බලයෙන් සියදහස් ගණනින් වැහිවලා නැගෙමින් මහා වැසි වැස්සවීය. වැසි පතිතවන වේගයට පොළව හැරිණ. කැලෑවේ මහ ගස් මතුයෙහි සිසාරා මහ වැසි වැස්සත්, දසබලධාරී බුදුරදුන්ගේ සිවුරෙහි පිනිබිඳුවකුදු තරමට තෙමන්නට නොහැකි විය. ඊළඟට ගල් වැස්සක් ඇති කරලීය. මහත් මහත් ගිරිකුළු දුම් දමමින්, ඇවිළෙමින් අහසින් අවුත් දසබලධාරී බුදුරදුන් ළඟ දිවමල්

පොකුරු බවට පත්විය. ඊළඟට තදින් පහර වැදෙන පරිදි ආයුධ වැස්සක් ඇතිකරලීය. එක් පැත්තක් මුවහත් වූ, දෙපැත්තම මුවහත් වූ කඩු, සැත්, ඊතල ආදිය දුම් දමමින්, ඇවිලෙමින් අහසින් අවුත් දසබලධාරී බුදුරදුන් හමුවේ දිවමල් බවට පත්විය. ඊළඟට අඟුරු වැස්සක් නංවාලීය. එරබදු මල් පැහැ රත් වූ අඟුරු අහසින් අවුත් දසබලධාරී බුදුහිමි පාමුල දිවමල්ව විසිරිණ. ඉක්බිති උණු අළු වැස්සකි. ඉතා උණුසුම් උණුඅළු අහසින් අවුත්, දසබල බුදුහිමි පාමුල සඳුන් සුණුව පතිත වුණි. මීළඟට වැලි වැස්සකි. ඉතා සියුම් වැලි දුම් දමමින්, ඇවිලෙමින් අහසින් අවුත් දසබල බුදුහිමි පාමුල දිවමල් බවට පත්විය. මඩ වැස්සක් ඊළඟට නැංවීය. එය දුම් දමමින්, ඇවිලෙමින් අහසින් අවුත්, දසබල බුදුහිමි පාමුල දිවසුවඳ පතුරුවමින් පතිත විය. 'බිය ගන්වා මහණ පලවා හරින්නෙමි'යි ඊට පසු මහා අඳුරක් නැංවීය. එය සිවුආකාර වූ මහා අඳුරක් වුවත්, දසබල බුදුහිමි වෙත පැමිණ, හිරු රැසින් අඳුරු දුරු වන්නා සේම අතුරුදන් විය. මෙසේ ආලවක යකු සුළං, ගල්, ආයුධ, අඟුරු, උණුඅළු, වැලි, මඩ, අඳුර යන වැසි නවයකින්ද භාග්‍යවතුන් වහන්සේ පලවා හැරීමට නොහැකිව, නොයෙක් ආකාර වූ විසුළු පෙනුමෙන් යුතු භූතයන්ද පිරිවරා, සිවුරඟ සෙන් සමග තමාම එඩිතරව ඉදිරියට ගියේය. ඒ භූත පිරිස් නොයෙක් අයුරින් විසුළු පෙන්වමින්, 'අල්ලා ගනිවු, වනසවු' කියමින් භාග්‍යවතුන් වහන්සේ ඉහළින් පැමිණෙන්නාක් මෙන් විය. එහෙත් රත්කොට පිරිසිදු කරන ලද ලෝහ පිඬක මැස්සන් නොරඳන සේ, භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි ඇලීමට හෝ නොහැකි විය. (එදා) බෝමැඩදී මාරයා පැමිණිවිට මෙබඳු දේ නැවතුණද (දැන්) එසේ නොනැවතී, අඩ රැයක් මුළුල්ලේම අවුල් සහගත බවක් ඇතිවිය. මෙසේ අඩ රැයක් පුරාම නොයෙක් බිය දනවන දසුන්වලින්ද භාග්‍යවතුන් වහන්සේ තිගැස්සීමකට හෝ නොහැකිව, 'කිසි කෙනෙකුට ජයගත නොහැකි, චේලායුධය මුදාහරිම් නම් මැනවැ'යි ආලවක සිතුවේය. සක්දෙවිඳුගේ වජිරායුධය, වෙසසවණගේ ගදායුධය, යමගේ පාරා වළල්ල සහ ආලවකගේ චේලායුධය ලොව බලවත්ම ආයුධ සතරකි. සක්දෙව් කිපී වජිරායුධය මහමෙර මත ගැසුවොත් යොදුන් එක් ලක්ෂ සැටඅටදහසක් මහමෙර ගිලා බැස්සාක් මෙන් යට යන්නේය. මගපල ලැබීමට පෙර, වෙසසවණ මුදාහරින ලද ගදායුධය දහසකටත් වඩා බොහෝ යකුන්ගේ හිස් පලා, නැවත තමන් අතටම පැමිණ සිටියේය. යම කෝපයෙන් තම පාරා වළල්ල දෙස බැලූ පමණින්ම, කුම්භාණ්ඩයෝ දහස් ගණනින්, රත්වූ යකඩ තැටියක දැමූ තල ඇට මෙන් පිපිරී විනාශ වෙති. යම් හෙයකින්, ආලවක කිපී, චේලායුධය අහසට විසිකළහොත්,

දොළොස් වසරක් වැසි නොවසී. පොළවට විසිකළහොත්, සියළුම ගස්, තණ ආදිය වියළී දොළොස් වසරක් පුරා නැවත නොවැඩෙන්නේය. මුහුදට දමා ගසන්නේ නම්, රත්වූ යකඩ තැටියක දියබිඳු මෙන්, මුළු මුහුදු ජලයම වියළෙන්නේය. මහමෙර හා සමාන පව්වකට දමා ගසන්නේ නම්, එය සීසීකඩව විසිරෙන්නේය. ආලවක මෙබඳු බල ඇති චේලායුධය දමා ගසන්නට සූදානම්ව අතට ගත්තේය. බොහෝසෙයින්ම දසදහසක් ලෝධාතුවල දේවතාවෝ 'අද භාග්‍යවතුන් වහන්සේ ආලවක දමනය කරන්නාහ, එහිදී දහම් අසන්නෙමු'යි වහ වහා රැස්වූහ. යුද්ධය දැකීමට කැමති දේවතාවෝද රැස්වූහ. මෙසේ මුළු අහස් තලයම දේවතාවුන්ගෙන් පිරී ගියේය. ඉක්බිති ආලවක භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් එහා මෙහා ගොස් චේලායුධය දමා ගැසීය. එය හෙණ ගුළියක් මෙන්, බිය දනවන හඬක් නංවමින්, දුම් දමමින්, අහසෙහි ඇවිලෙමින් භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණ, යකුගේ උඩඟු බව මඩිනු පිණිස පාපිස්නා රෙදිකඩක්ව පාමුල වැටිණ. එය දුටු ආලවක, අං කැඩුණු ගොනෙකු මෙන්, දළ උදුරා දැමූ සපෙකු මෙන් තෙද සිඳුණු, බල රහිත, මානය නම් වූ කොඩිය පහත හෙළන ලදුව 'චෙලායුධයටද සමණයා මැඩපවත්වනු නොහැකි විය. එයට හේතු මොනවාදැයි සිතුවේය. ඊට කරුණු මේවාය. මහණ මෙත් සිතින් වාසය කරයි, එහෙයින් කෝප ගන්වා මෙත් බව ඉවත් කරමි'යි (සිතීය) මේ අනුව **අථ ඛො ආලවකො යක්ඛො යෙන භගවා -පෙ- නික්ඛම සමණ** යැයි කියන ලදී. එයින් අදහස් කරන ලද්දේ මෙයයි. 'කුමක් නිසා, මගේ අනුදැනුමෙන් තොරව, මගේ විමනට පිවිස, ගෙයි හිමිකරු සේ ගැහැණුන් වසන තැනට වී හුන්නෙහිද? නුඹුන් දෙයක් පරිහරණයත්, ගැහැණුන් හා එක්ව සිටීමත්, මහණකට සුදුසු වේද? ඔබේ මහණකම එසේනම්, නික්ම යව, මහණ, යැයි කීය. මෙබඳු වෙනත් නපුරු වචන කියා, මේ ලෙසද කීවේ යැයි ඇතැමෙක් පවසති.

එවිට භාග්‍යවතුන් වහන්සේ, කෝපයෙන් පිරුණු තැනැත්තකු කෝපවීමෙන් හික්මවිය නොහැකිය, පෙරළා ඔහු කෙරෙහි කෝපවීම, නපුරු බල්ලකුගේ නාසයෙහි පිත් (සෙම්) බිඳී, ඌ තවත් නපුරු වන්නාක් මෙනි. තද බවක් නොපෙන්වීමෙන් ඔහු හික්මවිය හැකි බව දැන, 'ඇවැත්නි, යහපතැ'යි කියා ඔහුගේ වචනය පිළිගෙන විමනින් නික්මුණහ. එහෙයින් **සාධාවුසොති භගවා නික්ඛමි** යැයි කියන ලදී. එවිට ආලවක, 'මේ මහණ ඒකාන්තයෙන්ම කීකරුය. එක වචනයෙන්ම නික්මුණේය. පන්නා දැමීමට පහසු මෙබඳු මහණකු නිකරුනේ මුළු රැයක්ම යුදකොට නෙරපීමට මම

උත්සාහ කළෙමි'යි මුදු සිත් ඇතිවුවත්, නැවත 'නික්මුනේ කීකරුකම නිසාද? නැතහොත් තරහෙන් නික්මුණේදැ'යි දැන් දැනගැනීමට නොහැකියි, විමසන්නෙම් නම් මැනවැ'යි **පවිස සමණ** යැයි කීවේය. ඉක්බිති, කීකරුව, මොළොක්ව සිත පවත්නා සැටි ඔහුට පැහැදිලි වනු පිණිස, නැවත පියවදන් කියමින්, **සාධාවුසොති භගවා පාවිසි** ආලවක නැවත නැවතත්, එලෙසටම කීකරු බව විමසමින් **දුතියම්පි තතියම්පි නික්ඛම පවිස** යැයි කීය. භාග්‍යවතුන් වහන්සේද එසේ කළහ. ආලවක කියන ලද පරිදි නොකළේ නම්, මුලසිටම තද දැඩි බවට පත් යකුගේ සිත වඩාත් දැඩි බවට පත්ව, දහම් කතාවට සුදුසු නොවනු ඇත. එහෙයින්, මවක පුතු හඬන විට කැමති දෙයක් දී හෝ කැමති දෙයක් කොට ඔහු සන්සුන් කරන්නීද, එසේම භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් නිසා හඬන යකු සන්සුන් කරන්නට ඔහු කී පරිදි කළහ. තනකිරි නොබොන ළදරුවකු යම් දෙයක් දී නලවා කිරිමව ඔහුට කිරි පොවන්නීද, එසේම භාග්‍යවතුන් වහන්සේ යකුට ලොවුතුරු දහම් කිරි පෙවීමට ඔහු පතන ලද වචනවලින් නලවමින් එසේ කටයුතු කළහ. ලබු කැටයක සිවු මිහිරි දේ (චතුමධුර) පුරවනු කැමති මිනිසෙක්, ලබු කැටයෙහි ඇතුලත සෝදා පිරිසිදු කරයිද, එසේම භාග්‍යවතුන් වහන්සේ යකුගේ සිතෙහි සිවු ලොව්තුරු මිහිරි දෑ පුරවනු කැමතිව, ඔහුගේ සිත්සතන් තුළ තරහ කිළුටු සෝදා හරින්නට, තුන්වරක් දක්වා නික්මුණහ. පිවිසුණහ. ඉක්බිති ආලවක, 'මේ මහණ කීකරුය. නික්ම යව'යි කී විට නික්මෙයි. පිවිසෙව'යි කී විට ඇතුළු වෙයි. මේ මහණ මුළු රැයම මෙසේ වෙහෙසට පත්කොට, පාවලින් අල්ලා ගඟෙන් එතරට දමන්නෙමි'යි පාපී සිත උපදවා සිවුවන වරටද **නික්ඛම සමණ** යැයි කීය. එය දැන භාග්‍යවතුන් වහන්සේ **නඛ්වාහනතං** යැයි කීහ. මෙසේ (යකු කී විට) එයටත් වඩා කළයුතු දෙයක් සළකමින්, (යකු) පැනයක් විමසිය යුතු යැයි සිතා අසන පැනය දහම් කතාවට මුල් වන්නේ යැයි දැන, **නකවාහනතං** යැයි කීහ.

එහි **න** යනු පිළිකෙව් කිරීමෙහි යොදා ඇත. **ඛො** තහවුරු කිරීමෙහි, **අහං** තමා නිදසුන් කරයි, **තං** යනු හේතු දනවන වචනයයි. 'එසේනම්, ඔබ (යම් කරුණක්) සිතුවෙහිද? එබැවින්, ඇවැත්නි, මම ,නික්ම නොයන්නෙමි, ඔබට කළහැකි දෙයක් කරනු' යැයි මෙසේ මෙහි තේරුම දතයුතුය. පෙර ඉදුබල ඇති තවුසන් පිරිවැජියන් අහසින් යද්දී (ආලවකගේ) විමන රනින් නිමවීද, නැතිනම් රිදියෙන්, මැණික්වලින් කර ඇත්දැයි, බැලීමට තම විමනට පැමිණි විට ආලවක ඔවුන්ගෙන් පැන විමසා, ඒවා

විසඳීමට නොහැකි තැන, ඔවුන්ගේ සිත් අවුල්කොට වෙහෙසට පත් කරයි. ඒ කෙසේද? නොමිනිස් වූ (භූතාදීන්) ලවා බියජනක රූ පෙන්වීමෙන් හෝ, හදවත පිරිමැදීමෙන් හෝ යන දෙයාකාරයෙන්ම සිත වියරු බවට පත් කරයි. ඉඳුබල ඇති යම් තැනැත්තකු බිය දනවන රූප දැක්මෙන් තැති නොගනිති'යි දැනගත් විට ආලවක තම ඉඳු බලයෙන් සියුම් ආත්මයක් මවා ඔවුන් තුලට පිවිස හදවත පිරිමදී. එයින් සිත් සතන් මනාව නොපවතී. එසේ සිත මනාව නොපවත්නා තැනැත්තෝ උමතු වෙති. මෙසේ විකල් සිත් ඇත්තවුන්ගේ ළයද පලයි. 'නැවත මාගේ විමනට නොපැමිණෙව'යි ඔවුන්ගේ පාදයෙන් අල්ලා ගඟෙන් එතරට විසිකර දමයි. එහෙයින් එම පැන සිහිකොට 'මේ මහණ, දැන් ඒ ගැන විමසා වෙහෙසට පත් කරමි'යි සිතා **පඤ්හං තං සමණ** ආදී ලෙසින් කීය. ආලවකට එම පැන ලැබුණේ කෙසේද? ඔහුගේ මවුපියෝ කසුප් බුදුරජාණන් වහන්සේ ඇසුරු කරද්දී, පැන අටක් විසඳන අයුරු උගත්හ. ඒවා තරුණ කල්හී ආලවකට පුරුදු කළහ. කල්ගතවත්ම ඔහුට එය අමතක විය. එහෙයින් 'මේ පැන හෝ වැනසී නොයේවා'යි රන් තහඩුවක රත්සිරියල්වලින් ලියවා විමනෙහි තැබීය. එහෙයින් එය බුදුවරුන්ටම වෙන්වූ, බුදුවරුන්ම විසඳිය යුතු වෙයි. භාග්‍යවතුන් වහන්සේ, ආලවකගේ කීම අසා, එය බුදුවරුන්ට ලැබෙන සිවුපසය ආදිය වැළකීම හෝ, ජීවිත අනතුරක් හෝ, සියල්ල දන්නා වූ නුවණෙහි ආලෝකයට ගැටීමක් හෝ තරහ බවක් හෝ කිසිවෙකුට කළ නොහැකි බැවින්, ලෝකයෙහි ඒ අසමසම බුදු බලය දක්වමින්, **න ඛ්වාහං තං ආවුසො පස්සාමි සදෙවකේ** ලොකෙ යැයි කීහ.

එහි **සදෙවක** යන වචනයෙන් පස්කම්සුව විඳින දේව සමූහය ආදී ලෙස, ඒ පදවලට කෙටියෙන් අරුත පමණක් දක්වමින් කියන ලදී. වචන සබඳතා ගලපමින් විස්තර නොදැක්වේ. ඒ පිළිබඳව (දැන්) මෙසේ සඳහන් කරනු ලැබේ. **සදෙවක** වචනයෙන් ඉතා උසස් ලෙස කොටස් කරනු ලබන සියළුම දෙවිවරුන් මෙහි නොගැනෙතත්, එහි රැස්වූ දේව සමූහයාට සැකයක් ඇතිවිය. සය වැදෑරුම් කාමාවචර දෙවියන්ද වසඟයට ගන්නා ලද, යහපතට අකුල් හෙලන, නපුරු දේ කරන මහබලැති මාරයාගේ සිතද වියවුලට පත් නොකෙරේදැ'යි ඔවුන්ගේ ඒ සැකය දුරුකරනු පිණිස **සමාරකෙ** යැයි කීහ. 'බ්‍රහ්මයා මහා බලවත්ය. එක ඇඟිල්ලකින් එක් සක්වළ දහසක් එළිය කරයි. (පිළිවෙළින්) ඇඟිලි දෙකකින්, ඇඟිලි දහයකින්

දස දහසක් සක්වළ එළිය කරයි. උතුම් දැහැන් සමවත් සුවය අත්විඳියි. ඔහුගේ සිතද වියවුල් බවට පත් නොකරයිද යන ඔවුන්ගේ සැකය දුරුකරනු පිණිස **සබ්‍රහ්මකෙ** යැයි කීහ. සාසනයෙහි දියුණුව දැකීමට අකමැති, ඊට සතුරුවන, මන්ත්‍ර ආදී බලයෙන් යුතු බොහෝ මහණ බමුණන් එබඳු දෙයක් නොරන්නාහුදැයි ඇතිවූ ඔවුන්ගේ සැකය දුරුකරනු පිණිස **සස්සමණ බ්‍රාහ්මණියා පජාය** යැයි කීහ. මෙසේ උසස් උසස් ලෙසින් කිසිවකුටත් එසේ විය නොහැකි බව පෙන්වා දැන් සදෙව මනුස්සාය යන වචනයෙන් දෙවියන් යැයි පිළිගෙන ඇති කොටස හැර ඉතිරි මිනිසුන්ද සළකා ඒ උසස් උසස් කොටස් අනුව, ඉතිරි ජීව ලෝකයෙහිද කිසිවකුටවත් සිදුවිය නොහැකි බව පැහැදිළි කළහයි මෙසේ මෙහි පද ගැලපීම් දතයුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ, අවහිර කරන්නට, බාධා කරන්නට යොමුව තිබූ ආලවකගේ සිත, පැන විමසීමෙහි උත්සාහවත් කරමින්, **අපි ච ත්වං ආවුසො, පුච්ඡ, යදාකංඛසි** යැයි කීහ. එහි තේරුම නම්, කැමති දෙයක් අසව, මට පැන විසඳීමෙහි අපහසුවක් නැත, ඒ සියල්ලම, පසේබුදු, අගසව්, මහරහත් සව්වන් කෙරෙහි නොපවත්නා, බුදුවරුන්ට පමණක් පවත්නා සියළු දෙයම දන්නා නුවණින් පතළ කරන්නෙමි'යි පෙන්වා දුන්හ. පසේ බුදුවරු ආදීහු 'ඇවැත්නි, (මගෙන්) විමසන්න, අසා පවසන්නෙමු'යි කියති, බුදුවරුනම්, 'ඇවැත්නි, දැනගැනීමට කැමති දෙයක් ඇතොත් විමසන්න'යැයි කියති.

'ඔබේ සිතට නැගෙන කැමති පැනයක්, වාසව, (සක්‍රය) මගෙන් විමසව, 'පුච්ඡ වාසව මං පඤ්හං යං කිඤ්චි මනසිච්ඡසි'

'බාවරීගේ හෝ ඔබේ හෝ සියල්ලන්ගේම හෝ සිතට නැගෙන කිසියම් කැමති සැක සහිත දෙයක් (මගෙන්) විමසව, එයට අවසර ලබා දී ඇත.

**බාවරිස්සච තුය්හං වා සබ්බෙසං සබ්බසංසයං**
**කතාවකාසා පුච්ඡවෙහා යං කිඤ්චි මනසිච්ඡථ**

මේ ආදී ලෙසින් දෙව් මිනිසුන්ට සියල්ල දන්නා බව තහවුරු කරමින් විමසීමට ඉඩ දෙති.

බුදුබවට පත් වූ භාග්‍යවතුන් වහන්සේ එසේ කරුණු විමසීමට ඉඩ ලබාදෙන ලෙසටම බෝසත් කල්හිද ඊට අදාළ නුවණ මෙහෙයවමින් (පැන විමසුමට අවසර දුනි) 'කොණ්ඩඤ්ඤය, ඒ ඉසිවරුන් ඉල්ලන පරිදි මැනවින් පැන විසඳව, නුවණැති කෙනෙකුට ඒ පැන ඉදිරිපත් කිරීම මිනිසුන් අතර ඇති සොබාවයයි.

කොණ්ඩඤ්ඤ පඤ්හානි වියාකරොහි
යාචන්ති තං ඉසයො සාධුරූපා
කොණ්ඩඤ්ඤ එසො මනුජෙසු ධම්මො
යං වද්ධ මා ගච්ඡති එස භාරො

මෙසේ ඉසිවරුන් විසින් පැන විසඳ දෙන ලෙස සරභංග බෝසත්ගෙන් ඉල්ලා සිටින ලදී.

මනසෙහි පැන නැගුණ, පිළිතුරු පතන කිසියම් පැන ඇතොත්, (විමසීමට) ඉඩ ලබා දී ඇති බැවින් විමසත්වා! මෙලොව මෙන්ම පරලොව ගැනද මම දැනගෙන, එය ඔබලාට පහදා දෙන්නෙමි'

කතාවකාසා පුච්ඡන්තු භොන්තො
යං කිඤ්චි පඤ්හං මනසාභිපත්ථිතං
අහං හි තං තං වො වියාකරිස්සං
ඤත්වා සයං ලොකමිමං පරඤ්ච

සමභව ජාතකයෙහි දැක්වෙන පරිදි, මුළු දඹදිවම තෙවරක් සැරිසරා, පැනවල කෙළවරක් නොදැක, (නිසි පිළිතුරක්) නොලැබ, වීදියෙහි වැලිකෙළියෙහි පසුවන, අවුරුදු හතක් වූ කුමරුවාගෙන් අසන ලද සුචිරත නම් බමුණාට 'මාගේ හැකියාව පරිදි ඔබට මම එය කියන්නෙමි. රජුද දන්නා අයුරු කිරීම හෝ නොකිරීම හෝ රජ අතම වේ'

තග්ඝ තෙ අහමක්ඛිස්සං යථාපි කුසලො තථා
රාජාච බො නං ජානාති යදි කාහති වා නවා

මෙසේ (බෝසත් කලද) සියල්ල දන්නා බව තහවුරු කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සියල්ල දන්නා නුවණ මෙහෙයා ආලවකට පැන විමසීමට

ඉඩ දුන් විට අථ ඛො ආලවකො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි: **කිංසූධ විත්තං** යැයි කීය.

(ආලවක කී) ඒ ගාථාවෙහි **කිං** යනු විමසීම හඟවන වචනයයි. **සූ** යනු පද පිරවීමට යොදන නිපාතයකි. **ඉධ** - මේ ලෝකයෙහි **විත්තං** විඳියි, සතුටු කරයි, යන අදහසින් විත්තං, ධනයට කියන වචනයකි. **සුචිණ්ණං** මැනවින් කරන ලද, **සුඛං** කායික මානසික සැපයයි. ආවහාති (සුව) එළවයි. ගෙනෙයි, ලැබදෙයි, පමුණුවයි යනුවෙන් කියන ලද්දේය. **හවෙ** දැඩි යන අරුත් ඇති නිපාතයි. **සාදුතරං** වඩා යහපත්, සාධුතරං යැයිද වචනයකි. **රසානං** රසය දනවන කරුණු, **කථං** කුමන ආකාරයෙන් කිනම් ලෙසින්, කෙසේ ජීවිතය පවත්වාගෙන යයිද = **කථං ජීවිජීවිතං**, ගාථා සැකසීමේදී පහසුව සළකා අනුනාසික අකුරක් සේ කියනු ලැබේ. **කථං ජීවිං ජීවිතං** යනුද පාඨයකි. ජීවත්වන ආකාරය කෙබඳු විය යුතුද? වැනි අරුතකි. ඉතිරි කරුණු පහසුය. මෙසේ මෙම ගාථාවෙහි, මේ ලෝකයෙහි මිනිසාට උසස්ම ධනය කුමක්ද? කුමක් පුරුදු කිරීමෙන් සැප ගෙනදෙයිද? රස අතුරෙන් යහපත් (මිහිරි) රසය කුමක්ද? කෙසේ ජීවත් වනවිට උසස් ජීවිතයක් ලැබේද? යන පැන සතර විචාළේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ ද කස්සප බුදුරදුන් විසින් විසඳන ලද අයුරින්ම **සද්ධීධ විත්තං** යන මේ ගාථාව වදාළහ. රත්රන්, රිදී ආදිය පරිහරණය කිරීමේදී හා එයින් (ආදායම පරිදි) ජීවත්වීමේදී සිතට සුව ගෙන දෙයි. සාගිනි, පිපාස ආදී දුක වළකයි. දිළිඳුකම පහව යයි. මුතු, මැණික් ආදිය ලැබීමෙන් ලෝකයාගේ සැළකිල්ල ලබයි. මෙසේ ලොවී ලොවුතුරු **සද්ධා** ද (ජීවිතයට) එක්වූ විට මෙලොව-පරලොව සුව ගෙනෙයි. සැදැහැයෙන් කටයුතු කරන තැනැත්තන්ට ඉපදීම-ජරා-දුක වැළකෙයි. සිහිය හා (දහම්) අවබෝධයට අවැසි මැණික් ලැබීමෙන් (සති-සම්බොජ්ඣංග) අයහපත්-අගුණ නිසා වූ දිළිඳු බව වළකයි.

'සැදැහැයෙන්, සීලයෙන් යුතු, (එයින් ලබන) කිතුරාව නැමති ධන සම්පතින් හෙබි තැනැත්තා යම් යම් පෙදෙසක් ඇසුරු කරයිද, ඒ ඒ තැන්වලදී ඔහු ගරු සැළකිලි උපහාර ලබයි'

**සද්ධා සීලෙන සම්පන්නො යසො භොග සමප්පිතො**
**යං යං පදෙසං භජති තත්ථ තත්ථේව පූජිතො**

ලෝකයාගෙන් වාචිකව ලැබෙන තුති පැසසුම් සළකා විත්තං යැයි කියන ලදී. එදිනෙදා, ලෝකිය ජීවිතයේදී රන් රිදී ආදී සම්පත් ලැබීමට හේතුවන පරිදිම, සැදැහැ සම්පතින් යුතු තැනැත්තා ද ඒ අනුව දන් පිරිනැමීම් ආදී පින්කම් කොට (මෙලොව-පරලොව) සම්පත් ලබා ගනී. සැදැහැ බව නොමැති තැනැත්තාට තිබෙන ධනය අයහපත පිණිස පවතී. එහෙයින් (සද්ධාව) සෙට්ඨං යැයි දක්වන ලදී. පුරිසසස (සදධාවේ) උසස් බවට පමුණුවන කොටස්කරුවන් ලෙස පෙන්වයි. හුදෙක් පිරිමියෙකුට පමණක් නොව, සැදැහැ ධන සම්පත උසස් බව දතයුතුය. ධම්මො (දාන, සීල, භාවනා)දි ලෙස දැක්වෙන දසකුසල්හි ලා ගැනෙන කරුණුය. සුචිණ්ණ මනාව පිළිපදිනා ලද, මනාව හැසිරෙන ලද, සුඛමාවහාති සෝණ සිටුපුත්, රට්ඨපාල සිටුපුත් ආදීන්ට මෙන්, මිනිසකු ලෙසින් ලබන සැපද, සක්දෙවිඳුට මෙන් දෙව් සැපද, අවසානයෙහි මහා පදුම කුමරුට මෙන් නිවන් සුව ද ගෙන දෙයි. සච්චං යන මෙම වචනය, නොයෙක් තේරුම් ඇත. ඒ කෙසේද? සච්චං භණෙ න කුජ්ජෙය්‍යා ආදී තන්හි ඇත්ත කතා කිරීමද, සච්ච ඨිතා සමණබ්‍රාහමණා ච මුසා බසින් වැළකීමද, කසමා නූ සච්චානි වදනති නා නා පවාදියාසෙ කුසලාවදානා යනුවෙන් නිසි දැකීමෙහිද, චතතාරිමානි භික්ඛවෙ බ්‍රාහමණ සච්චානි තැන්වල රහතන් වහන්සේ කෙරෙහිද, එකං හි සච්චං න දුතියමත්‍ථි එකම-නියම ඇත්ත පිළිබඳවද, 'චතුනනං සච්චානං කති කුසලා' ආදි තැන උතුම් ඇත්ත (හෙවත් සිවුසස්) දැක්වේ. එහෙත් මෙහිදී ඇත්ත කීම අදහස් වේ. යම් තැනැත්තෙක් තම බලයෙන් ජලය ආදිය තම වසඟයෙහි පවත්වා ගනිති. ඉපදීම-ජරා-මරණින් එතරට යති. එහෙයින් මෙසේ කියා ඇත.

'ඇත්ත වචන කතා කිරීමේ බලයෙන් ජලයෙහි නොගැටෙයි. (දිය මතුපිට සිටිය හැකියි.) ඇත්ත කතා කිරීමේ බලයෙන් දැනුම් තේරුම් ඇති තැනැත්තෝ වස විස හානි වළකා ගනිති. ඇත්ත කතා කිරීමේ බලයෙන් අහස ගොරවා වැසි වැස්සවිය හැකිය. ඇත්ත වචනයෙහි පිහිටා නිවන පතති.'

'මේ පොළෝතලයෙහි යම් රස ඇත්ද, ඒවා අතරින් ඇත්ත (කථාකිරීම) වඩාත්ම රසය වේ. ඇත්ත වචනයෙහි පිහිටා මහණ බමුණෝ ඉපදීම හා මරණයෙන් එතරට (සසර) තරණය කරති.'

සච්චෙනවාචෙනුදකං හි ගාධති
විසමපි සච්චෙන හනන්ති පණ්ඩිතා
සච්චෙන දෙවො ථනයං පවස්සති
සච්චෙ ඨිතා නිබ්බුතිං පත්‍ථයන්ති

යෙ කෙචි මෙ අත්‍ථි රසා පථව්‍යා
සච්චං තෙසං සාදුතරං රසානං
සච්චෙ ඨිතා සමණ බ්‍රාහමණාච
තරන්ති ජාති මරණස්ස පාරං

සාදුතරං මිහිරිතම, ඉතා රසවත්, රසානං මුලෙහි රසය, කඳෙහි රසය ආදී ලෙසින් විඳිය යුතු රසයයි. 'මහණෙනි, මම සියළුම පල රසය අනුදනිමි. 'අනුජානාමි භික්ඛවෙ සබ්බං පල රසං' 'බමුණ, රූපයෙහි, හඬෙහි යම් රසයක් වේද, පින්වත් ගෝතමයන් වහන්සේ රසයෙහි ඇළුම් නොකරති.' 'අරසරූපො භවං ගොතමො, යෙ බො බ්‍රාහමණ රූප රසා සද්දරසා' - 'රස රසයන්හි වැරැද්දකට නොපැමිණේ' 'අනාපත්ති රසරසෙ', 'මේ දහම් විනයෙහි එකම රසය විමුත්ති රසයයි', 'අයං ධම්මවිනයො එකරසො විමුත්ති රසො', 'භාග්‍යවතුන් වහන්සේ අරුත් රසයටද දහම් රසයටද හිමිකරුවෙක් වූහ' - 'භාගී වා භගවා අත්‍ථරසස්ස ධම්මරසස්සා' මේ ආදී ලෙසින්, දියර සොබාව, පිසන ලද එළවළු, කැවිලි හා වෙනත් ව්‍යංජන ආදියෙහි ඇති රස සොබාවය කියනු ලැබේ. ඒ සියළු රස අතරින් සච්චං හවෙ සාදුතරං ඇත්ත (වචනයම) ඉතා උසස්ය. ඉතා උතුම්ය. මුල්වල රස ආදියෙන් සිරුරද වඩයි. කෙලෙස් වැඩීමටද මනාව ඉඩකඩ ලැබෙයි. ඇත්ත නම් වූ රසයෙන් යුතුව, මුසාවෙන් වෙන්ව, ඇත්ත රසය මුසු සමථ විදසුන් ආදියෙන් සිත වඩයි. කෙලෙස් හැඟුම් නැති කිරීමෙන් සුව දනවයි. විමුත්ති රසය උතුම් ඇත්ත නම් වූ රසය මුසුව පුරුදු කරන ලද බැවින් යහපත්ය. එය ලබාගැනීම පිණිස අරුත් රසයද දහම් රසයද උපකාර වී, දහම අනුවම පවත්නේය. පඤ්ඤාජීවී මෙහි, එක් ඇසක් අඳ වූ හෝ දෑසම අඳ වූ තැනැත්තන් අතුරින් දෑස පෙනෙන, නිවැරදි කටයුතුවල උත්සාහ වී, තෙරුවන් සරණ ගොස්, දාන පිරිනැමීම්, පන්සිල් පද රැකීම හා පෙහෙවස් සමාදානය වැනි ගිහි පිළිවෙත්හි යෙදෙන ගිහියෙකු හෝ පැවිද්දෙකු නම්, පසුතැවිලි නොවී (අධි) සීලයෙන් යුතුව, එයින් තවත් ඉදිරියට ගොස්, සිතෙහි උසස් පිරිසිදු බව හෙවත්, චිත්ත විසුද්ධිය ආදී කොට ඇති පැවිදි පිළිවෙත නුවණින්

ළඟාකොට වාසය කිරීම අදාළය. ඒ නුවණින් ජීවත්වන තැනැත්තාගේ දිවිමග හෝ, නුවණ නිසා ජීවත්වන ආකාරය උසස්යැයි කියා ඇති බව දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් පැන සතර විසඳන ලද පරිදි අසා සතුටුවූ ආලවක යකු ඉතිරි සතර පැනයද **කථං සු තරතී ඔඝං** යන ගාථාවෙන් විමසීය. භාග්‍යවතුන් වහන්සේද පෙර පරිදිම **සද්ධාය තරතී** යන ගාථාවෙන් එය පැහැදිලි කළහ. එහි (දැක්වෙන පරිදි) සතරාකාර වූ සැඩපහර තරණය කරන තැනැත්තා සංසාරය නැමති මහා මුහුදද තරණය කරයි. සසර ගමනද ඉක්මවයි. අපිරිසිදු කෙලෙස්වලින්ද මනාව පිරිසිදු වෙයි. කරුණු මෙසේ නමුදු, සැදැහැ නොමැති, සැඩපහරින් එතරවීම පිළිනොගනිමින්, පස්කම් සැපයෙහි සිත වසඟකොට, යහපත් කුසල දහමෙහි පමා වූ, එහිම ඇලීගැලී, එයින් ඉවත් නොවෙමින්, සිටින යම් තැනැත්තෙක් සංසාර සාගරය තරණය නොකරති. අකුසල් දෙයෙහිම නියැලෙමින්, අලසව දුකින් කල් යවති. අනුවණ බැවින් පිරිසිදු බවට මග නොදැන මනා පිරිසිදු බවට පත් නොවෙති. එහෙයින් එයට වෙනස්වන කරුණු පෙන්වාදෙන භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කරන ලදී. මෙසේ කියන ලද පරිදි යම් ආකාරයකින් සෝවාන්මගෙහි පිහිටන, සද්ධාඉන්‍ද්‍රිය ඇති කරගැනීමේ සිතිවිල්ලෙන් යුතුවේද, ඒ අනුව **සද්ධාය තරතී ඔඝං** යන මේ පදයෙන් දැඩිව ගන්නා ලද මිසදිටු දැකීම නම් වූ සැඩපහර තරණය කරන සෝවාන් මගද සෝවාන් පලයද වදාළහ. සෝවාන් පලයට පත් තැනැත්තා යම් හෙයකින් කුසල දහම් වැඩීමෙන් භාවනා කටයුතුවල නිරත වූයේ, එහි පමානොවී, එක්වරක් පමණක් ලොව උපත ලබන දෙවැනි මග සළකා, සසර සැඩපහරෙහි ඉතිරි වූ දැඳ සහිත වූ සසර සයුර තරණය කරත් ද, ඒ ආකාරයෙන් **අප්පමාදෙන අණ්ණවං** යන මේ පදයෙන් ඒ සැඩපහර තරණයේදී සකදාගාමී මගද එම පලයට පත්වන අයුරුද වදාරති. එසේ සකදාගාමී බවට පත්වූ උත්සාහයෙන් පසු, එයින් ඉවත්නොවූ කාම සැඩපහර යැයි සම්මත වූ කාමය නිසා වන දුක ඉවතලයිද **විරියෙන දුක්ඛමච්චෙති** යන මේ පදයෙන් ඒ කාම සැඩපහර තරණය හා අනාගාමි මගද අනාගාමි පලයද වදාළහ. අනාගාමි බවට පත්ව, කාමය නැමති මඩ ඉවත්කොට පිරිසිදු නුවණින් යුතුව, නිසැකවම පිරිසිදු වූ සිවුවන මගෙහි නුවණ මෙහෙයා, අනාගාමි මගෙන් ඉවත් නොකරන ලද අවිජ්ජා යැයි කියන ලද අපිරිසිදුම වූ කිළිටි බව ඊළඟට දුරු කරයි. ඒ ආකාරයෙන් **පඤ්ඤාය පරිසුජ්ඣති** යන මේ

පදයෙන් අවිජ්ජා නම් සැඩපහර තරණයත්, අරහත් මග හා අරහත් පලයත් වදාළහ. මේ අරහත් පලය කුළුගන්වන අයුරින් දේශනා කරන ලද ගාථාව අවසානයෙහිදී අලව් යකු සෝවාන් පලයෙහි පිහිටියේය. මීළඟට, ඒ නුවණින්ම පිරිසිදු වේයැයි මෙහි කියන ලද 'පඤ්ඤා' නම් වචනය ගෙන තම වැටහීම අනුව ලොව් ලොවුතුරා කරුණු මුසු වූ පැන අසමින් **කථං සු ලභතෙ පඤ්ඤං** යනුවෙන් පේළි සයකින් යුතු මෙම ගාථාව කීය. එහි **කථං** යනුවෙන් මුළුමනින්ම තේරුම් යෙදෙන සැටි අසන ලදී. මෙහිදී පඤ්ඤා යන අරුත දැන එය යෙදෙන අයුරු අසයි. **කථං** කුමන ආකාරයෙන්, කිනම් කාරණයකින්, පඤ්ඤං ලභති යනුවෙනි. **ධනං** පිළිබඳවද එසේය.

මීළඟට භාග්‍යවතුන් වහන්සේ කරුණු හතරකින්, නුවණ ලැබීම ගැන පහදා දෙමින්, **සද්දහානො** යන ගාථාව වදාළහ. එහි තේරුම නම්, මුලදී යම් පරිද්දෙන් යහපත් ලෙස කටයුතු කිරීමෙන්, පසුකල්හී සිවුසස් අවබෝධයට හේතුවන කරුණු තිස්හතක් සපුරා අරහත්ව, බුදු, පසේබුදු, උපාසක උපාසිකාවෝ නිවනට පැමිණියහ. **සද්දහානො අරහතං ධම්මං නිබ්බාණපත්තියා** ඒ ලොව් ලොවුතුරු, **පඤ්ඤං ලභති** එය හුදෙක් සැදැහැ බව තිබූ පමණින්ම නොවේ. ඒ බවට තහවුරුකොට, ඇදහීමෙන් යුතුව, ඒ සැදැහැ බවෙන් යුතුව (දැනුම් තේරුම් ඇති කෙනෙකු වෙත) පැමිණෙයි. පැමිණ ඇසුරු කරයි. ඇසුරු කරමින් සවන් යොමු කරයි. සවන් යොමා දහම් අසයි. ඒ ආකාරයෙන් පැමිණීමේ පටන් දහම් ඇසීම දක්වා **සුස්සූසං** ලබයි. එසේ කියන ලද්දේ කුමක් නිසාද? (මුලින්) ඒ දහම ගැන අදහා-තහවුරු කර ගනිමින්ද, ගුරු උපජ්ඣායන් වෙත පුද්ගලිකවම ගොස්, වත් පිළිවෙත් ඉටුකරමින්, ඇසුරුකොට, යම් කලක් ඇසුරු කිරීමෙන් (ඔවුන්ගේ) සිත් ගෙන, කිසිවක් පවසනු කැමති වේද, ඉක්බිති එය ඇසීමට කැමතිව සවන් යොමා ඇසීමෙන් (නුවණ-දැනුම) ලබන්නේය. මෙසේ කියන දෙයට ඇහුම්කන් දීමෙන්ද එහි මනාව සිහිය පවත්වා ගැනීමෙන්ද, **අප්පමත්තො** යහපත්ව කියන ලද හා අයහපත් ලෙස කියන ලද දේ දැනගැනීමට හැකිවීම **විචක්ඛණො** එය දැනගත හැක්කේ ඒ අයුරින් මිස අන් ලෙසකින් නොවේ. එහෙයින් **අප්පමත්තො විචක්ඛණො** යැයි වදාළහ. මෙසේ යම් ආකාරයකින් සැදැහැයෙන් නුවණ ලැබීමේ පිළිවෙතට පැමිණේද, කියන දෙය මැනවින් නුවණ ලබනු රිසින් අසයි. එසේ නොපමා වූ සිහි ඇතිව සිත දරාගන්නා ලද බැවින් අමතක නොවේ. යහපත් කරුණු, අයහපත් කරුණු මෙන්ම, එම කරුණු අඩුවෙන් හා වැඩියෙන්ද

ගැටළු සහගත තැන් ද සළකා විස්තර ලෙස දැනගනී. සවන් යොමුකොට නුවණ-දැනුම ලබනු කැමතිව දහම් අසයි. නොපමාව අසා දහම දරා ගනී. එසේ දරා ගත් දහමෙහි නුවණින් අරුත් විමසා බලයි. ඉක්බිති අනුපිළිවෙළින් උතුම් සිවුසස් අවබෝධ කරයි. එහෙයින් **කථං සු ලභතෙ පඤ්ඤං** යැයි ආලවක විචාළ විට මේ කරුණු සතර දක්වමින් **සද්දහානො** -පෙ- **විචක්ඛණො** යන ගාථාව වදාළහ. ඊට පසුව තවත් පැන තුනක් පැහැදිලි කොට විසඳමින් **පතිරූපකාරී** යන ගාථාව වදාළහ.

එම ගාථාවෙහි, පෙදෙස - කාලය ආදිය නොසළකා, මෙලොව හෝ ලොවුතුරු ධනය ලැබීමට සුදුසු කටයුතු කරන්නේ යැයි **පතිරූපකාරී**, ධුරවා යනු උත්සාහවත් බව දියුණුකරන සිතිවිලි ඇතිවීමයි. උට්ඨාතා - යමෙක්, (දැන්) සීතලයි, උණුසුමයි, තණපතක් තරමටවත් නොසළකති. 'යො ච සීතඤ්ච උණ්හඤ්ච තිණං භියො න මඤ්ඤති - ආදී ලෙසින් කය වෙහෙසමින්, උත්සාහවත්ව අත්නොහළ දැඩි වෙර යොදමින්, **වින්දතෙ** ධනං එක මීයෙකුගෙන් නොබෝ කලකින්ම, සියදහසක්, සියදහසක් (කහවණු) - එදිනෙදා ජීවිතයෙහි ධනය ලද සුළු අතවැසියා මෙන්ද, මිලක්ඛ මහාතිස්ස තෙරුන් මෙන් ලොවුතුරු ධනයද ලබයි. උන්වහන්සේ 'තුන් ඉරියව්වෙන් වසන්නෙමි'යි අදිටන්කොට, නිදිමත මැලිබව ඇතිවන විට, පිදුරු වෙණියක් තෙමා හිස තබා, ගෙල දක්වා දියට බැස, මැලිබව වළකාලමින් දොළොස් වසරකින් අරහත් බවට පත්වූහ. **සච්චෙන** මුසා බස් නොකියා, ඇදහිය යුතු, ඇත්තම කියන, බුදු, පසේබුදු, මහරහත් සව්වෝ පරම ඇත්ත පහදා දෙති. **කිත්තිං පප්පොති** ද්දං කැමති, බලාපොරොත්තු වන කැමති යම් දෙයක් දෙන, **මිත්තානි ගන්ථති** සකස් කරයි. කටයුතු කරයි යන අරුතයි. තුදුන් දෙයක් හෝ දිය යුතු දෙයක් දීමට කටයුතු කරයි. දීමේ අදහස මුල්කොට ගෙන හෝ සතර සංග්‍රහ කරුණු මෙහිදී අදාළ වේයැයි දතයුතුය. එබඳු දෙයින් මිතුරන් ඇතිකර ගනීයැයි කියන ලදී.

මෙසේ ගිහියන්ට, පැවිදි වූවන්ට ගැලපෙන සේ ලොවී ලොවුතුරු බව මුසුවෙන පරිදි පැන සතර විසඳ දැන් **කථං පෙච්ච න සොචති** යන මෙම පස්වන පැනය ගිහි ජීවිතයට අදාල කොට විසඳමින් **යස්සෙතෙ** යන ගාථාව වදාළහ. එහි තේරුම නම් **සද්දහානො අරහතං** මෙහි කියන ලද පරිදි සියළු යහපත් ගතිගුණ ඇතිකර ගැනීමෙන්, සැදැහැයෙන් යුතු බැවින්, **සද්ධස්ස**, සරමෙසිනො ගිහිගෙයි වසන පස්කම් ගුණ සොයන

කම්සුව විඳින ගිහියන්ට, **සච්චෙන කිත්තිං පප්පොති,** මෙහි කියන ලද පරිදි (ඇත්ත කථාබහ පිළිබඳව) **සච්චං සුස්සූසං ලභතෙ පඤ්ඤං,** මෙහි ඇහුම්කන් දීමෙන් ලබන දැනුම-නුවණ පඤ්ඤා නමින් සඳහන් කොට ඇති **ධම්මො, ධුරවා උට්ඨාතා** ධුර හා උට්ඨාන නමින් උත්සාහය දක්වයි. **දදං මිත්තානි ගන්ථති** මෙහි ඉහත සඳහන් කරන ලද පරිදි (තමන්ට අයිති දේ සතුටින්) දීම - (චාග) යන කරුණු හතරින් යුත්තාහ. **ස වෙ පෙච්ච න සොචති** මේ ලොවින් පරලොවට ගොස් ඒකාන්තයෙන් කණගාටු නොවේ යනුයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පස්වෙනි පැනයද විසඳ ඒ ආලවක යකු තවත් උනන්දු කරවමින් **ඉංඝ අඤ්ඤෙපි** යන ගාථාව වදාළහ. **ඉංඝ** උනන්දු කරවීම අරුත් දනවන නිපාතයකි. **අඤ්ඤෙපි** වෙනත් කරුණක්, **පුථු සමණ බ්‍රාහ්මණෙ පුච්ඡස්සු** පූරණ කස්සප වැනි සියළු දෙයම දන්නා බවට සහතික වන වෙනත් බොහෝ මහණ බමුණන්ගෙන් හෝ අසව, යදි ඇත්ත කතා කිරීමෙන් කීර්තියට පත්වේ යැයි අප විසින් මෙහි කියන ලද ආකාරයට වඩා, **සච්චා භිය්‍යො** (යම් කෙනෙකු ගැන) කිතුරාවයට පැමිණෙන කරුණ නම් ඇත්ත කීමයි. **සුස්සූසං ලභතෙ පඤ්ඤං** මෙහි ඇසීමෙන් නුවණ ලැබේයැයි කියා ඇත. දමා මෙම කරුණුවලට වඩා ලොවී ලොවුතුරු නුවණ ලබන ආකාරයක් (මේ කරුණුවලට වඩා වෙනස් කරුණු ඇත්දැයි අසව) **දදං මිත්තානි ගන්ථති** මෙහි කියන ලද පරිදි චාගා දීමෙන් මිතුරන් ඇතිකර ගැනීම යන කරුණට වඩා වෙනත් කරුණක් හෝ **ධුරවා උට්ඨාතා** මෙහි ඒ ඒ අරුත් පරිදි ධුර නමින්ද උට්ඨාන නමින්ද කියා ඇති විරිය නම් වූ උත්සාහයට වඩා (වෙනත් කරුණක්) **ඛන්ත්‍යා** ලොවීලොවුතුරු සම්පත් ලබන (මෙහි දැක්වූ කරුණට වඩා වෙනස් වූ අදහසක්) **සච්චං ධම්මො ධිතී චාගො** සඳහන් කර ඇති මෙම කරුණු සතරටද වැඩියෙන්, මේ ලෝකයෙහි හෝ පරලොවෙහිදී සොක නොවන කරුණක් හෝ **ඉධ විජ්ජති** යනුවෙන් මේ කරුණු කෙටියෙන් යෙදුනු සැටිය. විස්තර ලෙසින් නම්, එකක් එකක් සේ වචනයත්, එහි තේරුමත් අනුව බෙදා දක්වමින් වචන විස්තර කරන ආකාරය අනුව දතයුතුය.

මෙසේ වදාළ කල, ආලවක යකු, සැක සහිත වූ ඇසිය යුතු වෙනත් දේ පිළිබඳ සැක දුරු වූ බැවින්, **කථන්නුදානි පුච්ඡෙය්‍යං පුථුසමණ බ්‍රාහ්මණෙ** යැයි කියා, වෙනත් කෙනෙකුගෙන් විමසන්නට තරම් කරුණු

නොමැති බැවින්, ඔවුන්ද (මේ කරුණු ගැන) දැනුවත් කරවමින් **සොහං අජ්ජ පජානාමි, යො අත්‍ථො සම්පරායිකො** යැයි කීය. **අජ්ජ** යනු අද පටන්, **පජානාමි** යම්සේ කියන ලද පරිදි දැනගතිමි. **යො අත්‍ථො** එපමණකින්, **සුසසූසං ලභතෙ පඤ්ඤං** ආදී ලෙසින් මේ ජීවත්වන කාලය තුලදීම, **සම්පරායිකො** මේ කියන ලද කරුණු සතරට අනුව මරණින් පසු සෝකය නොමැති වේද, **අත්‍ථො** කරුණ-කාරණය යන්නට සමාන වචනයකි. මේ අත්‍ථ යන වචනය, 'හරවත් වූ අකුරු, ගැළපෙන අයුරු හොඳ අදහස් දෙන' - 'සාත්‍ථං සව්‍යඤ්ජනං' වැනි තැනක සඳහන් වනුයේ කිසියම් කොටසක තේරුමක් ලෙසිනි. 'ගහපතිය, මට රන්රිදී ඇත' - 'අත්‍ථො මෙ ගහපති හිරඤ්ඤ සුවණ්ණන' වැනි තැන්වල උපකාර වන තේරුමෙනි. 'සිල්වත් වීමෙහි වැදගත්කමක් වේ' - 'හොති සීලවතං අත්‍ථො' වැනි තැන දියුණුවෙහි, 'බොහෝ දෙනා ලාභ නිසා ඇසුරු කෙරේ' 'බහුජනො භජතෙ අත්‍ථහෙතු' ආදී තැන්වල ධනය පිළිබඳවද එලොව මෙලොව වැඩ පිණිස හැසිරේ' - 'උභිනනමත්‍ථං චරති' යන තැන්වල හිතවැඩ පිණිස අදහසින් ද, 'පණ්ඩිතුමනි, යම් කරුණක් සිදුවූ විට 'අත්‍ථෙ ජාතෙ ච පණ්ඩිත' තැන කාරණයෙහිද සඳහන්ව ඇත. මෙම සූත්‍රයෙහි අත්‍ථ - යෙදී ඇත්තේ කරුණු යන අදහසිනි. එහෙයින් නුවණ ලැබීම වැනි කරුණු මේ ජීවිතයෙහිදීම ලැබිය හැකිය. එමෙන්ම මරණින් පසු සෝකය නොමැති බැවින්, 'එය මම අද භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන ලද අයුරින්ම තමන් විසින්ම දැනගතිමි' - ඒ නිසා **කථනනුදානි පුච්ඡෙය්‍යං පුථු සමණ බ්‍රාහමණං** මෙසේ මෙහි අරුත කෙටියෙන් දතයුතුය. මෙසේ යකු **පජානාමි යො අත්‍ථො සම්පරායිකො** යැයි කියා ඔහුට එම නුවණ ලැබීමට භාග්‍යවතුන් වහන්සේ මූලික බව දක්වමින් **අත්‍ථාය වත මෙ බුද්ධො** යන ගාථාද කීවේය.

එම ගාථාවෙහි **අත්‍ථාය** හිත වැඩ පිණිස, දියුණුව **පිණිස යත්‍ථ දින්නං මහප්ඵලං** 'යසෙසතෙ චතුරො ධම්මා' යැයි කියන ලද පරිදි, යම් කෙනෙකුට දෙන ලද දෙය මහත් පලදායී වේද ඒ දීමට උසස්ම සුදුස්සා වන්නේ බුදුරජාණන් වහන්සේම යැයි දනිමි' යන අදහසයි. මෙසේ කියන්නේ සංඝයා වහන්සේ ගැන සළකා යයිද ඇතමෙක් පවසති. මෙසේ මේ ගාථාවෙන් තමා යහපත උදාකරගත් බව දක්වා දැන් අනුන් කෙරෙහි තම හිතවත් පිළිවෙත පැහැදිලි කරමින් **සො අහං විචරිසසාමි** යන ගාථාවද කීය. එහි තේරුම හේමවත සූත්‍රයෙහිදී සඳහන් වූ පරිදි දතයුතුය. මෙසේ, මෙම ගාථාව කියා අවසන්වීමත්, (එදා) රැය පහන්වීමත්, සාදු

නාද හඬ පැතිරීමත්, ආලවක කුමරු යකු වෙතට ගෙන ඒමත් එකවිටම සිදුවිය. රාජ සේවකයෝ සාදු නාදය අසා 'මෙබඳු සාදු නාදයක් බුදුවරයෙකුට හැර, වෙනත් කෙනෙකු උදෙසා පැතිර නොයයි. භාග්‍යවතුන් වහන්සේ වැඩි සේක්දැ'යි කල්පනා කරද්දී, බුදු සිරුරෙන් විහිදෙනා කාන්තිය දැක, පෙර මෙන් පිටත නොසිට, සැක නැතිව ඇතුලටම පිවිසි විට, යකුගේ විමන්හි භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින අයුරුත්, ඇඳිලි බැඳ සිටිනා යකු ද දුටහ. 'මහා යකුනි, මේ කුමරුවා ඔබට බිලි පිණිස ගෙනෙන ලදී. ඔහු (කෑලි කෑලිවලට කඩා) කෑමට හෝ (එකවර) අනුභව කිරීම හෝ කැමති දෙයක් කරනු මැනව'යි යකුට කීහ. ආලවක යකු සෝවාන් පලයට පැමිණි බැවින් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ එසේ කීම ගැන වෙසෙසින්ම ලජ්ජා වූයේය. එවිට ආලවක ඒ කුමරු දෝතින්ම බාරගෙන, 'හිමියනි, මේ කුමරු මට එවන ලදී. මම මොහු භාග්‍යවතුන් වහන්සේට දෙමි, බුදුවරු හිතසුව කැමැත්තෝය. ඔබවහන්සේ මේ දරුවාගේ හිතසුව පිණිස පිළිගන්නා සේක්වා'යි යොමු කළේය. මේ ගාථාවද කීය.

**ඉමං කුමාරං සත පුඤ්ඤ ලක්ඛණං**
**සබ්බංගුපෙතං පරිපුණ්ණවාඤ්ජනං**
**උදග්ගචිත්තො සුමනො දදාමි තෙ**
**පටිග්ග හ ලොකහිතාය චක්ඛුමා**

සිය පින් ලකුණුවලින් හෙබි, පිරිපුන් සියළු අඟපසඟින් යුතු මේ කුමරුන් සතුටු ඔදවැඩි සිතින් ඔබවහන්සේට දෙමි, නුවණැත්තාණනි, ලොව හිත සුව පිණිස මොහු පිළිගන්නා සේක්වා !

භාග්‍යවතුන් වහන්සේ කුමරු පිළිගත්හ. පිළිගන්නා අතරම, යකුටද, කුමාරයාටද යහපත පිණිස පේළියක් අඩුවෙන් ගාථාවක් ද වදාළහ. ඒ යකු කුමාරයාද තෙසරණයෙහි යොමුකරමින් තුන්වරක්ම කියා සිවුවන පේළිය පුරවයි. ඒ කෙසේද?

'මේ කුමරු දිගුකල් ජීවත් වේවා! යකුනි, ඔබද සුවසේ ජීවත් වේවා!' හිංසා නොකොට ලොවට හිතසුව පිණිස කටයුතු කරන්න. (එවිට යකු ඉහත සඳහන් කළ පරිදි) මේ කුමරු බුදු සරණ යයි, දහම් සරණ යයි, සඟුන් සරණ යයි' කීවේය.

දීඝායුකො හොතු අයං කුමාරො
තුවඤ්ච යක්ඛ සුඛිතො භවාහි
අව්‍යාධිතා ලොකහිතාය තිට්ඨථ
අයං කුමාරො සරණමුපෙති බුද්ධං-ධම්මං-සංඝං

භාග්‍යවතුන් වහන්සේ, 'මොහු හදාවඩා නැවත මට ම දෙව'යි වදාරා, රාජ සේවකයන්ට දුන්හ. මෙසේ ඒ කුමරු රාජ සේවයන් අතින් යකුගේ අතටද යකුගේ අතින් බුදුහිමියන් අතටද, බුදුහිමි අතින් නැවත රාජ සේවකයන් අතට ගත් බැවින් 'හත්ථ ආලවක' යැයි නම් විය. කුමරු ද රැගෙන ආපසු පැමිණෙන රාජ සේවකයන් දුටු ගොවියෝ, වනයෙහි වැඩ කරන්නෝ කිමද? කුමාරයා ඉතා ළදරු බැවින් ආලවකයා කැමති නොවීදැ'යි බිය වී විචාළහ. 'භය නොවවු' කී රාජ සේවකයෝ, 'භාග්‍යවතුන් වහන්සේ විසින් කුමරුට අභය ලබාදීමට කටයුතු කරන ලදැ'යි සියළු තොරතුරු සැළකළහ. සාදු! සාදු හඬින් මුළු අලව් නුවරම එකකෝලාහලයක් බඳු විය. නුවර වාසීහු යකු ඉදිරියට ආහ.

ආලවක, භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස කල් පැමිණිවිට, පා සිවුරු ගෙන, මද දුරක් අවුත් නැවතුණේය. නගරයෙහි පිඬු හැසිර වළඳ අවසන, නගර දොරටුවෙහි විවේකයට සුදුසු එක් ගසක් මුල පනවන ලද බුදු අසුනෙහි වැඩහුන්හ. එහිදී මහජනයා සමග රජුද නුවරවාසීහුද එක්ව භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, වැඳ පිරිවරා සිට 'හිමියනි, මෙබඳු දරුණු යකෙකු කෙසේ දමනය කළසේක්දැ'යි ඇසූහ. භාග්‍යවතුන් වහන්සේ 'මෙසේ නව ආකාරයෙන් වැසි වැස්සවීය. මෙසේ බිහිසුණු දේ කළේය. මෙසේ පැන විචාළේය. මම ඒවා මෙසේ විසඳුවෙමි'යි (ආලවක කරනු ලැබූ) 'යුද්ධය' මුලසිටම දක්වා, ඒ ආලවක සූත්‍රය වදාළහ. දේසනය අවසන අසූහාර දහසකට දහම් අවබෝධ විය. ඉන්පසු රජු ද නගරවාසිහුද වෙසසවණ මහ රජුගේ විමන අසළ යකුටද විමනක් කරවා, මල්, සුවඳ ආදී සත්කාර සහිත, ආහාර ආදී නිති පූජා පැවැත්වූහ. ඒ කුමරුද, වැඩිවියට පත්වූ විට 'ඔබ භාග්‍යවතුන් වහන්සේ නිසා ජීවිතය ලැබුවෙහි, යන්න උන්වහන්සේම ඇසුරු කරව'යි පිටත්කර හැරියහ. ඔහු භාග්‍යවතුන් වහන්සේද සංඝයා වහන්සේද ඇසුරු කරමින්, නොබෝ කලකින්ම අනාගාමි පලයෙහි පිහිටා, සියළු බුද්ධ වචනය ඉගෙන පන්සියයක් උපාසක පිරිවර ඇතිවිය. 'මහණෙනි, මගේ සසුනෙහි උපාසක පිරිස අතර සිවු

සඟරාවතින් පිරිසට සත්කාර කිරීමෙන් හත්‍ථක ආලවක අගතැන් ගනී' යැයි තනතුර දී වදාළහ.

**ආලවක සූත්‍ර විස්තරය නිමි.**

# 1.11

**චරං වා යදි වා තිට්ඨං** යනු විජය සූත්‍රයයි. කායවිච්ඡන්‍දනික සූත්‍රය යයිද කියනු ලැබේ. එය දේශනා කිරීමට හේතුවූ කරුණ කුමක්ද? මෙම දේශනය දෙතැනකදී පවත්වන ලද බැවින් නිදාන කතා දෙකකි.

භාග්‍යවතුන් වහන්සේ පිළිවෙලින් කිඹුල්වත් පුරට පැමිණ, සැකි කුලවතුන් හික්මවා නන්ද කුමරු ආදීන් පැවිදිකොට, (ඒ වනවිට) කාන්තාවනටද පැවිදිවීමට අනුදත් බැවින් ආනන්ද හිමිගේ සොහොයුරිය වූ නන්දා ද, සැකිකුල ඛෙමක රජුගේ දියණිය වූ අභිරූප නන්දා ද, ජනපදකල්‍යාණිය වූ නන්දා ද (නන්දා නමින්ම තිදෙනෙක්) පැවිදි වූහ. මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවසති. අභිරූප නන්දා රුවින් අගපත්ව, දැකුම්කළු, පහදනසුළු වූවා, ඒ නමින්ම හඳුන්වන ලදී. ජනපදකලණිය වූ නන්දා ද තමා හා රුවින් සම වූ අන් තැනැත්තියක් නොදක්නීය. 'භාග්‍යවතුන් වහන්සේ රූපය වැණුම් නොකරති. නින්දා කරති. නොයෙක් ලෙසින් රූපයෙහි දොස්ම දක්වති'යි මේ දෙදෙනාම උන්වහන්සේට උවටැන් කිරීමට නොයති. දැකීමටවත් නොකැමති වෙති. මෙසේ නොපැහැදී කුමක් නිසා පැවිදි වූවෝද? වැරදි අදහසිනි. අභිරූප නන්දා විවාහ ගිවිස ගැනීමට යෙදුනු දවසෙහිම (තමාට) හිමි සැකි කුල කුමරා මිය ගියේය. එවිට ඇගේ මවුපියෝ ඇය නොකැමති වුවත් පැවිදි කළහ. ජලපදකලණ නන්දා ද, ගරුකටයුතු නන්ද තෙරුන් අරහත් බවට පත් වූ කල, (ගිහි දිවියෙහි) ආසා නැතිව, 'මගේ හිමියන් ද මව මහා පජාපතිද, අනෙක් නෑදෑයන්ද පැවිදිව ඇත. නෑදෑයන් නොමැතිව, ගෙදර වාසය කිරීම දුකකි. ගිහි දිවියෙහි අස්වැසුමක් නොලැබ, සැදැහැයෙන්

තොරව පැවිදි වූවාය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, දහම් අවබෝධයට ඒ මෙහෙණින්ගේ නුවණ පිරිපුන් බව දැන, 'සියළුම මෙහෙණින් පිළිවෙලින් අවවාද ලබාදීමට එවන ලෙස මහා පජාපති තෙරණියට අණ කළහ. ඒ මෙහෙණියෝ අවවාද ලබාගැනීමට තම වාරය පැමිණිවිට වෙනත් මෙහෙණක යවන්නාහ. එවිට භාග්‍යවතුන් වහන්සේ 'වාරය පැමිණි විට අදාල මෙහෙණියම පැමිණිය යුතු බවත්, වෙනත් මෙහෙණියක නොඑවිය යුතු බවත් කීහ. එක් දිනක් අභිරූප නන්දා මෙහෙණිය අවවාද ලබාගැනීමට ගියාය. භාග්‍යවතුන් වහන්සේ (ඉද්ධි බලෙන් පෙන්වූ) රූවකින් සංවේගයට හා (අවබෝධයට උත්සාහවත් කොට) 'ඇටවලින් කරන ලද නගරයක් බඳු'..... මෙම ධම්මපද ගාථාවෙන් ද

'ගිලන් බවට පත්වන, නොයෙක් රෝග වැළඳෙන, ඉතා පිළිකුල් සහගත, කුණුවන, (ලේ, සැරව, මල මූ) කාන්දුවන, ගලන, අනුවණයන් සතුටුවනු ලබන මේ සිරුර දෙස නන්දාවනි බලන්න.'

'රූමත් යැයි ඇතිකර ගන්නා මානය-උඩඟුකම අත්හැර, මෙහි කිසිවක් සදාකාලික හෝ නිති පැවැත්මක් නැති බව, අනිස ලෙස නුවණින් මෙනෙහි කරන්න. එවිට මානය නැතිකිරීමෙන් සන්සුන්ව හැසිරෙන්න.'

**ආතුරං අසුචිං පූතිං පස්ස නන්දෙ සමුස්සයං**
**උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිනන්දිතං**
**අනිමිත්තංච භාවෙහි මානානුසයමුජ්ජහ**
**තතො මානාභිසමයා උපසන්තා චරිස්සසී**

යන මෙම ථෙරී ගාථාවලින්ද අනුපිළිවෙලින් අරහත් පලෙහි පිහිටියාය. එක්දිනක් සැවැත්නුවර වාසීහු පෙරබත් කාලයෙහි දානය දී, පෙහෙවස් සමාදන්ව, මනාව හැඳ පොරවාගෙන, සුවඳ මල්ගෙන, දහම් ඇසීමට ජේතවන විහාරයට ගොස්, දහම් දෙසුමෙන් පසු භාග්‍යවතුන් වහන්සේ වැඩ නගරයට පිවිසෙති. මෙහෙණින් වහන්සේලාද දහම් කතා අසා අසපුවට යති. ඒ අතර මෙහෙණිහුද මිනිස්සුද භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කියති. සිවුලෝ ධාතුවෙහි අපමණ වූ වසන්නන් අතර, සම්මා සම්බුදුරදුන් දැක නොපැහැදුණු කෙනෙක් නැත්තාහ. රූපයම මුල්කොට ගෙන බොහෝසෙයින් සිතන පුද්ගලයෝ පුරිස් ලකුණින් හා අනුසලකුණුවලින් විසිතුරු වූ, කේතුමාලාවෙන් හා බඹයක් පමණ විහිදෙන

බැබළෙන රැස්වලල්ලකින් අලංකාරවත් වූ ලොවට වැඩදායී වූ බුදුරජාණන් වහන්සේගේ රුව දැක පහදිති. කටහඬ ගැන අගයකොට සිතන්නෝ අපමණ ජාතක කතාවල අංග අටකින් යුතු කුරවිකෙවිල්ලන්ගේ බඳු මිහිරි හඬින් යුතු කටහඬ අසා පහදිති. රළු දිවිමග අගය කරන්නෝ රළු බවින් යුතු පාසිවුරු ආදියත්, අපහසුකාරී (පැවිදි) දිවිපෙවෙතත් දැක පහදිති. යහගුණ දම් අගයන්නෝ සීලාදී කිසියම් ගුණ සමුදායක් මෙනෙහිකොට පහදිති. එහෙයින් හැමතැනකම භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කියති. ජනපදකලණ නන්දා මෙහෙණියද අසපුවට පැමිණ, නොයෙක් අයුරින් කියන බුදුගුණ අසා බුදුරදුන් වෙත යනු කැමතිව, මෙහෙණින්ට සැළ කළාය. මෙහෙණියෝ නන්දා මෙහෙණිය සමග බුදුහිමියන් වෙත පැමිණියාහ. භාග්‍යවතුන් වහන්සේද මුලදීම නන්දා මෙහෙණියගේ පැමිණීම දැන, කටුවකින් කටුවක්, ඇණයකින් තවත් ඇණයක් ඉවත් කරන මිනිසෙකු මෙන්, රූපයෙන්ම රූප මදය ඉවතලීමට, තම ඉඳු බෙලෙන්, පසළොස්-සොළොස්විය තරම් වූ ඉතා රූමත් කාන්තාවක් පසෙක සිට පවන් සලන අයුරු දැකීමට සැලැස්වූහ. මෙහෙණින් සමග පැමිණි නන්දා මෙහෙණියද භාග්‍යවතුන් වහන්සේට වැඳ උන්වහන්සේගේ පා තලයේ පටන් හිසකේ අග දක්වා රූ සිරි දැක, නැවත, පිටිපස සිටි, ඉඳු බලයෙන් දක්වන ඒ රුව ද දැක, 'අහා! මේ කාන්තාව (මටත් වඩා) රූමත් යැයි තම රූ මානය ඉවත ලා, ඒ රූපය කෙරෙහි දැඩි ඇල්ම පෑවාය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ කාන්තාව අවුරුදු විස්සක් තරම් දැකීමට සැලැස්වූහ. කාන්තාව සුන්දර පෙනුම ඇත්තේ අවුරුදු දහසයේදීමය. ඊට පසු එසේ නොවේ. ඇගේ රුව එසේ පිරිහෙනු දැක, නන්දා මෙහෙණියගේ රූපයෙහි ඇති දැඩි ඇල්ම හීන විය. එහිදී භාග්‍යවතුන් වහන්සේ, ඒ තැනැත්තිය දරුවකු බිහිනොකළ ලෙසින්, එක් දරුවකු වැදූ තැනැත්තියක ලෙසින්, මැදිවියේ, වැඩිමහළු ගැහැණියක ලෙසින් මෙන්ම අවුරුදු සියය දක්වා, කුදු ගැසුණු හැරමිටිය උදව් කරගන්නා, කැලැල් පිරි සිරුරෙන් යුතු අයුරුද දක්වා, බලා සිටියදීම, ඒ ගැහැණියගේ මරණයත්, ඉදිමුනු මළ සිරුරත්, කපුටන් රංචුගැසී මස් කන සැටිත්, දුගඳ හා පිළිකුල් බවත් දැකගැනීමට සැලැස්වූහ. නන්දා ඒ සිදුවීම දැක, 'මේ අයුරින් මට ද, අනෙක් හැමට ද එකසේ හැමදා පැවතිය නොහැකියැයි අනිස හැඟීම් ඇතිවිය. ඒ අනුව දුකත්, තමාටම කියා අයත් නොවන බවත් වටහා ගත්තාය. තුන්භවයම (ගිනි) ඇවිලගත් ගෙයක් බඳුව පිළිසරණක් නොමැති සේ වැටහිණ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ

'නන්දාවගේ සිත කමටහන් සඳහා සුදුසු වේ'යැයි දැන, ඇයට ගැළපෙන පරිදි මෙම ගාථා වදාළහ.

'ගිලන් බවට පත්වන, නොයෙක් රෝග වැළඳෙන, ඉතා පිළිකුල් සහගත, කුණුවන (ලේ, සැරව, මල මූ) කාන්දුවන, ගලන, අනුවනයන් සතුටුවනු ලබන, මේ සිරුර දෙස නන්දාවෙනි, බලන්න.'

'මේ කය යම්සේ වේද, ඒ කය ද එසේමය. කය පිළිබඳව ධාතු ලෙසින් ද, හිස් දෙයක් ලෙස ද විමසා බලන්න. ලෝකයට නැවත නොපැමිණෙන්න. (සසර ඉපදීම නවතන්න) සසරෙහි කැමැත්ත අත්හැර දමා, සන්සුන්ව හැසිරෙන්න. (කටයුතු කරන්න.)

**ආතුරං අසුචිං පූතිං පස්ස නන්දෙ සමුස්සයං**
**උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිනන්දිතං**
**යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං**
**ධාතුසො සුඤ්ඤතො පස්ස මා ලොකං පුනරාගම**
**භවෙ ඡන්දං විරාජෙත්වා උපසන්තා චරිස්සසී**

ගාථා අවසානයෙහි නන්දා මෙහෙණිය සෝවාන් පලෙහි පිහිටියාය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට මගපල ලබනු පිණිසත්, ජීවිතයේ හිස් බවත් පැහැදිලි කෙරෙන විදසුන් කමටහනක් සේ මෙම සූත්‍රය වදාළහ. මේ එහි එක් නිදාන කතාවකි.

භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වැඩවසන සමයෙහි, චීවරක්ඛන්ධකයෙහි විස්තර වන පරිදි සාලවතී ගණිකාවගේ දුව, ජීවකගේ කණිටු සොයුරිය වූ සිරිමා මවගෙන් පසුව ඒ තනතුර ලැබ, 'තරහා නොගැනීමෙන් ජය ගන්නේය' - 'අක්කොධෙන ජිනෙ කොධං' ආදී මේ ගාථා දෙසුමට අදාල වූ පුණ්ණක සිටු දියණියට අවමන්කොට, භාග්‍යවතුන් වහන්සේ කමා කරගනිමින්, දහම් අසා සෝවාන් බවට පත්ව, නිතිපතාම අටනමකට දන් පිරිනැමුවාය. ඒ දානයට නිරතුරුවම පැමිණෙන මහණෙක් ඈ කෙරෙහි රාග සිතිවිලි ඇතිකර ගත්තේය. ආහාරද නොගෙන නිරාහාරව වැතිර සිටි බව ධම්මපද අටුවාවෙහි කියන ලදී. එසේ හිඳින කල්හිම, සිරිමා කළුරිය කොට යාම දෙව්ලොව සුයාම දෙවියාගේ දේවිය වූවාය. මේ අතර, රජු විසින් ආදාහනය වළකා අමු සොහොනෙහි

වෙන්කර තබන ලද සිරිමාගේ මළසිරුර දැකීමට භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුද කැටුව, මහසඟ පිරිවරා වැඩියහ. එසේම රජු ද නුවරවාසීහු ද පැමිණියහ. 'පෙර (කහවණු) එක්දහස් අටක් වැයකළද, දැකීමත් දුලබය. අද ඇය තුට්ටුවක් දී හෝ දැකීමට කැමති කෙනෙකු නැතැ'යි එහි මිනිස්සු කතාබහ කරති. සිරිමා දෙවඟන ද පන්සියක් (දෙව් රථ) පිරිවරා එහි ගියාය. එහිදී භාග්‍යවතුන් වහන්සේ රැස්වූ පිරිසට දහම් දෙසීමේදී මෙම සූත්‍රයද, ඒ (රාගී හැඟුම් ඇතිවූ) මහණට අවවාද පිණිස 'මේ විසිතුරු කොට ඇති සිරුර බලව' - 'පස්ස චිත්තකතං බිම්බං' යන ධම්මපද ගාථාවද වදාළහ. මේ දෙවන නිදාන කතාවයි.

මෙම සූත්‍රයෙහි **චරං වා** යනු මුළු රූපකාය හෙවත් සිරුර යා යුතු දෙසට මුහුණ හරවාගෙන ගමන් කිරීමයි. ඒ ආකාරයෙන් යෑම හෝ, යදි **වා තිට්ඨං** ඒ සිරුරම එසවීම් ආකාරයෙන් සිටගෙන සිටීම හෝ, **නිසිනෙනා උද වා සයං** ඒ සිරුරම යට කොටස හකුළුවන, උඩ කොටස එසවීම් අයුරින් හිඳිමින් හෝ හරහට දිගා වී සිටිනා අයුරින් නිදාගැනීම හෝ, **සම්මිඤ්ජති පසාරෙති** ඒ ඒ ඉරියව් අනුව (අත් පා ආදී අඟ පසඟ) හකුළුවයිද, දිගහරියිද, **එසා කායස්ස ඉඤ්ජනා** මේ පණනල සහිත, හැඟීම් දනවන, සියළුම අයුරින් සිරුරෙහි සිදුවන කම්පන, සෙලවීම්, ගැස්සීම්, මෙහි වෙන කිසිවෙකු ඇවිදින්නේ හෝ දිග හරින්නේ නැත. එහෙත් 'ඇවිදිමි'යි සිතක් පහළ වූ කල, ඒ හේතුකොට කයෙහි වාතය පිරේ. ඒ අනුව, යා යුතු දිසාව දෙසට සිරුර ඉදිරියට ගෙනයෑම වෙයි. දිසාවට අනුව, රූපයට (කයට) ඇතුළු වේයැයි, පහළවේය යන තේරුමයි. එහෙයින් **චරං** යැයි කියනු ලැබේ. එසේම නැගී සිටිමියි සිත පහළ වූ කල, ඒ හේතුකොට කයෙහි වාතය පිරේ. එයින් සිරුර එසවීමක් වෙයි. ඒ ඒ අයුරින් රූපය (හෙවත් ඉරියව්වේ සොබාවය) පහළවීම වේ. ඒ අනුව **තිට්ඨං** යැයි කියනු ලැබේ. එසේම හිඳගනිමියි සිත ඇතිවූ විට, ඒ හේතුකොට කයෙහි වාතය පිරේ. එයින් සිරුර යටි කොටස හැකිළීමද, උඩ කොටසෙහි එසවීමද සිදුවෙයි. එයින් **නිසිනෙනා** යැයි කියනු ලැබේ. එසේම නිදාගනිමියි සිත පහළ වූ විට, ඒ හේතුකොට කයෙහි වාතය පිරේ. එයින් සිරුර හරහට - දිගහැරීම වෙයි. ඒ ආකාරයෙන් රූපය (ඉරියව්ව) පහළ වේ. එහෙයින් **සයං** යැයි කියනු ලබයි. මෙසේ යම් ආකාරයෙන් මේ නම ඇති යම් කෙනෙක් ඇවිදීමට හෝ සිටීම හෝ හිඳගැනීම හෝ නැතිනම්, නිදාගැනීම යන ඒ ඒ ඉරියව් පවත්වාගෙන යෑමේ ආකාරය අනුව හැකිලීම හා දිගහැරීම ලෙසින් හකුළුවයි. දිගහරියි කියනු ලැබේ. එහිදී

යම් ආකාරයකින් හකුළුවන දිගහරින සිත ඇතිවූ කල (කලින්) කියන ලද පරිදිම වේ. එහෙයින් එය සිරුරෙහි කම්පනයයි. ඒ හැර වෙනත් කිසිවෙකු නැත. පුද්ගලයෙකු හෝ නැත.

'නොයෙක් නොයෙක් සිත් පහළව, ඒ ඒ ආකාරයට වායුවද වෙනස් වේ. ඒ ඒ වෙනස්වන වායුවේ සොබාවය අනුව සිරුරෙහි කම්පන-සෙලවීම් ඇතිවේ.'

**චිත්තනානත්තමාගම්ම නානත්තං හොති වායුනො**
**වායූනානත්තතො නා නා හොති කායස්ස ඉඤ්ජනා**

මෙය මෙහි නියම තේරුමයි. (මෙම සූත්‍රයේ මුල් ගාථාවෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැහැදිලි කරති.) යම් ආකාරයෙන් එකම ඉරියව්වක දිගු වේලාවක් සිටීමෙන් සිරුරට වේදනාවක් වෙයි. එය දුරුකර ගැනීම පිණිස ඉරියව් වෙනස් කරයි. එහෙයින් **චරං** වා යැයි ඉරියව්වල දුක් සහගත බව පෙන්වා දෙති. එසේ ඇවිදින කල්හි නැවතී සිටීමක් සිදුනොවන බැවින් සියළුම දේ ඇවිදීම ආදිය මූලිකව ගෙන (නිදසුනක් සේ) එය සිරුරෙහි සෙලවීම යැයි කීමෙන් නිතියෙන්ම සැඟවී පවත්නා වෙනස්වන සොබාවද ඒ ඒ ඉරියව් සමගම යෙදෙන බැවින් **එසා කායස්ස ඉඤ්ජනා** යැයි ආත්මවාදය බැහැරකොට දක්වමින් ආත්මීය හැඟීමෙන් තදින් වැසී ඇති ආත්ම රහිත බව පෙන්වති.

මෙසේ තිලකුණු පෙන්වා දෙමින්, (ජීවිතයේ) හිස්බව හැඟෙන කමටහන - (සුඤ්ඤතා) වදාරා, නැවත හැඟීම් සහිත, හැඟීම් රහිත, අසුභ පිළිකුල දක්වනු පිණිස **අට්ඨිනහාරූ සංයුතෙතා** යැයි දේශනය ඇරඹූහ. එහි අරුත නම්, කයෙහි කම්පන, සෙලවීම් වෙයි. විසුද්ධිමග්ගයෙහි මෙම කය පිළිබඳ දෙතිස් ආකාර විස්තරයෙහිදී පැහැය, පිහිටීම, ආදී කොටස් ආකාරයෙන් (ඇති තතු හඳුනා සසසර වටහා ගැනීම) උත්සාහවත් කරමින්, සඳහන් කරන ලද තුන්සිය හැටක් වූ ඇටවලින්ද, නහර නවසියයකින්ද, එකට බැඳී පවත්නා බැවින්, **අට්ඨිනහාරූ සංයුතෙතා** එහිම සඳහන් කර ඇති පරිදි පාද කෙළවර ඇඟිලි සමෙන්ද, නවසියයක් මස්පිඬුවලින්ද තවරන ලදුව එකට බැඳී පවත්නා බැවින් **තචමංසාවලෙපනො** ඉතා දුගඳ පිළිකුල් සහගත යයිද දතයුතුය. එය කෙසේ දැනගත යුතුද? (ඉතා උස් නොවූත්, ඉතා මිටි නොවූත්) මැද

පමණට හැදුණු වැඩුණු මිනිසකුගේ මුළු සිරුරෙන් උලුප්පා ගන්නා ලද සිවිය ඩෙබර ඇටයක් තරම් වේ. මැස්සකු අවුත් සියුම් සමෙහි වැසූ විට, සම නිල් ආදී පැහැයෙන් යුතුව, ගෙයක බිත්තියක් මෙන් ආවරණ නො වන්නේය. මෙබඳු සියුම් බවක් තිබුණද, ඡවියා කායො පටිච්ඡනෙනා නුවණ නැමති ඇස නොමැති බැවින්, අනුවණ බොහෝදෙනා යථාභූතං න දිසසති සම පිළිබඳව රාගයෙන් ඇලුන තැනැත්තෙක්, ඉතා පිළිකුල් කටයුතු 'සම' යැයි කියන ලද උඩු හමද, සම හා වෙලුනු ඒ සිරුරත් පහත සඳහන් පරිදි කොටස් ලෙසින් ඇති තතු පරිද්දෙන් නියම අයුරින් නොදකිති.

'මස් පේසි - නව සියයකින් හා මසින් අවුලන ලද සිරුර, නොයෙක් පණුවන් ගැවසුනු අසූචි පිරුණු කුණුගොඩක් වැන්න'

> නව පෙසිසතා මංසා අවලිත්තා කලෙබරං
> නානාකිමිකුලා කිණණං මීළහට්ඨානංව පූතිකා

'බඹයක් පමණ වූ සිරුරෙහි නහර නවසියයකි. වැල්වලින් බඳින ලද ගෙයක් මෙන් ඇටසැකිල්ලකින් බැඳී පවතී.

> නව නහාරු සතා හොනති ව්‍යාමමතෙත කලෙබරෙ
> බනධනති අට්ඨිසංඝාටං අගාරාමිව වලලියො

මෙසේ සිරුර පිළිවෙලින් නහර හා බැඳී, කුණුවන, දුගඳ හමන ඇට තුන්සියයකින් වැසී තිබුණත් එය ඇති සැටියෙන් නොදකී. ඒ සියුම් හමෙහි මැස්සකු අවුත් වැහුවත්, සමෙහි ඇති තතු නොසළකා, සම පිළිබඳව ආසාවක් ඇතිකර ගත්තද, උඩුහමකින් වැසී ඇති බැවින්, හැමදෙනාටම නොපෙනෙන්නා වූ, ඇතුලත කුණුවන සොබාවෙන් යුතු ඉතා පිළිකුල් දුගඳ වහනය වන දේ ගැන නුවණ නැමති ඇසින් අනතපූරො උදර පූරො -පෙ- පිතතසස ච වසාය ච ආදී ලෙසින් විමසා බැලිය යුතුය. එහි බඩවැලින් පිරුණේ - අනතසස පූරො = අනතපූරො, උදරයෙන් පිරුණේ උදර පූරො උදර යනු කුසට සමාන වචනයකි. එය පිහිටීම අනුව උදර යයි කියන ලදී. යකපෙලසස අක්මාව යයි හඳුන්වන 'එක්ව බැඳුණු මස් පිඩුවකි. වත්ථිනො මුත්‍ර ය. පිහිටි තැන සළකා 'වත්ථි' යැයි කියන ලදී. එහෙයින් අක්මාව පිරෙන විට මුත්‍රාසය පිරේයැයි යොදාගත යුතුය. හදය- ආදිය පිළිබඳවද මේ අයුරිනි. අතුනු ආදී සියළුම දේවල

පැහැය, පිහිටීම, බෙදා දක්වා ඇති ආකාරය විසුද්ධිමග්ගයෙහි සඳහන් පරිදි දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මුතු, මැණික් සේ මෙහි ගතයුතු එකම දෙයක් හෝ නොමැති බවත්, හුදෙක් මේ සිරුර ඇතුලත කුණුවන, අපිරිසිදු පිළිකුල් සහගත දෙයින්ම යුතු බවත් දක්වා, දැන් ඒ ඇතුළත පිළිකුල් සහගත දෙයම පිටතට නික්මෙන පිළිකුල් දේ හා පැහැදිලි කරමින්, මුලදී සඳහන් වූ කරුණුද එක්කොට **අථස්ස නවහි සොතෙහි** යන ගාථා දෙක වදාළහ. **අථ** යනු කරුණු දක්වන ආකාරය අතර නිදසුනකි. වෙනත් ලෙසකින් කිවහොත්, අපිරිසිදු බව දකින්නැයි කියා ඇති පරිදිය. අස්ස මේ සිරුරෙහි, **නවහි සොතෙහි** ඇස් සිදුරු දෙකින්, කන් සිදුරු දෙකින්, නාස්පුඩු දෙකෙන්, කට, මළපහ මග සහ මුත්‍රා මගින්, **අසූචි සවති** මුළු ලොවෙහිම පතළ, නොයෙක් ලෙසින්, ඉතාම පිළිකුල්, දුගඳ හමන අපිරිසිදු දෙයම ගලා බසියි. වැගිරෙයි. අගිල්, සඳුන් වැනි සුවඳ හමන දෙයක් හෝ මුතු, මැණික්, රන් රිදී ආදී අන්කිසි වෙනත් දෙයකින් නොවේ. **සබ්බදා** ඒවා හැමවිටම, රැයද, දවාලෙහිද උදයෙහිද, සවස්කලද (නැවතී) සිටින විටද, ගමන්කරන විට (සිදුවෙයි) අපිරිසිදු යැයි කියන්නේ කුමක් නිසාද? **අක්ඛිම්හා අක්ඛිගූථකො** ඒවා අතර, ඇස් සිදුරු දෙකෙන් ඉවත හළ හමෙහි මස මෙන් (කබ), කන්සිදුරුවලින්, බැඳුණු කුණු තට්ටුවක් මෙන් වූ (කලාඳුරු) **කණ්ණගූථකො**, නාස්පුඩුවලින් සැරව බඳු, සිංඝාණිකා (සොටු) ද ගලයි. **මුඛෙන** ච වම කුමක් වමනය කරයිද? එකදා **පිත්තං** යම්විටක පිත කෝප වූ කල - වෙනස්කම් (සිරුරේ) ඇතිවෙයි. එය වමනය යැයි අදහස් කෙරේ. **සෙම්හඤ්ච** පිත පමණක් නොවේ, සෙම සිරුරෙහි, පාත්‍රයක් පිරෙන තරමට ඇත. ඒ සෙමද එක්විටක (වැඩියෙන්) වැගිරෙන 'වමන' සොබාවට පත්වෙයි. එහි පැහැය ආදිය විසුද්ධිමග්ගයෙහි සඳහන් පරිදි දතයුතුය. සෙම්හඤ්ච යන තන්හි ච අකුරෙන් සෙමද ලේ ආදී වෙනත් අපිරිසිදු දියර සොබාවයෙන් යුතු දේවල් ඇතුළත් වෙයි. මෙසේ දොරටු සතකින් අපිරිසිදු දේ පිටවන අයුරු දක්වා, සුදුසු කාලය හා පුද්ගල ලෙසින් දැන භාග්‍යවතුන් වහන්සේ දොරටු දෙකක් වෙනම වචනයකින් සඳහන් නොකොට, වෙනත් අයුරින්, මුළු සිරුරෙහිම අපිරිසිදු දේ ගලන සැටි **කායම්හා සෙදජල්ලිකා** යැයි වදාළහ. එහි **සෙදජල්ලිකා** දහඩිය ද ලුණු රස මුසු ඇලෙන සුළු අපිරිසිදු තට්ටුවක් මෙන් මේ සිරුරෙහි **සවති සබ්බදා** යන මෙම වචන සමග එක්විය යුතුය.

යම්සේ බත් පිසනවිට, සහල්ද, සැලියෙහි මලද පෙණ සමග උඩට නැගී, සැලියෙහි කට ඉක්මවා පිටතට ගලයි ද එසේම අනුභව කරන ලද ආහාර, පානය කරන ලද (දියර) දේ කුසෙහි ගින්නක් පැසවන කල්හී, ඒ ආහාරපානවල මල නැගී **අක්ඛිමහා අක්ඛිගූථකො** ආදී ලෙසින් නික්ම ඇස් ඉක්මවා පිටතට ගලයි. මෙසේ මේ සිරුරෙහි අපිරිසිදු බව දක්වා මීළඟට, ලොව උතුම්ම කොටස යැයි සම්මත හිසෙහි ඉතා උසස් බවම සිතමින් වැඳිය යුත්තන්ට ද (හිස නමා) නොවඳිත්ද, එහි නිසරු බවත්, අපිරිසිදු බවත් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ **අථස්ස සුසිරං සීසං** යන මේ ගාථාව වදාළහ. එහි සුසිරං-සිදුරයි. **මත්ථලුංගස්ස පූරිතං** දීකිරි පිරුණ කැකිරි (මද) මෙන් වූ හිස්කබල අතර මිදුළු රැසකින් පිරුණු (හිස්මොළය) ඒ හිස්මොළය ගැන ද විසුද්ධි මගයෙහි සඳහන් පරිද්දෙන් දතයුතුය. **සුභතො නං මඤ්ඤති** බාලො මෙසේ නොයෙක් ලෙසින් අපිරිසිදු දෙයින් පිරුණු සිරුර, අනුවණ තැනැත්තා වරදවා වටහාගෙන, යහපත්, පිරිසිදු, කැමැත්ත වඩවන, සතුට දනවන දෙයකැයි ආසාවෙන්, දැඩිව එබඳු අදහසින්ම, උසස් පහත් ලෙස සළකමින් (තණ්හා-දිට්ඨි-මාන) යන තුන් ආකාරයෙන් කල්පනා කරයි. කවර හෙයින්ද? **අවිජ්ජාය පුරක්ඛතො** සිවුසස් සඟවන මෝහයෙන් (සිත) පෙරටුකොට, යටත්කොට පවත්නා ලද හෙයිනි. මෙසේ අදහාගෙන, එම අදහස දැඩිසේ ගෙන 'මෙසේ හඟිමි'යි (තවදුරටත්) සිතාගැනීමයි. ඒ නොදැනීමේ-මුළාවීමේ අයහපත (කෙතෙක්දැයි) බලන්න.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සජීවීව (සිරුරෙහි) පිළිකුල් සහගත බව දක්වා, සක්විති රජුගේ සිරුර වුවද ඒ කියන ලද පරිදි පිළිකුල් සහගතම වේයැයි, සියළු ආකාරයෙන් සම්පත් ඇතිව ඉපදුණද, අයහපත දක්වා, දැන් අජීවී ලෙසින් සිරුරේ අයහපත්-විපත් බව ද පෙන්වාදීමට **යදා ච සො මතො සෙති** යන ගාථාව කීහ. එහි අරුත නම්, මෙබඳු වූ මේ සිරුර, යදා ආයුස, උණුසුම, හුස්ම ඉවත්වීමෙන්, **මතො**, වාතය පිරුණු මයිනහමක් මෙන් ව **උද්ධුමාතකො** පැහැය වෙනස් වීමෙන් **විනීලකො සුසානස්මිං** වැඩකට නැති ලී කොටයක් මෙන්, අත්හැර දමන ලද බැවින් **අපවිද්ධො සෙති** ඉක්බිති, දැන් මොහුගේ නැවත නැගිටීමක් නැතැයි තරයේම සිතා **අනපෙක්ඛා හොන්ති ඤාතයො** මළේ යැයි තිර නොමැති බව-අනිස බව දක්වයි. **සෙති** යනු හුස්ම ගැනීම නතරවීම අදහස් වේ. මේ වචන දෙකින්ම ජීවිතයෙහි සවිය, බලය නොමැති බව පෙන්වයි. **උද්ධුමාතො** යැයි පවත්නා වෙනස පෙන්වයි. **විනීලකො** සමෙහි

රාගය-ඇලීම දුකයි. මේ වචන දෙකෙන්ම රූපයට ඇති මානය නැති කිරීමද (සමෙහි) පැහැපත් බව නිසා වූ මානය නැති කිරීමද දක්වයි. **අපවිද්ධො** ගතයුතු දේ දක්වයි. **සුසානස්මිං** ඉවසා දරාගැනීමට අපහසු, නුසුදුසු ඇතුළත, පිළිකුල් බවයි. මේ දෙකෙන්ම මගේ යැයි යහපත් ලෙස සිතාගැනීම ඉවත් කරයි, **අනපෙක්ඛා හොන්ති ඤාතයො** (මළ පසු) පෙරදී මෙන් කළයුතු දෙයක් නොමැති බව දක්වයි. එයින්ද (ජීවත්වන විට) පිරිවර නිසා ඇති වූ මානයද නැති වීම අදහස් කරයි.

මෙසේ මෙම ගාථාවෙන් වෙන් නොවූ හැඟීම් සහිත වූ පිළිකුල් බව දක්වා දැන් වෙන්ව යන ආකාරයද දැක්වීමට **ඛාදන්ති නං** යන ගාථාව කීහ. එම ගාථාවෙහි යෙ ච'ඤ්ඤෙ කපුටන්, උකුස්සන් වැනි මළකුණු ආහාරයට ගන්නා වෙනත් සත්තු **පාණිනො සන්ති** එබඳු සත්තුද ඒ මළ සිරුර කති යන අදහසයි. ඉතිරි කරුණු පැහැදිලිය.

මෙසේ චරං වා ආදී ලෙසින් 'හිස් බව' සැළකෙන සුඤ්ඤත කමටහන ද අට්ඨී නහාරු සංයුත්තො ආදී ලෙස සජීව (සිරුර) යහපත් දෙයක් ලෙස ද, **යදා ච සො මතො සෙති** ආදී ලෙසින් අජීවී සිරුරෙහි අයහපත ද දක්වා, එකම පැවැත්මක්, තිර බවක්, සැපයක් නොමැති ඒකාන්තයෙන්ම සිරුරෙහි අසුබ පැත්ත, **සුභතො නං මඤ්ඤති බාලො අවිජ්ජාය පුරක්ඛතො** මෙයින් අනුවණයාගේ ගතිසොබාව පවසා, කරුණු හරිහැටි නොදැනීම නිසා සසර ගැන ඔහුගේ අදහස දක්වා, දැන් එම කරුණු ගැන නුවණැත්තාගේ ගති සොබාව වන වෙසෙස් දැනීමත්, සසර ගමනින් මිදීම පෙන්වාදීමට **සුත්වාන බුද්ධවචනං** යනුවෙන් (පහදා දීම) ඇරඹූහ. **සුත්වාන** නුවණින් මෙනෙහි කරමින් අසා, **බුද්ධවචනං** සිරුර (සසරින්) සිඳ දමන පිළිවෙල (නැවත භවයක නොඉපදීම) ඇතුළත් බුදු වදන, **භික්ඛු** මුල් මග පල තුන ලැබූ මහණ හෝ මගපල නොලද මහණ හෝ, **පඤ්ඤාණ** වා විදසුන් මගින් (හැම දෙයකම) තිර නොවන බව දැකීමෙහි යුතු නුවණ **පඤ්ඤාණ** යැයි කියනු ලැබේ. එම නුවණින් යුතු යන තේරුමයි. **ඉධ** සසුනෙහි, **සො බො නං පරිජානාති** මේ සිරුර තුන් ආකාරයකින් වෙසෙසින් දැන ගනී. ඒ කෙසේද? යම්සේ අත්දැකීම් ඇති වෙළෙන්දෙකු, භාණ්ඩයක සුදුසු නුසුදුසු බව - හොඳ නරක (ඉදංඤ්චිදං) සළකා බලා, මෙපමණකට ගත් කල මෙපමණ ලාභයක් වන්නේ යැයි සසඳ එසේ කොට ඒ ලාභය සහිතව (විකුණා) භාණ්ඩය අත්හැර දමයි. එපරිදිම 'මේ ඇට, නහර ආදී ඒවාය. මේ කෙස් ලොම් ආදියයි, යනුවෙන්

නුවණ නැමති ඇසින් බලමින්, වෙසෙසින් හඳුනා ගනී. මේ සියළු දේ සදාකල් තිරව නොපවතී. (එහෙයින්) දුක ඇතිවේ. (මට) අයත් නොවේ යැයි සසඳමින් නුවණින් තීරණයකොට දැනගනී. මෙසේ තීරණය කොට, බුද්ධාදී උතුමන්ගේ මගට පැමිණෙමින්, එහි කැමැත්ත හෙවත් ඡන්දරාගය දුරු කිරීමෙන්, එය දුරුකරන ලදැයි පිරිසිඳ දැනගනී. ජීවී හා අජීවී ලෙස අසුබ ලකුණු දකිමින්, ඒ පිළිබඳව වෙසෙසින් පිරිසිඳ දැනගනී. තිර වූ පැවැත්මක් නැතැයි (අනිච්චා) මැනවින් දැන තීරණය කරයි. අරහත් මගින් ඒ දැඩි කැමැත්ත ඉවතට ඇද දමා, එය ඉවතලමින්, එසේ ඉවත හළ බවද වෙසෙසින් පිරිසිඳ දැනගනී. මෙසේ ඒ මහණ දැනගන්නේ කවර ආකාරයෙන්ද? **යථාභූතං හි පසසති** නියම අයුරින්ම - ඇති සැටියෙන්ම දැනගනී යනු අදහසයි. **පඤ්ඤාණවා** ආදී ලෙසින් කී පරිදි ඒ කාරණයෙහිලා අදහස මුදුන්පත් වූ කල්හී, බුදුවදන් අසා ඒ මහණ හට පැණවත් බව ඇතිවෙයි. සියළු ජනයාට පැහැදිලි වන ආකාරයට කය පිළිබඳව නොඅසා බුද්ධ වචනය මැනවින් ඉගෙනීමට නොහැකිය. එහෙයින් ඒ නුවණ හේතුකොට මෙයින් පිටතද කරුණු දැනීමට ඒ මහණට ඇති හැකියාව පෙන්වාදීමට **සුත්වාන බුද්ධවචනං** යැයි වදාළහ. නන්දා මෙහෙණියටද, සිත් පෙරළියක් ඇතිවූ මහණ ද අරබයා පවත්වන ලද දේසනයෙන්, ඒ ඉතා උසස් පිළිවෙතට පත්වන පැවිද්දෙකුගේ සොබාවය දක්වමින් **භිකඛු** යැයි වදාළහ.

දැන් **යථාභූතං හි පසසතී** යන තන්හි, නුවණින් ඇති සැටියෙන් දකී ද එය පැහැදිලි කිරීමට **යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං** යැයි වදාළහ. එහි අදහස නම්, **යථා ඉදං** (මේ සිරුර) ජීවය සහිත යහපත් සේ දකින, වයස, (ජීවිත කාලය) උණුසුම, හුස්ම (ගැනීම-හෙළීම) වැනි දේ ගැන නොසළකා ඇවිදියි, සිටියි, හිඳියි, නිදාගනී, **තථා එතං** දැන් සොහොනෙහි දමන ලද මේ අජීව සිරුර පිළිබඳවද මෙසේ සිදුවන බව කලින් නොසැළකීය. **යථා එතං** දැන් මළ සිරුරක් බැවින්, නොඇවිදී, නොසිටී, නොහිඳී, නිදා නොගනී. **තථා ඉදං** හුස්ම ගන්නාවිට (ජීවත්ව සිටිද්දී) එබඳු සොබාවයට පත්වන බව හෝ, මේ සිරුරෙහි ජීවය නොමැතිව මළ බවට පත්වන තෙක් පෙර එසේ නොවූ බවත්, සොහොනෙහි නොදමන බවත්, ඉදිමීමේ සොබාවයකට පත් නොවීමත්, දැන් ජීවය නොමැතිව මළ බවට පත්ව, සොහොනෙහි දමා ඇති අතර, ඉදිමීම් ආදී ස්වභාවයට පැමිණ ඇත. ජීවය සහිත සිරුරකට ද මෙසේ වන්නේ යැයි (මෙනෙහි කළ යුතුය.) **යථා ඉදං තථා එතං** තමා හා සමාන කරමින් අනුන්ගේ

දොස් දැකීම දුරුකරයි. යථා එතං තථා ඉදං මළසිරුර හා තමා සමාන කරමින්, තමා කෙරෙහි වූ ඇල්ම දුරුකරයි. යම් අයුරින් තමා හා අනුන් සමව සිතයිද, එය දැනගැනීමෙන් දෙකොටසෙහිම මෝහය දුරුවෙයි.

මෙසේ ඇති තතු ඒ ආකාරයෙන්ම දැකීමෙන්, පෙර තිබූ අකුසල මුල් නැතිකොට ඊට පිළිපන් මහණහට අනුපිළිවෙලින් අරහත් බවට පත්ව, සියළුම කාමරාග මුළුමනින්ම ඉවතලීමට හැකිවේද, එහෙයින් අජ්ඣත්තඤ්ච බහිද්ධා ච කායෙ ඡන්දං විරාජයෙ යනුවෙන් වදාළහ. එවං පටිපන්නො භික්ඛු අනුපුබ්බෙන ඉතිරි වූ පාඨයකි. (සූත්‍රයෙහි නොදැක්වේ.)

මේ ආකාරයෙන්, සෝවාන්, සකදාගාමි, අනාගාමි පල දක්වා (සෙක්ඛ භූමි) අරහත් පල දක්වමින් ඡන්දරාග විරත්තො සො යැයි වදාළහ. එහි අරුත නම්, ඒ මහණ අරහත් මග නුවණින් පඤ්ඤාණ වා මග අතර වන ඡන්දරාග විරත්තො වෙයි. මරණය නොමැති බැවින්, (ඒ නිසාම දුක ද නැති බැවින්) උසස් රසයක් වන අදහසින් හෝ අමතං සියළු එක්රැස් කරන දෙයින් (සංඛාර) නිදහස් වීමෙන් සන්තිං 'වාන' යනුවෙන් හඳුන්වනු ලබන තණ්හාවද දුරුකරන ලද බැවින්, නොමැති බැවින් නිබ්බාණං චුතවීම, අභාවය නැති බැවින් අච්චුතං යයි පසස්නා ලද පරිදි පදමජ්ඣගා කියනු ලැබේ. නැතහොත් ඒ මහණ අරහත් මග නුවණින් මගපල අතර සිටියේ, ඡන්දරාගය දුරුකළේ නම් වෙයි. ඉහත කියන ලද පරිදි නිවන අවබෝධ කළේ යැයි දතයුතුය. මෙයින් ඒ මහණගේ (කෙලෙස්) නැතිකිරීමද වෙයි. මෙය ඒ මහණ විසින් ලබන ලදැයි පැහැදිලි කරයි.

මෙසේ ජීව අජීව ලෙස (සළකා) අසුභ කමටහන් ද, එහි අවසානය (හෙවත් නිවන) ගැනද කියා, නැවත කෙටියෙන් දේශනා කරමින්, ඒ මහත් වූ උතුම් වූ ආනිසංසයට අනතුරුදායක වූ (දහම් නිය අනුව ජීවිතය පවත්වා ගැනීමෙහි) පමාවීමට ගරහමින් දිපාදකො යන (ගාථාව) වදාළහ. පාද නොමැති වුවත් සිරුරු අපිරිසිදුමය. මෙහිදී පාද රහිත අපිරිසිදු (කුණුවන සොබාවට පත්වන) සිරුරු වුවත් (මාළු වැනි) යම් ආකාරයෙන් ලුණු, ඇඹුල් ආදිය යොදා වෙනත් 'අමුතු' ලෙස හෝ 'වෙසස් රසවත්' ලෙස, (උක්කට්ඨ වසෙන) (ජාඩි/ටින් මාළු වැනි) මිනිස් පරිභෝජනය පිණිස සකස් කරගත්තද, මිනිස් සිරුර එසේ කළ නොහැකිය. අපිරිසිදු, පිළිකුල් බවම පෙන්වා දෙමින්, දිපාදකො යැයි කීහ. අයං මිනිස්

සිරුර ගැන සඳහන් කරයි. **දුග්ගන්ධො පරිහීරති** දුගඳට සමානව මලින්, සුවඳින් තවරා (සුවඳ විලවුන් ඉස) පරිහරණය කරනු ලබයි. **නානා කුණප පරිපූරො** කෙස් ආදී නොයෙක් ආකාර වූ අපිරිසිදු වන දෙයින් පිරුණු, **විස්සවන්තො තතො තතො** මලින් සුවඳ ආදියෙන් සඟවන්නට උත්සාහ කළද, ඒ උත්සාහය පල රහිතකොට, දොරටු නවයකින් කෙළ, සොටු ආදියත්, රෝම කූපවලින් ලාටු මෙන් ඩහදිය ද වැගිරේ. දැන් ඒ දෙස බලන්න, **එතාදිසෙන කායෙන යො** කිසියම් අනුවණ පිරිමියකු හෝ ගැහැණියක හෝ, **මඤ්ඤෙ උන්නමෙතවෙ** තණ්හා දිට්ඨි මානයෙන් යුතුව 'මම'ය හෝ මාගේය හෝ නොවෙනස්ව පවතීය යනුවෙන් යම් කෙනෙක් උසස් පහත් ලෙස සළකනු ලබන්නේ නම්, **පරං වා** (ඉපදුණු) කුල ආදිය **අවජානෙය්‍ය** තමන්ගේම උසස් බව පෙන්වමින්, **කිමඤ්ඤත්‍ර අදස්සනා** බුද්ධාදී උතුමන් ගත් මග හැරදමා, උතුම් ඇත්ත නොදැකීමෙන්, මෙසේ උසස් පහත් ලෙස සලකනු ලබන්නේ කුමක් නිසාද?

'අහෝ! මම ඇත්තෙන්ම අනුවණ වූයෙමි. මට ම ගැලපෙන සේ නොයෙක් දහම් දෙසුම් පවත්වන භාග්‍යවතුන් වහන්සේට උවටැන් කිරීමට නොපැමිණියෙමි'යි දේසනය අවසානයෙහි නන්දා මෙහෙණිය සංවේගයට පත්වූවාය. මෙසේ සංවේගයට පත්ව, ඒ දහම් දෙසුමටම සිත යොමුකරමින් එයම භාවනා අරමුණු කොට, කිහිප දිනකින්ම අරහත් බව අවබෝධ කළාය. දෙවන වරටද පවත්වන ලද දේසනය අවසානයෙහි, අසූහාර දහසකට දහම් අවබෝධ විය. සිරිමා දෙව් කුමරිය අනාගාමී පලයෙහිද, (ඇයට ඇළුම් කළ) ඒ මහණ සෝවාන් පලයෙහිද පිහිටියේය.

**කායවිච්ඡන්දනික සූත්‍ර විස්තරය නිමි.**

## 1.12

**සන්ථවාතො භයං ජාතං** යනු මුනි සූත්‍රයයි. එය දේශනා කිරීමට හේතුව කුමක්ද? මෙම සූත්‍රයෙහි සියළුම ගාථාවලට හේතුවූයේ එකම කරුණක් නොවේ. එහෙත් එහි මුල පටන් සිවුවන ගාථාවට අදාල වන

කතාවයි මේ, භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයෙහි ගම්වැසි එක් දිළිඳු, වැන්දඹු ගැහැණියක් තම පුතු පැවිදිකොට, මෙහෙණින් අතර පැවිදි වූවාය. ඒ දෙදෙනාම සැවැත් නුවරම වස් එළඹ නිතර එකිනෙකා දකිනු කැමති වූහ. මව කිසියම් දෙයක් ලැබුණුවිට පුතුට ගෙන යන්නීය. පුතුද ලද දෙයක් මවට ගෙන යයි. මෙසේ උදේත්, සවසත්, එකිනෙකා හමුව ලද ලද දේ බෙදා ගනිමින්, සතුටුසාමීචියෙහි යෙදෙමින්, සැප දුක විමසමින්, බිය සැක නොමැතිව සිටියහ. නිතර නිතර දැකීමෙන් ඔවුන් අතර ඇසුර වැඩිවිය. ඒ ඇසුර එකිනෙකා තදින් ඇදහීමත්, ඒ ඇදහීමෙන් වැරදි සිදුවීමට ඇති ඉඩකඩත්, රාගයෙන් මැඩුණු සිත්වලට පැවිදි ජීවිතය ගැනද, මව පුතු හැඟීමද අතුරුදන් කරනු ලැබීය. එයින් සීමා ඉක්මවා අයහපත් දෙයෙහි නියැලුණහ. අවමානයට පත්ව, උපැවිදි වී ගිහිව වාසය කළහ. සංඝයා වහන්සේලා එය භාග්‍යවතුන් වහන්සේට සැළකළහ. 'මහණෙනි, කිමෙක්ද? මව පුතු කෙරෙහි රාගයෙන් නොඇලිය යුතු බවත්, පුතු මව කෙරෙහි රාගයෙන් නොඇලිය යුතු බවත්, ඒ හිස් මිනිසා නොදනීදැ'යි ගරහා, 'මහණෙනි, මම වෙනත් එකම රූපයක් නොදකිමි. 'නාහං භික්ඛවෙ අඤ්ඤං එක රූපමපි සමනුපස්සාමි' ආදී ලෙසින් වෙනත් සූත්‍ර දේසනයෙන්ද මහණුන් (දහමෙහි) උනන්දු කොට, 'එබැවින් මහණෙනි, ඉතා නපුරු වසවිසක් මෙන්ද, තඹලෝ සැලියක උණුවෙන තෙල් මෙන්ද කාන්තාව දුරුකළ (යුතු) වන්නේය.

විසං යථා හලාහලං තෙල මුක්කට්ඨිතං යථා
තම්බලොහ විලීනංව මාතුගාමං විවජ්ජයෙ යනුවෙන්ද කියා නැවත දහම් දෙසනු පිණිස **සන්ථවාතො භයං ජාතං** යන තමා උපමා කෙරෙන ගාථා සතරක් වදාළහ.

එම ගාථාවෙහි **සන්ථවො** තණ්හා, දිට්ඨි, මාන ලෙස තුන්ආකාර යැයි පෙර කියන ලදී. මෙහි තණ්හා, දිට්ඨි අදහස් කෙරේ. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ **සන්ථවාතො භයං ජාතං** යැයි කීහ. 'බලවූ, මහණෙනි, නිතර දැකීමට කැමතිව, ඇලීම් ආදී ආසාවෙන් ඒ හිස් මිනිසාට බලවත් කෙලෙස් බය හටගත්තේය. එය දරාගත නොහැකිව මව කෙරෙහි වැරදි ලෙස කටයුතු කළේය. තමාට එල්ලවන අපහාස හෝ මහත් බය නිසා හෝ සසුන අතහැර ගිහි බවට පත්විය. **නිකෙතා** 'ගහපතිය, රූපය නිමිතිකොට ගිහිගෙයි වාසය කිරීමේ බැඳීම **නිකෙතසාරී** යැයි කියනු ලැබේ. **රූපනිමිත්තනිකෙත විස්සාරනිවිබන්ධා ඛො ගහපති, නිකෙතසාරීති**

**වුච්චති** යනුවෙන් කියන ලද පරිදි ඒ අරමුණ දැඩිව සිතට ගැනීමයි. **ජායතෙ රජො** රාග, ද්වේස, මෝහ නැමති දූවිලි හටගැනීමේදී, කුමක් නිසා කියන ලද ද? හුදෙක් එබඳු තැනැත්තාට එක්ව ඇසුරු කිරීමෙන් පමණක් බිය ඇති නොවේ. එම කෙලෙස්වලට වසන තැනක් (රැඳෙන තැනක්) සේ ඒවා අරමුණු කොට නිකෙත යැයි කියනු ලබයි. දැන් ඔහුගේ සංවර බව බිඳී ඇති බැවින්, සංවර සීමා ඉක්මවා ඇති බැවින්, පහසුවෙන්ම කෙලෙස් දූවිලි හටගන්නා නිවහනක් වෙයි. එයින් කිලිටි වූ සිතින් බොහෝ දුකට පැමිණෙන්නේය. නැතහොත් 'බලව, මහණෙනි, එක්ව ඇසුර නිසා මේ හිස් මිනිසාට බය ඇති වූවා සේම, මග පලයකට නොපත් සියළුම ජනයාට කෙලෙස් දූවිලිවලට නිවහන වේයැයි මෙසේ පද දෙකට යෙදිය යුතුය. භාග්‍යවතුන් වහන්සේ මේ මුල් පද දෙකෙන් පුහුදුන් මිනිසාගේ (කරුණු) තේරුම්ගන්නා අයුරු දොස් දක්වා තම දැකීම පසසමින් **අනිකෙතං** යැයි පසු පද දෙක වදාළහ. ඉහත කියන ලද පරිදි, ගිහිගෙයි පිළිකෙව් කිරීම **අනිකෙතං** කෙලෙස් සහගත ඇසුරක් නොවීම **අසන්ථවං** යැයි දතයුතුය. මේ නිවනට සමාන පද දෙකකි. **එතං වෙ මුනි දස්සනං** මෙම ගිහිගෙය පිළිකෙව් කිරීම සහ කෙලෙස් සහගත ඇසුර බුදුමුනිවරුන් විසින් දක්නා ලදැයි තේරුමයි. වෙ යනු පුදුමය අරුත දනවන නිපාතයකැයි දතයුතුය. එයින්ද ගිහිගෙයි ඇසුරු කිරීමෙන්, මව පුතු කෙරෙහි වැරදි අයුරින් පිළිපදිනවිටකදී, ගිහි නිවස හා ඇසුරෙන් ඈත්වී මුනිවරයන් වහන්සේ විසින් දක්නා ලද්දේ, අහා! පුදුම දෙයකි යන අදහස මුල් වේ. නැතහොත් මුනිවරයාගේ එම දැක්මම - මුනිදැකුමයි - මුනිදස්සනං - දස්සන නම් කැමැත්ත හෝ පියතාවයයි.

යම් මහණකු කිසියම් දෙයක් කෙරෙහි ඇතිකරගන්නා, උපදවා ගත් කෙලෙස් හැඟීම් මෙන්ම උපන් අකුසල් දුරු කරන්නේද, එසේ උත්සාහ කරමින්, ඒ දේ කෙරෙහි නැවත හටනොගන්නා ලෙස ඒවා ඉවත ලන්නේද, වත්මනෙහි (ඒ වේලාවෙහි) පවතින්නා වූ ඒ කෙලෙස් අනාගතයටද (තවදුරටත්-මතුවටද) පැවැතීමට ඉඩ ඇති බැවිනැයි දෙවන ගාථාවෙහි **යො ජාතමුච්ඡිජ්ජා** යනුවෙන් කියනු ලැබේ. **න රොපයෙය්‍ය ජායනතං** යම්සේ නූපන් අකුසල් ඇති නොවීමට වෑයම් කරමින්, නැවත අකුසල් ඇතිකර නොගන්නේ යැයි තේරුමයි. එසේ උපදවා නොගන්නේ කෙසේද? **අස්ස නානුප්පවෙච්ඡෙ** කෙලෙස් හටගැනීමට හේතුවන කරුණු මතුවීමට ඉඩ නොදෙන්නේය. ඒ කරුණු එක්තැන් නොකරන්නේය. මෙසේ එක්රැස් නොකරන බැවින්, ඒවා හටගෙන වැඩිදියුණු වීමටද ඉඩ

නොතබන්නේය. නැතහොත්, මගපල සඳහා වන භාවනාවෙන්, කලින් තිබූ කෙලෙස් උදුරා, සිඳ දමනු ලබයිද, එවිට මතු විපාක නොමැති බැවින්, වත්මනෙහිද (කෙලෙස් සිඳ දමන ලද මොහොත) වැඩි දියුණුවීමක් එහි නොමැත. කෙලෙස් ඉපදවීම නසන ලදින්, අනාගතයෙහිද පවත්නා වූ සිත් පරම්පරාවකටද පිවිසීමට ඉඩක් නැත. එහෙයින් යම් මහණෙක්, උතුම් මගපල ලබන භාවනාවෙන්, හටගත් කෙලෙස් උදුරා දමා, යළි ඇති නොවන ලෙස, වැඩිදියුණු වීමට කටයුතු නොකරයි. මතුවටද එහෙයින් මතුවටද ඒවා හටගැනීමේ ඉඩක් නැත. **තමාහු එකං මුනිනං චරනතං අද්දක්ඛි සනතිපදං මහෙසී** ඒකාන්තයෙන්ම කෙලෙස් රහිත බැවින් මෙහි යෙදෙන අයුරු මෙසේද දතයුතුය. **එකං** උසස් යන අරුතින් හෝ එකං නම් වේ. **මුනිනං** මුනිවරයකු, මුනිවරුන් අතර හෝ එක් මුනිවරයෙකු **චරනතං** හැම අතින්ම පිරිපුන්ව ලොවට හිතසුව පිණිසද, මුනිවරයාට අදාල වන හැසිරීම් රටාව අනුව යන, **අද්දක්ඛි** දුටුවේය. **සො** හටගත් කෙලෙස් උදුරා හරිමින්, නැවත හටගැනීම වැළැක්වීමට සමත් වූ ඒ මුනිවරයා, න රොපයෙය්‍ය, ජායනතමසස නානුපපවෙචෙඡ යනු (ඉහත) සඳහන් කරන ලද බුදුවරයා, රහතන් වහන්සේ හෙවත් මුනිවරයා, **සනතිපදං** සන්සිඳුණු කොටස, දෙසැටක් වැරදි දැකීම්, විදසුන්, නිවන යන කරුණු තුනක් අතරින්, සම්මතයක් ලෙස සැළකෙන සන්සිඳීම කෙලෙස් යටපත් කිරීමෙන් ලබන සන්සිඳීම හා මුළුමනින්ම (කෙලෙස් නැතිකොට) ලබන සන්සිඳීම උසස්ය. මෙසේ කලබලකාරී ලෝකයෙහි සියළු දෙයින්ම නිදහස්ව ලබන - ඒවා ඉක්මවා ලබන සන්සිඳීම උසස් බව පසක්ව දුටුයේ **මහෙසී** යැයි මෙසේ අරුත දතයුතුය.

තුන්වන ගාථාවෙහි **සංඛාය** ගණනය කොට, පිරිසිඳ, විමසා, ඇති සැටියෙන් දැන, මුළුමනින්ම දුක මනාව දැනගෙන, යන තේරුමයි. **වත්‍ථුනි**, මේ ලෝකය ඛන්ධ-ධාතු-ආයතන ලෙසින්, කෙලෙස් කෙලෙස් හටගන්නා තැන් සේ සකස් වී ඇත. **පමාය බීජං** ඉහත දක්වන ලද, ඒ ඒ කොටස්වලට මුල්වන - සකස්වන කරුණු දැන, (ඒ දුක්) ඇතිවීමට මුල හිංසාකොට - වද දී මුළුමනින්ම නැතිකිරීමෙන්, නැවත නොවැඩෙනා සේ, නැවත ඇතිනොවන සේ, නැත්තටම නැති කිරීමෙන් යන තේරුමයි. **සිනෙහමසස නානුප්පවෙචෙඡ** යම් ලෙසකින් ආසාව දැඩිව ගත් හැඟීම් දැකීම් (තණ්හා දිට්ඨී) යන සෙනෙහසින් තෙත් කරන ලද එම මූලබීජය නැවත වැඩෙන ලෙසින්, (ඉහත) කියන ලද ඛන්ධ ආයතන ආදී අස්වනු වැඩිදියුණු වන්නේ ද, ඒ සෙනේහයට ඇතුළුවීමට පිවිස රැඳී සිටීමට ඉඩ

නොදේ. එයට වෙනස්වන පරිදි මගපල අරමුණු වන භාවනා මගින් ඇතුළුවීමට ඉඩ නොදෙන්නේය යන තේරුමයි. **ස වෙ මුනි ජාතිඛයන්ති දසසී** මෙබඳු වූ බුද්ධ මුනිවරයා නිවන අවබෝධයෙන් ඉපදීම, මරණය කෙළවර කරන නිවන දක්නා ලද බැවින්, ඉපදීම ඇති නොවීමද දුටු සේක. **තක්කං පහාය න උපෙති සංඛං** මෙම සිවුසස් අධිගමය වන භාවනාවෙන්, නව ආකාර වූ අකුසල සිතිවිලි හැරදමා, සෝපාදිසෙස විඤ්ඤාණය හැරදැමීමෙන්, අනුපාදිසේස නිවනට පත්ව, (මතු භවයක) දෙවියෙකු හෝ මිනිසෙකු හෝ ලෙසට හඳුන්වනු නොලබන බවට පත්වෙයි. කෙලෙස් නැති කිරීමෙන් හෝ කාම සිතිවිලි ආදිය නැති නොකරන ලද බැවින් මේ අනුවණ තැනැත්තෝ (රාගයෙන්) රත් වූ හෝ නපුරු හෝ යැයි පිළිගැනේ. **එවං තක්කං පහාය න උපෙති සංඛං** යන තේරුම මෙසේ දතයුතුය.

සිවුවෙනි ගාථාවෙහි අඤ්ඤාය තිර පැවැත්මක් නැතැයි, අනිස ලෙසින්, **සබ්බානි** - ඉතිරි නැතිව - සියල්ලම, **නිවෙසනා** කාමාදි භවයන්හි, එහි විසීමෙහි, එහි වාසය කරන්නවුන් කෙරෙහි, එහෙයින් නිවෙසනා කියනු ලබයි. **අනිකාමයං අඤ්ඤතරම්පි තෙසං** මෙසේ දැඩිව ගත් හැඟීම්-අදහස් ආදිය කෙලෙස් ලෙස රඳවා ගැනීමට බලාපොරොත්තු නොවෙමින්, **සො** එබඳු ආකාර වූ බුදු මුනි, මගපල භාවනා බලයෙන් තණ්හාවෙහි ඇලීමෙන් මුළුමනින්ම ඈත්වූ බැවින් විගතගෙධො ඇලීම දුරුකරන ලද බැවින් **අගිද්ධො** වේ. තණ්හා ඇලීමෙන් ඈත්නොවූ කෙනෙක් 'මා ඇලීම් දුරුකරන ලදැයි' නොදැනීමය. **නායූහති** යනු ඒ ඒ කෙලෙස් රඳන, ඇතිවන තැන්හී හටගන්නා කුසල හෝ අකුසල නොකරයි, හේතුව කුමක්ද? **පාරගතො හොති** මෙබඳු කෙලෙස් රඳනා තැන්වලින් එතර වූ නිවනට ගියේය යන අරුතයි.

මෙසේ මගපල නොලදවුන්ගේ දැක්ම හෙවත් පිළිවෙත අගය නොකොට තම දැකීම පළමු ගාථාවෙන් පසසමින්, දෙවන ගාථාවෙන් යම්බඳු කෙලෙස්වලින් මගපල නොලැබූවන් සැනසීමට පත් නොවේද, ඒවා නැතිකිරීමෙන් තමන් ලද සැනසීම පසසමින් ද, තුන්වන ගාථාවෙන් යම් ඛන්ධධාතු ආදියෙහි විවාද කිරීම් අත්නොහැර, ඒ ඒ දේ ගැන සැක උපදවා ගනීද, සිවුසස් භාවනා මගින් ඒ විවාද හැර, සැක ඉවතලීම ගැන පසසමින්, සිවුවන ගාථාවෙන් නැවත යම් කෙලෙස් හැඟුම් හෙවත් නිවෙසන එක්කර ගැනීමට කැමති පුහුදුන් තැනැත්තා සසර බැඳ තබන

ආසා රැස් කරයිද, එබඳු ආසා රහිත බැවින්, තම එක්රැස් නොකිරීම් පසසමින්ද රහත් බව කුළුගන්වමින්ම ඒ එකම අදහස දෙන පරිදි දේසනය නිම කළහ.

සබබාභිභූ යන ගාථාව දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? මහබෝසතාණෝ මහබිනික්මන් කොට අනුපිළිවෙලින් බුදුබවට පත්ව දම්සක් පැවැත්වීමට බරණැසට යද්දී බෝමැඩටත් ගයාවටත් අතර උපක ආජීවක හමුවූහ. උපක, 'ඇවැත්නි, ඔබගේ ඉඳුරන් පැහැපත් ය' යනුවෙන් පැවසූ විටදී 'විප්පසනනානි බො තෙ ආවුසො ඉන්‍ද්‍රියානි' 'සියල්ල මම මැඩ පැවැත්වීමි' 'සබබාභිභූ' යැයි වදාළහ. උපක 'ඇවැත්නි, එසේද විය හැකියි' - 'හුවෙය්‍යපාවුසො' කියා හිස සොලවා වෙනත් මගකට පිවිසියේය. පසුව වංගහාර ජනපදයෙහි එක්තරා (දඩයම්කොට ජීවත්වන) වැදිගමකට පැමිණියේය. එහි වැදි නායකයා, උපක දැක, 'අහා! මේ මහණ ආසා අඩු, චාම් දිවිපෙවෙතක් ඇත්තෙකි, රෙද්දක් හෝ නොහඳී. මොහු ලොවෙහි අරහත් කෙනෙකැ'යි ගෙට කැඳවා ගොස්, මස් රස මුසු ආහාර වළඳවා, අනුභවයෙන් පසු, අඹුදරුවන් සමග නමස්කාර කොට, 'හිමියනි, මෙහිම වාසය කරනු මැනවි, මම සිවුපසයෙන් උවටැන් කරන්නෙමි'යි ආරාධනා කොට, වාසය කිරීමට සුදුසු තැනක් සකසා දුන්නේය. ඔහු එහි වාසය කරයි. මුවවැදි නායකයා පායන කාලයෙහි ජල පහසුව ඇති සීතල පෙදෙස්වල සතුන් දඩයමෙහි යනවිට, 'අපගේ රහතුන්ට මැනවින් උවටැන් කරව'යි ජාව නම් දුවට අණකොට, පුතුන් හා සොහොයුරියන් සමග ගියේය. ඒ දියණිය මනා අඟපසඟින් යුතු දැකුම්කළු තැනැත්තියකි. පසුදින, ගෙට ආ උපක, ඒ දැරිය සියළු ගරුබුහුමන් දක්වා අහර වැළඳවීමට පැමිණෙනු දැක, රාගයෙන් මැඩුණේ අනුභව කිරීමට ද නොහැකිව අහර බඳුන ද රැගෙන වසන තැනට ගොස් බඳුන පසෙක තබා, 'ජාවා ලදොත් ජීවත් වෙමි. නැතහොත් මැරෙමි'යි නිරාහාරව නිදාගත්තේය.

සත්වන දවසෙහි දඩයම් වැදි නායකයා පැමිණ, දියණියගෙන් උපක ගැන තොරතුරු ඇසුවේය. එක් දවසක් අවුත් නැවත නොපැමිණි බව ඇය කීවාය. දඩයම් වැදි නායකයා පැමිණි අයුරින්ම උපක වෙත පැමිණ විමසන්නෙමි'යි එකෙණෙහිම ගොස් 'හිමියනි, අපහසුතාව කුමක්දැ'යි දෙපා පිරිමදිමින්ම ඇසුවේය. උපක කෙඳිරිගාමින් අනික් ඇලයට හැරුණේය. 'හිමියනි, කියනු මැනවි, මට කළ හැකි සියළු දෙයක්ම කරන්නෙමි'යි වැදි නායකයා කීය. 'ජාවා ලබන්නේ නම්, ජීවත්

වෙමි, නොලබන්නේ නම් මෙතැනම මරණයම වේ'යැයි උපක පැවසීය. 'හිමියනි, ඔබ කිසියම් ජීවත්වන මගක් දන්නෙහිද?' 'නොදනිමි'යි උපක (පිළිතුරු දුන්නේය) 'හිමියනි, ජීවත්වීමේ කිසිදු මගක් නොදත්තකුට ගිහිගෙයි විසීමට අදිටන් කළ නොහැකියැ'යි වැදි නායකයා කීය. එවිට 'මම කිසිදු ජීවත්වන මගක් නොදනිමි. එහෙත් ඔබලා දඩයම් කරන (සතුන්) මස්, ගෙන එන්නෙක් වෙමි. මස් ද විකුණන්නෙමි'යැයි ද උපක කීවේය. දඩයම් නායකයාද අපද එයට කැමතියැ'යි උතුරුසළුව දී ගෙට කැඳවාගෙන ගොස් දියණිය පාවා දුන්නේය. ඔවුන්ගේ සහවාසයෙන් ඈ පුතකු වැදූවාය. පුතුට සුභද්‍ද යැයි නම් කළහ. ජාවා පුතු නලවන ගීතයෙන් උපකට කවටකම් කළාය. ඔහු එය ඉවසිය නොහැකිව, 'සොඳුර, මම අනන්තජින වෙතට යමි'යි මැද රට පෙදෙස දෙසට නික්මුණේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේද සැවැත්නුවර ජේතවන විහාරයෙහි වැඩවසති. 'මහණෙනි, යම් කෙනෙකු 'අනනතජින' යැයි අසමින් එයිද, ඔහුට මා පෙන්වව'යි කලින්ම භාග්‍යවතුන් වහන්සේ මහණුන්ට දැන්වූහ. උපකද පිළිවෙලින් (මග ගෙවා) සැවැත්පුරට පැමිණ, විහාර මළුවෙහි සිට, 'මේ විහාරයෙහි 'අනනත ජින' නම් මගේ යහළුවකු ඇත. ඔහු කොතැන වාසය කරත්දැ'යි ඇසීය. මහණහු උපක භාග්‍යවතුන් වහන්සේ වෙත කැඳවාගෙන ගියහ. ඔහුට ගැළපෙන අයුරින් උන්වහන්සේ දහම් දෙසූහ. දේසනය අවසන උපක අනාගාමී පලයෙහි පිහිටියේය. 'භාග්‍යවතුන් වහන්සේ මුලදීම කැත පෙනුමක් ඇති නිරුවත් සමණයකුට දහම් දෙසන ලදැ'යි උපකගේ මුල් තොරතුරු ඇසූ හිමිවරු කතාබහ කළහ. භාග්‍යවතුන් වහන්සේ ඒ කතිකාව දැන, සුවඳකිළියෙන් නික්ම, ඒ මොහොතට අනුව සුදුසු පෙළහරපාමින්, බුදුඅස්නෙහි වැඩහිඳ, 'ඔබලා දැන් කුමන කතාවකින් සිටියාහුදැ'යි සංඝයා වහන්සේලා ඇමතූහ. ඒ කතාබහ සියල්ලම පැවසූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, තථාගතයන් වහන්සේ හේතු රහිතව, නිකරුණේ දහම් දේසනා නොකරති. තථාගත දේසනය ඉතා පිරිසිදුය. එහි වරදක් දැකිය නොහැකිය. එහෙයින් මහණෙනි, දහම් දේසනය නිසා උපක දැන් අනාගාමී බවට පත්වූයේ යැයි පවසා, තමන්ගේ දේසනයෙහි පිරිසිදු බව පහදා දීමට මෙම ගාථාව වදාළහ.

එහි තේරුම නම්, කෙලෙස් සහිත සියළුම ඛන්ධ ආයතන ධාතු කෙරෙහි ඡන්දරාගය දුරු කිරීමෙන් ඒවා මැඩනොපැවැත්වූ සියල්ලන් අතරින් තමන්(වහන්සේ) ඒ කරුණු සියල්ලම මැඩපවත්වා ඒවා ඉක්මවා පවතින හෙයින් සබ්බාභිභූං වේ. ඒවාද, වෙනත් ආකාර වූ සියළුම කරුණු

හෝ සියළුම දේ සියළු ආකාරයෙන් අවබෝධ කරන ලද බැවින් **සබ්බවිදූං** ඒ සියළු කරුණු පහදා දීමට හැකි, දේසනා කළ හැකි සොඳුරු වූ, තියුණු නුවණින් යුතු බැවින් **සුමෙධං** කෙලෙස්වලින් පිරුණු ඛන්ධ ආයතන ආදියෙහි තණ්හා දිට්ඨි ආලේපනයක් ලෙස තවරනු ලබයිද, එබඳු ආලේපන නොමැති බැවින් **සබ්බෙසු ධම්මෙසු අනුපලිත්තං** ඒ සියළුම දේවල් කෙරෙහි ඡන්දරාගය අත්හළ බැවින්, ඒ සියළුම දේවල් හැර දැමූ බැවින් **සබ්බඤ්ජහං** කෙලෙස් දුරුකොට, සත්සුන් බවට නැඹුරු වූ සිතින්, තණ්හාව නැති කිරීමෙන් වෙසෙසින්ම මිදුණු බැවින් **තණ්හක්ඛයෙ විමුත්තං** හැම ලෙසින්ම, මනාව මිදුණු ලදැයි කියන ලදී. **තං වාපි ධීරා මුනිං වෙදයන්ති** එබඳු දැනුම් තේරුම් ඇති තැනැත්තෝ මුනිවරයෙකු ලෙස දනිති. මේ මුනිවරයාගේ ඉතා උසස් ගුණ දකිවූ. ඒ මුනිවරයා පවසන දෙයෙහි කොතැන වරදක් ඇත්දැයි තමන් ගැනම පැහැදිලි කරයි. මෙහි 'වා' යන පදය පැහැදිලි කිරීම තේරුමෙහි යෙදේ. උපක එදා තථාගතයන් වහන්සේ දුටුවද, මේ බුද්ධ මුනි යැයි අදහා නොගත්තේය. එහිදී සංඝයා වහන්සේලා අතර පැවති කතා අනුව, අදහා ගත්තත්, නොගත්තත්, නුවණැත්තන් ඒ මුනිවරයා හඳුනා ගනිති'යි දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ බව ඇතමෙක් විස්තර කරති.

පඤ්ඤාබලං යන ගාථාව දේසනා කිරීමට මුල් වූ කරුණ කුමක්ද? මේ ගාථාව රේවත තෙරුන් අරබයා දේසනා කරන ලදී. 'ගමෙහි හෝ, නැතිනම් වනයෙහි හෝ 'ගාමෙ වා යදිවා'රඤ්ඤෙ යන මේ ගාථාවෙන් විස්තර වන පරිදි, මුලසිටම රේවත තෙරුන්ගේ පැවිදිවීමත්, පැවිදි වූ පසු කිහිරි වනයෙහි වාසය කිරීමත්, එහි වසද්දී මගපල ලැබීමත්, භාග්‍යවතුන් වහන්සේ එහි වැඩමකිරීම හා ආපසු පැමිණීමත් (ඒ අනුව) දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ ආපසු පැමිණි කල්හි, ඒ මහළු පැවිද්දෙක් සෙරෙප්පු අමතකව ආපසු හැරී ගොස්, කිහිරි රුකෙක එල්ලා තිබෙනු දැක යළි සැවැත්පුරට ආවේය. විසාඛා උපාසිකාව කෙසේද? හිමියනි, රේවත තෙරුන් වසන තැන රමණීය වේදැ'යි ඇසූවිට, මහණුන් විසින් එය පසසනු ලැබූවත්, ඒ හිමිවරුන්ටද අවමන් කරමින්, ඒ මහළු හිමි, 'උපාසිකාවනි, මොවුන් හිස්වචන කියති. ඒ බිම්පෙදෙස ලස්සන නැත. ඉතා රළුය. කටුකය. කිහිරි වනයකැ'යි කීය. විසාඛාවගේ නිවසින් ආගන්තුක දානය වළඳ පැමිණි ඒ මහණ, රවුම් සාලාවෙහි රැස්ව සිටි සඟ පිරිසට දොස් නඟමින්, 'ඇවැත්නි, ඔබලා රේවත හිමියන්ගේ සෙනසුනෙහි ඇති ලස්සන දක්නා ලද්දෙහුදැ'යි ඇසීය. භාග්‍යවතුන් වහන්සේ, ඒ දැන,

සුවඳ කුටියෙන් නික්ම, ඒ මොහොතට ගැළපෙන පෙළහරපාමින්, පිරිස මැදට පැමිණ, බුදු අසුනෙහි හිඳ 'මහණෙනි, දැන් කිනම් කතාවකින් සිටියාහුදැ'යි මහණුන් ඇමතූහ. 'හිමියනි, අළුත පැවිදි වූවෙකු කවදා මහණදම් කරන්නේදැ'යි රේවත හිමි පිළිබඳව කතාබහ ඇතිවී යැ'යි කීහ. 'මහණෙනි, රේවත අළුතින් මහණදම් පුරන්නෙක් නොවේ. කෙලෙස් දුරුකළ රහත් කෙනෙකැ'යි පවසා ඒ තෙරුන් මුල්කොට සඟ පිරිසට දහම් දෙසනු පිණිස මෙම ගාථාව වදාළහ.

එහි තේරුම නම් (සිත) දුබල කරන කෙලෙස් දුරු කිරීමේදී, දැහැන් බල අදිටනෙන් හෝ බලවත් නුවණින් යුතු බැවින් **පඤ්ඤාබලං** සිවු පිරිසිදු සීලයෙන් හෝ ධුතංග වත් පිළිපදිනා හෙයින් **සීලවතූපපන්නං** (සෝවාන් ආදී) මඟෙහි සිත එකඟ බවින් හෝ එහි පලයෙන් එකඟ බවින් හෝ ඉරියව් පවත්වාගැනීමේ එකඟ බවින් හෝ යුතු වූයේ **සමාහිතං**, උපචාර, අප්පණා ලෙසින් (පළමු, දෙවන) ආදී දැහැනෙන් දැහැනට පත්ව, දැහැන් වැඩීමෙහි ඇළුන බැවින් **ඣානරතං** සිහිය මනාව දියුණු කළ බැවින් **සතීමං** රාගාදියෙන් එක්තැන්වීමක් නොමැති බැවින් **සංගා පමුත්තං** පස්ආකර වූ කෙලෙස් උල් හා සිවු වැදෑරුම් ආසවයන් නැති බැවින් **අඛිලං අනාසවං තං වාපි ධීරා මුනිං වෙදයන්ති** මෙසේ තියුණු නුවණ ආදී ගුණයෙන් යුතු, රාගාදී වැරදිවලින් තොරවූ ඒ උසස් පැණවත්හු මුනිවරයකු ලෙසින් (ලොවෙහි) හඳුන්වනු ලබති. මේ කෙලෙසුන් නැසූ මුනිවරයාගේ ඉතා උසස් ගුණ දකිවු. එබඳු කෙනෙකුට අළුතින් පැවිදි වූවෙකැයි හෝ, කවදා මහණදම් කරන්නෙකැයි කිවයුත්තේ කෙසේද? අළුතින් පැවිදිව කටයුතු කිරීමෙන් නොව, නුවණෙහි බලමහිමයෙන් ඒ (සසර) විසීම නිම කළේය. ඒ තැනැත්තා (පැවිදි වීමේ අරමුණ ඉටු කරගත් බැවින්) කළයුතු දේ කළේය. එහෙයින් දැන් මහණදම් නොකරති'යි රේවත තෙරුන් ගැන පැහැදිලි කළහ. මෙහි 'වා' යනු පැහැදිලි කිරීමේ අරුතෙහිය.

එකං චරන්තං යන ගාථාව දේසනා කිරීමට හේතුවූ කරුණ කුමක්ද? බෝමැඩදී (බුදුවූ තැන් පටන්) කල් ගතකොට, භාග්‍යවතුන් වහන්සේ පිළිවෙලින් කිඹුල්වත්පුරට පැමිණ පියපුතු හමුවීමේදී තුටු පිළිසඳර කතාවෙන් පසුවන සුදොවුන් රජ විසින්, 'හිමියනි, ගිහිකල, සුවඳ කරඬුවල බහා තිබූ, සුවඳ ගැන්වූ කසීසළු පිළි ආදී සියුම් රෙදි, ඇඳුම් හැඳි ඔබවහන්සේ දැන් කෙසේ දිරාගිය, පස් වැකුණු රෙදි අඳින්නෙහිදැ'යි ඇසූවිට රජුට

කරුණු පහදමින්, 'පියාණනි, ඔබතුමා සිනිඳු ලෝම රෙදි, මනාව පෙළුැ කපු රෙදි, කසී සළුපිළි ගැන කියූවත් පස්වැකුණු රෙදිකඩ මට අගනේය. මා පතන ලද්දේ එයයි.

**යං ත්වං තාත වදෙසි, පතතුණ්ණං තුලකාසිකං**

**පංසුකූලං තතො සෙය්‍යං එතං මෙ අභිපත්‍ථිතං** යනුවෙන් පහදා දී ලෝ දහමෙහි තමන් කම්පා නොවන බව දක්වා රජුට දහම් දෙසනු පිණිස මේ පේළි සතකින් යුතු ගාථාව වදාළහ.

එම ගාථාවෙහි අරුත නම්, පැවිදිවීම යැයි කියන ලද පරිදි, (නැතහොත්) පැවිදි වූ තැනැත්තෙක් යන අදහසින් **එකං** ඉරියව් පැවැත්වීම්, ඉරියව් හැසිරීම් අනුව **චරනතං**, උසස් හික්මීමෙන් යුතු වූ, මුනි යන නමට සුදුසු කරුණුවලින් යුතු **මුනිං**, හැමවිටම පමා නොවීමෙන් **අපපමතතං** බැණවැදීම, අවමන් කිරීම් ආදී නින්දාවෙහිද, ගුණකීම්, තුති කිරීම් ආදී පැසසුම් කිරීමෙහිද, **නිනදා පසංසාසු** කෝප සහගත නොවීමෙන් **අවෙධමානං**, නින්දා පැසසුම් ආදී අටලෝ දහමෙහි කම්පා නොවීම ගැන මෙහි කියන ලදැයි දතයුතුය. **සීහං ච** බෙරහඬ ආදියෙන්, **සද්දෙසු**, අටලෝ දහමෙහි සොබාවයන්, වෙනස්වීමේදීත් **අසනතසනතං** විවේකී තැන්වල හෝ සෙනසුන්වල තැති නොගෙන, **වාතං ච** නූල් ආදී දෙයින් කරන ලද දැලක් (සුළඟින් සෙලවෙන සේ) **ජාලමහි** සිවු මගෙහි තණ්හා දිට්ඨි (නම් වූ) දැලෙහි **අසජ්ජමානං** අටලෝ දහමෙහි කෝපයට පත්ව නොගැටෙමින්, **පදුමං ච** තොයෙන තණ්හා දිට්ඨි නම් ලාටු තැවරීමෙන් ජීවත්වන්නෝ ලොවෙහි ඇලෙති, ලොව උපන්නද (මුනිවරයා) එබඳු ලාටු තවරාගැනීම් ලෝකයා සමග නොමැති බැවින්, **අලිපපමානං** නිවන් මග මතුකොට, ඒ මගින් **නෙතාරමඤ්ඤෙසං** වෙනත් (සමයවාදීන් මෙන් නොව) දෙව් මිනිසුන්ටද තමන් ගත් මග පෙන්වා, **අනඤ්ඤනෙය්‍යං තං වාපි ධීරා මුනිං වෙදයනති** බුද්ධ මුනිවරයා ඒ මග දැනගන්නා ලදැයි තමා ගැන පැහැදිළි කරයි. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිමය.

යො ඔගහනෙ යන ගාථාව දේසනා කිරීමට හේතුවූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ පළමුකොටම බුදුබව ලැබීම පිණිස අසංඛෙය්‍ය සතරකුත් කප් සියදහසක් දස පාරමිතා, දස උපපාරමිතා, හා දස පරමත්‍ථ පාරමිතා ලෙසින් ඉදිරියට රැස් කරගත් ගුණ සමුදා පාරමී පුරා, තුසිත දෙව්ලොව උපන් සැටි, එහි වාසය කළ සැටි, පස්මහ බැලුම් විමසා බැලූ

සැටි, කුස පිළිසිඳ ගැනීම, ගැබෙහි විසීම, බිහිවීම, ඇවිදීම, අවට-දිසා විමසීමෙන් බැලීම, උසස් හඬ පතුරුවාලීම, මහබිනික්මන, මහා වෙර වැඩුම, සම්බුදු බව ලැබීම, දම්සක් පැවැත්වීම, සිවු ආකාර වූ මග නුවණ, සිවු ආකාර පල නුවණ, අට වැදෑරුම් පිරිස කෙරෙහි නොසැලෙන නුවණ, දසබල නුවණ, සිවු වැදෑරුම් උපදනා ආකාරය පිළිබඳ නුවණ, පස් ආකාරයෙන් යුතු උපදනා තැන් (ගති) පිළිබඳ නුවණ, බුදුවරුන්ටම පමණක් සීමා වූ සවැදෑරුම් නුවණ, සාවකයන්ට ද (සිවුමග-සිවු පලයට පත්) පවත්නා වූ අටවැදෑරුම් බුදුනුවණ, දහහතරාකාර වූ බුදුනුවණ, බුදුගුණ කොටස් සේ ගැනෙන දහඅට වැදෑරුම් වූ නුවණ, දහනව වැදෑරුම් විමසීමේ නුවණ, හැත්තෑහතක් වූ නන් ආකාරයෙන් පැතිර පවත්නා නුවණ, ආදී මෙබඳු සියදහස් වූ ගුණ නිසා ලද මහා ලාභ සත්කාර ඉවසාගත නොහැකි මිසදිටු වෙනත් ආගමික පිරිස විසින් මෙහෙයවනු ලැබූ චිඤ්චා නම් තරුණියට 'එකම කරුණ නම් ඇත්ත ය' - එකං ධම්මං අතීතස්ස' යනුවෙන් වදාළ කතා පුවතෙහි ද සඳහන් වන පරිදි, සිවු පිරිස මැද භාග්‍යවතුන් වහන්සේට නින්දා කරනු ලැබීම නිමිතිකොට, 'මෙබඳු අවමානයකදී ද උන්වහන්සේගේ සිතෙහි වෙනසක් නොවීයැ'යි සංඝයා වහන්සේලා කතාබහ කළහ. ඒ දැන භාග්‍යවතුන් වහන්සේ සුවඳ කුටියෙන් නික්ම, ඒ මොහොතට සුදුසු පෙළහරින් පිරිස මැදට පැමිණ, බුදු අස්නෙහි හිඳ 'මහණෙනි, ඔබලා දැන් කෙබඳු කතාවක යෙදී සිටියාහුදැ'යි මහණුන් ඇමතූහ. උන්වහන්සේලා සියළු කරුණු දැන්වූහ. එහිදී භාග්‍යවතුන් වහන්සේ, 'බුදුවරු නම් අටලෝ දහමෙහි කම්පා නොවන්නාහ'යි පවසා ඒ මහණුන්ට දහම් දෙසනු පිණිස මේ ගාථාව වදාළහ.

**යො ගාහණො ථම්භො රිවාභි ජායති**
**යස්මිං පරෙ වාචා පරියන්තං වදන්ති**
**තං වීතරාගං සුසමාහි තින්ද්‍රියං**
**තං වාපි ධීරා මුනිං වෙදයන්ති**

එහි තේරුම නම්, නානතොටෙහි දියට බසින මිනිසුන්ට සිරුරේ අඟපසඟ ඇතිල්ලීම පිණිස සිටුවන ලද හතරැස් වූ හෝ අටපට්ටම් වූ කණුවක කුලීනයෝ ද කුලහීනයෝ ද සිරුර අතුල්ලති. එයින් එම කණුව උඩ ඒමක් හෝ යට යෑමක් නොවේද, එසේම යො ඔගහනෙ **ථම්භොරිවාභිජායති, යස්මිං පරෙ වාචාපරියන්තං** වදන්ති යැයි කුමක් නිසා කියන ලදද? **යස්මිං** කිසියම් කරුණකදී පරෙ මිසදිටු වෙනත්

ආගමික පිරිස් හෝ ඉතා ඉහළින් ගුණ කියන්නේ නම් හෝ, ඉතා පහත් අයුරින් නුගුණ කියන්නේ හෝ **වාචා පරියන්තං වදන්ති** ඒ කාරණයෙහිලා, එකඟ බවක් හෝ කෝපයක් හෝ නොපෙන්වමින්, කම්පා නොවී, තොටෙහි පිහිටුවන ලද කණුවක් මෙන් වේ යැයි (දක්වයි) **තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං** ඒ බලාපොරොත්තු වන අරමුණෙහි රාගය නොමැතිවීමද, බලාපොරොත්තු ඉටු නොවූ අරමුණෙහි තරහ හා මුලාවෙන් තොරව, තැන්පත් ඉඳුරන් ඇතිව, මනාව සංවර කරගත් ඉඳුරන් ඇතිව, කලබලයට පත් නොවූ ඉඳුරන් ඇතිව, මනාව සංවර කරගත් ඉඳුරන් ඇතිව, කලබලයට පත් නොවූ ඉඳුරන් ඇතිව, ලොල්බවට පත් නොවූ ඉඳුරන් ඇතිව යැයි කියන ලදී. **තං වාපි ධීරා මුනිං වෙදයන්ති** බුද්ධ මුනිවරයා (එසේ) විදිනු ලබයි. එබැවින් ඒ සිත කෙසේ වෙනස් බවට පත්වන්නේදැයි තමන් පිළිබඳව පහදයි. ඉතිරි කරුණු කලින් කියන ලද පරිදිය.

යො වෙ ඨිතත්තො යන ගාථාව දේසනා කිරීමට හේතුව කුමක්ද?

සැවැත්නුවර එක්තරා සිටුදුවක්, පහයෙහි (මතු මහලින්) බැස බිම් මහලෙහි රෙදි වියන හලට ගොස්, නූල් දිග් ගසා බඳින ලීයෙහි නූල් ඔතනු දැක, එම ලීය කෙළින්, නොවක්ව මනාව පිහිටි බව දැන, 'අහා, සියළුම සතුන්, ඒ නූල් එළන දඬුව මෙන් වංකබව හැර, කය වචන හසුරුවමින් කෙළින් කටයුතු කිරීමට සිත් වේනම්, (කොතරම් අගීදැයි) එය සමාන නිමිත්තක් කොට ගත්තාය. ඇය මතු මහලට ගියද, යළි යළිත් එයම මෙනෙහි කරමින් හුන්නීය. මෙසේ පිළිපත් ඇයට නොබෝ කලකින්ම, අනිස ලකුණු පැහැදිලි විය. ඒ අනුවම දුක හා අනාත්ම ලකුණුද පැහැදිලි විය. ඉක්බිති ඒ අනුවම දුකෙහි අනාත්ම බවද දැනුණි. තුන් භවයම (සසර) ගිනිගත් සේ වැටහිණ. එසේ විදසුන් වඩන බව දැන භාග්‍යවතුන් වහන්සේ සුවඳ කුටියෙහි හිඳිමින්ම, ආලෝකයක් මුදාහළහ. ඇය ආලෝකය දැක, මේ කුමක්දැයි මෙනෙහි කරන්නී, උන්වහන්සේ පසෙක වැඩ සිටිසේ දැක, නැගිට දොහොත්මුදුන් තබා සිටියාය. ඇගේ අදහස අනුව සුදුසු අයුරු දහම් දෙසුම අවසන භාග්‍යවතුන් වහන්සේ මෙම ගාථාව වදාළහ.

එහි තේරුම නම්, **යො වෙ** එකඟ වූ සිත් ඇතිව, කෝප රහිත සිතිවිලි නිසා, දියුණුවට හානි නොමැති බැවින්, සසරෙහි ඉපදීම නවතාලූ බැවින්, භවයන්හි ආවේණික ජීවතරූප ලබන්නා වූ ඒ සසර ගමනද

නොමැති හෙයින් **ඨිතතෙතා** කය, වචන සිතෙහි ඇද බවක් නොමැති බැවින්, අයහපතට යොමු නොවීම හෝ **තසරං** ව උජු, ලජ්ජාව, බය ඇති බැවින් **ජිගුච්ඡති කමෙමහි පාපකෙහි** සිරුරෙහි අසූචි තැවරුනාක් මෙන්, මුත්‍ර තැවරුනාක් මෙන් පව්කම් පිළිකුල් කරයි. ඊට ලජ්ජා වේ යැයි කියන ලදී. එකිනෙක සබඳතා යෙදීමෙහිදී කරණ විබතින් යෙදීම වියරණ රීතියයි. **වීමංසමානො විසමං සමඤච** කයෙහි වැරදි හැසිරීම් වූ දුසිරිතද, කයෙහි නිවැරදි හැසිරීම් වූ සුචරිතයද (කුසල-අකුසල ලෙසින්) දුරුකිරීමේ භාවනා කටයුතු ලෙස මගපල නම් නුවණින් විමසමින්, මැනවින් විමසමින්, **තං වාපි** කෙලෙසුන් නැසූ තැනැත්තා **ධීරා මුනිං වෙදයනති** කුමක් නිසා (එසේ) කියන ලදද? ඉහත සඳහන් පරිදි මගපල නුවණින් වැරදි-නිවැරදි විමසමින් (සසර ගමන) නවතා සිටියේ වේද, ඒ තැනැත්තා රෙදි නූල් ඔතන ලද ලීය මෙන් ඇද නැතිව, කිසිදු (සීමා) ඉක්මවා නොයමින් පව්කම් පිළිකුල් කරයි. **තං වාපි ධීරා මුනිං වෙදයනති** ඒ කෙලෙස් නැසූ මුනිවරයා මෙබඳු යැයි දක්වමින්, අරහත් බව කුළුගන්වමින් ගාථාව දේසනා කළහ. දේසනාව අවසානයෙහි, සිටුදුව සෝවාන් පලයෙහි පිහිටියාය. මෙහි 'වා' විකල්පය හෝ, එක් කිරීම අරුතෙහි යෙදේ යැයි දතයුතුය.

**යො සඤඤතතෙතා** යන ගාථාව දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ අලව් පෙදෙසෙහි අලව් නුවර වැඩවසන සමයෙහි, එහි එක්තරා රෙදිවියන්නෙක්, සත් හැවිරිදි දියණියට 'දුව, ඊයේ ඔතනු නොලැබූ, නූල් ටිකක් ඉතිරිව ඇත, එය සකසා ඉක්මනින් පෙහෙකම්හලට ගෙන එන්න, පමා නොවන්නැයි අණ කළේය. ඈ යහපතැ'යි පිළිගත්තාය. රෙදි වියන්නාද පෙහෙකම්හලට ගොස්, නූල් සකසමින් සිටියේය. එදින භාග්‍යවතුන් වහන්සේ මහා කරුණා සමවතින් නැගී ලොව බලනවිට, ඒ දැරියට සෝවාන් පල හේතු සම්පත්ද, දේසනාව අවසන අසූහාර දහසකට දහම් අවබෝධය ලබන බවද දැක, කලින්ම සිරුරු පිළිදැගුම් කොට, පා සිවුරු ගෙන නගරයට පිවිසි සේක. මිනිස්සු උන්වහන්සේ දැක, 'ඒකාන්තයෙන්ම කවරකුට හෝ උපකාර ලබනු ඇති. භාග්‍යවතුන් වහන්සේ කලින්ම වැඩිසේකැ'යි උන්වහන්සේ වෙත එළඹියහ. බුදුහුද ඒ දැරිය පියා හමුවට යන මගෙහි සිටියහ. නගරවාසීහු ඒ පෙදෙස ඇමද, දිය ඉස, මලින් සැරසිලි කොට, වියනක් බැඳ අසුනක් පැනවූහ. භාග්‍යවතුන් වහන්සේ පැනවූ අසුනෙහි වැඩහුන්හ. මහජනයා පිරිවරා සිටියේය. දැරිය ඒ පෙදෙසට පැමිණ, මහජනතාව පිරිවරා සිටි භාග්‍යවතුන්

වහන්සේ දැක, 'පසඟ පිහිටුවා වැන්දාය. 'දැරිය, (ඔබ) කොහි සිට ආවෙහිදැ'යි ඇය ඇමතූහ. 'භාග්‍යවතුන් වහන්ස, නොදනිමි' (ඈ කීවාය) 'කොහි යන්නෙහිද?' 'නොදනිමි, භාග්‍යවතුන් වහන්ස' 'නොදන්නෙහිද?' 'දනිමි, භාග්‍යවතුන් වහන්ස', 'දන්නෙහිද?' 'නොදනිමි, භාග්‍යවතුන් වහන්ස' යැයි (පිළිතුරු දුන්නාය.) ඒ අසා මිනිස්සු, 'පින්වතුනි, බලවු, මේ දැරිය තම ගෙදර සිට ආවත්, භාග්‍යවතුන් වහන්සේ විමසන ලදුව, නොදනිමි'යි කීවාය. පෙහෙකම්හලට යන නමුත් නොදනිමි යැයිද, නොදන්නෙහිදැයි කීවිට, දනිමි යැයිද, දන්නෙහිදැයි කීවිට නොදනිමි යයිද හැමදෙයටම නොගැළපෙන දේ කරන්නී යැයි ඇයට දොස් නැගූහ. භාග්‍යවතුන් වහන්සේ මිනිසුන්ට ඒ කරුණු පහදා දෙනු කැමතිව, 'මා කුමක් අසන ලදද? ඔබ කුමක් කියන ලදදැ'යි ඇගෙන් විමසූහ. භාග්‍යවතුන් වහන්ස, මා ගෙදරින් අවුත්, පෙහෙකම්හලට යන්නේ යැයි නොදන්නා කිසිවෙකු නැත. එහෙත් ඔබවහන්සේ ආවේ කොතැන සිටදැයි විමසන්නේ මා මෙසේ (උපත ලැබීමට පෙර වූ ජීවිතයෙන්) පිළිසිඳ ගැනීම ගැනයි. කොහි යන්නෙහිදැයි, මරණින් පසු මාගේ ඉපදීම විමසන සේක. නිරයෙහි හෝ දෙව්ලොව සිට හෝ පැමිණි බවක් මමද නොදනිමි. එහෙයින් නොදන්නා බව කීවෙමි. (මරණින් පසු) නිරයට හෝ දෙව්ලොව හෝ කොතැනක යන්නෙම්දැ'යි ඔබවහන්සේ මගෙන් මරණය ගැන ඇසූහ. මටද අන් සියල්ලන්ටද මරණය නියත බව දනිමි. එහෙයින් දනිමියි කීවෙමි. දන්නෙහිදැයි ඔබවහන්සේ විමසුවේ මා මැරෙන මොහොතයි. අද හෝ හෙට හෝ කවදා හෝ මැරෙන්නෙම්දැයි නොදනිමි. එහෙයින් නොදන්නා බව කීවෙමි.' (දැරිය එසේ පිළිතුරු දුන්නාය.) භාග්‍යවතුන් වහන්සේ ඇය විසින් පැන විසඳන ලද අයුරු ඉතා මැනවැ'යි එකඟ බව පළ කළහ. මහජනයාද, 'මේ දැරිය දැනුම් තේරුම් ඇති තැනැත්තියකැ'යි සාධුකාර දහසක් දුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දැරියගේ සිත් සතන් දැන, 'මේ ලොව (නුවණ මද හෙයින්) අඳ වූ සේ වෙති, ඒ (මිනිසුන් අතරින්) ටිකදෙනෙක් විදසුන් අනුව (කරුණු) දකිති. දැලින් මිදුණු කුරුල්ලෙකු (වටු කුරුල්ලකු) සේ ටික දෙනෙක් සුගතියට - නිවනට යති.'

අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති

සකුනෙතා ජාලමුත්තොව අප්පො සග්ගාය ගච්ඡති මෙම ගාථාව වදාළහ. ගාථාව අවසානයෙහි ඇය සෝවාන් පලයෙහි පිහිටියාය. අසූහාර දහසකට දහම් අවබෝධ විය.

ඇය භාග්‍යවතුන් වහන්සේට වැඳ පියා සමීපයට ගියාය. පියා ඇය දැක, 'ඉක්මනින් පැමිණියේ නැතැ'යි කිපී, නූල් ඔතන ලද රෙදි වියන දණ්ඩ වේගයෙන් ගැස්සීය. එය ගැලවී, දැරියගේ කුසෙහි වැදිණි. ඇය එතැනම මියගියාය. ඔහු එය දැක, 'මම දුවට නොගැසුවෙමි, එම දණ්ඩ වැදී මැයගේ කුස තුවාල විය. ජීවත්වෙයිද, නැත්දැයි විමසා බලා, මළ බැව් දැන, 'මිනිස්සු මේ දියණිය මා විසින් මරණ ලදැයි දොස් කියන්නාහ, රජුද දැඩි දඬුවම් පමුණුවන්නේය, එහෙයින් කලින්ම පලායාම මැනවැයි සිතුවේය. ඔහු දඬුවමට බියෙන් පලායන අතර, භාග්‍යවතුන් වහන්සේ හමුව කමටහන් ගෙන, කැලයෙහි හිමිවරුන් වසන තැනකට පැමිණියේය. ඔහු හිමිවරුන් වෙත ගොස්, වැඳ පැවිදි කරන ලෙස ඉල්ලීය. හිමිවරු ඔහු පැවිදිකොට, තචපඤ්චක නම් වූ (කෙස්, ලොම්, නිය, දත් හා සම දක්වා වූ) සිරුරේ කොටස් පහ පිළිබඳව මෙනෙහි කිරීමට උපදෙස් දුන්හ. (අළුත පැවිදි වූ ඒ හිමියෝ) උත්සාහවත්, එය ඉගෙන නොබෝ කලකින්ම අරහත් පල ලදහ. උන්වහන්සේගේ ගුරු උපාධ්‍යායන් වහන්සේලාද රහත් පල ලැබූහ. ඒ සියළුම හිමිවරු විනයානුකූලව පවාරණය කරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ කරා ගියහ. බුදුරජාණන් වහන්සේද වස් පවාරණය කොට, මහසඟ පිරිවරා ගම් නියම්ගම්හි සැරිසරමින්, පිළිවෙලින් අලව් නුවරට පැමිණියහ. අලව් වාසීහු භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට, දන් ආදිය පිරිනමද්දී, ඒ මහණුන් දැක, 'දුව මරා, දැන් කවුරු මරන්නට ආවෙහිදැ'යි කියා නින්දා කළහ. හිමිවරු උවටැන් වේලාවෙහි පැමිණ ඒ කරුණු සැළකළවිට, භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, ඒ හිමි දුව මැරුවේ නැත. ඇය, තමන් කරන ලද දෙයක විපාක පරිදි මළා යැයි වදාරා, ඒ හිමියන් රහතන් වහන්සේ නමක බව මිනිසුන් නොදන්නා බැවින්, කෙලෙස් නසා රහත් බවට පත්වූ බව සඟ පිරිසට පහදා දෙමින් දහම් දෙසනු පිණිස මේ ගාථාව වදාළහ.

එහි තේරුම නම්, යො තුන්දොරෙහි හික්මීම - සීල සංවරය ඇති බැවින් **සංයතතෙතා** කයෙන් හෝ වචනයෙන් හෝ සිතිවිලිවලින් හෝ හිංසා ආදිය **න කරොති පාපං** එසේ දහරොවා තරුණ වියෙහි පසුවන කෙනෙකු හෝ, **මජ්ඣිමො** වා මැදිවියෙහි වූවකු හෝ, මේ ආකාරයෙන් තෙර නමක හෝ වැඩිමහළු වූවත් කිසිවිටකත් පව් නොකරති. ඊට හේතු මොනවාද? **යතතෙතා** යම්හෙයකින් ඇලීම් ආදියෙන් තොරව, සියළු පාපයෙන් මිදීමේ-වැළකීමේ සිත ඇති බව කියන ලදී. ඊළඟට **මුනි අරොසනෙයේ‍යා න රොසෙති කඤ්චි** මේ පදවලින් මෙබඳු අදහසක් ද

හැඟවේ. කෙලෙස් නැසූ ඒ මුනිවරයා, **මුනි අරොසනෙය්‍යො** දූවගේ මිනීමරුවා හෝ රෙදි වියන්නෙකැයි හෝ කයෙන්, වචනයෙන් වුවත් කෝපයට, පත්ව ගැටුම් ඇතිකර ගැනීමට, හිරිහැර කිරීමට සුදුසු නොවේ. සො ඒ මුනිවරයාද **න රොසෙති කඤ්චි** 'මම දියණිය නොමැරුවෙමි, ඔබ මැරුවෙහි, ඔබ වැන්නෙකු මැරුවෙහි' කියා කිසිවෙකු කෝප නොකරයි, නොගටයි, හිරිහැර නොකරයි, එහෙයින් ඔහුද කෝපයට පත් නොවන්නේය, එතකුදු වුවත්, 'නාගයාට ඉඩ දෙන්න, නාගයාට හිංසා නොකරන්න, නාගයාට නමස්කාර කරන්න' 'තිට්ඨතු නාගො, මා නාගං සඝට්ටෙසි, නමො කරොහි නාගස්ස' යනුවෙන් කියා ඇති පරිදි, නමස්කාර කළයුතුම වන්නේය. **තං වාපි ධීරා මුනිං වෙදයන්ති** මෙහි (නාග නමින්ද) ඒ උත්සාහවත් වූ මුනිවරයා රහතන් වහන්සේ සඳහන් කරති'යි මෙසේ පද විස්තර දතයුතුය. මේ අදහස නම්, ඒ තැනැත්තා කෝප නොවන්නෙකු බවට පත්වන්නේ යැයි ඒ අනුවණ මිනිස්සු නොදන්නා නිසා කෝප වෙති. නුවණැති, (කෙලෙස් දුරු කිරීමෙහි) උත්සාහවත් වූවෝම මුනිවරයා යැයි දන්නා ලබති. මෙයින් කෙලෙස් දුරුකළ මුනිවරයා හෙවත් රහතන් වහන්සේ යැයි දැනගන්න.

යදග්ගතො යන ගාථාව දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? සැවැත්නුවර පඤ්චග්ගදායක නම් බමුණෙක් විය. ඔහු අස්වනු හටගන්නා කල්හි, කෙතින් ලද අස්වැන්නෙන් මුල් කොටස, අස්වැන්න එක්රැස් කිරීමේදී වෙන්කරන ලද මුල්කොටස, අටුවෙහි තබනවිට මුලින්ම වෙන්කළ කොටස, සැලියට දැමීමේදී වෙන්කෙරෙන මුල් කොටස, අනුභවයේදී මුල් කොටස යනුවෙන් පස් ආකාරයෙන් දෙයි. කෙතෙහි මුලින්ම පැසුණු හැල්, යව (බාර්ලි), තිරිඟු, හිස තුබා ගෙනවුත්, කැඳ, කිරිබත්, හබලපෙති ආදිය පිළියෙල කොට, 'මෙසේ අගසස් දාන දෙන තැනැත්තා නුවණ ලැබීමෙන් මුල්තැන ගනී.' 'අග්ගස්ස දාතා මෙධාවී අග්ගං සො අධිගච්ඡති' මෙබඳු හැඟීමෙන් බුදුපාමොක් මහසඟනට දන් දෙයි. මේ ඔහුගේ අස්වනු හටගත් කල කෙතෙහි තිබියදී (අස්වැන්න) කොටසක් ගෙන දෙනු ලබන දානයයි. පැසුණු කල්හී, කැපීමේදී, පෑගීමේදී මුලින්ම කොටසක් වෙන්කොට එසේම දානය දෙයි. මෙය ඔහුගේ අස්වනු එක්රැස් කිරීමේදී දෙන දානයයි. නැවත ඒ අස්වනු අටුවල පුරවා (ගබඩා කිරීමේදී) ඉන් පසුව පළමුකොටම අටුව විවරකොට, පළමුව පිටතට ගන්නා අස්වනුවලින් දානය දෙයි. එය අටුවෙහි අගසස් දානයයි. එසේම කිසියම් කොටසක් ගෙදර (එදිනෙදා පිසීම සඳහා) තබාගනීද, එයින් මුල්කොටස පැමිණෙන

පැවිද්දන්ට නොදී, යටත් පිරිසෙයින් දරුවන්ටවත් නොදෙයි. මේ සැළියෙහි අගසස් දානයයි. නැවත අනුභව කරන මොහොතෙහි, පෙරබත් කාලය නම් තමන්ට ලැබෙන ආහාරය පැමිණි පැවිද්දන්ටද, පසුබත් කාලයේ නම් පැමිණෙන යාචකයන්ටද, එසේ නොමැතිනම්, යටත් පිරිසෙයින් බල්ලෙකුට හෝ නොදී අනුභව නොකරයි. මෙය අනුභවයෙහිදී මුලින්ම දෙන දානයයි. මෙසේ මුල්ම දාන පහක දායකයෙකැයි 'පඤ්චග්ගදායක' නමින්ම හැඳින්වීය.

මේ අතර, දිනක් භාග්‍යවතුන් වහන්සේ අළුයම් වේලෙහි බුදුඇසින් ලොව බලනවිට, ඒ බමුණාත්, බැමිණියත් සෝවාන් පලයට පත්වීමට හේතුසම්පත් ඇති බව දැන, සිරුර පිළිදැගුම් කොට, කල්ඇතිවම සුවඳ කුටියට පිවිසියහ. මහණහු සුවඳ කුටියෙහි දොර වසා ඇති බව දැක, 'අද භාග්‍යවතුන් වහන්සේ තනිවම ගමට පිවිසෙනු කැමති සේකැ'යි දැන, පිඩු පිණිස කල් පැමිණිවිට, සුවඳ කුටිය පැදකුණු කොට පිඩුසිඟා වැඩියහ. භාග්‍යවතුන් වහන්සේද බමුණාගේ ආහාර වේලාවෙහි තික්ම සැවත් නුවරට පිවිසියහ. මිනිස්සු බුදුරදුන් තනිවම වැඩියේ කවරකුට හෝ (දහම් අවබෝධයෙන්) උපකාර පිණිසම නොවේදැයි දැන, දානයට ආරාධනා කිරීමට උන්වහන්සේ කරා නොගියහ. භාග්‍යවතුන් වහන්සේද අනුපිළිවෙලින් බමුණාගේම ගෙයි දොරටුව අසළට පැමිණ සිටියහ. ඒ වේලාවෙහි බමුණා අහර බඳුන ගෙන වාඩිවී සිටියේය. බැමිණිය තල්වට ගෙන සිටියාය. ඇය භාග්‍යවතුන් වහන්සේ දැක, 'දැන් බමුණා දුටුවහොත් පාත්‍රය ගෙන මුළු ආහාරයම දෙන්නේය. එවිට මට නැවතත් කෑම පිසීමට සිදුවන්නේ යැයි සිතා නොසතුටද, මසුරුබවද උපදවා බමුණාට භාග්‍යවතුන් වහන්සේ නොපෙනෙනා ලෙසට තල්වටින් මුවහ කළාය. (සැඟවූවාය.) භාග්‍යවතුන් වහන්සේ ඒ බව දැන, සිරුරෙන් ආලෝකයක් මුදාහළහ. ඒ රන්පැහැ ආලෝකය දුටු බමුණා 'එය කුමක්දැ'යි බලද්දී, භාග්‍යවතුන් වහන්සේ දොරකඩ වැඩසිටිනු දැක්කේය. බැමිණියද, බමුණා බුදුරදුන් දක්නා ලදැයි දැන, එකෙණෙහිම තල්වට පසෙක තබා, උන්වහන්සේ වෙත එළඹ, පසඟ පිහිටුවා වැන්දාය. ඇය වැඳ නැගී සිටිද්දී, ඇගේ සිත දහම් අවබෝධයට සුදුසු බව දත් භාග්‍යවතුන් වහන්සේ, 'නාමරූප (රූප-වේදනා ආදී කොටස් පහ) කෙරෙහි මමය-මගේය යන හැඟීමක් මුළුමනින්ම නැත්ද, ඒ නාමරූප නැතිව ගියවිට-වැනසුන විට සෝක නොකරයිද, එසේ කෙලෙස් නසන ලද තැනැත්තා (නියම) මහණෙක් ලෙස හඳුන්වනු ලැබේ' යන අරුත් ඇති ගාථාව දේසනා කළහ.

**සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං**
**අසතා ච න සොචති ස වෙ භික්ඛූති වුච්චතී** - ඇය ගාථාව අවසාන වනවිටම සෝවාන් පලෙහි පිහිටියාය.

බමුණාද භාග්‍යවතුන් වහන්සේ ගෙතුළට වඩමවා මාහැඟි අසුනක හිඳුවා, (දානය පිළිගැන්වීමට පෙර) පැන් පිළිගන්වා තමාට පිළියෙල කර ඇති (අනෙක්) ආහාර ගෙන 'හිමියනි, දෙවියන් සහිත ලෝකයෙහි දෙනු ලබන දේ පිළිගැනීමට සුදුසු උතුමන් අතර, ඔබවහන්සේ මුල්තැන ගනිති, මේ භෝජනය ඔබවහන්සේගේ පාත්‍රයෙහි තැබීමට අවසර ලැබේවා'යි කීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට උපකාර පිණිස එය පිළිගෙන වැළඳූහ. වළඳ අවසන, බමුණාද දහම් අවබෝධයට සුදුසුව සිටීයැයි දැන යදග්ගතො යන ගාථාව වදාළහ.

එහි තේරුම නම් යං සැළියෙන් මුලින්ම ගන්නා ලද බැවින්, අග්ගතො පැමිණි (විට) සැළියෙහි අඩක් ඉතිරිව තිබී, එයින් ගන්නා ලද බැවින්, **මජ්ඣතො** එක් හැන්දක්, හැඳි දෙකක් තරම් ඉතිරිව තිබී, එයින් ගන්නා ලද බැවින්, **සෙසතො වා පිණ්ඩං ලභෙථ, පරදත්තුපජීවී** යනු පැවිදි වූවෙක්, පැවිද්දා ජලය, දැහැටි හැර, අනෙක් සියළු දෙයම අනුන් විසින් දෙනු ලබන බැවින් ජීවත් වෙයි. එහෙයින් පරදත්තුපජීවී යැයි කියනු ලැබේ. **නාලං ථුතුං නොපි නිපච්චවාදී** එබඳු බලාපොරොත්තු නොමැති බැවින්, මුල් කොටසම ලැබුණත් තමන්ට හෝ දෙන තැනැත්තාට හෝ තුති කිරීමක් නොවේ. ඉතිරි වූ දෙයින් ලැබුණත්, තරහ දුරුකරන ලද බැවින්, 'මේ දෙන ලද්දේ මොනවාදැ'යි ආදී ලෙසින් දායකයා පහත්කොට (බාල්දුකොට) අසතුටු වචන නොකියයි. **තං වාපි ධීරා මුනිං වෙදයන්ති** - බලාපොරොත්තු, තරහ දුරුකරන ලද උත්සාහවත් ඒ මුනිවරයා ලෙසින් හඳුන්වතියි, අරහත් පල කුළුගන්වා බමුණාට ගාථාව දේසනා කළහ. ගාථාව අවසානයෙහි බමුණා සෝවාන් පලෙහි පිහිටියේය.

**මුනිං චරන්තං** යන ගාථාව දේසනා කිරීමට හේතුවූ කරුණ කුමක්ද? සැවැත් නුවර එක්තරා සිටුපුතෙක් සීත, උණුසම් කාල අනුව, තුන් පහයක, සියළු පිරිවර සම්පත් විඳිමින්, සිටින අතර, තුරුණු වියෙහිදීම පැවිදිවනු කැමතිව, මාපිය අවසර ඉල්ලා, ඛග්ගවිසාණ සූත්‍රයෙහි **කාමා හි චිත්‍රා** යන මේ ගාථාවට අදාල වූ කතාවෙහි සඳහන් වූ පරිදිම තෙවරක් පැවිදිව - උපැවිදිව, සිවුවන වර පැවිදිව රහත් පල ලැබීය. අනෙක් හිමිවරු 'ඇවැත්නි,

දැන් උපැවිදිවීමට කාලය යැයි' පෙර පුරුද්ද සිහිගන්වති. උන්වහන්සේ, 'ඇවැත්නි, දැන් සිවුරු හැර ගිහිබවට පත්වීම සිදුනොවන බව පැවසූහ. ඒ ඇසූ හිමිවරු, බුදුරජාණන් වහන්සේට සැළ කළවිට, 'එසේය, මහණෙනි, දැන් ඒ තෙරුන්වහන්සේගෙන් සිවුරු හැර ගිය බවට පත්වීමක් සිදුනොවන බවත්, නිකෙලෙස් මුනි බව පැහැදිළි කරමින් මෙම ගාථාව දේසනා කළහ. එහි අරුත නම්, උසස් හික්මීමෙන් යුතු වූයේ **මුනිං**, තනිව වසමින්, පෙර කියන ලද ආකාරයෙන් හෝ උසස් හැසිරීම් රටාවකට කය සිත යොදවමින් **චරනතං** පෙර පරිදි මෛවුන්දම්හි සිත යොමු නොකොට, ආසාරාග අත්හැර දමන ලද උතුම් බවට පත්වූයේ **විරතං** මෛථුනසමා දෙවන පේළිය හා බැඳේ. මෛවුන්දම්හි වෙන්ව හැසිරෙන මුනිවරයා කෙබඳුදැයි කී අයුරුය. **යො යොබබනෙන න උපනිබජඣතෙ කවචි** යමෙක් සුන්දර නව යොවුන් වියෙහිදීම කිසියම් ලලනා රුවක් දැක, පෙර පරිදි මෛවුන්දමෙහි ආසාවෙන් සිත නොබැඳේද, නැතහොත් **කවචි** යනු තමාගේ හෝ අනුන්ගේ හෝ, **යොබබනෙ** - 'මම තවම තරුණ වෙමි, හෝ මේ තැනැත්තා තරුණය, ඒ තාක් ආසාවෙන් ඇසුරු කරමි'යි, මෙසේ රාගයෙන් නොබැඳේ යනු මෙහි තේරුමයි. හුදෙක්ම ලිංගික කටයුතුවලින් වෙන්වීම පමණක් නොව, උපතින් උසස් ආදී ලෙසින් මත්වීම **මදා**, කාමයන්හි සිත නොපවත්වා - එයින් වෙන්ව වාසය කිරීමෙන් **පමාදා විරතං** මෙසේ **මදපපමාදා විරතතතා** එයින් වෙන්වූයේ, **විපපමුතත** එදිනෙදා ජීවිතයට අයත් එක් කටයුත්තකින් පමණක් නොව, සියළුම කෙලෙස්වලින් මනාව මිදුණේ, එසේ නොවේ නම්, **විපපමුතතං විරතං** යනු කුමක්ද? සියළුම කෙලෙස් බැඳුම්වලින් මනාව මිදුණු බැවින්, ලොවුතුරු ආසාවෙන්ද මිදුණේය යන තේරුමයි. **තං වාපි ධීරා** (ඒ පැමිණි ලොවුතුරා උසස් බවටද ආසා රහිත වූ) ඒ නැණවත් තැනැත්තෝ **මුනිං වෙදයනති** ඔබලා එසේ ඒ නැණවත් තැනැත්තාට එසේ නොකියවු නම්, මේ ආකාරයෙන් කියවයි පහදා දෙති.

**අඤඤාය ලොකං** යන ගාථාව දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර වැඩ වසති. ඒ කාලයෙහි නන්ද කුමරුගේ තෙමඟුල වූ අභරණ පැළඳවීම, ඔටුනු පැළඳීම සහ අතිනත් ගැනීම සිදුවිය. භාග්‍යවතුන් වහන්සේද එහි ආරාධනා ලැබ, පන්සියයක් මහසඟණ සමග ගොස්, වළඳ නික්මෙන විට නන්දගේ අතට පාත්‍රය දුන්හ. ඔහු නික්ම යනු දුටු ජනපදකලණිය 'අරියපුතුනි, ඉක්මනින් එන්න'යැයි කීවාය. ඔහු බුදුරජාණන් වහන්සේට දක්වන ගරු සැළකිලි

නිසා 'භාග්‍යවතුනි, පාත්‍රය ගනු මැනවැ'යි කීමට නොහැකිව විහාරයටම ගියේය. භාග්‍යවතුන් වහන්සේ සුවඳ කුටියට පිවිසෙන තැන සිට, 'නන්ද, පාත්‍රය ගෙන එන්නැ'යි කියා (එය) රැගෙන, පැවිදි වන්නෙහිදැ'යි ඇසූහ. ඔහු උන්වහන්සේට දක්වන ගරුසැළකිලි නිසාම පිළිකෙව් කිරීමට නොහැකිව, 'භාග්‍යවතුනි, පැවිදිවෙමි'යි කීය. ඔහු පැවිදි කළහ. නන්ද හිමි ජනපදකලණියගේ වදන් යළි යළිත් සිහිකරමින් කළකිරුණේය. මහණහු එය බුදුහිමිට සැළකළහ. භාග්‍යවතුන් වහන්සේ, නන්ද හිමිගේ උකටලී බව දුරලනු පිණිස, 'නන්ද, ඔබ කලින් තව්තිසා දෙව්ලොවට ගොස් තිබේදැයි ඇසූහ. 'හිමියනි, ඔබ කලින් තව්තිසා දෙව්ලොවට ගොස් තිබේදැයි ඇසූහ. 'හිමියනි, කලින් නොගියෙමි'යි නන්ද හිමියෝ කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ තම බුදුබලයෙන් නන්ද හිමි තව්තිසාවට කැඳවාගෙන ගොස්, විජයොත් පහ දොරටුවෙහි සිටියහ. භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම දැන සක්දෙව් දෙවඟනන් පිරිවරා පහයෙන් බැස්සේය. ඒ සියළුම දෙවඟනෝ කසුප් බුදුරදුන්ගේ සඟ පිරිසට පාදවල ගැල්වීටම තෙල් ලබා දී (ඒ පිනින්) පරෙවියන්ගේ පා වැනි පාද ඇත්තියෝ වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'නන්ද, ඔබ මේ පරෙවිපා ඇති දෙවඟනන් පන්සියය දුටුවෙහිදැ'යි නන්ද හිමි ඇමතූහ. මෙම විමසීමට අදාල සියළු කරුණු විස්තර කළයුතුය. කාන්තාවගේ අඟපසඟ නිමිතිසේ ගතයුතු යැයි මුළු බුදුවදනෙහිම - බුද්ධ දේසනයෙහිම නැත. එහෙත් මෙහිදී භාග්‍යවතුන් වහන්සේ නන්ද හිමිට ගැලපෙන අයුරින් කරුණු පහදා දීමේ හැකියාව අනුව, රෝගියකුගේ (පිත්-සෙම්) දොස් වමනය කොට බැහැර කරනු කැමති වෙදෙකු ඊට සුදුසු ආහාර නියම කරන්නාක් මෙන්, නන්ද හිමිගේ රාගය ඉවත්ලීමට අඟපසඟ නිමිති සේ උපයෝගී කළහ. ඒ වූ කලී අධම මිනිසුන් දමනය කොට හික්මවන උතුම් යහමඟ පෙන්වන්නෙකු පරිද්දෙනි. එහිදී භාග්‍යවතුන් වහන්සේ, දෙවඟනන් නිසා නන්ද හිමිගේ බඹසර හැසිරීමෙහි ඇල්ම දැන, කුළියකට මෙහෙ කරන්නෙකු සේ සළකා දොස් නඟන ලෙස මහණුන්ට දැන්වූහ. නන්ද හිමි, ඒ හිමිවරුන් දොස් නගනු ලබද්දී, ලජ්ජාවට පත්ව, දහමට අනුව නුවණින් විමසා බලා කටයුතුකොට නොබෝ කලකින්ම අරහත් බව අවබෝධ කළේය. නන්ද තෙරුන් සක්මන් කරන මළුවෙහි කෙළවර පිහිටි ගසක වසන දේවතාවා ඒ බව භාග්‍යවතුන් වහන්සේට සැළකළේය. උන්වහන්සේද නුවණින් දත්හ. නන්ද තෙරුන් රහතන් වහන්සේ කෙනෙකු බව නොදන්නා ඒ හිමිවරු පෙර පරිදිම දොස් නඟති. භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, දැන් නන්ද තෙරුන්ට එසේ දොස් නොනැඟිය

යුතුයැ'යි කියා, කෙලෙසුන් නසා මුනිවරයකු වූ බව පහදා, දහම් දෙසනු පිණිස මහණුන් අමතා මෙම ගාථාව වදාළහ.

එම ගාථාවේ අරුත නම්, දුක පිළිබඳ වූ නියම ඇත්ත තහවුරු කිරීමෙන්, ඛන්ධ ආදී වූ රූප වේදනා ලෙසින් දැක්වූ **ලොකං අඤ්ඤාය** එය දැන-වෙන්කොට-තහවුරු කොට, දුක නැතිකිරීම නම් වූ ඇත්ත අවබෝධ කරනු පිණිස **පරමත්‍ථ දසසිං** දුක ඇතිවීමට හේතුව නැති කිරීමෙන් සිවු වැදෑරුම් වූ ද **ඔඝං** හේතුව නැතිකරන ලද බැවින්, රූප ආදියෙන් වන මත්වීමේ වේගයට (හෙවත් තද මානය) අනුව ඇස් ආදී අදාල ආයතන (සබඳතා මත) **සමුද්දඤ්ච** අතිතරිය මගපල අරමුණු කෙරෙන භාවනා මගින් මුළුමනින්ම එතෙරව, ඉක්මවා, ඉහත දැක්වූ පරිදි මේ ආකාරයෙන් කෙලෙස් දුරුකළ අරුතින් **තාදී**, යම් කෙනෙක් මේ රාගාදී කෙලෙස් රැසම ගසාගෙන යන අදහසින් ඕඝ නම් වේ. ඇතුලට බැසයන ගතිසොබාවෙන් යුතුව, ජලය රඳවාගනු ලබන අරුතින් සමුද්‍ර වේ. අදාල හේතුව නැති කිරීමෙන්ම ඒ සැඩ පහරින් යුතු මුහුද තරණයකොට, සැඩපහරින්ද එතර වූ බැවින් දැන් ඔබලා විසින් (ඒ ගැන) මෙසේ කියනු ලබද්දීත්, සිතෙහි අහිතක්, වෙනසක් නැතිව, එකාකාරව පවතී යැයි මෙසේ මෙහි අරුතද, එයින් හැඟෙන කරුණුද දතයුතුය. **තං ඡින්නගන්‍ථං අසිතං අනාසවං** මෙය තුති පැසසුම් වචනයි. මේ සිවුසස් භාවනාවෙන් (දැඩි ලෝභාදී සිරුරෙහි බැඳී පවත්නා) සතරාකාර වූ ගැට ලිහා දමන ලද බැවින්, කෙලෙස් ගැට කපා දැමූ, කිසිම දෙයක දැඩිව ගත් හැඟීම් හා ආසා නොමැති හෙයින්, (අසිතං) සතරාකාර වූ කෙලෙස් නොමැති බැවින්ද අනාසවං යැයි ද කියන ලදී. **තං වාපි ධීරා මුනිං වෙදයනති** කෙලෙස් නැතිකළ එබඳු පැණවත් තැනැත්තා මුනි යයි දක්වති. ඔබලා ඒ බව නොදන්නා හෙයින් මෙසේ කියන්නාහුයැයි දැක්වෙයි.

**අසමා උභො** යන ගාථාව දේසනා කිරීමට හේතුවූ කරුණ කුමක්ද? එක්තරා මහණෙක්, කොසොල් රට පිටිසර ගමක කැලයෙහි වසයි. ඒ ගමෙහි මුව වැද්දෙක් ඒ මහණුන් වසන පෙදෙසට ගොස් මුවන් කොටු කරයි. ඔහු කැලයට පිවිසෙන විට, ඒ හිමියන් පිඬු පිණිස යාම ද දකී. ඔහු කැලයෙන් ආපසු පැමිණෙනවිට ඒ හිමියන් ගමෙන් නික්ම යන අයුරු ද දකී. මෙසේ නිතර දැකීමෙන් හිමියන් කෙරෙහි සෙනෙහසක් ඇතිවිය. ඔහු බොහෝ මස් ලැබෙන විටක ඒ තෙරුන්ටද රසවත් පිණ්ඩපාත දානය පිළිගන්වයි. 'මේ මහණ අසවල් පෙදෙසෙහි මුවන් සිටිතියි ද,

බොහෝ සෙයින් මුවන් හැසිරෙන පෙදෙසකැයිද දිය බොතියිද? වැද්දාට දැනුම්දීම අනුව මුවන් මරමින්, දෙදෙනාම මේ අයුරින් එකතුව ජීවත් වෙතියිද, මිනිස්සු දොස් නගති. භාග්‍යවතුන් වහන්සේද මේ අතර, ජනපද චාරිකාවෙහි යෙදෙමින් ඒ ජනපදයට වැඩියහ. ගමෙහි පිඬු පිණිස ගිය 'මහණහු ඒ තොරතුරු අසා, භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. මුව වැද්දා සමග ඒ හිමියන් සමාන දිවි පැවතුම් නොමැති බවත්, ඒ හිමියන් කෙලෙසුන් නසන ලදින් මුනිවරයෙකු බව පැහැදිලි කරමින්, එම සඟ පිරිසට දහම් දෙසනු පිණිස භාග්‍යවතුන් වහන්සේ මෙම ගාථාව දෙසූහ.

එහි තේරුම නම්, 'මහණෙනි, යම් මහණෙක්ද, යම් වැද්දෙක්ද යන දෙදෙනා අසමා උභො සමාන අයුරින් ජීවත්වේ යැයි මිනිසුන් කියත්ද, එය වැරදිය. කුමක් හෙයින්ද? **දූරවිහාර වුත්තිනො** එකිනෙකාට සමීප නොවූ තැනක වසන බැවින්ද, දිවි පැවැත්මෙන්ද වෙනස් බැවින් **විහාරො** වාසය කරන තැනයි, ඒ මහණ කැලයෙහිද වැද්දා ගමෙහිද වසයි. **වුත්ති** දිවිපැවැත්මයි, ජීවිකාව ගෙන යෑමයි, ගෙපිළිවෙලින් ආහාර ලබාගැනීමට යාම ඒ මහණගේ ජීවිකාවයි. කැලයෙහි මුව ආදී සිවුපාවුන් හා කුරුල්ලන් මරා වැද්දා ජීවිකාව කරයි. **ගිහී දාරපොසී** එමෙන්ම වැද්දා ඒ සතුන් මැරීමෙන් අඹුදරුවන් ද ජීවත් කරයි. **අමමො ච සුබ්බතො** අඹුදරුවන් කෙරෙහි ආසා බලාපොරොත්තු හා මට - මගේ යන හැඟීම් දුරුකොට, යහපත් වූත් සොඳුරු වූත් පැවතුම් ඇති ඒ කෙලෙසුන් නැසූ පැවිදි තැනැත්තා **පරපාණරොධාය ගිහී අසංයතො** නැවතද, ඒ දඩයම්කාර වැද්දා කය, වචනය හා සිතින් අසංවර ව, ගිහියෙක්ව අනුන් ජීවත් කරවනු පිණිස ඒ සතුන්ගේ ජීවිතය වනසාලයි. **නිච්චං මුනී රක්ඛති පාණිනො යතො** අනෙක් තැනැත්තා වූ කෙලෙස් නැසූ මුනිවරයා කය, වචන, සිත නිති සංවරව, ජීවීන් හැමදෙනාම රැකගනී. කරුණු මෙසේ හෙයින් ඔවුන් සමානව ජීවත්වෙතියි කෙසේ සිදුවේද?

**සිඛී යථා** යන ගාථාව දේසනා කිරීමට හේතුවූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුර වැඩවසන කල, 'මුලින් සෝවාන් පල ලද තැනැත්තා, පසුව සෝවාන් පල ලද තැනැත්තාට වඩා දහමෙන් වැඩිමහල්ය. එහෙයින් පසුව සෝවාන් පල ලද පැවිද්දෙකු වුවත්, කලින් සෝවාන් පල ලද ගිහියාට නමස්කාර කළ යුතුයැ'යි සැකි කුලවතුන් අතර කතාබහ ඇතිවිය. පිඬු පිණිස පිවිසි එක්තරා මහණෙක් ඒ කතාව අසා භාග්‍යවතුන් වහන්සේට සැළ කළේය. භාග්‍යවතුන් වහන්සේ, 'මේ

කරුණෙහිලා මුල් හේතුව වෙනත් එකකි. පිදිය යුතු දෙය පිළිබඳව සළකා 'මහණෙනි, අනාගාමී වූ ගිහියෙකු වුවත්, ඔහු විසින් එදිනම පැවිදි වූ සාමණේර හිමි නමකට වුවද නැමදීම් ආදිය කළයුතු වේමැ'යි කියා, නැවතත්, පසුව සෝවාන් පල ලද මහණක වුවත්, ඊට කලින් සෝවාන් පලයට පත් ගිහියෙකුට වඩා බොහෝ වෙසෙස් වෙනසක් දක්වමින් සඟ පිරිසට දහම් දෙසනු පිණිස මෙම ගාථාව වදාළහ.

එහි තේරුම නම්, යම් දෙයක මුදුනෙහි හටගන්නා ලද සිළුවක් (කුඩුම්බියක්) ඇති බැවින් එය **සිඛී** නම් වේ. මැණික් දඬුවක් හා සමාන ගෙලින් යුතු **නීලගීවො** මොනරා **විහංගමො** (ඉගිලී යන අදහසින්) කියනු ලැබේ. යම්සේ, කොළපැහැ හංස, තඹ හංස, කිරිහංස, කළුහංස, මේරු හංස, රන් හංසයන් අතරින් වේගය අනුව **හංසසස** ජවෙන දහසයෙන් පංගුවක් ලෙසින් **න උපෙති** රන් හංසයා මොහොතකින් යොදුන් දහසක් වුවත් යයි. අනෙක් හංසයෝ යොදුනක් තරම්වත් යාමට නොහැකි වෙති. දැකුම්කළු බවින් නම් හංසයන් අගනේය. එවං **ගිහී** පළමු සෝවාන් පල ලද තැනැත්තා මග දැකීමෙන් ලස්සන වේ. ඉක්බිති, පසුව සෝවාන් පල ලද තැනැත්තාද මග දැක්මෙන්, දැකුම්කළු බවින් නම් සමාන වේ. **භික්ඛුනො** දිවයන වේගයෙන් අනුකරණය නොකරයි. කුමන වේගයෙන්ද? මග විදසුන් නුවණෙහි වැඩිම වේගයෙන්, ගිහියෝ අඹුදරු ආදීන්ගෙන් අවුලෙන් බැඳී අවුලටම පත්ව ඇති බැවින්, එම නුවණින් අඳ මෝඩ වෙති. මහණහු එබඳු අවුල් ලිහා දමන ලද බැවින්, ඉතා බලවත් වෙති. මේ අරුත භාග්‍යවතුන් වහන්සේ විසින් **මුනිනො විවිත්තසස වනසමිං ඣායතො** යන මේ පදයෙන් පෙන්වා දෙන ලදී. මෙහිදී මගපල ලබන මුනිවරයා කය, සිත විවේකයෙන් යුතුය. ලකුණු, අරමුණු නැවත නැවත සිහිපත් කරමින් වනයෙහි නිතර දැහැන් වඩයි. ගිහියෙකුට මෙබඳු විවේකයද, දැහැන්ද කොයින්ද? මේ කරුණු මෙයින් අදහස් කෙරේ.

මුනි සූත්‍ර විස්තරය නිමි.

**විස්තර තේරුම් සහිත පළමු කොටස වූ උරග වගග නිමි.**

# 2.1

යානීධ භූතානි යනු රතන සූත්‍රයයි. එය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? අතීතයේ විසල් පුර දැඩි ආහාර හිඟවීම ආදී උවදුරු ඇතිවිය. ඒ උවදුරු දුරුකරගනු පිණිස ලිච්ඡවීහු රජගහ නුවරට ගොස් ආයාචනාකොට භාග්‍යවතුන් වහන්සේ විසාලාවට වැඩම කරවූහ. මෙසේ වැඩමවාගෙන ආ භාග්‍යවතුන් වහන්සේ ඒ උවදුරු දුරුකරනු පිණිස මෙම සූත්‍රය දේසනා කළහ. මේ එහි කෙටි සඳහනයි. පැරණි ඇදුරෝ මෙහිදී විසල්පුර ගොඩනැගුන අයුරු මුල පටන්ම විස්තර කරති. ඒ විස්තර මෙසේ දතයුතුය. බරණැස් රජුගේ අග මෙහෙසියගේ කුසෙහි දරුගැබක් පිහිටියේය. ඇය එය දැන රජුට දැන්වූවාය. රජ ගැබිනියක වෙනුවෙන් කළයුතු සියළු කටයුතු හා රැකවරණ (ගැබ් පෙරහර) සැලසීය. ඇය මැනවින් ගැබ දරාගනිමින්, ගැබ මේරූ කල වදනාගෙට පිවිසියාය. පින් ඇති තැනැත්තියන්ට දරු උපත සිදුවන්නේ අළුයම් කාලයේදීය. එබඳු තැනැත්තියන් අතර ඇයද වූවාය. අළුයම් වේලෙහි ලාකඩ පටලයක් (වැසුණු) වැනි බඳු වදමලක් මෙන් මස්වැදැල්ලක් ඇය බිහිකළාය. එවිට, ඇය, 'අනික් බිසෝවරුන් රන් පිළිම බඳු පුත්තු වදති. අග මෙහෙසිය මස් වැදැල්ලක් වැදුවා'යැයිද රජු ඉදිරියේ අපහාසයට ලක්වන්නේ යැයි ද සිතා, ඒ අපහාසයට බියෙන්, එම මස්වැදැල්ල එක්තරා බඳුනක බහා, වෙනත් බඳුනකින් වසා, රාජකීය සලකුණු තබා, (ගඟෙහි) දැමූවිටම, දේවතාවෝ රැකවරණ සැලසූහ. රන් තහඩුවක, රත්සිරියල්වලින් 'බරණැස රජුගේ අග මෙහෙසියගේ දරුවන්' යැයිද එහි ලියා තැබූහ. එම බඳුන දියසුළි ආදී උවදුරු නැතිව ගඟ පහළට පාවී ගියේය. මේ කාලයෙහි එක්තරා තාපසයෙක් ගොපළු පවුල්වලින් සත්කාර ලබමින්, ගංතෙර වසයි. ඔහු උදෑසනම ගඟට බසිද්දී ඒ භාජනය පාවී එනු දැක, පංසුකූල හැඟීමෙන් (කුණු ගොඩක් එතු රෙදි යැයි සළකා) අතට ගත්තේය. ඒ අකුරු සඳහන් තහඩුව හා රාජකීය සලකුණුද දැක, එය ඉවත්කළ පසු මස් වැදැල්ල දුටුවේය. මෙය දරු (ගැබක්) කලලයක් විය යුතුය. එසේම මෙහි දුගඳක් හෝ කුණුවූ බවක් නැතැ'යි ඒ දුටු තවුසාට සිතුණි. ඔහු එය ගෙනගොස් පිරිසිදු තැනක තැබීය. අඩමසක් ගතවූ විට එම මස්වැදැල්ල මස්වැදලි දෙකක් සේ බෙදුණි. තාපසයා ඒ දැක වඩාත් හොඳින් සුදුසු තැනක තැබීය. නැවත අඩමසකට පසුව එක් එක් මස්වැදැල්ලක අත්, පා, හිස පිණිස ගැට (ගඩු) පහක් පහක් බැගින් මතුවිය. තවත් අඩමසකින්,

එක් මස් වැදැල්ලකින් රන් පිළිමයක් බඳු පිරිමි දරුවෙක්ද, අනෙක් මස් වැදැල්ලෙන් දැරියක්ද ඇතිවිය. තාපසයාට ඔවුන් කෙරෙහි දරු සෙනෙහස පහළ විය. ඔහුගේ මහපටඇඟිලි තුඩින් කිරි වැගිරේ. එතැන් පටන් කිරිබත්ද ලබයි. තාපසයා බත් කා ඒ දරුවන්ගේ මුවෙහි කිරි තවරයි. ඔවුන්ගේ කුස තුළට පිවිසෙන ඒ සියල්ලම මැණික් බඳුනකට දැමුවා සේ විනිවිද පෙනේ. (සිරුරෙහි) සමක් නොමැති විය. මසා තැබුවාක් මෙන් ඔවුන් එකිනෙකාගේ සම තුනී වී යැයි ඇතැම්හු කියති. මෙසේ ඔවුහු සම නොමැති බැවින් හෝ තුනී සම ඇති බැවින් හෝ 'ලිච්ඡවී' යැයි හැඳින්වූහ. දරුවන් ඇතිදැඩි කරන තාපසයා හිරු පෑයූ කල පිඬු පිණිස ගමට පිවිසෙයි. මහ දාවලෙහි ආපසු එයි. තවුසාගේ එම වැඩකටයුතු දැනගත් ගොපල්ලෝ 'හිමියනි, පැවිද්දන්ට දරුවන් ඇතිදැඩි කිරීම අවහිරයකි. දරුවන් අපට දෙන්න, ඇතිදැඩි කරන්නෙමු, ඔබතුමාට සුදුසු කටයුතු කරනු මැනවැ'යි කීහ. තාපසයා 'යහපතැයි පිළිතුරු දුනි. ගොපල්ලෝ මග වලගොඩැලි සමකොට, මල් අතුරා, දද කොඩි ඔසවා වාදන භාණ්ඩ වයමින් පසුදින අසපුවට පැමිණියහ. තාපසයා ද, 'මහත් පින් ඇති දරුවන්ය, මහත් සැළකිල්ලෙන් නොපමාවම ඇතිදැඩි කරව, ඇතිදැඩිකොට එකිනෙකා ආවාහවිවාහ කටයුතු කරව, පස්ගෝ රසින් රජු සතුටුකොට, බිම් කොටසක් (ලබා) ගෙන, නගරයක් සකසව, එහි කුමරු ඔටුනු පළඳවයි කියා දරුවන් (ඔවුන්ට) දුන්නේය. ඔවුහු යහපතැයි කියා දරුවන් ගෙන ගොස් ඇතිදැඩි කළහ. එසේ ඇතිදැඩිවන දරුවෝ අනෙක් ගොපළු දරුවන් හා කෙළි සෙල්ලම් කරමින්, (එකිනෙකා අතර) මතභේදාත්මක කරුණු ඇතිවූ විට අතින් පයින් පහර දෙති. ඒ ගොපළු දරුවෝ හඬති. ඔවුන්ගේ මව්පියන්, 'කුමක් නිසා හඬවුදැ'යි ඇසූවිට, 'මව්පියන් නැති, තාපසයා හදාවඩා ගත් මොවුන් අපට තදින් පහර දෙති'යි කියති. එවිට ඔවුන්ගේ මව්පියෝ, 'මේ දරුවන් අනෙක් දරුවන් පීඩාවට පත්කරති. දුකට පත්කරති. මොවුන්ට උදව් නොකළ යුතුය, මොවුන් දුරුකළ යුතුය. ඈත් කළ යුතුයැ'යි කීහ. (ඉමෙ වජ්ජිතබ්බා) එතැන් පටන් යොදුන් තුන්සියයක් වූ ඒ ජනපදය 'වජ්ජී' යැයි කියනු ලැබේ. ඉක්බිති ගොපල්ලෝ රජු සතුටුකොට ඒ පෙදෙස මිලට ගත්හ. එහි නගරයක් සකසා, සොළොස් වයසැති කුමරා අබිසෙස් කොට රජබවට පත්කළහ. 'පිටතින් දැරියක කැඳවා නොඈ යුතුය, මේ දැරිය වෙනත් කෙනෙකුට ද නොදිය යුතුයැයි' ඇය හා කතිකාකොට (විවාහය සඳහා) වෙන්කොට ගත්හ. ඔවුන්ගේ පළමු එක්වීමෙන්ම, දුවක්ද පුතෙකුද ලදහ. මෙසේ දහසය වාරයක්ම දෙදෙනා බැගින් උපත ලදහ. ඔවුන්ගේ දරුවන්

නිසි පරිදි වැඩෙනවිට, පළතුරු උයන්, වාසය කරන තැන් සඳහා පිරිවර ජනතාවට ඉඩකඩ මද වූ බැවින්, ඒ නගරය තෙවරක්ම ගවුවක්, ගවුවක් අතර පවුරකින් වටකළහ. එය නැවත නැවත (දිග-පළලින්) විසාල කරන ලද බැවින් වෙසාලී හෙවත් විසාලා නම් විය. මේ විසල්පුර ඇතිවූ අයුරුයි.

මේ විසාලා නුවර භාග්‍යවතුන් වහන්සේ පහළ වූ කල්හී මහත් යසඉසුරින් සපිරිණ. එහි රජවරුම හත්දහස් හත්සිය දෙනෙක් වූහ. එසේම යුවරජවරු, සේනාපතිවරු, භාණ්ඩාගාරික තනතුරු දරන්නෝ ද වූහ. එහෙයින් කියන ලදී. 'ඒ කාලයෙහි විසාලාව යසඉසුරින් පිරුණු, බොහෝ ජනගහණයෙන් යුතු, නිති මිනිසුන් ගැවසෙන, ආහාර සුලබ වූ, හත්දහස් හත්සිය සතක් පහයෙන්ද, එපමණම වූ කුළුගෙවලින්ද, මල්පලතුරු උයන්වලින්ද, එපමණ පොකුණුවලින්ද යුතු විය. පසුකලෙක ඒ විසල්පුරය ආහාර දුලබ වීය. වැසි නොමැතිව අස්වැන්න පාළු විය. මුලදීම දුගී මිනිස්සු මැරෙති. ඔවුන් පිටතට ගෙනගොස් දමති. මළසිරුරු කුණුව හමන ගඳින් භූතයෝ නුවරට පිවිසියහ. එයින්ද බොහෝ මිනිසුන් මැරෙති. එහි පිළිකුල නිසා, ඉතිරිව සිටි වැසියන්ට මහාමාරිය රෝගය වැළඳුණි. මෙසේ ආහාර දුලබවීම, භූත බිය සහ රෝග බියෙන් උවදුරු ඇතිවූ විට නගරවාසීහු රජු හමු වී 'මහරජතුමනි, මේ නගරයෙහි තුන් බියක් හටගෙන ඇත. මීට පෙර, සත් කුල රජ පරපුරක පටන් මෙබඳු දෙයක් නොවූ විරූය. ඔබවහන්සේගේ අදැහැමි බවෙන් දැන් එසේ සිදුවී යැයි පැවසූහ. රජු සියළුදෙනා පුරහලට රැස්කරවා, 'මගේ අදැහැමි බවක් ඇතොත් එය පෙන්වා දෙව'යි කීය. ඔව්හු මුළු රජ පරපුරම ගැනම විමසමින් කිසිදු දොසක් නුදුටුවහ. එහිදී රජුගේ වරදක් නොදැක, 'මේ බිය අප කෙසේ සංසිඳවන්නෙමු'දැයි සිතුහ. 'මගපෙන්වන නායකයන් ලෙස සැළකූ පූරණකසසප ආදී හයදෙනා නගරයට පමුණුවා ගත්විට බිය සංසිඳෙන්නේ'යැයි ඇතමෙක් පැවසූහ. 'ලොව බුදුවරයෙකු පහළවී ඇත. ඒ භාග්‍යවතුන් වහන්සේ සියළු සත්වගට හිතසුව පිණිස දහම් දෙසති. මහත් ඉඳුබල ඇතියහ. මහා බලසම්පන්න වෙති. එතුමන් මේ පුරයට කැඳවනු ලබන්නේ නම් බිය සංසිඳේ යැයි ඇතමෙක් කීහ. එයින් සතුටට පත් නගරවාසීහූ, 'ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් වැඩවසන්නේ කොතැනද? අප පණිවුඩ යැවූකල පැමිණේවිදැ'යි ඇසූහ. 'බුදුවරු නම් අනුකම්පා ඇතියහ. නොපැමිණෙන්නේ කවර කරුණක් නිසාද? ඇතමෙක් ඇසූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් රජගහනුවර වැඩ වසති. බිම්බිසාර රජුද

උන්වහන්සේට උවටැන් කරයි. ඇතැම්විට රජු පැමිණීමට ඉඩ නොදෙනු ඇතැ'යි (කෙනෙක් කීය) 'එසේනම්, රජුට කරුණු පහදා දී කැඳවාගෙන එන්නෙමු'යි ලිච්ඡවී රජවරු දෙදෙනෙකු මහත් බලසෙන් පිරිවරා, තුටුපඬුරු දී බිම්බිසාර රජු වෙත යැවූහ. ඔව්හු බිම්බිසාර රජුට පඬුරු පිළිගන්වා ඒ තොරතුරු දන්වා, 'මහරජ, භාග්‍යවතුන් වහන්සේ අපගේ නගරයට වැඩම කරවීමට (උපකාර වන ලෙස) කීහ. රජු එය නොපිළිගත්තේය. 'ඔබම (ඊට සුදුසු පරිදි) දැනගනුව'යි කීය. ඔව්හු භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ වැඳ 'හිමියනි, අපගේ නගරයෙහි තුන් බියක් හටගෙන ඇත. ඔබවහන්සේ වැඩම කරන්නේ නම්, අපට යහපතක් වන්නේ'යැයි කීහ. භාග්‍යවතුන් වහන්සේ (දිවැසින්) බලා 'විසාලාවෙහි රතන සූත්‍රය දේසනා කළවිට, එහි රැකවරණය කෙළ සියදහසක් සක්වළ පැතිර යන්නේය. දේසනය නිමවන විට, අසූහාර දහසකට දහම් අවබෝධ වන්නේ යැයි (ආරාධනය) පිළිගත්හ. බිම්බිසාර රජු, භාග්‍යවතුන් වහන්සේ ඒ ආරාධනය පිළිගත් බව අසා, 'විසල්පුරට බුදුරදුන් වඩිනා බව නගරයෙහි පතුරුවා, උන්වහන්සේ වෙත එළඹ, 'හිමියනි, විසල්පුරට පැමිණීමට කරන ලද ආරාධනය භාරගන්නා ලදදැ'යි ඇසීය. 'එසේය මහරජ'යි වදාළ විට, 'එසේනම් හිමියනි, වඩිනා මග පිළියෙල කරන තෙක් ඉවසනු මැනවැ'යි පැවසීය. බිම්බිසාර රජු ඉක්බිතිව, රජගහනුවර සිට ගංගා නදිය තෙක් පස්යොදුන් බිම සමකොට යොදුනෙන් යොදුන විහරණයට සුදුසු තැන් සකසා, ගමනට සුදුසු කාලය දැන්වීය. පන්සියයක් බික්සඟණ පිරිවරා භාග්‍යවතුන් වහන්සේ වැඩියහ. රජු පස්යොදුනක් පමණ වූ මග පස්පැහැ මල් දණක් පමණට විසිරුවා, දද කොඩි, පුන්කලස්, කෙසෙල්ගස් ආදිය ඔසවා, භාග්‍යවතුන් වහන්සේට සුදු සේසත් දෙකක්ද, එක් එක් හිමිනමකට එක් සේසත බැගින්ද සේසත් රැගෙන යන්නවුන් යොදවා, තමන් ද පිරිවර සමග මල් සුවඳ ආදියෙන් පූජා කෙරෙමින්, එක් එක් විහාරයෙහි බුදුරදුන් විහරණයට සලස්වා මහදන් පිරිනමා, දින පහකින් ගංතෙරට වැඩමවීය. එහි සියළු ආකාරයෙන්ම, අලංකාර වූ නැවක් සකසා, 'භාග්‍යවතුන් වහන්සේ, පැමිණියහ. මග පිළියෙල කොට, සියල්ලන්ම උන්වහන්සේට පෙරගමන් කරව'යි විසල්පුර වාසීනට පණිවුඩයක් යැවීය. ඔවුහුද 'පුද පූජා දෙගුණ කොට කරන්නෙමු'යි විසල්පුර හා ගංගා නදිය අතර තුන්යොදුන් මග සමකොට කරන්නෙමු'යි විසල්පුර හා ගංගා නදිය අතර තුන්යොදුන් මග සමකොට, භාග්‍යවතුන් වහන්සේට සුදු සේසත් සතරක්ද, එක් එක් හිමිනමකට සුදු සේසත් දෙක බැගින්ද රැගෙන යන්නවුන් යොදවා පූජා කරමින් ගංතෙරට පැමිණියහ. බිම්බිසාර

රජු නැව් දෙකක් එක්කොට වේදිකාවක් තනා, මල්දම් ආදියෙන් අලංකාර කොට, එහි මුළුමනින්ම රනින් නිම වූ බුදු අසුන පැනවීය. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩසිටියහ. පන්සියක් භික්සඟණද නැවට නංවා සුදුසු පරිදි වඩා හිඳවූහ. රජු, භාග්‍යවතුන් වහන්සේ පසුපසින් ගොස්, ගෙල පමණ දියෙහි බැස, 'හිමියනි, ඔබවහන්සේ ආපසු වඩිනා තෙක් මම මේ ගංතෙරෙහිම නැවතී සිටින්නෙමි'යි කීය. ගඟ ඉහළින් සිට දේවතාවෝ අකනිටා භවන තෙක්ම පූජා කළහ. ගඟ පත්ලෙහි වෙසෙන කම්බල අසසතර ආදී නාරජවරු ද පූජා කළහ. මෙසේ මහත් පූජා ලබමින් භාග්‍යවතුන් වහන්සේ ගඟෙන් යොදුනක මග ගෙවා, විසාලා නුවර සීමාවට පැමිණියහ. එහිදී ලිච්ඡවී රජවරු, බිම්බිසාර රජු විසින් කරන ලද ඒ පූජා දෙගුණ කරමින්, ගෙලවටක් පමණම දියට බැස භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කළහ. එකෙණෙහිම විදුලිය පැහැයෙන් අඳුර දුරු කෙරෙන අතර, සිවුදෙසම දෝර ගලායන මහ වැසි වැස්සේය. ඉක්බිතිව භාග්‍යවතුන් වහන්සේ ගංතෙරෙහි මුල් පියවර තැබූවිටම පොකුරු වැසි වැස්සේය. එයින් තෙමෙනු කැමැත්තෝම තෙමෙති. නොකැමැත්තෝ නොතෙමෙති. හැමතැනකම දනක් පමණට, කලවා පමණට, ඉඟටිය පමණට, ගෙල පමණට වතුර ගලයි. මළ සිරුරු ආදී සියළු අපිරිසිදු දෑ වතුරින් ගඟට ගසාගෙන අවුත්, බිම් පෙදෙස ඉතා පිරිසිදු විය. ලිච්ඡවී රජවරු භාග්‍යවතුන් වහන්සේ යොදුනෙන් යොදුන නවතාගෙන මහදන් දී දෙගුණයක් පූජා පවත්වමින් තෙදිනකින් විසල් පුරට කැඳවාගෙන ගියහ. භාග්‍යවතුන් වහන්සේ විසල්පුර පැමිණිවිට සක්දෙවිඳු දෙව් පිරිස පිරිවරා එහි ආවේය. මහා බලවත් දෙවියන් රැස්වෙද්දී, නොමිනිස් යක් භූතයෝ සියල්ලෝම පලාගියහ. භාග්‍යවතුන් වහන්සේ නගර දොරටුවෙහි සිට, 'ආනන්ද, මේ රුවන් සුතුර ඉගෙන, පූජා උපකරණ ගෙන, ලිච්ඡවී කුමාරවරුන් සමග විසාලාවෙහි තුන්පවුරු ඇතුලතම සැරිසරමින් පිරිත් කරව'යි අනඳ තෙරුන්ට එය වදාළහ. මෙසේ මෙම සූත්‍රය කවුරුන් විසින්, කවදා, කොහිදී කුමක් නිසා පවසන ලදැයිද යන මේ පැන විසඳමින් (අදාල) විස්තර ලෙස විසල්පුරය ගොඩනැංවීමේ පටන් පැරණි වියත් ඇදුරන් පහදා දෙනු ලබති.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසල්පුරට පැමිණි දවසේම, ඒ උවදුරු වැළකීම පිණිස, නගර දොරටුවෙහි වැඩසිට වදාරන ලද මෙම රතන සූත්‍රය ඉගෙන ගත් ගරු කටයුතු ආනන්ද හිමි රැකවරණ සලසනු පිණිස කියමින්, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රයෙන් මුළු නගරයෙහිම පිරිත්

පැන් ඉසිමින් සැරිසැරූහ. උන්වහන්සේ විසින් යං කිඤ්චි යැයි කී පමණින්ම, එතෙක් ඉවත් නොවූ, කසල ගොඩවල බිත්ති මුළුවල ආදී තන්හි සිටි යක් භූතයෝ දොරටු සතරෙන්ම පලාගියහ. (පිටවීමට) දොරටු අවහිර විය. ඇතැම් දොරටුවල ඉඩ නොලැබ, පවුර බිඳගෙන ද පලාගියහ. යක් බූ නොමිනිසුන් පලාගිය කෙණෙහිම, මිනිස් සිරුරුවල රෝග සංසිඳුණි. ඔවුහු පැමිණ, සියළු සුවඳමලින් තෙරුන් පිදූහ. මහජනයා නගර මැද පිහිටි රැස්වීම්හල සියළු සුවඳ තවරා, වියන් බැඳ, සියළු අලංකාරයෙන්ම සරසා, එහි බුදුරජාණන් වහන්සේට අසුනක් පණවා වැඩම කරවූහ. භාග්‍යවතුන් වහන්සේ රැස්වීම්හලට පිවිස පණවන ලද අසුනෙහි වැඩහුන්හ. සංඝයා වහන්සේද, රජවරුද නගරවාසීහුද සුදුසු පරිදි ඉඩ ඇති තැන්වල හුන්හ. සක්දෙව්ද දෙව්ලෝකවල දෙව් පිරිස සමග සිටියේය. වෙනත් දෙව්යෝද පැමිණියහ. ආනන්ද තෙරණුවෝද මුළු විසාලාවෙහිම සැරිසරමින්, රැකවරණ සලසා, නගරවාසීන්ද සමග පැමිණ එකත්පස්ව සිටියහ. එහිදී භාග්‍යවතුන් වහන්සේ සියල්ලන්ටම ඒ රතන සූත්‍රයම දේසනා කළහ.

එහි **යානීධ භූතානි** මුල් ගාථාවෙහි යානී යම් ආකාරයෙකින් උසස්කමින්, බලයෙන් අඩුවූ හෝ, උසස්කමින්, බලයෙන් වැඩි හෝ ඉධ මේ පෙදෙසෙහි, ඒ වේලාවෙහි රැස්වූ තැන උදෙසා කීය. භූතානි-භූත යන වචනය කිසියම් දෙයක් සිදුවූ විට, ඇතිවූ විට, 'මෙසේ වූ විට පචිති ඇවැතක් වේ' භූතසම්ං පාචිත්තියං' යැයි සඳහන් වේ. තව ද 'මහණෙනි, මෙය ඇති තතු පරිද්දෙන් සළකා බලව' 'භූතමිදනති භිකඛවෙ සමනුපසසථ' යනුවෙන් ඛන්ධ පඤ්චකය හෙවත් සිරුර පිළිබඳවද, 'මහණ, සතරාකාර වූ මහාභූත හේතුකොටගෙන, 'චත්තාරො ඛො භිකඛු මහාභූතා හෙතු' යන තැන පඨවී ආදී කොට ඇති ධාතු කොටස් සඳහාද, 'යමෙක් (ජීවිත) කාලය නසා ඇත්ද' 'යො ච කාලඝසො භූතො' මෙබඳු තැන කෙලෙස් නසන ලද අරුතින්ද 'ලොව හටගත් සියල්ලම හැර දමති' 'සබෙබව නිකඛිපපිසසනති භූතා ලොකෙ සමුසසයං' යන තැන සියළු සතුන් අරුතෙහිද, 'භූතගාමපාතව්‍යතාය' යන තැන ගස් ආදියටද, 'හටගත් ජීවීන් ඒ ඒ පරිදි හඳුනාගනිති', 'භූතං භූතතො සඤ්ජානාති' - මේ ආදී තන්හී චතුමමහාරාජික දෙව්ලොවෙන් පහළ සජීවීන් - සජීවී සිරුරු ඇතියවුන් දැක්වීමට යෙදේ. මෙසේ අරුත් කිසිපයක භූත යන්න යෙදුණත්, මෙහිදී පොදුවේ මිනිසුන් නොවන ජීවීන් යැයි දතයුතුය. **සමාගතානි** රැස්වූ, **භුමමානි** පොළවෙහි උපන්, වා යනු විකල්පයෙහි, එයින් මෙහි

පොළවෙහි උපන් හෝ රැස්වූ යම් නොමිනිස් කොටස් යනුවෙන් එක විකල්පයක් දක්වා නැවත දෙවැනි විකල්ප කරුණක් දැක්වීමට **යානිව අනතලික්ඛෙ** යැයි කීය. අහසෙහි යම් භූත කොටසක් උපන්නාහුද, ඒ සියල්ලෝම මෙහි රැස්වූහයි තේරුමයි. මෙහිදී යාම දෙව්ලොව පටන්, අකනිට්ඨා බඹලොව පටන් උපන් භූතයන්ද, අහසෙහි පහළ වූ විමානවල උපන් බැවින් අහසෙහි භූතයන් ලෙසද දතයුතුය. එමෙන්ම මහාමේරු පව්වෙන් යට පොළව දක්වා ගස්වැල්වල අරක්ගත්තා වූ පොළවෙහිද උපන් භූතයන්ද, ඒ සියල්ලන්ම බිම හා සම්බන්ධ වූ ගස්වැල් පව් ආදියෙහි උපන් බැවින් පොළවෙහි භූතයන් ලෙස දතයුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මිනිසුන් ලෙස නොසැළකෙන සියලුම ජීවීන් **භුම්මානි වා යානිවඅනතලික්ඛෙ** යැයි පද දෙකකින් අදහස් දක්වා නැවත එක වචනයකට ගෙන, **සබ්බෙව භූතා සුමනා භවනතු** යැයි කීහ. **සබ්බෙ** එක් කොටසක් අමුතුවෙන් නොදක්වා, **එව** අවධාරණයෙන්, එක කොටසක් හෝ අත් නොහැරෙන පරිදි යන අදහසයි. **භූතා** මිනිස් නොවූ, **සුමනා භවනතු** යහපත් සිතින්, සතුටු සොම්නස් ඇත්තෝ වෙත්වා! **අථොපි** ඒ අතර, හඳුනාදීම සඳහා වැකි සම්බන්ධවීමේ නිපාත දෙකකි. **සකකචච සුණනතු භාසිතං** අරුත් තේරුම් ගෙන, මෙනෙහිකොට, සියළු යහපත් සිතිවිලි එක්කොටගෙන, දිවසැප හා ලොවුතුරු සැප ගෙනදෙන මගේ දේසනය අසත්වා! මෙසේ භාග්‍යවතුන් වහන්සේ **යානීධ භූතානි සමාගතානී** යැයි අනියම් වචනයකින් භූතයන් දක්වා, නැවත පොළවෙහි හෝ අහසෙහි දෙආකාරව කියා, එයින්ද **සබ්බෙව භූතා** යැයි නැවත එක් අදහසක් සේ ගෙන, **සුමනා භවනතු** යනුවෙන් මෙහිදී ඇතිවන (සිතෙහි) යහපත් සොබාවය පෙන්වමින්, **සකකචච සුණනතු භාසිතං** යයි එසේ උත්සාහවත්ව කටයුතු කිරීමෙන් ලබන පලයෙන්, එසේම නුවණින් මෙනෙහි කිරීම, වෙනත් කෙනෙකුගෙන් (මේ පිළිබඳව) ඇසීමෙන් ලබන වැටහීම, යහපත් පුද්ගල ඇසුර ලැබීම හා තම සිත මනාව පිහිටුවා ගැනීමටත්, ගැඹුරු නුවණ වැඩිදියුණු කරගැනීමේ හැකියාවත් මෙහි සම්පත් ලෙසින් ලැබෙන බව දක්වමින් ගාථාව නිමා කළහ.

**තසමා හි භූතා** දෙවන ගාථාවයි. **තසමා** (ඊට) හේතුවන අයුරු දක්වන වචනයකි. **භූතා** ඇමතීමට යෙදූ වචනයයි. **නිසාමෙථ** - අසව. **සබ්බෙ** වෙන්කොට සඳහන් කිරීමක් නැතිව, කුමක් නිසා එසේ කියන ලදද? ඔබ හැමදෙනම දෙව්විමන් හැර, එහි විඳින සැප සම්පත්ද හැරදමා මෙහි පැමිණියේ දහම් අසනු පිණිසය. එසේ නැතිව, නැටුම් ගැයුම්

බැලීමට නොවේ. එහෙයින් භූතයනි, සියල්ලන්ම අසත්වා!යි දැක්වූහ. නැතහොත් **සුමනා භවනතු** මනාකොට අසත්වා! යන වචනයෙන් ඔවුන් සතුටුවන බවද, හොඳින් ඇසීමට කැමති බවද දැක 'ඔබහැම සතුටෙන්, තම සිත එකඟ කරගෙන, නුවණින් මෙනෙහි කරමින්, පිරිසිදු සිතැතිව, මනාව අසනු කැමතිව, (බුදුවරයෙකු වැනි) යහපත් කෙනෙකු ඇසුරෙන් ඇසීමෙන් ලබන පිරිසිදු දැනීමෙන් යුතුව (අසනු මැනව) අසත්වා! නැතහොත්, කලින් කියන ලද ගාථාවෙහි **භාසිතං** යනුවෙන් අදහස් වන දේ පිළිබඳ කරුණු දක්වමින්, 'මගේ මේ කීම ඉතා දුලබයි, දහම් ඇසීම නොලබන කෙනෙකුට ද (බුදුවරයෙකු පහළවන කාලයද) අදාල එවන් මොහොතක් ලැබීම දුලබ බැවින්ද, නොයෙක් ලෙසින් වැඩදායී වන, නුවණ හා කරුණා ගුණය පවත්නා බැවින්ද, එය කීමට කැමතිව **සුණනතු භාසිතං** යනුවෙන් මම කියමි. එහෙයින් (මෙය) සියළුම භූතයෝ අසත්වා! යනුවෙන් මේ ගාථාපදයෙන් කියන ලදී. මෙසේ මේ කරුණු ඉස්මතු කරමින්, තමන් කියන දෙය ඇසීමට යොමුකොට, **මෙත්තං කරොථ මානුසියා පජාය** යනුවෙන් දේසනය ඇරඹී සේක. එහි තේරුම නම්, උවදුරු තුනකින් පීඩිත වූ මිනිස් සමූහයක් වේද, එම මිනිස් සමූහයා කෙරෙහි හිතවත් බව පෙරදැරිව කටයුතු කරව යනුයි. ඇතමෙක් මානුසියං යනුවෙන්ද කියති. එය පොළවෙහි හටගත් ජීවීන් හා නොයෙදේ. වෙනත් අයුරින් විස්තර කිරීමද එසේ නුසුදුසුය. මෙයින් අදහස් කෙරෙන්නේ 'මම බුද්ධ' යැයි එහි ඉසුරුමත් බවකින් නොකියමි. එහෙත් ඔබහැමදෙනාටද මේ මිනිස් වගටද හිතවත්ව, **මෙත්තං කරොථ මානුසියා පජාය** යැයි කියන බවයි.

'යම් තැනැත්තෙකු සත්වග සහිත මහපොළව ජයගෙන (මුළු පොළෝ තලයම) රජබවට පත්ව, (ඒ වෙනුවෙන්) අසුන් බිලි දී කරන යාගය, (පිරිමි) මිනිසුන් බිලි දී කරන යාගය, මහා යාගය, ගීතිකා කියමින් කරන යාගය, සියළු බාධා - උවදුරු දුරලන යාගය, (පිළිවෙලින් අස්සමෙධ, පුරිසමෙධ, සම්මාපාස, වාජපෙය්‍ය, නිරග්ගල) යන පස්මහා යාග පවත්වමින් හැමතැනම ගියද, වඩනා ලද මෙත් සිත ඇත්තෙකු හා සළකන විට දහසයෙන් එක කොටසක්වත් නොවටී.'

'සියළු ජීවීන් කෙරෙහි නපුරු සිත නැතිව, මෙත් සිත පතුරුවයිද, එයින් යහපත වෙයි. සියළුම ජීවීන් කෙරෙහි අනුකම්පා සහගත සිතින් යුතු උසස් තැනැත්තා පින් රැස්කර ගනී.'

යෙ සත්ත සණ්ඩං පඨවිං විජෙත්වා
රාජිසයො යජ මානානුපරියගා

අස්සමෙධං පුරිසමෙධං
සම්මාපාසං වාජපෙය්‍යං නිරග්ගලං

මෙත්තස්ස චිත්තස්ස සුභාවිතස්ස
කලම්පි තෙ නානුභවන්ති සොළසිං

එකම්පි චෙ පාණමදුට්ඨ චිත්තො
මෙත්තායති කුසලී තෙන හොති

සබ්බෙව පාණෙ මනසානුකම්පී
පහූතමරියො පකරොති පුඤ්ඤං

(සෑමින් සමාන වූ යම් දැහැමි රජ කෙනෙක්, නිරග්ගල නම් වූ සප්තමේධය, පුරිසමේධ සම්මාපාස, වාජපෙය්‍ය යන සිවු සහරාවතින් යාග කරමින්ද, දන් දෙමින් හැසිරුනාහු වෙති. ඒ මෛත්‍රී සහගත චිත්තයාගේ විපාක මහත්මය. සොළොස්වන කලාව ද නො අගිත්. එකම සත්ත්වයකු කෙරෙහිවත් දුෂ්ට නොවූ සිතින් මෙත් වඩා නම්, ඒ මගින් පින් කරන්නෙක් වේ. සියලු සතුන් කෙරෙහි අනුකම්පා කරන ආර්යයා බොහෝ පින් කරයි.)

මේ ආදී සූත්‍රවල දැක්වෙන පරිදි අනුසස් එකොළහක් ලැබෙන මෙත වඩන තැනැත්තෝ මෙත් සිත් ඇත්තාහ'යි දතයුතුය. 'දේවතාවන්ගේ අනුකම්පාව ලබන තැනැත්තා හැමකල්හි යහපත දකී' - දෙවතානුකමපිතො පොසො සදා භද්‍රානි පස්සති' මේ ආදී ලෙසින් මෙත් වඩනු ලබයිද එය ඔහුටද හිතසුව පිණිස වේ යැයිද දතයුතුය. මෙසේ දෙපසටම හිතවත් බව දක්වමින් මෙත්තං කරොථ මානුසියා පජාය කියා, මීළඟට උපකාර කෙරෙන බවද පහදමින් දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා යැයි කීහ. එහි තේරුම නම්, යම් යම් මිනිස්සු (උවදුරු වළකා ගැනීමට) දේවරූප සිතුවම් කොටගෙන හෝ, ලීයෙන් දේවරූප සකස් කොටගෙන හෝ දෙවියන් අරක් ගත් යැයි සළකන වඳින පුදන තැන් හෝ (ඇසතු, නුග වැනි) ගස් ආදිය පිහිටි තැන් කරා ගොස් ඒ දේවතාවුන් උදෙසා දහවල පුද පූජා කරති. අමාවක

වැනි (කළුවරපස දිනවල) දවස්වල රෑ කාලයෙහි පහන් දල්වා පුදපූජා පවත්වති. (ඒ ඒ තැනැත්තන්ට පැවරෙන පරිදි) සලාක බත් ආදිය දී රැකවරණ සලසතැයි සළකන දේවතාවුන් උදෙසා බ්‍රහ්ම දෙවියන් දක්වාම පින් දී දිවා කාලයෙහි පූජා කරති. සේසත් නංවා, පහන් දල්වා, මල් පුදා මුළු රැයෙහිම දහම් ඇසීමේ ආදියෙහි යෙදෙමින් පින් අනුමෝදන් කරමින් රෑ කාලයෙහි පූජා පවත්වති. මෙසේ දිවා රෑ ඔබලා උදෙසා පුද පූජා කරන ඔවුන් රැකගත යුතු නොවන්නේ මන්ද? **තසමා හි නෙ රක්ඛථ** එහෙයින් පුද පූජා පවත්වන හෙයින්ද ඒ මිනිසුන් රකිවු, රැකවරණ සලසවු, ඔවුන්ට අහිතක් නොසිතවු, හිතසුව සලසව, නොපමාවම, ඒ කළගුණ හදවතෙහි දරා නිතර සිහිකරව.

මෙසේ දේවතාවන් කෙරෙහි (මිනිසුන් දක්වන ගරු සැළකිලි අනුව) මිනිසුන්ට උපකාර වන අයුරු දක්වා, ඔවුන්ගේ උවදුරු දුරුකරනු පිණිසද බුදුගුණ ආදිය පවසනු පිණිසද, දෙව් මිනිසුනට යහපත් කරුණු අසනු පිණිසද **යං කිඤ්චි විත්තං** ආදී ලෙසින් මුසා නොවන වචනයේ (ඇති බලය) මැනවින් යොදා ගැනීම ඇරඹි සේක. එහි **යං කිඤ්චි** යනු නියම කිරීමක් නොමැතිව, පොදුවේ සඳහන් කිරීමයි. කිසියම් දෙයක් වේද, එය ඒ ඒ ආකාරයෙන් කතාබහට එක්වෙයි. **විත්තං** ධනයයි. එය සතුට උපදවන අරුතින් කියා ඇත. **ඉධ වා** මිනිස් ලොව දක්වයි. **හුරං වා** එයින් එහා ඉතිරි වෙනත් ලෝක, ඒවා හැර, මිනිස් ලොව සියළු ලෝක හා සළකන විට, **සග්ගෙසු වා,** එසේ මුලින් සඳහන් කරන ලද මිනිස් ලොව හා දෙව් ලෝකද හැර ඉතිරි නාග, ගුරුළු සමූහද මෙහිලා ඇතුළත් කළ යුතුය. මෙසේ මේ පද දෙකෙන් මිනිසුන් අතර අලංකාරය පිණිස පරිහරණය කරන රන්, රිදී, මුතු, මැණික්, දියමන්ති, පබළු, පද්මරාග, වෙරළුමිණි, මැසිරිගල් යනුවෙන් හඳුනාගෙන ඇති දේද, මුතු මැණික් වැලි ඇතිරූ බිමෙහි යොදුන් සිය ගණනක් පළල නොයෙක් රුවන්මය විමන්වල උපන් නාගගුරුළු ආදීන්ගේ ධන සම්පතද දක්වන ලද්දේය. සග්ගෙසු වා කාමාවචර, රූපාවචර දේවලෝකවල, සුන්දර වූ කටයුතුවලින් ඉරියව් පවත්වනු ලබන බැවින් 'සගගා', ඉක්මණින් (එබඳු සැපයකට) පැමිණි යන අරුතින්ද 'සගගා' නම් වේ. **යං** අයත් කෙනෙකු හෝ, **රතනං** යනු ඇල්ම ඇති කරයි. උසුලයි. උපදවයි. දියුණු කරයි යන අදහසයි. විසිතුරු වූ, ඉතා වටිනා, අසමාන වූ, දැකීමට දුලබ, උසස් තැනැත්තන් පරිහරණය කරනු ලබන යම්කිසිවක් වේද, මෙය ඊට සමාන වචනයකි. එසේ හෙයින් කියන ලදී.

චිත්තීකතං මහග්ඝඤ්ච අතුලං දුල්ලභ දස්සනං
අනොමසත්ත පරිභොගං රතනං තෙන වුච්චති

පණීතං උතුම්, උසස්, බොහෝ වූ, මෙසේ මෙම ගාථා පදයෙන් දේව ලෝකවල යොදුන් සියගණන් වූ, මුළුමනින්ම රුවන්මය වූ අපමණ විමන්හි ඇති සුදම්හල් විජයොත් පහ පටන් හිමිකම් ඇති යම්දෙයක් වේද, බුදු උපත සිදුනොවන අපායවල ජීවීන් අතර හිස් විමන් හා බැඳුණු හිමිකම් නොමැති යම් දෙයක් වේද, පොළව, මහ මුහුද, හිමාලය ආදී තන්හි ඇති හිමිකම් නොමැති යම් රුවනක් වේද, **න නො සමං අත්ථි** තථාගතෙන මෙහි න නැත යන තේරුමයි. නො අවධාරණය කොට දක්වයි. සමං සමාන වන, අත්ථි ඇත, දැකිය හැකි, තථාගතෙන බුදුරජාණන් වහන්සේ හා (සමාන) මෙයින් අදහස් කරන ලද්දේ කුමක්ද? මෙහි ධනය ලෙසද, රුවනක් ලෙසද යම් දෙයක් සඳහන් කරන ලදද, බුදු රුවන හා සමාන වෙනත් වටිනා දෙයක් නැත. යම්සේ ගරු බුහුමන් දක්වන, වටිනා අරුතින් රුවන් වන්නේ කෙසේද? සක්විති රජුට සක්රුවන හා මිණිරුවනද අගනේය. එවැනි දෙයක් පහළ වූ විට හෝ (වටිනා දෙයක් ලද විට) මහජනයා වෙනත් දෙයකට ගරුබුහුමන් නොකරයි. කිසිවෙක් මල්සුවඳ ආදිය ගෙන යකුන් අරක් ගත් තැනකට හෝ භූතයන් අරක්ගත් තැනකට හෝ නොයති. සියළුම ජනයා සක්රුවනට - මිණිරුවනට ගරුබුහුමන් කරයි. පූජා කරයි. යම් යම් බලාපොරොත්තු ඉටුකරගැනීම හෝ වර ඉල්ලයි. පැතූ පැතූ දේ ඇතැම්විට ඉටුවෙයි. ඒ රුවන ද, බුදුරුවන හා සමාන නැත. ගරු බුහුමන් දක්වන රුවනක් වේනම්, ඒ තථාගතයන් වහන්සේමය. තථාගතයන් වහන්සේ (ලොව) පහළවූ කල්හී මහා බලවත් දෙව් මිනිස්සු වෙනත් කෙනෙකුට ගරුබුහුමන් නොකරති. වෙනත් කිසිවකුට පූජා නොකරති. එපරිද්දෙන් සම්පතී බ්‍රහ්මයා මහමෙර හා සමාන රුවන්දමකින් තථාගතයන් වහන්සේට පූජා කළේය. අනෙක් දෙවියෝද හැකි හැකි අයුරින් පූජා කළහ. මිනිස්සුද, බිම්බිසාර-කොසොල් රජවරුද, අනේපිඬු සිටු ආදීහුද තථාගතයන් වහන්සේ පිදූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑවද, උන්වහන්සේ උදෙසා අනූහය කෙළක් වැයකොට, මුළු දඹදිවෙහිම විහාර අසූහාරදහසක් පිහිටුවූයේය. (එසේනම්) වෙනත් කෙනෙකු ගරුබුහුමන් දැක්වීම ගැන කවර කතාද? එසේම, පිරිනිවන්පෑවත්, බිහිවුන තැන, දම්සක් පැවැත්වූ තැන, පිරිනිවනට පත්වූ තැන පිළිම, සෑ ආදිය තනා, එපරිදිම මෙසේ ගරුබුහුමන් පුදසත්කාර තථාගතයන් වහන්සේට මෙන් වෙනත් කවරකු උදෙසා නම් පැවැත්වේද?

මෙසේ ගරුබුහුමන් කෙරෙන අරුතින් තථාගතයන් වහන්සේ හා සමාන රුවනක් නැත. කසී සළුව වටිනාකමෙන් රුවන් මෙන් අගනේය. 'මහණෙනි, කසී සළුව දිරා ඇතත්, පැහැයෙන්ද, සුවපහසින්ද, වටිනාකමෙන්ද ඉහළය. 'ජිණ්ණම්පි භික්ඛවෙ, කාසිකං වත්ථං වණ්ණවන්තඤ්චෙව හොති සුඛසම්ඵස්සඤ්ච මහග්ඝඤ්ච' එයින්ද බුදුරුවන හා සමාන නොවේ. මහත් වටිනාකමින් රුවන් අගනේද, තථාගතයන් වහන්සේ රුවනක්මය. තථාගතයන් වහන්සේ යමෙකුගේ පස් වැකුණු රෙදිකඩක් පිළිගන්නා සේක්ද, අසෝක රජුට මෙන් එය ඒ තැනැත්තාට මහත්පල මහත් ආනිසංස පිණිස පවතී. මෙය මහත් වටිනා දෙයක් වන්නේය. මෙසේ වටිනා-මාහැඟි යන වචනයෙහි වරදක් නොවන අයුරු සූත්‍රයෙහි සඳහන් පරිදි ද දතයුතුය. සිවුරු.....පිරිකර යම් (බුදු) කෙනෙකුට පිළිගන්වයිද, එය ඔහුට මහත්පල මහානිසංස වේ. මෙය ඒ (උසස්) තැනැත්තාගේ මාහැඟි වටිනාකම බව කියමි. මහණෙනි, කසී සළුවෙක මාහැඟි විටනාකම යම්සේද, මහණෙනි, මම එය උපමාකොට ඒ පුද්ගලයා ගැන කියමි' - යෙසං ඛො පන පතිගණ්හාති, චීවර -පෙ- පරික්ඛාරං, තෙසං තං හොති මහප්ඵලං මහානිසංසං ඉදමස්ස මහග්ඝතාය වදාමි, සෙය්‍යථාපි තං භික්ඛවෙ කාසිකං වත්ථං මහග්ඝං, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි' මෙසේ මාහැඟි වටිනාකමින් තථාගතයන් වහන්සේ හා සමාන රුවනක් නැත. එසේම අසමාන වන අරුතින් 'රුවන' ලෙස හඳුන්වන්නේ කෙසේද? සක්විති රජුට ඉඳුනිල් මිණි වූ නැබ ඇති, සත්රුවන්මය වූ අරදහසකින් යුතු පබළු නිම්වලල්ලෙන් යුතු, රත්රනින් එකිනෙකට බැඳුණු, සක්රුවන පහළ වේ. එහි අර දහයක් දහයක් මතුයෙහි සුළඟින් නැගෙන හඬ, මනා වාදන හැකියාව ඇති, වාදකයෙකුගේ පසඟතුරු නද මෙනි. ඒ සකෙහි නැබ දෙපස සිංහ මුව ඇත. ඇතුලත කරත්ත රෝදයක මෙන් සිදුරකි. එම සක කරන ලද කෙනෙකු හෝ කරවන්නෙකු (කරකවන කෙනෙකු හෝ එය මෙහෙයවන්නකු) නැත. කැරකෙන්නේ සොබාවිකව සුළඟේ බලපෑමෙනි. දස සක්විති වත් සපිරූ කිසියම් රජෙක් පසළොස්වක පෝ දිනයෙහි, හිස පටන් නා, පෙහෙවස් සමාදන්ව, මතු මහලට ගොස් සිල් මෙනෙහි කරමින් හිඳිනවිට, පුන්සඳ මෙන්ද, හිරු මෙන් ද වූ යම් දෙයක් ඉදිරියට මතුව එනු දකී. යොදුන් දොළසක දුරසිටම කිසියම් හඬක් අසන්නට ලැබේ. යොදුනක දුර සිට පැහැය පෙනේ. මහජනයා දෙවන සඳක් හෝ දෙවන ඉරක් උදාවූයේදැයි කුතුහලයට පත්කරමින්, දකිනු ලබන සක්රුවන නගරයට ඉහළින් රජුගේ ඇතුළු නුවරට බටහිර දෙසින් වඩා උසින් හෝ වඩා පහළින්ද නොව,

මහජනයාට සුවඳමලින් පිදීමට සුදුසු තැනකට පැමිණ පසඇටක් දැමූ සේ නැවතිණ. ඒ අනුව යමින්, රත්පා ඇති, අඟපසඟ සතක් මනාව පිහිටි, ඉඳුබල යුත්, අහසින් යා හැකි, උපෝසථ කුල හෝ ඡද්දන්ත කුලයට අයත් සුදෝසුදු ඇත්රුවන පැමිණේ. උපෝසථ කුලයෙන් නම්, සියළු ඇතුන්ට නායක ඇතාම පැමිණෙයි. ඡද්දන්ත කුලයෙන් නම්, සියළු ඇතුන්ගෙන්ම කණිටු වූ, මනාව හික්මුණු, දමනය වූ ඇතු එයි. රජු දොළොස් යොදුනක් දුර පැතිර ඇති පිරිස ගෙන මුළු දඹදිවටම අනුසාසනා කොට, උදය අහරට පෙරම තම රාජධානියට එයි. ඒ අනුව යමින්, රත්පා ඇති, කපුටකුගේ බඳු හිස ඇති, මුඤ්ජ තණ වැනි දිගු ලොම් ඇති, වලාහක නම් අසුන්ගේ කුලයට අයත් සුදෝසුදු අස්රුවන පැමිණේ. ඉතිරි කරුණු (ඉහත දැක්වූ) ඇත්රුවනට හා සමානය. ඒ අනුව යමින් මිණිරුවන පහළවේ. වෙරළුමිණක් වූ එය, යහපත් පැති අටකින් යුතු, මනාව සකස් වූ, දිගින් රෝදයක නැබ හා සමානව, වේපුල්ල පව්වෙන් පැමිණේ. සක්විති රජු සිවුරඟ සෙන් පිරිවරා සිවු වැදෑරුම් අඳුරෙහි ගියද, එම මිණිරුවන රජුගේ කොඩිය බැඳි කණුවෙහි (රැඳී) යොදුනක් දුර ආලෝක කරයි. මිනිස්සු ඒ ආලෝකයෙන් දිවාකාලය යැයි සිතමින් කටයුතුවල යෙදෙති. යටත් පිරිසෙයින් කුරාකුහුඹුවන් පවා මතුවන අයුරු දකිති. මිණිරුවන අනුව යමින් කාන්තා රුවන පහළවෙයි. සොබාවිකවම අගමෙහෙසිය හෝ වන්නීය. (ඇය) උතුරුකුරු දිවයිනෙන් හෝ මද්දුරජ කුලයෙන් හෝ පැමිණෙන්නීය. ඉතා උස ආදී දොස් හයකින් මිදී, මිනිස් සිරුරු පැහැය ඉක්මවුවද, දෙවියන්ගේ පැහැයට සම නොවන්නීය. ඇයගේත්, රජුගේත් සිරුරු සීත කාලයේ උණුසුම් වේ. උණුසුම් කාලයෙහි සීතල වෙයි. සත්වර පෙලූ පුළුන් මෙන් ගත මුදුපහස වෙයි. සිරුරෙන් සඳුන් සුවඳ, මුවින් උපුල් මල් සුවඳ හමයි. (රජුට කලින්) උදයෙහි කලින්ම පිබිදීම වැනි නොයෙක් ගුණයෙන් යුතු වන්නීය. ඒ කාන්තා රුවන අනුව යමින් රජුගේ කටයුතු ඉටු කරනු පිණිස නොවෙනස්වන ගැහැවි සිටුරුවනද පහළවෙයි. සක්රුවන පහළවූ කෙණෙහිම, දිවැස ලබන රජු හාත්පස යොදුනක පමණ දුරට පිහිටි හිමි අහිමි නිදන් සම්පත් දකී. ඔහු රජු වෙත පැමිණ, 'දේවයන් වහන්ස, කරදර නොවුව මැනවි. ඔබවහන්සේට ධනයෙන් කළයුතු දේ ඉටු කරන්නෙමි'යි බාර ගනී. ගැහැවි සිටු රුවන අනුව යමින් (රජුට) උපදෙස් දෙන, රැකවරණය සලසන නායක රුවන පහළවෙයි. රජුගේ නියම දෙටුපුත් සක්රුවන පහළ වූ කෙණෙහිම, වඩාත් පුළුල් නැණ බලයෙන් යුතු වෙයි. යොදුන් දොළසක වෙසෙන පිරිසගේ සිතිවිලි (තම) සිතින් මැනවින් දැන, ඒ අනුව දොස් පැවරීමටත්, නිවැරදි බවට

පත්කර ගැනීමටත් සමත් වෙයි. ඔහු රජු වෙත පැමිණ, 'දේවයන් වහන්ස, කරදර නොවනු මැනවි, දේවයන් වහන්ස, මම ඔබතුමාට රජකමට අදාළ උපදෙස් දෙමි'යි පවරා ගනී. මෙබඳු අසමාන වූ අරුතින්, වෙනත් රුවනක් සේ හඳුන්වන ලද දේවල් වේනම්, බුදුරුවන හා ඒ කිසිදු රුවනක් සමාන නැත. බුදුරුවන ඒ කිසිදු රුවනක් හා සියදහසක් හෝ කෝටියක් හෝ අගනේ යැයි සමකළ නොහැකිය. අගය කළ නොහැකිය. අසමාන වන අරුතින්ද රුවනක් වේනම්, ඒ තථාගතයන් වහන්සේමය. සීලයෙන්ද, සමාධියෙන්ද, පඤ්ඤාවෙන්ද වෙනත් කෙනෙකු හා සමානකොට, තීරණය කොට මෙපමණ ගුණයෙන් හෝ මෙබඳු හෝ වේයැයි ගළපා කීමට හෝ, තථාගතයන් වහන්සේ පිළිබඳව සීමා කිරීමටද නොහැකිය. මෙසේ අසමාන වන අරුතින්ද තථාගතයන් වහන්සේට සමාන රුවනක් නැත. එසේම දැකීමට දුලබ අරුතින් රුවන නම් වේද, සක්විති රජකු පහළ වීමත්, ඔහුට සක්රුවන ආදිය පහලවීමත් දුලබ වුව, එය බුදුරුවන හා සමාන නැත. එසේ දැකීමට දුලබ රුවන සක්විති රජු ආදීන්ට කොයින්ද? එකම කල්පයෙහි නොයෙක් දේ උපදීද, කප් අසංඛයකදී වුවත්, තථාගතයන් වහන්සේ (පහළ නොවීමෙන්) ලෝකය හිස්වෙයි. එහෙයින් කවරකලක හෝ තථාගතයන් වහන්සේගේ ඉපදීමද දුලබ දැකුමක් වෙයි. පිරිනිවන්පාන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරන ලදී. 'අපි තථාගතයන් දකිනු පිණිස ඒකාන්තවම දුරසිට පැමිණියෙමු. කවරකලක හෝ ලොව පහළවන අරහත් සම්මා සම්බුදු තථාගතයන් වහන්සේගේ පිරිනිවන අද රෑ (ඉකුත්ව) අළුයම් වේලෙහි සිදුවන්නේය. මේ මහා බලවත් මහණකු භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිට වළක්වන හෙයින් පසුකාලයෙහි උන්වහන්සේ දැකීම අපට නොලැබේයැයි ආනන්ද, දේවතාවෝ දොස් නගති. දේවතා ආනන්ද උජ්ඣායනති, දූරවතමහා ආගතා තථාගතං දස්සනාය, කදාචි කරහචි තථාගතො ලොකෙ උප්පජ්ජති, අරහං සම්මා සම්බුද්ධො, අජ්ජච රත්තියා පච්ඡූසසමයෙ තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති, අයඤ්ච මහෙසක්ඛො භික්ඛු භගවතො පුරතො ඨිතො, ඔවාරෙනෙතා, න මයං ලභාම පච්ඡිමෙ කාලෙ තථාගතං දස්සනාය' මෙසේ දුලබව දක්නට ලැබීමේ අරුතින්ද තථාගතයන් වහන්සේ හා සමාන රුවනක් නැත. එමෙන්ම උසස් තැනැත්තන් පරිහරණය කරන අරුතින්ද රුවන් නම් වේ. සක්විති රජුගේ සක්රුවන ආදී ලෙසිනි. එය කෝටි සයදහස් ගණනින් ඇති ධනවතුන්ටද, සත්මහල් පහයන්හි මතු මහලෙහි වසන්නවුන්ටද, සැඩොල්, කුළුපොතු, වැදි, රියකරු, කසලසෝධක වැනි කුලහීන ලාමක මිනිසුන්ටද සිහිනෙනුදු පරිහරණයට පහල නොවේ.

මව්පිය කුල දෙපසම පිරිසිදු බැවින්, මැනවින් උපතලද, දස සක්විතිවත් පුරන ලද, කැත්කුල රජෙකුටම පරිහරණය පිණිස පහළවන අරුතින් උසස් තැනැත්තන්ටම සුදුසු වේම ය. ලොවෙහි උසස් යැයි සම්මත වූ, ඇති සැටියෙන් කරුණු තේරුම් ගතනොහැකි වූ, අවුල් සහගත දැක්මෙන් යුතු, පූරණකසුප් ආදී සාමයික නායකයන් හයදෙනාටත්, වෙනත් එබඳු නායකයන්ටත් තථාගතයන් වහන්සේ වෙත සිහිනෙන්වත් සමීපවිය නොහැකිය. ඇති සැටියෙන් කරුණු අවබෝධයට හේතුසම්පත් ඇත්තවුනට සතරපද ගාථාවක් අවසානයේදී වුවත්, අරහත් පල ලබනට හැකි තියුණු නුවණින් යුතු බාහිය දාරුචීරියගේ පටන්, වෙනත් උසස් කුලවල උපන් හැමටත්, මහා සච්චන්ටත් ඇසුරුකළ හැකිය. ඔවුහු තථාගතයන් වහන්සේ කෙරෙහි උසස් දැක්මෙන්, උසස් (දහම්) ඇසීමෙන්, උසස් පිළිවෙත්හි හැසිරීමෙන් අරමුණු සපුරාගෙන ඒ ඒ අයුරින් (අනුරූප ලෙස) අත්විඳිති. මෙසේ උසස් තැනැත්තන් ඇසුරු කිරීමේ අරුතින්ද තථාගතයන් වහන්සේ හා සමාන රුවනක් නැත. එසේම සක්විති රජුගේ සක්රුවන මෙන් පොදුවේ ඇල්ම වඩන අරුතින්ද රුවන නම් වේ. සක්රුවන දැක රජ සතුටු වෙයි. එයින්ම රජුට ඇල්මක් හටගනී. එවිට සක්විති රජු, 'උතුම් සක්රුවන කැරකී යනු මැනව, උතුම් සක්රුවන ජයගෙන දේවා'යැයි (පවසමින්) වම්අතින් රන්කෙණ්ඩිය ගෙන දකුණතින් (පැන්) වත්කරයි. සක්රුවන පසඟතුරු ගොස වන් මියුරු නද නංවමින් නැගෙනහිර දෙසට අහසින් යයි. දොළොස් යොදුන් පුළුල්ව විහිද යන සිවුරඟ සෙන් සමග, බොහෝ උස් නොවූ ගස්වලට උඩින්ද, බොහෝ ගස්වලට යටින්ද සක්රුවනේ බලයෙන් ඒ අනුව යමින්, සක්විති රජු, ගස්වල මල්කොළ, පලතුරු ආදී පඬුරු ගෙන පැමිණි තැනැත්තන්ගෙන් ඒ පඬුරු ලබමින්ද, 'මහරජතුමනි, වඩිනු මැනවැ'යි කියමින් මහත් ගරුසැළකිලි දක්වමින් පැමිණෙන සතුරු රජුනට 'පරපණ නොනැසිය යුතුයි' ආදී ලෙසින් අවවාද කරයි. යම්තැනකදී රජු අනුභව කරනු කැමතිව හෝ දහවල නිදාගැනීමට හෝ කැමතිවේද, එහිදී සක්රුවන අහසින් බැස, ජලය ආදී සියළු පහසුකම් ඇති සමතලා බිමක පසඇටක් දැමූ සේ සිටී. නැවත රජුට ගමන් ඇරඹීමට සිත් වූ කල, පෙර පරිදිම හඬ නගමින්, යයි. ඒ හඬ අසා දොළොස් යොදුනක් පිරිසද අහසින් යයි. සක්රුවන (ඒ ඒ පෙදෙස් පසුකර) අනුපිළිවෙලින් ගොස් නැගෙනහිර මුහුදට බසී. එය බැසගත් කල්හී යොදුනක් පමණ ජලය ඉවත්ව (පොළව) බිත්තියක් බඳු වෙයි. මහජනයා කැමති පරිදි (එහි) සත්රුවන් ගනී. රජු නැවත කෙණ්ඩිය ගෙන 'මෙතැනට වනතුරු මගේ රජය' යැයි පැන් වත්කොට (එතැන)

නවතී. සේනාව ඉදිරියෙන්ද, රජු මැදි කොටගෙන සක්රුවන රජුට පිටුපසින්ද වෙයි. සක්රුවන (බිමට) බසින තැන් ජලයෙන් පිරේ. මේ අයුරින් දකුණ, බටහිර, උතුරටද මුහුදෙහි යයි. මෙසේ සිවු දෙසටම රජු අනුසාසනා කොට, තුන් යොදුනක් අහසට නැගි සක්රුවනෙහි බලයෙන් එහි සිටි රජු, යොදුන් සත්දහසකින් වටවූ, කුඩා දිවයින් පන්සියයකින් යුත් පෙර විදේහ රාජධානියද, යොදුන් අටදහසක් වටවූ උතුරුකුරු දිවයින හා යොදුන් හත්දහසක් වටවූ අපරගෝයානයද, යොදුන් දසදහසක් වටවූ දඹදිව යන සිවුමහා දිවයින් හා කුඩා දිවයින්වලින් යුතු සක්වළම මනාව පිපුණු නෙළුම් මල් උයනක් මෙන් දකී. මේ දකින රජුට දැඩි ආසාව උපදී. එමෙන්ම,ඒ සක්රුවනටද රජුගේ ආසාව-ඇල්ම වඩයි. එයද බුදුරුවන හා සමාන නැත. ආසාව උපදවන අරුතින් ද රුවන නම් වේනම්, තථාගතයන් වහන්සේම රුවනකි. එක සක් රුවනක් කුමකටද? තථාගතයන් වහන්සේගේ දිවමය වූ (ගති පිළිබඳව යම් කෙනෙකුට ඇතිවන) ඇල්ම හා සසඳන විට, සක්රුවන ආදී සියළුම රුවන් කෙරෙහි සක්විති රජුට ඇතිවන ආසාව සොළොසකින් එක් කොටසක් හෝ ඉන් අඩක් හෝ නොවටී. ඊටත් වඩා, තමන්වහන්සේගේ අවවාද අනුව කටයුතු කරන අසංඛෙය්‍යක් වූ දෙව් මිනිසුන්ට, පළමු දැහැනෙහි, දෙවන දැහැනෙහි, තුන්වැනි දැහැනෙහි, සිවුවන දැහැනෙහි, පස්වන දැහැනෙහි ඇල්ම - 'ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ඇල්ම, සෝවාන් මගෙහි ඇල්ම, සෝවාන් පලෙහි ඇල්ම, සකදාගාමි, අනාගාමි, අරහත් මගෙහි හා පලයෙහි ඇල්මත් ඇතිකරයි. මෙසේ ඇල්ම ඇතිකරන අරුතින්ද තථාගතයන් වහන්සේ සමාන රුවනක් නැත.

එසේම මෙම රුවන 'හැඟීම් සහිත, හැඟීම් රහිත' යැයි දෙයාකාරය. එහි හැඟීම් රහිත (අජීවී ලෙස) සක්රුවන, මැණික් රුවන හෝ රන්රිදී වැනි, ඉඳුරන් හෝ නොබැඳුණු වෙනත් දේ ගැනේ. හැඟීම් සහිත ලෙස ඇත්රුවන, නායක රුවන හෝ ඉඳුරන් හා බැඳුණු එබඳු දේ සැළකේ. මේ කොටස් දෙකෙන් හැඟීම් සහිත යැයි දැක්වූ රුවන් අගයෙන් වැඩිය. කවර හෙයින්ද? අජීවී රන්, රිදී, මිණි, මුතු ආදී රුවන්, ඇත්රුවන ආදිය අලංකාරය පිණිස ගනු ලබන හෙයිනි. ජීවී ලෙස දැක්වූ රුවනද කොටස් දෙකකි. තිරිසන් ලෙස ගැනෙන රුවන හා මිනිස් රුවන ලෙසිනි. එහිදී මිනිස්රුවන අගයෙන් වැඩිය. තිරිසනුන් ලෙස ගැනෙන (වටිනා දේ හෙවත් ඇත් අස් රුවන) රුවන පිට නැගී යාමට මිනිස් රුවනට උපකාරී

වන හෙයිනි. මිනිස් රුවනද දෙආකාරය. කාන්තා හා පිරිමි රුවන ලෙසිනි. පිරිමි රුවන අගයෙන් වැඩිය. කුමක් නිසාද? කාන්තා රුවන පිරිමි රුවනට සේවක බවට පත්වන හෙයිනි. පිරිමි රුවන ද දෙආකාරය. ගිහිව වසන පිරිමි රුවන හා ගිහිබවෙන් වෙන්ව - අනගාරිකව වසන පිරිමි රුවන ලෙසිනි. මෙහි ගිහිව නොවසන තැනැත්තා අගයෙන් වැඩිය. කුමක් හෙයින්ද? ගිහිව වසන්නන්ගෙන් රුවන් සේ වටිනා සක්විති රජ වුවත්, සීලාදී ගුණ පිහිටි, ගිහිගෙයින් වෙන්වූවෙකුට, පසඟ පිහිටුවා වැඳ උවටැන්කොට, ඇසුරුකොට, දෙව්මිනිස් සම්පත් ලැබ, අනතුරුව, නිවන් සම්පතට පැමිණෙන හෙයිනි. ඒ ගිහිගෙයින් වෙන්වූ රුවන් කොටසද ම ගපල ලද හා කෙලෙස් සහගත (එහෙත්) පිළිවෙත් මගෙහි යන තැනැත්තන් ලෙස කොටස් දෙකකි. ඒ මගපල ලබන තැනැත්තන්ද සේඛ-අසේඛ යැයි දෙකොටසකි. අසේඛ රුවනද සාවක පාරමී බවට පත්වූ හා එසේ නොපැමිණි යනුවෙන් දෙආකාරය. එයින් සාවක පාරමී බවට පැමිණීම අගනේය. කවර හෙයින්ද? බොහෝ යහගුණ පවත්නා බැවිනි. සාවක පාරමී බවට පත් රුවන් අතුරෙන් පසේ බුදුරුවන අගයනු ලබයි. කුමක් නිසාද? බොහෝ යහගුණ පවත්නා බැවිනි. සැරියුත් මුගලන් තෙරුන් සමාන සියගණන් වූ සාවක පිරිස එක් පසේබුදුවරයෙකුගේ ගුණසමුදායට සියයෙන් අඩක් හෝ සම නොවේ. පසේ බුදුවරුන් අතුරෙන් සම්මා සම්බුදුරුවන අගයෙන් උසස්ය. කවර හෙයින්ද? බොහෝ යහගුණ පවත්නා හෙයිනි. මුළු දඹදිවෙහිම පලඟින් පලඟට වැදෙමින් වැඩසිටිනා පසේබුදුවරුන් හා එක් සම්මා සම්බුදුවරයන් වහන්සේගේ ගුණ හා සමකර බලනවිට පසේ බුදුගුණ සොළොස් කලාවක් හෝ අඩ කලාවක් වේයැයි අගය කළ නොහැකිය. 'මහණෙනි, යම් තරමක් පාරහිත වූවන් වෙත්ද.... තථාගතයන් වහන්සේ ඔවුන්ගෙන්ද උසස්ය' ආදී ලෙසින් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. 'යාවතා භිකඛවෙ සතතා අපදා වා -පෙ- තථාගතො තෙසං අගගමකඛායති' මෙසේ කිසිදු ආකාරයකින් තථාගතයන් වහන්සේට සමවන වෙනත් රුවනක් නොමැත. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ න නො සමං අත්‍ථි තථාගතෙන යැයි වදාළහ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ බුදුරුවනට සමාන වෙනත් රුවනක් නොමැති බව වදාරා, මීළඟට, ඒ සත්වගට හටගත් උවදුරු දුරුකිරීමට, උපත නිසා නොව, කුලගොත් නිසා නොව, කුලවතකු නිසා නොව, මනා පෙනුම නිසා නොව, හුදෙක් අවීචි නිරයෙහි පටන් බව කෙළවර දක්වා වූ ලොවෙහි, සීල සමාධි ආදී ගුණ සමූහයෙන් යුතු බුදුරුවනෙහි

අසමාන බව පරම ඇත්ත බැවින් **ඉදමපි බුද්ධෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු** යැයි දක්වති. එහි අදහස නම්, ඉදමපි මේ ලෝකයෙහි හෝ පරලොවෙහි හෝ දෙව්ලොව හෝ යම්කිසි වටිනා දෙයක්, සම්පතක් හෝ රුවනක් හෝ ඇත්ද, ඒ හා සමාන හෝ එහි ගුණයෙහිද සමාන නොවන බැවින්, **බුද්ධෙ රතනං පණීතං** එය ඇත්තයි. එහෙයින් **එතෙන සච්චෙන** මේ ජීවත් වන්නන්ට **සොත්ථි හොතු** යහපත උදාවේවා! නිරෝගීව, උවදුරු නැතිවේවා' - 'ආනන්ද, ඇස තමාගේ යැයි හෝ, තමා කෙරෙහි (තමාට අයිති යැයි) සැළකීම හිස් දෙයකැයි' - 'චක්ඛුං බො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා, අත්තනියෙන වා' මෙහිදී දැක්වේ. මේ ආදී තැන්වලින් අදහස් වන්නේ, තමාගේ හෝ තමාට අයත් යයි සිතා කටයුතු කිරීමයි. වෙනත් අයුරින් කිවහොත් ඇස තමාගේ හෝ තමාට අයත් යයි සැළකීම හෝ අයහපතට හේතුය. **රතනං පණීතං** මෙසේ රුවන උසස් දෙයකි. රුවන් සේ සැළකීම - රුවන් බව උසස්ව සැළකේ යැයි මෙහි අරුත දතයුතුය. අනෙක් අතට, බුදුරජාණන් වහන්සේ රුවනක් යැයි නොසළකන්නේ නම්, රුවන් යැයි සළකනු ලබන වෙනත් දෙයක් මෙහි නැත. ගරුබුහුමන් කරන ලද අරුතින් රුවන් යයි කියනු ලබන යම්දෙයක් යම්තැනක වේද ඒ රුවන් බව සළකාම **රතනං** යයි හඳුන්වනු ලබයි. ඒ අනුව රුවන යයි හඳුන්වනු ලබන දෙයක් ඇති බැවින්, එසේ හැඳින්වීමට සිදුවේ. **ඉදමපි බුද්ධෙ රතනං පණීතං**, නැතහොත් මේ කරුණින්ද බුදුරජාණන් වහන්සේ රුවනකැයි මෙහි අරුත දතයුතුය. මෙම ගාථාව වදාළ කල්හිම රජකුලය සුවපත්ව, බිය දුරුවිය. ගාථාවෙහි අණ - බලය කෙළසිය දහසක් සක්වළ භූතාදී නොමිනිසුන් පිළිගන්නා ලදී.

මෙසේ බුදුගුණයෙහි ඇත්ත පවසා, මීළඟට නිවනෙහි යහපත කීම ඇරඹියේ **ඛයං විරාගං** යනුවෙනි. එහිලා නිවන අවබෝධය පිණිස රාගාදිය නැතිකරන ලදී. නැවත හට නොගන්නා ලෙසටම නැතිකරන ලදුව, යළි නැවත එකතුවීමක් නොවේ. ඊට අරමුණු නොවන හෙයින්ද, නිවන අවබෝධ කළ කල්හී රාගාදිය මුළුමනින්ම ඈත්කරන ලද්දේ වෙයි. හැරදමන ලද්දේ වෙයි. සිඳබිඳ දමන ලද්දේද වෙයි. එහෙයින් ඛය යනුවෙන්ද **විරාගං** යයිද කියනු ලැබේ. එහි යම් ආකාරයකින් හටගැනීමක් නොපෙනේද, නැතිවීම හා පැවැත්මෙහි වෙනසක් නොපෙනේද, එහෙයින් එය හට නොගනී. ජීවත් නොවෙයි. මරණයට පත් නොවේයැයි සළකා අමතං යැයි කියනු ලැබේ. උතුම් අරුතින්ද, පමණ නොකළ හැකි අරුතින්ද

පණීතං වේ. යදජ්ඣගා යම් දෙයක් ලැබුවේය, අත්වින්දේය, මනාව ලැබුවේය, තම නුවණ බලයෙන් පැහැදිලිවම අවබෝධ කළේය. **සක්‍යමුනී** සැකිකුල උපන් බැවින් සක්‍ය වේ. උසස් හික්මීම ලබන (මුනිවරයකු බවට පත්වන) ගුණදහමින් යුතු බැවින් මුනි, සැකිකුලම උපන් මුනිවරයා සක්‍යමුනි, **සමාහිතො** උතුම් වූ මගපල සමාධියෙන් එකඟ වූ සිත් ඇති, **නතෙන ධම්මෙන සමත්ථි කිඤ්චි** ඒ බය ආදී ලෙස නම් වූ රාගාදී (කෙලෙස්) දුරුකරන ලද සැකි මුනිවරයා විසින් අවබෝධයෙන් ලද දහමට සමාන කිසිදු දෙයක හටගැන්මක් නැත. 'මහණෙනි, සකස් වූ හෝ සකස් නොවූ හෝ, යම් පමණකට පවත්නා වූ හෝ හැමදෙයකටම වඩා විරාගය වටිනා බව කියනු ලැබේ' යනුවෙන් 'යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා වා අසංඛතා වා විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති' සූත්‍ර අතර සඳහන් වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ නිවන නම් වූ දහමට වෙනත් දෙයක් සමනොවන බව දක්වා, මීළඟට, මිනිස් සත්වගට හටගත් ඒ උවදුරු දුරුකරනු පිණිස (ඉහත කී) බය, විරාග අමත, පණීත ගුණයෙන් යුතු නිවන්දහම් රුවනෙහි අසමාන බව ඇත්ත යැයි සහතික කොට **ඉදම්පි ධම්මෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථිහොතු** යැයි පවසති. එහි අරුත මුල් ගාථාවට කරුණු දැක්වූ අයුරින් දතයුතුය. මෙම ගාථාවෙහි අණද කෙළසිය දහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ නිවන් දහම් ගුණයෙන් ඇත්ත පහදා දැන් (එය ලබන පිළිවෙත්) මගෙහි ගුණ කීමට **යං බුද්ධසෙට්ඨො** (ආදී ගාථාව) කීම ඇරඹූහ. ඇති තතු - ඇත්තටම අවබෝධ කළ යන අරුතින් බුද්ධො, උතුම් පැසසිය යුතු අරුතින් සෙට්ඨො, බුදුබවට පත්, උසස්ම තැනැත්තාම බුද්ධසෙට්ඨො අනුබුදු වූ පසේබුදු යැයි කියන ලද බුදුවරුන් අතරෙන්ද උසස් වන බැවින්ද බුද්ධසෙට්ඨො නම් වේ. **යං පරිවණ්ණයී** 'නිවන නමැති කෙම්බිමට පැමිණීමට මග අරිඅටැඟි මගයි. 'අට්ඨංගිකො ච මග්ගානං ඛෙමං නිබ්බාණපත්තියා' යනුවෙන්ද, 'මහණෙනි, උතුම් වූ සිවුසස් අවබෝධයට හේතුවන ඊට උපකාර වන යහපත් වූ සිත එකඟතාව-සමාධිය ඔබලාට දේසනා කරන්නෙමි', 'අරියං වො භික්ඛවෙ සම්මා සමාධිං දෙසිස්සාමි, සඋපනිසං, සපරික්ඛාරං' මේ ආදී ලෙසින් ඒ ඒ තැන්හිදී එය පැසසූහ. **සුචිං** අපිරිසිදු කෙලෙස් මුළුමනින්ම නසා මනාව පිරිසිදු වීමයි.

**සමාධිමානනතරිකඤ්ඤමාහු** තම සිතෙහි උසස් සමාධිය පවත්නා කල්හි පලය උපදවාලීම (එයින් බලාපොරොත්තුවන අරමුණ ඉටුවීම) නොවෙනස්ව සිදුවන බැවින් (ළඟටම පැමිණි අරුතින්) ආනන්තරිය සමාධි යැයි කීහ. අරිඅටැඟි මගෙහි සමාධිය ඇතිවූ කල්හී ඒ තැනැත්තාට අරහත්පලය ලැබීමේ කිසිදු අවහිරයක් නැත. 'යම් තැනැත්තෙක් සෝවාන් පලය අවබෝධ කරගැනීමට පිළිපන්නේ වේද, ගින්නෙන් කල්පය දැවෙන විටකදී වුවත්, ඒ තැනැත්තා සෝවාන් පලය අවබෝධ කරන තෙක්, කල්පය නොදැවෙන්නේය. මහණෙනි, කල්පය පිහිටි පුද්ගලයා යැයි මොහුට කියනු ලැබේ. අරිඅටැඟි මගට පිළිපන් සියළුම තැනැත්තෝ එසේ කල්පයෙහි පිහිටියාහු වෙති. 'යඤ්ච පුගගලො සොතාපතතිපල සච්ඡිකිරියාය පටිපනෙනා අසස, කපපසසච උඩ්ඩයහන වෙලා අසස, නෙව තාව කපෙපා උඩ්ඩහෙය්‍ය, යාවායං පුගගලො න සොතාපතතිඵලං සච්ඡිකරොති, අයං වුච්චති පුගගලො ඨිතකපපී, සබෙබපි මගගසමංගිනො පුගගලා ඨිතකපපිනො' යනුවෙන් වදාරා ඇත. **සමාධිනා තෙන සමො න විජ්ජති** බුදුරජාණන් වහන්සේ විසින් උසස් ලෙස පසස්නා ලද, පිරිසිදු කෙලෙස් මල නසන ඒ ආනන්තරික සමාධියට සමාන රූපාවචර සමාධි හෝ අරූපාවචර සමාධි හෝ කිසිතැනක නොවේ. කවර හෙයින්ද? රූපාවචර, අරූපාවචර ලෝකවල උපත ලබන දැහැන් වඩා ඒ ඒ බඹලොව්හි උපන් තැනැත්තාට වුවද නැවත නිරය ආදියෙහි ඉපදීමට ඉඩ ඇති බැවිනි. මෙම අරහත්පල ලබන 'සමාධි පිළිවෙත' වඩනා ලද උසස් තැනැත්තා සියළුම ඉපදීම් මුළුමනින්ම අවසන් කරන ලදී. (සසර ඉපදීමට ඇති හේතු මුළුමනින්ම උදුරා දමන ලදී.) 'මහණෙනි, සකස් වූ දෙයක් යම් පමණකට ඇත්නම්, ඒ අතරින් අරිඅටැඟි මග උසස්යැයි කියනු ලබයි. 'යාවතා භිකඛවෙ ධමමා සංඛතා වා, අරියො අට්ඨංගිකො මගෙගා තෙසං අගගමකඛායති' යනුවෙන් සූත්‍රවල දක්වන ලදී. භාග්‍යවතුන් වහන්සේ, අනෙක් සමාධිවලින් ආනන්තරික සමාධිය සමාන නොවන බව දක්වා දැන් පෙර පරිදි මගපල දහම් රුවනෙහි අසමානතාව ඉදමපි ධමෙම ආදී ලෙසින් ඇත්තකැයි තහවුරු කරති.

මෙසේ මගදහම් ගුණයෙහිද ඇත්ත දක්වා, මීළඟට යෙ පුගගලා ආදී ලෙස සඟ ගුණද කීම ඇරඹී සේක. යෙ පොදුවේ සඳහන් වීමකි. **පුගගලා** යම් තැනැත්තන් - පුද්ගලයන්, අට්ඨා ඔවුන්ගේ ගණන හෝ පමණ කොටස, පිළිවෙත් මගට පත් සතරදෙනෙක්ද, පලයෙහි පිහිටි සතරදෙනෙක් ඔවුහු අටදෙනෙක් වෙති. **සතං පසත්ථා** යහගුණ පත් බුදු,

පසේබුදු, මහරහතන් වහන්සේලා විසින්ද, අනෙක් දෙව් මිනිසුන් විසින්ද පසස්නා ලදහ. ඒ කවර හෙයින්ද? (පෙර සසර පුරුදු පරිදි) උපතින්ම පිහිටන සීලාදී ගුණදහම්හි එකතුවීමයි. සපුමල්, මූණමල් ආදියෙහි සොබාවයෙන්ම පැහැය, සුවඳ ඇතිවන්නා සේ, ඒ අටදෙනාද (සතරමග සතරපලයට පත්) සීල, සමාධි ආදී ගුණයෙන් යුතු වෙති. ඒ මල් පැහැපත්, සුවඳවත් සේ, දෙව් මිනිසුන්ට පියමනාප වෙමින් පැසසුම් ලබති. එහෙයින් යෙ පුගගලා අටඨ සතං පසත්ථා යැයි කියන ලදී. නැතහොත්, යෙ නියමයක් නොකොට පොදුවේ දැක්වීමකි. පුගගලා පුද්ගලයෝ, අටඨසතං ඔවුන්ගේ ගණන හෝ පමණ කොටස, එකබීජී (හෙවත් එක්වරක්, පමණක් කාමභවයෙහි ඉපිද රහත්පලයට පත්වන) කොලංකොල (හෙවත් දෙවාරයක සිට සයවාරයක් දක්වා කාම භවයන්හි ඉපිද රහත්පලයට පත්වන) සත්තකඛත්තුපරම (හෙවත් සත්වරක් පමණක් කාමභවයන්හි ඉපිද රහත්පලයට පත්වන) යනුවෙන් සෝවාන් බවට පත්වන්නන් තුන් ආකාරය. කාම, රූප, අරූප භවවල සකදාගාමි පල ලද්දෝ තුන්ආකාර වෙති. ඒ සියල්ලන්ම සතරාකාර වූ පිළිවෙතින් විසිහතර දෙනෙකි. අන්තරා පරිනිබබායි, උපහචච පරිනිබබායි, සසංඛාර පරිනිබබායි, අසංඛාර පරිනිබබායි, උද්ධංසොත, අකනිටඨගාමී යැයි අවිහ බඹලොව පස්දෙනෙකි. එසේම අතපප, සුදසස, සුදසසී යන බඹලෙව්හිද වෙති. අකනිටාවෙහි උද්ධංසොත 'උතුමා' හැර - සතරදෙනෙකි. ඒ අනුව අනාගාමී බවට පත්වූවන් විසිහතර (කොටසකි) සුකඛ විපසසක, සමථයානික යනුවෙන් රහත් බවට පත්වූවන් විසිහතර (කොටසකි) සුකඛ විපසසක, සමථයානික යනුවෙන් රහත් බවට පත්වූවන් දෙදෙනෙකි. සතරමගෙහි පිහිටි සතරදෙනෙකු සමග පනස් හතරකි. මේ සියල්ලෝම සද්ධාධුර, පඤ්ඤාධුර යනුවෙන් ඒ දෙගුණ වූ විට එකසිය අටක් වෙති. ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය. චත්තාරි එතානි යුගානි හොනති අටදෙනෙක් හෝ, එකසිය අටදෙනෙක් යැයි විස්තර ලෙස දැක්වූ ඒ සියල්ලෝම, කෙටියෙන් දක්වතොත්, සෝවාන් මගෙහි පිහිටි, සෝවාන් පලයෙහි පිහිටි, යනුවෙන් එක් යුගලක් ලෙසින් අරහත් මග - අරහත් පලය දක්වා සතර යුගලක් වෙති. තෙ දකඛිණෙයයා මෙහි තෙ යනුවෙන් මුලින් නම් නොකොට පොදුවේ දැක්වූ ඔවුන් 'දැන් නම් කොට පෙන්වා දෙති. විස්තර අනුව අටක් හෝ එකසිය අටකැයිද, කෙටියෙන් යුගල සතරක් ලෙසින්ද දැක්වූ යම් පුද්ගලයෝ වෙත්ද, ඒ සියල්ලෝම දානාදිය පිළිගැනීමට සුදුසු වෙති. ඒ අදහසින් දකඛිණෙයයා වේ. 'මොහු මට මේ වෙදකම හෝ පණිවුඩය හෝ ඉටුකරනු ඇතැයි 'මෙවැනි බලාපොරොත්තු නැතිව, (කරන කියන

දෙයෙහි) කම්පල අදහාගෙන, දෙනු ලබන දීමට සුදුසු දේ දකබිණ නම් වේ. සීලාදී ගුණෙන් යුතු පුද්ගලයෝ හා ඉහත දැක්වූ උතුමෝද එසේ දීමට සුදුසු බවට පත්වෙති. **සුගතසස සාවකා** භාග්‍යවතුන් වහන්සේ සොඳුරු ගමනින්ද, යහපත් තැනකට ගිය බැවින්ද මැනවින් ගිය බැවින්ද, හොඳ වචන පවසන බැවින්ද සුගත නම් වෙති. ඒ සුගතයන් වහන්සේගේ, උන්වහන්සේගේ වචනය අසන සියල්ලෝද සාවකයෝය. වෙනත් පුද්ගලයෝද ඇසීමට කැමති වෙති. ඒ අසා නැවත කළයුතු කටයුතු නොකරති. එහෙත් මොවුහු නම් අසා, දහමට අනුව කළයුතු පිළිවෙත්හි හැසිර, මගපලවලට පැමිණියහ. එහෙයින් සාවකයන් යැයි කියනු ලබති. **එතෙසු දිනනානි මහපඵලානි** ඒ සුගත සාවකයන් කෙරෙහි සුළුවෙන් හෝ දෙනු ලබන දානයක් පිළිගන්නා තැනැත්තා එය පිළිගැනීමට සුදුසු වන සේ මගපල ලැබ පිරිසිදු බවට පත්ව ඇති බැවින්, මහත් ආනිසංස වේ. 'මහණෙනි, යම් පමණක සංඝයා හෝ සමූහයක් හෝ වේද, ඔවුන් අතුරෙන් යුග හතරක් වූ, පුද්ගල කොටස් අටක් වන, භාග්‍යවතුන් වහන්සේගේ එබඳු සාවක පිරිසම වඩා උසස් වේ. (දෙනු ලබන දෙයෙහි) මහත් ආනිසංස වේ. 'යාවතා භික්ඛවෙ, සංඝා වා ගණා වා තථාගත සාවකසංඝො තෙසං අග්ගමක්ඛායති, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා, එය භගවතො සාවකසංඝො -පෙ- අග්ගො විපාකො හොති' යනුවෙන් සූත්‍රවල සඳහන්කොට ඇත. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මගපලයෙහි පිහිටීම අනුව සියළුම මහ සඟරුවනෙහි ගුණ කියා, මීළඟට එම ගුණ නිසාම එහි ඇත්ත සහතික කරමින් **ඉදම්පි සංඝෙ** යැයි ද වදාළහ. එහි අරුත පෙර කී අයුරින් දතයුතුය. මේ ගාථාවෙහි අණ කෙළසිය දහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ මගපල ලද ලෙසට සාවක සඟ ගුණ දක්වා, දැන් ඇතැම් පලසමවත් සුව විඳින, කෙලෙස් දුරුකරන ලද තැනැත්තන්ගේ ගුණ කීමට **යෙ සුපපයුත්තා** යනුවෙන් ගාථාව ඇරඹූහ. යෙ නියමකොට නොදැක්වූ වචනයකි. **සුපපයුත්තා** මනාව යෙදුණු, නොයෙක් ආකාර වූ, ආසාවලින් හා (ඒවා ලබාගැනීම) අත්හැර, පිරිසිදු ජීවන පැවැත්මෙන් යුතුව තමන්ම විදසුන් වැඩීමෙහි නියැලීමට පටන්ගෙන, නැතහොත් **සුපපයුත්තා** යනු කය වචනය පිරිසිදු ලෙස හසුරුවාගැනීමයි. එයින් ඔවුන්ගේ සිල් සමූහය පෙන්වා දෙයි. **මනසාදළ්හෙන** තිරව, නොසෙල්වෙන සිතිවිලිවලින්ම එකඟ කොටගත්, සකස් කරගත් මනසින් යුතුව, එයින් ඔවුන්ගේ සමාධි කොටස පෙන්වා දෙයි. **නික්කාමිනො** සිරුර ගැනද

ජීවිතය ගැනද බලාපොරොත්තු නැතිව, නුවණ පෙරදැරි වූ උත්සාහයෙන් සියළු කෙලෙසුන්ගෙන් ඉවත් වූ මෙයින් ඔවුන්ගේ උත්සාහවත් වූ නුවණ රැස (පඤ්ඤාකඛන්ධ) දැක්වෙයි. **ගොතමසාසනමහි පරම්පරාවෙන්** ගොතම නම් වූ තථාගතයන්ගේම සසුනෙහි, එයින්, මේ සසුනෙන් පිටත, විමුක්තිය සිතා, නොයෙක් ලෙසින් තවුස්දම් කරන්නන් අතර, මනා ගුණ නොමැතිව කෙලෙස්වලින් ඉවත් නොවීම පැහැදිලි කරයි. **තෙ** පෙර දක්වන ලද ගොතම ශ්‍රාවකයෝ **පත්තිපත්තා** මෙහි පත්තබ්බා යනු පැමිණීමට සුදුසු, 'යම් දෙයකට - ස්වභාවයකට පැමිණ, මුළුමනින්ම කාමාදී බැම්වලින් නිදහස් වෙති. අරහත් පලයට සමාන වචනයකි. එබඳු තැනට පැමිණියේ යැයි පත්තිපත්තා, **අමතං** නිවන, **විගයහ** අරමුණු ලෙසින් එය රඳවා - බැසගෙන, ලද්ධා ලැබ, **මුධා** වැය නොකොට, තුට්ටුවක් හෝ වැය නොකොට නොමිලයේ, **නිබ්බුතිං** කෙලෙස් දැවිල්ල නිවාලන ලද පල සමවත් සුව, **භුඤ්ජමානා** අනුභව කරමින්, කුමක් නිසා කියන ලදද? මෙම ගෝතම සාසනයෙහි සීල සංයමයෙන් යුතුව, කය වචනයෙන් සංවරව, සිත සමාධියටම යොමුකොට, නුවණින් යුතුව, මනාව පිළිවෙත් සපුරා, නිවන අරමුණු කොට, ගත් ඔවුහු නොමිලේ ලබන පල සමවතින් හඳුන්වා ඇති නිවන විඳිමින් පැමිණිය යුතු තැනටම පැමිණියහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පලසමවත් විඳින, කෙලෙස් දුරුකළ තැනැත්තන් ලෙසින් සඟරුවනෙහි ගුණ කියා, දැන් එය ඇත්තක් බව දක්වමින්, ඉදම්පි සංඝෙ යැයි සහතික කොට පවසති. එහි අරුත පෙර කී පරිදි දතයුතුය. මෙම ගාථාවෙහි අණද කෙළසිය දහසක් සක්වල භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ කෙලෙසුන් නසන ලද තැනැත්තන්ගේ ගුණයෙන් ශ්‍රාවක සංඝයා පිළිබඳව ඇත්ත පහදා, බොහෝ දෙනාට තහවුරු වන පරිදි, දැන් සෝවාන් පලයට පත්වූවන්ගේ ගුණ දැක්වීමට **යථින්දඛීලො** යන (ගාථාව කීම) ඇරඹූහ. එහි **යථා** යනු උපමා වචනයයි. **ඉන්දඛීලො** නගර දොරටුවෙහි (උවදුරු) වැළකීම පිණිස එළිපත්ත අතරෙහි අටරියනක් හෝ දසරියනක් (ගැඹුරට) පොළව සාරා, සිටුවන ලද සවිමත් දැව කුළුණකට සමාන වචනයකි. **පඨවිං** බිමෙහි **සිතො** ඇතුලට පිවිස සිටියේ, **සියා** වන්නේ, **චතුබ්භි වාතෙහි** සිවුදෙසින් හමන සුළඟින්, **අසමපකමපියො** කම්පනය කිරීමට හෝ සෙලවීමට හෝ නොහැකි වන්නේය. **තථූපමං** එසේ, ඒ පරිදි, **සප්පුරිසං** උසස් මිනිසෙකු වදාම් කියම්. **යො අරියසච්චානි අවෙච්ච පසසති** යමෙක් උතුම් සිවුසස් නුවණින් තහවුරුකොට පිරිසිඳ දකී.

(අවබෝධ කරයි.) ඒ උතුම් සිවුසස් පිළිබඳව විසුදධිමගගයෙහි දක්වා ඇති පරිදි දතයුතුය. මෙය එහි කෙටි තේරුමයි. නගර දොරටුවෙහි තදින් සිටවූ කණුව පොළව ඇතුලත ගැඹුරට තිබෙන බැවින්, සිවුදෙසින් හමන සුළඟින් නොසෙල්වෙන්නා සේ, සිවුසස් දහම අවබෝධ කරන ලද මේ තැනැත්තා එයට උපමා කොට කියමි. කවර හෙයින්ද? සිවුදිගින් හමන සුළඟට කම්පා නොවන නගර දොරටුවෙහි කුළුණ මෙන්, ඒ උතුම් තැනැත්තාද වෙනත් සියළු තීර්ථක ආදීන්ගේ වාද නැමති සුළඟින් කම්පා නොවේ. එහෙයින් ඔවුන්ගේ මතවාදවලින් ඒ කිසිකෙනෙකු කම්පනයට හෝ සෙලවීමට හෝ නොහැකි වන්නේය. සූත්‍රවලද මෙසේ වදාරන ලදී. 'මහණෙනි, ගැඹුරට හාරා සිටුවා ඇති යකඩ කණුවක් හෝ ඉන්ද්‍රඛීලයක් හෝ නැගෙනහිර දෙසින්, පැසුළු දෙසින්, දකුණු දෙසින්, උතුරු දෙසින් හමන සුළඟින් කම්පා නොවන්නේය. තදින් කම්පා නොවන්නේය. මඳක් හෝ නොසෙල්වෙන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, පොළවෙහි ගැඹුරට සාරා, ඒ ඉන්ද්‍රඛීලය පිහිටුවා ඇති බැවිනි. 'මහණෙනි, එපරිද්දෙන්ම, යම්කිසි මහණන් හෝ බමුණන් හෝ මේ දුක යැයි......පිළිවෙත යැයි ඇති සැටියෙන් දැනගනිත්ද, ඔවුහු 'මේ පින්වත් තැනැත්තා ඒකාන්තයෙන් දතයුතු දේ දනී, දැකිය යුතු දේ දකී'යැයි (සළකා) වෙනත් මහණකුගේ හෝ බමුණකුගේ හෝ මුහුණ දෙසවත් නොබලති. ඊට හේතු කවරේද? මහණෙනි, උතුම් වූ සිවුසස් මනාව දකින ලද (අවබෝධ කරන ලද) හෙයිනි. 'සෙය්‍යථාපි හිකඛවෙ අයොඛීලො වා ඉඤඛීලො වා ගමභීර භූසා වාතවුටඨී, නෙව නං සංකමෙපය්‍ය, න සමපකමෙපය්‍ය, න සමපචාලෙය්‍ය, පචඡිමාය-දකඛිණය-උතතරාය චෙපි -පෙ- න සමපචාලෙය්‍ය, තං කිසස හෙතු? ගමභීරතතා හිකඛවෙ නෙමසස සූනිඛාතතතා ඉඤඛීලසස, එවමෙව ඛො හිකඛවෙ යෙ හි කෙචි සමණා වා බ්‍රාහමණා වා ඉදං දුකඛනති ඉදං දුකඛනති -පෙ- පටිපදාති යථාභූතං පජානනති, තෙ න අඤඤසස සමණසස වා බ්‍රාහමණසස වා මුඛං උලෙලාකෙනති, අයං නූන භවං ජානං ජානාති, පසසං පසසතීති තං කිසස හෙතු? සුදිටඨතතා හිකඛවෙ චතුනනං අරියසචචානං' යනුවෙනි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ බොහෝදෙනාට පිළිගත හැකි පරිදි සඟරුවනෙහි ගුණයට අදාලව සෝවාන් පලයට පත් තැනැත්තකු පිළිබඳව පැහැදිලිකොට, එම ගුණ නිසාම ඉදම්පි සංඝෙ යනුවෙන් ඇත්ත වූ වචන සහතික කොට දක්වති. එහි අදහස පෙර කී පරිදි දතයුතුය. මේ ගාථාවෙහි අණ කෙළ සියදහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ සෝවාන් බවට පත්වූවන්ගේ ගුණයෙන් පොදුවේ සඟ පිරිස පිළිබඳ වූ ඇත්ත පවසා, දැන් ඒකබීජී, කොලංකෝල, සත්තක්ඛත්තු පරම යයි හැඳින්වෙන සෝවාන්පල ලද තිදෙනා ගැන දක්වති. ඒ පිළිබඳව මෙසේ සඳහන්ය. 'මේ ලෝකයේ ඇතැම් කෙනෙක් සසර බැඳීම් හෙවත් සංයෝජන තුනක් නසා සෝවාන් බවට පත්වෙති. ඔහු එකම භවයෙක ඉපිද, දුක් කෙළවර කරයි. මේ 'එකබීජී' යැයි හැඳින්වේ. (ඇතැම් කෙනෙක්) දෙවරක් හෝ තෙවරක් භවයෙහි ඒ ඒ තැන්හි සැරිසරා (ඉපිද) දුක කෙළවර කරති. ඔහු හැඳින්වෙන්නේ 'කොලංකොල' යනුවෙනි. එසේම සත්වරක් පමණක් දෙව් මිනිස් ලෝකවල සැරිසරා, දුක් කෙළවර කරති. මේ 'සත්තක්ඛත්තුපරම' වේ. මේ සියල්ලන් අතරෙන් කණිටු තැන් ගන්නා 'සත්තක්ඛත්තුපරම' යැයි හැඳින්වෙන සෝවාන් පල ලද තැනැත්තාගේ ගුණ කීම **යෙ අරියසච්චානි** යන ගාථාවෙන් ඇරඹූහ. එහි **යෙ අරියසච්චානි** පිළිබඳව කලින් කියා ඇති පරිදිමය. **විභාවයන්ති** නුවණ නැමති ආලෝකයෙන්, ඇත්ත වසාලන කෙලෙස් අඳුර දුරුකොට, තමන් විසින් මැනවින් අවබෝධ කරති. **ගම්භීර පඤ්ඤෙන** අපමණ නුවණැති බැවින්, දෙවියන් සහිත ලෝකයෙහි (හැම කෙනෙකුටම) නොලැබිය හැකි සේ පිහිටි නුවණින්, සියල්ල දන්නා බව කියන ලදී. **සුදෙසිතානි** හැමවිටම ගැලපෙන පරිදි, කරුණු එක්රැස් කොට, අඩුපාඩු නොමැතිව ඒ ඒ තන්හි මැනවින් දෙසන ලදහ. **කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා** වඩනා ලද සිතැති මගපලයට පත්, සෝවාන් මග නුවණින් යුතු, ඒ තැනැත්තෝ, සසර ගමන කෙළවර කිරීමට පමාවන දෙව්රජුන් හෝ සක්විති රජුන් සේ පැමිණ (ඉපිද) බොහෝ (නිවනට) පමාවෙත් ද, පවත්නා වූ විඤ්ඤාණයෙහි නැති නොකිරීම නිසා කෙළවරක් නොමැති සසරෙහි හත්වරක් උපත ලැබ, නාමයද රූපයද එහිදී නැතිකරන ලද බැවින්, කෙළවර කරන ලද බැවින්, **න අට්ඨමං භවං ආදියන්ති** සත්වන භවයෙහි විදසුන් වඩා අරහත් බවට පැමිණෙති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ, සත්වරක් පමණක් භවගාමී වන, සෝවාන් පල ලද සාවක සඟරුවනෙහි ගුණ දක්වා, ඒ ගුණ නිසාම **ඉදම්පි සංඝෙ** යනුවෙන් එය ඇත්තක් සේ සහතික කොට වදාරති. එහි අරුත පෙර කී පරිදිම දතයුතුය. මෙම ගාථාවෙහි අණ කෙළ සියදහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ සත්වරක් පමණක් භවගාමීව, අටවැනි උපතක් නොලබන සාවක සඟගුණ ඇත්ත බව කියා, මීළඟට, ඒ සත්වන භවයෙහි උපත ලබන වෙනත් පුද්ගලයන් විසින් ඊට පෙර භවයන්හි උපත් ලැබීමෙහිදී

දැඩිකොට ගනු ලබන, එතෙක් ඉවත් නොවූ කරුණුද (ඒවාද දුරුකොට ඉතිරි) මගපල ලබන්නන්ගේ ගුණ දැක්වීමට **සහාවසස** ආදී ගාථාව වදාළහ. එහි **සහාවා** සමගම අසසා අටවන වරට උපතක් නොවේයැයි කියනවිට, ඒ අතර භවයක උපත ලබන්නාට, **දසසන සමපදාය** සෝවාන් මගපල පැමිණීමෙන්, සෝවාන්මගට පැමිණීමෙන් නිවන දැක, කළයුතු කටයුතු පරිදි සියල්ලන්ට පළමුව නිවන දැකීම නිසා එසේ කියනු ලැබේ. එය තමන් කෙරෙහි පහළවන අවබෝධාත්මක වූ දැකීමයි. ඒ දැකීමත් සමගම **තයසසු ධමමා ජහිතා භවනති** මෙහි **සු** යනු අකුරු අඩුවක් පිරවීමට නිපාත පදයකි. 'සාරිපුතත, මේ මගේ 'මහා විකට' නම් ආහාරය වෙයි. 'ඉදං සු මෙ සාරිපුතත මහා විකට භොජනසමිං හොති' ආදී තැන් මෙනි. මේ දැකීම හෙවත් සෝවාන් පලයට පැමිණීමත් සමගම, එතෙක් බැඳී තිබුණු කරුණු තුනක් අත්හරිති. දුරු කරති. එහි අදහස මෙසේය. දැන් ඒ අත්හරින ලදැයි දකිනු ලබන කරුණු පහදා දෙනු පිණිස **සකකායදිට්ඨි, විචිකිචඡිතඤච සීලබබතංවාපි යදතථි කිඤචි** යැයි වදාළහ.

උපාදාන පහකින් යුතුව සිරුර පවත්නා කල්හී, සිරුර පිළිබඳව ඇතිවන විසිවැදෑරුම් වූ හැඟීම් අනුව දක්නා ආකාරය **සකකාය දිට්ඨි** වේ. සිරුර කියා දෙයක් ඇතැයි සැළකීම සකකාය දිට්ඨිය. ඉහත කියන ලද පරිදි සිරුර දකිනවිට හැඟීම් ඇතිකර ගැනීම සකකාය දිට්ඨිය. ඒ කියන ලද පරිදි, කයෙහි රූප ආදී ලෙස සළකමින් 'තමාගේ' යැයි සිතා පවත්නා වූ හැඟීම යන තේරුමයි. එම හැඟීම නැතිකරන ලද බැවින් සියළු දැකීම්, හැඟීම් දුරුකරන ලද්දේම වේ. තමාගේ යැයි සැළකීම එයට මුල්වන හෙයිනි. සියළු කෙලෙස් රෝග සමනය කරන බැවින් (විදසුන්) නුවණ **විචිකිචඡිත** (හෙවත් ඉවත් කිරීමට ඇති බලාපොරොත්තුව) යැයි කියනු ලැබේ. ඒ නුවණින් මේ භවයේදී ඒවා දුරුකරන ලදී. ඒ ලෙසින් හෝ නුවණින් ඒවා දුරුකිරීමේ බලාපොරොත්තුව ඉටුකර ගත් බැවින්, ජීවත්වන විටද ඒවා ඉවත්ව ඇති බැවින් **විචිකිචඡිතං** වේ. (මග පෙන්වන) බුදුරජාණන් වහන්සේ පිළිබඳ විමතිය-සැකය ආදී ලෙසින් අටවැදෑරුම් වූ කරුණු ගැන සමාන වචනයකි. ඒ සැකය දුරුකරන ලද බැවින්, අනෙක් සියළුම සැක සහගත කරුණු ද දුරුකරන ලද්දේය. එයම සැකයෙහි මුල නොවේ. මේ සසුනෙන් පිටත, මහණ බමුණන් සීලයෙන් පිරිසිදු වේ. වත්පිළිවෙතින් පිරිසිදු වේ යැයි (පවසමින්) ගවයන්, බල්ලන් මෙන් කටයුතු කර, එය සීලය සේ සමාදන්ව, ගවයන්ගේ, බල්ලන්ගේ හැසිරීම් වතාවත් සේ පිළිපදිත්ද, **සීලබබත** යැයි කියනු ලැබේ. එබඳු

සීලවත අනුගමනය නොකරන බැවින්, රෙදි නොහැඳ සිටීම, මුඩුකිරීම් ආදී දරුණු තවුස්දම් නැත. එය සැකයටද මුල්වේ. එහෙයින් ඒ සියල්ල අවසාන බැවින් **යදත්ථි කිඤ්චි** යැයි කියන ලදී. දුක දැකීමෙන් මෙහි සක්කාය දිට්ඨියද, දුකට හේතුව දැකීමෙන් විචිකිච්ඡාවද, දුක නැතිකිරීම හා දුක නැතිකිරීමේ පිළිවෙත් මගින් හෙවත් නිවනින් සීලබ්බතද දුරුවේ යයි දතයුතුය. මෙසේ ඒ සෝවාන් පලයට පත් තැනැත්තාගේ සසර ගමනේ කෙලෙස් නැතිවන අයුරු දක්වා, තවදුරටත් කෙලෙස් ඇතිකල්හී එය ඉතිරිව ඇති විපාක ලෙසින් දතයුතුය. එයද නැතිකළ යුතු බැවින් එහි නැතිකිරීමද දක්වමින් **චතූහපායෙහි ච විප්පමුත්තො** යැයි වදාළහ. නිරය, තිරිසන් යෝනිය, පේත හා අසුරකාය යනු සතර අපායයි. ඒ සෝවාන් පලයට පත් තැනැත්තා සත්වරක් උපදින්නේ නමුදු ඒ සතර අපායෙන් මිදුනේ වේ. මෙසේ විපාක නැති කිරීමද දක්වා දැන්, යම් විපාක දීමකට මුල්වන කටයුතුද (කම්ම) නැතිකිරීමද පහදමින් **ඡ චාභිඨානානි අභබ්බො කාතුං** යැයි කීහ. එහි **අභිඨානානි** යනු ලාමක පහත් තැන්ය. ඒ තැන් හයෙහි ඉපදීම ලබාදෙන දේ ඔහු වෙතින් සිදුවනු නොහැකිය. ඒ ගැන, 'මහණෙනි, මෙම යහපත් දැකීම ලබන තැනැත්තාගෙන්, මවගේ දිවි තොර කිරීමක් සිදුවීමට ඉඩක් නැත' 'අට්ඨාන මෙතං භික්ඛවෙ අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො මාතරං ජීවිතා වොරොපෙය්‍යා'.........ආදී ලෙසින් ඒකක නිපාතයේ කී පරිදි, මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, (බුදු සිරුරෙන්) ලේ සෙලවීම, සංඝ භේදය, වෙනත් සමයක මගපෙන්වන නායකයකු ඇදහීම නොකරන්නේ යැයි දතයුතුය. මනා දැකීමෙන් යුතු අරියසාවකයා කුරාකුහුඹුවෙකුගේ වුවත් දිවි තොර නොකරයි. එයද කෙලෙස් සහිත ජනයාට නිගරු පිණිස කියන ලදී. කෙලෙස් සහිත වූවෝ මනා දැකීමක් නොමැති බැවින් මෙසේ මහත් වැරදි සහගත දේ කරති. දැකීමෙන් යුතු තැනැත්තා වෙතින් එවැනි දේ සිදුනොවේ. පසු ඉපදෙන ජාතිවලදීද ඒවා නොකිරීමේ දැක්මක් ඇත. ඉපදෙන අතරතුර, තමන්ගේ උසස් සාවක බව (සෝවාන් බව) නොදන්නා නමුදු, පරපණ නැසීම ආදී පස්ආකාර වූ විරමණයෙන් හා මව මැරීම වැනි තරහ මුල්කොට ගත් කරුණු පහක්ද, වෙනත් සමයවාදයක් නොපිළිගැනීමත් යන සවැදෑරුම් දේද සොබාවයෙන්ම නොකරයි. ඒ අනුව ඇතැම් කෙනෙක් **ඡ චාභිඨානානි** යැයි ද කියති. මළ මසුන් ගෙන යන්නන්ද, උසස් පැවතුම් ඇති (අරියසාවක) ගම්දරුවන්ද මෙහිලා නිදසුන්ය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ, භව සතක් දක්වා උපත ලබන සෝවාන් බවට පත් උසස් සාවක ගුණ ලෙසින් මුලපටන්ම

සඟරුවනෙහි ගුණ කියා දැන් ඒ ගුණ නිසාම, **ඉදමපි සංඝෙ** යනුවෙන් ඇත්ත වූ වචන සහතික කොට දක්වති. මේ ගාථාවෙහි අණ ද කෙළ සියදහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ මුලපටන්ම සත්භවයක ඉපදීම නැති නොකරන ලද පුද්ගලයන් පිළිබඳ උසස් ගුණයෙන් සාවක සංඝයා කෙරෙහි වූ තීරණයෙන් හා ඇත්තම වූ වචනයෙන් සහතික කොට දක්වා, දැන්, ඒ සෝවාන්පලය ලද තැනැත්තා වෙතින් සයවැදෑරුම් කරුණු සිදුනොවීම, පමණක් නොව, සුළු හෝ පවක් කොට එය සැඟවීමත් සිදුවිය නොහැකි යයිද, කිසියම් පමාවීමකින් හෝ කරන ලද එබඳු දෙයක් නොසඟවන ගුණය **කිඤ්චාපි සො කම්මං කරොති පාපකං** යනුවෙන් වදාළහ. එහි තේරුම නම්, සො සෝවාන් තැනැත්තා, **කිඤ්චාපි** සිහි මුළාවකින් පමාවීමකට පැමිණ, ලෝකයා වරද යයි සම්මත කරුණු දැන දැන නොඉක්මවිය හැකි බැවින්, භාග්‍යවතුන් වහන්සේ ඒ පවත්නා වහර සැළකිල්ලට ගෙන එසේ වදාරන ලදී. 'මා විසින්, මගේ සාවක පිරිසට යම් පමණ සිකපද පණවන ලදද, ඒ සාවක පිරිස ජීවිතය අත්හළද, ඒවා නොඉක්මවති.' 'යං මයා සාවකානං **සික්ඛාපදං පඤ්ඤත්තං**, තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති', එසේ දක්වා ඇති සේම, කුටි සැකසීම, එක්ව නිදීම ආදී පණවන ලද වැරදි ඉක්මවා යන, **කායෙන පාපකම්මං කරොති** පද පිළිවෙලින් දහම හැදෑරීමෙන්, මතුවට වචන පහ හයකින් (සුදුසු නොවන ආකාරයෙන්) දහම් දෙසීම, වැඩකට නැති කතා හෝ නපුරු වචනයෙන් හෝ **වාචාය උද චෙතසා වා** කිසිවිටක ආසා උපදවන රන්රිදී ආදිය පිළිගැනීමෙන් හෝ, සිවුරු ආදිය පරිහරණයෙහිදී විමසීමකින් තොරව (සීතල, උණුසුම වළකා ගැනීම ආදී පච්චවෙක්ඛනයෙන් තොරව) හෝ පාපයක් කෙරේද, **අභබ්බො සො තස්ස පටිච්ඡාදාය** ඒ සෝවාන් පලයට පත් තැනැත්තා මේ දෙය අකැපය, නොකළ යුතුයැයි දැන, මොහොතකුදු නොසඟවයි. එකෙණෙහිම තම මගපෙන්වන නායකයාට හෝ (තථාගතයන් හෝ) වියත් දැනුමැති කෙනෙකුට හෝ, තමා හා එක්ව වසන කෙනෙකුට හෝ හෙළිකොට, දහමට අනුකූලව කටයුතු කරයි. නැවත නොකරන්නෙමි'යි සංවර වෙයි. නැතිනම් එසේ සංවර විය යුතුයි. කවර හෙයින්ද? **අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා** මෙබඳු පව්කම් කොට, එය වළක්වනු පිණිස, නිවන පෙනෙන මානයේ සිටි දැක්මෙන් යුතු ඒ තැනැත්තාට නොහැකි වේයැයි කියන ලදැයි තේරුමයි. ඒ කෙසේද? 'මහණෙනි, උඩුකුරුව නිදන ළදරු කුමරකු අතින් හෝ පාදයෙහි ගිනි අඟුරක් (තවරා) ගත්විට ඉක්මණින්ම

ඉවතට ඇදගන්නේ යම්සේද, ඒ දැකීමෙන් යුතු තැනැත්තාද එබඳු ඇවැතකට පැමිණේද, එයින් ඇත්වීමට වැටහේද, ඉක්මණින්ම තම නායකයා හෝ තථාගතයන් වහන්සේ හෝ වියත් දැනුමැති කෙනෙකු හෝ තමා හා එක්ව වසන කෙනෙකු වෙත හෝ එය කියයි. විවරණය කරයි. පැහැදිළි කරයි. එසේ කියා, විවරණය කොට, පැහැදිළිකොට නැවත එවැනි දෙයක් සිදුනොවීමට හික්මෙයි. එය මෙබඳු තැනැත්තන් කෙරෙහි වූ නියාම දහමකි. 'සෙය්‍යථාපි භික්ඛවෙ දහරො කුමාරො මන්‍දො උත්තානසෙය්‍යකො හත්‍ථෙන වා පාදෙන වා අංගාරං අක්කමිත්‍වා ඛිප්පමෙව පටිසංහරති, එවමෙව ඛො භික්ඛවෙ ධම්මතා දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස, කිඤ්චාපි තථාරූපිං ආපත්තිං ආපජ්ජති යථාරූපාය ආපත්තියා වුට්ඨානං පඤ්ඤායති, අථඛො තං ඛිප්පමෙව සත්‍ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු දෙසෙති, විවරති, උත්තානී කරොති, දෙසෙත්‍වා විවරිත්‍වා උත්තානීකත්‍වා ආයතිං සංවරං ආපජ්ජති' මෙසේ භාග්‍යවතුන් වහන්සේ, පමාදව ගත කරන්නකු වුවද, නිවන දැක්මෙන් යුතු ඒ සෝවාන් බවට පත් තැනැත්තාගේ වරද නොසඟවන ලද ගුණය දක්වා, දැන් ඒ ගුණ නිසා ඉදම්පි සංඝෙ යැයි ඇත්ත වචනය සහතික කොට කියති. එහි අරුත කලින් කියා ඇති පරිදි දතයුතුය. මේ ගාථාවෙහි අණ ද කෙළ සියදහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ සාවක සංඝබවට පිළිපන් තැනැත්තන්ගේ ඒ ඒ ගුණ සමූහය අනුව, තීරණයකොට ඇත්ත කියා, මීළඟට භාග්‍යවතුන් වහන්සේ විසින් තෙරුවන් ගුණ පහදා දෙමින්, මෙහිදී සැකෙවින්ද, වෙනත් තන්හී සවිස්තරවද උගත යුතු - දැනගත යුතු ලෙස දෙසන ලද දහම අනුව (තම අවබෝධය හෙවත් බුදු අදිටන බලයෙන්) ඇත්ත තහවුරු කොට වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ ආදී ගාථාව ඇරඹූහ. එකිනෙකට ළං ළංව පිහිටි, වැඩුණු ගස් සමූහය වනයයි. මුල්වලින් හා අරටුව එළය හා පොතු සහිත අතුපතරින් යුතු වූයේ ගුම්බයි. (මෙසේ) පඳුරු පඳුරු සේ එකට බැඳී වැඩී ඇති හෙයින් වනෙ පගුම්බො = වනප්පගුම්බෙ යැයි කියා ඇත. 'විතක්කය ද විචාරය ද ඇත, 'විතක්ක හැර විචාරය පමණකට ඇත.' අත්‍ථි සවිතක්ක සවිචාරෙ - අත්‍ථි අවිතක්ක විචාරමත්තො', 'සැපෙහිද දුකෙහිද ජීවත් වේ', 'සුඛෙ දුක්ඛෙ ජීවෙ' ආදී තැන්හි මෙන් මෙසේ කිව හැකි අයුරිනි. යථා උපමාව දැක්වීමේ වචනයයි. අතු අග පිපුණු මලින් යුතු - ඵුස්සිතානි අග්ගානි අස්සා = ඵුස්සිතග්ගෙ, අතුඉති සෑම තැනකම මල් පිපුණු යන අදහසයි. කලින් සඳහන් වූ පරිදි ඵුස්සිතග්ගෙ යැයි කියා

ඇත. ගිම්හාන මාසෙ පඨමසමිං ගිම්හෙ උණුසුම් කාලයට ගැනෙන මාස හතරක යම් මාසයක්, ඒ කිනම් මාසයද? ගිම්හානයෙහි මුල් ම මාසය - බක් මාසය අදහස් වේ. එය පළමු ගිම්හානය - වසන්ත සමයෙහි පටන්ගැන්ම සේ, 'බාල වසන්තය' සේ ගැනේ. මින්පසු පදවල තේරුම පහසුය. මේ කෙටි අරුතයි. යම්සේ පළමු ගිම්හානය නම් වූ බාල වසන්තයෙහි, නොයෙක් නොයෙක් ගස්වලින් යුතු කැලෑවෙහි නොමේරූ ගස් අතුඅග පිපුණු මලින් එකම පඳුරක් මෙන් සිරියාවක් වේද, එසේම, රූප ආදී කොටස්වලින් යුතු, පිහිටුවා ගන්නා ලද සිහිය වත් සීල සමාධි කඳින් හා නොයෙක් ආකාර වූ අරුත් කොටස් නැමති මලින් බොහෝ සොඳුරු සිරියා ඇති බැවින් තථූපමං, ඒ නිවන් සලසන මග පහදා දෙමින්, නිබ්බාණගාමිං, ඉගෙන දරාගත යුතු ධම්මවරං වාසි ලබාගැනීමට නොව, සත්කාර ලබාගැනීමට නොව, හුදෙක්ම හැමදෙනා කෙරෙහි මහා කරුණාව පෙරදැරි කොටගත් හදවතින් පරමං හිතාය අදෙසයී, මෙහි ගාථාවේ වචන ගැළපීමේ පහසුව සළකා පරමංහිතාය යනුවෙන් අනුනාසිකව යොදා ඇත. තේරුම මෙයයි. පරම හිතාය - හැමදෙනා කෙරෙහි හිතානුකම්පාවෙන්ම නිවන්මග දක්වනු පිණිස දේසනා කළහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ, අතුඅග මල් පිපුණු වනලැහැබක් බඳුවූ, ඉගෙන-පිළිපැදිය යුතු දහම පිළිබඳව කරුණු කියා, දැන් ඒ නිසාම බුදු අදිටන තීරණය වන ඇත්ත වචනය ඉදම්පි බුද්ධෙ යනුවෙන් සහතික කොට දක්වති. එහි අරුත කියන ලද පරිදි දතයුතුය. හුදෙක්ම ඉදම්පි යනුවෙන් ඉහත සඳහන් කරන ලද ඉගෙන දරාගත යුතුයයි සළකනු ලබන දහම හා, බුද්ධෙ රතනං පණීතං යැයි මේ අනුව යොදාගත යුතුය. මේ ගාථාවෙහි අණ ද කෙළ සියදහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, ඉගෙන පිළිපදිනා දහමෙන් තීරණය වන අයුරින් බුදුඅදිටන පරිදි තීරණය වන ඇත්ත වචන පවසා, දැන්, වරො වරඤ්ඤූ යන ගාථාවෙන් ලොවුතුරා දහම පිළිබඳව කරුණු පහදාදීම ඇරඹූහ. වරො 'අහා! අපිද මෙබඳු උතුම් ගුණ ඇත්තන් වෙමු'යි උතුම් දහම පිළිගැනීමට කැමති තරම් උසස් අදහස් ඇති, එබඳු ගුණ (තමා කෙරෙහි) පිහිටුවා ගැනීමෙන් හෝ උතුමෙකුව, ඉතා උසස් යන අදහසයි. වරඤ්ඤූ නිවන ගැන දන්නා වූ, හැම දෙයකටම වඩා නිවන උතුම් යන අරුතින් වරං නම් වේ. ඒ බව බෝමැඩදී තමන් විසින්ම පිරිසිඳ දන්නා ලදී. වරදො පස්වග මහණුන්, භද්‍රවග්ගිය කුමාරවරුන් හා ජටිල ආදීන්ටද,

අනෙක් දෙව් මිනිසුන්ට ද කරුණු පෙන්වාදීමෙන් ලබාදුන් අවබෝධයෙන්ද, පෙර කරන ලද යහපත් කටයුතුවලට අනුරූප වූ වාසනා ගුණයෙන්ද, ඒ නිවන මග කියාදෙන, වරාහරො එම නිවන ලබාදෙන පිළිවෙත් මග හෙළිකරන ලද බැවින් වරාහරො යැයි කියනු ලැබේ. එසේම ඒ භාග්‍යවතුන් වහන්සේ දීපංකර බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි පටන්, සමතිස් පෙරුම් පුරමින් පෙර බුදුවරුන් වහන්සේලා විසින් අනුගමනය කරන ලද පැරණි උතුම් මග ගෙනහැර දැක්වූහ. එහෙයින් වරාහරො යැයි කියනු ලැබේ. එමෙන්ම සියල්ල දන්නා වූ නුවණ ලැබීමෙන් වරො නම් වේ. නිවන අවබෝධයෙන් වරඤ්ඤූ සත්වගට සසරින් මිදීමේ සුවය ලබාදීමෙන් වරදො, උතුම් පිළිවෙත පෙන්වාදීමෙන් වරාහරො, මෙබඳු ලොව්තුරු ගුණවලින් වැඩි කිසිවකු නොවන බැවින් අනුත්තරො වෙනත් අයුරින් කියන්නේ නම්, වරො සිත කිලිටි වන සියළු කරුණුවලින් මිදී, සිත එකඟ කරගැනීමේ අදහස සපුරා ගැනීමෙන් යන අරුතයි. වරඤ්ඤූ තියුණු නුවණ සපුරා ගැනීමෙන් වරාහරො කියන ලද දෙයෙහි ඇත්ත හැමවිට තහවුරු කරන අදහස සපුරා ගැනීමෙන් උසස් වූ පිළිවෙත් මග හෙවත් අරිඅටැඟි මග ඇත්ත වන බව ගෙනහැර දක්වති. එසේම උසස් පින් මහිම ඇති බැවින් වරො නම් වේ. එසේම බොහෝ පින් මහිම ඇති බැවින්ද වරො නම් වේ. උසස් නැණ මහිමයෙන්ද එසේ වෙයි. බුදුබව ලබනු කැමති වූවනට එයට සුදුසු කටයුතු පෙන්වාදීම වරදො නම්. පසේ බුදුබව කැමති වූවන්ට එම වැඩපිළිවෙල ගෙනහැර පෑමෙන් වරාහරො නම් වේ. ඒ ඒ කරුනින් අසමාන බැවින්ද, තමාට ගුරුවරයෙකු නොමැති වුවත් අනෙක් හැමටම ගුරුවරයෙකු වීමෙන් (තථාගතයන්) අනුත්තර ය. ධම්මවරං අදෙසයී සාවකයෙකු වීමට කැමති වූවන්ට ඒ සඳහා මැනවින් කියන ලදැයි අරුත දෙන ස්වාක්ඛාත ආදී ගුණවලින් යුතු උතුම් දහම දේසනා කරන ලදින්, ඉතිරි කරුණු ඉහත දැක්වූ අයුරිනි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ නව ලොවුතුරු දහමෙන් තම ගුණ දක්වා, දැන් ඒ ගුණ නිසාම බුදු අදිටනින් තීරණය වන ඇත්ත වචනය ඉදම්පි බුද්ධෙ යැයි සහතික කොට දක්වති. එහි අදහස පෙර කියන ලද අයුරින් දතයුතුය. හුදෙක්, ඒ තථාගතයන් වහන්සේ උතුම් වූ යම් ලොවුතුරු දහමක් අවබෝධ කළේද, යම් දෙයක් ලබාදුන්නේද, යම්දෙයක් ගෙනහැර පෑවේද යම් දෙයක් දේසනා කළේද, ඉදම්පි බුද්ධෙ රතනං පණීතං යැයි මෙසේ යෙදිය යුතුය. මේ ගාථාවෙහි අණ කෙළ සියදහසක් භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, ඉගෙන දරාගත යුතු දහමද, නව ලොවුතුරා දහමද අනුව බුදුබලය පවත්නා ඇත්ත කරුණු ගාථා දෙකකින් කියා, ඒ ඇසූ-ඉගෙන දරාගත යුතු දහම පිළිපැද නව ලොවුතුරු දහම පසක් කළ ඒ උතුමන්ගේ මතු සසර නූපදනා ගුණ නිසා, නැවතත් ඒ සාවක සඟ ගුණයෙන්ද සහතික වන ඇත්ත **ඛීණං පුරාණං** ආදී ලෙසින් පහදා දුන්හ. **ඛීණං** සහමුලින්ම සිඳ දැමීමයි. **පුරාණං** පෙර, **නවං** පවත්නා (වත්මන්) කාලය, **නත්ථි සම්භවං** හටගැනීමක් නොපෙනෙන, **විරත්ත චිත්තා** කැමැත්ත -රාගය පහ වූ සිත ඇති, **ආයතිකෙ භවස්මිං** මතු නැවත ඉපදීමක්, **තෙ** පෙර භවයන්හී කළ කම් නැති කළ, අළුතින් කම්පල පැවැත්මක් නොමැති, නැවත භවයෙක ඇලීම් දුරුකළ සිතැති, කෙලෙසුන් නැසූ ඒ රහතන් වහන්සේලා, **ඛීණබීජා** (උපතට අවැසි හේතුව) බිජුවට සිඳින ලදී. **අවිරූළ්හිච්ඡන්දා** එසේ මතු ඉපදීමෙහි වැඩෙන ආසා රහිත වූ, **නිබ්බන්ති** නිවීමට පත්වෙති, **ධීරා** උත්සාහවත් වූවෝ, **යථායම්පදීපො** මේ පහන මෙන්, කුමක් නිසා එසේ කියන ලද ද? සසර සැරිසරන හැම සතෙකුම ඉපිද, නැසුණද, පෙර කළ කම්හි 'තණ්හා' නම් සෙනෙහස් දියෙන් නොවියලන ලද බැවින්, යළි උපතක් ගෙනදීමට සමත් හෙයින්, එය නොසිඳී පවත්නේමය. ඒ පෙර කළ කම් අරහත් මගින් වියලන ලද හෙයින්, ගින්නේ දැවූ බීජයක් මෙන් නැවත විපාක දීමට අසමත් වන බැවින්, **ඛීණං** වේ. ඒ රහතුන්ගේ බුදුපුද ආදී ලෙසින් දැන් (පවත්නා ජීවිතයෙහි) කරන දේවල් නවං යැයි කියනු ලැබේ. එහිදී තණ්හාව නැතිකරන ලද බැවින්, මුල සිඳින ලද ගසක මල් හටනොගන්නා සේ, නැවත විපාක දීමට සමත්වන ඉපදීමක් යම් කෙනෙකුට නැත්තේද, තණ්හාව නැති කළ, නැවත භවයක් නොකැමති සිතැති ඒ රහතන් වහන්සේ, **කම්ම නම් වූ කෙතට විඤ්ඤාණය** බීජය වේ' යැයි කී පරිදි 'කම්මං ඛෙත්තං විඤ්ඤාණං' නැවත මවුකුසක පිළිසිඳීමේදී යොමුවන විඤ්ඤාණය - කම්ම නැතිවීමත් සමගම නසන ලදින්, **ඛීණ බීජා** නම් වේ. පෙර නැවත ඉපදීම යැයි කියනු ලබන (බීජය) වැඩිදියුණු කිරීමට කැමැත්ත වීද, එහි හේතුව නැතිකිරීමෙන්ම නසන ලද බැවින්, පෙරදී මෙන් මැරෙන මොහොතෙහි ඒ වැඩෙන ආසාවද නැත. එහෙයින් **අවිරූළ්හිච්ඡන්දා** උත්සාහවත් වූ බැවින් **ධීරා** අවසන්වරට විඤ්ඤාණය නැති කිරීමෙන් මේ පහන නිවුණසේ (කෙලෙස් දැවීමෙන්) නිවෙති. රූපී හෝ අරූපී හෝ මේ ආදී ලෙසින් සම්මතව ඇති උපත ලබන භව ඉක්මවා ඇත්තාහ. ඒ වේලාවෙහි දේවතාවුන්ට පූජා පිණිස දල්වන ලද පහන්වලින් එක් පහනක් නිවුණි. එය (නිදසුන් සේ) දක්වමින් යථායම්පදීපො යැයි වදාළහ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, මුල් ගාථා දෙකින්, කියන ලද පරිදි ඉගෙන දරාගත යුතු දහම් අසා, ඇසූ අයුරින්ම පිළිපැද නව ලොවුතුරා දහම අවබෝධ කළ ඒ උතුමන්ගේ, නැවත නූපදනා සේ නිවනට පත්වීමේ ගුණ කියා, දැන් ඒ ගුණ සාවක සංඝයා පිළිබඳ තීරණය වන ඇත්ත වචනය සහතික කරමින් දේසනය නිමකළහ. **ඉදම්පි සංඝෙ** මෙහි තේරුම පෙර කියන ලද පරිදි දතයුතුය. හුදෙක්ම **ඉදම්පි** යනු (ඉහත) කියා ඇති පරිදි රහතන් වහන්සේ අවබෝධ කොටගත් නිවනයි. **සංඝෙ රතනං පණීතං** යැයි මෙසේ යෙදිය යුතුය. මේ ගාථාවෙහි අණද කෙළසියදහසක් සක්වළ භූතාදී නොමිනිසුන් විසින් පිළිගන්නා ලදී. දේසනය අවසන රජපවුලෙහි සියළුදෙනා සුවපත් වූහ. උවදුරු සියල්ල සන්සිඳුණි. අසූහාර දහසකට දහම් අවබෝධය විය.

ඉක්බිති සක්දෙවිඳු, 'භාග්‍යවතුන් වහන්සේ විසින් තෙරුවන් ගුණය පිහිටුවමින් එහි ඇත්ත සහතික කොට පැවසීමෙන් නගරය සුවපත් කරන ලදැ'යි සිතා 'මා ද නගරයෙහි හිතසුව පිණිස තෙරුවන් ගුණය පිළිබඳව යම්කිසිවක් කිවයුතු'යැයි අවසානයේදී **යානීධ භූතානි** ආදී ගාථා තුනක් කීය. බුදුරජාණන් වහන්සේ ලොවට හිතසුව පිණිස උත්සාහවත්ව පැමිණිය යුතු විටකදී එසේ පැමිණි බැවින්ද - හිතසුව සැලසීමට සුදුසු තැනැත්තන් වෙත ගිය බැවින්ද (සසර තතු ආදිය) නොදත්තවුන් අතර දන්නා බැවින් ද - දැනගත යුතු දේ දැනසිටි බැවින් ද කරුණු ඇති සැටියෙන් පහදා පවසන බැවින්ද තථාගත යැයි කියනු ලැබේ. දෙව් මිනිසුන් විසින් මලින්, සුවඳින් වැනි බාහිරව සකස් වූ දෙයින්ද, දෙසන ලද දහම් කරුණු අනුව පිළිපැද, ඒවා තමන් කෙරෙහි පිහිටුවා ගැනීමේ පිළිවෙතින්ද තථාගතයන් වහන්සේ පූජා ලබන ලදහ. එහෙයින් සක්දෙවිඳු සියළුම දෙව් පිරිස සමග එක්ව ඒ අදහස් ගොනුකොට, **තථාගතං දෙවමනුසස පූජිතං බුදධං නමසසාම සුවත්‍ථි හොතු** යනුවෙන් කීය. දහමෙහි පිළිවෙත් මග පරිදි සමථ-විදසුන් යන දෙයාකාර බල එක්කොට කෙලෙස් පැති මුළුමනින්ම සිඳලීමෙන් යායුතු තැනට ගිය බැවින්ද තථාගත වේ. නිවන් දහම නුවණින් පිරිසිඳ දැන, සියළු දුක් නැතිකරනු පිණිස, පැමිණ බුදුවරුන් ආදී උතුමන් විසින් එසේ අවබෝධ කරන ලද බැවින්ද තථාගත යැයි කියනු ලැබේ. සාවක පිරිසද තම හිතසුව පිණිස ඒ පිළිවෙත් මගට පැමිණ එසේ (සෝවාන් ආදී) ඒ ඒ මගින් (සසරින් එතරට) ගිය බැවින්ද තථාගත නම් වේ. ඒ අනුව තථාගතම වේ යැයි කියනු ලැබේ. අවසාන ගාථා දෙකින්ද 'තථාගතයන් (වහන්සේගේ)

දහමට නමස්කාර කරන්නෙමු, සෙත්වේවා! තථාගතයන් වහන්සේගේ සාවක රහත් උතුමන්ට නමස්කාර කරන්නෙමු, සැපවේවා'යි කියන ලදී. ඉතිරි කරුණු ඉහතින් සඳහන් වූ පරිදිමය.

සක්දෙව් මෙසේ මෙම ගාථා තුන කියා භාග්‍යවතුන් වහන්සේ පැදකුණු කොට දෙව් පිරිස සමග දෙව්පුරයටම ගියේය. බුදුරජාණන් වහන්සේ ඒ රුවන් සුතුරම දෙවන දිනයෙහිද දේසනා කළහ. නැවතද අසූහාර දහසකට දහම් අවබෝධ විය. මෙසේ සත්දිනක්ම දේසනා කළහ. ඒ ඒ දිනවල දේසනාව අවසානයෙහි එපරිදිම දහම් අවබෝධය ලදහ. භාග්‍යවතුන් වහන්සේ අඩමසක් විසාලාවෙහි වාසයකොට, 'නගරයෙන් පිටවන්නෙමු'යි රජවරුන්ට දැන්වූහ. එවිට රජවරු (පෙරටත් වඩා) දෙගුණ වූ ගරුසත්කාරයෙන් නැවත තෙදිනකින් ගංතෙරට කැඳවාගෙන ගියහ. ගඟෙහි උපන් නා රජවරුද 'තථාගතයන් වහන්සේට මිනිස්සු සත්කාර කරති, අපි කිනම් හෝ සත්කාරයක් නොකරන්නෙමුදැ'යි රන් රිදී මැණික් නැව් මවා, රන්, රිදී මැණික් අසුන් පනවා පස්පැහැ පස්පියුමෙන් දිය මතුපිට සකසා, 'අපට (පුදසත්කාර සඳහා) උපකාර වුව මැනවැයි 'භාග්‍යවතුන් වහන්සේ වෙත සැළකළහ. එය ඉවසූ බුදුරජාණන් වහන්සේ රුවන්මය නැවට පිවිසුනහ. පන්සියයක් සඟ පිරිසද නැව් පන්සියයකට පිවිසියහ. නා රජවරු බුදුපාමොක් මහසඟ පිරිස නාග විමනට කැඳවාගෙන ගියහ. එහිදී භාග්‍යවතුන් වහන්සේ නා පිරිසට මුළු රැයම දහම් දෙසූහ. පසුදින නාගයෝ කැයුතු බුදිය යුතු දිව බොජුනින් මහදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කොට නා බවනින් නික්මුණහ. පොළවෙහි වැසි දෙවිවරු 'මිනිස්සු ද නාගයෝ ද තථාගතයන් වහන්සේට සත්කාර කරති, අපි කිනම් බඳු සත්කාර නොකරන්නෙමුදැ'යි සිතා වනලැහැබ්වල, ගස් පව් මුදුන් ආදියෙහි සේසත් පිට සේසත් නැංවූහ. මේ ආකාරයෙන් අකනිටා බඹලෝ දක්වා මහත් සත්කාර පැවැත්වීය. බිම්බිසාර රජුද, ලිච්ඡවී රජවරුන් පැමිණි කල කරන ලද සත්කාරවලට වඩා දෙගුණ වන පරිදි සත්කාර කළේය. පෙර කී පරිද්දෙන්ම පස්දිනකින් භාග්‍යවතුන් වහන්සේ රජගහනුවරට වැඩම කරවන ලදී.

භාග්‍යවතුන් වහන්සේ රජගහනුවරට පැමිණිවිට, පසුබත් කාලයෙහි වටරවුම් සාලාවෙහි රැස්වූ සඟ පිරිස අතර, 'යම් තැනැත්තකු වෙනුවෙන් ගඟෙහි එතෙර මෙතෙර, අටයොදුනක් වූ බිම් පෙදෙසෙහි දියෙහිද ගොඩබිමෙහිද සමකොට වැලි අතුරා, මලින් ගැවසී තිබුණේද, යොදුනක්

පමණ ගංගා ජලයෙහි නත් පැහැති පියුමින් ගැවසුණද, අකනිට්ඨා බවන දක්වා සේසත් පිට සේසත් නැංවීද, ඒ භගවත් බුදුරජාණන් වහන්සේගේ බලමහිමය හරි පුදුමයි' යනුවෙන් මේ අතුරු කතාබහ ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේ ඒ බව දැන, සුවඳ කුටියෙන් නික්ම, ඒ මොහොතට සුදුසු අයුරින් පැමිණ පනවන ලද උතුම් බුදුඅසුන්හි වැඩසිටියහ. එසේ වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, දැන් කිනම් කතාබහකින් සිටියාහුදැ'යි සඟ පිරිස ඇමතූහ. සංඝයා වහන්සේලා ඒ සියළු තොරතුරු සැළකළහ. 'මහණෙනි, මේ වෙසෙස් වූ පූජා මගේ බුදුබලයෙන් පැවැතියේ නොවේ. නාගයන්ගේ, දෙවියන්ගේ, බඹුන්ගේ බලයෙන්ද නොවේ. එතෙකුදු වුවත්, පෙර, අපමණ වූ දේ (පවරා) දෙනු ලැබූ බැවින්, ඒ බලයෙනැ'යි වදාළහ. 'හිමියනි, ඒ අපමණ දෙන ලද දේ පිළිබඳව අපි නොදනිමු. අපට දැනගැනීමට එය වදාරන්නේ නම් මැනවැ'යි සඟ පිරිස කීහ. භාග්‍යවතුන් වහන්සේ (මෙසේ) වදාළහ. 'මහණෙනි, පෙර තක්සලාවෙහි සංඛ නම් බමුණෙක් විය. ඔහුගේ සුසීම නම් සොළොස් වියැති තරුණ පුතු දිනක් පියා ළඟට අවුත් එකත්පස්ව සිටියේය. 'සුසීම, කුමක්ද දරුව' පියා ඇසීය. 'පියාණනි, මම බරණැසට ගොස් සිප්සතර ඉගෙනීමට කැමැත්තෙමි'යි කීය. එවිට බමුණා, 'එසේනම් දරුව, අසවල් නම් ඇති බමුණා මගේ යහළුවෙකි. ඔහු වෙතින් උගනුව'යි කහවණු දහසක් දුන්නේය. ඔහු එය රැගෙන මව්පියන් වැඳ අනුපිළිවෙලින් බරණැසට ගොස් කළයුතු සිරිත් අනුව ගුරුතුමා වෙත එළඹ, වැඳ තමන් හඳුන්වා දුන්නේය. ඇදුරුතුමා, 'මගේ යහ යහළුවාගේ පුතු'යැයි තරුණයා පිළිගෙන සියළු ආගන්තුක සත්කාර කළේය. සුසීම ගමන් විඩාව දුරු වූ පසු ඒ කහවණු දහස ඇදුරුතුමාගේ පාමුල තබා සිප්සතර ඉගෙනීමට අවසර ඉල්ලීය. ඇදුරුතුමා එය පිළිගෙන උගැන්වීය. තරුණයා සුළුවෙන් හෝ වැඩියෙන් හෝ අසා දරා ගත් දේ රන්බඳුනෙහි දැමූ සිංහතෙල් මෙන් අමතක නොකොට සිත දරමින් දොළොස් වසරකින් ඉගෙන ගතයුතු සිප්සතර මාස කීපයකින් ඉගෙන අවසන් කළේය. ඔහු එය වනපොත් කරනවිට එහි මුල, මැද මිස අවසානය නොදකී. ඉක්බිති ඇදුරු වෙතට ගොස්, 'මේ සිප්සතර මුල, මැද දකිමි, අවසානය නොදකිමි'යි කීය. 'දරුව, මමද එසේ වෙමි'යි ඇදුරුතුමා කීය. 'එසේනම්, මේ සිප්සතරෙහි අවසානය දන්නේ කවරෙකුදැ'යි ඇසීය. 'දරුව, ඉසිපතනයෙහි ඉසිවරු ඇත්තාහ, ඔවුන් දනිති'යි පැවසීය. 'ඇදුරුතුමනි, ඔවුන්ගෙන් විමසමි'යි කීය. 'ඔබට පහසු වේනම් විමසන්නැ'යි ඇදුරුතුමා අවසර දුන්නේය. ඔහු ඉසිපතනයට

ගොස්, පසේබුදුවරුන් හමුවී 'මුල-මැද-අවසානය දන්නෙහුදැ'යි ඇසීය. 'ඇවැත්නි, එසේය, දනිමු'යැයි කීය. 'එය මට ද උගන්වනු මැනව', 'එසේනම් ඇවැත්නි, පැවිදිවන්න, පැවිදි නොවන්නන්ට ඉගැන්වීමට නොහැකි'යැයි පැවසූහ. 'හොඳයි, හිමියනි, පැවිදිකොට හෝ, ඔබවහන්සේලාට කැමති ලෙස කටයුතුකොට හෝ අවසානය දැනගැනීමට සැලැස්වුව මැනවැ'යි කීය. පසේබුදුවරු ඔහු පැවිදිකොට, කමටහන් පෙන්වාදීමට නොහැකිව, 'ඔබ මෙසේ සිවුරු හැඳිය යුතුය, මෙසේ සිවුරු පෙරවිය යුතුයි, ආදී ලෙසින් උසස් හැසිරීම් වත්පිළිවෙත්හි හික්මවූහ. ඒ තරුණ හිමි, එසේ හික්මී, මගපල හේතු සම්පත් ඇති බැවින්, නොබෝ කලකින්ම පසේබුදුබව අවබෝධ කළේය. දානමානාදි පුදසත්කාර ලැබීමෙන් හා පැතිරුණු කිත් රාවයෙන්ද, පිරිවරද යුතුව සුසීම පසේබුදු නමින් පතළ වූහ. පෙර කරන ලද කම්විපාක අනුව කලක් ජීවත්වීමට තරම් ආයු නොලද සුසීම පසේබුදුහු නොබෝ කලකින්ම පිරිනිවන් පෑහ. අනෙක් පසේබුදුවරුද, මහජනයාද සුසීම පසේබුදුන් ආදාහනය කොට, ධාතු තැන්පත් කොට, නගරදොරටුවෙහි ථූපයක් පිහිටවූහ. සංඛ බමුණාද 'මගේ පුතු (සිප්සතර ඉගෙනීමට) ගොස් බොහෝ කල් ගතවීය. ඔහුගේ තොරතුරක් නොදනිමි'යි පුතු දකිනු කැමතිව, තක්සලාවෙන් පිටත්ව, අනුපිළිවෙලින් මග ගෙවා, බරණැසට පැමිණ, මහජනයා රැස්ව සිටිනු දැක, 'මේ බොහෝ දෙනාගෙන් එක් තැනැත්තකු හෝ මගේ පුතාගේ තොරතුරක් ඒකාන්තයෙන්ම දන්නවා ඇතැ'යි සිතමින්, එතැනට පැමිණ, 'සුසීම නම් තරුණයෙකු මෙහි පැමිණ ඇති, ඔහු ගැන තොරතුරක් දනිවුදැ'යි ඇසීය. 'එසේය, බමුණ දනිමු, මේ නගරයෙහි බමුණකු වෙතින් තුන් වේදයෙහිම පරතෙරට පත්ව, පසේබුදුවරුන් ළඟ පැවිදිව, අනුපදිසෙසව පිරිනිවන් පෑහ. මේ උන්වහන්සේ වෙනුවෙන් පිහිටුවන ලද ථූපය' යැයි ඔවුහු කීහ. ඔහු පොළවෙහි අත්ගසා හඬාවැලපී, ඒ සෑමළුව තණකොළ උදුරා, උතුරු සළුවෙන් වැලි ගෙනවුත් පසේබුදු සෑමළුවෙහි අතුරා, බිම හාත්පස කෙණ්ඩියෙන් පැන් ඉස, වනමලින් පූජාකොට, උතුරු සළුවෙන් කොඩියක් නංවා, ථූපය මතුයෙහි තම කුඩය සවිකොට පිටත්ව ගියේය.

මෙසේ අතීතය දක්වා, ඒ ජාතකය වත්මන් කාලය හා ගළපමින්, සඟ පිරිසට දහම් කථා කළහ. 'මහණෙනි, එකල සංඛ බමුණා වෙනත් කෙනෙකැයි ඔබලාට සිතිය හැකියි, මහණෙනි, එසේ නොදත යුතුයි, එකල සංඛ බමුණා නම් මම වීමි. මා විසින් සුසීම පසේබුදුන්ගේ සෑමළුවෙහි

තණකොළ උදුරන ලද්දේය. ඒ කම්විපාකයෙන් අටයොදුන් මග කැටකැබලිති ආදිය ඉවත්වී, සමව පිරිසිදු බවට පත්විය. මා එහි වැලි අතුරන ලදී. වනමලින් පුදන ලදී. ඒ කම්විපාකයෙන් නවයොදුන් මග ජලයෙහිද, ගොඩබිමෙහිද නානාමලින් සෑදුණු මල් ඇතිරිල්ලක් විය. මා එහි කෙණ්ඩියෙන් පැන් ඉසින ලදී. ඒ කම්විපාකයෙන් විසාලාවෙහි පොකුරු වැසි වැස්සේය. මා විසින් සෑයෙහි කොඩි නංවන ලදී. (සෑයෙහි කොත පරිදි) කුඩයක් බඳින ලදී. ඒ විපාකයෙන් අකනිටා බවන තෙක් කොඩි නංවා, සේසත් ඔසවනු ලැබීය. මහණෙනි, මේ ආකාරයෙන් මා මහත් වූ වෙසෙස් පූජා ලද්දේ බුදුබලයකින් නොවේ. නාග-දේව-බ්‍රහ්ම ආනුභාවයෙන් නොවේ. ඉතා සුළු වුවත් දීමෙහි බලයෙන්' යැයි දහම් කතාව අවසානයෙහි මෙම අදහස ඇති ගාථාවක්ද වදාළහ.

'ඉතා සුළු වූ සැපදෙන දෙයක් වුවත් අත්හැරීමෙන් උදාර වූ (නිවන්) සුවය දක්නේ වේද, ඒ උදාර වූ නිවන් සුව දකිනු කැමති නුවණැති තැනැත්තා ඒ ඉතා සුළු වූ සැපය වුවද අත්හරින්නේය.'

මත්තාසුඛ පරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං
චජෙ මත්තාසුඛං ධීරො සම්පස්සං විපුලං සුඛං

රතන සූත්‍ර විස්තරය නිමි.

# 2.2.

සමාකචිංගුලචීනකා යනු ආමගන්ධ සූත්‍රයයි. එහි නිදාන කතාව කුමක්ද? (අප) භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ නොවූ කල්හි, ආමගන්ධ නම් බමුණෙක්, තරුණයන් පන්සියයක් සමග තවුස් පැවිද්දෙන් පැවිදිව හිමාලයට පිවිස උස්බිම් අතරෙහි අසපුවක් කරවා වනමුල්පල ආහාරයට ගනිමින් වාසය කරයි. කිසිවිටකත් මස් මාළු නොකයි. ලුණු ඇඹුල්

ආදියද අනුභව නොකරන බැවින්, ඒ තවුසන්ට පාණ්ඩු රෝගය වැළඳුණි. එවිට ඔවුහු 'ලුණු ඇඹුල් ආදිය ලබාගනු පිණිස මිනිස් වාසයකට යමු'යි (කතිකාකොට) ඈත ගමකට පැමිණියහ. මිනිස්සු ඒ තවුසන් දැක, ආරාධනා කොට වැළඳවූහ. බත්කිස අවසානයෙහි, තවුසන්ට පරිහරණය සඳහා ඇඳ, පුටු, බඳුන්, පාපුටු ආදිය දී, 'හිමියනි, මෙහි වාසය කරනු මැනව, කලකිරීමට පත් නොවනු මැනවැ'යි වසන තැන්ද සකසා ගියහ. පසුදිනද තවුසන්ට දානය දී, නැවත නිවෙස් පිළිවෙලින් එක් එක් දින දානය දුන්හ. සිවුමසක් එහි වැස, ලුණු ඇඹුල් ආදිය සහිත ආහාර ලැබීමෙන් සිරුරු පැහැපත් වූ තවුසෝ 'ඇවැත්නි, අපි යමු'යි මිනිසුන්ට සැළකළහ. මිනිස්සු තවුසන්ට තෙල්, සහල් ආදිය දුන්හ. ඔවුහු ඒවා රැගෙන තම අසපුවලට ගියහ. එසේම වසරින් වසර ඒ ගමටද පැමිණියහ. මිනිස්සුද තවුසන් පැමිණෙන කාලය දැන, දානය පිණිස, සහල් ආදිය පිළියෙල කොට තබති. තවුසන් පැමිණිවිට එසේම පිළිගන්වති.

ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ ලොව පහළව, උතුම් දම්සක් පවත්වන ලදුව, අනුපිළිවෙලින් සැවැත්නුවරට ගොස්, එහි වසන සේක්, ඒ තවුසන්ගේ (දහම් අවබෝධයට) හේතුසම්පත් දැක, එතැනින් නික්ම, භික්සඟන පිරිවරා ගම් සැරිසරා, ඒ ගමටද පැමිණියහ. මිනිස්සු උන්වහන්සේ දැක මහදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දහම් දෙසූහ. ඒ දහම් ඇසූ ඇතමෙක් සෝවාන්, සකදාගාමී, අනාගාමී පල ලැබූහ. ඇතමෙක් පැවිදිව රහත්බවට පත්වූහ. භාග්‍යවතුන් වහන්සේ නැවත සැවැත් නුවරට වැඩියහ. පසුව ඒ තාපසවරු එම ගමට ආහ. මිනිස්සු තවුසන් දැක, පෙර පරිදි ඔවුන්ගේ තොරතුරු දැනගැනීමට උනන්දුවක්, වෙසෙසක් නොපෙන්වූහ. 'ඇවැත්නි, මේ මිනිස්සු දැන් පෙර පරිදි නොවෙති, කිම? මේ ගමට රජු දඬුවම් නියම කිරීමෙන් උවදුරු වීද? නැතිනම් ආහාර ආදිය හිඟවීමක්ද? නැතිනම්, අපටත් වඩා සීලාදී ගුණයුත් කිසියම් පැවිද්දෙක් මේ ගමට පැමිණියේදැයි තවුසෝ ඇසූහ. 'හිමියනි, රාජ දඬුවමකින්, ආහාර හිඟයකින් මේ ගමට උවදුරු නැත. බුදුවරයෙක් ලොව උපන්හ, ඒ භාග්‍යවතුන් වහන්සේ බොහෝදෙනාට හිත පිණිස දහම් දෙසමින් මෙහි පැමිණිසේකැ'යි මිනිස්සු කීහ. ඒ ඇසූ ආමගන්ධ තවුසා, 'ගහපතිවරුනි, බුදුකෙනෙකු ගැන කියවුද?' 'හිමියනි, බුදුකෙනෙකු ගැන කියමු'යි තෙවරක්ම කියා, 'ලෝකයෙහි බුද්ධ යැයි ඇසෙන හඬ දුලබ යැයි' සතුට පළකොට, 'ඒ බුදුවරයා 'ආමගන්ධය' අනුභව කරත්ද, නැද්දැ'යි ඇසීය. 'හිමියනි, 'ආමගන්ධ' යනු කුමක්දැයි මිනිස්සු විමසූහ.

'ගහපතිවරුනි, ආමගන්ධ නම් මාළුමස් යැයි කීය. 'හිමියනි, භාග්‍යවතුන් වහන්සේ මාළුමස් වළඳති'යි මිනිස්සු කීහ. 'එසේනම් බුදුකෙනෙකු විය නොහැකි'යැයි තවුසා විපිළිසර විය. එවිටම බුදුවරුන්ගේ පහළවීම නම් දුලබය. විමසා දැනගන්නෙමි'යි නැවත සිතීය. එහිදී භාග්‍යවතුන් වහන්සේ වැඩිය මග ඒ මිනිසුන්ගෙන් විචාරා වසුපැටවාට ආසා වූ එළදෙනක මෙන් වහ වහා එක රැයකින්ම තම පිරිස සමග සැවැත්නුවරට පැමිණ, ජේතවනාරාමයටම පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේද එවේලෙහි දහම් දෙසනු පිණිස ආසනයෙහි වැඩසිටියහ. තවුසෝ බුදුහිමි වෙත පැමිණ, නොවැඳම, නිහඬව එකත්පස්ව හුන්හ. භාග්‍යවතුන් වහන්සේ 'ඉසිවරුනි, ඔබලාගේ සුවදුක් කෙසේද?' ආදී ලෙසින් ඔවුන් හා පිළිසඳර කතා කළහ. ඔවුහුද 'පින්වත් ගොතම, සුවෙන් සිටිමු'යි කීහ. එහිදී ආමගන්ධ නම් බමුණා (තවුසා) 'පින්වත් ගොතම, ආමගන්ධය අනුභව කරහිද? නොකරහිදැ'යි විචාළේය. 'බමුණ, ඒ ආමගන්ධය නම් කුමක්ද? (බුදුහු ඇසූහ.) 'පින්වත් ගොතම, මස් මාළු' යැයි පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ, 'බමුණ, ආමගන්ධ යනු මාළු, මස් නොවේ. එහෙත් ආමගන්ධ යනු සියළුම පාපී, අයහපත් කෙලෙස්' යැයි පවසා 'බමුණ, ආමගන්ධය ගැන විමසුවේ ඔබ පමණක්ම නොවේ. අතීතයේද තිස්ස නම් බමුණා කසුප් බුදුරදුන්ගෙන් මෙලෙසම විමසන ලදින්, ඒ කසුප් බුදුරදුන් මෙසේ පැහැදිලි කරන ලදැයි **සාමාකචිංගූලකචීනකානි** යන ගාථාව ගෙනහැර දැක්වූහ. මෙය මෙම සූත්‍රයෙහි නිදාන කථාවයි. අතීත කථාව නම්,

අසංඛෙය්‍ය අටකුත් කප් සුවහසක් පෙරුම් පිරූ කසුප් බෝසත්තුමා බඹදත් නම් බමුණාගේ, ධනවතී බැමිණියගේ කුස පිළිසිඳ ගත්තේය. අගසව් බවට පත්වන තැනැත්තාද, එදිනම දෙව්ලොවෙන් චුතව, දෙවන පුරෝහිත බමුණාගේ, බැමිණියගේ කුස පිළිසිඳ ගත්තේය. මෙසේ ඔවුන් එක දවසෙහිම කුස පිළිසිඳ ගැනීමද - බිහිවීමද සිදුවිය. එකම දිනයෙහිම, ඔවුන්ගෙන් එක් දරුවෙකුට කස්සප යැයි ද, අනෙක් දරුවාට තිස්ස යයිද නම් කළහ. ඔවුහු පස් තවරාගෙන කෙළිදෙලින් පසුවන කාලයේ පටන්ම (වැලිකෙළියේ පටන්) එකිනෙකා මිතුරුව කෙමෙන් වැඩුණහ. 'දරුව, මේ කස්සප ගිහිගෙයින් නික්ම, පැවිදිව බුදුබව ලබන්නේය. ඔබද එතුමන් ළඟ පැවිදිව සසර දුක කෙළවර කරව'යි තිස්සගේ පියා පුතුට අණකළේය. ඔහු යහපතැ'යි පිළිවදන් දී, බෝසතුන් ළඟට ගොස්, මිතුර, අපි දෙදෙනාම පැවිදි වන්නෙමුදැ'යි කීහ. බෝසත් කසුප් 'යහපතැ'යි පිළිවදන් දුන්නේය.

වැඩිවියට පත් කල්හිද තිස්ස බෝසතුන් ළඟට පැමිණ, 'එන්න මිතුර, පැවිදි වන්නෙමු'යි කීය. බෝසත් ගිහිගෙයින් නික්මුණේ නැත. තිස්ස, 'තවමත් තම මිතුරාගේ නුවණ මෝරා නැතැ'යි සිතා, ගිහිගෙයින් නික්ම, තවුස් පැවිද්දෙන් පැවිදිව, කැලයෙහි පව්වක පාමුල අසපුවක් සකස්කොට, වසයි. බෝසත්ද නිවසෙහිදීම ආනාපානසතිය වඩා, දැහැන් සතර හා වෙසෙස් නුවණ (අභිඤ්ඤා) උපදවා, පහයෙන්ම බෝමැඩ කරා ගොස්, 'පහය පිහිටි තැනම නැවත තිබේවා'යි අදිටන් කළේය. එය පෙර තිබූ තන්හිම පිහිටියේය. පැවිදි බව නොලබා බෝමැඩට පැමිණීමට නොහැකිය. කසුප් පැවිදිව බෝමැඩට පැමිණ, හිඳ සත්දිනක් උත්සාහ වඩා සත්වන දින සම්මා සම්බුදුබව අවබෝධ කළහ. එකල්හි ඉසිපතනයෙහි විසිදහසක් පැවිදි වූවෝ වෙති. කසසප බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලා අමතා දම්සක් දෙසූහ. සියල්ලෝම දෙසුම අවසන රහත් බව ලදහ. කසසප බුදුරදහු විසිදහසක් මහසඟ පිරිවරා ඉසිපතනයෙහිම වසති. කිකී නම් කාසි ජනපදයෙහි රජු සිවුපසයෙන් උවටැන් කරයි. දිනක්, බරණැස වැසි එක් මිනිසෙක්, පව්වෙහි සඳුන්හර ආදිය සොයමින්, තිස්ස තවුසාගේ අසපුවට පැමිණ, වැඳ එකත්පස්ව සිටියේය. තවුසා ඔහු දැක, 'කොහි සිට පැමිණියෙහි දැ'යි විමසීය. 'හිමියනි, බරණැස සිටය.' 'එහි තොරතුරු කෙසේදැ'යි (තවුසා ඇසීය) 'හිමියනි, කසසප නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ එහි උපන්හ'යි කීය. තවුසා (බුදධ නම් වූ) දුලබ වදන අසා සතුටට පත්ව, 'කිම, එතුමන් ආගමන්ධය අනුභව කරත්ද, නැද්දැ'යි විචාළේය. 'හිමියනි, ආමගන්ධය නම් කුමක්ද?' 'ඇවැත්නි, මස් මාලුය', 'ඒ බුදුරජාණන් වහන්සේ මස්, මාළු වළඳති'යි (මිනිසා කීවේය.) ඒ ඇසූ තවුසා විපිළිසරව, 'එහි ගොස් විමසමි'යි සිතීය. 'ආමගන්ධය වළඳමි'යි කීවොත්, එය ඔබවහන්සේටද, ජාතියටද, කුලයට ද පරම්පරාවට ද නුසුදුසු වේ යැයි කියා, එයින් වළක්වාගෙන, උන්වහන්සේ ළඟ පැවිදිව, සසරින් මිදෙන්නෙමි'යි (තවුස් පිරිකර වැනි) සැහැල්ලු දෑ රැගෙන එක් රැයකින්ම බරණැස ඉසිපතනයට පිවිසියේය. භාග්‍යවතුන් වහන්සේද ඒ වේලාවෙහි දහම් දෙසනු පිණිස අසුනෙහි වැඩසිටියහ. තවුසා එහි පැමිණ, නොවැඳම-නිහඬවී එකත්පස්ව සිටියේය. බුදුහු ඔහු දැක පෙර කී පරිදි පිළිසඳර කතා කළහ. තවුසාද 'පින්වත් කසසය, සැප දුක් කෙසේද?' ආදී ලෙසින් කතාකොට, 'පින්වත් කසසප, ඔබ ආමගන්ධය අනුභව කරහිද? නොකරහිදැ'යි ඇසුවේය. 'බමුණ, මම ආගමන්ධය අනුභව නොකරමි'යි කීහ. 'කසසප ඉතා යහපත්ය, ඉතා යහපත්ය, අනුන්ගේ මළකුණු නොකෑමෙන් ඔබතුමන් යහපත් දෙයක්ම කළෙහිය, පින්වත් කසසප, එය

ජාතියටද, කුලයටද පරම්පරාවට ද සාධාරණ වූවකි.' තවුසා පැවසීය. එහිදී කසුප් බුදුරජාණන් වහන්සේ 'මම කෙලෙස් යන තේරුමෙන් ආමගන්ධය අනුභව නොකරමි'යි කියමි, මේ බමුණා එයින් මස්මාළු අදහස් කරයි, මම හෙට ගමෙහි පිඬු නොහැසිර, කිකී රජුගේ මැදුරින් ගෙනෙන ලද පිණ්ඩපාත ආහාරය අනුභව කරන්නෙම් නම් මැනවි, මෙසේ ආමගන්ධය පිළිබඳව කතාබහ ඇතිවන්නේය, එහිදී බමුණාට දහම් දෙසීමෙන් කරුණු පහදා දීමට හැකිවන්නෙමි'යි පසුදින කලින්ම සිරුර කිස නිමවා සුවඳකිළියට පිවිසියහ. සංඝයා වහන්සේලා සුවඳකිළියෙහි දොර වසා ඇති බව දැක, භාග්‍යවතුන් වහන්සේ, අද බික්සඟණ සමග නොපිවිසෙනු කැමති සේකැ'යි දැන, සුවඳකිළිය පැදකුණුකොට පිඬු පිණිස ගියහ. භාග්‍යවතුන් වහන්සේද සුවඳකිළියෙන් නික්ම පනවන ලද අස්නෙහි වැඩහුන්හ. තවුසාද පත්තසාක (පලාකොළ) පිස (මලවා) කා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි හුන්නේය. කාසි ජනපදයෙහි කිකී රජුද පිඬු පිණිස හැසිරෙන සඟපිරිස දැක, 'හිමියනි, භාග්‍යවතුන් වහන්සේ කොහිදැ'යි විචාරා, 'මහරජතුමනි, විහාරයේ වැඩසිටිති'යි අසා, නොයෙක් එළවළු හා නොයෙක් රසින් මස් යොදා පිළියෙල කරන ලද බොජුන් උන්වහන්සේට යැවීය. ඇමතිවරු විහාරයට ගෙනගොස්, බුදුහිමියන්ට දන්වා, පැන් පිළිගන්වා, වළඳනු පිණිස මුලින්ම නොයෙක් මසින් පිළියෙල කරන ලද කැඳ දුන්හ. තවුසා ඒ දැක, 'වළඳයිද, නොවළඳීදැ'යි සිතමින් සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහු දකිද්දීම කැඳ පානය කරමින්ම මස් කැබල්ලක් මුවෙහි තබාගත්හ. තවුසා ඒ දැක කෝප විය. නැවත කැඳ පානය කළ බුදුරජාණන් වහන්සේට නා නා රසැති බොජුන් පිරිනැමූහ. එය පිළිගෙන වළඳනු දැකීමෙන් 'මස්මාළු කමින්ම නොකමි'යි කියතැයි තදින්ම කෝපයට පත්විය. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ වළඳා අවසන අත්පා සේදීමෙන් පසු, තවුසා එහි ගොස්, 'පින්වත් කසසප, ඔබ බොරු කියහි, එය පණ්ඩිතයන්ගේ කටයුත්තක් නොවේ. බොරුකීම බුදුවරුන් ගරහන ලද්දකි. උස්බිම් පාමුල වසන ඒ ඉසිවරුන් වනමුල්පල ආදියෙන් යැපෙමින්, බොරු නොකියන බවද කියා, නැවත ඉසිවරුන්ගේ ගුණ අගයමින් **සාමාකචිංගුලකචීනකානි** යන ගාථා කීය.

එහි **සාමකා** යනු පොතු ඉවත්කර හෝ, (පැළැටියෙහි) කරටියෙන් කපා, ලබාගත යුතු තණකොළ පවුලට අයත් ඇට ජාතිය. **චිංගුලක** කතේරු මල් පොකුරු හා සමාන, **චීනකානි** කැලෑ උස්බිම් බැවුම්වල හැදී වැඩෙන හීන් මුං, **පත්තපලං** කොළ පැහැයෙන් යුතු පලාකොල

ජාති, **මූලඵලං** ගස්වැල්වල හටගන්නා ගෙඩි, මූල යනුවෙන් මුලෙහි අල හටගෙන ඇති, ඵල ගස්වල හටගන්නා ගෙඩි, ගව්පඵල යැයි දියෙහි හටගන්නා ඕලු නෙළුම් ආදී ඇට ආදිය දතයුතුය. **ධම්මෙන ලද්ධං** පණිවුඩකරුවන් යැවීම, (යම් යම් වාසි ලැබීමේ අදහසින්) ආපසු ගෙන්වා ගැනීම වැනි වැරදි දිවිපැවැත්ම හැර, කැලයෙහි හැසිර හෝ, පිඬු පිණිස හැසිරීමෙන් **ලැබුණු, සතං** සත්හුන්, යහපත් උතුමන්, **අසමානා** අනුභව **කරමින්, න කාමකාමා අලිකං භණන්ති** මෙසේ, 'මගේය' යන හැඟීමෙන් තොරව, උවදුරු නැතිව, ඒ බඩහමු ආදිය අනුභව කරන ඉසිවරුන්, ඔබ මනා රසවත් ආහාරයට කැමතිව, ඒ දේ පතමින්, ආමගන්ධ හෙවත් මස්මාළු අනුභව කරමින්, 'බමුණ, මම ආමගන්ධය අනුභව නොකරමි'යි බොරු කියයි. එසේ අකමැත්තෙන් බොරු නොකියත් ද - කැමති දේ පතමින් බොරු නොකියතැයිද ඉසිවරුන්ට පසසනු පිණිස භාග්‍යවතුන් වහන්සේට නින්දා පමුණුවයි.

මෙසේ ඉසිවරුන්ට පැසසුම් කරමින්, භාග්‍යවතුන් වහන්සේට ගරහා, තමන් අදහස් කරන පරිදි නින්දාවට හේතුවන ආකාරය දක්වා, වෙනස් කළ නොහැකියැයි (තවත්) නින්දා පැමිණවීමට **යදස්නමානො** යන ගාථාව කීය. එහි 'ද' කාරය පද එක්කිරීමෙහි යොදා ඇත. මේ එහි තේරුමයි. කැටකිරිලි මස් හෝ වටුකුරුළු මස් හෝ කිසියම් මසක් සේදීම, කැපීම වැනි මුලදී කරන කටයුතු **සුකතං**, පිසීම, තුනපහ ආදී රසකාරක යෙදීම වැනි පසුව කරන කටයුතු **සුනිට්ඨිතං**, මව, පියා ලෙස සළකා නොව, එහෙත් 'මේ තැනැත්තාට දීමට සුදුසු යැයි සිතන දැහැමි පුද්ගලයන් **විසින් පරෙහි දින්නං,** ගරු සත්කාර කරන **පයතං** රසවත් වූ, එමෙන්ම ඉතාම රසවත් බවින්, රසනහර පිනවන ඕජෝ ගුණැති, සවිබල ගෙනදීමටද සමත් බැවින්ද **පණීතං අස්නමානො** ආහාරයට ගනිමින්, හුදෙක් යම් මස් ජාතියක් පමණක්ම නොවේ. කළුපැහැ (ඇට) නොමැති, හැල්සහලින් පිසන ලද බත, **සාලීනමන්නං** ආහාරයට ගනිමින් **පරිභුඤ්ජමානො සො භුඤ්ජසි කස්සප ආමගන්ධං** ඒ ඔබතුමා කිසියම් මස් ජාතියක් අනුභව කරමින්, මෙම හැල්සහල් බත්ද ආහාරයට ගනිමින්, **භුඤ්ජසි කස්සප ආමගන්ධං** යැයි භාග්‍යවතුන් වහන්සේට පරම්පරා නාමයෙන් අමතයි.

මෙසේ ආහාරයෙන් භාග්‍යවතුන් වහන්සේට නින්දා කොට, දැන් බොරු කියන බවටද නින්දා කරමින්, **න ආමගන්ධො - සුසංඛතෙහි** ආදී ගාථාව කීය. එහි අදහස නම්, **න ආමගන්ධො මම කප්පතීති** ඉවෙවව ඔබ

(මෙසේ) කියහි, එක්වරටම තහවුරුකොට ඔබ කියහි, **බ්‍රහම බන්ධු** බමුණු ගුණ නොමැති, ජාතිය පමණක් උසස් සේ සළකන බමුණකැයි අපහාසයෙන් කියයි. **සාලීනමන්නං** හැල් සහලින් පිසූ බත්, **පරිභුඤ්ජමානො** අනුභව කරමින්, **සකුන්ත මංසෙහි සුසංඛතෙහි** ඒ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට ගෙනෙන ලද කුරුළු මසක් පෙන්වමින් කියයි. මෙසේ කියමින්ද භාග්‍යවතුන් වහන්සේගේ යටිපත්ලේ පටන් හිසකෙස් අග තෙක් සිරුර පිරික්සමින්, දෙතිස් පුරිස් ලකුණින් හා අනුලකුණු අසූවකින්ද යුතු, බඹයක් පමණ වටකොට විහිදෙන රැස්මාලාවත් දැක, මෙබඳු මහපුරිස් ලකුණු ඇත්තෙකු බොරු කීමට සුදුසු නොවේ. මේ තැනැත්තාගේ දෙබැම අතරෙහි සුදුපැහැ මුදුමොළොක් පුළුන් වන් සිහින් උණුරෝමයද, එක් එක් රෝම කූපයක එක් එක් රෝමය බැගින්ද හටගත්තේ පෙර සසරේදී ඇත්ත කතාකිරීමේ යහපත් විපාක බලයෙනි. මෙබඳු තැනැත්තෙකු දැන් කෙසේ බොරු කියන්නේද? මොහු 'ආමගන්ධ' යැයි පවසනුයේ ඒකාන්තයෙන් වෙනත් දෙයකටය. 'බමුණ, මම ආමගන්ධය' අනුභව නොකරමි'යි මෙසේ යම් දෙයක් සඳහා කීවේද, එය විමසන්නෙම් මැනවැයි සිතා, ගරු බුහුමනින් යුතුව, පරම්පරා නමින්ම අමතමින් **පුච්ඡාමි තං කස්සප එතමත්ථං කථම්පකාරො තව ආමගන්ධො** යැයි (ඉහත දැක්වූ ගාථාවේ) ඉතිරි කොටස කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආමගන්ධය පැහැදිලි කිරීමට **පාණාතිපාතො** ආදී ගාථා වදාළහ. **පාණාතිපාතො** පණ ඇති කෙනෙකුට වදහිංසා කිරීමයි. **වධච්ඡෙද බන්ධනං** එසේ පණ සහිත වූ සත්වගට දඬු ආදියෙන් පහර දී වද දීමයි. අත්පාදිය කැපීමයි. රැහැන් ආදියෙන් බැඳීම බන්ධන නම් වේ. **ථෙය්‍යා මුසාවාදො** සොරකම හා බොරු කීමද **නිකති** දෙන්නෙමි, කරන්නෙමි ආදී ලෙසින් (කියා) ආසාව උපදවා බලාපොරොත්තු නිසැකව ඇතිකිරීමෙන්, **වඤ්චනානි** රත්රන් නොවූ දේ රත්රන් බවට කරුණු දැක්වීම, **අජ්ඣෙන කුජ්ජං** වැඩකට නැති, අයහපතට හේතුවන දේවල් ඉගෙනීම, **පරදාරසෙවනා** අනුන්ගේ අඹුවන් හා වරදෙහි බැඳීම, **එසාමගන්ධො න හි මංසභොජනං** එම පරපණ නැසීම අකුසල ලෙස ගැනෙන ආමගන්ධ හෙවත් මස්මාළු ලෙස පිළිගඳ ඇත. කුණුගඳ ඇත. ඊට හේතුව කුමක්ද? සිත් ඇළුම් නොකරන බැවින්ද, කෙලෙස් නම් වූ අපිරිසිදුතාව මුසු වූ බැවින්ද, යහගුණදම් ඇත්තවුන් (ආදීනව දැන) පිළිකුල් කරන ලද බැවින්ද, ඉතා දුගඳ පතුරුවන බැවින්ද වෙයි. කෙලෙස් දුරුකළ උතුමන්ගේ සිරුරද දුගඳ නොවේ. එහෙයින් එය ආමගන්ධයයි.

මස් ආහරය නම්, නොදුටු, නොඇසූ, සැක කළ නොහැකි නම් නිවරදය. එහෙයින් මස් ආහාරය ආමගන්ධය නොවේ.

මෙසේ දහම් කරුණු ඇතුළත් දේසනා මගින්, එක් ආකාරයකට ආමගන්ධය විසඳ, මීළඟට යම් ලෙසකින් ඒ ඒ පුද්ගලයන් ඒ ඒ ආමගන්ධවලින් හෙවත් කෙලෙස්වලින් පිරී ඇති බැවින්, එක් පුද්ගලයෙක් අන් සියල්ලන් මෙන් නොවේ. සියල්ලෝම එක් ආකාරද නොවෙති. එහෙයින්, ඒ ඒ කෙලෙස් පිළිබඳව පවසන්නට යෙ ඉධ කාමෙසු අසඤ්ඤතා ජනා ආදී ලෙසින් පුද්ගලයකුට යොමු කෙරෙමින්, ආමගන්ධය ගාථා දෙකකින් පැහැදිලි කළහ. යෙ ඉධ කාමෙසු අසංයතා ජනා මේ ලෝකයෙහි කාමසේවනයයි කියනු ලබන කාමයන් පිළිබඳව මව, සුළුමව කෙරෙහි වුවත් සීමා නොකොට, හික්මීම බිඳගනිමින්, අවිනීත වූ, අනුවණව හැසිරෙන කෙලෙස් පිරි මිනිසුන්, රසෙසු ගිද්ධා දිවට දැනෙන, රසයෙන් කෑදරව, එහි ගැලී, තදින් ඇලී, එයට වැරදි ලෙස යොමුවීමෙන් ඇතිවන හානි නොදකිමින්, අනුවණව රසයම විඳිති. අසුචීක මිසසිතා ඒ රසයෙහි කෑදරව, ඒ රසය යළි යළිත් ලබනු පිණිස නොයෙක් වැරදි දිවිපැවැත්මෙන් අපිරිසිදු බවට පත් නත්ථික දිට්ඨී 'දෙන ලද දෙයෙහි විපාක නැත' ආදී ලෙසින් දසආකාර වූ මිසදිටු බවින් යුතු, විසමා කය, වචන ආදිය අයහපත්ව යොදවන, දුරනනයා වැරදි ලෙසට වටහාගත් දැකීම් තුළින් (අදහස්) දැඩිව පිළිගනිමින්, අත්නොහැර සිටින, එසාමගන්ධො ඒ ගාථාවෙන් පුද්ගලයකු තුළ පහළවන, කැමතිවන, ගිජුවන දේ කෙරෙහි හැඟීම් හා රසයට ලොල්වීමෙන් විපතට පත්වන ජීවිත පැවැත්මත්, කරන දෙයෙහි විපාක නැතැයි සිතීම, (කම්පල නොඇදහීම) දුරදක්නා වූ අවබෝධයෙන් තොරව දුසිරිතෙහි යෙදීම ආදී පෙර කී පරිදි සයආකාර වූ 'ආමගන්ධය' තේරුම් දතයුතුය. න හි මංස භොජනං මස් ආහාර යනු මේ කියන ලද ආමගන්ධ යන අදහසින් නොවේ.

දෙවන ගාථාවෙහි යෙ ලූඛසා රළු, සැනසීමක් නැති, දුක් ගෙන දෙන, වෙහෙසට පත්කරන යම් පිළිවෙතක්, දාරුණ නපුරු, අකීකරු බවින් යුතු, පිට්ඨිමංසිකා ඉදිරියෙහි මිහිරි දේ කියා, අනුන් හමුවේදී නුගුණ, වැරදි කියන්නා වූ - මොවුහු අනික් තැනැත්තා දෙස එකඑල්ලේ බැලීමට හෝ, අනුන් ඉදිරියේ නුගුණ කියමින් 'පිටෙහි මස් කන්නෝ' වෙති. එහෙයින් පිට්ඨිමංසිකා යැයි කියනු ලැබේ. මිත්තද්දුනො මිතුරන්ට සතුරුකම් කරන, මිතුරන් සමග බොහෝ හිතවත්ව, ඔවුන්ගේ යහපත්

දිවියෙහි අඹුදරුවන්, වත්පොසොහත්කම් පිළිබඳව දොස් කියමින් වැරදි ලෙස කටයුතු කරතියි කියනු ලබයි. **නික්කරුණ** කරුණා සහගත නොවන බැවින් හැමදෙනාටම අයහපත කැමති. **අතිමානිනො** 'මේ ලොව ඇතමෙක් උපතින් හෝ....... වෙනත් වෙනත් දේවලින් අනුන් පහත්කොට සිතයි. මෙබඳු යම් මැනීමක් සිතෙහි කොඩියක් නංවා ඇති සේය.' 'ඉධෙකච්චො ජාතියා වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරේන වත්ථුනා පරෙ අතිමඤ්ඤති, යො එවරූපො මානො කෙතුකම්‍යතා චිත්තස්ස', මේ කියන ලද පරිදි, දැඩි මානයෙන් යුතුව, **අදානසීලා** නොදෙනසුළු ගති සොබාවෙන්ම, දීමෙහි කිසිදු අදහසක් නොමැතිව, තමාට අයිති කිසිම දෙයක් බෙදාහදා ගැනීමට අකමැති යන තේරුමයි. **න ච දෙනති කස්සචි** දෙන ලෙස ඉල්ලීමක් කළද, ඒ නොදෙන ගතිය නිසාම කිසිම කෙනෙකුට කිසිම දෙයක් නොදෙති. අදින්න පුබ්බක බමුණාගේ පරම්පරාවට අයත් මිනිස්සු මරණින් මතු නිජ්ඣාම තණ්හික හෙවත් නොසංසිඳෙන පිපාසයෙන් යුතු පේත දිවිය පිහිටකොට ගනිති. ඇතැම්හු **ආදානසීලා** යනුවෙන්ද කියති. එයින් කැමති වචනයක් යොදාගත හැකියි. **කස්සචි** කිසිවක් **නදෙනති එසමාගන්ධො න හි මංසභොජනං** මේ ගාථාවෙන්, රළු නපුරු, අනුන්ගේ නුගුණ කියන, මිතුරන් බේද කරන, අකාරුණික, බොහෝ සේ අනුන් පහත්කරන, කිසිවක් නොදෙනසුළු, පුද්ගලයකු යොමුවන, පෙර කියන ලද පරිදි අටආකාර වූ අරුතින් කෙලෙස් දතයුතුය. ආමගන්ධය නම් මස් ආහාරය නොවේ.

මෙසේ පුද්ගලයකු යොමුවන පරිදි ගාථා දෙකක් කියා, නැවත ඒ තවුසාගේ සිතෙහි කෙලෙස් මතුවන අයුරු දැන, ඒ ගතිසොබාවට අනුකූල වන පරිදි එක් ගාථාවක් වදාළහ. එම ගාථාවේ සඳහන් **කොධො** පිළිබඳව (මෙහි) උරග සූත්‍රයෙහි සඳහන් අයුරින් දතයුතුය. **මදො** උපතින් තමා උසස්යැයි ඇතිවන හැඟීම, පරම්පරාවෙන් උසස්ය යන හැඟීම, නිරෝගී යැයි ඇතිවන හැඟීම ආදිය මැනීම් ලෙසින් විභංගයෙහි දක්වා ඇති පරිදි සිත මත්කරවන බවයි. **ථම්භො** තද බවයි. **පච්චුට්ඨපනා** දහම් කරුණු අනුව දැක්වෙන පරිදි විරුද්ධව නැගී සිටින, පසමිතුරු බවට පත්ව, **මායා** මෙලොව ඇතැමෙක් කයින් දුසිරිතෙහි යෙදී, 'ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා'.......ආදී ලෙසින්, විභංගයෙහි විස්තර වූ පරිදි අයහපත් කටයුතු කොට සඟවන බවයි. **උසූයා** අනුන් ලබන ගරු සැලකිලි ආදිය නොරිසි ගතියයි. **භස්ස සමුස්සයො** පුරසාරම් දෙඩීම තමන් උසස්කොට දැක්වීමට කියන ලදී. **මානාතිමානො** 'මෙලොව ඇතැම් කෙනෙක්

ඉපදීමෙන් හෝ.........වෙනත් වෙනත් දේවලින්, පෙර අනුන් හා සමාන වීයැයි තමන් ගැන සිතයි. පසුකාලයෙහි තමන් හා සමානව සිතයි. පසුව අනුන් පහත් යැයි සිතයි. මෙබඳු මැනීම සිතෙහි කෙඩි නංවා ඇති සේ යැයි විභංගයෙහි විස්තර කරන ලදී. 'ඉධෙකච්චො ජාතියා වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පුබ්බකාලෙ පරෙහි සදිසං අත්තානං දහති, අපරකාලෙ අත්තානං සෙය්‍යං දහති, පරෙ හීනෙ දහති, යො එවරූපො මානො -පෙ- කෙතුකම්‍යතා චිත්තස්ස', අසබ්භි සන්ථවො දුදනන් හා ඇසුරයි. එසාමගන්ධො න හි මංසභොජනං මේ අයුරින් තරහව ආදී අයහපත් කරුණු නවයක් පෙර කියන ලද අරුතින් ආමගන්ධ යැයි දතයුතුය. මස් ආහාරය ලෙසට නොවේ.

මෙසේ ගතිසොබා අනුව ආමගන්ධ යැයි කරුණු නවයක් දක්වා, නැවතද පෙර කී පරිදි එය පුද්ගලයා හා යොමුවන පරිදි දේසනයෙන් ආමගන්ධය පැහැදිලි කරමින්, ගාථා තුනක් වදාළහ. එහි **පාපසීලා** යම් තැනැත්තෙකු අයහපත් හැසිරීමෙන් යුතුනම්, පව්කාරයෙකැයි සමාජයේ පතළ වෙයි. **ඉණඝාතසූචකා** වසල සූත්‍රයෙහි කී පරිදි ණය ලබාගෙන, ආපසු නොගෙවීමෙන්, ණයකරුවෙකුව, කේලාම් ද කියති. **වොහාරකූටා ඉධ පාටිරූපකා** සාධාරණව නඩු තීරණය කරනු ලබතැයි සිතුවත් අල්ලස් ගෙන හිමිකරු (නිවරදකරු) පරාජය වන සේ, කපටිව කටයුතු කිරීමෙන්, සාධාරණය මින් පෙනීසිටින අනුරුවක් මෙන්, නැතහොත් ඉධා සසුනෙහි, **පාටිරූපිකා** දුසිල් වූවෝ, යම්ලෙසකින් ඉරියව් පැවතුම් ආදියෙහි සිල්වත් ලෙස පෙන්වත්ද එහෙයින් පටිරූපා - පිළිරූ වෙති. (සිල්වතුන් ලෙස පෙනී සිටින දුසිලන්ය.) පාටිරූපිකා වචනයද එම අදහසමය. **නරාධමා යෙධ කරොන්ති කිබ්බිසං** යම් තැනැත්තෙක් මෙලොවෙහි මිනිස්කමට නිගාවන පරිදි මව්පියන්, බුදු-පසේබුදුවරු ආදීන් කෙරෙහි වැරදි සේ පිළිපැද දරුණු, නපුරු දේ කරති. **එසාමගන්ධො න හි මංසභොජනං** මේ ගාථාවෙන්, පුද්ගලයා යොමුකොට පෙන්වාදුන් පරිදි, පව්කම්හි ලොල් වූ, ණය ආපසු නොගෙවන, කේලාම් කියන, කපටි ලෙස තීරණය කරන, නැති ගුණදම් පෙන්වන, දරුණු කටයුතුවල නියැලීම ඉහත කියන ලද අයුරු ආමගන්ධ කරුණු හයක් යැයි දතයුතුය. මස් ආහාරය ආමගන්ධය නොවේ.

**යෙ ඉධ පාණෙසු අසංයතා ජනා** මිනිස්සු මේ ලෝකයෙහි ජීවී සත්වග කෙරෙහි කිසිදු දයාවක් නොමැතිව, කැමති කැමති පරිදි සියදහස්

ගණනින් මරා නොහික්මුණු බව දක්වති. **පරෙසමාදාය විහෙසමුයුත්තා** අනුන්ට අයත් ධනය ගැනීමේදී හෝ ජීවිතයට හිරිහැර කරනවිට හෝ 'එසේ නොකරනු මැනවැ'යි ඉල්ලනවිට හෝ වළක්වන විට හෝ අතින්, කැටකැබලිති පොලු ආදියෙන් වධහිංසා කිරීමෙහි නියැලුනෝ, **පරෙ** සතුන් කෙරෙහි (අනුන් කෙරෙහි) **සමාදාය** අද දහයක්, අද විස්සක් ලබාගන්නේ යැයි (අනුන් සතු ධනය කහවණු හෝ වස්තුව ලබාගැනීමට) ඔවුන් වදහිංසා බැඳීම්වලින් වෙහෙසට පත් කරන, **දුසසීලලුද්දා** සිල්වත් බවක් නැතිව, දුසිරිතෙහි ලොල්ව, නපුරු, දරුණු කටයුතුවල යෙදෙමින් අත්වල ලේ තවරාගෙන, මසුන්, සතුන්, කුරුල්ලන් ආදීන් නැසීම මෙහිලා අදහස් වේ. එරුසා නපුරු වචනයි. අනාදරා දැන් නොකරන්නෙමු, වළකාලන්නෙමු. මෙබඳු දයාවක් නොමැති බව දැක්වීමෙන්, **එසාමගනෙධා න හි මංසභොජනං** මේ ගාථාවෙන් පුද්ගලයා අරමුණුකොට පෙන්වා දුන් පරිදි, පරපණ නැසීමෙන්, හිංසාවෙන් හා තුවාල සිදුකිරීමෙන්, බැඳ තැබීමෙන්, පෙර කියන ලද අයුරු ජීවීන් කෙරෙහි හික්මීමක් නැතිව, අනුන්ට හිරිහැර කරමින්, දුසිල්බවෙන්, නපුරුකමෙන්, නපුරු වචනයෙන් හා ආදරයක් නොමැතිවීම යන සයආකාර ආමගන්ධය දතයුතුය. මස් ආහාරය නොවේ. පෙර කියන ලද නමුත්, අසනු කැමති වූවන්ට ඇසීමටත්, වෙන් වෙන්ව පැහැදිලි කිරීම පිණිසත්, තවදුරටත් තහවුරුවනු පිණිසත්, මේ කරුණු නැවත කියනු ලැබේ. වේදයෙහි පරතෙරට පත් ඒ බමුණාට මෙසේ මෙම කරුණු භාග්‍යවතුන් වහන්සේ නැවත නැවතත් කියතැයි වෙනත් කෙනෙකුට අදහසක් එයින් ඇතිවිය හැකි බැවිනි.

**එතෙසුගිද්ධා විරුද්ධාතිපාතිනො** මේ පණ ඇත්තවුන් කෙරෙහි තද ඇලීමෙන් ගිජුව, තරහින් සතුරු වී, පලවිපාක නොදැක මුළා වී (රාග-දෝස-මෝහයෙන්) නැවත නැවත වරදෙහි යෙදෙමින්, අනුන් නැසීමට කටයුතු කරන, පරපණ නැසීමෙන්, හිංසාවෙන්, තුවාල සිදු කිරීමෙන්, බැඳ තැබීමෙන් ආදී මෙබඳු අයහපත් දේ පිළිබඳ කියනවිට, ඒවා ඇතිවීමට හේතුවන රාග-දෝස-මෝහයෙන්, ඒවාට ගිජුව, තරහින් අනෙක් තැනැත්තකු වැනසීමට කටයුතු කරන, **නිච්චුය්‍යුතා** කිසිවිටකත් සිදුවන අයහපත ගැන නුවණින් සළකන්නේ නැතිව, නිතර අයහපත් දෙයෙහිම යෙදෙන, **පෙච්චා** මෙලොවින් පරලොව ගොස්, **තමං වජනති යෙ පතනති සත්තා නිරයං අවංසිරා** එබඳු තැනැත්තෝ ලෝකාන්ධකාර යැයි කියනු ලබන නිරයට හෝ පහත්යැයි සම්මත කුලයක හෝ ඉපිද අඳුරට යති. අවීචිය ආදීකොට ඇති නිරයට යටිකුරු වූ හිසින් (ඔළුව

පහළට) වැටෙති. **ඵසාමගන්‍ධො** අඳුරට යන - නිරයට වැටෙන ඒ තැනැත්තන්ට, එහි (උපතට) හේතුවන, අයහපතට ගිජුවීම, සතුරුබව හා නැසීම වූ සියළු ආමගන්‍ධයට මූලික වන අයුරු ඉහත දක්වා ඇති පරිදි තුන් ආකාර වේ. **නහි මංසභොජනං** මස් ආහාරය ආමගන්‍ධ නොවේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, නිවැරදි, උසස් අදහස් ලෙසට (දහම්නය පරිදි) ආමගන්‍ධය පහදා, දුගති මගද පහදා, යම් මස් මාළු ආහාරයක් ඒ තාපසයා අයහපත මග යැයිද, ඒවා නොකෑමෙන් පිරිසිදු වේ යැයි සිතා අනුභව නොකරන්නේ නම්, ඔහුටත්, ඔහු වැනි වෙනත් තැනැත්තන්ටත්, එයින් පිරිසිදු බවක් නොවන බව දක්වමින්, **න මච්ඡමංසං** යන මේ පේළි හයකින් යුතු ගාථාව කීහ. එහි සියළුම පද අවසන් පේළියට ගැළපිය යුතුය. සැකය දුරු නොකළේ නම්, මස්මාළු කෑමෙන් පිරිසිදු නොවේ. සැකය දුරු නොකළේ නම් පූජා, යාග ආදියෙන්ද පිරිසිදු නොවේ. මෙසේ මෙහිලා **න මච්ඡමංසං** මස්මාළු නොකෑවත් පිරිසිදු වන්නේ නැත. **අනාසකත්තං** මේ මස්මාළු නොකෑමෙන් පමණක්ම මිනිස්සු පිරිසිදු නොවෙතියි පැරණි වියත්හු (පොරාණ) දක්වති. එය වඩාත් සුදුසුය. එහෙත් මස්මාළු අනුභව නොකිරීම වෙනත් කරුණක්ද වේ. ඒ තවුස්දම් රැකීමෙන් බාහිර මිනිසුන් (ඔවුන් කෙරෙහි) රඳවාගන්නා ලද බැවිනි. මේ ලෝකයෙහි සිරුර තවනු ලබන - පීඩාවට පත්කරන තපස්කම් ඇතැයි සඳහන් වූ අයුරින්, කියන ලද ඉතිරි සියළු කරුණු සිරුරට දැඩිව දුක්දීමෙහිලා ගැනේ. **නග්ගියං** ඇඳුම් නොහඳිනා බව, **මුණ්ඩියං** (හිස) මුඩුකිරීම, **ජටාජල්ලං** හිසෙහි ජටාව හෝ හැඩපළු ගෙතුණ කෙස්, දූවිලි-කුණු බැඳී ඇති, **ඛරාජිනානි** කුර සහිත වූ අඳුන් දිවියන්ගේ සම්, **න අග්ගිහුත්තස්සුපසෙවනා** ගිනිපිදීමෙහි යෙදෙන, අමරා පවත්නා වූ සිරුරු කෙලෙසින් දෙව් බව පතනු පිණිස බහු බිම ඇන තබා හිඳීම හෙවත් උක්කුටික ආදී නොයෙක් ආකාර වූ තවුස් වත්, **තපා** (එවැනි තවුස් වතවලින්) සිරුර තැවීම. **මන්තා** වේද (ගීතිකා) **ආහුති** ගිනිපිදීමේ පූජා යාගය. **යඤ්ඤමුතූපසෙවනා** අසුන් මරා කරන යාගයද උතුපසෙවනයද, උණුසුම් කාලයෙහි තද අව්වේ සිටීම, වැහිකාලයෙහි ගස්යට සිටීම, සීත කාලයෙහි ජලයෙහි සිටීම උතුපසෙවනයයි. **න සොධෙන්ති මච්චං අවිතිණ්ණකංඛං** සැකය දුරුනොකළ තැනැත්තාට කෙලෙස් පිරිසිදුවීමක් හෝ උපතෙහි පිරිසිදු බවක් හෝ නැත. සැකයෙන් අපිරිසිදු වීමෙන් මනා පිරිසිදුබවක් නොවේ. ඒ පිළිබඳවද සැකයම වේ. මෙහි දැක්වෙන **අවිතිණ්ණකංඛං** හා **න මච්ඡමංසං** ආදිය අසා 'මස්මාළු අනුභව නොකිරීමෙන් මනාව පිරිසිදුවීමට මඟ වේදැ'යි තවුසාට ඇතිවූ සැකය

නිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාරන ලදැයි අදහස් නොකළ යුතුය. උන්වහන්සේ මස්මාළු අනුභව කරතියි අසත්‍ය බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇතිවූ සැකය නිසා ඒ අනුව එසේ දේසනා කරන ලදැයි දතයුතුය.

මෙසේ මස්මාළු අනුභව නොකිරීමෙන් පිරිසිදු බව ලබාගැනීමට නොහැකි බව දක්වා, දැන් පිරිසිදු බව ලැබිය හැකි ආකාරයට දහම් දෙසමින්, **සොතෙසු ගුත්තො** යන මේ ගාථාව කීහ. **සොතෙසු** ඉඳුරන් සයෙහි **ගුත්තො** ඉඳුරන් සංවරව, රැකගැනීමෙන් යුතුව, මෙපමණකින් ඉඳුරන් හික්මවා ගැනීමට අවැසි සීලය දක්වයි. **විදිතින්ද්‍රියො චරෙ** ඉඳුරන් සයෙන් අරමුණු ලබන අයුරු නුවණින් දැන - කරන කියන දේ නොසඟවා කරන්නේය, වාසය කරන්නේ යැයි කියන ලදී. මෙපමණකින් පිරිසිදු සීලයට අයත් නාමරූප කොටස දක්වයි. **ධම්මෙ ඨිතො** අරිඅටැඟි මගින් අවබෝධ කළයුතු සිවුසස් දහමෙහි පිහිටියේ, මෙයින් සෝවාන්පලය දක්වයි. **අජ්ජවමද්දවෙ රතො** නොවෙනස්වන (කය සිත වචනයෙහි) ඇද නොවන බව හා මුදුබවෙහි ඇළුනේ, මෙයින් සකදාගාමි පලය දක්වයි. සකදාගාමී වීමෙන් කයෙන් කරන කටයුතු ආදියෙහි නොවක් බවද සිතෙහි තදබව නැතිබවද, රාග දෝස තුනීවන බවද අදහස් වේ. **සංගාතිගො** රාග දෝසයෙහි ඇලීම් දුරුකරන ලද, එයින් අනාගාමි පලය දක්වයි. **සබ්බදුක්ඛප්පහීණො** සසර සියළුම දුක්වලට හේතුව නැති කිරීමෙන් සියළුම දුක් නසන ලද, එයින් අරහත් බව දක්වයි. **න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො** මෙසේ අනුපිළිවෙලින් අරහත්බවට පැමිණියේ, ඊට උත්සාහවත් වූයෙන් ධීරො අසන, දකින දේවල් කෙරෙහි හැඟීම් නොගන්නා බැවින්, එය සිතෙහි රඳවා නොගන්නා බැවින් නොඇලේ. එපමණකුදු නොව, දක්නා ලද, අසන ලද, පහස ලබන කිසිදු දෙයක නොඇලෙයි. හුදෙක්ම උතුම් පිරිසිදු බවට පත්වූයේ යැයි අරහත් බව කුළුගන්වමින් දේසනය නිමවූහ.

මෙම ගාථාවෙන් පසුව ඇති **ඉච්චෙතමත්ථං** ආදී ගාථා දෙක සංගායනාවට සහභාගී වූ හිමිවරුන් කියන ලදී. එහි අරුත මෙසේය. **ඉති භගවා** කසුප් බුදුහු, **එතමත්ථං පුනප්පුනං** ඒ තවුසා නිසි තතු දැනගන්නා තෙක්, දහම මුල්කොටද, පුද්ගලයා මුල්කොටද නොයෙක් ගාථාවලින් **අක්ඛාසි** කීය. සවිස්තරව දැක්වීය. **තං වෙදයී මන්තපාරගූ** ඒ තිස්ස නම් බමුණාද වේදයෙහි කොටස් තුනෙහිම පරතෙරට පත් හෙයින්, මෙය

අවබෝධ කළේය. ඊට හේතු කවරේද? අරුතින්ද, දේසනයට යොදා ගත් වචනවලින්ද යුතු වූ හෙයිනි. **චිත්‍රාහි ගාථාහි මුනි පකාසයී** කෙබඳු අයුරින්ද? **නිරාමගන්‍ධො අසිතො දුරන්නයො** ආමගන්ධ යනුවෙන් හැඳින්වූ කෙලෙස් නොමැති බව **නිරාමගන්ධ** වේ. තණ්හා දිට්ඨි ඇසුරක් නොවන හෙයින් **අසිත** නම් වේ. මෙය උතුම්ය, මෙය උසස් යැයි බාහිර දැකීම් ලෙස දැඩිව ගත් හැඟීම් ලෙස ඉදිරියට ගෙන යා නොහැකිය. ඔහුට මෙසේ පවසන ලදින්, **සුත්වාන බුද්ධස්ස සුභාසිතං පදං** මනාව පවසන ලද දම් දෙසුම අසා, **නිරාමගන්ධං** කෙලෙස් එකතුනොවන, **සබ්බදුක්ඛ පනූදනං** සසර සියළු දුක් දුරුකරන, **නීචමනො** යටහත් සිත් ඇතිව, **වන්දි තථාගතස්ස** තිස්ස බමුණ පසඟ පිහිටුවා තථාගතයන් වහන්සේගේ පා වැන්දේය. **තත්ථෙව පබ්බජ්ජ මරොචයිත්ථ** එතැනදීම, ඒ ආසනයෙහි වැඩසිටි කසුප් බුදුරදුන්ට තිස්ස තවුසා තමාගේ පැවිදිවීම සැළකළේය. පැවිද්ද ඉල්ලූයේ යැයි කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ 'එව මහණ' යැයි ඔහුට ඇමතූහ. එකෙණෙහිම අටපිරිකර දරා අහසින් අවුත්, සියවස් සපිරි තෙරනමක මෙන් උන්වහන්සේට වැඳ කිහිප දිනකින්ම රහත් බව ලබා තිස්ස නම් අගසවු බවටද පත්විය. දෙවැන්නා භාරද්වාජ නම් විය. මෙසේ කසුප් බුදුරදුන්ට තිස්ස, භාරද්වාජ යැයි අගසවු දෙනම වූහ.

අපගේ භාග්‍යවතුන් වහන්සේ, තිස්ස බමුණා වෙනුවෙන් මුලදී යම් ගාථා තුනක් වදාළ සේක්ද, කසුප් බුදුරජාණන් වහන්සේ විසින් සූත්‍රය මැද දී යම් ගාථා නවයක් වදාළ සේක් ද, එදා සංගීතියට සහභාගී වූ තෙරුන් වහන්සේලා විසින් ගාථා දෙකක් සූත්‍ර අවසානයට සකස් කරන ලද ද, ඒ සියළුම ගාථා දහහතර මෙම සූත්‍රයට ඇතුළත් විය. මෙම ආමගන්ධ සූත්‍රය, ඒ ගුරුවරයා ඇතුළු තවුසන් පන්සියයකට, කෙලෙස් පිළිබඳ අරුත් දක්වමින් දේසනා කළ සේක. ඒ ඇසූ ආමගන්ධ බමුණා, යටහත් සිත් ඇතිව, බුදුරදුන්ගේ දෙපා නැමද පිරිසත් සමග තමන් පැවිදි කරන ලෙස ඉල්ලා සිටියේය. 'එව මහණ' යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. ඔවුහු එහිදීම පාසිවුරු දරා, පැවිදිව අහසින් අවුත් භාග්‍යවතුන් වහන්සේ වැන්දාහ. නොබෝ දිනකින්ම සියල්ලෝම උතුම් රහත් පලයෙහි පිහිටියහ.

**ආමගන්ධ සූත්‍ර විස්තරය නිමි.**

# 2.3

හිරිං තරන්තං යනු හිරි සූත්‍රයයි. එම සූත්‍රය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේගේ උපතට පෙර, සැවැත්නුවර අසූකෙළක් ධනය හා මහත් සම්පත් හිමි එක්තරා බමුණෙක් විය. ඔහුට පියමනාප වූ එක් පුතෙක්ද සිටියේය. බමුණ ඒ කුමරු දෙව් කුමරුකුට මෙන් නොයෙක් සැප සලසමින් මැනවින් හදාවඩා ගනිද්දී, ඒ සම්පත් ඔහුට පවරා නොදීම බමුණාද බැමිණියද මළහ. එවිට ඒ තරුණයාගේ මවුපියන් ඇවෑමෙන් පසු, භාණ්ඩාගාරික ධනසම්පත් ඇති ගබඩා කාමරය විවරකොට, 'හිමියනි, මේ ඔබගේ මවුපිය සතුදේය, මේ මීමුතුන්ගෙන් පැවරී ඇති දේය, මේ සත්කුල පරපුරෙන් පැවතෙන දේ'යැයි, සම්පත් පෙන්වාදෙමින් තරුණයාට පැවසීය. තරුණයාද, 'මෙහි ධන සම්පතම පෙනේ, මේවා රැස්කරනු ලැබුවෝ නොපෙනෙති. සියල්ලෝම මරු වසඟයට ගියහ. එසේ යද්දී මේ කිසිවක් රැගෙන නොගියහ. මෙබඳු සියළු සම්පත් හැරදමා පරලොව යා යුතුය. යහපත්ව ජීවත්වීම හැර, කිසිවක් ගෙනයාමට නොහැකිය, මම මේ ධනය තෑගි ලෙසින් බෙදා දී පරලොව ගෙන යා හැකි, යහපත්ව හැසිරීමෙන් ලබන 'ධනය' රැස්කර ගන්නෙම් නම් මැනවැ'යි සිතුවේය. ඔහු දවසින් දවස කහවණු සියදහසක් වැය කරමින් 'මේ ධනය බොහෝය, මෙතරම් සුළුවෙන් දීමෙන් කුමන පලක්ද? මහා දානයක් දෙන්නෙම්'නම් මැනවැයි නැවත සිතුවේය. 'රජතුමනි, මගේ නිවසෙහි මෙපමණ ධනය ඇත, එයින් මහා දානයක් දීමට කැමැත්තෙමි, ඒ බැව් නගරයෙහි දැනුම්දීමක් කරන්නේ නම් යහපතැ'යි ඔහු රජුට සැළකළේය. රජු එසේ කරවීය. ඔහු පැමිණි පැමිණි තැනැත්තන්ට බඳුන් පුරවා සත්දිනක්ම සියළු ධනය බෙදා දුන්නේය. 'මෙබඳු මහා තෑගි දී, ගිහිගෙයි විසීම නුසුදුසුය. පැවිදිවන්නේ නම් මැනවැ'යි නැවතද සිතුවේය. තම සේවක පිරිසට ඔහු මෙම කරුණ දැන්වීය. 'ඔව්හු, හිමියනි, ධනය අවසන් වීයැයි නොසිතනු මැනව, අපි ටික කලකින්ම, නොයෙක් ආකාරයෙන් ධනය රැස් කරන්නෙමු'යි කියා, නොයෙක් ලෙසින් පැවිදි නොවන සේ ඉල්ලා සිටියහ. ඔහු ඔවුන්ගේ ඉල්ලීම නොසළකා තවුස් පැවිද්දෙන් පැවිදි වූයේය.

සපුත්තභරියා, උඤ්ඡාචාරිකා, සම්පත්තකාලිකා, අනග්ගි පක්කිකා, අසාමුට්ඨිකා, දන්තලුයාකා, පවත්තඵලිකා, වණ්ටමුත්තිකා යනුවෙන්

තවුසන් තාපසා අටවැදෑරුම්ය. සපුත්තභරියා යනු අඹුදරුවන් සමග පැවිදිව, ගොවිතැන, වෙළඳම් ආදියෙන් ජීවිකාව කරන කෙණියජටිල වැනි තැනැත්තන්ය. නගර දොරටුවෙහි අසපුවක් කරවා, එහි කැත්, බමුණු කුමරුන් ආදීන්ට සිප්සතර උගන්වා, අමුරන් පිළිකෙව් කොට, තල, සහල් ආදී කැප දේවල් පිළිගන්නාහු උඤ්ඡාචාරිකා නම් වෙති. ඔවුහු මුලින් කී සපුත්තභරිය තවුසන්ට වඩා උසස් වෙති. සම්පත්තකාලිකා යනු ආහාර වේලාවේදී ලැබෙන අහරින් යැපෙන තවුසන්ය. ඔවුහු උඤ්ඡාචාරිකයන්ට වඩා උසස්ය. නොඉදුණු (අමු) වැටුණු ගෙඩි ආදිය ගින්නෙන් පලහා කා යැපෙන්නෝ අනග්ගිපක්කිකා නම් වෙති. ඔවුහු සම්පත්තකාලිකයන්ට වඩා උසස් වෙති. ගලක් (ගල් පතුරක්) අතමිට මොලවාගෙන, වෙනත් වෑයක් හෝ ආයුධයක් ගෙන, හැසිරෙමින්, කුසගිනි දැනුණ විටකදී හමුවන ගහකින් පොතු ලබාගෙන කමින් සමාදන් වූ පෙහෙවස් මෙනෙහිකොට, සිවුබඹ විහරණ වඩන්නෝ අසසමුට්ඨිකා නම් වෙති. ඔවුහු අනග්ගපක්කියනට වඩා උසස් වෙති. දන්තලුයාකා නමින් හැඳින්වෙන්නේ ගලක් හෝ අතමිට මොලවා නොගෙන, ඇවිදිනවිටදී කුසගිනි වූ විට හමුවන ගසකින් පොතු දත්වලින් උදුරා කා පෙහෙවස් සමාදානය මෙනෙහිකොට බඹවිහරණ වඩන්නන්ය. ඔවුහු අසසමුට්ඨිකයනට වඩා උසස් වෙති. පවත්තඵලිකා යනු සොබාවිකව හටගත් විලක් හෝ කැලෑවක් හෝ ඇසුරුකොට වාසය කරන්නාහ. ඒ විලෙහි නෙළුඹුදැලි ආදිය හෝ කැලෑවෙහි මල් හටගන්නා කල මල්ද, ගෙඩි හටගන්නා කල ගෙඩිද කති. මල්පල නැතිවිට යටත් පිරිසෙයින් එහි ගස්වල පොතු හෝ කා වසති. ආහාර පිණිස වෙනතකට නොයති. සමාදන් වූ කරුණුද, බඹවිහරණ වැඩීමද කරති. ඔවුහු දන්තලුයාකා වූවන්ට වඩා උසස් වෙති. වණ්ටමුත්තිකා නම් නටුවෙන් මිදී බිම වැටුණු වැටුණු කොළ ආදියම කති. අනෙක් කරුණු ඉහත කී පරිදිය. ඔවුහු සියල්ලන්ටම වඩා උසස් වෙති. 'මේ බමුණු කුලපුත්‍ර තවුස් පැවිද්දෙහි උසස්ම පැවිදිවත අනුව පැවිදි වන්නෙමි'යි වණ්ටමුත්තිකව පැවිදි වී, හිමාලයෙහි උස් පව් දෙකතුනක් පසුකොට ගොස් අසපුවක් කරවා වසයි.

මේ අතර, (අප ගෞතම) බුදුරජාණන් වහන්සේ, ලෝ පහළව, උතුම් දම්සක් පවත්වා, අනුපිළිවෙලින් සැවැත්පුරට පැමිණ අනේපිඩු සිටු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වසති. එකල්හි සැවැත්පුර වැසි එක් මිනිසෙක් හිමාල පව්වෙහි සඳුන්හර ආදිය සොයමින්, ඒ අසපුවටද පැමිණ, තවුසාට වැඳ එකත්පස්ව සිටියේය. තවුසා ඔහු දැක

'කොහි සිට ආවෙහිදැ'යි විචාළේය. 'හිමියනි, සැවැත්පුර සිට'යැයි කීය. එහි තොරතුරු කෙසේදැයි තවුසා ඇසීය. 'එහි මිනිස්සු නොපමාව දානාදී පින්කම් කරති.' 'ඒ කවරකුගේ අවවාද අසාද?' භගවත් බුදුරජාණන් වහන්සේගෙන්'යැයි මිනිසා කීය. තවුසා බුද්ධ යන වචනයෙන් විස්මිතව පින්වත, ඔබ බුදුරජාණන් වහන්සේ ගැන කියහි'දැයි අසා, ආමගන්ධ සූත්‍ර විස්තරයෙහි කී පරිදි තෙවරක්ම එසේ විචාරා, 'එබඳු හඬක් වුවද ලොව ඇසීම දුලබ'යැයි සතුටුව, භාග්‍යවතුන් වහන්සේ හමුවීමට යනු කැමතිව, 'බුදුකෙනෙකු සමීපයට හිස්අතින් යෑම සුදුසු නොවේ, කුමක් ගෙන යන්නෙම්දැ'යි සිතුවේය. නැවතද මෙසේ සිතීය. 'බුදුවරු නම් ලාභසත්කාරයට ගරු නොකරති. එහෙයින් මම දහම් පඬුරක් ගෙන යමි'යි ගැටළු සතරක් සැකසීය. 'කෙබඳු මිතුරකු ඇසුරු නොකළ යුතුද? ඇසුරු කළයුත්තේ කෙබඳු මිතුරෙකු ද? කෙබඳු අයුරින් කටයුතු කළයුතුද? රස අතුරෙන් උසස් රසය කුමක්ද? යන මේ ගැටළු සිත තබාගෙන, (රටෙහි) මැද පෙදෙසට මුහුණලා පිටත්විය. අනුපිළිවෙලින් සැවැත්පුරට පැමිණ, ජේතවනාරාමයට පිවිසියේය. භාග්‍යවතුන් වහන්සේද ඒ වේලාවෙහි දහම් දෙසනු පිණිස අසුනෙහි වැඩසිටි සේක. ඔහු භාග්‍යවතුන් වහන්සේ දැක, නොවැඳම එකත්පස්ව සිටියේය. උන්වහන්සේ, 'තවුසාණනි, සැපදුක් කෙසේදැ'යි සතුටු සාමීචියෙහි යෙදුනාහ. ඔහුද, 'පින්වත් ගොතම, සුවෙන් සිටිමි' ආදී ලෙසින් පිළිසඳර කතාකොට, 'යම්සේ බුදුවරයෙකු වන්නේ නම්, සිතින් විමසන පැන, වචනයෙන් විසඳනු ඇතැ'යි ඒ පැන සිතින් ඇසීය. භාග්‍යවතුන් වහන්සේ, බමුණු තවුසා විසින් සිතින් විමසන ලද පැන මුලසිටම විසඳීමට **හිරිං තරනතං** යනුවෙන් පටන්ගෙන ගාථා දෙකක් හා තවත් ගාථා අඩක්ද වදාළහ.

එම ගාථාවල අරුතනම්, **හිරිං තරනතං** ලජ්ජාව ඉක්මවා යන, ලජ්ජා නැති බව, **විජිගුච්ඡමානං** අසූචි මෙන් දක්නා වූ, ලජ්ජා නැති තැනැත්තා ලජ්ජාව පිළිකුල් කරයි. අසූචි සේ සළකයි. එයින් ලජ්ජා නැතිකම ඇසුරු නොකරයි, එහි නොඇලේ. (විලිබිය නැත.) එහෙයින් **විජිගුච්ඡමානං** යැයි කියන ලදී. **සඛාහමසමි ඉති භාසමානං** 'මිතුර, මම ඔබට හිතසුව කැමති යහළුවෙක්මි, මගේ ජීවිතයද ඔබ වෙනුවෙන් අත්හරිමි, ආදී ලෙසින් කියනු ලබන, **සයහානි කච්චානි අනාදියනතං** එසේ කීවත්, සහයෝගය දීමට හැකියාව තිබියදීත්, ඒ මිතුරාගේ කටයුතු මැනවින් ඉටුකරගන්නට අතහිත නොදෙමින්, නැතහොත් සිතින්වත් ඊට කැමති බවක්වත් පළ නොකරමින්, එසේ වුවත් කළයුතු දෙයක් ඇතිවූ

විට, එහි අයහපතම පෙන්වමින්, **නෙසො මමනති ඉති තං විජඤ්ඤා** 'එබඳු මිතුරකු, මිතුරු වෙසින් එන්නෙකු මිස, මගේ නියම, කලණ මිතුරකු නොවේයැ'යි මෙසේ නුවණැති මිනිසා දැනගන්නේය. **අනත්‍ථයං** යම් දෙයකදී, 'දෙන්නම්, කරන්නම්, කරයි, එයින් මිතුරා අනුව නොයන බව දැක්වේ. **පිය වාචං යො මිතෙතසු පකුබ්බති** එබඳු තැනැත්තා අතීතයට, අනාගතයට ගැලපෙන වචනයෙන් පිළිසඳර කතාකරමින්, හුදෙක්ම සුන්දර වචනයෙන් පමණක්ම පිය මිතුරකු සේ වදන් හසුරුවයි. **අකරොනතං භාසමානං පරිජානනති පණ්ඩිතා** මෙබඳු කියන දේ නොකොට, හුදෙක් වචනයටම සීමාවෙමින්, 'වචීපරම' නමින්ද, මිතුරකු නොවූවත්, මිතුරු විලාස ඇත්තෙකැයි නුවණැත්තෝ ඔහු ගැන පිරිසිඳ දනිති. **න සො මිතෙතා යො සදා අපපමතෙතා භෙදාසංකී රන්‍ධමෙවානුපසසී** මිහිරි කතාබහෙන් යුතුව, අනෙකා බිඳවීම ගැනම හැමවිටම බලාපොරොත්තු වෙමින්, නොපමාව කල්ගෙවයි. එබඳු කිසිම කරුණක් නොමැති වූ විට, කල්පනා නොකරන ලද (සිතාමතා නොකරන ලද) හෝ නොදන්නා නිසා නොකළ දෙයකට හෝ තමාට නින්දා කරන්නේ නම්, එවිට මේ අයුරින් පෙරළා චෝදනා කරන්නෙමි'යි සිදුරුතැන්ම (වැරැද්දක්ම) විමසා බලයි. එබඳු මිතුරකු ඇසුරු නොකළ යුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, ඇසුරු නොකළයුතු කෙබඳු මිතුරන්දැයි පහදා දෙවැනි පැනය විසඳීමට **යසමිඤ්ච සෙතී** යන අඩ කොටසකින් යුතු (පද දෙකකින් යුතු) ගාථාව වදාළහ. එහි අදහස නම් **යසමිඤ්ච** මිතුරා (අනෙක්) මිතුරන් කෙරෙහි හදවතින් ලැදිව, නිදා ගැනීමෙන් (හදවතින්ම වැළඳගනු ලැබීද - එක යහනෙහි නිදාගැනීමෙන්ද) **පිතු උරසි** යම්සේ 'මගේ ළයෙහි හොවා පුතු නිදිකරනවිට, දුකක් හෝ නොසතුටු බවක් හෝ ඇතිවේ'යැයි සැකයක් නොමැති වේද, **සෙති** එපරිද්දෙන් දරුවන්, ධනය ජීවිත ආදිය කෙරෙහි මිතුරු බවින් සැක නොකොට, මිතුරා අදහා ගනී. **යො ච පරෙහි** කරුණු සියයක්, කරුණු දහසක් වුවත් කියා, **අභෙජ්ජො, ස වෙ මිතෙතා** එබඳු මිතුරකු ඇසුරු කළ යුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, ඇසුරු කළයුතු කෙබඳු මිතුරන්දැයි යන දෙවැනි පැනය විසඳ තුන්වන පැනය විසඳීමට **පාමුජ්ජකරණං** යන ගාථාව වදාළහ. එහි තේරුම නම්, සතුට ඇතිවීමට හේතුවෙයි. සතුටු කරයි අරුතින් **පාමුජ්ජකරණං, ඨානං** කරුණු, ඒ කුමක්ද? උත්සාහයයි.

එය දහම හා බැඳීමෙන් සතුට, සුව දනවන බැවින් **පාමුජ්ජකරණං** යැයි කියනු ලැබේ. 'මහණෙනි, මනාව දේසනා කරන ලද දහම් විනයෙහි, යම්කෙනෙක් අරඹන ලද උත්සාහය පවත්වා ගනිත්ද ඔහු සැපසේ කල්යවයි' යනුවෙන් වදාළේ එහෙයිනි.

'සවාක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ යො ආරද්ධවිරියො, සො සුඛං විහරති' පැසසුම ගෙනෙන අදහසින් **පසංසාවහනං** මුලදී දෙව්මිනිස් සැප අවසන නිවන්සුව ළඟාකර ගැනීමේ පිළිවෙත අනුව **සුඛං** වේ. පලය බලාපොරොත්තුවීම, **ඵලානිසංසො, භාවෙති** වඩයි. **වහනෙතා පොරිසං ධුරං** පුද්ගලයාට සුදුසු පරිදි අනුගමනය කරන පිළිවෙල හෝ කටයුතු තුලින් යහපත් උත්සාහය යැයි කියන ලද 'කරුණ' දියුණු කරයි. (උත්සාහය තවත් දියුණු කරගනී.) මෙබඳු උත්සාහයක් යෙදිය යුතුයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන්වන පැනය විසඳ හතරවන පැනය විසඳීමට **පවිවෙක රසං** යන ගාථාව කීහ. **පවිවෙකො** යනුවෙන් කෙලෙස් නැති කිරීමෙන් හටගන්නා විවේකයෙහි උසස් පලය කියනු ලබයි. රසො විඳිය හැකිවන පරිදි එහි ඇති සුවයයි. **උපසමො** කෙලෙස් නැතිකිරීමෙන් ලබන නිවන යැයි හඳුන්වන සත්සුන් අරමුණ ඇති බැවින් හෝ නිවනට පත්, ධම්මපීතිරසො උතුම් දහමෙන් ඉවත් නොවී, නිවනට පත්ව, උපන් සතුට නම් වූ රසය ඇති බවයි. **විවෙකරසං උපසමස්සච රසං පීත්වා** එමෙන්ම, **ධම්මපීති රසං පිවං නිද්දරො හොති නිප්පාපො** දහම් රසය පානය කළත්, කෙලෙස් දැවීම් නොමැති බැවින්, දැවීම් රහිත, දහම් රසය පානයෙන් පව් දුරුකරන ලදින් නිප්පාපො වෙයි. එහෙයින් දහම් රසය රස අතුරෙන් උසස්ය. ඇතැම් කෙනෙක්, දැහැන්ද, නිවනද විමසිලිමත්ව බලද්දී, කාය-චිත්ත-උපධි විවේක ලෙසින්, කයෙන් දහම් සතුටින් වූ විවේකයද, සිතින් සංසිඳවීමේ විවේකයද, රහත්පල විවේකයද යන කරුණු තුනම දහමෙහි ඇතුලත් කරති. එහෙත් මුලින් කී අදහස වඩා සුදුසුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, සිවුවන පැනය විසඳමින්, අරහත් ඵලය කුළුගන්වා දේසනය නිමකළහ. දේසනය අවසන බමුණා පැවිදිව, කිහිප දිනකින්ම පිළිසිඹියා පත්ව රහත් බව ලැබීය.

**හිරි සූත්‍ර විස්තරය නිමි.**

# 2.4

එවං මෙ සුතං යනු මංගල සූත්‍රයයි. එය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? දඹදිව, මහජනයා නගර දොරටු, රැස්වීම් සාලා, රැස්වීම් ආදී ඒ ඒ තැන රැස් වී අමු රන් දී සීතාවන්ගේ පැහැරගෙන යාම් ආදී නොයෙක් ආකාර බාහිර කතා කියවා ගනී. ඒ එක් එක් කතාවක් සිවුමසකින් නිමාවෙයි. 'දකින ලද දේ යහපත් වේද? අසන ලද දේ යහපත් වේද? පහස ලද දේ යහපත් වේද? කවරෙක් යහපත දකිත්දැයි එක් දවසක් එහිදී මංගල හෙවත් යහපත් දේ ගැන කතාවක් ඇතිවිය. එහිදී දිට්ඨමංගලික නම් එක් මිනිසෙක්, 'මම මංගල යැයි කියන දේ දනිමි, ලොව යහපත වන්නේ දුටු දේය. ඉතා උතුම් යැයි සම්මත මෙබඳු රූප දැකීම නම්, යහපත් වෙයි. ඇතැම් කෙනෙක් උදෑසන පිබිද කතාකරන සුළු කුරුල්ලකු දකිති. තරුණ බෙලිගසක් හෝ ගැබිණියක, අලංකාරවත්ව සැරසුණු කුමාරවරුන් හෝ පුන්කලසක් හෝ අළුත් රේමසකු හෝ අජානීය අසකු හෝ අජානීය අසකු යෙදූ රියක් හෝ, දුඹුරුවන් ගවයෙකු හෝ දුඹුරුවන් එළදෙනක හෝ මේ හා සමාන වෙනත් උතුම් යැයි සම්මත රූප දකී ද මෙය දිට්ඨමංගලං යැයි කියනු ලැබේ. ඔහුගේ වචනය ඇතැම්හු පිළිගත්හ. ඇතැම්හු නොපිළිගත්හ. එසේ නොපිළිගත්තෝ අනික් තැනැත්තන් හා වාද වූහ.

සුතමංගලික නම් එක් මිනිසෙක්, 'පින්වතුනි, ඇස පිරිසිදු දේද, අපිරිසිදු දේද දකී. එසේම ලස්සන, අවලස්සන දේත්, කැමති අකැමති දේත් දකී. ඒ අනුව දකින ලද දෙය යහපත් නම්, ඒ හැම දෙයමත් යහපත් වන්නේය. නොදුටු දේ යහපත් නොවේ. එසේ වුවද ඇසූ දේ යහපත්ය. ඒ මේ ආකාර වූ උසස් යැයි සම්මත ආසිරිදායක නාදයි. ඇතැම් කෙනෙක් උදෑසන පිබිද 'දියුණු වේවා හෝ, දියුණුවට හේතු වේවා හෝ, බලාපොරොත්තු ඉටුවේවා හෝ යහපත් දේ ඇසේවා හෝ සතුටු සිත් ඇතිවේවා, සිරිමත් වේවා, සිරියාව ඇතිවේවා හෝ අද නැකැත් හොඳය, වේලාව හොඳය, දවස හොඳය, යහපත උදාවේ යැයි, මෙබඳු ඉතා යහපතැයි සම්මත හඬ අසති. මෙය සුතමංගල නම් වේ. ඔහුගේ වචනය ඇතැම්හු පිළිගත්හ. ඇතමෙක් නොපිළිගත්හ. එසේ නොපිළිගත්තෝ අනෙක් තැනැත්තන් හා වාද වූහ.

මුතමංගලික නම් වූ එක් මිනිසෙක්, පින්වත, කන හොඳ දෙයද, නරක දෙයද, කැමති දෙයද අකැමති දෙයද අසයි. ඒ අනුව අසන ලද දෙයම යහපත් නම්, හැමදෙයම යහපත් වන්නේය. ඒ නිසා ඇසූ දෙය මංගල හෙවත් යහපත් නොවේ. එසේ වුවත් පහස ලද දේ, විඳින ලද දේ යහපත්ය. උසස්යැයි පිළිගත්, සුවඳ-රස පහස විඳීම මෙයින් අදහස් වේ. ඇතැම් කෙනෙක් උදෑසනම පිබිද පියුම් සුවඳ වැනි මල්සුවඳ විඳගනිති. හොඳ දැහැටි කයි, (නැවුම්) පොළව හෝ අතගායි. අළුත් වී ආදිය හෝ අමුගොම හෝ කැස්බෑවෙකු හෝ තල පිරවූ ගැලක් හෝ අතපතගායි. උසස් මැටි හෝ තවරා ගනු ලබයි. අළුත් සළුවක් හෝ හැඳගනී. අළුත් හිස්වෙළුමක් දරයි. මෙබඳු හොඳයැයි සම්මත වෙනත් සුවඳක් හෝ රසයක් විඳියි. පහස හෝ ලබයි. මේ මුතමංගල යැයි කීය. ඇතැම් කෙනෙක් ඔහුගේ වචනය පිළිගත්හ. ඇතමෙක් නොපිළිගත්හ. දුටු දේ යහපත් යැයි පිළිගත් තැනැත්තාට ඒ අදහස, ඇසූ දේ-පහස ලැබූ දේ යහපත් යැයි කියන තැනැත්තන්ට වටහාදීමට නොහැකි විය. අනෙක් දෙදෙනාටද තම තම අදහස් එකිනෙකාට වටහා දීමටද හැකි නොවීය. දිටඨමංගලිකගේ වචනය පිළිගත් මිනිස්සු ඒ අනුව හැඳින්වූහ. සුතමංගලිකගේද මුතමංගලිකගේද වචනය පිළිගත් මිනිස්සුද ඒ ඒ ලෙසටම හඳුනා ගත්හ. මෙසේ මෙම මංගල (කරුණු) පිළිබඳව මුළු දඹදිවම පතළ වීය.

ඉක්බිති මුළු දඹදිවම මිනිස්සු සමූහ සමූහව, යහපත් දේ කුමක්ද? යහපත් දේ කුමක්දැයි සිතූහ. ඒ මිනිසුන් රක්නා දේවතාවෝ ද ඒ කතාව අසා, එසේම සිතූහ. ඒ දේවතාවෝ මිහිකත් දෙවිවරුන් හා මිතුරු වෙති. මිහිකත් දෙවිවරුද ඒ අසා මංගල හෙවත් යහපත් දේ ගැන එපරිදිම සිතූහ. අහසෙහි වසන දෙවිවරු ඒ දෙවිවරුන්ගේ මිතුරෝ වෙති. චාතුමමහාරාජික දෙවියෝ අහසෙහි වසන දෙවිවරුන්ගේ මිතුරෝ වෙති. මේ අයුරින් අකනිටා දෙවිවරු සුදසසී දෙවිවරුන්ගේ මිතුරෝ වෙති. අකනිටා දෙවිවරුද ඒ කතාව අසා සමූහ සමූහව රැස්ව මංගල යනු කුමක්දැයි සිතූහ. මෙසේ දසදහසක් සක්වළ හැමතැනම මංගල පිළිබඳව අදහස් පළවිය. මේ මංගල කරුණුයැයි තීරණයකට නොපැමිණ දොළොස් වසරක්ම ගතවිය. මගපල ලද සාවක පිරිස හැර, මිනිස්සුද දෙවියෝද බ්‍රහ්මයෝද දුටු දේ - ඇසූ දේ - පහස ලද දේ යහපතැයි කියමින් තෙකොටසකට බෙදුණහ. එක් තැනැත්තකුට හෝ 'යහපත් දේ මේ' යැයි

නිසි පරිදි තීරණය කළ නොහැකි විය. මංගල කෝලාහලය ලොව හටගත්තේය.

**කොලාහලං** කප්ප කෝලාහලය, චක්කවත්ති කෝලාහලය, බුද්ධ කෝලාහලය, මංගල කෝලාහලය, මොනෙය්‍ය කෝලාහල යැයි පස් ආකාරය. කාමාවචර දෙවිවරු හිසකෙස් මුදා - කෙස් විසුරුවාගෙන, හඬමින්, අත්වලින් කඳුළු පිසිමින්, රතුවත් හැඳ බොහෝ විරූපී වූ වෙසින් මේ ලෝකය වැනසෙන්නේය, මහ මුහුද වියළෙන්නේය. මේ මහපොළවද මහාමේරු පව්වද උඩට නැගී වැනසෙන්නේය. බඹලොව දක්වා ලොව වැනසෙයි. වසර සියදහසකින් පසු කල්පය හටගන්නේය. පින්වතුනි, මෙත්වඩවු, කරුණා, මුදිතා, මැදහත් බව වඩවු. මවට උවටැන් කරවු. පියාට උවටැන් කරවු. කුලදෙටුවන් පුදවු. අවදියෙන් (කල්පනාකාරීව) කල්ගත කරවු. පමා නොවවු යනුවෙන් මිනිස් ලොවෙහි සැරිසරමින් දැනුම් දෙති. මෙය **කප්ප කොලාහලං** නම් වේ. කාමාවචර දෙවිවරුම, 'මෙතැන්සිට අවුරුදු සියයකට පසු සක්විති රජලොව පහළවන්නේයැ'යි මිනිස්ලොව සැරිසරමින් සැළකරති. මේ **චක්කවත්ති කොලාහලං** නම් වෙයි. සුද්ධාවාස දෙවියෝ බඹ අබරණින් අලංකාරවත්ව, බඹ වෙළුම් - උතුම් වෙළුම් හිසපැළඳ සොම්නස්ව, බුදුගුණ කියමින්, 'වසර දහසක් ඇවෑමෙන් බුදුවරයකු ලොව උපදින්නාහ'යි මිනිස්ලොව සැරිසරමින් දන්වති. මෙය **බුද්ධ කොලාහලං** නම් වෙයි. සුද්ධාවාස දෙවියෝම, දෙව් මිනිසුන්ගේ සිත් දැන, (බුදුවරයෙකුගේ පහළවීමෙන්) දොළොස් වසරකට පසු, සම්මා සසම්බුදුරජාණන් වහන්සේ මංගල හෙවත් 'සුබ කරුණු' වදාරන සේකැ'යි මිනිස්ලොව හැසිර සැළකරති. මෙය **මංගල කොලාහලං** නම් වේ. 'වසර සතකට පසුව, එක්තරා පැවිදි හිමිනමක ඒ සම්මා සම්බුදුරදුන් හමුව (උසස් හික්මීමේ පිළිවෙත) මොනෙය්‍ය පිළිවෙත විමසන්නේ' යැයි සුද්ධාවාස දෙවියෝ මිනිස්ලොව සැරිසරමින් දැනුම් දෙති. **මොනෙය්‍ය කොලාහලං** නමින් මෙය හැඳින්වේ. මේ කොලාහල පහෙන් දකින ලද දේ යහපත් වේ යන ආදී ලෙසින් දෙව් මිනිසුන් තුන් කොටසකට බෙදී මෙම මංගල කොලාහලය ලොව පැතිර ගියේය.

මංගල කරුණු පිළිබඳව දෙවියන්ද මිනිසුන්ද කතා කළද, විමසුවද එකඟ බවක් නොවූ විට, දොළොස් වසරක් ගතවූ පසු තව්තිසා දෙවිවරු රැස්වී මෙසේ සමව සිතූහ. 'පින්වතුනි, නිවසක වාසය කරන්නන්ට එහි මූලිකයා මෙන් ද, ගම්වාසීන්ට ගම්මුලාදෑනියා මෙන්ද, සියළුම මිනිසුන්ට

රජ මෙන්ද, දෙදෙව්ලොවකට අධිපති, මේ සක්දෙව්ඳු පින්බලෙන්ද, සම්පතින්ද නුවණින් ද අපට වඩා උසස්ය. මුල්තැන ගනී. අපි සක්දෙව්ඳුගෙන් ඒ කරුණ විමසන්නෙමු' නම් මැනවි. අඩුතුන් කෙළක් දෙවඟනන් පිරිවරා, ඒ වේලාවට සුදුසු සළුපිළි හැඳ, අබරණ පැළඳි ගතින් සැරසි සක්දෙව්ඳුන් පරසතු රක්මුල පඬුඇඹුල් අසුනෙහි හිඳිද්දී, දෙවිවරු ඔහු වෙත ගොස්, වැඳ එකත්පස්ව සිට, 'නිදුකාණනි, දැන් මංගල කරුණු පිළිබඳ පැනයක් පැනනැගී ඇති බව දැනගන්නේ නම් යෙහෙකි, ඇතමෙක් දකින ලද දේ මංගල යැයි කියති. තවත් කෙනෙක් ඇසූ දේ මංගලයැයි කියති. ඇතැම් කෙනෙක් පහස ලද දේ මංගල යැයි කියති. මෙහිදී අනෙක් තැනැත්තෝද අපිද එක තීරණයකට නොපැමිණියෙමු. එහෙයින් ඔබතුමා අපට එය නිසි අයුරින් පහදා දෙන්නේ නම් මැනවැ'යි දන්වා සිටියහ. සක්දෙව් රද සැබවින්ම නුවණැති බැවින්, 'මේ මංගල කතාව පළමුවෙන්ම කොතැනදී ඇතිවීදැ'යි ඇසීය. 'දේවයන් වහන්ස, අපි එය චාතුම්මහාරාජික දෙවියන්ගෙන් ඇසුවෙමු'යි කීහ. ඒ අනුව පිළිවෙලින් චාතුම්මහාරාජික දෙවියන්, අහසෙහි වසන දේවතාවුන්ගෙන්ද, අහස් දේවතාවුන් පොළවෙහි වසන දේවතාවුන්ගෙන්, පොළවෙහි දේවතාවුන් මිනිසුන්ට රැකවරණ සලසන දේවතාවුන්ගෙන් (අසන ලද අතර) මිනිසුන් රක්නා දේවතාවෝ එය මිනිස්ලොවෙන් ඇතිවූ කරුණකැයි පැවසූහ. එවිට සක්දෙව්ඳු 'සම්මා සම්බුදුරදුන් කොහි වසත්දැ'යි ඇසීය. 'දේවයන් වහන්ස, මිනිස්ලොව යැ'යි කීහ. 'එය කවුරුන් හෝ භාග්‍යවතුන් වහන්සේගෙන් අසා ඇත්ද' නැත, දේවයන් වහන්ස' දෙවියෝ පිළිතුරු දුන්හ. 'පින්වත් දෙවිවරුනි, ඔබලා ගිනි අත්හැර දමා කණාමැදිරියන්ගෙන් ආලෝකය ලබවුද? හැමවිටම යහපත ගැන දේසනා කරන්නා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා යම් කරුණක් ගැන මා විමසීමට සිතුවාහුද? එවු එය භාග්‍යවතුන් වහන්සේගෙන් අසමු, ඒකාන්තයෙන් අද ඉතා අගනා - විසිතුරු පැන විසඳීමක් ලබන්නෙමු'යි (කියා) 'ඔබ භාග්‍යවතුන් වහන්සේගෙන් අසව'යි එක් දෙව්පුතකුට අණ කළේය. ඒ දෙව්පුතු ඒ වේලාවට සුදුසු අලංකාරයෙන් සැරසී විදුලියක් මෙන් බබළමින්, දේව පිරිස පිරිවරා, ජේතවන මහා විහාරයට පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව සිට මංගල පැනය අසමින් ගාථාවක් කීය. භාග්‍යවතුන් වහන්සේ ඒ පැනය විසඳමින් මේ සූත්‍රය වදාළහ.

එවං මෙ සුතං යන්නෙහි අරුත කසීභාරද්වාජ සූත්‍ර විස්තරයෙහි කෙටියෙන් කියන ලදී. විස්තර දැනගැනීමට කැමති වන්නන්, පපඤ්චසූදනී

නම් වූ මැඳුම්සඟි අටුවාවෙහි සඳහන් පරිදි දතයුතුය. කසීභාරද්වාජ සූත්‍රයෙහි 'මගධයෙහි දකුණුගිරි පෙදෙසෙහි ඒකනාළා නම් බමුණුගමෙහි වැඩවසති'යි සඳහන්ව තිබේද, **සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ යැයි මෙහි කියන ලදී. ඒ අනුව සාවත්ථියං යන මේ වචනයේ පටන්, කලින් සඳහන් නොවූ වචන පැහැදිලි කරන්නෙමි. කෙසේද යත්? **සාවත්ථියං** එම නම ඇති නගරයෙහි, එය සවත්ථ නම් ඉසිවරයා වසන තැන විය. කුසම්බ විසූ තැන කොසඹෑ වූවා සේ, කාකන්ද විසූ තැන කාකන්දී නමින් හැඳින්වූ පරිද්දෙනි. මෙසේ ඉත්ථිලිංග වචනසේ ගෙන සාවත්ථියැයි කියනු ලැබේ. එකතැනකට තවලම් මගින් භාණ්ඩ රැස්කරන විට, කුමන බඩුවක් තිබේදැයි අසද්දී, 'හැමදෙයම තිබේයැ'යි කීහ. එහෙයින් ඒ වචනයද අනුව, සාවත්ථී යැයි කියනු ලැබීය යනු පැරණි ඇදුරන් දක්වා ඇත. ඒ සැවත් නුවරම (අවට) ගොදුරු ගමද ඇතුලත් විය. ජේත නම් වූ රජ කුමරෙකු විසින් ගස්වැල් රෝපණය කොට එය සකස්කොට වැඩිදියුණු කරන ලදුව ජේතවන නම් වීය. එහි ජෙතවනෙ ඒ ජේත (කුමරු) ගේ උයන, පිහිටවිය යුතු තැනැත්තන්ට ආහාර සැපයෙන අරුතින් - අනාථපිණ්ඩිකො - ඒ අනාථපිණ්ඩිකගේ, **අනාථපිණ්ඩිකස්ස** ඒ අනාථපිණ්ඩික ගහපතියා විසින් පනස්සතර කෝටියක් ධනය වැයකොට නිමවන ලද ආරාමය යන අදහසයි, එතැන පැවිදි වූවනට වාසයට සුදුසු ඉඩ ඇති තැනක් ලෙස දක්වන ලදී.

අථ යනු සිදුවීම - කතාව එකදිගට සබඳතාව පවත්වා ගැනීමේ අරුතින් යෙදුවකි. බො එසේ උපකාරවන අයුරින් නිදසුන්කොට යෙදුන නිපාතයකි. ඒ අතරතුරදීම භාග්‍යවතුන් වහන්සේ එහි විහාරයෙහි වාසය කිරීමත් (සක්දෙවිඳුගේ උපදෙස් අනුව කටයුතු කිරීමට) මීට අදාල දේ සඳහා පහසු විය. **අඤ්ඤතරා දෙවතා** ආදී ලෙසිනි. **අඤ්ඤතරා** නම නියමකොට දක්වා නැති, නම් ගොත් කුමක්දැයි හෙළිදරව් නොවේ. එහෙයින් එක්තරා යැයි කියා ඇත. දෙවියාම දෙවතා ගැහැණු පිරිමි දෙකොටසම ගැනේ. මෙහි පිරිමි බව ලද දෙව්පුතෙකි. **අභික්කන්තාය රත්තියා, අභික්කන්ත** යන වචනය අවසානය, යහපත් සොඳුරු බව, ලස්සන, උවමනාවෙන්ම පිළිගැනීම ආදී තේරුම්වල යෙදේ. 'හිමියනි, රැය ඉකුත් වීය. රැයෙහි මුල් යාමය නික්මියේය. සඟ පිරිස බොහෝ වේලා (මෙහි) සිටියාහ. භාග්‍යවතුන් වහන්සේ සඟ පිරිසට පාමොක් වදාරන සේක්වා. 'අභික්කන්තා භන්තෙ රත්ති, නික්ඛන්තො පඨමො යාමො, චිරනිසින්නො භික්ඛුසංඝො, උද්දිසතු භගවා පාතිමොක්ඛං'

මෙබඳු තන්හි අවසානය යන අරුත දීමට යොදා ඇත. 'සතරාකාර පුද්ගලයන් අතුරෙන්, මේ කියන ලද පුද්ගලයා වඩාත් සුදුසුය, උසස්ය' - අයං ඉමෙසං චතුනනං පුගගලානං අභිකකනතතරොච පණිතතරොච' මෙබඳු තැන්වල යහපත්, සොඳුරු අරුතින් යෙදේ.

'ඉඳුබලයෙන් ඉතා උසස්, කිතුරාවයට පත්, පැහැයෙන් මුළු දිසා ඉක්මවා බබළවමින්, මුළු පෙදෙසම ආලෝකමත් කරමින්, මගේ පාද වඳින්නේ කවරෙක්ද?

**කො මෙ වනදති පාදානි, ඉදධියා යසසා ජලං**
**අභිකකනෙතා වණෙණන සබබා ඔභාසයං දිසා**

මෙබඳු තැන්වල මනා පැහැපත් රුව අරුතිනි. 'පින්වත් ගෝතමයන් වහන්ස, ඉතා කදිමයි, පින්වත් ගෝතමයන් වහන්ස, ඉතා කදිමයි' අභිකකනතං භො ගොතම, අභිකකනතං භො ගොතම මෙහි දැඩි උවමනාවෙන්ම, හදවතින්ම, නොවෙනස් වූ පිළිගැනීමේ අරුතිනි. මෙම සූත්‍රයෙහි ඉකුත් වූ රැය - රැය ගෙවීයාමෙන් පසු යන තේරුමෙන් යෙදී ඇත. අභිකකනතවණණ මෙහි අභිකකනත වචනය ලස්සන අරුතිනි. වණණ යන වචනය සම, තුති කිරීම, කුලය, සමූහය, කාරණය, පිහිටීම, ගණන, රූප, එකතුව ආදී අරුත්හි පෙනේ. 'භාග්‍යවතුන් වහන්සේ රන්වන් පැහැ ඇතියහ.' 'සුවණණවණෙණසි භගවා' මෙහි සම ගැන කියවේ - 'ගහපතිය, මේ මහණ භවත් ගෝතමයන්, පිළිබඳ ගුණ සමූහය එකතු කරගත්තේ කවදාද? කදා සංවුළහා පන තෙ ගහපති, ඉමෙ සමණසස ගොතමසස වණණ' මේ ආදී තැන්වල තුති ගුණයෙහි දැක්වේ. 'පින්වත් ගොතම, කුල සතරකි', 'චතතාරො භො ගොතම වණණ' - මේ තැන්වල කුලය ගැනයි. 'එසේනම්, කිනම් අදහසින් 'ගනධතෙථන' යැයි කියනු ලබයිද? 'අථ කෙන නු වණෙණන ගනධතෙථනාති වුච්චති' මේ ආදී තැන කාරණයෙහි යෙදේ. 'මහත් වූ ඇත්වෙසක් මවාගෙන, 'මහනතං හතථිරාජවණණං අභිනිමමිණිතවා' - මෙහි පිහිටි ආකාරයයි. ගණන දැක්වෙන අයුරින් 'තයො පතතසස වණණ' යැයි යෙදී ඇත. 'සුවඳ, රසය, ඉස්ම මෙබඳු තැන සමූහයක එකතුවක් ලෙස 'වණෙණ ගනෙධා රසො ඔජා' - වණණ යෙදී ඇත. මෙම සූත්‍රයෙහිදී සම ගැන සඳහන් වේ යැයි දතයුතුය. ඒ අනුව මනා බබළන පැහැයෙන්, මනාවූ පැහැපත් සමක් ඇති බව කියා ඇත.

**කෙවලකප්පං** යන්නෙහි කෙවල වචනය - මුළුමනින්ම, බොහෝ සෙයින්, එයටම බැඳුණු, පමණ වූ, දැඩිබව, වෙන්කිරීම් ආදී නොයෙක් තේරුම්වල යෙදේ. 'මනා පිරිපුන්, පිරිසිදු වූ බඹසර' - 'කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහමචරියං' - මෙහි මුළුමනින්ම යන අරුතිනි. 'අඟමගධ දෙරටින් (ඇති තරම්) සෑහෙන පමණ කෑයුතු - බුදිය යුතු ආහාර ගෙන පැමිණෙන්නාහ' 'කෙවලකප්පාව අංගමගධා පහූතං ඛාදනීයං භොජනීයං ආදාය උපසංකමිස්සන්ති' මේ ආදී තැන බොහෝසෙයින් යන තේරුමයි. 'මේ සියළුම දුක් ගොඩම (රැසම) හටගැනීමට හේතු ඇත' - 'කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති' මෙහි එයටම බැඳුණු අදහසින් යෙදී ඇත. 'මේ ගරුකටයුතු තැනැත්තා සැදැහැ බව පමණ වේද?' කෙවලං සද්ධාමත්තකං නූන අයමායස්මා' - මෙහි නොවැඩි වූ අරුතිනි. 'ගරු කටයුතු අනුරුද්ධ හිමිගේ ගෝල හිමිනමක වූ මේ බාහික හිමි, සඟ පිරිස බිඳවීමට පිණිස සිටියේ වෙයි. 'අයං ආයස්මතො අනුරුද්ධස්ස බාහිකො නාම සද්ධිවිහාරිකො කෙවලකප්පං සංඝභෙදාය ඨිතො' මෙහි දැඩි අරුතින් යෙදී ඇත. 'හුදෙක්ම සිල්ගුණදම් සපිරූ තැනැත්තා උතුම් පුද්ගලයෙකැයි කියනු ලැබේ. මෙහි වෙන්කොට දැක්වීමෙහි යෙදේ. 'කෙවලී වුසිතවා උත්තම පුරිසොති වුච්චති. මෙම සූත්‍රයෙහිදී කෙවල යන වචනය මුළුමනින්ම (ඉතිරි නොකොට) යන අදහස දේ. කප්ප යන වචනය, දැඩිව ඇදහීම, පරිහරණය, කාලය, හැඳින්වීම, කැපීම, විකල්පය, සුළුඉඩ, හාත්පස වැනි නොයෙක් තේරුම්වල යෙදේ. 'පින්වත් ගෝතමයන් අරහත් සම්මා සම්බුදුවරයන් වහන්සේ ලෙස තද පිළිගැනීමක්, තහවුරුවීමක් ඇත. 'ඔකප්පනීයමෙතං භොතො ගොතමස්ස යථා තං අරහතො සම්මා සම්බුද්ධස්ස', 'මහණෙනි, පස්ආකාර මහණුන් විසින් ගෙඩි අනුභවය අනුදනිමි' - අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණ කප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං - මේ ආදී තැන්වල පරිහරණයෙහි අරුතිනි. 'යම්තැනක නිතරම වසමි' - යෙන සුදං නිච්චකප්පං විහරාමි' 'මෙහි අදහස් වන්නේ කාලයයි. 'මේ ගරුකටයුතු කප්ප ය - 'ඉච්චායස්මා කප්පො' මෙබඳු තැන හඳුන්වා ඇති අයුරින් නම කියැවේ. 'කෙස්රවුල් කැපීමෙන් මනාව සකසා සරසන ලද' - අලංකතො කප්පිත කෙසමස්සු' මෙහි කැපීම අරුතින් යෙදේ. 'ඉර හැරී අඟල් දෙකක් සෙවනැල්ල ඉක්මවා යනතුරු ආහාර ගැනීම සුදුසුය. 'කප්පති ද්වංගුල කප්පං' - මෙබඳු තැනක විකල්ප අරුතිනි. 'වැතිර සිටීමට ඉඩක් ඇත' - 'අත්‍ථි කප්පො නිපජ්ජිතුං' - මෙහි ඉඩකඩ තිබීම අරුතිනි. 'වෙළුවන පෙදෙස හාත්පස බබුළුවා' - 'කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා' - 'මෙහිදී හාත්පස, පරිසරය යන අරුතිනි. මෙම සූත්‍රයෙහිද

හාත්පස යන්න අදහස් වේ. **කෙවලකපපං ජෙතවනං** හාත්පස මුළු ජේතවන පෙදෙසම මෙයින් හැගෙන බව දතයුතුය. **ඔභාසෙත්වා** ආලෝකය පතුරුවා, සඳ මෙන් ද, හිරු මෙන් ද එකම ආලෝකයක්, එකවර එළියකොට, යෙන **භගවා තෙනුපසංකමි** ආධාර විබත් අරුතින් කරණ විබතින් යෙදී ඇත. යම්තැනක භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි සේක්ද, එතැනට පැමිණියේ යැයි තේරුම දතයුතුය. යම් කරුණක් නිසා දෙව් මිනිසුන් විසින් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණිය යුතු වීද, ඒ කරුණ සඳහා පැමිණියේ යැයි ද තේරුම දතයුතුය. කුමන කරුණකට භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණිය යුතු වේද? මිහිරි පල ලබාගැනීමේ අදහසින් බොහෝ නොයෙක් කුරුල්ලන් නිතරම පැමිණෙන මහා රුකකට මෙන්, නොයෙක් ආකාර වූ යහගුණ වෙසෙසක් ළඟාකර ගැනීමේ අදහසින් පැමිණිය යුතුය. **උපසංකමී** ගියේ යැයි කියන ලදී. **උපසංකමිත්වා** පැමිණ, අවසානයේ - නැතහොත්, එසේ ආසන්නම තැනට - භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් යන අදහසින් කියන ලදී. **භගවනතං අභිවාදෙත්වා** භාග්‍යවතුන් වහන්සේට ගරුබුහුමන් දක්වා වැඳ නමස්කාර කොට, **එකමනතං** භාව නපුංසකව දැක්වේ. එක් ඉඩ ඇති තැනක, එකත්පසෙක, ආධාර විබත් සඳහා කම් විබතින් යෙදී ඇත. **අටඨාසි**, හිඳගැනීමෙන් තොරව, එක් තැනකට වී සිටගෙන සිටියේය. එකත්පස්ව සිටියේ යැයි කියන්නේ කෙසේද?

'පසුපසින් නොවේ, ඉදිරියෙන්ද නොවේ, එතරම් ළඟින්ද නොවේ. එතරම් ඈතින්ද නොවේ. උසකින්ද නොවේ. උඩුසුළඟ අනුවද නොවේ. එකත්පස්ව සිටීම වනුයේ මේ දොස් ඇති නොවන පරිදි සිටීමයි.

**න පචඡතො න පුරතො න පි ආසනන දූරතො**
**න කචෙඡ නො පි පටිවාතෙ න චාපි ඔනතුනනතෙ,**
**ඉමෙ දොසෙ විවජෙජත්වා එකමනතං ඨිතා අහූ'**

කවර හෙයින් නොහිඳ සිටගෙන සිටියේද? ඉක්මණින් ආපසු යාමේ කැමැත්ත නිසාය. දේවතාවෝ කිසියම් වැදගත් කරුණක් නිසා, පිරිසිදු මිනිසෙකු මෙන් අපිරිසිදු තැනක් වූ මිනිස්ලොවට එති. යොදුන් සියයක දුරක පටන් මිනිස්ලොවෙහි දුගඳ දැනෙන බැවින්, පිළිකුල් වෙයි. මිනිස්ලොවෙහි ඇළුම් නොකරති. එහෙයින් පැමිණි කරුණ අවසන්කොට, ඉක්මනින් ආපසු යාමට කැමතිව හිඳගත්තේ නැත. ගමන් කිරීමේදී,

ඉරියව් පවත්වා ගැනීමේදී ඇතිවන වෙහෙස දුරුකරගැනීම පිණිස, යම් කෙනෙකුට හිඳගැනීම අවැසි වේද, දෙවියන්ට එබඳු වෙහෙස නැත. මහා සච්චන් පිරිවරා බුදුරජාණන් වහන්සේ වැඩසිටි බැවින්, ගරුසැළකිලි දැක්වීමටද හිඳගත්තේ නැත. එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ගරුබුහුමන් දක්වනු පිණිස ද හිඳගත්තේ නැත. හිඳගනු කැමති දේවතාවුන්ට ආසන පහළ වේ. ඊට නොකැමතිව, හිඳගැනීමට සිතකුදු ඇතිකර නොගෙන, එකත්පස්ව සිටියේය. **එකමන්තං ඨිතා ඛො සා දෙවතා** මෙසේ මේ කරුණු අනුව එකත්පස්ව සිටි ඒ දේවතාවා, **භගවන්තං ගාථාය අජ්ඣභාසි** භාග්‍යවතුන් වහන්සේට, නියමිත අකුරු යොදා ගළපන ලද වචනයෙන් (ගාථාවෙන්) කීවේය යන තේරුමයි.

එම ගාථාවෙහි බහූ යනු නියමිත නොවූ ගණනක් නොදැක්වූ, එයින් නොයෙක් සියගණන්, නොයෙක් දහස් ගණන්, නොයෙක් සියදහස් ගණන් කියන ලදී. දෙව්ලොවෙහි වසන්නෝ **දෙවා,** පස්කම් ගුණයෙහි ඇලෙමින්, කෙළිදෙලින් තුටුවෙති. තම සිරියාවෙන් බබලති අරුතද ඇත. තවද, සම්මුති, උපපත්ති, විසුද්ධි යැයි දෙවා තුන් කොටසකි. **සම්මුතිදෙවා** නම් රජවරු, බිසෝවරු, කුමාරවරු, **උපපත්තිදෙවා** නම්, චාතුම්මහාරාජික දෙවියන් පටන්, ඊටත් ඇතින් සිටින දෙව්වරු, විසුද්ධිදෙවා නම් රහත්බව ලැබුවෝ වෙති'යි කියන ලදී. 'දෙවාති තයො දෙවා, සම්මුතිදෙවා උපපත්තිදෙවා, විසුද්ධිදෙවාති, සම්මුතිදෙවා නාම රාජානො දෙවියො කුමාරා, උපපත්තිදෙවා නාම චාතුම්මහාරාජිකෙ දෙවෙ උපාදාය තදුත්තරිං දෙවා, විසුද්ධිදෙවා නාම අරහන්තො වුච්චන්ති' මෙහිදී අදහස් වන්නේ උපපත්ති දෙවියන්ය. මනුගෙන් පසුව පැවත එන අදහසින් **මනුස්සා,** 'උසස් මනසක් ඇති බැවින් මිනිසුන් වූහ'යි පැරණි ඇදුරෝ කියති. මිනිස්සු දඹදිව වැසි, අපරගෝයාන වැසි, 'උතුරුකුරු වාසී හා පුබ්බවිදේහික යැයි සිවුආකාර වෙති. මෙහි අදහස් වන්නේ දඹදිව වාසීන්ය. **මංගලං** යනු මේ මිනිසුන් විසින් සොයන ලද, **මංගලානි** යහපත උදාව සහ වැඩිදියුණුවට පැමිණෙතියි තේරුමයි. **අචින්තයුං** සිතුහ, **ආකංඛමානා** කැමතිවෙමින්, බලාපොරොත්තුවෙමින්, ආසා වෙමින්, **සොත්ථානං** සුවතාවය, මෙලොව පරලොවට යහපත් වූත්, වැඩදායී වූත්, හරවත් වූත් කරුණු දැනගැනීමට සියල්ලන්ගේම උවමනාව කියන ලදී. **බ්‍රෑහි** දේසනා කරනු මැනව, පවසනු මැනව, කියනු මැනව, හෙළිදරව් කරනු මැනව, බෙදා දක්වනු මැනව, පැහැදිලි කරනු මැනව. **මංගලං** යහපත උදාකරන, වැඩිදියුණු කරන, සියළු සම්පත් ළඟාකර දෙන කරුණු, **උත්තමං** සියළු

ලෝකවාසීන්ගේ හිතසුව පිණිස උසස් වූ, උතුම් වූ, මේ එම ගාථාවෙහි වචන අනුව සඳහන් කිරීමයි.

මේ දැක්වෙන්නේ කෙටි අරුතයි. දස දහසක් සක්වළ දෙවියන් මංගල පැනය අසනු කැමතිව, මේ එකම සක්වළෙහි රැස්වී, එකම සක්වළෙහිම කෙළවර පටන් ලද ඉඩ පමණින්, දහයක්, විස්සක්, තිහක්, හතළිහක්, පනහක්, හැටක්, හැත්තෑවක්, අසූවක් තරම් සියුම් රූ මවාගෙන සිටි සියළු දෙව්බඹමරුන් අබිබවා, සිරියෙන්ද, තේජසින්ද බබළමින්, පණවන ලද උතුම් බුදු අසුනෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ පිරිවර සමග දැක, ඒ කාලයෙහි මෙන්ම අනාගතයෙහිද මුළු දඹදිව මිනිසුන්ගේ සිතිවිලි, සැක දැන, සියළුම දෙව් මිනිසුන්ගේ සැකය නැමති උල උදුරාදමනු පිණිස, ඒ දේවතාවා (මෙසේ) කීය. 'බොහෝ දෙවියෝ ද, මිනිස්සු ද මංගල කරුණු යහපතට හේතු සිතූහ. ඒ සුවදායී බව කැමති වූවන්ට ඒ දෙවියන්ගේ අනුමැතියෙන්ද - මිනිසුන්ගේ උපකාරයෙන්ද මා විසින් අසන කරුණු වේද, අපට ඒකාන්ත වූ හිතසුව ගෙනදෙමින්, ඒ යහපත් දේ ඔබවහන්සේ අනුකම්පාකොට වදාරනු මැනව.'

මෙසේ ඒ දෙව්පුතුගේ වචනය අසා, භාග්‍යවතුන් වහන්සේ **අසෙවනාච බාලානං** යන ගාථාව කීහ. **අසෙවනා** ඇසුරු නොකිරීම, සහ සබඳතා නොපැවැත්වීම, **බාලානං** බලය (ජීවත්වීමේ) ඉහළට ගනු ලබන්නෝ, ඔවුහු හුස්ම ඉහළ පහළ කරන පමණින් ජීවත් වෙති. නුවණින් ජීවත් නොවෙතියි අදහසයි. එබඳු නුවණ නැති තැනැත්තන්, **පණ්ඩිතානං** පණ්ඩිත බව ඇත්තන් - පණ්ඩිතයන්, මෙලොව පරලොව වැඩදායී කරුණු කෙරෙහි නුවණින් කටයුතු කරන්නන් මෙහි අදහස් වේ. එබඳු නුවණැත්තන් **සෙවනා** ඇසුරු කිරීමෙන්, සහ සබඳතා පැවැත්වීමෙන්, ඔවුන් හා සහයෝගීතාවයෙන්, සමීප වීමෙන්, පූජා ගරුබුහුමන් කිරීමෙන් හා වැඳීමෙන්, **පූජනීයානං** එසේ පිදීමට සුදුසු තැනැත්තන්, **එතං මංගලමුත්තමං** අනුවණයන් හා ඇසුරක් නොවේද, පණ්ඩිතයන් හා යම්බඳු ඇසුරක් වේද, ගරුබුහුමනට සුදුස්සන්ට පූජා කරයිද, ඒ සියළු කරුණු එක්කොට එතං මංගලමුත්තමං යැයි වදාළහ. ඒවා යහපත් කරුණු ලෙස ගතයුතු යැයි කියන ලදී. මේ ඒ ගාථාවේ වචනවල අදහසයි.

එහි විස්තර මෙසේ දතයුතුය. ඒ දෙව්පුතුගේ වචනය අසා භාග්‍යවතුන් වහන්සේ මෙම ගාථාව වදාළහ. **පුච්ඡිත කථා, අපුච්ඡිත කථා,**

සානුසන්ධි කථා, අනනුසන්ධි කථා යැයි අදාළ වන කථා සතරාකාරය. 'මහපොළව සේ පැතිරුණු මහා නුවණැති ගෝතමයන් වහන්ස, යහපත් සාවකයෙකු (අනුගාමිකයෙකු) වීමට කෙසේ කටයුතු කළයුතුද?' 'පුච්ඡාමි තං ගොතම භූරිපඤ්ඤ කථං කරෝ සාවකො සාධු හොති' යැයිද 'නිදුකාණෙනි, ඔබවහන්සේ කෙසේ සැඩපහර තරණය කළෙහිද? 'කථං නු ත්වං මාරිස ඔඝමතරී' මේ ආදී තැන අසන ලද අදහසින් පුච්ඡිත කථා වේ. 'වෙනත් තැනැත්තන් යම් දෙයක් සැපය සේ කියත්ද, බුදුවරු ආදී උතුමෝ එය දුක සේ කියති' - 'යං පරෙ සුඛතො ආහු, තදරියා ආහු දුක්ඛතො' - 'මෙබඳු තැන නොඅසන ලද නමුත්, තම අදහස අනුව කියන ලද දේ අපුච්ඡිත කථා ය. සියළුම බුදුවරුන්ගේ කතා, 'මහණෙනි, මම කරුණු සහිතව (තැනට උචිත පරිදි) හේතු ඇතිව දහම් දෙසමි' - සනිදානාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි' - දක්වන ලද පරිදි සානුසන්ධිකථා නම් වේ. (එයට වෙනස්වන) අනනුසන්ධිකථා මේ සසුනෙහි නැත. මෙබඳු කථා අතරින්, මේ දෙව්පුතු විසින් අසන ලදුව, භාග්‍යවතුන් වහන්සේ වදාරන ලද බැවින් මෙය පුච්ඡිත කථා ලෙස ගැනේ. යහපත් මග, අයහපත් මග ගැන විමසීමේදී, වියත් තැනැත්තෙක් මුලින් අත්හළ යුතු මග කියා පසුව යායුතු මග කියයි. 'අසවල් නම් තැන මාවත් දෙකක් වෙයි. එහි වම් පැත්තට ඇති මාවත හැර දකුණුපසට ඇති මාවතෙහි යව'යි පහදා දෙයි. මෙසේම ඇසුරු කළයුතු හා ඇසුරු නොකළයුතු අයුරු කියා දී, ඇසුරු කළයුතු දෙය පැවසිය යුතුය. භාග්‍යවතුන් වහන්සේද මග කියාදීමෙහි සමත් තැනැත්තෙකු වැනිය. 'තිස්ස, මග කියාදීමෙහි සමත් තැනැත්තෙකු යනු, තථාගත අරහත් සම්මා සම්බුදුන්ට සමාන වචනයකි. මේ ලෝකය පිළිබඳවත්, පරලොව පිළිබඳවත්, මරණයට යටත් පෙදෙස ගැනත්, මරණය නොමැති පෙදෙස ගැනත්, මාරයාට යටත් පෙදෙස ගැනත්, මාරයාට යටත් නොවන පෙදෙස ගැනත් කියාදීමට තථාගතයන් වහන්සේ සමත්වෙති'යි එසේ හෙයින් කියන ලදී. 'පුරිසො මග්ගකුසලොති ඛො තිස්ස, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මා සම්බුද්ධස්ස, සොහි කුසලො ඉමස්ස ලොකස්ස, කුසලො පරස්සලොකස්ස, කුසලො මච්චුධෙය්‍යස්ස, කුසලො අමච්චුදෙය්‍යස්ස, කුසලො මාරධෙය්‍යස්ස, කුසලො අමාරදෙය්‍යස්ස' - එහෙයින් පළමුකොට, ඇසුරු නොකළ යුතු දේ ගැන පැහැදිලි කරමින්, අසෙවනාච බාලානං පණ්ඩිතානඤ්ච සෙවනා යැයි කීහ. අත්හළ යුතු මග මෙන්ම, මුලින්ම නුවණැත්තන් ඇසුරු නොකළ යුතුය. ඒ අනුව යා යුතු මාවත මෙන්, නුවණ ඇත්තන් ඇසුරු කළ යුතුය. සහසබඳතා පැවැත්විය යුතුයැයි වදාළහ.

කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින්, මංගල කරුණු කීමේදී මුලදීම නුවණ නැත්තවුන් ඇසුරු නොකිරීම හා නුවණැත්තන් ඇසුර ගැන වදාරන ලදද? (යම් කරුණක් නිසි පරිදි වටහාගත නොහැකි) අනුවණයන් ඇසුරින් දෙවියෝද මිනිස්සු ද දක්නා ලද නොදක්නා ලද දේ මංගල යැයි යහපත් යැයි පිළිගත්හ. එයද අයහපත් කරුණකි. එහෙයින් ඔවුනට මෙලොවත්, පරලොවත් දියුණුව නොපවත්නා හෙයින්ද, දෙලොවම දියුණුව උදෙසා යහපත්, කලණ මිතුරු ඇසුර පසසමින්ද, භාග්‍යවතුන් වහන්සේ විසින් මුලින්ම, නුවණ නැත්තන් ඇසුරු නොකිරීමද, නුවණැත්තන් ඇසුරද වදාරණ ලදී.

එම ගාථාවෙහි බාලා නම්, පරපණ නැසීම ආදී අයහපත් කටයුතුවල යෙදුණු පුද්ගලයෝ වෙති. ඔවුන් තුන් ආකාරයෙන් දතයුතුය. 'මහණෙනි, බාලයන් හඳුනාගැනීමේ ලකුණු තුනකැ'යි සූත්‍ර සඳහනයි. 'තීණිමානි භික්ඛවෙ බාලස්ස බාලලක්ඛණානි' ඒ අතර, පූරණ කස්සප ආදී සමයවාදී නායකයන් හයදෙනා - දෙව්දත්, කොකාලික, කටමොරකතිස්ස, ඛණ්ඩදෙවියා පුත්ත, සමුද්දදත්ත, චිඤ්චමාණවිකාව ආදීහු වෙති. අතීතයෙහිදී දීඝවීදගේ සහෝදරයා යන මෙබඳු වෙනත් තැනැත්තෝ බාලයන් යැයි දතයුතුය. ඔවුහු ගින්නෙහි දිලෙන අඟුරු මෙන් තමන් වැරදි ලෙස කටයුතු කිරීමෙන් තමාද, තමන් කියන පරිදි කටයුතු කරන්නන්ද වනසති. එසේම දීඝවිදගේ සොහොයුරා බුදුවරුන් සිවුදෙනෙකුගේ කාලය තුල, සැටයොදුනක් පමණ වූ සිරුරක් ලැබ, උඩුයටිකුරු වෙමින් මහා නිරයෙහි පැසෙයි. එමෙන්ම ඔහුගේ හැඟීම්වලට කැමති වූ පවුල් පන්සියක පිරිසද ඔහු සමග එක්ව, මහා නිරයෙහි පැසෙති. මෙසේද කියන ලදී. 'යම්සේ, බටකොළ සෙවිළි කළ හෝ තණ (ඉළුක්) සෙවිලි කළ ගෙයක් මෙන්ම මැනවින් පාට ආලේප කළ, පිරිසිදු වාතය ලැබෙන, වාකවුළු වසන ලද කුළුගෙවල් සහිත ගෙයක් වුවත්, ඇවිලෙන ගින්නෙන් දවයිද, එමෙන්ම මහණෙනි, යම් බියක් ඇතිවන්නේ නම්, ඒ සියළුම බිය අනුවණ බව නිසාම හටගනී. වියත් නුවණැති බවින් නොවේ. යම් උවදුරක් හටගනීද, යම් හිරිහැරයක් හටගනීද, ඒ අනුවණ බව නිසාවෙති. මහණෙනි, මේ අනුව බාලයා බයෙන් යුතුය. පණ්ඩිතයා බයෙන් තොරය. බාලයා උවදුරු සහිතය. පණ්ඩිතයා උවදුරු රහිතය. ඒ බාලයා හිරිහැර ලබයි. නුවණැත්තා හිරිහැරවලින් තොරය. 'සෙය්‍යථාපි භික්ඛවෙ නළාගාරො වා, තිණාගාරොවා අග්ගිමුක්කො කූටාගාරානිපි දහති, උල්ලිත්තාවලිත්තානි නිවාතානි ඵුසිතග්ගලානි පිහිතවාතපානානි,

එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි භයානි උප්පජ්ජන්ති, සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතො, යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති -පෙ- යෙ කෙචි උපස්සග්ගා -පෙ- නො පණ්ඩිතො, ඉති ඛො භික්ඛවෙ සප්පටිභයො බාලො, අප්පටිභයො පණ්ඩිතො, සඋපද්දවො බාලො, අනුපද්දවො පණ්ඩිතො, සඋපස්සග්ගො බාලො, අනුපස්සග්ගො පණ්ඩිතො' - තව ද අනුවණ බාලයා කුණු වූ මාළු වැනිය. ඔහු ඇසුරු කරන්නා කුණුමාළු දවටනයක් හා සමානය. වියතුන් විසින් ඉවත හළයුතු, පිළිකුල් කටයුතු ලෙස බාලයන් ඇසුරු කරන්නාද සැළකෙයි. ඒ ගැන මෙසේද කියා ඇත.

පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති
කුසාපි පූති වායන්ති, එවං බාලූපසෙවනා

යම් තැනැත්තෙකු කුණු වූ මාළු කුසතණවලින් දවටා ගෙන යයිද, ඒ කුසතණද ගඳ ගසයි. බාලයන් ඇසුරද එසේය.

සක්දෙවිඳුන් විසින් වර දෙනු ලබද්දී, අකිත්ති පණ්ඩිතයෝද මෙසේ කීහ. 'බාලයකු - අනුවණයෙකු ඇසුරු නොකරන්නෙමි' 'බාලයා (වෙනත් කෙනෙකු) කියන හොඳ දෙයකට ඇහුම්කන් නොදෙන්නේය. බාලයා සමග එකතුවීමක්, කතාබහක් නොකරන්නේය. ඊට කැමති නොවන්නේය.'

'බාලයා ඔබට කුමක් කළේද? කස්සප, ඊට කරුණු කිව මැනවි. කවර හෙයින් ඔබ අනුවණයාගේ දැක්ම කැමති නොවන්නෙහිද?'

'අනුවණ බාලයා (අන් හැම) විපතට පමුණුවයි. අයහපතෙහි යොදවයි. ඔහු උතුම්කොට සලකන්නේ අයහපත් දේ කිරීමයි. හොඳ දෙයක් කී විට කිපෙයි. ඔහු හික්මීම නොදනී. එවැනි කෙනෙකු නොදැක සිටීම මැනවි.'

බාලං න පස්සෙ න සුණෙ න ච බාලෙන සංවසෙ
බාලෙන'ල්ලාපසල්ලාපං න කරෙ න ච රොචයෙ

කින්නු තෙ අකරා බාලො වද කස්සප කාරණං
කෙන කස්සප බාලස්ස දස්සනං නාභිකංඛසී

අනයං නයති දුම්මෙධො අධුරායං නියුඤ්ජති
දුන්නයො සෙය්‍යසො හොති, සම්මා වුත්තො පකුප්පති,
විනයං සො න ජානාති සාධු තස්ස අදස්සනං

මෙසේ භාග්‍යවතුන් වහන්සේ හැම ආකාරයෙන්ම අයහපත් තැනැත්තන්ගේ ඇසුර ගරහමින්, ඒ බාලයන් ඇසුරු නොකිරීම මංගල කරුණකැයි කියා, දැන් නුවණැත්තන් ඇසුර පසසමින් පණ්ඩිතානඤ්ච සෙවනා මංගලං යැයි කීහ.

පණ්ඩිතයෝ නම්, යම්කිසිවෙක්, පරපණ නැසීමෙන් වැළකීම ආදී දසකුසල් දහමෙහි හැසිරෙන පුද්ගලයෝ වෙති. තුන් ආකාරයකින් ඔවුන් දතයුතුය. 'මහණෙනි, පණ්ඩිතයාගේ ගති ලකුණු තුන් ආකාරය'යැයි සූත්‍ර දේසනයෙහි දැක්වෙන්නේ එහෙයිනි. 'තීණිමානි භික්ඛවෙ පණ්ඩිතස්ස පණ්ඩිත ලක්ඛණානි' - තවද, බුදු, පසේබුදු, අසූමහ සව්වන්, වෙනත් තථාගත සවුවන්, සුනෙත්ත, මහාගොවින්ද, විධුර, සරභංග, මහොසධ, සුතසොම, නිමිරජ, අයොඝර කුමරු, අකිත්ත පණ්ඩිත ආදීහු නුවණැත්තෝ වෙති. ඔවුහු බියෙහිදී රැකවරණයද, අඳුරට පහනක් මෙන් ද, සා පිපාසාදී දුක් මැඩලීම පිණිස ආහාරපාන ලබාදීමද, තම අවවාද පරිදි කටයුතු කරන්නන්ගේ සියළු බය උවදුරු දුරුකිරීමට සමත් වූවෝ වෙති. එසේම, අපමණ වූ, ගිණිය නොහැකි තරම් දෙව් මිනිස්සු තථාගතයන් වහන්සේ වෙතට පැමිණ කෙලෙසුන් නැසූ බවට පත්වූහ. (මරණින් පසු) බඹලොව පහළ වූහ. දෙව්ලොව පහළ වූහ. සැප ඇති තන්හි - සුගතියෙහි උපන්හ. සැරියුත් තෙරුන් කෙරෙහි සිත පහදවා සිවුපසයෙන් උවටැන්කොට පවුල් අසූදහසක පිරිස දෙව්ලොව උපන්හ. මහමුගලන්, මහ කසුප් ආදී පටන් සියළුම මහ සව්වන් කෙරෙහිද සිත පහදවා, සිවුපසයෙන් උවටැන් කළෝද, එසේම වූහ. සුනෙත්ත බුදුරදුන්ගේ සව්වන්ගෙන් ඇතැම් කෙනෙක් බඹලොව පහළ වූහ. ඇතැම් කෙනෙක් පරනිම්මිත වසවත්ති දෙව්ලොවද ඇතැම් කෙනෙක් ගැහැවි මහසල් කුලවලද උපන්හ. මෙසේද සඳහන් කරන ලදී. 'මහණෙනි, නුවණැත්තාගෙන් බියක් නොවේ. නුවණැත්තාගෙන් උවදුරු නොවේ. නුවණැත්තාගෙන් කරදර නොවේ' යැයි (මෙසේද වදාරා ඇත.) 'නත්ථි භික්ඛවෙ පණ්ඩිතතො භයං, නත්ථි පණ්ඩිතතො උපද්දවො, නත්ථි පණ්ඩිතතො උපස්සග්ගො' තවද, යම් පුද්ගලයෙකු තුවරලා සුවඳ ජාති ගෙන යයිද, එම බඳුනෙන්ද, දවටනයද සුවඳ හමයි. නුවණැත්තන් හා ඇසුරද එබඳුය. වියතුන් හා ඇසුර සිත ඇළම් කරයි.

තගරඤ්ච පලාසෙන යො නරො උපනයහති
පත්තාපි සුරභි වායන්ති එවං ධීරූපසෙවනා

සක්දෙවිඳුන් විසින් වර දෙනු ලබද්දී, අකිත්ති පණ්ඩිතයෝද මෙසේ පැවසූහ.

නුවණැත්තෙකු ඇසුරු කරන්නේය, ඔහු කියන හොඳ දෙයට සවන් දෙන්නේය. නුවණැත්තා සමග එකමුතුව ඇසුරු කරන්නේය. නුවණැත්තා සමග සතුටුසාමීචි, කතාබහ කරන්නේය. ඊට කැමති වන්නේය.

'නුවණැත්තා ඔබට කුමක් කළේද? ඊට කරුණු කිව මැනව, කවර හෙයින් නුවණැත්තාගේ දැක්ම කැමති වන්නෙහිද?'

'නුවණැත්තා සැපයට පමුණුවයි. යහපතෙහි යොදවයි. ඔහු උතුම්කොට සළකන්නේ යහපත් දේ කිරීමයි. හොඳ දෙයක් කී විට නොකිපෙයි. ඔහු හික්මීම දනී. ඔහු සමග එක්ව සිටීම මැනවි.'

ධීරං පසෙස සුණෙ ධීරං, ධීරෙන සහ සංවසෙ
ධීරෙනලලාපසලලාපං තං කරෙ තඤ්ච රොචයෙ

කිනනු තෙ අකරා ධීරො වද කසසප කාරණං
කෙන කසසප ධීරසස දසසනං අභිකංඛසි

නයං නයති මෙධාවී අධුරායං න යුඤ්ජති
සුනයො සෙයාසො හොති සමමා වුතෙතා න කුපපති
විනයං සො පජානාති සාධු තෙන සමාගමො

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, හැම ආකාරයෙන්ම පණ්ඩිතයන්ගේ ඇසුර පසසමින්, පණ්ඩිත ඇසුර යහපත් කරුණකැයි කියා, මීළඟට අනුවණ ඇසුරද, නුවණැත්තන් ඇසුරද, පිදිය යුත්තන්ට පිදීම පසසමින් පූජාච පූජනීයානං එතං මංගලමුත්තමං යැයිද වදාළහ. කිසිදු ලෙසකින් වැරදි නැති බැවින්ද, සියළු යහගුණයෙන් යුතු බැවින්ද භගවත් බුදුරජාණන් වහන්සේලාද, ඒ හැර පසේබුදුවරු, මගපල ලත් අරිය සාවකයෝ පිදිය යුත්තෝ වෙති. ඒ උතුමනට කරන ලද මඳ වූ පූජා දිගුකලක් හිතසුව පවතී.

සුමන මල්කරු, මල්ලිකාවන් ආදීන් නිදසුන්ය. එහි එක් නිදසුනක් පමණක් කියමු.

භාග්‍යවතුන් වහන්සේ එක් දවසක් උදෑසන, හැඳපොරවා, පාසිවුරු ගෙන රජගහනුවර පිඬු පිණිස පිවිසියහ. එවිට සුමන නම් මල්කරු මගධ රජුට මල් ගෙන යද්දී, බුදුසිරින් බබළන, දුටුවන් පැහැදෙන, පහදනසුළු භාග්‍යවතුන් වහන්සේ නගර දොරටුවට පැමිණෙනු දුටුවේය. දැක මෙසේ සිතීය. 'රජතුමා මල් ගෙන කහවණු සියයක් හෝ දහසක් හෝ දෙන්නේය. භාග්‍යවතුන් වහන්සේට කරන පූජා අපමණ වූ කිව නොහැකි පරිදි පලදායීව දිගුකලක් හිතසුව පිණිස වෙයි. එබැවින් මම මේ මල්වලින් භාග්‍යවතුන් වහන්සේට පූජා කරමි'යි පැහැදුණු සිතින් එක් මල්මිටක් ඉදිරියට දැමීය. එය අහසට නැගී බුදුරදුන් මතුයෙහි මල් වියනක් සේ සැදුණි. මල්කරු ඒ අසිරිමත් බලය දැක, වඩාත් පැහැදුණු සිතින් නැවත තවත් මල් මිටක් දැමීය. එය මල් ආවරණයක් සේ සැදුණි. මෙසේ මල් අටමිටක්ම දැමීය. ඒවා මල්කුළුගෙවල සේ සෑදුණි. භාග්‍යවතුන් වහන්සේ කුළුගෙයක් තුළ වැඩසිටිනා සේ විය. මහජනයාද රැස්විය. භාග්‍යවතුන් වහන්සේ මල්කරු දෙස බලමින් සිනා පහළ කළහ. 'බුදුවරු නිකරුනේ සිනා පහළ නොකරති'යි සිතූ අනඳ හිමි සිනහ පහළ කිරීමට හේතුව විමසීය. 'ආනන්ද ඒ මල්කරු මෙම පූජාවේ බලයෙන් සියදහසක් දෙව් මිනිස් ලොව සැරිසරා, අවසන මුනිසසර නම් පසේබුදු වන්නේ යැයි භාග්‍යවතුන් වහන්සේ පැවසූහ. ඒ වචන අවසාන වත්ම දහම් දෙසනු පිණිස මේ ගාථාව කීහ. 'යම් දෙයක් කළ පසුව පසුතැවිලි නොවේද, එවැනි කටයුතු යහපත්ය. එයින් සතුටු සිත් ඇතිව යහපත් දේ කිරීමෙන් ලද පල ඇසුරු කරයි. (යහපත් පල ලබයි.)

"තඤ්ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවති"

ගාථාව අවසානයෙහි අසූහාර දහසකට දහම් අවබෝධ විය. මෙසේ මද වුවත් පූජා කිරීමෙන් ඔවුන්ට දිගුකලක් හිතසුව පිණිස වේයැයි දතයුතුය. ඒ ආමිස පූජාවය. එසේනම් දහම් පිළිවෙත් පිළිපැදීම ගැන (පටිපත්ති පූජා) කිසිදු වාදයක් නැත. (තෙරුවන්) සරණ යෑමෙන්, සිකපද පිළිගැනීමෙන් (රැකීමෙන්), අටසිල් ආදී පෙහෙවස් සමාදානයෙන්, සිවු පිරිසිදු සීලාදියෙන් යුතු තම ගුණගරුක පිළිවෙතින් කිසියම් කුලපුත්හු

භාග්‍යවතුන් වහන්සේට යම් පූජා කරති. කවරෙක් ඔවුන්ගේ පූජාවෙහි පලය අගය කරත්ද? ඔවුන් තථාගතයන් වහන්සේට උතුම් වූ පූජාවෙන්ම පූජා කරතියි කියන ලදහ. 'ආනන්ද, යම් මහණක හෝ, මෙහෙණියක හෝ උවසුවෙක් හෝ උවැසියක හෝ දහමට අනුව පිළිවෙත්හි පිහිටා මනා දිවිපැවැත්මෙන් යුතුව, දහමට අනුව හැසිරෙයි ද, වාසය කරයි ද ඔහු තථාගතයන්ට සත්කාර කරයි. ගරු කරයි. උතුම් පූජාවෙන් පූජා කරයි.' 'යො ඛො ආනන්‍ද, භික්ඛු වා, භික්ඛුනි වා උපාසකො වා උපාසිකා වා, ධම්මානුධම්මපටිපන්නො විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තථාගතං සක්කරොති, ගරු කරොති, මානෙති, පූජෙති පරමාය පූජාය' මේ අනුසාරයෙන්, පසේ බුදුවරුනට, මගපලලත් ආරිය සව්වන්ටද පූජා කිරීමෙහි හිතසුව වේයැයි දතයුතුය. එමෙන්ම ගැහැවියන් අතුරෙන් වයසින් බාල - කණිටු වූවන් දෙටු සොයුරුටද සොහොයුරියටද පිදිය යුතු වේ. පුතු විසින් මවුපියන්ට ද - කුලවමිය විසින් හිමියා සහ නැදිමයිලන්ද මෙසේ පිදිය යුතු බව දතයුතුය. මොවුනට කරන පූජා කුසල් දහම් යැයි කියන ලද බැවින්, දිගුකලක් ජීවත්වීම ආදී දියුණුවට හේතුවන නිසා යහපත් කරුණු වේමය. 'යම් තැනැත්තෝ මවුවරුන්ට ගරු කරන්නෝද, පියවරුනට ගරු කරන්නෝද, මහණුන්ට, උසස් දැහැමි දිවි පෙවෙතක් ගතකරන්නවුන්ට, පවුලෙහි වැඩිහිටියන්ට ගරු බුහුමන් කරත්ද, ඔවුහු මේ කුසල් දහමට අනුව පවතින්නාහ. ඒ කුසල් දහම්හි යෙදීමේ හේතුවෙන් දිගුකල් ජීවත්වෙති. (සිරුරු) පැහැයෙන් වැඩෙති' - 'යෙ තෙ මත්තෙය්‍යා භවිස්සන්ති, පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලජෙට්ඨාපචායිනො, ඉමං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති, තෙ තෙසං කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති, වණ්ණෙනපි වඩ්ඪිස්සන්ති'• ආදී ලෙසින් දක්වා ඇත.

මෙසේ මේ ගාථාවෙන් බාලයන් ඇසුරු නොකිරීමත්, පණ්ඩිතයන් ඇසුරු කිරීමත්, පිදිය යුත්තන් පිදීමත් යන යහපතට හේතුවන කරුණු

---

• මේ වැකි අතරට මෙම කොටස විද්‍යාදය පොත්ගුලෙහි සිංහල අකුරින් දැක්වෙන සුත්තනිපාත අටුවාවේ සඳහන් බව (මෙම සිංහලට නැගීමේ මුල් ඇසුර වන) හේ.වි. අටුවා සංස්කරණයේ 253 පිට අධෝ ලිපියක ඒ 'ඉදානි යස්මා යං යත්ථ මංගලං වත්තබ්බං තං තස්ස මංගලත්තං විභාවයෙ ඉති මාතිකා නික්ඛිත්තා තස්මා ඉදං වුච්චති' (දැන් යම්හෙයකින් යම් තැනකදී, මංගල කරුණු වෙන්කොට, එය යහපත් බවට ඒ දේවතාවට කරුණු විස්තර කිරීමේදී සිරස්තල ඉදිරිපත් කරන ලදී. එහෙයින් 'මේ යනුවෙන් කියනු ලැබේ.)

තුනක් කියන ලදී. ඒ අනුව බාලයන් ඇසුරු නොකිරීමෙන්ද බාලයන් ඇසුර නිසා වන බියෙන් රැකවරණය ලැබීමෙන් දෙලොවටම වැඩදායී වන බැවින්ද පණ්ඩිත ඇසුර හා පිදිය යුත්තන් පිදීම යහපත් පලගෙන දෙන බැවින්ද, කී පරිද්දෙන්ම නිවන සුගතිය පිණිස හේතුවන බැවින්ද 'මංගල' යැයි දතයුතුය. ඉදිරියට සිරස්තල (මාතිකං) නොදක්වාම, මංගල කරුණු පමණක් නියමකොට කියන්නෙමි, එහි යහපත් බව පැහැදිලි කරන්නෙමි.

**අසෙවනාච බාලානං යන මේ ගාථාවෙහි අරුත් විවරණය නිමියේය.**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, බ්‍රෑහි මංගල මුත්තමං යැයි (දේවතාවා) එක් කරුණක් ගැන අදහස් කළ ද, සුළු දෙයක් ඉල්ලූ කෙනෙකුට බොහෝ දේ දෙන උදාර මිනිසෙකු මෙන්, එක් ගාථාවකින් මංගල කරුණු තුනක් කියා, ඊටත් වැඩියෙන් දේවතාවුන්ට අසනු පිණිසද, යහපත බලාපොරොත්තු වන්නන්ට යම් යම් ආකාරයෙන් ගැළපේද, ඒ ඒ පුද්ගලයන් එම යහපතෙහි යොමුකරනු කැමතිවද **පතිරූපදෙසවාසො** ආදී ගාථාවලින් නැවතද නොයෙක් යහපත් කරුණු පැවසීම ඇරඹූහ.

එහි පළමු ගාථාවෙහි **පතිරූපො** සුදුසු, **දෙසො** කිසියම් මිනිසුන් වසන ගම, නියම්ගම, නගරය, ජනපදය වේ. **වාසො** එහි වාසය කිරීමයි. **පුබ්බෙ** පෙර, ඉපදුණු අතීත භවවලදී **කතපුඤ්ඤතා** රැස්කරන ලද කුසල් අතතා සිතට කියනු ලැබේ. මුළු ජීවිතයම හෝ, **සම්මා පණිධි** එහි තමා මනා පිහිටුවා ගැනීමයි. යෙදීම - පැවතීම කියන ලදි. ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය. මෙය මෙහි වචනවල තේරුමයි.

විස්තර මෙසේ දතයුතුය. **පතිරූප දෙසවාසො** යම්තැනක සිවු පිරිස වසත්ද, දන් පිරිනැමීම ආදී පින් කරගත හැකි ඉඩක් වේද, බුදුරදුන්ගේ නව වැදෑරුම් සසුන බබළයිද, එහි වැසියන්ට පින්කර ගැනීමට හේතු වන බැවින් මංගල යැයි කියනු ලැබේ. සිංහල දිවයිනට පිවිසි මසුන් මරන්නන් ආදීන් නිදසුන්ය. වෙනත් අයුරින් කිවහොත්, **පතිරූපදෙසො** නම් භාග්‍යවතුන් වහන්සේගේ බෝමැඩ පෙදෙසයි. දම්සක් පවත්වන ලද පෙදෙසයි. දොළොස් යොදුනක් පැතිර සිටි පිරිස මැද, සියළු මිසදිටු සමණවාදීන්ගේ අදහස් බිඳ යමාමහ පෙළහර දක්වන ලද ගඬඹරුක්මුල්

පෙදෙසයි. දෙව්ලොවින් පොළවට බට පෙදෙසයි. සැවැත්පුර, රජගහනුවර ආදී බුදුරජාණන් වහන්සේ ආදී උතුමන් විසූ අනෙක් පෙදෙස්ය. එහි නිවැසි මිනිස්සු උතුම් අරිය වූ ලැබීම් හයක් හේතුවෙන් මංගල යැයි කියනු ලැබේ. තවත් ආකාරයකට කියන්නේ නම්, නැගෙනහිර දෙසින් කජංගල නම් නියම්ගමක් ඇත. එයින් බටහිර දෙස මහාසාලා නම් ගමය. එයින් එහා මැද ඉතා දුරින් ජනපද පිහිටියේය. දකුණු නැගෙනහිර (ගිනිකොණ) දෙසින් සලලවතී නම් ගඟත්, එයින් හා මැද ඇත ජනපද පිහිටියේය. දකුණු දෙසින් සෙතකණ්ණිකා නම් නියම් ගමත් එයින් එහා මැද ඇත ජනපද පිහිටියේය. ථූන නම් බමුණුගම බටහිර දෙසින්ද, ඉන් එහා මැද ඉතා දුරින් පිහිටි ජනපද වේ. උතුරුදෙසින් උසිරද්ධජ නම් පව්ව හා එයින් එහා මැද ඇත පිහිටි ජනපද ඇත්තේය. මේ (දඹදිව) මැද පෙදෙසයි. දිගින් යොදුන් තුන්සියයක්ද, පළලින් යොදුන් දෙසිය පණහක්ද මුළු වටපමණින් යොදුන් නවසියයක්ද වන මැද (මජ්ඣිම) දේසය පිහිටියේය. සුදුසු පෙදෙස මෙය වෙයි. මේ මහා දිවයින් සතරටද කුඩා දිවයින් දෙදහසටද බලය පතුරුවන සක්විති රජවරු උපදනාහ. එක් අසංඛයකුත් කප් සියදහසක් පාරමිතා පුරා සැරියුත්, මුගලන් ආදී මහසව්වෝ උපදනාහ. අසංඛෙය්‍ය දෙකකුත් කප් සියදහසක් පාරමිතා පුරා පසේබුදුවරු උපදනාහ. අසංඛෙය්‍ය හතරක්, අසංඛෙය්‍ය අටක් හෝ අසංඛෙය්‍ය දහසයකුත් කප් සියදහසක් පාරමී පුරා සම්මා සම්බුදුවරු උපදනාහ. මිනිස්සු සක්විති රජුගේ අවවාද ලබා පන්සිල් පිහිටා (මරණින් මතු) දෙව්සැප ලබති. එසේම පසේ බුදුවරුන්ගේ ද අවවාදයෙහි පිහිටා දෙව් සැප ලබති. සම්මා සම්බුදු, බුදු සව්වන්ගේ අවවාදයෙහි පිහිටා දෙව් සැපද නිවනද ලබති. එහෙයින් එබඳු පෙදෙසක විසීම මෙම සම්පතට හේතුවන බැවින් මංගල යැයි කියනු ලැබේ.

**පුබ්බෙ කතපුඤ්ඤතා** නම් පෙර ඉපිද සිටි කල්හී, බුදු, පසේබුදු මහරහතුන් වහන්සේලා අරබයා රැස්කරන ලද කුසල්ය. එය මංගල කරුණක් වන්නේ කුමක් නිසාද? බුදු, පසේබුදුවරු හමුවීමෙන්, දැක හෝ බුදුවරුන්ගෙන් හෝ බුදු සව්වන් හමුව හෝ පද සතරකින් යුතු ගාථාවක් ඇසීමෙන් අවසානයේ රහත් පලයට පැමිණිය හැකි හෙයිනි. යම් මිනිසෙක්, පෙර කරන ලද මහත් කුසල් බලයෙන්, විදසුන් උපදවා, මහා කප්පින රජු මෙන් ද, අගමෙහෙසිය මෙන් ද කෙලෙස් දුරුකරති. එහෙයින් පෙර කරන ලද පින් ඇති බව යහපතකි.

**අත්තසම්මා පණිධි** මේ ලෝකයේ ඇතැම් කෙනෙක් තමන් දුසිල්ව සීලයෙහි පිහිටුවයි. සැදැහැ නොමැතිව, සැදැහැ සම්පතෙහි පිහිටුවයි. මසුරු බව හැර දීමෙහි පිහිටුවයි. මෙය තමන් (ජීවිතය) මැනවින් පිහිටුවා ගැනීමයි. එයද මංගල කරුණක් වන්නේ කුමක් හෙයින්ද? මෙලොවත් මරණින් පසුවත් තරහ නැතිකම ආදී නොයෙක් යහපත් පල ලබන බැවිනි.

මෙසේ මෙම ගාථාවෙන්ද, සුදුසු පෙදෙසක විසීම, පෙර කරන ලද පින් ඇති බව තමාගේ ජීවිතය මනාව පිහිටුවා ගැනීම යැයි මංගල කරුණු තුනක් කියන ලදී. ඒවා යහපත සිදුකෙරෙන අයුරු ඒ ඒ තැන්හි පැහැදිලි කර ඇත.

**පතිරූපදෙසවාසො යනාදී මේ ගාථාවෙහිද අරුත් විවරණ නිමියේය.**

මීළඟට **බාහුසච්චඤ්ච** ගාථාවයි. බාහුසච්ච යනු බොහෝ (යහපත් කරුණු) අසා ඒ අනුව දිවිය සකස්කර ගැනීමයි. **සිප්පං** කිසියම් අත් හුරුවීමකි. **විනයො** (කය සිත) හික්මවා ගැනීම, **සුසික්ඛිතො** මනාව සංවර වීම, **සුභාසිතා** මැනවින් කියන ලද, යා අනියම් ලෙස දැක්වීමයි. වාචා වහරන වචන, ඉතිරි කරුණු ඉහත කී පරිදිය. මේ මෙහි වචනවල තේරුමයි.

එහි විස්තර මෙසේ දතයුතුයි. අසන ලද දේ හොඳින් සිත්හි දරා ගනිමින් ඒ අනුව පුරුදු පුහුණු වීම බාහුසච්ච නම් වේ. 'සුතධරො හොති සුත සන්නිචයො' - 'මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් සූත්‍ර, ගාථා, විස්තර කොටස් කරුණු පැහැදිලිකොට ඇති අයුරු (නවංග සත්‍ථු සාසන) මනාව අසන ලද්දේ' යැයි 'ඉධෙකච්චස්ස බහු සුතං හොති, සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං' මේ ආදී නයින් බුදුරජාණන් වහන්සේ විසින් සසුනෙහි මනා පිහිටි බව පසස්නා ලදී. එය අකුසල් නැති කරමින්, කුසල් රැස්කර ගනිමින්, අනුපිළිවෙලින් සිවුසස් අවබෝධ කරගැනීමට හේතුවන බැවින් මංගල යැයි කියනු ලැබේ. 'මහණෙනි, මනාව අසා (ඒ අනුව) කටයුතු කරන අරිය සාවකයා අකුසලය දුරුකරයි. කුසලය දියුණු කරයි. වරද ඉවතලයි. නිවැරදි දේ පුරුදු කරයි. තම පිරිසිදු බව පවත්වා ගනී'යැයි 'සුතවා ච ඛො භික්ඛවෙ අරියසාවකො අකුසලං පජහති, කුසලං භාවෙති,

සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධමත්තානං පරිහරති' භාග්‍යවතුන් වහන්සේ වදාරන ලදී. 'අසා සිත දරාගත් දහමෙහි අරුත විමසා බලයි, එසේ අරුත විමසත්ම දහම වැටහෙනු දැනෙයි, දහම වැටහෙන කල්හී තවත් දැනගැනීමේ කැමැත්ත ඇතිවෙයි. කැමැත්ත ඇති නිසා උත්සාහවත් වෙයි, උත්සාහවත් වීමෙන් (ඒ කරුණු) සසඳ බලයි. සසඳ බැලීමෙන් කරුණු තදින් සිත රඳවා ගනී. සිත රඳවා ගනිමින්, කයෙන්ද (එයට අදාල කර ගනිමින්) ඇති තතු නියමාකාරයෙන් අවබෝධ කරගනිමින්, සියුම් නුවණින්ද විනිවිද දකී' යැයි වෙනත් ලෙසකින්ද සඳහන් කරන ලදී. 'ඔතානං ධම්මානං අත්‍ථමුපපරික්ඛති, අත්‍ථ මුපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති, ධම්ම නිජ්ඣානඛන්තියා සති ඡන්‍දො ජායති, ඡන්‍දජාතො උස්සහති, උස්සහන්තො තුලෙති, තුලයන්තො පදහති, පදහන්තො කායෙන චෙව පරමත්‍ථසච්චං සච්ඡිකරොති, පඤ්ඤායච අතිවිජ්ඣ පස්සති' තවද ගිහි ජීවිතයේදී නිවැරදි වූ බොහෝ යහපත් කරුණු අසා දැනගැනීම මෙලොව පරලොව හිතසුව එළවන බැවින් මංගල යැයි දතයුතුය.

**සිප්පං** නම් ගිහි ජීවිතයෙහි හා පැවිදි ජීවිතයෙහි (දිවි පැවැත්මට) අදාල හැකියාවන්ය. කිසිම කෙනෙකුට හානිදායක නොවන, අකුසල් සිදු නොවන, මැණික්, රත්රන්වලින් කෙරෙන සිප්කම් ගිහි ජීවිතයට අදාලය. එය මෙලොව ජීවිතයට යහපතක් බැවින් මංගල කරුණකි. ගිහිගෙයින් නික්ම පැවිදිවීමෙන් - සිවුරු පරිහරණය, මැහීම, පිරිකර සකස් කරගැනීම, මෙහිලා අදාල වේ. 'මහණෙනි, මෙහි (පැවිදි සස්නෙහි) කිසියම් පැවිද්දෙක් තමා හා එක්ව මහණදම් පුරන, හැමදෙනා කෙරෙහි ඉටුකරදිය හැකි, කුඩුමහත් කටයුතු වේද, එහිලා හැකියාව ඇවැසි'යයි කියන ලදී. 'ඉධ භික්ඛවෙ භික්ඛූ යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්‍ථ දක්ඛො හොති' මේ ආදී ලෙසින් ඒ ඒ තන්හි පහදා දී තිබේ. එය තමාටද, අනුන්ටද මෙලොව පරලොව හිතසුව එළවන, එහිලා උපකාරී වන කරුණක් ලෙසද කියන ලදී.

**විනයො** - ගිහි, පැවිදි ලෙස දැක්වේ. දස අකුසලයෙන් වෙන්වීම ගිහි දිවියට අදාළය. එය අනුගමනය කරන තැනැත්තාට, හැඟීම් ආදියෙන් කිලුටට පත් නොවෙමින්, (ඉරියව් පවත්වා ගැනීමේදී) යහගුණවත් හැසිරීමෙන් යුතුව, මැනවින් සංවර බවටම පත්කරමින්, මෙලොව පරලොව හිතසුව සලසන බැවින්, මංගල කරුණක් වේ. පැවිදි විනය නම්, නිතර ඇවැත් සමූහයෙහි වැරදිවලට හසු නොවීමයි. එහි කියා ඇති පරිද්දෙන්ම

මනා හික්මීමෙන් සිවු පිරිසිදු සීලයෙහි පිහිටීම පැවිදි විනයට අදාළය. පැවිද්දා එහි මනාව පිහිටීමෙන් අරහත් බවට පැමිණේ. මෙසේ විනයානුකූල ඇතිවන සංවරයෙන් ලොවී ලොවුතුරා සුව ලබන බැවින් මංගල කරුණකැයි දතයුතුය.

සුභාසිතා වාචා නම් බොරු කීම වැනි වැරදිවලින් තොර වචනයි. 'මහණෙනි, කොටස් හතරකින් යුතු වචනය යහපත් වේ'යැයි එහෙයින් වදාරා ඇත. 'චතුහි භික්ඛවෙ අංගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති' දහම මුල්කොට ගත් වචනද යහපත් වේ. 'බුද්ධාදී උතුමෝ යහපත් වචනය උතුම් බව කීහ. යහපත් කරුණු ඇතුලත් දේ පැවසීම දෙවැන්නයි. තුන්වන අංගය සතුට - පියබව වඩන වචන කීමයි. බොරු නොකියා ඇත්ත කීම සතරවන අංගයයි.

"සුභාසිතං උත්තම මාහු සන්තො
ධම්මං භණෙ නා ධම්මං, තං දුතියං
පියං භණෙ නාප්පියං, තං තතියං
සච්චං භණෙ නාලිකං, තං චතුත්‍ථං"

මෙයද මෙලොව පරලොව හිතසුව ලබාදෙන බැවින්, මංගල කරුණකි. හික්මීමට - විනයට මෙය අදාල වේමය. එහෙයින් විනයට අදාල කොට සඳහන් කළ යුතු වුවත්, මෙහිදී දැක්වීමට උත්සුක වූයේ කුමක් හෙයින්ද? අනුනට දහම් සේ දෙසන වචන මෙහි යහපත් වචන සේ දතයුතුය. සුදුසු පෙදෙසක වාසය මෙනි. මෙසේ යහපත් වචනයද අදාළ වන අයුරු සැළකිය යුතුවේ. සත්වගට ලොවී ලොවුතුරු සුව - නිවන අවබෝධයට හේතුවන බැවින් මංගල කරුණකැයි කියනු ලැබේ.

'බුදුරජාණන් වහන්සේ (සසර) බිය නැතිකරන, දුක කෙළවර කිරීමෙන් නිවනට පත්වන යම් වචනයක් පැවසූ සේක්ද, එම වචනය ඒකාන්තයෙන්ම උතුම්' යැයි ද දැක්වේ.

"යං බුද්ධො භාසතී වාචං ඛෙමං නිබ්බාණ පත්තියා
දුක්ඛස්සන්තකිරියාය සා වෙ වාචානමුත්තමං"

මෙසේ (මංගල සූත්‍රයට අයත්) ගාථාවෙන් බොහෝ ඇසූ දේ දරා ගැනීමටත්, යහපත් කුසලතා වැඩිදියුණු කරගැනීමටත්, මනා හික්මීමත්, යහපත් වචන කතාබහත් යන කරුණු සතරක් කියන ලදී. එහි යහපත් බවද ඒ ඒ තන්හී විස්තර කරන ලදී.

බාහුසච්චඤ්ච ආදී මේ ගාථාවෙහි විස්තර නිමියේය.

දැන් **මාතාපිතු උපට්ඨානං** ගාථාවයි. මව ද පියා ද **මාතාපිතු උපට්ඨානං** උවටැන් කිරීම - උදව් කිරීමයි. දූ පුතුන්ට ද අඹුදරුවනට **පුත්තදාරස්ස** සැළකීම **සංගහො**, නිරවුල් වූ අනාකුලා, කටයුතු කම්මන්තා අනික් කරුණු පෙර කියා ඇත. මේ වචන තේරුමයි.

විස්තර මෙසේ දතයුතුය. උපදවන්නී යන අරුතින් මවට ජනිකා යැයි ද කියනු ලැබේ. පියා ද එසේය. උවටැන් නම්, පා සේදීම්, ඇඟ පිරිමැදීම්, ඇඟ ඉලීම්, නැවීම්, සිවුපසයෙන් උපකාර කිරීමයි. මවුපියෝ දූපුතුන්ට බොහෝ උපකාර වෙති. දූපුතුන්ගේ දියුණුව කැමති වෙති. අනුකම්පා කරති. දරුවකු පිටත සෙල්ලම් කොට, දූවිලි තැවරුණු සිරුරින් පැමිණෙනු දැක, දූවිලි පිසදමා, හිස්මුදුන පිරිමැද, සිඹිමින් සෙනෙහස පළ කරති. වසර සියයක් තිස්සේ වුවත්, මවුපියන් හිස මත තබාගෙන සිටියත්, ඔවුනට පෙරළා උපකාර කරන්නට පුත්තු අපොහොසත් වෙති. යම් ලෙසකින් මවුපියෝ දරුවන් (බිම) දන ගගා යන කාලයේ සිට කවා පොවා ඇතිදැඩි කරමින්, මේ ලොව හොඳ නරක පෙන්වා දෙමින්, බ්‍රහ්මයා සේ සම්මතව, මුල් ගුරුවරු ලෙස ද පිළිගත්හ. එහෙයින් ඔවුනට උවටැන් කිරීම මෙලොව පැසසුමත්, පරලොව සග සැපත් ලැබදෙයි. එහෙයින් මංගල යැයි කියනු ලැබේ. 'මවුපියෝ බ්‍රහ්මයා යනුවෙන්ද, පෙර ගුරුවරු ලෙසද හඳුන්වති. දූදරුවන්ගේ ගරු බුහුමනට සුදුසු ඔවුහු මිනිස් සංහතියටම අනුකම්පාව දක්වති.'

'එබැවින්, නුවණැති තැනැත්තා ඔවුන්ට නමස්කාර කරන්නේය. ආහාර, පානාදියෙන්, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම් පහසුකම් සැලසීමෙන් ඇඟ ඉලීමෙන් සහ නැවීමෙන්, පා දෝවනයෙන් නුවණැත්තෝ මව්පියන් කෙරෙහි කටයුතු ඉටුකරන්නාහ. ඔවුහු ඒ නිසා මෙලොවෙහිදී පැසසුම් ලබති. මරණින් මතු දෙව්ලොව සතුටු වෙති.

බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ
ආහුනෙය්‍යාච පුත්තානං පජාය අනුකම්පකා

තස්මාහි නෙ නමස්සෙය්‍ය, සක්කරෙය්‍යච පණ්ඩිතො
අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙනච

තාය නං පරිචරියාය මාතාපිතුසු පණ්ඩිතා
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙච මොදති

යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී.

වෙනත් අයුරින් දක්වන්නේ නම්, උවටැන් කිරීම නම්, ඇතිදැඩි කිරීම, ආහාරපාන ලබාදීම (ඉටුකරගත නොහැකි) කටයුතුවලට උපකාර වීම, කුල පරම්පරාව රැකගැනීම, ආදී සේ පස්වැදෑරුම්ය. එය පවින් වැළකීම ආදී පස්ආකාරව මෙලොව හිතසුව සලසන බැවින් මංගල යැයි දතයුතුය. 'ගැහැවි පුතුනි, නැගෙනහිර දිසාව යයි නම් කරන ලද මවුපියන්ට පුතකු විසින් (දූදරුවන් විසින්) මවුපියන්ට පෙරළා උවටැන් කළ යුතුය. ඔවුන්ට ආහාරපාන සපයා දෙන්නෙමි, ඔවුන්ගේ උවමනා කටයුතු (තනිව කළ නොහැකි දේ) ඉටු කරන්නෙමි, කුල පරපුර ඉදිරියට පවත්වා ගන්නෙමි, උරුමයෙන් ලැබෙන දේ මැනවින් පරිහරණය කරන්නෙමි, එමෙන්ම මියගිය මවුපියන් වෙනුවෙන් දානාදී දීමට සුදුස්සන් වෙත පිරිනමමින් පින් අනුමෝදන් කරන්නෙමි'යි මෙසේ කරුණු පහකින් උවටැන් කරනවිට මවුපියෝ (තම දරුවන් කෙරෙහි) අනුකම්පාවෙන් අයහපත් දෙයින් වළක්වති, යහපතෙහි යොදවති, සිප් සතරෙහි හික්මවති, (හැකියාවක් ඇති දෙයෙහි හෝ ඉගෙන ගැනීම් ආදියට යොමු කරවති.) සුදුසු කල සුදුසු පරිදි ආවාහවිවාහ කර දෙති. සුදුසු කාලයෙහි උරුම වූ දේපල ආදිය පවරා දෙති'යි භාග්‍යවතුන් වහන්සේ වදාරන ලදී. 'පඤ්චහි ඛො ගහපති පුත්ත ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨාතබ්බා, භතො නෙ භරිස්සාමි, කුලවංසං ඨපෙස්සාමි, දායජ්ජං පටිපජ්ජිස්සාමි, අථච පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමීති, ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති පාපා නිවාරෙන්ති කල්‍යාණෙ නිවෙසෙන්ති, සිප්පං සික්ඛාපෙන්ති, පතිරූපෙන

දාරෙන සංයොජෙනති, සමයෙ දායජ්ජං නියාාදෙනති' එමෙන්ම මවුපියන් තෙරුවනෙහි පැහැදීම ඇතිකරවීමෙන්, සිල් සමාදන් කරවීමෙන්, පැවිදි වීමෙහි යොමුකරවීමෙන් හෝ උවටැන් කෙරේද, මෙය මවුපිය උවටැනින් උසස්ය. මවුපියන් විසින් (තමාට) කරන ලද උපකාරයට පෙරළා උපකාර වීමක් බඳු ඒ මවුපිය උවටැන ඔහුට මෙලොව පරලොව වැඩදායී වන ලෙසින් මංගල යැයි කියනු ලැබේ.

**පුතතදාරසස** මෙහි තමාට දා වූ පුත්තු ද දූවරුද පුතුන් ලෙසම සළකති. බිරියන් විසිදෙනාගෙන් යම් බිරියක දාරා නම් වේ. පුත්තුද බිරින්දෝද අඹුදරුවෝ, ඒ අඹුදරුවන්ට, සංගහො ගරු කිරීම් ආදියෙන් උපකාර කිරීමයි. එය මනාව පිළියෙල කර දෙන ලෙස ආයොජන කටයුතු ආදී මෙලොව දියුණුවට හේතුවන හෙයින් මංගල යැයි දතයුතුය. 'බටහිර දිසාව සේ අඹුදරුවන් දතයුතු' යැයි - 'පච්ඡිමා දිසා පුතතදාරා වෙදිතබ්බා' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරා ඇත. මෙහි දක්වන ලද පුතුන්, අඹුවන් බිරිය යන වචනයෙහි ඇතුලත්කොට, 'ගැහැවිපුත, කරුණු පහකින්, පැසුළු දිසාවෙහි ලා සැළකෙන බිරිඳට හිමියා විසින් සැළකිය යුතු' යැයි දක්වා ඇත. 'පඤ්චහි බො ගහපතිපුතත ඨානෙහි සාමිතෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨාතබ්බා' (ඇයට) 'ගරු සැළකිලි දැක්වීමෙන්, අවමන් නොකිරීමෙන්, ඇය ඉක්මවා නොයෑමෙන්, ධනය ආදී ඉසුරු ලබාදීමෙන්, ඇඳුම් පැළඳුම් ආදිය සපයා දීමෙන් යන කරුණු සැමියා විසින් බටහිර දිසාව ලෙස හඳුන්වන ලද බිරියට සළකනු ලබන විට බිරියද කරුණු පහකින් සැමියාට කරුණාවෙන් සළකන්නීය. (සැමියාගේ) කටයුතු මැනවින් සකසන්නීය. අදාල හැමට මැනවින් සළකන්නීය. සැමියා ඉක්මවා නොයන්නීය. සරිකරගත් ධනය ආදිය මනාව රැකගන්නීය. සියළු කටයුතුවල අනලස්ව මනාව යෙදෙන්නීය. 'සමමානනාය, අවිමානනාය, අනතිචරියාය, ඉසසරිය වොසසගෙගන, අලංකාරානුපපදානෙන ඉමෙහි බො ගහපති පුතත පඤ්චහි ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි සාමිකං අනුකමපති සුසංවිහිත කමමනතා ච හොති, සුසංගහිත පරිජනාච, අනතිචාරිනීච, සමභතං අනුරකඛති, දකඛාච හොති අනලසා සබ්බකිච්චෙසු' මීළඟට වෙනත් අයුරින් සඳහන් කිරීමකි. සංගහො යනු දැහැමි දීමෙන්, පිය වදනින්, ඔවුන් කෙරෙහි යහපත් හැසිරීමෙන් සැළකීමයි. ඒ කෙසේදැයි කිවහොත් පෙහෙවස් සමාදන්වන දිනවල, තමා උපයාගත් දෙය වැයකොට ආහාර ආදිය ලබාදීම, නැකැත් දිනවල, නැකත් පහදා දීමෙන්, සුබ

දිනවල යහපත් කටයුතු කිරීමෙන් ද, මෙලොව පරලොව දියුණුවට උපදෙස් දෙති. ඒ කියන ලද පරිදිම මෙලොව දියුණුව හා පරලොව දියුණුව සළකා දෙවියන් විසින්ද (එබඳු යහපත් තැනැත්තන්ට) නමස්කාර කරනු ලබන බැවින් ද මංගල යැයි දතයුතුය. 'මාතලී පින්දහම් කරන්නා වූ යම් සිල්වත් ගිහි උපාසකවරුන් දැහැමින්, ආහාරපානාදිය ලබාදී අඹුදරුවන් මැනවින් රැකබලා ගනිත්ද, මම ඔවුන්ට වඳින්නෙමි'යි සක්දෙවිඳු කීය.

"යෙ ගහට්ඨා පුඤ්ඤකරා සීලවන්තා උපාසකා
ධම්මෙන දාරං පොසෙන්ති තෙ නමස්සාමි මාතලී"

අනාකුලා කම්මන්තා නම් සුදුසු කල් දැන, නිසි පිළිවෙලකට අලස නොවී, පටන්ගත් උත්සාහයෙන් යුතුව, නිසි වේලාවට - කල් නොඉක්මවා අයහපත් නොවූ, අකුසල් සිදුනොවන ගොවිතැන, ගව පාලනය, වෙළඳ කටයුතුවල නියැලීමයි. මේ අයුරින් තමන්ගේ හෝ දැසිදස් කම්කරුවන්ගේ හෝ පුහුණු හැකියාවෙන් මෙසේ දියුණුවට යොදවනු ලදුව, මේ ජීවිතයෙහිදීම ධනය, බෝග අස්වනු ලැබ වැඩිදියුණු වන බැවින් මංගල යැයි කියන ලදී. 'පටන්ගන්නා ලද උත්සාහයෙන් යුතුව, සුදුසු පරිදි කටයුතු කරන උත්සාහවන්තයා ධනය ලබයි' - 'පතිරූපකාරී ධුරවා උට්ඨාතා වින්දති ධනං' යැයි බුදුහු වදාළහ.

'දිවාකල නිදා නොගැනීම, රැයෙහි (තම කටයුතුවල) එදින කළ දේ හා පසුදින කළයුතු දේ විමසා දැකීමෙන්ද, ඒ අනුව නිති, තමා කැමති පරිදි නියැලේ නම්, (ඔහුට) ගිහිගෙයි විසීමට හැකිය.

'දැන් බොහෝ සීතලය කියා හෝ උණුසුම්ය, දැන් කුසගිනි ඇතැයි කටයුතු හැරදමන මිනිස්සු දියුණුව ඉක්මවති.'

'යම් තැනැත්තෙක් සීතලය කිහා හෝ, උණුසුම් යැයි ඒ ගැන වැඩිදුර නොසිතා, තමාට අයත් කටයුතු කරයිද ඒ තැනැත්තා සැපය අත් නොහරී.'

'සම්පත් එක්රැස් කිරීමේදී බඹරකු මෙන් ඉරියව් පවත්නේය. වේයන් තුඹසක් ගොඩනගනු සේ, සම්පත් රැස් කරන්නේය. මේ ආදී ලෙසින්ද බුදුරජාණන් වහන්සේ වදාරා ඇත.

න දිවා සොපප, සීලෙන රතතිනුට්ඨාන දසසිනා
නිච්චං මතෙතන සොණ්ඩන සකකා ආවසිතුං ඝරං

අතිසීතං අති උණ්හං අතිසාය මිදං අහු
ඉති විසසට්ඨ කමමනෙත අත්ථා අවෙචනති මානවෙ

යො ච සීතඤ්ච උණ්හඤ්ච තිණා භීයො න මඤ්ඤති
කරං පුරිසකිච්චානි සො සුඛා න විහායති

භොගෙ සංහරමානසස භමරසෙසව ඉරීයතො
භොගා සනනිචයං යනති වම්මිකොවූපචීයති

මෙසේ මේ ගාථාවෙන් මවට උවටැන් කිරීමද, පියාට උවටැන් කිරීමද, අඹුදරුවනට සැළකීම හා නිරවුල් දිවිපෙවෙතට අදාල කටයුතු යැයි මංගල කරුණු සතරක් කියන ලදී. අඹු-දරුවනට සැලකීම දෙකක් සේ ගත්විට කරුණු පහකි. මව පිය උවටැන එක්ව ගත්විට කරුණු තුනකි. ඒවා මංගල කරුණු වන සැටි ඒ ඒ තන්හි පැහැදිලි කරන ලදී.

මාතාපිතු උපට්ඨානං යන මේ ගාථාවෙහි විස්තර නිමියේය.

මීළඟට දානඤ්ච ආදී ගාථාවයි. මේ දේ දෙනු ලබන්නේ (දෙන දේ) දානං, තමන්ට අයිති දෙය අනුන්ට පවරා දෙනු ලැබේ යැයි කී පරිදිය. දැහැමි හැසිරීම හෝ දහමෙහි පෙන්වාදෙන පරිදි හැසිරෙන ධම්මචරියා මොවුන් අපගේ යැයි දැනගනු ලබන්නේ ඤාතකා වැරදි නොවන අනවජ්ජා නින්දා නොව, අපහාස නොවන බව කියන ලදී. ඉතිරි වචන ගැන කලින් සඳහන් වූ පරිදිය. මේ වචනවල තේරුමයි.

තේරුම් විස්තර මෙසේ දතයුතුය. දානං යනු අනුන් උදෙසා, නුවණ පෙරදැරිව ආහාර ආදී දීමට සුදුසු දේ දහයක් තෑගි සේ දීමේ සිතිවිල්ලෙන් හෝ ඒවාට ඇති ලෝභය අත්හැර, ආසාව අත්හැර යම් දෙයක් අනුන්ට පවරා දෙයි ද, දෙනු ලබන දෙය දානය යැයි එබැවින් කියන ලදී. එයට බොහෝදෙනා කැමතිවන හෙයින්ද, මෙලොව පරලොව

යහපත සලසන හෙයින්ද මංගල යැයි කියන ලදී. 'දීමෙහිම නියැලුනු සිහ දීමෙන්ම බොහෝදෙනාට පියමනාප වෙයි. 'දායකො සීහදානපති බහුනො ජනසස පියො හොති මනාපො' මෙබඳු සූත්‍ර සඳහන් තැන් සිහිකළ යුතුය. වෙනත් අයුරින් කිවහොත්, ආමිස දානය - ධම්මදාන යනුවෙන් දානය දෙවැදෑරුම්ය. එහි ආමිස දානය ඉහත කියා ඇති පරිදිය. දුක නැතිකිරීමෙන් මේ ලොවෙහිද පරලොවෙහිද සුවය ගෙනෙන, සම්මා සම්බුදුවරයකු විසින් දෙසන ලද දහම අනුන්ට හිතසුව කැමතිව පහදා දීම දහම් දානයයි. මේ දාන දෙකින් එයම උසස් වේ. 'දෙනු ලබන සියළුම දේ අතුරින් දහම් දානය ජයගනී. සියළු රස අතුරින් දහම් රසය ජයගනී. සියළු ඇලීම් අතුරින් දහමෙහි ඇලීම ජයගනී. තණ්හාව - ආසාව නැතිකිරීම සියලු දුක් ජයගනී' යැයි වදාළේ එබැවිනි.

"සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසො ජිනාති
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති"

ආමිස දානයෙහි යහපත් බව කියා ඇත. දහම් දානය වන්නේ දහමෙහි (නිවැරදි) අරුත් දනවන පරිදි එහි ගුණයෙහි පිහිටුවීමයි. එහෙයින් එය යහපත් යැයි කියනු ලැබේ. 'මහණෙනි, පැවිද්දෙක් අසා ඇති පරිදි - පුහුණුකර ඇති පරිදි යම් පරිද්දෙන් අනුන්ට විස්තර සහිතව දහම දේසනා කරයිද ඒ මහණ එසේ එම දහමෙහි මනා අරුත් දැනීමෙන්ද, මනා වැටහීමෙන් ද යුතු වේ' යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. 'යථා යථා භික්ඛවෙ, භික්ඛු යථාසුතං යථා පරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති, ධම්ම පටිසංවෙදී ච'

ධම්මචරියා නම් දසකුසල් සඳහා යොමුවන කටයුතුයි. 'ගැහැවියෙනි, කයෙන් සිදුකෙරෙන දැහැමි හා සම හැසිරීම් තුන් ආකාරයැ'යි වදාළ පරිදිය. 'තිවිධං ඛො ගහපතියො කායෙන ධම්මචරියා සමචරියා හොති' ඒ දැහැමි හැසිරීම් දෙව්ලොව උපත ලැබීමට හේතුවන බැවින්, මංගල යැයි දතයුතුය. 'ගහපතිවරුනි, මේ ලොවෙහි ඇතැම් පුද්ගලයෝ දැහැමි හා සන්සුන් හැසිරීමෙන් යුතුව කය බිඳී මරණින් පසු දුගති නොවූ දෙව්ලොව උපදිත්' යැයි 'ධම්මචරියා සමචරියා හෙතු ඛො ගහපතයො

එවමිධෙකච්චෙ සත්තා කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති' - භාග්‍යවතුන් වහන්සේ වදාරන ලදී.

**ඤාතකා** නම් මවගෙන් හෝ පියාගේ පටන් සත් මුතු මිත්තෙපිය පරපුර තෙක් සබඳතාවයි. ඔවුන්ට සම්පත් හීනවීමෙන් හෝ රෝගී වීමෙන් ඇතිවන කය දුබලතා හෝ, තමන් වෙතට පැමිණිවිට කුසගිනි නිවා, රෙදි පිළි ලබා දී මුදල්, අස්වනු, සහල් ආදියෙන් සැළකීම මෙලොවදීම පැසසුම් ලැබීමටත්, පරලොව දී සැප ඇතැයි සළකනු ලබන වෙසෙස් තැන් ලැබීමටත් හේතුවන බැවින් මංගල යැයි කියනු ලැබේ.

**අනවජ්ජ කම්මානි** පෙහෙවස් සමාදානය, වතාවත් කිරීම, උයන් වතු, පැල සිටුවීම, ඒදඬු තැනීම ආදී කය, සිත, මනස හා බැඳුණු යහපත් කටයුතුය. ඒවා නොයෙක් අයුරින් හිතසුව ලබාදෙන බැවින් මංගල යැයි කියනු ලබයි. 'විසාඛ, මෙලොව ඇතැම් ගැහැණියක හෝ පිරිමියෙකු අටසිල් සමාදානය (පුරුදු කළේ නම්) කය බිඳී මරණින් මතු චාතුම්මහාරාජික දෙවියන් හා සහවාසව උපදනා බව සඳහන් මෙබඳු සූත්‍ර ද සිහිකළ යුතුය. 'ඨානංඛො පනෙතං විසාඛෙ විජ්ජති, යං ඉධෙකච්චො ඉත්ථි වා පුරිසො වා අට්ඨංග සමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා - චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය'

මෙසේ මෙම ගාථාවෙන් දානය, දැහැමි හැසිරීම, නෑදැයන්ට සැළකීම, නිරවුල් ජීවනෝපාය යන මංගල කරුණු හතරක් කියන ලදී. එහි යහපත් බව අදාල වන පරිදි පැහැදිලි කරන ලද්දේය.

**දානඤ්ච ආදී මේ ගාථාවෙහි විස්තරය නිමි.**

දැන් **ආරති විරති** ගාථාවයි. **ආරති** - නොඇලීමයි. වෙන්වීමයි, **විරති** වැළකීමයි. පුද්ගලයන් මෙයින් වැළකෙතියි යන අරුතින් විරති වේ. **පාපා** අයහත, අකුසලය, මත් කරවන අරුතින් මජ්ජං, එය පානය කිරීම **මජ්ජපානා**, හික්මීම **සංයමො**, පමා නොවීම **අප්පමාදො**, **ධම්මෙසු** කුසලයෙහි, ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය. මේ වචන තේරුම්ය.

විස්තර මෙසේ දතයුතුය. ආරති නම් පාපයෙහි ආදීනවය දකිමින් ඊට සිත නො ඇලීමයි. විරති කය, වචන ආදී දොරටුවලින් කෙරෙන එබඳු කටයුතුවලින් වැළකීමයි. සම්පත්ත විරති, සමාදාන විරති, සමුච්ඡෙද විරති යැයි එය තුන් ආකාරය. යම් කුල පුතකු උපත හෝ කුලය හෝ පරම්පරාව හෝ නිසා, 'මෙසේ පරපණ නසන්නෙම් නම්, මේ නුදුන් දෙය ගන්නෙම් නම්, මෙය මට සුදුසු නොවේ' ආදී ලෙසින් කරුණු සළකා වෙන් වෙයිද එය සමපත්ත විරති නම්. සිකපද සමාදන්ව ඒ අනුව පැවැත්ම සමාදාන විරති වේ. එය සමාදන් වූ තැන් පටන් කුල පුතු පරපණ නැසීම් ආදියෙන් වැළකෙයි. උතුමන් ගත් මග අනුරූපව කටයුතු කිරීම සමුච්ඡෙද විරති වේ. එසේ කටයුතු කිරීමේදී ඒ අරියසාවකයාට බිය පහක්, ඒ හා බැඳෙන තරහත් සංසිඳේ. 'ගහපති පුතුනි, පරපණ නැසීම, නුදුන් දේ ගැනීම, පස්කම්හි වැරදි හැසිරීම, බොරු කීම' ආදී ලෙසින් කියා ඇති පරිදි පාපං නම් වේ. මේවා දැනුම් තේරුම් ඇති නුවණැත්තෝ පැසසුම් නො කරති.

"පාණාතිපාතො අදින්නාදානං මුසාවාදොච වුච්චති
පරදාර ගමනඤ්චෙව නප්පසංසන්ති පණ්ඩිතා"

මේ ගාථාවෙහි ඇතුලත් කෙලෙස් සහිත වූ ඒ කටයුතුවල යෙදීම සතරාකාර වූ අකුසල්ය. එහෙයින් පව්කම් ද වේ. හැම අතින්ම එයින් වෙන්වීම ද - වැළකීම ද මෙලොව පරලොව බිය - තරහ - නැති කිරීම වැනි නොයෙක් අයුරින් වෙසෙස් බවක් ලැබීම හේතුවෙන් මංගල යැයි කියනු ලැබේ. 'ගැහැවි පුතුනි, පරපණ නැසීමෙන් ආරිය සාවකයා වැළකේ' යන, 'පාණාතිපාතා පටිවිරතො ඛො ගහපති පුත්ත, අරියසාවකො' ආදී කරුණු දැක්වෙන සූත්‍ර ගෙනහැර පෑ යුතුය.

මජ්ජපානා සංයමො කලින් කියන ලද පරිදි, පමාවට හේතුවන, මත්බව ඇති කරන, පෙරන ලද හෝ පැසවන ලද සුරා පානයෙන් වැළකීම යන්නට සමාන වචනයකි. එසේ මත්වන තැනැත්තා වැටහීමක්, අරුතක් නොදනී. දහම - හොඳ නරක නොදනී. මවට අනතුරක් කරයි. පියාට, බුදු පසේ බුදු තථාගත සව්වනටද අනතුරක් කරයි. මේ ජීවිත කාලය තුල ගැරහීමටත්, මරණින් පසු දුගතියටත් ඇතැම්විට උමතුවටද පැමිණේ. මත්වන දෑ ගැනීමෙන් හෝ පානයෙන් තොර වූ තැනැත්තා

එබඳු වරදට පත් නොවන හෙයින්, උසස් ගුණ සමුදායකට පත්වෙයි. එහෙයින් මතින් හික්මීම මංගල යැයි දතයුතුය.

මේ ගාථාවෙන් පාපයෙන් වැළකීම, මත්වන දේ පානයෙන් වැළකීම, කුසල් දහම්හි නොපමාව නියැලීම යන මංගල කරුණු තුනක් කියන ලදී. එහි යහපත් බවද පැහැදිලි කරන ලදී.

**ආරති විරති පාපා** යන මේ ගාථාවෙහි විස්තර නිමියේය.

දැන් **ගාරවො ච** යන ගාථාවයි. **ගාරවො** ගරු කටයුතු බවයි. **නිවාතො** යටත් පැවතුම් ඇති බව, **සන්තුට්ඨී** සතුට, කළගුණය දන්නා බව, **කතඤ්ඤුතා, කාලෙන** සුදුසු කාලයෙහි, දහම් ඇසීම ධම්ම සවණං ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය. මේ වචනවල තේරුමය.

විස්තර මෙසේ දතයුතුය. ගාරවො ගරු කටයුතු බවට සුදුසු වූ බුදු, පසේ බුදු, තථාගත සාවකයන්, ගුරුවරුන්, උපජ්ඣාය හෙවත් ගුරු හිමිවරුන්, දෙවු සොයුරු සොයුරියන් ආදීන්ට ගැළපෙන පරිදි ගරු කිරීම, ගරු බුහුමන් දැක්වීම, ඒ ගරුසැළකිලි දැක්වීම සුගති ගමනට හේතු වේ. 'ගරු කළ යුත්තාට ගරු කිරීමද, බුහුමන් දැක්විය යුත්තාට බුහුමන් කරයිද, පිදිය යුත්තන්ට පූජා කරයිද, ඒ තැනැත්තා ඒ කටයුතුවලින්, ඒ බලයෙන් කය බිඳී මරණින් පසු සුගති වූ දෙව්ලොව ඉපදී. යම්ලෙසකින් දෙව්ලොව නූපදී නම්, මිනිසත් බව ලැබ, යම් යම් තැන ඉපදෙයිද, උසස් යයි සම්මත පවුලකට අයත් වෙතැ'යි කීහ. 'ගරුකාතබ්බං ගරුකරොති, මානෙතබ්බං මානෙති, පූජෙතබ්බං පූජෙති, සො තෙන කම්මෙන එවං සමත්තෙන, එවං සමාදින්නෙන කායස්ස භෙදා පරං මරණා සුගතිංසග්ගං ලොකං උපපජ්ජති, නො චෙ කායස්ස -පෙ- උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්‍ථ යත්‍ථ පච්චාජායති, උච්චාකුලිනො හොති' - එසේම, 'මහණෙනි, පිරිහීමට හේතු නොවන කරුණු සතකි. ඒ කවරේද? නායකයාට ගරුකිරීම ආදී ලෙසින්' යැයි ද කියා ඇත. 'සත්තිමෙ භික්ඛවෙ අපරිහානියා ධම්මා, කතමෙ සත්ත? සත්‍ථු ගාරවතා'......... එහෙයින් මංගල 'යැයි කියනු ලැබේ.

**නිවාතො** යටත් බව, යටහත් පැවතුම් ඇති බවයි, මෙබඳු තැනැත්තා

නිහතමානීව, ආඩම්බර නොවී, පා පිස්නා රෙදිකඩක් බඳුව, අං බිඳුණු ගොනෙකු බඳුව, දළ උදුරා දැමූ සපෙකු බඳුව, මුදු වදනින් කතාබහ කරයි. මෙය යටහත් බවයි. මෙසේ කිතුරාව පැතිරීම් ආදී ගුණ ලබන බැවින් මංගල යැයි කියනු ලැබේ.

සනතුට්ඨි ලැබෙන සිවුපසය කෙබඳු ආකාර වුවත්, එහි සතුටට පත්විමයි, එය දොළොස් ආකාරය, ඒ කෙසේද? ලැබෙන ආකාරයට සිවුරු පිළිබඳවත්, සිවුරෙහි සොබාවය ගැනත්, සිවුරෙහි සුදුසු බව ගැනත්, යන තුන් ආකාරයෙන් සෑහීමට පත්වේ. පිඬු පිණිස ලැබෙන ආහාරය ගැනද මෙසේමය. එහි බෙදා දක්වන විස්තරයයි මේ. පැවිද්දෙක් යහපත් හෝ අයහපත් වූ සිවුරක් ලැබෙයිද, ඒ පැවිද්දා එයින්ම යැපෙයි. වෙනත් සිවුරක් බලාපොරොත්තු නොවේ. ලැබුණද එය පිළි නොගනී. මෙය **චීවරෙ යථාලාභ සනෙතාසො**, විටක රෝගී වුවහොත්, ඝන-දළ-බර සිවුරක් පොරවනවිට, අපහසුතාවකට හෝ වෙහෙසට හෝ පත්වේද, ඒ පැවිද්දා සමාන පැවතුම් ඇති වෙනත් පැවිද්දකු සමග මාරුකොට සැහැල්ලුවෙන් සිටිමින් සෑහීමට පත්වෙයි. මෙයද **චීවරෙ යථාබල සනෙතාසො** වේ. තවත් පැවිද්දෙක් අගනා පටපිළි ආදියෙන් නිමවන ලද වෙනත් වටිනා සිවුරක් ලැබ, 'මෙය දිගු කලක් පැවිදිව වෙසෙන, බොහෝ ඇසූ පිරූ බවට පත් තෙරුන්වහන්සේලාට සුදුසු'යැයි උන්වහන්සේලාට දී, තමා කසල ගොඩකින් හෝ වෙනත් කිසියම් තැනක හැර දමන ලද පළුදු වූ රෙදි තෝරාගෙන, සඟල සිවුරක් සේ දරන නමුදු සෑහීමට පත්වෙයි. මෙය **චීවරෙ යථාසාරුප්පසනෙතාසො** වේ. මෙහිදී පැවිද්දා පිඬු පිණිස රළු හෝ රසවත් හෝ අහරක් ලැබ, එයින්ම යැපෙයිද, වෙනත් ආහාරයක් බලාපොරොත්තු නොවෙයි ද, වෙනත් අහරක් ලැබුණද එය පිළිනොගනීද මෙය **පිණ්ඩපාතෙ යථාලාභසනෙතාසො** වේ. ඉක්බිති රෝගීව, පිඬු පිණිස ලද රළු ආහාරය වළඳ දැඩිසේ ගිලන් බවට පැමිණේද, සමාන පැවතුම් ඇති පැවිද්දෙකුට එය දී, ඒ පැවිද්දාගේ අතින් ගිතෙල්, මීපැණි, කිරි ආදිය අනුභවකොට මහණදම් පුරමින් සෑහීමට පත්වෙයි. මෙය **පිණ්ඩපාතෙ යථාබලසනෙතාසො** වේ. තවත් මහණෙක් රසවත් පිඬු අහරක් ලබයි, 'මේ පිඬු පිණිස ලද ආහාරය, දිගු කලක සිට පැවිදිව සිටින, රසවත් පිඬු අහරක් නොලද, එක්ව බඹසර හැසිරෙන වෙනත් මහණුන්ට සුදුසු'යැයි දී තමන් පිඬු පිණිස හැසිර, නොයෙක් කවලම් වූ ආහාර වළඳමින් ද සෑහීමට පත්වෙයි. මෙය **පිණ්ඩපාතෙ යථාසාරුප්ප සනෙතාසො** වේ. මේ අතර මහණුන් වහන්සේ සෙනසුනකට පැමිණෙති.

එයින්ම සෑහීමට පත්ව, නැවත ඒ සෙනසුනට වඩා හොඳ සෙනසුනක් ලැබුණද, එය නොසළකයි. මෙය ඒ මහණන්ගේ **සෙනාසනෙ යථාලාභ සන්තොසො** වෙයි. ඉක්බිතිව වාතය හරිහැටි නොලබන, සෙනසුනක වසමින්, පිත් රෝගාදියෙන් දැඩි සේ ගිලන් වේද, සමාන පැවතුම් ඇති මහණක් හට ඒ සෙනසුන දී, ඒ මහණ පැමිණිවිට (තමන්) සීතල වාතය ලැබෙන සෙනසුනෙක වැස, මහණදම් පුරයිද එයින් සෑහීමට පත්වේමය. මෙය ඒ මහණගේ, **සෙනාසනෙ යථාබලසන්තොසො** වේ. තවද පැවිද්දා හොඳ සෙනසුනකට පැමිණියද, එය පිළිනොගනී. ඒ යහපත් සෙනසුන (මහණදම් වැඩීම) අතපසු කරන තැනකි. එහි හිඳිනවිට අලස බව හා නිදිමත ඇතිකරයි. නිදා පිබිදිවිට ආසා සිතිවිලි හටගනී' යැයි එය පිළිකෙව් කොට, එළිමහනෙහි, රුක්මුල්හි, තණසෙවිලි කුටි වැනි කොතැනක වාසය කළද, සෑහීමට පත්වෙයි. මේ පැවිද්දාගේ **සෙනාසනෙ යථාසාරුප්පසන්තොසො** වේ. මෙහි දී පැවිද්දා අරළු හෝ නෙල්ලි හෝ බෙහෙත් සේ ලැබ එයින්ම යැපෙයි. වෙනත් මහණුන් ලද ගිතෙල්, මීපැණි ආදිය ද බලාපොරොත්තු නොවෙයි. ඒවා ලැබුණද පිළිනොගනී. මෙය **ගිලානපච්චයෙ යථාබලසන්තොසො** වේ. ඉක්බිති ගිලන් වූ විටක තෙල් අවැසි ව, (උක්) පැණි ආදිය ලැබෙයි. ඒ මහණ එය සමාන පැවතුම් ඇති පැවිද්දෙකුට දී, ඒ පැවිද්දා වෙතින් තෙල් බෙහෙත් ගෙන මහණදම් පුරන්නේ සෑහීමටම පත්වෙයි. තවද පැවිද්දා, එකම බඳුනක ගවමුත්‍ර හා අරළු බහා, තවත් බඳුනක චතුමධුර (ගිතෙල්, මීපැණි, උක්සකුරු, තල) බහා 'හිමියනි, කැමති යම් දෙයක් පිළිගත මැනවැ'යි කියද්දී, 'ඒ බෙහෙත් දෙකෙන් එකකින් රෝගය සුවවේද, එයින් ගවමුත්‍ර - අරළු නම් බුදුවරුන් අගය කරන ලදහ, 'මෙහිද, 'පැවිදි ජීවිතයෙහි බෙහෙත් ගවමුත්‍රය, එබැවින් එය පරිහරණයෙහි ඔබ දිවිහිමියෙන් උත්සාහ කළ යුතු වෙයි' යැයි කියා ඇති පරිදි 'පූතිමුත්ත-භෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා - තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණියො' සිහිකරමින්, චතුමධුර බෙහෙත් පිළිකෙව් කොට, ගවමුත්‍ර, අරළු බෙහෙත් සේ ගනිමින් ඉහළම සෑහීමක් ලබයි. මේ ඒ මහණගේ **ගිලානපච්චයෙ යථාරූපසන්තොසො** වෙයි. මේ සියළු අයුරින්ම ලබන සතුටින් යුතු සෑහීමකට පත්වීම **සන්තුට්ඨී** යැයි කියනු ලැබේ. එසේ සෑහීමට පත්වීම, පමණට වඩා එක්රැස් කරගැනීම, කැමති දේ අඩුවීම සහ පවිටු බව නැති කිරීමට හේතුවන බැවින්ද, සුගතියට හේතුවන බැවින්ද, උතුම් නිවන්මඟට පිළිවෙත් වැඩීමෙන් සිවුදෙසම (තමාට) නතුවන බැවින්ද මංගල යැයි දතයුතුය. ඒ ඒ පරිදි සිවුපසයෙන් සෑහීමට පත්වීම (ඒවා නොලැබීමෙන් වන දුක-තරහ ද නැතිකරයි.

චාතුද්දිසො අප්පටිඝොච හොති
සන්තුස්ස මානො ඉතරීතරෙන' ආදී ලෙසිනි.

කතඤ්ඤුතා යම් කෙනෙකු විසින් කරන ලද මඳ වූ හෝ බොහෝ උපකාර නැවත නැවත සිහිකරන බැවින් අමතක නොවීමයි. එහෙත් නිරයාදී දුකෙහි රැකවරණ සේ මිනිසුන්ට බොහෝ උපකාර වන්නේ පින්දහම්ය. එහෙයින් එයද උපකාරයක් ලෙස සිහිකරන බැවින් කළගුණ දන්නා බව යැයි දතයුතුය. එය යහපත් උතුමන්ගෙන් පැසසුම් ලබන, නොයෙක් ලෙසින් උදව්වන කරුණක් බැවින් මංගලයැයි දතයුතුය. 'මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙනා ලොව දුලබ වෙති. ඒ දෙදෙනා කවරේද? පෙරළා උදව් උපකාර කරන තැනැත්තා සහ කළ උපකාරය අමතක නොවන තැනැත්තාය. 'දෙව මෙ භික්ඛවෙ පුග්ගලා දුල්ලභා ලොකස්මිං, කතමෙ ද්වෙ? යො ච පුබ්බකාරී යො ච කතඤ්ඤූ කතවෙදී'

කාලෙන ධම්මස්සවණං යම්විටක කාමසිතිවිලිවලින් හෝ වෙනත් හැඟීම්වලින් මඩනා ලදුව, සිත උඩඟු බවට පත්වේද, එවිට එය දුරුකර ගැනීමට දහම් ඇසීම අදහස් වේ. දවස් පහෙන් පහට 'දහම් ඇසීම කාලෙන යන්නෙන් හැඟෙන බව' තවත් කෙනෙක් කීහ. 'හිමියෙනි, අපි පස්වන දවසෙහි මුළු රැයම දහම් කතාවෙන් කල් යවමු'යි 'පඤ්චාහිකං ඛො පන මයං භන්තෙ සබ්බරත්තිං ධම්මියාකථාය සන්නිසීදාම' ගරු අනුරුද්ධ තෙරණුවෝ කීහ. එහෙත් යම්විටක, යහපත් කලණ මිතුරෙකු වෙත පැමිණ, තම සැක දුරුකර ගැන්ම සඳහා දහම් ඇසීමට හැකිවේද, එයද කාලයෙහි දහම් ඇසීම යැයි දතයුතුය. 'ඔවුහු වරින්වර පැමිණ විමසති, ගැටළු ගැන අසති' 'තෙ කාලෙන කාලං උපසංකමිත්වා පරිපුච්ඡති, පරිපඤ්හති' යනුවෙන් සඳහන්ව ඇත. ඒ අනුව (සුදුසු) කාලයෙහි දහම් ඇසීම නීවරණ දුරු කිරීමටද, සිතේ පැසවනු ලබන කෙලෙස් නැති කිරීමෙන් මගපල ආදී නොයෙක් ආකාර වූ උසස් බවක් ලැබීමටත් හේතුවන බැවින් මංගල යැයි දතයුතුය. මෙසේ ද කියා ඇත. 'මහණෙනි, යම්විටක, අරිය සාවකයා සියළු සිතිවිලි එක් අරමුණකට ගෙන, අරුත් විමසා, මෙනෙහි කරමින්, මනාව සවන් යොමා දහම් අසයිද, නිවන අවුරාලන කරුණු පහ ඒ වේලාවේම නැතැ'යි 'යස්මිං සමයෙ භික්ඛවෙ, අරියසාවකො අට්ඨීකත්වා, මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාති, පඤ්චස්ස නීවරණ තස්මිං සමයෙ න හොන්ති' වදාරන ලදී. 'මහණෙනි, සවනට යොමුවුනු දහම මැනවින්

සිත දරාගැනීමෙන් අනුසස් හතරක් බලාපොරොත්තු විය යුතුය යනුවෙන්ද 'සොතානුගතානං භික්ඛවෙ ධම්මානං -පෙ- සුප්පටිවිද්ධානං චත්තාරො ආනිසංසා පාටිකංඛා', 'මහණෙනි, වරින්වර දහම පුරුදු කිරීමෙන්ද, මනාව ඒ අනුව හැඩගැසීමෙන් ද, කෙමෙන්, කෙමෙන් දැඩිව සිත පැසවන කෙලෙස් නැතිකිරීමේ දී කරුණු සතරක් වේ. ඒ කරුණු සතර කුමක්ද? සුදුසු කල්හි දහම් ඇසීම ආදී ලෙසිනි. 'චත්තාරො මෙ භික්ඛවෙ ධම්මා කාලෙන කාලං සම්මා භාවියමානා, සම්මා අනුපරිවත්තිය මානා, අනුපුබ්බෙන ආසවානං ඛයං පාපෙන්ති, කතමෙ චත්තාරො? කාලෙන ධම්මසවණං'.............එවමාදීනි'

මෙසේ මේ ගාථාවෙන් ගරුකිරීම, යටත් පැවතුම් ඇති බව, සෑහීමට පත්වීමෙන් ලබන සතුට, කළගුණ දත් බව හා (ඉඩ ලැබෙන) සුදුසු කාලයේදී දහම් ඇසීම යැයි මංගල කරුණු පහක් කියන ලදී. එහි යහපත් බව ඒ ඒ පරිදි පැහැදිලි කර ඇත.

ගාරවො ආදී මේ ගාථාවෙහි විස්තර නිමියේය.

දැන් ඛන්තී ආදී ගාථාවයි. ඛන්තී ඉවසීමයි, ගරුකිරීමෙන් යුතුව, යහපත් (වැඩදායී) වචනයකැයි පිළිගනිමි'යි සුවච නම් වේ. එසේ කටයුතු කිරීම, ඒ කීකරු බව - සොවචස්සතා, කෙලෙස් සංසිඳවන බැවින් සමණ දස්සනං දැකීම, දහම පිළිබඳ කතාබහ = ධම්ම සාකච්ඡා ඉතිරි කරුණු කලින් කියන ලදී. මේ වචන තේරුමයි.

විස්තර මෙසේ දතයුතුය. ඛන්ති නම් ඉවසීමේ ගුණයයි. ඉවසීමෙන් යුතු මහණුන් වහන්සේ අපහාස දනවන කරුණු දහයෙන්ම අනුන් විසින් අපහාස කරද්දී එය නොඇසුණ සේ ද, බැඳ දැමීම් වැනි දෙයින් හිංසා කරද්දී නොදුටු සේ ඛන්තිවාදී - ඉවසීම ගැනම කතා කළ තවුසා මෙන් වෙනස් නොවේ. 'පෙර ඛන්තිදීපන නම් තවුස් පැවිද්දෙක් විය. කසී රජු ඒ තවුසා කඩ කඩ කොට කැපීය. තවුසා (තරහ නොගෙන) ඉවසීමෙන්ම සිටියේ'යැයි එහෙයින් කීය.

"අහු අතීතමද්ධානං සමණො ඛන්තිදීපනො
තං ඛන්තියායෙව ඨිතං කාසි රාජා අඡෙදයී"

ගරු කටයුතු පුණ්ණ තෙරුන් මෙන් (එවැනි දේ) වරදක්, අපරාධයක් ලෙස තරහ නොගනිමින් වඩාත් යහපත් ලෙස මෙනෙහි කරයි. ඒ ගැන මෙසේ සඳහන්ය. 'හිමියෙනි, මට සුණාපරන්තයෙහි මිනිසුන් අපහාස කරත්ද, උපහාසයට ලක් කරත්ද, මෙසේ සිතෙයි. මේ සුණාපරන්තයෙහි මිනිසුන් අතින් පහර නොදෙනු ඇත. සුණාපරන්ත මිනිසුන් ඉතා හොඳය.' 'සචෙ මං භන්තෙ සුණාපරන්තකා මනුස්සා අක්කොසිස්සන්ති, පරිභාසිස්සන්ති, තත්‍ථ මෙ එවං භවිස්සති භද්‍රකාවති මෙ සුණාපරන්තකා මනුස්සා, යං මෙ න ඉමෙ පාණිනා පහාරං දෙන්ති' මෙබඳු ගුණයෙන් යුතු තැනැත්තා ඉසිවරුන්ගේ ද පැසසුමට ලක්වෙයි.

'තරහෙන් කරනු ලබන වද වේදනා ගැන කිසිකලකත් කණගාටු නොවේ, ඉසිවරුන් විසින් ගුණමකු බවින් තොරවීම පසසනු ලබයි. නපුරු වචන පවසන ලද සියල්ලන්ටම කමා කරව, ඒ ඉවසීම උතුම් යැයි සරභංග ඉසිවරයා කීය. ඉවසීම දේවතාවුන්ද පැසසුම් කරන ලදී. 'යම් බලවත් තැනැත්තෙක් දුබලයාට (ඔහු කරන කියන නපුරු දෙයට) ඉවසයිද, දුබලයාට එසේ නිති කමා කරයිද, එය උසස්ම ඉවසීම යැයි සක්දෙවිඳු කීය.

"යො හවෙ බලවා සන්තො දුබ්බලස්ස තිතික්ඛති
තමාහු පරමං ඛන්තිං නිච්චං ඛමති දුබ්බලො"

මෙසේ දේවතාවුන්ගේද පැසසුම් ලැබීමට සුදුසුය.

'අපහාසයද, වධහිංසා හා බැඳ දැමීමද, යම් පුද්ගලයෙක් නොකිපී ඉවසයිද, ඉවසීම බල ඇණියක් කොටඇති (කෙලෙස් නැසූ) ඒ තැනැත්තා බමුණකැයි මම කියමි' භාග්‍යවතුන් වහන්සේ කීහ.

"අක්කොසං වධබන්ධඤ්ච අදුට්ඨො යො තිතික්ඛති
ඛන්තිබලං බලාණිකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං"

මෙසේ බුදුවරුන්ගේ ද පැසසුම් ලැබීමට සුදුසුය.

මෙසේ අගය කරන ලද මෙම ඉවසීමේ ගුණයද, වෙනත් යහගුණද ලැබීමේ හේතුවෙන් මංගල යැයි දතයුතුය.

සොවචස්සතා නම් (දියුණුවට) යහපත් අවවාද කරනු ලබනවිට

සිත අවුලට පත්කර නොගෙන, නිහඬව නොසිට හෝ එහි ගුණදොස් සිතීමට හෝ නොපැමිණ, ඉමහත් ආදරයෙන් හා ගරු සැළකිලිමත්ව, යටහත් සිත පෙරදැරිව 'යහපතැ'යි කියා පිළිගැනීමයි. එය එක්ව වාසය කරන්නන්ගේ ඇසුරින් අවවාද උපදෙස් ලැබීමට හේතුවන බැවින්ද වැරදි නැතිකර ගැනීමට ලැබෙන හෙයින්ද මංගල යැයි කියනු ලැබේ.

**සමණානං දස්සනං** - කෙලෙසුන් නසන ලද, වඩනා ලද පුරුදු කරන ලද කය, සිත වචනයෙහි තියුණු නුවණැති ඒ අනුවම ඉඳුරන් දමනයෙහි යුතු, පැවිදි හිමිවරුන් වෙත එළඹීම, සිහිකිරීම, කියන දෙයට සවන් යොමුකිරීම හා බැහැදැකීමයි. සියළුම උසස්, පහත් දේසනයට (එහි දක්වන කරුණුවලට) දැකීම - දස්සන යැයි කියනු ලැබේ. එය මංගල යැයි දතයුතුය. කවර හෙයින්ද? බොහෝ උපකාර සලසන බැවිනි. 'මහණෙනි, ඒ පැවිදි හිමිවරුන් දැකීමද බොහෝ වැඩදායක යැයි මම කියමි. 'දස්සනමපහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහුකාරනති වදාමි' ආදී ලෙසින් දක්වා ඇත. තම හිතසුව කැමති වන කුලපුතකු විසින් සිල්වත් පැවිදි හිමිනමක් නිවසෙහි දොරටුව ළඟට පැමිණි බව දැක, දීමට සුදුසු දෙයක් වේනම්, හැකි අයුරින් එයින් පිදිය යුතුය. දීමට දෙයක් නොමැති නම්, පසඟ පිහිටුවා වැඳිය යුතුය. එයද ඉටුකළ නොහැකි නම්, පහන් සිතින් පියකරු ඇසින් දැකිය යුතුය. මෙසේ දැකීම පමණින්ම ඇතිවන, සිත පිනායාමෙන්, මතු උපදනා සියදහස් වාරයකදී රෝගයක් හෝ දැවිල්ලක් හෝ විකල් බවක් හෝ ගෙඩි-ඉන්නන් හට නොගනී. නෙත්, රන් විමනක විවර වූ, පස්පැහැයෙන් පැහැබරව දිදුලන, මැණික් කවුළුවක සිරි ගනී. කප් සියදහසක් පමණ දෙවියන් අතරද මිනිසුන් අතරද සියළු සැප සම්පත් ලබයි. මනා පැවතුම් ඇති පැවිදි නමක දැකීම පමණක් වූ පිනින් යමෙකු මිනිසත් බව ලැබ මෙබඳු සම්පත් විඳින්නේ ද එය අරුමයක් නොවේ. තිරිසන් බව ලැබුවන් ද, හුදෙක් හටගත් සැදැහැයෙන් පැවිදි හිමිවරු දැකීමෙන් මෙබඳු සම්පත් ලැබූහයි අගයනු ලැබේ.

'වෙදියක (පව්වෙහි) බොහෝ කලක් වාසය කරන, රවුම් ඇස් ඇති මේ බකමූණා (බස්සා) ඒකාන්තයෙන්ම සුවපත් වූයේ, උදෑසන පිබිදුණු උතුම් බුදුරජාණන් වහන්සේ දකී.'

'මා කෙරෙහි ද උතුම් බික්සඟන කෙරෙහි ද සිත පහදවා, කප් සියදහසක් දුගතියට නොයයි.'

'දෙව්ලොවින් චුතව, යහපත් කටයුතුවලින් මෙහෙයවන ලදුව, අනාගතයෙහි අපමණ නුවණ ලැබ සොමනසස යැයි පසිඳු වේ'

"උලූකකො මණ්ඩලක්ඛිකො
වෙදියකෙ චිරදීඝවාසිකො
සුඛිතො වත කොසියො අයං
කාලුට්ඨිතං පසසති බුදධවරං

මයි චිත්තං පසාදෙත්වා භික්ඛුසංඝෙච'නුත්තරෙ
කප්පානං සතසහස්සානි දුග්ගතිං සො න ගච්ඡති

දෙවලොකා චවිත්වාන කුසලකම්මෙන චොදිතො
භවිස්සති අනන්තඤාණො සොමනස්සොති විස්සුතො"

කාලෙන ධම්මසාකච්ඡා අඳුරු වැටෙන වේලාවෙහි හෝ අළුයම හෝ සූත්‍ර කටපාඩමෙන් දරන පැවිදි හිමිවරු දෙදෙනෙක් එහි කරුණු එකිනෙකා අතර සාකච්ඡා කරති. විනය දරන්නෝ විනයද, අබිදහම දරන්නෝ අබිදහමද, ජාතක කට පාඩමෙන් දරන්නෝ ජාතක ගාථා ද, අටුවාචාරීහු අටුවාද ගැන අඩුලුහුඩුකම් හා එකිනෙකාට මතු වූ සැක දුරුකර ගැනීම පිණිස, ඒ ඒ කාලයෙහි කතාබහ කරති. මෙය කාලයෙහි දහම් සාකච්ඡාවයි. එය ආගම පිළිබඳ වියත්බව ඇතිකර ගැනීම ආදී ගුණ හේතුවෙන් මංගල යැයි කියනු ලැබේ.

මෙසේ මේ ගාථාවෙහි ඉවසීම, කීකරු බව, පැවිදි හිමිවරුන් දැකීම, කාලයෙහි දහම් සාකච්ඡාව යැයි යහපත් කරුණු සතරක් කියන ලදී. එහි යහපත් බව අදාළ පරිදි පැහැදිලි කර ඇත.

**ඛනති ආදී මේ ගාථාවෙහි විස්තරය නිමි.**

දැන් තපො ච ආදී ගාථාවයි. පාපී-අකුසල දේ තවන බැවින්, තපො උතුම් හැසිරීම හෝ බ්‍රහ්මයන්ගේ හැසිරීම බ්‍රහමචරියං ඇත්ත (ඇති සැටියෙන්) දැකීම **අරියසච්චාන දස්සනං** ඇතැම් කෙනෙක් අරියසච්චානි දස්සනං යැයි කියති. එය සුදුසු නැත. වාණ නම් වූ තණ්හා

ආසාවෙන් නික්මුණු යන තේරුමෙන් නිබ්බාණං, අවබෝධ කිරීම් - සච්ඡිකිරියා - **නිබ්බාණ සච්ඡිකිරියා** ඉතිරි කරුණු කියා ඇති පරිදිය. මේ වචන තේරුමයි.

තේරුම් විස්තර මෙසේ දතයුතුය. **තපො** දැඩි ලෝභය, දොම්නස ආදිය තැවීමේ අරුතින් ඉඳුරන් හික්මවා ගැනීමයි. කුසීත බව මැඩපැවැත්වීමේ ද උත්සාහයයි. එයින් යුතු තැනැත්තා ආතාපී යනුවෙන් ද කියනු ලැබේ. මෙය දැඩි ලෝභය නැති කිරීමත්, දැහැන් ආදිය ලැබීමටත් හේතුවන බැවින් මංගල යැයි දතයුතුය.

**බ්‍රහමචරියං** මෛථුනයෙන් වැළකීම හෙවත් (කායික) ලිංගික කටයුතුවලින් වැළකීමයි. මෙය මහණදම් පුරන සසුන් මගට සමාන වචනයකි. 'අබ්‍රහමචරියං පහාය බ්‍රහමචාරී හොති' යනුවෙන් මෙබඳු තැන අදහස් වන්නේ කායික එක්වීමෙන් වැළකීමයි. 'භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේද? ඇවැත්නි, 'එසේය 'භවති නො ආවුසො බ්‍රහමචරියං වුසසතී ති? එවමාවුසො' මෙවැනි තැන මහණදම් අදහස් වේ. 'පවිටු මාරය, මගේ සාසනය වැඩිදියුණු වී, බොහෝ දෙනා එහි පල ලබනතුරු, වැඩිදෙනා දැනගන්නාතුරු, මම පිරිනිවන් නොපාන්නෙමි' - 'න තාවාහං පාපිම, පරිනිබ්බායිසසාමි, යාව මෙ ඉදං බ්‍රහමචරියං න ඉධඤෙචව භවිසසති වීතඤච විත්‍ථාරිකං බාහුජඤඤං' - මෙබඳු තැන බ්‍රහමචරියං යෙදී ඇත්තේ සසුන පිළිබඳවයි. 'මහණ, බඹසර නම් උතුම් වූ අටැඟි මගයි, කෙසේද? ඒ යහපත් දැකීම' ආදී ලෙසිනි. 'අයමෙ භිකඛූ අරියො අට්ඨංගිකො මගෙගා බ්‍රහමචරියං, සෙය්‍යථීදං? සමමාදිට්ඨි' මෙබඳු තැන මග අදහස් වේ. අරි අටැඟි මග උතුම් ඇත්ත දැකීමට හේතුවන හෙයින් මෙම සූත්‍රයටද ඇතුලත් කරන ලද අනෙක් සියළු කරුණු ද වැදගත් වන අතර, මතු මතුත් (මගපල ආදී) නොයෙක් අයුරින් උසස් බවට පත්වීමට ලැබෙන බැවින් මංගල යැයි දතයුතුය. **අරියසච්චානං දසසනං** යනු විසුද්ධිමග්ගයෙහි සඳහන් කරන ලද පරිදි උතුම් ඇත්ත අවබෝධ කිරීම නම් වූ ඒ දැකීම 'සසර දුක ඉක්මවීමට හේතුවන බැවින්ද මංගල යැයි කියනු ලැබේ.

**නිබ්බාණ සච්ඡිකිරියා** මෙහි රහත් පලය නිවන යැයි අදහස් වේ. එයද සසර උපත සිදුවන පස් ආකාරව දක්වා ඇති තැන්වල රඳවන (ගති) 'වාණ' යනුවෙන් කියනු ලබන තණ්හාව ඉක්මවන ලද බැවින්

නිබ්බාණ යැයි දැක්වේ. ඒ නිවණට පැමිණීම හෝ පිරිසිඳ දැකීම හෝ අවබෝධය මින් අදහස් වේ. දුක ආදී සිවුසස් නුවණින් දැකීමෙන්ම ඒ අවබෝධය ලබනු ඇත. එහෙයින් එය මෙහිදී අදහස් නො කෙරේ. මෙම නිවන අවබෝධය මෙලොව ජීවිතයේ සුවයට හේතුවන බැවින් මංගල යැයි දතයුතුය.

මෙම ගාථාවෙන් තපස, බඹසර, උතුම් ඇත්ත දැකීම, නිවන අවබෝධය යන මංගල කරුණු සතර කියන ලදී. එහි යහපත් බවද ඒ ඒ තැන්හි පැහැදිළි කර ඇත.

**තපො ආදී මේ ගාථාවෙහි විස්තරය නිමි.**

දැන් ඵුටඨසස ලොකධමෙමහි යන ගාථාවයි. ඵුටඨසස යනු දැනෙන, පහස ලබන, (තමන් කරා) පැමිණෙන, ලෝකයෙහි පවත්නා සොබාවය, (සොබා) දහම - ලොකධමමා ලොව පැවැත්මට අදාල, නොනවතින සොබාවයි, චිතත සිත, සිතිවිලි, යසස අළුත හෝ මැද වයසේ හෝ තෙර බවට (පැවිදි) පත් වූ, න කමපති නොසෙල්වෙයි, කම්පා නොවෙයි, අසොකං කණගාටු නොවන, සෝකය නැමති උල් උදුරා දැමූ, විරජං කෙලෙස් පහකළ, දුරුකළ, ඛෙමං බිය නැති, උවදුරු නැති, ඉතිරි කරුණු කියා ඇති පරිදිය, මේ වචන තේරුමයි.

තේරුම් විස්තර මෙසේ දතයුතුය. ඵුටඨසස ලොක ධමෙමහි යසස චිතතං න කමපති ලාභ අලාභ ආදී අට ලෝ දහමෙහි යම් තැනැත්තෙකුට බලපාන විට, ඒවාට මුහුණපෑමේදී එයින් සිත පීඩාවට පත් කර නොගනීද, නොසැලේද, කම්පා නොවේද, ඔහුගේ ඒ සිත කම්පානොවන - ලොවුතුරු බවට පත්කරන හෙයින්, මංගල යැයි දතයුතුය. මෙම අටලෝ දහමේ බලපෑමෙන් කවරකුගේ සිත කම්පා නොවේද? කෙලෙසුන් නැතිකළ අරහත් බවට පත් තැනැත්තාගේ ය. කිසිවිටකත් වෙනත් කෙනෙකුගේ නොවේ.

'ඉතා තද ගල් පව්වක් සුළඟින් නොසෙල්වෙන්නා සේ, රූපය, හඬ, රසය, සුවඳ හා පහස ද යන සිත හා බැඳෙන, සතුටු අසතුටු (මිහිරි-අමිහිරි) හැම දෙයකදීම රහතන් වහන්සේ කම්පා නොවෙති.

කෙලෙසුන්ගෙන් මිදුණු සිත ඒවායේ හටගැනීම - නැතිවීම මැනවින් හඳුනාගෙන දකිත්' යැයි කියන ලදී.

"සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං රූපා රසා සද්දා ගන්ධා ඵස්සා ච කෙවලා
ඉට්ඨා ධම්මා අනිට්ඨා ච නප්පවෙධන්ති තාදිනො
ඨිතං චිත්තං විප්පමුත්තං වයඤ්චස්සානුපස්සති"

**අසොකං** රහත් බවට පත්වූවකුගේ සිතයි, එය සෝක කිරීම, සෝක කළ බව, සෝකයෙන් වෙළී සිටීම, යළි යළිත් සෝකයට පත්වීම, එම සිතිවිලිවලින් නැවත නැවතත් පසුතැවිල්ලට පත්වීම යනුවෙන්, 'සොකො සොචනා, සොචිතත්තං, අන්තො සොකො, අන්තො පරිසොකො, චෙතසො, පරිනිජ්ඣායිතත්තං' ආදී ලෙසින් කියනු ලැබේ. ඒ සෝකය රහතන් වහන්සේට නොමැති බැවින්, අසෝක නම් වේ. ඇතමෙක් නිවන යයි ද කියති. එය මුල් වචනය හා නොගැළපේ.

යම්සේ සෝක රහිත වූ සේම, දූවිලි ද නැති, බිය ද නැති, කෙලෙස් සිඳලන ලද තැනැත්තාගේ සිත රාග, දෝස, මෝහ යන ඇලෙන දූවිල්ලෙන් පහ වූ බැවින් **විරජං** සසර රඳවන කාමාදී බැඳීම් සතරින් නිදහස් වූ බැවින්, **ඛෙමං** මෙසේ ඒ ඒ ආකාරයෙන් ඒ ඒ තන්හි පවත්නා (ඉපදී ඇති) මොහොත දක්වා, තුන් ආකාර වූ (භවයන්හි) නොරැඳෙමින් ලොවෙහි උසස් බවටම කැඳවනු ලබන බැවින්ද, පූජා කිරීමට සුදුසු වන හෙයින්ද මංගල යැයි දතයුතුය.

මේ ගාථාවෙහි අටලෝ දහමෙන් කම්පා නොවූ සිත, සෝක රහිත සිත, කෙලෙස් දූවිලි නොරඳන සිත, බිය නැති සිත යැයි මංගල කරුණු සතරක් කියන ලදී. එහි යහපත් බව අදාල තන්හි පැහැදිලි කරන ලදී.

**ඵුට්ඨස්ස ලොකධම්මෙහි යන මේ ගාථාවෙහි විස්තරය නිමි.**

භාග්‍යවතුන් වහන්සේ, මෙසේ **අසෙවනා ච බාලානං** ආදී ගාථා දහයකින්, තිස් අටක් මංගල කරුණු දක්වා, දැන් තමන් විසින් කියන ලද එම කරුණු මුළුමනින්ම අගයමින් **එතාදිසානි කත්වාන** යන මෙම අවසාන

ගාථාව වදාළහ. මේ එහි තේරුම් දැක්වීමයි. **එතාදිසානි** අනුවණ-අයහපත් තැනැත්තන් ඇසුරු නොකිරීම වැනි මා විසින් කියන ලද එබඳු කරුණු, **කත්වානි** අනුගමනය කොට, වෙනසක් නොකොට, **සබ්බත්ථ මපරාජිතා** රූපාදි සමූහ (ඛන්ධ), කෙලෙස් අභිසංඛාර මාර, දෙවපුත්ත මාර යැයි (සසර ගමන නැවතීමට) සතුරුකාරක වූ, සතරාකාරව බෙදා දක්වා ඇති පරිදි, එකකිනිදු නොපැරදී, මුළුමනින්ම තමන් විසින් සිවුමරුන් පරාජය කොට ඇතැයි කියන ලදී. 'ම' අකුර වචන සන්ධි කිරීමෙහි යෙදී ඇතැයි දතයුතුය. **සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති** මෙබඳු කරුණු අනුගමනය කොට සිවු මරුන් පරදවා මෙලොවෙහි සිටීම්, සක්මන් කිරීම් ආදී ඉරියව්වලදී ද, පරලොවෙහිදී මුළුමනින්ම සැපවත් වෙති. බාලයන් ඇසුරට ලැබුණද, කෙලෙස් දැවිලි, වෙහෙස නොවන බැවින් සැපවත් වෙති. උවදුරු නැතිව, ඇලීම් නැතිව, බිය නැතිව යති'යි කියන ලදී. අනුනාසිකය එහි ගාථාව සකස්වීමේ පහසුව සඳහා කියන ලදැයි ද දතයුතුය. **තං තෙසං මංගලමුත්තමං** මේ ගාථා පදයෙන් භාග්‍යවතුන් වහන්සේ දේසනය නිම කළහ. ඒ කෙසේද? දෙව්පුතුනි, මෙබඳු කරුණු අනුගමනය කරන සියල්ලෝම හැමතැනකදීම සැපවත් වෙති. එහෙයින් බාලයන් ඇසුරු නොකිරීම ආදී කරුණු තිස්අට යහපත්ය. උසස්ය. වටිනා බව දැන පිළිගෙන කටයුතු කරන ලෙස පහදා දුන්හ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දේසනය නිමකරන ලදුව, කෙළසිය දහසක් දේවතාවෝ රහත් බවට පත්වූහ. සෝවාන්, සකදාගාමී, අනාගාමී පලයට පත්වූවෝ මෙතෙකැයි කිව නොහැකි විය.

භාග්‍යවතුන් වහන්සේ ඊට පසුදින, ආනන්ද තෙරුන් අමතා, 'ආනන්ද, මේ (ඉකුත් වූ) රැයෙහි එක්තරා දේවතාවෙකු මා වෙත එළඹ මංගල කරුණු ගැන පැනයක් අසන ලදී. ඔහුට මම මංගල කරුණු තිස්අටක් කීවෙමි. ආනන්ද, මේ මංගල කරුණු ඉගෙන අනෙක් මහණුන්ට කියා දෙන්නැ'යි වදාළහ. ආනන්ද හිමි, මෙම මංගල කරුණු ඉගෙන අනෙක් සඟ පිරිසට පැවසූහ. එය ගුරු පරම්පරාවෙන් ගෙන එන ලදුව අද දක්වාම පවතී. මෙසේ මෙම සසුන වැඩිදියුණු වී, බොහෝ සෙයින් පතළව පැතිරී ගොස්, තවත් බොහෝ දෙනා දැනගැනීමෙන් ද, දෙව් මිනිසුන් වෙනුවෙන්ම මනාව පවසන ලදැයි දතයුතුය.

මෙම මංගල කරුණු පිළිබඳව නුවණ වැඩීමටත්, ඊට යොමු වීමේ හැකියාව පිණිසත්, මීළඟට මෙසේ යෝජනා කෙරේ. මේ අයුරින් මෙලොව

පරලොව සුවය හා ලොවුතුරු සුවය කැමති පුද්ගලයෝ අනුවණ ජන ඇසුර හැර, නුවණැත්තවුන් නිසා පිදිය යුත්තන් පුදමින් සුදුසු පෙදෙස්හි වසමින්, පෙර කරන ලද පින් බෙලෙන්, තව තවත් යහපත් වූ පැවැත්මකට අනුබල ලබමින්, තමා එහි මනාව පිහිටමින්, බොහෝ ඇසූ දේ අනුව යහමග යමින්, මනාව හික්මී, දිවිය සරසාගෙන, යහපත් වචන පවසමින්, යම්තාක් ගිහි ජීවිතය අත් නොහරීද, ඒතාක් පැරණි ණයක් ගෙවන්නාක් මෙන් මවුපිය උවටැනින් ද, අළුත් ණයක් ලබා ගන්නාක් මෙන් අඹුදරුවන්ට සත්කාර කිරීමෙන් ද, නිරවුල් ජීවන කටයුතුවලින් ධනය, බෝග, අස්වනු ආදී සම්පත් ලබමින්, දීමෙන් (දාන) හරවත් සම්පත් ලැබීමද, දැහැමි හැසිරීමෙන් ජීවිත හරයද ගෙන, නෑදැයනට උදව්, සැළකිලි දැක්වීමෙන්, තමාට හිතවත් බවද, නිවැරදි කටයුතුවලින් අනුන් කෙරෙහි හිතවත් බවද, ඇතිකර ගනිමින්, පවින් තොරවීමෙන් අනුන් නැසීමද, මතින් වෙන්වීමෙන් තමන් නැසීමද හැරදමා, කුසල දහමෙහි පමානොවී, කුසල් දියුණුකර ගනිමින්, ගිහිබව අත්හැර පැවිදිවී සිටියත්, බුදුරදුන්, බුද්ධ සාවකයන්, ගුරුවරුන්, උපජ්ඣායවරුන් කෙරෙහි ගරුබවින් හා යටහත් පැවතුම් ඇතිව, වත්පිළිවෙතින් සතුටුකොට සෑහීමට පත්වීමෙන්, සිවුපසයෙහි ආසා හැර, කළගුණ දත් බැවින්, යහපත් කෙනෙකු ලෙස සිට, දහම් ඇසීමෙන් සිතෙහි රහස් බව හැර, ඉවසීමෙන් සියළු උවදුරු මැඬලමින්, සුවච බවින් තමාට පිහිට කොටගෙන, මහණුන් දැකීමෙන් පිළිවෙත් දකිමින්, දහම් සාකච්ඡාවෙන් දහමෙහි සැක ඇති තැන් විසඳ ගනිමින්, ඉඳුරන් සංවරයෙන් සීලයෙහි පිරිසිදු බවද, මහණදම් සපුරමින් සිත පිරිසිදු බවද, එයින් පසු සිවු පිරිසිදු බව සකසා ගනිමින්, මේ පිළිවෙතින් උතුම් සිවුසස් දැක්මෙන් පිරිසිදු නුවණ ලැබ, අරහත් පලය යැයි හඳුන්වනු ලබන නිවන අවබෝධ කරති. එබඳු දෙය අවබෝධකොට, තද සුළං හා වැස්සෙන් කම්පානොවන සිතින්, සෝක රහිත, කෙලෙස් දූවිලි නොතැවරී, බිය නැති වෙත් ද, ඒ බිය නැත්තෝ හැමතන්හිම නොපැරදෙති. හැම තැන්හිදීම සුවපත් වෙති. එහෙයින් බුදුරජාණන් වහන්සේ

**එතාදිසානි කත්වාන සබ්බත්‍ථ මපරාජිතා**
**සබ්බත්‍ථ සොත්‍ථිං ගච්ඡන්ති තං තෙසං මංගල මුත්තමං**

යැයි වදාළහ.

**මහාමංගල සූත්‍ර විස්තරය නිමි.**

# 2.5

එවං මෙ සුතං යනු සූචිලොම සූත්‍රයයි. එම සූත්‍රයට මුල් වූ කරුණ කුමක්ද? විස්තර සඳහන් කරන අතරම ඒ කරුණ පැහැදිලි කරනු ඇත. එහිදී එවං මෙ සුතං කියන ලද්දේමය. **ගයායං විහරති ටංකිතමඤ්චෙ සූචිලොමස්ස යක්ඛස්ස භවනෙ,** මෙහි ගයා යනු කුමක්ද? ටංකිත මඤ්ච යනු කුමක්ද? කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ ඒ යකුගේ භවනයෙහි වැඩසිටි සේක්ද? ඊට අදාළ කරුණු දක්වනු ලැබේ. **ගයා** යනු ගමකට ද තොටුපොළකට ද කියනු ලැබේ. ඒ දෙකම මෙහිදී යොදාගැනීම වටී. ඒ ගම්දොර ආසන්නයේ ටංකිතමඤ්ච පිහිටියේය. ගයා තොටෙහි වාසය කළද, ගයාවෙහි වැඩ වසතියි කියනු ලබයි. ගයා තොටෙහිම ඒ ටංකිතමඤ්ච පිහිටියේය. **ටංකිතමඤ්චො** යනු ගල් සතරක් මත පළල් ගලක් නංවා සකස් කරන ලද ගල් ඇඳකි. එය ආලවකගේ භවන මෙන් මේ යකුගේද වසන තැන විය.

භාග්‍යවතුන් වහන්සේ එදින උදෑසන මහා කරුණා සමවතින් නැගිට බුදුඇසින් ලොව බලන සේක්, සූචිලොම සහ ඛර නම් වූ යකුන් දෙදෙනාට සෝවාන් පලයට පැමිණීමේ හේතු සම්පත් දැක, පාසිවුරු ගෙන උදෑසනම, නොයෙක් දිසාවලින් රැස්වූ මිනිසුන්ගේ කෙළ, සොටු ආදී අපිරිසිදු දේවලින් කිලිටි වූවත් ඒ තොටුපල පිහිටි බිම්පෙදෙසට පැමිණ, සූචිලොම යකුගේ නිවහන වූ ඒ ගල්ඇඳෙහි හුන් සේක. එහෙයින්, **එකං සමයං භගවා ගයායං විහරති ටංකිතමඤ්චෙ සූචිලොමස්ස යක්ඛස්ස** භවනෙ යැයි කියන ලදී.

**තෙන ඛො පන සමයෙන** භාග්‍යවතුන් වහන්සේ යම් වේලාවක එහි වැඩ සිටි සේක් ද, ඒ කාලයෙහි, **ඛරොච යක්ඛො සූචිලොමො ච යක්ඛො භගවතො අවිදූරෙ අතික්කමන්ති** ඒ යක්කු කවරහුද? කවර හෙයින් (ඉවත්ව) පසුකොට යත්ද? ඊට කරුණු මෙසේය.

ඒ යකුන් දෙදෙනාගෙන් එකෙක් පෙර සංඝයා වහන්සේ නමකගේ තෙලක් නො විමසා රැගෙන තම සිරුරෙහි ගැල්වීය. ඔහු ඒ කළ දෙයෙහි විපාක සේ නිරයෙහි පැසී, ගයා පොකුණුතෙර යකෙක් ව උපන්නේ ය.

ඒ කම් විපාකය ඉතිරිව තිබූ බැවින්, අඟපසඟ විරූපී විය. ගල් ඉබ්බෙකුගේ මතුපිට සේ, සම රළු පහස ඇති විය. ඔහු අනුන්ට හිංසා කිරීමට කැමති වූ විට, උළු සෙවිල්ලක් බඳු හම් කබල ඔසවා හිංසා පමුණුවයි. මෙසේ ඔහු රළු-ගොරෝසු පහස ඇති බැවින් 'ඛර' 'යකු' යැයි නම් ලැබීය.

කසුප් බුදුන් කල උපාසකයෙක්ව සිටි එක්තරා යකෙක් මාසයේ අට දිනක් විහාරයට ගොස් දහම් අසයි. එක් දවසක් දහම් අසන වේලාව නිවේදනය කළ විටදී, සංඝාරාමයෙහි දොරටුව අසල (ඉදිරිපිට පිහිටි) තම කුඹුරෙහි (වල් නෙලීම්) ආදී වැඩකටයුතු කරමින් සිට, ඒ හඬ අසා, 'නෑමට ගියොත් පමා වේ'යැයි (සිතා) කිලිටි සිරුරෙන් ම, පාමොක් දේසනා කරන සාලාවට පිවිස, මාහැඟි බුමුතුරුණෙහි නොසැළකිලිමත්ව වැතිරී නිදාගත්තේය. සංයුත්ත නිකාය (කටපාඩමෙන්) දරණ හිමිවරු 'මොහු උපාසකයෙකු නොවේ'යැයි කියති. ඔහු එසේ කළ දෙයින් හා වෙනත් (අයහපත්) කටයුතුවලින් නිරයෙහි පැසී, ගයා පොකුණුතෙර, යකෙක්ව ඉපදුණේය. ඉතිරි විපාක පරිදි දැකීමට නොහෙන තරම් විරූපී විය. සිරුරෙහි ඉදිකටු වැනි ලොම් (රෝම) විය. ඔහු ඉදිකටුවලින් අනිත්නාක් මෙන් ජීවත් වන්නන්ට හිංසා පමුණුවයි. මෙසේ ඉදිකටු මෙන් වූ රෝම ඇති බැවින්, 'සූචිලොම' යකු යැයි නම ලැබීය. ඔහු තම ආහාර සඳහා වසන තැනින් නික්ම මද දුරක් ගොස් නැවතී, ගිය මගෙහිම අනෙක් යකු හමුවී භාග්‍යවතුන් වහන්සේ සමීපව (එකිනෙකා) පසුකොට ගෙන යති.

**අථ ඛො ඛරො** යැයි කුමක් නිසා කීවාහුද? ඛර යකා ශ්‍රමණ ආකල්පය දැක, 'සූචිලොමට යමෙකු බිය වෙත් ද, ඔහු මහණෙක් නොවේ. බොරු මහණ වෙස් ගත්තෙකියි කියන එබඳු අදහස් ඇත්තෙක් විය. එහෙයින් ඒ අදහස පරිදි, භාග්‍යවතුන් වහන්සේ ගැනද සිතමින්, **නෙසො සමණො සමණකො එසො** යැයි එක්වරම සිතා, යාව ජානාමී යැයි විමසනු කැමතිව කීය. **අථ ඛො** මෙසේ කීමෙන් පසු, **සූචිලොමො යකෙඛා** මෙතැන් පටන් **අපිච ඛො තෙ සමඑසෙසා පාපකො** මේ අදාල කොටස මුලින් පැහැදිලි කරන ලද්දේය. **භගවතො කායං** හුදෙක්ම මෙහිදී තම සිරුර, භාග්‍යවතුන් වහන්සේ වෙතට ළං කළේ යැයි මෙසේ කතාවේ **සම්බන්ධය** දතයුතුය. එහිදී භාග්‍යවතුන් වහන්සේ බිය නොවනු දැක, **පඤ්හං තං සමණ** යැයි කීය. ඊට කරුණු කෙසේද? 'මාගේ මේ නොමිනිස් වූ ගොරහැඩි පහසින් මිනිසකු හා සමාන මොහු බිය නොවෙයි. එහෙයින්

මම බුදු කෙනෙකුගේ නුවණට අදාළ වන පැනයක් අසමි. ඒකාන්තයෙන්ම එයට මුහුණ දිය නොහැකි වනු ඇත. එයින් වෙහෙසට පත් කරන්නෙමි'යි සූචිලොම සිතුවේය. භාග්‍යවතුන් වහන්සේ එය අසා, **න බවාහනතං** ආවුසො ආදී ලෙස කීහ. ඒ සියල්ල ආලවක සූත්‍රයෙහි දී කියා ඇති පරිදි දතයුතුය. **අථ බො සූචිලොමො යකෙබා භගවනතං ගාථාය අජඣභාසි** රාගොච දොසො ච යන ගාථාව කීය.

එම ගාථාවෙහි රාගදොසා කලින් විස්තර පරිදිය. **කුතො නිදානා** ඇතිවීමට පසුබිම කුමක්ද? හේතුවූයේ කුමක්ද? **කුතො** යන වත්මන් අදහස දෙන වචනයට 'තො' එකතුවී යැයි දතයුතුය. සමාස වීමේදී ලොප් නොවේ. නැතහොත් **නිදානා** හටගැනීම - ඉපදීම යන තේරුමයි. එහෙයින් කුතො නිදානා ඇතිවූයේ, උපන්නේදැ'යි කියන ලදී. **අරතී රතී** ලොමහංසො කුතොජා විවේක ඇති තැන්වල, සෙනසුන්වල හෝ වෙනත් වෙනත් තැන්වල හෝ, උසස් කුසල් දහම් පිළිබඳ නොඇලීමක්, නොඇළුණු බවක්, නොකැමැත්තක්, කලකිරීමක් නැතිගැන්මක්' යනුවෙන් මෙසේ අරති බෙදා දක්වා ඇත. 'පනෙතසු වා සෙනාසනෙසු අඤඤතරඤඤතරෙසු වා අධිකුසලෙසු ධමෙමසු අරති අරතිතා අනභිරති, අනභිරමණ උකකණඨිතා පරිතසසිතා', පස්කම් පිළිබඳ වූ **රති**, යම් ලොමු දැහැගැනීමක් හටගනීද ලොමහංසො නමින්ම සිතෙහි තැති ගැන්ම හඳුන්වනු ලබයි. මේ කරුණු තුන **කුතො ජා** හටගත්තේ කොතැනින්දැයි විමසයි. **කුතො සමුටඨාය** කොතැනින් ඉපිද, **මනො** කුසල සිත, **විතකකා** අභය සූත්‍රයෙහි කියන ලද කාම සිතිවිලි නවය ආදියයි. **කුමාරකා ධංකම්වොසසජනතී** යම්සේ කෙළිදෙළින් පසුවන ගම්දරුවෝ කපුටකුගේ පාද නූලෙන් බැඳ ඉහළට පහළට දමත් ද, මෙසේම කුසල සිතට අකුසල සිතිවිලි කොතැනින් හටගෙන සිත සසල කරත්දැයි විමසයි.

එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ පැන විසඳමින් **රාගොච** යන දෙවන ගාථාව වදාළහ. එහි **ඉතො** (කෙලෙස් නැති නොකළ) පුද්ගල ජීවිත සොබාව (අතතභාව) ගැන සළකා කීහ. තමන්ම හේතුකොට - මුල්කොට ඇති, රාග දොසා, **අරති රතිලොමහංසා** ඒ තමාම මුල්කොට ඇති 'කාම සිතිවිලි ආදී අකුසල් ද **විතකකා** තමාගෙන්ම හටගෙන කුසල සිත පහළ දමයි. **මනො ඔසසජනති** එයින් වෙනත් හටගන්නා කරුණු පිළිකෙව් කරමින්, **ඉතො නිදානා, ඉතො ජා, ඉතො සමුටඨාය** යැයි කීහ. වචන සකස්වන අයුරු මුල් ගාථාවෙහි කී ලෙසින් දතයුතුය. මෙසේ ඒ පැන

විසඳ දැන් ඉතො නිදානා ආදී ලෙසින් තමා නිසා තමාගෙන් හටගත් යන අදහසින් කියන ලදී. එය පහදා දෙමින්, සෙනහජා අත්තසම්භූතා යැයි කීහ. මේ සියළුම රාගාදී සිතිවිලි අවසන ආසා නැමති සෙනහසින් හටගති. එසේ හටගැනීමේදී ද, රූප ආදී උපාදාන පසෙහි ද තමා මුල්කොට, තමා කෙරෙන්ම හටගන්නා බැවින්, සෙනහජා අත්ත සම්භූතා යැයි කීහ. දැන් එය පැහැදිලි කිරීමට නිග්‍රොධසෙසව ඛන්ධජා යැයි උපමාවක් දක්වයි. කඳෙහි හටගත් බැවින් ඛන්ධජා එය වැඩීම යන්නට සමාන වචනයකි. කුමක් නිසා කියන ලද ද? යම්සේ නුග ගසෙහි කඳින් හටගත්, පහළට ඇදෙන මුල් (අරළු) පොළවෙහි රස සෙනහස ලබනවිට වැඩෙමින්, ඒ නුගයෙහිම ඒ ඒ අතුපතර හටගනීද, එපරිදිම තමා තුළ පවත්නා රාගය ආදිය තමාගේම ආසා සෙනහස ඇතිවිට හටගනී, ඒ ඒ ඉපදීමේදීම ඇස් ආදී කොටස්වලට අරමුණු ලබන දොරටු සකස් වෙයි. එහෙයින් තමාම හේතුකොට, තමාගෙන්ම හටගන්නා, තමා කෙරෙන්ම, ඒ රාගාදිය පිහිටන්නේ යැයි දතයුතුය. ඉතිරි ගාථා අඩකින් හා අනික් ගාථාවෙහි මේ සියළු කරුණු එක්කොට මෙසේ විස්තර දැක්වෙයි. තමන් හා බැඳී හටගන්නා බැවින්, පුථු විසත්තා කාමෙසු රාගයද පස්කම් ගුණ ලෙසින් ද, තරහව ඊට ගැටෙන තැන් ලෙසින් ද, අරති ආදිය ද ඒ ඒ කොටස් ලෙසින් (සිරුරේ) දොරටු හා බැඳෙන අරමුණු ඒ ඒ කැමති දෙයෙහි ඇලී, ගැලී, පැටලී පවතී. කුමක් ලෙසින්ද? මාලුවාව විතතා වනෙ කැලෑවෙහි 'මාලුවා' නම් වැල වැඩී, ඒ ඒ ගස් අතු රිකිලි ආදියෙහි වෙලී, පැටලී පැතිරී යන්නා සේ, බොහෝ දෙනා ඒ ඒ දෙයට කැමති වෙමින් කෙලෙසින් පිරී සිටිති. එය නියමාකාරව දන්නා තැනැත්තෝ එය දුරු කරති. සූචිලොම යකුනි, අසව, යතො නිදානං යනු භාව නපුංසක වචනයයි. එයින් අදහස් කරන්නේ කුමක්ද? යෙ පුද්ගලයෝ, තං කෙලෙස් සමූහය, යතො නිදානං හටගන්නේ යැයි මෙසේ දැනගනිති. තෙ නං තෘෂ්ණා නම් වූ ඇලීම් සෙනෙහස නිසා ඊළඟ භවය ලැබෙන බව දැන, ඒ ඇලීම් සෙනෙහසෙහි ආදීනව විපාක නුවණින් මෙනෙහි කර භාවනා නුවණ නමැති ගින්නෙන් වියළමින්, විනොදෙනති අත්හරිති. දුරු කරති. එය අපගේ යහපත් වචනයයි. සුණෙහි යක්ඛ මෙසේ මෙහි තමන් නිසා වන දුක දැන, තණ්හා සෙනහස් රාගාදී කෙලෙස් සමූහය දුරු කිරීමෙන්, හටගැනීමේ හේතුව නැති කිරීමද, පෙන්වයි. යමෙක් එය දුරු කරත්ද, තෙ දුත්තරං ඔඝමිමං තරනති අතිණ්ණපුබ්බං අපුනබ්භවාය එයින් පිළිවෙත් මග වැඩීමේදී 'නැතිකිරීම' අවබෝධ කර ගැනීමද පෙන්වයි. යමෙක් ඒ කෙලෙස් සමූහය දුරු කරත්ද, ඔවුහු ඊට පාදක වන මග වඩති.

ඒ මග වැඩීම හැර, කෙලෙස් දුරු කිරීමට වෙනත් මගක් නැත. මේ මග වඩන්නෝ, තමා තුළ පවත්නා වූ නුවණින්, එතරවීමට අපහසු කාමාදී සැඩපහර සතර තරණය කරති. මගග භාවනාව යනු සැඬ පහර තරණයයි. අතිණණ පුබබං මේ ඉතා දිග වූ, කල්ගතවන, සිහිනෙනුදු ඉක්මවිය නොහැකි විරූ, අපුනබභවාය නිවන පිණිස, මෙසේ මෙම සිවුසස් දැක්වෙන ගාථාව අසමින්, 'අසා, දහම සිත දරා ගනිති. එසේ සිත තබා ගත් දහම මැනවින් විමසා බලති. 'සුත්වා ධමමං ධාරෙනති', ධතානං ධමමානං අත්ථමුපපරිකඛනති යැයි කියා ඇති පරිදි, නුවණ මෙහෙයවමින් ඒ යහළු යකුන් දෙදෙනා ද සෝවාන් පලයෙහි පිහිටියහ. රන්වන් වූ පහදන සුළු බවින් දෙවියන් මෙන් අලංකාරවත් වූහ.

**සුචිලොම සූත්‍ර විස්තරය නිමි.**

## 2.6

ධමමචරියං යනු කපිල සූත්‍රයයි. මෙම සූත්‍රය දේසනා කිරීමට හේතුව කුමක්ද? හේමවත සූත්‍ර විස්තරයෙහි සඳහන් වූ පරිදි කසුප් බුදුරදුන් පිරිනිවන්පෑ කල්හී, සහෝදර කුලපුත්තු දෙදෙනෙක් ගිහිගෙයින් නික්ම සාවක හිමිවරුන් ළඟ පැවිදි වූහ. වැඩිමහල් තැනැත්තා සොධන නම් විය. කනිටු සොයුරු කපිලය. ඔවුන්ගේ මවු සාධනී ය. කණිටු සොයුරිය තාපනා වූවාය. මවත් දුවත් මෙහෙණි සස්නෙහි පැවිදි වූහ. හේමවත සූත්‍ර විස්තරයෙහි කී පරිදි 'හිමියනි, සසුනෙහි ධුර කොපමණදැ'යි විචාරා, දෙටු සොයුරු හිමි, 'විදසුන් ධුරය පුරන්නෙමි'යි පස් වසරක් ගුරු උපජඣාය හිමිවරුන් ළඟ වැස, සපුරන ලද වස් පහක් ඇත්තෙක්ව, අරහත් පලය තෙක් කමටහන් අසා, කැලයට පිවිස උත්සාහ කරමින්, රහත්පල ලැබීය. කපිල හිමි 'මම තවම තරුණ වෙමි, වැඩිහිටි වියෙහිදී

විදසුන් ධූරය සපුරන්නෙමි'යි දහම ඉගෙන තුන්පිටකයෙහිම හසළ දැනුමක් ලැබීය. කපිල හිමිගේ දහමෙහි වියත් බව නිසා පිරිවර ද පිරිවර නිසා ලාභ සත්කාරද ලැබුණි. බොහෝ ඇසූ පිරූ තැන් ඇති වියතෙකැයි උඩඟු බවෙන් මත්ව, නොදන්නා දෙයක් වුවත් දන්නා බව අඟවමින්, වෙනත් හිමිවරුන් පිළිගැනීමට කැප දේ අකැප ලෙසත්, අකැප දේ කැප ලෙසත්, වැරදි දේ නිවැරදි ලෙසත් නිවැරදි දේ වැරදි ලෙසත් පවසයි. අනෙක් සිල්වත් මහණුන් 'ඇවැත්නි, කපිල, මෙසේ නොකිව මැනව'යි ආදී ලෙසින් අවවාද කරනු ලබනවිට, 'හිස් මුට්ටියක් වැනි ඔබලා කුමක් දනිවු'දැයි දොස් නගමින්, ගරහමින්ම හැසිරෙයි. හිමිවරු කපිල හිමිගේ සොයුරු සොධන තෙරුන්ටද ඒ කරුණ සැළකළහ. සොධන හිමිද කපිල හිමි වෙත එළඹ, 'ඇවැත්නි, කපිල, සාසනය දිගුකලක් පවතින්නේ ඔබවැන්නන්ගේ මනා පිළිවෙත් නිසයි, කැප දේ අකැප ලෙසත්,......නිවැරදි දේ වැරදි ලෙස නොකියව'යි කීය. කපිල හිමි එය පිළි නො ගත්තේය. එහිදී සොධන හිමි තෙවරක්ම එසේ නොකියව කියා හිමිකරුවෙක්, දාසයාට එක් වචනයක් හෝ වචන දෙකක් (එක් වරක් හෝ දෙවරක්) අනුකම්පාවෙන් කියන්නේ ය. ඊට වැඩියෙන් නො කියන්නේය.

'එකං වාචං ද්‍වෙ වාචා භණෙය්‍ය අනුකම්පකො
තතුත්තරිං න භාසෙය්‍ය, දාසො අයිරස්ස සන්තිකෙ'

'ඇවැත්නි, ඔබම කරන දෙය, ඔබ ම බලාගත මැනවැ'යි ද පවසා එතැනින් ඉවත්ව ගියේය. එතැන් පටන් යහළු පැවිදි හිමිවරු කපිල හිමි හැර ගියහ. කපිල හිමි අයහපත්ව, අයහපත් ලෙසින් කටයුතු කරන පිරිස පිරිවරා, වෙසෙමින්, එක් දවසක් 'පොහොය විචාරන්නෙමි'යි මුල් අසුනෙහි හිඳ විසිතුරු වටාපොත රැගෙන, 'ඇවැත්නි, මෙහි පැවිදි හිමිවරුන්ට පාමොක් දෙසුම වේ'යැයි තෙවරක් කීය. එවිට එක මහණක හෝ 'මම ඒ අනුව පවතිමි හෝ, ඒ හිමිවරුන් කෙරෙහි පාමොක් පවත්නා බවක් හෝ නො පැවසීය. කපිල හිමි 'පාමොක් ඇසුවත්, නොඇසුවත්, විනය නම් නැතැයි' කියා අසුනින් නැගිට්ටේය. මෙසේ කසුප් බුදුරදුන්ගේ සාසනය පිරිහී ගියේ ය. වැනසුණේය.

සෝධන තෙරුන් වහන්සේ ද එදිනම පිරිනිවන් පෑහ. ඒ කපිල හිමි ද මෙසේ ඒ සසුන පිරිහීමට කටයුතුකොට, අවීචි මහා නිරයෙහි උපන්නේ ය. කපිල හිමිගේ මව ද සොහොයුරිය ද එම වැරදි අදහස

ගෙන සිල්වත් මහණුන්ට දොස් නගමින්, නින්දා කරමින්, කළුරියකොට නිරයෙහි උපන්හ. ඒ කාලයෙහිම, මිනිස්සු පන්සියයක්, ගම් වනසමින්, සොරකමින් ජීවත් වී, ජනපදවාසීන් ලුහුබඳනා විට පලායද්දී, කැලයට වැදී, එහි කිසිවක් ලබාගැනීමට හෝ පිළිසරණක් නොදැක, ඒ අසළ වූ ගල් පව්වෙක වසන එක් වනවාසී මහණකු දැක, වැඳ 'හිමියනි, අපට පිළිසරණක් වනු මැනව'යි කීහ. 'ඔබලාට සීලය හා සමාන අන් පිළිසරණක් නැත, පන්සිල් සමාදන් වෙව'යි කීය. ඔවුහු සියල්ලෝම 'යහපතැ'යි පිළිගෙන, සිල් සමාදන් වූහ. තෙරුන් වහන්සේ, 'දැන් ඔබ හැම සිල්වත් ය. දැන් තමන්ගේ ජීවිත විනාස වෙතත්, සිත කිලිටි කර නොගනිවු' යැයි පැවසූහ. ඔවුහු 'යහපතැ'යි පිළිගත්හ. පසුව ජනපදයට පැමිණ, එහා මෙහා ගමන් කරන ඒ මිනිසුන් දුටු ජනපදිකයෝ ඒ සියල්ලන්ගේම ජීවිත වැනසූහ. ඔවුහු කාමාවචර දෙව්ලෝකවල උපන්හ. ඔවුන්ගේ දෙටු සොරා ඒ දෙව් පිරිස අතර දෙටු දෙව් පුත් විය. අනෙක් සියල්ලෝම ඔහුගේ පිරිවර වූහ. ඔවුහු සසරෙහි, දෙව්ලොව හා මනුලොව අතර සැරිසරමින්, එක් බුදුවරයකුගේ කාලයක් දෙව්ලොව කල්යවා, අප ගොතම බුදුන් කල, එයින් චුත වූහ. දෙටු දෙව්පුතු, සැවැත්පුර දොරටුව අසළ පිහිටි ධීවර ගමක, පවුල් පන්සියයකට දෙටු වූ මසුන් මරන්නාගේ බිරියගේ කුස පිළිසිඳ ගත්තේය. අනික් දෙව්වරු අනෙක් පවුල්වල බිරියන්ගේ කුස්හි පිළිසිඳ ගත්හ. මෙසේ ඔවුන්ගේ පිළිසිඳ ගැනීම් ද, බිහිවීම ද එකම දිනක විය. ඉක්බිති දෙටු මසුන් මරන්නා 'අද දින උපන් තවත් දරුවන් මේ ගමෙහි වෙත්දැ'යි සොයන විට, ඒ දරුවන් දැක, 'මොවුන් මගේ පුතුට සහායකයන් වන්නාහ'යි සියල්ලන්ටම ඇතිදැඩි කිරීමට මුදල් ආදිය දුන්නේය. වැළිකෙළියෙහි පටන්ම යහළු වූ ඒ සියළු දරුවෝ කල්යත්ම වැඩිවියට පත්වූහ. ඔවුන්ගෙන් නායකයා වූයේ යසෝජය. කපිල ද එකල්හී නිරයෙහි පැසුණු කාලය අවසන්ව, අචිරවතී නදියෙහි, රන්වන් පැහැ ඇති, මුවින් දුගඳ හමන මාළුවෙක්ව උපන්නේය. දිනක්, සියළු මසුන් මරන දරුවෝ දැල් ගෙන, 'මසුන් අල්ලා ගන්නෙමු'යි ගඟට ගොස් දැල් දැමූහ. ඔවුන්ගේ දැලට ඒ මාළුවා ඇතුළු විය. ඒ දුටු සියළු ධීවර ගම්වාසීහු 'අපේ පුතුන් මුල්වරටම අල්ලා ගත්තේ රන් මාළුවෙකි, එය ඒ දරුවන්ගේ දියුණුවට හේතුවෙයි. දැන් රජතුමා ඔවුන්ට සෑහෙන තරම් ධනය දෙනු ඇතැ'යි මහ හඬින් කෑගැසූහ. ඒ දරුවෝ පන්සියයම මාළුවා නැවක තබා, නැව ඔසවා ගෙන, රජතුමා වෙත ගියහ. රජු එය දැක, 'දරුවනි, අර කුමක්දැ'යි ඇසීය. 'දේවයන් වහන්ස, මාළුවෙකැ'යි කීහ. රජු රන්වන් පැහැ මාළුවා දැක, මාළුවා රැගෙන බුදුරජාණන් වහන්සේ කරා ගියේය.

මාළුවා මුව විවර කරනවිට, ජේතවන පෙදෙසම තද දුගඳ පැතිරිණි. 'හිමියනි, කුමක් නිසා මාළුවා රන් පැහැ වීද? කුමක් නිසා උගේ මුවින් දුගඳ හමන්නේදැ'යි බුදුරදුන්ගෙන් ඇසීය. 'මහරජ, මේ මාළුවා කසසප බුදුරදුන්ගේ සාසනයෙහි, කපිල නමින් පැවිදිව සිටියේය. දහමෙහි බොහෝ ඇසූ පිරූ තැන් ඇතිව, තම වචනය පිළිනොගන්නා මහණුන්ට නින්දා අපහාස කරමින් සසුන වැනසීය. ඒ විපාකයෙන් අවීචි මහා නිරයෙහි උපන්නේ ය. ඉතිරි විපාක ලෙසින්, දැන් මසෙක්ව උපනි. දිගු කලක් බුදු වචන කියා දුන් බැවින් ද, බුදුගුණ කී බැවින් ද ඒ විපාකය අනුව මෙබඳු පැහැය ලැබීය. මහණුන්ට බැන වැදී, නින්දා අපහාස කළ හෙයින් මුවින් දුගඳ හමයි. මහරජ, මොහු ලවාම එය ඉදිරිපත් කරවමි'යි පැවසූහ. 'එසේය, හිමියනි' රජු පිළිවදන් දුන්නේය. 'ඔබ කපිල නේද?' භාග්‍යවතුන් වහන්සේ මාළුවා ඇමතූහ. 'එසේය හිමියනි, මම කපිල වෙමි.' 'කොහි සිට පැමිණියෙහිද?' 'භගවත් හිමියනි, අවීචි මහා නිරයෙහි සිටය.' 'සෝධන කොහි ගියේ ද?' 'භගවත් හිමියනි, පිරිනිවන් පෑවේය.', 'සාධනී ගියේ කොහේද?' භගවත් හිමියනි, නිරයේ ඉපදුණාය', 'තපනා කොහි ගියේද?' 'මහා නිරයෙහි උපන්නේය', 'දැන් ඔබ යන්නේ කොහේද?' 'භාග්‍යවතුන් වහන්ස, මහා නිරයටයි', එකෙණෙහිම විපිළිසර වූ කපිල මාළුවා හිසෙන් නැවට පහර දී මියගොස්, මහා නිරයෙහි උපන්නේය. මහජනයා ලොමුදැහැ ගනිමින් සංවේගයට පත් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එහි පැමිණි ගිහි පැවිදි පිරිසට, ඒ මොහොතට සුදුසු පරිදි දහම් දෙසමින්, මෙම සූත්‍රය වදාළහ.

**ධම්මචරියං** කයෙන් සුචරිතවත් වීම ආදී ලෙසින් දැහැමි හැසිරීම. **බ්‍රහ්මචරියං** මගපල සඳහා වූ උතුම් හැසිරීමයි. **එතදාහු වසුත්තමං** එසේ මනා හැසිරීමෙන් ලොවී ලොවුතුරු-සගමොක් සුව සාදාලන බැවින් බුදුවරු ආදී උතුමෝ එහි උසස් බව කීහ. **වසුත්තමං** වටිනා උතුම් රුවනයි. එය අනුගමනය කරන, තම බලය මුල්කොට කටයුතු කරන රජවරුන් ආදීනටද සමනොවන අදහසයි.

**මෙපමණකින්** ගිහියෙකුගේ හෝ පැවිද්දකුගේ හෝ මනා පිළිවෙත්හි පිහිටීම ඒ තැනැත්තාට පිළිසරණ වේ යැයි දක්වා, දැන් පිළිවෙත් නොරකින පැවිදි ජීවිතයෙහි නිසරු බව දක්වමින්, කපිලට හා එබඳු වෙනත් තැනැත්තන්ට දොස් නගමින් **පබ්බජිතොපි චෙ හොති** ආදී ලෙසින් වදාළහ. මේ එහි තේරුම් විස්තර කිරීමයි. යමෙක් ගිහි බව අත්හැර, හිස

මුඩුකොට, කසාවත් හැඳ පමණින් පැවිදි බවට පත්වීමෙන් **පබ්බජිතොපි වෙ හොති** පෙර කියන ලද අරුතින්, **අගාරසමා අනගාරියං, සො චෙ මුඛරජාතිකො** නපුරු වචන කියන, නොයෙක් ආකාරයෙන් වෙහෙස පත් කිරීමෙහි තදින් ඇළුනේ **විහෙසාභිරතො**, ලජ්ජා බය නොමැති වීමෙන් තිරිසනකුට සමාන වූ **මගො, ජීවිතං තස්ස පාපියො** මෙබඳු තැනැත්තකුගේ ජීවිතය ඉතා පව්කාරය. ඉතා පහත්ය. කවර හෙයින්ද? මේ මිසදිටු පිළිවෙතින් රාගාදී නොයෙක් ආකාර වූ කෙලෙස් දූවිලි **රජං වඩ්ඪෙති අත්තනො** හුදෙක් ජීවිතය පව්කාර වන්නේ මේ කරුණින් පමණක් නොවේ. තව ද මෙබඳු මහණ දොඩමළු ගති ඇති බැවින් **කලහාභිරතො භික්ඛු** වේ. යහපත් පිය වචන දැනගත නොහී, මුළා වීමෙන් **මොහධම්මෙන ආවටො**, 'ඇවැත්නි, කපිල, මෙසේ නොකියව, මේ ආකාරයෙන් ද එය තේරුම් ගනුව'යි සිල්වත් මහණුන් විසින් කියනු ලබද්දී, **අක්ඛාතම්පි න ජානාති ධම්මං බුද්ධෙන දෙසිතං** යම් මහණකේ, බුදුරදුන් දෙසූ දහම නොයෙක් ආකාරයෙන් පැහැදිලිකොට කියන නමුදු නොදනිති. මේ අයුරින්ද ඔහුගේ ජීවිතය පව්කාරය. පහත්ය. එසේ ඒ මහණ මෙබඳු වෙහෙසකට (අනුන්) පත්කිරීමෙහි කැමති වීමෙන් **විහෙසං භාවිතත්තානං** තම ජීවිතය භාවනා ආදියෙන් දියුණුවට පත්කරගන්නා ලද සොධන රහතන් වහන්සේගේ පටන්, 'ඔබලා විනය - සුත්ත අබිදහම නොදනිවු, වයස්ගතව පැවිදි වූවන්'යැයි වෙහෙසට (හිරිහැරයට) පත් කරමින්, දුතියා විබත් අරුතින් ජටයී විබතින් යෙදුණි. නැතහොත් කියා ඇති පරිද්දෙන්, **විහෙසං භාවිතත්තානං** කරන්නා වූ (කරොනෙතා) කරමින් යන ඉතිරි කොටස දතයුතුය. මෙසේ සම්මත ලෙසින්ම ජටයී විබත්ම යෙදේ. **අවිජ්ජාය පුරක්ඛතො** එසේ (සිත) වඩනා ලද උසස් කෙනෙකුට, වෙහෙස කිරීමෙන් ලැබෙන විපාක නොදැනීමෙන් මුළාවෙන් වැසී, එයින් මෙහෙයවන ලදුව, පොළඹවනු ලදුව, වෙහෙසට පත්කොට මෙලොවදීම සිතට හිරිහැර පමුණුවා ගනිමින්, **සංකිලෙසං** නැවත මතු නිරයට පැමිණීමෙන්, **මග්ගං නිරයගාමිනං න ජානාති** සතර අපායට යන මග නොදැන, **විනිපාතං සමාපන්නො** එහි දරුණු ලෙස වැටී, **ගබ්භා ගබ්භං තමා තමං** එක් එක් අපායවල සියක්වර හෝ දහස් වරක්ද, මවුකුසින් මවුකුසටද, සඳහිරුගෙන්ද, විනාසනොවන අසුර කායිකයන් මෙන් අඳුරේ අඳුරටම ගැලී, **ස වෙ තාදිසකො භික්ඛු පෙච්ච** මෙලොවින් පරලොව ගොස් මේ කපිල මාළුවා මෙන් නොයෙක් ආකාර වූ **දුක්ඛං නිගච්ඡති** (දුකට පත්වන) හේතුව කුමක්ද? **ගූථකූපො යථා අස්ස සම්පුණ්ණො ගණවස්සිකො** යම්සේ වැසිකිළිවලක් අසූචි එකතු වෙමින්, බොහෝ වසර

ගණනකට පසු මුවවිට දක්වාම අසූචියෙන් පිරී, උතුරා යයිද, වතුර කළ සියයකින් හෝ දහසකින් හෝ සෝදනු ලැබූවත්, දුගඳ - කිළිටි පැහැය ඉවත් නොවී, පිරිසිදු බව නොවේද, එපරිද්දෙන්ම, **යො එවරූපො අසස** දිගුකලක් අයහපත් කටයුතුවලින් - අසූචි වළක් මෙන් අසූචි නම් වූ පාපයෙන් පිරුණු බැවින්, **සාංගණෙ** ඒ පුද්ගලයා **දුබබිසොධො** බොහෝ කලක් ඒ කෙලෙස් නිසා වූ කටයුතුවල විපාක විඳිනු ලැබුවද පිරිසිදු නොවේ. එහෙයින් වසර ගණනාවක් හෝ කිව නොහැකි තරම් කාලයක් එබඳු මහණ මරණින් පසු දුකට පත්වෙයි. එමෙන්ම මේ සඳහන් කරන්නේ මේ ගාථාවෙහි සම්බන්ධයයි. 'මෙබඳු මහණ මරණින් පසු දුකට පත්වේයැයි කියන විට - මරණින් පසු දුක් නොලබන සේ කටයුතු කිරීම් හැකියාවක් ඇත්දැයි ඔබලාට සිතෙනු ඇත. එසේ නොහැකිය. කුමක් හෙයින්ද? **යම් හෙයකින් ගූථකූපො - සාංගණෙ.....** ඒ අයුරින් මුලදී සඳහන් කළ පරිදිය. **යං එවරූපං ජානාථ භිකඛවො ගෙහනිසසිතං** මෙබඳු පස්කම්හි ගැලී ඇති සැටි දැනගනුව. නැති යහගුණ බලාපොරොත්තුවෙන්, පාපී වූ සිතැඟිවලින් පිරී ඇති බැවින් **පාපිචඡං**, කාම සිතිවිලිවලින් යුතු **පාපසංකපපං** කයෙන් වන වැරදිවලින් හා (විනයෙහි දැක්වෙන පරිදි) උණගස් දානයක් සේ ලබාදීම ආදී අයහපත් පාපී හැසිරීමෙන් යුතු **පාපාචාරං**, ගණිකා ඇසුර වැනි අයහපතට යොමුවීමෙන් **පාපගොචරං**, **සබෙබ සමගගභූතවාන අභිනිබබිජජයාථ නං** එහි **අභිනිබබිජජයාථ** යනු අත්හැර දමව, ඇසුරු නොකරව, එසේ අත්හැර දැමීමෙන් පමණක් උත්සාහය අඩු නොකරව. **කාරණඩවං නිදධමථ කසමබුඤච අවකසසථ** තව ද, කසල බවට පත් තැනැත්තා කසල ගොඩක් මෙන් බලාපොරොත්තු නොතබාම ඉවත් කරව. ඔහු කැත්කුලවතුන් මැදට පිවිසී සැරව වැගිරෙන, වණ-තුවාල සැදුණු බිඳුණු සිරුරැති සැඩොලකු මෙන් ඉවත් කරව. ඔහුගේ අතින් හෝ හිසින් හෝ ඇද බැහැරට දමව, යම්සේ ගරු කටයුතු මහ මුගලන් තෙරුන් ඒ (පැවිදි) පවිටු තැනැත්තා අතින් අල්ලාගෙන දොරකොටුවෙන් එළියට දමා, දොරගුළු දැමූ පරිදිම මේ පවිටු කසල තැනැත්තා ද බැහැර කළ යුතු යැයි දක්වයි. කුමක් නිසාද? සංඝාරාමය කරන ලද්දේ සිල්වත් මහණුන්ට මිස දුසිලන්ට නොවන බැවිනි. **තතො පලාපෙ වාහෙථ අසසමණෙ සමණමානිනෙ** එය එසේමය. බොල් වී ඇතුලෙහි සහල් ඇටය නොමැති වුවද, දහයියාවලට (පොතුර) පිටතින් වී ඇටය මෙන් පෙනෙන්නා සේ, පවිටු මහණ ඇතුලතින් සීලාදී ගුණ නැතිවුවද, කසාවත හැඳීමෙන් හා පිරිකර දැරීමෙන් බාහිර පෙනුම මහණකු ලෙසයි. එහෙයින් බොල් - හරයක් නැතැයි යන අදහසින් පලාප යැයි කියනු ලැබේ. ඒ

බොල් දියෙහි පාකර හරිවු, පොළා ඉවත් කරවු, වනසා දමවු, සියළු ආකාරයෙන්ම පැවිද්දකු නොවී, මහණ වෙසින් සිට මහණකු යයි සිතන්නන් ඉවත් කරව. **නිදධමිත්වාන.........පතිසසතා** එහි **කපපයවෙහා** යනු පිළියෙල කරවු, කරව යන තේරුමයි. **පතිසසා** එකිනෙකා කෙරෙහි ගරු කිරීමෙන් සිහියෙන් යුතුව, **තතො සමගගා නිපකා දුකඛසසනතං කරිසසථ** මෙසේ ඔබලා සීලයෙන් පිරිසිදුව සිල්වත් ගුණවත් මහණුන් සමග ඇසුරු කරමින්, යහපත් හැඟීමෙන් හා මහණදමට අනුකූල සීල සංවරයෙන් යුතුව, සමගිව, කෙමෙන් කෙමෙන් පැසුණු නුවණින් පිරිපුන්ව සියළු සසර දුක් කෙළවර කරවු යැයි අරහත් පලය කුළුගන්වමින් දේසනය නිමවූ සේක. දේසනය අවසන ඒ මසුන් මරණ දරුවෝ පන්සියයම සංවේගයට පත්ව, නොබෝ කලකින්ම දුක් කෙළවරකොට, භාග්‍යවතුන් වහන්සේ සමග **ආනඤජවිහාර සමාපතතිධමම** සේ හඳුන්වන කෙලෙස් සිඳ එකම අරමුණ වූ තිවන ලදහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සමග 'එකම දේ පරිහරණය' නම් වූ ඒ තතු උදානයෙහි සඳහන් යසොජ සූත්‍රය අනුව දතයුතුය.

කපිල සූත්‍ර විස්තරය නිමි.

## 2.7

**එවං මෙ සුතං බ්‍රාහමණධම්මික** සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? ඊට අදාල කතාව **අථ ඛො සමබහුලා** ආදී ලෙසින් කියන ලද්දේය. **සමබහුලා** බොහෝ, නොයෙක්, **කොසලකා** කොසොල් රටවැසියෝ, **බ්‍රාහමණ මහාසාලා** මහත් සම්පත් ඇති බමුණු සම්මත කුලයක උපත ලද්දෝ, නිදන් කොට තබන ලද ඔවුන්ගේ ධනය අසූ කෙළකි. ඔවුන්ට බමුණු මහසල් යැයි කියනු ලැබේ. මොවුන් ද එසේය. එහෙයින් බ්‍රාහ්මණ මහාසාලා යැයි කියන ලදී. **ජිණණා** ජරාවට පත්ව, දත් වැටීම ආදී කැඩුණු බවට පත්ව, **වුදධා** වයස්ගත වනවිට වැඩුණු අඟපසඟවල කටයුතු සීමිතව, **මහලලකා** උපතින් පසු මෙසේ වැඩිහිටිව

මහළු බවට පත්වූවෝ, ඉපිද බොහෝ කලක් ගත වූ, **අද්ධගතා** දීගුකල් ගතකළ, රජවරුන් වෙනුවෙන් බමුණන් ඉටුකරන රාජකාරිවලින් දෙකොටසක්, තුන් කොටසක් සේවය කොට කල්ගත වූයේ, **වයො අනුප්පත්තා** (ජීවිතයේ) පසු වයසට පැමිණි, තව ද වෙනස් ලෙස සඳහන් කළොත්, **ජිණ්ණ** පැරණි, කුල පරම්පරාව බොහෝකලක් පවත්වා ගත් බව කියන ලදී. **වුද්ධා** හික්මුණු, යහපත් ගුණයෙන් වැඩුණු, **මහල්ලකා** මහත් වස්තු සම්පත් ඇති බැවින් මහා පොහොසත්තු වූවෝ, **අද්ධගතා** බමුණු පරපුරට අයත් වත්, හැසිරීම් ආදී සීමා නො ඉක්මවා හැසිරෙන, **වයො අනුප්පත්තා** උපතින් මේ වනවිට (දැන්) වැඩිහිටි බවට පත්ව, ජීවිතයේ අවසාන කොටසෙහි කල්ගත කරන්නාහු යන මේ අදහස දතයුතුය. ඉතිරි අරුත් පහසුය. **භගවතා සද්ධිං සම්මොදිංසු** ඉවසිය හැකිද? සුවදුක් කෙසේද? ආදිය විමසමින් එකිනෙකා අතර සතුටුසාමීචි කතා කළහ. 'පින්වත් ගෝතම, කෙසේද? (පරිසරය දේසගුණ රටාව) ඉවසිය හැකිද? යැපෙන පමණට සිවුපසය ලැබේද? අපහසුතා තිබේද? සුවසේ සිටිත්ද? පහසු විවේකයක් ඇත්ද?' යනාදී කතාබහෙන් සතුටු වූහ. තුටුපහටු පියජනක බව ඇතිවන බැවින් එසේ සතුටුසාමීචි කතා කිරීම සුදුසුය. අරුත්බර වචනයේ මිහිර නිසාම බොහෝ කලක් සිහිපත් කරන්නට නිතර හේතුවන බැවින් සාරාණීය වේ. අසනවිට කණට සුව දනවන බැවින්, සම්මොදනීය වේ. සිහිකරන විට සිතට සුව දනවන බැවින් සාරාණීය වේ. එමෙන්ම පිරිසිදු යහපත් වචන සතුට දනවන බැවින් ද සම්මොදනීය වේ. යහපත් තේරුමක් ඇති බැවින් සාරාණීය වේ. මෙසේ නොයෙක් ආකාරයෙන් **සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා** (කතාබහ) අවසන්කොට, නිමවා යම් කරුණක් සඳහා පැමිණියාහුද, එය විමසනු කැමතිව, **එකමන්තං නිසීදිංසු** එය,

> **"න පච්ඡතො න පුරතො නාපි ආසන්න දූරතො**
> **න පස්සෙ නාපි පටිවාතෙ න චාපි ඔනතුන්නතෙ"**

ආදී ලෙසින් මංගල සූත්‍ර විස්තරයෙහි සඳහන් කර ඇති පරිදිමය. මෙසේ **එකමන්තං නිසින්නා බො තෙ බ්‍රාහමණමහාසාළා භගවන්තං එතදවොචුං** යැයි සැළකළේ කුමක් ගැනද? **සන්දිස්සන්ති නු බො** ආදී ඒ සියළු තැන් කලින් පැහැදිලි කොට ඇත. **බ්‍රාහමණානං බ්‍රාහමණ ධම්මෙහි** හුදෙක්ම මෙහි රටතොට, කාලය ආදී කරුණු හැර බමුණු දහමක් වේද ඒ පිළිබඳ වූ, **තෙන හි බ්‍රාහමණං** බ්‍රාහ්මණයෙනි, යම් කරුණක් ඔබලා මගෙන්

විමසවුද? **සුණාථ** සවන් යොමා එය අසවු, **සාධුකං මනසි කරොථ** නුවණින් මෙනෙහි කරවු, සිත විසිර යා නොදී අසවු, මනාව සිතෙහි දරා ගනිමින් හොඳින් සිතා බලව යනාදී ලෙසින්, පෙර නොකියන ලද කරුණු අදහස් වේයැයි දතයුතුය. **එවං භොති බො තෙ බ්‍රාහමණ මහාසාළා භගවතො පච්චසෙසාසුං** භාග්‍යවතුන් වහන්සේගේ ඒ වචන මනාව පිළිගනිමින්, එයට මුල්තැන දෙමින් ඇසූහ. නැතහොත් එසේ අසන බවට තහවුරු කළහ. අසව, මැනවින් මෙනෙහි කරවයි කීමට එකඟ වන්නේ එසේ අනුගමනය කරන බවට පිළිවදන් දීමෙනි. ඉක්බිති ඔවුන්ගේ ඒ පිළිතුරෙන් පසුව **ඉසයො පුබ්බකා** ආදී ලෙසින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීහ.

එහි මුල් ගාථාවෙහි **සංයතත්තා** යනු සීලයෙන් හික්මුණු, සංවර වූ සිත් ඇති බවයි. **තපස්සිනො** ඉඳුරන් සංවරයෙහි තපසින් යුතු, **අත්තදත්ථමචාරිංසු** වේද මතුරු ඉගැන්වීමෙන්, බඹ විහරණයෙන්, භාවනාදියෙන් තම දියුණුව සලසා ගත්හ. ඉතිරි කරුණු පැහැදිලිය.

දෙවන ගාථා ආදියෙහි මේ කෙටි විස්තරයයි. **න පසූ බ්‍රාහමණානාසු** පෙර බමුණන්ට සත්තු නොසිටියහ. ඔවුහු සතුන් ඇති නොකළහ. **න හිරඤ්ඤං න ධානියං** බමුණන්ට අමුරන්ද, යටත් පිරිසෙයින් මසුරමක්වත් නොතිබුණි. එසේම දඹදිව පෙර අපර කොටසෙහි වැවෙන වී, හැල් වී, බාර්ලි, තිරිඟු වැනි දේවල් ද ඔවුනට නොවීය. ඔවුහු රන් රිදී රැස්කර තබා නොගෙන හුදෙක්ම **සජ්ඣාය ධන ධඤ්ඤා** වේද මන්ත්‍ර ඉගැන්වීමෙන්ම තමන්ට ලැබෙන ධනය හා වී ආදී අස්වැන්නෙන් සෑහීමට පත්වූහ. මෙත් වැඩීමෙන් කල් ගෙවූවෝ, උසස් බවටත්, බ්‍රහ්මයාගේ නියම අනුගාමික වූවෝ, බ්‍රහ්ම නිදානයක් සේ හැඳින්වූහ. එසේ **බ්‍රහමං නිධිමපාලයුං** හැම කල්හිම භාවනානුයෝගීව මෙසේ කල්ගෙවන, **යං තෙසං පකතං ආසි** මේ බමුණන්ට දීමට මැනවින් සූදානම් කොට තබන ලද දෙයක් විය. **ද්වාර භත්තං උපට්ඨිතං** 'බමුණන්ට දෙමු'යි ඒ ඒ දායකයන් විසින් තම තම ගෙයි දොරටුවෙහි පිළියෙල කොට තබන ලද බත්, **සද්ධා පකතං** සැදැහැයෙන් මනාව පිළියෙල කරන ලද, සැදැහැයෙන් දෙනු ලැබේ යැයි කියන ලද්දේ වෙයි. (එදිනෙදා ජීවත්වීමට අවැසි දේ සොයා ගනිති) දාතවෙ දිය යුතුය. **තදමඤ්ඤිංසු** එය සිතූහ. දොරටුවෙහි සකස්කොට තබන ලද ඒ බත, සොයනු ලබන එම බමුණන්ට සැදැහැයෙන් දිය යුතු යැයි සිතූහ. දායකයෝ, එය ඔවුන්ට උවමනා නැත්නම්, වෙනත් කෙනෙකුට (සුදුසු) වේ යැයි මිස, ඉන් එහා නොසිතූහ. හුදෙක්ම කුසගිනි

නිවීමෙන් සෑහීමට පත්වේ යන අදහසයි. **නානාරතෙතහි** නොයෙක් පැහැයෙන් යුතු, **වත්‍ථෙහි** විසිතුරු ඇතිරිලි අතුරන ලද, **සයනෙහි** එක් මහලකින්, මහල් දෙකකින් යුත් මැදුරු ලෙසින්, **ආවසථෙ** මෙබඳු උපකරණවලින්, **ඵීතා** රටෙහි එක් එක් පෙදෙසෙහි පටන්, **ජනපදා** යම් යම් (පෙදෙස්වල) මුළු රටෙහිම ද **රට්ඨා**, 'බමුණන්ට නමස්කාර වේවා'යි උදේ සවස **බ්‍රාහමණෙ** දෙවියන්ට මෙන් **නමසසිංසු** මෙසේ ඔවුන්ට ලෝකයා විසින් වඳිනු ලබනවිට, **වජ්ඣා බ්‍රාහමණා ආසුං** (දඬුවම් ලබන තරම්) වැරදි සිදුනොවීම පමණක්ම නොවේ. අජෙය්‍යා වෙහෙසට පත්කළ නොහැකි බැවින්ද පැරදවිය නොහැකි වූහ. ඊට හේතු කවරේද? **ධම්මරක්ඛිතා** දහමෙන් රක්නා ලද බැවිනි. ඔවුහු උතුම් පන්සිල්හි සඳහන් කරුණු රැකගත්හ. 'දැහැමිව හැසිරෙන තැනැත්තා දහමෙන්ම රැකෙයි' - 'ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී' යනුවෙන් සඳහන් පරිදි දහමින් රකිනු ලැබ, දඬුවම් පැමිණවිය නොහැකි වූහ'යි අදහසයි. **න තෙ කොචි නිවාරෙසි, කුලානං ද්වාරෙසු සබ්බසො,** සීල සංවරයෙන් හා පියමනාප බවට පත්වූ ඒ බමුණන් කෙරෙහි මිනිස්සු සියළුම නිවෙස් ඇතුලතදීත්, පිටතදීත් මව්පියන් මෙන් බොහෝ විස්වාසවන්ත වූහ. එහෙයින් මෙතැනට ඔබලා නොපිවිසිය යුතුයැයි කිසිවෙකු වැළකුවේ නැත. මෙසේ දහමින් රකිනු ලැබූ ඒ බමුණෝ **අට්ඨචත්තාරීසං වස්සානි** අවුරුදු හතළිස් අටක් කුලගෙවල නොවැළකී හැසිර, කුමාර (තරුණ) කාලයේ පටන් **කොමාරං බ්‍රහමචරියං චරිංසු තෙ** උතුම් බඹසර හැසිරුණහ. යමෙක් බමුණු සැඬොල් වූවාහුද, බ්‍රහ්ම හා සම හැසිරීමක් තිබූ බමුණන් ගැන කිනම් වාදයක්ද? මෙසේ උතුම් හැසිරීමෙහි නියැලුණාහු. **විජ්ජා පරියෙට්ඨිං අචරුං බ්‍රාහමණා පුරෙ** ඒ උතුම් හැසිරීමෙහි ඇත්වූවෝ නොවූහ. **විජ්ජා පරියෙට්ඨි** මන්ත්‍ර ඉගෙනීම, 'ඔහු අවුරුදු හතළිස් අටක්, තරුණ කල පටන්ම, මන්ත්‍ර ඉගෙන ගනිමින් බඹසර හැසිරෙතැ'යි ද කියන ලදී. **චරණපරියෙට්ඨි** සිල් රැකීම, **විජ්ජාචරණ පරියෙට්ඨුං** යනුද පාඨයකි. උසස් නුවණ හා උසස් හැසිරීම නොවළහා කරතියි තේරුමයි. ඉහත කියන ලද පරිදි ඒ කාලයක් බඹසර වැස, එයින් පසු ගිහි ජීවිතයට පත් වූවද **න බ්‍රාහමණා අඤ්ඤමගමුං** කැත්කුල හෝ වෙළඳකුල හෝ වෙනත් කුලයක දෙවඟනක හා සමාන වූ කාන්තාවක සිටියත්, තමා පිළිබඳ සීමා තබාගත් බව අදහස් වේ. එසේම දැන් කාලයේ මෙන් මසුරන් සියයක් හෝ දහසක් හෝ ගෙවා මිලට නොගත්හ. **නපි භරියං කිණිංසු තෙ** මේ කාලයේ නම්, ඇතමෙක් (බිරිඳක්) මිලට ගනිති. (මුලදී) ඔවුහු දැහැමෙන් බිරියන් සොයති. ඒ කෙසේද? 'අවුරුදු හතළිස් අටක් මම බඹසර පුරුදු කළෙමි. වියපත් දැරියක වේනම්, මට දෙව'යි

කියමින් බමුණු ගෙවල දොරටුවෙහි අවිවාහක තරුණියක පවරා දෙන ලෙස ඉල්ලමින් (කඤ්ඤා භික්ඛං) ඇවිදිති. එහිදී යම් තැනැත්තෙකුට වියපත් දැරියක ඇත්නම්, ඔහු ඇය සරසවා ගෙයින් පිටතට ගෙන, දොරටුවෙහි සිටි බමුණාගේ අතෙහි පැන් වත්කොට, 'බ්‍රාහ්මණය, මේ තැනැත්තිය, ආහාර ආදිය දෙමින් ඇතිදැඩි කිරීම පිණිස ඔබට බිරිය ලෙස දෙමි'යි කියා පවරා දෙයි. මෙසේ ඔවුහු කුමක් නිසා කලක් බඹසරව සිටියද බිරියක් සොයන්නාහුද? ජීවත් වනතුරුම බඹසර නොහැසිරෙන්නේ ඇයි? වැරදි අදහසක් නිසාය. 'යම් තැනැත්තෙකු පුතෙක් උපදවා නොදෙත්ද, ඔහු කුල පරම්පරාව සිඳින්නෙකි. ඒ නිසා නිරයට යති'යි ඒ වැරදි අදහසයි. ගණ්ඩුප්පාද, කිකී, කොනතනී, බ්‍රාහමණ යැයි බිය නොවිය යුතු කරුණු සතරකට බිය වෙති. ගණ්ඩුප්පාදා - ගැඩවිල්ලු මහපොළව වැනසේ යන බියෙන් බොහෝ මැටි - පස් නො කති. කිරල් දෙන කිකී අහස කඩා වැටේය යන බියෙන් බිත්තර මතුයෙහි උඩුකුරුව නිදයි. කොනතනී කිරිල්ල (දියකාවි?) පොළව සෙලවේ යැයි බියෙන් බිම ඉක්මනින් පා තබා යයි. බමුණෝ කුල පරම්පරාව නැති වේ යැයි බියෙන් අඹුවක සොයති.

'ගැඩිවිලා ද, කිරලිය ද, කොනතනී කිරිල්ලිය ද, දැහැමි බමුණා ද යන සතරදෙනා බොහෝ මුළා වී, බිය නොවිය යුතු දෙයට බිය වෙති'

ගණ්ඩුප්පාදො කිකීචෙව කොනෙතා බ්‍රාහමණ ධම්මිකො
එතෙ අභායා භායනතී සමමූළහා චතුරො ජනා

මෙසේ දැහැමෙන් අඹුවක සොයා, සමපියෙනෙව සංවාසං සංගනත්‍වා මනා පියතාවයෙන් යුතුව, එකිනෙකා කෙරෙහි ආදරයෙන්, කයින් ද සිතින් ද මුසු වී, ඇලී ගැලී මෛථුන්දම් කැමති වූහ. අකමැත්තෙන් හෝ අවලාද නැගීම් හෝ නොමැති බව කියන ලදී. මෙසේ පියතාවයෙන්ම මෛථුන්දමට කැමති වූවාහුද, අඤ්ඤත්‍ර තමහා ඔසප් වීමෙන් පසු බැමිණිය කරා බමුණා පැමිණිය යුතුය. අඤ්ඤත්‍ර තමහා සමයා ඔසප් වීමෙන් වෙන් වූ ඒ කාලය හැර, උතු වෙරමණී පතිං බිරියට නැවත ඒ කාලය පැමිණෙන තුරු නොසිට, අනතරා අතරෙහිම, (ඒ අතරතුර) මෙථුන ධම්මං මෛථුන්දහමෙහි, සමපදාන අරුතෙහි ද්‍රුතියාව යෙදුනි. නාසසු ගච්ඡනති නොයත්මය. බ්‍රාහමණ ඔවුන් දෙවියන් හා සම වූ (තමන්ම) සීමා පනවා ගත් යන අදහසයි. මුළුමනින්ම සියල්ලෝම. බ්‍රහමචරියඤ්ච...

**අවණ්ණයුං** බ්‍රහමචරියං (මෙහි අදහස) මෛථුන්දමින් වැළකීමයි. **සීලං** ඉතිරි සිකපද හතර, **අජ්ජවං** කරන දෙයෙහි නොවක් බව, යහපත් ලෙස, කපටි බවින් තොරව, රැවටීමෙන් තොරව, **මද්දවං** මුදුබව, යහපත් ලෙස, තපුරු නොවී, නිහතමානීව, **තපො** ඉඳුරන් සංවරය, **සොරච්ච** කීකරු බව, සිල් පිරිසිදු බව, පිළිකුල් නොවන ගතිගුණයෙන් හෙබි, **අවිහිංසා** අත් ආදියෙන් (පහර දී) හිංසා නොකරන, කරුණාවෙන් යුතු, **ඛන්ති** ඉවසීමේ කැමැත්ත, මෙබඳු ගුණ **අවණ්ණයුං** පිළිවෙතින් සියළු දෙනාම සතුටු කිරීමට නොහැකි වූහ. ඔවුහු එහි හරය දැක වචනයෙන් අගය කළහ. පැසසුම් කළහ. මෙසේ අගය කරනු ලබන්නන්ගේ **යො නෙසං........** **නාගමා** ඒ බමුණන් අතර **පරමො** බ්‍රහමා අහොසි බ්‍රහමසම නම් උතුම් බමුණෙක් විය. දැඩි උත්සාහයෙන් යුතු බැවින් දළහ **පරක්කමො, සවා** විස්තර දැක්වීමේදී, 'වා' යනු එයින් මෙබඳු බමුණෙකැයි ඔහුට විස්තර කරයි. **මෙථුනං ධම්මං** මෛථුන්දම් සේවනයට පැමිණීමට, **සුපිනෙන පි** **නාගමා** සිහිනෙන්වත් නො ගියේය. එයින් **තස්ස වත්තං.... අවණ්ණයුං** මේ ගාථාවෙන් නවවෙනි ගාථාවෙහි කී ගුණම මුලසිට අග දක්වාම පෙන්වා දෙමින් දෙවියන් සම බමුණා ගැන පවසයි. **විඤ්ඤූජාතිකා** දැනුම් තේරුම් ඇති වියත්හු **තස්ස** ඒ බ්‍රහම හා සමාන බමුණාගේ **වත්තං** **අනුසික්ඛන්ති** පැවිද්ද ද, දැහැන් ලැබීමට භාවනාවද යන මේ බ්‍රහ්මචරියා ගුණ පිළිවෙත්ම අගය කරනු ලබත්. ඒ සියළුම බමුණන් ගැන පඤ්චක නිපාතයෙහි ද්‍රෝණ සූත්‍රයෙහි කී පරිදි දතයුතුය. දැන් සීමා පණවාගෙන ඒ අනුව කටයුතු කරන බමුණන් දක්වමින් **තණ්ඩුලං සයනං** යන ගාථාව කීහ. එහි අරුත නම් ඔවුන් අතුරෙන් සීමා පණවා ගත් බමුණෝ යාගයක් කරනු කැමැත්තෝ වෙත් ද, අමු අස්වැන්න පිළිගැනීමෙන් වැළකුණු බැවින් නොයෙක් ආකාරයෙන් සහල් ද ඇඳපුටු ලෙසින් සයනඤ්ච කොමුපිළි ආදියෙන් වත්ථඤ්ච ගිතෙල්, තල, තෙල් ආදී ලෙසින් **සප්පිතෙලඤ්ච යාචිය ධම්මෙන** 'ලැබෙන දෙයක් බලාපොරොත්තුවෙන් උතුමෝ සිටිති. එය උතුමන්ගේ ඉල්ලීමයි.'

**'උද්දිස්ස අරියා තිට්ඨන්ති එසා අරියාන යාචනා'** මෙසේ කියා ඇති අයුරු බලාපොරොත්තුවෙන් සිටිමින් දැහැමි ලෙස ඉල්ලා යම් කෙනෙක් යම් දෙයක් දීමට කැමති වේද, ඒ දෙන ලද සහල් ආදිය **සමොධානෙත්වා** එකතුකොට, **සමුදානෙත්වා** යැයිද පාඨයකි. එකම තේරුමයි. **තතො යඤ්ඤමකප්පයුං** එය ගෙන දානය දුන්හ. එසේ කරද්දීම, එවේලෙහි, **උපට්ඨිතස්මිං** දානයට ලැබුණු දේ, **යඤ්ඤස්මිං නාස්සු ගාවො**

හනිංසුතෙ ඔව්හු ගවයන් නොමැරූහ. ගවයන් ගැන කීවද සියළුම පණ ඇති සතුන් (ජීවීන්) ඇතුලත් වේ යැයි දතයුතුය. කුමක් නිසා නො මැරුවාහුද? බ්‍රහ්මචරියාදී ගුණයෙන් යුතු බැවිනි. එහෙත් වෙනසක් ඇත. යථා මාතා -පෙ- නාසසු ගාවො හනිංසු තෙ එහි යාසු ජායන්ති ඔසධා පිත ආදියට බෙහෙතක් ලෙස පස්ගෝරස නිපදවති. අන්නදා යම් ආකාරයකින් පස්ගෝරස වළඳනවිට කුසගින්න සංසිඳේ. සවිය වඩයි. සිරුරු සම පැහැපත් වේ. සිරුරෙහි, මනසෙහි සුවය ඇතිවේ. තතො එයින්, අන්නදා බලදා වණ්ණදා සුඛදාච යැයි දතයුතුය. ඉතිරි කරුණු පැහැදිලිය. මෙසේ ඔවුහු යාගවලදී ගවයන් නොනසන බැවින්, පින් මහිමයෙන් පැහැපත් වූ සිරුරු ඇත්තාහ. සුඛුමාලා -පෙ- සුඛමෙධිත්ථයං පජා එහි සුඛුමාලා යනු මුදු යොවුන් අත් පා ආදිය, මහාකායා උසට සරිලන මහතින් යුතු, වණ්ණවන්තා රන්වන් පැහැයෙන් ඔපවත් වූ, යසස්සිනො ලාභ පිරිවර සම්පතින් යුතු, සෙහි ධම්මෙහි සිය සිරිත්වලින් කිච්චාකිච්චෙසු උස්සුකා ඒ ඒ කටයුතුවලදී මෙය කළයුතුයි, නොකළ යුතු කටයුතුවලදී මෙය නොකළ යුතුය ආදී ලෙසින් උත්සාහය දනවන යන අරුතයි. මෙසේ ඒ පැරණි බමුණෝ මෙබඳු දැකුම්කළු පහදනා සුළුව, මේ පිළිවෙතින් ලෝකයාගේ උතුම් වූ පූජාවට සුදුසු බවට පත්ව, යාව ලොකෙ අවත්තිංසු ඒ ඇතිතාක් උවදුරු-බිය පහව නොයෙක් ආකාර වූ, සුඛං එධිත්ථ සුවයට පැමිණියාහ. සැප හෝ ලැබූහ. අයං පජා මිනිස් ලොව (සත්තලොකං) ගැන සඳහන් කිරීමයි. කල්යත්ම එතෙක් පැවති බමුණු දහම් සීමා වෙනස් කිරීමට කැමතිව, තෙසං ආසි විපල්ලාසො විපල්ලාස යනු වෙනස් වූ හැඟීම් හෝ අදහස් අණුතො අණුං බොළඳ වූත් අල්ප වූත්, ඒ අල්ප වින්දනයක් ඇති ඉතා සුළු වූ කාමගුණ දැක එය සැපයයි සළකමින්, දැහැන් ලැබීම - නිවන ඉතා සුළුකොට, තමන් ලද මෙලොව සම්පත් සැපයෙන් අඩු යැයි ටිකින් ටික කාමයෙහි ඇලීමෙන් යන අදහසයි. රාජිනොච රජවරුන්ද, වියාකාරං සම්පත්, ආජඤ්ඤ සංයුත්තෙ අජානීය අසුන් යොදන ලද, සුකතෙ ලීයෙන්, ලෝහයෙන් මනාව නිමවන ලද, චිත්තසිබ්බනෙ සිංහසම් ආදියෙන් අලංකාර වන පරිදි විසිතුරුව මැසූ වැනි, නිවෙසනෙ ගෙදර, නිවෙසෙති එහි පිහිටි ගෙවල්, විභත්තෙ දිගු, පුළුල් ලෙසින් බෙදන ලද්දා වූ, භාගසො මිතෙ මිදුල, දොරටු, මැදුරු, කුළුගෙවල් ලෙසින් ද වෙන් වෙන්කොට මණින ලද, කුමක් නිසා කියන ලදද? රජුට ආවතේව කරන, අලංකාරව සැරසුනු කාන්තාවන්ද ඉහත සඳහන් කරන ලද අසුන් යෙදූ රිය, ඉඩකඩම් හා මන්දිර දැක, ඒවා දුක් උපදවන දේ වුවත්, ඒ දේවල් කෙරෙහි සැපයයි

පවත්නා හැඟීමෙන් පෙර තමන් පුරුදු කරන ලද 'අත්හැර දැමීමට හුරු වූ' විකාර වූ ඒ බමුණු අදහස්, මෙසේ අවුල් සහගත සිතිවිලිවලින් යුතු විය. ඔවුහු මෙසේ අවුල් වූ, විකාර වූ සිතිවිලිවලින් යුතුව, **ගොමණ්ඩල... බ්‍රාහමණ,** මේ ගාථාවේ **ගොමණ්ඩල පරිබ්බූළහනති** බොහෝ ගවරංචුවලින් ගැවසුණු, **නාරිවරගණයුතං** උසස් යයි සම්මත බොහෝ කාන්තාවන්ගෙන් යුතු, **උළාරං** මහත්, **මානුසං භොගං** මිනිසුන් වසන තැන් ආදී පරිහරණය කරනු ලබන සම්පත්, ඉඩකඩම් ආදිය, **අභිජ්ඣායිංසු** 'අනේ, මෙය අපට තිබේනම්.........යැයි ආසාව වඩමින්, බොහෝ බලාපොරොත්තු තබාගෙන, දැහැන් වැඩූහ. මෙසේ දැහැන් වඩන අතරම, 'මේ මිනිස්සු මැනවින් දිය නා, සුවඳ තවරා, කෙස් රවුල් මනාව සරසාගෙන, මල් අබරණ පැළඳ පස්කම්ගුණෙහි හැසිරෙති. අපිනම්, ඔවුන් අපට නමස්කාර කරනු ලැබූවත්, දහදිය ගලන කිලිටි සිරුරුවලින් හා කිහිලිවල රෝම හා නියපොතුද වැඩී, වස්තු සම්පත් නැතිව බොහෝ කරුණාව පතුරුවමින් වාසය කරමු. මොවුහූ ඇතුන් පිට, අසුන් පිට, දෝලාවල, රන්මුවා රියවලින් එහා මෙහා යති. අපි පයින් යමු, මොව්හූ දෙමහල් පහ ආදියෙහි වසති. අපි කැලෑවේ රුක්මුල්වල වසමු, 'මොවුහූ සතුරගුල් පමණ දිග ලොම් ඇතිරිලි අතුරා, සුවසේ නිදති. අපි පත්කඩ (කුඩා පැදුරු), සම්කඩ බිම අතුරා නිදමු, මොව්හූ රසබොජුන් අනුභව කරති. අපි පිඬුසිඟා ගොස් යැපෙමු. අපිත් මොවුන් හා කෙසේ සමාන වන්නෙමුදැ'යි සිතා, 'ධනයට කැමතිවිය යුතුය, ධනය නැතිව මේ සැපසම්පත්වලට පැමිණීමට නොහැකි'යයි තීරණය කොට, වේදය බිඳ, සුදුසු ලෙස පැවති දැහැමි පැරණි මන්ත්‍ර ඉවත්කොට, අයුතු පරිදි බොරු මන්ත්‍ර සකසා ධනය ලබාගනු කැමතිව, ඔක්කාක රජු හමුවී ආසිරිබර වදන් යොදා 'මහරජ, අපේ බමුණු පරම්පරාවෙන් පැවත එන පැරණි මන්ත්‍ර ඇත, අපි 'මිටෙහි රඳවා ගත් ගුරු රහස් ලෙස (ආචරිය මුට්ඨිනා) ඒවා ගැන කිසිවෙකුටත් නොකීවෙමු. මහරජ, ඒවා ඇසීම සුදුසු යැයි කියා අසකු මරා කරන යාග පැසසූහ. එසේ යාගය අගය කොට, රජු මෙහෙයවමින්, 'මහරජ, යාග කරනු මැනවි, මෙසේ ඔබතුමන් ධනය, වී අස්වනු ආදියෙන් සෑහෙන තරම් පොහොසත් වේවි! යාග උපකරණවලින් ඔබතුමාට අඩුවීමක් නොවනු ඇත. ඔබතුමන් මෙසේ යාග කරනවිට සත්මුතු පරම්පරාවම බඹලොව උපදින බව පැවසූහ. බමුණන් රජුට ඒ පුවත පවසන අයුරු දක්වමින් භාග්‍යවතුන් වහන්සේ **තෙ තත්‍ථ මනෙත........බහු තෙ ධනං** යන ගාථාව වදාළහ. **තත්‍ථ** දැඩිව ආසා කළ සම්පතක් මුල්කොට කියන ලදී. එය අරමුණ කොට දක්වන අරුත සඳහා ආධාර විබත් යොදා ඇත. **තදුපාගමුං**

එකල්හි පැමිණියහ. **පහූතධනධඤ්ඤාසි** මරණින් පසුද වස්තුව - වී අස්වනු ආදියෙන් සෑහෙන තරම් ලබන්නේ ය යන අදහසයි. සැකය, අනුමානය අරුත් දැක්වීමෙහිදී අනාගත කාලය වෙනුවෙන් වත්මන් වචනයෙන් යෙදීම වදන් පිළිබඳ වියත්හු කැමති වෙති. **යජස්සු** යාග කරන්න, **විත්තං** ධනං රන් ආදියම ඉතා වටිනා ලෙසින් ද, දියුණුවීමේ අදහසින් ධනය ලෙසද කියන ලදී. නැතහොත් **විත්තං** සතුට ඇති කරනු ලබන අබරණ ආදී දේ සතුට දනවන සෑහෙන තරම් උපකරණ හෝ යම් යම් දේ 'පහූතවිත්තූපකරණෝ' යනුවෙන් ගැනේ. **ධනං** අමුරන්, රන් ආදිය, කුමක් සඳහා කියන ලද ද? එකල ඒ බමුණෝ මන්ත්‍ර ගොතා ගෙන ඔක්කාක රජු වෙත ගියහ. කුමක් පිණිසද? 'මහරජ, ඔබතුමාට බොහෝ සම්පත් ද ධනය ද ඇත. යාග කරනු මැනවි, මතුවටද සෑහෙන තරම් ධනය - සම්පත් ලබන්නේය. මෙසේ කරුණු පහදන විට දී **තතො ච රාජා.....අදා ධනං**

**සඤ්ඤත්තො** කරුණු දක්වන ලදී, රථෙසභො මහා රථ කෙරෙහිද කැත් කුලවතුන් කෙරෙහිද කම්පා නොවන, ගවරැළක නායක ගොනකු හා සමාන වූ, මෙහි අසකු බිලි දී කරන යාගය **අසසමෙධො** වෙයි. යාග කළ යුතු වූ විට, දෙකෙළවර සිට යාග කණු විසිඑකක් තබා, යාග බිමෙහි ද, මිනිසුන් ද වෙනත් සියළු පිදිය යුතු දේ ඇතුලත් යාගයට එය සමාන වචනයකි. **පුරිසමෙධො** පිරිමියෙකු බිලිදී කරන යාගයයි. අසසමෙධයෙහි සඳහන් කරන ලද පරිදි, යාග බිම සතර කෙළවරෙහි යාගයට පිදිය යුතු අගනා දේවලට සමාන වචනයකි. **සම්මාපාසො** දවසින් දවස වියගහක් දමා, එය බිම වැටෙන තැන බටවලින් යාග පුදසුන සකසා, යාග කණු ආදිය රැගෙන යන්නවුන් විසින් සරසතී නදියෙහි ගිල් වූ යාග පුදසුන තිබූ තැන පටන් පිටුපසට යමින් කළයුතු (දියෙහි පාවෙන දෙයක සිට කරන) 'රිය යාගයකට - යාත්‍රා යාග - මෙය සමාන වචනයකි. 'සෝම' පානය කරතී යනු **වාජපෙය්‍යො** එක් කෙළවරකින් තිරිසන් සතුන් දහහතක් බැගින් බිලිදී කළයුතු යාගයකදී, බෙලි කඳක් යොදා ගත් යාග කණුවෙහි සතුන් දහහතක්, දහහතක් පුද කළයුතු යාගයකට මෙය සමාන වදනකි. එහි අවහිර නැති අදහසින් **නිරග්ගලො** නවයක් බැගින් වූ යාග පූජාවක් කරනවිට, බිම ද පිරිමි තැනැත්තන් සමග, අසසමෙධ යාගයෙහි කියන ලද පරිදි, සියළුම පිදිය යුතු දේ සහිත වූ, සියළු යාගවලට සමානවූම අසසමෙධයට විකල්පයක් ලෙස මෙය අදහස් කෙරේ. ඉතිරි කරුණු පහසුය.

'බමුණන්ට ධනය දුන්නේය'යි කියන ලදද, මීළඟට එය පැහැදිලි කරමින්, **ගාවො සයනඤ්ච** යන ගාථා දෙක වදාළහ. දිගුකලක් රළු ආහාර නිසා දුබල වූ, වෙහෙස වූ ඒ බමුණන්ට රජතුමා, 'පස්ගෝරස අනුභව කරත්වා'යි නායක ගවයන් ද සමග ගව පට්ටි ද දුන්නේ ය. එසේම, දිගුකලක් රළු පොළවෙහි නිදාගත් බැවින් ද, දළ රෙදි පොරවා ගැනීමෙන් ද, එකම ආකාරයෙන් පා ගමනින් ද, රුක්මුල්වල විසීමෙන් ද වෙහෙස වූ ඔවුන්ට, සතරගුල් පමණ දිගැති ලොම් පලස්, ඇතිරිලි යෙදූ මාහැඟි යහන් ආදිය 'සුවසේ පරිහරණය කරත්වා'යි සපයා දුන්නේ ය. මෙසේ නොයෙක් අයුරින් වෙනත් අමුරන්, (කහවණු) රත්රන් ආදී වටිනා දේ දුන්නේ ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ, **ගාවො සයනඤ්ච වත්ථඤ්ච..... බ්‍රාහමණං අදා ධනං** යනුවෙන් වදාළහ. මෙසේ ඒ රජු සමීපයට **තෙ ච තත්‍ථ......පුනුපාගමුං**, එසේ කියන ලද්දේ කුමක් නිසාද? ඒ රජුගෙන් **තෙ** ඒ බමුණෝ ඒ යාගවලින් ධනං දිගු කලක් දවසින් දවස, එක් දවසකට සෑහෙන ආහාර හා රෙදි ද නොයෙක් ආකාර වූ එදිනෙදා පරිහරණයට ගැනෙන වෙනත් කැමති කැමති දේ ලැබ, **සනනිධිං සමරොචයුං**, එයින් **තෙසං ඉච්ඡාව තිණ්ණනං** කිරි ආදී පස්ගෝරස තණ්හාවෙන් මැඩුණු සිතින් 'ඒ ගව දෙනුන්ගේ කිරි ආදිය ඉතා මැනව, ඒකාන්තයෙන්ම මොවුන්ගේ මස් ඊටත් වඩා රසවත් වන්නේ යැයි මස් නිසා **භීයො තණ්හා පවඩ්ඪථ** එවිට 'අපි මරා කන්නෙමු නම්, ගැරහුම් ලබන්නෙමු, මන්ත්‍ර ගොතන්නේ නම් මැනවැ'යි සිතූහ. ඉක්බිතිව, නැවත වේදය බිඳ, ඊට සුදුසු වූ, **තෙ තත්‍ථ මනෙත ගන්‍ථෙත්වා** ඒ බමුණෝ එය අරමුණු කොට, කපටි මන්ත්‍ර ගොතා ඔක්කාක රජු වෙත නැවත ද පැමිණියහ. මෙම කරුණු දක්වමින්, **යථා ආපොච.........බහූ තෙ ධනං** යන ගාථාව වදාළහ. කුමක් නිසා එසේ කියන ලදද? 'මහරජතුමනි, අපගේ මන්ත්‍රවල මෙසේ සඳහන් වේ. **යථා ආපො** (ජලය) අත් සේදීම් ආදී සියළු කටයුතුවලදී ජීවත් වන්නන්ට උපකාර වෙයි. ඒ නිසා ඔවුන්ට පව් සිදුවන්නේ නැත. කවර හෙයින්ද? **පරිකඛාරො සො හි පාණිනං** යම් ලෙසකින් ජලය උවමනා දෙයක් ලෙස ඇති වූ බැවිනි. **පඨවී** යම්සේ මේ මහපොළවද ගමන් කිරීම් ආදී කටයුතු සඳහා සම්බන්ධ වන්නාක් මෙන්ද, කහවණු යැයි ද හඳුන්වනු ලබන **හිරඤ්ඤං**, රන්රිදී ආදියෙන් ධනං, බාර්ලි, තිරිඟු වැනි දේ **ධානියඤ්ච** ලෙසද වහරන පරිදි ඒ හා සියළු කටයුතුවලදී අදාල වේ. **එවං ගාවො මනුසසානං** මෙසේ (ගවයන්ද) සියළු කටයුතුවලදී උපකාර හෝ සම්බන්ධවන ලෙසට පහළව ඇත. එහෙයින් ඒ ගවයන් මරා නොයෙක් ආකාර වූ යාගයෙහි **යජසසු බහූ තෙ විතතං බහු තෙ**

ධනං, මෙසේ පෙර පරිදිම, **තතොච රාජා..... අසාතයී** (ගාථාව වදාළහ.) ඊට පෙර කිසිම සතෙකු **න පාදා.........සාතයී** එකල්හි බමුණෝ යාග බිම (යාග මළුව) ගවදෙනුන්ගෙන් පුරවා, නායක ගවයා (යාග කණුවේ) බැඳ කණු මුලට රජු කැඳවාගෙන ගොස්, 'මහරජතුමනි, ගොමෙධ යාගය ඉටු කරනු මැන, මෙසේ ඔබතුමාට බඹලොව මග පිරිසිදු වන්නේ යැයි කීහ. (ආසිරි පැතීම් වේද ගීතිකා ගායනා වැනි) මංගල යැයි බමුණන් සම්මත කටයුතුවලින් පසු, රජු කඩුව ගෙන, නායක ගවයා සහ, සියදහස් ගණන් ගවයන් මැරුවේය. බමුණෝ යාග මළුවෙහි මස් කපා කෑහ. කහ-සුදු-රත් පැහැ කම්බිලි ද පොරවා මැරූහ. ගවයෝ පොරෝනා දැක බියෙන් තැති ගනිති. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ, **න පාදා............සාතයි** ගාථාව වදාළහ. **තතො දෙවා** මෙසේ ඒ රජු ගවදෙනුන් මැරීමට පටන්ගත් විට, ඒ අතරතුර, ඒ ගව ඝාතනය දුටු චාතුමමහාරාජිකාදී දෙවිවරු **දෙවා ච,** පිතරො බමුණන් විසින්ම හඳුන්වා ඇති පරිදි මහා බ්‍රහ්මයා ද, සක්දෙවිඳු ද **ඉන්‍ද්‍රා,** උස් ගිරිකුළුපව්හි වසන, දානවයකුන් යැයි හඳුන්වනු ලබන **අසුර රක්ඛසා ච අධම්මො** 'අදැහැමි'යි යන වචන කියමින් 'මිනිසුනි, නින්දා වේවා! මිනිසුනි, නින්දා වේවා! කියමින් **පක්කන්‍දුං** මෙසේ පොළොවෙන් ඇරඹී ඒ හඬ මොහොතකින් බඹලොව දක්වාම පැතිර ගියේය. ලොවම එකම පාලනයකට නතු විය. හේතුව කුමක්ද? **යං සත්‍ථං නිපතී ගවෙ** යම් ලෙසකින් ගවදෙනකට අවි පහරක් වැදුනි යැයි කියන ලදද, එය දෙවියන්ට පමණක් වන (බලපෑමක්) නොවේ. මෙය වෙනත් ලෝකවලටද අයහපත උදාවීමකි. **තයො රොගා පුරෙ ආසුං ඉච්ඡා අනසනං ජරා** යම් යම් බලාපොරොත්තු හා ආසා ද, බඩගින්න හා වයස ගෙවෙනවිට ජරාවට පත්වීම කියන ලදී. **පසූනඤ්ච සමාරම්භා අට්ඨානවුතිමාගමුං** ඇස් රෝග ආදී රෝග අනූඅටක් පැමිණියේ යැයි තේරුමයි. දැන් භාග්‍යවතුන් වහන්සේ ඒ සතුන් මැරීමට නින්දා කරමින් **එසො අධම්මො** යන ගාථාව වදාළහ. එහි අරුත නම්, **එසො** සතුන් මැරීමට ගත් තැන් පටන් කයෙන් කෙරෙන දුසිරිත් ආදී තුන් ආකාර වූ **දණ්ඩානං** එක්තරා වැරැද්දක් වීමෙන් දහමෙන් - යහපත් බවෙන් ඉවත්වන බැවින්, **අධම්මො ඔක්කන්තො අහූ** (එසේ) පැවතුණේය. එතැන් පටන් ඒ වැරදි තවමත් පවත්නා බැවින්, **පුරාණො,** ඒ මරණවිටදී පවා කිසිම සතෙකු පාදයෙන් හෝ හිංසාවක් නොකරන බැවින් **අදූසිකායො,** එසේ වූ ගවයන්, **හඤ්ඤන්ති** එබඳු ගවයන් යම් කෙනෙක් මරත් ද **ධම්මා ධංසෙන්ති** දහමෙන් වැළකෙති. පිරිහෙති. **යාජකා** යාගයෙහි යෙදෙන්නෝ - යදින්නෝ දනිති. **එවමෙසො අණුධම්මො** මෙසේ එය පහත් දෙයක් - ලාමක දෙයක් ලෙස කියන ලදී.

යම් ආකාරයකින් හෝ එහිදී දෙනු ලබන මඳ වූ දෙයක් හෝ ඇතොත්, ඒ සඳහා **අණු ධම්මො** යැයි වදාළහ. **පොරාණො** බොහෝ කලක පටන් පැවත එන, පැරණි වියතුන් විසින් පැසසුම් නොකරන ලද බැවින් **විඤ්ඤූගරහිතො** යැයි දතයුතුය. යම්හෙයකින් නැණවතුන් විසින් පැසසුම් නොකරන ලදද, එහෙයින්, **යථා එදිසකං පසසති යාජකං ගරහති ජනො** යනුවෙන් පැසසුම් නොකරන්නේ කෙසේද? (ඒ අදහස්) බමුණන් බොරුවෙන් උපදවන ලද්දකි. ගවයන් මරා මස් කති'යි අසා ඇතැයි මෙහිදී අදහස් වේ. **එවං ධම්මෙ වියාපනෙන** මෙසේ පැරණි බමුණු දහම නැසිණි. **වියාපනෙන** යනුද පාඨයකි. අදහස වෙනස්ව, වෙනත් අදහසක් වී යැයි තේරුමයි. **විහිනනා සුදද වෙසසිකා** පෙර සමගිව වාසය කළ මෙහෙකරු වැනි සුද්ද යැයි හැඳින්වූවෝ ද - වෙසස යැයි කියන ලද වෙළඳ කොටස් ද බිඳුණාහ. **පුථු විහිනනා ඛතතියා** කැත් කුලවත්තු ද එකිනෙකා කෙරෙහි බිඳුණාහ. **පතිං හරියාව මඤ්ඤථා** බිරින්දෑ නිවසෙහි මුල්තැන තබන ලද බැවින්, පුතුන්ගේ බලයෙන් ද යුතුව හිමියාට අවමන් කළහ. නින්දා කළාය. නොසැළකීය. මැනවින් උවටැන්, ගරු සැළකිලි නොකළාය. මෙසේ එකිනෙකා බෙදී ගියා සේම, **ඛතතියා බ්‍රහමබනධුච....** **කාමානං වසමනවගුං** කැත් කුලවත්තු ද බමුණෝ ද යෙ වඤ්ඤ වෙසස වෛශ්‍ය හා ශුද්‍ර යන කොටස් එකතු වී කටයුතු නොකරති. මෙසේ තම තමන්ගේ පරම්පරාව රකින ලද බැවින් **ගොතතරකඛිතා** ඒ සියල්ලෝම **ජාතිවාදං නිරං කතවා** 'මම කැත් කුල වෙමි. මම බමුණෙක්මි' ආදී හැඟීම් වනසා පස්කම් සැපයෙහි දැඩි වසඟයට **අනවගුං** පැමිණියහ. කාමයට වසඟ වීමෙන් කළයුතු දේවල් කිසිවක් නොකළාහු යැයි කියන ලදී.

මෙසේ මෙහිදී භාග්‍යවතුන් වහන්සේ, **ඉසයො පුබබකා** ආදී ගාථා නවයකින් පැරණි බමුණන්ගේ යහපත් ගුණ දක්වා, **යො තෙසං පරමො** යන ගාථාවෙන් බ්‍රහ්මයා හා සමානව ද **තසස වතත මනුසිකඛනතා** යන ගාථාවෙන් දෙවියන් හා සමානවද **තණඩුලං සයනං** ආදී ගාථා හතරකින් ඔවුන් පණවා ගත් සීමා ද, **තෙසං ආසි විපලලාසො** ආදී ගාථා දහහතකින් ඒ සීමා ඉක්මවා කටයුතු කිරීමෙන් එතෙක් සුරැකි පිළිවෙත් මගින් බැහැර වීමෙන් දෙවියන් ආදීන්ගේ ඉවත් වීමද දක්වා දේසනය නිම කළහ. බමුණු සැඬොලා ගැන මෙහි කියා නැත. කවර හෙයින්ද? බ්‍රහ්මයාට සමානව, දෙවියන් හා සමව සහ (තමා කෙරෙහි) සීමා කොටගත් කරුණු වීද, යම් නොමග යාමකින් හෝ, නුසුදුසු දෙයක් අගනා බමුණු දහම ලෙසින් ගෙන සීමා ඉක්මවා විපතට පත් වූයේ ද්‍රොණ සූත්‍රයෙහි කියා

ඇති පරිදිය. බමුණු දහම නැසුණද බමුණු සැඩොලකු වීමට එය හේතු නොවේ. කවර හෙයින්ද? බමුණු දහම නොපිටට හරවා ගත් බැවිනි. එහෙයින් එය නොදක්වාම දේසනය නිම කළහ. දැනුදු ඒ බමුණු සැඩොලා දුලබය. මෙසේ ඒ බමුණු දහම වැනසුනි. 'පින්වත් ගොතමයනි, කරුණු මෙසේ නම්, 'බ්‍රාහ්මණ සැඩොලා වීමට අපි කටයුතු නො කරමු'යි ද්‍රොණ බමුණා කීය. ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය.

**බ්‍රාහමණ ධම්මික සූත්‍ර විස්තරය නිමි.**

# 2.8

යස්මා හි ධම්මං යනු ධම්ම සූත්‍රයයි. නාවා සූත්‍රය යැයි ද කියනු ලැබේ. මෙම සූත්‍රය දේසනා කිරීමට හේතුව කුමක්ද? ගරු කටයුතු සැරියුත් තෙරුන් අරබයා දෙසන ලදී. මේ එහි කෙටියෙන් සඳහන් කිරීමයි. විස්තර අගසවු දෙනම ඉපදුණු කල පටන්ම දතයුතුය. ඒ තොරතුරු කෙසේද යත්?

(අප) භාග්‍යවතුන් වහන්සේ පහළවීමට පෙර, අගසවු දෙදෙනා එක් අසංඛයකුත් කප් සියදහසක්ම පාරමිතා පුරා දෙව්ලොව උපන්හ. ඔවුන්ගෙන් පළමු තැනැත්තා දෙව්ලොවින් චුතව, බමුණන්ට අයබදු ලබාගැනීමට වෙන් වූ 'උපතිස්ස' නම් වූ රජගහනුවරට නුදුරු බමුණු ගමෙහි හැටපන් කෝටි සියයක ධන සම්පත් ඇති ගම්දෙටු බමුණාගේ රූපසාරී බැමිණියගේ කුස පිළිසිඳ ගත්තේය. දෙවැන්නාද එම ගමට නුදුරු, බමුණන්ට අයබදු ලබාගැනීමට වෙන් වූ කෝලිත ගමෙහි එපමණ වූම ධන සම්පත් හිමි ගම් දෙටු බමුණාගේ මුගලන් නම් බැමිණියගේ කුස ඒ දවසෙහිම පිළිසිඳ ගත්තේය. මෙසේ එකම දිනක ඔවුන්ගේ පිළිසිඳ ගැනීමත්, බිහිවීමත් සිදුවිය. එකම දින උපතිස්ස ගමෙහි එක් දරුවකු

උපන් බැවින් උපතිස්ස යැයිද, කෝලිත ගමෙහි එක් දරුවකු උපන් බැවින් කෝලිත යැයිද ඔවුන්ට නම් කළහ. ඔවුහු වැලි සෙල්ලම් කරන කාලයේ පටන්ම එකිනෙකා යහළුව, කෙමෙන් තුරුණු වියට පත්වූහ. දෙදෙනාටම පන්සියයක්, පන්සියයක් බැගින් තරුණයෝ පිරිවර වූහ. එක් තැනැත්තෙක් රන්දෝලා පන්සියයක්ද දෙවැන්නා අජානීය අසුන් බැඳි රිය පන්සියයක්ද පිරිවරින් යුතුව උයනට හෝ ගං තෙරට හෝ යති. එකල රජගහනුවර කලින් කලට පවත්වන 'ගිරගග සමජ්ජ' නම් රඟදැක්මක් වෙයි. සවස් කල මුළු අගු - මගධ වැසියෝ ද - පසිඳු කැත් කුමරුවෝ ද නුවර වීදි මැදට රැස්ව මනාව සැකසූ මැසි හා ආසනවල හිඳිමින් රැඟුම් අසිරිය නරඹති. උපතිස්ස කෝලිතද පිරිවර සමග එහි ගොස් පණවන ලද අසුන්වල හුන්හ. උපතිස්ස රැඟුම් අසිරිය දකිමින්ම, රැස්වූ මහා ජනකායද දැක, මෙපමණ ජනතාවක් අවුරුදු සියයක්වත් නොපැමිණ මැරෙන්නේ යැයි සිතුවේය. මරණය අවුත් නළලෙහි සිටියාක් මෙන් ඔහුට දැනිණ. කෝලිතටත් එසේම සිතුණේය. නන් අයුරු රඟන රැඟුම් පැවතියද දැකීමට පමණවත් සිත නොනැමුණි. හුදෙක් සංවේගයම පහළ විය. රැඟුම නිමා වී ආපසු යන පිරිස අතරට එක්වූ ඒ යහළුවන් දෙදෙනා ද තම පිරිවර සමග එක්ව 'මිතුර, කෙසේද? නැටුම් බැලීමෙන් ඔබ නොසතුටු වීදැ'යි කෝලිත උපතිස්සගෙන් ඇසීය. උපතිස්ස තම අදහස සැළකොට, ඒ කරුණුම කෝලිතගෙන් ද විචාළේය. ඔහුද තම අදහස පවසා, 'මිතුර, පැවිදි වී නොමැරෙන මග (අමතං) සොයන්නෙමු, එන්නැ'යි කීය. 'මිතුර, එය මැනවැ'යි උපතිස්ස එකඟ විය. දෙදෙනාම ඒ සම්පත් හැරදමා නැවත රජගහනුවරට පැමිණියහ. ඒ කාලයෙහි රජගහනුවර සංජය නම් පිරිවැජියෙක් වාසය කරයි. ඔවුහු තරුණයන් පන්සියයද සමග සංජය වෙත පැවිදිව කිපි දිනකින්ම තුන්වේදය හා සියළුම පිරිවැජි දහමද උගත්හ. ඒ ඉගෙන ගත් දහමෙහි මුල-මැද-අවසානය විමසමින්, අවසානයක් නොදැක, 'මේ දහමෙහි මුල, මැද පැහැදිලිය. අවසානය නො පෙනෙයි. මෙහි අප ඉගෙන ගත් දෙයට වඩා වැඩියෙන් දැනගත යුතු බවට පැමිණීමක් නැතැ'යි ගුරුතුමාගෙන් විචාළහ. 'මම ද එසේ පැමිණිය යුතු අවසානයක් නොදකිමි'යි සංජය පිරිවැජි කීය. 'එසේනම් අපි මෙහි අවසානය සොයන්නෙමු'යි ඔවුහු කීහ. 'කැමති පරිදි සොයවු' යැයි ගුරුතුමා ඔවුන්ට පැවසීය. මෙසේ ගුරුතුමාගෙන් අවසර ලත් ඔවුහූ 'නොමැරෙන බව' සොයමින් ඇවිදිමින් දඹදිව පතළ වූහ. කැත් කුල ආදී වියතුන්ගෙන්ද පැන විචාරන ලදුව, මතු මතුත් ඒ ගැන විමසුවද අවසානයක් නොපෙනේ. උපතිස්ස, කෝලිත යැයි කී විට, 'මොවුන්

කවුරුන්ද? අප නම නොදනිමු'යි කියන අයෙකු නම් නැත. එපමණටම ඔවුන් හඳුනනු ලැබූහ.

මෙසේ ඔවුන් 'නොමැරෙන බව' ගැන සොයමින් හැසිරෙන කල, අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළව උතුම් දම්සක් පවත්වා අනුපිළිවෙලින් රජගහ නුවරට පැමිණියහ. ඒ පිරිවැජියෝද, මුළු දඹදිවම ඇවිද 'නොමැරෙන කෙනෙකු නොලබාම, නැවත රජගහනුවරට ගියහ. 'ඉක්බිති ගරුකටයුතු අස්සජි තෙරුන් උදෑසන හැඳ, පොරවා....' යැයි සඳහන් වූ තැන් පටන් ඔවුන්ගේ පැවිදිවීම දක්වා සියළුම කරුණු විස්තර සහිතව ඛන්ධකයෙන් දතයුතුය. මෙසේ පැවිදි වූ ඒ යහළුවන් දෙදෙනාගෙන් ගරුකටයුතු සැරියුත් හිමියෝ අඩමසකින් රහත්බව පසක් කළහ. සැරියුත් තෙර, යම්විටක, අස්සජි තෙරුන් සමග එකම විහාරයෙහි වාසය කරයිද, එවිට භාග්‍යවතුන් වහන්සේට උවටැන් පිණිස ගොස්, ඉන්පසු, 'මුලදී මට ගුරුවරයා වූ උන්වහන්සේට ගරුකළ යුතුයි, මම එතුමන් නිසා භගවත් සසුන දැනගතිමි'යි අස්සජි තෙරුන්ටද උවටැන් පිණිස යයි. යම්විටක අස්සජි තෙරුන් සමග එක විහාරයෙහි නොවසයිද, එවිට උන්වහන්සේ වැඩසිටින දිසාව බලා පසඟ පිහිටුවා වැඳ ඇඳිලි බැඳ නමස්කාර කරයි. ඒ දැක ඇතැම් හිමිවරු 'සැරියුත් හිමි අගසව්වකු වුවත් දිසා නමදිනු ලබයි, තවමත් බමුණු හැඟුම් ඉවත් වී නැතැ'යි කතාබහ කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දිව කණින් ඒ කතාබහ අසා, පණවන ලද උතුම් බුදු අසුනෙහි වැඩ හිඳිමින්ම, තමන් දක්වමින් 'මහණෙනි, දැන් ඔබලා කුමන කතාවකින් සිටියාහුදැ'යි ඇසූහ. හිමිවරු ඒ පුවත කීහ. එහිදී භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, සැරියුත් දිසා නමදින්නේ නොවේ, යම් කෙනෙකු නිසා සසුන දැනගත්තේ ද තමන්ගේ ඒ ගුරුවරයාට නමස්කාර කරයි. ගරු කරයි. මහණෙනි, සැරියුත් ගුරුවරයාට පූජා කරන්නෙකි'යි එහි රැස්වූ පිරිසට දහම් දෙසනු පිණිස මෙම සූත්‍රය වදාළහ.

යස්මා හි ධම්මං පුරිසො විජඤ්ඤා තුන් පිටකය ඇතුලත් ඉගෙන ගතයුතු දහම හෝ එම දහම් කරුණු අසා අවබෝධ කටයුතු නව ලොවුතුරා දහමෙහි පරම ඇත්ත ඇති සැටියෙන් දැකීම හෝ, (එසේ දකින) තැනැත්තෝ **විජඤ්ඤා** දැනගනු ලබන්නේය. අවබෝධ කරන්නේ ය. **යස්සා** යනුද පාඨයකි. එය ද මෙම අරුතමය. **ඉන්දං ව නං දෙවතා පූජයෙය්‍ය** දෙව්ලෝ දෙකෙහි දෙවිවරු සක්දෙවිඳුට යම්සේ පූජා කරත්ද, ඒ තැනැත්තා ද අනෙක් තැනැත්තාට උදෑසනින් පිබිද, පාවහන් මුදාහැරීම

ආදී සියළු වත් පිළිවෙත් කරමින් පූජා කරන්නේය, සත්කාර කරන්නේය. ගරු කරන්නේය. ඊට හේතු කවරේද? **සො පූජිතො.........පාතුකරොති ධම්මං** ඒ ගුරුතුමා එසේ පූජා ලබන ලද්දේ, **තස්මිං** අතවැසියා කෙරෙහි, **පසන්න චිත්තො** ඉගෙනීම හා අවබෝධය ලෙසින් **බහුස්සුතො** දේසනය අවසන්හිම දහම ඉගෙන, අවවාද අනුව පිළිපැද දහම අවබෝධ කර ගනී. දේසනයෙන් හෝ පිළිවෙත් දහම උපමා කරගනිමින් තමන් අවබෝධ කරගත් දහම හෙළිදරව් කරයි. **තදට්ඨි කත්වාන නිසම්ම ධීරො** මෙසේ පහන් සිතින් ඉගෙනීමෙන් හා අවබෝධ කිරීමෙන් ගුරුවරයා විසින් හෙළිදරව් කරන ලද දහම අරුත් මෙනෙහි කරමින් අසා, ඒ පිළිබඳව සැලකිලිමත් වීමේ හැකියාව ඇති නැණවත් තැනැත්තා, **ධම්මානුධම්මං පටිපජ්ජමානො** ලොවුතුරු දහමට වෙනස් නොවන බැවින් ඊට අනුකූලව විදසුන් වඩමින්, **විඤ්ඤූ විභාවී නිපුණො ච හොති** නුවණැති බව යැයි කියන ලද වියත් බව ලැබූයේ නුවණැත්තා වේ. එය මැනවින් අවබෝධ කොට, අනුන්ට ද පැහැදිලිව වටහාදීමට සමත් බැවින් විභාවී වේ. සියළු කරුණු ඉතා සියුම්ව (ඉතිරියක් නොමැතිව) පිරිසිඳ දැනීමේ හැකියාවෙන් යුතු වෙයි. **යො තාදිසං භජතෙ අප්පමත්තො** පෙර කියන ලද පරිදි බොහෝ ඇසූ පිරූ තැන් ඇති තැනැත්තකුගේ අවවාද අනුසාසනා ලබමින් නොපමාව ඇසුරු කරයි.

මෙසේ නුවණැතියන්ගේ හැසිරීම හා ඇසුර පසසා දැන් අනුවණයාගේ හැසිරීම් හා ඇසුර ගරහමින් **ඛුද්දඤ්ච බාලං** යන මේ ගාථාව වදාළහ. **ඛුද්දං** නොවැදගත් කයෙන් කෙරෙන කටයුතුවල යෙදුනු, නුවණ මෙහෙයා කටයුතු කිරීමෙන් තොර වූයේ **බාලං**, **අනාගතත්ථං** දහම් ඉගෙනීමක් නැති, අවබෝධ නොකරන ලද, **උසූයකං** අතවැසියාගේ දියුණුව නොකැමති වූ සිතින්, ඉතිරි කරුණු පහසුය. මෙහි අදහස් කෙරෙන්නේ ගුරු හිමියන්ට බොහෝ සිවුරු ආදිය ලැබේ ද, අතවැසි ගෝලයනට ඒ සිවුරු ආදිය දීමට නොහැකි බවත්, දහම ගැන කියා දීමේදී 'කිසිවක් තිර නැත, දුකය, මගේ යැයි නොගත යුතුය යන වචනයකුදු කියාදීමට නොහැකි බවත්ය. මෙබඳු අඩු ගුණ ඇති බැවින්, එබඳු අනුවණ, ඉසි සිතින් පිරුණු ගුරුවරයකු ඇසුරු කරන්නා ද 'කුසතණ පතින් ඔතන ලද කුණු වූ මස්' යැයි කියා ඇති පරිදි 'පූතිමච්ඡං කුසග්ගෙන' තමාද මෝඩයකු බවට පත්වේ. එහෙයින් ඉධ මේ සාසනයෙහි කිසියම් කෙනෙකු මදක් හෝ ඉගෙනීමෙන් හෝ පිළිපැදීමෙන්, ධම්මං පිළිවෙත් දහම හෝ,

අවිභාවයිත්වා නොදැනීමෙන් ද, ඒ දහමෙහි සැක ඇති තැන් දුරුකර නො ගැනීමෙන්ද **මරණං උපෙති** මෙසේ අරුත දතයුතුය.

දැන් එහිම අරුත තවත් පැහැදිලි කරනු පිණිස **යථා නරො** යන ගාථා දෙක වදාළහ. **ආපගං** ගඟ, **මහොදිකං** බොහෝ ජලය ඇති, **සලිලං** එහා මෙහා ගිය, පුළුල්ව පැතිරුණු යැයි කියන ලදී. **සරිතං** යනුවෙන්ද පාඨයකි. එයද මෙම තේරුමයි. **සීඝසොතං** බර ගෙනයන, වේගයෙන් (ගලායන) **කිං සො** මෙහි 'ඔහු ගසාගෙන යනු ලබන්නේ' **සො** යන මෙම පදයෙන් ඒ පුද්ගලයා දක්වන ලද බැවින් එය නිපාතයකි. කුමක් කියන ලදද? 'ඔහු මෙන් නොවන්නෙමි. ඔහු මෙන් විනාස නොවන්නෙමි.' (ඒ පරිදි යෙදී ඇත.) ධම්මං පෙර කී පරිදි දෙ ආකාරය. **අනිසාමයත්ථ** ඇහුම්කන් නොදී යන තේරුමයි. ඉතිරි වචන පැහැදිලිය. අදහස් කරන්නේ මෙයයි. යථා කියන ලද පරිදි කිසියම් මිනිසෙක් ගඟට **ඔතරිත්වා** ඒ ගඟෙහි වුයහමානො **අනුසොතගාමී** දිය පහරටම අනුව යන්නේ, **පරෙ** එතෙර වීමට කැමතිව, **කිං සක්කති** එතරට ගෙනයාමට **සක්ඛති** යනුවෙන්ද පාඨයකි. **තථෙව** දෙආකාර වූත්, ධම්මං තමන්ගේ නුවණින් **අවිභාවයිත්වා** බහුස්සුතානඤ්ච සමීපයෙහි අරුත් නොඅසා, **සයං** පුරුදු නොකරන ලද බැවින්, අජානනෙතා නොඅසන ලද බැවින්ද, **අවිතිණ්ණකංඛො පරෙ කිං සක්ඛති** නිජ්ඣාපෙතුං බලාපොරොත්තු වීමට යැයි අරුත දතයුතුය. 'චුන්ද, තමන් මඩෙහි එරුණේ' - 'සො වත චුන්ද අත්තනා පලිපපලිපනෙනා' ආදී තන්හි සූත්‍රවල යෙදුණු අයුරු සිහිපත් කළ යුතුය.

මෙසේ බාලයකු - අනුවණයකු ඇසුරෙන් අන් තැනැත්තන්ට කරුණු පහදා දීමට නොහැකි බව දැක්වීමට උපමාවක් දක්වා, දැන් 'යම් පුද්ගලයෙකු එබඳු කෙනෙකු ඇසුරු කෙරේ නම් පමා නොවේ'යැයි කියන ලද පරිදි, නුවණැති දැනුම් තේරුම් ඇති කෙනෙකුට අනෙක් තැනැත්තන්ට කරුණු පහදා දීමට හැකි බවට **යථාපි නාවං** යන ගාථා දෙක වදාළහ. **පියෙන** හබලෙන්, ලැල්ලෙන්, **අරිතෙතන** උණ ලීයෙන්, **තත්ථ** ඒ නැවෙහි **තත්‍රූපායඤ්ඤූ** ඒ නැවෙහි ගෙනයන දෙයෙහි, ඒවා පිළිවෙලකට තැබීම වැනි කළයුතු දේ දැන, සුදුසු මග දැන; සුදුසු පරිදි කටයුතු කිරීමෙහි උපාය කුසලතාවෙන් යුතු, මනා හික්මීමෙන් සැහැල්ලු බවින් යුතු **කුසලො** ඇතිවන අපහසුතා මගහරවා කටයුතු කිරීමේ හැකියාවෙන් **මුතීමා, වෙදගූ** දැනීම හෙවත් වේද යැයි කියනු ලබන සිවුමග නුවණින් (එතරට) ගිය, **භාවිතතෙතා** ඒ මග නුවණින් පුරුදු

කරන ලද සිත ඇති, **බහුස්සුතො** (මෙහි තේරුම) පෙර කියන ලද පරිදිමය. **අවෙඩධමෙමා** අටලෝ දහමෙන් කම්පා නොවන බැවින්, **සොතාවධානූපනිස්සූපපනෙන** සවන් යොමු කරමින්ද මගපල ලැබීම පිණිසද හේතුවන ආකාරයෙන්ද, ඉතිරි පද කලින් තේරුම් දී ඇති පරිදිමය. මෙහි අදහසද පෙර පරිදිම දැනගත හැකිවෙතැයි විස්තර නොකරන ලදී.

මෙසේ නුවණැත්තාට අනුන්ට වටහාදීමට හැකි බව පැහැදිලි කරනු පිණිස උපමාවක් කියා, ඒ නුවණැති ඇසුරෙහි යොදවමින් **තසමා භවෙ** යන මේ අවසාන ගාථාව වදාළහ. මේ එහි කෙටි අදහසයි. යම් හෙයකින් හේතු සම්පත් ඇතිව නුවණැත්තන් ඇසුරෙන් උසස් බවට පැමිණේද, **තසමා භවෙ සපපුරිසං භජෙථ** කෙබඳු යහපත් තැනැත්තෙක්ද? **මෙධාවිනඤ්චව බහුස්සුතඤ්ච** නුවණ සම්පතද, ඇසීම ද යන කරුණු දෙකම නුවණැතියන් කියන ලද අයුරු බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවයි. එවැනි තැනැත්තන් ඇසුරෙන් ඒ කියන ලද කරුණු **අඤ්ඤාය අත්‍ථං** මෙසේ දැන අනුසාසනා පරිදි **පටිපජජමානො** ඒ පිළිවෙතින් අවබෝධ කිරීම් ලෙසින් **විඤ්ඤාත ධමෙමා සො** මගපල නිවන් ලෙසින් ලොවුතුරා **සුඛං ලභෙථ** ලබන්නේය, පැමිණෙන්නේ යැයි රහත් පලය කුළුගන්වමින් දේසනය නිමකළහ.

ධම්මසූත්‍ර විස්තරය නිමි.

## 2.9

**කිං සීලො** යනු කිංසීල සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? ගරු කටයුතු සැරියුත් හිමිගේ ගිහිකල එක් යහළුවකු වූ, උන්වහන්සේගේ පියා වූ වංගනත බමුණාගේ ද යහළු බමුණකුගේ පුතෙක් විය. ඔහු සැටපත් කෝටියටකත් වඩා ධනය හැරදමා ගරුකටයුතු සැරියුත් තෙරුන් සමීපයෙහි පැවිදිව සියළු බුදුවදන්ද ඉගෙන ගත්තේය. තෙරුන්

වහන්සේ ඒ හිමිට බොහෝ අවවාද කොට කමටහන් දුන්හ. එයින් මගපල වැනි උසස් බවක් නොලැබීය. එවිට සැරියුත් තෙරුන්, 'මේ හිමියන් ගැන දන්නේ බුදුරදුන්යැ'යි ඒ හිමිද සමග භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස්, ඒ හිමියන් මුල්කොට, පුද්ගලයෙකු නියම නොකොට, **කිං සීලො** යැයි ඇසීය. එවිට භාග්‍යවතුන් වහන්සේ වැඩිදුරට කරුණු පැහැදිළි කළහ.

**කිං සීලො** කෙබඳු වැළකිය යුතු (කරුණු අනුව) සීලයෙන් යුතු වේද? කෙබඳු ගතිගුණ සොබාව තිබිය යුතුද? **කිං සමාචාරො** කෙබඳු හැසිරීමෙන් යුතු වේද? **කානි කම්මානි බෲහයං** කයෙන් කෙරෙන කටයුතු කෙබඳු ලෙස විය යුතුද? **නරො සම්මා නිවිට්ඨස්ස** සසුනෙහි ඇල්මෙන් යුතු මිනිසා මැනවින් කටයුතු කරන්නේය. **උත්තමත්ථඤ්ච පාපුණෙ** හැමවිටම උතුම් අරහත් පලයටද පැමිණෙන්නේ යැයි කියන ලදී.

එහිදී භාග්‍යවතුන් වහන්සේ 'සැරියුත් අඩමසකදී අරහත් පලයට පත්විය. මගපල පත් නොවූ කෙනෙකු මුලින්ම කළ යුතු දේ ගැන පැනයක් අසන්නේ කවර හෙයින්දැ'යි විමසා බලන්නේ, එක්ව වාසය කරන්නෙකු මුල්කොට ගෙන යැයි දැන, අසන ලද පරිදි හැසිරීම් පිළිබඳ වූ සීලය නොපවසාම, ඒ හිමියන්ට සුදුසු වන සේ දහම් දෙසමින්, **වද්ධාපචායී** ආදී ගාථා වදාළහ. එහි නුවණින් වැඩිහිටි බව, ගුණයෙන් වැඩිහිටි බව, උපතින් වැඩිහිටි බව, වයසින් වැඩිහිටි බව යයි කරුණු සතරකි. උපතින් තරුණ වුවද, බොහෝ දැනුමැති ගුණදම් සපිරූ මහණක නම්, උගත්කමින් අඩු, ගුණදම් සපුරා නැති වැඩිහිටි මහණක අතර, නුවණින් වැඩි බවින් (ඒ තරුණ මහණ) **පඤ්ඤාවද්ධා** වේ. ඒ තරුණ මහණ සමීපයෙහි මහළු මහණෙක් වුවද බුදුවදන් උගනිති. උපදෙස්, තීරණ, පැන විසඳුම්ද බලාපොරොත්තු වෙති. එසේ තරුණ මහණ ද අවබෝධයෙන් යුතු වූයේ **ගුණවද්ධා** නම් වේ. ඒ මහණගේ අවවාදයෙහි පිහිටා වැඩිමහල් මහණුද විදසුන් මග වඩා අරහත් පල ලබති. එසේ තරුණ වුවද, අබිසෙස් ලද කැත්කුල රජකු හෝ බමුණකුගේ හෝ අන් ජනයාගේ වැඳුම් ලැබීමට සුදුසු බැවින් **ජාතිවද්ධා** නම් වේ. සියල්ලටම කලින් මුලින්ම ඇති වූ බැවින් **වයොවද්ධා** වේ. එහි පැනවත් බවින් බුදුරදුන් හැර, සැරියුත් සමාන වූවෙකු නැත. එසේම අඩමසකින් සියළුම සාවක පාරමී නුවණ - රහත් පල අවබෝධ කළ බැවින් ගුණයෙන් ද උසස්ය. උපතින්ද බමුණු මහසල් කුලයෙක උපන්නේය. එහෙයින් ඒ

මහණුන්ට වයසින් සමාන වුවද, සැරියුත් හිමි මේ කරුණු තුනෙන්ම වැඩිහිටියහ. මේ තේරුමෙන්ද, පැනවත් ගුණයෙන් මෙන්ම වැඩිහිටි බවද අනුව භාග්‍යවතුන් වහන්සේ **වද්ධාපචායී** යැයි වදාළහ. එහෙයින් මෙබඳු වැඩිහිටියනට ගරු කිරීම **වද්ධාපචායී** වේ. ඒ වැඩිහිටියන්ට ලැබීම් ආදී දේ කෙරෙහි (එබඳු වැඩිහිටි මහණුන්ට සිවුපසය ආදිය ලැබීමේදී) ඉරිසියා සහගත නොවීම ද **අනුසූයය්‍යකො සියා** වන්නේය. මේ මුල් ගාථා පදයේ අරුතයි. **කාලඤ්ඤූවස්ස** රාගය ඇතිවූ විට එය දුරුකරගැනීම පිණිස ගුරු (හිමිවරු) දැකීමට යාමද කාලය දන්නා කාලඤ්ඤූය. මෙසේ **කාලඤ්ඤූ වස්ස** ගරු දස්සනාය යැයි දැක්වේ. ධම්මී කථං සමථ විදසුන් කරුණු, **එරයිතං** කියන ලදී. **ඛණඤ්ඤූ** එම කතාවට කාලය දන්නේ, මෙබඳු කතා ඇසීමට කාලය, දුලබ, පහසුවෙන් ලබාගත නොහෙන බව දැනගැනීමෙන්, **සුණෙය්‍ය සක්කච්ච** ඒ කතාව මනාව අසන්නේය. එපමණක් නොවේ. බුදුගුණ ආදිය ඇතුලත් වෙනත් කතාද **සුභාසිතානි**, ඉතා මැනවින් අසන්නේය යන තේරුමයි. 'ගුරුවරයෙකු දකිනු පිණිස ඔහුට කාලය යැයි' එහි කියන ලද පරිදි තමන්ට හටගත්තා වූ රාග ආදිය දුරුකර ගැනීමට කාලයද දැන ගුරුවරුන් සමීපයට යන්නේ **කාලෙන ගච්ඡෙ ගරූනං සකාසං** වේ. 'මම කමටහන් අනුගමනය කරමි. ධූතංග පිළිපදිමි'යි සළකා දාගැබ බෝමළු වැඳීම, පිඩු පිණිස හැසිරීම, බොහෝ දවල් වී යැයි, යම් තැනක සිටි ගුරුවරයා දැක කරුණු විචාරීමට නො එළඹෙන්නේය. තමන් වසන සෙනසුනෙහි, තමන්ගේ අසපුවෙහි හිඳ සිත් තැවුල සමනය වූ සැටි සළකා කමටහන් ආදිය ගැන ඇසීමට පැමිණෙන්නේ යැයි තේරුමයි. මෙසේ පැමිණෙන්නේ ද **ථම්භං නිරංකත්වා නිවාතවුත්ති** තද ගතියෙන් යුතු මානය නැතිකොට, පා පිස්නා රෙදිකඩක්, අං කැඩුණු නායක ගොනෙකු, දළ උදුරා දමන ලද සපෙකු බඳුව එළඹෙන්නේය. එවිට ඒ ගුරුහිමියන් කියන ලද **අත්ථං ධම්මං........සමාචාරෙ ච, අත්ථං** කියන ලද දෙයෙහි අරුත, **ධම්මං** පෙළ දහම, **සංයම** සීලය, **බ්‍රහ්මචරියං** සාසනයෙහි ඉතිරි කරුණුවලට අදාල උසස් හැසිරීම, **අනුස්සරෙ චෙව සමාචරෙ ච** වටහා දුන් කල්හි සිහි කරන්නේ ය. පෙළ දහම, සීලය, උසස් හැසිරීම ගැන පහදා දුන් කල්හි සිහි කරන්නේය. සිහි කිරීමෙන්ද, අසතුටු නොවී, ඒ සියළු කරුණු **සමාචරෙ** පිළිපදින්නේය. මනාව පවත්නේය. එම ගුණ වැඩිදියුණු කරගැනීමෙන් තමා කෙරෙහි එම ගුණ පැවතීම ගැන උත්සාහවත් වන්නේ යැයි තේරුමයි. මෙසේ නියම අයුරින් කටයුතු කරන්නේ වේ. එයින් දහමෙහි කැමති වූ, දහමෙහි ඇළුණේ, දහමෙහි පිහිටියේ, දහම අනුව තීරණය කෙරෙමින් අනුන් කෙරෙහිද පවතින්නේය.

මෙහි සියළුම පදවල ධම්මො යනු සමථ විදසුන්ය. ආරාමො - රතී එකම තේරුමයි. දහමෙහි ඇළුනේ ධම්මාරාමො, දහමෙහි ඇළුම් කරනවිට වෙනත් දෙයකට කැමති නොවේ යනු ධම්මරතො, ධම්මෙ ඨිතො දහමට පැමිණ පවතින, දහමට අනුව කරුණු තීරණය කිරීමට දනී. යම්දෙයක හටගැනීම නිසිපරිදි දැනගැනීමේ නුවණ, මේ යම්දෙයක නැතිවීම යයි නිසි අයුරින් දැනගැනීමේ නුවණින් යුතු වූයේ ධම්ම විනිච්ඡයඤ්ඤු වේ. මෙබඳු කෙනෙකු විය යුතුය. එසේම රජවරුන් පිළිබඳව, තිරිසනුන් පිළිබඳ වූ හෝ (වැඩකට නැති නොසරුප්) කථාවලින් ද, පිටතින් දකින රූප ආදී අරමුණු කෙරෙහි සතුටක් ඇති වීමෙන්ද විදසුන් වඩන තරුණ යෝගාවචරයෙකුට සමථ විදසුන් දහම අපිරිසිදු වෙයි. එහෙයින් දහම කිලිටි බවට පත්කරන්නේ යැයි කියනු ලැබේ. එසේ පත්නොවීම නෙවාචරෙ ධම්මසන්දොසවාදං වෙයි. තීයෙථ තච්ඡහි සුභාසිතෙහි හුදෙක් අසපු ආදී බවුන් වඩනා කෙනෙකුට සුදුසු දෙය ඇසුරු කරමින්, සමථ විදසුන් පිළිබඳ වූ අරුත් ඇති ඇත්ත වූ යහපත් දෙයෙහි නීයෙථ යෙදෙන්නේය. කල්ගත කරන්නේය යන තේරුමයි. ධම්මසන්දොසවාදං මෙහි ඉතා කෙටියෙන් සඳහන් කරන ලද සමථ විදසුනෙන් යුතු මහණ හට කෙලෙසුන් ඉස්මතු වෙමින් තවත් වෙනස් කෙලෙස් සමග පැවතෙන අයුරු පැහැදිලි කිරීමට හසසං ජපපං යන මේ ගාථාව වදාළහ. හාසං යනුද වචනයක් වේ. විදසුන් වඩන මහණ සිනහ උපදවන කරුණු කෙරෙහි මඳ සිනා පමණක් පහළ කළ යුතුය. හරවත් නොවන කථා නොකිය යුතුය. නෑයන්ට විපත් වූ කල පරිදෙවො නොකළ යුතුය. කැටකැබලිත්තකට හෝ සිතෙහි පදොසො නොඉපදවිය යුතුය. මායාකතං කපටිබවට කියන ලදී. තුන් ආකාර නැතිගුණ ඇතැයි පෙන්වීම කුහනං, සිවුපසය කෙරෙහි ආසාව ගිදධි, ජාතිය ආදියෙහි මානො, නිති සතුරුවන ගතිය යැයි කියන ලද සාරම්භා, නපුරු වචනයම ගතිය කොට ඇති කකකසං, රාගාදිය කසාවා බොහෝ තණ්හාව යැයි කියන ලද මුච්ඡා මේ සියළු වැරදි, සැපය කැමැත්තා ගිනි අඟුරු වලකින් මෙන්ද, පිරිසිදු වීමට කැමැත්තා අසූචි තැනි තැනකින් මෙන්ද, ජීවත්වීමට කැමැත්තා සපුන්ගෙන් මෙන් ද හිත්‍වා ඇත්විය යුතුය. නිරෝගී යැයි මානයෙන්ද මත් නොවූයේ වීතමදෙන, සිත අවුලට පත්කර නොගැනීමෙන් ඨිතතෙතචරි (හැසිරිය) යුතුය. මෙසේ පිළිපන් තැනැත්තා සියළු කෙලෙස්වලින් පිරිසිදුව නොබෝ කලකින්ම රහත්බවට පැමිණේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ හසසං ජපපං.... ඨිතතෙතා ගාථාව වදාළහ.

**හසසං ජපපං** ආදී ලෙසින් කෙලෙස් හැඟීම් ගැන කියන ලදද, ඒ කෙලෙස් සහගත මහණ යම් හෙයකින් විමසා නොබලමින් නපුරු කටයුතුවල යෙදේද, රාගයෙන් රත්ව, තරහෙන් නපුරුව, යහපත් දෙයෙහි පුරුදු වීමට පමාවීමෙන් අම්හිරි දුක් උපදවන දෙයෙහිම නියැලුනේ වේ. එබඳු කෙනෙකුට 'යහපත් වචන මනාව අසන්නේ'යැයි කීවත්, ඒ අවවාද පල රහිතය. එහෙයින් මෙම කෙලෙස් සහගත පුද්ගලයාට ගැළපෙන පරිදි දේසනයට සවන් දීම ආදී දියුණුව ඇතිවන දෙයට නොකැමති බව පෙන්වා දෙමින් **විඤ්ඤාතසරානි** යන මේ ගාථාව වදාළහ. එහි තේරුම නම්, සමථ, විදසුන් පිළිබඳ කරුණු **සුභාසිතානි**. ඒවා දැනගැනීම හරවත්ය. යම්සේ ඒවා මැනවින් දැනගත්තේ නම් යහපත්ය. එහෙත් එම වචනවල හඬ පමණක් සළකා ගතහොත්, කිසිදු (හරවත්) දෙයක් නොකරන ලදී. එම කරුණු ඇසීමේ නුවණින් දැනගනු ලබයි. එය **සුතං** නම් වේ. ඇසීමෙන් ලද නුවණ **විඤ්ඤාතසමාධිසාරං** ඒ දැනගන්නා ලද කරුණු කෙරෙහි යම් කෙනෙක් (යම් මහණක්) තම එකඟ වූ සිත අවුලකට පත් නොවන ලෙස පිහිටුවා ගනී. මේ එහි හරවත් බවයි. දැනගැනීමෙන් පමණක් කිසියම් වැදගත් දෙයක් සිදුනොවේ. **යො නරො** රාගාදි වසයෙන් යුතු යම් කෙනෙක්, **සාහසො** කුසල දහම් වැඩීමෙහි, යහපත් දෙයෙහි නොයෙදුනේ, **පමතෙතා** ඔහු හඬ පමණක් සළකන ලදී. එයින් **තසස** අරුත් නොදැනීම නිසා ඒ යහපත් වූ කියන ලද දෙයෙහි දැනීමේ **පඤ්ඤා** හෝ එය ලබාගැනීමට පිළිවෙත්හි නොයෙදීමෙන් **සුතං න වඩ්ඪති** මෙසේ පමා වූ පුද්ගලයන්ගේ නුවණ පිරිහීමත්, ඇසීමෙහි පිරිහීමත් දක්වා, දැන් නොපමා වූවන් ඒ කරුණු දෙකෙන්ම හරවත් බව ලබන සැටි පහදමින් **ධමෙම ච යෙ..........සාරමජ්ඣගූ** යන ගාථාව වදාළහ. එහි බුද්ධාදී උතුමන් මැනවින් දත් දහමනම්, සමථ විදසුන් කරුණුය. සමථ විදසුන් පිළිබඳ කරුණු දේසනා නොකොට පිරිනිවනට පත් එකම බුදුවරයෙකු වත් නොමැත. **ධමෙම ච යෙ අරියපපවෙදිතෙරතා** එහෙයින් එහි නිරත වූ පමා නොවූ, නිරතුරුවම භාවනාවෙහි යෙදුනේ, **අනනුතතරා තෙ වචසා මනසාච කමමනා** ඔව්හූ වචනයෙහි සිවුආකාරව මනා හික්මීමෙන් ද, සිත තුන් ආකාරව හික්මීමෙන් ද, කයෙහි තුන් ආකාරව හික්මීමෙන් ද යුතු බැවින්, වචනයෙන් ද සිතින් ද කරන කටයුතුවලින් ද අනෙක් පුද්ගලයන්ට වඩා උසස් වෙති. අසමාන වෙති. වෙසෙසින්ම උසස් වෙති. මෙපමණකින් සීලය මුල්කොට ඇති මගපල ලැබීමට හික්මිය යුතු අයුරු දැක්වූහ. මෙසේ පිරිසිදු සීලසම්පන්න වූ ඔව්හූ සත්හුන් බව, සුවච බව, එකඟ බව පිහිටා ඇසීමෙන්ද - දැනීම හා නුවණින් ද සාරවත් දෙයම ලැබූහ.

බුද්ධාදී උතුමන් අවබෝධ කරන ලද දහමෙහි ඇළුම් වූ ඔව්හු වචනයෙන් පමණක් උසස් වූවෝ නොවෙති. එමෙන්ම සත්හුන් බව, සුවච බවද, සිත එකඟ බවෙහිද පිහිටා ඇසීමෙන් ද නුවණින් ද හරවත් දේ ලබාගත් බව මෙසේ දතයුතුය. සැක නැති, ඇත්ත වචනය නම් **සනතී** යන නිවණයි. **සොරච්චං** සොඳුරු යහපත් වූ ඇල්මෙන්, ඇති සැටියෙන් අවබෝධය ලබාදෙන නුවණයි. ඒ කරුණු දෙකම, **සනති සොරච්චං** නිවණ අරමුණු වූ මගපල ලබන නුවණට එය සමාන වචනයකි. **සමාධී** එයද ඇතුලත් මග්ග සමාධි - සමාධි මග වේ. **සණ්ඨිතා** ඒ කරුණු දෙකෙහිම පිහිටියේ, **සුත පඤ්ඤානං සාරං** නම් අරහත් පල විමුත්තියයි. මේ උසස් හැසිරීමෙහි, (බ්‍රහ්ම චරියාවෙහි) හරය හෙවත් (සසර දුකින්) මිදීමයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ දහමෙහි මුල් පිළිවෙත් කොටස සේ උතුම් වචනය මුල්කොට ඇති සිල් සමූහයද සන්හිඳුණු නිවණ අරමුණු වූ නුවණ හා සිත එකඟ බවද යන මේ සමූහ තුනෙහි (සීලක්ඛන්ධ පඤ්ඤාඛන්ධ සමාධික්ඛන්ධ) පසු පිළිවෙත් ද දක්වා, ඇසීමෙන් ලබන නුවණ ඇසුරෙන් නොවෙනස් වන මනා මිදීම ද පැහැදිලි කරමින් අරහත් පලය කුළුගන්වා දේසනය නිම කළහ. දේසනය අවසන ඒ මහණ සෝවාන් පලයට පත්ව, නොබෝ කලකින්ම උසස් වූ අරහත් බවෙහි පිහිටියේය.

**කිංසීල සූත්‍ර විස්තරය නිමි.**

## 2.10

උට්ඨහථ යනු උට්ඨාන සූත්‍රයයි. එය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? එක් සමයෙක, භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩ වසද්දී, රැය ජේතවන විහාරයෙහි ගතකොට උදෑසන බික්සඟන පිරිවරා පිඬු පිණිස හැසිර, බටහිර දොරටුවෙන් නගරයෙන් නික්ම දිවා කාලය ගතකිරීමට මිගාරමාතු පහයට වැඩියහ. ජේතවන විහාරයෙහි

රැය ගතකොට දිවාකල විහරණයට මිගාරමාතු පහයට වැඩම කිරීමත්, රැය මිගාරමාතු පහයෙහි ගතකොට ජේතවනාරාමයෙහි දිවා විහරණයත් භාග්‍යවතුන් වහන්සේගේ පුරුද්දකි. කවර හෙයින්ද? කුල දෙකටම දහමෙන් උපකාර කිරීම පිණිසත්, දීමෙහි - ආසාව අත්හැර දැමීමේ ගුණ පැහැදිලි කර දෙනු පිණිසත්ය. මිගාරමාතු පහයෙහි යට (බිම් මහලෙහි) කුළුගෙවල කාමර පන්සියයකි. පන්සියයක් මහසඟණ වසති. යම්විටක එහි භාග්‍යවතුන් වහන්සේ බිම් මහලෙහි වැඩසිටිත්ද, උන්වහන්සේට ගරු කරනු වස් උඩුමහලට මහසඟණ නොනඟිති. එදින භාග්‍යවතුන් වහන්සේ මතු මහලෙහි කුළුගෙවල කාමරයට පිවිසියහ. එවිට යටමහලෙහි කාමර පන්සියයට පන්සියයක් මහණහු පිවිසියහ. ඒ මහණහු සියල්ලෝම මේ සසුනට එක්ව වැඩිකලක් ගත නොවූ, නවක, නොසන්සුන් උඩඟු අසංවර වූ ඉඳුරන් ඇත්තාහ. ඒ මහණහු එහි පිවිස, දහවල නිදා, සවස් කල පිබිද, බිම් මහලෙහි රැස්ව, 'අද බත් හලෙහි ඔබ (නොසිටියේ) කුමක් වූවෙහි? ඔබ ගියේ කොහිද? 'ඇවැත්නි, මම කොසොල් රජගෙදර සිටියෙමි. මම අනේපිඬු සිටු නිවසෙහි සිටියෙමි', එහි මෙබඳු මෙබඳු ආහාර සකසා තිබුණි. ආදී නොයෙක් ලාභදායී-සුලබ කතා උස්හඬින් මහත් හඬින් කියමින් සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ හඬ අසා 'මොවුන් මා සමග සිටියදීත් හැසිරෙන්නේ මෙසේය, අහෝ! සිදු නොවිය යුතු දෙයකැ'යි, මුගලන් මහතෙරුන්ගේ පැමිණීම ගැන සිතූහ. එකෙණෙහිම මහමුගලන් හිමි භාග්‍යවතුන් වහන්සේගේ සිත දැන, ඉඳු බලෙන් අවුත් පා වඳිමින්ම සිටියේය. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මුගලන, මේ එක්ව වෙසෙන්නෝ (දහමෙහි) පමා වෙති. ඔවුන් 'සංවේගයට පත් කරන්නේ නම් මැනවැ'යි මුගලන් හිමියන් ඇමතූහ. 'එසේය, හිමියනි'යි පිළිවදන් දුන් ගරුකටයුතු මුගලන් හිමි, එකෙණෙහිම ආපො කසිණයට සමවැද, කාණුව පිහිටි තැන සිට මහ පහය මහා සුළඟට අසු වූ නැවක් මෙන් පා ඇඟිල්ලෙන් කම්පා කළහ. සෙලවූහ. එවිට ඒ මහණහු බයවී, විලාප නඟමින් තම තමන්ගේ සිවුරු ද ඉවත ලා දොරටු සතරින්ම නික්මුණහ. භාග්‍යවතුන් වහන්සේ, ඒ මහණුන්ට පෙනෙන පරිදි වෙනත් දොරටුවකින් සුවඳ කුටියට පිවිසෙන්නාක් මෙන් වූහ. ඒ මහණහු දැක වැන්දාහ. 'මහණෙනි, කිනම් දෙයකට බිය වූවෝදැ'යි ඇසූහ. 'හිමියනි, මේ මිගාරමාතු පහය කම්පා වී සෙලවුණේ'යැයි සඟපිරිස කීය. 'මහණෙනි, එය කවුරුන් විසින් කරන ලදදැ'යි ඔබලා දනිවුද?' 'හිමියනි, නොදනිමු' එවිට භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, ඔබලා වැනි සිහියෙන් කටයුතු නොකරන, සිහි මුළාවූ පමාවූවන්ට සංවේගය දනවනු පිණිස මුගලන් තෙරුන් විසින් කම්පා

කරන ලදැයි කියා ඒ මහණුන්ට දහම් දෙනු පිණිස මෙම සූත්‍රය වදාළහ.

උට්ඨහථ අලස කමින් නැගිටිවු, උත්සාහ කරව්, වෑයම් කරවු, කම්මැලි නොවව්, නිසීදථ පලක් බැඳ කමටහනට ගැලපෙන අයුරු හිඳිවු, කො අත්‍ථො සුපිතෙන වො කෙලෙස් නැති කිරීම පිණිස පැවිදි වූ ඔබලාට නිදීමෙන් ඇති පලය කුමක්ද? නිදාගන්නා තැනැත්තෙකු විසින් කිසිදු යහපතක් මුදුන්පත් කරගත නොහැකිය. ආතුරානං කා නිද්දා සල්ල විද්ධාන රුප්පතං සිරුරෙහි ඉතා සුළු කොටසක හටගත් ඇස් රෝගයක් ආදියෙන් පෙළෙන විටද, අඟලක්, අඟල් දෙකක් තරම් වූ යකඩ උලක්, උල් වූ ඇට කැබැල්ලක්, උල් වූ දත් කැබැල්ලක්, උල් වූ අං කැල්ලක්, උල් වූ දර කැබැල්ලක් වැනි එක්තරා උලක් ඇනී වේදනා දැනෙන විට ඒ මිනිසුන්ට නින්ද නැත. එසේම මුළු සිතත්, සිරුරත් බිඳගෙන හටගත් නොයෙක් ආකාර වූ කෙලෙස් රෝගවලින් පීඩිත වූ ඔබලාට කුමන නින්දක්ද? රාග ආදී උල් පහක් හදවත ඇතුලට පිවිස විදින ලද බැවින් සල්ලවිද්ධාන රුප්පතං වේ.

මෙසේ කියා, භාග්‍යවතුන් වහන්සේ වඩ වඩාත් ඒ මහණුන් උත්සාහවත් කරමින් සංවේගයට පත් කරනු පිණිස නැවත උට්ඨහථ..... වසානුගෙ යන ගාථාව වදාළහ. මේ එහි අදහස් කෙරෙන අරුත් විස්තර දැක්වීමයි. 'මහණෙනි, මෙසේ කෙලෙස් උලෙන් විදිනු ලබන ඔබලාට පිබිදීමට කාලයයි. ඊට හේතු කවරේද? 'මහණෙනි, මගපෙන්වන නායකයෙකු හමුවී ඇති මෙම උසස් හැසිරීම හෙවත් බ්‍රහ්මචරිය හැම අතින්ම ඉහළය. මීට පෙර ඔබලා උතුම් ඇත්ත නොදැක (එය අවබෝධ කිරීමේ අදහසින්) දිගුකලක් උස්පව්වල නිදාගත්තහු, ගංගා (ඉවුරුවල) නිදාගත්තහු, සම නොසම රුක්මුදුන්හි නිදාගත්තහු, එහෙයින් නිදීම අව්සන් කරනු පිණිස, (සිතෙහි) සත්සුන් බව පතා නැගී සිටිව්, හිඳිව්, දැඩිසේ හික්මෙව්, එහි මුල් පාදයෙහි අරුත කියන ලද පරිදිය. දෙවන පදයෙහි සන්තී සන්හිඳීම් තුනකි. අච්චන්ත සන්ති, තදංග සන්ති, සම්මුති සන්ති යනුවෙනි. නිවන අරමුණුකොට විදසුන් දැක්වූවනට සමාන වචනයකි. මෙහි සසර සීමා ඉක්මවූ (අච්චන්ත) නිවණ අදහස් වේ. එහෙයින් නිවණ පිණිස දළහං සික්ඛථ දැඩි උත්සාහවත්ව හික්මෙවු යැයි කුමක් නිසා කියන ලදද? මා වො පමත්තෙ විඤ්ඤාය මච්චුරාජා අමොහයිත්‍ථ වසානුගෙ ඔබලා එසේ පමා වූ බව දැන, 'මරණය' නම් වූ මාර වසඟයට

ගොස් මුළා නොවවු - යම්සේ මරු වසඟයට යවුද, ඊට අනුකූලව කටයුතු කිරීමට ගොස් මුලා නොවවු යැයි කියන ලදී. යම් හෙයකින් ඔහුගේ වසඟයට යන්නෝ, යාය දෙවා මනුසසා දෙවියෝ ද මිනිසුන් ද ඇතුලත් වෙති. අපෙක්ඛා රූවට හඬට පහසට කැමති දෙවියෝද මිනිස්සු ද ඒ රූප දැකීම් ආදියෙහි සිතා තදින් ඇසුරුකොට, ඇලී ගැලී තිට්ඨනති, තරථ එය ඉක්මවා යවු, එතං ඒ නොයෙක් ආකාර වූ දේවල් කෙරෙහි, විසාල ලෙස පැතිර ගිය බැවින්, විහිද ගිය බැවින් වතුපිටි භවභෝග ආදී සම්පත්වලට ඇති ආසාව විසත්තිකං, ඛණො වො මා උපච්චගා මේ ඔබලාගේ මහණදම් සපුරන මොහොත - කාලය ඉක්මවා නොයවු. යම් තැනැත්තෙක් මෙබඳු මොහොතක් ඉක්මවයිද, (මේ ලද මොහොතේ එසේ සුදුසු පරිදි කටයුතු නොකරයිද) ඒ තැනැත්තෝ මේ මොහොත ඉක්මවති. ඛණාතීතා හි සොචනති නිරයමහි සමපපිතා සැනසීමක් සැපයක් නොවන හෙයින් නිරය යැයි කියන ලද සතර අපායෙහි ඉපිද 'යහපත් කටයුතු නොකරන ලදැ'යි සෝක කරති.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුන් උත්සාහවත් කොට සංවේගයට පත්කොට, දැන් පමාවී කල් ගතකිරීම ගැන නින්දා කොට, ඒ සියල්ලන්ම නොපමාව මහණදම්හි යොදවමින් පමාදො රජො යන ගාථාව වදාළහ. පමාදො යනු කෙටියෙන් සිහියෙන් නොසිටීමයි. එය සිත කිලිටිකරන අරුතින් රජො වේ. ඒ පමාවීමට නතුවූයේ පමාදානුපතිතො පමාවට යොමුවූ බැවින් මැරෙන - ඉපදෙන හෙයින් ඒ ලෙසින්ද රජො නම් වේ. කිසිවිටකත් පමාව නම් කෙලෙස්වලින් බැහැරව නැත්තේමය. එයින් පැහැදිලි කරන්නේ කුමක්ද? 'අපි තවම තරුණ වෙමු, පසුව දැනගන්නෙමු'යි ඔබලා එබඳු තහවුරු කිරීමකට නොපැමිණෙවු, තරුණ කල පමාවද රජො හෙවත් කෙලෙස් වඩා ගැනීමකි. මැද වයසෙහිද තෙර කෙනෙකු බවට පත්කල්හිද පමාවටම නතු වූ බැවින් බොහෝ දූවිලි පිරි කසල ගොඩක්ම වෙයි. යම්සේ නිවසෙහි එක් දිනක්, දෙදිනක් දූවිලි එක්වීමෙන් වසර කිහිපයකදී කසල ගොඩක් එකතු වේද, මෙසේ ඇතිකල්හිදු මුල්කාලයෙහි බුදුවදන ඉගෙන, ඉතිරි කල්හි මහණදම් කිරීමද, මුල් කාලයෙහි ඉගෙන - මැදි වියෙහිදී අසා පැසුළුවියෙහි මහණදම් කරන පැවිද්දා ද පමාවී කල්ගත කරන්නෙක් නොවේ. පමා නොවී, නියම පිළිවෙතට පැමිණ සිටින හෙයිනි. යම් කෙනෙක් හැම වයසෙහිදීම පමාවී වාසය කරමින්, දවල් නිදමින්, අරුත් සුන් බොළඳ කතා කියමින්, ඔබලා මෙන්ම වෙත්ද, ඔහුගේ මුල් වියෙහි පමාවද

කෙලෙස් සහිතය. ඉතිරි වයස් කාලවල පමාවෙමින් වැඩී, පමාවට පත්ව, මෙසේ මහාකෙලෙස් එකතු කරගත් කෙනෙකු වේ. මෙසේ ඒ හිමිවරුන්ගේ පමා විහරණයෙහි දොස් දක්වා, පමානොවීමෙහි යොදවමින් **අපපමාදෙන විජ්ජාය අබබහෙ සලලමතතනො** යන ගාථාව වදාළහ. එහි අරුත නම්, යම් ආකාරයෙන්, හැමවිටම මේ සියළුම පමාවීම් කෙලෙස්ය. එහෙයින් සිහිය අත් නොහැරීම යයි කියන ලද **අපපමාදෙන**, පැසවන කෙලෙස් නැතිකිරීමේ නුවණැයි කියන ලද **විජ්ජාය**, නුවණැති කුලපුතෙකු **අතතනො** තම හදවත ඇසුරුකොට ලැගගත් රාගාදී පස්ආකාර වූ **සලලං** උදුරා දමන්නේ යැයි අරහත් පලය කුළුගන්වමින් දේසනය නිම කළහ. දේසනය අවසන සංවේගයට - තැතිගැනීමට පත්ව, එම දහම් දෙසුමම මෙනෙහි කොට සළකා බලමින් විදසුන් වඩා ඒ පන්සියයක් මහණහු අරහත් පලයෙහි පිහිටියාහ.

උට්ඨාන සූත්‍ර විස්තරය නිමි.

## 2.11

**කචචි අභිණ්හ සංවාසා** යනු රාහුල සූත්‍රයයි. මෙම සූත්‍රය දේසනා කිරීමට හේතුව කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ බව අවබෝධ කොට, බෝමැඩ සිට (පසුව) අනුපිළිවෙලින් කිඹුල්වත් පුරට ගොස්, එහිදී රාහුල කුමරුන් 'මහණ, මට දායාද දෙව'යි ඉල්ලන ලදුව, 'රාහුල පැවිදි කරව'යි සැරියුත් හිමිට අණ කළහ. ඒ සියළු කරුණු ඛන්ධක අටුවාවෙහි සඳහන් පරිදි ගතයුතුය. මෙසේ රාහුල කුමරු පැවිදිව නිසි වියපත් වූ කල සැරියුත් තෙරුන්වහන්සේම උපසම්පදා කළහ. එහිදී කම්මවාචා ගුරුහිමි වූයේ මහමුගලන් තෙරුන් වහන්සේය. භාග්‍යවතුන් වහන්සේ 'මේ කුමරු ඉපදුණු දා සිටම සම්පත් ඇත්තෙකි, ජාතිය, පරපුර, කුලය, පැහැය ආදිය නිසා උඩඟු බවක් හෝ ඒ ගැන ආසා - කල්පනා නොකෙරේවා'යි තරුණ කල පටන්ම රහත් බවට පත්වනතුරුම අවවාද ලෙසින් නිතර

මෙම සූත්‍රය වදාළහ. එහෙයින් ඒ පිළිබඳව 'මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගරුකටයුතු රාහුල හිමියන්ට මේ ගාථාවලින් නිතර අවවාද කරති'යි සූත්‍රය අවසානයෙහිද කියන ලදී.

එහි මුල් ගාථාවෙහි කෙටි අදහස මෙසේය. **කච්චි** රාහුල, ඔබ **අභිණ්හං සංවාසං** ඉපදීම ආදී වෙනත් කරුණකින් නින්දා නොකරහිද? **පණ්ඩිතං,** නුවණ නැමති පහනද දහම් දෙසීම ආදී පහනද දැරීමෙන් **උක්කාධාරො මනුස්සානං කච්චි අපචිතො** තව ඔබ විසින් නිතර පූජා කරන ලද්දේ කුමක්ද? ගරුකටයුතු සැරියුත් තෙරුන් උදෙසා කියයි. මෙසේ කී කල්හි ගරු කටයුතු රාහුල හිමි, භාග්‍යවතුන් වහන්ස, මම පහත් මිනිසෙකු මෙන් ඇසුර හේතුකොට මානය හෝ තණ්හා කල්පනා නොකරමි' යැයි **නාහං අභිණ්හ සංවාසා** යැයි මෙම පිළිතුරු ගාථාව කීය. එහි අදහස පැහැදිලිය.

එහිදී භාග්‍යවතුන් වහන්සේ තවදුරටත් අවවාද කරමින්, **පඤ්චකාම ගුණෙ** ආදී කොට ඇති ඉතිරි ගථා වදාළහ. පස්කම් ගුණය පුද්ගලයන් කැමැත්ත දනවන, පුද්ගලයන් කැමතිවන, පතන ලද, ඔවුන්ගේ සිත අලවන්නකි. රාහුල ඒවා හැරදමා සැදැහැයෙන් ගිහිගෙයින් නික්මුනේ, රජු විසින් එහි පමුණුවන ලද්දෙකු ලෙස නොවේ. සොරකු සේ පමුණුවන ලදුව නොවේ. ණය ගැතිව නොවේ. බය ඇතිව නොවේ. දිවිපැවැත්ම පිණිස නොවේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ, **පඤ්චකාමගුණෙ හිත්වා පියරූපෙ මනොරමෙ සද්ධාය ඝරා නික්ඛම්ම** යනුවෙන් රාහුල හිමි උත්සාහවත් කරනු පිණිස, සියල්ල හැර දැමීමට සුදුසු පිළිවෙතට යොමු කරමින් **දුක්ඛස්සන්තකරො භව** යැයි ද වදාළහ.

රාහුල (කුමරු) දායාද පතමින් ආ කල බලාත්කාරයෙන් පැවිදි කරන ලද්දේ නොවේදැ'යි අදහසක් ඇතිවිය හැකිය. භාග්‍යවතුන් වහන්සේ සැදැහැයෙන් ගිහිගෙයින් නික්ම යැයි වදාළේ කවර හෙයින්ද? ගිහිගෙයින් නික්ම, කෙලෙසුන් හැර දැමීමෙහි දැඩි ඇල්මක් තිබුණි යැයි (ඊට පිළිතුරයි.) මේ ගරු රාහුල හිමි දිගුකලක් ගිහිගෙයින් නික්ම, සියළු කෙලෙසුන් දුරු කිරීමේ උත්සාහ වූවෙකි. පියුමතුරා සම්බුදුවරයාණන්ගේ පුත් උපරේවත නම් සාමණේරයන් වහන්සේ දැක, සංඛ නම් නාරජව, සත් දිනක් දානය දී එසේ සාමණේර නමක (කුඩා පැවිදි කෙනෙකු) වීමට එදා සිට ඉදිරියට පැතුම් සපුරාගෙන යමින් කප් සියදහසක් පාරමී පුරා අවසන් උපත

ලද්දේය. මෙසේ රාහුල ගිහිගෙයින් නික්ම කෙලෙසුන් හැරදැමීමේ උත්සාහය භාග්‍යවතුන් වහන්සේ දනිති. ඒ තථාගත බල හේතුවෙන් ඇතිවන එක්තරා නුවණකි. එහෙයින් **සද්ධාය ඝරා නික්ඛම්ම** යැයි වදාළහ. නැතහොත් දිගුකලක් පැවති සැදැහෙන්ම ගෙයින් නික්ම දැන් දුක් කෙළවර කරන්නෙකු වන්නැ'යි මෙහි අදහසයි. රාහුල හිමිට මුල පටන්ම, සසර දුක් කෙළවර කිරීමේ පිළිවෙත දැක්වීමට **මිත්තෙ භජස්සු කල්‍යාණෙ** ආදී ගාථා වදාළහ. එහි සීල ආදී ගුණ බොහෝ ඇත්තන් **කල්‍යාණ මිත්තා** නම් වේ. හිමාලයේ හටගැනීම නිසා මහාසාල වෘක්ෂයන්ගේ මුල් ස්ථාවරව වැඩුනේද, එසේ ස්ථාවර ගුණ ඇති කලණ මිතුරන් ඇසුරු කරන්නෝ සිල් ආදී ගුණයන්ගෙන් වැඩෙති. **මිත්තෙ භජස්සු කල්‍යාණෙ** යැයි එහෙයින් වදාළහ. **පන්තඤ්ච සෙනාසනං විවිත්තං අප්පනිග්ඝෝසං** විවේකී වූ, දුරින් පිහිටි, මිනිසුන් නොගැවසෙන, නගරයෙහි, ගමෙහි පවතින නොයෙක් උස් හඬ නොඇසෙන තරම් වූ යම් සෙනසුනක් වේද, එහි මුවන්, ඌරන් ආදී සිවුපාවුන්ගේ හඬින් කැලෑවක් යන හැඟීම දනවයිද එබඳු වූ වන සෙනසුන්ද ඇසුරු කරව. **මත්තඤ්ඤූ හොහි භොජනෙ** පිළිගැනීමේදී ද, වළඳනවිටද, දෙනු ලබන දෙයෙහි අඩු බවක් වේනම්, අඩුවෙන් දෙනු කැමති බව පෙනේ නම්, සුළු පමණින් ගතයුතුය. දියයුතු දෙයෙහි අඩු දායක බවක් වේනම්, බොහෝ කොට දෙනු කැමති බව පෙනේ නම්, සුළු පමණින්ම ගතයුතුය. දිය යුතු දෙයෙහි බොහෝ කොට දිය යුතු වුවත්, අඩුවෙන් දෙනු කැමති බව පෙනේ නම්, සුළු පමණින්ම ගතයුතුය. දියයුතු දෙයෙහි බොහෝ දායකව, බොහෝ සෙසයින් දෙනු කැමති වේනම්, තම බලය (හෙවත් සුදුසු පමණ) දැනගත යුතුය. වැළඳීම හෝ සිවුපසය පරිහරණයේදී, පුතකුගේ මස් මෙන්, (රියසක සවිවන) අලවංගුවට තෙල් ගල්වන්නාක් මෙන් නුවණින් මෙනෙහි කොට ආහාර ගතයුතු යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් පමණ දැනගැනීම පසස්නා ලදහ. මේ ගාථාවෙන් සසුන් බඹසරෙහි උපකාර වන, එයට සුදුසු වන යහපත් මිතුරු ඇසුරක් සඳහන් කරමින්, සෙනසුන් හා සිවුපසය පිළිබඳ හික්මිය යුතු අයුරු පහදා දැන් සිවුරු ආදියෙහි දැඩි ආසාවකින් වැරදි දිවි පැවැත්මකට යොමු වේනම්, එය වළක්වා පිරිසිදු හැසිරීමට අදාල වූ හික්මීමෙහි යොදවමින් **චීවරෙ පිණ්ඩපාතෙච** යන මේ ගාථාව වදාළහ.

එම ගාථාවෙහි **පච්චයෙ** ගිලන්පසෙහි, **එතෙසු** සිවුරු ආදී වූ මහණුන්ට ආසාව වඩවන කරුණු සතර කෙරෙහි, **තණ්හං මාකාසි** ලජ්ජා සහගත තැන් ආවරණය කරගැනීමේදී සිවුරු පරිහරණයේ අරුත මෙන්,

මෙම සිවුපසය, නිති රෝගාතුර වූවෙකුට බෙහෙතින් කරන පිළියම් සේ, දිරායන ගෙයක් බඳු දුබල වූ මෙම කය පවත්වාගෙන යාම පිණිස, උදව් වන්නේ යැයි කරුණු සළකමින්, 'තණ්හාවක් ඇතිකර නොගනිවු, තණ්හාව ඇතිකර නොගනිමින්, තණ්හාව උපදවා නොගනිමින්, වාසය කරව'යි කියන ලදී. ඊට හේතු කුමක්ද? මා ලොකං පුනරාගමි. ඒවාට ආසා කරමින්, තණ්හාවෙන් (ඒ වෙතට) අදිනු ලබමින් නැවත මේ ලෝකයට පැමිණේ. ඔබ ඒවා කෙරෙහි ආසා නොකරව. එසේ වූ විට නැවත මේ ලෝකයට නොපැමිණෙන්නේය.

මෙසේ වදාළ කල්හී, ගරු කටයුතු රාහුල හිමි 'සිවුරෙහි ආසාවක් ඇතිකර නොගන්නැ'යි මට භාග්‍යවතුන් වහන්සේ කීයේ යැයි සිවුර හා අදාල වූ පාංසුකූලිකංගය, තෙචීවරිකංග යන ධූතාංග දෙක සමාදන් විය. පිඬු පිණිස ලැබෙන ආහාරයෙහි ආසා නොකරවයි මට භාග්‍යවතුන් වහන්සේ කීහ යැයි සළකා ඊට අදාල වූ පිණ්ඩපාතයෙන්ම යැපීම, එක් අසුනකම හිඳ වැළඳීම, පිළිවෙලින් පිඬු පිණිස යාම, පිණ්ඩපාතයට ලැබෙන පමණ සැළකීම, වැළඳූ පසුව ලැබෙන දෙයින් වැළකීම, යන ධූතාංග පහද සමාදන් විය. 'සෙනසුන්හි ආසාවක් ඇතිකර නොගනුව. මට භාග්‍යවතුන් වහන්සේ කීහ'යැයි සළකා ඊට අදාල වන කැලෑවක විසීම, එළිමහනේ විසීම, රුක්මුලක විසීම, ලැබෙන පරිදි ඇතිරිලි ආදිය පරිහරණය, සොහොනෙහි විසීම, නොනිදා හිඳගැන්ම පමණක් අනුගමනය කිරීම යන ධූතාංග හය සමාදන් විය. ගිලන්පසෙහි ආසා ඇතිකර නොගනිවු' යැයි මට භාග්‍යවතුන් වහන්සේ කීහ'යි සළකා කීකරු කුලපුතකු අවවාද පිළිගන්නා අයුරින් සිවුපසයට අදාල සියළු දේ ලැබෙන පරිදි, උවමනා පමණට හා සුදුසු පරිදි, තෙආකාරයෙන් සෑහීමට - සතුටට පත් වූයේය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගරු කටයුතු රාහුල හිමිට, පිරිසිදු දිවිපැවැත්මට හික්මෙන පරිදි මෙහෙයවා, දැන් ඉතිරි සීලයෙහිද, සමථ-විදසුන් ද යොමු කරමින් සංවුතො පාතිමොක්ඛසමිං ආදී ගාථාව කීහ. එහි භවසසු යැයි වචනයක් ඉතිරිව ඇත. භව යන අවසන් පදය සමග එහි සම්බන්ධය දතයුතුය. දෙවන පදයද එබඳුය. මෙසේ එම වචන දෙකින් පාමොක් සංවර සීලයත්, ඉඳුරන් සංවර සීලයත් සමාදන් කරවීය. බොහෝ දෙනා දන්නා පරිදි මෙහි පසිඳුරන් ගැන කියන ලදී. එහි ගති ලකුණු සළකා (වෙසෙසින්) හයක්ම කියන ලදැයි දතයුතුය. සති කායගතා

තථාගත මෙසේ සිවු පිරිසිදු සීලයෙහි පිහිටි ඔබ, කය පිළිබඳ නුවණින් විමසන පරිදි සිවුධාතුන්හි පැවැත්ම, සතරාකාර වූ විමසුම් නුවණ, හුස්ම ඉහළට ගැනීම, හුස්ම පහළ දැමීම, ආහාරයෙහි පිළිකුල් හැඟුම්, නුවණින් වඩව යන තේරුමයි. **නිබ්බිදා බහුලො භව.** සසර පැවැත්මෙහි කලකිරීමෙන්, මුළු ලොවෙහිම ඇල්මක් නොමැති සේ කටයුතු කරව යන අරුතයි. මෙපමණකින් තියුණු අවබෝධය ලැබීමට සුදුසු පරිසරය දක්වා දැහැන් පිළිබඳව දක්වමින් **නිමිත්තං පරිවජ්ජෙහි** ආදී ලෙස කීහ. එහි නිමිත්තං රාගය දනවන යහපතැයි සැළකෙන අරමුණුය. එයම රාහුල හිමිටත්, අන් හැමටත් ගැලපෙන අයුරින් **සුභං රාගූපසංහිතං** යැයි කීහ. **පරිවජ්ජෙහි** සිහි නොකිරීමෙන් දුරුකරව, අසුභාය චිත්තං භාවෙහි යම්සේ පණ ඇති පණ නැති සිරුරු පිළිබඳව අසුභ වැඩීම සැළකිය හැකිද, එසේ සිත පුරුදු කරහි, **එකග්ගං සුසමාහිතං** උපචාර සමාධියෙන් එකඟ බවත්, අප්පණා සමාධියෙන් තැන්පත් බවත් ඔබේ සිතට ඇතිවේද, එය පුරුදු කරවයි අදහසයි. මෙසේ දැහැන් ගැන දක්වා විදසුන් පිළිබඳව දැක්වීමට **අනිමිත්තං** ආදී ගාථාව කීහ.

අනිමිත්තඤ්ච භාවෙහි මෙසේ තියුණු අවබෝධයෙන් ලද එකඟ බවෙන් තැන්පත් සිත ඇතිව විදසුන් වඩවයි කියන ලදී. විදසුන් ලෙසට හැමදෙයක තිරවූ පැවැත්මක් නැතැයි දන්නා නුවණින්, එහි අවබෝධයෙන් මනාව කෙලෙසුන්ගෙන් මිදුණේ යැයි 'අනිච්චානුපස්සනා ඤාණං නිච්ච නිමිත්තතො විමුච්චතී ති අනිමිත්තො විමොක්ඛො' ආදී ලෙසින්, රාගාදී අරමුණු නොගැනීමෙන් විදසුන් මගට ළං වෙයි. 'ඇවැත්නි, ඒ මම සියළු ආකාර නිමිති හෙවත් අරමුණු මෙනෙහි නොකරමින්, අරමුණු රහිත සිත එකඟ බවට පැමිණ වාසය කරමි, ඇවැත්නි, එසේ වාසය කරන විට, සුදුසු පරිදි (භාවනා මගෙහි) සිතීමේ නුවණ මට ඇතිවෙයි' 'සො ඛ්වාහං ආවුසො සබ්බ නිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරාමි, තස්ස මයහං ආවුසො ඉමිනා විහාරෙන විහරතො නිමිත්තානුසාරී විඤ්ඤාණං හොති' ඒ අනුව **මානානුසයමුජ්ජහ** මේ අනිමිත්ත භාවනාවෙන් තිර නැතැයි යන හැඟීම ලැබ, 'මෙසිය කිසිවක් තිරව නොපවතීය යන හැඟීමෙන් යුතුව, මම වෙමි ආදී මැනීම් මුලින්ම උදුරා දැමීමට පැමිණේ යැයි 'අනිච්ච සඤ්ඤිනො මෙඝිය අනත්තසඤ්ඤා සණ්ඨාති, අනත්තසඤ්ඤී අසම්මානසමුග්ඝාතං පාපුණාති' - මේ ආදී නයින් දේසනා කොට ඇති පරිදි පිළිවෙලින් මානය වැනි සිත යට පවත්නා හැඟීම් ඉවත් කරව, දුරු කරව, අත්හැර දමව යන අරුතයි.

**තතො මානාභිසමයා උපසන්තො චරිස්සසි.** ඉක්බිති මෙසේ සෝවාන් ආදී පිළිවෙත් මගින් මානය වටහාගෙන, දැන, එය ඇතිවීම හා නැතිවීමද දැන, දුරුකිරීමෙන් සන්සුන්ව, නිවුනේ, සිහිල් වූයේ, සියළු දැවීම් නැතිව, යම්දිනක නැවත හටනොගන්නා පරිදි කෙලෙස් පිරිනිවනට පත්වේද එතෙක් 'සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත යැයි කියන ලද ඒ ඒ පලසමවත් විහරණයෙන් හැසිරෙහි, වාසය කරන්නෙහි යනුවෙන් අරහත් පල කුළුගන්වමින් දේසනය නිම කළහ.

මීට පසුව **ඉත්ථං සුදං භගවා** යනු සංගායනාවට සහභාගී වූ හිමිවරුන්ගේ වචනය. එහි **ඉත්ථං සුදං** මෙසේ මේ ආකාරයෙන් යන අදහසට කියන ලදී. ඉතිරි වචන අරුත් පැහැදිලිය. මෙසේ අවවාද ලද ගරු කටයුතු රාහුල හිමි කෙලෙස්වලින් මිදීමට තරම් නුවණ මේරූ විට චූලරාහුලොවාද සූත්‍ර දේසනය අවසානයේ, නොයෙක් දහස් ගණන් දේවතාවුන් සමග අරහත් පලයෙහි පිහිටියේය.

රාහුල සූත්‍ර විස්තරය නිමි.

# 2.12

**එවං මෙ සුතං** යනු නිග්‍රොධකප්ප සූත්‍රයයි. වංගීස සූත්‍රය යයිද කියනු ලැබේ. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? මෙහිම ඊට හේතු වූ කරුණු කියන ලදී. එහිදී **එවං මෙ** ආදී ලෙසින් කියන ලද්දේය. ඒ දැනගත් කරුණු අත්හැර, සඳහන් නොකරන ලද කරුණු වෙතොත් විස්තර කරන්නෙමි. **අග්ගාලවෙ චෙතියෙ** අලව් නුවර උතුම් චෛතියකි. අප භාග්‍යවතුන් වහන්සේ පහළවීමට පෙර, අග්ගාලව, ගොතමක ආදී යකුන්, නාගයන් ආදීන් වසන නොයෙක් ස්ථාන චෛතිය (නමින් හඳුන්වා) තිබුණි. භාග්‍යවතුන් වහන්සේ ගේ කාලයේදී මිනිස්සු ඒවා වනසා විහාර

කළහ. ඒවා ඒ නම්වලින්ම හඳුන්වනු ලැබිණ. එයින් අගගාලව චෛතිය යැයි කියනු ලබන විහාරයෙහි වැඩවසතියි කියනු ලබයි. ආයසමතො වංගීසසස මෙහි ආයසමා යනු යහපත් පිය වදනකි. වංගීසො එය තෙරුන්ගේ නමය. වංගීස හිමි පිළිබඳව උපතෙහි පටන්ම මෙසේ දතයුතුය.

ඔහු පිරිවැජියෙකුගේ පුතෙකි. පිරිවැජි කතකගේ කුසින් බිහිවිය. මිනී ඔළුවකට තට්ටුකොට ඒ මළ තැනැත්තා උපන් තැන යම් බලයකින් කිවහැකි එක්තරා දැනුමක් ඔහුට ඇත. මිනිස්සු තම මියගිය නෑයන්ගේ හිස්කබල් සොහොනින් ගෙනවුත් ඔහුගෙන් උපන් තැන් විමසති. 'අසවලා නිරයෙහි ඉපිද ඇත, අසවලා මිනිස් ලොව ඉපිද ඇතැ'යි ඔහු කියයි. ඔව්හු එයින් පුදුමයට පත්ව බොහෝ ධනය දෙති. මෙසේ ඔහු මුළු දඹදිවම පතළ විය. කප් සියදහසක් පුරන ලද පාරමී හේතු සම්පත් ඇති ඔහු මිනිසුන් පන්දහසක් පිරිවරන ලදුව ගම්නියම්ගම් රාජධානිවල සැරිසරමින් සැවැත්පුරට පැමිණියේය. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ වසති. සැවැත්පුර වැසියෝ පෙරබත් කාලයෙහි දානය දී, ඉන්පසු (බතින් පසු) මැනවින් හැඳ පොරවාගෙන, මල් සුවඳ ආදිය රැගෙන දහම් අසනු පිණිස ජේතවනාරාමයට යති. ඔහු ඔවුන් දැක 'මහජනයා කොහි යන්නේදැ'යි ඇසීය. 'බුදුරජාණන් වහන්සේ ලොව උපන්හ. උන්වහන්සේ බොහෝ ජනතාවට හිත පිණිස දහම් දෙසති. එහි යමු'යි ඔව්හු කීහ. ඔහුද සිය පිරිවරද කැටුව ඔවුන් සමග ගොස් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු සාමීචි කතාකොට එකත්පස්ව හුන්නේය. 'වංගීස, ඔබ මළ මිනිසුන්ගේ හිස් කබලට තට්ටුකොට, උපන් තැන කිවහැකි දැනුමක් තිබේදැ'යි ඇසූහ. 'එසේය පින්වත් ගොතම, දනිමි'යි කීය. භාග්‍යවතුන් වහන්සේ, නිරයෙහි උපන් කෙනෙකුගේ හිස් කබලක් ගෙන්වවා පෙන්වූහ. වංගීස, නිය පිටින් තට්ටුකොට 'පින්වත් ගොතම, නිරයේ උපන්නකුගේ හිස'යැයි පැවසීය. මෙසේ උපත ලබන සියළුම තැන්හි ඉපද ඇත්තන්ගේ හිස්කබල් පෙන්වූහ. ඔහු ඒ ගැන නිවැරදිව හෙළිදරව් කළේය. භාග්‍යවතුන් වහන්සේ රහත් උතුමකුගේ (එබඳු) හිසක් පෙන්වූහ. ඔහු නැවත නැවතත් තට්ටු කළත් (ඉපදුණු තැන) දැනගත නොහැකි විය. එහිදී භාග්‍යවතුන් වහන්සේ, 'වංගීස, ඔබට එය හෙළිකිරීමට දැනුම නැත, එය මටම කිවහැකි කරුණකි. එය කෙළෙස් දුරුකළ උතුමකුගේ හිසකැ'යි මේ ගාථාව වදාළහ. සිවුපාවුන්ට ගමන් මග මහ වනයයි. පක්ෂීන්ට ගමන්මග අහසයි. විභවයට ගමන්මග ධර්මයයි. නිවනට ගමන්මග රහත් බවයි.

**ගති මිගානං පවනං ආකාසො පක්ඛිනං ගති**
**විභවො ගති ධම්මානං නිබ්බාණං අරහතො ගතී**

වංගීස මේ ගාථාව අසා, 'පින්වත් ගෝතම, මට ඒ බලය-දැනුම ලබා දෙනු මැනව'යි ඉල්ලීය. භාග්‍යවතුන් වහන්සේ, 'එම දැනීම පැවිදි නොවූ තැනැත්තන්ට නොපිහිටන' බැව් කීහ. 'පින්වත් ගෝතම, මා පැවිදිකොට හෝ ඔබවහන්සේ කැමති පරිදි හෝ මට මේ දැනුම ලබාදෙන්නැ'යි කීය. භාග්‍යවතුන් වහන්සේ, එවිට සමීපයෙහි සිටි නිග්‍රොධකප්ප තෙරුන් අමතා 'එසේනම්, නිග්‍රොධකප්ප, මොහු පැවිදි කරව'යි පැවසූහ. උන්වහන්සේ, ඔහු පැවිදිකොට, (සිරුරෙහි කෙස් සිට හම දක්වා කරුණු පහ ඇතුළත්) කමටහන ගැන උපදෙස් දුන්හ. වංගීස හිමි පිළිවෙලින් සිවුපිළිසිඹියා ලැබ රහත් බවට පත්වූහ. 'මහණෙනි, මාගේ පැවිදි සාවක පිරිසෙහි මනා වැටහීමේ හැකියාවෙන් යුතු වූවන් අතුරින් වංගීස උසස්ම වේ යැ'යි '**එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං පටිභානවන්තානං යදිදං වංගීසො**' අග තනතුර දෙන ලදහ.

මෙවන් ගුණයෙන් යුතු ගරු කටයුතු වංගීස තෙරුන්ගේ **උපජ්ඣායො** වැරදි නිවැරදි දේ නැවත නැවත සිහිපත් කිරීමෙන් මෙසේ හැඳින්වූ වහරයි. **නිග්‍රොධ කප්පො** එම නමින් දන්නා තෙරුන් වහන්සේ, **කප්පො** ඒ තෙරුන්වහන්සේගේ නමයි. නුගරුක මුලදී අරහත් බව අවබෝධ කරගත් බැවින්, **නිග්‍රොධ කප්පො** යැයි භාග්‍යවතුන් වහන්සේ අමතන ලදී. එහෙයින් උන්වහන්සේට අනෙක් මහණහුද මෙසේ හඳුන්වති. සසුනෙහි තහවුරු බවට පැමිණි අදහසින් ථේර නම් වේ. අග්ගාලවෙ චෙතියෙ **අචිරපරිනිබ්බුතො හොති** අග්ගාලව සෑය නමින් හැඳින්වූ තැනදී පිරිනිවන්පෑ නොබෝ දිනකින්, **රහොගතස්ස පතිසල්ලීනස්ස** සමූහයෙන් වෙන් වූ බැවින් තනිව, කයින් සිතින් විවේකීව ඒ ඒ කරුණු පිළිබඳව ආපසු සළකා බලනවිට, **එවං චෙතසො පරිවිතක්කො උදපාදි** මේ ආකාරයෙන් සිතිවිල්ලක් - අදහසක් ඇතිවිය. කුමක් හෙයින් එබඳු අදහසක් ඇතිවීද? හමු නොවූ බැවින් හා දැක ඇසුරු නොකළ බැවිනි. නිග්‍රොධකප්ප තෙරුන් පිරිනිවන්පාන කාලයෙහිදී වංගීස තෙරුන්ට හමුනොවීය. ඒ තෙරුන්ගේ අත් හැසිරවීම ආදිය පෙර දැක ඇත. එබඳු හැසිරීම රහත් නොවූවන්ටද වෙයි. රහත් වූවන්ටද පෙර පුරුදු ලෙසින් පවතී. පෙර කලක පිරිවර සහිත රජකුව සිටි පිණ්ඩෝලභාරද්වාජ හිමි පෙර පුරුද්ද නිසාම දිවා කාලය ගතකිරීමට උදේන රජුගේ උයනටම වැඩම කරයි.

පෙර කල පිරිවර සහිතව, දෙව්පුතකුව සිටි ගවම්පතී තෙරුන් වහන්සේ මේ පෙර පුරුද්ද නිසාම තව්තිසාවෙහි හිස් දෙව් විමනකට වඩිති. පන්සිය වරක්ම නොකඩවාම බමුණකුව ඉපිද සිටි පිලින්දවච්ඡ හිමිද පෙර පුරුදු හැසිරීම් පරිදි වසලය යනුවෙන් හිමිවරුනට අමතති. එහෙයින් හමු නොවූ බැවින්ද, දැක ඇසුරු කළ නොහැකි වූ බැවින්ද පරිනිබ්බුතො නු බො මෙ උපජ්ඣායො උදාහු නො පරිනිබ්බුතො යැයි එබඳු සිතිවිල්ලක් වංගීස හිමිටද ඇතිවිය. ඉන් පසුව (ඇති වචනවල) අරුත් පැහැදිලිය. එකංසං චීවරං කත්වා නැවත (පැවිද්දකු ලෙස) පෙනෙන අයුරු කියන ලදී. එකංසං වම් උරය වැසෙන සේ සිවුර පොරවා සිටින ලදැයි තේරුම දතයුතුය. ඉතිරි වචනවල තේරුම පහසුය.

අනොම පඤ්ඤං මෙහි ධම්මං යන්නෙන් අඩු - ලාමක අරුත් වේ. එසේ අඩු නුවණක් නොමැති - මහත් නුවණැති බවයි. දිට්ඨෙව ධම්මෙ (තමා විසින්ම) අත්දැකිය යුතු, මේ ජීවිතයෙහි හෝ යන තේරුමයි. විචිකිච්ඡානං මෙබඳු සිතිවිලි, ඤාතො පසිද්ධව, යසස්සී සිවුපසය ලැබ, පිරිවර සම්පතින් යුතුව, අභිනිබ්බුතත්තො (කෙලෙස්වලින්) රැකගන්නා ලද සිත - කෙලෙස්වලින් නොදැවෙන සිතැතිව, තයාකතං නුගරුක මුල හිඳින ලද බැවින් නිග්‍රොධකප්ප යැයි කියනු ලබන ඔබවහන්සේ විසින් කරන ලද, තමන් හා සලකමින් එසේ කියයි. භාග්‍යවතුන් වහන්සේ එසේ හිඳිනු නොලැබුවද, එහි අරහත්බවට පැමිණි බැවින් එසේ උන්වහන්සේ ඇමතුහ. බ්‍රාහ්මණස්ස එසේ උපන් නිසා කියයි. ඔහු බමුණු මහසල් කුලයක (ඉපිද) පැවිදි විය. නමස්සං අචරී නමස්කාර කරමින් වාසය කළේය. මුත්‍යපෙක්ඛො නිවන යැයි කියන ලද මිදීම බලාපොරොත්තුවෙන්, නිවන පතමින් යන අදහසට කියන ලදී. දළ්හධම්මදස්සී භාග්‍යවතුන් වහන්සේට අමතයි. දළ්හ ධම්මං නිවන අවබෝධ කරන ලද අරුතින්, එහිදී භාග්‍යවතුන් වහන්සේ ගැන සඳහන් කරයි. එහෙයින් උන්වහන්සේට දළ්හධම්මදස්සී යැයි කීය. සක්කා භාග්‍යවතුන් වහන්සේටම කුලයේ නමින්ම අමතයි. මයම්පි සබ්බෙ ඉතිරි නොවූ පිරිස ගැන සළකමින් තමන් දක්වමින් පවසයි. සමන්තචක්ඛු භාග්‍යවතුන් වහන්සේටම සියල්ල දන්නා නුවණද සලකා අමතයි. සමවට්ඨිතා (කියන කරුණු පිළිබඳ) මනාව පිහිටා සිට, සිතා බලා නො අපට සවණාය මෙම පැනය පැහැදිලි කිරීම අසනු පිණිස, සොතා අසන ඉඳුරන් - කන්, ත්වං නො සත්ථා ත්වමනුත්තරොසි එය තුති කිරීමේ වචන පමණි. ඡින්දෙව නො විචිකිච්ඡං අකුසල සිතිවිලි, සැකය (ඒ නිග්‍රොධකප්ප තෙරුන්) දුරු කළත්, (වංගීස හිමිට) සැකයක්

ලෙසින් මතු වූ ඒ සිතිවිල්ල සඳහාම එසේ කීය. **බ්‍රෑහි මෙතං** මා ඉල්ලන ලද පරිදි ඒ කරුණු මට පවසනු මැනව. සැකිකුල උතුමාණනි, (සකක), ඒ සාවකයා පිළිබඳ අපි සියල්ලෝම දැනගැනීමට කැමැත්තෙමු'යැයි පවසන බව අදහස් වේ. **පරිනිබබුතං වෙදය භූරිපඤ්ඤ** මහා නුවණින් භාග්‍යවතුන් වහන්ස, පිරිනිවන දැන අප හමුවේ පවසනු මැනව. අප සියල්ලන්ටම දැනගැනීමට හැකිවන පරිදි අප හමුවේ පවසනු මැනව. **සකෙකා දෙවානංව සහසසනෙතෙතා** මෙය තුති වදනක්මය. එසේ වුවත් මෙසේ ද අදහස් වේ. දහසක් නෙත් ඇති සක්දෙව්, දෙවියන් මැද ඒ දෙවියන්ට මැනවින් පිළිගත හැකි වචන කියන සේ, (ඔබවහන්සේ) අප හමුවේ අපට පිළිගත හැකි වචන පවසනු මැනව. **යෙ කෙචි** මේ ගාථාවද භාග්‍යවතුන් වහන්සේට තුති කරනු කැමතිව කියයි. එහි අරුත නම්, යෙ කෙචි දැඩි ලොභ ආදිය, **ගන්ථා** ඒවා නැති නොකිරීමෙන්, මෝහය-සැකය නැතිකිරීමද සිදුනොවන බැවින්, **මොහමගගා** යයිද **අඤ්ඤාණ පකඛා** යැයිද **විචිකිචඡටඨානා** යයිද කියනු ලබයි. ඒ සියල්ල **තථාගතං පත්වා** තථාගතයන් වහන්සේගේ දෙසනා බලයෙන් වනසන ලද්දේ වේ. නැසෙති. ඊට හේතු කවරේද? **චකඛුං හි එතං පරමං නරානං** තථාගතයන් වහන්සේ සියළු කෙලෙස් දුරුකරන නුවණ නැමති ඇස උපදවනු ලබන බැවින් මිනිසුන්ටද උතුම් ඇස වැනි යැයි කියන ලදී. **නො චෙ හි ජාතු** මෙම ගාථාවද තුති කරනු කැමතිවම කියයි. එහි **ජාතු** නිසැකවම - ඒකාන්තවම මූලිකකොට දැක්වූ වචනයකි. **පුරිසො** භාග්‍යවතුන් වහන්සේ සඳහාම කීය. **ජොතිමනෙතා** නුවණින් බබළන්නා වූ සැරියුත් තෙරුන් ආදීන් මෙසේ කියන ලදී. නැගෙනහිර ආදී දිසාවෙන් හමා එන සුළඟ ඝන වළාකුළ නැති කරයිද, ඉවත් කරයිද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ දේසනා වේගයෙන් කෙලෙස් නැතිකරන සේක. තදින් ඝන වළාකුළු පැතිරුනවිට ලොවම එකම අඳුර වේද එමෙන්ම අනුවණ බවින් වැසී ගියවිට මෝහ නම් අඳුර වේ. සැරියුත් ආදී තෙරුන් වහන්සේලා බබළන නුවණින් මොහඳුර දුරු කරති. **තෙපි න තපෙයුං. ධීරා ච** ආදී මෙම ගාථාවද පෙර අයුරින්ම කියයි. එහි අරුත නම, ධීරා ච දැනුම් තේරුම් ඇති නැණවත් මිනිස්සු, **පජෙජාතකරා භවනති** නුවණ නම් වූ ආලෝකය පහල කරති. **අහං තං වීර** දූක කෙළවර කිරීමෙහි උත්සාහවත් වූ භගවත් හිමි, **තථෙව මඤ්ඤෙ** බබළයිද, (නුවණ නැමති) ආලෝකය ලබාදෙන පහනක් මෙන්ම හඟිමි. අපි ද සියළු දෙයම ඇති සැටියෙන් මනාව දකින භාග්‍යවතුන් වහන්සේ වෙතට මෙසේ, **ජානනතා උපාගමමහා**, එහෙයින්, **පරිසාසු නො ආවිකරොහි කපපං** නිග්‍රොධකපප (තෙරුන්) ගැන පැවසුව මැනව. හෙළිදරව් කළ මැනව. **ඛිපපං** ආදී මේ

ගාථාවද පෙර පරිදිම කියයි. එහි තේරුම නම්, **ඛිප්පං ගිරං එරය** භාග්‍යවතුන් වහන්ස, ඉක්මණින් කල් නොයවා, සිත්කළු මිහිරි වදනක් පැවසුව මැනවි. රත් හංසයෙක් අහරින් පසුව, සොබාවික විලක් පිහිටි වනලැහැබක් දැක, ගෙල **පග්ගය්හ** උඩට ඔසවා, කලබල නොවී, සෙමින් රතුහොටය දිගුකොට වග්ගු (වචනයක්) හඬක් නගයි. පිට කරයි ද එසේම ඔබවහන්සේ ද **සනිකං නිකූජ.** මේ මහපුරිස් ලකුණු අතරින් එක් ආකාරයෙන් හෙබියා වූ **බින්දුස්සරෙන සුවිකප්පිතෙන** මනාව සකස් කොටගෙන, පිළියෙල කොට, මෙහිදී අපි, **සබ්බෙව උජ්ජුගතා** අවුල් නොවූ එක්තැන් වූ සිතින්ම ඔබවහන්සේගේ මිහිරි කූජන හඬ **සුණාම පහීණජාති මරණං** ආදී මෙම ගාථාවද පෙර පරිදි අදහසින්ම කියයි. ඉතිරි නොවූයේ යන තේරුමෙන් අසෙසා ඒ ඉතිරි නොකොට, සෝවාන් බව ආදී මගපල පත්වූවන් මෙන් කිසිවක් ඉතිරි නොකොට, **පහීණජාති මරණං** ආදී මෙම ගාථාවද පෙර පරිදි අදහසින්ම කියයි. ඉතිරි නොවූයේ යන තේරුමෙන් **අසෙසො,** ඒ ඉතිරි නොකොට සෝවාන් බව ආදී මගපල පත්වූවන් මෙන් කිසිවක් ඉතිරි නොකොට **පහීණජාතිමරණං** යැයි කියන ලදී. **නිග්ගය්හ** මැනවින් ඉල්ලා හෝ සකස්කොට හෝ, **ධොතං** සියළු අයහපත් දේ ඉවතහල, වඳෙස්සාමි කියවන්නෙමි. **ධම්මං, න කාමකාරොහි පුථුජ්ජනානං** මගපල නොලද මිනිස්සු කැමති දේ (දහමට අනුව) නොකරති. පතන දේ දැනගැනීමට හෝ කීමට හෝ නොහැකි වෙතියි අදහසයි. **සංඛෙය්‍යකාරොච තථාගතානං** තථාගතයන් වහන්සේලා විමසීමෙන් යුතුව, නුවණ පෙරදැරිකොට කටයුතු කරති. උන්වහන්සේලා බලාපොරොත්තු වන දේ දැනගැනීමට හෝ කීමට හෝ හැකිවෙතැ'යි අදහසයි. දැන් එය මැනවින් විමසා පවසන ලෙසින් **සම්පන්නවෙය්‍යාකරණං** යන ගාථාව කීය. එහි අරුත නම්, **ඉදං සමුජ්ජුපඤ්ඤස්ස** එසේම භාග්‍යවතුන් වහන්ස, ඒ ඒ තැන්හිදී **සමුග්ගහීතං** කියන ලද, පවත්වන ලද පැහැදිලි විස්තර අනුව, 'සන්තති මහ ඇමති තල්ගස් හතක් තරම් ඉහළට නැගී පිරිනිවන් පාන්නේය.', 'සැකිකුල සුප්පබුද්ධ සත්වන දින පොළව ඇතුලට ගිලා බස්නේය.' මෙබඳු නොවෙනස් වූ දේ දක්නා ලදින්, යහපත් ලෙසම ඇඳිලි බැඳ කීය, **අයමඤ්ජලී පච්ඡිමො සුප්පණාමිතො** මේ නැවතත් මැනවින් ඇඳිලි බැඳ ගරු බුහුමන් දැක්වීමයි. **මා මොහයී** (ඒ ගැන) නොකීමෙන් අප මුළා නොකළ මැනවි. **ජානං කප්ප** (තෙරුන්ගේ) පිරිනිවන දැන, **අනොමපඤ්ඤ,** භාග්‍යවතුන් වහන්සේ අමතයි. **පරොවරං** යන මේ ගාථාවද පෙර පරිදිම මුළා නොවීම ගැනම ඉල්ලා සිටින සේ කීය. එහි **පරොවරං** එලොව මෙලොව ලෙස යහපත් අයහපත් හෝ දුර සමීප හෝ **අරියධම්මං**

සිවුසස් දහම, **විදිතවා** මැනවින් අවබෝධ කොට, **ජානං** දැනගත යුතු සියළුම දේ දන්නා, **වාචාභිකංඛාමිති යථා සමමනි සමමතතෙතා** වෙහෙසට පත් පිපාසිත වූ මිනිසෙකුට **වාරිං** මෙසේ ඔබවහන්සේගෙන් වදනක් බලාපොරොත්තු වෙමි. **සුතං පවසස** ඇසීම යයි කියන ලද හඬට යොමුවන පරිදි සවනට වස්වනු මැනව, වගුරුවනු මැනව, මුදාහළ මැනව. **සුතසස වසස** යනුද පාඨයකි. ඉහත සඳහන් කරන ලද පරිදි කනට (මිහිරි වචන නැමති) වැස්ස වැස්සවුව මැනවැයි අදහසයි. දැන් යම්බඳු වචනයක් කැමති වේද, එය හෙළි කරමින් **යදත්ථිකං** යන ගාථාව කීවේය. **කපපායනො** කපප තෙරුන් වහන්සේටම පූජා පිණිස කියයි. **යථා විමුතෙතා** රහත් බවට පත්ව අනුපාදිසෙස පිරිනිවනට පත්වූයේද? නැතිනම් සොපාදිසෙස පිරිනිවනට පත්වූයේදැ'යි අසයි. සෙසු අරුත් පැහැදිලිය.

මෙසේ ගාථා දොළහකින් භාග්‍යවතුන් වහන්සේගෙන් (නිග්‍රොධ කපප තෙරුන්ගේ පිරිනිවන ගැන) ඉල්ලා සිටි බැවින්, එය පැහැදිලි කරමින් **අචෙඡචඡි** යන ගාථාව වදාළහ. එහි මුල් පදයෙහි සිට අරුත මෙසේය. මෙම නාමරූපයෙහි (හෙවත් සිරුරෙහි) කාම තණ්හා ආදී ලෙසින් වූ තණ්හාව නැති නොකොට බොහෝ කලක සිට එහිම ගැලී සිටිමින් කණ්හ නම් වූ මාරයාගේ ජල පහරක් සේ ද කියනු ලබන ඒ තණ්හාව. **කණහසස සොතභූතං දීඝරතතානුසයිතං ඉධ නාමරූපෙ තණහං** (නිග්‍රොධ) **කපපායන** සිදියි. **ඉති භගවා** මෙය සංගායනාවට සහභාගී වූ තෙරුන් වහන්සේලාගේ වචනයි. අතාරි ජාතිමරණං අසෙසං කපප තෙරුන්වහන්සේ, ඒ තණ්හාව සිඳ ඉපදීම - මරණය ඉතිරි නොකරමින් (සසර) තරණය කළහ. එයින් අනුපාදිසෙස පිරිනිවන ගැන සඳහන් කරයි. **ඉච්චබ්‍රවී භගවා පඤච සෙටඨො** වංගීස හිමි විසින් අසන ලද පරිදි භාග්‍යවතුන් වහන්සේ 'මුල්ම සිසුන් (ගෝලයන් වූ) පස්වග මහණුන්ටද උසස් වූ, සද්ධා ආදී ඉන්ද්‍රියයන් පහෙන්ද, සීලාදී ගුණදම් සමූහයෙන්ද, ඉතා වෙසෙස් වූ පැණසින්ද උසස්ම වේ යැයි වදාළ බව මේ සංගායනාවට පැමිණි හිමිවරුන්ගේ වචනයි.

මෙසේ වදාළ කල්හි, ඒ කියන ලද දෙයට බෙහෙවින්ම සතුටු වූ වංගීස හිමි **එස සුතවා** ආදී ගාථා පැවසීය. එහි මුල් ගාථාවෙහි **ඉස සතතම** (අප) බුදුරජාණන් වහන්සේය. උතුම් යන අරුතින් සත්වන ඉසිවරයාය. විපස්සී, සිඛී, වෙස්සභූ කකුසඳ, කෝණාගමන, කස්සප යන ඉසිවරුන් හයදෙනා ද තමන් සමග ඉසිවරුන් සත්දෙනෙකු කරමින්

පහළ වූ ඒ සත්වන ඉසිවරයා වූ බුදුරජාණන් වහන්සේ අමතා කීය. **න මං වඤ්චසි.** යම් ආකාරයට පිරිනිවනට පත්වීද, ඒ පිරිනිවන්පෑ බව දැනගැනීමට කැමති වූ මා නොරැවටීය. මුළා නොකළේය යන තේරුමයි. ඉතිරි අරුත් පැහැදිලිය. මීළඟ ගාථාවෙන් (දුකින්) මිදීම බලාපොරොත්තුව වාසය කිරීම ගැන **යථාවාදී තථාකාරී අහූ බුද්ධසස සාවකො** ආදී ලෙස කීය. එම ගාථාවෙහි **මච්චුනො ජාලං තතං** මේ වටපිටාවෙහි අතුරන ලද මාරයාගේ තණ්හා නැමති දැල, **මායාවිනො** බොහෝ මායාවලින්, **තථා මායාවිනො** යැයිද ඇතමෙක් කියති. ඒ මාරයා නොයෙක් මායාවලින්, කිහිපවරක්ම භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේය. එසේ මාරයාගේ මායාකාරී බව අදහස් වේ. (ඊළඟ) තුන්වන ගාථාවෙහි **ආදී** යනු (අදාල) කරුණය. උපාදානසස සසර ගමනට, සසර පැවැත්මට හේතුවන - උපදවනු ලබන බැවින් මෙහි උපාදාන යැයි කියනු ලැබේ. එහි හේතු ලෙස නොදැනීම, තණ්හාව ආදී කරුණු (පිරිසිඳ) දුටුවේය. **කපෙපා** භාග්‍යවතුන් වහන්ස, මෙසේ කීමට සුදුසු යන අදහසින් කියයි. **අච්චගා වත** ඒකාන්තයෙන් ඉක්මවූයේය. **මච්චුධෙය්‍යං** මරණය දරාගෙන ඇතැයි යන අදහසින් (සියළු සත්වග) උපදනා තුන්ලොවටම සමාන වචනයකි. **සුදුතතරං** ඒ මරණයෙන් ඉවත්වීයැයි සතුටින් කියයි. ඉතිරි කරුණු පැහැදිලිය.

**නිග්‍රොධකපප සූත්‍ර විස්තරය නිමි.**

# 2.13

**පුච්ඡාමි මුනිං** යනු සමමා පරිබබාජනීය සූත්‍රයයි. (පසුව විස්තර වන පරිදි බොහෝ දෙවිදේවතාවුන්) රැස්වූ වේලාවෙහි කියන ලද බැවින් මහාසමය සූත්‍රය යැයිද හඳුන්වනු ලබයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? විමසූ දෙයකට පිළිතුරු ලෙසිනි. ඉඳු බලයෙන් පෙන්වන ලද බුදුවරයකු විසින් අසන ලද පරිදි භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය දෙසූහ. එසේ බුදුවරයකු සමග කරුණු විමසන ලද නිසා **සමමා**

පරිබ්බාජනීය සූත්‍රය යැයි කියනු ලැබේ. මේ එහි කෙටි විස්තරයකි. විස්තර ලෙසින් සැකිකුල - කෝලිය උපතෙහි පටන් තොරතුරු පැරණි ඇඳුරු හිමිවරුන් (පොරාණෙහි) සඳහන් කරනු ලබයි. මේ එහි කෙටි විස්තරයයි. පළමු කල්පයෙහි මහා සම්මත රජුගේ රොජ නම් පුතෙක් විය. රොජගේ පුත් වරරොජ, වරරොජගේ පුත් කල්‍යාණ - කල්‍යාණගේ වරකල්‍යාණ - වරකල්‍යාණගේ මන්ධාත - මන්ධාතුගේ වරමන්ධාත - වරමන්ධාතුගේ උපෝසථ - උපෝසථගේ චර - චරගේ උපචර - උපචරගේ මඛාදේව ලෙසින් අසූහාරදහසක් මඛාදේව පරපුර වූහ. ඔවුන්ගෙන් පසු ඔක්කාක වංසිකයෝ තිදෙනෙක් වූහ. තුන්වන ඔක්කාක රජුට හත්‍ථා, චිත්තා, ජන්තු, ජාලිනී, විසාඛා යැයි මෙහෙසියෝ පස්දෙනෙක් වූහ. එක් මෙහෙසියකට පිරිවර කාන්තාවන් පන්සියයකි. දෙවු මෙහෙසියට ඔක්කාමුඛ, කරකණ්ඩු, හත්‍ථිනබ, සිනිපුර යැයි පුතුන් සතරදෙනෙකි. පියා, සුප්පියා, ආනන්දා, විජිතා, විජිතසෙන යන දූවරුන් ද පස්දෙනෙකි. මෙසේ දූපුතුන් නව දෙනෙකු ලද ඇය (පසුව) කළුරිය කළාය.

එවිට රජු, ඉතා රූමත්, තුරුණු වියෙහි වූ වෙනත් රජදියණියක් ගෙන්වාගෙන, අග මෙහෙසි තනතුරෙහි තැබීය. ඇය ද පුතකු වැදුවාය. උපන් කුමරුවා පස්වන දින සරසා අලංකාර කොට රජුට පෙන්වීය. සතුටු වූ රජු කැමති දෙයක් ඉල්ලන ලෙස වරයක් ලබා දුන්නේය. ඇය නෑයන් සමග කතාකොට, පුතුට රජකම දෙන ලෙස ඉල්ලුවාය. රජු, 'නැසෙව - වසලිය, මගේ පුතුන්ට අනතුරක් කැමති වෙහිදැ'යි (අසා) රජකම නොදුන්නේය. ඇය රහසේ, නැවත නැවතත් රජු සතුටුකොට, 'මහරජ, බොරු කීම සුදුසු නැතැ'යි කියා රජකම දෙන ලෙස ඉල්ලුවාය. ඉක්බිති පුතුන් ඇමතු රජු 'දරුවනි, මම ඔබලාගේ කණිටු ජන්තු කුමරු දැක, ඔහුගේ මවට ඉක්මණින්ම වරයක් දුනිමි. ඇය පුතුට රජකම පිරිනමනු දැකීමට කැමැත්තීය. ඔබලා මගේ ඇවෑමෙන් අවුත් රජකම් කරව්' යැයි ඇමතිවරුන් අටදෙනෙකු සමග පිටත්කර හැරියේය. ඔව්හූ සොහොයුරියන්ද කැටුව සිවුරඟ සෙන් පිරිවරා නුවරින් නික්මුණහ. 'පියාගේ මරණින් පසු කුමරුවන් අවුත් රජකම් කරනු ඇත. යමු, ඔවුන්ට උවටැන් කරමු'යි සිතා බොහෝ මිනිස්සු ඔවුන් පසුපස ගියහ. සේනාව පළමු දිනයෙහි යොදුනක් පමණද, දෙවන දින යොදුන් දෙකක් පමණද, තුන්වන දින තුන් යොදුනක් පමණ විය. 'මේ බලසෙනග ඉතා මහත්ය, අපි කිසියම් පළාතක රජකු යටත් කොට ජනපදයක් අල්ලා ගන්නෙමු නම්, එය අපට තරම් නොවන්නේය. අනුන් පීඩනයට පත්කොට ලබන

රජකමෙන් ඇති පලය කුමක්ද? දඹදිව විසාලය, කැලයෙහි නගරයක් සකස් කරන්නෙමු'යි කුමරුවෝ සිතූහ. ඔව්හූ හිමාලය දෙසට ඉදිරියට ගියහ. එහි නගරය සැකසීමට සුදුසු ඉඩක් සොයනවිට, බොහෝ අතු පතුරින් ගැවසුණු පෙදෙසක, පොකුණු තෙර, දැඩි තවුස්දම් රකින කපිලනම් තවුසකු වසන තැනට ගියහ. තවුසා ඔවුන් දැක විමසා, සියළු තොරතුරු අසා ඔවුන් කෙරේ අනුකම්පා කළේය. තවුසා අසූරියනක් අහසෙහිද, පොළව යටද ගුණදොස් දකින 'භූමමජාල' නම් (පොළෝ දැල) විද්‍යාසතර දනී. මේ අතර එක් පෙදෙසක ඌරෝ, මුවෝ, සිංහයන්, ව්‍යාඝ්‍රයන් තැති ගන්වා බොහෝ හිංසා පමුණුවති. මැඩියෝ සහ මීයෝ සපුන්ට හිංසා කරති. තවුසා එය දැක, මේ බිම් පෙදෙස පොළවෙහි ඉතා උසස් තැනක් යයි සළකා ඒ පෙදෙසෙහි අසපුවක් සැකසීය. 'මගේ නමින් නගරය නම් කරන්නේ නම්, මේ බිම ඔබලාට දෙමි'යි තවුසා රජකුමරුවන්ට පැවසීය. ඔව්හූ එය පිළිගත්හ. 'මේ ඉඩ ඇති තැන සිට, සැඩොල් දරුවා වුවත් සක්විතිව ඒ බෙලෙන් (අන් හැම) අබිබවා යති'යි කියා අසපුව පිහිටි තැන රජමැදුර තනා නගරයද සකස් කරව'යි ඒ බිම්කොටස දී නුදුරු කඳු බෑවුමක අසපුවක් කොට විසීය.

කුමාරවරු එහි නගරය ගොඩනගා, කපිල තවුසා කියන ලද තැන ඊට යොදාගත් බැවින් **කපිලවත්‍ථු** යයි නම් තබා එහි නිවෙස් තනා ජීවත් වූහ. ඉක්බිති ඇමතිවරු 'මේ කුමරුවෝ වැඩිවියට පත්වූහ. පියා ළඟ සිටියේ නම්, ඔහු ආවාහ විවාහ කරනු ඇත. දැන් අපගේ වගකීම'යැයි සිතා කුමාරවරුන් සමග සාකච්ඡා කළහ. කුමාරවරුද 'අපට සමාන කැත්කුල දූවරුන් නොදකිමු. ඔවුන්ද සොහොයුරියන්ය. කැත් කුමරුන්ද එබඳුය. කුලය බිඳී යනු ඇත'යි බියෙන් දෙටු සොහොයුරිය මව් තනතුරෙහි තබා අනෙක් සොයුරියන් සමග අඹුසැමියන් ලෙස හැසිරුණහ. ඔවුන්ගේ පියා ඒ පුවත අසා 'පින්වත් කුමාරවරුන් ඒකාන්තයෙන්ම සැකිකුලවතුන්' යැයි සතුටින් උදන් වැකි පළ කළේය. මේ දැක්වූයේ **සක්‍යානං උපපත්ති** (සැකි කුල උපතයි) 'අම්බට්ඨ, ඔක්කාක රජු ඇමතිවරුන් පුරෝහිතයන්ගෙන් 'පින්වතුනි, කුමාරවරුන් දැන් කොතැන එක්තැන්ව සිටිත්දැ'යි ඇසීය. 'දේවයන් වහන්ස, හිමාලය පෙදෙසෙහි පොකුණුතෙර මහා අතුපතරින් යුතු පෙදෙසක දැන් එක්තැන්ව වෙසෙන කුමාරවරුන්, කුල පරපුර බිඳී යනු ඇතැයි බියෙන් තම සොහොයුරියන් සමග අඹුසැමි ලෙස සිටිති'යි කීහ. 'අම්බට්ඨය, එවිට ඔක්කාක රජු 'පින්වත් රජකුමාරවරුන් ඇත්තෙන්ම සැකි කුලවතුන්මය, පින්වත් රජකුමාරවරුන් උසස්තම සැකි කුලවතුන්

යැයි සතුටින් උදන් ඇනීය. අම්බට්ඨ, එතැන් පටන් සැකි කුලවතුන් පසිඳු වන බවත් ඔහු (ඔක්කාක) සාක්‍යයන්ගේ මුල් තැනැත්තාද වූ බවත් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී.

'අථ ඛො අම්බට්ඨ, රාජා ඔක්කාකො අමච්චෙ පාරිසජ්ජෙ ආමන්තෙසි, කහං නු ඛො භො එතරහි කුමාරා සම්මන්තී ති, අත්‍ථි දෙව හිමවන්තපස්සෙ පොක්ඛරණියා තීරෙ මහාසාකසණ්ඩො, තත්‍ථෙතරහි කුමාරා සම්මන්තීති, තෙ ජාතිසම්භෙදභයා සකාහි භගිනීහි සද්ධිං සංවාසං කප්පෙන්ති ති අථඛො අම්බට්ඨ රාජා ඔක්කාකො උදානං උදානෙසි, සක්‍යා වත භො රාජ කුමාරා, පරමසක්‍යා වත භො රාජකුමාරාහි, තදග්ගෙනෙව පන අම්බට්ඨ, සක්‍යා පඤ්ඤායන්ති, සො ච සක්‍යානං පුබ්බපුරිසො'ති

මේ අතර, ඔවුන්ගේ දෙටු සොහොයුරියට සිරුරේ වණ බිබිලි හටගැනිණ. මුළු සිරුරම කොබෝලීල මල් මෙන් විය. ඇය සමග එක්ව හිඳීමෙන් ආහාරාදිය ගැනීමෙන්ද හැමදෙනාටම ඒ රෝගය වැළඳේ යැයි සිතා රජකුමරුවෝ, උයන්කෙළියට යන්නා සේ, ඇය යානයක නංවා, කැලයට පිවිස, පොකුණක් සාරවා, ආහාරපාන සමග ඇය එහි තබා, මතුපිටින් වසා පස් දමා ආපසු ගියහ. ඒ කාලයෙහිම රාම නම් රජුද වණ බිබිලි සෑදි, ඇතොවුරෙන් ද, නළඟනන්ද පිළිකුල් කොට නොසළකා හරින ලදුව, ඒ දුකින් දෙටු පුතුට රජකම දී කැලයට පිවිස, එහි පලමුල් අල ආදිය අනුභව කොට, නොබෝ කලකින්ම නිරෝගීව, රන්වන් පැහැ සිරුරෙන් යුතුව, එහා මෙහා සැරිසරනවිට, මහත් බෙනයක් සහිත ගසක් දැක, දහසය රියනක් තරම්, එය ඇතුලත වියලි කොවුල (කොලාපං) පිරිසිදු කොට, දොර ජනෙල් ද සකසා, ඉණිමගක් ද බැඳ එහි වාසය කළේය. ඔහු රෑ කාලයෙහි අඟුරු කබලෙහි ගිනි දල්වා, අනතුරුදායක, නපුරු හඬ ද, මිහිරි හඬ ද අසමින් නිදයි. 'අසවල් පෙදෙසෙහි සිංහයකු නාද කරන ලදැයි'ද, අසවල් පෙදෙසෙහි ව්‍යාඝ්‍රයෙකුගෙ හඬ යැයි සළකා, පසුදා උදෑසන එහි ගොස් ඉතිරි මස් ගෙනවුත් පිස අනුභව කරයි. එක් දවසක් ඔහු අළුයම් වේලෙහි ගිනි දල්වා හුන්නේය. ඒ වේලාවෙහි ඒ රජදුවගේ සුවඳ ඉවකොට ව්‍යාඝ්‍රයෙකු ඇය සිටි බිම් පෙදෙස සාරා ලෑලි අතර සිදුරක් ඇති විය. ඒ විවරයෙන් ව්‍යාඝ්‍රයා දුටු ඇය බිය වී කෑ ගැසුවාය. රජු ඒ හඬ අසා, 'ගැහැණියකගේ කටහඬක් යැයි සළකා උදෑසනින්ම එහි ගොස් 'ඔතන කවුදැ'යි ඇසීය. 'හිමියනි, මම

ගැහැණියක්මි', 'පිටතට එව', 'පිටතට නොඑමි', 'කුමක් නිසාද?' 'මම කැත් රජකුල එකියක්මි', 'මෙසේ වළක් තුල සිටියත්, මානයම පළ කරන්නීය, ඔහු සියළු කරුණු අසා, 'මම ද රජ කුලයේ වෙමි', යැයි කුලය විචාරා, 'දැන් එන්න, කිරිවලට එළඟිතෙල් මෙන්'යැයි කීය. 'හිමියනි, වණ හොරි වැළඳී සිටිමි. පිටතට ඒමට නොහැක්කෙමි'යි ඇය කීවාය. 'මම දැන් අවැසි පරිදි කටයුතු කොට ඇත්තෙමි, බෙහෙත් කළ හැකි'යැයි ඉණිමගෙන් ඇය පිටතට ගෙන, තමන් වසන තැනට කැඳවාගෙන ගොස්, තමා පරිහරණය කරන ලද බෙහෙත්ම දී නොබෝ කලකින්ම නිරෝගී රන්පැහැ සිරුරින් යුතු තැනැත්තියක් බවට පත්කළේය. ඇය හා කායිකවද එකතු විය. පළමු එක්වීමෙන්ම ගැබ්ගෙන පුතුන් දෙදෙනෙකු බිහි කළාය. මෙසේ දෙදෙනකු බැගින් සොළොස් වරක්ම දරුවන් ලැබුවාය. මෙසේ සොහොයුරෝ තිස් දෙදෙනෙක් වූහ. වැඩිවිය පත්වන විට පියා ඔවුන් සියළු සිප් සතරෙහි හික්මවාලීය.

දිනක් රාම රජුගේ නගරවැසියෙක්, පව්වෙහි රුවන් ආදිය සොයමින්, ඒ පෙදෙසට පැමිණ, රජු දැක හඳුනාගෙන, 'දේවයන් වහන්ස, මම ඔබ හඳුනමි'යි කීය. 'ඔබ කොහි සිට පැමිණියෙහි' දැ'යි විචාරන ලදුව, 'දේවයන් වහන්ස, නගරයේ සිට' යැයි කීය. එහිදී රජු ඔහුගෙන් සියළු තොරතුරු ඇසීය. මෙසේ ඔවුන් කතාබහ කරද්දී, ඒ දරුවෝද පැමිණියාහ. ඔහු ඔවුන් දැක, 'දේවයන් වහන්ස, මොවුන් කවුරුන්දැ'යි විමසීය. 'පින්වත, මගේ පුතුන්ය', 'දේවයන් වහන්ස, දැන් මේ කුමාරවරුන් තිස්දෙනෙකු පිරිවරා කැලයේ කුමක් කරන්නෙහිද? එන්න, (රජකමෙහි පිහිටා) අනුසාසනා කරනු මැනවැ'යි කීය. 'කම් නැත පින්වත, මෙහිම සැපය'යි (රාම රජු පැවසීය.) 'මට කතාබහට සුදුසු කරුණක් ඇතැ'යි සැළකූ නගරවැසියා, නගරයට ගොස් (එහි) රජුගේ පුතුට සැළ කළේය. රජුගේ පුතා 'පියා කැඳවාගෙන එන්නෙමි'යි සිවුරඟ සෙනග සමග එහි ගොස් නොයෙක් ලෙසින් (ආපසු යන සේ) පියාගෙන් ඉල්ලා සිටියේය. ඔහුද 'කම් නැත, දරුව, මෙහිම සැප'යයි කැමති නොවීය. එවිට රජුගේ පුතා 'දැන් රජතුමා ඒමට අකමැතිය. මෙහිම නගරයක් සකසමි'යි සිතා එතැන කොල (ඩෙබර) ගසක් උදුරා ගෙයක් තනා, නගරය සකසා, 'කොල' ගසක් ඉවත්කොට කරන ලද බැවින් කොල නගර යයිද, ව්‍යාඝ්‍රයාගේ ගමන්මගෙහි කරන ලද බැවින් ව්‍යග්ඝපජ්ජ යැයිද නම් දෙකක් තබා ගියේය. කුමාරවරුන් වියපත් වූ කල, ඔවුන්ගේ මව 'දරුවනි, කිඹුල්වතෙහි සාක්‍යයන් ඔබලාගේ මාමලා වෙති. ඔවුන්ගේ දූවරුන්

විවාහ කරගනුව'යි අණ කළාය. ඔව්හු කැත් රජකුල තරුණියන් දියකෙළියට යන දවසෙහි, ගොස් නාන තොටුපල අවුරා, නම් ගොත් පවසා කැමති රජ දූවරුන් කැඳවාගෙන ආහ. සාක්‍ය රජු ඒ අසා, 'අපගේ නෑදැයන් බැවින් එය සේ වේවා'යි නිහඬ විය. මේ කොලිය වරුන්ගේ උපතයි.

මෙසේ ඒ සාක්‍ය කොලිය යන් එකිනෙකා අතර ආවාහ විවාහ සිදුකරමින්, පවත්වාගෙන ආ පරම්පරාව සීහහනු රජු දක්වා විස්තර සහිතව දතයුතුය. සීහහනු රජුට සුදෙධාදන, අමිතොදන ධොතොදන, සුකෙකාදන, අසුකෙකාදන යැයි පුත්තු පස්දෙනෙක් වූහ. ඔවුන්ගෙන් සුද්ධෝදන රජ වූ කල, පාරමී පිරූ මහබෝසතුන් වහන්සේ, ජාතක නිදානයෙහි සඳහන් වූ පරිදි, රජ බිසව වූ මහාමායා දේවියගේ කුසෙහි තුසිත දෙව්ලොවෙන් චුතව පිළිසිඳගෙන (බිහිව) මහබිනික්මන් කොට අනුපිළිවෙලින් සම්මා සම්බුදු බව අවබෝධකොට, උතුම් දම්සක් පවත්වා, කපිලවත්‍ථු නගරයට වැඩ, සුද්ධෝදන මහරජ ආදීන් මගපලෙහි පිහිටුවා ජනපද චාරිකාවෙහි ගොස්, අවුත් පසුකලක නැවත, පසළොස් දහසක් මහසඟ පිරිස සමග කපිලවත්‍ථුවෙහි නිග්‍රොධාරාමයෙහි වැඩ වසති. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩවසන කල්හි, සාක්‍යකෝලියන් අතර ජලය වෙනුවෙන් කලහ ඇතිවිය. ඒ කෙසේද?

කපිල පුරය හා කෝලිය පුරය අතරින් රෝහිණී නදිය ගලා බසී. ඇතැම්විටක එහි ජලය මඳය. ඇතැම් විටක ජලය බොහෝය. ජලය මඳ කල සාකය කෝලියවරු ඇළ මං මගින් තම තමන්ගේ වගා කටයුතු සඳහා ජලය ලබාගනිති. ඔවුන්ගේ මිනිස්සු එක් දවසක් ඇළ මං සකසද්දී, එකිනෙකා කලහ කරමින්, 'බොල, තොපේ රාජ පරම්පරාව කුකුළන්, බල්ලන්, හිවලුන් ආදී තිරිසනුන් මෙන් සොහොයුරියන් සමග අඹුසැමිව සිටියහ', 'තොපගේ රාජපරම්පරාව පිසාචයන් මෙන් ගස් බෙනයක සිටියහ'යයි මෙසේ ජාතිවාදයෙන් නින්දා අපහාසකොට තම තමන්ගේ රජුන්ට සැළ කළහ. ඔව්හූ කිපී, යුදට සූදානම්ව රෝහිණී ගංතෙරට පැමිණියහ. ඒ පිරිස මුහුද හා සමාන බලයෙන් යුතු විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, 'නෑදැයන් කලහ කරති, ඔවුන් එයින් වළක්වමි'යි අහසින් අවුත් සේනා පිරිස් මැද සිටියහ. 'දිවැසින් දැක, සැවැත්නුවර සිට පැමිණි බව' ඇතැමෙක් කියති. ඒ පිරිස මැද සිට අත්තදණ්ඩ සූත්‍රය වදාළහ. ඒ ඇසූ සියල්ලෝම බියට පත්ව, ආයුධ ඉවත ලා භාග්‍යවතුන් වහන්සේ

නමදිමින් සිටියහ. මාහැඟි අසුනක් ද පැනවූහ. භාග්‍යවතුන් වහන්සේ අහසින් බැස, පනවන ලද අසුනෙහි වැඩහිඳ 'කෙටේරියක් අතට ගත් මිනිසා'.....ආදී ලෙසින් එන්දන ජාතකයද, 'ඒ ඇතුට වඳිමි' ආදී ලෙසින් ලටුකික ජාතකයද,

'කුරුල්ලෝ සතුටින් දැල ඔසවාගෙන පියඹති. ඔවුන් විවාද ඇති කරගත්විට මගේ වසඟයට එති'යි

සම්මොදමානා ගච්ඡන්ති ජාලමාදාය පක්ඛිනො
යදා තෙ විවදිස්සන්ති තදා එහින්ති මෙ වසන්ති

මේ වට්ටක ජාතකයද, නැවත දිගු කලක පටන් පවත්නා ඔවුන්ගේ නෑදෑ සබඳතාව ද දක්වමින් මහා පරපුරේ අතීත කතාවද වදාළහ. ඔව්හු, අප පෙරදීත් නෑදෑයන් යයි බොහෝ පැහැදුණහ. එහිදී සාක්‍ය කුමාරවරුන් දෙසීය පණහක්ද, කෝලිය කුමාරවරුන් දෙසීය පණහක්ද වූ පන්සියයක් කුමරුවන් භාග්‍යවතුන් වහන්සේට පිරිවර පිණිස දුන්හ. බුදුරජාණන් වහන්සේ, ඔවුන්ගේ පෙර හේතු සම්පත් දැක, 'එව මහණ,' යැයි කීහ. ඒ සියල්ලෝම ඉදුබලෙන් ලද අටපිරිකර දරා, අහසට නැගී අවුත් වැඳ පසෙක සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සඟ පිරිස සමග මහා වනයට ගියහ. බිරින්දෑවරු දූතයන් යැවූහ. ඔවුන්, ඒ හිමිවරු නොයෙක් අයුරින් පොළඹවනු ලබනවිට, කලකිරුණහ. භාග්‍යවතුන් වහන්සේ, ඒ හිමිවරුන්ගේ කලකිරුණු බව දැන, හිමාලය පෙන්වා එහිදී කුණාල ජාතක කතාවෙන් උකටලී බව දුරුකරනු කැමතිව, 'මහණෙනි, ඔබලා කලින් හිමවත් පෙදෙස දැක තිබේදැ'යි ඇසූහ. 'භාග්‍යවතුන් වහන්ස, නොදිටිමු'යි කීහ. 'එවු, මහණ බලවු' යැයි තම ඉදුබලෙන් ඒ හිමිවරුන් අහසින් කැඳවාගෙන යමින්, 'මේ රන් පව්වකි. මේ රිදී පව්වකි. මේ මැණික් පව්වකි' යැයි නොයෙක් ආකාර දක්වා කුණාල විලෙහි හිරියල් තලාවට පැමිණ වැඩසිටියහ. 'හිමාලයෙහි සියළුම සිවුපා, බහුපා සතුන්ද, හැමට පසුව කුණාල කුරුල්ලා ද (ඉන්දියානු කොවුලා) පැමිණේවා'යි අදිටන් කළහ. එසේ පැමිණෙන කුරුල්ලන් හඳුන්වා දෙමින්, 'මහණෙනි, අර හංසයන්ය. අර කොස්වාලිහිණියන්ය. අර සක්වාළිහිණියන්ය. කොවුලන්ය. ඇත්කඳ ලිහිණියන්ය. තල්පේරුන්'යැයි පෙන්වා දුන්හ. පුදුමව බලා සිටින ඒ හිමිවරු, තරුණ බමුණු කුමරියන් දෙදෙනෙකු මුවින් ඩැහැගන්නා ලද දරලී කැබල්ලක මැද, දහසක් බමුණු කුමරියන් පිරිවරකොට හිඳ කුණාල

කුරුල්ලා හැමට පසුව එනු දැක මහත් පුදුම සිතින් 'හිමියනි, ඔබවහන්සේත් කුණාල රජ ලෙස පෙර සිටිසේක්දැ'යි ඇසූහ. 'එසේය මහණෙනි, මා විසින් කුණාල වංසය අරඹන ලදී. පෙර නාරද දේවල ඉසිවරයා ද, ආනන්ද නම් ගිජුලිහිණි රජුද පුණ්ණමුඛ නම් තිත්තොවුලාද, කුණාල කුරුල්ලා ලෙසින් මා ද යන අපි සතරදෙනා මෙහි විසීමු'යැයි මහා කුණාල ජාතකය දෙසූහ. ඒ අසා, ඒ මහණුන්ට ගිහිකල බිරියන් කෙරෙහි වූ ඇල්ම සංසිඳුණි. එහිදී භාග්‍යවතුන් වහන්සේ ඇත්ත කථාව කීහ. කතාව අවසානයෙහි ඒ හිමිවරුන් යටත්පිරිසෙයින් සෝවාන් පලයටද, උඩත් පිරිසෙයින් අනාගාමි පලයටද පත්වූ අතර, එක් හිමිනමක හෝ මගපලයකට පත්නොවූ හෝ රහත් පලයට හෝ පත්නොවීය. භාග්‍යවතුන් වහන්සේ ඒ හිමිවරුන්ද කැටුව නැවත මහා වනයට ගියහ. තම ඉඳුබලයෙන් ඒ හිමිවරු පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ රහත්පල පිණිස නැවත දහම් දෙසූහ. ඒ පන්සියයක් හිමිවරු විදසුන් වඩා රහත් පලයෙහි පිහිටියහ. පළමුව රහත්පල ලද හිමි ඒ බව භාග්‍යවතුන් වහන්සේට සැළ කිරීමට පැමිණ, 'භාග්‍යවතුන් වහන්ස, සසුනෙහි ඇළුම් කරමි. උකටලී නොවෙමි'යි පවසා, වැඳ එකත්පස්ව හුන්නේය. මෙසේ ඒ සියළුම හිමිවරු පොසොන් මස පොහෝදින - උපෝසථ දිනයෙහි අනුපිළිවෙලින් පැමිණ භාග්‍යවතුන් වහන්සේ පිරිවරා හිඳගත්හ.

උතුම් බුදුඅසුන්හි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටි එම රහතන් වහන්සේලා පන්සියය හැර, අසඤ්ඤතලයෙහි අරූපි බ්‍රහ්මයෝ ද, දස දහසක් සක්වළ ඉතිරි සියළු දේවතාවෝ ද, මංගල සූත්‍ර විස්තරයෙහි කී පරිදි සියුම් අත්බැව් ගනිමින්, 'විසිතුරු, වටහාගත හැකි දහම් දෙසුමක් අසන්නෙමු'යි රැස්ව සිටියහ. එමෙන්ම අනාගාමී පත් බ්‍රහ්මයෝ සතර දෙනෙක්ද සමවතින් නැගිට බ්‍රහ්ම පිරිස නොදැක, 'කොහි ගියේදැ'යි මෙනෙහිකොට, ඒ කරුණ දැන, පසුව එහි අවුත්, ඉඩක් නොලැබ, සක්වළ මුදුනෙහි සිට වෙන වෙනම ගාථා කීහ. ඒ ගැන මෙසේ සඳහන්ව ඇත. 'මේ වනවිට භාග්‍යවතුන් වහන්සේ රහතන් වහන්සේලාම පන්සියයක් සමග කපිලවත්ථු නුවර සාක්‍ය ජනපදයෙහි මහා වනයෙහි වැඩ වසති. ලෝකධාතු දහයක දේවතාවුන් භාග්‍යවතුන් වහන්සේ සහ භික්සඟන දැකීමට බොහෝ සෙයින් රැස්වී සිටින ලද බැවින්, 'අපි ද භගවත් හිමි දැකීමට යන්නෙමු, එහි එළඹ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි වෙන වෙනම ගාථා කියන්නෙමු' නම් යෙහෙකි. 'අයං ඛො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛු සංඝෙන සද්ධිං

පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි, දසහි ච ලොකධාතූහි දෙවතායො යෙභුය්‍යෙන සන්නිපතිතා භගවන්තං දස්සනාය භික්ඛුසංඝඤ්ච, යන්නූන මයම්පි යෙන භගවා තෙනුපසංකමෙය්‍යාම, උපසංකමිත්වා භගවතො සන්තිකෙ පච්චෙක ගාථායො භාසෙය්‍යාමා'ති ඒ සියළු කරුණු සගාථක වග්ගයෙහි කියා ඇති පරිදි දතයුතුය.

එසේ ගොස්, නැගෙනහිර සක්වළ මුදුනෙහි ඉඩක් ලද එක් බ්‍රහ්මයෙක් ද එහි සිට **මහාසමයො පවනස්මිං.....දක්ඛිතායෙ අපරාජිත සංඝං** යන මේ ගාථාව කීය. මේ ගාථාව කියනවිට බටහිර සක්වළ පව්වෙහි සිටි දේවතාවෝ ඒ හඬ ඇසූහ. බටහිර සක්වළ මුදුනෙහි ඉඩ ලබා සිටි දෙවන බ්‍රහ්මයා ඒ ගාථාව අසා, **තත්‍ර භික්ඛවො සමාදහංසු...... ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතා** යන ගාථාව කීය. දකුණු සක්වළ මුදුනෙහි ඉඩ ලබා සිටි තුන්වන බ්‍රහ්මයා එහි සිට ඒ ගාථාව අසා, **ජෙත්වා ඛීලං ජෙත්වා පලිඝං.............** සුසුනාගා යන ගාථාව කීය. සතරවැනි බ්‍රහ්මයාද උතුරු සක්වල මුදුනෙහි සිට **යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ.......... දෙවකායං පරිපූරෙස්සන්ති** යන ගාථාව කීය. ඔහුගේද ඒ හඬ දකුණු සක්වළ සිට ඇසීය. මෙසේ එදා මේ බ්‍රහ්මයන් සතරදෙනා පිරිස පසසා සිටියහ. මහා බ්‍රහ්මයාද එක් සක්වළක් ආවරණය වන පරිදි සිටියේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ දෙව් පිරිස දෙස බලා 'මහණෙනි, අතීතයෙහි අරහත් සම්මා සම්බුදුවරයන් වෙතද දැන් මා හමුවෙහි මෙන්ම මෙපමණම දේවතාවෝ රැස්වූහ. අනාගතයෙහි පහළවන අරහත් සම්මා සම්බුදුවරයන් වෙතද දැන් මා හමුවෙහි රැස් වූ පරිදිම දේවතාවුන් රැස්වනු ඇතැයිද සැළකළහ. 'යෙ පි තෙ භික්ඛවෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මා සම්බුද්ධා තෙසම්පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා අහෙසුං, සෙය්‍යථාපි මය්හං එතරහි, යෙපි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො -පෙ- සන්නිපතිතා භවිස්සන්ති සෙය්‍යථාපි මය්හං එතරහි' ඒ රැස්වූ දෙව් පිරිස මෙපමණකට දහම් අවබෝධය ලද හැකිය, මෙපමණකට දහම් අවබෝධය ලද නොහැකිය යනුවෙන් දෙකොටසකට බෙදුණි. ඒ දහම් අවබෝධය ලද නොහැකි පිරිස, බුදුවරු සියයක් දහම් දෙසූවත් අවබෝධය නොලබයි. අවබෝධය ලද හැකි පිරිස දැන, නැවත පුද්ගල හැසිරීම් අනුව මෙපමණ රාගී චරිත ඇත්තන්ය. මෙපමණ දෝස - මෝහ - විතක්ක - සද්ධා - බුද්ධි චරිත ඇත්තන්යැයි කොටස් හයකට බෙදීය. මෙසේ හැසිරීම් ගති සළකා, ඒ ඒ

පිරිසට තම අදහස අනුව පවසන දෙය දැනගත හැකි වේද, ඔවුන්ගේ අදහස අනුව කියන දෙය දැනගත හැකි වේද, ඒ මොහොතට සුදුසු වන අයුරු කීවොත් දැනගත හැකි වේද, විමසන ලද දෙයකට පිළිතුරු දෙන සැටියෙන් දැනගත හැකිවේදැයි, ඒ ඒ චරිතයන්ට ගැළපෙන දම් දෙසුම් නය පිළිබඳව මෙනෙහි කළහ. එවිට පිළිතුරු දීම අවබෝධයට හේතුවන බව දැන, 'පැනයක් ඇසීමට සමතෙකු ඇත්ද, නැත්දැ'යි නැවත මුළු පිරිසම විමසා බලා, 'කිසිවකු නැතැ'යි දැන, 'මා ම අසා, මම ම විසඳන්නෙම් නම්, එය මේ පිරිසට ගැලපෙන්නේ නැත. ඉඳුබලෙන් බුදුරුවක් දක්වන්නේ නම් මැනවැ'යි, ඊට අනුරූප දැහැනට සමවැද, නැගිට මනෝමය වූ ඉඳු බලෙන් අදිටන් සිත සමගම පාසිවුරු දරන, සියළු අඟපසඟින් හා (දෙතිස්-අනු) ලකුණින් යුතු, ඉදිරි-පසුපස බැලීම ආදී සන්සුන් ඉරියව් ඇති බුදුරුවක් පහළ විය. ඒ බුදුරුව, බටහිර ලෝධාතුව දෙසින් භාග්‍යවතුන් වහන්සේ හා සම අසුනෙහි සිටියේය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙම හමුවෙහිදී චරිත අනුව පුරාභෙද, කලහ විවාද, චූලව්‍යූහ, මහාව්‍යූහ, තුවටක හා සම්මා පරිබ්බාජනීය යන සූත්‍ර හයක් දේසනා කරන ලද අතර, ඒ අතරින් රාග චරිත ඇති දේවතාවුන්ට ගැලපෙන අයුරු මෙම සූත්‍රය ඉදිරියට පැවැත්වීමට (පහළ වූ බුදුන් ලවා) **පුච්ඡාමි මුනිං පහූත පඤ්ඤං** යන මෙම ගාථාවෙන් පැන අස්වන ලදී. **පහූත පඤ්ඤං** මහා නුවණැති, **තිණ්ණං** සිවු සැඩපහර තරණය කරන ලද, **පාරගතං** නිවනට පැමිණි, පරිනිබ්බුතං සොපාදිසෙස නිවණින් පිරිනිවුණ, **ඨිතත්තං** ලෝදහම්හි කම්පානොවන සිතැති, **නික්ඛම්ම ඝරා පණුජ්ජ කාමෙ** සම්පත් ආදිය හැරදමා ගිහිගෙයින් නික්ම, **කථං භික්ඛු සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය** ඒ මහණ ලොව (සමාජයෙහි) කෙසේ මැනවින් දිවි ගෙවන්නේද? වාසය කරන්නේද? ලෝකයෙහි නොඇලී, ලෝකය ඉක්මවා සිටින්නේදැයි කියන ලදී. ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිමය.

**කෙලෙසුන් නැති** නොකොට, ලොවෙහි මැනවින් වාසය කරන්නකු නැති හෙයින් රාග චරිත ඇත්තාට ගැලපෙන පරිදි, දහම අවබෝධ කරගැනීමට හැකියාව තිබෙන, සමාන වූ දොසින් යුතු දේව සමූහයෙහි පුරුදු වී ඇති ඒ ඒ වැරදි දුරුකරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ ඉක්බිතිව **යස්ස මංගලා** යැයි ගාථාව පටන්ගෙන, අරහත් බව කුළුගන්වමින්, කෙලෙස් නස්නා පිළිවෙත පහදමින් ගාථා පසළොසක් වදාළහ. ඒ මුල් ගාථාවෙහි **මංගල** යනු, මංගල සූත්‍රයෙහි දී සඳහන් වූ, දුටු දේ යහපත්ය ආදී

කරුණුවලට සමාන වචනයි. **සමූහතා** මැනවින් හානිකරන ලද, නුවණ නැමති ආයුධයෙන් කපන ලද, **උප්පාතා** උල්කාපාත, කාලගුණය නිසා වන උණුසුම් බව අනුව ඉදිරියට මෙබඳු පල ලැබේ යැයි බලාපොරොත්තුව සිටීම, **සුපිනා** පහන් වන යාමයෙහි දකින සිහින පල මෙබඳු වේ. මැදියම් රෑ කල දකින සිහින පල මෙබඳුය. දකුණු ඇලයෙන් නිදාගත්විට දකින සිහින පල මෙබඳුය. සිහිනෙන් සඳ දුටුවිට මේ පල වෙයි. හිරු දුටුවිට මේ පල ලැබේ ආදී ලෙසින් සිහින බලාපොරොත්තු, **ලක්ඛණ** (ලී) දඬුවක, රෙද්දක ලකුණු අනුව යම් යම් වැකි කියා මෙයින් මෙබඳු පල ලැබේ යැයි කීම - ඒ සියළු කරුණු බ්‍රහ්මජාල සූත්‍ර විස්තර අනුව දතයුතුය. **සමංගල දොසවිප්පහීණො** මංගල කරුණු තිස්අට හැර, ඉතිරි දේ මංගල වැරදි සේ ගැනේ. මෙම මංගල යැයි කියනු ලබන වැරදි දේ ඉවත හළ තැනැත්තා එවැනි වැරදි අදහස්වලින් මිදුණේ වේ. නැතහොත් උල්කාපාත ආදිය නිසා මෙබඳු අයහපත වේ යන වැරදි අදහස් නොමැති බැවින් මංගල දොස්වලින් මිදුණේ වේ. සෝවාන් ආදී මගපල පත් බැවින් මංගල යැයි සම්මත කරුණුවලින් පිරිසිදු බවක් බලාපොරොත්තු නොවේ. **සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය** එහෙයින් ඒ කෙලෙස් නැසූ තැනැත්තා ලොවෙහි නොඇලී මැනවින් වාසය කරන්නේය.

රාගං විනයෙථ **මානුසෙසු දිබ්බෙසු කාමෙසු චා පි භික්ඛූ** දෙවැනි ගාථාවෙහි දෙව් මිනිස් කාමගුණ (එහි ඇලීම) අනාගාමි මගින් නැවත හටනොගන්නා ලෙසට පත්කොට රාගය දුරුකරවයි දක්වයි. **අතික්කම භවං සමෙච්ච ධම්මං** මෙසේ රාගය දුරුකොට, සියළු ආකාරයෙන්ම දතයුතු හැමදෙයම ඊට පසු අරහත් මගෙන් මැනවින් අවබෝධ කොටගෙන සිවුසස් පසක්කොට ලබන මෙම පිළිවෙත් මගෙන් කාමරූපී - අරූපී තුන්භවයම ඉක්මවා, **සම්මා සො** ඒ මහණ ලොවෙහි මැනවින් වෙසෙන්නේය. තුන්වන ගාථාවේ **අනුරොධ විරොධ විප්පහීණෙ** හැමදෙයක් කෙරෙහිම රාගය - තරහව නැති කළ, ඉතිරි කරුණු කලින් කී පරිදිය. හැම ගාථාවකම (අවසන් පදය සේ) **සොපි භික්ඛූ සම්මාලොකෙ පරිබ්බජෙය්‍ය** යැයි යෙදිය යුතුය. මින්පසු එය සඳහන් නොකොටම (කලින්) සඳහන් නොවූ දේම විස්තර කරන්නෙමු.

---

අටුවාවේ සඳහන් දිසාඩාහ යන වචනයට පී.ටී.එස්. ශබ්ද කෝෂය 'ගින්නකින්' හටගත් බඳු ක්ෂිතිජයේ ඇතිවන අමුතු වූ රත්පැහැය සේ තේරුම් දේ.

සතරවන ගාථාවෙහි **පියඤ්ච අප්පියඤ්ච** යනු පුද්ගලයන් ඒ ඒ දේ එක්රැස් කරගැනීම අනුව දෙයාකාරව දතයුතුය. **හිත්වා** එහි දැඩි කැමැත්ත, රාගය, තරහව නැති කිරීමෙන්, **අනුපාදාය** සසර පැවැත්මට උපකාරවන සිවු උපාදානයන්ගෙන් කිසිදු දෙයක් නොගෙන, **අනිස්සිතො කුහිඤ්චි** එකසිය අටවැදෑරුම් තණ්හාව ඇසුරුකොට පවතින, මිසදිටු හැඟීම් සැටදෙකක හා රූපාදී වූ භවයන්හි කිසිම තැනක නොගැලී, **සංයොජනීයෙහි විප්පමුත්තො** තුන්භවයෙහි රඳන හේතු සහගත සියළු කරුණු දස සංයෝජනවලට ඇතුලත් බැවින්, එකම සබඳතාවක් ඇතිවේ. මගපල වැඩීමෙන් ඒවා පිරිසිඳ දත් බැවින්ද, සියළු ආකාරයෙන්ම මනාව මිදුණේ යැයි අදහසයි. එහි පළමු පදයෙන්ද රාග දෝස නැතිකිරීම කියන ලදී. දෙවන පදයෙන් උපාදාන හේතුද, තෙවන පදයෙන් ඉතිරි වූ කුසල අකුසලවලින් ද මැනවින් මිදුණු බවත්, පෙන්වා දෙන ලදී. මෙසේ පළමු පදයෙන් රාගදෝස නැතිකිරීම, දෙවන පදයෙන් ඊට කටයුතු යෙදීමත් (උපාය) තුන්වන පදයෙන් ඒවා නැතිකරන ලද බව කියා ඇති පරිදි සංයෝජනවලින් ද මනාව මිදුණේ යැයි දතයුතුය.

පස්වන ගාථාවෙහි **උපධීසු** යනු රූපාදී සමූහය කෙරෙහි, ආදානං ගන්නා ලද යන අරුතයි. **අනඤ්ඤනෙය්‍යො** හැමදෙයකම වෙනස්වන, තිර නොමැති බව මනාව අවබෝධයෙන් දක්නා ලද බැවින් 'මෙය උසස්' යැයි කිසිවක් නොසළකයි. ඉතිරි කලින් කියා ඇති පරිදිය. දැඩිව ගන්නා දේ - ඡන්ද රාගය - අරහත් මගෙන් දුරුකොට, **සො** ඡන්දරාගයෙන් හික්මුණු තැනැත්තා, **උපධීසු න සාරමෙති** ඒ සියළුම රූපාදී සමූහය නිසරු ලෙසින්ම දකී. මේ දෙයාකාරයෙන්ම **අනිස්සිතො** වෙනත් ආකාරයකින් හෝ කිසිවකින් හෝ මෙය උසස් යැයි නොසළකන ඒ කෙලෙසුන් නැසූ මහණුන් වහන්සේ ලොවෙහි මැනවින් වසන්නෝය.

හයවන ගාථාවෙහි **අවිරුද්ධො** යනු ඒ ආකාර දුසිරිත් තුනම දුරුකරන ලද බැවින්, යහපත් හැසිරීම - සුචරිතය හා ගැටීමක් නැතිව, **විදිත්වා ධම්මං** පිළිවෙත් මගින් සිවුසස් දහම දැන, **නිබ්බාණ පදාභිපත්ථයානො** අනුපාදිසෙස නිවන පතමින්, ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිමය.

සත්වන ගාථාවෙහි **අක්කුට්ඨො** යනු කරුණු දහයකින් නින්දා අපහාස ලද, **න සන්ධියෙථ** තරහ ඇතිකර නො ගනුව, කෝප වන්නේ

නැත. ලද්ධා පරභොජනං න මජ්ජති සැදැහැයෙන් අනුන් විසින් දෙන ලද දේවල් ලබාගෙන, 'මම බොහෝ දෙනා දන්නා හඳුනන කෙනෙක් වෙමි. පැතිරී යන කිතුරාවය මට ඇත. සිවුපසය ලබමි'යි මෙසේ මානයෙන් මත් නොවන්නේය. ඉතිරි කරුණු කියා ඇති පරිදිමය. අටවන ගාථාවෙහි ලොභං යනු ඒ ඒ දෙය කෙරෙහි ඇති ආසාවයි. භව කාම ආදී භව, දෙවන පදයෙන් මෙසේ භවයට හා සම්පත් පිළිබඳ ආසාව කියන ලදී. මුල්පදයෙන් සියළුම තණ්හා ද, පසුපදයෙන් (කියන කරන කටයුතු හෙවත්) කම්මානුකූලව ලබන භව පිළිබඳව කියන ලදී. විරතො ඡෙදනබන්ධනතො මෙසේ එම කම්කෙලෙස් නැතිකරන ලදුව, වෙනත් ජීවියෙකුට කැපීම්, බැඳීම් වැනි හිරිහැර කිරීමෙන් වෙන්වී, ඉතිරි කරුණු කියා ඇති පරිදිමය. නවවන ගාථාවෙහි සාරුප්පමත්තනො විදිත්වා තම මහණකමට නොගැලපෙන, නුසුදුසු සෙවීම් අත්හැර, යහපත් සෙවීම් වූ පිරිසිදු දිවිපැවැත්මද, වෙනත් යහපත් පිළිවෙත්ද පිහිටි බව දැන, ඒ දන්නා බව පමණක් මිස අන් කිසිවක් නොවේ, යථා තථියනති පවත්නා අයුරින්, ඇති සැටියෙන්, ධම්මං ඛන්ධ, ආයතන කොටස් පිළිබඳ ඇති සැටියෙන් සිවුසස් දහම මගින් හෝ, සෝවාන් ආදී මගපල නයින් දැන, ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය.

දසවන ගාථාවෙහි සො නිරාසො අනාසයානො නිවන් මගින් වනසන ලද බැවින්, අනුසයා න සනති අකුසල මූලා සමූහතා ඒ කෙලෙසුන් නැසූ තැනැත්තා ආසා රහිත, තණ්හා රහිත ය. ආසා රහිත බැවින් රූපාදි කිසිම දෙයක අදහසක්, බලාපොරොත්තුවක් නැත. නිරාසයො අනාසයානො යැයි එබැවින් කියන ලදී. ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය. එකළොස් වන ගාථාවේ ආසව ඛීණො (කාම දිට්ඨි) ආදී සිවු ආසාව නැතිකරන ලද, පහීණමානො නව ආකාර වූ මානය නැතිකරන ලද, රාගපථං රාගය හා බැඳුණු ඒ කාමභව ආදී තුන් භවයෙහි අදාලව, උපාතිවත්තො ඒ නැතිකිරීම දැනගැනීමෙන් ඉක්මවන ලදුව, දනෙතා කය ආදී කොටගත් දොරටු මගින් ඇසුරු කරනු ලබන දේවල්වල එල්බ නොගෙන, එසේ දමනය කොට, සන්සුන් තැනට (නිවන) පැමිණ, පරිනිබ්බුතො කෙලෙස් ගිනි නිවීමෙන් සිහිල් වූයේ, ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය.

දොළොස්වන ගාථාවෙහි සද්ධො බුද්ධ ආදී ගුණ සමූහය ගැන අනුන් කියන දේ හේතුකොට ගෙන නොව, සියළු ආකාරයෙන්ම මනාව

පැහැදෙන සුළු වූ, අනුන් සැදැහැවත් වූ පිළිවෙත අනුව නොගොස්, තමන්ම කරුණු වටහාගෙන පැහැදී, 'හිමියනි, මම මෙහිදී භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සැදැහැයෙන් පමණක් (පිළිගැනීමට) නොයමි. 'නඛ්වාහං එත්ථ භනෙත භගවතො සද්ධාය ගච්ඡාමි' යනුවෙන් දක්වා ඇති පරිදිය. **සුතවා** ඉතා මැනවින් අසා, ඒ අනුව කටයුතු කරමින්, එසේ අසා උසස් බවක්, හරවත් බවක් (ජීවිතයට) ලබාගන්නා ලදුව, **නියාමදස්සී** සසර නැමති කාන්තාරයෙහි මුළා වූ ලෝවාසීනට නිවන් පුරයට මගපෙන්වන නියමුවකු බඳු, මුලින්ම ඒ මග දක්නා ලද තැනැත්තා යන අදහසින් කියා ඇත. **වග්ගගතෙසු න වග්ගසාරී** දැඩිසේ ගන්නා ලද දෙසැටක් මිසදිටු අදහස් අනුව, එක් අයෙකු අනිකා හා පිළිමල් වෙද්දී, වග්ගගතා යනු ඒ අදහසයි. මෙසේ බෙදී ගිය සමූහයා අතරට, 'මේ අදහස මුළුමනින්ම නැතිකර දමන්නේය. මේ අදහස මෙසේම තිබිය යුතුය' යන මෙබඳු මත පළ කරමින් නොයන්නේය. **පටිඝං** තරහින් ගැටුම් සහිත වූ, එකිනෙකාගේ අදහස් අනුව ගැටුම් අවුලමින්, එය තරහ හැඟීමෙන් යුතු බව පෙන්වීමට යෙදූවකි. **විනෙය්‍ය** ඉවත්කොට ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය.

දහතුන්වන ගාථාවෙහි **සංසුද්ධජිනො** ඉතා පිරිසිදු අරහත් මගෙන් කෙලෙස් පරදවන ලද යන අදහසයි. **විවත්තච්ඡද්දො** රාග, දෝස, මෝහ නැමති සෙවිලි විවර කළ, **ධම්මෙසු වසී** සිවුසස් දහමෙහි වසඟයට පත්, ඒ දහම ඇති තතු පරිද්දෙන් දන්නා ලද බැවින්, අන් කිසි කෙනෙකුට වෙනස් කිරීමට නොහැකිය. එබඳු කෙලෙසුන් සිඳින ලද උතුමෝ, දහමෙහි වසඟ වූහයි කියනු ලැබේ. **පාරගූ** නිවනට පාරං යැයි කියනු ලැබේ. එතැනට ගියා වූ, සොපාදිසෙස ලෙසින් අවබෝධ කරගන්නා ලද, **අනෙජො** තණ්හාවෙන් සිත එහා මෙහා සෙලවෙන ගති ඉවත හළ, **සංඛාර නිරොධ ඤාණ කුසලො** සංඛාර නැති කිරීම යනුද නිවණයි. එහි නුවණ සෝවාන් ආදී පල මගින් ලබන නුවණයි. එම කුසලතාව සිවුවරක්ම වඩන ලද බැවින්, පුරුදු කරන ලද බැවින් ඡෙක යැයි කියනු ලැබේ. දහහතර වැනි ගාථාවෙහි **අතීතෙසු** පෙර පැවති බවද නොසළකමින් රූපාදී පස්ආකාර සමූහයෙහි (සිරුරෙහි) බැඳීම් ඉවත් කළ කල්හී, **අනාගතෙසු** මතුවට එය නොපවත්නා කල්හී, **කප්පාතීතො** 'මමය, මගේ ය යන කල්පනා ආදී සියළුම තණ්හා දැකීම් - හැඟීම් ඉක්මවූයේ, **අතිච්ච සුද්ධිපඤ්ඤො** පිරිසිදු නුවණ ඉක්මවා හෝ, පිරිසිදු නුවණ ඇතිව, කුමක්

ඉක්මවාද? තමා පිළිබඳ ඒකාන්ත වූ සොබාවයි. අවිජ්ජා සංඛාර ආදියෙන් අතීතයේ ද ඒකාන්තයෙන් ඉවත් වූයේ, ඉපදීම, ජරාව හා මරණයෙන් අනාගතයෙන්ද ඉවත් වේ. විඤ්ඤාණ ආදිය (නැතිව) භවය කෙළවර වීමෙන් වත්මනින් ද ඉවත් වේ. ඒ සියල්ලම ඉක්මවා, සැක දුරුකොට, උසස්ම පිරිසිදු බවට පැමිණ මහත් වූ නුවණින් යුතුව සිටියේ, එහෙයින් ඉතා පිරිසිදු නුවණ ඇතැයි කියනු ලැබේ. **සබබායතනෙහි** ආයතන දොළහෙන්, මෙසේ කල්පනා ඉවත් වූයේ, කල්පනා ඉවතහළ බැවින් මහත් වූ පිරිසිදු නුවණැති බවින්ද, නැවත කිසිදු ආයතනයකට නොපැමිණේ. එහෙයින් **සබබායතනෙහි විපපමුතෙතා** යැයි කියන ලදී.

පහළොස්වන ගාථාවෙහි **අඤ්ඤාය පදං** 'වචන සතර ඇත්තයි' 'සච්චාන චතුරො පදා' කියා ඇති පරිදි ඒ එක් එක් පදයෙහි පළමු කොටසෙහි නියම ඇත්ත තතු නුවණින් දැන, **සමෙචච ධමමං** එයින් පසු උතුම් මග සතරින් සිවුසස් දහම දැන, **විවටං දිසවාන පහාණමාසවානං** ඉක්බිති විමසුම් සහිත වූ නුවණින් කෙලෙසුන් හඳුන්වන නිවන හෙළිකොට, නිරවුල්ව පළකොට ඇතැයි දැක, **සබබූපධීනං පරිකඛයා** රූප වේදනා ආදී සමූහ කොටස් පහකට හෙවත් සිරුර කෙරෙහි කැමතිව බැඳෙන සියළුම කෙලෙස් එක්රැස් කිරීම් අවසන් කරන ලද බැවින්, ලොවෙහි මැනවින් කටයුතු කරන්නේය. වාසය කරන්නේය. නොඇලී ලෝකයෙහි පවතින්නේ යැයි දේසනය නිමකළහ.

ඉක්බිති, ඉඳුබලෙන් දැක්වූ බුදුහු දහම් දෙසුමට පසසමින් **අදධා හි** භගවා යන මේ ගාථාව කීහ. **සො එවං විහාරී** යම් තැනැත්තෙක් මංගල යැයි සම්මතයන් ඉවත දමා, සියළු මංගල යැයි කියන ලද වැරදි දැකීම් නැතිකොට වාසය කරත්ද, ඒ මහණ දෙව් මිනිස් කාමයන්හි රාගය ආදිය ඉක්මවා දහම දැන වසත්ද, මෙසේ ඒ ඒ ගාථාවෙන් පෙන්වාදෙන ලද මහණ ගැන කීහ. ඉතිරි කරුණු කලින් කියන ලද පරිදිය. මෙම ගාථාවෙන් අදහස් කරන්නේ මෙයයි. **අදධා හි භගවා තථෙව එතං** 'මංගල සම්මත වැරදි හැඟීම් ඉවතලා ආදී ලෙස ඔබවහන්සේ කරුණු පැහැදිලිකොට, ඒ ඒ ගාථාව අවසානයෙහි මැනවින් ඔහු ලොව පවතින්නේ'යැයි වදාළහ. ඊට කරුණු කුමක්ද? **යො සො එවං විහාරි භිකඛූ** ඒ මහණ උතුම් වූ දමනයෙන් යුතුවූයේ **දනෙතා** වේ. එහෙයින් **සමමා සො ලොකෙ පරිබබජෙයා** මෙයින් එහාට මට සැකයක් නැතැයි දේසනයට ගරුකරන ලෙසින් කී ගාථාවද අනුව අරහත් බව කුළුගන්වමින් නිමකළේය. **සුත්‍ර**

දේසනය අවසන කෙළ සියදහසක් දෙවියෝ උසස්-රහත් පල ලදහ. සෝවාන්, සකදාගාමී, අනාගාමී පලයට පත්වූවන් ගණනය කළ නොහැකි තරම් විය.

**සම්මා පරිබ්බාජනීය සූත්‍ර විස්තරය නිමි.**

# 2.14

**එවං මෙ සුතං** යනු ධම්මික සූත්‍රයයි. එම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? ලෝ සතුනට පිහිට වන භාග්‍යවතුන් වහන්සේ වැඩවසන සමයෙහි ධම්මික නම් උපාසකතුමෙක් විය. තිසරණයෙහි පිහිටි, සිල්වත් වූ, බොහෝ ඇසූ යහපත් දේ ජීවිතයට හුරු පුරුදු කොටගත් ඔහු තමටද පිළිවෙතටද ගැලපෙන අයුරු කටයුතු කළ, තුන්පිටකය මැනවින් දත්, අභිඥා ලැබූ අහසින් ද යා හැකි අනාගාමී බවට පත් වූවෙකි. ඔහුගේ පිරිවර වූ පන්සියක් උපාසකවරු ද ධම්මික උපාසකතුමන් මෙන්ම වූහ. එක් දවසක් මැදියම් කාලය අවසානයේ, පෙහෙවස් රකිමින් තනිව - විවේකීව සිටිනවිට, මම ගිහි ජීවිතය හා පැවිදි ජීවිතයට අදාල පිළිවෙත් විමසන්නෙම් නම් මැනවැ'යි මෙබඳු අදහසක් ඇතිවිය. ඔහු උපාසකවරුන් පන්සියයද පිරිවරා භාග්‍යවතුන් වහන්සේ වෙතට එළඹ එම කරුණ විචාළේය. බුදුරජාණන් වහන්සේ ඔහුට එය පැහැදිළි කළහ.

කලින් විස්තර වූ කරුණු (වචන) ඒ ආකාරයෙන් දතයුතුය. සඳහන් නොවූ කරුණු ඇතොත් පහදමි. එහි පළමු ගාථාවෙහි **කථං කරොති** කෙසේ කටයුතු කරන්නේ, කෙසේ පිළිපදින්නේ, **සාධු හොති** යහපත්, නිවැරදි, යහපත සිදුවන, **උපාසකා සෙ** උපාසකා යනුවෙන් මෙහි (ඉදිරියට) දක්වන කරුණුවලින් හෙළිවේ. ඉතිරි කරුණු පැහැදිළිය. මේ ගාථාවෙන් අදහස් වන්නේ මෙයයි. **යොවා අගාරා අනාගාරමෙ** පැවිදි වෙයි. **යෙ වා අගාරිනො උපාසකා** මේ දෙයාකාර සාවකයන් අතුරෙන් කෙසේ කටයුතු කරන සාවකයා යහපත් වේද? දැන් මෙසේ විමසන අතරම, භාග්‍යවතුන් වහන්සේගේ කරුණු පැහැදිලි කිරීමේ හැකියාව අගයමින් **තුවං හි** ආදී

ගාථා දෙකක්ද කීය. **ගතිං** තම පුරුදු, **පරායණං** හටගැනීම නැතහොත් **ගතිං** නිරය ආදී පස්ආකාර වූ (උපදනා තැන්) **පාරායණං** ලද උපතින් පසු වෙනත් උපතක් සොයන, උපදනා තැන්වලින් මිදුණු, පිරිනිවනය. **න චත්ථි තුලෙ‍්‍යා** ඔබවහන්සේ හා සමාන නැත. **සබ්බං තුවං ඤාණමවෙච්ච ධම්මං පකාසෙසි සත්තෙ අනුකම්පමානො** භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ සියළුම දැනගත යුතු දේ ඉතිරි නැතිවම නුවණින් මැනවින් අවබෝධකොට සත්වග කෙරෙහි අනුකම්පාවෙන් ඒ සියළු දහම පැවසූ සේක. යම් තැනැත්තකුට හිතසුව පිණිස වේනම්, එය පැවසූ සේක. එහි 'ගුරු රහස්' ලෙස සුරැකිව තබාගත් දෙයක් නැතිබව කියන ලදී. **විරොචසි විමලො** දූම්, රජසින් තොර වූ සඳ මෙන් රාග, දෝස වැනි අපිරිසිදු බවෙන් තොරව, මැනවින් බබළයි. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිය.

මීළඟට (ධම්මික උපාසක තුමා) භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් දෙසන ලද දෙව්පුතුන් ගැන සඳහන් කරමින්, උන්වහන්සේ පසසමින්, **ආගඤ්ඡි තෙ සන්තිකෙ** ආදී ගාථා දෙකක් කීය. **නාගරාජා එරාවණො නාම** මේ එරාවණං නම් දෙව්පුතු කාමලොවට අයත් දෙව් විමනක වසයි. සක්දෙව් උයන් කෙළියට යනවිට එරාවණ, යොදුන් එකසිය පණහක් උස, කුම්භතල තිස්තුනක් ඇති, ඒ නමින්ම වූ ඇතකුගේ සිරුරක් මවා ගනී. ඒ එක් එක් කුම්භතලයෙහි දත් දෙක බැගින් ඇත. එක් එක් දතක පොකුණු සතක් සතක් වේ. ඒ එක් එක් පොකුණෙහි පියුම් විල් සතක් සතක් බැගින් ඇත. ඒ ඒ පියුම් විල්හි නෙළුම් මල් සතක් සතක් වේ. එක් එක් මලෙහි නෙළුම් කොළ ද සතක් සතක් වේ. එක් එක් නෙළුම් කොළය මත අප්සරාවෝ සත්දෙනා සත්දෙනා නටති. සක්දෙවිගේ නළඟනෝ පියුම් අප්සරාවන් සේ හඳුන්වති. 'නැටුමෙහි හසළ අවිවාහක තරුණියෝ නෙළුම් මල්වල කැරකෙමින් නටති' ' 'හමන්ති කඤ්ඤා පදුමෙසු සික්ඛිතා' යැයි විමානවත්ථුවෙහිද සඳහන් වේ. ඒ කුම්භතල තිස්තුන මැද 'සුදස්සන' නම් තිස්යොදුන් කුම්භතලයක් වේ. එහි යොදුනක් පමණ වූ මිණිපළඟක තුන්යොදුනක් උසට වේදිකාවක් සේ මල් අතුරනු ලැබේ. එහි සක්දෙවිඳු අප්සරාවන් පිරිවරා දිවසුව විඳියි. සක්දෙවිඳු උයන්කෙළියෙන් ආපසු පැමිණිවිට ඇතා ඒ රූපය අත්හැර දෙව්පුතෙක්ම වෙයි. එබැවින් **ආගඤ්ඡි තෙ සන්තිකෙ නාගරාජා එරාවණො නාම** යැයි කීය. **ජිනොති සුත්වා** ඒ භාග්‍යවතුන් වහන්සේ අයහපත පැරදවූ බව අසා යන අදහසයි. **සොපි තයා මන්තයිත්වා** ඔබවහන්සේ සමග කතාබහ කොට, පැන අසා යන අදහසයි. **අජ්ඣගමා** උසස් අවබෝධයට

පැමිණියේය. ගියේ යැයි කියන ලදී. සාධූති සුත්වාන පතීතරූපො ඒ පැන අසා, යහපත හිමියනි, යැයි සතුටුව ගියේ යැයි තේරුමයි.

රාජාපි තං වෙසසවණෙ කුමාරො මේ යකු සිත් අලවන අරුතින් රජ ය, විසාණ නම් රාජධානියෙහි රජකරන බැවින් වෙසසවණ නම් වෙයි. මුල් නම කුවේර යැයි දතයුතුය. ඔහු කුවේර නම් බමුණු මහසල් කුලවතකු වී, දන් පිරිනැමීම් ආදී පින්කම්කොට, විසාණ නම් රාජධානියෙහි අධිපතිව උපන්නේය. එහෙයින් කුවේර යැයි කියනු ලැබේ. 'සිරිමතාණෙනි, කුවේර නම් මහරජුගේ රාජධානිය 'විසාණ' යනුවෙන් ද හඳුන්වනු ලබන බැවින්, කුවේර රජුට වෙසසවණ යයිද කියන බව ආටානාටිය සූත්‍රයෙහි කියන ලදී. 'කුවෙරසස ඛො පන මාරිස, මහාරාජසස විසාණ නාම රාජධානි, තසමා කුවෙරො මහාරාජා වෙසසවණොති පවුචචති' ඉතිරි කරුණු පැහැදිලිය.

ඉතා දුර වූ තව්තිසාවෙහි වසන එරාවණ පළමුව පැමිණියේත්, වෙසසවණ පසුව ආවේත් කවර හෙයින්දැයි කෙනෙකුට ඇසිය හැකිය. එමෙන්ම නගරයෙහි වසන මේ උපාසකතුමා පසුව ආවේ ඇයි? ඔහු කෙසේ ඔවුන්ගේ පැමිණීම දැක මෙසේ කීවේද? ඊට කරුණු මෙසේය. එකල්හි වෙසසවණ නොයෙක් දහස් ගණන් පබළු ආසන සහිත, කාන්තාවන් යෙදූ දොළොස් රියන් රියකට නැග, පබළු අංකුසයක් ඔසවාගෙන කෝටි දසදහසක් යකුන් පිරිවරා, භාග්‍යවතුන් වහන්සේගෙන් පැණ විචාරන්නෙමි'යි අහස් විමන් පිරිවරකොට මගින් මග ගෙවා, වෙළුකණ්ටක නගරයෙහි නන්‍දමාතා උවැසියගේ නිවස ඉහළින් පැමිණෙයි. නන්දමාතා උවැසිය මෙබඳු බලයක් ඇත්තියකි. ඇය පිරිසිදු සීලයෙහි පිහිටි, නිති නොකල් බොජුනින් වැළකුණු, තුන්පිටකය මැනවින් දත්, අනාගාමි පලයට පත්වූ තැනැත්තියකි. ඇය එවේලෙහි සීමැදුරු කවුළුව විවරකොට, සිහිල් සුළඟින් ගත නිවාගැනීමට, සුළං හමන පෙදෙසට මුහුණලා අටඨක පාරායණ වග්ගයෙහි ගාථා - අකුරු පද පැහැදිලිව මියුරු හඬින් කියන්නීය. වෙස්සවණ එතැනම රිය නවතා, 'උපාසිකාව මේ කියන්නේ භාග්‍යවතුන් වහන්සේ මගධයෙහි පාසාණක චෙතියෙහිදී අතවැසි බමුණන් දහසය දෙනෙකුට කියන ලද ගාථා යැයි නිගමනය කළේය. ඒ සියළු ගාථා (කොටසම) අසා, රන් මිහිගු බෙර කඳක් වන් මහත් සිරුර (ගෙල) ඉහළට ඔසවා, 'සොයුරිය, ඉතා මැනව, ඉතා අගෙයි' කියා සාධු නාද පැවැත්විය. 'ඇය ඔතැන සිටින්නේ කවුරුන්දැ'යි ඇසුවාය.

'සොයුරිය, මම වෙස්සවණ නම් වෙමි'යි කීය. උපාසිකාව පළමුව සෝවාන් පලයට පත්ව සිටියාය. වෙස්සවණ සෝවාන් පලයට පත්වූයේ ඊට පසුවය. මෙසේ ඔහු දහමෙන් ඇතිවූ සුහදතාව සළකා ඔහු ඇයට සොහොයුරිය සේ අමතයි. උපාසිකාවද 'යහපත් මුව ඇති සොයුරාණනි, ඔබේ අදහසට අනුව මේ සුදුසු කාලය නොවේ' යැයි කී කල්හි 'සොයුරිය, මම ඔබට පැහැදුනෙමි. පැහැදිනු බැවින් ඊට සුදුසු දෙයක් කරමි'යි කීය. 'එසේනම්, යහපත් මුව ඇත්තාණනි, මගේ කෙතෙහි හටගත් හැල් වී කම්කරුවන්ට ගෙන ඒමට නොහැකිය. ඒවා ඔබේ පිරිසට ගෙන ඒමට අණ කරන්නැ'යි කීවාය. ඔහු 'හොඳයි, සොයුරිය' යැයි කියා, යකුන්ට අණ කළේය. ඔව්හු එක්දහස් අටසියයක් වූ වී කොටු පිරවූහ. එතැන් පටන් අටුවෙහි අඩුවීමක් නොවීය. 'නන්ද මාතාවගේ වී අටුව මෙන්' යැයි ලෝකයා උපමාවක්ද කීය. වෙස්සවණද අටුකොටු පුරවා භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේය. උන්වහන්සේ, විකාලයෙහි පැමිණියෙහිදැ'යි ඇසූහ. 'එසේය, භාග්‍යවතුන් වහන්ස, යැයි සියල්ල සැළ කළේය. මේ නිසා චතුමමහාරාජිකයෙහි වසන වෙස්සවණ (එරාවණට වඩා ආසන්න දුරක සිටියත්) පමාවී පැමිණියේය. කළයුතු කිසියම් අතුරු කටයුත්තක් නොවූයෙන් එරාවණ පළමුව පැමිණියේය.

අනාගාමි පලයට පත්වුවද ධම්මික උපාසකතුමා මුලසිටම ආහාර ගන්නේ එක් වේලකි. එදින පෙහෙවස් දිනක් සේ සළකා පෙහෙවස් කරුණු අදිටන් කොට, සවස් කාලයෙහි මනාව හැඳ පොරවා උපාසකවරුන් පන්සියයක් පිරිවරා ජේතවනාරාමයට ගොස්, දහම් අසා තම නිවසට පැමිණ, ඒ උපාසකවරුන්ට සරණ සීලය හා පෙහෙවස් රැකීම ආදියෙහි ආනිසංස ඇතුලත් උපාසකවරුනට සුදුසු දහම් කරුණු කියා, ඒ උපාසකවරුන් උත්සාහවත් කළේය. ධම්මික උපාසකතුමන්ගේ නිවසෙහි ඒ උපාසකවරුන්ට ද මිටි රියනක් පමණ වූ කැප වූ ඇඳන් පන්සියයක් වෙන වෙනම කාමරවල පනවන ලදී. උපාසකවරු තම තමන්ගේ කාමරවලට පිවිස සමවත්හි පිහිටා හුන්හ. ධම්මික උපාසකතුමාද එසේ කළේය.

එකල සැවැත්නුවර පවුල් පනස්හතක් ලක්‍ෂයක් වසති. ජනගහණය කෝටි දහඅටකි. මුල් යාමයෙහි ඇතුන්ගේ, අසුන්ගේ, මිනිසුන්ගේ හඬත්, බෙරහඬ ආදියෙන් ද සැවැත්නුවර මහ මුහුද මෙන් එකනින්නාද වෙයි. මැදියමෙහි ඒ හඬ සන්සිඳෙයි. ඒ කාලයෙහි උපාසකතුමා සමවතින්

නැගී සිට, තම ගුණ මෙනෙහිකොට, 'මම මගපල සුවයෙන් වසමි. මේ සුවය කවරෙකු නිසා ලැබුණිදැයි සිතා, භාග්‍යවතුන් වහන්සේ නිසායැයි උන්වහන්සේ කෙරෙහි සිත පහදවා, උන්වහන්සේ කෙබඳු විහරණයකින් වෙසෙත්දැ'යි දිවැසින් බලනවිට එරාවණ, වෙස්සවණ දැක, දිව කණින් දහම් දෙසුම අසා, සිත් හසර දැනගන්නා නුවණින් ඔවුන්ගේ පහන් සිත් දැන, 'මම ද භගවත් හිමිගෙන්, ගිහි පැවිදි දෙපසටම හිතසුව එළවන පිළිවෙත විමසන්නේ නම් මැනවැ'යි අදහස් කළේය. එහෙයින් ධම්මික උපාසකතුමා, එකම නගරයෙහි වාසය කළද, සියල්ලන්ටම පසුව පැමිණියේය. මෙසේ ඔවුන්ගේ පැමිණීමද දැනගත්තේය. **ආගඤ්ජි තෙ සන්තිකෙ නාගරාජා -පෙ- සොචාපි සුත්වාන පතීතරූපො** යැයි එහෙයින් කීවේය.

මීළඟට එයින් බාහිරව, ලොව පිළිගන්නා ලද මහණ බමුණන් විසින් ඉතා උසස් ලෙසින් භාග්‍යවතුන් වහන්සේට පැසසුම් කිරීම පිළිබඳව **යෙ කෙචි මෙ** ආදී ගාථා දෙක කීය. **තිත්ථියා** නන්ද, වච්ඡ, සංකිච්ච ආදී මිසදිටු සමයවාදීන් තිදෙනෙකු අනුව යන ඔවුන්ගේ හැඟීම් නැමති තොටට බැසගත්, ඔවුන්ගේ සස්නෙහි පැවිදි වූ පූරාණ ආදී ආගමික නායකයන් හයදෙනාය. ඒ අතර එම ගාථාවෙහි නිගණ්ඨා නම් නාථපුත්තය. ඉතිරි වූවන් ආජීවකය. ඒ සියල්ලන්ම ඇතුලත් වන සේ **යෙ කෙචි මෙ තිත්ථියා වාදසීලා** යැයි කීය. 'අපි මැනවින් පිළිවෙත් සපුරන්නෝ වෙමු. අනික් හැම පැවිද්දන්ම වැරදි පිළිවෙත් සපුරති'යි මෙසේ වාද කරනු කැමතිව, මුව (කටවචන) නැමති සැතින් විදිමින් සැරිසරති. **ආජීවිකා වා** ඔව්හූ එක්තැනකට රැස්ව, ඒ දක්වා ඇති (අනෙක් තවුස් පැවිදි වූවන්ගේ) මතවාද බිඳ කරුණු දක්වති. **නාති තරන්ති** ඉක්මවා නොයති. **සබ්බෙ** වෙනත් යම්කිසි තිත්ථිය සාවකාදීන් ගැන ද සඳහන් කරයි. **ඨිතො වජන්තං වියා** මේ සියල්ලන්ටම සිටිතැන් වෙනස් කරමින්, (අදහස වෙනස් කරමින්) **සීඝගාමිනං** යන තැනැත්තකු ඉක්මවා නො යන්නේ ය. මෙසේ ඔවුන් තියුණු නුවණ නොමැති බැවින්, ඒ ඒ අරුත් කොටස් අවබෝධ කරගැනීමට නොහැකිව, ඉතා තියුණු, විනිවිද දකින නුවණින් යුතු භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා නොයති යන අදහසයි. **බ්‍රාහමණ වාදසීලා වුද්ධා වා** මෙපමණකින් චංකී, තාරුක්ඛ, පොක්ඛරසාතී, ජානුසෙසාණි, ආදීන් ගැන දක්වයි. **අපි බ්‍රාහමණ සන්ති කෙචි** මෙයින් මැදිවියේ වූද, තරුණ වූද ඇතැම් බමුණන් වෙති'යි අදහස් කෙරේ. **කෙචි මෙසේ** අස්සලායන-වාසිට්ඨ-අම්බට්ඨ-උත්තර මාණවක අදහස් කෙරේ.

අත්‍ථබද්ධං මේ පැන විසඳ විසඳ දෙන්නේ නොවේද? මෙය කෙසේ අදාල වේදැ'යි මෙසේ තේරුම හා සබැඳේ. **යෙ චාපි වක්ඛෙ** අප වැනි වෙනත් (සමයවාදීන්) වාදිනො මෙසේ **මඤ්ඤමානා** (සිතමින්) කැත්කුල පඬිවරු, බමුණු, දෙවි, බඹ, යකුන් ආදී අපමණ වූ මේ සියල්ලෝම ඔබවහන්සේගේ කරුණු පැහැදිලි කිරීම හා එකඟ වෙති. (තේරුමෙන් බැඳෙති.)

මෙසේ නොයෙක් ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ පසසා මීළඟට දහමද අගය කොට දහම් කතාවක් දෙසන ලෙස ඉල්ලා **අයං හි ධම්මො** යන ගාථා දෙක කීය. ඒ ගාථාවෙහි **අයං හි ධම්මො** දහම් අවබෝධය සඳහා උපකාරී වන කරුණු තිස්හතයි. **නිපුණො** සියුම්, පහසුවෙන් දැන අවබෝධ කළ නොහැකි, **සුඛො** අවබෝධය හා සමාන (අවබෝධයෙන් ලබන) ලොවුතුරු සුවය දනවයි. එහෙයින් සුව එළවන, ගෙනදෙන බැවත්, සුඛාවහනතා - හෙවත් සැප ගෙන දේ යැයි කියනු ලැබේ. **සුපපවුතෙතා** මනාව දෙසන ලද, **සුසසුසමානා** අසනු කැමැත්තෙමු යන තේරුමයි. **තං නො වදා** ඒ දහම අපට වදාළ මැනව. **තවං නො** යැයිද පාඨයකි. 'ඔබවහන්සේ අපට කිව මැනව' **සබ්බෙපිමෙ භික්ඛවො** එවේලෙහි වැඩසිටි පන්සියයක් වූ සඟ පිරිස පෙන්වා කරුණු පහදා දෙන ලෙස ඉල්ලයි. **උපාසකා** වාපි තම පිරිවර හා (එහි සිටි) අන් හැමදෙනාද පෙන්වයි. එහි ඉතිරි කරුණු පැහැදිලිය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනගාරිය පිළිවෙත දේසනා කිරීමට සඟ පිරිස අමතා **සුණාථ මෙ භික්ඛවො** යනුවෙන් වදාළහ. එහි **ධම්මං ධුතං තඤ්ච ධරාථ සබ්බෙ** කෙලෙස් වනසා දමන ලද බැවින් ධූත නම් වේ. කෙලෙස් වනසා දැමිය හැකි මෙබඳු වූ පිළිවෙත් දහම **සාවයාමි වො**, මම අසන්නට සලස්වමි. සියල්ලන්ම එය සිත්හි දරා පිළිපදිවු, පමා නොවවු යැයි කියන ලදී. **ඉරියාපථං** ගමන් කිරීම ආදී සිවු ආකාර පැවැත්මයි. **පබ්බජිතානුලොමිකං** මහණකමට ගැලපෙන, සිහිනුවණින් යුතු, කමටහන් ලැබ, බවුන් වඩමින්, පැවැතිය යුතු සැටිද සමහරු අදහස් කරති. **සෙවෙථ නං** ඒ ඉරියව් අනුව පවත්නේය. **අත්‍ථදසො** හිතසුව දකින, මුතිමා නුවණැති, ගාථාවෙහි ඉතිරි කරුණු පැහැදිලිය. **න වෙ විකාලෙ** මෙසේ පැවිදි දිවියට සුදුසු වූ, ඉරියවු පවත්වන මහණ මැදියම දවල් ඉක්මවා නොකල්හි නොහැසිරෙන්නේය. **කාලෙ** සුදුසු කල්හිම. **ගාමං පිණ්ඩාය චරෙය්‍ය** ඊට හේතු කවරේද? **අකාලචාරිං හි සජ්නති**

සංගා නුසුදුසු කාලයෙහි හැසිරෙන තැනැත්තා, රාගික ආදී නොයෙක් ඇලීම් වැළඳ ගනී. ගොදුරු වෙයි. ඒවාට දැඩිව ඇලෙති. **තසමා විකාලෙ න චරනති බුද්ධා** එහෙයින් සිවුසස් අවබෝධ කළ බුදුවරු, මගපල ලද්දෝ අවේලාවෙහි පිඬු පිණිස නො හැසිරෙති. මේ කාලයෙහි නොකල්හි ආහාර ගැනීමේ අදාල සිකපදය පනවා නොතිබුණි. එහෙයින් දහම් දේසනයෙහිදීම පොදු ජනයාට එයින් ඇතිවිය හැකි ආදීනව දක්වමින් මෙම ගාථාව වදාළහ. රහතන් වහන්සේලා සහ මගපල ලද්දෝ එයින් වැළකුණහ. එය පවත්නා සොබාවයයි.

මෙසේ අවේලාවෙහි හැසිරීම වළකා, සුදුසු කාලයෙහි හැසිරීමේදී ද මේ ආකාර විය යුතු යැයි සඳහන් කරමින් රූපාව සදදාව යන ගාථාව කීහ. එහි තේරුම නම්, එහිදී රූපාදී නොයෙකුත් දේ (දැකීමෙන් හෝ) පමාව හෝ එහි තද ඇලීමක් හෙවත් එයින් මත්වීමක් ඇති කරමින් **සතෙත සමමදයනති** පිණ්ඩපාත පාරිසුද්ධි සූත්‍ර ආදියෙහි කියන ලද පරිදි ඒවායෙහි **ඡන්දං විනෙය්‍යා** සුදුසු ලෙස කාලෙනෙව පාතරාසං පවිසෙය්‍ය මෙහි උදෑසන ආහාරය යන අදහසින් පාතරාස වේ. එය පිණ්ඩපාතයට නමකි. ඒ මහණ ලබන දෙය සඳහන් කරමින් මෙහි පාතරාස යැයි කියන ලදී. පිඬු පිණිස ලැබෙන යම් දෙයක් සඳහා යන්නේය යනු මෙහි තේරුමයි දතයුතුය. මෙසේ පිවිසි මහණ 'පිඬු අහරෙහි සිත යොමන ලද්දේ' 'පිණ්ඩං භිකඛූ.... -පෙ- සංගහිතතතභාවො' වේ.

**පිණ්ඩං** යනු බත් ව්‍යඤ්ජන ආදිය කවලම් වූ ආහාරයයි. එම ආහාරය ඒ ඒ තැන්වලින් රැස්කරගෙන එකට මුසුව ගුලි කරන අරුතින් පිණ්ඩා යැයි කියනු ලැබේ. සමයෙන මැදියම දාවල අතර කාලයෙහි, **එකො පටිකකමම** කයෙහි විවේකය ඇතිකර ගනිමින් තනිවම නැවතී, **අජඣතතචිනතී** රූප, වේදනා ආදී සමූහයෙන් යුතු සිරුර ගැන, තිලකුණු මෙනෙහි කරමින්, **න මනො බහිද්ධා නිචඡාරයෙ** පිටත රූපාදිය කෙරෙහි රාගාදීව සිත යොමු නොකරන්නේය. **සංගහිතතත භාවො** මනාව සිත පිහිටුවා ගැනීමයි. මෙසේ වාසය කරන මහණ 'සචෙහි සො -පෙ- පරූපවාදං' (ගාථාවෙන් තවදුරටත් විස්තර වේ.)

**කුමක් නිසා එසේ කියන ලද ද?** සො බවුන් වඩන යෝගාවචර වූ තැනැත්තා කිසියම් දෙයක් අසනු කැමතිව පැමිණෙන **සාවකෙන** කෙනෙකු වෙනත් **තීර්ථක** වැනි සමයවාදීන් හෝ ගිහියන් ආදීන් හෝ මේ සසුනෙහි

පැවිදි වූවකු භික්ඛුනා වා සමග කතාබහ කරයිද ඒ කතා මගපල ආදියට ඇතුලත් කරුණු සහිත වූ, නුසුදුසු කතා දහයෙන් මුළුමනින්ම වෙන්ව, උසස් දහම ගැනත්, එහි වැදගත් බවත් මිහිරි බවත් නිදසුන් කොට දක්වන්නේ ය. කේලාම් ආදී පරූපවාදං මදකුදු නොකියන්නේය.

දැන් මෙහි අනුන්ට දොස් කීමෙහි වරද දක්වමින් වාදං හි එකෙ යන ගාථාව කීහ. එහි අරුත නම්, මේ ලෝකයෙහි ඇතැම් හිස් මිනිසුන් අනුන්ට දොස් නගන අයුරින් නොයෙක් ලෙසින් කලහ වඩන ලෙසට කරන කතා, වාදං පටිසෙනියං සතුරු වෙති. යුද කරනු කැමතිව සේනාව සමග ඉදිරියට යන්නාක් මෙන් වෙති. තෙ 'අපි ලාමක පඤ්ඤා නපපසංසාම ඊට හේතුව කුමක්ද? තතො තතො නෙ පසජනති සංගා යම් ලෙසකින් එබඳු පුද්ගලයන් කෙරෙහි කියනු ලබන ඒ ඒ වචන නිසා කලහකාරීව හටගන්නා වාද මුසුව එක්වෙති. ඇලෙති. කිනම් හේතුවකින් ඊට එක්වෙත් ද? චිත්තං හි තෙ තත්‍ථ ගමෙනති දූරෙ ඔවුන් එකිනෙකාට සතුරු වෙමින් සිත ඊටම යොමු කරන තරමටම සමථ විදසුන් ඈත් වෙයි. මෙසේ නුවණ මද බවෙහි තතු දක්වා මීළඟට මහත් නුවණැත්තන්ගේ තතු පෙන්වමින් පිණ්ඩං විහාරං -පෙ- වර පඤ්ඤ සාවකො යන ගාථාව කීහ.

එහි වාසයට සුදුසු, හිඳින, නිදන තැන්, ඇඳ පුටු යන පද තුනම සේනාසන නමින්ම කියන ලදී. ආප ජලයයි. සංඝාටිරජූපවාහනං සඟල සිවුරෙහි දූවිලි කුණු ආදිය සෝදා හැරීම, සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං සියළු කෙලෙසුන් කෙරෙහි 'නුවණින් මෙනෙහි කොට, සීතලෙන් වැළකීම පිණිස සිවුරු පරිහරණය කරයි' - පටිසංඛා යොනිසො චීවරං පටිසෙවති සීතසස පටිඝාතාය' ආදී ලෙසින් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද දහම් අසා, සංඛාය සෙවෙ වරපඤ්ඤසාවකො මෙම ගාථාවෙහි පිණ්ඩං යනු පිණ්ඩපාතයයි. විහාර ආදී වාසය ලෙසින් සේනාසනද, ආප යනුවෙන් ගිලන්පසද, සංඝාටි යනුවෙන් සිවුරද සිවුපසය ලෙස හඳුන්වමින්, 'හුදෙක්ම මේ සිරුරේ පැවැත්ම පිණිස' - යාවදෙව ඉමසස කායසස ඨිතියා' - යැයි නුවණැති ඒ උතුම් සාවකයකු ඇසුරු කිරීමට හැකි වන්නේය. උතුම් නුවණැති තථාගතයන් වහන්සේගේ සව්වකු හෝ ඒ පිළිවෙත් මග පත්වූවකු හෝ එම මග අනුගමනය කරන්නකු හෝ වෙසෙසින්ම රහත්පල ලැබූවෙකි. සිවුපසය සැළකීමේදී නුවණින් යුතුව පරිහරණය කරයි. නුවණින් යුතුව ඉවසයි. නුවණින් යුතුව දුරුකරයි.

'සංඛායෙකං පටිසෙවති, සංඛායෙකං අධිවාසෙති, සංඛායෙකං පරිවජ්ජෙති, සංඛායෙකං විනොදෙති යැයි කියා ඇත. නුවණින් යුතු ඒ උතුම් සාවකයා එබඳුය. **තසමාහි පිණෙඩ** - පොකඛරෙ වාරි බිඳු ඒ සාවකයා එසේ වේයැයි දතයුතුය.

මෙසේ කෙලෙසුන් නැති කිරීමේ පිළිවෙත දක්වමින්, අරහත් බව කුළුගන්වා, අනගාරිය පිළිවෙත නිමවා දැන් ගිහි පිළිවෙත පහදා දීමට **ගහටඨවතතං පන වො** ආදී ගාථා වදාළහ. ඒ ගාථා පෙළෙහි **සාවකො** යැයි කියන ලද්දේ ගිහිව වසන තෙරුවන් සරණ ගිය තැනැත්තා ගැනය. අනෙක් කරුණු කලින් කියා ඇති පරිදිමය. අදහස් කෙරෙන්නේ මෙපරිද්දෙනි. **යො** මා මීට පෙර, **කෙවලො** හැම අයුරින්ම පිරිපුන්ව, හිකඛුධමෙමා (එසේ) කියන ලද, එස කෙත්වතු ආදී අයිතියෙන්, **සපරිගගහෙ න ලබහා එසෙසතුං** ලබාගැනීමට නොහැකිය. මෙසේ පැවිදි දහම ගැන කීම නවතා, ගිහි පිළිවෙත දක්වමින් **පාණං න හානෙ** යැයි කීහ. එහි මුල් ගාථා පද දෙකෙන් තුන් ආකාරයෙන් පිරිසිදුව පරපණ නැසීමෙන් වැළකීම කියන ලදී. පසුපදයෙන් ජීවීන් කෙරෙහි හිතවත් පිළිවෙතත්, තුන්වන පදයෙන් ඛගගවිසාණ සූත්‍රයට අදාලවත්, සිවුවන පදයෙන් මෙතත සූත්‍රයේ සඳහන් පරිදි තැති ගන්නා වූ සහ නොසැලෙන යන ලෙස දැක්වෙන කරුණු ද මුළුමනින්ම විස්තර කරන ලදී. ඉතිරි කරුණු ද කලින් පැහැදිලි කොට ඇත. (මෙහිදී) පිළිවෙල වෙනස්කොට අදහස දැක්විය යුතුය. තැති ගන්නා සුළුවූද, තැති නොගන්නා වූ, කම්පා නොවන සියළුම ජීවීන් කෙරෙහි දඬු ආදිය හෝ නොගෙන, නොනසන්නේය. විනාස නොකරන්නේය. නැසීමට අනුමත නොකරන්නේය. **නිධාය දණඩං** මෙයින් හෝ පසුව වතෙතයා යන ඉතිරිව ඇති පාඨය ගෙනහැර දැක්විය යුතුය. පෙර පසු කරුණු සම්බන්ධ වන්නේ එසේය.

මෙසේ පළමු සිකපදය දක්වා, දෙවන සිකපදය පෙන්වාදීමට **තතො අදිනනං** යන ගාථාව වදාළහ. **කිඤචි** ටිකක් හෝ බොහෝ හෝ, **කවචි** ගමෙහි හෝ කැලයෙහි හෝ, **සාවකො** ගිහි සාවකයා, **බුජකධමානො** මෙය අනුන්ට අයත්යැයි දැනගෙන, **සබබං අදිනනං පරිවජජයෙයා** මෙසේ පිළිපදිනවිට නුදුන් සියළුම දේ ගැනීමෙන් දුරුවන්නේ ය. වෙනස් නොවන බව පෙන්වා දෙයි. කියා ඇති පරිදි ඉතිරි කරුණු දැනගැනීම පහසුය. මෙසේ දෙවන සිකපදයෙන්ද තුන්ආකාර පිරිසිදු බව දක්වා ඉතා උසස්

අදහසක් වෙනුවෙන් තුන්වන සිකපදය දක්වමින් **අබ්‍රහමචරියං** යන ගාථාව වදාළහ. **අසමභුණනෙතා** නොහැකිව.

දැන් සිවුවන සිකපදය දක්වමින් සභගගතො වා යන ගාථාව වදාළහ. **සභගගතො** රැස්වෙන තැනකට ගියේ, **පරිසගගතො** සමූහයක් මැදට ගියේ, ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදි පැහැදිලිය.

මෙසේ සිවුවන සිකපදයෙන් ද තුන් ආකාර වූ පිරිසිදු බව දක්වා **මජජඤචපානං** ආදී ගාථාවෙන් පස්වන සිකපදය ගැන වදාළහ. එහි **මජජඤච පානං** යැයි ගාථාව ගෙතීමේ පහසුව සළකා කියන ලදී. මේ එහි තේරුමයි. මත් ගතිය ඇතිවන බීම **න සමාචරෙයය, ධමමං ඉමං** මත්බව ඇතිවන එබඳු දේ පාවිච්චියෙන් වැළකීමේ ගතියයි. **උමමාදනනතං** එය උමතුවෙන් අවසාන වේ. බොහෝසෙයින් මත්වන දෑ ගැනීමට යොමුවන තැනැත්තාට අත්විඳීමට වන්නේ මිනිසකුව සිටියද උමතු මිනිසකු බවට පත්වීමය. **ඉති නං විදිත්වා** ඒ තැනැත්තා මත්වන දෙයකැයි දැන, ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදි පැහැදිලිය. මෙසේ පස්වන සිකපදයෙන්ද තුන් ආකාර වූ පිරිසිදු බව දක්වා, දැන් මුලසිටම සිකපදයෙන් මත්වන දේ පානයෙහි කෙලෙස් සහගත බවද (හැමදෙනා අමනාපව) බිඳවන අයුරුද පෙන්වා එයින් වැළකීමට දැඩිලෙස පොළඹවමින්, **මදා හි පාපානි කරොනති** යන ගාථාව වදාළහ. මදා මත්වීමට හේතුවයි. 'හි' අකුර පදයෙහි අඩුව පිරවීමට යෙදූ නිපාතයකි. **පාපානි කරොනති** පරපණ නැසීම ආදී සියළු අයහපත් දේ කරති. **උමමාදනං මොහනං** පරලොව උමතුව ඉපදීමත්, මෙලොවදීම (සිහි) මුළාවීමත් වේ. ඉතිරි කරුණු කලින් කියන ලද පරිදි පැහැදිලිය.

මෙපමණකින් ගිහි සාවකයකුගේ නිති හික්මීමට අදාල සීලය දක්වා දැන් පෙහෙවස් කරුණු පහදමින් **පාණං න හානෙ** යන ගාථා දෙකක් වදාළහ. එහි **අබ්‍රහමචරියා** පහත් හැසිරීමෙන් යුතු **මෙථුනා** ලිංගික ඇසුරෙන්, **රතතං න භුඤජෙය** **විකාලභොජනං** රෑ කාලයෙහි අනුභව නොකරන්නේ, දිවාකල්හිද නියම කාලය ඉකුත් වූ විට අනුභව නො කරන්නේය. **න ච ගනධං** මෙහි ගනධ යනුවෙන් විලවුන් වත්සුණු ආදිය දතයුතුය. **මඤචෙ** කැප වූ ඇඳන්, **සනථතෙ** පැදුරු ආදී කැපවූ ඇතිරිලිවලින්, **ඡමායං** දිග් ලොම් ඇති පලස් වැනි ඇතිරිලි ද සඳහන් කළ හැකිය. **අට්ඨංගිකං** පසඟතුරු මෙන් නොව, ඒ ඒ කොටස්වලින්

වෙන් නොකළ, **දුක්ඛනතගුනා** සසර දුකෙහි කෙළවරට යන, ඉතිරි වචනවල අරුත් පැහැදිලිය. ගාථාවෙහි අවසන් පද දෙක සංගායනාවට එක්වූ යතිවරුන් කියන ලදැයි අදහස් වේ. මෙසේ පෙහෙවස් අංග දක්වා දැන් පෙහෙවස් කාලය සඳහන් කරමින් **තතොච පක්ඛස්ස** යන ගාථාව වදාළහ. **තතො** පද පිරවීමට යෙදූ නිපාතයකි. **පක්ඛස්සුපවසසුපොසථං** යැයි මෙසේ පසුපදය යෙදිය යුතුය. **පක්ඛස්ස චාතුද්දසී පඤ්චදසී අට්ඨමී** මේ දින තුනෙහි පෙහෙවස් වසව, ඒ අටසිල් සමාදන්ව කල්ගතකොට, **පාටිහාරිය පක්ඛඤ්ච** වස් එළඹෙන මුල්කොටස වූ ඇසළ මාසයත්, වස් කාලයට ගැනෙන තුන් මාසයත්, ඉල් මාසයත් යන මාසපහ පාටිහාරිය පක්ඛ යැයි හඳුන්වනු ලබයි. ඇතමෙක් ඇසළ, ඉල්, මැදින් යන මාස තුන දක්වති. පෙහෙවස් සමාදන් වන (පොහොය යයි සම්මත) දිනවල පුරපස වැනි කොටස් අනුව, මුලින් හා පසු දවස් ලෙස, දහතුන්වන දිනය, පසළොස්වක දිනය, අමාවක දිනට පසු හත්වන, නවවන දිනය සේ දින සතර සතර බැගින් සැළකිය යුතු බව ඇතැම්හු අදහස් කරති. එය කැමති පරිදි පිළිගත යුතුය. පින් කිරීමට බිය විය යුතු නොවේ. මෙම (පොහොය යැයි) සම්මත වෙසෙස් කාලය අනුවද **පසනන මානසො සුසමතතරූපං** මුළුමනින්ම එක්දිනක් හෝ අත්නොහැර, **අට්ඨංගුපෙතං** පෙහෙවස් වසන්නේ යැයි ගැළපිය යුතුය.

මෙසේ පෙහෙවස් කාලය දක්වා, දැන් ඒ කාලය තුල පෙහෙවස් සමාදන්ව කළ යුත්තේ කුමක්දැයි පහදමින් **තතොච පාතො** යන ගාථාව වදාළහ. **තතො** යනු පද පිරවීමට යෙදූ නිපාතයකි. අතරතුර හෝ ඉක්බිති, ඊළඟට වැනි තේරුමක් සේ කියන ලදී. **පාතො** පසුදින මුල්කොටස, **උපවුත්ථුපොසථො** පෙහෙවස් සමාදන්ව, **අනෙනන** කැඳ බත් ආදියෙන්, **පානෙන** පානයට සුදුසු අටවැදෑරුම් දේ (අට්ඨපාන), **අනුමොදමානො** පිළිගෙන, සතුටට පත්වෙමින්, නිරතුරුවම පහන් වූ සිතින් යන අදහසයි. **යථාරහං** තමාට සුදුසු පරිදි, හැකි පරිදි, **සංවිභජෙථ** අනුභව කරන්නේය, බෙහෙවින් ගරු කරන්නේය. ඉතිරි කරුණු පැහැදිලිය.

මෙසේ පෙහෙවස් සමාදන් වූවකුගේ කටයුතු දක්වා, දැන් දිවිහිමියෙන් ඔහු විසින් හුරු කරගත යුතු, පිළිපැදිය යුතු වත් පිළිවෙත් හා පිරිසිදු දිවිපැවැත්ම පවසා, ඒ පිලිවෙතින් ලද හැකි 'උසස් බව' දක්වමින් **ධම්මෙන මාතාපිතරො** යන ගාථාව වදාළහ. ධම්මෙන දැහැමින් ලද සම්පතින්, **භරෙය්‍ය** ආහාරපාන ලබා දෙන්නේය. **ධම්මිකං සො**

වණිජ්ජං අවි වෙළඳම, සතුන් වෙළඳම, මස් වෙළඳම, රහමෙර-මත්වන දේ වෙළඳම, වසවිස වෙළඳම යන මෙම අදැහැමි වූ වෙළඳම් පහ හැර, ඉතිරි වෙළඳම් දැහැමි වේ. වෙළඳම යනුවෙන් මෙහි ගොවිතැන, ගව පාලනය ආදී වෙනත් දැහැමි ආදායම් ලබන කටයුතු ඇතුලත්ය. ඉතිරි කරුණු පැහැදිලිය. මෙහිදී මෙම කරුණු ද අදහස් වේ. ඒ තෙරුවන් සරණ පත් සාවකයා නිරතුරුවම රකින සීලය (පන්සිල්) පෙහෙවස් සීලය හා දන් දීම ආදී දැහැමි කටයුතුවලින් යුතුව, **පයොජයෙ** දැහැමි වූ වෙළඳම හා එයින් ලද ආදායම යහපත් දෙයටම මිස, අපතේ නිකරුනේ වැය නොකොට, මව්පියන් පෝෂණය කරන්නේය. එවිට ඔහු ගිහි එසේ සිටියත්, අපපමතෙතා මුලදීම කියන ලද පරිදි, **වතතයං** මේ පිළිවෙත, මරණින් පසු තමන් ලද (පින්) ආලෝකයෙන් අඳුර දුරුකොට, එළිය පතුරුවමින් සයමපභා යන නම ලබමින් කාමාවචර සදෙව් ලෝ අතර සයමපභෙ නාම දෙවෙ උපෙති උපත ලබයි. ඇලෙයි. එබඳු දෙවිවරුන් උපන් තැන ඔහුද ඉපදෙයි.

ධම්මික සූත්‍ර විස්තරය නිමි.

චූලල වගග නම් වූ දෙවන කොටස නිමි.

# 3.1

**පබබජ්ජං කිතතයිසසාමි** යනු පබබජ්ජා සූත්‍රයයි. එම සූත්‍රය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවසන කල, 'සැරියුත් ආදී මහරහත් සාවකයන් වහන්සේලාගේ පැවිද්ද අගය කරන ලද බවත්, ඒ තොරතුරු අනෙක් සඟ පිරිස හා උපාසකවරුන්ද දන්නා බවත්, බුදුරජාණන් වහන්සේගේ පැවිදිවීම එසේ අගය කොට වදාරා නැති බවත්, 'ගරු කටයුතු ආනන්ද හිමියන්ට සිතුණි. එහෙයින් 'මම එය විස්තරකොට කියන්නෙම් නම් මැනවැ'යි ජේතවන මහා විහාරයෙහි දහම් අසුනෙහි හිඳ විසිතුරු වටාපොත ගෙන, සඟ පිරිසට භාග්‍යවතුන් වහන්සේගේ පැවිදිවීම විස්තර කරමින් මෙම සූත්‍රය කීහ.

එහිදී පැවිද්ද ගැන කියන්නේ නම්, පැවිදිවූ ආකාරය (මුල සිටම) සඳහන් කළ යුතු වේ. එසේ පැවිදි වූ අයුරු කියන්නා විසින් ඒ පිළිබඳව විමසූ කෙනෙකුට පැහැදිලි වන අයුරින් කිවයුතුය. එහෙයින් 'පැවිදිවීම ගැන කියන්නෙමි'යි කියා 'පැවිදි වූ අයුරු' මුලසිටම කීහ. **චක්ඛුමා** ඇස් පහකින් යුතු, (පසැස් යනුවෙන් තථාගතයන් වහන්සේ අදහස් වේ.) ඉතිරි කරුණු මුල් ගාථා විස්තරයේදී සඳහන්ව ඇත. දැන් **යථා වීමංසමානො** එම කරුණු පවසමින්, **සම්බාධොයං** ගාථාව කීහ. සම්බාධො අඹුදරුවන් ආදීන්ගෙන් වන දුක්පීඩාවලින් ද, කෙලෙස් පීඩාවලින්ද කුසලමය කටයුතුවලට ඉඩ නොමැති වීමෙන්, **රජස්සායතනං** අසුන්ට කාම්බෝජ දේසය මෙන් (ගිහි දිවිය) රාගාදී දූවිලිවලට නිජබිමයි. **අබ්භො කාසො** ඒ කියන ලද අවහිරතාවනට සතුරුවන අයුරින් අහස මෙන් පැතිරුණා වූ, **ඉති දිස්වාන පබ්බජි**. ගිහිගෙයි විසීමේදී ඇතිවන රෝග, ජරාව, මරණය ආදියෙන් පොළඹවන ලදුව, මෙසේ එහි ගැහැට දැන, පැවිදිවීමෙහි යහපත සළකා, සියළු දෙයම අත්හැර, නික්ම ගොස්, අනොමා ගංතෙරදී කඩුවෙන් කෙස් සිඳ දෑඟුල් පමණ කෙසින් යුතුව, සටීකාර බ්‍රහ්මයා පුදන ලද අටපිරිකර පිළිගෙන 'මෙසේ හැඳිය යුතුය, මෙසේ පෙරවිය යුතුයැ'යි කිසිවෙකුගෙන් උපදෙසක් නොමැතිව, සිය දහස්වර උපන් නොයෙක් ජීවිත පැවතුමෙන් හික්මවන ලද පැවිදි බවට නතු වූ සිතින්ම පැවිදි වූයේය. එක් කසාවතක් හැඳ, එකක් උතුරු සළුවක් සේ සිවුරක් කොට උඩුකය වසා, මැටි පාත්‍රයක් උරහිසෙහි එල්ලාගෙන, පැවිදි වෙස් දැරීමට අදිටන් කළේ යැයි කියන ලදී. ඉතිරි කරුණු පැහැදිලිය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ පැවිදිවීම ගැන කියා, ඊට පසු පැවිදි පිළිවෙතද, අනෝමා නදී තෙර සිට කෙලෙසුන් නැතිකිරීමේ උත්සාහවත් ගමනද දැක්වීමට **පබ්බජිත්වාන කායෙන** ආදී ලෙසින් සියළු විස්තර කීහ. එහි **කායෙන පාපං කම්මං විවජ්ජයී** කයෙන් කෙරෙන තුන් ආකාර දුසිරිත් හැර දැමීය. **වචී දුච්චරිතං** සතරාකාර වූ වචනයෙන් වන වැරදිය. **ආජීවං පරිසොධයී** වැරදි දිවිමග අත්හැර, නිවැරදි දිවිමග අනුගමනය කළේය. මෙසේ ආජීව අටවමක සීලයෙන් පිරිසිදුව, අනෝමා ගංතෙර සිට තිස්යොදුන් මග සත්දිනකින් ගෙවා, **අගමා රාජගහං බුද්ධො** රජගහනුවරට එසේ ගියද බුදුබව ලබා නැත. එහෙත් බුදුවරයකුගේ මුල් ජීවිත රටාවට අදාල කොට එසේ කීම නිවරදය. මෙහි රජෙක් උපන්නේ ය. මෙහි රජකම ගත්තේය' යනුවෙන් පොදු කතාබහ අනුව යොදන වචන මෙනි. **මගධානං** මගධ ජනපදයට, නගරයට යයි ද කියන ලදී. **ගිරිබ්බජං**

මෙය ද එයට නමකි. එය පණ්ඩව, ගිජ්ඣකූළ, වෙභාර, ඉසිගිලි, වෙපුල්ල නම් පර්වත පහක් මැද කොටුවක් මෙන් පිහිටි බැවින් ගිරිබ්බජ යැයි කියනු ලබයි. **පිණ්ඩාය අභිහාරෙසි** ආහාර පිණිස ඒ නගරයෙහි හැසිරුණේය.

බිම්බිසාර රජුට තම පැමිණීම දන්වන්නේ නම්, **සුද්ධෝදන** රජු පුතු සිද්ධාර්ථ කුමරු පැමිණ ඇතැයි, මට බොහෝ පුද පඬුරු පිරිනමන්නේය. දන්වා සිවුපසය ලබාගැනීම පැවිද්දෙකුට සුදුසු නොවේ. පිඬු පිණිස හැසිරෙමි'යි එතුමා නගර දොරටුවෙහි සිට සිතුවේය. එහිදී දෙවියන් දෙන ලද පංසුකූල සිවුර පොරවා, මැටි පාත්‍රය ගෙන, බටහිර දොරටුවෙන් නගරයට පිවිස, ගෙපිළිවෙලින් පිඬු පිණිස හැසිරුණේය. එහෙයින් ගරු කටයුතු ආනන්ද හිමියෝ, **පිණ්ඩාය අභිහාරෙසි** යැයි කීහ.

ආකිණ්ණවරලක්ඛණො සිරුරෙහි විසිරුණාක් මෙන් පිහිටියා වූ උතුම් ලකුණුවලින් හෙබි, බොහෝසෙයින් පැතිරුනු ලකුණින් ගැවසුණු, 'නපුරුකමින් පිරුණු මිනිසා මෙන් ද - අපිරිසිදු දේ තැවරුණු කිරිමවකගේ හැඳිවතක් මෙන් ද, 'ආකිණ්ණලුද්දො පුරිසො ධාතිචෙලංව මක්ඛිතො' කියා ඇති අයුරිනි. බොහෝ නපුරු, දරුණු යන අදහසයි. තමද්දසා ඊට සත්දිනකට පෙර නගරයෙහි නැකත් කෙළි උළෙල නිවේදනය කරන ලදී. මෙදින නැකැත් නැකැත් උළෙල අවසන් වී, අදාල කටයුතු (නැවත) ඇරඹීමට අණබෙර යැවීය. එවිට මහජනයා රජමිදුලට රැස්වෙයි. රජුද 'කටයුතු සංවිධානය කරන්නෙමි'යි සීමැදුරු කවුළුව විවරකොට බලකාය දෙස බලද්දී, පිඬුසිඟා ඉදිරියට යන ඒ මහබෝසත් දුටුවේය. එහෙයින් ගරුකටයුතු ආනන්ද හිමියෝ **තමද්දසා බිම්බිසාරො පාසාදස්මිං පතිට්ඨිතො** යැයි ද **ඉමමත්ථං අභාසථ** මේ අදහස (රජු විසින්) ඇමතිවරුන්ට පවසන ලදැයිද (ගාථාවෙන් සඟ පිරිසට) දැන්වූහ. මීළඟට රජු ඇමතිවරුන්ට කී අයුරු **ඉමං භොනෙතා** යන ගාථාවෙන් පැහැදිළි කළහ.

එහි **ඉමං** යනුවෙන් ඒ රජු බෝසතුන් පෙන්වයි. **භොනෙතා** යැයි ඇමතියන් අමතයි. **නිසාමෙථ** බලවු, **අභිරූපො** දැකුම්කළු අඟපසඟ බ්‍රහා උසට සරිලන මහතින් යුතු, **සුචී** සම පිරිසිදු පැහැපත්, **චරණෙන** ගමනින්, **නීචකුලාමිව** පහත් යැයි සම්මත කුලයකින් පැවිදි වූවකු නොවේ යන තේරුමයි. 'ම' අකුර වචන සන්ධි කිරීමට යොදා ඇත. **කුහිං භික්ඛු ගමිස්සති** මේ මහණ කොහි යන්නේද? අද කොතැන වාසය කරයිද? එය

දැනගැනීමට **රාජදූතා** ඉක්මනින් යත්වා! 'අපි (එතුමා) දැකීමට කැමැත්තෙමු'යයි මේ අදහසින් එසේ කියයි. **ගුත්තද්වාරො** බිමට හෙලන ලද ඇස් ඇතිව (වටපිට නොබලමින්) **සුසංවුතො** සිහියෙන්, **ගුත්තද්වාරො** ඒ පිළිබඳ සිහි නුවණින්, **සුසංවුතො** සඟල සිවුරු දැරීමෙන් පහදනසුළු වූ, **ඛිප්පං පත්තං අපූරෙසි** බොහෝ සෙයින් නොගෙන, මෙපමණක් සෑහේ යැයි **සම්පජාන** දන්නා බැවින්, ඒ අදහස ඇතිව **පතිස්සත** වහා පාත්‍රය පුරවා ගත්තේය. මුනි රහතන් වහන්සේගේ පිළිවෙත අනුගමනය කරන බැවින්, දැනට ඒ තැනට නොපැමිණියද මුනිවරයා ලෙසම කියන ලදී. පොදු වහරේදී, ලෝකයා විසින් රහත් බවට පත් නොවූ මහණකට වුවද 'මුනි' යයි කියනු ලබයි. **පණ්ඩවං අභිහාරෙසි** පණ්ඩව නම් ඒ පව්වට නැංගේය.

'මේ නගරයෙහි, පැවිද්දන් නම් කොහි වසත්දැ'යි (සිදුහත්) බෝසත් මිනිසුන්ගෙන් ඇසීය. එවිට ඔව්හු පාණ්ඩව පව්ව මත්තෙහි නැගෙනහිර දෙසට ඉදිරියෙන් පිහිටි පව්ව ගැන සැළකළහ. එහෙයින් ඒ පණ්ඩව පව්ව ඉදිරියට ගමන් කළේය. **එත්ථ වාසො භවිස්සති** මෙසේ සිතා, **ව්‍යග්ඝසූසභොව සීහොව ගිරිගබ්භරෙ** ගල් ගුහාවෙහි ව්‍යාඝ්‍රයකු මෙන් ද ගව රැළක නායක ගවයෙකු මෙන් ද සිංහයකු මෙන් ද නිසිනෙනා (හිඳමින්) යන තේරුමයි. මේ බලවත් සිවුපාවෝ තිදෙනාම ගල්ගුහාවෙහි නිබයව, බිය අරමුණු නොගෙන හිඳිති. එහෙයින් මෙසේ උපමා කළේය. **භද්දයානෙන** ඇත්, අස්, රිය, දෝලා ආදී වටිනා රියකින්, **ස යානභූමිං යායිත්වා** ඇතුන්, අසුන් යෙදූ එබඳු රියකින් බිමින් යා හැකි තරම් දුර ගොස්, **ආසජ්ජ** පැමිණ, සමීපයට ගොස් යන තේරුමයි. **උපාවිසි** හුන්නේය. **යුවා** යොවුන් බවට පත්, **දහරො** තරුණ වූ, **පඨමුප්පත්තිතො සුසු** මේ වචන දෙකම වෙසෙස් ගුණ දක්වන පද ය. **යුවා සුසු** ඉතා තරුණ **පඨමුප්පත්තිතො** මුලසිටම තරුණ වියේ මෙන් පෙනුමෙන් යුතු, **දහරොචාසි** තරුණ බව ඇතත්, බාලවියේ කෙනෙකු මෙන් වැටහිණ. **අණිකග්ගං** බලසෙනග, සේනාව පෙරටුව, **දදාමි භොගෙ භුඤ්ජස්සු** මෙහිදී මම අඟුමගධ ජනපදවලින් කැමති දෙයක් ඒ සම්පත් පරිහරණය පිණිස ඔබට දෙමි. එය ඔබ **සොභයනෙතා** (පිළිගෙන) බලසේනා ඉදිරියට මෙහෙයවමින් ඒ සම්පත් පරිහරණය කරනු මැනවැයි මෙසේ සම්බන්ධය දතයුතුය.

**උජු ජනපදො රාජා** 'සම්පත් දෙමි, ඒවා පරිහරණය කරව, විමසන ලදින්, ජාතිය ද කියව'යි කී කල බෝසත් මෙසේ සිතුවේය. 'මම රජකම

කැමති වන්නෙම් නම්, චාතුම්මහාරාජික ආදියෙන් පවා මට තම තමන්ගෙ රජය බාරගැනීමට ආරාධනා කරනු ඇති. ගිහිගෙයි සිටියෙම් නම්, සක්විති රජ වන්නෙමි. මේ රජු නොදන්නා නිසා මෙසේ කියයි. එහෙයින් ඔහුට දැනගැනීමට සලස්වමි'යි තමන් පැමිණි පෙදෙස අත ඔසවා පෙන්වමින්, **උජු ජනපදො රාජා** යැයි කීය. **හිමවනතසස පසසතො** මෙසේ කියමින් අස්වනු හා සම්පත් නොසළකන බව පැහැදිලි කළේය. හිමාලයෙහි ගල් (දෙකඩව) විවර වූ කුහරවලින් මතු වූ මහා සම්පත් පස් ගුණයෙකින් වැඩේ. (එසේනම්) කෙතෙහි අස්වැන්න ගැන කියනුම කවරේද? **ධන විරියෙන සමපනෙනා** සත්රුවනින් නොඅඩු වූත්, සතුරු රජවරුන්ටද සිතිය නොහැකි බලවත් මිනිසකු සතු අදිටන් බව දක්වයි. **කොසලෙසු නිකෙතිනො** මෙසේ කියමින් අළුතින් රජකම පිළිනොගනී. අළුත් රජවරුන් ගැන නිකෙති යැයි කියනු නොලැබේ. මුල් කාලයේ පටන්ම පිළිගෙන තිබුණේ ජනපදයක වාසය කරන තැනැත්තාටත් එසේ කීමටයි. එසේ සළකා සුද්ධෝදනට ද **කොසලෙසු නිකෙතිනො** යැයි කීය. එයින් පරම්පරාවෙන් උරුම වූ ධන සම්පත් ගැන ද දක්වයි. මෙපමණකින් තම සම්පත් දක්වා, **ආදිචෙචා නාම ගොතෙතන සාකියා නාම ජාතියා** මෙයින් උපතින් ලද (පසුබිම) උසස් බව දක්වා, 'ඔබට මම සම්පත් දෙමි, එය පරිහරණය කරන්නැ'යි රජු කියන ලද දෙය පිළිනොගනිමින්, **තමහා කුලා පබබජිතොමහි රාජ න කාමෙ අභිපත්‍ථයං** යනුවෙන් පැවසීය. 'මම එබඳු කම්සැප පතන්නෙම් නම්, මෙබඳු ධනය බලය සහිත වූ අසූදහසක් වීර බලැති මිනිසුන් ගැවසි පරපුරක් හැරදමා පැවිදි නොවන්නෙමි'යි මේ අදහස කීය.

මෙසේ රජුගේ වචනය පිළිනොගෙන, තවදුරටත් තම පැවිදිවීමට හේතු දක්වමින්, **කාමෙසවාදීනවං දිසවා නෙකඛමමං දටඨු ඛෙමතො** යැයි පැවසී. 'මේ නිසා පැවිදි වූයෙමි'යි මෙසේ වෙසෙසින් (ඊට හේතුව) ගැළපිය යුතුය. දටඨු දැක, ඉතිරි වචනවල තේරුම් ද, මුල් ගාථාවල නොදැක්වූ, විවරණය නොකරන ලද සියළුම දේ (කලින් අදාල තැන්හි) පැහැදිලි කොට ඇති බැවින් සඳහන් නොවූ බවද දතයුතුය. මෙසේ තම පැවිදිවීමට හේතු දක්වා, එහි උත්සාහවත්ව, (ඉදිරියට) යනු කැමතිව රජු අමතා **පධානාය ගමිසසාමි, එත්‍ථ මෙ රඤජතී මනො** යැයි කීය. එහි අදහස නම්, 'මහරජ, මම (ගිහිගෙයට අදාල කෙලෙසුන් වැඩෙන දේවලින්) නික්මීම දැක පැවිදිවීමි. එහෙයින් ඒ උතුම්ම නික්මීම වූ, සියළු දෙයින්ම

උසස් වූ අමා නිවන බලාපොරොත්තුවෙන් ඊට උත්සාහවත්වීම පිණිස, යන්නෙමි. මගේ සිත එම උත්සාහයෙහි මිස කාමයන්හි නොඇලෙයි.

මෙසේ කී කල්හි (බිම්බිසාර) රජු 'හිමියනි, සුද්ධෝදන රජුගේ පුත් සිදුහත් කුමරු සතර පෙරනිමිති දැක, පැවිදිව බුදුබවට පත්වන්නේ යැයි කලින්ම අසන ලදී. හිමියනි, මම ඔබගේ අදහස දැන මෙසේ සතුටු වෙමි. බුදුබවට පත්වුව මැනවි. හිමියනි, බුදුබවට පත්ව, මුලින්ම මගේ විජිතයට පැමිණෙනු මැනැවැ'යි කීවේය.

**පබ්බජ්ජා සූත්‍ර විස්තරය නිමි.**

# 3.2

**තං මං පධානපහිතත්තං** යනු පධාන සූත්‍රයයි. එම සූත්‍රය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? 'උත්සාහවත්වීම පිණිස බුදුබව අවබෝධයට උත්සාහය පිණිස යන්නෙමි, මගේ සිත එහි ඇලෙයි' යනුවෙන් ගරුකටයුතු ආනන්ද හිමි 'පධානාය ගමිස්සාමි, එත්ථ මෙ රඤ්ජති මනො' පබ්බජ්ජා සූත්‍රය නිමා කළේය. භාග්‍යවතුන් වහන්සේ සුවඳ කුටියෙහි වැඩහිඳිමින්ම, 'මා විසින් උත්සාහවත් වෙමින්, බුදුබව පතමින් සයවසරක් ඉතා අපහසු කටයුතුවල යෙදෙන ලදී. එය අද මහසඟනට පවසන්නෙමි'යි සිතූහ. ඉක්බිති ගඳකිළියෙන් නික්ම බුදුඅසුනෙහි වැඩහිඳ **තං මං පධානපහිතත්තං** යනුවෙන් මෙම සූත්‍රය වදාළහ.

එහි තං මං යන වචන දෙකින් තමන්ම හඳුන්වයි. **පධාන පහිතත්ත** නිවන පිණිස යොමුවුණු සිතින්, හැරදමන ලද ජීවිතය හෝ, **නදිං නෙරඤ්ජරං පතී** ඊට යොමුවන ලකුණු (හෙවත් සුදුසු පරිසරය) දක්වයි. ලකුණ නම් නිවනට උත්සාහවත් වනු පිණිස නේරංජරා නදියයි. එහෙයින් එය සම්බන්ධතාව දක්වන වචනයයි. මේ එහි තේරුමයි. නේරංජරා ගංතෙර යැයි කියන ලදී. **විපරක්කම්මා** බොහෝ සෙයින්ම උත්සාහවත්ව, **ඣායන්තං** හුස්ම ඉහළට ගැනීම, හුස්ම පහළ හෙළීම මෙනෙහි කිරීමෙන්

යොදමින්, **යොගක්ඛෙමස්ස පත්තියා** කාමාදී සතරාකාර වූ සංයෝගවලින් මිදුණු නිවන අවබෝධය පිණිස, **නමුචි** මාරයා, ඔහු තම බලයෙන් ඉවත්වීමට කැමති වන දෙව්මිනිසුන් මුදා නොහරී. ඔවුන්ට අනතුරු කරයි. එහෙයින් **නමුචි** යැයි කියනු ලැබේ. **කරුණා** - දයාවෙන් යුතු, **භාසමානො උපාගමි** කවර හෙයින් පැමිණියේදැයි මෙය පැහැදිලි කෙරේ.

එක්දිනක මහ බෝසත්හු මෙසේ සිතූහ. 'හැමදාම ආහාරයටම යොමුවීම ජීවිතය ගැන බලාපොරොත්තු ඇති කරයි. මෙසේ ජීවිත පැවැත්ම බලාපොරොත්තුවෙන් නිවන ලද නොහැකිය.' එසේ සිතා, ආහාර ගැනීම බොහෝ සීමා කළේය. එයින් සිරුර කෙට්ටු විය. පැහැපත් බව නැතිවිය. ඉක්බිති මාරයා, 'මෙය මනා අවබෝධයට සුදුසු මගද, නැත්දැ'යි නොදැන, (සිදුහත් තවුසා) ඉතා දරුණු තවුස්දම් පුරයි. කවදා හෝ මගේ බලය ඉක්මවනු ඇතැ'යි බියවී, මේ මේ ආකාරයෙන් කරුණු කියා වළක්වන්නෙමි'යි අවුත්, **කිසො ත්වමසි දුබ්බණ්ණො සන්තිකෙ මරණං තව** යනුවෙන් කීය. මෙසේ කියා, බෝසතුන්ගේ මරණය ආසන්න බව තහවුරු කරමින්, **සහස්සභාගො මරණස්ස එකංසො තව ජීවිතං** ලෙසද පැවසීය. එහි තේරුම නම්, දහසෙන් එක් කොටසක්, ඒ මරණයට කවරෙකු හේතු වේදැයි ඉතිරි පාඨයක් ද වේ. එක් කොටසක් (එකො අංසො - එකංසො) මේ සඳහා කියන ලදී. මේ හුස්ම ගැනීම, හෙළීම ආදිය වැඩීමෙන් ඔබේ මරණයට හේතුවන්නේ දහසෙන් තවත් එක් කොටසකි. එහෙයින් ඔබේ ජීවිතය පවත්නේ එක් කොටසකි. මෙසේ ඔබ මරණය ආසන්නයෙහිය.

මෙසේ මරණයට ආසන්න බව තහවුරුකොට, ඊළඟට ජීවත්වීම පිළිබඳව උත්සාහවත් කරමින්, **ජීවමෙහා ජීවිතං සෙය්‍යො** යැයි කීය. කෙසේනම් උසස් වේද? **ජීවං පුඤ්ඤානි කාහසි** ඉක්බිති තමන් පින යැයි සිතා ඇති දේ දක්වමින්, **චරතො ච තෙ** යනුවෙන් කීය. එම ගාථාවේ **බ්‍රහමචරියං** තවුසන් කලින් කල ලිංගික ඇසුරෙන් වෙන්වීම ගැන කීය. **ජුහතො** යාග කරන්නාට, ඉතිරි කරුණු පැහැදිලිය. **දුග්ගො මග්ගො** මෙම ගාථා අඩකින්, කෙලෙසුන් දුරු කිරීමේ උත්සාහයට කැමැත්ත නැති කරමින්, හුස්ම ගැනීම - හෙළීම පිළිබඳව දැහැන් වැඩීම දුකින්ම කළයුතු දෙයකැයි කීය. **දුග්ගො** කයත් සිතත් දුකට පත්කරමින් කළයුතු බැවින්, **දුක්කරො** ඔබ වැනි කෙනෙකුට ඉක්මනින් මරණයට පැමිණීම නොහැකිවන බැවින්, **දුරභිසම්භවො** යැයි මෙසේ අරුත් දතයුතුය. **මෙයින්**

පසුව ඇති **ඉමා ගාථා භණං මාරො අට්ඨා බුද්ධසස සනතිකෙ** මෙම ගාථා අඩ සංගායනාවට සහභාගී වූ හිමිවරුන් කියන ලදී. ඇතමෙක් මුළු ගාථාවම කී බව දක්වති. භාග්‍යවතුන් වහන්සේ විසින්ම වෙනත් තැනැත්තකු මෙන් තමන් නිදසුන් කරමින්, මෙහි සියල්ල වදාරන ලදැයි අපගේ වැටහීමයි. **අට්ඨා** සිටියේය. ඉතිරි කරුණු පැහැදිලිය. හයවන ගාථාවෙහි **යෙනතෙථන** අනුන්ට අනතුරු කරන පිණිසත්, තමාගේ (මාරයාගේ) යහපත තකා ඔබ (මාරය) **පාපිම ආගතො** ආවෙහි යැයි අදහස් වේ. ඉතිරි කරුණු පැහැදිලිය. **ජීවං පුඤඤානි කාහසි** මෙම වචනය පිළිනොගනිමින් **අණුමතෙතනපි** යන මෙම ගාථාව කීය. එම ගාථාවෙහි **පුඤෙඤන** සසර ගමනට හේතුවන මාරයා විසින් පින යැයි අදහස් කරන ලද කරුණ ගැන කියයි. ඉතිරි කරුණු පැහැදිලිය.

දැන් **එකංසො තව ජීවිතං** යන මේ වචනය නිසා මාරයා තැති ගන්වමින්, **අත්‍ථි සද්ධා** මේ ගාථාව කීහ. එහි අදහස් වන්නේ මෙම කරුණුයි. 'බොල, මාරය, යම් කෙනෙකු උතුම් නිවන සඳහා සැදැහැ නැත්තේ ද, සැදැහැ ඇතත් අලස වේද, සැදැහැති බවත්, පටන් ගන්නා ලද උත්සාහ ඇතත්, නුවණ නැතිනම්, ඒ ඔබ විචාරන ලද තැනැත්තා ලෙස ඔබට සුන්දර වෙහි? (ඒ ඔබ කැමති තැනැත්තාය) මට නම්, උතුම් නිවන පිළිබඳව තිර අදිටනින් යුතු **සද්ධා අත්‍ථි**. එසේ කායික හා මානසිකවද, ලිහිල් නොවූ, දැඩි උත්සාහය යයි කියන ලද **විරියං**, දියමන්තියක් බඳු වූ **පඤඤා ච මම විජජති**, ඒ ඔබ **එවං මං පහිතතතං** (ජීවිතය ගැන) අදහස අත්හළ, **කිං ජීවමනුපුචඡසි**. නුවණ ද මට ද මෙහි **ච** යන්නෙන් සිහියද, එකග බව ද (අදහස් වේ.) මෙසේ ඇතිකල්හි, යම් කෙනෙක් සද්ධා ආදී ඉඳුරන් පහෙන් යුතු වූවෝ නම්, නිවනට පැමිණෙති. එබඳු එක කරුණකින් හෝ ඉවත් නොවූ, ජීවිතයෙහි අදහසක් නැති මට - ජීවත්වීමක් කුමට අසන්නෙහිද?' 'දැඩි ලෙස පටන්ගන්නා ලද උත්සාහයෙන් යුතුව, (ජීවිතය ඇතුළු හැම දෙයකම) ඇතිවීම හා නැතිවීම ගැන නුවණින් බලමින්, බවුන් වඩන නුවණැත්තාගේ එක්දිනක් ජීවත්වීම වුවද උසස්'යැයි කියා තිබෙනවා නොවේද?

> **"එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළහං**
> **පඤඤවනතසස ඣායතො, පසසතො උදයබබයං"**

මෙසේ මාරයා තැති ගන්වා, තම සිතෙහි වූ අරමුණ පහදමින්

නදීනං අපි ආදී ගාථා තුනක් කීහ. එහි වචනවල තේරුම් පැහැදිලිය. මේ එයින් අදහස් වන කරුණුයි. මගේ මේ සිරුරෙහි හුස්ම ගැනීමේ උත්සාහයෙන් වාතො පවත්නේය. ලෝකයෙහි ගංගා, යමුනා ආදී ගංගා ද නදීනං අපි සොතානි අයං විසොසයෙ, කිඤ්චි මෙ මේ ආකාර වූ - පහිතත්තසස නැළි සතරක් පමණ වූ ලොහිතං න උපසොසෙය්‍ය හුදෙක් මාගේ ලේ පමණක්ම වියළේ ද, එතකුදු වුවත් එම ලේ ලොහිතෙ සුස්සමානම්හි ඒ ඒ ආකාරයට සිරුර හා බැඳුණු, පිත්තං කෑමෙන්, බීමෙන් (ආහාරපානාදියෙන්) වැසී ඇති නැළි හතරක් පමණ වූ සෙමහඤ්ච මෙයට අමතරව තවත් දේ තිබේද? එපමණම වූ මුත්‍ර ද, සාරය ද, වියළේ. ඒවා වියලෙන විට, මස ද අඩු වේ. මෙසේ අනුපිළිවෙලින් මගේ, මංසෙසු ඛියමානෙසු භීයො චිත්තං පසීදති එයින් පමණක්, ඒ හේතු කොට පමණක් සිරුර නැතිවන්නේ නොවේ. 'ඔබ මෙබඳු සිතක් ගැන නොදැන, සිරුර ගැන පමණක් සිතා, 'ඔබ මළාතික වෙහි, කෙට්ටුය, මරණය ඔබ ළඟ යැයි (මට) කියයි. හුදෙක් මාගේ සිත පමණක් පැහැදීම නොවේ. එතකුදු වුවත්, භීයො සතී ච පඤ්ඤා ච සමාධි මම තිට්ඨති දශමයකින්වත් (ඉතාම සුළුවෙන් වත්) පමාවක් හෝ මුලාවක් හෝ සිතෙහි අවුල් හෝ නැත. තසස මට, එවං විහරතො කිසියම් මහණ බමුණකු අතීතයෙහි හෝ අනාගතයෙහි හෝ, වත්මනෙහි හෝ තම උවමනාවෙන්ම වේදනා විඳිත් ද, එය නිදසුන් කොට පත්තසස උත්තමවෙදනං, යම්සේ දුකෙන් පෙළුණ විට සැපය ද, සීතලට උණුසුම ද, උණුසුමට සීතලද, කුසගිනි වූ විට ආහාරද, තද පිපාසයට ජලය ද, වෙනත් පුද්ගලයන්ගේ සිත් බලාපොරොත්තුවෙන් පසුවෙයි. පස්කම් ගුණ පිළිබඳවද එසේමය. (බෝසත්තුමා ඒ කිසිදු දෙයකට) එකම කැමැත්තක් හෝ, කාමමපි නාපෙක්ඛතෙ චිත්තං 'අහා! මම ඒකාන්තයෙන්ම රසවත් අහරක් අනුභව කොට සුව යහනක නිදාගන්නෙම් නම්',............ යන මෙබඳු එකම සිතක්වත් ඇති නොවේ. පසස ඔබ, මාරය, සත්තසස සුද්ධතං මෙසේ තමන්ගේ පිරිසිදු බව දක්වා, 'බෝසත් වළක්වමි'යි පැමිණි මාරයාගේ අදහස ඉටු නොවන පරිදි 'මාර සේනාව' ගැන සඳහන් කොට, ඒ මාරයා පරදවන බව පහදමින් කාමා තෙ පඨමා සෙනා ආදී ගාථා හයක් කීය.

මුල පටන්ම, ගිහි ගෙවල්වල වසන්නෝ භව භෝග සම්පතට දැඩි කැමති වීමෙන් ද, කෙලෙස්වලින් බැඳීමෙන් ද කාමා මුලා වෙති. ඒවා මැඩපවත්වා, ගිහිගෙයින් නික්මුණු තැනැත්තාට විවේකී තැන් සහ සෙනසුන් කෙරෙහි හෝ, ඒ ඒ උසස් දහම් (දැහැන් ආදිය) ගැන හෝ

නොඇලීම, නොකැමැත්ත **අරති** හටගනී. ඇවැත්නි, පැවිද්දකු විසින් ඇලීම ඉතා අපහසු'යැයි 'පබ්බජිතෙන ඛො ආවුසො අභිරති දුක්කරා' මෙසේ කියන ලදී. එමෙන්ම පැවිද්දාගේ ජීවිතය අනුන්ගෙන් යැපෙන බැවින් **ඛුප්පිපාසා** පීඩාවට පත්වෙයි. සාපිපාසාවෙන් පෙළෙනවිට ඒවා සොයා ලබාගැනීමේ **තණ්හා** සිත වෙහෙසට පත්කරයි. එසේ වෙහෙසට පත්වන සිත්වලට **ථිනමිද්ධං** බැසගනී. එවිට මගපල ආදී වෙසෙස් බවක් ලබාගත නොහැකි, කැලෑ, වනසෙනසුන්හි වාසය කළත්, තැතිගන්නා හැඟීම් හටගැනීමෙන් **භීරු** ඇතිවෙයි. එයින් ඇතිවන දෙගිඩියාවෙන් හා සැකයෙන් දිගුකලක් විවේක සුවයෙහි නොසතුටින් වාසය කිරීමෙහිදී, 'දහම් අවබෝධ කරගැනීමේ පිළිවෙතට මේ සුදුසු මගද? නැත්දැ'යි **විචිකිච්ඡා** හටගනී. එය දුරුකොට වාසය කිරීමේදී මද හෝ (සිතෙහි) උසස් බවක් ලැබීමෙන් මානයෙන් **මක්ඛථම්භා** හටගනී. එයද දුරුකොට වාසය කරනවිට, පෙරට වඩා උසස් බවකට පත්වීම නිසා **ලාභසක්කාර සිලොකා** ලැබේ. එසේ ලබන සිවුපසයෙහි ඇලී ගැලී දහමට ගැලපේ යැයි පවසමින්, **මිච්ඡායසං** එසේ ලැබෙන බොරු යසසට පත්ව ජාති ආදී ලෙසින් **අත්තානං උක්කංසෙනති** අනුන් පහත්කොට හෙළා දකිති. එහෙයින් කැමැත්ත ආදී වූ පළමු (මාර) සේනාව මෙසේ දතයුතුය.

මෙසේ දස මරසේනාව පෙන්වා දී ඒවා (යහපත අඳුරු කරන බැවින්) කළුපැහැ කරුණු සේ ගෙන ඒ අඳුර මාරයාට උපකාර පිණිස පවත්නා හෙයින්, 'මාරය, ඔබගේ සේනාව එබඳු යැයි දක්වමින් **එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිප්පහාරිණී** යැයි කීහ. අභිප්පහාරිණී මහණ බමුණන් වැනසීම, තලාපෙලා හිරිහැර කරමින් අනතුරට පත් කිරීම යන තේරුමයි. **න තං අසූරො ජිනාති, ජෙත්වා ච ලභතෙ සුඛං** මෙසේ ඔබගේ සේනාවට, කයෙහි බලාපොරොත්තු නොමැති තැනැත්තා ද දිනාගත නොහැකිය. ඒ තැනැත්තා ඔබ පරදවා මගපල සුව පමුණුවා ගනී. ලබාගනී. එසේ ලැබිය හැකි සුවය පතමින් මම ද **එස මුඤ්ජං පරිහරෙ** යුදයෙහි උත්සාහවත්ව නොනවතින තැනැත්තෝ තම නොනවතින බව දන්වනු පිණිස හිසෙහි හෝ කොඩියෙහි හෝ ආයුධයෙහි හෝ බට තණකොළ බඳිති. එය පරිහරණය කරන්නකු ලෙස, (එය අනුගමනය කරන්නකු ලෙස) මා ගැනද සළකා ගනුව. ඔබගේ සේනාව පැරදවූ විට ධීරත්වූ මම **ජීවිතං**, එහෙයින් එසේ සිත තබා ගනුව, **සංගාමෙ මෙ මතං සෙය්‍යො යඤ්චෙ ජීවෙ පරාජිතො** මතා ජීවිත පැවතුම්වලින් යුතු තැනැත්තෙකුට ඔබ වැන්නකු විසින් කරනු ලබන යුද්ධයේදී, සිදුවන අනතුරින් පැරදී

ජීවත්වනවාට වඩා මට මරණය උතුම්ය. කවර හෙයින් මරණය උසස්යැයි කියන ලදද? **පගාළ්හා එත්ථ -පෙ- සුබ්බතා** ලෙසිනි.

එත්ථ කැමැත්ත ආදිය මුල්කොටගෙන, තමා උසස් කොට සළකා, අනුන් හෙළා දකිමින්, අවසානයෙහි ඔබේ සේනාවෙහි **පගාළ්හා** ගැලී, තදින් බැස, (ඇතුලටම) පිවිස, **එකෙ සමණ බ්‍රාහමණා න දිස්සන්ති** අඳුරට පිවිසියාක් මෙන් සීලාදි ගුණ පළ නොකරත්. මෙසේ ඔව්හු එහි ගිලුනාක් වෙත්ව, දියෙන් මතුව, දියෙහි ගිලෙනා මිනිසෙකු සේ, කිසියම් දිනක, 'සැදැහැ බව මැනවැ'යි ආදී ලෙසින් (හැඟීම් මත) කිම්දෙති. එසේම ඉහත දැක්වූ ඒ මාර සේනාවෙන් තදින් වෙලී ගත් බැවින්, **තඤ්ච මග්ගං න ජානන්ති**. සියළුම බුදු පසේබුදුවරු ආදීහු බිය නොමැති නිවනට පත් වූවෝ යෙන **ගච්ඡන්ති සුබ්බතා**.

මේ ගාථාව අසා මාරයා නැවත කිසිවක් නොකියාම ඉවත්ව ගියේය. මහබෝසතාණෝ, මාරයා ඉවත්ව ගියවිට, සිරුරට දුක් දීමේ ඒ ඉතා අපහසු කටයුතුවලින් කිසිදු වෙසෙස් බවක් නොලැබ, 'අවබෝධය පිණිස වෙනත් මගක් තිබේදැ'යි සියා නු බො අඤ්ඤො මග්ගො බොධාය' සිතා, කටුක නොවූ රසවත් ආහාර ගෙන සවිය ලැබ, වෙසක් පුන් පොහෝ දින, කලින්ම සුජාතාව පිරිනමන ලද කිරිබත අනුභවකොට, සොඳුරු වනලැහැබෙහි දිවාකාලය ගතකොට, එහිදී සමාපත්ති අට උපදවා දවස ගතකොට, සවස් කාලයෙහි මහබෝමැඩ ඉදිරියට ගොස්, සොත්ථිය බමුණා දෙන ලද තණ මිටි අට බෝමුල විසිරුවා, දස සහසක් ලෝධාතුන්හි දේවතාවුන්ගේ බොහෝ ගරුසැළකිලි මැද, 'ඒකාන්තයෙන් සිරුරෙහි සම ද නහර ද ඉතිරි වේවා! මස් ලේ වියලේවා, එහෙත් බුදුබවට නොපැමිණ දැන්නම පලඟ නොබිඳින්නෙමි'යි (තමාම) පොරොන්දු වී, (සිවු ආකාර උත්සාහය අදිටන් කොට) නොපැරදෙන පලඟෙහි වැඩහුන්හ. පව්ටු මාරයා එය දැන, 'සිදුහත් අද අදිටන් කොට හිඳී. අදම ඔහුගේ ඒ පොරොන්දු අදිටන වැළැක්විය යුතුයැ'යි, බෝමැඩ සිට සක්වළ තෙක් දික් වූ දොළොස් යොදුන් පළල, නව යොදුනක් උසට මාරසේනාව රඳවා තබා, යොදුන් එකසිය පණහක් උසැති 'ගිරිමෙඛලා' නම් ඇත්රජු පිට නැගී, අත් දහසක් මවා, නොයෙක් ආයුධ රැගෙන, (සිදුහත්) 'අල්වා ගනිව්, වනසව්, ගසවු' කියමින්, ආලවක සූත්‍රයෙහි කියන ලද පරිදි වැසි මැවීය. ඒ වැසි මහ බෝසතුන් කරා පැමිණ එහි කියන ලද පරිදිම සන්සිඳුණි. එවිට දියමන්ති හෙණ්ඩුවෙන් ඇතුගේ කුම්භතලයට ගසා (ඇන)

මහ බෝසතුන් ළඟට ගෙනගොස්, 'එම්බා, සිදුහත්, පලඟින් නැගිටුව'යයි හඬ නැගීය. මහ බෝසතාණෝ, 'මාරය, නොනැගිටිමි'යි කියා, හාත්පස ඒ සේනාව පිරික්සා බලමින්, **සමන්තා ධජිනී** ආදී මේ ගාථා ද වදාළහ. **ධජිනී** සේනාව, **යුත්තං** අදාල කටයුත්තක යෙදුණු, **සවාහනං** ගිරිමෙඛලා නම් ඇත්රජු සහිත, ඒ ආකාර සිරුරෙන්ම ඉදිරියට යන්නෙමි, කවර හෙයින්ද? **මා මං ඨානා අචාවයී** පරදාලිය නොහැකි පලඟ පිහිටි ඒ තැනින් මාරයාට මා සෙලවීමට නොහැකි වෙහි යයි කියන ලදී. **නප්පසහති** ඉවසීමට හෝ යටපත් කරන්නට හෝ නොහැකි වෙයි. **ආම පත්තං** අමු මැටි බඳුනක්, **අසමනා** ගලින්, ඉතිරි වචනවල අරුත් පැහැදිලිය.

දැන්, 'ඒ මාර සෙනග බිඳ, ඉන්පසු යුද්ධය (කෙලෙස් යුද්ධය) ජයගෙන, දහම් නැමති රජයෙහි මෙසේ අබිසෙස් ලබන්නෙමි'යි පෙන්වා දෙමින්, **වසිං කරිත්වා** යන ගාථාව කීහ. **වසිං කරිත්වා සංකප්පං** සීල-සමාධි-පඤ්ඤා මග වැඩීමෙන් සියළු වැරදි කල්පනා හැරදමා, නිවැරදි කල්පනාවම තබාගනිමින්, එම කල්පනාව වසඟකොට, **සතිඤ්ච සූපට්ඨිතං** කය ආදී කොට ඇති සිවු තැන්හි තම සිහියද මැනවින් පිහිටුවා, මෙසේ වසඟ කරන ලද කල්පනාව මනාව සිහි තබාගෙන, **රට්ඨා රට්ඨං විචරිස්සාමි** දෙව් මිනිසුන් ආදී, **පුථූ සාවකෙ විනයනෙන්තා** මා විසින් හික්මවනු ලබනවිට, **තෙ අප්පමත්තා.........න සොචරෙ** ඒ අමා නිවන ම අවබෝධ කොට යන අදහසයි.

ඉක්බිති මාරයා මේ ගාථා අසා, 'මහණ, මෙබඳු යකෙකු දැක බිය නොවෙහිදැ'යි ඇසීය. 'එසේය, මාරය, බිය නොවෙමි' - 'කවර හෙයින් බිය නොවෙහි ද?' 'දානා දී පින් පුරන ලද බැවිනි.' 'ඔබ දානාදී පින් පුරා ඇති බව දන්නේ කවුද?' 'පාපී මාරය, ඒ කරන ලද බවට සාක්කි කුමටද? එහෙත් එක් භවයකදී වෙස්සන්තරව යම් දානයක් දුනිම් ද, ඒ බලයෙන්, සය ආකාරයකින් සත්වරක් කම්පා වූ මේ මහපොළව සාක්කි දරනු ඇත. මෙසේ කී විට ජලය කෙළවරකොට ඇති මහපොළව බියකරු හඬක් නඟමින් කම්පා විය. මාරයා ඒ අසා, හෙණයක් වැදුණාක් මෙන් බියවී (ඔසවාගෙන තිබූ) කොඩිය පහත් කොටගෙන, පිරිස සමග පලා ගියේය.

ඉන්පසු, මහබෝසතාණන් වහන්සේ, තුන් විදු නැණ අවබෝධ කොට, හිරු උදාවෙද්දී, 'සසර නොයෙක් ලෙසින් ඉපිද, තණ්හාව නැති කරන ලදැයි' 'අනෙක ජාති සංසාරං........තණ්හානං ඛයමජ්ඣගා' මේ

උදානය පළ කළහ. මාරයා උදානය පවසන හඬ අසා පැමිණ, 'මොහු මම බුදුබවට පත්වීමි' යැයි හඳුන්වා දෙයි. මොහුගේ උසස් හැසිරීමෙහි දී කයෙන් හෝ වචනයෙන් හෝ යම් වරදක් වන්නේ නම්, එයින් ඔහු වෙහෙසෙන්නෙමි. එය දැනගැනීමට ලුහුබඳිමි'යි අදහස් කොට, පෙර බෝසත් කල සිට හයවසරක් ද, දැන් බුදුබවට පත් වූ පසු වසරක්ද පසුපස ගියේය. එහිදී භාග්‍යවතුන් වහන්සේගේ කිසිදු දොසක් නොදැක, තම අදහස ඉවත හළ බව දන්වමින් **සත්තවස්සානි** ආදී ගාථා කීය. එම ගාථාවල **ඔතාරං** සිදුරක්, විවරයක්, **නාධිගච්ඡිස්සං** නොලදිමි. **මෙදවණ්ණං** මේද පිඩක් බඳු, **අනුපරියගා** හාත්පස, හාත්පසින් (ඉතා ළඟින්ම) ගියේය. **මුදු මොළොක්, විඳෙම ලබන්නෙමු. අස්සාදනා** යහපත් බව, **වායසෙතො** කවුඩකු මෙන්, ඉතිරි වචන පැහැදිලිය. මේ විස්තර වන අදහසයි. **සත්වසක්** වරද සොයමින් භාග්‍යවතුන් වහන්සේගේ **පසුපස** කිසිදු විටක අත් නොහරිමින් පසුපස ගියෙමි. **පදා පදං** පියවරක් පියවරක් පාසා ගියද වරදක සොයා නොගතිමි. **මෙද වණ්ණං පාසාණං** මේදය යැයි සිතා, එක් තැනකට හොටෙන් ඇන අවුස්සන කවුඩකු මෙන් ඒ මම ද සතුටක් නොලබමින්, **අපෙපව නාම එත්ථ මුදු විඳෙම අපි මෙයින්, අස්සාදනා** සියා එසේම හාත්පස හොටෙන් අනිමින්, **අනුපරි** ගොස්, කිසිම තැනක අස්සාදං අලද්ධා මේ ගලක් යැයි කලකිරී ඉවත ගියෙමි. එසේම මේ භාග්‍යවතුන් වහන්සේගේ කයෙන් කෙරෙන කටයුතුවලදී, කිසියම් අයහපත් බවක් ඇතොත් මැනවැයි, තම අල්ප වූ දැනුම නැමති හොටින් අනිමින්, හැමතැනම පසුපස ගියද, (එතුමන්ගේ) මුදුමොළොක් බවම අත්විඳීමි. බලා සිටි සතුට කොයින්ද? දැන් අපි (සිතා සිටි) වින්දනය නොලබමින්, **කාකොව සෙලං ආසජ්ජ නිබ්බිජ්ජාපෙම ගොතමං** ඒ ගෝතමයන් හා ගැටී, මගහැර ඉවත්ව යමු' මෙසේ කියන මාරයාට සත්වසක් තිස්සේ දරන ලද පල රහිත උත්සාහය නිසාම බලවත් කණගාටුවක් ඇතිවිය. එයින් ඔහුගේ ලිහිල් වූ අඟ පසඟ නිසා බෙලුවපණ්ඩු නම් වීණාව කිසිල්ලෙන් ගිලිහී වැටිණ. ඒ වීණාව එක් වරක් ඇඟිලිවලින් වාදනය කළවිට සිවුමසක් මිහිරි නාද නිකුත් වෙයි. සක්දෙව් එය (අහුලා)ගෙන පන්සිළුට දුන්නේය. වීණාව ගිලිහී වැටෙද්දීත් මාරයාට නොවැටහිණ. **තස්ස සොකපරෙතස්ස වීණා කච්ඡා අභස්සථ තතො සො දුම්මනො යක්ඛො තත්ථෙවන්තරධායථ** යැයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ. ඇතැමෙක් එය සංගායනාවට සහභාගී වූ හිමිවරුන් කී බව දක්වති. ඒ පිළිබඳව අපගේ වෙසෙස් රුචියක් නැත.

**පධාන සූත්‍ර විස්තරය නිමි.**

# 3.3

**එවං මෙ සුතං** යනු සුභාසිත සූත්‍රයයි. එය (වෙනත් කෙනෙකුගේ විමසීමකට නොව) තම අදහස පරිදි දේසනා කරන ලදී. භාග්‍යවතුන් වහන්සේ යහපත් වචනයට කැමති වෙති. යහපත් වචන කතා කිරීමෙන් පුද්ගලයන් අයහපත් වචන කතාකිරීම වැළැක්වීමට මෙම සූත්‍රය වදාළහ. එහි **එවං මෙ සුතං** සංගායනාවට සහභාගි වූ හිමිවරුන්ගේ වචනයි. **තත්‍ර ඛො භගවා........... භදන්තෙ තෙ භික්ඛූ** යනුවෙන් මෙහි සඳහන් නොවේ. ඉතිරි කරුණු කලින් කියා ඇති අයුරිනි. එහෙයින් විස්තර සඳහන් නොවූ වචන ගැන මෙහි දක්වනු ලැබේ. තත්‍ර (දේසනා කරන ලද) තැන හා කාලය දැක්වීමයි. වැඩවසන කාලයෙහි, වැඩවසන ආරාමය අදහස් වේ. එයින් කිවයුතු දේ සහ, දේසනා කාලය පෙන්වා දෙයි. භාග්‍යවතුන් වහන්සේ නුසුදුසු තැන හෝ නුසුදුසු වේලාවෙහි දහම් නොදෙසති. 'බාහිය, ඔබට (දහම් දෙසීමට) මේ කාලය නොවේ. 'අකාලො ඛො තාව බාහිය' ආදී තැන් නිදසුන්ය. ඛො යනු පදයක අඩු තැන් පිරවීමට හෝ අවධාරණයෙන් කිවයුතු විටකදී යොදන නිපාතයකි. භගවා ලෝකවාසීන් ගරු බුහුමන් පළකිරීමට (තථාගතයන් වහන්සේට යෙදූ වදනකි.) භික්ඛූ කතාව ඇසීමට බලාපොරොත්තු වන පුද්ගලයන් පිළිබඳව සඳහන් කිරීමකි. **ආමන්තෙසි** ඇමතීය, වදාළේය. (ඇමතුහ) වටහා දුන්නේය. **භික්ඛවෙ** ඇමතූ අයුරුය. එයින් පිඬුසිඟා යාම, සිල් ආදී මහණුන් අනුගමනය කරන යහගුණ එකතුව ගැනද කියන ලදී. ඒ අනුව ලාමක වූවන් විසින් සෙවුනා ලද පැවැත්ම පැවිදි පිරිසට පවසමින් උඩඟු බැගෑබවෙහි දොස් දක්වති. **භික්ඛවෙ** කරුණාව පැතිරුණු හදවතින් හා නෙතින් යුතුව, කරුණා දයා පිරි වදනින් තම මුහුණ දෙසට (අසන පිරිස) යොමු කරවාගෙන, එහිදී පැවසීමට කැමති වන කරුණු පහදා දෙමින්, තමාට සවන් දීමට කැමැත්ත උපදවයි. එසේම, පහදා දෙන කරුණු, මනාව ඇසීමටත්, මෙනෙහි කිරීමටත්, මනාව ඇසීමෙන් මෙනෙහි කරවීමෙන් සසුන් සම්පතෙහි යොදවති. වෙනත් දෙව් මිනිසුන්ද පැමිණ සිටිනවිට (මෙහිදී) කවර හෙයින් මහණුන්ට ඇමතූ සේක්ද? දෙටු බවින්ද, උසස් බවින්ද සමීපව හා හැමවිටම තැන්පත් බවද සළකාය. මේ දහම් දෙසුම එක් තැනැත්තෙකුට නොව හැමටම ගැළපෙන, සුදුසුවන බැවින්ද, පිරිස අතරෙහි ද දෙටු මහණ මුල්තැන ගනී. ගිහි ජීවිතයෙන් වෙන්ව අනගාරික වීම මුල්කොට උසස් වේ. (මුළු පිරිසෙහිම) නායකයාට සමීප වෙමින්

(තථාගතයන් වහන්සේ අනුගමනය කරමින් ද) හැමවිටම තැත්පත් බවින් යුතුව, සමීපව හැසිරෙන බැවින්ද, සියළු පිරිසට ගැලපෙන පරිදිම දහම් දෙසමින් පැවිදි පිරිසම ඇමතු සේක. එමෙන්ම මේ කතාබහට ගැළපෙන පරිදි හා ඒ යහපත් පිළිවෙතට සුදුසු ලෙසද එසේ ඇමතුහ. **භදනෙත** ගරු සැළකිලි හඟවන වචනයකි. **තෙ භික්ඛූ** භාග්‍යවතුන් වහන්සේ යම් පිරිසකට ඇමතු සේක්ද, ඒ පිරිස උන්වහන්සේට එසේ ගරුකරමින් 'ගරු හිමියනි' යනුවෙන් පිළිවදන් දුන්හ.

**චතුහි අංගෙහි** කරුණු සතරකින් හෝ කොටස් හතරකින් බොරු කීමෙන් වැළකීම වැනි යහපත් වචනයට අදාල කරුණු හතරින්, ඇත්ත කතා කිරීමේදී ඊට යොමුවන කොටස් හතර, **චතුහි** අවධි විබත් වචනයකි. කරණකොට අරුතින් යෙදී ඇත. **සමනනාගතා** සමනු ආගතා ඒ අනුව පැමිණි, පවතින, යුතු, **වාචා** 'කතාබහ කරන වදන්' වාචා ගිරා ව්‍යපපථො 'හොඳ කණට මිහිරි වූ' - 'නෙළා කණ්ණසුඛා ආදී ලෙස යෙදී ඇත. එමෙන්ම වචනය කරන ලද දෙයක 'ඇඟවීමක්' ද වේ. 'වාචාය චෙ කතං කම්මං, 'සතරාකාර වූ දුසිරිත් වචනයෙන් වෙන්වීම යහපත් වචනය යැයි කියනු ලැබේ. 'යා චතුහි වචී දුච්චරිතෙහි ආරති....පෙ.... 'අයං වුච්චති සම්මා වාචා 'මෙසේ වැළකීම් අරුතෙහිද වේ. 'මහණෙනි, නපුරු වචන නිතර කීමෙන්, ඊට පුරුදු වීමෙන්, වැඩි වැඩියෙන් යොදා ගැනීමෙන් නිරයෙහි ඉපදීමට හේතුවේ.' එරූසා වාචා භික්ඛවෙ ආසෙවිතා, භාවිතා, බහුලීකතා නිරයසංවත්තනිකා හොති' - මෙහි සිතිවිල්ලද, වචනයද ඇතුළත් වේ. එහෙත් මෙහිදී එය අදහස් නොකෙරේ. කවර හෙයින්ද? නොකිව යුතු බැවිනි. **සුභාසිතා හොති** යහපත් ලෙස කියන ලද්දේ වෙයි. එයින් එහි යහපත් අරුතක් ඇති බව දැක්වෙයි. **න දුබ්භාසිතා** අයහපත් ලෙස නොකියන ලද, එයින් අයහපතක් නොවන බව දැක්වෙයි. **අනවජ්ජා** වැරදි ලෙස කියන ලද රාග - තරහ ඇති කරවන ගති නැති, එයින් අදාල දෙයෙහි පිරිසිදු බව - යහපත් බව තහවුරු බව කීමෙහිදී (එහි අනික් අරුත) වැරදි බව දැක්වීමයි. **අනනුවජ්ජාච** දොස් නැගීමෙන් මිදුණු, එයින් හැමලෙසින්ම පිරිපුන් බව පෙන්වයි. **විඤ්ඤූනං** පණ්ඩිතයන්ට, එයින් ගැරහුම් පැසසුම් ලබන අනුවණයන් අපමණ යැයි පෙන්වා දෙයි. **කතමෙහි චතුහි** කියාදීමට කැමතිව විමසීමයි. **ඉධ** මේ සසුනෙහි, **භික්ඛවෙ** එය පවසනු කැමතිව කරන ඇමතීමයි. **භික්ඛූ** ඉහත සඳහන් කරන ලද පරිදි වචන කියන තැනැත්තා පෙන්වා දෙයි. **සුභාසිතං යෙව භාසති** පුද්ගලයන් උදෙසා කරන දේසනයෙහි සිවු ආකාර වූ වචනයෙන් එක්

ආකාරයක් සඳහන් කිරීමයි. නො දුබ්භාසිතං ඒ වචනයට පටහැනි වූ වචන කීමෙන් වැළකීමයි. එයින් කවර විටක හෝ බොරු කිවයුතු නම්, ඒ හැඟීමෙන් වැළකෙයි. නො දුබ්භාසිතං මෙයින් වැරදි වචන (කීම) දුරු කෙරෙයි. සුභාසිතං වැරදි වචනවලින් වැළකී කිවයුතු වචන හඳුනා ගැනීමෙන්, අයහපත් නොකිරීමත්, කුසල් රැස්කර ගැනීමත්, මුලදීම දුසිරිතට අදාල වන වචන නොකිය යුතු බවත් කිවයුතු වචන ගැනත් පැහැදිලි කළහ. ධම්මඤ්ඤෙව යන වචනය ගැන ද එසේය. සුභාසිතං යෙව භාසති, නො දුබ්භාසිතං මෙයින් කේලාම් වැනි වැරදි වචන කීම අත්හැර, සමගියට හේතු වන වචන පිළිබඳව කියන ලදී. ධම්මං යෙව භාසති නො අධම්මං මෙයින් පලක් නැති, හරයක් නැති වචන කීමෙන් තොරව, හොඳයැයි පිළිගත් වචන කීම පිළිබඳව කියා ඇත. නපුරු බවින් හා මුසාවෙන් තොර වූ අනෙක් දෙආකාර වචන (කොටස) පියසවච යනුවෙන් අදහස් වේ. ඉමෙහි බො මේ ලෙසින් එබඳු ගුණයෙන් යුතු වචන, නුවණින් විමසා බලා පවසයි. ඉමෙහි බො භික්ඛවෙ චතුහි අංගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති මෙහි වෙසෙසින් දැක්විය යුතු වන්නේ වචන කතාකරන විට, එය කියන ආකාරයෙන්ද, ලිඟු, විබත්, කාලය හා යෙදෙන සැටියෙන්ද වචනයෙහි යහපත් බව හැඟී යාමයි. ඒ යහපත් ගතියෙන් (වචනයේ) අයහපත් බව වැළකෙයි. වචනයෙහි ඒ ඒ කොටස් (ආකාරය) අනුව කේළාම් සොබාවයෙන් යුතු වචනද නරකය. එය තමන්ටත්, අනුන්ටත් අයහපතම ගෙන දෙයි. මේ කොටස් හතරට ගැනෙන (යහපත්) වචන වේ නම්, හැදියාවක් නොවූ බස්වහරකට (මිලක්ඛභාසා) හුරු දිය පිරුණු කලයක් ගෙන ගිය කෙල්ලක ගැයූ ගීතයක් වුවත් යහපත් වචන වේමය. හෙළ දිවයිනෙහි, මාවතක් අසල, කෙතක් රකිමින් සිටි සිංහල මෙහෙකාර කෙල්ලක සිහල බසින්ම ගායනා කරන ලද, ඉපදීම, ජරාව හා මරණය ගැන කරුණු ඇතුලත් ගීයක් අසා, මග යමින් සිටි විදසුන් වඩන සඟ සැටනමක් එහිම රහත් බවට පත්වීම නිදසුන්ය. එසේම විදසුන් වැඩීමෙහි උත්සාහවත් වූ තිස්ස නම් හිමිනමක්, නෙළුම් විලක් අසළින් යද්දී නෙළුම් විලෙහි නෙළුම් මල් නෙලමින් සිටි මෙහෙකාර කෙල්ලක ගයන ලද 'මනහරව පිපුණු මේ රත් පියුම, හිරු එළියෙන් පීඩාවට පත්කරනු ලබයි, එසේම මිනිස්වගද ජරාවෙන් මඩිනු ලබයි' යන (අරුත් ඇති) ගීතය.

පාතඵුල්ලිතකොකනදං සුරියාලොකෙන තජ්ජියතෙ
එවං මනුස්සත්තගතා සත්තා ජරාභිවෙගෙන මද්දීයන්ති

අසා රහත් බව ලැබීය. බුදුවරයකු පිරිනිවීමෙන් පසු නැවත බුදුවරයකු පහලවීමට පෙර කාලයේදී, පුතුන් සත්දෙනා සමග කැලයෙන් ආ එක් මිනිසෙක්, එක්තරා ගැහැණියක මොහොලෙන් සහල් කොටද්දී, 'දැඩිසේ ජරාවෙන් මඩනා ලද, මැලවුනු සම හා සිවියෙන් යුතු මේ (සිරුර) මාරයාට ගොදුරක්ව මරණයෙන් බිඳේ.'

'මෙය පණුවන්ට ආකරයකි. නොයෙක් පිළිකුල් දෙයින් පිරුණකි. අපිරිසිදු දුගඳ බඳුනකි. කෙසෙල් කඳක් හා සමානය' යන අරුත් ඇති,

ජරාය පරිමද්දිතං එතං මිලාතචඡවිචම්මනිස්සිතං
මරණෙන භිජ්ජති එතං මච්චුස්ස ඝසමාමිසං

කිමීනං ආලයං එතං නානාකුණපෙන පූරිතං
අසුචිස්ස භාජනං එතං කදලික්ඛන්ධසමං ඉදං'

මෙම ගීතිකාව අසා සියල්ලෝම පසේ බුදුබවට පත්වූහ. මෙබඳු අයුරින් වෙනත් තැනැත්තන්ද එවන් උතුම් තැනකට පැමිණීම නිදසුන්ය. 'හේතුවක් ඇතිව සකස් වූ සියළුම දේවල නිති පැවැත්මක් නැතැයි 'සබ්බෙ සංඛාරා අනිච්චා' - භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ඒ තැනැත්තන්ගේ හිත් හසර දැන වදාරන ලද ගාථා අසා පන්සියයක් මහණුන් රහත් බවට පත්වීම පුදුමයක් නොවේ. නොයෙක් දෙවි මිනිසුන් ද (රූප වේදනා) ආදී සමූහ කොටස් ගැන හා (ඇස, කණ) ආයතන පිළිබඳ වූ වෙනත් දේසනා අසා රහත් බවට පත්වීම ද (සැළකිය යුතුය.)

මෙසේ මේ කොටස් සතරකින් යුතු වචන, හැදියාවකට පත් නොවූ බසක හෝ දිය කළ ගෙනයන මෙහෙකාර කෙල්ලකගේ ගීතයක් වුව හෝ යහපත් යැයි දතයුතුය. යහපත් බැවින් එය වැරදි රහිතය. එහි වැටහීමක් පතන නැණවත් කුලපුතුනට අරුතම උපකාරී වේ. අකුරු යෙදුන හැටි පිළිසරණ නොවේ. **ඉදමවොච භගවා** මේ යහපත් කරුණු භාග්‍යවතුන් වහන්සේ වදාළහ. **ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා** මේ කරුණු කියා තවදුරටත් භාග්‍යවතුන් වහන්සේ මෙසේ ද කීහ. දැන් ඒ සඳහා කිවයුතු ගාථා දක්වමින්, ඒ ගාථා සියල්ලම සංගායනාවට සහභාගි වූ හිමිවරු කීහ. එහි **අපරං** යනු ගාථාව සකස්වන වචන සබඳතාව (ගොඩනැගීම) සඳහා කියනු ලැබේ. එය දෙආකාර වෙයි. පසුව පැමිණි

පිරිසට ඇසීමට නොලද කරුණු දැනගැනීමට ඉඩ සලසමින්, එය තහවුරු වන පරිදි, අරුත් පැහැදිලි වන සැටි එයින් අදහස් වේ. කලින් කිසියම් කරුණක අරුත පැහැදිලි කිරීමේදී (අසන්නාට) අඩුලුහුඩුතාවක් සිදුවීනම්, එය වඩාත් පැහැදිලි වීම (දෙවැනි හේතුවයි.) 'උපන් මිනිසාගේ මුවෙහි කෙටේරියක් ද හටගනී' - 'පුරිසසස හි ජාතසස කුඨාරී ජායතෙ මුඛෙ' වැනි සඳහන් මෙනි මෙහි ද ඒ අරුත් දැක්වීම පිණිස වේ.

**සනෙතා** බුදුවරු ආදී උතුමන්, උන්වහන්සේලාගේ යහපත් වචන, කියමන් උතුම් යැයි, උසස් යැයි අගය කරනු ලබයි. **දුතියං තතියං චතුත්‍ථං** මෙය කලින් සඳහන් කරන ලද පිළිවෙල සඳහා කියන ලදී. ගාථා අවසානයෙහි වංගීස හිමි භාග්‍යවතුන් වහන්සේ වදාළ යහපත් වචනයෙහි පැහැදුනේය. වංගීස හිමි භාග්‍යවතුන් වහන්සේගේ වචනයට පැහැදුණු බව පෙන්වා දෙමින් **අථඛො ආයසමා** යැයි සංගායනාවට සහභාගි වූ හිමිවරු පැවසූහ.

**පටිභාති මං** මට කිසියම් අදහසක් පැවසීමට ඇත. **පටිභාතු තං** ඔබගේ අදහස පවසන්න. **සාරුපපාහි** සුදුසු අයුරින්, අභිත්‍ථවි පැසසුම් කළේය. **න තාපයෙ** විපිළිසරව, තැවීමට, දුකට පත් නොවන්නේය. **න විහිංසෙය්‍ය** එකිනෙකා බිඳවීමෙන් වැළකෙන්නේය. **සා වෙ වාචා** එබඳු වචනය ඒකාන්තයෙන් යහපත්ය. මෙපමණකින් කේළාම් නොකීම මතුකරමින් භාග්‍යවතුන් වහන්සේට තුතිපැසසුම් කළේය. **පති නන්දිතා** සතුටු හදවතින් ඉදිරියට ගොස්, කැමති ලෙසින් සතුටට පත්කරන ලද්දේය. **යං අනාදාය පාපානි පරෙසං භාසතෙ පියං** යම් වචනයක් කියන්නේ නම්, එය අනුන්ට අයහපත වන. අකැමති වන, පිළිකුල දනවන, නපුරු ලෙසට නොව, අරුත් පිරි, මිහිරිව, කැමතිවන පරිදිම කියයි. **පියවාචමෙව භාසෙය්‍ය** යැයි එය සඳහන් කරන ලදී. මේ ගාථාවෙන් භාග්‍යවතුන් වහන්සේට පිය වදනින් තුති පැසසුම් කළේය. **අමතා** යහපත් බවින් අමා බඳු, 'රස අතුරෙන් ඇත්ත ඒකාන්තයෙන්ම උසස්ම රසය බව 'සච්චං හවෙ සාදුතරං රසානං' කියන ලදී. නිවනට හේතුවන බැවින්ද අමා නම් වේ. **එස ධම්මො සනනතනො** ඇත්ත කතාකිරීම ඉපැරණි කලක සිට පැවතෙන සිරිතකි. පෙර සිට පැවතෙන යහපත් හැසිරීමේ ගුණයකි. මෙය පෙර පටන්ම පුරුදු කරන ලද්දකි. ඔව්හූ බොරු බස් නොපැවසූහ. **එහෙයින් සච්චෙ අත්‍ථෙච ධම්මෙච ආහු සනෙතා පතිට්ඨිතා** යැයි කීය. **ඒ අනුව** ඇත්ත කතාකරන බැවින්, තමන්ද, අනුන්ද මනා වැටහීමෙහිද

පිහිටියහ. වැටහීම ඇති බැවින් පිහිටියාහුයැයි දතයුතුය. අන් තැනැත්තන් ඇත්ත මුල්කොට (පල ලබන අයුරු) මෙසේ දතයුතුය. ඒ කෙබඳුද? වැටහීමෙන් හා යහපත් බවිනි. එයින් අනුන්ට අවහිර නොවේ. සිහියද අවහිර නොවී පවත්නා බැවින්, දැහැමි යහපත් බවද වේ. යහපතම සිදුවේ යැයි කියන ලදී. මේ ගාථාවෙන් ඇත්ත කීම පිළිබඳව භාග්‍යවතුන් වහන්සේට තුති කළේය. **ඛෙමං** බිය නැති, උවදුරු නැති, ඒ කුමක් නිසාද? **නිබ්බාණපත්තියා. දුක්ඛස්සන්තා කිරියාය** යම් ලෙසකින් කෙලෙස් සිඳලන්නේ ද එය සසර දුක නැති කිරීමද වන්නේ යැයි තේරුමයි. **යං බුද්ධො නිබ්බාණපත්තියා දුක්ඛස්සන්තකිරියාය** නැතහොත් (සොපාදිසෙස- අනුපාදිසෙස) දෙයාකාරව හඳුන්වනු ලබන නිවනෙහි බිය රහිත මග පැවසීමෙන් **ඛෙමං** යනුවෙන් දක්වයි. **සා වෙ වාචානමුත්තමං** එම වචනය සියළු වචනවලින් උසස් යැයි මෙසේ ද අරුත දතයුතුය. මේ ගාථාවෙන් ද භාග්‍යවතුන් වහන්සේට හැම ලෙසින්ම තුති කරමින්, අරහත් පලය කුළුගන්වා දේසනය නිම කළේය. මේ කලින් නොදැක්වූ වචනවල විස්තරයි. ඉතිරි වචන ගැන කලින් කියා ඇති පරිදි දතයුතුය.

**සුභාසිත සූත්‍ර විස්තරය නිමි.**

# 3.4

**එවං මෙ සුතං** පූරළාස සූත්‍රයයි. එම සූත්‍රය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ පසුබත් කිස අවසන බුදුඇසින් ලොව බලන සේක්, සුන්දරීක භාරද්වාජ බමුණු රහත් පලයට පත්වීමේ හේතුසම්පත් දැක, 'මා එහි ගියවිට ඇතිවන කතා සල්ලාපයෙන් පසු දහම් අසා, ඒ බමුණා පැවිදිව රහත් බවට පත්වන්නේ යැයි දැන, එහි ගොස්, (පිළිසඳර) කතාකොට මේ සූත්‍රය වදාළහ.

එහි **එවං මෙ සුතං** සංගායනාවට සහභාගී වූ හිමිවරුන්ගේ වචනයි. **කිං ජච්චා භවං** ආදිය ඒ බමුණාගේ (වචනයි). **න බ්‍රාහමණො නොමහි** ආදී භාග්‍යවතුන් වහන්සේගේ (වචනයි). ඒ සියල්ල එක්කොට පූරළාස

සූත්‍රය යැයි කියනු ලැබේ. සඳහන් නොවූ වචන විස්තර කරන්නෙමි. එහිද අරුත් පැහැදිලි වචන අත නොගසන ලදී.

**කොසලෙසු** - කෝසල ජනපදයෙහි රජකුමරුවෝ, ඔවුන් වසන තැනද කෝසල ජනපදය නමින්ම කියනු ලැබේ. එම කෝසල ජනපදය ගැන ඇතමෙකුගේ අදහස මෙසේය. 'පෙර මහාපණාද රජුගේ පුත් කුමරුවන්, නොයෙක් නොයෙක් රැඟුම් නාටක දැක සිනාවක් පමණකුදු නොකරති'යි ඇසූ රජු, 'යමෙකු මපුතු සිනහ ගන්වතොත්, ඔහු සියළු අබරණින් අලංකාර කරමි'යි අණ ලැවීය. මහජනයා (තම කටයුතු අත්හැර) නඟුල් ආදිය පසෙක තබා රැස්වෙයි. ඒ මිනිස්සුද තවත් සත් අවුරුද්දක්ම නොයෙක් කවට රැඟුම් ආදිය දැක්වුවත් සිනාගැන්වීමට නොහැකි වූහ. එවිට සක්දෙවිඳු දෙව් නළුවකු යැවීය. ඔහු දිවනාටක, රැඟුම් දක්වා සිනාගැන්වීය. ඉක්බිති ඒ මිනිස්සු තම තමන්ගේ නිවෙස් දෙසට ගියහ. ඔව්හූ ඒ යන අතරේදී, හමුවන සුහද මිතුරන් දැක, 'එම රැඟුමෙහි (නළුවාගේ) හැකියාව-කුසලතාව කෙබඳුදැ'යි, පිළිසඳර කතා කළහ. එහෙයින් ඒ කුසල යන පදය අනුව එම පෙදෙස 'කෝසල' නම් වීයැයි විස්තර කරනු ලැබේ. **සුන්‍දරිකාය නදියා තීරෙ** සුන්දරිකා නම් වූ ගංතෙරෙහි, **තෙන ඛො පන** ඒ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණා දහමෙහි හික්මවනු කැමතිව, ඒ ගංතෙර, හිස වසා පොරවාගෙන ගසක් මුල හිඳගත් සේ පෙනෙන ඉරියව්වෙන් වැඩ සිටිති. **සුන්‍දරික භාරද්වාජො** ඒ බමුණාද ඒ ගංතෙරම වාසය කරයි. ගිනි පුදයි. **භාරද්වාජො** ඔහුගේ පරම්පරාවයි. එහෙයින් එසේ කියනු ලබයි. (පරම්පරා නමින් අමතනු ලබයි.) **අග්ගිං ජුහති** යාග පූජා පැවැත්වීමේ අදහසින් ගිනි දල්වයි. **අග්ගි හුතතං පරිචරති** ගිනිදල්වා, බිලි පිදවිලි ආදියෙන් උතුම් ගිනි දෙවියාට පුද දෙයි.

**කො නු ඛො ඉමං හව්‍යසෙසං භුඤ්ජෙය්‍ය** ඒ බමුණා ගිනි (පිදීමට) ගෙන ඉතිරි වූ කිරිබත් ආදිය දැක, 'ගින්නෙහි තැබූ කිරිබත් මහා බ්‍රහ්ම විසින් අනුභව කරන ලදී. මෙහි තවත් ඉතිරිව ඇත. ඒ ඉතිරිව ඇති දේ බ්‍රහ්මයාගේ මුවින් උපන් බමුණකුටම දිය හැකිනම්, මගේ පියා සහ පුතුද සතුටුවී, බඹලොවට යන මග හෙළිකරගනු ඇත. එහෙයින් බමුණකු සොයමි'යි සිතුවේය. **උට්ඨායාසනා චතුද්දිසා අනුවිලොකෙසි** මේ ඉතිරි පූජාව අනුභවයට කවරෙකු සුදුසු වෙත්දැ'යි බමුණකු දැකගනු පිණිස.

අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ ඒ කැලෑගොමුවෙහි සුවිසල් ගසක් මුල, යසීසං පාරුතං හිස සමගම සිරුර පොරවාගෙන, කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ එසේ කළසේක්ද? 'නාරයණ' නම් වූ බලයක් තිබුණද, හිමපතනය සහ සීතල සුළඟ වුව වැළැක්වීමට නොහැකි වීද? මෙයට හේතුවක් ඇත. බුදුවරු හැමවිටම එසේ සිරුර පිළිදැගුම්-රැකගැනීම නොකරත්මය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ, 'බමුණා පැමිණිවිට හිසෙන් සිවුර ඉවත් කරන්නෙමි. ඒ දැක බමුණා කතාබහට එක්වන්නේය. එවිට ඔහුට ඒ කතාබහ අනුව දහම් දෙසන්නෙමි'යි ඊට මග පාදාගනු පිණිස එසේ කළහ. දිසවාන වාමෙන -පෙ- තෙනුපසංකමි සුන්දරික බමුණා භාග්‍යවතුන් වහන්සේ දැක, 'මේ බමුණා හිස සිට පොරවාගෙන මුළු රැයම කෙලෙස් තවන උත්සාහයෙන් යුතු විය. මොහුට පූජා පැවැත්වීමට පෙර, පැන් පිළිගන්වා, මෙම යාගයේ ඉතිරි පූජා කොටස දෙමි'යි බමුණෙකැයි සිතාම (එතැනට) පැමිණියේය. මුණ්ඩො අයං භවං මුණ්ඩකො අයං භවං හිසෙන් සිවුර ඉවත් කළ පමණින්ම, හිසකෙස් කෙළවර දැක, මුණ්ඩො යැයි කීය. ඉන්පසු තවත් හොඳින් බලද්දී, හිසෙහි මද හෝ සිළු (ගුලි වූ කෙස් කැරළි) නොදැක පහත් ලෙස සිතමින්, මුණ්ඩකො යැයි කීය. ඒ බමුණන්ගේ හැඟීම මෙබඳුය. තතො ව එය දුටුවේ යම් තැනක සිටද, මුණ්ඩාපි හිස මුඩුකර ඇත්තේ කිසියම් හේතුවක් නිසා වෙයි.

න බ්‍රාහමණො නොමහී මෙහි න අකුර වැළකීම අදහසින් යෙදේ. නො දැඩිලෙස (අවධාරණයෙන්) වෙන්කොට දැක්වීමෙහි යෙදේ. 'ඒ හා සමාන නොවේ' - 'න නො සමං ආදී තැන් මෙනි. එම වචනයෙන් තමා මෙන් බමුණකු නොවේ යැයි දක්වයි. න රාජපුතෙතා රජ කුලයෙහි නොවේ. න වෙසසාය නො වෙළඳ කුලයෙහි නොවේ. උද කොචි නොමහි සුද්ද කුලයට අයත් හෝ සැඩොලෙක් හෝ වෙනත් කිසිවෙක් නොවෙමි. මෙසේ ඒකාන්තයෙන්ම ජාතිවාදී කතා පිළිකෙව් කරයි. කුමක් නිසාද? මහ සයුරට පත් ගංගා මෙන්, පැවිදි වූ කුලපුත්තු මුල් නම්ගොත් අත්හරිති. පහාරාද සූත්‍රය මෙහිලා නිදසුන්ය. මෙසේ කුලවාදය පිළිනොගෙන, තමාගේ නියම තතු එළිදරව් කරමින්, ගොතතං පරිඤ්ඤාය පුථුජ්ජනානං අකිඤ්චනො මනත චරාමි ලොකෙ ආදී ගාථා වදාළහ.

කෙසේ මුළුමනින්ම පරම්පරාව දැනගත්තේ යැයි කියයිද? භාග්‍යවතුන් වහන්සේ තුන් ආකාරයකින් රූපාදී ඛන්ධ පහ මැනවින්

දත්හ. එසේ දැනගැනීමම පරම්පරාවම දැනගැනීමය. රාග ආදී කෙලෙස් කෙලෙස් නොමැති බැවින් උන්වහන්සේ 'කිසිවක් නැති' බවට පත්වූහ. පිළිපැදිය යුතු කරුණු හෝ මන්ත්‍ර දැන, නුවණ මෙහෙයා කායික කටයුතුවල යෙදෙති. එහෙයින් **ගොතතං......ලොකෙ** යැයි කීහ. මනතා යනුවෙන් නුවණට කියනු ලැබේ. ඒ අනුව හැසිරෙන බැවින්, **මනත චරාමි ලොකෙ** යැයි කීහ. ඡන්‍දස අනුව වචනය කෙටිකොට ඇත. මෙසේ තමන් ගැන පැහැදිලිකොට, දැන් දළ ජීවිත රටාව බලා, 'ඇසිය යුතු - නොඇසිය යුතු දේ නොදන්නෙහිදැ'යි බමුණාට දොස් නගන්නා සේ **සංඝාටි වාසී.... ගොතත පඤ්හං** යැයි කීහ. කොටස් ලෙසින් කපා සකස්කොට ඇති අදහසින් තුන් සිවුරු මෙහිදී **සංඝාටි** යැයි සැළකේ. ඇඳ ගනී. හඳී, දරයි යනුවෙන් ඒවා **සංඝාටිවාසී** වේ. **අගහො** ගෙයක් නොමැති, ආසාවක් නැති යන අදහසයි. භාග්‍යවතුන් වහන්සේ වැඩවසන තැන් ලෙස, ජේතවන අරමෙහි මහ සුවඳ කුටිය, ලුණුවරණ ගස්වලින් වටවූ සාලාව, කොහොඹ කුටිය, සඳුන් මාලය නොයෙක් අයුරින් දක්වා ඇත. එය මෙහිදී සැළකීම නුසුදුසුය. **නිවුතත කෙසො** ඉවත් කරන ලද කෙස්, කපන ලද කෙස්රවුල් ඇතැයි කියන ලදී. **අභිනිබබුතතෙතා** තැවීම්, සෝකවීම් සමනයකොට, රැකගත් සිතැතිව, **අලිපපමානො ඉධ මානවෙහි** උදව් කරගැනීමට ඇති සෙනහස (සෙනෙහස දක්වා වාසි ලබාගැනීම) ඉවත හළ බැවින්, මිනිසුන් සමග නොඇලී, නොගැටී, ඈත්ව තනිව මෙන් සිටිමින්, අකලල මං **බ්‍රාහමණා** මෙසේ සඟල සිවුර හැඳ පොරවා..... මිනිසුන් හා නොඇලී වසන, මගෙන්, බමුණ, ඔබ පෙර පැවිදි වූවන් හා සමානකොට නුසුදුසු පරිදි **ගොතත පඤ්හං පුචඡසි** සුපුරුදු ලෙස නම්ගොත් අසහි?

මෙසේ කී කල්හි, දොස් නැගීමෙන් නිදහස්වීමට මෙන් බමුණා **පුචඡනති වෙ භො බ්‍රාහමණා බ්‍රාහමණෙහි සහ බ්‍රාහමණෙ නො භවං** යැයි කීය. **බ්‍රාහමණෙ නො** බමුණකු නොවේ ද යන අදහසයි. ඒ අනුව කියන ලද්දේ මෙයයි. 'පින්වත, මම නුසුදුසු ලෙස නොඅසමි. බමුණෝ එක්රැස් වූ විට, අපගේ බමුණු දහමට අනුව, ඔබ බමුණෙක්ද, භාරද්වාජ පරපුරේ නොවේදැයි මෙසේ කුලය, පරම්පරාව විමසති. මෙසේ කී විට, භාග්‍යවතුන් වහන්සේ, බමුණාගේ සිත මොළොක් බවට පත් කිරීමට තමන් පිළිබඳ ඇති තතු පෙන්වා දෙමින්, **බ්‍රාහමණෙ වෙ ත්වං බ්‍රෑසි -පෙ- චතුවීසතකඛරං** යන ගාථාව වදාළහ. එහි අදහස නම්, 'එසේනම් ඔබ, 'මම බමුණෙක්මි' යැයි (අනිකක්) කියහි, **මඤ්ච අබ්‍රාහමණං බ්‍රෑසි** එහෙයින් පින්වත, (ඔබගෙන්) **සාවිතතිං පුචඡාමි තිපදං චතුවීසතකඛරං** එය මට කියව. මෙහිදී භාග්‍යවතුන්

වහන්සේ, පරම අරුත වූ, තුන් පිටකයෙහි මුලින්ම ඇති, සියළුම බුදුවරුන් හා මහ රහතුන් විසින් පවසන ලද අරුතින් පිරිපුන්, මැනවින් පිළියෙල වූ **බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි** යන මෙම උතුම් 'වේදය' සඳහා විමසති. යම් හෙයකින් බමුණා වෙනත් දෙයක් කියන්නේ නම්, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සෙ ඔහුට 'බමුණ, (තථාගත) දහම් විනයෙහි 'වේදය මෙය නොවේ' යැයි (ඔවුන්ගේ) වේදයෙහි අසාර බව පෙන්වා, (සාර) දහමෙහි පිහිටුවන්නේය. 'අකුරු විසිහතරකින් යුත් පද තුනක් ඇති වේද වැකිය අසමි'යි තම අදහස ඉටුවන වේදයේ ලකුණු මෙන් හරවත් වූ, ගැඹුරු-උසස් හඬින් නිකුත්වන වචන අසාම, 'ඒකාන්තයෙන්ම මේ මහණ බමුණු දහමෙහි අවසනටම ගියේය. මම නොදැනුවත්කමින් බමුණකු නොවේ යැයි මොහුට නින්දා කළෙමි, (වේද) මතුරුවල එතරට ගිය මොහු බමුණකුම වේ'යැයි තීරණය කොට, 'එසේනම් මොහුගෙන් නොයෙක් යාග කරන අයුරු හා පූජා කළයුතු අයුරු විමසමි'යි **කිං නිස්සිතා.........ලොකෙ** යන සම නොවූ පේළි දෙකකින් යුතු මෙම ගාථා දෙක කීය. එහි අරුතනම්, **කිං නිස්සිතා** කුමක් අදහස් වේද? පතන්නේ කුමක්ද? **ඉසයො ඛත්තියා බ්‍රාහ්මණා,** වෙනත් මනුජා දෙවතානං මොවුන් වෙනුවෙන් **යඤ්ඤං අකප්පයිංසු යඤ්ඤ මකප්පයිංසු** 'ම' අකුර වචන සන්ධි කිරීමේදී යෙදේ. **අකප්පයිංසු** සංවිධාන කළහ. පුදු ආහාරපාන දීම ආදියෙන් නොයෙක් ආකාරයෙන් බොහෝ ඉසිවරු, මිනිස්සු, රජවරු, බමුණෝ කුමක් හේතුකොට යාග කළාහුද? කෙසේ ඔවුන්ගේ ඒ කටයුතු ඉටුවේද? යන මේ අදහසින් අසයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම කරුණු පහදමින්, **යදන්තගූ වෙදගූ යඤ්ඤකාලෙ යස්සාහුතිං ලභෙ තස්සිජ්ඣෙති** බ්‍රෑමි යැයි මේ ඉතිරි පද දෙක වදාළහ. යදන්තගූ යමෙක් කෙළවරට ගියේද 'ඔ' අකුරට 'අ' එක්වීමයි. 'ද' කාරය පද සන්ධි කිරීමෙහි යෙදේ. 'අසාධාරණ මඤ්ඤෙසං' (අන් අයට පොදු නොවූ) මෙබඳු තන්හි 'ම' කාරය මෙනි. මේ එහි අරුතයි. **යො** සසරෙහි තුන්ආකාර වූ දැනීමෙන් - කෙළවරට ගිය බැවින් අන්තගූ, සිවු ආකාර වූ මග නුවණ දැනීමෙන් (සිවුසස් මගින් කෙලෙස් වනසා ගිය බැවින් වෙදගූ, එම ඉසිවරුන්, මිනිස්, රජුන්, බමුණන් අතුරෙන් **යස්ස** එක්තරා කෙනෙකුට, **යඤ්ඤකාලෙ** යම්කිසි ආහාරයක් ලැබුණුවිට යටත් පිරිසෙයින් කැලෑකොළ, මුල්, ගෙඩි ආදී දෙයක් ගෙනැවිත් දුන්විට, **ආහුතිංලභෙ** එයින් කිසියම් දියයුතු දෙයක් ලැබේනම්, **තස්ස** ඒ

යාග කටයුත්ත ඉජෙඣ ඉටුවන්නේය, මහත් පලදායී වන්නේ යැයි බ්‍රෑම් යනුයි.

ඉක්බිති බමුණ, භාග්‍යවතුන් වහන්සේගේ උසස් අදහස් කෙරෙහි යොමුවන, ගැඹුරු, ඉතා මිහිරි වදනින් යුතු ඒ දේසනය අසා සිරුරේ පැහැපත් බවට මෙන්ම, උන්වහන්සේගේ සියළු ගුණසම්පතටද ගරුසැළකිලි දක්වමින්, බොහෝ සතුටට පත්ව, අදධා හි තසසා යන ගාථාව කීය. ඉති බ්‍රාහමණෙ යනු සංගීතියට සහභාගී වූ හිමිවරුන්ගේ වචනයි. ඉතිරි වචන බමුණා කී දේය. එහි තේරුම නම්, අදධා හි තසස මට හුතම්ජෙඣ අද මේ දෙනු ලබන දෙය අදහස් ඉටුවන්නේය. මහත් පලදායී වන්නේය. යං තාදිසං වෙදගුං අද්දසාම යම් ලෙසකින් වේදයෙහි පරතෙරට ගිය එබඳු යහපත් කෙනෙකු දුටුවෙමු නම් වේදයෙහි පරතෙර පත් ඒ තැනැත්තා ඔබම මිස වෙනත් කෙනෙකු නොවේ. තුමහා දිසානං මීට පෙර, එසේ වේදයෙහි කෙළවරට ගිය, අදසසනෙන අප වැනි බමුණණන් පිළියෙල කරන ලද යාගය, අඤ්ඤා ජනො භුඤ්ජති පූරළාසං යාග බත හා කැවුම් (ආදී සියළුම පූජා කරන දේ)

එහිදී භාග්‍යවතුන් වහන්සේ, (තවදුරටත්) කරුණු පහදා දෙනවිට බමුණා තමා කෙරෙහි පැහැදෙන අයුරු දැන, දීමට (පූජාව) සුදුසු වන අයුරු මනාව හෙළිවන සේ නොයෙක් ලෙසින් පහදා දෙනු කැමතිව, තසමාතිහ ත්‍වං යන ගාථාව වදාළහ. එහි අරුත නම්, මා කෙරෙහි යම් ආකාරයෙන් පැහැදුණෙහි නම්, තසමා ඉහ ත්‍වං බ්‍රාහමණා, උපසංකමම පුචඡා යනුවෙන් තමන් දක්වමින් කීහ. දැන් මෙතැන් සිට අපෙථන අතථිකං යන වචන පසු සඳහන් වචනය හා සම්බන්ධ විය යුතුය. අපෙථනපථිකො ඔහුට උපකාරයක්, යහපතක් වන දෙයක් ලැබෙන පරිදි කෙලෙස් ගිනි නිවීමෙන් සනතං තරහ නැමති දුමාරය ඉවතලීමෙන් විධූමං, දුක නැති වීමෙන්, අනීඝං නොයෙක් ආකාර වූ ආසා නොමැති බැවින් නිරාසං අපෙපවිධ යනු, ඒකාන්තයෙන් මෙහි පිහිටා හෝ මේ සසුනෙහි හෝ, අභිවිඤෙ ලබහි, ලඟාකර ගන්නෙහි, සුමෙධං උතුම් නුවණැති, කෙලෙස් ඉවතහළ උතුමන්ට පිදිය යුතු දේ, නැතහොත් - බමුණ ඔබ මා කෙරෙහි යම් ලෙසකින් පැහැදුණෙහි නම්, ඔබ යම්දෙයක් බලාපොරොත්තු වේනම්, පැමිණ විචාරව, කෙලෙස් ගිනි නිවීමෙන් සන්සුන් වූ, තරහ නැමති දුමාරය ඉවතලූ, දුක් නැතිකළ, ආසා රහිත වූ තමන් දක්වමින්, මෙසේ නිසැකවම මේ සසුනෙහිම උතුම්, නුවණැති, පිදීමට

සුදුසු රහතන් වහන්සේ ලබන්නේ යැයි වදාළහ. එහි අදහස මෙසේ දතයුතුය.

ඉක්බිති, බමුණා අනුසාසනය පිළිපදිමින්, **යඤ්ඤං රතාහං භො ගොතම....... බ්‍රෑහි, මෙ තං** යැයි භාග්‍යවතුන් වහන්සේට පැවසීය. එහි යඤ්ඤ, යාග දාන එකම තේරුමය. එහෙයින් දීමෙහි **රතො අහං** කැමැත්ත ඇතත්, දියයුතු ආකාරය **කාමො න ජානාමි** මෙසේ නොදන්නා මට **අනුසාසතු මං භවං** පැහැදිලි වන ලෙසට අනුසාසනා කරනු මැනවි. **යථාභූතං ඉජෙඣ බ්‍රෑහි මෙ තං** මෙසේ එහි අදහස දතයුතුය. **යථාභූතං** යයි ද පදයක් ඇත.

එවිට භාග්‍යවතුන් වහන්සේ එය පැහැදිලි කරනු කැමතිව, **තෙන හි දෙසෙසසාමි** යැයි වදාළහ. අසනු කැමතිව සවන් යොමුකළ බමුණාට අනුසාසනා පිණිස **මා ජාති පුච්ඡ** යන ගාථාව වදාළහ. පූජා කළ දෙයින්, දෙන ලද දෙයින් මහත් බලාපොරොත්තු ඇතිකර ගන්නෙහි නම්, **මා ජාති පුච්ඡි** ජාතිය ගැන නොඅසව. පිදීමට සුදුසු තැනැත්තෙකුට දීමේදී ජාතිය හේතුවක් නොවේ. **චරණඤ්ච පුච්ඡ** එහෙත් සීලය ආදී යහගුණ පිළිබඳව - හැසිරීම ගැන අසව, පිදීමට සුදුසු තැනැත්තකුට දීමේදී එය ඇසිය හැකි කැරුණකි. දැන් ඒ කරුණු පැහැදිලි කරමින්, **කට්ඨා හවෙ ජායති ජාතවෙදො** ආදී ලෙසින් නිදසුන් දැක්වූහ. එයින් අදහස් වන්නේ මෙයයි. දරවලින් ගිනි දැල්විය හැකිය. එම ගින්න සල් වැනි දර කැබලි නොවූවත්, ගින්නෙන් කෙරෙන කටයුත්ත සිදුකරයි. හිණි මං, ඔරු ආදියෙහි ලීවලින්ද ගිනි දැල්වුවත්, (බලාපොරොත්තු වන පරිදි පුද කටයුතු) එයින් සිදු නොකරයි. එහෙත් ගිනිදළු පැතිරීම සිදුවේ. මෙසේම බමුණු ආදී කුලවල ඉපදුණ පමණින් පූජාවට සුදුසු නොවේ. සැඬොල් ආදී කුලවල ඉපදුණත් සුදුසු නොවේ. එසේ වුවත් **නීචාකුලීනො** උසස් හෝ පහත් හෝ කුල (සම්මත) කෙලෙසුන් නැසූ මුනිවරයා **මුනි ධිතිමා හිරි නිසෙධො ආජානීයො හොති** උසස් නුවණ ද, ලජ්ජාව මුල්කොට ඇති ගුණසම්පතින්ද 'උපත ලද' මේ මුනිවරයා උසස් ලෙසින්ම පූජාවනට සුදුසුය. එතුමා නුවණින්ද, යහගුණෙහිද පිහිටා සිටී. ලජ්ජාවෙන් වැරදි වළක්වයි. 'ලජ්ජාවෙන් සාන්ත වූ නිවුණු තැනැත්තෝ අයහපත් දේ නොකරති.' 'හිරියා හි සනතා න කරොනති පාපං' යැයි කියන ලදී. එහෙයින් මම ඔබට කියමි. කුලය නො අසව. දර ඒකාන්තයෙන්ම ගිනි අවුලවයි. සීලාදී හැසිරීම් ගැන අසව. පහත් යැයි සම්මත කුලයේ වුවද, උසස් කුලයෙක

වුවද මුනිවරයා ලජ්ජාවෙන් වැරදි වළකාලීමෙන්ද නුවණින් ද ඉතා උසස්ම වෙයි. මේ කෙටියෙන් සඳහන් කිරීමයි. විස්තර අසසලායන සූත්‍රය අනුව දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සිවුවණක් පිරිසිදු බවින් අනුසාසනා කොට, දැන් යම් තැනක (යාගයක) පිදූ දෙයින් අදහස් ඉටුවේද, යම් ආකාරයෙන් යාග කළවිට අදහස් ඉටුවේදැයි පහදා දීමට **සචෙචන දනෙතා** ආදී ගාථා වදාළහ. එහි සචෙචන උතුම් ඇත්ත, සිවුසස් දම්, එයට පරම ඇත්ත අවබෝධ කළ තැනැත්තා, එහෙයින් **සචෙචන දනෙතා** යැයි කීහ. **දමසා උපෙතො** ඉඳුරන් දමනය කරන ලද දැමුණු ඉඳුරන්ගෙන් යුතු, **වෙදනතගු** වේදයෙහි හෝ කෙලෙස් කෙළවරට පත්ව ලද දැනීමෙන් හෝ, සිවුමග නුවණෙහි කෙළවරට ගියේ **වුසිතබ්‍රහමචරියො** නැවත සසර විසීම නැතිකිරීමට මග බඹසර පිරූ, **කාලෙන තමහි හව්‍ය පවෙචෙඡ** තමන්ට දීමට දෙයක් ඇති කල පූජා ලැබිය යුතු තැනැත්තා හමුවන කාලයද සළකා (එසේ හමුවූ විට) එබඳු දිය යුතු තැනැත්තාට දියයුතු දෙයක් පිලියෙල වන්නේය. **කාමෙ** සැප සම්පත් කැමැති වීමත්, කෙලෙස් වැඩෙන දෙයට කැමැතිවීමත්, **සුසමාහිතින්‍ද්‍රියා** මනාව තැන්පත් වූ ඉඳුරන් ඇති, සංවර වූ ඉඳුරන් ඇති බව කියන ලදී. **චන්‍ද්‍රව රාහුගගහණ පමුතතා** සඳ රාහු ගිලගැනීමෙන් මිදුණ සේ, කෙලෙස් වැසීමෙන් මිදී බොහෝසෙයින් ආලෝකමවත් වෙති. **බබළති**. සතා සිහියෙන් යුතු, **මමායිතානි** ආසා හා දැඩිව ගත් හැඟීම් තුළින් මමය - මාගේ යැයි සැළකීම.

**යො කාමෙ හිතවා** මෙතැන්සිට තමා පිළිබඳව කියති. **කාමෙ හිතවා** කෙලෙස් වඩන කැමැත්ත හැර, **අභිභුය්‍යචාරී** ඒ කැමැත්ත නැති කළ බැවින් සම්පත් ආදියෙහිද කැමැත්ත මැඩපවත්වා හැසිරෙන, **ජාතිමරණසස අනතං** නිවන සඳහා කියන ලදී. **වෙදී** එය යම් කෙනෙක් තම නුවණ බලයෙන් දැනගත්තේ ද, **උදකරහදො** වා හිමාලයෙහි පිහිටි අනොතතත විල, කණ්ණමුණ්ඩ විල, රථකාර විල, ඡද්දනත විල, කුණාල විල, මන්‍දාකිනී විල, සීහපපපාතක විල යන මහා විල් හත ගිනිවන් හිරු රැසින් තැවුණද උණුසුම් නොවී, නිති සිසිල් වේද, ඒ එක්විලක ජලය මෙන් සිසිල් වූයේ, **පරිනිබබුත** කෙලෙස් දැවිලි රහිත බැවිනි. **සමො** සමාන, සමෙහි විපසසි ආදී බුදුවරු සහ ඒ බුදුවරු මෙන් අවබෝධය ලද බැවින් සමවූ යැයි කියනු ලබති. උන්වහන්සේලා අවබෝධ කළ සියළු කරුණුවලද, අත්හළ යුතු වූ වැරදිවලද කිසිදු වෙනසක් නැත. (අවබෝධයට)

පැමිණි මග, ආයුකාලය, කුලය, උස, මහබිනික්මන, දහම් අවබෝධයට ගත් උත්සාහය, සෙවන දුන් බෝධිය හා රැස්මාලාවෙහි නම් වෙනස්කම් ඇත. එසේම උන්වහන්සේලා විසින් අවම ලෙසින් අසංඛෙය්‍ය සතරකුත් කප් සියදහසක් පෙරුම්දම් පුරති. උපරිම කාලය අසංඛෙය්‍ය දහසයකුත් කප් සියදහසකි. මේ වූකලී බුදුවරුන්ගේ **අද්ධානවෙමත්තතා** නම් වෙයි. ජීවත්වන අඩුම කාලය වසර සියයක් ද ජීවත්වන වැඩිම කාලය වසර සියදහසක් අතර පවත්නා යුගයක බුදුවරු උපදිති. මේ උන්වහන්සේලාගේ ආයුවෙමත්තතා වෙයි. රජකුලයෙහි (කැත්කුල) හෝ බමුණු කුලයෙහි ඉපදීම කුලවෙමත්තතා නම් වේ. වැඩිම උසින් අසූඅට රියනකි. අවම උස පහළොස් රියනක් හෝ දහඅට රියනක් පමණ වෙයි. මෙය පමාණවෙමත්තතා වේ. අහසින් හෝ ඇතුපිටින් හෝ, අසකු පිටින් හෝ රියකින්, දෝලාවකින් හෝ මහබිනික්මන් කරති. විපස්සී, කකුසඳ (බෝසත්වරු) අස්රියෙන් නික්මුණහ. සිඛී, කෝණාගම (බෝසතුන්) ඇතුන් පිටිනි. වෙස්සභූ (බෝසත්) දෝලාවෙනි. කස්සප (බෝසත්) අහසිනි. සැකිමුනි (බෝසත්) අසුපිටිනි. මෙය **නෙක්ඛම්ම වෙමත්තතා** ය. දහම් අවබෝධයට සත්දිනක්, අඩමසක්, එක්මසක්, දෙමසක්, තෙමසක්, හයමසක්, එක් වසරක්, වසර දෙකක්, තුනක්, හතරක්, පහක් හෝ හයක් ගතවේ. **පධාන වෙමත්තතා** නම් මෙයයි. බෝරුක් ලෙස ඇසතු හෝ නුග හෝ වෙනත් ගසකි. මෙය බොධිවෙමත්තතා ය. බුදුරැස් විහිදීම බඹයක්, බඹ අසූවක් වන අතර, පැහැයෙහි සීමාවක් දැක්විය නොහැකිය. එහි ආලෝකය බඹයක් දුර වුවත්, බඹ අසූවක් වුවත්, හැමටම එක සමානය. අපමණ වූ රැස් දහරා ආලෝකය දුරටද, ළඟටද විහිදෙයි. ගවුවක්, ගවු දෙකක්, යොදුනක්, යොදුන් බොහෝ ගණනක් හෝ සක්වළ කෙළවරටද විහිදේ. මංගල බුදුරදුන්ගේ සිරුරේ පැහැයෙහි ආලෝකය දසදහසක් සක්වළ පැතිර ගියේය. කරුණු මෙසේ වුවද සියළුම බුදුවරුන්ගේ සිත් අදිටන් පරිදි, කැමති පමණ දුරකට පැතිරෙයි. **රංසිවෙමත්තතා** නම් මෙයයි.

මේ වෙනස්කම් අට හැර, අවබෝධ කළයුතු සියළුම දෙයෙහිත්, අත්හැර දැමිය යුතු යැයි හෝ, වරද සේ පෙන්වාදෙන කරුණුවල හෝ බුදුවරුන් අතර වෙනස් බවක් නැත. එහෙයින් සමාන යැයි කියනු ලැබේ. මෙසේ ඒ බුදුවරු සමවූවන් හා සමවෙති. **විසමෙහි දූරෙ** පසේබුදුවරු පසේබුදුවරුන් හා සමවෙති. අනෙක් සියළු සතුන් හා සම නොවෙති. මුළු දඹදිව මුළුල්ලේම ළංවන සේ, එකට ගෑවෙන සේ පසේ බුදුවරුන් වැඩසිටියද ගුණවලින් එක සම්මා සම්බුදුවරයකු හා සළකන විට දහසයෙන්

එක් කොටසක්වත් තරම් නොවේ. එසේනම් (බුදු) සච්චන් පිළිබඳව කවර කතාද? එහෙයින් විසමෙහි දූරෙ යැයි කීහ. **තථාගතො හොති** වචන දෙක අතර දූරෙ යනුවෙන් (තථාගතො දූරෙ හොති) **අනන්ත පඤ්ඤා** අපමණ වූ නුවණින්, පොදු මිනිසුන්ගේ නුවණ හා සළකනවිට, සෝවාන් මග ආ තැනැත්තාගේ නුවණ වැඩිය. සෝවාන් බවට පත් තැනැත්තාගේ නුවණ ඊටත් වැඩිය. මෙසේ අරහත් වූවකු දක්වා සළකනවිට, පසේ බුදුවරයකුගේ නුවණ වැඩිය. පසේ බුදුනුවණ හා සළකනවිට තථාගතයන් වහන්සේගේ නුවණ වැඩියැයි නොකිව යුතුය. එහිදී කිවයුත්තේ තථාගත නුවණ පමණ කළ නොහැකි බවයි. එහෙයින් එහි කෙළවරක් දැක්විය නොහැකිය. එහෙයින් අනන්ත පඤ්ඤා යැයි කීහ. **අනුපලිත්තො** තණ්හා ආසා හා දැඩිව ගත් හැඟීම්වල නොඇළුණු, ඉධ වා හුරං වා මෙලොව හෝ පරලොවෙහි, මේ කරුණුවලින් අදහස් වන්නේ, බුදුවරයකුම හා සම වූ, අන් සියළු දෙනාගේම සමතාවයෙන් ඉතා දුර වූ බවයි. (අසම සම) කවර හෙයින්ද? නුවණින් අපමණ වූ, මෙලොව හෝ පරලොව හෝ කිසිම දෙයක නොඇළුණු, තථාගතයන් වහන්සේ (යාග) බත හා කැවිලි ආදිය පිළිගැනීමට සුදුසු වෙති.

**යමහි න මායා** ගාථාව, මෙබඳු මුලා වූ, තරහ ආදී ගතියෙන් යුතු වෙනත් බමුණන්ගේ ද පූජා පිදිය යුත්තේ කවුරුන් වෙතදැයි පවත්නා හැඟීම දුරුකිරීම පිණිස, කියන ලද බව දතයුතුය. **අමමො** පුද්ගලයා කෙරෙහි වූ 'මේ මගේය' යන අදහස නොමැති බවයි. **නිවෙසනං** තණ්හා සහ දැඩිව ගත් නොයෙක් හැඟීම්වලින් වෙලුණු, ඒ අනුව මනස තුන් භවයෙහිම ඇලෙයි. එහෙයින් එසේ ඇලී වසන තැන, **මනසො** යයි කියනු ලබයි. එහිම ඇලී විසීම නිසා එය අත්හැර යාමට නොහැකි බැවින් නිවෙසන යැයිද සඳහන් වෙයි. **පරිගගහා** තණ්හාව හා දැඩිව ගත් හැඟීම්වලින්ම අල්ලාගෙන ඇති බව, **කෙව්** යහපතෙහි නොපමා වූද, **අනුපාදියානො** අල්ලා ගන්නා ලද බැඳීම් නැතිකළ බැවින්, ඒ කිසිදු දෙයක් ඇතිකර නොගනිමින්, **සමාහිතො** සතරමගෙහි සමාධියෙන් **උදතාරී** එතර වූයේ, ධම්මඤ්ච **අඤ්ඤාසි** සියළුම දැනගත යුතු දේ අවබෝධ කළ සේක. **පරමාය දිට්ඨියා** සියල්ල දන්නා නුවණින්, **භවාසවා** ඉපදෙන තැන් පිළිබඳ දැඩි ආසාවෙන් බැඳුණු, සදාකාලිකවම එහි ඇලීමේ රාගයයි. **වචී** වචන, බරා රළු, නපුරු, **විධූපිතා** දවන ලද, **අත්ථංගතා** නසන ලද්දේය, නැතිකරන ලද, **න සනති** දවන ලද බැවින් ද නසන ලද බැවින්ද න සනති යන්න මේ වචන දෙකටම යෙදිය යුතුය. **සබබධී** සියළු රූපාදී

සමූහය සහ ඇස ආදී ආයතන කෙරෙහි, **මානසත්තෙසු** මානයෙන් එල්ලී සිටින, **දුක්ඛං පරිඤ්ඤාය** සසර දුක තුන් ආකාර වූ පිරිසිඳ දැනීමෙන්, **සබ්බෙතවත්‍ථු** හේතුව සහ පලය සහිත, කෙලෙස් පිරි කටයුතු සඳහා කියන ලදී. **ආසං අනිසසායා** තණ්හාවෙහි නොඇලී, **විවේකදස්සී** නිවන දුටු, **පරවෙදියනති** අන් තැනැත්තන්ටද දැනගැනීමට සැලසිය යුතුය. **දිට්ඨීමුපාතිවත්තෙතා** සැටදෙකක් වූ මිසදිටු බව ඉක්මවූයේ, **ආරම්මණ** හේතු, නැවත භවයක ඉපදීමට හේතු ගැන කියන ලදී.

**පරොවරා** අනුන්, තමන් - යහපත් අයහපත් හෝ වෙනත් බාහිර හෝ තමා පිළිබඳ, **සමෙච්ච** නුවණින් මනාව අවබෝධකොට, **ධම්මා** රූපාදී සමූහය හා ඇස් ආදී ආයතනයන්හි ගතිසොබාව, **උපාදානක්ඛයෙ** විමුත්තෙතා නිවන කෙරෙහි, නිවන හේතුකොට, කෙලෙසුන්ගෙන් මිදුණු, නිවන් අරමුණෙහි කෙලෙසුන්ගෙන් මිදෙනු ලැබූ තේරුමයි. **සංයොජනක්ඛජාති ඛයනත දස්සී** සසර බැඳීම් නසන දැක්ම හෝ ඉපදීම නැතිකිරීම දකින, සංයෝජන නැසීමෙන්, සෝපාදිසෙස නිවනත්, ඉපදීම නැතිකිරීමෙන් අනුපාදිසෙස නිවනත් කියන ලදහ. නැතිකිරීම, මුළුමනින්ම නසන ලද, තේරුමට සමාන වදනකි. අනුනාසික ලොපයයි. **විවෙකජං පීතිසුඛං** ආදී තැන්වල එසේ නොවීය. **යොපානුදී** යම් කෙනෙක් දුරුකරත්ද **රාගපථං** රාග අරමුණු හෝ රාගයම හෝ, රාගයද දුගතියට මාවත බැවින් රාගපථො යැයි කියනු ලැබේ. කම්මපථො යන්න මෙනි. **සුද්ධො නිද්දොසො විමලො අකාචො** කය හැසිරවීම් ආදියෙන් පිරිසිඳුව, මේ මිනිසුන් රාගයෙන් වැරදි කරන, තරහව නිසා වැරදි කරන, මුළාවෙන් වැරදි කරති'යි කියනු ලබයි. ඒ වැරදි නැතිකරන ලදින් නිදොස්ය. අටආකාර වූ අපිරිසිදු බවින් තොරවීමෙන් ඉතා පිරිසිදුය. කෙලෙස් කිලුටෙන් තොරවූ බැවින්, පලුදු රහිත බැවින් **කාචො** යැයි කියයි. යම්ලෙසකින් පිරිසිදුව, වැරදි රහිත වේද, ඒ වැරදි සහගත නොවීමෙන් ඉතා පිරිසිදු බවද, පිටතද අපිරිසිදු බව නොමැති හෙයින් පලුදු රහිතය. අපිරිසිදු බවින් යුතු සකාචො වේ. එසේ අති පිරිසිදු බැවින් අපරාධ නොකරයි. එහෙයින් අකාච වේ. අපරාධ කටයුතුවලදී වැනසීම, නැසීම ආදිය කරන හෙයින්ද කාචො යයි කියනු ලබයි. **අත්තනා අත්තානං නානුපස්සති** නුවණ පෙරදැරි වූ සිතින් මනාව බලමින්, තමන්ගේ රූපාදි සසමූහයෙහි (සිරුරෙහි) මමායනය පෙරටුව ගත් දෙයක් සේ නොදකී. හුදෙක් රූප-වේදනා ආදී සමූහයන්ගේ එකතුවක් ලෙසම දකී. තමා ගැනම, තමාගේම යනුවෙන් හඳුනාගන්නා තැනැත්තාට ඇත්තටම (ඒ සිතන ආකාරයෙන්) දැඩිව අල්ලාගන්නා

හැඟීම් හටගනී. එසේ නොකොට තමා ගැන තමාගේ යන අදහසින් නොබලමින්, හුදෙක්ම නුවණ මෙහෙයා සිරුර පිළිබඳව සළකා බලයි. මග්ග සමාධියෙන් **සමාහිතො** කයෙන් කෙරෙන කටයුතුවල ඇද බවක් නොමැතිවීම **උජ්ජුගතො**, ලෝ දහමෙහි කම්පා නොවීම **ඨිතත්තො**, එජා නම් වූ තණ්හාවද, කෙලෙස් උල් පහද, බුදුරජාණන් වහන්සේ ආදී කොට ඇති සැක අටද නොමැති බැවින් **අනෙජො, අඛිලො, අකංඛො** මුලාවට කරුණු වන, මුලාවට හේතුවන හෙයින් **මොහනතරා** සියළුම කෙලෙස්වලට එය සමාන වචනයකි. **සබ්බසු ධම්මෙසු ච ඤාණදස්සී** සියල්ල දන්නා නුවණින් අවබෝධ කරන ලද, ඒ සියළු දෙයම දන්නා නුවණයි. භාග්‍යවතුන් වහන්සේ එය පසක් කළහ. ලැබගත්හ. අවබෝධ කොට විසූහ. එබැවින් සියළුම දතයුතු දේ නුවණින් දක්නා ලද්දේ යැයි කියනු ලැබේ. **සම්බොධි** අරහත් බවයි. **අනුත්තරං** පසේ බුදුවරුන් හා මගපල ලද සවුවනට වඩා උසස් වූ, **සිවං** බිය නැති, උවදුරු රහිත, අසිරිමත් වූ, **යක්ඛස්ස** තැනැත්තාගේ, **සුද්ධි** සුපිරිසිදු බව, මුළාවට පත් නොවීමෙන්, සියළු වැරදි සිදුනොවන බැවින්ද, එයින් සසර නොඩනගන හේතුද නැතිකරන බැවින්ද, උතුම් සම්බුදු බවට පත්වී, මෙයින් මතු ඉවත හළයුතු හෝ ලබාගත යුතු දෙයක් නැත. එපමණකින් මිනිසාගේ සුපිරිසිදුතාව වදාළහ.

මෙසේ වදාළ කල බමුණා බොහෝ සතුටට පත්ව, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුනු බව පළකරමින් **හුතඤ්ච මය්හං** යන ගාථාව කීය. එහි තේරුම නම්, 'ඇත්ත හෝ බොරු හෝ නොදැන පෙරදී මම බ්‍රහ්ම උදෙසා ගිනි පුදමින් යාගපූජා කිරීමෙහි යෙදුණෙමි. **යුතඤ්ච මය්හං හුතමත්‍ථු සච්චං** අද මේ පූජා කිරීමෙහි තේරුමත්, ඇත්තක් ඇතැයි (වැටහී) එය පිළිගන්නා ලෙස ඉල්ලයි. **යං තාදිසං වෙදගුනං අලත්‍ථං** පූජා පිළිගැනීම දන්නා සුදුසුම තැනැත්තකු මෙතැනදීම ලැබීමි. **බ්‍රහ්මාහි සක්ඛි** ඔබ බ්‍රහ්ම බවම පැහැදිලිය. **පතිගණ්හාතු මෙ භගවා** පිළිගෙන, **භුඤ්ජතු මෙ භගවා පූරළාසං** ඒ කිරිබත් ආදී යාගයෙහි ඉතිරි දේ පිළිගන්වමින් කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කසීභාරද්වාජ සූත්‍රයෙහි දැක්වූ පරිදි (ගාථාභිගීතං) ඒ ගාථා දෙක වදාළහ. එවිට බමුණා 'මේ තැනැත්තා තමාගෙන් (ඒ පූජා) ලැබීමට කැමති නොවේ. ගුණින් පිරිපුන්, උසස්, සැකය නැතිකළ, කෙලෙසුන් නසන ලද වෙනත් කෙනෙකු වෙනුවෙන්

ආහාර පානයෙන් උවටැන් කරන ලෙස කියතැ'යි මෙසේ ගාථාවේ අදහස නොසළකා, එය දැනගනු කැමතිව **සාධාහං භගවා** යන ගාථාව කීය. සාධු යනු ඉල්ලීමක් කරන අරුත් ඇති නිපාතයකි. **තථා** ඔබ පැවසූ පරිදි, **විජඤ්ඤං** දැනගන්නේ නම්, **යං** (පූජාවක් සේ) දිය යුතු දෙයට සුදුසු, **යඤ්ඤකාලෙ පරියෙසමානො** උවටැන් කරන්නේය. (ගරු සැළකිලි කරන්නේය යනුවෙන් ඉතිරි පාඨයක්ද වේ. **පපුප්‍ය** පැමිණ, **තව සාසනං** ඔබතුමන්ගේ අවවාදය, 'භාග්‍යවතුන් වහන්ස, ඔබගේ අවවාදය මට දැනගත හැකිවන පරිදි පැහැදිළි කරන්නේ නම් යහපති, මා වැනි කෙනෙකු පූජා කරන ආහාරය අනුභව කරන්නේ නම්, යාග පවත්වන වේලාවෙහි උවටැන්, ගරු සැළකිලි දක්වමි. ඔබ අනුභව නොකරන්නෙහි නම්, මේ පූජා පිරිනැමීමට සුදුසු එබඳු කෙනෙකු පෙන්වා දෙනු මැනවි'යැයි මේ අදහස අනුව කියන ලදී.

එවිට, භාග්‍යවතුන් වහන්සේ, එසේ දීමට සුදුසු කෙනෙකු ගැන පැහැදිලිව පෙන්වා දෙමින් **සාරමභා යසස** ආදී ගාථා තුනක් වදාළහ. **සීමනතානං විනෙතාරං** යහපත් දිවිපැවැත්ම සඳහා වූ යම් සීමා සියල්ලම කෙළවරකොට, අවසන් කරන ලද බැවින්, සීමනතා යැයි කෙලෙස් ලෙස කියනු ලැබේ. එයින් හික්මවනු ලබන, සීමනතා යනු බුදුවරයකු විසින් හික්මවනු ලබන මගපල ලබන්නන් සහ සෙසු ජනයා, මෙසේ සෙබ-පුථුජ්ජන ලෙස බුදු නුවණින් හික්මවිය හැකි අදහස ඇතමෙක හඟිති. **ජාතිමරණං කොවිදං** ඉපදීම මෙසේ ඇතිවෙයි. මෙසේ මරණය වේ යැයි දක්නා හැකියාව ඇති, **මොනෙය්‍ය සමපනනං** තියුණු නුවණින් යුතු, කයෙහි උසස් හික්මීමෙන් යුතු, **භූකුටිං විනයිතවාන** ඇතැම් අනුවණ තැනැත්තෝ යම් දෙයක් ඉල්ලා සිටින කෙනෙකු දැක, බැම හකුළුවා නොකැමැත්ත දක්වති. එසේ නොකොට සතුටු මුහුණින් යුතුව යන අදහසයි. **පඤ්ජලිකා** අත්මුදුන් දී,

අනතුරුව, සුන්දරික භාරද්වාජ බමුණා, භාග්‍යවතුන් වහන්සේට තුති පැසසුම් කරමින් **බුදෙධා භවං** යන ගාථාව කීය. **ආයොගො** දිය යුතුය. දිය යුතු දේ ගැන සුදුසු සේ සැළකිය යුතුය. මෙයින් පසු මුල් ගාථාවල විස්තර නොවූ වචන කසීභාරද්වාජ සූත්‍ර විස්තරවල කියා ඇති පරිදි දැනගත හැකි බැවින් මෙහි විස්තර නොකරන ලදී.

**පූරළාස සූත්‍ර විස්තරය නිමි.**

# 3.5

**එවං මෙ සුතං** යනු මාඝ සූත්‍රයයි. ඊට හේතු වූ කරුණු සූත්‍රයෙහිම සඳහන් වේ. මාඝ නම් තරුණයා දීමෙහි සිත් ඇති, - දානයටම යොමු වූවෙකි. 'පැමිණි දුගී මගී ආදීනට දුන් දෙය මහත් පල ලැබේද, නොලැබේදැයි ගෝතම මහණුන්ගෙන් විචාරන්නෙමි. ගෝතම සමණ අතීත-අනාගත-වත්මන ගැන දනී' යැයි ඔහුට සිතුණි. ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ එය ඇසීය. විමසූ පරිදි කරුණු පැහැදිළි කළහ. සංගායනාවට සහභාගී වූ හිමිවරුන්ගේද (මාඝ) බමුණාගේද භාග්‍යවතුන් වහන්සේගේද කරුණු (වචන) ගළපා මාඝ සූත්‍රය යැයි කියනු ලැබේ.

රාජගහෙ යනු එම නම ඇති නගරයයි. එම නගරය මන්ධාතු, මහාගෝවින්ද ආදී රජවරුන් විසින් රැකවල් කරන ලද බැවින් 'රජගහ' යැයි කියනු ලැබේ. ඒ කෙසේද? එය එම නගරයේ නමයි. බුදුරජාණන් වහන්සේගේ කාලයේදීත්, සක්විති රජු කාලයේදීත් නගරයක්ව පැවතුණි. අනෙක් කාලයෙහි පාළු - හිස් බවට පත්වෙයි. යකුන් අරක්ගනු ලබයි. ඔවුන් වාසය කරන තැනක් බවට ද පත්වෙයි. මෙසේ ගොදුරු ගම දක්වා, **ගිජ්ඣකූට පබ්බතෙ** යැයි (බුදුරජාණන් වහන්සේ) වසන තැන සඳහන් වෙයි. ඒ පව්ව මුදුන්හි ගිජුලිහිණි වාසය කළහ. ලිහිණියන් හා සමාන මුදුන් පිහිටි බැවින් ගිජ්ඣකූට යයි හඳුන්වන බව දතයුතුය. **අථ ඛො...........අවොච,** මෙහි මාඝො යනු ඒ බමුණාගේ නමයි. මාණවො අතවැසිව වසන වත්මන් කාලය සළකා කියනු ලබයි. උපතින් මහළුය. ඇතැම් කෙනෙක් පෙර පුරුද්දට අනුව පිංගිය මාණවක වැනි යයි කියති. හෙතෙමේ ද වසර එකසිය විස්සක් පුරාම පිංගිය මාණවක නමින්ම ව්‍යවහාරයට පත්විය. ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය. **අහං හි භො -පෙ- පසවාමි** යැයි පැවසීමේදී **දායකො දානපති** (ලෙසද සඳහන්ව ඇත.) දායකයාද දානපතියාද එයින් අදහස් වේ. දෙන තැනැත්තෙක් ද ඒ දෙන දේ නොමැලිව දෙන අයෙක්ද වේ. තමන්ට අයත් දේ තමා විසින් අනුන්ට දෙයි ද ඔහු දායකයා වේ. දීමෙන් සම්පත් නැතිවේයැයි (සිතන්නේ නම්) මනාව දෙන තැනැත්තකු හෙවත් දානපතියකු නොවේ. මාඝ තමාට අයිති දෙයම නිවැරදිව දෙන බැවින් **අහං හි භො ගොතම දායකො දානපති** යැයි කීය. මේ එහි තේරුමයි. මේ හැර, නිරතුරුවම මසුරුබව යටපත් කරමින්, දෙන තැනැත්තාට දායක දානපති යැයි කීම

සුදුසුය. වදඤ්ඤූ ඉල්ලා සිටි පමණින්ම, 'මේ දෙය මොහුට සුදුසුය, මෙය මොහුට දෙමි'යි ඒ ඒ තැනැත්තන් කෙරෙහි සැළකිලිමත් වෙමින්, එය ඔහුට උපකාර වේයැයි සිතා හෝ, ඒ (හිඟන්නාගේ) ඉල්ලා සිටින තැනැත්තාගේ අදහස දනිමි' (මෙයින් අදහස් වේ) යාචයොගො ඉල්ලීමට සුදුසුය. යාචකයෙකු දැක, බැමි හකුළුවා, නපුරු වචන කියන තැනැත්තාගෙන් ඉල්ලීම නුසුදුසුය. 'මම එබඳු කෙනෙකු නොවෙමි'යි දක්වයි. ධම්මෙන නුදුන් දේ ගැනීම, වංක හා කපටි ගතිය හැරදමා, ආහාර ලබාගැනීම පිණිස ඉල්ලීමයි. ඉල්ලීම නම්, බමුණන්ට සම්පත් සොයාගැනීමට කරන දෙයකි. එසේ ඉල්ලා සිටින ඔවුන්ට, අනුන් හට උපකාරයක් කරනු කැමති සේ දෙන ලද දෙය භොගා ධම්මලද්ධා ලෙසද, ධම්මාධිගතා යයි ද දක්වති. ඔහු ද එසේ සොයා ලබාගත්තේය. එහෙයින් ධම්මෙන භොගෙ පරියෙසාමි......ධම්මාධිගතෙහි යැයි කීය. භීයොපි දදාමි ඊටත් වැඩියෙන් දෙමි. මෙතෙකැයි කිව නොහේ. ලැබුණු ලැබුණු සම්පත් පමණ නොකොට දෙමියි දක්වයි. තගඝ ඒකාන්තයෙන් යන අදහස ඇති නිපාතයකි. ඇත්තෙන්ම, සියළු බුදු පසේබුදු මහරහත් සව්වන් කෙරෙහි දෙන දානය මෙන්ම යටත් පිරිසෙයින් සතෙකුට දෙනු ලබන දානයද පසස්නා ලදී. 'දානය කිසිකලකත් නින්දා කටයුතු නොවේ. හැමතැන්හිදීම අගය කරන ලදැයි' මෙසේද කියන ලද්දේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේද එය ඒකාන්තයෙන්ම පසසමින් තගඝ ත්වං මාණව- පෙ- පසවස යැයි වදාළහ. ඊට අදාළ වචන පැහැදිලිය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ, 'දෙන තැනැත්තා බොහෝ පින් රැස්කර ගනිති'යි පසවති වදාළ කල්හි දීමෙන් ලබන පිරිසිදු බව අසනු කැමතිව තවදුරටත් කරුණු විචාළේය. එහෙයින් සංගායනාවට සහභාගි වූ හිමිවරු අථ ඛො මාඝො මාණවො භගවන්තං ගාථාය අජ්ඣභාසි යනුවෙන් කීහ. එහි අදහස කලින් දක්වා ඇති පරිදිය.

පුච්ඡාමහං යන ගාථාවෙහි වදඤ්ඤූ වචන ගැන දන්නා වූ, පුද්ගලයන් නොයෙක් ලෙසින් කියනු ලබන වචනවල අරුත් ගැන දන්නා, අවබෝධයෙන් යුතු අදහසයි. සුජෙඣ දෙනු ලබන සුදුසු දෙයින් යහපතක් උදාවේනම්, යො යාචයොගො දානපති ගහට්ඨො පුඤ්ඤත්ථිකො මෙහි අදහස් වන්නේ පින් කැමති ගැහැවියෙකුව, පරෙසං අන්නපානං දදං යජති පූජාවට සුදුසු දේවල් ගින්නෙහි දැමීමෙන් නොවේ. පුඤ්ඤපෙඛොව එයද කරන ලද උපකාරයට පෙරළා උදව් හෝ යහපත් කිතුරාවයක්

බලාපොරොත්තු නොවී, මෙසේ මෙබඳු අදහස් ඇති කෙනෙකුගේ, **යජමානස්ස හුතං කප්පං සුජෙඣයාහි**, ආරාධයෙ දක්ඛිණෙය්‍යෙහි තාදී ඒ ඉල්ලීම පරිදි, දෙනු ලබන තැනැත්තා විසින් දීමට සුදුසු දෙයකින් සතුටු කරන්නේ ය, (එයින්) සකස් කරන්නේ ය, පිරිසිදු අදහසින් සිදු කරන්නේ ය. එම පූජා කරන ලද හෝ දෙන ලද දේ මහත් පල උදා කරන්නේ ය. වෙනසක් නොවේ යන අදහසයි. පිදූ දෙයින් කෙසේ පිරිසිදු වේදැයි යාග කරන ඔහුට මෙයින් පහදා දෙන ලදී.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ, දීමට සුදුසු වන සැටි නොයෙක් ආකාරයෙන් **යෙ වෙ අසත්තා** ආදී ගාථාවලින් පෙන්වා දුන්හ. **අසත්තා** රාග ආදී ඇලීමෙන්, එක්ව වෙලීගිය, **කෙවලිනො** (සසර) කටයුතු නිමකරන ලද, **යතත්තා** රැකගත් සිත් ඇත්තෝ, දනතා උතුම් දැමුණු බැවින්, **විමුත්තා** තියුණු නුවණ මෙහෙයා සිතිවිලිවිලින් මිදුණු, **අනීඝා** නැවත සසර දුක් ඇති නොවන, **නිරාසා** කෙලෙස් එක්රැස් නොවන, මෙම ගාථාවල දෙවැන්න භාවනාවෙහි බලය දැක්වීමේ අදහසින් කියන ලදැයි දතයුතුය. 'මහණෙනි, භාවනාවෙහි යෙදෙන මහණහට 'අහෝ! මගේ සිත, නැවත හටනොගන්නා සේ, කෙලෙසුන්ගෙන් මිදෙන්නේ ය.' යන මෙබඳු කැමැත්තක් ඇති නොවූවත්, ඒ මහණගේ සිත නැවත කෙලෙස් හට නොගන්නා සේ, කෙලෙස්වලින් මිදෙන්නේ ය යන මෙම සූත්‍රාගත කරුණ නිදසුන්ය. 'භාවනානුයෝග මනුයුත්තස්ස භික්ඛවෙ භික්ඛුනො විහරතො කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය, 'අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යා'ති, අථඛ්වාස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති'ති. **රාගඤ්ච........යෙසු න මායා......න තණ්හාසු උපාතිපන්නා** කාමතණ්හා ආදියෙහි නොගිලුනු, **විතරෙය්‍ය** එතර වී, **තණ්හා** රූප තණ්හා ආදී ලෙසින් සය ආකාරය. **භවාභවාය** සදාකාලික හෝ වැනසෙන හෝ, නැතහොත් ඉපදුන තවත් උපදිනා තැනක් නැති, ඉපදීමට තැනක් නැති, ඉපදීමට සුදුසු තැනක නැවත උපදින්නේ නැති බව කියන ලදී. **ඉධ වා හුරං වා** මේ ලෝකයෙහි කොතැනක හෝ යන්න මෙහි විස්තර කරන වචනයයි. **යෙ විතරාගා........සමිතාවිනො** කෙලෙස් සන්සිඳුවන ලද තේරුමයි. **වීතරාගා අකොපා, ඉධ විප්පහායා** මෙලොවෙහි දැන් පවත්නා සිරුර හැර, එයින් පසු (සසර) ගමන නැතැයි කියන ලදී.

මින්පසු, **යෙ කාමෙ හිත්වා අගිහා චරන්ති සුසංවුතත්තා තසරං ව උජ්ජු** මේ ගාථාව ඇතමෙක් කියවති. **ජහිත්වා** හැර, ජහෙත්වා යයි ද

පාඨයකි. මෙම තේරුමම ය. **අත්තදීපා** තම ගුණයම තමන්ට පහනක් කොට හැසිරෙන, කෙලෙස් නැතිකළ උතුමන් ගැන කියනු ලබයි. **යෙ හෙත්‍ථ** 'හ' අකුර පදය පිරවීමට යෙදූ නිපාතයකි. තේරුම මෙයයි. **යෙ** **එත්‍ථ** රූප ආදී සමූහ හා ඇස් ආදී ආයතන හෙවත් සිරුර පිළිබඳව, **යථා** **ඉදං** ඒ ආකාරයෙන්, **තථා ජානන්ති** කිසිවක තිර පැවැත්මක් නැතැයි ඇති සැටියෙන් අවබෝධයෙන් දනිති. **අයමන්තිමා - නත්‍ථීදානි පුනබ්භවො** මේ අපගේ අවසන් ඉපදීමයි. දැන් නැවත ඉපදීමට තැනක් නැතැයි එයද මේ තැනැත්තෝ දනිති. **යොවෙදගු** දැන් තමන් වෙනුවෙන් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව කීහ. ඒ ගාථාවේ **සතිමා** නිති සය ආකාර වූ විහරණයෙන්, සිහියෙන් යුතුව, **සබ්බාධිපන්නො** සියල්ල දන්නා බවට පත්ව, **සරණං බහුජනං** බොහෝ දෙවි මිනිසුන්ගේ බයහිංසාවනට පිහිටක් වන්නා වූ

මෙසේ දීමට - පිදීමට සුදුස්සන් ගැන අසා සතුටට පත් බමුණා අදධා අමොසා යන ගාථා කීය. **ත්වං හෙත්‍ථ ජානාසි යථා තථා** ලෝකයෙහි, **ඉදං** ඔබවහන්සේ මේ ලෝකයෙහි දැනගත යුතු සියළුම දේ ඇති සැටියෙන්ම, ඒ ආකාරයෙන්ම දැනගත්හ'යි කියන ලදී. **තථා හි තෙ විදිතො එස ධම්මො** ඔබවහන්සේ එසේ ඒ සියල්ල මැනවින් අවබෝධ කරන ලදහ. එබඳු සියළු දේ මනාව අවබෝධ කළ බැවින්, බලාපොරොත්තු වන යම් යම් දෙය පවසයි ද, ඒවා දැන සිටි බැව් අදහස් වේ. මෙසේ ඒ බමුණා භාග්‍යවතුන් වහන්සේට පැසසුම්කොට, දීමට සුදුසු පිළිවෙලක් - යාග (පූජා) පිළිවෙලක් දැන, දෙනු ලබන ආකාරය සහ ඒ සය ආකාර වූ යාග පිළිවෙත ද අසනු කැමතිව, **යො යාචයොගො** ආදී ලෙසින් තවදුරටත් පැන අසයි. එයින් අදහස් වන්නේ මෙයයි. 'ඉල්ලා ගැනීමට සුදුසු යම් තැනැත්තෙකු, යම් දෙයක් අනුන්ගෙන් ඉල්ලා සිටිනු ලබනවිට ඒ දෙන පිළිවෙල ඒ දානය දියයුතු අයුරු, භාග්‍යවතුන් වහන්ස, මට පවසනු මැනවි' එවිට ගාථා දෙකකින් කරුණු දක්වති. මේ එහි තේරුමයි. 'මාඝ, යාග කරන්න, (දීමෙහි නියැලෙව.) එසේ යාග කරනවිට, (දන් දෙනවිට) සිත පහදවා ගනුව. හැමවිටම, තුන්කල්හිම සිත පහදවා ගනුව. එය ඔබට මෙසේ කියම් නම්, 'මුලදීම දීමෙහි සිත පහන් විය යුතුය. දෙන විට සිත පහදවා ගතයුතුය. දුන්පසු සතුටුවිය යුතුය. යාග පිළිවෙත හෙවත් දානයේ පිළිවෙල එයයි.

**"පුබ්බෙව දානා සුමනො, දදං චිත්තං පසාදයං**
**දත්වා අත්තමනො හොති, එසා යඤ්ඤස්ස සම්පදා"**

මෙසේ යාග පිළිවෙත කියන ලදී. 'කෙසේ සිත පැහැදිය යුතුදැ'යි (යම් කෙනෙකුට) අදහසක් ඇතිවිය හැකිය. (එයට පිළිතුර) වැරදි හෝ තරහ නැති කිරීමෙනි. තරහ නැති කරගන්නේ කෙසේද? දීමෙහි (යාගයෙහි) අරමුණ අනුවය. **ආරම්මණං යජමානස්ස යඤ්ඤා එත්ථප්පතිට්ඨාය ජහාති දොසං** මේ වූකලී. ඉල්ලන තැනැත්තාට දිය යුතු වන්නේ දිය යුතු දෙයෙහි අරමුණ වන්නේ, සත්වග කෙරෙහි මෙත් පෙරදැරිව, යහපත් දැකීම නම් පහනින් මෝහ නැමති අඳුර පහකරන ලද සිතිනි. මෙහි යාගයෙහි අරමුණ ලෙසින් පවත්නා දිය යුතු දෙයෙහි ආසාවත්, පිළිගැනීම හේතුකොට තරහවත්, ඒ කරුණු දෙකම මුල්කොට මෝහය ද යන තුන්ආකාර වූ වැරදි හැරදමයි. **සො** මෙසේ සැප සම්පතෙහි **වීතරාගො ච**, සත්වග කෙරෙහි **පටිවිනෙය්‍ය දොසං** ඒ වැරදි නැති කිරීමත් සමගම නීවරණ පහද ඉවත් කරන ලදුව, කෙමෙන් කෙමෙන් උපචාර-අප්පණා කොටස් අනුව, අපමණ වූ සත්වග කෙරෙහි හෝ, එක් තැනැත්තකු කෙරෙහි හෝ නොවෙනස්ව පතුරුවන මෙත්සිත වඩමින් නැවත භාවනාව වැඩිදියුණු කරගැනීම පිණිස **රත්තිං දිවං සතතං** නොපමාවම සියළු ඉරියව්වල ඒ මෙත් අදහසම පෙරදැරිව **සබ්බා දිසා ඵරතෙ අප්පමඤ්ඤං** (සිටිය යුතුය.)

එවිට බමුණා එම මෙත් වැඩීම 'බඹලොව මග' යැයි නොදැන, හුදෙක් තමාගේ පෙර (පුරුදු වූ) මෙත් භාවනාව ගැන අසා සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වඩාත් ගරු සැළකිලිමත්ව, තමන් බඹලොවටම ඇලී ගැලී සිටින හෙයින්, බඹලොව ඉපදීමෙන් පිරිසිදු බවද, මිදීමද සිතමින්, බඹලොවට මග විමසමින් **කොසුජ්ඣති** යන ගාථාව කීය. එහිම බඹලොව ඉපදීමට (පහලවීමට) හේතුවන පින් කරන්නකු උදෙසා **කො සජ්ඣති මුච්චති** යැයිද, ඒ සමගම පින් නොකරන්නකුද ගැන **බජ්ඣති ච** යැයි ද කීය. **කෙනත්තනා** කුමන කරුණින්, **සක්ඛි බ්‍රහ්මජ්ජ දිට්ඨො** බ්‍රහ්මයා අද ඇත්තටම තහවරු වන පරිදි දුටුවෙමි. **සච්චං** භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම යැයි සළකා බොහෝ ආදර ගරු සැළකිල්ලෙන් පොරොන්දු වෙයි. **කථං උපපජ්ජති** බොහෝ ආදරයෙන් නැවත අසයි. **ජුතිමා** භාග්‍යවතුන් වහන්සේ අමතයි. එහිදී මෙත් සිතින් තෙවන, සතරවන දැහැන් උපදවා, එයම මූලික කොට විදසුන් වඩන මහණ අරහත් බවට පත්ව පිරිසිදු වෙයි. මිදුනේ වෙයි. එබඳු තැනැත්තා බඹලොව නොයේ. යමෙක් මෙත් වැඩීමෙන් තුන්වන හතරවන දැහැන් උපදවා 'ඒ සමාපත්ති තමා කෙරෙහි ඇතැ'යි එයට පහන් සිත් ඇතිකර

ගනී. එහි බැඳෙයි. නොපිරිහුණු දැහැනින්ම බඹලොව උපදී. (පහල වෙයි.) එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'පිරිසිදු වන මිදෙන කෙනෙකුට බඹලොව ගමන අනුදැන නොවදාරා, නොසළකා, ඒ දැහැනෙන් බැඳෙන තැනැත්තාගේ ගමන පැහැදිලි කරමින්, බමුණාට ගැළපෙන අයුරින් යො යජති යන මේ ගාථාව වදාළහ. එහි තිවිධං යනුවෙන් තුන්කල්හිම දානයෙහි ඇතිකරගන්නා සතුට ගැන දක්වයි. එයින් දායකවීමේ කරුණු තුනක් පෙන්වයි. ආරාධයෙ දක්ඛිණෙය්‍යෙ හි තාදී එබඳු තුන් ආකාර වූ සම්පත් ඇති තැනැත්තා, තුන් ආකාර වූ යාගයක් හෙවත් පූජාවක් පිරිනැමීමට සුදුසු වූ කෙලෙසුන් නැසූ උතුමන් කෙරෙහි ඉටු කරන්නේ ය. සකස් කරන්නේ ය. මෙයින් පිළිගනු ලබන තැනැත්තාගේ ද කරුණු තුනක් දක්වයි. එවං යජිත්වා සම්මා යාචයොගො මෙසේ මෙත් අදහස මුල්කරගත්, භාවනාවෙන් සය ආකාර වූ යාගය මනාව පවත්වා, ඒ ඉල්ලීමට සුදුසු, ඒ සය ආකාර වූ හේතු සම්පතින් යුතුව මෙත් දැහැනින්, උපපජ්ජති බ්‍රහමලොකනති බ්‍රෑමි යනුවෙන් මාඝ බමුණා උත්සාහවත් කරමින් දේසනය නිම කළහ. මෙයින් පසු ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

මාඝ සූත්‍ර විස්තරය නිමි.

# 3.6

එවං මෙ සුතං යනු සභිය සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණු මෙහි කියන ලදී. එහි විස්තර පෙර සඳහන් වූ කරුණු හා සමාන බැවින් ඒ අනුව දතයුතුය. විස්තර නොදැක්වූ වචන ඇතොත්, ඒ විස්තර කරන ලද වචන හා සම්බන්ධ කොට සඳහන් කරන්නෙමු.

වෙළුවනෙ කලන්‍දක නිවාපෙ වෙළුවන යනු ඒ උයනේ නමයි. එය දහඅට රියන් පවුරකින්ද, උණගස්වලින් ද වටවූයේය. දොරකොටු, මුරගෙවල් ආදියෙන් යුතු, මනරම් තිල්පැහැයෙන් යුතු විය. එහෙයින් වෙළුවන යැයි හඳුන්වනු ලබයි. ලේනුන්ටද නිදහසේ මෙහි විසීමට ඉඩ ලැබුණි. එහෙයින් කලන්‍දක නිවාප යැයිද කියනු ලැබේ. ලේනුන්ට මෙහි

නිදහස් තැනක් විය. ලේනුන් කාලක යනුවෙන් ද හඳුන්වයි. පෙර එක්තරා රජෙක් එහි උයන්කෙළි පිණිස අවුත්, සුරාවෙන් මත්ව, දවල් කල නිදාගත්තේය. පිරිවර ජනයාද 'රජ නිදන්නේ' යැයි උයනෙහි මල්පල ආදියට ආසා කරමින් එහා මෙහා ගියේය. සුරාගඳ දැනුණු එක් විසකුරු සපෙක් ගස් බෙනයෙන් නික්ම, රජු දෙසට එයි. ඒ දුටු රුක්දෙවියෙක් 'රජුගේ ජීවිතය රැකගනිමි'යි ලේනෙකු සේ අවුත්, රජුගේ කන අග හඬක් නැගීය. රජ පිබිදුණි. විසකුරු සර්පයා නැවතුණි. රජු එය දැක, මේ ලේනා මගේ ජීවිතය රැක ගත්තේ'යැයි ලේනුන්ට ආහාර සකස් කරවීය. ලේනුන් නොමරණ ලෙසද අණ පැතිරවීය. එතැන් පටන් එය කලන්දකනිවාප යැයි හැඳින්වීය. **සභියසස පරිබබාජකසස** සභිය යනු ඔහුගේ නම යි. පරිබබාජක යැයි (බුදු සසුනෙහි) පිටත පැවිද්ද උදෙසා කියනු ලබයි. **පුරාණසාලොහිතාය** දෙවතාය මව, පියා නොවේ. එසේ වුවත්, මවකු මෙන්, පියෙකු මෙන් හිතසුව කැමති වන ඒ දෙව්පුත් පෙර ලේ නෑකම ඇති දේවතාවකු සේ හඳුන්වා ඇත.

කසුප් බුදුරජාණන් වහන්සේගේ පිරිනිවනින් පසු, රුවන්සෑය පිහිටි කල්හී, කුලපුත්තු තිදෙනෙක් මුණගැසුණු සව්වන් හමුවෙහි පැවිදිව, චරිතයට ගැලපෙන කමටහන් ගෙන, පිටිසර ජනපදයකට ගොස්, කැලයෙහි මහණදම් පුරති. අතරතුර සෑය වැඳීමටත්, දහම් ඇසීමටත් නගරයට යති. පසුව හුදෙකලාව කැලයෙහි වාසයට එකඟව නොපමාව මහණදම් රැක්කාහ. එසේ විසුවත්, කිසිදු මගපලයෙන් උසස් බවක් නොලැබූහ. 'අපි පිඬු පිණිස යාමේදී ජීවිතය ගැන බලාපොරොත්තු තබමු. එසේ ජීවිතය ගැන බලාපොරොත්තු ඇතිව ලොවුතුරු දහම අවබෝධයට නොහැකිය. කෙලෙස් සහිතව මරණයට පත්වීමද දුකකි. අපි ඉණිමගක් බැඳ පව්වකට නැග, කයෙහිද, ජීවිතයෙහිද බලාපොරොත්තු නැතිව, මහණදම් පුරමු'යැයි සිතා එසේ කළහ.

ඒ අතර, වැඩිමහල් මහණුන් වහන්සේ හේතුසම්පත් ඇති බැවින්, එදිනම අභිඥා සයද සමග අරහත් බව අවබෝධ කළහ. උන්වහන්සේ ඉඳු බලයෙන් හිමවතට ගොස්, අනොතත්ත විලෙන් මුව දොවා, උතුරු කුරුවෙහි පිඬු පිණිස හැසිර, බත වළඳ නැවත වෙනත් පෙදෙසකට ගොස් පාත්‍රය පුරවා, අනොතත්ත පැන් ද බුලත් හා දැහැටි ද ගෙන, අනෙක් මහණුන් දෙදෙනා වෙත අවුත්, 'ඇවැත්නි, බලව, බලවත්කම, මේ උතුරුකුරුවෙහි පිඬු පිණිස ලද අහරයි. පැන් හා දැහැටි හිමාලයෙන්

ගෙනෙන ලදී. මේවා වළඳ මහණදම් කරවූ, මම මෙසේ හැමදා උවටැන් කරන්නෙමි'යි කීය. හිමිවරු දෙදෙනා ඒ අසා 'හිමියනි, ඔබ කටයුතු නිමකරන ලදී. ඔබවහන්සේ සමග සතුටුසාමීචි කතා පමණකුදු අපට පමාවකි. ඔබවහන්සේ නැවත අප හමුවට නොපැමිණෙනු මැනවැ'යි කීහ. ඒ දෙවු හිමි, කිසිදු අයුරකින් අනෙක් හිමිවරුන් එකඟ කරගැනීමට නොහැකිව ඉවත්ව ගියේය. ඒ හිමිවරුන් දෙදෙනාගෙන් කෙනෙක් දින දෙකතුනකින් අභිඥා පහ ලබා, අනාගාමී ව දෙවු හිමියන් පරිදිම කටයුතු කළේය. (මගපලයක් නොලද) ඉතිරිව සිටි හිමියන් විසින් පිළිකෙව් කරන ලදුව ඉවත්ව ගියේය. ඒ ඉතිරි වූ හිමි, පව්වට නැගී සත්වන දින, කිසිදු වෙසෙස් බවක් (මගපලයක්) නොලැබම කළුරියකොට දෙව්ලොව උපන්නේය. දෙවු රහත් හිමියෝ ද ඒ දවසෙහිම පිරිනිවන් පෑහ. අනාගාමී වූ හිමියෝ සුද්ධාවාසයෙහි උපන්හ. දෙව්පුතු කාමාවචර සදෙව් ලෝකවල වරින්වර දෙව්සැප විඳ අප බුදුරදුන් කල දෙව්ලොවින් චුතව, එක් පිරිවැජි ළඳක කුස පිළිසිඳ ගත්තේය.

ඇය එක්තරා රජකුල දුවකි. මවුපියෝ, 'අපගේ දියණිය ආගම් වාද දැනගනීවා'යි එක් පිරිවැජියෙකුට භාර කළහ. එහිදී එක් අතවැසි පිරිවැජියෙක් ඇය සමග අනාචාරයෙහි යෙදුණේය. එයින් ඇය ගැබ් ගත්තාය. ඇය ගැබිනියක බව දත් පිරිවැජියෝ නෙරපා දැමූහ. ඇය වෙනත් තැනකට යන අතරමගදී - ජනයා මැද (සභාවෙහි) දරුවකු බිහිකළාය. එයින් ඔහු 'සභිය' නමින්ම හැඳින්වූහ. සභිය, වයසින් වැඩුණුවිට, පිරිවැජි පැවිදි බව ලබා, නොයෙක් සිප්සතර ඉගෙන, මහා වාද කරන්නෙකුව, (දේසකයෙකුව) මුළු දඹදිවම සැරිසරමින්, තමා හා වාද කරන්නෙකු නොදැක නගරදොරටුව (අසළ) අසපුවක් කරවාගෙන, කැත් කුමරුන් ආදීනට උගන්වමින් වාසය කරයි.

මේ අතර, භාග්‍යවතුන් වහන්සේ උතුම් දම්සක් පවත්වා, රජගහ නුවරට අවුත් ලේනුන්ට වාසය වූ වේළුවනයෙහි වැඩවසති. සභිය බුදුවරයකුගේ ලොව පහලවීම ගැන නොදනී. ඉක්බිති සුද්ධාවාසයෙහි උපන් ඒ බ්‍රහ්මයා, සමවතින් නැගී, මෙබඳු වෙසෙසකට මම කවරකුගේ බලයෙන් පැමිණියෙම්දැයි, මෙනෙහි කරනවිට, කසුප් බුදුසස්නෙහි තමන් හා මහණදම් කළ සහායකයන් සිහිකොට, 'ඔවුන්ගෙන් එක් අයෙකු පිරිනිවන්පා ඇත. අනික් තැනැත්තා කොහිදැයි බලනවිට, දෙව්ලොවින් චුතව, දඹදිව ඉපිද (සිටියත්) බුදුඋපත ගැන නොදන්නේ යැයි දැන, මම

ඔහු බුදුන්වහන්සේගේ ඇසුරට යොමුකරම්'යි පැන විස්සක් සකසා, ඒ කාලයෙහි ඔහුගේ අසපුවට අවුත් අහසෙහි සිට, 'සභිය, සභිය යැයි කැඳවීය. සභිය නිදාසිටියදීම, ඒ හඬ අසා, පිටතට අවුත්, ආලෝකය දැක, හිස අත්මුදුන් බැඳ සිටියේය. 'සභිය, මම ඔබ වෙනුවෙන් ගැටළු පැන විස්සක් ගෙනාවෙමි, ඔබ එය උගනුව, යම් මහණකු හෝ බමුණකු හෝ මෙම පැන විචාළවිට පැහැදිලි කරත් ද, ඔහු ළඟ බඹසර හැසිරෙව'යි ඒ බ්‍රහ්මයා කීය. මේ දෙව්පුතු උදෙසා **පුරාණසාලොහිතාය දෙවතාය පඤ්හා උද්දිට්ඨා හොනති** යැයි කියන ලදී. උද්දිට්ඨා එසේ පැවසුවා මිස විස්තර නොකරන ලදී. එසේ කීවිටම සභිය එක් වචනයෙන්ම පද පිළිවෙලින් වටහා ගත්තේය. ඒ බ්‍රහ්මයා බුදු උපත දැන සිටියද සභියට නොකීවේය. අරුත් සොයන - විමසන පිරිවැජියා තමන්ම මගපෙන්වන නායකයෙකු හඳුනාගනී. මේ සසුනෙහි හැර පිටත මහණ බමුණන්ගෙන් හිස් යැයි අදහස් කරමින්, **යො තෙ සභිය.......චරෙය්‍යාසි** යැයි කීය. ථෙර ගාථාවේ සතරවන නිපාතයෙහි සභිය තෙරුන්ගේ චරිත කථාවේ '(ඔහුගේ) මව තම වැරදි පිළිවෙත ගැන සිතා, එය පිළිකුල් කොට, දැහැන් උපදවා බඹලොව ඉපිද ඒ බ්‍රහ්ම දේවතාවාට එම පැන පවසන ලදැයිද සඳහන්ව ඇත.

**යෙ තෙ** දැන් කිවයුතු කරුණු ගැන නැවත සඳහන් කිරීමයි. **සමණ බ්‍රාහමණ** පැවිදි බවට පත් මහණුන් ලෙසද, බමුණන් ලෙසද ලොවෙහි හඳුන්වනු ලබන, **සංඝිනො** පිරිස් ඇති, **ගණිනො** අපි (ආගමික) නායකයෝ වෙමු. සියල්ල දත්තෝ වෙමු'යැයි තහවුරු කරමින්, **ගණාචරියා** (යහපත අයහපත) පැවසීම හා අසන දෙයට පිළිතුරු දීමෙන් ගිහි පැවිදි පිරිසට ගුරුවරු ලෙස, **ඤාතා** උසස් යැයි හඳුනාගන්නා ලද පසිඳුව ඇති, **යසසිනො** (පූජා-සිවුපසය ආදිය) ලැබීමේ ගුණය යුතු, **තිත්ථකරා** ඔවුන්ගේ හැඟීම්-මතවාද පිළිගන්නවුන් විසින් තරයේ වැළඳ ගතයුතු, පිළිගතයුතු සමයවාදී නායකයෝ, **සාධු සමමතා බහුජනසස** මොවුන් සත්හුන් යහපත් තැනැත්තන් යැයි බොහෝදෙනා පිළිගත්තා වූ, **සෙය්‍යථීදං** ඔව්හු කවරහුදැ'යි තේරුම ඇති නිපාතයකි. **පූරණෙ** නමයි. **කසසපො** පරම්පරාවයි. උපතින් ඔහු දාසයෙකි. දාසයන් ගණනින් සියයක් පිරුනේ මොහුගෙනි. එහෙයින් ඔහුට පූරණ යැයි නම් කළහ. පලාගොස් නිරුවත් (කොටසක්) අතරේ පැවිදිව 'මම කසසප වෙමි'යි පරම්පරා නමින් හඳුන්වා ගත්තේය. සියල්ල දන්නා බව ද හැඟවීය. **මකඛලී** යනු නමය. ගවහලක උපන් බැවින් ගොසාල යැයි ද කියනු ලැබේ. ඔහු ද උපතින් දාසයෙකි. පලාගොස් පැවිදි වූයේය. සියල්ල දන්නා බවද හැඟවීය. **අජිතො** යනු

නමය. සැහැල්ලු දිවිපැවැත්ම සඳහා කෙස්වලින් කරන ලද කම්බිලියක් (පොරෝනයක්) දරයි. (පොරවයි) එහෙයින් **කෙසකම්බලී** යැයි කියනු ලැබේ. ඔහු ද සියල්ල දන්නා බව හැඟවීය. **පකුධ** යනු නමයි. **කච්චායන** පරම්පරාවයි. සැහැල්ලු දිවිපැවැත්ම අනුව ජලයෙහිද ජීවය ඇතැයි සළකා නෑම, මුහුණ සේදීම ආදිය පිළිකෙව් කරන ලදී. සියල්ල දන්නා බව ඔහුද හැඟවීය. **සඤ්ජයො** යනු නමයි. ඔහුගේ පියා බෙලට්ඨ නම් විය. එහෙයින් බෙලට්ඨ ගේ පුතා - බෙලට්ඨපුත්ත යනුවෙන් හැඳින්වීය. ඔහු ද සියලු දේ දන්නා බව හැඟවීය. **නිගණ්ඨා** පැවිදිව ලද නමයි. **නාත පුත්තො** යැයි පියාගේ නමින් කියනු ලබයි. **නාත** පියාගේ නමයි. ඔහුගේ පුතු නාතපුත්තය. ඔහුද සියල්ල දන්නා බව හැඟවීය. මේ සියළුදෙනාටම (ගෝලයෝ) පිරිවර පන්සියය බැගින් වූහ.

තෙ ඒ සාමයික නායකයෝ, **තෙ පඤ්හ** ඒ පැන විස්ස, **තෙ** ඒ පූරණ කස්සප ආදී නායකයෝ, **නෙව සම්පායන්ති** පිළිතුරු සකසා නොදෙති. **කොපං** සිතුවිලි කැළඹුණු බව (සිත අවුල් බවට පත්ව) **දොසං** නපුරු සිත් ඇති බව, මේ වචන දෙකම අඩුවැඩි ලෙසින් තරහ ගතියටම සමාන වචනයකි. **අප්පච්චයං** නොසතුටු බව, දොම්නස පළකරති. **පාතුකරොන්ති** කයෙන්, වචනයෙන් පළකරති. හැඟෙන සේ දක්වති. හීනායා ගිහි බවට පත්ව, පැවිදි බව හා සළකනවිට ගිහියෙකු වීම, සීලය ආදී ගුණයෙහි අඩුවීමක්, ලාමක වූ කාම ඇසුරත් අනුව පහත් බව කියැවේ. පැවිද්ද උසස්ය. **ආවත්තිත්වා** පසුබැස, **කාමෙ පරිභුඤ්ජයා** කම්සුව සොයන්නෙමි.

මේ වූකලී, සියල්ල දන්නා බව හැඟවූ පැවිද්දන්ගේ හිස්බව දැකීමෙන් සභියට ඇතිවූ හැඟීමයි. (එහෙත්) සිතෙහි ඇතිවන එකිනෙක ගැටෙන සිතිවිලි ගැන නැවත නැවතත් විමසන විට 'මේ තැනැත්තාද මහණෙනි, (බොහෝ දෙනා) ඔවුන් උසස් ලෙස පිළිගනී. තරුණ වූ පමණින් ඒ මහණුට දොස් නොනැඟිය යුතු'යැයි ආදී ලෙස සභිය පිරිවැජියාට සිතුණි. එහි **ජිණ්ණ** ආදී වචනවල ඉහත දක්වා ඇති පරිදිය. **ථෙරා** තම මහණදමෙහි තහවුරු බවට, තිර බවට පත්ව, **රත්තඤ්ඤූ** රුවන් හඳුනන්නා සේ, 'නිවන් රත්නය අපි දනිමු' යැයි මෙසේ තම හැඟුමෙන් ලෝවාසින් විසින්ද පිළිගන්නා ලද (පැවිදි බව ලැබ) බොහෝ රැය ගතවූ, දිගුකලක් පැවිදිව සිටින, **චිර පබ්බජිතා** ඔවුන් බොහෝ කලක් පැවිදිව සිටියේ යැයි, **න උඤ්ඤාතබ්බො** අවමන් කොට නොසිතිය යුතුය. පහත් ලෙස හඳුනා

නොගත යුතු බව කියන ලදී. **න පරිභොතබෙබා** නින්දා නොකළ යුතුය. 'මොහු මොනවා දන්නෙහිදැ'යි නොගත යුතුයැයි ද කියන ලදී.

**කංඛී වෙච්කිච්ඡී** සභිය භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුසාමීචි කතා කරමින්, උන්වහන්සේගේ රූසිරියත්, තැන්පත් බව හා සියල්ල දන්නා බවටත් බුහුමන් කරමින්, උඩඟුකම නැතිව ඉහත සඳහන් ගාථාව කීය. 'මෙය පැහැදිලි කරගැනීමට ඉඩක් (මට) ලැබෙන්නේ නම්, '.....මෙසේ සැක දුරු කරගැන්ම සඳහා විචාරීමට **කංඛී**, 'මේ මේ පැනවලට තේරුම්, පිළිතුරු කවරේද? මෙසේ මතුවන දෙගිඩියාව **වෙච්කිච්ඡී** තීරණය කරගැනීමට දුබල තරම් වූ සැකය හෝ ඒ පැනවල අරුත් සැක කිරීමේ දෙගිඩියා වූ සැකයෙන් **කංඛී**, දැඩි ලෙස තේරුම සොයමින්, (සිත) වෙහෙස කරමින් තීරණයක් ගැනීමට නොහැකිවීම **වෙච්කිච්ඡී**, **අභිකංඛමානො** බොහෝ බලාපොරොත්තු වෙමින්, **තෙසනතකරො** ඒ විමසන ලද පැනවල කෙළවර කරන කෙනෙකු වනු මැනව, **භවාහි** මෙසේ (තම අදහස) ඉදිරිපත් කළේය. **පඤ්හ මෙ පුට්ඨො.........ව්‍යාකරොහි මෙ** ඒ (කොටසෙහි) **පඤ්හ මෙ** මගේ පැන, **පුට්ඨො** අසන ලද, **අනුපුබ්බං** පැන පිළිවෙලින්, **අනුධම්මං** අදහස - තේරුම අනුව පාලියට නඟා, **ව්‍යාකරොහි මෙ** මට පහදා දෙනු මැනව.

**දූරතො** සභිය ඒ මේ අත ඇවිදිමින්, යොදුන් සත්සියයක් දුර ගෙවා පැමිණියේය. එහෙයින් **දූරතොව ආගතොසි** යැයි භාග්‍යවතුන් වහන්සේ කීහ. කසුප් බුදුරදුන්ගේ සසුනෙහි පටන් හෝ පැමිණි බැවින්, 'දුර සිට ආවෙහි'යැයි ඔහුට කීහ. **පුච්ඡ මං** මේ ගාථාවෙන් සියල්ල දන්නා වූ නුවණින් විසඳ අවසන් කරන බව හඟවයි. **මනසිච්ඡස** ඔබේ සිත කැමති වෙහිද? (ඔබ ඊට කැමැති වෙහි)

**යං වතාහං** ඒකාන්තයෙන් මම යම් කරුණක්, **අතතමනො** සතුටින් උද්දාම වූ සොම්නස් පිරි සිතින්, **උදගො** කයෙන් ද සිතින් ද, බොහෝ සෙයින් උසස්ව, මේ පදය හැම පාඨයකම නැත. දැන් යම් කරුණකින් සතුටු සිතක් ඇතිවී නම්, එය දක්වමින් **පමුදිතො පීතිසොමනසසජාතො** යැයි කීය. **කිමපතතිනං** කුමකට පැමිණියේද? කුමක් අවබෝධ වීද? **සොරතං** මනාව සාන්ත වූ, **සුරතං** යනුද පාඨයකි. මැනවින් වෙන්වූ යන තේරුමයි. **දනතං** දැමුණු, **බුදෙධා** මනාව අවබෝධ කළ හෝ අවබෝධ කළ යුතු හෝ,

මෙසේ සභිය එක් එක් ගාථාවකින් පැන සතර බැගින් පැන විස්සක් විමසීය. භාග්‍යවතුන් වහන්සේ එක් එක් පැනයට එක් එක් ගාථාවකින් පිළිතුරු දී අරහත් බව කුළුගන්වමින් ගාථා විස්සක් වදාළහ.

කෙලෙස් බිඳ දැමූ, උතුම් අදහස් මුදුන්පත් කරගත් ඒ මහණ නිවනට පැමිණියේදැ'යි **කිමපත්තිනමාහු භික්ඛූනං** යන ඔහුගේ මේ පැනයට **පජ්ජෙන** ආදී ගාථාවෙන් කරුණු පැහැදිලි කළහ. එහි තේරුම නම්, යම් මහණෙක් තමා විසින් පුරුදු කරන ලද පිළිවෙත් මගින්, **පරිනිබ්බානගතො** කෙලෙස් පිරිනිවනට පැමිණියේද, එසේ පිරිනිවනට (සසර ගමන ඇති කරවන සියළු කෙලෙස් සිඳ දමන ලද බැවින්) ගිය බැවින් ද **විතිණ්ණකංඛො** වේ. විපත්, සම්පත්, හානි, දියුණුව, වැනසීම, සදා පැවැත්ම, පව් පින් ආදී ලෙසින් **විභවඤ්ච භවඤ්ච විප්පහාය** සෝවාන් ආදී මගෙහි වසන්නා වූ **වුසිතවා ඛීණ පුනබ්භවො** මෙබඳු තුති වචනවලට සුදුසු වූ **සො භික්ඛු** වැරදි පිළිවෙත්වලින් මනාව වෙන්වීමෙන්, නොයෙක් ආකාර වූ කෙලෙස් නැති කිරීමෙන් සංවරයට පත්, එබැවින් එම අරුත දක්වමින් **සබ්බත්‍ථ උපෙක්ඛො** ආදී ගාථාවෙන් දෙවැනි පැනයට පිළිතුරු දුන්හ. එහි අදහස නම්, **සබ්බත්‍ථ** යම් (කෙනෙක්) මහණෙක්, රූප ආදී අරමුණුවල, 'ඇසින් රූ දැක සතුටු වන්නේද නොවේ. අසතුටු සිත් ඇති කරගන්නේද නොවේ.' 'චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති, න දුම්මනො' මෙසේ පවත්නා විට, කොටස් හයකින් යුතු **උපෙක්ඛතො** මනාව වැඩිදියුණු කරගත් සිහියෙන් **සතිමා, න සො හිංසති** හිංසා පීඩා නොකෙරේමය. එහිද, තැති ගන්නා - තැති නොගන්නා වූ ජීවීන්, **සබ්බලොකෙ** සියළු ලෝකවල, සැඩපහරින් එතෙර වූ බැවින් **තිණ්ණො** පව් සංසිඳින ලද්දේ **සමණො**, කැළඹුණු කල්පනා නැතිකරන ලදින් **අනාවිලො, යස්ස** රාග, දෝස, මෝහ, මාන දැඩිව ගත් රළු හෝ සියුම් කෙලෙස් පිරි නොයෙක් අදහස් **න සන්ති, සො** මේ මැදිහත් වූ වාසය කිරීමෙන් මනා දියුණු කොටගත් සිහියෙන් ද, හිංසනයෙන් තොර වීද, වැරදි පිළිවෙතින් වෙන්ව, සැඩපහර බඳු නොයෙක් කෙලෙස් සංසිඳවීමෙන් **සොරතො** එසේ ඉඳුරන් පුරුදු කරන ලදුව, නොබියව, නොවෙනස්ව දමනය වූයේ වේ. එහෙයින් එම අදහස **යස්සින්ද්‍රියානි** යන ගාථාවෙන් තුන්වන පැනය (පිළිතුරු) ලෙසට පැහැදිලි කළහ. එහි අදහස නම්, **යස්ස** ඇස් ආදී ඉඳුරන් හයට වන අරමුණු ගැනීමේදී එහි තිරසාර බවක් නැතැයි තිලකුණු මෙනෙහිකොට මනා සිහිනුවණ නම් සුවඳ ලඟාකරගත් ලෙසින්ද, **භාවිතානි** ඒ පිළිබඳ නිසි අයුරින්, **අජ්ඣත්තං** අරමුණ මෙනෙහි කරමින්, **බහිද්ධාච සබ්බලොකෙ**

මෙසේ යම් යම් ආකාරයෙන් ඉඳුරන් වෙනස් බවකට හෝ, වෙනස්වී, එහි දැඩි ලෝභ හැඟීම් ලෙසින් පුරුදු කරන ලද්දේ නොවේ. මෙසේ **නිබ්බිජ්ඣ** දැන, මනාව අවබෝධ කොට, **ඉමං පරඤ්ච ලොකං** රූපාදිය අරමුණුකොට (ඛන්ධ සමූහය හෙවත්) තමා ඇසුරෙන් ගොඩනඟන ලෝකයෙන් ද මුළානොවූ මරණයකට පත්වනු කැමතිව, **කාල කංඛති** ජීවිතයෙහි අවසන් කාලය - මොහොත බලා සිටී. මරණයට බයක් නැත. 'මට මරණයෙහි බයක් නැත, ජීවිතය ගැන දැඩි ආසා නැත. කුලීකරුවකු කුලිය බලාපොරොත්තු වන්නා සේ මරණයට කාලය බලා සිටිමි'යි රහත් තෙරනමක කියන ලදී.

**මරණෙ මෙ භයං නත්‍ථි, නිකන්ති නත්‍ථි ජීවිතෙ**
**නාභිකංඛාමි මරණං, නාභිකංඛාමි ජීවිතං**
**කාලඤ්ච පටිකංඛාමි නිබ්බිසං භතකො යථා**

**භාවිතො ස දන්තො** මෙසේ පුරුදු කරන ලද ඉඳුරන් ඇති ඒ තැනැත්තා දැමුණේ වෙයි. යම් ලෙසකින් බුද්ධය හෙවත් තියුණු නුවණින් 'බුද්ධ' නම් වේ ද, කෙලෙස් නින්දෙන් පිබිදුනේ ද එපරිදි ඒ අදහස දක්වමින්, **කප්පානි** යන ගාථාවෙන් සිවුවන පැනය පැහැදිළි කළහ. **කප්පානි** ආසාව හා දඩිව ගත් නොයෙක් හැඟීම්, දැකීම් ය. ඒවා පිළිබඳව ඒ ඒ ආකාරයෙන් තදින් කල්පනා කරන බැවින් කප්පානි යැයි කියනු ලබති. **විචෙය්‍ය** තිර පැවැත්මක් නැතැයි නුවණින් සිතා, **කෙවලානි** සියළු, **සංසාරං** එය මෙසේ දැක්වේ.

**ඛන්ධානඤ්ච පටිපාටි ධාතු ආයතනානි ච**
**අබ්බොච්ඡින්නං වත්තමානා සංසාරොති පවුච්චති**

රූපාදී සමූහයන්ගේ පිළිවෙලත්, ආප ආදී ධාතු කොටස් හා ඇස් ආදී ආයතනාදියෙන් නොසිඳී පැවැත්ම - සසර යැයි කියනු ලැබේ.

මෙසේ රූපාදී සමූහයන්ගේ පිළිවෙලින් සසර වේ. ඒ සසර ගැන විමසා බලන්නේ නම්, එපමණකින් ඒ රූප ආදියට මුල්වන කම් කෙලෙස් බැඳුම්වලින් තෙ ආකාරව (තිලකුණු) විදසුන් වැඩීම **උභයං චුතුපපාතං** යැයි කීහ. සත්වග මරණය, උපත යන කරුණු දෙක මැනවින් දැන යන තේරුමයි. මෙයින් නැවත උපදනා තැන් ගැන දැනීම දැක්වෙයි. **විගතරජමනංගනං විසුද්ධං** රාගාදී දූවිල්ලෙන් ඉවත්වූ, නොකිලිටි, පිරිසිදු

වූ, **පත්තං ජාතික්ඛයං** නිවනට පත්, **තමාහු බුද්ධං** මේ ලොව්තුරු විදසුන් වැඩීමෙන්, මරණය, උපත ගැන දැනගන්නා නුවණින් යුතුව, මේ කෙලෙස් නම් දූවිල්ලෙන් තොරව, කෙලෙස් නින්දෙන් පිබිද, ඒ පිළිවෙතින් ඉපදීම කෙළවර කළ බැවින් 'බුද්ධ' යැයි කීහ. **කප්පානි විචෙය්‍ය කෙවලානි** නැතහොත් හටගැනෙන හා පිරිහී යන නොයෙක් කල්පවල දී 'මෙසේ විසීමි' යනාදී ලෙස සොයා දැනගෙන යන තේරුමයි. මෙයින් මුල්ම විදු නැණ (පෙර විසූ තැන් දැනීම) ගැන කීය. **සංසාරවූභයං චුතූපපාතං** (සසර) සරන සත්වග මැරීම ඉපදීම සේ දෙකොටසක් ඇත්තේ සංසාරයයි. ඒකාන්තයෙන් මේ ජීවී ආදී ලෙසින් ඒ තතු සොයා දැන යන තේරුමයි. එයින් දෙවැනි විදුනැණ ගැන (මැරෙන - උපදනා තැන් දැනීමේ නුවණ) දැක්වීය. කෙලෙස් දුරුකිරීමේ නුවණින්, කෙලෙස් දූවිලි පහකරන ලදුව, නිවනට පැමිණියේ යැයි ඉතිරි තුන්වන නුවණ ගැන කීය. **තමාහු බුද්ධං** මෙසේ තුන්විදු නැණින් යුතු බැවින් ද 'බුද්ධ' යැයි කීය.

මෙසේ පළමු ගාථාවෙන්, කියන ලද පැනය විසඳ දෙවන ගාථාවෙන් අසන ලද පැනයටද, බ්‍රහ්ම බවට හෙවත් උසස් බවට පත්ව උතුම් අදහස මුදුන් පමුණුවා ගත් බ්‍රාහ්මණයා (කෙලෙසුන් නැසූ) තැනැත්තා) සියළු පව් බහාතබන ලදැයි **බාහිත්වා** යන ගාථාවෙන් පැහැදිළි කළහ. එහි තේරුම නම්, **බාහිත්වා සබ්බපාපකානි ධීතතෙතා** යමෙකු අරහත් මගට පත්ව පව් බැහැර කරන ලද බැවින් එසේ සඳහන් කෙරේ. **විමලො** පිරිසිදු, උසස් බවට පත්ව, සිත අවුලට පත් කරන කෙලෙස්වලින් සන්සුන්ව එකඟ බවට පත් උසස් පල සමවතින් සාධූ **සමාහිතො**, සසර ගමනට අදාල වන හේතු ඉක්මවන ලද නිසා **සංසාරමතිච්ච** සියළු කටයුතු නිමකරන ලද නිසා **කෙවලී, සො** තණහා හා දැඩිව ගත් දැකීම් තදින් සිතෙහි නොපවතින නිසා **අසිතො**, ලෝදහම්හි කම්පාවීමක් වෙනසක් නොමැති බැවින් **තාදි පවුච්චති** මෙසේ තුති පුදට - අගැයුමට සුදුසු **සො** බ්‍රහමා ඒ උතුම් තැනැත්තා (නියම) බමුණාය.

පවු නසන ලද බැවින් **සමණෙ** නැවත පව් නොකරන (දිය නෑමෙන් පිරිසිදු වූවා සේ) **නහාතකො**, අපරාධයක් නොකරන බැවින් **නාගො** යැයි කියනු ලැබේ. එහෙයින් එම කරුණ පැහැදිලි කරමින්ද, ඊට පසුව තවත් ගාථා තුනකින් විමසූ පැන තුනකටද පිළිතුරු දුන්හ. **සමිතාවී** අරහත් මගින් කෙලෙස් සමනය කොට සිටි, **සමණෙ පවුච්චති තථත්තා** එබඳු තැනැත්තාට **සමණ** යැයි කියනු ලැබේ යනුවෙන් මෙපමණකින්

පැන විසඳන ලදහ. ඉතිරි වචන සභිය, බොහෝ ගරු බුහුමන දැක්වීමට කියන ලදී. කෙලෙස් සමනය කළ ඒ මහණ පින් ද පවු ද රැස් නොකිරීමෙන් පහාය **පුඤ්ඤපාපං** (කෙලෙස්) දූවිලි ඉවත් කිරීමෙන් විරජො **අනිච්චාදිවසෙන ඤත්වා ඉමං පරඤ්ච ලොකං ජාතිමරණං උපාතිවත්තො** තාදී වේ. **නිනහාය..........නහාතකො** තමා කෙරෙහි ද, බාහිරව ද ඇස් ආදී ආයතන මගින් ඇතිකරගන්නා තමා හා බාහිරව අරමුණු ලෙසින් උපදවා ගනු ලබන සියළු දේ, **සබ්බපාපකානි** සිවුමග නුවණින් **නිනහාය** සෝදා, එසේ නෑමෙන් (සෝදා හළ) පව් නැති බැවින් තණ්හා - දැඩි හැඟීම් සංකල්පනාවලින් **කප්පියෙසු දෙවමනුසෙසසු කප්පං න එති, තං නහාතකමාහු** යැයි මෙසේ අරුත දතයුතුය.

(දෙවන පැනයට පිළිතුරු දැක්වෙන) සිවුවන ගාථාවෙහි ද ආගුං **න කරොති කිඤ්චි ලොකෙ** යම් තැනැත්තෙක් ලොවෙහි සුළු පමණකුදු අයහපත් දෙයක් සේ සැළකෙන වරදක්, අපරාධයක් නොකරයිද, **නාගො පවුච්චති තථත්තා** මෙපමණකින් පැනය විසඳන ලද්දේය. ඉතිරි වචන පෙර පරිදිම තුති වදන්ය. සිවුසස් අවබෝධය මගින් අපරාධ - වැරදි නොකරන හෙයින් කාමාදී එකතුවීම්, **සබ්බසංයොගෙ** සංයෝජන දහයද, සියළු සසර බැඳීම්ද **විසජ්ජ** හැරදමා **සබ්බත්ථ** රූපාදී සමූහයෙහි කිසිදු ඇලීමක්, **න සජ්ජති** දෙ ආකාරයෙන් මිදීමෙන් **විමුත්තො තාදී** නම් වේ.

මෙසේ දෙවන ගාථාවෙන් කී පැනය විසඳ තුන්වන ගාථාවෙන් (ඊළඟ) පැනයට (පිළිතුරු දෙති.) **ඛෙත්තානි** ආයතන ගැන කියනු ලැබේ. මේ ඇසය. (අරමුණු වන) ආයතනයද මෙයයි. අරමුණ හටගැනීමට සුදුසු තැනද එයයි. හේතුවන - ආධාරවන තැනද එය බව එබැවින් දක්වා ඇත. **විජෙය්‍ය** ඒවා ජයගෙන, මැඩපවත්වා, **විචෙය්‍ය** තිරව පවත්නේ නැතැයි නුවණින් විමසා බලා **කෙවලානි** ඒ ඒ දේ එකතුවීමෙන් හටගනු ලබන සියළුම දේ, **දිබ්බං මානුසකඤ්ච බ්‍රහ්මඛෙත්තං** දොළොස් ආකාර ආයතන ලෙස ඇතිවන දෙව් මිනිස් භවයන්හි, බඹලොවෙහිද ආයතන හය හා ඇස් ආදී දොළොස් ආයතනවලද ඒ සියළුම දේ ජයගෙන, හැරදමා (මේ කිසිම තැනක උපතක් නොලබා) මේ සියළුම දේ හටගැනීමට මුල්ම බැඳීම, නොදැනීම හෙවත් අවිජ්ජා හා භවයෙහි දැඩි ආසාවයි. ඒ සියල්ලම **සබ්බඛෙත්ත මූලබන්ධනා පමුත්තො** මෙසේ ඒ හටගැනීමට හේතුවන තැන ජයගන්නා ලද බැවින් **ඛෙත්තජිනො** නම් වේ. එහෙයින් **ඛෙත්තානි** පිළිබඳව මේ ගාථාවෙන් පළමු පැනය සේ පැහැදිලි කළහ.

ඇතැම් තැනක, කරන කියන කටයුතු හෙවත් කම්ම නැමති කෙතෙහි බීජය විඤ්ඤාණය බවත්, තෙත් ගතිය - ජල සැපයුම තණ්හාව බවත් 'කම්මං ඛෙත්තං විඤ්ඤාණං බීජං තණ්හා සිනෙහො සඳහන් වේ. කම්මානි ඛෙත්තානි යැයි බහුවචනයෙන්ද කියති.

දිබ්බං මානුසකඤ්ච බ්‍රහ්මඛෙත්තං දෙවි බවට පත්වන කටයුතුය. මිනිස් බව ලැබීමට හා බ්‍රහ්මයකු බවට පත්වීමට සුදුසු කටයුතු මෙහිලා ගැනේ. ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය. තමා විසින් කරනු ලබන හෝ තමාට අයත් යන අදහසින් රැස්කර තබන කොපු (කවර) සේ කොසානි යැයිද අදහසින් රැස්කර තබන කොපු (කවර) සේ කොසානි යැයිද කරන කියන කටයුතුවලට කියනු ලැබේ. ඒවා සිඳ දැමීමෙහි, වනසා දැමීමෙහි සමත්වේද ඒ කරුණ දක්වමින් කොසානි යන ගාථාවෙන් දෙවන පැනය පැහැදිළි කළහ. එහි තේරුම නම්, ලොවී ලොවුතුරා විදසුන් වැඩීමෙන් එහි පලය ලෙස හැමදෙයෙහි තිර නැති බවද කුසල අකුසල කටයුතු ලෙස කියන ලද පරිදි කොසානි විචෙය්‍ය කෙවලානි, මෙහි වෙනස වන්නේ එයට එකතුවන කාමාවචර කුසල් අටයි. දිබ්බං මානුසකඤ්ච මහත් බවට පත්වන නවාකාර වූ කුසල සිතිවිලි අනුව බ්‍රහ්මකොසං ලබන්නේය. මෙම සිවුමග භාවනාවෙන් නොදැනීම, භවය හා ආසාව ඉවත්වීමෙන් සබ්බකොසානං මූලබන්ධනා මිදුණේය. මෙම කම්ම රඳවා තබන, මලු හෙවත් 'කෝස' සිඳ දැමීමෙන් කුසලො පවුච්චති තථත්තා තාදී වෙයි. නැතහොත් සත්වගට (ආවේණික ඒ ඒ පුරුදු) තබා ගන්නා කඩුකොපුවක් මෙන් කොස යන්නෙන් තුන්භවය සහ ආයතන දොළහ දතයුතුය. මෙසේ මේ පිළිබඳව අදහස් දැක්විය හැකිය. හුදෙක් මෙපමණකින්ම නුවණැත්තෙකැයි, පණ්ඩිත යැයි කියනු නොලැබේ. එතකුදු වුවත් එම ආයතන පිළිබඳව විමසුම් නුවණින් (ඇති සැටියෙන් දැකීමේ) ඇලුනේද පණ්ඩිතයෙකැයි කියනු ලැබේ. එම අරුත දක්වමින් තදුභයානි යන ගාථාවෙන් තුන්වන පැනය විසඳූහ. එහි අරුත නම්, අජ්ඣත්ත බහිද්ධා ච මෙසේ උභයානි අනිච්ච ආදී ලෙසින් විමසා බලන්නේය. පණ්ඩරානි (ඉහත සඳහන් වූ) ආයතන, ඒවා ඇති සැටියෙන්ම, නිසි පරිදි, ඉතා පිරිසිදුව අවබෝධයෙන් දැනීම අනුව, (එහි තතු පැහැදිලි කිරීමට) මෙසේ කියනු ලබයි. එසේ දැන, මේ පිළිවෙතින් අපිරිසිදු කෙලෙස් ඉවතහළ බැවින් සුද්ධ පඤ්ඤා පණ්ඩිතො පවුච්චති තථත්තා ඒ ආයතන පිළිබඳ මෙබඳු නුවණින් යුතු වූයේය. ඉතිරි වචනවලින් තුති පළවෙයි. පව්පින් යැයි කියන ලද පරිදි කණ්හසුක්කමුපාතිවත්තෙතා තාදී වෙයි.

එහෙයින් මෙසේ තුති කරන ලදී. 'මොන' යනුවෙන් නුවණට කියනු ලැබේ. යම් නුවණකින් යහපත් දැකීම මැනවින් අවබෝධ කරගනීද එබඳු නුවණින් හෙබි තැනැත්තා මුනිවරයා යැයි හඳුන්වයි. එහෙයින් අසතඤ්ච යන ගාථාවෙන් සිවුවන පැනය පැහැදිලි කළහ. එහි අදහස නම්, අයහපත, යහපත ලෙස ගැනෙන, හොඳ නරක පිළිබඳ දේවල්, අජ්ඣත්තං බහිද්ධා ඒවා මුළු ලොවෙහිම (ඉඳුරන් මගින් තමා හා බාහිරව ගොඩනඟන ලෝකය) නුවණින් දැන අසතඤ්ච සතඤ්ච ඤත්වා ධම්මං එම නුවණ ඇති නිසාම, රාගාදී කොටස් සතක් වූ, සංගං තණ්හා, දිට්ඨි ලෙසින් දෙකොටසකි. ජාලඤ්ච අතිච්ච ඉක්මවා සිටියේ, සො ඒ 'මොන' යැයි කියන ලද මහා නුවණින් යුතු බැවින් මුනි, දෙවමනුසෙසහි පූජියො මේ තුති වදනයි. ඒ තැනැත්තා කෙලෙසුන් නසන ලදුව මුනි හෙවත් රහත් බවට පත්වූ බැවින් දෙව්මිනිසුන්ගෙන් පූජා ලැබීමට සුදුසු වේ. එහෙයින් මෙසේ තුති ලද්දේය.

මෙසේ තුන්වන ගාථාවෙන් අසන ලද පැන විසඳ සිවුවන ගාථාවෙන් අසන ලද පැනයටද පිළිතුරු දෙති. යම් තැනැත්තෙක් සිවුමග නුවණින් ලද අවබෝධයෙන් කෙලෙස් වැනසීද, ඉතා උසස් වූ වෙදගූ නම් වෙයි. ඒ උසස් බවට පත් තැනැත්තා සියළු මහණ බමුණන් විසින් මැනවින් දතයුතු යැයි අදහස් කරන ලද වෙදානි ඒ විදසුන් මග වැඩීමේ කටයුතු හේතුවෙන් කිසිවක තිර පැවැත්මක් නොමැති බව විචෙය්‍ය, ඡන්දරාගය හෙවත් කැමැත්ත හා ආසාව නැති කිරීමෙන් සබ්බං වෙදමතිච්ච යම් වින්දනයක් නිසා වෙනස් ආකාර වූ වේදනා හටගනීද, ඒ සියල්ල සබ්බාසු වෙදනාසු වීතරාගී වේ. එබැවින් එම කරුණු පැහැදිලි කිරීමට 'මෙසේ පැමිණිය යුතුයැ'යි නොකියා, වෙදානි යන ගාථාවෙන් මුල් පැනය පැහැදිලි කළහ. මනා නුවණින් සියළු දතයුතු දේ සොයා දැනගැනීමෙන් ද වෙනත් මහණ බමුණන් දැනසිටිය යුතුයැයි අදහස් කළ කරුණුද දැන, ඡන්ද රාගය නැති කිරීමෙන් ඒ සියල්ල ඉක්මවා සිටියේය. වේදනාවලදීද (විඳීම්වලදී) වීතරාගීව ඒ පිළිබඳ මනා දැනීමෙන් සියල්ල ඉක්මවා සිටියේය. එහෙයින් ද වෙදගූ නම් වේ. එම අදහස පැහැදිලි කිරීමේදී මෙයට පත්විය යුතුයැයි නොකියා, මේ ගාථාවෙන් පළමු පැනයට කරුණු පැහැදිලි කළහ. දෙවැනි පැනයෙහි අනුවිදිතො අවබෝධ නොකළ යන අදහසින් කියනු ලබයි. අනුවිච්ච පපඤ්ච නාමරූපං අජ්ඣත්තං තම සිත් පරම්පරාවෙහි දැඩි ආසාව, දැඩිව ගත් හැඟීම්, මානාදී කෙලෙස් (පුද්ගලිකව ගොඩනඟන ලෝකය) නිසා ඇතිවන නාමරූප තිරබවක් නැතැයි මනාව

විමසා දැන, හුදෙක් තමා ගැන පමණක් නොව, බහිද්ධා ච රොගමූලං අනුන්ගේද මෙම නාමරූප නිසා වන (කෙලෙස්) රෝගයනට මුල්වන්නේ නොදැනීමෙන් වූ මුළාව, භවයෙහි ඇල්ම ආදී පමාව බව දැන ඒ භාවනා මගින්, සබ්බසං රොගානං මූල බන්ධනා සියළුම රෝගයනට මුල්ම බැඳීම වන්නේ නොදැනීම, භව ඇල්ම ආදියට ඇති පමාව මුදා, අත්හැර දමන ලද්දේය. එහෙයින් අනුවිච්ච යන ගාථාවෙන්, දෙවන පැනයට පිළිතුරු දුන්හ. මෙහි උත්සාහය ඇත්තකු වන්නේ කෙසේද? යම් ලෙසකින් ඒ තැනැත්තා උතුම් සිවුසස් මගින් සියළු අයහපතින් දුරුව, එසේ ඉවත් වූ බැවින් නැවත පිළිසිඳ ගැනීමක් (උපතක්) නොමැති බැවින් නිරයදුක්ඛමතිච්ච, උත්සාහය වාසය කරන තැනක් කොට, (උත්සාහයෙන් ඈත්නොවී) විරියවාසො ඒ කෙලෙස් දුරුකළ රහත් උතුමා 'විරියවා' යනුවෙන් හැඳින්වීම සුදුසුය. එම කරුණ සඳහන්කොට විරතො යන ගාථාවෙන් තෙවන පැනය පැහැදිළි කළහ. පධානවා ධීරොතාදී මේ තුති වදන්ය. ඒ මග නුවණෙහි උත්සාහවත් වූ නුවණැත්තා කෙලෙස් සතුරන් මැඩලීමට හැකි බැවින් (අටලෝ දහම්හි) නොවෙනස්ව කම්පා නොවී සිටී. එහෙයින් මෙසේ තුති දක්වන ලදී. (අගයන ලදී.) ඉතිරි වචන සුදුසු පරිදි සළකා ගත යුතුය. කෙසේ ආජානී නම් වේද? සියළු වැරදි දොස්වලින් තොරව, නොවක්ව, කළයුතු නොකළ යුතු දේ දන්නා අසකු හෝ ඇතකු ආජානීය යැයි ලෝක සම්මතයයි. එහෙත් ඒ සතුන්ගේ දොස් නැතුවාම නොවේ. එහෙත් කෙලෙස් සිඳලූ රහතුන්ගේ ඒ සියළු දොස් නැත. එහෙයින් ආජානීය යැයි හැඳින්වීමද සුදුසු බැවින් යසස යන ගාථාවෙන් සිවුවන පැනයට පිළිතුරු පහදා දුන්හ.

එහි අරුත නම්, අජ්ඣත්තං බහිද්ධාච තමා හා බාහිරව බැඳුණු (දස) සංයෝජන යසස අසසු ලුතානි බන්ධනානි තියුණු නුවණ නැමති අවියෙන් සිඳින ලදී. දෙකඩ කරන ලදී. සංගමූලං (කාමය, තණ්හාව ආදිය ඇතිකරන) ඒ ඒ දේවල් කෙරෙහි එකතුවීමෙන්, ඇලීමෙන්, එය ඉවත් නොකරන බැවින් මුල් බැසගෙන සිටී. තමා හා බාහිරවද එසේ මුල්බැසගත් රාගාදී බැඳීම් සියල්ලම කපා දමන ලදුව, බන්ධනා පමුත්තො ආජානීයො වුච්චති තථත්තා තාදීච හොති මෙසේ සිවුවන ගාථාවෙන් ඇසූ පැනය විසඳ පස්වන ගාථාවෙන් ඇසූ පැනයටද පිළිතුරු දෙති. අකුරු ගැන සිතන්නෝ ඡන්දස් ඉගෙනීම පමණකින් (වේදය) ඇසීමෙන් කෙනෙකුගේ උගත් බව අගය කරනු ලබත් ද, ඒ ඇසීමෙන් ලද උගත් බව කතාබහට සීමාවීමක් පමණි. උසස් තැනැත්තා බොහෝ ඇසූ පිරූ තැන්

ඇති බැවින්, අයහපත් කටයුතු අත්හැරීමෙන් එම ඇසීමෙහි (අසා දැරීමෙහි) නිසි අගය සපුරයි. ඒ කරුණ දැක්වීමට මෙයට පැමිණිය යුතුයැයි නොකියා **සුත්වා සබ්බධම්මං** යන ගාථාවෙන් පැහැදිලි කළහ.

එහි තේරුම නම්, ඒ රහත් උතුමා, මේ ලෝකයෙහි ඇසීමෙන් ලබන නුවණින් කරන කටයුතු ගැන අසා, හෝ කළයුතු කටයුතු ගැන අසා, විදසුන් අනුව සියළු දෙයෙහි අනිස බවද දැන, යම්කිසි වැරදි නිවැරදි දේ ඇත්ද, කෙලෙස් හා කෙලෙස් හටගන්නා තැන්ද මේ පිළිවෙතින් ඉක්මවූයේ යැයි වදාළහ. **සුත්වා සබ්බධම්මං අභිඤ්ඤාය ලොකෙ සාවජ්ජානවජ්ජං යදත්ථිකිඤ්චි අභිභුං** අසන ලද තැනැත්තා **සොත්ථියොති** ආහු ඒ රහත් උතුමා සියළුම රූපාදී සමූහ පසකින් හා ඇස ආදී ආයතනවලින් හටගැනෙන කෙලෙස් බැඳුම් වලින් මිදී ඒ රාගාදී දුක්වලින්ද ඇත් වූයේය. එහෙයින් **අකථංකථිං විමුත්තං අනීඝං සබ්බධි** යැයි දක්වා ඇත. අයහපත් කටයුතු අත්හළ බැවින්ද සොත්ථියො යැයි හඳුන්වයි. ජනයා කෙරෙහි හිතකාමීව, සාමකාමීව සිටීමෙන් අරිය නම් වෙයි. පහසුවෙන් ළඟාවිය හැකි, සමීප වියහැකි යන තේරුමයි. ඒ ගුණයෙන් 'අරණියො' නම් වෙයි. **ජෙත්වා** ආදී ගාථාවෙන් දෙවන පැනයටද කරුණු පැහැදිළි කළහ. එහි අරුත නම්, සතරාකාර වූ ආසවානි ඒවා ද, ආලයානි නුවණ නැමති අවියෙන සිඳ, විදවා නුවණැති, සිවුමගින් ද පැණවත් වූ **සො** නැවත උපතකට **න උපෙති ගබ්භසෙය්‍යං** කිසිදු උපත් මූලයකටද නොපැමිණේ. (කිසිදු ආකාර ඉපදීමක් නොලබයි) **සඤ්ඤං තිවිධං** කාමාදි ලෙසින් වූ, කාමයෙහි ගති සොබාවය වූ **පංකං පණුජ්ජ** දුරලා, තණ්හා, දිට්ඨි ආදී කිසිම හැඟීමක් නොගනී. මෙසේ කෙලෙස් සිඳලන ලද ගුණයෙන් යුතු එතුමන්ට **තමාහු අරියො** (එසේ කියනු ලැබේ.) එසේම පාපයෙන් දුරුවූ බැවින් ද අරිය නම් වේ. අයහපත් වූ, විපත්දායක වූ දෙයෙහි පහත් බවට පත් නොවේ. එබැවින් එම අරුත සඳහන් වන මෙම ගාථාවෙන් දෙවැනි පැනයටද කරුණු පහදා දුන්හ. කාම ආදී ආසව, පාපී වූ, විපත් ගෙන දෙන බව පිළිගැනීමයි. ඒවා රහත් බවින් සිඳ දමන ලදින්, දුරුකරන ලදින්, කිසිදු කම්පාවකට පත් නොවේ. එයින් ඈත් වෙයි. ඒවා කෙරෙහි ඉරියව් නොදක්වයි. (නොහැසිරේ.) මේ කරුණු නිසාද අරිය නම් වේයැයි දතයුතුය. නුවණ ලද එබඳු උතුමෙක් නැවත මවුකුසකට නොපැමිණේ. මේ අරුත් සංකල්පනය තුති වචනම - අගැයීම පිණිසම වෙයි.

කෙලෙස් දුරුකිරීමෙහි ලා, යම් ආකාර වූ හැසිරීමකට පැමිණිය

යුතු නම්, ඒ කෙසේද? එසේ හැඳින්වීමට කෙසේ සුදුසු වේද? එහෙයින් එම කරුණ දක්වමින් **යො ඉධ** ගාථාවෙන් තුන්වන පැනයට පිළිතුරු දුන්හ. **යො ඉධ** මේ සසුනෙහි යම් කෙනෙක්, **චරණෙසු** හෙමවත සූත්‍රයෙහි කියන ලද පරිදි සීලාදී පසළොස් ආකාර වූ, කරුණු දැක්වීමෙහි ආධාර විබත් වචනයි. **පත්තිපත්තො** පැමිණිය යුතු තැනට පැමිණියේ, යම් තැනැත්තෙකු, හැසිරීම අනුව, හැසිරීම හේතුකොට, හැසිරීම නිසා පැමිණිය යුතු අරහත් බවට පැමිණියේ යැයි කියන ලදී. **චරණවා සො** ඒ තැනැත්තා විසින් එම හැසිරීම අනුව පැමිණිය යුතු වූ, (තැන ලැබීමට) එම හැසිරීම අනුගමනය කරන ලදී. මෙපමණකින් පැනය විසඳන ලද්දේය. ඉතිරි වචන එහි තුති වචනයි. අගැයීමයි. හැසිරීමෙන් පැමිණිය යුතු තැනට පැමිණි තැනැත්තා **කුසලො** හැකියාව - සමත්කම ඇත්තෙක්ද වේ. **සබ්බදා ච ආජානා** නිවණෙහි නිති ගැඹුරු වූ සිතින් හැමවිටම රූපාදී සමූහයෙහි **න සජ්ජති** දෙආකාර මිදීමෙන් **විමුත්තො**, තරහ ද **න සන්ති**

(තවුස්) පිරිවැජි පිළිවෙතට අදාල කටයුතු කිරීමෙන් පිරිවැජි නම් වේද, එය පෙන්වා දෙමින් **දුක්ඛවෙපක්කං** යන ගාථාවෙන් සිවුවන පැනයට කරුණු පැහැදිළි කළහ. එහි විපාකයම වෙපක්ක නම් වෙයි. දුක් විපාක වේ යැයි **දුක්ඛ වෙපක්කං**, දුක් ගෙනදෙන තුන්කල්හිම පවත්නා කටයුතු මෙහි අදහස් වේ. **උද්ධං** අතීතයට අයත්, **අධො** අනාගතයට අයත්, **තිරියං වාපි මජ්ඣෙ** වත්මනට අයත්, ඒ විපාකය අතීතයටද අනාගතයට ද, වත්මනට ද අදාල නැත. ඒ අතර වූ බැවින් මැද යයි කියනු ලැබේ. **පරිබ්බාජයිත්වා** පිට කරවා, ඉවත් කරවා, **පරිඤ්ඤචාරී** පිරිසිඳ දැන හැසිරෙන, මේ කලින් සඳහන් නො කරන ලද වචනයි, එහි අදහස මෙයයි. යම් තැනැත්තෙක් තුන්කල්හිම බලපාන දුක් ළඟාකර ගනීද, උපදවා ගනී ද, **යදත්ථි කිඤ්චි** ඒ සියළු කටයුතු ඒ සියල්ල උසස් සිවුසස් මගින්, තණ්හාව, නොදැනීමේ තෙත් බව වියළවාලමින්, නැවත පිළිසිඳ ගැනීමක් ඇති නොවන අයුරු (මතු සසරින්) ඉවත්වන බැවින් ඒ පිළිබඳ මනා දැනුමෙන් හැසිරෙන නිසා පරිඤ්ඤාචාරී වේ. ඒ වූ කලී කරන, කියන කටයුතුවලින් පමණක් නොවේ. **මායා මානමථොපි ලොභකොධං** මේ කරුණු ද නැතිකිරීම නුවණින් දැන එසේ හැසිරේ. **පරියන්තමකාසි නාමරූපං** නාමරූපයද අවසාන කළේය. මෙම අදහස පරිබ්බාජෙසි යනුවෙන් කියැවේ. මෙසේ ඒවා ඉවතහළ බැවින්, **තං පරිබ්බාජකමාහු, පත්තිපත්තං** මේ තුති වදනකි. මෙසේ පැන විසඳීමෙන් සතුටු වූ සභිය ඒ ගැන අගය කොට තුති දැක්වූ ගාථා තුනෙහි **ඔසරණානි** යන වචනයෙහි තේරුම

බසිනා තොටුපලවල්, මෙහි දැඩිව එල්බගත් මත හා හැඟීම් අදහස් වේ. 'මමය, මගේය යන හැඟීම මෙන්ම, බ්‍රහ්මජාල සූත්‍රයෙහි කියන ලද දෙසැටක් වූ වැරදි මත ද සමග ඒවා හැටතුනක් වේ. ඒ වෙනත් මතවාදීන් වූ **සමණානං පවාද සිතානි** ඔවුන් පෙන්වා දෙන පරිදි, (මිස) උපන් ආකාරයෙන් නොවේ. ඉපදීම අනුව ගැහැණිය - පිරිමියා යැයි. **සඤ්ඤක්ඛරං** හඳුන්වනු ලබන නමයි. වැරදි කල්පනාවෙන් යුතු, පරම්පරාගතව පැවතෙන වහර අනුව, තමන් මෙසේ වියයුතු යැයි නුවණ නැත්තන්ට වෙනස් හැඟීම් හටගනී. ඒවා තණ්හා දිට්ඨි ඇසුරෙන් උපදී. හටගනී. තමන් විසින් නුවණින් මෙනෙහි කිරීමෙන් නොවේ. භාග්‍යවතුන් වහන්සේ ඒවා ද **විනෙය්‍ය** දුරුකොට, **ඔඝතමගා** තද සැඬපහර, සැඩ පහර නැමති අඳුර ඉක්මවා ගියහ. **ඔකන්තමගා** යනුද පාඨයකි. (තමා ද දැන්) සැඩපහරවල් ඉක්මවා කෙළවරට ගියේය. එබැවින් **යානි ච තීණි.... තමගා** යැයි කීය.

ඊට පසු සසර දුකෙහි කෙළවර (එයින්) එතර වූ නිවන හා නිවනට පැමිණීමෙන් දුක් නොමැති බවද සළකා, **අන්තගුසි පාරගු දුක්ඛස්ස** යැයි කීය. නැතහොත් නිවනට ගිය බැවින් භාග්‍යවතුන් වහන්සේ 'පාරගු' නම් වෙති. උන්වහන්සේ අමතන අයුරු, පාරගූ, අන්තගූසී දුක්ඛස්ස යැයි එහි සම්බන්ධතාවයි. මැනවින් අවබෝධ කළ, තමන් විසින්ම අවබෝධ කරන ලද හෙයින් **සම්මා සම්බුද්ධො, තං තං මඤ්ඤෙ** ඒ ඒ කරුණු ගැන දනිමි. වෙනත් කෙනෙක් (අන් සමයවාදීන්) නොදනිතැයි ඉමහත් ආදර බුහුමනින් කියයි. **ජුතිමා** අනුන්ගේද (මෝහ) අඳුර දුරුකිරීමෙන් ආලෝකමත් වූ, **ජුතිමා** පෙර පසු ලෙසින් (අතීත, අනාගත) දන්නා නුවණැති, **පහූත පඤ්ඤා** කෙළවරක් කිව නොහැකි නුවණින් යුතු, මෙහි සියළු දෙයම දන්නා නුවණ අදහස් වේ. **දුක්ඛන්තස්සන්තකර** යැයි අමතන අයුරුයි. **අතාරෙසි මං** දෙගිඩියාවෙන්, සැකයෙන් මා එතර කළ සේක.

**යමෙම** යන අඩ ගාථාව නැමදීම පිණිස කියයි. **කංඛිත** පැන විස්සක අරුත් සඳහා කීය. ඒ කරුණු සභියට සැක සහිත විය. **මොන පථෙසු** නුවණ මාවත්, **විනලීකතා** වනසන ලදී. උදුරන ලදැයි කියන ලදී. **නාග නාගස්ස** එහි එක් වදනක් ඇමතීම සඳහාය. එක් වචනයක් (වෙසස් වදනක් ලෙස) හඳුන්වන පරිදිය. **අනුමොදන්ති** මෙම වචනයෙන් සම්බන්ධ වේ. ධම්ම දෙසනං යැයි ඉතිරි පාඨයක් ද ඇත. **සබ්බෙදෙවා** අහසෙහි ද

පොළවෙහිද (වසන) නාරද පබ්බතා මොව්හු දෙව් පිරිස් දෙකොටසක තැණවත්හු වෙති. ඒ දෙව්වරුද අනුමොදන්ති, හැම දෙයටම පැහැදී (තමාට) හැඟෙන පරිදි කියයි. පිළිගැනීමට, (නොදත් කරුණු දැනගැනීමෙන්) සතුටුවීමට සුදුසු වූ පැහැදිලිව පැන විසඳූ තියාව අසා නමො තෙ අත් මුදුන් තබා, පුරිසාජඤ්ඤ මිනිසුන් අතර උසස් කෙනෙකැයි කීය. පටිපුග්ගලො සමාන තැනැත්තෙක්, තුවං බුද්ධො සිවුසස් අවබෝධයෙන්, සත්ථා අනුසාසනාවෙන්, මගපෙන්වන නායකයකු මෙන්, මාරාභිභූ සිවුමරුන් මැඩ පැවැත්මෙන්, මුනි බුදුනම් මුනිවරයා උපධී රූපාදී සමූහ පහ, කෙලෙස්, කාම හා (කම්ම) එක්රැස් කිරීම් ලෙස සතරාකාරය. වග්ගු ඉතා රූමත්, පුඤ්ඤ ච ලෝකය තුළ නොඇලෙයි. අරමුණු ගැනීම ආදිය නොකරන හෙයින්, කලින් කරන ලද හෝ නැවත මතු යම් දෙයක් බලාපොරොත්තුවෙන් හෝ ඒවා මුල් කරගෙන හෝ ඇතිවන දැඩි ආසාව හා දැඩි හැඟීම් නැමති ආලේප, වන්දති සත්ථුනො මෙසේ කියමින් දෙපා වළලුකර (ගොප්මස) වැළඳගෙන පසඟ පිහිටුවා වැන්දේය. අඤ්ඤතිත්ථිය පුබ්බො වෙනත් සමයවාදීන් - ආගමික මතවාදීන්, ආකංඛති කැමති වෙයි. ආරද්ධ චිත්තා සතුටු සිත් ඇති, අපි ච මෙත්ථ පුග්ගල වෙමත්තතා විදිතා එහෙත් වෙනත් ආගමික මතවාදීන් වෙනුවෙන් පිරිවාස හෙවත් පිරික්සුම් කාලය පිළිබඳ පුද්ගල වෙනස අනුදන්නා ලදී. ඒ හැමදෙනාම පරිවාසයට අයත් නොවෙති. පරිවාසය නොලබන්නේ කවුරුන් විසින්ද? ගිනි පුදන ජටිලයන්, සැකිකුල උපත ලැබූවන්, කලින් අනුගමනය කළ සමණ පිළිවෙත හැර දමා පැමිණෙන්නන්, මෙන්ම එසේ කලින් සිටි බාහිර මහණ වෙස අත් නොහළද සෝවාන් ආදී මගපල ලැබීමට හේතු සම්පත් ඇත්තන් (පරිවාසය නොලබනු ඇත.) සභිය පිරිවැජි එවන් හේතු සම්පත් ඇත්තෙකි. එබැවින් භාග්‍යවතුන් වහන්සේ, 'සභිය, ඔබ වෙනත් මහණ පිළිවෙතක් පිරුවද, පරිවාසය අවැසි නොවේ. මගපල ලබනු පිණිස ඔබට හේතු සම්පත් ඇතැයි මා විසින් දැනගන්නා ලදැයි (තථාගත සාසනයෙහි) ඔහුගේ පැවිද්ද අනුදැන වදාරා, 'එසේ වුවත් මෙහිදී පැවිදි බව ලබන පුද්ගලයා අනුව වෙනසක් ඇතැයි' ද කීය. 'එසේ නම් හිමියනි,' යැයි සභිය තම ආදරය පළකරමින් පැවසීය. ඒ සියල්ල මෙබඳු වූම වෙනත් තැන්හි පැහැදිලි කර ඇති බැවින් ද පෙර සඳහන් කරන ලද. බැවින්ද මෙහි විස්තර නොකරන ලදී. එහෙයින් පෙර සඳහන් වූ විස්තර අනුව දතයුතුය.

**සභිය සූත්‍ර විස්තරය නිමි.**

# 3.7

එවං මෙ සුතං යනු සෙල සූත්‍රයයි. මෙයට මුල් වූ කරුණු සූත්‍රයෙහිම දැක්වේ. අරුත් විස්තරද පෙර සඳහන්ව ඇති පරිදි දතයුතුය. විස්තර නොවූ වචන, පැහැදිලි කරන ලද පද ඇසුරු කරමින් විස්තර කරන්නෙමි. අංගුත්තරාපෙසු යනු ඒ ජනපදයයි. උතුරු දෙසින් 'ආප' නම් ගඟ ය. එයට ආසන්නව පිහිටි බැවින් 'උත්තරාපාති' යැයි ද කියනු ලැබේ. ඒ ආප යැයි නම් වූ පෙදෙස උතුරින් පිහිටියේ කිනම් ගඟකින් ද? මහාමහි ගඟටය. මේ එම ගංගාව ඇති වූ අයුරු මුලසිටම විස්තර දැක්වීමයි.

මේ දඹදිව යොදුන් දසදහසක් පමණය. එහි යොදුන් හාර දහසක පමණ පෙදෙසක් ජලයෙන් යටව 'මුහුද' යැයි හැඳින්වේ. තුන් යොදුනක් පමණ පෙදෙසක මිනිස්සු වසති. යොදුන් තුන් දහසක පෙදෙසක හිමාලය පිහිටියේය. උසින් යොදුන් පන්සියයකි. අසූහාර දහසක් කඳු මුදුනින් යුතුය. හාත්පසින් ගලායන ගංගා පන්සියයකින් මනහරය. පූරළාස සූත්‍ර විස්තරයෙහි කියන ලද පරිදි පළලින් ද, ගැඹුරින් ද යොදුන් පණහක් පණහක් බැගින් වූ යොදුන් එකසිය පණහක පමණ බිම් පෙදෙසක් වසා පැතිරුණු අනොතත්ත ආදී මහාවිල් සත පිහිටියේය. ඒ විල් අතරින් අනොතත්ත විල සුදස්සන, චිත්ත, කාල, ගන්ධමාදන, කෙලාස යන කඳු පහකින් වටව ඇත්තේය. සුදස්සන කඳුපව්ව සිය යොදුනක් උස, රන්මය වූ, ඇතුලතට නැමුණු කපුටකුගේ මුව බඳුව, මුළු විලම වසා සිටියේය. චිත්තකූටය මුළුමනින්ම රුවනින් කළා සේද, කාල නම් කූටය අඳුන්මය ලෙසින්ද සිටියේය. ගන්ධමාදන පව්ව සානුවක් සේ, ඇතුලත මුං පැහැයෙන් නොයෙක් නොයෙක් ඔසුපැලවලින් ද යුතුව, අමාවක පොහෝදින දිලියෙන ගිනි අඟුරු මෙන් සිටී. කෙලාසකූටය රිදීයෙන් නිමවූයේය. සියළුම කඳු පව් සුදස්සන කුළ මෙන් සම උසින් යුතුව ඒ විල ආවරණය කළා සේ පැතිර සිටී. දේව බලයෙන් ද නාගයන්ගේ බලයෙන් ද සැමතැනටම වැසි වසී. එයින් ගංගාද ගලයි. ඒ සියළු ජලය අනොතත්ත විලටම ගලා එයි. සඳ හිරු දකුණු දෙසින් හෝ උතුරු දෙසින් හෝ ගමන් කරමින් කඳු පව් අතරින් විල බබළවයි. හිරු සඳු කෙළින් ගමන් කරද්දී බැබළීමක් නැත. එහෙයින් 'අනොතත්ත' යැයි එය හැඳින්විණ.

අනොතත්ත විලෙහි මනහර ගල් පුවරුවලින් ද, මසුන් ඉදිබුවන්

නොමැති, පලිඟුවන් පිරිසිදු ජලයෙන් ද යුතු මැනවින් පිළියෙල වූ නාන තොටවල් ඇත. ඒවායේ බුදු, පසේබුදු, මහරහත්හු ඉසිවරු නාති. දෙවිවරු, යක්කු උයන්කෙළි කෙළිති. විලෙහි සතර පැත්තෙහි සිංහ, මුව, ඇත් මුව, අස් මුව, ගව මුව ලෙස මුව හතරකි. එයින් ගංගා සතරක් ගලයි. සිංහ මුවෙන් නික්මෙන ගංගාවේ ඉවුරෙහි බොහෝ සිංහයෝ වෙති. ඇත්, අස්, ගව මුවින් නික්මෙන ගංගා ඉවුරුවල ඒ ඒ සත්තු බොහෝ වෙති. නැගෙනහිර දෙසින් නික්මෙන ගංගාව අනොතත්ත විල තෙවරක් පැදකුණු කොට, අනෙක් ගංගා තුන කරා නොපැමිණ, හිමවතට බටහිර දෙසින්, මිනිස් වාසයෙන් තොර පෙදෙසින් මහ සයුරට එක්වෙයි. බටහිරින්ද උතුරෙන්ද නික්මෙන ගංගාද එසේම විල පැදකුණු කොට, හිමවතට බටහිර දෙසින්ද, හිමවතට උතුරු දෙසින්ද මිනිස් වාසයෙන් තොර පෙදෙසකින් මහ සයුරට ගලයි. දකුණු දිසාවෙන් නික්මෙන ගඟ තෙවරක් අනොතත්ත විල පැදකුණු කොට ගල්තලාවෙහි නොවක්ව ගලාගොස්, කඳු පව්වෙහි වැදී, එයින් තුන්ගවු පමණ ජල දහරක් ඉහළට නැගී, සැටයොදුනක් අහසින් ගලා ගොස්, 'තියගගල' නම් ගල්තලයෙහි වැදී, ජල ධාරා වේගවත්ව බිඳී යොදුන් පණහක් පමණ වූ 'තියගගල' නම් පොකුණ සකස් වෙයි. පොකුණු ඉවුර බිඳ, ගල්තලයට පිවිසෙන ජල පහර සැටයොදුනක් ගලා ගොස්, තද පොළව බිඳගෙන, සැටයොදුනක් උමගින් ගොස්, විජ්ඣ නම් පව්වෙහි ගැටී, අත්ලෙහි ඇඟිලි පහ මෙන්, දිය දහරා පහක්ව විහිදෙයි. එම දිය දහරා අනොතත්ත විල පැදකුණුකොට ගිය තැන, ආවට්ට ගඟ (වටසුළි ගඟ) යැයි කියනු ලැබේ. ගල්තලාවෙහි සැටයොදුනක් නොවක්ව ගලා ගිය තැන්හි කාල ගංගා (කළු ගඟ) නම් වෙයි. අහසින් සැටයොදුන් ගිය තැන ආකාස ගංගාව හෙවත් අහස් ගඟ නමින්ද, තියගගල ගල්පව්වෙහි පනස් යොදුනක් පැතිරුන තැන තියගගල නම් පොකුණද වෙයි. ඒ පොකුණු ඉවුර බිඳ ගල්තලයට පිවිස සැටයොදුනක් ගියතැන උම්මගග ගංගා හෙවත් උමං ගඟ යැයි හැඳින්වෙයි. විජ්ඣ නම් පව්ව හරහා වැදුණු ජල දහරා පහ ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යයි හඳුන්වනු ලබයි. මෙසේ ඒ මහා ගංගා පහ හිමාලයෙන් ඇරඹේද, ඒ පස්වන ගංගාව මහා මහි යැයි අදහස් වේ.

මහාමහී ගඟට උතුරෙන් 'ආපො' නම් පෙදෙස වේද, ඊට ආසන්නව ඇති ජනපදය අංගුත්තරාප යැයි දතයුතුය. **චාරිකං චරමානො** මගෙහි ගමන් කරමින්, තුරිත චාරිකා, අතුරිත චාරිකා යනුවෙන් භාග්‍යවතුන් වහන්සේගේ චාරිකා දෙආකාරය. දහම් අවබෝධ කළහැකි තැනැත්තන්,

දූරක සිටියත් වහා ඔවුන් වෙත යාම තුරිත චාරිකාය. එය මහා කස්සප පෙර ගමන් ආදී තැන්වලින් දතයුතුය. එම ගමනෙහිදී භාග්‍යවතුන් වහන්සේ මොහොතකින් ගවු තුනක් වැඩියහ. ආළවක දමනයට, අංගුලිමාල දමනයට තිස් යොදුනකි. පුක්කුසාති හමුවට යොදුන් හතළිස් පහක දූරකි. මහා කප්පින වෙනුවෙන් යොදුන් එකසිය විස්සකි. ධනිය හමුවීමට ගමන් මග සත්සිය යොදුනකි. මේ තුරිත චාරිකාය. ගම්, නියම්ගම්, නගර පිළිවෙලින් පිඬු පිණිස හැසිරීම් ආදියෙහිදී ලෝවාසීන්ට උපකාරී වීම සඳහා යාම අතුරිත චාරිකාය. මෙහිදී අදහස් කරන ලද්දේ එයයි. මෙසේ ගමනෙහි යෙදෙමින්, **මහතා** ගණනින් බොහෝ වූ මෙන්ම බොහෝ ගුණවත් වූ **භික්ඛුසංඝෙන** මහණ පිරිස සමග, **අඩ්ඪතෙළසෙහි** අඩක් අඩු දහතුනෙන් සියය බැගින් වූ දොළහක් හා පනහක් වූ මහණුන් සමග (එක්දහස් දෙසීය පනහක්) යැයි කියන ලදී. **යෙන.......තදවසරි** බොහෝ වෙළඳසල් ඇති බැවින්, ඒ නියම්ගම 'ආපණා' යැයි නම් ලැබීය. එහි විසිදහසක් වෙළඳසල් සඳහා වෙන්කර ඇත. **යෙන** දිසාවකින් හෝ මගකින් හෝ **අංගුත්තරාපානං** ඒ රටට **නිගමො** පැමිණිය යුතුය. එහි වාසය කළේය. **තදවසරි** ගියේය. ඒ නියම්ගමට පැමිණියේ යැයි කියන ලදී. **කෙණියො ජටිලො** කෙණිය නම් වූ, ජටිලො යනු තවුසෙකි.

ඔහු බමුණු මහසල් කුලයකට අයත්ය. ධනය රැකීම පිණිස තවුස් වත සමාදන්ව, රජුට පඬුරු දී බිම් කොටසක් ලැබ, එහි අසපුවක් කොට පවුල් දහසකට උපකාරවෙමින් වාසය කරයි. අසපු බිමෙහි එක් තල්ගසක දිනපතා එක් රත්රන් ගෙඩියක් වැටෙතැයි කියති. කේණිය තවුසා දිවාකල කහවත් දරයි. ජටාව බඳී. රැයෙහි කැමති පරිදි පස්කම් සුවෙහි රිසිසේ ගැලී කල්ගත කරයි. **සක්‍යපුත්තො** උසස් කුලය දැක්වෙයි. **සක්‍යකුලා පබ්බජිතො** සැදැහැයෙන් පැවිදි වූ බව පැහැදිලි කිරීමයි. කිසිදු දෙයකින් පීඩනයකට නොපැමිණ, (සම්පත් ආදිය) අහිමි වීමෙන් නොව, ඒ කුලය අත්හැර, සැදැහැයෙන් පැවිදි වූයේ යැයි කී අයුරුයි. **තං ඛො පන** 'මෙසේ වී යැයි' යන අදහසින් දුතියා විබත් යෙදිණ. ඒ පින්වත් ගොතමගේ යන අරුතයි. **කල්‍යාණො** යහපත් වූ ගුණවලින් යුතු, උසස් යැයි කියන ලද්දේය. **කිත්තිසද්දො** කිතු රාවයෙන් හෝ තුතිගොසින් හෝ, **ඉතිපි සො භගවා** එහි මුලපටන්ම මේ අයුරින් අදහස් කෙරේ. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණින්ද අරහං ගුණයෙන් යුතු වෙති. මේ කරුණින්ද සම්මා සම්බුද්ධ වෙති. මේ කරුණින්ද භගවා නම් වෙති යනුවෙන් මේ මේ කරුණු දක්වන ලදී. කෙලෙස් සතුරන් දුරින්ම දුරු කළ බැවින්ද, කෙලෙස්

අර නැසූ බැවින්ද, සිවුපසයෙන් පිදීමට සුදුසු බැවින්ද, අයහපතෙහි කිසිදු රහසක් නැති බැවින්ද (කිසිදු අයහපතක් කිසිවිටක නොකරන බැවින්ද) මේ කරුණුවලින් ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං ගුණයෙන් යුතු බව දතයුතුය. සියළුම කෙලෙසුන්ගෙන් දුරු වූයේ, (සිවුසස් අවබෝධය නම් වූ) මගෙන් පෙර සසර පුරුදුවලින් ආ බලපෑම් ද සමග කෙලෙසුන් දුරු කරන ලද බැවින් අරහං නම් වේ. ඒ කෙලෙස් නැමති ගරාදි සිවුසස් මගෙන් නසන ලද බැවින් ද කෙලෙස් සතුරන් වනසන ලද බැවින් ද අරහං නම් වේ. නොදැනීම - ඉපදෙනා තැන් හා දැඩි ආසාවෙන් (අවිජ්ජා භව තණ්හා) සැදුණු නැබෙන්ද, එක්රැස් කරනු ලබන පින් ආදී ගරාදියෙන්ද, ජරාව හා මරණය නම් පට්ටමෙන්ද, ආසව හටගැන්මෙන් වූ 'අලවංගුවෙන්'ද, විද, සිදුරුකොට, තුන් භවයෙහි යොදවන ලද බොහෝ කලක පටන් පවත්නා වූ සසර නම් වූ රෝදය, ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් බෝමැඩදී, උත්සාහය නම් දෙපයින්, සීලය නම් පොළවෙහි පිහිටුවා, සැදැහැ නැමති අතින්, සියළු කටයුතු (කම්ම) නිමාකරන ලද නුවණ නමැති පොරව ගෙන (ඒ සසර රෝදයෙහි) සියළු අර නැසූ බැවින් ද අරහං වේ. දීමට සුදුසු බැවින් ද සිවුපසයෙන් ගරු සත්කාර කිරීමට සුදුසු බැවින් ද අරහං වේ. ඇතැම් විටක, ලොවෙහි තමන් බොහෝ දේ දන්නේ යැයි පණ්ඩිත බව පෙන්වන අනුවණයෝ අපහාසයට බියෙන් රහසින් පව් කරති. කිසිවිටකත් එසේ පව් කිරීමෙහි රහසිගත බව නොමැති බැවින්ද අරහං වෙති. ඒ අනුව මෙසේ ද කීය.

ආරකත්තා හතත්තාච කිලෙසාරීන සො මුනි
හතසංසාරචක්කාරො පච්චයාදීනචාරහො
න රහො කරොති පාපානි අරහනෙත න පවුච්චතී

තමන් විසින්ම ලොව ඇති තතු මැනවින් අවබෝධ කරන ලද බැවින්, සම්මා සම්බුද්ධො ඉතා පිරිසිදු විදු නැණින් හා කිසිවකුට දොස් නැගිය නොහැකි චරිතය හෝ හැසිරීමෙන් යුතු බැවින් විජ්ජාචරණ සම්පන්නො යහපත්-විසිතුරු ගමනින් ද සොඳුරු තැනට (නිවනට) ගිය බැවින්ද, සුගතො, ලොවෙහි සියළු දෙයම දන්නා බැවින් ලෝකවිදූ සම්බුදුරජාණන් වහන්සේ ඇති සැටියෙන්, හටගැනීමට හේතු දකිමින්, එය නැති කිරීම හා ඊට උපායමගද, රූපාදී සමූහ සහ ඇස් ආදී වූ ආයතන ලෙසින් සකස්වන ලෝකයද නිසි පරිදි දත්හ. 'පළමු ලෝකය, සියළුම ජීවීන් ආහාරයට කැමති බවයි. දෙලොව නම් නාමය හා රූපයයි.

ලෝක තුන නම්, තුන්ආකාර වූ වේදනාය. සිවු ලෝකය නම් සතරාකාර වූ ආහාරයයි. ලෝක පහ, උපාදාන සමූහ පහයි. තමා කෙරෙහි වූ ඇස් ආදී ආයතන හය ලෝක හය සේ ගැනේ. විඤ්ඤාණය පිහිටීම අනුව ලෝක හතකි. අටලෝ දහම ලෝක අටකි. නව සත්තාවාස (බ්‍රහ්ම ලෝක) අනුව ලෝක නවයකි. ආයතන දහයද ලෝක දහයකි. ආයතන දොළහ ලෝක දොළහකි. ධාතු දහඅටද ලෝක දහඅටකි. යනුවෙන් ලෝකය සකස්වන සැටි මෙසේ මැනවින් දැනගත්හ. සත්වයගෙහි සිත්හසර දනිති. සැඟවුණු සිතිවිලි දනිති. හැසිරීම් රටාව දනිති. තීරණ, අදහස් දනිති. කෙලෙස් අඩු ඇත්තන්, කෙලෙස් බොහෝ ඇත්තන්, තියුණු ඉඳුරන් ඇති බව, මුදු ඉඳුරන් ඇති බව, යහපත් බව, අයහපත් බව, කරුණු අවබෝධ කරවීමේ පහසුව, අවබෝධයෙහි අපහසුව, මගපල ලද හැකිබව, මගපල ලද නොහැකි බව දනිති. මෙසේ හැම ලෙසින්ම ජීව ලෝකය මනාව දත්හ. එසේ එක් සක්වළක් දිගින්ද පළලින් ද යොදුන් දොළොස් ලක්ෂ තුන්දහස් හාරසිය පනහකි. ඒ සක්වළ වටින් යොදුන් තිස්හය ලක්‍ෂ දසදහස් තුන්සිය පනහකි. එහි, මහපොළව යොදුන් දෙලක්ෂ හතළිස් දහසක් ඝන ය. යොදුන් හාරලක්ෂ අසූදහසක ජලය පිරී පවතී. එපමණ ඝනකමකින් දිය පොළව දැරූ වා තලය (වා පොළව) පිහිටියේය. එහි නවලක්ෂ යොදුන් අහස උසට නැගෙන වාතය පවත්නා මේ ලෝකය (කප්) සැටදහසක් පවතී.

**ද්වෙ සතසහස්සානි චත්තාරි නහුතානි ච**
**එත්තකං බහලත්තෙන සංඛාතායං වසුන්ධරා**

**චත්තාරි සතසහස්සානි අට්ඨෙව නහුතානි ච**
**එත්තකං බහලත්තෙන ජලං වාතෙ පතිට්ඨිතං**

**නව සතසහස්සානි මාළුතො නභමුග්ගතො**
**සට්ඨිංචෙව සහස්සානි එසා ලොකස්ස සණ්ඨිති**

මෙසේ පිහිටි එක් සක්වළක තොරතුරු මෙසේය.

'යොදුන් අසූහාර දහසක් මහ සයුරෙහි ගිලී සිටි මහාමේරු පර්වත එකෙණෙහිම උඩට නැගුණි.

එහි අඩක් පමණ වූ, හෙවත් යොදුන් හතළිස් දෙදහසක් මුහුදෙහි ගිලුණු, එපමණින් ඉහළට නැගණු, දිව රුවනින් විසිතුරු වූ,

යුගන්ධර, ඊසධර, කරවීක, සුදස්සන, නෙමින්ධර, විනතක, අස්සකණ්ණ නම් වූ මහමෙර වටා පිහිටි මෙම සත්කුළු පව් දෙවියන්, වාසය කරන්නා වූ මහරජවරුන්ටද නිවහනකි.

හිමාලයෙහි යොදුන් පන්සියයක් උස, දිගින් පළලින් යොදුන් තුන්දහසක් වූ ගිරිකුළු (කඳු) අසූහාර දහසකි.

යොදුන් පහළොවක් වට කඳින් යුතු, යොදුන් පනහක් උසට අහසට නැගී මහ කඳකින් ද හාත්පස වටා විහිද ගිය අතුපතරින් හෙබි යොදුන් හතක් පළල් වූ එකෙණෙහිම ඉහළට මතුවූ දඹ ගසක බලයෙන් 'දඹදිව' යැයි කියනු ලැබේ.

යොදුන් අසූහාර දහසක් යටට මහ සයුරෙහි ගිලුනු, එකෙණෙහිම මතුවුන අසූහාර දහසක් සක්වළ පවු හෝ ගල්කුළු ඒ වටා පිහිටියේය.

චතුරාසීතිසහස්සානි අජ්ඣොගාළ්හො මහණ්ණවෙ
අච්චුග්ගතො තාවදෙව සිනෙරු පබ්බතුත්තමො

තතො උපඩ්ඪුපඩ්ඪෙන පමාණෙන යථාක්කමං
අජ්ඣොගාළ්හුග්ගතා දිබ්බා නානාරතනචිත්තිතා

යුගන්ධරො ඊසධරො කරවීකො සුදස්සනො
නෙමින්ධරො විනතකො අස්සකණ්ණො ගිරිබ්‍රහා

එතෙ සත්ත මහාසෙලා සිනෙරුස්ස සමන්තතො
මහාරාජානමාවාසා දෙවයක්ඛ නිසෙවිතා

යොජනානං සතානුච්චො හිමවා පඤ්ච පබ්බතො
යොජනානං සහස්සානි තීණි ආයතවිත්ථතො
චතුරාසීතිසහස්සෙහි කූටෙහි පතිමණ්ඩිතො

තිපඤ්ච යොජනක්ඛන්ධ පරික්ඛෙපා නගව්හයා
පඤ්ඤාස යොජනක්ඛන්ධ සාඛායාමා සමන්තතො

සතයොජන විත්ථිණ්ණා තාවදෙව ච උග්ගතා
ජම්බූ යස්සානුභාවෙන ජම්බුදීපො පකාසිතො
ද්වෙ අසීති සහස්සානි අජ්ඣොගාළ්හො මහණ්ණවෙ

අච්චුග්ගතො තාවදෙව චක්කවාළසිලුච්චයො
පරික්ඛිපිත්වා තං සබ්බං චක්කවාළමයං ඨිතො

ඒ සක්වළ සඳමඬල හතළිස් නව යොදුනකි. හිරු මඬල යොදුන් පණහකි. තව්තිසාව යොදුන් දසදහසකි. අසුර භවන, අවීචි මහා නිරය, දඹදිව ද එපමණම වේ. අපරගොයානය, පුබ්බවිදේහය යොදුන් හත්දහසකි. උතුරුකුරු දිවයින යොදුන් අටදහසකි. ඒ එක් එක් මහා දිවයිනකටද පන්සියයක්, පන්සියයක් බැගින් වූ කුඩා පිරිවර දිවයින් ඇත. ඒ සියල්ලමද එක් සක්වළක වෙයි. එකම ලෝධාතුවකි. සක්වළ අතරෙහි ලෝකාන්තරික නිරය පිහිටියේය.

මෙසේ කෙළවරක් නොවන සක්වළ හා කෙළවර නොවන ලෝක ධාතු පමණ කළ නොහැකි බුදු නැණින් හැම අයුරින්ම හඳුනා දත්හ. එහෙයින් **ලොකවිදූ** නම් වෙති. තම ගුණවලට වඩා උසස් ගුණවලින් යුතු වෙනත් කිසිවෙකු නොමැති බැවින් **අනුත්තරො** නම් වෙති. (සිත තුටු වන) විසිතුරු වූ, නොයෙක් ආකාරයෙන් මිනිසුන් - නොදැහැමි වූවන් හික්මවා දමනය කොට, හරවත් මග පෙන්වා ඊට යොමු කරන බැවින් **පුරිසදම්මසාරථී** වෙති. මෙලොව පරලොව උසස් බවක් ඇතිකර ගැනීමට සුදුසු පරිදි අවවාද උපදෙස් දෙමින්ද (සසරින්) එතරවන මග පෙන්වන හෙයින්ද **සත්ථා** නම් වෙති. දෙව්මිනිස් කැලට (තම ජීවිතවල) උසස් බවට පත්කර ගැනීමටද, මගපල ලැබීමට හේතු සම්පත් ඇත්තවුන්ට ඒ ලෙසින්ද අනුසාසනා කරන ලදහ. නාග ආදීනටද එදිනෙදා දියුණුව සඳහා අනුසාසනා කරති. කිසියම් උපකාරීවන දෙයක් වේද, ඊට යොමු කරති. සියළුම දතයුතු දේ අවබෝධ කරගත් බැවින්ද (තවත් දැනගැනීමට නොමැති හෙයින්, එයින් නිදහස් වූ බැවින්ද) **බුද්ධො** නම් වෙති. යම් ලෙසකින් බුදුරජාණන් වහන්සේ - පෙර පුරන ලද පාරමිතා බලෙන් අත්කරගත් කුසල්වලින් (වාසනා) පල ලද බැවින්ද, කෙලෙස් සිඳ දැමූ

බැවින්ද, ගුණයෙන් කිත් යසස් ලද බැවින්ද, කරුණු බෙදා දක්වා පැහැදිලි කරන බැවින් ද, උතුම් විහරණයෙන් යුතු හෙයින් ද සසර ගමනට හේතුවන තණ්හාව ඉවතහළ බැවින්ද භගවා නම් වෙති.

භාග්‍යවා භගවා යුතෙතා භගෙහි ච විභත්තවා
භත්තවාවනතගමනො භවෙසු භගවා තතො

මේ සඳහන් වූයේ කෙටියෙනි. මේ වචනවල විස්තර විසුද්ධිමග්ගයෙහි දක්වා ඇත. සො ඉමං ලොකං ඒ භාග්‍යවතුන් වහන්සේ මේ ලෝකවාසීනට ද, දැන් කිවයුතු දෙය පැහැදිළි කරති. සදෙවකං කසීභාරද්වාජ, ආළවක සූත්‍රවල සඳහන් වූ පරිදිය. සයං වෙනත් කෙනෙකුගේ උපකාරයක් අනුදැනීමක් නොමැතිව, තමන් විසින්ම, අභිඤ්ඤා මැනවින් දැන, සච්ඡිකත්වා පසක් කොට, තහවුරු කොට, පවෙදෙති අවබෝධ කරවයි. දන්වයි. පවසයි. සො ධම්මං දේසනා කරයි. (ඒ දහම) අවසානය තෙක්ම යහපත්ය. සො ඒ භාග්‍යවතුන් වහන්සේ කරුණාව නිසා උතුම් විවේක සුවය ද නොසළකා ධම්මං දෙසෙති එසේ මදක් හෝ බොහෝ හෝ දහම් දෙසතත් මුලසිටම යහපත් සේ මැනවින් දේසනා කරති.

ඒ කෙසේද? මුළුමනින්ම ඉතා යහපත් බව ඇති නිසාම, දහම් අගයෙන් යුතු එක ගාථාවක මුල් පදයම ආදි කල්‍යාණ දෙවන, තෙවන පදවලින් මජ්ඣෙ කල්‍යාණ අවසන් පදයෙන් පරියොසාන කල්‍යාණ එක් කරුණක් ගලපා දක්වන සූත්‍ර දේසනයක, එහි ආරම්භය හේතු දැක්වීමම මුල යහපත් වීමයි. කරුණු පහදා දීමෙන් පසු, නිගමනය අවසානයෙහි ඇති යහපත් බවයි. මේ අතර වූ ඉතිරි සියල්ල, ඒ පවසන දෙයෙහි මැද ද, යහපත් වන අයුරුයි. ගැළපෙන කරුණු රැසක් ඇතිවිට, මුලින්ම එය ඉදිරිපත් කරන අකාරය මුල යහපත් බවයි. පසුව - අගදී දක්වන ආකාරය අවසානයෙහි යහපත් බවයි. ඉතිරි කොටස මැද දී කරුණු දැක්වීමේ යහපත් බවයි. මුළු (තථාගත) සසුනෙහි තමන් වහන්සේම නිදසුන් වන සේ, අරුත් දැක්වීමේදී සීලයෙහි (පිරිපුන් බව) මුලදීම ඇති යහපත් බවයි. මැද යහපත් වන්නේ සමථ - විදසුන් මගින් ලබන පලයයි. අවසාන යහපත් බව නිවනයි. මුලදී ඇති යහපත් බව සීල සමාධියයි. විදසුන් මගින් ලබන පලය මැද යහපත් බවයි. නිවන් පලය අවසාන යහපත් බවයි. බුදුබව මැනවින් අවබෝධය මුල යහපත් වීමය. මැද

යහපත් වන්නේ දහමෙහි මනා සැකැස්මයි. මනා පිළිවෙත්හි පිහිටි සඟ පිරිස අවසාන යහපත් බවයි. ඒ දහම අසා ඇති තතු නිසි පරිදි දැනගැනීමට පිළිපන් තැනැත්තකු විසින් පැමිණිය යුතු ඒ සියළු දේ දැනගැනීම හෙවත් බුදුබව මුල්ම යහපතයි. මැද යහපත වන්නේ පසේබුදු බවයි. අවසාන යහපත රහත් පලයයි. දහම් ඇසීමේදී නීවරණ ආදිය යටපත් කිරීමෙන් ඇසීමේදී යහපත උදාවන බැවින් මුලින්ම ද යහපත වේ. ඒ දහම පිළිපැදීමෙන් සමථ-විදසුන් ලැබීමේ පිළිවෙතින් යහපතම ගෙන දෙන හෙයින් මැද දී ද යහපත්ය. එසේ පිළිපන්ව, පිළිවෙත් පිරීම නිමවූ කල්හි, කම්පා නොවීමේ හැකියාව ලැබීමෙන් අවසානය ද යහපත්ය. මායාවක්, මුළාවීමක් නැතිව (සිත) පිරිසිදු බවට මග මුලදී යහපත් බවයි. ඒ අනුව කරනු ලබන කටයුතුවලින් ඇතිවන පිරිසිදු බව අවසාන යහපත් බවයි. මද හෝ බොහෝ හෝ දේසනා කරනවිට මුලසිටම යහපත් ආකාරයෙන් යුතුයැයි දතයුතුය.

**සාත්‍ථං සව්‍යඤ්ජනං** මේ අයුරින් මුල, මැද, අග යහපත්ව දහම් දෙසනවිට, **බ්‍රහමචරියං** (පැවිදි) සසුනෙහි බඹසර හා මග බඹසර ලෙස ඉතා උසස් හැසිරීම ද **පකාසෙති** නොයෙක් නොයෙක් ආකාරයෙන් පහදා දෙති. එය පැහැදිලි වන අයුරින්ම අරුත් පිරුනු බව **සාත්‍ථං**, ගැළපෙන අකුරු යෙදීම **සව්‍යඤ්ජනං** බලාපොරොත්තු වන අදහස පැවසීම, විවරණය, කරුණු බෙදා දැක්වීම, විස්තර කිරීම, වචන දැක්වීමෙන් එහි අදහස නැවත තහවුරු කොට දැක්වීම **සාත්‍ථං**, අකුරු, පද සකස්වන අයුරු, වචන මුලින් ඇතිවන සැටි, (ඒවා) විස්තරකොට දැක්වීම **සව්‍යඤ්ජනං**, ගැඹුරු අරුතින් හා ගැඹුරින් - උසස් ලෙස ලබන අවබෝධය **සාත්‍ථං** දහමෙහි (කරුණුවල) උසස් බව හා දේසනයෙහි උසස් බව **සව්‍යඤ්ජනං**, අරුත වැටහීම හා කරුණු වෙන්කොට දතහැකි වෙසෙස් නුවණැති බව **සාත්‍ථං**, දහම පැහැදිළි කිරීමෙහිදී බස් වහර පිළිබඳ වෙසෙස් දැනුම **සව්‍යඤ්ජනං**, නුවණැතියන් විසින් දතයුතු, විමසීමට ඇති නිදහස නිසා ජනතාවගේ සතුට ලබන **සාත්‍ථං**, පොදු ජන සතුට වඩන බැවින් **සව්‍යඤ්ජනං**, ගැඹුරු අදහසක් ලබාදෙන බැවින් **සාත්‍ථං**, පැහැදිලි අකුරු-වචන ඇති හෙයින් **සව්‍යඤ්ජනං**, අත්හැර දැමිය යුතු දෙයක් නොමැති බැවින් ද, හැම අයුරින්ම පිරිපුන් බැවින් **කෙවල පරිපුණ්ණං** ඉවත් කළයුතු දෙයක්ද නොමැති, නිදොස් බැවින් **පරිසුද්ධං** හික්මීමට අදාල වන, බ්‍රහ්මයකු බඳු උසස් අයුරින් හැසිරිය යුතු බැවින්, එසේ හැසිරීම **බ්‍රහමචරියං**, ඒ අනුව **සාත්‍ථං සව්‍යඤ්ජනං........බ්‍රහමචරියං පකාසෙති** යැයි කියනු ලැබේ.

තවද, නිදාන - හේතු සහිතව දේසනා කිරීම මුල යහපත් වෙයි. හික්මවිය හැකි ජනතාවට සුදුසු වන ආකාරයෙන්, අරුත වෙනස් නොවන ලෙස, හේතු-නිදසුන් පෙන්වා දෙමින් කරුණු දැක්වීම මැද යහපත් බවයි. අසන තැනැත්තන් සැදැහැ බව දියුණු කරගනු ලැබීමෙන් තීරණයට එළඹීම අවසානය යහපත් බවයි. මෙසේ දේසනා කරද්දී බ්‍රහ්මචරියාව ගැනද පවසති. ඒ පිළිවෙතින් මගපල ලැබීමද සාත්‍ථං නම් වේ. ඇසීමෙන්, ඉගෙන ගන්නා දහමෙන් ලබන සාමයික දැනුම - වියත් බව සව්‍යඤ්ජනං වේ. පන්සිල් ආදී දහම් සමූහයෙන් යුතු නිසා කෙවල පරිපුණ්ණ වේ. කෙලෙස් නොමැති වීමෙන්, එදිනෙදා ලබන ලාභවාසි ගැන බලාපොරොත්තු රහිත නිසාද පරිසුද්ධං, උසස්, උතුම් අරුතින් බ්‍රහ්ම බඳු බුදු පසේ බුදු රහතන්වහන්සේලාගේ හැසිරීමද බ්‍රහ්මචරියාව යැයි කියනු ලැබේ. එබැවින් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසති. බඹසර පහදා දෙතියිද කියනු ලබයි. සාධු බො පන මැනවි, යහපත්ය, සොඳුරුය, අරුත් දනවයි. සැප ගෙනදෙයි යන තේරුමයි. ධම්මියාකථාය පානය කිරීමට දුන් දෙයක් ආනිසංස සළකා, කෙණියට භාග්‍යවතුන් වහන්සේ පැමිණෙන බව අසන්නට ලැබුණේ සවස් කාලයේදීය. හිස් අතින්ම භාග්‍යවතුන් වහන්සේ දැකීමට යාමට ලජ්ජාවෙන්, විකාලයෙහි ආහාර ගැනීමෙන් වැළකී ඇති නමුදු, පානයට සුදුසු දෙයක් කැපයයි ද සිතා, ඩෙබර (මසං) මනාව පිළියෙල කොට, කත් පන්සියයකින් ගෙන ගියේය. 'මම සමණ ගොතමයන්ට කුමක් ගෙන යන්නෙම්දැ'යි ඉක්බිති කෙණිය ජටිලයාට සිතුණේය. 'අථ බො කෙණියසස ජටිලසස එතදහොසි, කිනනුඛො අහං සමණසස ගොතමසස හරාපෙය්‍යනති' ආදී ලෙසින් භෙසජ්ජක්ඛන්ධකයෙහි සඳහන් පරිදි ඒ සියල්ල දතයුතුය. එහිදී ඔහුට භාග්‍යවතුන් වහන්සේ, සෙඛ සූත්‍රයෙහිදී සැකි කුලවතුන්ට ආවාස ආනිසංස වදාරන ලද පරිදි, ගොසිංග සිල් උයනෙහිදී කුලපුතුන් (මහ රහතුන්) තිදෙනාට සමගියෙහි අගය වදාරා ඇති පරිදි, රථවිනීත සූත්‍රයෙහිදී කිඹුල්වත් පුර උපන් මහණුන් කෙරෙහි දසකථා පිළිබඳ වදාරන ලද පරිදි, මෙසේ ඒ වේලාවට ගැළපෙන පරිදි පානය කිරීමට දෙන ලද දේ අනුව එහි ආනිසංසය **සන්‍දසෙසසි.** එබඳු යහපත් දේ, පින් - නැවත කළයුතු බවට උත්සාහවත් කරමින් **සමාදපෙසි** තවදුරටත් එහිලා උත්සාහවත් කරමින් **සමුතෙතජෙසි** මෙලොව පරලොව යහපත පෙන්වාදෙමින් සතුටු කළහ. දැහැමි කතාවෙන්........සතුටු කළහයි එහෙයින් කියන ලදී. කෙණිය බොහෝ සතුටට පත්ව භාග්‍යවතුන් වහන්සේට (කැඳ පානය සඳහා) ආරාධනා කළේය. භාග්‍යවතුන් වහන්සේද

**තෙවරක් පිළිකෙව් කොට පිළිගත්හ. එහෙයින් අථ බො කෙණියො ජටිලො.......අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන යැයි කීය.**

භාග්‍යවතුන් වහන්සේ පිළිකෙව් කළේ කුමක් නිසාද? නැවත නැවත පිළිගන්නා ලෙස ඉල්ලා සිටිනවිට ඔහුට පින් වැඩෙන හෙයිනි. වැඩියෙන් ද පිළියෙල කෙරෙන බැවිනි. එක්දහස් දෙසීය පණහක භික්සඟනට පිළියෙල කරන ලද පානය අමතරව තුන්සියයකට සෑහේද? සෙල බමුණා බත පිළියෙල කල කල්හිම, තම තුන්සියයක් වූ තරුණ පිරිස සමග පැවිදි වන්නේ යැයි දැන, භාග්‍යවතුන් වහන්සේ එසේ කළහ. **මිත්තාමච්චෙ** මිතුරන්ද කම්කරුවන් ද, **ඤාතිසාලොහිතෙ** සම ලේ සබඳතා ඇති, එකට දාව උපත ලද දූ පුතුන් හා සෙසු නෑදැයින්, යෙන යම් ආකාරයෙන්, මෙ මට, **කායවෙය්‍යාවටිකං** කය වෙහෙසා වැඩ කරමින්, (එසේ උදව් කරන) **මණ්ඩලමාලං පටියාදෙති** වියන් බැඳ වෙන් කරන ලද වේදිකාවක් කරයි. **තිණ්ණං වෙදානං** ඉරු වේදය, යජු වේදය, සාමවේදයත්, නිඝණ්ඩු සහ කෙටුභ ද **සනිඝණ්ඩුකෙටුභානං** නිඝණ්ඩු නම් ගස් ආදියට සමාන වචන පෙන්වාදෙන ඉගැන්වීම, කෙටුභ යනු කළයුතු දේ, අදහස් හා සංකල්පනා ඇතුළු කවීන්ට උපකාරී වන ඉගෙනීම, **සාක්ඛරප්පභෙදානං** අකුරුවල වෙනස්කම් හා එහි නිපුණතාව ලැබීමත්, එහි පද සකස්වන ආකාරය දැනගැනීම, **ඉතිහාසපඤ්චමානං** සිවුවන වේදය ලෙස අථබ්බණ වේදයද ගෙන, 'මෙසේ ඇසුවෙමු' යයිද, මෙසේ සිදුවී යැයි ද මෙබඳු වචන යොදා අතීත කතා දැක්වීම, සිවු වේදයට අමතරව, ඉතිහාසයද පස්වැනි (පාඨමාලාව) සේ ඉගෙනීම, එහිදී ද පදවල වියරණ ඉගෙන ගනී. මනාව දැනගනී යනුවෙන් **පදකො වෙය්‍යාකරණො** (ඔවුන්ගේ මතය අනුව) ලොව **සම්මත** වූ පරලොවක් නැත වැනි (විතණ්ඩවාදී) අදහස් මෙන්ම, දොළොස් දහසක් කරුණු දැක්වෙන මහපුරිස් ලකුණු සිප්හි නොඅඩු, පිරිපුන් දැනුමැති **ලොකායත මහාපුරිස ලක්ඛණෙසු අනවයො** (දැනුම) නොපිරිහුණු බව එසේ කියන ලදී. අවය නම්, එම කරුණු අරුත් ලෙසින්ද කොටස් සේ (එක්රැස්කොට තබා ගැනීම ලෙසද) පාරම්පරිකව නොකඩවාම මතුවටත් පවත්වාගෙන යාමයි. කෙණ්ඩාවලට (පාදවලට) සුවදායී පැවැත්ම **ජංඝාවිහාරං** වීරාසනය ආදී (යෝග) වැඩීමේදී ඇතිවූ වෙහෙස දුරුකිරීමට, කෙණ්ඩාවල පහසුවන පරිදි, මඳ දුරක් ඇවිදීමෙහි යෙදුන බව අදහස් වේ. **අනුචංකමමානො** සක්මන් කරමින්ම, **අනුවිචරමානො** එහා මෙහා ඇවිදිමින්, **කෙණියස්සමියෙ** කෙණියගේ අසපුවෙහි වසන, ආවාහො නව යොවුන් කුමරි බඹසර රැකි තරුණියන් කැඳවාගෙන ඒම, විවාහො

එවැනි තරුණියන් පවරා දීම, මහායඤ්ඤො මහා දානයක්, මාගධො මගධ දේසයට අධිපති වූ, මහත් සේනාවක් ඇති බැවින්, සෙනියො, බිම්බී යනු රන් ය. ඒ නියම රන්වන් පැහැයෙන් යුතු බැවින් බිමබිසාරො සො මෙ නිමනතිතො මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේට මා විසින් ආරාධනා කරන ලදී.

ඉක්බිති බමුණා පෙර කරන ලද පින් ඇති බැවින්, 'බුදධ' යන වචනය අසා, අමාවෙන් අබිසෙස් ලද පරිද්දෙන්, පුදුමය දනවමින්, බුදෙධාති භො කෙණිය වදෙසි යැයි ඇසීය. කෙණිය ඇති තතු දක්වමින් බුදෙධාති භො සෙල වදාමි යැයි කීය. එය තවත් තහවුරු කරගනු පිණිස නැවතත් ඇසීය. කෙණිය එලෙසම පිළිතුරු දුන්නේය. එමෙන්ම කල්ප දහසකිනුදු බුද්ධ යන වදනෙහි දුලබ බව දක්වමින්ද බුද්ධ යන හඬ ලොව ඇසීමට දුලබ වදනකැයි කීය. යදිදං නිපාතයකි. යම් කරුණක් එසේ වේ යැයි කියා ඇත. ඉක්බිති බමුණාට 'බුදධ' යන වචනය අසා 'ඇත්තටම බුදු කෙනෙකුද? නැතිනම් බුද්ධ යනු නමට පමණක්දැයි විමසීමට සිත්විය. 'දොස් රහිත වූ බවට (ඒ බුදුවරයා) පත් වීද..........අපගේ බමුණු සමයෙහි මෙබඳු අදහසක් පැවත එන්නේ'යැයි ආගතානි බො පන.......... විවත්තචඡදො යනුවෙන් කීය.

මනෙතසු වේදයෙහි, සුද්ධාවාසී දෙවියෝ කල්ඇතිවම 'තථාගතයන් ලොව පහළවෙති'යි බමුණු වෙසින් වෙදය පවසති. උගන්වති. ඒ අනුව උසස් තැනැත්තන් ඒ ඒ ලකුණු අනුව තථාගතයන් හඳුනා ගනිතැයි එයින් මුලසිටම වේදයෙහි මහපුරිස් ලකුණු ගැන සඳහන් කරති. තථාගතයන් වහන්සේ පිරිනිවන්පෑ කල්හී, කෙමෙන් (එම කරුණු) නොසැළකෙයි. මැකී යයි. එය දැන් නැත. මහා පුරිසසස අවබෝධය හා මුසු නුවණින්ද කරුණ දී මහා ගුණවලින් පිරුණු උතුම් තැනැත්තාගේ, දෙව ගතියො දෙආකාරයෙන් තීරණය කළහැකිය. මේ 'ගති' යන වචනය අරුත් කීපයක යෙදේ. 'සාරිපුතත, මේ ආකාර වූ ගති පහකි. 'පඤ්ච බො පනිමා සාරිපුතත ගතියො' යන තන්හි ඉපදෙන තැන් දැක්වෙයි. 'තිරිසන් සතුන්ගේ ගති මහා වනය'යි දැක්වූයේ 'ගති මිගානං පවනං' වාසය කරන තැන අරුතිනි. 'මෙසේ බොහෝ ගතිවලින් යුතු, 'එවං අධිමතතගතිමනෙතා' නුවණ ගැන සඳහන් වේ. 'ගති ගත' ආදී තැන්වල යෙදුනේ පැතිර පවත්නා බව අදහස් කිරීමටයි. මෙහි දී 'ගති' යන වචනය යෙදුනේ තීරණයකට එළඹීම සළකා යැයි දතයුතුය. ඒ අනුව ලකුණු කිහිපයක්

පිහිටියේ නම්, ඒ තැනැත්තා සක්විති රජ වන්නේය. එපමණකින් 'බුද්ධ' වන්නේ නොවේ. උසස් වූ උපත සළකා එසේ කියන ලදී. **යෙහි සමන්නාගතා** යැයි ඒ අනුව කීය. **සචෙ අගාරං අජඣාවසති** යම්හෙයකින් ගිහිගෙයි වසයි ද, **රාජාහොති චක්කවත්තී** පුදුමය දනවන කරුණු සතරකින්ද, සිවු සඟරාවතින්ද ලෝකය සතුටු කරන්නා රජුය. සක් රුවන පහළ වීද, සිවුසම්පත් සක්වලින් යුතුවීද, එයින් සෙසු ජනතාවටද උපකාර කරමින්, අනුන් කෙරෙහි හිතවත්ව ඉරියව් නැමති සක පවත්වන බැවින්, සක්විති වේ. පොදුවේ රජ යැයි කියා වෙසෙසින් හැඳින්වීමට 'සක්විති' යැයි යෙදේ. දැහැමින් රජකම ලැබ රජවී යැයි **ධම්මරාජා**, අනුන් කෙරෙහි හිතවත්ව, දැහැමිව කටයුතු කිරීමද **ධම්මිකො**, තමාගේ ද හිතසුව පිණිස දැහැමිව කටයුතු කිරීම ද 'ධම්මරාජා' නම් වේ. කටයුතුවල නිපුණතාව නිසා **චාතුරන්තො** සිවු මුහුදු කෙළවර තෙක්, සිවුමහා දිවයින් කෙළවර කොට ඇති පොළවට අධිපති යන තේරුමයි. තමා කෙරෙහි වූ තරහව ආදී සතුරන්ද, බාහිර අනෙක් රජවරුන් ද දිනුවේ යැයි **විජිතාවී**, **ජනපදත්ථාවරියප්පත්තො** ජනපදවල තහවුරු බව, කිසිඳු අවුල් වියවුල් නොමැති වූ, කිසිවෙකුටත් කලබල ඇති කළ නොහැකි සේ මැනවින් ජනපදය තිරව සකස් වූ බැවින්, උත්සාහවත්ව, තම කටයුතුවල නිරත වූ, සෙලවිය නොහැකි, කම්පා කළ නොහැකි, සෙය්‍යථීදං නිපාත පදයකි. ඒවා කවරේද? ඒ කෙසේද? යන අරුතයි. චක්කරතනං....... **පරිණායකරතනමෙව සත්තමං** එහි වැඩි විස්තර රතන සූත්‍ර විස්තරයෙහිදී කියන ලදී.

ඒවා අතරින් සක්විති රජු සක් රුවනින් ජය නොලද පෙදෙස් දිනයි. ඇත්, අස් රුවනින් කැමති පරිදි පාලන පෙදෙසෙහි පහසුවෙන් සැරිසරයි. සේනාධි නායක රුවනින් රාජධානිය මනාව රැක දෙයි. අනෙක් රුවන්වලින් එදිනෙදා ජීවිතය සුවපහසුවෙන් ගතකරයි. මුලදී ඔහුගේ උත්සාහය දක්වයි. ඇත්, අස්, ගහපති රුවන්වලින් ඔහුගේ ගරුබුහුමන් ලැබීම, උසස් බව පැහැදිලි කරයි. පරිනායක රුවනින් පාලන රටාව පිරිපුන් වෙයි. කාන්තා රුවනින් හා මිණිරුවනින් තෙ ආකාර වූ සව්පල ගෙනෙයි. සක්විති රජු කාන්තා, මිණි රුවනින් සම්පත් සුව විඳියි. ඉතිරි රුවන් සයෙන් ඉසුරු සුව විඳියි. මෙහි වෙසෙසින් සඳහන් කළයුතු වන්නේ, අදොස ආදී කුසල් මුල් තුනෙන් ලබන යහපත් කටයුතු බලයෙන් මුල් රුවන් පහළවීමයි. අතරමැද සඳහන් වන රුවන් පහළවන්නේ අලෝභ කුසල මූලව හටගත් යහපත් කටයුතුවල බලයෙනි. පසු කියැවෙන රුවන

අමොහ කුසල මූලව හටගත් යහපත් කටයුතුවල බලයෙන් පහළ වීයැයි දතයුතුය.

පරොසහස්සං දහසකට වැඩියෙන්, සූරා බිය නොහඳුනන, වීරංගරූපා දෙව්පුතුන් බඳු සිරුරු ඇති, මේ එහි පවත්නා ගතිසොබාවයි. වීරා උසස් සුරුවිරුකම් ඇති, උත්සාහවත් බවද මෙහි කියන ලදී. පරසෙනප්පමද්දනා සතුරු සේනා සිටියහොත්, එය මැඩලීමට හැකි බව අදහසයි. ධම්මෙන 'පරපණ නොනැසිය යුතුය' ආදී පන්සිල් දහම්, අරහං හොති සම්මා සම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දො රාග දෝස මෝහ, මාන, දිට්ඨි, අවිජ්ජා දුසිරිත් නැමති ආවරණයෙන් වසා ඇති කෙලෙස් අඳුරෙන් ලොවෙහි ඒ අඳුරු තිර විවරකොට, ඒ බව ලෝකාවාසීනට හඳුන්වා දීමෙන් විවත්තච්ඡද්දො, අරහං යන පදයෙන් පිදීමට සුදුසු බව දැක්වේ. එහි දෙවන පදයෙන් ඊට හේතු ලෙස සම්මා සම්බුදු බව දක්වයි. ඒ අවබෝධය ලැබීමෙන් කෙලෙස් ආවරණය ඉවත හළ බව තුන්වන පදයෙන් දතයුතුය. සසර ගමන අවසන් කරන ලද බව (ඉහත සඳහන් පරිදි) ආවරණ ඉවත් කරන ලද බව පැහැදිලි කරයි. එයින් සසර ගමන නැතිකළ හෙයින් අරහං හෙවත් පිදීමට සුදුසු වීමෙන් ද, කෙලෙස් වැසුම් රහිත හෙයින් සම්මා සම්බුද්ධ ලෙසද හඳුන්වති. මෙසේ මුල් වචන හේතු දෙකක් ලෙස දක්වන ලදී. මෙසේ දෙවන වචනයෙන් අදහස් වන, (දැනීම - අපමණ නුවණ හා අවබෝධය නිසා ලද) සියල්ල දැනගැනීමෙන් ලබන එඩිතර බව වැනි කරුණු මුල්පදය සමගද දෙවැනි පදයෙන් දැක්වූ කරුණු තුන්වන පදය සමගද එකිනෙකට සම්බන්ධ වෙයි. මුල් පදයෙන් දහම් ඇසද, දෙවැනිව බුදු ඇසද, තෙවැනිව හාත්පස විනිවිදව දකින ඇසද පිරිපුන් වෙතැයි දතයුතුය. සෙල බමුණා, භාග්‍යවතුන් වහන්සේ වෙත යනු කැමතිව, 'පින්වත, සම්බුදුරජාණන් වහන්සේ දැන් කොහි වසත්දැ'යි ඇසීය. මෙසේ කී කල්හී, යෙන සා යම් දිසාවක, නීලවනරාජි ඒ නිල් (හරිතවත්) ගස් සමූහය, ඒ වනය, (පැහැයෙන් හා අවට ඝන සෙවනැල්ලෙන්) වළාකුළු පෙළක් වැන්න. එකල භාග්‍යවතුන් වහන්සේ එහි වැඩසිටියහ. එය පෙන්වා දෙමින්, 'පින්වත් සෙල, අර පෙනෙන නිල්වන් වනයෙහි ඒ බුදුරජාණන් වහන්සේ වාසය කරති'යි කීය. මෙය එහි ඉතිරි පාඨයයි. ආධාර විබත් අරුතෙහි තතියා විබත් යෙදී ඇත. පදෙ පදං පියවරෙන් පියවර තබා (සෙමින් පියෙන් පිය නගා) එයින් ඉක්මන් ගමන වළකයි. දූරාසදාහි (බුදුහිමි කරා) එකවරටම පහසුවෙන් ළංවිය හැකි නොවේ. එහෙයින් මෙසේ, භොනෙතා ආගච්ඡන්තු යැයි

පහසුවෙන් ළංවිය නොහැක්කේ කුමක් නිසාද? තනිව හැසිරෙන සිංහයන් වැනිය. කළයුතු දෙයක් නොමැති බැවින් සිංහයන් තනිව හැසිරෙත්ද, එසේ උන්වහන්සේලාද විවේකය කැමති වෙති. යදාවාහං යනුවෙන් ඒ තරුණ සිවු පිරිස හැසිරිය යුතු මූලික කරුණු පහදා දෙයි. මා ඔපාතෙථ (කතා කරන අතරතුර) නොපිවිසෙව, අතුරු කතා නොකරව, ආගමෙනත ගරු සැළකිලිමත්ව සන්සුන්ව සිටුව, කතාබහ අවසානය තෙක් නිහඬව සිටිත්වා යන අදහසයි.

**සමනෙනසි සොයාගත්තේය. යෙභුයෙයන** බොහෝ, අඳදස අඩුවෙන් දුටුවේය. නොදුටු දෙයක් නිසා ඨපෙත්වා දෙව යැයි සඳහන් විය. **කංඛති** සැකය උපදවා ගනී. 'අනේ, මට දැකිය හැකි නම්'....යන බලාපොරොත්තුව, **විචිකිච්ඡති** ඒ ඒ ආකාරයෙන් පිරික්සමින් සැක කරයි. දටඨුං දකින්නට නොහැකි වෙයි. **නාධිමුච්චති** ඒ සැකයෙන් තීරණය නොකරයි. **න සම්පසීදති** එහෙයින් 'මෙතුමා පුරිස් ලකුණින් පිරිපුන් නැතැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදීමක් නොකරයි. සැකය හෝ (බලාපොරොත්තු වූ දේ නොදැකීමෙන් වූ) දුබල විමතිය, දෙගිඩියාව, ඒ සැකයෙහි මැද අවදියයි. ඒ සැකය මතම දැඩි මතවාදී වීම, එහි මුල්බැස ගැනීම බලවත් අවදියයි. ඒ නිසා ඇතිවන නොපැහැදීම සිතෙහි කිලිටි බව වඩයි. **කොසොහිතෙ** කොපුවක් තුල මෙන්, (පිටතට නොපෙනෙන සේ) වැසී ඇති, **වත්ථගුයෙහා** රහසඟ, භාග්‍යවතුන් වහන්සේගේ රහසඟ ඇතකුගේ මෙන් සිරුර තුලට වැද, රන්පැහැති පියුම් ගැබක පිහිටියේය. එසේ වැසී ඇති බැවින් සෙල බමුණා එය නොදැක, මුවතුල ඇති දිවෙහි පිරිපුන් බවද නොසලකා ඒ ලකුණු දෙක පිළිබඳවම දෙගිඩියාවෙන් සැක සිතුවේය. **තථාරූපං** කෙබඳු ආකාරයටද?

මෙහිදී අප විසින් කුමක් කිවයුතුද? මේ ගැන ඇසූ මිලිඳු රජුට නාගසේන තේරුන් මෙසේ පවසන ලදී. 'නාගසේන හිමියනි, භාග්‍යවතුන් වහන්සේ ඉතා අපහසු දෙයක් කරන ලද සේක්ද?' 'කුමක්ද? මහරජ?' මහජනයා ලජ්ජාව යැයි සලකනු ලබන දේ, බ්‍රහ්මායු බමුණාටද, අතවැසි උත්තර නම් තරුණයාටද, බාවරීගේ අතවැසි බමුණු තරුණන් දහසය දෙනාටද සෙල බමුණාට සහ ඔහුගේ තුන්සියයක් වූ අතවැසි තරුණයන්ටද පෙන්වීය.' 'මහරජ, භාග්‍යවතුන් වහන්සේ රහස් තැන් පෙන්වූවා නොවේ. එහි සෙවනැල්ල පෙන්වූ සේක. පටියෙන් බැඳ ඇති අඳනයද, පෙරවූ සිවුරද තුලින් සෙවනැලි රුව පමණක් දැක්වූහ. 'හිමියනි, සේයාරුව

දැකීමත් පියවි ලෙසම දැකීම නොවේද?' 'මහරජ, එය මෙසේ සැළකුව මැනවි, හදවත දැක, දහම් අවබෝධ කරන කෙනෙකු වේනම්, සම්මා සම්බුදුන් වහන්සේ හදවත ද පෙන්වන සේක. නාගසේන හිමියනි, ඔබවහන්සේ පැන විසඳීමෙහි සමතෙකි.' (රජු කීය.)

'දුක්කරං භන්තෙ නාගසෙන භගවතා කතන්ති, කිං මහාරාජාති, මහාජනෙන හිරිකරණොකාසං බ්‍රහ්මායු බ්‍රාහ්මණස්ස ච අන්තෙවාසී උත්තරස්සච බාවරිස්ස අන්තෙවාසීනං සොළසබ්‍රාහ්මණානඤ්ච සෙලස්ස බ්‍රාහ්මණස්ස අන්තෙවාසීනං තිසතමාණවානඤ්ච දස්සෙසි භන්තෙති, න මහාරාජ, භගවා ගුය්හං දස්සෙති, ඡායං භගවා දස්සෙති, ඉද්ධියා අභිසංඛරිත්වා නිවාසනනිවත්ථං කායබන්ධනබද්ධං චීවරපාරුතං ඡායාරූපකමත්තං දස්සෙති මහාරාජාති, ඡායාරූපෙ දිට්ඨෙ'සති දිට්ඨො එව නනු භන්තෙ ති, තිට්ඨතෙතං මහාරාජ, හදයරූපං දිස්වා බුජ්ඣනකසත්තො භවෙය්‍ය 'හදයමංසං නීහරිත්වා දස්සෙය්‍ය සම්මා සම්බුද්ධොති, කල්ලොසි භන්තෙ නාගසෙනා'ති.

නීහරිත්වා පිටතට ගෙන, කන් සිදුරු පිරිමැදීමෙන් දිග් බව, නාස්පුඩු කන් පිරිමැදීමෙන් තුනී බව, නලල් තලය වැසීමෙන් පුළුල් බවද පෙන්වීයැයි දතයුතුය. ආචරියපාචරියානං ගුරුවරුන්ද, ඔවුන්ගේ ගුරුවරුන්ද, සකෙ වණ්ණෙ තම ගුණය, පරිපුණ්ණකායො ලකුණුවලින් පිරුණු, අඟපසඟ අඩුවීමක් හෝ විසුළු බවක් නැතිව, පිරිපුන් වූ සිරුරින් යුතු, සුරුචි සොඳුරු සිරුරු පැහැ ඇති, සුජාතො උසට ගැලපෙන මහතින්ද, නියම පිහිටීමෙන්ද, චාරු දස්සනො බොහෝ වේලාවක් බලා සිටියත් සෑහීමක් නොමැති, පිළිකුල් නොවන, සුන්දර දැකීමෙන් යුතු, ඇතැමෙක් චාරුදස්සන යනුවෙන් සොඳුරු නෙත් යැයි කියති. සුවණ්ණවණ්ණො රන් හා සමාන වූ පැහැය, අසි වන්නෙහි එය සියළු පදවල යෙදිය යුතුය. සුසුක්කදාඨො මනා පිහිටි සුදුපැහැ දත්, භාග්‍යවතුන් වහන්සේගේ දත්වලින් සඳරැස් මෙන් ඉතා සුදුරැස් නිකුත් වෙයි. සුසුක්කදාඨො යැයි එහෙයින් කියන ලදී. මහාපුරිස ලක්ඛණා පෙර කියන ලද අකුරු සහිත වචන ඒ දත් අතරින් නික්මෙයි.

ඒ ලකුණු අතුරෙන් තමන් කැමති ලකුණුවලින් භාග්‍යවතුන් වහන්සේ පසසමින්, පහන් නෙත් ඇති යැයි කීය. පස් ආකාරයෙන් පැහැදෙන ගතියෙන් යුතු හෙයින් පසන්නනෙත්තො වෙයි. පිරිපුන් සඳමඬල

වන් මුහුණ සුමුඛො, උසට සරිලන මහතින් යුතු බ්‍රහා, බ්‍රහ්මයාගේ මෙන් කෙළින් සිරුර උජු, බබළන සුළු පතාපවා, මීට අදාල කරුණු කලින් සඳහන් කර ඇත. මජ්ඣෙ සමණසංඝස්ස මේ ආකාරයෙන් තුති කරමින්, අගයමින් නැවත කියන ලදී. ඒ කියන ලද පරිදි බබළයි. ඉදිරියට දැක්වෙන ගාථාද මේ අයුරිනි. උත්තමවණ්ණිනො උතුම් පැහැයෙන් යුතු, ජම්බුසණ්ඩස්ස දඹදිවෙහි, පසිඳු වූ, අධිපති බව අගය කරමින්, සක්විති රජ වී නම්, සිවු දිවයිනම ජයගන්නා බව කීය. ඛත්තියා උපතින් රජ කුලයට අයත්, භොජා සම්පත් ඇති, රාජානො රජ බවට පත්වූවෝ, අනුයුත්තා අනුව යන සේවකයෝ, රාජාභිරාජා (අනෙක්) රජවරුන්ගෙන් පුද ලැබිය යුතු රජව, සක්විති බව අදහස් කෙරේ. මනුජින්දො මිනිසුන්ට අධිපතිව.

අරහත් සම්මා සම්බුදුවරුන් ගැන සෙල බමුණා මෙසේ ඔහුට හැඟෙන පරිදි කරුණු කියනවිට, ඒ අනුව තමන් ගැනද පැහැදිලි කරන්නේ යැයි ඔහුගේ අදහස ඉටු කරමින් 'මම ද රජෙක්මි' යැයි භාග්‍යවතුන් වහන්සේ පැවසූහ. එහි අදහස මෙසේය. 'සෙල, ඔබ මගෙන් සක්විති රජවීමට සුදුසු යැයි ඉල්ලා සිටියත්, ඒ ගැන උත්සාහ නොවව, රාජාහමස්මි රජකමට පත්වූ විට වෙනත් රජෙකු යොදුන් සියයක් හෝ යොදුන් දෙසියක්, තුන්සියයක්, හාරසියයක් හෝ යොදුන් දහසක් හෝ සක්විති රජව සිවු දිවයින් කෙළවර කොට පාලනය කරයි. අනුසාසනා කරයි. මට එවැනි සීමාවූ කොටසක් නැත. ධම්මරාජා අනුත්තරො මම භව කෙළවර පටන් අවීචිය දක්වා අපමණ ලෝකධාතූන්හි අනුසාසනා පවත්වමි. පාද රහිත, පාද ඇති, හැම ජීවීන්ටම වඩා මම උසස් වෙමි. සීලයෙන් හෝ.... (සියළු කෙලෙස් බැඳීම්වලින්) මිදුණු බවට නුවණැති දැක්මෙන් හා සමාන කිසිවකු නැත. එහෙයින් මම මෙසේ දහමෙහි රජු වෙමි. උතුම් බවින් උතුම් බවට පත්ව, සිවු ආකාර වූ සිහිය පිහිටුවා ගැනීමෙන්ද, ඇති තතු මැනවින් අවබෝධයට අවැසි කරුණු ද ආදියෙන් ධම්මෙන චක්කං වත්තෙමි 'මෙය දුරු කරව, මෙ පරිදි, මෙයට පැමිණ, වාසය කරව' ආදී තන්හි අණ සක හෙවත් අණ පැවැත්මය. 'මහණෙනි, මේ දුක (අවබෝධ කරන ලද) උතුම් ඇත්තයි. 'මෙහි ඉගෙන ගතයුතු කරුණින් දහම් සක වේ. චක්කං අප්පතිවත්තියං මහණකු විසින් හෝ, බ්‍රාහ්මණයකු විසින් හෝ ලොව කිසිම කෙනෙකු විසින් ආපසු වරදක් නොපෙන්විය හැකි, පෙරළිය නොහැකි සකක් වේ නම් මේ දහම් සකයි.

මෙසේ තමන් පිළිබඳ හඳුන්වා දෙන භාග්‍යවතුන් වහන්සේ දුටු සෙල සතුටට පත්ව, නැවත ඒ කරුණු තවදුරටත් තහවුරු කරගනු පිණිස සම්බුදුවරයෙකු බව දනිමි'යි ගාථා දෙකක් කීය. **කො නු සෙනාපතී** දැහැමිව දම්සක් පවත්වන, දහමින් රජ වූ ඔබවහන්සේගේ සෙන්පති කවරෙක්දැ'යි ඇසීය. මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේගේ දකුණුපසින් ගරු කටයුතු සැරියුත් හිමි, රන්පිඬක් මෙන් සිරියාවෙන්, බබළමින් වැඩසිටියහ. භාග්‍යවතුන් වහන්සේ, සැරියුත් හිමි පෙන්වමින්, **මයා පවත්තිතං චක්කං** යන ගාථාව වදාළහ. **අනුජාතො තථාගතං** තථාගතයන් සමානව, (පැවිදි සසුනෙහි) උපත ලද, තථාගතයන් වහන්සේ හේතුකොට - උපකාරයෙන් සසුන් පත් වූ, යන තේරුමයි. මෙසේ 'සෙන්පති කවුරුන්දැ'යි ඇසූ පැනයට පිළිතුරු දී, 'සම්බුදුන් ලෙස දැනගනිමි' යැයි සෙල පැවසූ කරුණෙහිලා ඔහුගේ දෙගිඩියාව නැති කරනු පිණිස, 'මම පොරොන්දු දෙන පමණකින් (ඔබ හා) එකඟ නොවෙමි, එහෙත් මේ කරුණින් බුද්ධ නම් වේයැයි දැනවීමට **අභිඤ්ඤෙය්‍යං** යන ගාථාව කීහ.

අභිඤ්ඤෙය්‍යං යනු විදුනැණ හා කෙලෙස්වලින් මිදීමයි. (සිවුසස්හි) මගග හා සමුදය **භාවෙතබ්බං** යනුවෙන් (මෙහිදී සැළකේ) ඉවත හළ යුතු (දේ ද ඇත.) හේතු යන වචනයෙන් (බුදුබවට පත්වීම නම්) පල ලැබීමේදී ඉටුවීමේදී, සිවුසස්හි නිරෝධ හා දුකෙහි ඇත්ත පිළිබඳවද කියන ලදී. අවබෝධ කළයුතු දේ අවබෝධ කරන ලද බවත්, වෙසෙසින් දතයුතු දේ දැනගන්නා ලද බවත්, මෙහිම ඇතුලත්ය. 'මෙසේ සිවුසස් මග වැඩීමෙන් ලබන පල සහ විජ්ජා-විමුත්ති දක්වමින්, අවබෝධ කළයුතු දේ අවබෝධ කොට බුදුබවට පත්වීමි'යැයි කීමෙන් බුදුබව තහවුරු කරයි. පහදයි. මෙසේ වෙනස් කළ නොහැකි පරිදි තමන් පිළිබඳව පැහැදිලිකොට, තමන් කෙරෙහි වූ සැක දුරුකරනු පිණිසද, බමුණාගේ උනන්දුව වැඩිදියුණු කිරීමට වේගවත් කිරීමට **විනයසසු** ආදී ගාථා තුනක් වදාළහ. **සල්ලකත්තො** රාග කෙලෙස් ආදී උල් උදුරා දමන, සැත්කම් කරන වෙදකු බඳු, **බ්‍රහ්මභූතො** උසස් වූ, **අතිතුලො** සමකළ නොහැකි, උපමා ඉක්ම වූ, උපමා කොට සඳහන් කළ නොහැකි, **මාරසෙනප්පමද්දනො** 'කාමය ඔබේ මුල්ම සේනාවයි' යනුවෙන් පටන් ගෙන, 'හාත්පස යුද සෙනග දැක, ආදී ලෙසට කී කල්හි මාරපිරිස යැයි කියන ලද මරසේනාව මැඩ පවත්වමින්, **සබ්බා මිත්තෙ** ඛන්ධ, කිලෙස, අභිසංඛාර, මච්චු, දෙවපුත්ත මාර යැයි කී සියළු සතුරන්, **වසීකත්වා** තම යටතෙහි තබාගෙන, **අකුතොභයං** කිසිවකුට බය නැති,

මෙසේ වදාළ කල්හී, එකෙණෙහිම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වූ පැහැදීමෙන්, පැවිදිවනු කැමතිව, **ඉමං භොනෙතා** ආදී ගාථා තුන කීවේ, මගපල ලැබීමට හේතු සම්පවත් ඇති, ඊට සුදුසු පරිදි මුහුකුරා ගිය නුවණින් මෙහෙයවන ලද පරිද්දෙනි.

**කණහාභිජාතිකො** සැඩොල් වැනි පහත් යැයි සම්මත කුලයක උපත ලද, එහිදී සෙල බමුණා හා පැමිණි තරුණයෝ ද එසේම පැවිදිවනු කැමතිව, **එතඤ්චෙ රුචචති** භොතො යන ගාථාව කීහ. ඉක්බිතිව සෙල බමුණා ඒ තරුණ සිසු පිරිස කෙරෙහි සතුටු සිතැතිව, තමන් හා පෙර භවයන්හි එක්ව කරන ලද යහපත් කටයුතුවල පින් මහිමය ඇති, ඒ කුලපුතුන් දක්වා **බ්‍රාහමණ තිසතා** යන ගාථාව කීය.

අතීතයෙහි පියුමතුරා බුදුරදුන් දවස, සේල තුන්සියයක් පිරිසට නායකව, ඔවුන් සමග පිරිවෙණක් කරවා, දන් පිරිනැමීම් ආදී යහපත් දේ කොට, කෙමෙන් දෙව් මිනිස් සුව විඳිමින්, අවසන් උපත ලෙස ඔවුන්ටම ගුරුවරයෙකුව සිටින බවත්, මෙහිදී ඔවුන්ගේ (යහපත්) කටයුතුවල පලය වූ සසරින් මිදීමේ හැකියාවත් දුටු භාග්‍යවතුන් වහන්සේ, 'එව මහණ'යැයි කී පමණින් පා සිවුරු දරා පැවිදිවීමේ හේතුසම්පත් ඇතැයි දැන, ඒ සියල්ලන්ම 'එහි භික්ඛූ' යනුවෙන් අමතා පැවිදි කරමින්, **සවාකඛාතං** යන ගාථාව වදාළහ. **සන්දිට්ඨිකං** තමා විසින් අවබෝධ කරගැනීම, **අකාලිකං** සිවුමග - පල ලබාගැනීමට නියම කරන ලද කාලසීමාවක් නැති බව, **යථා** බලාපොරොත්තු පරිදි, මග බඹසර මුල්කොට ඇති, **පබබජජා අපපමතතසස** සිත කය වචන හික්මීමෙහි සිහිය නොවෙනස්ව, **සිකඛතො අමොඝා** වෙයි. එහෙයින් 'බඹසර මග මනාව කියන ලදී. හික්මීමෙන් නොපමාව'.........යන ගාථාව වදාළහ. එසේ වදාරා 'එව මහණ' භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ඇමතූහ. ඒ සියළු දෙනාම සිවුරු දරා අහසින් අවුත් භාග්‍යවතුන් වහන්සේ වැන්දාහ. සංගායනාවට සහභාගි වූ හිමිවරු මෙසේ ඒ පිරිසගේ පැවිදිවීම අනුව සෙල උපසම්පදාවද ලැබීයැයි කීහ.

**භුතතාවී** දන් වළඳ, **ඔනිත පතතපාණී** යනු පාත්‍රයෙන් අත ඉවතට ගෙන, එහි 'උපගනතවා' - එළඹ යැයි ඉතිරි වචනයක් ද දතයුතුය. වෙනත් තැන්හි මෙන් භාග්‍යවතුන් වහන්සේට එකත්පස්ව හුන්නේ යැයි (පමණක්) යෙදීම නුසුදුසුය.

අග්ගිහුත්තමුඛා ආදී ගාථා භාග්‍යවතුන් වහන්සේ කෙණියගේ සිතට ගැලපෙන පරිදි අනුමෝදනා කරමින් වදාළහ. පුරුද්දක් ලෙස ගිනි පිදීම හැර, බමුණන්ගේ නිසි පරිදි වූ (නිවැරදි) යාගයක් නොවේ. **අග්ගි හුත්ත මුඛා යඤ්ඤා** ගින්නට පුදන ලද දේ උතුම්ය. ගින්නට පුදන ලද දෙය මුල්තැන ගනී යන තේරුමයි. වේදය හදාරන්නන් විසින් මුලින්ම ඉගෙන ගතයුතු බැවින් **සාවිත්තී ඡන්දසො මුඛං** යැයි කියන ලදී. **මනුස්සානං** උසසස් බැවින් රාජා මුඛං යැයි කියා ඇත. **නදීනං** ආධාර වන බැවින්, උපකාර වන බැවින් **සාගරො මුඛං** කියන ලදී. සඳෙහි ගමන යෙදෙන පරිදි, 'අද කැති නැකතය. අද රෙහෙණ නැකත' යයි ද ඒ ඒ දින අනුව පෙනෙන අයුරින්ද ආලෝකයෙන්ද සොම් ගුණයෙන්ද **නක්ඛත්තානං මුඛං චන්දො** යැයි කියා ඇත. බබළන ආලෝකයෙන් මුල්තැනට පත්වන බැවින්, **ආදිච්චො තපතං මුඛං** යැයි කියන ලදී. දීමට, පිදීමට සුදුස්සන් අතරින් මුල්තැන ගන්නා, වෙසෙසින්ම ඒ කාලයෙහි බුදුපාමොක් අරිමහ සඟුණ උදෙසා **පුඤ්ඤං ආකංඛමානානං සංඝො වෙ යජතං මුඛං** යැයි කියන ලදී. එයින් සංඝයා වහන්සේ පින් ලබාගැනීමට සුදුසු ආයෝජන මගක් - දොරටුවක් සේ පෙන්වයි.

වෙනත් ආකාරයෙන් තම හැඟීම් පළකිරීමට **යං තං සරණං** ගාථාවද සෙල හිමි කීහ. එහි තේරුම නම්, පසැසින් යුතු **චක්ඛුමා** භගවා යම් ලෙසකින් අපි **ඉතො** අටය්මෙ දිවසෙ මෙයින් අටවන දිනයෙහි ඒ සරණ ගියෙමු. **සත්තරත්තෙන** තව සාසනෙ එහෙයින් උතුම් වූ දමනය වීමෙන් දැමුණෙමු. 'අහා! ඒ සරණ යෑමෙහි බල මහිමය! මෙයින් පසු භාග්‍යවතුන් වහන්සේට ගාථා දෙකකින් තුති පැසසුම්කොට තුන්වන ගාථාවෙන් වැඳ බුහුමන් දැක්වීමට අවසර ඉල්ලා සිටී.

මේ තුන්සියයක් වූ පැවිද්දෝ ඇඳිලි බැඳ (සැදී පැහැදී) සිටිති. වීරයන් වහන්ස, පා දිගු කළ මැනව. (අපට මග පෙන්වූ) නායකයාණන්ට, කෙලෙසින් මිදුණු බැවින් නාග නම් වූ මේ පැවිදි පිරිසගේ වැඳුම වේවා!

**භික්ඛවො තිසතා ඉමෙ තිට්ඨන්ති පඤ්ජලීකතා**
**පාදෙ වීර පසාරෙහි නාගා වන්දන්තු සත්ථුනො**

**සේල සූත්‍ර විස්තරය නිමි.**

# 3.8

**අනිමිත්තං** යනු සලල සූත්‍රයයි. එම සූත්‍රය දේසනා කිරීමට හේතුව කුමක්ද? භාග්‍යවතුන් වහන්සේට උවටැන් කරන එක් උපාසකතුමෙක් විය. ඔහුගේ පුතා මළේය. ඔහු පුතු මළ සොවින් සත්දිනක්ම නිරාහාරව සිටියේය. ඔහුට අනුකම්පාවෙන් භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ නිවසට වැඩමකොට ශෝකය දුරුකරනු පිණිස මෙම සූත්‍රය වදාළහ.

**අනිමිත්තං** යම් කටයුතුවල නිරතවීමට නොහැකිවීමයි. 'මා යම් වේලාවක ඇසින් ඉඟි කරද්දී හෝ, ඇහි බැම ඉහළට නැංවීම වැනි ඒ නිමිති අනුව (ඒ හඟවන ලකුණු අනුව) ඒ දෙය ඉවතට ගෙන යන්න' මේ ආදී ලෙසට කටයුතු කරනු ඇත. 'ජීවිතය මෙසේ නොවේ. ලබාගැනීමට නොහැකිය. මම මේ ලෙස හෝ කරන්නම්, එතෙක් ඔබ ජීවත්වන්න, මැරෙන්න එපා! (මෙපරිදි තිර බවක් නැත.) **අනඤ්ඤාතං** මෙපමණ කලක් මොහු ජීවත්විය යුතුයැයි, ඉපිද ජීවත්වන කාලය හෝ, ආයු කාලය අවසානය හෝ ඒකාන්තයෙන් දැනගත නොහැකිය. චාතුම්මහාරාජික දෙවියන්ගේ ආයුකාලය මෙපමණකැයි දක්වා ඇතත්, (මිනිසුන්ට) එසේ නොවේ. **මච්චානං** මෙසේ නිසැකවම දැනගත නොහැකිය. **කසිරං** නොයෙක් කරුණු, දේවල් හා සම්බන්ධවන බැවින් සුවසේ යැපීම අපහසුය. ඒ අනුව හුස්ම ගැනීමත්, හුස්ම පහළ හෙළීම ද මහාභූතවලින් සකස්වීමත්, පිඬු ලෙස ගන්නා ආහාරයත්, උණුසුමත්, හැඳිනීමේ, සිතීමේ හැකියාවත් අතර ඇති සම්බන්ධය නොතිබේ නම්, නොකිය හැකි වුවත්, නොදැකිය හැකි වුවත් ජීවත් නොවේ. සිව් ධාතූන් අතරින් පඨවි ධාතුව කෝප වීමෙන්, වෙනස් වීමෙන් විස සපෙකු ඩසිනු ලැබූ විටකදී මෙන් ලී කැබැල්ලක් මෙන් සිරුර තද බවට - දරදඬු බවට පත්වේ.

**පත්ථද්ධො භවතී කායො දට්ඨො කට්ඨමුඛෙන වා**
**පඨවීධාතුප්පකොපෙන හොති කට්ඨමුඛෙව සො**' එහෙයින් කියා ඇත.

ආපෝ ධාතුව කිපීමෙන් - වෙනස් වීමෙන් සිරුර කුණු වූ ගතියට පත්ව, සැරව මස් ලේ වැගිරීමෙන් ඇටසම පමණක් ඉතිරි වේ.

පූතියො භවතී කායො දට්ඨො පූතිමුඛෙන වා
ආපො ධාතුප්පකොපෙන හොති පූතිමුඛෙව සො

තේජෝ ධාතු කිපීමෙන් - වෙනස්වීමෙන් ගිනි අඟුරුවලකට දැමුවාක් මෙන් සිරුර හාත්පස දැවෙයි.

සන්තත්තො භවතී කායො දට්ඨො අග්ගිමුඛෙන වා
තෙජො ධාතුප්පකොපෙන හොති අග්ගිමුඛෙව සො

වායෝ ධාතුව කිපීමෙන් - වෙනස්වීමෙන් ජරාවට පත්වන සිරුරේ හන්දි බැඳුම් ගලෙක දමා කොටන ලද පරිදි ඇට බිඳී යයි.

සඤ්ඡින්නො භවති කායො දට්ඨො සත්ථමුඛෙන වා
වායොධාතුප්පකොපෙන හොති සත්ථමුඛෙවසො

මෙසේ ධාතු සතර නියම ලෙස සම සමව නොවූ විට සිරුර නොපවතී. ඒ ධාතු එකිනෙක මැනවින් පවතිමින්, සම ලෙස ඇතිතාක් ජීවිතය පවතී. මෙසේ ජීවිතය මහාභූත හා බැඳී ඇත. දුබික් කාලවලදී ආහාර නොලැබීමෙන් ජීවිත නැසෙන අයුරු පැහැදිලිය. කැබලිකොට, පිඬුකොට ගන්නා ආහාරය ජීවිතය හා බැඳෙන්නේ මෙසේය. එසේම ආහාරපානාදිය දිරවීමේදී (සිරුරෙන් ලැබෙන) උණුසුම නිසි පරිදි නොලැබුණු විට, ජීවිතය නැසෙන සැටි ද පැහැදිලිය. එසේම ජීවිතය, උණුසුම හා බැඳී පවතී. පණ හෙවත් සිත් පරම්පරාව නැතිවූ කල්හි, එතැන් පටන් ජීවිතය හෝ ජීවී පුද්ගලයකු නැත. මෙයද ලොවෙහි පැහැදිලි දෙයකි. මෙසේ ජීවිතය, විඤ්ඤාණය හා බැඳී ඇත. මේ අයුරින් නොයෙක් හේතු නිසා ජීවිත පැවැත්ම අපහසු යැයි දතයුතුය. **පරිත්තඤ්ච** අල්පය. දෙවියන්ගේ ජීවිතය හා සළකන විට, තණ අග පිනිබිඳක් හා සමානය. අසුරු සැනකින් හෝ සිත ඉදිරියට නොනැගෙන තරම් අල්ප වෙයි. බොහෝ කලක් ජීවත්වන්නකු අතීතයේ තිබූ සිතින්ම ජීවත් වූයේ නොවේ. දැන් ජීවත් වේනම්, ඒ සිතින්ම ජීවත්වන්නේද නොවේ. අනාගතයෙහිද ජීවත්වන්නේ නොවේ. වත්මනෙහි දැන් ජීවත්වන්නේ ද අනාගත සිතකින් නොවේ. වත්මනෙහිද ජීවත් නොවේ. ජීවත් වන්නේද නොවේ. ජීවත් වූයේද නොවේ.

ලැබී ඇති ජීවිතය හුදෙක් සැප දුක පමණි. එක් සිතකින් යුතුව, ඒ මොහොතෙහි ඇතිවී, ගෙවී යන ඉක්මන් වූ මොහොතක්ම වෙයි. කප්

අසූහාර දහසක් කල් දෙවියෝ සිටිත්ද, සිත් දෙකකින් ඔව්හු ද ජීවත් නොවෙතියි ද කියන ලදී.

**ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කෙවලා**
**එකචිත්තසමායුත්තා ලහුසො වත්තතෙ ඛණො**

**චුල්ලාසීතිසහස්සානි කප්පෙ තිට්ඨන්ති යෙ මරූ**
**නත්වෙව තෙපි ජීවන්ති ද්වීහි චිත්තෙහි සංයුතා** යනුවෙනි.

**තඤ්ච දුක්ඛෙන සඤ්ඤුතං** ඒ ජීවිතය මෙසේ නියමිත කාලයක් නැතිව, කොතෙක් කල් ජීවත්වේදැයි නොදැන, අපහසුවෙන්, සීතලෙන්, උණුසුමෙන්, ඩැහැලේ බොන මැසි මදුරු ආදීන්ගෙන් වන ගැහැටෙන්ද, සාපිපාසා නිසා ඇතිවන දුක්පීඩාවෙන් ද, ඒ සියළු කරුණු හේතුකොට ලබන දුකින්ද (නිරතුරුවම) වෙනස්වීම නිසා ඇතිවන දුකින්ද, හැම ලෙසකින්ම දුක් සමූහයකින්ම සමන්විත වේ. එසේ කියන ලද්දේ කුමක් නිසාද? මිනිසුන්ගේ ජීවිත මෙබඳුය. එහෙයින් ඔබ ද ජීවිතය අවසන් වනතුරු දැහැමි හැසිරීමෙහි යෙදෙන්න. පුතු වෙනුවෙන් සෝක නොවවයි (අදහසිනි)

එමෙන්ම සියළු අවැසි දෙය සපයා දෙමින්, මැනවින් පුතු රැක බලා ගත්තද, 'ඔහු මළේ ය, සෝක කෙරෙමි'යි ඔබ සිතන්නෙහිද? එසේ කණගාටු නොවන්න. **න හි සො උපක්කමො අත්ථි යෙන ජාතා න මීයරෙ** උපන් සතුන් නොමැරෙත්වා! රැකගනිත්වා'යි කියනු ලැබූවත්, ඊට කළ හැකි කිසිදු පිළියමක් නැත. එහිදී උපාසකතුමා 'හිමියනි, ජරාවට පත්වීනම්, මරණය සුදුසුය. ඉතා තරුණ වියෙහිම මගේ පුතු මළේ යැ'යි සිතූ පරිදි, 'ජරාවට පත්වුවද නොවූවද මරණය සිදුවෙයි. එහි නියමයක් නැතැ'යි වදාළහ. එම කරුණ නිදසුන් මගින් තහවුරු කරමින්, **ඵලානම්ව පක්කානං** ආදී ගාථා වදාළහ. එහි තේරුම නම්, පැසුණු (ඉදුණු) ගෙඩි මෙනි. ඒ ගෙඩි හිරු උදාවූ වේලෙහි පටන්, හිරු රැසෙන් තැවෙමින්, පොළොවෙහි රස සාරය, දිය සාරය ද ගසෙහි කොළවලින් අත්තටද, අත්තෙන් කඳටද, කඳෙන් මුලටද, මුලින් පොළවටම අනුපිළිවෙලින් පොළවටම පිවිසෙයි. පොළවට පතිත වීමේදී පටන්, පොළවෙන් මුලටද මුලින් කඳටද ආදී ලෙසින් අතු කොළ කෙමෙන් නැවත වැඩෙයි. මෙසේ වැඩීමේදී පැසුණු ගෙඩි, නටුව මුලට නොඒ. ඉක්බිති හිරු රැසින් තැවෙමින්, නටුව (රිකිලි) රත්වීමට පත්වේ. එයින් ඒ ගෙඩි උදෑසන, උදෑසන නිසිකලට බිම වැටෙයි.

පාතො පපතතො භයං වැටීමෙන් බියක් වේ යැයි අරුතයි. **ජාතානං මච්චානං නිච්චං මරණතො භයං** මිනිසුන් මෙසේ පැසුණු ගෙඩි මෙනි. වැඩිදුර කිවයුතුද? ජීවිතයත් කැඩී බිඳෙන සුළු (මැටි) කළයක් බඳුය. එහෙයින් අඩුවයස් වූ තරුණයෝ ද................මරණය පිහිටකොට ඇත්තාහ. මෙසේ වටහාගන්න. එසේ තේරුම් ගෙන, මරණයට නෑදැයා හෝ නෑදැබවද සළකා බලන්න. පියාට පුතාවත් (මරණයෙන්) රැකගෙන පිහිටක් නොවිය හැකි සේම, අනෙක් නෑදැයන්ට තම නෑයා ද රැකගත නොහැකිය. එහෙයින් බලාසිටියදීම (මරණයට) පත්වෙයි. ඒ අනුව මෙසේ සඳහන් කළහැකිය. නෑදැයන් බලා සිටියදීම, 'අම්මේ, තාත්තේ (නැතිනම්) දුවේ, පුතේ............ආදී ලෙසින් පුථු නොයෙක් ලෙසින්, **ලාලපතං** එසේ විලාප කීම, **මච්චානං එකමෙකො** යම්සේ මිනිසා, **ගො වජ්ඣො** මෙසේ ගෙන යයි. **පසස** උපාසකය, බලන්න, වටහා ගන්න. (මරණයෙන්) ලොවට පිහිටක් නැත.

බුදු පසේබුදුවරු ආදීහු ඉතා ගැඹුරු නුවණින් යුත්තාහ. **එවමභාහතො ලොකො මච්චුනා ච ජරාය ච** කිසිවකුට මද හෝ රැකවරණයක් කළ නොහැකි බව දනිති. **තසමා ධීරා න සොචනති විදිත්වා ලොක පරියායං** මෙම ලෝක නියාමය දැන, ඒ නුවණැත්තෝ සෝක නොකරත්. ඔබ යම් මගකට.......... විලාප නගහි? කුමක් නිසා එසේ කියන ලද්දේ ද? **යසස** මවුකුසට, **ආගතසස** පැමිණි, **මගගං** මෙයින් චුතව වෙනත් තැනකට, **ගතසස** ගිය මග හෝ **වා න ජානාසි,** ඔහුට මෙම **උභො අනෙත අසමපසසං නිරත්ථං පරිදෙවසි,** නුවණැත්තෝ එය දැක, දැන, ලොවෙහි මේ පිළිවෙල සොබාව දැන සෝක නොකරති.

මීළඟට 'නිරත්ථං පරිදෙවසි' යැයි මෙහි සඳහන් කරන ලද විලාප නැගීමෙහි තේරුමක් නැති බව තහවුරු කරමින් **පරිදෙවයමානො චෙ** ආදී ගාථා කීහ. **උදබබහෙ** හරවත් දෙයක් ලබන්නේය. දරන්නේය. තමා හඳුනාගත යුතු වන්නේය. **සමමූළෙහා හිංසමතතානං** මුළාවී තමන් කරදරයට පත්වෙමින්, **කයිරාචෙතං විචකඛණෙ** යම්ලෙසකින් එබඳු, **කඤ්චි අත්ථං** කිසියම් වැදගත් හරවත් බවක් වේනම්, නුවණැත්තාද ඒ වෙනුවෙන් වැළපෙන්නේය. හැඬීමෙන් පලක් නැතැයි මෙහිදී අදහස් වේ. **න කිසිවෙකු රුණෙණන සොකෙන චෙතසො සනතිං පපොති** එතකුදු වුවත් හැඬීමෙන් හෝ සෝක කිරීමෙන් හෝ, **භියෝ‍ය අසස උපපජජතෙ දුකඛං සරීරඤ්ච** සිරුර පැහැ වෙනස්වීමෙන් මළානික පෙනුමෙන්, **උපහඤ්ඤති, න තෙන**

**පෙතා** ඒ හැඬීමෙන් මියගිය තැනැත්තෝ, **පාලෙනති** යැපෙන්නෝ නොවෙති. ඔවුනට එය උපකාර පිණිස නොපවතී. එහෙයින් **නිරත්‍ථා පරිදෙවනා** හැඬීම තේරුමක් නැති බව පමණක් නොවේ. අයහපතම පමුණුවයි. කවර හෙයින්ද? 'සෝකය දුරු නොකරනවිට..........එයි වසඟයට යයි.' **අනුත්‍ථුනනෙතා** තදින් සෝක කරමින්, **වසමන්‍වගු** වසඟයට ගියේ, මෙසේ සෝක කිරීමෙන් කිසිදු තේරුමක් නොමැති බවත්, අයහපත ඇතිවන බවත් පෙන්වා, දැන් සෝකය දුරුකිරීමට අවවාද දෙමින් **අඤ්ඤෙපි පස්ස** ආදී ගාථාව කීහ. එම ගාථාවෙහි **ගමිනෙ** පරලොව යාමට සූදානම්ව සිටින, **එත්‍යෙනතවිධ පාණිනො** මරණබියෙන් තැති ගන්නා වූම මේ ලෝකයෙහි සත්වග, **යෙන යෙන** යම් යම් ආකාරයෙන්, **මඤ්ඤන්ති** ආයු බොහෝ වේවා!, නිරෝගි වේවා'යි සිතති. **තතො තං අඤ්ඤථා**, ඔහු මෙසේ සිතාගෙන මියයයි. (ඇතැම්විට) රෝගී ද වෙයි. සිතන අයුරු වෙනස්ම වෙයි. **එතාදිසො** මේ ලෙස, **විනාභාවො** සිතන ලද දෙය එසේ නොවේ. **පස්ස** උපාසකය, ලොව නියමය මෙයයි යන අදහස මෙහිලා යොදාගත යුතුය. **අරහතො සුත්‍වා** මේ කෙලෙසුන් දුරුකළ උතුමෙකුගෙන් මෙබඳු දහම් දෙසුමක් අසා, **න සො ලබ්භා මයා ඉති** ඒ මළ තැනැත්තා නැවත මා විසින් ජීවත් කිරීමට නොලැබේයැයි මනාව දැන, **විනෙය්‍ය පරිදෙවිතං** යැයි කියන ලදී.

**යථා සරණමාදිත්තං** යන ගාථාවෙහි **ධීරො** නුවණින් යුතු, **සප්පඤ්ඤො** නිසග නුවණින්, **පණ්ඩිතො** බොහෝ දේ අසා, ඒ අනුව ජීවිතය සකසා ගත්, මහත් නුවණින් යුතු, **කුසලො** සිතා, විමසා කටයුතු කරන, මෙහිදී සිතාබැලීමෙන්, ඇසීමෙන් හා වැඩීමෙන් හෙවත් ජීවිතයට එක්කර ගැනීමෙන් යන අදහසද මෙහිලා සළකා ගතයුතුය. සෝකයටම පමණක් නොවේ. පරිදෙවං......... **සලලමත්තනො** යන ගාථාවෙහි **පජපප** තණ්හාවයි. **දොමනස්සං** සිතෙහි දුක, **අබ්බහෙ** උදුරා දමන්නේය. **සලලං** මෙසේ තුන්ආකාර වූ දුක් ගෙනදෙන හෙයින්ද, (තමන්) ඇතුලත සිදුරු කරන අදහසින් ද උලකි. ඉහත කියන ලද පරිදි රාගාදී උල් සත් ආකාරයෙනි. මෙම උල් උදුරා හළවිට - නිවුනේ යැයි අරහත් පල කුළුගන්වමින් දේසනය නිමවූහ. **අසිතො** තණ්හා දිට්ඨියෙන් තොරව, **පප්පුය්‍ය** පැමිණ, මෙහි ඉතිරි පද කලින් ද විස්තර දක්වා ඇති බැවින් පැහැදිලිය එහෙයින් සඳහන් නොකරන ලදී.

**සලලසූත්‍ර විස්තරය නිමි.**

# 3.9

එවමෙම සුතං - වාසෙට්ඨ සූත්‍රයයි. මෙම සූත්‍රය දේසනා කිරීමට අදාල හේතු සූත්‍රයෙහිම කියන ලදී. කලින් විස්තරකොට ඇති වචන හැර ඉතිරි පද විස්තර කරන්නෙමි.

ඉච්ඡානංගලො ගමෙහි නම යි. බමුණු මහසල් කුලවලින් චංකී, තාරුක්ඛ, තොදෙය්‍ය යනු හඳුන්වනු ලබන නම්ය. පොක්ඛරසාති, ජානුසෙසාණි යනු නිමිති කියන්නෝය. ඔවුන්ගෙන් එක් තැනැත්තෙක් හිමවතෙහි පොකුණක පියුමෙක උපන්නේය. එක්තරා තවුසෙක් ඒ පියුම ගෙන, එහි නිදාසිටි දරුවකු දැක, ඇති දැඩිකොට රජුට පෙන්වීය. නෙළුම්මලෙහි නිදාසිටි බැවින් පොක්ඛරසාති යැයි ඔහුට නම ලැබිණ. එක් තැනැත්තකුගේ තනතුර වූයේ නිමිති කීමයි. එහෙයින් ජානුසෙසාණි යැයි පුරෝහිත තනතුර ලැබුණි. ඔහු ඒ නමින්ම පතළ විය. ඔව්හූ සියල්ලෝම අඤ්ඤෙඤ්ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහමණ මහාසාලා, කවර හෙයින් ඉච්ඡානංගලෙ පටිවසනති (එහි වසත්ද) වේදය ඉගැන්වීම සහ සොයාබැලීම පිණිසය.

එකල කෝසල ජනපදයට වේදය දත් බමුණෝ වේදය ගායනා කිරීමටද එහි අරුත් විමසා සාකච්ඡා කිරීමටද එම ගමෙහිම රැස්වෙති. තම තමන්ගේ උරුම ගම්වලින් පැමිණි එහි වසත්. වාසෙට්ඨභාරද්වාජානං වාසෙට්ඨගේද භාරද්වාජගේ ද අයමනතරා කථා තම තමන්ට ගැලපෙන කතා හා තොරතුරු කතා කරමින්, හැසිරුණහ. ඔවුන්ගේ කතාබහ අතරතුරදී මෙබඳු වෙනත් කතාවක් උදපාදි ඇතිවිය. කියන ලද්දේ වෙයි. සංසුද්ධගහණිකො ඉතා පිරිසිදු කුසකින්, ඉතා පිරිසිදු බැමිණියකගේ කුසෙහි උපන්නේ යැයි අදහසයි. 'සමවෙපාතිනියා ගහණියා' ආදී තැන කුසෙහි අහර දිරවන උණුසුම් බව (ගින්න) ගැන කියනු ලැබේ. මෙහි දී මවුකුස අදහස් කෙරේ. යාව සතතමා 'මවගේ මව, පියාගේ පියා යැයි මෙසේ අතීතයේ සත්දෙනෙකු දක්වා, මෙහි පියාගේ පියා ද, පියාගේ මව ද පිතාමහ නම් වේ. එසේම මවගේ පියාද මවගේ මවද මාතාමහා නම් වේ. පිතාමහ, මාතාමහා එක්කොට පිතාමහ විය. මෙවැනි යුවළක් පිතාමහ යුගං යුග යනු ආයු කාලයයි. එය වචනයට සීමා වූවකි. තේරුමෙන් සත්මුතු පරම්පරා දෙකක් වේ. අකඛිතෙතා ඉපදීම ගැන,

'ඔහු කවුදැ'යි කිසිවකු විසින්වත් දොස් නැගිය නොහැකි, අනුපක්කුට්ඨා කුලගොතින්ද දොස් කිව නොහැකි, වතත සමපනෙනා හොඳ සිරිත් පිළිපදින, සඤ්ඤාපෙතුං දැන්වීමට, අවබෝධ කිරීමට (කතාබහේදී) නිහඬ කිරීමට, ආයාම යමු.

අනුඤ්ඤාතපතිඤ්ඤා 'ඔබලා තුන්වේදය දත්තාහු'යැයි මෙසේ ඇදුරුතුමන්ලාගෙන්ද, හඳුනා සම්මානයට පත්ව, තමන්ම එය දැනසිටිමු'යි තේරුමයි. අසම වෙමු. උභො දෙදෙනා, අහං පොකඛරසාතිසස - තාරුකඛසසායං මාණවො මම පොකබරසාතිගේ දෙටු අතවැසි මුල්ම සිසුවාය. මොහු තාරුකඛගේ අතවැසියා යැයි ගුරුවරුන් ගැනද තම තමන් ගැනද හඳුන්වති. තෙවිජ්ජානං තුන්වේදයෙහි කෙවලිනො අවසානය දක්වා ඉගෙන අසමසෙ අපි මෙසේ වෙමු, ඉක්බිතිව ඒ අවසානය දක්වා ඉගෙනීම විස්තර කරමින්, පදකසමා -පෙ- සාදිසා යැයි කීය. එහි ජපෙප වෙදයෙහි යන තේරුමයි. කමමනා දස ආකාර වූ යහපත් කටයුතුවලට, 'පෙර මොහු සත් ආකාර වූ කය වචනයෙන් කෙරෙන කටයුතු සඳහා, 'පින්වත, යම් ලෙසකින් (එසේ කටයුතු කරන තැනැත්තා) සිල්වත් වේ' යැයි කීය. සිත මුල්වන තුන්ආකාර වූ කටයුතු සඳහා 'වත් සම්පන්න' වේ යැයි ද කීය. ඒ තැනැත්තා සීලාචාර කෙනෙකි. දැන් එය වචනයට පමණක් සීමාකොට අහඤ්ච කමමනා බ්‍රැම් යැයි පැවසීය. ඛයාතීතං අඩුබව, ඉකුත් වූ, පිරිපුන් යන අරුත් ද වේ. පෙචච එළඹ, නමසසනති වඳිති. චකඛං ලොකෙ සමුපපනෙනා අවිඳු අඳුරු වූ ලෝකයෙහි, ඒ අඳුර දුරුකොට, මෙලොවෙහි දැහැමි දෙයෙහි හරවත් බව ලෝකයාට පෙන්වාදෙන, ඇසක් පහළවූවාක් බඳු,

මෙසේ තුති පැසසුම් කොට, වාසෙට්ඨ විසින් ඉල්ලා සිටි පරිදි, 'එසේනම්, මම ඔබලාට කියන්නෙමි'යි භාග්‍යවතුන් වහන්සේ ඒ දෙදෙනාටම කරුණු පහදා දීමට වන්හ. ව්‍යකඛිසසං කරුණු පැහැදිළි කරන්නෙමි. අනුපුබබං 'මෙසේ කරුණු විස්තර කිරීමෙන් ඒ තරුණයන් හික්මවිය යුතුයි. (නිවැරදි අවබෝධයක් ලබාදිය යුතු යැයි) සිතා, 'බමුණ, ඔබගේ සිතිවිල්ල තිබියේවා!, කීට, පළගැටි, තණකොළ, ගස් ආදියෙහි සිට පිළිවෙලින් පහදා දෙන්නෙමි'යි මෙහි අදහස දතයුතුය. ජාති විභංගං උපත් විස්තර, අඤ්ඤ මඤ්ඤාහි ජාතියො ඒ ඒ ජීවීන්ගේ ඉපදීම - හටගැනීම එකිනෙකට වෙනස්ය. නොයෙක් ආකාර වේ. එයින් ජීවීන්ගේ උපත් විස්තර කියන කල්හි, 'තණකොළ හා ගස් ගැනද දැනගනුව'යි

ඉපදීමක් ලෙසම දැක්විය නොහැකි දේ දක්වාද පැවසීමට පටන් ගත්හ. ඒ කිනම් අදහසකින්ද? උපදින සියළු සතුන් අතර පහසුවෙන් දැනගැනීම පිණිසයි. ඉපදීමක් නොමැති වූවන්ගේ හටගැනීමේ වෙනස්කම් පෙන්වා දෙනවිට, උපත ලබන්නන් පිළිබඳව කරුණු වඩාත් පැහැදිළි වෙයි. තණකොළ ආදියෙහි ඇතුලත එළය වේ. හරයක් ඇත්තේ පිටතය. එමෙන්ම, තල් පොල් ආදියද තණ කොටසට ගැනේ. ඒ ගස්වල පිටත එළයය. අරටුව හෝ හරය ඇතුලතය. තණ ද ගස් ද තණගස් යන සමාස පදය දුතියා (කම් විබත්) බහුවචනයෙන් **තිණරුක්ඛෙපි ජානාථ** යැයි දක්වා ඇත.

න චාපි පටිජානරෙ 'අපි තණ වෙමු, අපි ගස් වෙමු'යි මෙසේ නොදනිති. **ලිංග ජාතිමයං** එසේ නොදත් නමුදු, තණ ආදිය හඳුන්වනු ලබන්නා සේ ඒ ඒ නම් අනුව ජාතියම මුල් වෙයි. ඊට කරුණු මොනවාද? **අඤ්ඤමඤ්ඤාහි ජාතියො** තණ ආදිය වෙනස්ය. ගස් ජාති වෙනස්ය. තණකොළ අතරද වෙනස්කම් ඇත. තල් ආදියද වෙනස්ය. නොයෙක් නමින් හැඳින්වෙන පොල් ජාති ඇතැයි මෙසේ විස්තර කළ යුතුය. එයින් කුමක් හැඟේද? ජාති ලෙසින් (වෙනස්කම්) ඇතත්, එය තම වහර අනුව හෝ වෙනත් කෙනෙකුගේ (සම්මත) පෙන්වාදීමක් නැතිව, ජාතියෙන් වෙනස් වේ යැයි සළකනු ලැබේ. උපතින් බමුණකු හෝ, කැත්කුල හෝ වෙළඳ කුලයක හෝ පහත් කුලයක හෝ වන්නේ යැයි, තම මතය අනුව වෙනත් කෙනෙකුගේ පෙන්වාදීමක් නොමැතිවය. එසේ නොසළකන්නේ නම්, උපතින් බමුණකු නොවනු ඇත. 'යථා එතාසු ජාතිසු' යන මේ ගාථාවෙන් ඒ කරුණ වචනයට පමණක් සීමාවන අයුරු හෙළි කරන්නේය. මෙසේ හටගන්නා දේවලද ජාතිභේදය දක්වා උපදනා දේවල්ද එය පෙන්වාදීමට කීටෙ ආදී ලෙස වදාළහ. **කීටා** යනු කීටයෝ, කුඩාම සතුන්, පටංගා පළගැටියෝ, යාව **කුන්ථකිපිලලිකෙ** කුහුඹුවන්, කඩියන් දක්වා, බුද්දකෙ කලු කටුසු ආදීහු, මහලලකෙ සාවුන්, බළලුන් ආදීන් ඒ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාහ. පාදූදරෙ උදරය පාද කොටගත්, උදරයෙහිම ඇතැම් සතකුගේ පාද වේ යැයි කියන ලදී. **දීඝ පිට්ඨිකෙ** සපුන්ගේ හිසෙහි පටන් වලගය දක්වාම පිට වෙයි. එහෙයින් පිට දික්වූවන් යැයි කියනු ලැබේ. හිස පිහිටි ආකාරය අනුව සපුන් ද නොයෙක් ආකාරය. **ඔදකෙ** ජලයෙහි උපන්, රේමසුන් ආදී ලෙසින් මාළුන් ද නොයෙක් ආකාරය. **පක්ඛී** කුරුල්ලන්, පියාපත් හෙවත් තටු (පක්ඛ) ඇති බැවින්, පක්ඛී යැයි කියනු ලැබේ. පියාපත්වලින් යන්නෝ **පත්තයානා** අහසෙහි

යන්නෝ **විහංගමා** කපුටන් ආදී ලෙසින් කුරුල්ලන්ද නොයෙක් ආකාරය. මෙසේ ගොඩබිම, දියෙහි, අහසෙහි වසන ජීවීන්ගේ උපත් වෙනස දක්වා මීළඟට 'යථා එතාසු' ගාථාවෙන් (මේ සූත්‍ර දේශනයෙන්) අදහස් කරන කරුණු ඉදිරිපත් කළහ.

එහි අරුත, කලින් කෙටියෙන් කියන ලද කරුණු අනුව දතයුතුය. සවිස්තරව කිවයුතු කරුණු තමන්ම දක්වමින් **න කෙසෙහි** ආදී ගාථා කීහ. කලින් කියන ලද දේවල ජාතිය (වෙන් වෙන්ව) හඳුනාගත හැකි වෙතත්, මිනිසුන් අතර බොහෝසෙයින් හඳුනාගත හැකි ලකුණු නැතැයි දතයුතුය. ඒ කෙසේද? **න කෙසෙහි** 'බමුණන්ගේ හිසකෙස් මෙබඳු විය යුතුය. කැත් කුලවතුන්ගේ හිසකෙස් මෙබඳු විය යුතු යැයි නියමයක් නැත. ඇත් අස් මුව ආදීනට (මිනිසුන් හැර) මේ අයුරු යෙදිය යුතුය. **ලිංගං ජාතිමයං නෙව යථා අඤ්ඤාසු ජාතිසූ** මෙසේ දක්වා ඇති පරිදි තේරුම දතයුතුය. ඒ ගැන මෙසේ සඳහන් කළ හැකිය. මේ කෙස් ආදියෙන් මිනිසුන් අතර, බොහෝසෙයින් වෙනස්වන සලකුණු දත නොහැකිය. බ්‍රාහ්මණ ආදීන් කෙරෙහිද, අනෙක් මිනිසුන් අතර ද වෙනසක් නැත. එබැවින් මෙසේ දතයුතුය. මෙසේ මිනිසුන් අතර, (උපතින්) වෙනසක් නැතත්, බමුණකි, 'කැත් කුලවතෙකැයි' හැඳින්වීමෙන් ඇතිවන වෙනස් තතු දැක්වීමට **පච්චත්තං** යන ගාථාව කීහ. එහි තේරුම නම්, තිරිසන් සතුන්ගේ මෙන් කෙස් පිහිටා ඇති අයුරින් වෙනසක් ඇතත්, මිනිසුන්, බමුණු ආදී තම තමන්ගේ උපත ලැබීමේදී මිනිස් සිරුරුවල වෙනස නොපෙනේ. එසේ නොපෙනෙතත්, 'බමුණෙකි, කැත් කුලවතෙකි' යැයි වෙනස ඇත්තේ (ඒ ඒ කටයුතු අනුව) හඳුන්වාදීමෙනි. එය **වොකාරඤ්ච මනුස්සෙසු සමඤ්ඤාය පවුච්චති** වහරන පමණින් කතාබහට අනුව හැඳින්වීමකි.

මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ භාරද්වාජගේ මතය පහත් ලෙස සළකා, 'උපතින් බමුණකු වන්නේ නම්, ඔහු යහපත් දිවිපැවැත්මෙන් හා හික්මීමක් නොමැති වුවද, බමුණෙකුම විය යුතුය. පැරණි බමුණන් එසේ එවැනි තැනැත්තකුගේ බ්‍රාහ්මණ බවට - බමුණකු ලෙස සැළකීමට කැමති නොවූ අතර, ලොව වෙනත් වියත් මිනිසුන් ද කැමති නොවෙතත්, වාසෙට්ඨගේ මතවාදය ඉදිරියට ගෙන යාම පිණිස **යො හි කොචි මනුස්සෙසු** ආදී ගාථා අටක් වදාළහ. එහි **ගොරක්ඛං** කෙත රැකීමයි. ගොවිතැන ගැන කියන ලදී. පොළවට අදාල කොට ගවයා අදහස් කරයි.

ඒ යෙදුම අනුව මෙහිලා කෙත - කුඹුර සැළකේ. පුපු සිපෙපන රෙදි විවීම වැනි නොයෙක් සිප් කටයුතු වොහාරං වෙළඳම, පරපෙසසනා අනුන්ට මෙහෙ කිරීම, ඉසසත්‍ථං ආයුධ වෙළඳමෙන් ජීවත්වීම, ඊතල දුනු ආදිය ගැන කියන ලදී. පොරොහිචෙචන පුරෝහිත කටයුතු (හෙවත් උපදෙසක)

මෙසේ බමුණු සමයෙන් ද, ලෝක වහරට අනුවද යහපත් හැසිරීමෙන් හා හික්මීමක් නැති තැනැත්තා බමුණකු නොවන බව තහවුරු කොට, යම් යම් කුලයක උපන් තැනැත්තකු වුවත් ගුණවතකු නම් ඔහු ද බමුණෙකැ'යි යන නියමය වටහා දී, එය නැවත වාචිකවද නචාහං බ්‍රෑමි බ්‍රාහමණෙ යැයි සඳහන් කළහ. එහි තේරුම නම්, බිජුවටින් ඉපදීම ආදී සිවු ආකාරයෙන් (එක් විදියෙකින්) යම් කෙනෙකු උපත ලැබද, එවැනි කෙනෙකු බමුණකු ලෙස හැඳින්වීමේදී වුව ඔහුට මවකගේ සබඳතාවක් වේ. එය යොනිජං මතති සමභවං නම් වේ. මේ අනුව, බමුණන් කියන පරිදි මව්පිය පරම්පරා දෙකෙහිම බමුණකු උපතින් ඉතාමත් පිරිසිදු වෙත්මැයි, ඒ බමුණාගේ පිරිසිදු වූ උපත් මග (මවගේම) යෝනියමය. 'සංසුදධ ගහණිකො' යනු මවගේ මෙම බැඳීමයි. එයින්ද ඉපදීමක් ලබන බැවින්, මවකගේ සබඳතාව ඇතිව, යෝනියෙන් උපන් ලෙසට කියනු ලැබේ. එසේ මවකගේ සබඳතාවෙන් - යෝනියෙන් උපන් පමණින්ම බමුණකු වේ යැයි අහං මම නොකියමි. කුමක් හෙයින්ද? 'පිංවත, පිංවත' යන වචනයෙන් පමණක්ම කිසියම් වෙනත් තැනැත්තකුගේ ද උසස් බවක් හැඟෙන බැවිනි. භොවාදි නාම සො හොති සචෙ හොති සකිඤචනො යම් තැනැත්තෙකු කිසියම් (සම්මත) කුලයක හෝ පවුලක හෝ උපන්න ද රාගය ආදී (කෙලෙස්) කිසිම දෙයක් නොමැති නම්, අකිඤචන නම් වේ. කිසිදු දෙයක් තමාට අයත්කර නොගැනීමෙන් අනාදාන නම් වේ. ඒ අනුව අකිඤචනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහමණං කුමක් හෙයින්ද? අයහපත හෙවත් පව් බැහැර කරන ලද බැවිනි.

තවදුරටත් කිවහොත්, සබබ සංයොජනං ජෙත්වා......... ආදී ගාථා විසිහතකි. එහි සබබ සංයොජනං යනු සසර බැඳීම් ඇතිකරන බැම් දහයකි. න පරිතසසති තණ්හාවෙන් බිය නොවේ. තමහං ඒ මම රාගාදී කෙලෙස් ඉක්මවූ බැවින්, සංගාතිගං, කාමාදී සතර යෝග නොමැති හෙයින් විසංයුතතං බ්‍රාහමණං එසේ කියමි යන තේරුමයි. නදධිං වෙළාගනු ලබන තරහ නැතිකිරීමෙන්, වරතතං බැඳීමක් මෙන් වූ තණ්හාව ද නැති කිරීමෙන්, සනදානං සහනුකකමං තමා තුළ සැඟවී පවත්නා ලෙසින්,

නොයෙක් ආකාරව පවත්නා දෙසැටක් මිසදිටු හැඟීම් එකතු වීමෙන්, මෙම සියළු බැඳීම් සිඳ දමා 'අවිජ්ජා' නැමති අවහිර දොරටු ඔසවනු ලැබූ (ඉවත් කරන ලද) බැවින් **උක්ඛිත්තපලිඝං** සිවුසස් අවබෝධ කළ බැවින් **බුද්ධං අහං බ්‍රාහ්මණං** කියමි'යි තේරුමයි.

**අදූටෙඨා** නින්දා පරිභව කෙරෙන කරුණු දහයෙන් **අක්කොසඤ්ච** අතින් තැලීම ආදියෙන් සහ දම්වැලින්, මාංචු ආදියෙන් බැඳීම්වලින් **බන්ධනඤ්ච යො** නොකිපෙන සිතින් ඉවසයි. ඉවසීම නැමති බලයෙන් යුතු බැවින් **ඛන්තිබලං** නැවත නැවත දියුණුවන යුදසේනාවක් බඳු එම ඉවසීම නැමති බලඇණියෙන් යුතු බැවින් **බලානීකං** මම එබඳු තැනැත්තා බමුණෙකැයි කියමි. **වතවන්තං** කෙලෙස් මැඩපැවැත්වීම සඳහා වුවත් (ධූතංග) පිළිපදිනා වූ, සිවු පිරිසිදු සීලයෙන් සිල්වත්ව, තණ්හා ආදී කෙලෙස් රහිත බැවින් **අනුස්සදං** ඉඳුරන් හයම දමනය කිරීමෙන් **දන්තං** සසර ගමන කෙළවර සිටි බැවින්, නැවත උපතක් නොලබන හෙයින්, **අන්තිම සරීරං** ඒ තැනැත්තා මම බමුණෙකැයි කියමි. **යො න ලිප්පති** මෙසේ ඒ තැනැත්තා දෙආකාරයෙන් තමා කෙරෙහි කාමයෙහි නොඇලෙයි. එහෙයින් කාමයෙහි නොපිහිටයි. **තමහං බ්‍රාහ්මණං** එසේ කියමියි අදහසයි. **දුක්ඛස්ස** සිරුර පිළිබඳ දුක, **පන්නභාරං** සිරුර බර (හෙවත්) රූපාදි සමූහය බහා තබන ලද, කාමාදී සිවු සැඬපහරින් හා සියළු කෙලෙස්වලින් හෝ **විසංයුත්තං තමහං බ්‍රාහ්මණං** එසේ කියමියි අදහස් වේ. **ගම්භීර පඤ්ඤං** ගැඹුරු වූ රූපාදී සමූහ කෙරෙහි පවත්නා නුවණින් යුතු, දහම් රස නුවණින් යුතු **මෙධාවිං** මේ දුගතියයි. මේ සුගතියයි. මේ නිවනට මගයි. මේ වැරදි මගයි යනුවෙන් මග-නොමග (වටහාදීමේ) හැකියාවෙන් **මග්ගා මග්ගස්ස කොවිදං** අරහත් බව යයි කියන ලද **උත්තමත්ථං අනුප්පත්තං** ඒ පැමිණි තැනැත්තාට මම බමුණෙකැයි කියමි. **අසංසට්ඨං** දැකීමෙහි, ඇසීමෙහි, කතාබහ සහ (ඉඳුරන්) පරිහරණය හා සිරුරේ පහසෙහි කිසිදු අරමුණු නොගන්නා බැවින් අසංසට්ඨ වේ. **උභයං** ගිහි පිරිස සමගද, **අනාගාරෙහි** පැවිදි පිරිස සමගද නොගැටී, **අනොකසාරී** ඇලීම, ආසාව නැතිව හැසිරෙන, **තං** එබඳු, **අහං බ්‍රාහ්මණං** කියමි යන අදහසයි. **නිධාය** අත්හැර දමා, බහා තබා, **තසෙසු ථාවරෙසු ච** තණ්හාවෙන් තැතිගනු ලබන්නන් අතර, තණ්හාව නැතිකරන ලද බැවින්, නොසැලෙන - තිර බවින් යුතු, **යො න හන්ති** මෙසේ යම් තැනැත්තෙක් සියළු සතුන් කෙරෙහි තරහ අත්හැර, දඬුමුගුරු ඉවත ලා, තමාද නොනැසී, අනුන්ද නොනසයි. **ඝාතෙ, තමහං බ්‍රාහ්මණං**

එසේ කියමි'යි අදහසයි. අවිරුද්ධං තද කෝපයෙන්, වෙර බැඳ සතුරුව සිටින පොදු මහජනතාව අතර, සතුරු නොවී, දඬුමුගුරු හෝ අවි හෝ අතට නොගෙන, අනුන්ට පහර දීමෙන් වැළකී සිටින බැවින්, අත්තදණ්ඩෙසු ජනයා කෙරෙහි, නිබ්බුතං දඬුමුගුරු ඉවත දැමූ, රූපාදී සමූහ පහ හෙවත් සිරුර පිළිබඳව 'මම-මගේ' යැයි සළකන බැවින් සාදානෙසු, එසේ නොසළකන බැවින් අනාදානං, තං එබඳු (කෙනෙකුට) අහං බ්‍රාහ්මණං කියමියි අදහසයි. ආරග්ගා ඒ යම්බඳු වූ රාගාදියො, අනුන්ගේ ගුණ මකා, නැතිකොට කතා කිරීමෙන් මක්ඛො, ඉදිකටු තුඩෙහි සාසපො විය. පතිතවන ලදී. අබ ඇටය ඉදිකටු තුඩෙහි නොරඳන්නා සේ සිතෙහි නොසිටී. තමහං බ්‍රාහ්මණං එසේ කියමියි අදහසයි.

අකක්කසං නපුරු රළු වචන නොකියන, විඤ්ඤපනි අරුත් පහදා දෙන, සච්චං ඇත්ත ඇති සැටියෙන්, නාභිසජෙ (යම්) යාය වචනයකින් වෙනත් කෙනෙකු කෝපවන ලෙසට පත් නොකරන්නේය. කෙලෙසුන් නැසූ උතුමා (රහත් පල ලද තැනැත්තා) එබඳු වචනම කතා කරන්නේය. එහෙයින් තමහං බ්‍රාහ්මණං කියමියි අදහසයි. සළු, අබරණ ආදී දීඝං වා රස්සං වා, මුතු මැණික් ආදියෙහි අණු ථූලං වටිනාකමෙන් වැඩි හෝ අඩු සුභං අසුභං, යො පුද්ගලයෙක් මේ අදහසයි. නිරාසයං තණ්හා නැති, විසංයුත්තං සියළු කෙලෙස්වලින් වෙන්ව, තමහං බ්‍රාහ්මණං කියමියි අදහසයි. ආලයා තණ්හාව අඤ්ඤාය අකථං කථී බුද්ධාදී සැක හටගන්නා කරුණු පිළිබඳව සැකය හා දෙගිඩියාව දුරුකරන ලද, අමතොගධං අනුප්පත්තං අමා නිවනට පැමිණි, තමහං බ්‍රාහ්මණං කියමියි අදහසයි. උභො දෙකොටසම, පුඤ්ඤානි පාපානි හැරදමා, සංගං රාගාදි ලෙසින් ඇතිවන කෙලෙස් එකතුව, උපච්චගා ඉක්මවූයේ, සසර පිළිබඳව සෝකයක් නැති අසොකං (සිත) ඇතුලත රාග නැමති දූවිලි නැති බැවින් විරජං කෙලෙස් සහගත සිතිවිලි රහිත බැවින් සුද්ධං බ්‍රාහ්මණං කියමි යි අදහසයි. විමලං කළුවලා වැනි අපිරිසිදු - කිළිටි සිතිවිලි නොමැති, සුද්ධං කෙලෙස් නැති, විප්පසන්නං පහන් සිත, අනාවිලං කෙලෙසුන්ගෙන් කැළඹී නැති, නන්දීභව පරික්ඛීණං තුන්භවයෙහිම තණ්හාව මුළුමනින්ම නැතිකළ, තමහං බ්‍රාහ්මණං කියමි යි අදහසයි. යම් පැවිද්දෙක් ඉමං රාගපලිපථං මේ කෙලෙස්, දුග්ගඤ්ච සංසාරං සසර ගමනද, සිවුසස් අවබෝධ නොකළ බැවින් වූ මොහඤ්ච ඉක්මවා කාමාදි සැඩපහර සතරින්ම තිණ්ණ (එතෙර) ව, පාරං පැමිණියේය. දෙආකාර දැහැනෙන් ඣායී තණ්හාව නැති කිරීමෙන් අනෙජො, සැක නැති බැවින් අකථංකථී සසර ගමනට

හේතුවන දේවල් දැඩිකොට නොගැනීමෙන් නැවත නොඉපිද, කෙලෙස් (ගිනි) නිවීමෙන් **නිබ්බුතො**, **තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං** කියමි යි අදහසයි. යම් පුද්ගලයෙක් **ඉධ** ලෝකයෙහි දෙයාකාර වූ කාමෙ හැරදමා, **අනාගාරො** එසේ පැවිදි වෙයි. **තං පරික්ඛීණකාමං භවං** ඒ කාමයද, ඉපදෙන තැන්ද හැරදමන ලද ඔහු බ්‍රාහ්මණයෙකැයි මම කියමි. යමෙක් **ඉධ** ලෝකයෙහි, (ඇස්, කන්) ආදී දොරටු සයෙහි **තණ්හං** හැරදමා ගිහිගෙයි විසීම හරයක් නැතැයි සළකා **අනාගාරො** අනගාරිකව කෙලෙස් දුරුකිරීමට උත්සාහ දරයි. **තණ්හාය ච භවස්ස** තණ්හාවද සසර ඉපදීමේ ආසාවද දුරුකළ තැනැත්තාට **තමහං බ්‍රාහ්මණං** එසේ කියමි යන අදහසයි.

**මානුසකං යොගං** මිනිසුන්ට මෙන් ආයුසද පස්කම්හි ඇලීමද දෙවියන්ටද එසේමය. **උපච්චගා** යමෙක් මිනිසුන් කැමති, ඒ දේවල් ද **හිත්වා** දෙවියකු වීමද ඉක්මවා, **තං සබ්බෙහි** සතරාකාර වූ යොගෙහි **විසංයුත්තං අහං බ්‍රාහ්මණං** කියමි යි අදහසයි. **රතිං** පස්කම්හි ඇලීම, **අරතිං** වනවාසයෙහි ද ඇළුම් රහිත වූ, **සීතිභූතං** නිවුණු, **නිරූපධිං** කෙලෙස් රහිත වූ **වීරං තං** එබඳු වූ, **සබ්බං ඛන්ධලොකං අභිභවිත්වා** එසේ සිටි උත්සාහවත් වූ, **අහං බ්‍රාහ්මණං** කියමියි අදහසයි. **යො වෙදී** යමෙක් **සත්තානං** සියළු ආකාරයෙන්, **චුතිඤ්ච පටිසන්ධිඤ්ච** පතළව දැන ගනී ද, නො ඇලෙන බැවින් **අසත්තං**, මනා සේ පිළිවෙත් මගෙහි ගිය බැවින් **සුගතං**, සිවුසස් අවබෝධ කළ බැවින් **බුද්ධං බ්‍රාහ්මණං** එසේ කියමියි අදහසයි.

**යස්ස** මෙබඳු යම් කෙනෙකුට දෙවා උපන් තැනක් නොදනීද, **තමා** තුළ පැසවන (කෙලෙස්) ආසව නැතිකරන ලද බැවින්, කෙලෙස් දුරින්ම දුරුකළ, ඇත් කළ බැවින් **අරහන්තං බ්‍රාහ්මණං** කියමි යි අදහසයි. **පුරෙ** අතීත ජීවිතවල, **පච්ඡා** අනාගතයෙහි උපදනා තැන් පිළිබඳව, **මජ්ඣෙ** දැන් පවත්නා ජීවිතය ගැන, **කිඤ්චනං** මේ කිසිම තැනක තණ්හා හැඟීමෙන් දැඩිව සිතට ගනු ලබන කිසිවක් නැත. ඒ මම රාගාදි, එබඳු කිසිවක් නොමැති බැවින්, **අකිඤ්චනං**, කිසිවක් සිතට නොගන්නා හෙයින් **අනාදානං බ්‍රාහ්මණං** (එසේ) කියමියි අදහසයි. තැති නොගන්නා බැවින්, ගවරැළක නායක ගවයා මෙන් උසස් **උසභං** උතුම් යන අරුතින් **පවරං** උත්සාහවත් බවින් **වීරං**, මහත් වූ සිල් සමූහය සොයා ගත් බැවින් **මහෙසිං** තුන් මරුන් දිනන ලද බැවින් **විජිතාවිනං** කෙලෙස් සෝදාහළ බැවින් **නහාතකං**, සිවුසස් අවබෝධයෙන් **බුද්ධං** මෙබඳු **තං**, අහං **බ්‍රාහ්මණං**

කියමියි අදහසයි. (එබඳු) යම් තැනැත්තෙක් **පුබ්බෙනිවාසං** අවබෝධයෙන් පිරිසිඳ දනී ද, දෙව්ලෝ සය අනුවද **සග්ගං**, සතරාකාර වූ **අපායඤ්ච** දිවැසින් **පස්සති**, **අථො ජාතික්ඛයං** එසේ කියනු ලබන අරහත් බවට පැමිණියේද **තමහං බ්‍රාහ්මණං** කියමියි අදහසයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගුණවත් බවින් බ්‍රාහ්මණයා කවරෙකුදැයි පහදා, යම් කෙනෙකු උපතින් බමුණකු වේයැයි දැඩිව අදහස් කළද, ඔවුන් කරුණු හරිහැටි නොදනිතියි'ද, ඔවුන්ගේ ඒ හැඟීම වැරදි බවද දක්වමින් 'සමඤ්ඤා හෙසා' ආදී ගාථා දෙකක් වදාළහ. එහි අදහස නම්, බ්‍රාහ්මණ, ඛත්තිය, භාරද්වාජ, වාසෙට්ඨ යනුවෙන් **නාම ගොත්තං පකප්පිතං**, **සමඤ්ඤා හෙසා ලොකස්මිං** හඳුන්වාදීමට, කතාබහ කිරීමේදී පමණක් යොදා ගැනේ යැයි දතයුතුය. කවර හෙයින්ද? **සමුච්චා** සමුදාගතා එකිනෙකා අතර හඳුනා ගැනීමක් ලෙස පැවත ආ බැවිනි. ඒ වනාහී, **තත්ථ තත්ථ** උපන් කල පටන් සහ ලේ නෑදෑයින් විසින් **පකප්පිතං** නමක් ලෙස තබන ලදී. ඔහුට එසේ නමක් තැබීමට අදහස් නොකළේ නම්, කිසිවෙකු වෙනත් කෙනෙකු දැක 'මේ බමුණෙකි' හෝ 'මෙ භාරද්වාජ යැයි හෝ නොදනී. මෙසේ ඇති වූ පරිකල්පනය **දීඝරත්තං අනුසයිතං** දිට්ඨිගතං අජානතං ඊට බැඳුණු නම්ගොත් අනුව, වහරට පත් වූ බව නොදන්නා මිනිස්සු තම සිත් සතන්හි දිගු කලක් පවත්නා හැඟීමක් ලෙස තහවුරු කරගන්නා බැවින්, ඒ නම් ගොත් **අජානන්තා තෙ පබ්‍රුවන්ත** උපතින් බමුණකු වේ'යැයි නොදැනීමෙන්ම මෙසේ කියතැයි විස්තර කරන ලදී.

මෙසේ යම් කෙනෙක් 'බමුණකු වන්නේ උපතින්ම' යැයි දැඩිව මත දරන්නෝ වෙත් ද, එය වහරට පමණක් වේ යැයි නොදැනීම ඔවුන්ගේ වැරදි හැඟීමක් බව පෙන්වා, මුළුමනින්ම ඒ ජාතිවාදය පිළිකෙව් කරමින්, කරන කියන දෙයෙහි පල ඇතැයි ද යන කම්මවාදය ඇතුළත් කොට, න ජච්චා යන ගාථාව වදාළහ. **කම්මනා බ්‍රාහ්මණො හොති කම්මනා හොති අබ්‍රාහ්මණො** යන මේ ගාථා පද දෙකෙන් අරුත් විස්තර කිරීම පිණිස ඒ ඒ තැනැත්තාට අදාල කටයුතු අනුව, **සීසෑම්** ආදිය කරන්නා ගොවියා යනුවෙන් (හඳුන්වන බව) කියන ලදී. එහි **කම්මනා** නම් ගොවිතැන ආදී ආදායම් ඉපැයෙන කටයුතුය. **පටිච්ච සමුප්පාද දසා** මෙම හේතුව නිසා මෙසේ වෙයි' යනුවෙන් හේතුව සහ පලය දකින, **කම්මවිපාක කොවිදො** ගරුසැළකිලි ලබන, ගැරහුම් නින්දා ලබන පවුල්වල,

පෙර කරන ලද කටයුතු හේතුකොට (මරණින් පසු) උපත ලබයි. තවත් විටක, උසස් පහත් ලෙසින් කරන ලද කටයුතුවල විපාක විඳී. මේ කරන ලද කටයුතුවල විපාක දීමේ හැකියාවයි. **කම්මනා වත්තති** ගාථාවෙහි **ලොකො** හෝ **පජා** හෝ **සත්තා** හෝ එකම තේරුම වේ. 'බ්‍රහ්මයා ඇත. ඒ බ්‍රහ්මයා උසස්මය. (ලෝකය) පියෙකු මෙන් උපදවා, මුළු ලොවම තම වසඟයෙහි පවත්වා ගනී' යන මේ හැඟීම, දැකීම ඉවත දමන බව දතයුතුය. කම්ම විපාක අනුව ඒ ඒ උපත ලබන තැන් පැවතෙනු මිස, වෙනත් කවරෙක් ලොව බිහිකරයිද? දෙවෙනිවරද, මෙසේ කළ කී දෙයක (කම්ම) පල අනුව ඉපදුණද - පැවතුණද, ඒ අතීත වත්මන පරිදි සැපදුක ලබමින්, උසස් පහත් බවට පත්වෙමින්, කම්ම (නියාමය) පවත්නේ යැයි පහදා දුන්හ. තෙවන වරටද එම අදහස නිගමනය ලෙස ඉදිරිපත් කරති. මෙසේ මුළුමනින්ම **කම්මනිබන්ධනා** පුද්ගලයෝ කරන කියන දෙයින්ම, බැඳී පවත්නාහ. වෙනත් කිසිවක් නිසා නොවේ. **සිවුවැනිව රථස්සාණීව යායතො** යැයි උපමාවෙන් පැහැදිලි කරති. යම්සේ රිය ගමනේදී (රෝදයට) කඩඇණය හා බැඳී පවත්නේ ද, ඇණය හා සබඳතාව නොමැති වූ කල යා නොහැකිය. එසේම ලෝකයාගේ ඉපදීමත්, පැවැත්මත් 'කම්ම' හා බැඳී ඇත. එසේ නොබැඳේ නම්, හටගැනීමක් නැත. පැවැත්මක් නැත. එසේ කම්ම නියාමය හා ලොව බැඳී ඇති සේම, උසස් කටයුතුවල පලයෙහි උසස් බවම දක්වමින්, **තපෙන** ආදී ගාථා දෙකක් කීහ. **තපෙන** ඉඳුරන් සංවරයයි. **බ්‍රහ්මචරියෙන** ඒ හික්මීම ඇසුරුකොට ඇතිවන, අනුගමනය කරන ලද උසස් වූ හැසිරීම් රටාවයි. **සංයමෙන** සීලයෙන්, **දමෙන** නුවණින්, මෙසේ උසස් කටයුතු නිසා උතුම්, බ්‍රහ්ම යන අරුතින්, **බ්‍රාහ්මණො හොති** එසේ බමුණකු වන්නේ කවර හෙයින්ද? **එතං බ්‍රාහ්මණං උත්තමං** ඒ (යහපත්) කටයුතු උතුම් බ්‍රහ්මයකු බවටද හේතුවන හෙයිනි. **බ්‍රහ්මානං** යනුවෙන් ද වචනයකි. එහි අරුත නම්, බ්‍රහ්මයකු බවට පත්වීම, එය ලඟාකර ගැනීම, එය ගෙනදීම මෙහිලා කියන ලදී. දෙවන ගාථාවෙහි **සන්තො** කෙලෙසුන් (නසන ලද බැවින්) සන්සුන්ව, **බ්‍රහ්මා සක්කො** මෙබඳු කෙනෙක් බ්‍රහ්මයෙක් පමණක් නොවෙති. සක් බවටද පත්වන්නේය. **එසේ පණ්ඩිතයන්ගේ** (දැන හඳුනාගැනීමය.) **එවං වාසෙට්ඨ ජානාහ** යනුවෙන් වදාරන ලද්දේය. ඉතිරි කරුණු කලින් සඳහන් වූ පරිදිය.

**වාසෙට්ඨ සූත්‍ර විස්තරය නිමි.**

# 3.10

එවමෙම සුතං කෝකාලික සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතුවූ කරුණ කුමක්ද? එය විස්තර ලෙස, එවමෙම සුතං යනුවෙන් සූත්‍රයෙහිම සඳහන් වෙයි. එහි 'ඉක්බිති කෝකාලික'යැයි දැක්වෙන පරිදි මේ කෝකාලික නම් කවුද? කුමක් නිසා (භාග්‍යවතුන් වහන්සේ වෙත) එළඹියේදැ'යි මෙසේ විස්තර කරනු ලැබේ.

මොහු කෝකාලී රටෙහි, කෝකාලී නගරයෙහි, කෝකාලි සිටුවරයාගේ පුත්‍රය. සුළු කෝකාලික නමින් පැවිදිව පියා විසින් කරවන ලද විහාරයෙහිම වාසය කරයි. දෙව්දත් තෙරුන්ගේ සිසුවකු නොවේ. බමුණු පුතෙකු වූ ඔහු මහා කෝකාලික නමින් පතළ විය. භාග්‍යවතුන් වහන්සේ, සැවැත් නුවර වැඩවසද්දී, අගසවු දෙනම, පන්සියයක් මහණුන් සමග ජනපදචාරිකාවෙහි යෙදෙමින්, වස් සමාදන් වන කාලයෙහි විවේකීව වාසය කිරීමට කැමතිව, ඒ මහණුන් පිටත්කරවා, තම පාසිවුරු ද ගෙන, කෝකාලි ජනපදයෙහි එම විහාරයට ගියහ. එහිදී කෝකාලික හිමි සමග සතුටු පිළිසඳර කතාවෙන් පසු 'ඇවැත්නි, අපි මෙහි මේ තුන්මාසය වසන්නෙමු. කිසිවෙකුටත් ඒ බව සැළ නොකරව'යි කීහ. කෝකාලික හිමි 'යහපතැ'යි පිළිවදන් දී, තුන් මාසය ඉකුත්වීමට දිනකට පෙර, කලින්ම නගරයට ගොස්, 'ඔබලා අගසවු දෙනම මෙහි වසන බව නොදනිවුද? කිසිකෙනෙක් සිවුපසයෙන් වත් ආරාධනා නොකළේ යැයි සැළ කළේය. නුවරවැසියෝ, 'හිමියනි, අපට නොදැන්වූයේ ඇයිදැ'යි ඇසූහ. 'දැනුම් දෙන්නේ කුමකටද? ඇයි දෙනමක් වසන බව නුදුටුවෙහිද? (එසේනම් ඒ) අගසවු දෙනම නොවේදැ'යි (සළකා) වහා ගිතෙල්, හකුරු, රෙදි ආදිය ගෙනවුත් කෝකාලික හිමි ඉදිරියේ තැබූහ.

අගසවුවෝ ලද දෙයින් සෑහීමට පත් වෙති. දැනුම් දීම නිසා ලැබුණු දේ බව දැන භාර නොගනිති. එසේ භාර නොගෙන, නිසැකවම 'මෙහි වසන හිමියන්ට දෙව'යි කියන්නාහ. එබැවින් මම මේ ලැබුණු දේවල් ඔවුන් ලවාම ගෙන යම්'යි කෝකාලික හිමි සිතුවේය. එසේ කටයුතු කළේය. තෙරුන්වහන්සේලා දෙනම එය දුටු කෙණෙහිම දැනුම් දීමෙන් ලද බව දැන, 'මේවා අපට නොව කෝකාලිකටම වටී' යැයි සිතා, ආවාසයෙහි වසන හිමිව දෙව'යි නොකියාම බැහැරකොට ගියහ. 'තමන් නොගන්නේ නම්, මටවත් නොදුන්නේ යැ'යි කෝකාලික හිමි

දොම්නස් විය. අගසවු දෙනමද භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. බුදුරජාණන් වහන්සේ ද පවරාණය කොට, තමන් ජනපද චාරිකාවෙහි නොහැසිරෙත් නම්, 'මහණෙනි, බොහෝදෙනාගේ හිත පිණිස චාරිකාවෙහි හැසිරෙවු'යැයි අගසවු දෙනම පිටත්කර හරිති. මෙය තථාගතයන් වහන්සේලාට ආවේණික වූවකි. මේ වේලාවෙහි තමන් නොයනු කැමතිව, 'මහණෙනි, යව, චාරිකාවේ හැසිරෙවු' යැයි නැවත පිටත්කර හැරියහ. උන්වහන්සේලා තවත් මහණුන් පන්සියයක් සමග චාරිකාවේ යෙදෙමින් පිළිවෙලින් කෝකාලි නුවරටම ගියහ. නගරවාසීහු තෙරුන් වහන්සේලා හැඳින සපිරිකර දානය පිළියෙල කොට, නගර මැද වේදිකාවක් කරවා දානය පිරිනැමූහ. පිරිකරද පිළිගැන්වූහ. තෙරුන් වහන්සේලා ඒවා පිළිගෙන අනෙක් හිමිවරුන්ට දුන්හ. ඒ දුටු කෝකාලික හිමි 'කලින් මේ තෙරුන් වහන්සේලා ලද දෙයින් සතුටු වූහ. දැන් ලෝභයෙන් වෙළී පවිටු බවට පත්වූහ. පෙරදී ද ලද දෙයින් සතුටුවීමේ සිතිවිල්ලෙන් ඇත් වීදැයි හැඟේ. මේ නැතිගුණ පෙන්වන ලාමක මහණුන් යැයි සිතුවේය. කෝකාලික හිමි, තෙරුන්වහන්සේලා වෙත පැමිණ, ඇවැත්නි, ඔබලා පෙර ලද දෙයින් සතුටුව, විවේකීව මෙන් සිටියාහුය. දැන් පවිටු පැවිද්දන් සේ යැයි' කියා, 'ඉක්මනින්ම ගොස් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කරන්නෙමි'යි පා සිවුරු ගෙන, එදිනම සැවැත්පුරට ගියේය. කෝකාලික හිමි භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේ මේ කරුණ නිසාය. එහෙයින්, **අථ ඛො කොකාලිකො භික්ඛු යෙන භගවා තෙනුපසංකමි** යැයි කියන ලදී.

කොකාලික හිමි වහ වහා පැමිණෙනු දුටු භාග්‍යවතුන් වහන්සේ 'අග සවුවන් කෙරෙහි දොස් නැගීමට කැමතිව එසේ පැමිණෙන බව දැන, එය වළක්වාලීමට හැකිදැයි මෙනෙහිකොට' එය නොහැකිය, තෙරුන් වහන්සේලාට දොස් නඟා නිසැකවම පදුම නම් නිරයෙහි උපදින්නේ යැයි දිවැසින් දුටහ. එහෙත්, සැරියුත්, මුගලන් තෙරුන්ට ගරහනවිට, එය නොවැළැක්වීයැයි නැගෙන පොදු චෝදනාවෙන් මිදෙනු පිණිසත්, උතුමන්ට ගැරහීම බරපතල වරදක් බවත් දැක්වීමට 'එසේ නොකරන්නැයි' තෙවරක්ම වැළැක්වූහ. **මාහෙවං** මා එවමාහ, 'එසේ නොකියව'යි අදහසයි. **පෙසලා** සිල්වත්, **සද්ධායිකො** ඇදහිය හැකි, පහදන සුළු, **පච්චයිකො** හේතු සහිතව 'එය මෙසේ' යැයි තීරණයකට පැමිණෙතැයි ද කියන ලදී. **අචිරපක්කන්තස්ස** ඉවතට ගිය නොබෝ වේලාවකින්, **සබ්බො කායො ඵුටො අහොසි**, කෙස් අගක් පමණකුදු ඉඩක් නොතබා, මුළු සිරුරම ඇට බිඳගෙන මතු වූ **පීළකාහි**, වසා පැතිරී ගියේය.

කළ දෙයක මෙබඳු විපාකය බුදු බලය නිසා බුදුරජාණන් වහන්සේලා හමුවේදීම පල නොදෙයි. බුදුහිමි දැකීමට නොලබන විටකදී (එතැනින්) ඉවත් වූ කල විපාක ලැබෙයි. එහෙයින් කෝකාලික හිමි බුදුහිමි වෙතින් ඉවතට ගිය නොබෝ වේලාවකින් බිබිලි මතුවිය. **අචිරපක්කන්තස්ස කොකාලිකස්ස** යැයි ඒ අනුව කියන ලදී. කුමක් නිසා එතැනම නොසිටියේ යැයි කියන ලද්දේ ද? කරන ලද දෙයෙහි බලපෑමයි. ඉඩලද විට ඒකාන්තයෙන් එය විපාක දෙයි. එබැවින් එතැන සිටීමට (සිත) ඉඩ නුදුනි. කෝකාලික හිමි තමන් කරන ලද දෙයින් (සිත) මෙහෙයවමින්, **උට්ඨායාසනා පක්කාමි, කාලයමත්තියො** කඩල ඇට පමණ, **බෙලුව සලාටුකමත්තියො** නොමේරූ බෙලිගෙඩි තරම්, **පභිජ්ජිංසු** පැලුනාහ. එසේ ගෙඩි පිපිරී ගිය කල මුළු සිරුරම ඉදුණු කොස්ගෙඩියක් මෙන් විය. කෝකාලික හිමි සිරුර කුණු වී, බොහෝ විපතට පත්ව දුකින් පෙළී ජේතවන විහාර දොරටුවෙහි නිදා සිටියේය. දහම් ඇසීමට එනයන මිනිස්සු ඒ දැක, 'කැතයි, කෝකාලික, ලැජ්ජයි කෝකාලික, නුසුදුසු දෙයක් කළෙහි, තමන්ගේම කට නිසා බොහෝ විපතට පත්වී'යැයි කීහ. ඔවුන්ගේ කීම ඇසූ රැකවලෙහි සිටි දේවතාවෝ එකසේ නින්දා කළහ. රැකවල දේවතාවන්ගේ කීම ඇසූ අහසෙහි වසන දේවතාවුන්ගේ සිට අකනිට්ඨාව තෙක් එක්බදුම නින්දා ගැරහුම් විය.

එකල්හි තුදු නම් වූ කෝකාලික හිමිගේ ගුරු හිමියෝ අනාගාමී ඵලයට පත්ව, සුද්ධාවාසයෙහි ඉපිද සිටිති. ඒ නින්දා හඬ අසා සමවතින් නැගිටි එතුමෝ එහි අවුත්, සැරියුත් මුගලන් තෙරුන් වහන්සේලා කෙරේ සිත පහදවා ගන්නා ලෙස අවවාද කළහ. කෝකාලික හිමි එම වචනයද නොපිළිගෙන, ඒ අපරාධයෙන්ම කළුරියකොට පදුම නිරයෙහි ඉපදුණේය. **අථ ඛො කොකාලිකො භික්ඛු තෙනෙවා බාධෙන......... ආඝාතෙත්වා** යැයි එහෙයින් කියන ලදී.

**අථ ඛො බ්‍රහ්මා සහම්පතී** 'මේ බ්‍රහ්මයා කවරෙක්ද? කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, මෙසේ කීවේද යත්, මොහු කස්සප බුදු සසුනෙහි සහක නම් මහණකුව අනාගාමීව, සුද්ධාවාසයෙහි උපන්නේය. එහිදී සහම්පතී බ්‍රහ්ම නමින් හඳුන්වති. 'මම භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ, පදුම නිරයෙහි තොරතුරු කියන්නෙමි. ඊට පසු, උන්වහන්සේ පිරිසට පවසන්නාහ. කරුණු වටහාගත හැකි සංඝයා වහන්සේලා එහි ආයු කාලය විමසන්නාහ. භාග්‍යවතුන් වහන්සේ උතුමන්ට

ගැරහීමේ ආදීනවද එහිදී පවසන්නාහ'යි සහම්පතී බ්‍රහ්මයා එහි පැමිණ ඒ තොරතුරු කීවේය. භාග්‍යවතුන් වහන්සේ එපරිදිම කටයුතු කළහ. එක්තරා මහණෙක් ඒ තොරතුරු විචාළේය. එසේ විමසන ලද පරිදි 'මහණ, ඒ කෙබඳුදැ'යි යනුවෙන් විස්තර කළහ.

**වීසති ඛාරිකො** යනු මගධ පතින් (නැළියකින් හතරෙන් එක් කොටසක්) සතරක් කොසොල් රටෙහි පත් එකකි. එයින් පත් හතරක් ආළහක එකකි. ආළහක හතරක් ද්‍රොණ එකකි. ද්‍රොණ සතරක් මානික එකකි. මානික සතරක් ඛාරි එකකි. ඛාරි තුනක් වීසති ඛාරික නම් වෙයි. **තිලවාහො** තල පිරවූ කරත්තයක්, **අබ්බුදො නිරයො** අබ්බුද නමින් කිසියම් වෙනම නිරයක් නැත. අවීචියෙහිම අබ්බුද ගණනාවක් දුක්විඳීමට, තැවීමට සිදුවන බැවින්, අබ්බුද නිරය යැයි කියන ලදී. නිරබ්බුදා ගැනද මේ ආකාරයෙන් දතයුතුය. ඒ ගැන අවුරුදු ගණනින් මෙසේ දතයුතුය. යම් සේ සිය සිය දහස කෝටිය වේ. එසේ කෝටි සියසිය දහසක් පකෝටි වේ. පකෝටි සියදහස් සියයක් කෝටිපකෝටි වේ. කෝටිපකෝටි සිය සිය දහසක් නහුතයකි. නහුත සියසිය දහසක් නිනනහුත එකකි. නිනනහුත සිය සියදහසක් අබ්බුද එකකි. එහි විසි ගුණයක් නිරබ්බුදයකි. ඉතිරි සියල්ලටද මෙසේය. ඇතැමෙක් ඒ ඒ තැන්හි තමා විසින් කරනු ලබන හඬාවැලපීම් හා තමා කරන ලද දරුණු දේවල් අනුව වේ නම් ලැබුවේ යැයි ද කියති. තවත් සමහරෙක් ඒවා 'සීතල නිරය' සේ ද කියති.

**අථාපරං** යනුවෙන් එම කරුණු ගාථා මගින් වෙසෙසින් දැක්වීමට කියන ලදී. පාඨ ලෙසින් (පද) ඇති මෙම ගාථා විස්සෙහි 'සතං සහසසානි' යන එක් ගාථාවක්ම ඉහත සඳහන් කළ කාලය පැහැදිලි කිරීමට දක්වා ඇත. ඉතිරි ගාථා වෙනත් වෙසෙස් කරුණු පැහැදිලි කිරීමටය. අවසාන ගාථා දෙක ගැන මහ අටුවාවෙහි තහවුරු කරන ලද සඳහනක් නැත. එහෙයින් ගාථා විස්සකැයි කීවෙමු. **කුඨාරී** තමන් කැපෙන අරුතින්, කෙටේරියක් බඳු නපුරු වචනය, **ඡිඥති** මුලින්ම තමාගේ යහපත වනසා ගනී. (තමන්ම වැනසෙයි.) **නින්‍දියං** ගැරහුම් කටයුතු, **තං වාපි නින්‍දති යො පසංසියො** උසස් ලෙසින් පැසසුම් කළයුතු පුද්ගලයෙකු වේද, ඔහුටද පවිටු අදහස් දක්වමින් නින්දා කරයි. **විචිනාති** රැස්කරයි. **කලිං** අපරාධය, **අයං කලී** මේ අපරාධය, **අක්ඛෙසු** දූ කෙළියෙහි යොදාගන්නා දාදු කැටවල, **සබ්බසසාපි සහාපි අත්තනා** තමන් සමගම තමාගේ සියළු ධනයෙන්, **සුගතෙසු** යහපත් ලෙස ගිය බැවින් ද යහපත් තැනකට ගිය

බැවින් ද සුගත නම් වූ බුදු පසේබුදු සව්වන් කෙරෙහි, **මනං පදූසයෙ** මෙසේ යම් කෙනෙක් සිත කිළිටි බවට පත් කරගන්නේ නම්, එය සිතෙහි ඇතිවන මහත් වැරැද්ද **මහනතරො කලී** යැයි කියන ලදී. කවර හෙයින්ද? වසර සියදහස් ගණනින් මෙපමණකැයි කාලය දැක්විය නොහැකි හෙයිනි. **යං කාලයක්, අරියගරහී වාචං මනඤ්ච පණිධාය පාපකං නිරයං උපෙති** එහි පැසෙති'යි කියන ලදී. මේ කෙටියෙන් පදුම නිරයෙහි ආයු කාලයයි. වෙනත් ආකාරයකින් යම් තැනැත්තෙකු සුගතයන් වහන්සේලා කෙරෙහි සිත කිලිටි කරගතහොත්, එය මහත් වූ අපරාධයක් වන බව පහදා දෙමින් දැන් අභූතවාදී යන ගාථාව කීහ. **අභූතවාදී** එබඳු උතුමන්ට අපහාස ලෙසින් බොරු දොස් කියන තැනැත්තා, නිරයං පදුම ආදී නරකාදිවල, **පෙචච සමා භවනති** මේ ජීවිතයෙන් පසු නිරයෙහි උපදී. පරත්‍ථ පරලොව ගැන වැඩි කතා කුමටද? **යො අපපදුටඨසස** වැරදි නැති, නපුරු නොවන, අවිජ්ජා නමැති කිලිටි නැති බැවින් **සුදෙධා** පව් සිතිවිලි නොමැති බැවින් **අනංගණො** යැයි දතයුතුය. නපුරුකම් නොමැති බැවින් හෝ පිරිසිදු, පිරිසිදු බැවින් සිතෙහි කිලිටි නැති ලෙසද මෙසේ අරුත් යෙදිය යුතුය.

මෙසේ බුද්ධාදී සුගතයන් වහන්සේලා කෙරෙහි සිත කිලිටි කරගත් කෙනෙකු මහත් අපරාධයක් කරන බව තහවුරු කොට, මීළඟට තුරිත වත්‍ථු ගාථා නමින් ගාථා දහහතරක් කීහ. එම ගාථා කෝකාලික හිමියන් මිය යද්දී, අවවාද ලෙසින් ගරුකටයුතු මහමුගලන් තෙරුන් විසින් කියන ලදී. මහා බ්‍රහ්මයා විසින් කියන ලදැයි තවත් කෙනෙක් කියති. ඒ ගාථාද මේ සූත්‍රය සමගම අදාල වන පරිදි ඇතුලත් කර ඇත. යමෙකු ලෝභයෙන් යුතුනම්, එම ගතිගුණය මෙවැනි විටකදී ද නොයෙක් ලෙසින් (නොයෙක් මුහුණුවරෙන්) පවත්නා බැවින්, එය ලෝභයම බව ඒ මුල් ගාථාවෙන් ලෝභ ගුණෙ අනුයුතෙතා යැයි දක්වනු ලැබීය. එය තණ්හාවටම සමාන වචනයකි. **අවදඤ්ඤූ** වචන පිළිනොගෙන, බුදුවරුන්ගේ වුවද අවවාද නොසැළකීමෙන්, **මචඡරී** පස්ආකාර වූ මසුරුකමින්, කේලාම් කීමෙන් අගසවුවන් බිඳවනු කැමතිව, ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය. **යො** ඇවැත්නි, කොකාලික ලෝභ තණ්හාවෙන් යුතු ඔබ වැනි කෙනෙකු, **ලොභගුණෙ අනුයුතෙතා සො වචසා පරිභාසති අඤ්ඤං** පුද්ගලයෙකුට නින්දා කිරීමේ අරමුණින්, මුඛදුග්ගා ආදී ගාථා තුනක් එහෙයින් කියමි. මේ එහි පැහැදිලි නොකල පදවල තේරුම්ය. **මුඛදුගග** විසම මුවක් ඇති තැනැත්ත, ඇති තතු නොකියන, බොරු කියන්නා වූ, **අනරිය** අයහපත්

**මිනිසාණනි, භූණහු** දියුණුව වනසන තැනැත්ත, **පුරිසන්ත** ජීවිතය කෙළවර කොට ඇති මිනිසාණනි, කලි අවාසනාවන්ත තැනැත්ත, අවජාත බුදුරජාණන් වහන්සේට (ගරු නොකරන) බුදුපුතකු නොවන තැනැත්ත, **රජං ආකිරසි** කෙලෙස් දූවිලි තමන්ම තවරා ගත්තෙහි, **පපතං** අපිරිසිදු වතුරවළ **පපාතං** යනුද මෙම අදහස ඇති වචනයකි. **පපද** යන වචනයක්ද වේ. මහා නිරය යනු ද තේරුමයි. **ඉතිහතං** මෙහි හ ඉති නිපාත පදයි. **තං** ඒ යහපත් අයහපත් කටයුතු, නැතහොත් හතං ගිය, පිළිපන්, රැස්කරන ලද යනු ද තේරුමයි. සුවාමී එබඳු දෙයක් කරන ලද බැවින් එය ඔහුට හිමිය. ඔහුම එය ලබනෙව එයින් ඔහු වැනසේ යැයි කියන ලදී. ලැබෙන දේ **දුක්ඛං මඤ්ඤෙ**.......... කිබිබිසකාරී යැයි දැක්වූහ. මීළඟට යම් දුකක් එබඳු තැනැත්තකු විඳීද, එය පහදා දෙමින්, අයොසංකුස මහතට්ඨානං ආදී ගාථාව කීහ. එහි මුල් ගාථා පද දෙකෙහි අදහස - යකඩ කුරුවලින් ඇනීමෙන් පීඩා විඳීමට සිදුවීම ගැන, භාග්‍යවතුන් වහන්සේ විසින්, 'මහණෙනි, ඒ නිරයපාලකයන් ඔහුට පස්ආකාර වූ බැඳීම් නම් වූ (දඬුවම් කාරණ) කරතැයි කියන ලද පරිදි මෙහි අදාළය. එසේ දක්වා ඇති පරිදි, ගිනියම් වූ පොළවෙහි හොවා, නිරයපාලකයන් විසින් සිරුරෙහි පස් තැනකට යකඩින් කළ තියුණු මුවහත් රත් වූ උලකින් අනිනු ලබයි. රත් වූ උල් සහිත යකඩ කුරක් අතෙහි තබති ආදී ලෙසින් භාග්‍යවතුන් වහන්සේ මේ පිළිබඳව වදාරන ලදී. ගාථාවේ පසුපේළි දෙකෙහි අරුත මෙයයි. නොයෙක් අවුරුදු ගණනක් එහි දුක්විඳ ඉතිරි වී ඇති තවත් දුක් විඳිනු පිණිස අනුපිළිවෙලින් ලුණු හා කහට රසැති ගංතෙරට ගිය ඔහුට 'රත් වූ යකඩ ගුළි මුවෙහි දමතැයි ද, රත් වූ ලෝදිය මුවෙහි ඉසිතැයි ද කියන ලදී.

**අයො** ලෝහ, **ගුළ සනනිභං** බෙලිගෙඩි හා සමාන, යකඩ ලෙසින් තඹ ලෝහ ද අනිත් පදයෙන් යකඩ ගුළි යැයි ද දතයුතුය. **පතිරූපං** කරන ලද කටයුතු අනුව, එයින් පසු ගාථාවල (සඳහන්) න හි වගගු 'අල්ලා ගනිවු, පහර දෙව් යැයි, වදනතා, නිරය පාලකයෝ මිහිරි වචන නො කියති. **වදනති, නා භි ජවනති** මුදු මොළොක් ලෙසින් (සුහද ලෙසින්) ඉදිරියට නොදුවති. මුදු ලෙස (සෙනහසින්) නොපැමිණෙති. බොහෝ විපත් පමුණුවමින්ම එළඹෙතැයි කියන ලදී. **න තාණං උපෙනති** රැකවරණයක්, පිළිසරණක්, පිහිටක් වෙමින් නොපැමිණෙති. අල්ලා ගනිමින්, වනසමින්ම එතියි කියන ලදී. **අංගාරෙ සන්ථතෙ සෙනති** අඟුරු පච්චකට නැංවූවා සේ, නොයෙක් අවුරුදු දහස් ගණනක් අතුරන ලද ගිනි අඟුරු

මත නිදති. **අගගිනිසමං ජලිතං** හාත්පස දිලිසෙන, හැම පැත්තෙන්ම සමව ඇවිලෙන ගින්න, **පවිසනති** මහා නිරයෙහි වැටුනු හා සමානව බැසගනිති. ඒ මහා නිරය 'චතුකකණණ' යැයි කියන ලදී. යොදුන් සියයක් දුර සිට බැලූවිට ඇස් බිඳී යයි. **ජාලෙනච ඔනහියානා** යකඩ දැලෙන් වෙලා, මුවන් දඩයම් කරන වැද්දන් මෙන් **හනනති** මේ දේවදූත සූත්‍රයෙහි සඳහන් නොවූ දෙයකි. **අනධං ච තිමිසං ආයනති** (ඇස් අඳ වූවාක් මෙන්) තද අඳුරමය. ඝන අඳුර බැවින්, එසේ හඳුන්වනු ලබන, දුම් දමන 'රෞරුව' නම් නිරයට යති. එහිදී ඒ රළු දුම හුස්ම ගැනීමෙන් ඇස් තද දුබල බවට පත්වෙයි. එහෙයින් අඳ වේ යැයි කියන ලදී. **තං විතතං හි යථා මහිකායො** ඒ තද අඳුර මීදුම මෙන් පුළුල්ව පැතිරේ යන අරුතයි. **විකත** යනුද වචනයෙකි. මෙයද දේවදූත සූත්‍රයෙහි නොකියන ලදී.

**අථ ලොහමයං** මේ ලෝසැලිය පොළව කෙළවරකොට ඇති නහුත සතරකුත් දෙසිය දහසක් යොදුන් ගැඹුරැති, මුවවිටටම පිරවූ ලෝදියෙන් යුතුය. **පචචනති හි තාසු චිරරතතං** ඒ හැලිවල දිගුකලක් පැසෙති. **අගගිනිසමාසු** ගින්න හා සමාන වූ, **සමුපපිලවාසො** වරක් උඩටද, වරක් යටටද යමින් පෙණ බුබුළු නැගෙන ඒ හැලිවල උඩුයටිකුරු වෙයි. එය දේවදූත සූත්‍රයෙහි සඳහන් පරිදි දතයුතුය. **පුබබලොහිතමිසෙස** සැරව, ලේ මුසු වූ ලෝහ සැලියෙහි, **තත්ථ කිං එහි, දිසතං** දිසාවට, **අධිසෙති** යයි, **අභිසෙති** යනුද පාඨයකි. **යං යං** දිසාවකට ඇලේ, පිහිටක් නොලබයි යනු තේරුමයි. **කිලිසසති** අවහිර කරනු ලබයි. **කිලිජජති** යනු ද වචනයකි. කුණුවෙයි යන තේරුමයි. **සමුප්පසමානො** ඒ සැරව ලේවල තැවරී, මෙයද දේවදූත සූත්‍රයෙහි සඳහන් නොවූවකි. **පුළවාවසථෙ** පණුවන් වසන, මෙම ලෝහ සැලිව දේවදූත සූත්‍රයෙහි 'අසූචි නිරය' යැයි කියන ලදී. ඉඳිකටු තුඩු වැනි මුව ඇති ජීවීහු එහි වැටුණු තැනැත්තකුගේ සම ආදී තැන් සිදුරුකොට, ඇට මිදුළු කති. **ගනතුං නහි තීරමපත්ථි** ඉවත්වීමට ඉවුරක්වත් නැත. **තීරවමත්ථි** යයිද වචනයකි. ඒ තේරුමයි.

**සබබසමාහි සමනතපලලා** ඒ හැළියෙහි උඩ කොටස යටිකුරු කරන ලද බැවින්, හැම තැනම සමාන පමණ වූ කටාරම් (තාච්චි) නිසා එයින් ඉවත්ව යාමට තෙරක් නැත. **අසිපතතවනං** දේවදූත සූත්‍රයෙහි කියන ලද පරිදි එය දුරින් පෙනෙන්නේ මනහර අඹ උයනක් මෙනි. නිරයෙහි වෙසෙන්නෝ ඊට ආසාවෙන් එහි පිවිසෙති. එහිදී සුළඟින් ගිලිහුණු කොළ ඔවුන්ගේ ඇඟට වැටී අඟ පසඟ කැපේ. එහෙයින් **තං**

**පවිසනති සමචණ්දගතතා** යැයි දැක්වීය. එසේ සිරුරු දැඩි ලෙස **ජීවහං බළිසෙන ගහෙත්වා ආරජාරජයා විහනනති** වේගයෙන් දිවවිත් ඒ අසිපත් වනයට වැටුනු (පෙර) ජීවිතයේ බොරු කී තැනැත්තන්ගේ දිව නිරය පාලකයෝ බිළි කොකුවෙන් පිටතට ඇද, තෙත සම් බිම එළා පොලු කැබලිවලින් පහරදෙන මිනිසුන් සේ, තලා, පොරෝවලින් පලා එක් එක් කෙළවර කපා හිංසා කරති. කැපූ කැපූ කෙළවරින් නැවත උඩට ඔසවයි. **ආරචයා රචයා** යනුද වචනයකි. උඩට ඇද ඇද යන තේරුමයි. මෙයද දේවදූත සූත්‍රයෙහි සඳහන් නොවූ දෙයකි. **වෙතරණී** යනු දේවදූත සූත්‍රයෙහි කියා ඇති පරිදි කර-ලුණු දිය පිරි ගඟකි. ඒ දියෙන් පිරී ඇති සේ පෙනේ. එවිට 'එහි නාන්නෙමු, දිය බොන්නෙමි'යි නිරයට ගිය තැනැත්තෝ එහි වැටෙති. **තිණහධාරං ඛුරධාරං** තියුණු ඉතා මුවහත් මතුපිට, මුවහත් තල පිළිවෙලින් තබන ලද සේය. ඒ තියුණ මුවහත් වූ ජලයෙහි **උපෙනති** ඇලෙනු ලබති යන තේරුමයි. මෙසේ ඒ පවෙහි විපාකයෙන් අලලන ලද්දේ, **තපථ මඥා පපතනති** මෝඩ යන අදහසයි. **සාමා සබලා** මෙයට පසුව බල්ලෝ යනුවෙන් මෙසේ යෙදිය යුතුය. සුදු පැහැති, කබර පැහැති බල්ලෝ සපා කති. **කාකොළ ගණා** කළු පැහැති කපුටු සමූහයා, **පටිගිද්ධා** දැඩි කුසගින්නෙන්, 'මහාලිහිණි' යැයි ඇතැමෙක් කියති. **කුලලා** උකුස්සෝ 'සෙන' නමින්ද සමහරෙක් හඳුන්වති. **වායසා** කළුපැහැ නොවූ කපුටෝ, මෙයද දේවදූත සූත්‍රයෙහි නොකියන ලදී. එසේ සඳහන් කළද, කිසියම් තැනක සඳහන් නොවූවද, එය ඒ ආකාරයෙන් මුලදී හෝ පසුව හෝ කියා ඇති සේ දතයුතුය.

මීළඟට මේ ආකාරයෙන් නිරයෙහි තොරතුරු දක්වා, අවවාද කෙරෙමින්, **කිචඡා වත අයං ඉධ** යන ගාථාව කීහ. නිරයෙහි නොයෙක් ආකාරයෙන් (දඬුවම් සේ ලැබෙන) කටයුතු වුනතා කියන ලද **යඤ්ජනො පසසති කිබ්බිසකාරී තසමා ඉධ ජීවිතසෙසෙ** ජීවිත පරම්පරාවෙන් මේ ලොව ජීවත්වෙමින්, සරණ ගමන ආදී කුසල් දහම්හි යෙදෙන, **කිච්ච කරො නරො** වන්නේය. ඒ යහපතෙහි යෙදී, නොනැවතීම කටයුතු කරන්නෙක් වෙයි. **න පමජ්ජ** මොහොතකුදු පමා නොවන්නේය. මේ මූලික කෙටි විස්තරයයි. කලින් විස්තර දැක්වූ වචන, ඒ ආකාරයෙන් අරුත් පැහැදිලි කොට ඇති බැවින්, එසේ දැනගත යුතුය. එබැවින් වචනයක් වචනයක් පාසා විස්තර නොකරන ලදී.

**කෝකාලික සූත්‍ර විස්තරය නිමි.**

# 3.11

ආනන්දජාතෙ යනු නාලක සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතුවූයේ කුමක්ද? පියුමතුරා බුදුසව්වකු මොනෙය්‍ය පිළිවෙත අනුගමනය කරනු දැක, එතැන් පටන් එසේ කිරීමට බලාපොරොත්තු වෙමින්, කප් සියදහසක් කල් පෙරුම් පිරූ අසිත ඉසිවරයාගේ බෑණනුවකු වන නාලක තවුසා (අප) භාග්‍යවතුන් වහන්සේ දම්සක් පැවැත්වූ දවසින් සත්වන දින 'අඤ්ඤාතමෙතං' ආදී ගාථා දෙකකින් මොනෙය්‍ය පිළිවෙත විචාළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට 'මොනෙය්‍යනෙත උපඤ්ඤිස්සං යනුවෙන් එය පැහැදිළි කළහ. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑමෙන් පසු සංගීතියට පැමිණ ගරුකටයුතු මහකසුප් තෙරුන් විසින් ගරුකටයුතු ආනන්ද තෙරුන්ගෙන් නාලක තවුසා එය විමසා සමාදන් වූ අයුරු විමසන ලදී. ඒ සියල්ල හෙළිදරව් කරනු පිණිස, ආනන්දජාතෙ ආදී ලෙසින් ගාථා විස්සක් කියන ලදුව, එය නාලක සූත්‍රය ලෙස හඳුන්වනු ලැබේ.

ආනන්දජාතෙ අදහස ඉටුවී, (සිත) දියුණුවට පත්වී, පතීතෙ සතුටුව, නැතහොත් වඩ වඩාත් සතුටට පත්ව, පතීතෙ සොම්නසට පත්ව, සුචිවසනෙ නොකිලිටි ලෙසින්, දෙවියන්ගේ කප්රුකෙහි පහළ වූ රෙදි දූවිලි හෝ කුණු පැල්ලම් නොගනී. දුස්සං ගහෙත්වා රෙද්දකට සමාන බැවින් 'දුස්ස' යනුවෙන් හඳුන්වනු ලබන දිව (සළුව) ඔසවා - සිසාරමින්, අසිතො ඉසී කළුපැහැ සිරුර නිසා එසේ නම් ලද ඉසිවරයා, දිවා විහාරෙ දවල් කාලය ගතකිරීමෙහි, ඉතිරි වචන කලින් සඳහන් කරන ලද පරිදිය. මෙහි සම්බන්ධතාව මෙසේය. අසිත ඉසිවරයා සුද්ධෝදන රජුගේ පියා වූ සීහහනු රජුගේද පුරෝහිතව, සුද්ධෝදන (කුමරු) ඔටුනු පැළඳීමට පෙර, සිප් ඇදුරව, රජ බවට පත්වූ පසු පුරෝහිත තනතුරට පත්විය. අසිත ඉසිවරයා උදේ සවස රජුට උවටැන් පිණිස (උපදෙස් දීමේ සේවය පිණිස) පැමිණිවිට, තරුණ කාලයේදී මෙන්, ගරුසත්කාර නොකොට ඇඳිලි බැඳ වැඳීම පමණක් කරයි. එය ඔටුනු පළඳ රජබවට පත්වන සැකිකුල රජ සිරිතකි. අසිත ඉසිවරයා එයින් කලකිරී, 'මහරජ, මම පැවිදි වෙමි'යි කීය. රජු තවුසාගේ තීරණය දැන 'එසේනම් ඇදුරුතුමනි, මට නිතර දැකිය හැකි පරිදි මගේම උයනෙහි විසිය යුතු'යැයි ඉල්ලා සිටියේය. තවුසා 'එසේ'යැයි පිළිවදන් දී, තවුස් පැවිද්දෙක්ව, රජුගෙන් උවටැන් ලබමින්, උයනෙහිම වෙසෙමින් කසිණ බවුන් වඩා සමාපත්ති අට හා

අභිඤ්ඤා පහ උපදවා ගත්තේය. එතැන් පටන් රජමැඳුරෙහි අහර ගෙන, හිමාලය, චාතුම්මහාරාජික දෙව්ලොව, ආදී තැනකට ගොස් දිවාකාලය ගතකරයි. එක් දවසක් තවුතිසාවට ගොස්, රුවන් විමනට පිවිස, දෙව්රුවන් පලඟෙහි හිඳිමින්, සමාධිසුව විඳ හවස් කල නැගිට, විමන් දොරටුවෙහි සිට වටපිට බලනවිට, සැටයොදුන් මහා වීදියෙහි පිළී හිස සිසාරාවමින් බෝසත් ගුණ සඳහන් තුති වදන් කියමින් කෙළිදෙලින් පසුවන සක්දෙව් පිරිවරා ගත් දෙවියන් දුටුවේය. ඒ අනුව ගරුකටයුතු අනඳ හිමි 'ආනන්ද ජාතෙ.....දිවා විහාරෙ යැයි කීය. අසිත තවුසා ඒ දෙවියන් දැක.......කුමක් නිසා එසේ (සතුටු වන්නේ දැයි ඇසීය.) උදඟෙග සතුටුව, සතුට-උනන්දුව පිරි සිරුරු (ඉරියව්වෙන්) චිත්තිං කරිත්වා ආදරය කොට, කලල රූපො සතුටු බවින් යුතුව, ඉතිරි පද අරුත් පැහැදිලිය.

මීළඟට දැක්වෙන 'යදාපි ආසි' ආදී ගාථා ඉහත දැක්වූ කරුණු සම්බන්ධ කිරීමට යෙදේ. ඒ මුල්ගාථාවේ වචනවල අරුත් දක්වතොත් සංගාමො යුද්ධය, ජයො සුරානං දෙවියන්ට ජය ය, එය වටහාගනු පිණිස එහි පිළිවෙල කතාව දතයුතුය. මගධ රට, මඩල නම් ගමෙහි විසූ මිනිසුන් තිස්තුන් දෙනෙකුට නායක වූ මඝ නම් තරුණයෙක් වත් සතක් සපුරා තම පිරිස සමග සක්දෙව්ව තව්තිසාවෙහි උපන්නේය. එහිදී පෙර සිට වසන දෙවියෝ, 'අමුත්තන් සේ දෙව්පුතුන් පැමිණ ඇත. ඔවුන්ට සත්කාර කරමු'යි කියා දෙව්ලොව පිපෙන පියුම් ගෙනාහ. දෙව් රජයෙන් අඩක් පාලනයට ඇරයුම් කළහ. සක්දෙව් එවන් පාලනයකට නොකැමතිව, තම පිරිසට කරුණු වටහා දී දිනක් සුරා මතින් මත්ව සිටි ඒ දෙව්වරුන් පාවලින් ගෙන සිනෙරු පව්වෙහි පාමුලට විසිකර දැමීය. එයින් සිනෙරු පව්වෙහි යටිතලයෙහි පරසතු මලින් වැසුනු මනහර පලොල් මලින් සුන්දර වූ සියක් යොදුන් පෙදෙසක අසුර භවන පිහිටියේය. එහිදී ඔව්හු පියවි සිහිය ලැබ, තව්තිසා භවන නොදැක, 'අනේ, අපි බීමත් වූ වරදින් නැසුනෙමු. අපි සුරා පානය නොකෙළෙමු. අපි සුරා නොවූ - අසුර පානය කළෙමු. දැන් අපි සුරයෝ නොවෙමු. අපි දැන් අසුරයෝ ලෙසින් උපන්නෙමු'යැයි එතැන් පටන් අසුර යනුවෙන් හැඳිනීමක් ඇතිව, 'අපි දෙවියන් සමග යුද සටන් කරමු'යි සිනෙරු පව්ව හාත්පස සිසාර නැඟ සිටියහ. එහිදී සක්දෙව්, අසුරයන් ඉහළට නංවා, නැවත මුහුදෙහි දමා, සිවු දොරටුවෙහි තමා හා සමාන පිළිරූ මවා තැබීය. එවිට අසුරයෝ, 'සක් දෙව් පමා නොවී, නිසැකවම, නිති රැකවරණය සලසමින් සිටිතැ'යි සිතා නැවත (අසුරයන්ගේ) නගරයටම ගියහ. එවිට දෙවියෝ තමන්

වෙනුවෙන් ජය ගොස නඟමින්, පිළි හිස සිසාරමින් මහා වීදියෙහි නැකත් කෙළි කළහ. ඉක්බිති අසිත ඉසිවරයා අතීතයට සහ අනාගතයෙහි කප් සතළිහක් සිහි කිරීමට හැකි බැවින්, 'මොවුන් පෙරද මෙසේ කෙළිදෙළින් සිටියාහුදැ'යි මෙනෙහි කරමින්, ඒ දෙව්-අසුර සටනෙහිදී දෙවියන් ජයගත් බව දැන, **යදාපි ආසි අසුරෙහි සංගාමො ජයො සුරානං අසුරා පරාජිතා, තදාපි නෙතාදිසො ලොමහංසනො** යැයි කීය. ඒ කාලයෙහිද මෙබඳු ලොමුදැහැ ගැන්වෙන සතුටක් (ඊට පෙර) නොවීය. **කිමබ්භුතං දට්ඨු මරූ පමොදිතා** අද කිනම් පුදුම එළවන සුළු දෙයක් දැක මෙසේ දෙවියෝ සතුටු වූවාහුද?

දෙවන ගාථාවෙහි, **සෙලෙන්ති** මුවෙන් සතුට දනවන හඬ පිටකරත්. **ගායන්ති** නොයෙක් ආකාර ගීත, **වාදයන්ති** වාදන භාණ්ඩ සැටඅට දහසක්, **ඵොටෙන්ති** අත්පොළසන් දෙති. **පුච්ඡාමි වොහං** තමන්ට මෙනෙහිකොට දැනගත හැකි වුවත්, ඔවුන්ගේම වචනයෙන් දැනගනු කැමතිව අසයි. **මෙරු මුද්ධවාසිනො** සිනෙරු පව් මුදුනෙහි වසන, සිනෙරු පව්වෙහි යට තලයෙහි යොදුන් දසදහසක් වූ අසුර භවනත්, මැද තලයෙහි දෙදහසක් කුඩා දිවයින් පිරිවරා සිවු මහා දිවයින් ද, මතු තලයෙහි යොදුන් දස දහසක තව්තිසාව ද පිහිටියේය. එහෙයින් 'දෙවියන් මහමෙර මුදුනෙහි වසති'යි කියනු ලබති. **මාරිසා** දෙවියන්ට අමතති. නිදුක් නිරෝගී යැයි කියන ලදී.

ඉක්බිතිව තවුසාට ඒ කරුණ සැලකරන දෙවියන් විසින් කියන ලද තුන්වන ගාථාවෙහි **බොධිසත්තො** අවබෝධ කරන තැනැත්තා සම්මා සම්බුදුබවට සුදුසු තැනැත්තා ය. **රතනවරො** උතුම් රුවනක් වූ **තෙනම්හ තුට්ඨා** ඒ කරුණින් අපි සතුටු වෙමු. එතුමා බුදුබවට පත්ව, අනෙක් දේව සමූහයාටද, අපට ද මගපල හෝ රහත් බව ලබන ලෙසටද, දහම් දෙසන්නේය. දහම් අසා නිවන් ලැබීමට නොහැකි වුවහොත් මිනිස්සු දානාදී පින්කම් කොට දෙව්ලොව උපත ලබති. මේ ඔවුන්ගේ අදහසයි. **තුට්ඨා කල්‍යරූපා** මේ වචන දෙකෙහි අරුත පැහැදිලි වුවත්, 'දෙවියන් සතුටුවනු දැකීම කුමන පුදුමයක්ද? දේව සමූහයා (වෙනදා නැති) බොහෝ තුටු පහටු බවින් ඉන්නේ කුමක් නිසාද? මේ ගැටළු දෙක විසඳනු පිණිස කියන ලදැයි දතයුතුය. මීළඟට බෝසතුන් උපන්කල්හී සතුටු කරුණු පැහැදිලි කිරීමට කියන ලද සිවුවෙනි ගාථාවෙහි **සත්ත** යනුවෙන් දෙව් මිනිස් සමූහය සැළකේ. **පජා** යන්නෙන් වෙනත් පිරිස ගැනේ. මෙසේ

වචන දෙකෙන් (උපත් ලබන) ගති පහ අතුරින් උසස් බව දක්වයි. තිරිසන් සතුන් අතර සිංහ ආදීන් තැති නොගන්නා සේ, සෙසු සතුන්ද එසේ සැළකීමෙන් උනුන් (පජා) අතරද උසස් යැයි කියා ඇත. එහෙයින් ඒ වෙනත් පිරිස අතරද උසස් වේ යැයි කියන ලදී. දෙව් මිනිසුන් අතර, තමාට හිතසුව පිණිස පිලිපන්නා වූ පුද්ගලයන් හතර දෙනාගෙන් ඒ දෙකොටසටම හිතසුව සැලසීමෙන් මේ (බෝසත් තුමා) අගග පුගගලො, (ගවරැළෙහි නායක බවට පත්වන ගොනකු මෙන්) මිනිසුන් අතරද උසස් නායකයකු බවට පත්වෙයි. එහෙයින් බෝසත් අගයමින්, තුති කරමින් මෙම වචන දෙක කීහ.

පස්වන ගාථාවෙහි තං සද්දං ඒ දෙවියන් නගන ලද හඬයි. (ඇසෙන ලෙස කියන ලද වචනය) අවංසරි බැස්සේය. තද භවනං එකල්හි මැදුරට, හයවෙනි ගාථාවෙහි තතො අසිත ඉසිවරයාගේ වචනය අතරතුර උකකාමුඛෙව රන්කරුවාගේ කෝවෙහි තිබෙන සේ, සුකුසලසමපහටඨං නිපුණ රන්කරුවකු විසින් නිමවන ලද, මැනවින් කෝවෙහි රත්කොට සකස් කරන ලදැයි අදහස් වේ. දදදලලමානං බබළන, අසිතවහයසස අසිත නම් වූ, දෙවැනි නමින් හඳුන්වන කාලදෙවල ඉසිවරයාගේ, සත්වන ගාථාවෙහි තාරාසභංව තාරකාවලට නායක වූ, උසස් වූ, සඳ අදහස් වේ. විසුදධං වලාකුළු ආදී අවහිරයෙන් තොරව, සරදරිව සරත් කාලයේ මෙන්, ආනන්‍දජාතො ඇසූ පමණින්ම ඇතිවූ සතුටින් පිනා, අලතථ පීතිං දැක නැවත සතුට ලැබීය.

එයින් පසු, බෝසතුන්ට දෙවියන් විසින් හැමකල්හි පවත්වන ලද ගරු සත්කාර දැක්වීමට කියන ලද අටවන ගාථාවෙහි අනෙකසාඛං නොයෙක් ලෙස විහිදී ඉරටු වැනි කිරණ ඇති සහසස මණඩලං රත්රුවනින් සැදූ දහසක් මඩුළු (කොටස්) ඇති, ඡතතං දෙව්ලොව සුදු සේසතක්, වීතිපතනති උස් පහත් වෙමින් සිරුරට පවන් සලති. නවවන ගාථාවෙහි ජටී ජරා දරන හෙයින් ජටිල නම් වූ, කණහ සිරිවහයො 'කණහ' යැයිද 'සිරි'යැයිද කතා කරමින් - කිරි කණහ යැයි අසිත ඉසිට අමතති, හඬ ගසතියි කියන ලදී. පණඩුකමබලෙ රත්පැහැ කම්බිලියෙහි යැයි මෙහි සඳහන් කිරීමේදී 'කුමාරයා' යන අදහස ඇති ඉතිරි වචනයක් යොදාගත යුතුය. කලින් ගාථාවෙහිද අතින් අල්ලා ගැනීම යැයි දැක්වීමට 'දැක' යැයි කියන ලදී. මෙහිදී අතින් ගෙන ආ (වඩාගෙන ආ) කුමරුවා පිළිගන්නා ලෙස යොමු කිරීමේදී 'දිසවා' වචනය නැවත යෙදීම වරදක්

නොවේ. මුලින් දැකීම හෝ සතුට ලබන අදහසින් ගාථාව අවසානයෙහි 'බොහෝ සතුට ලැබුවෙමි' යනුවෙන් හෝ, කුමරුන් පිළිගෙන අවසානයෙහි 'සතුටින් පිළිගත්තේය' යන වචනයෙන් මුලින් කී කුමරු යන වචනයට සම්බන්ධ වේමය. සියදහස් ගණනින් වටිනා ගන්ධාර දෙසයෙහි රත් කම්බිලියක තබන ලද රත්රන් පිඩක් බඳු වූ කුමාරයාට 'ඡත්තං මරූ' (දෙවියන් සේසතක්) යනුවෙන් එහි කියන ලද පරිදි, මුදුනට සුදු සේසතක් දරා සිටිනු දැක, යනුවෙන් මෙසේ කුමරුට - සුදු සේසතද සම්බන්ධ වේ. ඇතැමෙක් එය මිනිසුන් දරණ සේසතක් සේ කියති. එසේ දෙවියන් මෙන්ම, මිනිස්සුද කුඩ, සෙමර, මොණර පිලෙන් සැදූ වටාපත්, තල් වටාපත්, වල්විදූනා අතින් දරමින් මහබෝසතුන් කරා එළඹෙති. මෙසේ සඳහන් කළවිටද ඒ වචනයෙන් (කුමරු ගැන) වැඩියෙන් කරුණු දැක්වීමක් නැත. එහෙයින් කියා ඇති ආකාරයම සුදුසුය. **පටිගගහෙ** මේ අයුරින් දැතින්ම පිළිගත්තේය. ඉසිවරයාට වැන්දවීමට කුමාරයා යොමුකළවිට, කුමරුගේ දෙපා හැරවී ඉසිවරයාගේ හිසමුදුනෙහි පිහිටියේය. අසිත ඉසිවරයා ඒ අසිරිය ද දැක **උදගග චිතෙතා සුමනො** (එසේ) පිළිගත්තේය. දසවන ගාථාවෙහි, **ජිංගිසකො** බලාපොරොත්තු වෙමින්, සොයමින්, විමසමින් යැයි කියන ලදී. **ලකඛණමනතපාරගූ** අසිත ඉසිවරයා මහපුරිස් ලකුණු ගැනද වේදයෙහිද පරතෙරටම ගියේය. **අනුතතරායං** මේ අසිත ඉසි උතුම් කෙනෙකි. තමාගේ ඉදිරියට ආ මහබෝසතුන්ගේ දෙපතුලෙහි සක්ලකුණු දැක, ඒ අනුව ඉතිරි ලකුණු ද විමසමින්, සියළුම මහ පුරිස් ලකුණු හඳුනාගෙන 'නිසැකවම මොහු බුදු වන්නේ' යැයි දැන මෙසේ කීය.

එකොළොස්වන ගාථාවෙහි **අථතතනො ගමනං** ඊළඟ උපත ලෙස අරූප බ්‍රහ්ම තලය බව දැන, **අකල්‍යරූපො ගලයති** ඔහු තම අරූප බඹලොව උපත සිහිකොට 'මම දැන් මෙතුමාගේ දහම් දේසනය අසන්නට නොලබමි'යි අසතුටුව බලවත් සොවින් දුකට පත්ව කඳුළු හෙළයි. වගුරුවයි. ගරයති යනුද වචනයක් වේ. යම්ලෙසකින් රූපාවචර ලොව සිත යොමු වූයේ නම්, එහි උපත නොලබන්නේ කුමක් නිසාද? මෙසේ හඬන්නේ ඇයි? උපත නොලබන්නේ නම්, ඊට හේතු දැනගැනීමට නොහැකි වේද? කරුණු මෙසේනම් ඊළඟ උපත ඔහුට දුකක් වේනම් අසාධාරණය. සමාපත්ති ලැබූවෙකුට එය යටපත් කළහැකි නොවේදැ'යි, මෙසේ කරුණු දැක්විය හැකිය. යටපත් කිරීමෙන් පමණක් නොවේ. මගපල ලැබීමෙන්ද නැතිකරන ලද කෙලෙස් නූපදිති. සමවත් ලැබූවන්ට බලවත් හේතු මත

කෙලෙස් හටගනී. කෙලෙස් හටගත්විට, දැහැන පිරිහුනු බැවින්, කෙසේ අරූප තලයෙහි කෙසේ උපත වේදැ'යි මතුකළ හැකිය. නොබෝ කලකින්ම නැවත දැහැන උපදවා ගන්නේය. සමවත් ලද තැනැත්තෙකුට, කෙලෙස් ඇතිවූ විට, එය ඉක්මවීමට තරම් බලවත් නොවන බැවින්ද, 'මෙය පිරිහීමක් දැයි දැනගත නොහැකි බැවින් ද ඒ වෙසෙස් බව යළි පහසුවෙන්ම ලැබ ගනී. අසිත ද එබඳු කෙනෙකි. **නො චෙ කුමාරො භවිසසති අනතරායො** මේ කුමරුන්ට අනතුරක් වේවි ද එයින් අදහස් වේ.

දොළොස්වන ගාථාවෙහි **න ධරකායං** මේ (කුමාරයා) ලාමක වූ, සුළුකොට තැකිය හැකි තැනැත්තෙකු නොවේ. ඉදිරි ගාථාවෙන් සඳහන් කළයුතු බුදුබව සඳහා එසේ කීය දහතුන්වෙනි ගාථාවෙහි **සමෙබාධියගගං** සියල්ල දන්නා නුවණයි. කිසිදු අඩුපාඩුවක් නැතිව, මනා සේ අවබෝධ කරගන්නා ලද, කිසියම් තැනකදී පැහැදිලි කොටගත යුතු කිසිදු දෙයක් නොවළහා, පිරිසිඳ දත් හෙයින්, සියළු නුවණින්ම එය උසස් යැයි කියනු ලැබේ. **වුසිසසති** පැමිණෙන්නේය. **පරම විසුදධදසසී** නිවන දකින, එය නිසැකවම මනාව දත් බැවින් පරම පිවිතුරුය. **විත්‍ථාරිකසස** පතළ වූයේය. **බ්‍රහමචරියං** සසුන, **අඵනතරා** අනතුරු දහහතරක්, ඒවා සම්බුදුබවට පත්වූ තැන් පටන් වළක්වන ලදැයි කියන ලදී. **න සොසසං** ඇසීමට නොලබමි. **අසමධුරසස** සමකළ නොහැකි උත්සාහ ඇති, අටෙටා පෙළී, ව්‍යසනගතො සැපය වනසා ගත්, **ආසාවී** දුකට පත්ව, සියළුම දුක් දොම්නස් සඳහා එසේ කීය. ඔහු දොම්නසින් පීඩා විඳියි. එයින් ඔහුගේ සුවය වැනසුණි. එයින් ඔහු දුක් සිතිවිල්ලෙන් සිටී. පහළොස්වන ගාථාවෙහි **විපුල ජනෙත්වා** සතුට දනවා, **නිරගමා** නික්ම ගියේය. එසේ නික්මගිය ඔහු, **භාගිනෙය්‍යං සයං** තමාගේ බෑණනුවන්ට, තම සොහොයුරියගේ පුතාට, **සමාදපෙස** තමා සුළු කාලයක් ජීවත්වන බව දැන, කණිටු සොහොයුරියගේ පුත් නාලක නම් තරුණයා පින් රැස්කොට ඇති බව තම බලයෙන් දැන, (ඔහු) වැඩිවියට පත්වීමේදී පමාවනු ඇතැ'යි ඔහුට **අනුකමපමානො**, සොහොයුරියගේ ගෙට ගොස්, 'නාලක කොහිදැ'යි (අසා) 'හිමියනි, පිටත කෙළිලොල්ව ගතකරයි' (කී විට) 'ඔහු කැඳවා එව'යි ගෙන්වා ගෙන, අණ දී, එකෙණෙහිම තවුස් පැවිද්දෙන් පැවිදි කරවා, වත් පිළිවෙත්හි සමාදන් කරවීය, අවවාද කළේය, කෙසේද? **බුදෙධාති සොසං -පෙ- බ්‍රහමචරියං** යනුවෙනි.

එහි **යද පරතො** යම් දවසක වෙනත් කෙනෙකුගෙන්, **ධමමගගං**

නියම දහමෙහි නිවණට මඟ, දහම හෝ අගගං පිළිසිඹියා සමග නිවන, තසමිං ඔහුගේ (ඒ උතුම් තැනැත්තාගේ) සමීපයෙහි, බ්‍රහමචරියං මහණදම්, දහහත්වන ගාථාවෙහි තාදිනා මනාව සිත පිහිටියා වූ, එවිට කෙලෙස් යටපත් කිරීමෙහි සමාධිය ලැබීමද ඇති කල, කෙලෙස් යටපත්ව, සිත සන්සුන් වේ යැයි අදහසය. අනාගතෙ පරමවිසුද්ධදසසිනා මේ නාලක අනාගතයෙහි භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පරම පිවිතුරු වූ නිවන දකින්නේ යැයි සනිටුහන් කළ ඒ අසිත ඉසිවරයා මේ ආකාරයෙන් අනාගතයෙහි පරම පිවිතුරු බව දැක්කේ යැයි කියන ලදී. එයින් ඔහුද අනාගතයෙහි ඒ උතුම් පිවිතුරු බව දකින්නේය. උපචිත පුඤ්ඤ සඤ්චයො පියුමතුරා බුදුරජාණන් වහන්සේගේ කාලයේ පටන් කරන ලද පින් රැස් කිරීම්, පතිකඛං බලාපොරොත්තුවෙන්, පරිවසී පැවිදිව තවුස් වෙසින් විසීය. රකඛිතින්‍ද්‍රියො සවන් නම් වූ ඉන්ද්‍රිය රැකගෙන, 'වතුරට පිවිස, කන නමැති ඉන්ද්‍රිය වැනසුනහොත්, දහම් ඇසීමට නොලැබේ' යැයි සිතා, එතැන් පටන් දියෙහි ගිලුනේ නැත.

දහඅටවන ගාථාවෙහි සුත්වාන ඝොසං - ඒ නාලක තවුසා මෙසේ වාසය කරන අතර, අනුපිළිවෙලින් සම්බුදු බවට පත් භාග්‍යවතුන් වහන්සේ, බරණැස දී දම්සක් පැවැත්වූ කල, 'භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් සක පවත්වන ලදී. නිසැකවම භගවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ (ලොව) පහළ වූහ'යි ආදී ලෙසින් ජිනවරචකක වතතනෙ තමන්ට හිතසුව කැමති දේවතාවුන් පැමිණ සැලකරන ලද කරුණු අසා, ගනත්වාන දිසවා ඉසිනිසභං දේවතාවුන් විසින් සත්දවසක් මොනෙය්‍ය කෝලාහලය පවත්වනු ලබද්දී, සත්වන දිනයෙහි ඉසිපතනයට ගොස් 'නාලක (මෙහි) පැමිණෙන්නේය. ඔහුට දහම් දෙසන්නෙමි'යි මෙසේ සුදුසු පරිදි සළකා උතුම් බුදු අස්නෙහි වැඩසිටි ඉසිවරුන් අතර ද උසස්තම වූ භගවත් හිමි දැක, පසනෙනා දකිනවිටම පහන් සිතින් යුතුව, මොනෙය්‍ය සෙට්ඨං උතුම් නුවණ, සිවුසස් දැනීමේ මග-නුවණ යැයි කියන ලදී. සමාගතෙ අසිතවහයසස සාසනෙ අසිත ඉසිවරයාගේ අවවාදය අනුව කටයුතු කිරීමට කාලය පැමිණි කල්හි, අසිත ඉසිවරයා විසින් 'දහම් මග හෙළිදරව් වන කාලයේදී, එහි ගොස්, ඒ ගැන විමසා, භාග්‍යවතුන් වහන්සේ උදෙසා බඹසර හැසිරෙව'යි (නාලකට) අවවාද කරන ලදී. මේ එයට කාලයයි. එහෙයින්, අසිත ඉසිවරයාගේ දැනුම් දීම අනුව පිළිපැදිය යුතු කල් පැමිණියේ යැයි කියන ලදී. ඉතිරි කරුණු පැහැදිලිය. මීළඟට විමසනු ලබන කරුණට අදාල ගාථා පදවල අරුත් විවරණයි.

කරුණු විමසන ලද්දේ ගාථා දෙකකිනි. **අඤ්ඤාතමෙතං** මා එය දැනගන්නා ලදී. **යථාතථං** නොවෙනස්ව, එහි අදහස කුමක්ද? අසිත ඉසිවරයා 'මේ කුමරු උතුම් සම්බුදුබව ලබන්නේ'යැයි දැන, 'බුද්ධ' යන හඬ වෙනත් කෙනෙකුගෙන් යම්දිනක අසහිද, (එවිට) සම්බුදුවරයාණන් වෙත පැමිණ, දහම් මග හැසිරෙන්න' යැයි මට කී අයුරු පිළිපැදීමට කාලයයි. **අසිතසස වචනං** 'මා ඒ වචනයට අනුව පැමිණ ඇත. අද භාග්‍යවතුන් වහන්සේ ඇස් පනාපිටම දැක, පැමිණිය යුතු තැනට ආවෙමි'යි දැනගතිමි. **තං තං** එහෙයින් එය, **සබබධමමාන පාරගුං** හේමවත සූත්‍රයෙහි කියන ලද පරිදි සය ආකාරයෙන් සියළු දෙයින්ම පරතෙරට ගිය, **අනගාරියුපෙතසස** ගිහිගෙයින් නික්මුණු තැනැත්තකුට, පැවිදි වූවෙකුට යන තේරුමයි. **භිකඛාචරියං ජිගිංසතො** බුදුවරුන් ආදී උතුමන් විසින් පුරුදු කරන ලද නොකිලිටි පිණ්ඩපාතයෙහි යෙදෙන පැවිද්දාට, **මොනෙය්‍ය** මුනිවරයන්ට අයත්, **උතතම පදං** උතුම් පිළිවෙත ඉතිරි වචන අරුත් පැහැදිලිය.

නාලක තවුසා විසින් විචාරන ලද පරිදි භාග්‍යවතුන් වහන්සේ මොනෙය්‍යං තෙ උපඤ්ඤිසසං ආදී ලෙසින් මුනිවරයකුගේ පිළිවෙත පැහැදිලි කළහ. **උපඤ්ඤිසසං** අනුදැන කියමි. විවරණය කරමි. පණවමි යන තේරුමයි. **දුකකරං දුරභි සමභවං** කිරීමට ද අපහසු, දුක් ගෙනදෙන, අනුගමනය කිරීමේදී (එහි යෙදෙනවිට ද) දුක් ලැබෙන, ඒ දුක ඉවසා දරා ගැනීමද දුක බව කියන ලදී. එසේ කීමෙහි අදහස මෙයයි. 'මම ඔබට මුනි පිළිවෙත පණවන්නෙම් නම්, එය පිළිපැදීමේදී හෝ මනාව එහි යෙදීමෙන් යහපතක් වන්නේය. එසේම එය අපහසුය. මගපල නොලද තැන සිටම කෙලෙස් සිතක් උපදවා නොගනිමින්, පිළිපැදිය යුතුවේමය. එසේ නාලක එක බුදුවරයකුගේ එක් සව්වෙකු බවට පත් කරයි. එම පිළිවෙතෙහි යොමු කරයි. භාග්‍යවතුන් වහන්සේ මුනි පිළිවෙතෙහි අපහසුතාව හා පහසුවෙන් ළංවිය නොහැකි බව පෙන්වා දෙමින්, නාලක තවුසා උත්සාහවත් කොට, 'හන්‍ද තෙ නං පවකඛාමි සත්‍ථමහසසු දළෙහා භව යැයි වදාළහ. **හන්‍ද** යම් දෙයකට යෙදවීමෙහි, යම් දෙයකට පොළඹවීමෙහි අරුත් ඇති නිපාතයකි. **තෙ නං පවකඛාමි** ඔබට ඒ මුනිවරයාගේ පිළිවෙත පවසමි. **සත්‍ථමහසසු** එවැනි අපහසු දේ කිරීමට හැකිවීමෙන්ද, උත්සාහ ඇතිකර ගැනීමෙන් ද තමන්ට උපකාර කරගනුව. **දළෙහා භව** ලඟාකර ගැනීමට පහසු නොවන හෙයින්, ඒ සඳහා ඉවසීමෙන් යුතුව, ලිහිල් නොවූ, දැඩි උත්සාහයෙන් නොවෙනස්ව කටයුතු කරව.

එයින් කුමක් කීවේද? ඔබ පෙර රැස්කරන ලද පින් ඇත්තෙකි. අපහසු වූ, පහසුවෙන් ලද නොහැකි ඒ මුනි පිළිවෙත ඔබට මෙසේ පවසමි. එහෙයින් නිසැකවම එහි යෙදෙමින් උත්සාහ වඩව.

මෙසේ කෙලෙස් දුරුවන, උතුම් මුනි පිළිවෙත පහදා දෙනු කැමතිව, නාලක තවුසා උත්සාහවත් කොට, දැඩි ලෙස එහි යොදවීමට මුලදීම ගම (හෙවත් තමන් හා සමාජය) හා බැඳුණුවිට ඇතිවන කෙලෙස් නැතිකිරීම ගැන **සමානභාගං** යන ගාථා දෙපදය කීහ. **සමානභාගං** සම කොටස, එක හා සමාන, කරුණු වෙනස් නොවන, **අක්කුට්ඨ වන්දිතං** නින්දා අපහාසද, වැඳීමද, දැන් එය සමානව සළකා ගතයුතු බව දක්වයි. එයට සුදුසු වන පරිදි මනොපදොසං ආදී ගාථා දෙපදය කීහ. එහි අරුත නම්, කෝප නොවී **මනොපදොසං රක්ඛෙය්‍ය**, වැඳුම් ලබද්දී, **සන්තො අනුන්නතො චරෙ** රජු විසින් වඳිනු ලබන විටද, 'මට රජතුමාද වඳී'යයි උඩඟු නො වන්නේ ය. මීළඟට වනයෙහි විසීමේදී හටගැනෙන කෙලෙස් නැතිකිරීම දක්වමින් උච්චාවචා යන ගාථාව කීහ. එහි අරුතනම්, කැලෑව ලෙස හඳුන්වන තැන්හි දාසෙපි ඉටු අනිටු ලෙසින් නොයෙක් ආකාර අරමුණු, **නිච්ඡරන්ති** ඇස් ආදී ඉඳුරන් හමුවට පැමිණෙති. ඒවා **අග්ගිසිඛූපමා** දැවීම ඇතිකරන අයුරින්, කැලෑව දවනු ලබන ගිනිදළු නොයෙක් අයුරින්, උස් පහත් ලෙසද දුම් සහිතවද, දුම් රහිතවද, නිල්, කහ, රත් පැහැයෙන්ද සුළුවෙන්ද, මහත්වද නැගේ. මෙසේම සිංහ, වග, මිනිස් හඬ හා නොයෙක් කුරුළු නාද, මල්, පල, දළු ආදී නොයෙක් ආකාරයෙන් බියජනක ලෙසින්ද ඇළුම් කරන ලෙසින් ද, කෝපය ඇතිවන අයුරින් හා මුළාවන අයුරින්ද අරමුණු හමුවෙයි. එහෙයින් වනයෙහි ඇතිවන ලැව්ගිනි සිළුවෙහි නොයෙක් අරමුණු ඇතිවේයැයි කීහ. මෙසේ නොයෙක් ආකාර අරමුණු හමුවනවිට, වනසිරි දැකීමට පැමිණි හෝ, එහි වෙසෙන වනලියන් හෝ, දර කඩාගෙන යන ලියන් හෝ, තනිව හිඳිනු දැක, සිනාවෙන්, කතාවෙන් හඬක් නැගීමෙන්, ඇඳුම් විවරකොට දැක්වීම් ආදියෙන් **නාරියො මුනිං පලොභෙන්ති** ඒ කාන්තාවෝ මට පෙළඹවීම් හෝ ආසා පහළ කිරීමක් හෝ නොකරත්වා! එසේ පෙළඹීම් ඇති නොවන ලෙසට කටයුතු කරව. **තාසුතංමා පලොභයුං** යැයි කීහ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගමෙහි ද, කැලෑවෙහි ද පිලිවෙත් විධි නාලක තවුසාට සඳහන් කොට, මීළඟට සීල සංවරය ගැන විරතො මෙථුනා ධම්මාති ආදී ලෙසින් ගාථා දෙකක් වදාළහ. **හිත්වා කාමෙ**

පරොවරෙ ලිංගික කායික සබඳතා මෙන්ම, අනෙක් සොඳුරු වූත්, අයහපත් වූත් පස්කම් හැරදමා, එසේ ඒවායින් ඈත්වීමෙන්ම මෛථුන්දමින්ද ඉවත් වූයේ ද වේ. එහෙයින් කාම සේවනය හැරදමා යනුවෙන් කීහ. තරහ නොමැති බව යැයි කියා ඇති පරිදි 'නො නසන්නේ ය, නො මරන්නේ ය' මෙහි සඳහන් වීමේදී, පණ ඇති ජීවීන් නැසීමෙන් වැළකීමේ වැදගත්, උතුම් බව පැහැදිලි වේ. මේ එහි කෙටි විස්තරයයි. බාහිර වූ අනෙක් ජීවීන් කෙරෙහි පාණෙසු, අවිරුදෙධා, අසාරතෙතා ආසා ඇති සියල්ලන් කෙරෙහිම තණ්හා ආසා හැරදමා, තසථාවරෙ 'මා මෙන්ම අනෙක් සියලු ජීවීහු, ජීවත්වනු කැමතිවූද, නොමැරෙනු කැමති වූද, සැපයට කැමති වූද දුක පිළිකුල් කරන්නාහ. මෙසේ තමා හා සමානකොට ඔවුන් කෙරෙහි තරහක නොසිතා, ඒ ආකාරයෙන් යථා එතෙ තථා අහං අනුන් හා සමානකොට, තමා කෙරෙහිද තරහ අවහිරතා වළක්වමින්, දෙකොටසටම විරෝධතා අවහිර නැතිව, මරණය නොකැමතිව අතතානං උපමං කත්වා තැතිගන්නා සුළු හෝ තැති නොගන්නා වූ සියළුම ජීවීන් න හනෙය්‍ය අත්වලින් ආදී ලෙස (දඬුමුගුරු ආදිය ගෙන) න ඝාතයෙ අණදීමකින් හෝ නො කරන්නේ ය.

මෙසේ කායික-ලිංගික සබඳතා හා පරපණ නැසීමෙන් වෙන්වීම ගැනද, පාමොක් සීලය ගැනද නාලක තවුසාට කෙටියෙන් දක්වා, 'හිත්වා කාමෙ' ලෙසින් ඉඳුරන් සංවරයද පෙන්වා, මීළඟට පිරිසිදු දිවිපැවැත්ම විස්තර කිරීමට හිත්වා ඉච්ඡඤ්ච යන ගාථාව කීහ. එහි අරුත මෙයයි. 'මේ තණ්හාව වූ කලී එක් දෙයක් ලැබුණුවිට දෙකක් ලැබීමට කැමති බව ඇතිකරයි. දෙකක් ලැබුණවිට තුනක් ද, සියදහසක් ලැබී, ඊටත් වැඩියෙන් ලබාගැනීමේ කැමැත්තයි. මෙසේ නොලැබෙන දෙයෙහි කැමතිවීම ඉච්ඡා යැයි කියනු ලැබේ. එසේ ලැබුන දෙයෙහි, දැඩිව මසුරුව ඇළුම් කෙරේද, ඒ ලෝභයයි. හිත්වා ඉච්ඡඤ්ච ලොභඤ්ච, යත්‍ථ සතෙතා පුථුජ්ජනො සිවුරු ආදී සිවුපසයෙහි කෙලෙස් දුරුනොකළ තැනැත්තෙක්, එහි කැමැත්තෙන් හා ආසාවෙන් ඇලී ගැලී, ඒ හා බැඳී සිටියද ඒ ආසාව හා ලෝභය අත්හැර, සිවුපසය සඳහා යහපත් හැසිරීම් පිළිවෙත් පිළිපදිමින්, වෙනස් නොවෙමින්, නුවණ නැමති ඇසින් චක්ඛුමා යුතුව මෙම මොනෙය්‍ය පිළිවෙත පටිපජ්ජෙය්‍ය මෙසේ පිළිපදින තැනැත්තා තරෙය්‍ය නරකං ඉමං දුසිරිත පිරෙන බැවින් නරක යැයි හඳුනාගෙන ඇති වැරදි දිවි පෙවෙතට හේතුවන තණ්හාව ඉවත් කරන්නේ නම්, එසේ කළයුත්තේ මේ පිළිවෙතින් බව කියන ලදී. මෙසේ සිවුපසයෙහි තණ්හාව නැති

කිරීමෙන්, පිරිසිදු හැසිරීම් රටාව පෙන්වා දී ආහාරයෙහි පමණ දැන හික්මීමට ද ඒ අනුසාරයෙන් අරහත් පලය දක්වා වූ පිළිවෙත ඌනූදරො යන ගාථාවෙන් පැහැදිළි කළහ. එහි අරුත නම්, දැහැමෙන් සෙමෙන් ලද සිවුරු ආදී කිසියම් සිවුපසය අතුරෙන් ආහාරය ගැනීමේදී

**චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ**
**අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො**

'බත්පිඩු සතරක් පහක් නොවළඳ වතුර බොව, එය (නිවන සඳහා) බවුන් වඩන පැවිද්දකුගේ පහසු විහරණයට හේතුවේ' යනුවෙන් කියා ඇති පරිදි **ඌන උදරො** වේ. සුළං පිරුණු මයිනහමක් මෙන් (ආහාර ගැනීමෙන්) පිපුණු උදරයෙන් නොසිටිය යුතුය. වැඩියෙන් බත් කෑමෙන් ඇතිවන මත සිතේ මැලි බවට හේතු වේ. කුසට අඩුවෙන් ආහාර ගත්තද, **මිතාහාරො** කෑමෙහි තම පමණ දතයුතුය. 'කෙළි පිණිස නොවේ' ආදී මෙනෙහි කිරීමේ විමසුම් ගුණයෙන් යුතුව ආහාරය ගතයුතුය. මෙසේ ආහාරයෙහි පමණ දැනීම මෙන්ම, සිවුපසය, ධුතංග, පරියත්ති, අධිගම යනුවෙන් ලද පමණින් සෑහීමට පත්වීමෙන් **අප්පිච්ඡො අස්ස** මොනෙය්‍ය පිළිවෙත පිලිපදින මහණුන් විසින් මෙසේ ලද දෙයින් සෑහීමට පත්විය යුතුය.

සිවුපසයෙහි එක් එක් දෙයක් ලැබීමේදී ද ලද පමණින් තුන් ආකාරයෙන් සෑහීමට පත්විය යුතු (එය පච්චය අප්පිච්ඡතා වේ.) ධුතංග පිළිපදින්නේ නම්, 'මා ධුතවාදී යැයි අනුන් දැනගනිත්වා'යි නොකැමති වීම ධුතංග පිළිබඳ සෑහීමට පත්වීමයි. 'මා බොහෝ ඇසූ පිරූ තැන් ඇතැයි' අනුන් දැනගැනීමට කැමති නොවී, දහම් දැනුමෙහි මජ්ඣන්තික තෙරුන් සේ සෑහීමට පත්විය යුතුය. සිතෙහි කිසියම් උසස් බවක් ලැබීමෙන්, 'මේ යහපත් දහම මා කෙරෙහි ඇතැයි අනුන් දැනගනිත්වා'යි කැමති නොවීම අධිගමයෙහි සෑහීමට පත්වීමයි. එය අරහත් පල ලැබීමෙන් පසුවද ඇත් නොවේ යයි දතයුතුය. මෙය අරහත් පල ලබාගැනීමේ පිළිවෙත හෙයිනි. මෙසේ සැහැල්ලු දිවි පැවැත්මද ඇතිව අරහත් පල මගින් තණ්හා ගිජුබව හැරදමා ඒ ආසා අත්හරියි. **ස වෙ ඉච්ඡාය නිච්ඡාතො අනිච්ඡො හොති නිබ්බුතො** සා පිපාසාවෙන් පෙළෙන ජීවීන් සේ, යම් දෙයකට කැමැත්තක් ඇතිවීනම්, ඒ කැමැත්තෙහි සෑහීමට පත්වීමක් නැති. ඒවායෙහි කැමැත්ත (සංසිඳෙනා) කැමැත්තක් නොවේ. ඒ

නොසංසිඳෙනා කැමැත්ත ද නැතිකරන ලද බැවින්, (කායික-මානසික) පීඩාවකට නොපැමිණ, පරම සැහීමට පත්ව, කෙලෙස් දැවිලි සමනය කිරීමෙන් සැනසුනේය. නිවුණේය. මෙසේ විමසීමෙන් මෙහි තේරුම් දතයුතුය.

මෙසේ අරහත් පලයට පත්වීම තෙක් පිළිවෙත මග පවසා දැන් එය පිළිපදිනා මහණුන්ගේ අවසන් පලය වූ අරහත් බවට පත්වීමත්, ධුතංග සමාදානයත් හා සෙනසුන් වත් ද සපිණ්ඩාරං යන ගාථා දෙකකින් කීහ. **ස පිණ්ඩචාරං චරිත්වා** ඒ මහණ පිඬු පිණිස හැසිර, බත් කිස හෝ කොට, **වනන්තමභිහාරයෙ** ගිහි ජීවිතයේ කෙලෙස් බැඳීම්වලින් පමානොවී, කැලයටම යන්නේ ය. **උපට්ඨිතො රුක්ඛමූලස්මිං** රුක්මුල්හි සිටීමෙන් හෝ, **ආසනූපගතො** අසුනක හිඳ හෝ, මුනි මොනෙය්‍ය පිළිවෙත පිළිපදින, මෙහි පිඬු පිණිස හැසිරේ යැයි සඳහන් කිරීමෙන් (ධුතංග අතර) පිණ්ඩපාතිකංගය ගැන කියන ලදී. (ගෙපිළිවෙලින් ඉතා මැනවින් පිඬු පිණිස හැසිර, එක් අසුනෙහිම හිඳ, පාත්‍රයෙහිම වළඳමින්, ඒකාන්තයෙන් දෙවරක් පිඬු පිණිස නොයා සිටීමෙන්, තුන් සිවුරු දැරීම හා කසලගොඩක් වැනි තැනකින් සපයාගත් රෙදිවලින් සකස් කරගත් සිවුරක් දැරීමද සමාදන් වන ලද්දේමය. ඒ අනුව ධුතංග සයක් දැක්වේ. වනයෙහිම ගතකිරීම ගැන සඳහන් කිරීමෙන් ආරඤ්ඤකංගය දැක්වේ. ගසක් මුල සිටීමෙන් රුක්ඛමූලිකංගය ද, හිඳගැනීමේ ආසනය සඳහන් කිරීමෙන් නෙසජ්ජිකංගයද - ඒවා පිළිපැදීම අනුව එළිමහනෙහි විසීම, ඇතිරිලි පරිහරණය හා සොහොනෙහි විසීමද යනුවෙන් ධුතාංග දහතුනම, මෙම ගාථාවෙන් නාලක හිමිට වදාළහ.

**ස ඣාන පසුතො ධීරො** ඒ පිළිවෙත් පුරන පැවිද්දා ලබානොගත් දැහැන් උපදවා ගැනීමෙන් ද, උපදවා ගත් දැහැන් මෙනෙහි කිරීමෙන්, එහි අදිටනින්, එයින් නැගී සිටීමෙන් හා නුවණින් සිහි කිරීමෙන් යුතුව කල්යවයි. **ධීරො** නුවණින් යුතු, **වනන්තෙ රමිතො සියා** කැලයෙහි විසීමට කැමති වෙයි. ගම කෙළවර ඇති සෙනසුන්වල ඇලීමක් නැතැයි කියන ලදී. **ඣායෙථ රුක්ඛමූලස්මිං අත්තානමභිතොසයං** හුදෙක් මෙලොව ජීවිතයට අයත් දැහැන් ලැබීමට පමණක් යොමු නොවේ. එහෙයින්, ඒ සිටින රුක්මුල්හිදීම සෝවාන් ආදී ලොවුතුරු දැහැන්වලින්ද තමන් බොහෝ සතුටුව දැහැන් නතු වෙයි. උතුම් සැනසුමට පත්ව, වෙනත් දැහැනින් නොව, ලොවුතුරු දැහැනින්ම සිත බොහෝ සතුටු වෙයි. එහෙයින් අත්තානමභිතොසයං යැයි කියන ලදී. මෙසේ මේ ගාථාවෙන්

දැහැන් වඩමින්, වනගත සෙනසුන්හි ඇලීමත්, අරහත් බවත් කියා ඇත.

මෙම දහම් දෙසුම ඇසූ නාලක හිමි, වනයෙහිම ඇළුම්කොට, යම්ලෙසකින් ආහාර නොගෙනම, පිළිවෙත් පිරීමෙහි බොහෝ උත්සාහවත් වුවහොත් නිරාහාරව මහණදම් පිරිය නොහැකිය. එවිට ජීවිතය නොපවතී. කෙලෙස් හටනොගන්නා ලෙසට ආහාර සොයාගත යුතුය. මෙය තිසි, දැනගතයුතු දෙයයි. එහෙයින් දිනපතා පිඬු පිණිස හැසිරිය යුතුයි. කෙලෙස් නොඉපිදවිය යුතුයැයි නාලක හිමිට පහදා දීමටත්, අරහත් පලය අවසන් (ඉලක්කය) කොට දැක්වීමටත්, ආහාර වත් අනුව, තතො රත්‍යා විවසනෙ ආදී ගාථා හයක් දෙසූහ. **තතො** 'පිඬු පිණිස හැසිර, වනයෙහිම ඇළුම් කරයි' යනුවෙන් කී කරුණුවලට අමතරවද විස්තර දැක්වේ. **රත්‍යා විවසනෙ** රැය ඉකුත්ව, ඊළඟ දවස ගැන කියන ලදී. **ගාමන්තමභිහාරයෙ** උසස් හැසිරීමට අයත්, වත් ඉටුකොට, පිඬු පිණිස වේලාව තෙක් විවේකීව සිට ගතපච්චාගත වත අනුව කී අයුරු කමටහන් මෙනෙහි කරමින්, ගමට යන්නේය. **අව්හානං නාභිනන්‍දෙය්‍ය** හිමියනි, අපගේ නිවසෙහි වැළඳිය යුතු'යැයි ඇරයුම් කරයිද, 'ආහාර දෙයිද, නොදෙයිද, මැනවින් සකසා දෙයිද, මනාසේ නොදෙයිද' මෙබඳු දෙගිඩියා සිතිවිලි නැතිව ආහාරයෙහි පිළිවෙත් පුරන්නා වූ පැවිද්දා එහි නො ඇලෙන්නේ ය. නො පිළිගන්නේ යැයිද කියන ලදී. යම්සේ බලහත්කාරයෙන් පාත්‍රය ගෙන පුරවා දෙත් ද, එය වළඳ මහණදම් කළ යුතුය. ධුතංග නොබිඳෙයි. එය නිමිතිකොට ඒ ගමට නොපිවිසිය යුතුය. **අභිහාරඤ්ච ගාමතො** ඉදින් ගමට පිවිසිවිට, පාත්‍ර සියයකිනුදු බත් ගෙනෙත්ද, එහි නොඇලී, එක බත්හුලකුදු නො පිළිගන්නේ ය. ගෙපිළිවෙලින් පිණ්ඩපාතයෙහිම හැසිරෙන්නේ ය. **න මුනි ගාමමාගම්ම කුලෙසු සහසා චරෙ** ඒ මුනි පිළිවෙතට පිළිපන් මුනිවරයා ගමට ගොස් ඉක්මණින් ගෙවල්වල නොහැසිරෙන්නේය. එක්ව සෝකවීම වැනි ගිහියන් හා නුසුදුසු සබඳතාවනට නොපැමිණිය යුතු බවද කියන ලදී.

**සාසෙසනං ජිනනකථො න වාචං පයුතං භණෙ** ආහාරය ලබාගැනීම වෙනුවෙන් ඉඟි කිරීමක් හෝ දැනවීමක්, හැඟවීමක් ඇතිවන පරිදි කුහුල දනවන විසිතුරු කතා නො කියන්නේ ය. ගිලන්ව සිටියදී, කැමති නම්, ගිලන් බව වළකා ගැනීම අදහසින් ඒ ගැන කිවහැකි වුවද සෙනසුන් පිණිස හෝ එයින් ඇඟවීමක් නොවන ලෙසට (සැළකිලිමත් විය යුතුය.)

වෙනත් දෙයක් ලබාගැනීමට ගිලන් නොවූවකු විසින් කිසිවක් නොපැවසිය යුතුය. අහරක් නොලැබුණද, එයද කම්නැතැයි (මැනවැයි) සැළකීම මේ ගාථාවේ අදහසයි. පිඬු පිණිස යම් දෙයක් සුළු ලෙසින් ලැබුණද **අලත්‍ථං යං ඉදං සාධු** යැයි සිතා, නොලැබුණත්, 'මම කිසිත් නොලැබීම්, එයත් යහපතැයි සළකා ලැබීම්, නොලැබීම් දෙකෙහිම, **සො** සමානව, කම්පා නොවී සිටිය යුතුයි. **රුක්ඛං ච උපනිවත්තති** (පලතුරු වැනි) පල සොයා යන මිනිසෙක් ගසක් ලඟට ගොස්, එහි ගෙඩි ලැබුණද - නොලැබුණද, කම්පා නොවී, මැදහත් සිතින් යයිද, එසේම (පැවිද්දා) ගෙවල් කරා එළඹ ලැබුණත් නොලැබුණත් මැදහත්ව යන්නේ ය.

**සපත්තපාණි** ගාථාවට අදාල වන කරුණු ඉහත දක්වා ඇත. උච්චාවචා - මේ ගාථාව හා සබැඳේ. මෙසේ ආහාර පිළිබඳ වත් සපුරත්ද, එපමණකින් සතුටට (සෑහීමකට නොපැමිණ) ඉතිරි පිළිවෙත් කෙරෙහිද සිත යොමන්නේ ය. සසුන යනු පිළිවෙත් සරු බවයි. 'උච්චාවචා......මුතං' යනුවෙන් එහි අරුත නම්, ඒ දැක්වූ මග පටිපදා උසස්-ලාමක ලෙසින් **උච්චාවචා**, බුදුවරයන් විසින් **සමණෙන පකාසිතා** දක්වා ඇති පරිදි යහපත් පිළිවෙතින් ඉක්මණින් අවබෝධ-දැනගැනීම උසස්ය. අයහපත් දුක් නො දෙන පිළිවෙතෙහි නොදැනීම පහත්ය. මේ කොටස් දෙකෙන් එකක් අනික් කොටසට වඩා උසස්ය. අනික් කොටසට වඩා පහත්ය. පළමු අංගයම උසස්ය. අනෙක් කොටස් තුනම පහත්ය. මේ උසස් වූ හෝ ලාමක වූ හෝ පිළිවෙතෙහි **න පාරං දිගුණං යනති** - **දුගණං** යනුවෙන්ද දැක්වේ. එක මගකින් දෙවරක් නිවනට නොයති'යි අදහසයි. කවර හෙයින්ද? යම් මගකින් කෙලෙස් යම් පමණකට නසන ලද ද, ඒවා නැවත බැහැර කළයුතු නොවේ. එයින් කෙලෙස් පිරිහී ඇති අයුරු දක්වයි. **නයිදං එකගුණං මුතං** එහි මේවායේ පරතෙරට - ඈත් කිරීමට එකවරකම අරමුණු වීමක් නොවේ. කවර හෙයින්ද? එක මගකින් (සෝවාන් පල පමණින්) සියළුම කෙලෙස් නැසීම සිදුනොවන හෙයිනි. එයින් එකම මග ලෙසම අරහත් බව පෙන්වා දෙයි. දැන් පිළිවෙතෙහි ආනිසංස වැදගත්කම යසස ච විසතා යන ගාථාවෙන් දක්වති. එහි අරුත නම්, **යසස ච** මෙසේ පිළිපදින පැවිද්දාට **භික්ඛුනො** ඒ පිළිවෙත් මගින් එකසිය අටක් සේ ගැනෙන, ඇලෙන, ගැලෙන **විසතා** තණ්හා නැත. කෙලෙස් වාන්දොරටු කපාහළ බැවින් **ඡින්නසොතසස** කුසල් අකුසල් දුරුකළ බැවින් **කිච්චාකිච්චප්පහීණසස** රාගයෙන් හෝ තරහින් හටගන්නා සුළු වුවත් **පරිළාහො න විජ්ජති.**

දැන්, මේ ගාථා ඇසූ නාලක තෙරුන්ට 'මොනෙය්‍ය පිළිවෙත මෙපමණ වේනම්, එය පිළිපැදීම පහසුය. අපහසු නොවේ. නොබෝ කලකින්ම, පිරිය හැකිවේ'යැයි සිතක් පහළවිය. (සිතුණි) භාග්‍යවතුන් වහන්සේ, 'මොනෙය්‍ය වත අපහසුම'යැයි නාලක හිමිට නැවත පෙන්වා දී මොනෙය්‍යනෙත උපඤ්ඤිස්සං ආදී ගාථා වදාළහ. (මොනෙය්‍ය වත) දැළිපිහියෙහි මුවහත මෙන් **ඛුරධාරූපමො භවෙති** වන්නේ ය. මෙහි අදහස කුමක්ද? මුනි පිළිවෙතෙහි පිළිපන් පැවිද්දා සිවුපසය පරිහරණය කළයුත්තේ දැළිපිහියෙහි මුවහත සේ සළකාය. දැළිපිහි මුවහතෙහි තැවරුණු මීබිඳු ලෙවකන විට, දිව කැපීමෙන් රැකගන්නා සේම, දැහැමින් ලැබුණු සිවුපසය පරිහරණයෙහිදී කෙලෙස් හටගැනීමෙන් සිත රැකගනු ලැබේ යැයි කියන ලදී. සිවුපසයෙහි නිරවුල් දැනීමෙන්ද, එය නිවැරදිව පරිහරණයද පහසු නොවේ යැයි මේ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ බොහෝ කරුණු දේසනා කරති. **ජිව්හාය තාලුමාහච්ච උදරෙ සංයතො සියා** දිවෙන් තල්ල මැඩගෙනම, රසයෙහි ආසාව දුරු කෙරෙමින්, ලද ආහාරය කිලිටි (නීරස) වුවත් කුස පමණට ගැනීමට හික්මිය යුතුය. **අලීන චිතෙතා ච සියා** නිති කුසල් දහම් වැඩීම පිණිස වටහා ගැනීමෙන්, අනලස් වූ සිත පිහිටුවිය යුතුය. **න චාපි බහු චින්තයෙ** නෑයන්, ජනපද, දෙවියන් ආදීන් ගැන දෙගිඩියාවේ බොහෝ සෙයින් නොසිතන්නේය. **නිරාමගන්ධො අසිතො බ්‍රහමචරිය පරායණො** නිකෙලෙස්ව තණ්හා දිට්ඨිවලින් සසරෙහි නොඇලී, හික්මීමෙන් යුතුව, මුළුමනින්ම සසුන් බඹසරම පිහිට කරගන්නේය.

**එකාසනස්ස** ආසනයෙහි විවේකීව, ආසන යනුවෙන් මෙහිදී සියළුම ඉරියව් ඇතුලත් වන අතර, සියළුම ඉරියව් පැවතුම්වලදී එකාකාරවම හික්මේ යැයි කියන ලදැයි දතයුතුය. එකාසනස්ස යනු සම්පදාන විබත් වචනයි. **සමණූපාසනස්ස** ච මහණුන් විසින් ඇසුරු කරන ලද, බවුන් වැඩීමට සුදුසු අරමුණු තිස්අට, මෙයද සම්පදාන විබත්ය. පුරුදු කිරීම යන තේරුමයි. මෙහිදී එකාසන යනුවෙන් කයෙහි විවේකයද, සමණූපාසන යන්නෙන් සිතෙහි විවේකයද දතයුතුය. **එකත්තං මොනමක්ඛාතං** මෙහිද කය සිත විවේකය එක්කොට මොන හෙවත් මග නුවණ සේ කියන ලදී. **එකො වෙ අභිරමිස්සසී** මෙය ඊළඟ ගාථාවේ 'අථ භාසිහි දස දිසා' හා සම්බන්ධ වේ. **භාසිහි** කියහි, පවසන්නෙහි, මේ පිළිවෙත වඩන තැනැත්තා පිළිබඳව සියළු දිසාවලම කිතුරැව් පැතිරෙන්නැයි කියන ලදී. **සුත්වා ධීරානං** ආදී සතරවන පදයෙහි අරුත මෙයයි. ඒ කිතුගොසින් දස දෙසෙහි

කියව. **තං ධීරානං ඣායිනං කාමචාගිනං නිගෙඝාසං සුත්වා** ඔබ ඒ කිතුගොසින් උඩඟු බවට නොපැමිණ, **හියොයා හිරිඤ්ච සද්ධඤ්ච** ඒ හඬින් ලජ්ජාවෙමින් 'සසරින් නිදහස් වන පිළිවෙත මෙය'යැයි සැදැහැ උපදවා වැඩිදුරටත් ඒ පිළිවෙතම වඩන්නේය. **මාමකො** මෙසේ කටයුතු කරනවිට මගේ අනුගාමිකයෙකු වෙයි. **තනනදීහි** ඒ පිළිවෙත් පුරන පැවිද්දාට මා විසින් ලජ්ජාවත්, සැදැහැ බවත් බෙහෙවින් දියුණුකොට වඩවයි කීවිට උඩඟුවීමද නොකළ යුතුයැයි කියන ලදී. එය නදිය ගැන කී මේ නිදසුනින් **ජානාථ** ඒ ආකාරයෙන්ම දියවළ, ඇලවල්වලින් හා පොළවේ ඉරිතැලීම්වලින් ද දනිවු. **සොබෙහසු** ඇල්වල්වලින්, **පදරෙසු** පැලීම්වලින්, විවරවලින්.

කෙසේද? **සනනතා යනති කුසසුබබා තුණහී යනති** මහොදධී සියළුම කුඩා ගංගා, කුඩා වලවල්, දිය පිරුණු වලවල් විවර ආදියෙන් උඩට නැගී හඬ නගමින් ගලා යයි. ගංගා අතර මහා ගංගා නිහඬව ගලයි. මෙසේම 'මොනෙය්‍ය වත පුරමි'යි (පැවිද්දා) මගේ යන හැගුමෙන්, මමායනයෙන් තොරව උසස් ලෙස කටයුතු කරයි. මගේය යන කටයුතු කරන්නා ලජ්ජාව හා සැදැහැ බව ද උපදවා යටහත් සිතින් යුතු වෙයි. වැඩිදුර කියනුම කවරේද? **යදූනකං** -පෙ- **පණ්ඩිතො** එපරිදි වන්නේය. **අඩඪකුමභූපමො** බාලො හඬ නැගීමෙන් (තමා ගැනම කීමෙන්) අනුවණයෙකි. නුවණැත්තා පිරුණු විලක් මෙනි. සන්හුන්ය. එසේනම් කවරහෙයින් බුදුමග යන මහණෙක් මෙසේ දහම් දෙසීමේ නියැලිව, බොහෝ කොට කියන්නේ ද යන්න පිළිබඳව යං සමණො යන ගාථාව වදාළහ. එහි අරුත නම්, **සමණො බහුං භාසති** යම් පැවිද්දකු බොහෝ කොට කථාකරතත් එය අරුත් සහිත, අරුත් දනවන, යහපත පෙන්වන, (දහම් කරුණින් යුතු) හිතකාමී වේ. එහෙත් උඩඟු, මානයෙන් නොවේ. **ජානං සො ධම්මං දෙසෙති** දවසක් පුරාම දේසනා කරතත්, කිලිටි දොසින් තොරව ඒ කියන ඒ සියළු වචනම නුවණ පෙරදැරිව පවතී. මෙසේ දේසනා කරනවිටද මෙය හිතකාමී වේ. මෙය යහපතට හේතු වේයැයි නොයෙක් අයුරින් දැන, **ජානං සො බහු භාසති** හුදෙක් බොහෝ කතා කිරීම පමණක් නොවේ.

අවසාන ගාථාව මේ විස්තරයට අදාල වන්නේ මේ අයුරිනි. සියල්ල දන්නා නුවණින් යුතු සියළු පව් දුරුකරන ලද හෙයින් බුද්ධසමණා නම් වූ බුදුරජාණන් වහන්සේ දැනගෙනම දහම් දෙසති. දැනගෙනම (ගැළපෙන

අයුරින්) බොහෝ ලෙස කියති. ඒ දේසනා කරන ලද දහම අවබෝධ කරගැනීමේ අදහසින් නුවණින් දැන, **යො ච ජානං යතත්තො ජානං න බහු භාසති - ස මුනි මොන මරහති සමුනි මොනමජ්ඣගා** එහි අරුත නම්, ඒ දහම දැන, උත්සාහවත්ව, (කෙලෙසින්) සිත රැකගෙන, **යං** කියන දෙය පුද්ගල හිතසුව පිණිස නොවේ නම්, එහිදී දැනගත් දෙය වුවත් බොහෝ කොට නොකියති. මේ අයුරින් නිහඬ බවින් යුතු මුනිවරයා මොනෙය්‍ය පිළිවෙත යැයි හඳුන්වනු ලබන, සිවුමග නුවණ ලැබීමට සුදුසුය. ඊට සුදුසු බව පමණක්ම නොවේ. ඒ මුනිවරයා අරහත් මග නුවණ යැයි හඳුන්වනු ලබන සිවුසස් අවබෝධ කරති'යි මෙසේ දතයුතු යැයි අරහත් බව කුළුගන්වා දේසනය නිමකළහ.

ඒ ඇසූ නාලක හිමි, දැකීමෙහි, ඇසීමෙහි, විමසීමෙහි යන තුන් තන්හි සෑහීමකට පත්ව කටයුතු කළහ. නාලක හිමි දේසනාව අවසානයෙහි පහන් සිතින් භාග්‍යවතුන් වහන්සේට වැඳ වනයට පිවිස, නැවත, 'අහා! මම භාග්‍යවතුන් වහන්සේ දකින්නෙම් නම් මැනව'යි කැමැත්තක් නොදැක්වීය. මේ දැකීමෙහි සෑහීමට පත්වන අයුරුයි, එසේම, 'මම නැවත දහම් අසන්නෙමි'යි කැමැත්තක් ඇතිකර නොගැනීම ඇසීමෙහි සෑහීමට පත්වීමයි. 'මම නැවත මොනෙය්‍ය පිළිවෙත විමසන්නෙමි'යි කැමති නොවීම විමසීමෙහි සෑහීමට පත්වීමයි. මෙසේ සෑහීමට පත්ව, පව්වෙහි පාමුලට පිවිස, එක වන පියසක දවස් දෙකක් නොසිටියේය. එක් ගසක් මුල දින දෙකක් නොසිටියේය. එකම ගමෙහි දින දෙකක් පිඬු පිණිස නොගියේය. මේ අයුරින් කැලයෙන් කැලයට, ගසෙන් ගසට, ගමෙන් ගමට ඇවිදිමින්, සුදුසු පිළිවෙත අනුව අග පලයෙහි පිහිටියේය. මොනෙය්‍ය පිළිවෙත දැඩිව උත්සාහවත්ව පුරන පැවිද්දා සත් මසක් ජීවත් වේ. සමව උත්සාහවත් වන පැවිද්දා ජීවත් වන්නේ සත් වසරකි. අඩුතරමින් පිළිවෙත් පුරන පැවිද්දා වසර දහසයකි. ඒ පිළිවෙතෙහි දැඩි උත්සාහ වූ නාලක හිමි සත් මසක් ගත වූ බැවින්, ආයු කාලය අවසන් බව දැන, දිය නා, සිවුරු හැඳ, පටිය බැඳ, සඟල සිවුර පොරවා, බුදුරජාණන් වහන්සේ වැඩසිටින දෙසට පසඟ පිහිටුවා වැඳ, ඇඳිලි බැඳ, සිටිනා ඉරියව්වෙන්ම රත්හිරියල් පව්වෙහි අනුපාදිසෙස පිරිනිවනට පත්විය. භාග්‍යවතුන් වහන්සේ නාලක පිරිනිවන්පෑ බව දැන, බික්සඟන පිරිවරා ගොස්, සිරුරු කිස කොට, ධාතු ගෙන සෑයක් පිහිටුවා ආපසු වැඩියහ.

**නාලක සූත්‍ර විස්තරය නිමි.**

# 3.12

**එවමෙම සුතං** යනු ද්වයතානුපස්සනා සූත්‍රයයි. මෙම සූත්‍රය කුමක් නිසා දෙසන ලද ද? බුදුරජාණන් වහන්සේට ඇතිවූ අදහසක් අනුව දේසනා කරන ලදී. මේ කෙටි සඳහනයි. එහි විස්තර ඉදිරියට වචන තේරුම් කිරීමේදී දැක්වේ.

එවමෙම සුතං ආදිය කලින් කියා ඇති පරිදිය. පුබ්බාරාමෙ සැවැත් නුවරින් නැගෙනහිර දෙසින් පිහිටි අරමයි. **මිගාරමාතුපාසාදෙ** විසාඛා උපාසිකාව තම මයිලණුවන් වූ මිගාර සිටුවරයා විසින් මවු තනතුරෙහි තබන ලද බැවින්, 'මිගාරමාතා' යැයි හැඳින්වූවාය. ඒ මිගාර මාතාව විසින්, නව කෝටියක් අගනා මහාලිය පළඳනාව විකුණා කරවන ලද, බිම් මහලෙහි කාමර පන්සියයක් ද, මතුමහලෙහි කාමර පන්සියයක් ද, කුළුගෙවල් දහසකින් ද යුතු වූ පහය, 'මිගාරමාතු' නම් විය. ඒ මිගාරමාතු පහයෙහි, **තෙන ඛො පන සමයෙන** භගවා භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර පුබ්බාරාමයෙහි මිගාරමාතු පහයෙහි වැඩවසන කාලයෙහි, **තදහුපොසථෙ** ඒ පෙහෙවස් දිනයෙහි **පණ්ණරසෙ** මෙය පෙහෙවස් දින ගණනය අනුව (සඳෙහි අඩුවැඩි බව අනුව) වෙන් කෙරෙනා අනිකුත් පෙහෙවස් දින, **පුණ්ණාය පුණ්ණමාය රත්තියා** එසේ දවස් ගැනීමෙන් පසළොස්වන දිනය බැවින්, වළාකුළුවලින් තොර, පැහැදිලි අහසින් යුතු පිරිපුන් සඳ පෑයූ රැයක (පසළොස්වක දින) **භික්ඛුසංඝ පරිවුතො** භික්සඝණ පිරිවරන ලදුව, **අබ්භොකාසෙ නිසින්නො හොති** මිගාරමාතු රුවන් පහයෙහි පිරිවෙන්හි, ඉහළින් ආවරණයක් නොමැති. එළිමහනෙහි ඉඩ ඇති තැනක පනවන ලද අගනා බුදුඅසුනෙහි වැඩ සිටිති. **තුණ්හී භූතං තුණ්හීභූතං** මුළුමනින්ම නිහඬ බවයි. බැලූ බැලූ තන්හිම නිහඬතාවයි. කිසිදු කතාකරන හඬක් නැත. අත් පා (කය සෙලවෙන) හඬකුදු නැත. **භික්ඛු සංඝං අනුවිලොකෙත්වා** එසේ පිරිවරා හිඳ සිටි නොයෙක් දහස් ගණන් නිහඬව සිටින පැවිදි පිරිස අතර, මෙපමණ සෝවාන් පල ලැබූවන්ය. මෙපමණ සකදාගාමීන්ය. මෙපමණ අනාගාමීය. මෙපමණ විදසුනෙහි යොමුවූ මගපල අරමුණුකොට ඇත්තන්ය. මේ පැවිදි පිරිසට කෙබඳු දහම් දෙසුමක් ගැළපේදැයි, සුදුසු දහම් දෙසුමකට වටපිට බලා,

**යෙන තෙ භික්ඛවෙ කුසලා ධම්මා** (කෙලෙස් ලෙඩ නැතිකරන) කායික මානසික සුවය ලබන තේරුමෙන් ද, නිවැරදි බවින් ද ඉටු

අරමුණු පල දරන හෙයින් ද, (සිවුසස් අවබෝධයට) හැකියාව ඇති කරවන බැවින්ද, කුසල් සේ දැක්වෙන අවබෝධය ලබාගැනීමට මගපෙන්වන ඉගෙන දරාගතයුතු කරුණු තිස්හතක්, (බෝධිපකඛිය ධමම) **අරියා නියයාණිකා සමෙබාධගාමිනො** අරිය උතුමන් හෙවත් බුදු පසේබුදු මහරහතුන් විසින් එළඹෙනා ලද, (මේ) ලෝකයෙන් එතරට - නික්ම යා හැකි, (සසරින් ඉවතට පමුණුවන) මනා අවබෝධය වූ අරහත්බවට පැමිණෙන්නා වූ, **තෙසං වො භිකඛවෙ** -පෙ- **සවණාය** මහණෙනි, ඒ අවබෝධය කරා ගෙන යන කුසල දහම, **කා උපනිසා** මෙය ඇසීමෙන් ඔබලාට ලැබෙන පලය කුමක්ද? කුමක් නිසා මේ දහම අසවු'දැයි කියන ලදී. දෙයාකාරව කරුණු විමසා බැලීමෙන්, ඇති සැටියෙන් දැකීමේ නුවණ ඇතිවෙයි. **යාවදෙව** පැහැදිලි කරන දෙය අවධාරණයෙන් දැක්වීමට යොදන වචනයකි. කොටස් දෙකක් යන අදහසින් **දවයා** වේ. එසේ දෙආකාර වූ, **දවායනං** යනු ද වචනයකි. **යථාභූතං ඤාණයා** වෙනස් නොවන නුවණ, එසේ කියන ලද්දේ කුමක් හෙයින් ද? ලොවී ලොවුතුරු ලෙසින් දෙයාකාරව කිවයුතු කරුණු (අතර) විදසුන් යන නමින් හඳුන්වන, ඇති තතු ඒ අයුරින්ම දක්නා නුවණයි. මෙහිදී ඒ ගැන වැඩිදුර නොදැක්වේ. ඇසීමෙන් මෙපමණකැයි දැනගත හැකිය. ඊටත් වඩා උසස් අවබෝධයක් ඒ ගැන ලැබිය යුත්තේ භාවනාවෙනි. **කිඤචදවයතං වදෙථ** 'මහණෙනි, දෙයාකාරව කුමක් උදෙසා කියන්නේදැ'යි ඔබලා සිතන්නාහුද? කිනම් පදරුත් අනුව දෙයාකාර වේද? එහි අදහස වදාළ මැනව.' එහිදී භාග්‍යවතුන් වහන්සේ එම දෙආකාරය පහදමින් 'මේ දුක' යැයි වදාළහ. සිවුසස් දහම්හි 'මේ දුකය, මේ දුක ඇතිවීමට හේතුව'යැයි දෙආකාරව දැක්වේ. මෙසේ එදිනෙදා ඇතිවන දේවල, කරුණුවල හේතු සහගතව දුක දැකීම **අයමෙකානුපසසනා** මේ ලෝකයෙන් එහා (සසර පැවැත්මේ) නැවතීම දැකීම අනෙක් කොටස ලෙස **දුතියානුපසසනා** පළමුවෙන් මෙහිදී දැකීමෙහි පිරිසිදුවීම හා සැක දුරුවීමෙහි පිරිසිදු බව (දිට්ඨි, කංඛා විතරණ) ඇතිවෙයි. දෙවැනි බැලීමේදී ඒ අවබෝධයට අදාල වන මග නොමග දැකීමේ පිරිසිදු බව (මගගාමගග ඤාණදසසන) වේ. **සමමාදවයතානුපසසිනො** මේ කී පරිද්දෙන් මැනවින් දෙආකාරයෙන්, සිහිය නොවෙනස්ව පවත්වා ගනිමින් නැතිවන සුළු බව වැනසීමට පත්වන සැටි මෙනෙහි කිරීමෙන්, **අපපමතතසස** කායික හා මානසිකව ඇතිවන කෙලෙස් උත්සාහයෙන් තැවීමෙන් - මැඩපැවැත්වීමෙන් **ආතාපිනො** සිරුර පිළිබඳවද, ජීවිතය පිළිබඳවද බලාපොරොත්තු නැති බැවින් **පහිතතතසස, පාටිකංඛං** කැමතිවිය යුතුය. **දිටෙඨව ධමෙම අඤඤා**

මේ ජීවිතයෙහිදීම හෝ අරහත් බව සති වා උපාදිසෙසෙ අනාගාමිතා උපාදිසෙස යනු නැවත සසර උපතකට ඉඩ ඇති පරිදි ඉපදීම ඇති කරවන (විඤ්ඤාණ) ඉතිරිව ඇති හේතු, එසේ ඇති කල්හී, අනාගාමී බව බලාපොරොත්තු වේ යැයි දැක්වෙයි. ඊට පසු ලබන පලය වුවත් දෙආකාරව, නුවණින් විමසා බැලීම වේ. මගපල අතරින් අවසානය වූ රහත්පලයට උත්සාහය වඩවනු පිණිස එසේ කීහ.

**ඉදමවොච** ආදී වැකි සංගායනාවට සහභාගී වූ තෙරුන්ගේ වචනයි. එහි **ඉදං** 'මහණෙනි, යම් ඒ දේවල් ආදී ලෙසින් කියන ලද අයුරු නිදසුන්ය. **එතං** මීළඟට 'යම් දුකක්' ආදී ලෙසට කිවයුතු වූ සකස්කරන ලද ගාථා ද නිදසුන්ය. මේ ගාථාද සිවුසස් පහදා දීමට අරුත් දනවන ගාථාය. මෙසේ දක්වා ඇතිවිට, ගාථාවලට කැමති වූවන්ට ද, පසුව මෙහි කරුණු දැනගැනීමට උනන්දු වන්නන්ට ද, මුලදී කියනවිට, එකවරටම සිත දරා ගැනීමට නොහැකි වූ බැවින්, දැන් මෙසේ කියන අයුරු හොඳයැයි එය අසා දරා ගැනීමට කැමති වන්නන්ටද, සිත අවුල් සහගත වූවන්ටද වඩාත් අරුත් පැහැදිලිවීමටද හේතු වේ. මැනවින් නුවණ මෙහෙයා නොවිමසන තැනැත්තන්ටද සසර පිළිබඳව පෙන්වාදෙන හෙයින් වෙසෙසින් අරුත් දැක්වීමක් ලෙස වැදගත් වේ. මෙයින් පසු සඳහන් වන ගාථාවලටද එසේමය. **යතො** වා මෙයින් නිවන දක්වයි. **දුක්ඛං සබ්බසො උපරුජ්ඣති** නිවන මුළුමනින්ම දුක වනසයි. දුකට හේතු වළකයි. **අසෙසඤ්ච** එසේ විනාස කරයි. **තඤ්ච මග්ගං** ඒ අරි අටැඟි මග, **චෙතො විමුත්තිහීනා තෙ අථො පඤ්ඤාවිමුත්තියා** මෙහි අරහත් පල සමාධියෙන් රාගය නැතිකිරීම, චෙතො විමුත්ති වේ. අරහත්පල නුවණින් අවිජ්ජා හෙවත් නොදැනීම දුරුකිරීම පඤ්ඤාවිමුත්ති යැයි දතයුතුය. තණ්හාව වැඩි, තණ්හා චරිතවත් පුද්ගලයා විසින් අවසන් දැහැන් බලයෙන් කෙලෙස් මැඩපවත්වා අරහත් පලය ලබාගැනීම රාගය නැතිකළ චෙතොවිමුත්තිය වෙයි. දැඩිව ගත් හැඟීම්වලින් යුතු (දිට්ඨි චරිත) පුද්ගලයා විසින් මුල් දැහැන් පමණක් උපදවා විදසුන් වඩා ලද අරහත් පලය අවිජ්ජාව නසන ලද පඤ්ඤා විමුත්තිය වේ. කාම රාගය දුරුකරන අනාගාමි පලයද රාගවිරාග චෙතො විමුත්තිය වේ. එහෙත් අරහත් පලය මුළුමනින්ම අවිජ්ජා විරාග චෙතො විමුත්තියයි. **අන්තකිරියාය** සසර දුක කෙළවර කරනු පිණිස, **ජාතිජරූපගා** ඉපදීම, ජරාවට පත්ව, ඉපදීමෙන් ජරාවට පත්ව, ඉපදීමෙන් ජරාවෙන් නොමිදෙතියි මෙසේ දතයුතුය. ඉතිරි කරුණු මුලසිටම පැහැදිලිය. ගාථාව අවසානයෙහි සැටනමක් ඒ දෙසුම ඉගෙන

විදසුන් වඩා අවසානයෙහි අරහත් බවට පත්වූහ. හැම ගාථාවකම අවසානයේදී මෙම කරුණ පොදුය.

ඊට පසු භාග්‍යවතුන් වහන්සේ **සියා අඤ්ඤෙනාපි පරියායෙන** ආදී ලෙසින්, නොයෙක් අයුරින් දෙආකාරයෙන් විමසා බැලීම ගැන, කීහ. එහි දෙවන වාරයෙහි සඳහන් **උපධිපච්චයා** කෙලෙස් සහගතව කරන කියන කටයුතුය. කෙලෙස් සහිත කටයුතු මෙහි උපධි යැයි අදහස් වේ. **අසෙස විරාගනිරොධා** මුළුමනින්ම විරාගයෙන් (රාගය) නැති කිරීමයි. උපධි නිදානා ඒ කටයුතු (කම්ම) හේතුයි. **දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී** සසර දුකෙහි ඉපදීම ඇතිකරන එම උපධි ගැන නුවණින් විමසා බලමින්, ඉතිරි වචනවල අරුත් පැහැදිලිය. මෙසේ මේ කොටසෙහි සිවුසස් සඳහන් කොට අරහත් බව කුළුගන්වා ඇත. හැම ගාථාවකම අවසානය මෙබඳු වේ.

තුන්වන වර, **අවිජ්ජා පච්චයා** යයි වදාළේ සසර ගමනට අදාල නොදැනීමේ හේතුවයි. **දුක්ඛං** මෙය සඳහන් වූ හැමවිටකම සසර දුකම ගැනේ. **ජාතිමරණ සංසාරං** රූපාදී සමූහ පහ (හෙවත් සිරුර) ඇතිකරවන උපතයි. ඒ සමූහයේ බිඳීම වූ මරණය, ඒ සමූහයෙහි පැවැත්ම හෙවත් පිළිවෙල සසර ද වේ. **වජන්ති** යති, එළඹෙති, **ඉත්ථභාවඤ්ඤථාභාවං** මේ මිනිස් භවය හෝ වෙනත් ආකාර ඉපදීම්, **ගති** උපත ලබන තැන්, **අවිජ්ජාහයං** මේ නොදැනීමමය. **විජ්ජාගතාච යෙ සත්තා** අරහත්මග විදුබලෙන් කෙලෙස් නැතිකළ තැනැත්තෝ ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය.

සිවුවන වර **සංඛාර පච්චයා** පින්, පව්, කම්පානොවන ලෙසින් ඇතිවන ඒ ඒ එක්රැස් කිරීම්, **එතමාදීනවං ඤත්වා** ඒ ආකාර **දුක්ඛං සංඛාර පච්චයා** එය ආදීනව යැයි දැන, **සබ්බ සංඛාර සමථා** කියන ලද පරිදි මුළුමනින්ම සංඛාර මග නුවණින් සන්සිඳවීමෙන්, මගපල ලැබීමේ හැකියාව ගැන කියන ලදී. **සඤ්ඤානං** කාම හැඳිනීම් ආදී මගෙන්ම **උපරොධනා, එතං ඤත්වා යථා තථං** එම දුක නැතිකිරීම නොවෙනස්ව දැන, **සම්මද්දසා** මනාව දැකීමෙන්, **සම්මදඤ්ඤාසා** යම් යම් දේ එක්වීමෙන් සකස්වන සියළුම දෙයෙහි අනියත බව දැන, **මාර සංයොගං** සසරෙහි තුන් භවයටම අදාල වූ, ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිය.

පස්වන වාරයෙහි **විඤ්ඤාණ පච්චයා** කම්ම සහජාත අභිසංඛාර

විඤ්ඤාණය හේතුවෙයි. **නිච්ඡාතො** තණ්හාව නැති, **පරිනිබ්බුතො** මුළුමනින් කෙලෙස් නැතිකිරීමෙන් නිවනට පත්වූයේ වෙයි. ඉතිරි කරුණු පැහැදිලිය.

පස්වන වාරයෙහි **විඤ්ඤාණ පච්චයා** කම්ම සහජාත අභිසංඛාර විඤ්ඤාණය හේතුවෙයි. **නිච්ඡාතො** තණ්හාව නැති, **පරිනිබ්බුතො** මුළුමනින් කෙලෙස් නැතිකිරීමෙන් නිවනට පත්වූයේ වෙයි. ඉතිරි කරුණු පැහැදිලිය.

සවැනි වාරයෙහි, **ඵස්ස පච්චයා** සකස් වූ විඤ්ඤාණය පහසට හේතු වේයැයි තේරුමයි. මෙසේ වචන පිළිවෙලින් දක්වන්නේ නම්, නාමරූප, සළායතන නොකියා, ඵස්ස යැයි කියා ඇත. ඒවා රූප මුසුවන බැවින් කම්ම හා එක්ව නොයෙදේමය. මේ සසර දුක ද කම්මයෙන් හෝ කම්ම බැඳෙන කරුණුවලින් ඇතිවන්නේ ය. **භවසොතානුසාරිනං** තණ්හාව අනුව යන, **පරිඤ්ඤාය** තුන්ආකාර වූ නුවණින් දැන, **අඤ්ඤාය** අරහත් මග නුවණින් දැන, **උපසමෙ රතා** පල සමවත් ලෙසින් නිවනෙහි ඇලුන, **ඵස්සාභිසමයා** පහස නැතිකිරීමෙන්, ඉතිරි කරුණු පැහැදිලිය.

සත්වන වාරයෙහි **වෙදනා පච්චයා** කම්ම හා එක්වන වෙදනා හේතු වේ. **අදුක්ඛම සුඛං** සහ (වේදනාවෙහි කොටස් දක්වන අයුරු) දුකත් සැපත් නොවන වේදනා සමග, **එතං දුක්ඛන්ති ඤත්වාන** එය විඳිනු ලබන්නා වූ සියළු දෙයෙහි දුකට කරුණකැයි දැන, **මොස ධම්මං** නැසෙන බැවින් යුතු, **පලොකිතං** ජරා මරණයෙන් බිඳෙනසුළු බවින් යුතු, **ඵුස්ස ඵුස්ස** ඇතිවීම-නැතිවීම නුවණින් අරමුණුකොට බලා, **වයං පස්ස** අවසානයෙහි වැනසීම - නැතිවීම දකිමින්, **එවං තත්ථ විජානති** මෙසේ ඒ වේදනාව දැනගනී. එහි දුක් බව හෝ දැනගනී. **වෙදනානං ඛයා** ඉන්පසු මගනුවණින් කම්ම හා බැඳුණු වේදනාව නැති කිරීමෙන්. ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

අටවන වාරයෙහි **තණ්හා පච්චයා** කම්ම හා බැඳෙන තණ්හාව හේතුවෙන්, **එතමාදීනවං ඤත්වා තණ්හා දුක්ඛස්ස සම්භවං** ඒ දුකට හේතුවන තණ්හාවෙහි ආදීනව දැන, ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

නවවන වාරයෙහි **උපාදාන පච්චයා** කම්ම හා බැඳුණු දැඩිව අල්වා ගැනීමෙන්, **භවො** (පෙර කම්පල අනුව ලබන) උපත සිදුවන ලෝකයෙහි

රූපාදි සමූහයේ හටගැනීම, **භුතො දුක්ඛං** ඇතිවූ, හටගත්තා වූ සසර දුක **නිගච්ඡති, ජාතස්ස මරණං** එසේ උපත ලද තැනැත්තා 'සැපසේ ඉවත්ව යති'යි අනුවණයෝ සිතති. එහිද දුකම පෙන්වාදෙමින් **ජාතස්ස මරණං** හොති යැයි වදාළහ. ඊළඟ ගාථාවේ කිසිම දෙයක තිර නැති බව සළකා **සම්මදඤ්ඤාය පණ්ඩිතා උපාදානක්ඛයා ජාතික්ඛයං අභිඤ්ඤාය** නාගච්ඡන්ති පුනබ්භවං නිවනට (පැමිණෙන බව දැක්වේ.)

දහවන වාරයෙහි **ආරම්භ පච්චයා** කරන කියන කටයුතු ආදිය (කම්ම) හා බැඳුණු උත්සාහය හේතුවෙන්, **අනාරම්භ විමුත්තිනො** නිවනට පත් කෙලෙස්වලින් මිදුණු තැනැත්තාට ඒ උත්සාහය නැති වෙයි. ඉතිරි කරුණු කලින් දැක්වූ පරිදිය.

එකොළොස්වන වන වාරයෙහි - **ආහාර පච්චයා** කම්ම හා බැඳුණු ආහාර හේතුවෙන්, වෙනත් අයුරින් දක්වතොත්, ජීවීහු රූපයෙන්, වින්දනයෙන් (වේදනා) හැඳිනීමෙන්, කුසල් අකුසල් (යහපත-අයහපත) රැස් කිරීම අනුව සිවුආකාර වෙති. එසේ කාම ලෝක එකොළහක උපන් සියළුම සත්වග, අතරින් රූපයක් ලද්දෝ විකා කනු ලබන ආහාර ඇසුරු කරති. අසඤ්ඤතලයෙහි උපත ලද්දවුන් හැර, රූප ලෝකයෙහි උපත ලද්දෝ වේදනා (වින්දන) යුතු පහස - එසසාහාරය සේවනය කරන්නෝය. අරූප ලෝකයෙහි පහළ වන්නෝ හැඳිනීම් අනුව මනසේ ඇතිවන සිතිවිලි ඇසුරු කරන්නෝය. භවග්ගයෙහි පහළ වන්නෝ සංඛාරයෙන් උපන් විඤ්ඤාණ හෙවත් සිතම (අහර සේ) ඇසුරුකොට පවතී. මෙසේද **යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ආහාර පච්චයා** යැයි දතයුතුය. **අරොග්‍යං** නිවන, **සංඛාය සෙවී** සිවුපසයෙහි නුවණින් විමසා බලා, පරිහරණය කරන, ඛන්ධ පහ, ආයතන දොළහ, ධාතු දහඅට ලෙසින් හෝ ලොව ඇති තතු සළකා 'තිර බවක් නැත. දුකය, තමන් යැයි කියා දෙයක් නැතැයි නුවණින් සළකමින්, **ධම්මට්ඨො** සිවුසස් දහමෙහි පිහිටියේ, **සංඛං නොපෙති** 'දෙවියකු' හෝ 'මිනිසෙකු' ලෙස නොගැනේ. ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

දොළොස්වන වාරයෙහි, **ඉඤ්ජිත පච්චයා** තණ්හා, මාන, දිට්ඨී කම් කෙලෙස්වලින් සැලෙන කල්හි, කම්ම හා බැඳුණු ඒ කෙලෙස් හේතුවෙන්, **එජං වොසස්සජ්ජ** තණ්හාව හැරදමා, **සංඛාරෙ උපරුන්ධිය**

කම්ම හා ඒ හා බැඳුණු රැස්කිරීම් නැතිකොට, ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

දහතුන්වන වාරයෙහි **නිස්සිතස්ස චලිතං** තණ්හාවෙන් හෝ තණ්හා දිට්ඨි මානයෙන් හෝ සිරුර ඇසුරුකොට ඇති බිය, සීහ සූත්‍රයෙහි සඳහන් දෙවියන්ට ඇතිවූ බිය මෙන් සෙලවීමට, ගැස්සීමට පත්කරයි. ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

දහහතරවන වාරයහෙි, **රූපෙහි** රූප භවයෙහි හෝ රූප සමාපත්ති කෙරෙහි හෝ **ආරුප්පා** අරූපී භවයෙහි හෝ අරූප සමාපත්ති කෙරෙහි හෝ, **නිරොධො** නිවන, **මච්චුහායිනො** මරණ මරු, කෙලෙස් මරු, දෙව්පුත් මාර යන තුන්ආකාර මරණ අත්හැර ගියේ යැයි කියන ලදී. (ඉදිරි උපතක් නැත) ඉතිරි කරුණු කලින් දක්වා ඇති පරිදිය.

පහළොස්වන වාරයෙහි, **යං** නාමරූප උදෙසා කියන ලදී. එයද ලෝකයා විසින් සදා පවත්නා වූ, යහපත් හා සැප ලෙසින් සළකා **ඉදං සච්චං** (මේ ඇත්ත යයි) කල්පනාකොට, තදින්ම ඒ හැඟීම්වලින් වෙලී පවතී. **තදමරියානං** එය, මේ බුද්ධාදී උතුමන්ට, තං ඉදං අරියානං - තං ඉදං අනුනාසික ඉ කාරය ලොප්කොට කියන ලදී. **එතං මුසා** එය සදා පවතී යැයි දැඩිව සිතාගැනීමද බොරුවකි. එය එසේ නොවේ. නැවත **යං** යනුවෙන් නිවන සඳහා කීහ. එහිද ලෝකයා විසින් රූප, වේදනා ආදිය නොමැති බැවින් **ඉදං මුසා** කිසිත් නැතැ'යි **උපනිජ්ඣායිතං තදමරියානමෙතං සච්චං** බුද්ධාදී උතුමන්ගේ මෙම කෙලෙස් රහිත බව යහපත් බවත්, දුක පිළිකෙව් කරන ලද බැවින්, සැපවත් බවත්, අසීමිත සන්හුන් බවින් නිසලතාව මෙන්ම, (ලොවුතුරු බවින්) ඉවත් නොවන පරම ඇත්ත, **යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං - අනත්තනි අත්තමානි** තමා කෙරෙහි නොවන නාමරූපය තමාට අයත් යයි සළකා **සච්චන්ති මඤ්ඤති** මෙම නාමරූපය සදා පවතී යන්න 'ඇත්තක් සේ හඟිති. **යෙන යෙන හි** යම් යම් රූපයක හෝ වින්දනයෙහි හෝ 'මගේ රුව, මගේ (පහස) ආදී විදීම් ලෙසින් **මඤ්ඤන්ති, තතො තං** එසේ කල්පනා කරන ලද ආකාරයෙන් ඒ නාමරූපය **හොති අඤ්ඤථා** ඊට හේතු කිමෙක්ද? **තං හි තස්ස මුසා හොති** එසේ කල්පනා කරන ලද ආකාරයෙන් ඒ නාමරූපය බොරුවකි. 'එහෙයින් වෙනස් වේ'යැයි තේරුමයි. 'බොරුවක් වන්නේ කවර හෙයින්ද? **මොසධම්මං හි ඉත්තරං** යම් ලෙසකින් ඉතා මඳව හෝ

නාම රූප එබඳු යැයි එසේ කල්පනා කරන්නේ නම්, වනසන ගතියකි. (කරුණු වරදවා ගැනීමකි.) **සච්චාභිසමයා** ඇති තතු ඒ අයුරින් අවබෝධයයි. ඉතිරි කරුණු පෙර කී පරිදිය.

දහසයවන වාරයෙහි යං යනුවෙන් සය ආකාර වූ ඉටු අරමුණු සඳහා කියන ලදී. එහිදී ලෝකයා විසින් පළගැටියෙකු පහන් ආලෝකයට, මසෙකු බිලී කොක්කට, වඳුරෙකු ලේපයකට ඇලෙන සේ (කටයුතු කරනු ලබයි.) **එතං සුඛංනති උපනිජ්ඣායිතං, තදමරියානං එතං දුක්ඛං** බුද්ධාදී උතුමන් 'කාමයන් විසිතුරුය, මිහිරිය, සිත්ගනී, නියම ගති වෙනස්කොට දක්වා සිත කළඹතැ'යි, 'කාමා හි චිත්‍රා මධුරා මනොරමා, විරූපරූපෙන මථෙනති චිත්තං ආදී ලෙසින් එහි දුක උපදවන බව පැහැදිලි කරනු ලබයි. **යථාභූතං සම්මපඤ්ඤාය සුද්දිට්ඨං** නැවතත් **යං** නිවන සඳහාම කීහ. එහිදී ලෝකයා විසින් කැමති වින්දන නොලබනවිට **දුක්ඛනති උපනිජ්ඣායිතං තදමරියානං** බුද්ධාදී උතුමන් එය 'ඒකාන්ත සැපයකැ'යි. **එතං සුඛං** ඇති සැටියෙන් **භූතං සම්මපපඤ්ඤාය සුද්දිට්ඨං, කෙවලා** හුදෙක්ම, **ඉට්ඨා** කැමති දේ, පතන ලද දේ, **කනතා** සතුට ගෙනෙන, **මනාපා** එයින් සිත පුරවාලන, **යාවතත්ථීති වුච්චති** යම්තාක් ඒ සයආකාර වූ අරමුණු 'ඇතැ'යි කියනු ලබයි. මෙහි වචනයෙන් දක්වන භාවිත අදහස දතයුතුය. **එතෙ වො** ඒවායෙහි 'වො' යනු නිපාතයකි. **සුඛනති දිට්ඨං අරියෙහි සක්කායසස උපරොධනං** බුද්ධාදී උතුමන් විසින් ඛන්ධපසෙහි අවසානය සැපයකැයි දක්නා ලදී. නිවන ගැන මෙයින් කියා ඇත. **පච්චනීකමිදං හොති** මෙය නොගැලපෙන අදහසකි. **පසසතං** නිවැරදිව දකින තැනැත්තන්ට, 'පණ්ඩිතයෝ' යැයි කියන ලදී. මෙහි යං පරෙ යන ගාථාවෙහි **යං** යෙදුනේ කැමැත්ත ඇතිකරන දේවල් සඳහාය. නැවත **යං පරෙ** යයි සඳහන් වන්නේ නිවන යි. **පසස** යනුවෙන් අසන්නන් අමතයි. **ධම්මං** නිවන් දහම, **සම්පමූළෙහෙත්ථ විද්දසු** දැනුම් තේරුම් නැත්තෝ මේ කරුණෙහි මුළා වූ බැවින් නොදනිති.

**නිවුතානං තමො හොති අන්ධකාරො අපසසතං** ඒ පුද්ගලයෝ නොදැනීමෙහිම වෙලී, එයටම නතුව, ආලෝකය නොදැක, අඳුරේම වෙති. ඔවුන්ට නිවන් දහම දැකිය නොහැකිය. **සතඤ්ච විවටං හොති ආලොකො පසසතාමිව** යහපත් මිනිසුන්ට ආලෝකය පෙනෙන්නාක් මෙන්, ආවරණය නොවූ නිවන නුවණින් දකී. **සනතිකෙ න විජානනති මගා ධම්මසස කොවිදො** සසර ගමනේ යෙදෙන මිනිස්සු තම සිරුරෙහි

කෙස් සිට සම දක්වා වූ කොටස් පහ පමණක් වෙන්කොට නොසළකා, ඒ අනුව තම ඇතුළතින්ම (තමා වෙතින්ම) අවබෝධ කරගත යුතු, තම සිරුර තුළම හෝ තමා ළඟම නිවන තිබුණද ඒ බව නොදනිති. මගග ධම්මසස දහම හෝ දහම් මගෙහි හෝ යෙදීමට අසමත් වූවන්, හැමවිටම භව රාගයෙහි අවබෝධයක් නොමැතිව, මාරධෙය්‍යානුපනෙනහි තුන් භවයෙහිම ඉපදෙමින්, අවසන් ගාථාව හා සම්බන්ධයි. මෙසේ අවබෝධ නොකරන්නවුන් අතර බුද්ධාදී උතුමන් හැර නිවන්පදය දැනගැනීමට අන් කවරෙක් වේද? අරහති, යං පදං සිවුවන උතුම් මගෙන්, සමමදඤ‍ඤාය අත්තරතුරම, අනාසවා කෙලෙස් ගිනි නිවීමෙන් පරිනිබ්බනති මැනවින් පිරිසිඳ දැන, කෙලෙසුන්ගෙන් මිදී, අනතුරුව නැවත ඉපදීමට ඇති හේතු අවසන්කොට පිරිනිවන්පාති යැයි අරහත්බව කුළුගන්වා දේසනය නිමකළහ.

අතතමනා සතුටු සිතින්, අභිනන්‍දුනති සතුට පළ කළහ. ඉමසමිං ඛො පන වෙය්‍යාකරණෙ මේ කරුණු දහසයක් පැහැදිලි කිරීමේදී, භඤ‍ඤමානෙ කියන විට, ඉතිරි වචන අරුත් පැහැදිළිය. මෙසේ දහසය වරකදී සියළු කරුණු පැහැදිලි කළවිට, හැටනමක්, හැටනමක් බැගින්, නවසිය හැටනමක්, අනුපාදාය ආසවෙහි චිතතානි විමුචචිංසු හතර බැගින් දහසය වාරයක්ම,. හැටහතර වරක්ම, දහම් අවබෝධය හා කෙලෙස් දුරුකරනු පිණිස සිවුසස් දහම දේසනා කරනු ලැබීය.

ද්වයතානුපසසනා සූත්‍ර විස්තරය නිමි.

මහාවගග නම් වූ තුන්වන කොටස නිමියේය.

# 4.1

කාමං කාමයමානසස කාම සූත්‍රයයි. මෙම සූත්‍ර දේසනයට හේතුව කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවසන කල එක්තරා බමුණෙක් සැවැත්නුවරටත්, ජේතවනාරාමයත් අතර, අචිරවතී ගංතෙර, 'යව වපුරමි'යි සිතා කෙතක් සී සායි. භාග්‍යවතුන් වහන්සේ, භික්සඟන පිරිවරා පිඬු පිණිස යද්දී, ඒ දැක, විමසා බලනවිට, 'මේ බමුණාගේ යව අස්වනු වැනසෙන්නේ'යැයි දුටහ. නැවතත් විමසා බලද්දී, බමුණාට සෝවාන් පල ලැබීමට හේතු සම්පත් ඇති බවද දැක, 'කවදා ඊට පැමිණෙන්නේදැ'යි විමසද්දී, 'අස්වනු වැනසුනු පසු, කණගාටුවෙන් පසුවෙද්දී, දහම් අසා' යයි ද දුටහ. 'එදිනටම මම බමුණා කරා යන්නෙම් නම්, ඔහු මගේ අවවාද නො ඇසිය යුතු'යැයි සිතන්නේය. බමුණෝ නම් නොයෙක් රුචි ඇත්තාහ. එබැවින්, අද සිටම එහි ගොස්, ඔහුට උපකාර වෙමි, මෙසේ මා කෙරෙහි මුදු සිත් ඇතිව, එදිනට මගේ අවවාද අසන්නේ'යැයි සිතා, බමුණා ළඟට ගොස්, 'බමුණ, කුමක් කරන්නෙහිදැ'යි ඇසූහ. බමුණා ද 'මෙබඳු උසස් කුලීන ගොතම මහණද මා සමග කතා කරති'යි එපමණකින්ම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහන් සිත් ඇතිව, 'ගොතමයනි, කෙත සීසාමි, යව වපුරමි'යි කීවේය. ඉක්බිති සැරියුත් හිමි ද 'භාග්‍යවතුන් වහන්සේ බමුණා සමග පිළිසඳර කතා කළහ. හේතුවක් නැතිව තථාගතයන් වහන්සේලා එසේ නො කරති. මම ද බමුණා සමග කතා කරමි'යි සිතා ඔහු කරා ගොස් කතාබහ කළහ. මෙසේ, මහ මුගලන් හිමි ද, අසූමහා සව්වන් ද පිළිසඳර කතා කරද්දී බමුණා බොහෝ සෙයින් සතුටුවිය. මේ අතර, භාග්‍යවතුන් වහන්සේ, අස්වනු පැසෙන කාලයේදී, දිනක් වැළඳීමෙන් පසු සැවැත් නුවරින් ජේතවනාරාමයට වඩිනා මගින් ඉවත්ව, බමුණා ළඟට ගොස්, 'බමුණ, ඔබේ යවකෙත සරු'යැයි කීහ. 'එසේය, පින්වත් ගොතමයනි, කෙත සරුය. අස්වනු නෙලාගත් පසු ඔබටද තෑගි කරන්නෙමි'යි කීය. සිවුමසක් ගත වූ පසු යව පැසිණ. බමුණ, 'අද හෝ හෙට හෝ කපන්නෙමි'යි ඊට අදාල කටයුතු ගැන සිතා සිටියදීම, මුළු රැයක්ම පුරා වූ මහා වැස්සකින් අචිරවතී ගඟ උතුරා, මුළු යව කෙතම යටවිය. බමුණා මුළු රැයෙහිම නොසතුටු වී, පහන් වූ කල ගංතෙරට ගොස්, කෙතට වූ විපත දැක, 'මම නැසුණෙමි, දැන් කෙසේ ජීවත් වන්නෙම්දැ'යි බලවත් සේ සෝක විය. භාග්‍යවතුන් වහන්සේ ද ඒ රැයෙහි අළුයම් කාලයෙහි බුදුඇසින් ලොව බලද්දී, 'අද

බමුණාට දහම් දෙසීමට සුදුසු කාලය බව දැන, පිඬු හැසිරෙමින්, සැවැත් නුවරට පිවිස බමුණාගේ ගෙය දොරකඩ සිටියහ. භාග්‍යවතුන් වහන්සේ දුටු බමුණා 'සෝකයෙන් පෙළුණු මා අස්වැසීමට සමණ ගොතමයන් පැමිණ ඇතැ'යි සිතා අසුනක් පනවා, පාත්‍රය ගෙන, උන්වහන්සේ හිඳවූයේය. භාග්‍යවතුන් වහන්සේ, 'ඇයි බමුණ නොසතුටු සිතින්?'යැයි ඇසූහ. 'එසේය, පින්වත් ගෝතමයනි, මගේ යවකෙත මුළුමනින්ම වතුරෙන් යටව වැනසුනේ යැයි කීය. එවිට භාග්‍යවතුන් වහන්සේ 'බමුණ, විපත් වූ කල දොම්නසත්, ඉටු වූ කල සතුටු වීමත් නොකළ යුතුයි. කැමති වන දේ - බලාපොරොත්තු අලාභ ගෙන දෙයි. සමහරවිටක ඉටුවෙතැයි පවසා, ඒ බමුණාගේ සිත දහම් දේසනයට යොමුවීමට තරම් සුදුසු බවට පත්වූ විට, මේ සූත්‍රය වදාළහ. කෙටියෙන් එහි වචන තේරුම් පමණක් කියන්නෙමි. විස්තර නිදෙදසයෙහි දක්වා ඇති පරිදි දතයුතුය. එය මෙම සූත්‍රයට මෙන්ම, මින් පසු දැක්වෙන සියලුම සූත්‍රවලටම අදාල වේ.

**කාමං** තුන් භවයෙහිම උපන් සත්වග කැමති වන, සිත ඇළුම් කරන, රූප ආදී දේවල්, **කාමය මානසස** බලාපොරොත්තු වන කෙනෙකුට, **තසස චෙ තං සම්ජඣති** එසේ කැමති වූ තැනැත්තාට ඒ කැමති දේ ලැබී බලාපොරොත්තු ඉටු වේද, අදධා **පීතිමනො** හොති නිසැකවම සතුටු සිත් ඇත්තේ වෙයි. ලදධා ලැබී, මචෙචා පුද්ගලයා, ජීවියා, **යදිචඡති** කැමති යම් දෙයක්, **තසස චෙ කාමයානසස** ඒ කැමැත්ත ඉටුවන පුද්ගලයාට, **ඡඤජාතසස** හටගත්තා වූ තණ්හාව, **ජනතුනො** මිනිසාට-ජීවියාට **තෙ කාමා පරිහායනති** එසේ කැමති දෙය නැතිවූ විට - නොලැබුණු විටද, **සලල විදෙධා රුපපති** ඉක්බිති යකඩ උලකින් විදිනු ලැබූසේ පෙලෙයි.

තුන්වන ගාථාවෙහි කෙටි අරුත නම්, යො මේ (කියන ලද) **කාමෙ** කැමැත්ත - ඡන්දරාගය යටපත් කිරීමෙන් හෝ තම පාදයෙන්, **සපපසස සිරං** මෙන්, සො මහණ මුළු ලොවෙහිම (නොඇලී) ඇත්ව සිටි බැවින්, **ලොකෙ විසතතිකා** එසේ හඳුන්වනු ලබන තණ්හාව, සතො (සිහි ඇති)ව, **සමතිවතති.**

**මින්පසු** දැක්වෙන ගාථා තුනෙහි මේ කෙටි අරුතයි. යො ඒ හැල් කෙත් **ඛෙතතං** ආදී හෝ, නිවාස-වතුපිටි සම්පත් හෝ, කහවණු හෝ අමු රන්, ගවයන් අසුන් ආදී ලෙසින් **ගවාසසං** කාන්තාවන් හෝ **ථීයො** වා,

නෑදෑ සබඳතාදී බන්ධු වෙනත් සතුට දනවන රූපාදිය පුද්ගලයා දුබලයකු බවට පත්කරන කෙලෙස්, **බලීයනති** යටත් කරති. පාගා දමති. සැදැහැ ආදී බලය නැතිවීමෙන් ඒ තැනැත්තන් **අබලා**, කෙලෙස්වලින් **බලීයනති** දුබල බැවින් පෙළනු ලබතියි අරුතයි. **තං** එවිට ඒ කැමැත්තෙහිම ගැලුනු, කැමැති දෙයම රැකගැනීමේදී සිංහයන් ආදී සතුන්ගෙන් වන පැහැදිලිව පෙනෙන උවදුරුවලින්ද, කයෙහි දුසිරිත්හි යෙදීමෙන් නොපැහැදිලි, නොපෙනෙන උවදුරුවලින්ද මඩිති. **තතො** පැහැදිලිව නොපැහැදිලි, නොපෙනෙන උවදුරුවලින්ද මඩිති. **තතො** පැහැදිලිව නොදකින උවදුරුවලින් මඩනා ලද **තං** පුද්ගලයා ඉපදීම ආදී දුකඛකඛව භිනනං නාවං උදකං මෙන් **අන්වෙති, තසමා** කයෙහි ඇති තතු භාවනා ආදියෙන් සිහියෙන් දකින, **ජනතු** සදා **සතො** මැඩපැවැත්වීම හෝ මුළුමනින්ම රූපාදී දේවල් කෙරෙහිද හැම ආකාර වූ ඡන්දරාගාදී කෙලෙස් කැමති බවද දුරුකරමින් **කාමානි පරිවජජයෙ. මෙසේ තෙ** ඒ කාමයන් **පහාය** ඒවා නැතිකරන ලද ආකාරයටම සතරාකාර වූ, **තරෙ** ඔඝං එතර වන්නේය. එතරවීමට හැකිවන්නේය. ඒ අනුව යම් මිනිසෙක් ජලයෙන් පිරුණු **නාවං සිඤ්චිත්වා** නැවෙහි සැහැල්ලු බවෙන් නොබෝ කලකින්ම **පාරගු** එතරට යන්නේය. එසේම තම ජීවිතය නැමති නැවෙහි පිරී ඇති කෙලෙස් නැමති ජලය හිස්කොට සැහැල්ලු ජීවිතයෙන් (සසර) එතර වන්නේය. සියළු දෙයින්ම එතරට ගිය නිවනට ගියේ වෙයි. අරහත් බවට පත්වන්නේය. මතු සසර නොඉපදෙන සේ අනුපාදිසෙස නිවනින් පිරිනිවන් පාන්නාහ'යි අරහත් බව කුළුගන්වමින් දේසනය නිමකළහ. දේසනය අවසන බමුණාද බැමිණියද සෝවාන්පලෙහි පිහිටියහ.

කාමසූත්‍ර විස්තරය නිමි.

## 4.2

**සතෙතා ගුහායං** ගුහට්ඨක සූත්‍රයයි. මෙම සූත්‍රය දේසනා කිරීමට හේතුව කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවසද්දී ගරුකටයුතු පිණ්ඩෝල භාරද්වාජ හිමි කොසඹෑ ගංඉවුරෙහි ජල වනය නම් උදේන රජුගේ උයනෙහි සිහිලැල් පෙදෙසෙහි දිවාකාලය ගතකරනු කැමතිව

එහි ගියේය. වංගීස සූත්‍ර විස්තරයෙහි දී කියා ඇති පරිදි ගවම්පතී තෙරුන් තව්තිසාවට වඩිනා සේ, පිණ්ඩෝල භාරද්වාජ හිමි ද පෙර පුරුද්ද පරිදි - වෙනත් දිනවල මෙන්, එදිනද එහි ගොස් ඇත. භාරද්වාජ හිමි, ගංතෙර රුක්මුලක හිඳ දිවා විහරණය පිණිස සමවතට පැමිණියේය. උදේන රජුද එදිනම උයන්කෙළියට ගොස්, බොහෝ සේ නැටුමෙන්, ගීතයෙන් දවසෙන් වරුවක්ම ගතකොට, පානය කළ දෙයින් මත්ව, එක් කාන්තාවකගේ ඇකයෙහි හිස තබා නිදා ගත්තේය. අනෙක් කාන්තාවෝ 'රජ නිදි' බැවින් උයනෙහි මල්පල ආදිය නෙලමින් සිටියදී තෙරුන් වහන්සේ දැක, ලජ්ජා බය ඇතිව, 'නිහඬ වෙව'යි එකිනෙකා වළකා, නිහඬව එතැනට එළඹ උන්වහන්සේ පිරිවරා හිඳගත්හ. තෙරුන්වහන්සේ, සමවතින් නැගිට, ඔවුනට දහම් දෙසූහ. කාන්තාවෝ සතුටට පත්ව 'සාධු සාධු' නද පවත්වමින් දහම් අසති. තම ඇකයෙහි රජු හිස තබාගෙන සිටි කාන්තාව, 'මොවුන් මා හැරදමා කෙළිදෙලින් සිටිති'යි ඉසියෙන් යුතුව (තම) කලව සොලවා රජු පිබිදවූවාය. රජු (අනෙක්) කාන්තාවන් නොදැක, 'මේ වසලියන් කොහිදැ'යි ඇසීය. 'ඔබවහන්සේට උදව් නොවී, මහණකු සතුටු කරන්නාහ'යි කීවාය. රජු කිපී තෙරුන් හමුවට ගියේය. ඇතැම් කාන්තාවෝ රජු දැක නැගී සිටියහ. ඇතැම් කාන්තාවෝ 'මහරජ, අපි පැවිදි කෙනෙකුගෙන් දහම් අසන්නෙමු'යි නොනැගී හුන්තැනම සිටියහ. රජු එයින් වඩාත් කිපී තෙරුන් වහන්සේට නොවැඳම, 'කුමක් නිසා පැමිණියේදැ'යයි ඇසීය. 'මහරජ, විවේකය පිණිස'යැයි තෙරුන්වහන්සේ පිළිතුරු දුන්හ. රජු 'විවේකයට අවුත්, මෙසේ කාන්තාවන් පිරිවරාගෙන ඇත, ඔබේ විවේකය මට කියව'යි කීය. 'විවේකය පිළිබඳව පහදා දීමට හැකි වුවද මොහු විමසන්නේ දැනගැනීමට නොවේ'යැයි දන්නා තෙරණුවෝ නිහඬ වූහ. 'නොකියන්නෙහි නම්, දිමියන් ලවා කවවන්නෙමි'යි කී රජු, එක් අසෝක ගසෙක තිබුණු දිමිගොටුවක් (ඉවතට) ගැනීමේදී තමා මත්තෙහිම විසිරුණි. රජු ඇඟ පිසදා, වෙනත් දිමිගොටුවක් ගෙන, තෙරුන්වහන්සේ ඉදිරියට ගියේය. ගවම්පතී තෙරුන්වහන්සේද, 'රජතුමා මට අපරාධයක් කරන්නේ නම්, අපා දොරටුවෙහි සිටින්නේ'යැයි ඔහුට අනුකම්පාවෙන්, ඉඳු බලයෙන් අහසට නැගී ගියහ. එවිට කාන්තාවෝ, 'රජතුමනි, වෙනත් රජවරුන් නම් මෙබඳු පැවිද්දකු දැක, මල්සුවඳ ආදියෙන් පූජා කරති. ඔබතුමා දිමිගොටුවකින් හිරිහැර කිරීමට සූදානම් විය. කුල පරම්පරාවේ සිරිත් වැනසීමට කටයුතු කරන ලදැ'යි කීහ. රජු තම වරද දැක නිහඬව, 'වෙනත් දිනකදී ද තෙරුන්වහන්සේ මෙහි එන්නේදැ'යි උයන්පල්ලාගෙන් ඇසීය. 'එසේය, මහරජ' උයන්පල්ලා කීවේය. 'එසේනම්

පැමිණිවිට මට දැනුම්දෙව'යි කීය. එක්දිනක තෙරුන් වහන්සේ උයනට පැමිණිවිට, රජුට දැන්වීය. රජු ද තෙරුන්වහන්සේ වෙත එළඹ, පැන විමසා දිවිහිමියෙන් (තෙරුවන්) සරණ ගියේය.

දිම් ගොටුවෙන් හිරිහැරයට පත් තෙරුන්වහන්සේ එදින අහසින් ගොස් නැවත පොළවෙහි ගිලී, භාග්‍යවතුන් වහන්සේ වැඩවසන සුවඳ කුටියෙන් මතු වූහ. භාග්‍යවතුන් වහන්සේ මනා සිහිනුවණින් යුතුව, දකුණුපසට හැරී, සීහ ඉරියවුවෙන් සැතපී සිටි අතර, ගවම්පතී තෙරුන් දැක, 'භාරද්වාජ කිම? අකාලයෙහි පැමිණියෙහිදැ'යි ඇසූහ. 'එසේය භාග්‍යවතුන් වහන්ස' කියා සියළු තතු සැළ කළහ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ, 'ඔහුගේ විවේක කතාව' නම්, කාමයෙහි ගැලීම' යයි කියා දකුණු ඇලයෙන් හිඳිමින්ම, තෙරුන්වහන්සේට දහම් දෙසනු පිණිස මේ සූත්‍රය වදාළහ.

එහි **සත්තො** ඇලුනු තැනැත්තා **ගුහායං** සිරුරෙහි, රාගාදී සෙලවීම්වලට සිරුර තුල වාසය කිරීමට ඉඩ ඇති නිසා, 'ගුහා' යැයි කියනු ලැබේ. **බහුනාභිජනෙනා** හටගත්තා රාගාදී බොහෝ කෙලෙස්වලින් මනාව වැසුනේ, මෙයින් තමා (නොදැනුවත්වම) බැම්වලින් හිරකර ඇති බව පවසන ලදී. **තිට්ඨං** රාගාදි (සිතිවිලිවල) පිහිටා සිට, **නරො** මිනිසා **මොහනසම්ං පගාළෙහා** කාමයන්හි ඇති ගති සොබාවනට 'මොහනය' යැයි කියනු ලැබේ. එහිදී දෙවියෝද, මිනිස්සුද මුළාවෙති. ඒවායෙහි දැඩිසේ වෙළී, ඇතුලට බැස, එයින් බාහිරව ඇති බැඳීම් කියන ලදී. **දූරෙ විවෙකාහි තථාවිධො සො** එබඳු මිනිසා කාය විවේකාදී තුන් ආකාර විවේකයෙන් ඈත්වේ. ඊට හේතු කුමක්ද? **කාමා හි ලොකෙ න හි සුපපහායා** ලෝකයෙහි කාමයන් පහසුවෙන් අත්හළ නොහැකි බැවිනි.

මෙසේ පළමු ගාථාවෙන්, 'එබඳු තැනැත්තා විවේකයෙන් ඈත්වේ' යැයි පහදා දෙමින්, නැවත එබඳු පුද්ගලයන්ගේ ගති සොබාව ඉච්ඡා නිදානා යන ගාථාවෙන් වදාළහ. **ඉච්ඡා නිදානා** තණ්හාව හේතුකොට, **භවසාතබද්ධා** සැප වේදනාදියෙන් සසරෙහි ඇළුම් ඇති, **තෙ දුපපමුඤ්චා** ඔව්හූ සසර ඇළුම් වඩන කටයුතුවල යෙදෙමින්, එහි බැඳී කැමැත්තටම ආසාවටම ඉඩදෙමින් මිදිය නොහැකිව සිටිති. **න හි අඤ්ඤමොක්ඛා** අන් කෙනෙකු විසින් ද එයින් මුදවා ගැනීමට නොහැකි වෙති. ඒ තැනැත්තන් මුදවා ගැනීම අපහසුය. කවර හෙයින්ද? වෙනත් කෙනෙකුන් විසින්ද

මුදවා ගත නොහැකි හෙයිනි. යම් ආකාරයෙන් මිදෙන්නාහු නම්, තම උත්සාහයෙන්ම මිදිය යුතුයැයි මෙහි අරුතයි. **පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා** අනාගතයෙහි හෝ අතීතයෙහි හෝ තමා කැමති දේ පතමින්, **ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං** දැන් පවතින කැමැත්ත - කාමයන් ගැනද කලින් පැවති හෝ අතීතයේ හා අනාගතයෙහි ද දැඩිසේ ආසාවෙන් පතමින් මේ වචන දෙක (මුලදී සඳහන්) 'තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා' යන පද සමග සම්බන්ධ වන බව දතයුතුය. අනෙක් තැනැත්තෝ ඒවා ගැනම පතමින්, 'ඊට කුමක් කරත්ද? කළේ කුමක්දැ'යි කියමින් (කාමයෙහි) අවසානයක් නොලබති.

මෙසේ පළමු ගාථාවෙන් 'එබඳු තැනැත්තා විවේකයෙන් ඈත් වේයැයි පහදා දෙමින්, දෙවන ගාථාවෙන් ද ඔවුන්ගේ ගති සොබාව පළකොට, දැන් ඔවුන්ගේ අයහපත් කටයුතු හෙළිකරමින්, 'කාමෙසු ගිද්ධා' යන ගාථාව කීහ. එහි අරුත නම්, **තෙ** ඒ තැනැත්තෝ (සියළු) සත්තු, **කාමෙසු** ඒ ඒ දේ පරිහරණයෙහි ආසාවෙන් (වෙළී) ගිද්ධා, ඒවා ඉටුකර ගැනීමට මග-උපාය සොයමින් **පසුතා** දැඩි මුලාවට පත්වන බැවින් **පමූළ්හා**, වංචා සහගත සිතින්, මසුරු බවින්, බුදුවරු ආදීන්ගේ අවවාද පිළිනොගන්නා හෙයින් ද **අවදානියා** කයින්-(වචනයෙන්) නපුරු වැරදි කරමින්, අවසාන කාලයෙහි මරණ (මොහොතේදී) **දුක්ඛූපනීතා** **'කිංසු භවිස්සාම ඉතො චුතාසෙ'** යනුවෙන් **පරිදෙවයන්ති** එහෙයින් ඒ කටයුතුවලදී 'හික්මෙවු'...........යැයි පැනවත් උතුමෝ කීහ. **සික්ඛෙථ** තුන් ආකාර වූ හික්මීමට පැමිණෙවු, **ඉධෙව** මේ සසුනෙහිදීම, ඉතිරි වචන ගැන කලින් දක්වා ඇති පරිදිය.

මීළඟට එසේ කටයුතු නොකරන තැනැත්තන්ගේ වැනසීම දක්වමින් 'පස්සාමි' යන ගාථාව කීහ. **පස්සාමි** මසැස් ආදියෙන් දකිමි. **ලොකෙ** අපාය ආදී තැන්හි, **පරිඵන්දමානං** එහා මෙහා දඟලන, (කම්පාවන) **පජං ඉමං** මේ සත්වග, **තණ්හාගත** තණ්හාවෙන් දැඩිසේ වෙළී - එයින්ම වැටුණු (බේරීමට නොහැකිව) **භවෙසු** කාම ආදී භවයන්හි, **හීනා නරා** පහත් කටයුතුවල යෙදෙන මිනිස්සු, **මච්චු මුඛෙ ලපන්ති** අවසාන කාලය පැමිණිවිට මරණය හමුවේ වැළපෙති. **අවීත තණ්හාසෙ** තණ්හාවෙන් ඈත් නොවී, **භවාභවෙසු** කාම ආදී භවයන්හි, නැතහොත් නැවත, නැවත (උපත ලබන) භවයන්හි යැයි කියන ලදී.

තණ්හාව ඉවත් නොකරන ලද බැවින් (ඔව්හු) මෙසේ කම්පා වෙති. හඬා දොඩති. එහෙයින්, තණ්හාවෙන් ඈත්වීමට - ඒ ගැන යම් හික්මීමකට යොමු කරමින්, මීළඟට 'මමායිතෙ' යන ගාථාව කීහ. **මමායිතෙ** ආසාවලින් හා දැඩිව ගත් හැඟීම්වලින් (තණ්හා දිට්ඨිවලින්) 'මම-මගේ' යැයි ඒ ඒ දේවල් කෙරෙහි දැඩි බැඳීම, **පසසථ** අසන්නා අමතමින් කියයි. **එතමපි** මේ ආදීනවය, ඉතිරි කරුණු පැහැදිළිය.

මෙසේ මෙහි පළමු ගාථාවෙන් (කාමයන්හි) 'වින්දන රසය'ද, ඉන්පසු ගාථා සතරෙන් එහි ආදීනවද දක්වා, මීළඟට එයින් නිදහස් වීම හා ඉන් ලබන යහපත් පලයද, පැහැදිලි කිරීමටත්, ඒ කාමයන්හි පහත් ලාමක බව, කෙලෙස් සහගත බව නිසා එයින් ඈත්වීමේ වැදගත්කමත්, උභොසු අනෙතසු යන ගාථා දෙකකින් වදාළහ. **උභොසු අනෙතසු** පහස, පහසට හේතු ආදී කොටස් දෙකෙහි, **විනෙය්‍ය ඡන්දං** ඡන්දරාගය දුරුකොට, **ඵස්සං පරිඤ්ඤාය** ඇස ලබන පහස, ඒ පහස අනුසාරයෙන්, ඒ හා බැඳුණු රූපී නොවන හඬ ආදී සියළු දේ ගැටෙන දොරටු තැන් හා අරමුණු ද නාමරූප සියල්ලම තුන් ආකාරයෙන් මනාව දැන, **අනනුගිද්ධො** රූපාදී සියළු දෙයෙහි ගිජු නොවී, **යදත්තගරහී තදකුබ්බමානො** තමන්ට ගැරහුම් ලබන දේවල් නොකරමින්, **න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො** ඒ මෙබඳු නුවණැත්තා දකින, අසන දේ පිළිබඳව දෙආකාර වූ ඇලීම්වලින් (තණ්හා දිට්ඨි) එකක්වත් තවරා නො ගනී. අහසෙහි කිසිවක් නොඇලෙන්නාක් මෙන් බෙහෙවින්ම පිරිසිදු බවට පැමිණේ.

සඤ්ඤං පරිඤ්ඤාති ගාථාවෙහි මේ කෙටි අදහසයි. පහස ගැන පමණක් නොවේ. හැඳිනීම් අනුසාරයෙන් කාමය දැන හඳුනාගැනීමද, නාමරූප ගැනද කලින් දැක්වූ පරිදි තුන් ආකාරයෙන් දැන, සතරාකාර වූ මේ පිළිවෙතින් **විතරෙය්‍ය ඔඝං** එයින් සැඩපහරින් එතරව, **පරිග්ගහෙසු** තණ්හා දිට්ඨි නම් වූ ආලේපයෙහි (නොතැවරී) තොරව, **අනුපලිත්තො** කෙලෙස් නැසූ මුනි, රාගාදී උල් උදුරා දැමූ බැවින් **අබ්බූළ්හසල්ලො**, සිහිය බොහෝකොට - නිරතුරුවම මැනවින් පවත්වා ගනිමින් **අප්පමත්තො චරං** (ජීවිත කාලයෙහි) පසු කලක හෝ නොපමාව කටයුතු කරමින්, රාගාදී උල් උදුරා දමා, මෙලොව පරලොව සේ ගෙන, **නාසිංසති ලොකමිමං පරඤ්ච** හුදෙක්ම අවසන් සිත නැති කිරීමෙන්, ඊළඟ භවයක අල්ලා ගැනීමක් නොමැතිව, ගින්න සේ පිරිනිවනට පත්වන්නේ යැයි අරහත් බව කුළුගන්වා දේසනය නිමකළහ. රහතන් වහන්සේ කෙනෙකුටම

කරන ලද දේසනයක් බැවින් තවදුරටත් දහම් කරුණු දැක්වීමක් මිස මගපල උපදවීමක් නොවීය.

**ගුහට්ඨක සූත්‍ර විස්තරය නිමි.**

# 4.3

**වදනති වෙ දුට්ඨමනාපි** දුට්ඨට්ඨක සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? මුල් ගාථාවෙන්ම එය සඳහන් වේ. මුනි සූත්‍රයෙහි ද දැක්වූ පරිදි භාග්‍යවතුන් වහන්සේට සහ සඟ පිරිසට ලද සිවුපස ලාභ සත්කාර ඉවසිය නොහැකි වූ වෙනත් සමයවාදීහු සුන්දරී පිරිවැජි යොදවා ගත්හ. ජනපදයටම සුන්දරියක් වූ ඇය, සුදුවත් හැඳ පිරිවැජියක් වූවාය. භාග්‍යවතුන් වහන්සේගෙන් දහම් අසා සැවැත්නුවර වාසීන් ජේතවනාරාමයෙන් නික්ම යන වේලාවට, ඇය මැනවින් දිය නා, හොඳින් හැඳපෙරවා, මල් සුවඳ විලවුන් දරමින් ජේතවනාරාමය දෙසට යන්නීය. මිනිසුන් 'කොහි යන්නෙහිදැ'යි විචාරන ලදුව, 'සමණ ගෝතමයන්ද, සව්වන් සමගද සැපවිඳ සතුටුවන්නට යමි'යි කියා, ජේතවන දොරකොටුව (අසළ) හැසිර, එය වැසූ කල, නගරයට පිවිස, උදෑසන ජේතවනාරාමයට ගොස් සුවඳ කුටිය ළඟ මල් සොයන්නියක මෙන් හැසිරෙන්නීය. බුදු උවැටනට ආ මිනිසුන් 'කුමක් නිසා පැමිණියෙහිදැ'යි ඇසූවිට කිසියම් දෙයක් කියන්නීය. මෙසේ අඩමසක් පමණ ගත වූ කල වෙනත් සමයවාදීහු ඈ මරා, දිය අගල අසළ වළලා, උදෑසනම 'සුන්දරී නොදුටුවෙමු'යි කලබලකොට, රජුටද දන්වා රජුගේ අවසරයෙන් ජේතවනාරාමයට අවුත්, සොයන්නාක් මෙන්, ඒ වැළලූ තැනින් පිටතට ගෙන, මැස්සක තබා නගරයට ගෙනවුත් නින්දා අපහාස කළහ. මේ විස්තර සියල්ල පෙළෙහි දක්වා ඇති අයුරින් දතයුතුය.

භාග්‍යවතුන් වහන්සේ, එදින අළුයම බුදුඇසින් ලොව බලත්ම, 'අන් සමයවාදීන් අද නින්දා උපදවති'යි දැන, ඔවුන්ගේ කීම අදහා, මා

වැනි (බුදු)කෙනෙකු කෙරෙහි සිත කෝපයෙන් පුරවාගෙන, මහජනයා අපායෙහි නොයේවා'යි (සුවඳ කුටියෙහි දොර වසා) කුටිය තුළම සිටියහ. පිඬු පිණිස නගරයට නොවැඩියහ. දොර වසා ඇති බව දුටු සංඝයා වහන්සේලා පෙර පරිදිම පිඬු පිණිස වැඩියහ. මිනිස්සු උන්වහන්සේලා දැක නොයෙක් ලෙසින් නින්දා කළහ. එවිට ගරුකටයුතු අනඳ හිමි, භාග්‍යවතුන් වහන්සේට ඒ පුවත සැළකොට, 'හිමියනි, අන් සමයවාදීන් මහත් නින්දා උපදවන ලදී. මෙහි විසීමට නොහැකියි. දඹදිව් විසාලයි. වෙනත් පෙදෙසකට යමු'යි කීය. 'ආනන්ද, එහිදීත් අපහාස ලදොත් කොහි යන්නෙහිද?' 'භාග්‍යවතුන් වහන්ස, වෙනත් නගරයකට' (අනඳ හිමි පැවසීය.) 'ඉවසන්න, ආනන්ද, අපහාස හඬ සත් දවසක් පමණි. සත් දිනකින් පසු, අපහාස කළ තැනැත්තන්ටම පෙරළා එනු ඇතැ'යි කියා, ආනන්ද හිමිට දහම් දෙසනු පිණිස 'වදනති වෙ' යන මේ ගාථාව වදාළහ.

වදනති භාග්‍යවතුන් වහන්සේටද, බික්සඟණටද දොස් නගති. දුට්ඨමනාපි එකෙ අථොපි වෙ සච්චමනාපි එකෙ ඇතමෙක් නපුරු සිතින්ද, ඇතමෙක් එය එසේයැයි සිතාගෙන, වෙනත් සමයවාදීන් දොස් නඟන්නේ නපුරු සිතිනි. (ඇතැම්හු) ඔවුන්ගේ වචන පිළිගත්හ. එය ඇත්ත යයි යන අදහසයි. වාදඤ්ච ජාතං එම අපහාස වචන කීම ඇරඹිණ. මුනි නො උපෙති බුද්ධ නම් වූ මුනිවරයා එසේ නොකරන හෙයින් ද, කෝප නොවන හෙයින් ද ඔවුන්ගේ මගට නොපැමිණෙත්. තසමා මුනී නත්‍ථි ඛිලො කුහිඤ්චි ඒ නිසා මේ මුනිවරයාට රාගාදී උල් නැත.

භාග්‍යවතුන් වහන්සේ මෙම ගාථාව කියා, 'ආනන්ද, මෙසේ දොස් නඟා අවමන් කරනු ලබද්දීත්, සංඝයා කුමක් කියත්දැ'යි විචාළහ. 'හිමියනි, කිසිවක් නොකියති.' 'ආනන්ද, මා සිල්වතෙක් යැයි' හැමවිටම නිහඬ විය යුතු නැත. මෝඩයන් සමග පණ්ඩිතයා (මෙබඳු) කතා නොකරන බව ලෝකයා දනී. ආනන්ද, සංඝයා ඒ මිනිසුන්ට පෙරළා කියත්වා'යි 'සිදුනොවූ - බොරු දේවල් සිදුවූවක් සේ පවසන තැනැත්තා නිරයට යයි.' අභූතවාදී නිරයං උපෙති යන ගාථාව වදාළහ. ආනන්ද හිමි ද එය ඉගෙන 'ඔබලා විසින්, ඒ මිනිසුන්ට මේ ගාථාවෙන් පිළිතුරු දිය යුතු'යැයි පැවසීය. සංඝයා වහන්සේලා එසේ කළහ. දැනුම් තේරුම් ඇත්තෝ නිහඬ වූහ. රජතුමාද ඔහුගේ මිනිසුන් හැමදෙසටම යවා, වෙනත්

සමයවාදීන් - තීර්ථකයන් විසින් සළෙලුන්ට අල්ලස් දී ඇය මරවන ලද බවත්, ඒ මගින් අපහාසූ කරන ලද බවත් ඔවුන්ගෙන් දැන, ඒ තීර්ථකයන්ට අවමන් කළේය. මිනිස්සුද, 'භාග්‍යවතුන් වහන්සේට අවමන් කළේ'යැයි ඒ තීර්ථකයන් දැක කැටකැබලිතිවලින් ගසති. ඔවුන්ගේ සිරුරුවලට පස් විසිකරති. ඒ දුටු ආනන්ද හිමි භාග්‍යවතුන් වහන්සේට සැළ කළේය. එවිට 'සකං හි දිට්ඨිං -පෙ- වදෙය්‍යාසි යන ගාථාව ආනන්ද හිමිට වදාළහ. එහි තේරුම නම්, 'සුන්දරී මරා, සැකිකුල මහණුන්ට අයස ගෙන දී, ඒ මගින් (තමන්ට) ලැබෙන ගරුසත්කාර ඉවසමු'යි යන දැඩි හැඟීම, දැඩි අදහස ඉවත් කළහැක්කේ කෙසේද? ඒ අයස, අපහාස ඒ තීර්ථකයන් වෙතම ආපසු ආයේ නොවැළක්විය හැකි පරිද්දෙනි. යම් දෙයක් ඒ ආකාරයෙන්ම සදාකල් පවතීය යන හැඟීමෙන් **සකං දිට්ඨිං කථමච්චයෙය්‍ය** ඒ හැඟීම්වලට ඇති කැමැත්තෙන් **අනුනීතො**, ඒ හැඟීමෙහි **රුචියා නිවිට්ඨො** එහෙත් **සයං සමත්තානි පකුබ්බමානො** තමන්ම (සිත) පුරවාගත් ඒ හැඟීම් මතම කටයුතු කරමින්, **තථෙව වදෙය්‍ය**.

ඉක්බිති රජු සත් දිනකින් පසු, ඒ මළ සිරුර ඉවත්කරවා සවස් කල විහාරයට ගොස්, භාග්‍යවතුන් වහන්සේට වැඳ, හිමියෙනි, මෙවැනි අපහාසාත්මක දෙයක් ඇතිවූ විට, මටත් දැන්විය යුතු නොවේදැ'යි කීය. එවිට භාග්‍යවතුන් වහන්සේ, 'මහරජ, මම සිල්වත්, ගුණවත් වෙමි'යි අනුන්ට හැඟවීම බුදුවරුන් ආදීනට සුදුසු නොවේ' යැයි පවසා, එහි කරුණු පැහැදිලි කිරීම පිණිස, යො අත්තනො සීලවතානි ආදී ඉතිරි ගාථා වදාළහ. **සීලවතානි** පාමොක් සීලාදිය, වනවාසී වීම වැනි ධූතංග වත්, **අනානුපුට්ඨො** නොවිචාරන ලද්දේ, **පාවා** කියයි. **අනරිය ධම්මං කුසලා තමාහු යො ආතුමානං සයමෙව පාවා** මෙසේ යම් කෙනෙක් තමන් ගැනම තමාම කියයි ද ඔහුගේ ඒ කීම උසස් දෙයක් නොවේ යැයි ලෝකය පිළිබඳ තතු පිරිසිඳ දැකීමේ සමත් බුද්ධාදී උතුමෝ මෙසේ කියති. **සන්තො** රාගාදී කෙලෙස් සමනය කිරීමෙන් සන්හුන් බවට පත්, එසේම **අභිනිබ්බුතත්තො ඉතිහන්ති සීලෙසු අකත්ථමානො** 'මම සිල්වත් වෙමි'යි සීලය පිළිබඳ නොකියමින්, තමා කෙරෙහි පිහිටි සීලය ගැන වචනයකුදු කතා නොකිරීම මෙයින් කියන ලදී. **තමරිය ධම්මං කුසලා වදන්ති** එසේ කතා නොකිරීම උතුමන්ගේ දහමකැයි රූපාදි සමූහයන් පිළිබඳ පිරිසිඳ දත් බුද්ධාදී උතුමෝ පවසති. **යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ** කෙලෙසුන් නැසූ තැනැත්තන්ට රාගාදී සත්වැදෑරුම් ඉල්පීම්

කිසිවක් ලොව නැත. එය ගැන කතා නොකිරීම උතුමන්ගේ යහපත් ගතියකැයි යන අදහස හා සබැඳේ.

මෙසේ කෙලෙස් නැසූ උතුමන්ගේ පිළිවෙත පහදා මීළඟට දැඩි හැඟීම්වලින් යුතු වෙනත් සමයවාදී තීර්ථකයන්ගේ පිළිවෙත 'පකපපිතා සංඛතා' යන ගාථාවෙන් රජුට කීහ. පරිකල්පනය කරන ලද **පකුපපිතා** සිතාගන්නා ලද, සංඛතා නොයෙක් හේතු නිසා සකස් වූ, **යසසා** යම්කිසි දැඩිව ගන්නා ලද හැඟීම් ඇති තැනැත්තකුට, **ධමමා** අදහස් - හැඟීම් (මතිමතාන්තර) පූරකඛතා ඉදිරියට ගෙන, **සනති** පැහැදිලිව පෙනේ. අවිවදාතා කිලිටි වූ, **යදතතනි පසසති ආනිසංසං තං නිසසිතො කුපප** - පටිචච සනතං මෙබඳු හැඟීම් පෙරදැරිකොට, (කෙලෙසින්) කිලිටි වෙත්ද, එසේ තමා දැඩිකොට ගත් හැඟීම් නිසා - මෙලොවදී ගරු සත්කාර (වාසි සහගත දේ) සහ පරලොව යහපත් තැනක (භවයක) ඉපදීම හා සැප ආදියද බලා සිටියි. එහෙයින් එහි ලබන පල සහ එයින් ඇතිවන වෙනස්කම්ද එය ඇතිවීමට මුල්වන හේතු ද, ඒවාට ලැබී ඇති (සමාජමය) සම්මුති හෙවත් පිළිගැනීම් ද, ඇසුරුකොට ඒ හැඟීම්-කල්පනා පවතී. ඔහු එයට තදින් ඇසුරුකොට, එහි මුල්බැස ගත් බැවින්, තමා ගැන හෝ උසස් ලෙස හුවා දක්වන්නේය. නැති අගුණ කියමින්, නැති දොස් දක්වමින් අනුන් හෙළා දකින්නේය. මෙසේ මුල්බැස ගන්නා හැඟීම් සංකල්ප ඇසුරින් (යුතු තැනැත්තා විසින්) **දිටඨිනිවෙසා -පෙ- ආදියතිච ධමමං** (යැයි දක්වා ඇත.)

දිටඨි නිවෙසා මේ මේ දෙය ඇත්ත යයි මුල්බැස ගන්නා ලද හැඟීම්, න හි සවාතිවතතා ලෙහෙසියෙන් අත්හළ නොහැකිය. **ධමෙමසු** නිචෙඡයා සමුගගහීතං දෙසැටක් වැරදි හැඟීම්වලින් ඒ ඒ දේ වැඩියෙන් සිතට ගෙන, කටයුතු කිරීමේදී ඒ මුල්බැස ගත් හැඟීම් ඉවතලීම පහසු නොවේ යැයි කියන ලදී. **තසමා නරො තෙසු නිවෙසනෙසු නිරසසති** ආදියතිච ධමමං එසේ අත්හළ නොහැකි බැවින්, ඒ හැඟීම්වල මුල්බැස ගනිමින්, එළුවන්, ගවයන්, බල්ලන්ගේ ඉරියව් අනුව පිළිපදිමින් ද, අව්ව තැපීම, (දෙපා මත) ඇන බා හිඳීම, කටු මැස්සක හිඳීම වැනි දෙයින් ද, සත්දවසක් (වේද වැකි) ආදිය කියවීම වැනි දේ වරෙක පිළිගනිමින් ද, තවත් වරෙක පල රහිත යැයි ඉවතලමින්ද, නැවත වෙනත් දෙයක්-මතයක් පිළිගන්නේ ද කැලෑ වඳුරෙකු එක් අත්තක් අතහරින විට තවත් අත්තක් අල්ලා ගන්නා පරිදි යැයි දක්වන ලදී. මෙසේ ඉවතලමින්ද,

නැවත පිළිගනිමින්ද, වෙනස්වන සිත නිසා, නැති ගුණදොස් කියා, තමාට හෝ අනුන්ට හෝ යස-අයස උපදවන්නේය. මේ සියළු හැඟීම් නිසා ඇතිවන වැරදි සෝදා පිරිසිදු කරන්නාක් මෙන් නුවණින් යුතු වූ බැවින්, **ධොන** නම් වේ. ඒ ධොන නම් වූ කෙලෙස් රහිත තැනැත්තා කිසිතැනක නොරඳන්නේය. කුමක් නිසා එසේ කියන ලදද? ඒ පිළිවෙතින් යුතු බැවින්, **ධොනසස** සියළු අයහපත් දේ සෝදාහළ බැවින් අරහත් බවට පත්ව කිසිදු තැනක **ලොකෙ, ඒ ඒ භවෙසු පකපපිතා දිට්ඨි නත්‍ථි** එබඳු හැඟීම්වලින් කෙලෙසුන් නැසුවෝ ඉවත් වෙති. තමන් කරන ලද අයහපත් කටයුතු සඟවන තීර්ථකයෝ කපටිබවින්, මානයෙන් අගතියට යති. **මායඤ්ච මානංච පහාය ධොනො** එබඳු රාගාදි දොස් (නොමැති බැවින්) **කෙන ගච්ඡෙය්‍ය** මෙලොව හෝ පරලොව හෝ නිරය ආදී තැනකට යන්නේ කුමන (කරුණු) හඳුනාගෙනද? **අනුපයො සො** ඒ තණ්හා-දිට්ඨි දෙකම උපය නම් වන අතර, එය නැති බැවින් අනුපය වෙයි. **උපයොහි..........** දිට්ඨම්ධෙව සබ්බං **එහි උපයො** තණ්හා දිට්ඨි ඇසුරින් වෙලුනු (තැනැත්තා), **ධම්මෙසු උපෙති වාදං** 'රාගයෙන් රත් වූ' හෝ 'නපුරු' හෝ යැයි මෙසේ ඒ ඒ කරුණු කෙරෙහි වාදයට එළඹෙයි. **අනුපයං කෙන කථං වදෙය්‍ය** තණ්හා-දිට්ඨි නැති කිරීමෙන් 'උපය' නොවූ එතුමෝ රාගයෙන් හෝ තරහින් හෝ කෙසේ 'රත්වූයේ'දැයි හෝ නපුරු වූයේදැ'යි කුමකින් කිවහැකිද? මෙසේ කිසිදු වරද නැති එතුමන් වෙනත් තීර්ථක සමයවාදීන් මෙන් කරන ලද වරද සඟවති'යි කෙසේ සිදුවිය හැකිද? **අත්තං නිරත්තං නහි තස්ස අත්‍ථි** රහත් පලයට පත්වූ තැනැත්තාට තමා පිළිබඳ වූ දැඩි හැඟීමක් හෝ (මේ ජීවිතයෙන් පසු) විනාස වේයැයි හෝ දැඩිව ගත් කිසිදු හැඟීමක් නැත. එමෙන්ම බැහැර කිරීමට හෝ නැවත පිළිගැනීමට හෝ කිසිදු හැඟීමක් නැත. එසේ කරුණු නොමැත්තේ ඇයි? **අධොසි සො දිට්ඨිම්ධෙව සබ්බං** මෙම ජීවිතයෙහිදීම, ඒ සියළුම දැඩිව ගන්නා ලද මුල්බැස ගත් හැඟීම් ලද නුවණින් හෝ සෝදා හළේ ද, අත් හළේ ද, දුරුකළේදැ'යි අරහත් බව කුළුගන්වමින් දේසනය නිම කළහ. ඒ අසා සතුටුවූ රජු භාග්‍යවතුන් වහන්සේට වැඳ නික්ම ගියේය.

**දුට්ඨට්ඨක සූත්‍ර විස්තරය**
**නිමි.**

# 4.4

පසසාමි සුද්ධං යනු සුද්ධට්ඨක සූත්‍රයයි. එය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? පෙර කසුප් බුදුරදුන් කල, බරණැස වැසි එක්තරා කෙළෙඹියෙක් බඩු ගෙනඒම සඳහා ගැල් පන්සියයකින් පිටිසර ජනපදයකට ගියේය. එහි කැලයෙහි හැසිරෙන මිනිසකු සමග මිතුරුව, ඔහුට තුටුපඬුරු දී, 'යහළුව, මෙහි සඳුන් හර දැක තිබේදැ'යි විමසීය. 'එසේය හිමියනි, කී විට, ඔහු සමගම සඳුන් වනයට පිවිස, ගැල් සියල්ලම අරටුව, ඇති සඳුන් දැවයෙන් පුරවා, ඒ මිතුරාට 'බරණැස පැමිණෙන විට සඳුන් හර ද ගෙන එව'යි කියා බරණැසටම ගියේය. පසුකලක, ඒ වනචාරී මිතුරා සඳුන් හරද ගෙන කෙළඹියාගේ නිවසට පැමිණියේය. කෙළඹියා ඔහු දැක සියළු පිළිසඳර කතාකොට, සවස්කල සඳුන්හර කුඩුකොට, කරඬු පුරවා, 'මිතුර, දිය නාගෙන එන්නැ'යි තම සේවකයෙකු සමග නාන තොටුපලට යැවීය. ඒ කාලයෙහි බරණැස උත්සවයකි. බරණැස වැසියෝ උදෑසනම දානය පිරිනමා, පිරිසිදු වත් හැඳ මල්සුවඳ ආදිය ගෙන කසුප් බුදු මහසෑය වැඳීමට යති. ඒ වනචාරිකයාද ඔවුන් දැක, 'මහජනයා කොහි යන්නේදැ'යි ඇසීය. 'විහාරය, සෑය වැඳීමට බව අසා, ඔහු ද ගියේය. එහිදී මිනිසුන් හිරියල් මනෝසීල ආදියෙන් නොයෙක් ආකාරයෙන් සෑයට පූජා කරනු දැක, එබඳු විසිතුරු දෙයක් කිරීමට නොදැන, ඒ සඳුන් ගෙන මහා සෑයෙහි රන්ගඩොල් මත ලෝහ පාත්‍රයක් තරම් කවාකාර ලෙස සකස් කළේය. හිරු උදාවන විට එය හිරු රැසින් පැහැපත් විය. ඔහු එය දැක පැහැද, 'ඉපදෙන, ඉපදෙන හැම වරකම, මෙබඳු රැස් දහරක් මගේ ළයෙන් විහිදේවා'යි පැතීය. ඔහු කළුරියකොට, තව්තිසාවෙහි උපනි. ඔහුගේ ළයෙන් රැස් නැගුණි. ළයමඬල සඳමඬල මෙන් බබළයි. 'චන්‍ද්‍රාභ' දෙව් පුත් යැයි හැඳින්වීය. චන්‍ද්‍රාභ දෙව් පුතු ඒ සම්පතින් යුතුව, දෙව්ලෝ සයෙහිම අනුලෝම පටිලෝම ලෙස හෙවත් ඒ ඒ දෙව්ලෝ පිහිටි පිළිවෙළින් (ඉපිද) වැස, එක් බුද්ධාන්තරයක් ගෙවා අප ගොතම බුදුරජාණන් වහන්සේ පහළ වූ කල, සැවැත්නුවර බමුණු මහසල්කුලයෙක උපන්නේය. ඔහුගේ ළයෙහි සඳමඬල සදිසි රැස් මඬුල්ලක් විය. නම් තබන දවසෙහි, සිරිත් ඉටුකොට, බමුණෝ ඒ රැස් මඬුල්ල දැක, 'මේ කුමරු බොහෝ යසඉසුරින් පින් ලකුණින් හොබනේ යැයි පුදුමව 'චන්‍ද්‍රාභ' නමින්ම හැඳින්වූහ. චන්‍ද්‍රාභ වැඩිවිය පත් කල, ඔහු අලංකාරකොට, පටරෙදි ඇඳුමින් උඩුකය පොරවා, යානාවක නංවා 'මේ මහා බ්‍රහ්මයා' යැයි පූජාකොට, 'චන්‍ද්‍රාභය දකින

තැනැත්තකු ධනය, කිතුරාව ලබන බවද, මරණින් පසු සඟලොව උපදනා බවත් හඬනගා කියමින්, ගම් නියම්ගම් රාජධානිවල ඇවිදිත්. ගිය ගිය තැන්හි මිනිස්සු, 'මේ පින්වත් චන්‍ද්‍රාභ දැකීමෙන් කිතුගොස, ධනය, සඟසැප ලබති'යි පොරකමින් එති. මුළු දඹදිවම මෙයින් කලබල විය. බමුණෝ හිස්අතින් පැමිණෙන්නවුන්ට චන්‍ද්‍රාභ දැකීමට ඉඩ නොදෙති. (කහවණු) සියයක් හෝ දහසක් හෝ රැගෙන පැමිණෙන්නන්ටම පෙන්වති. මෙසේ චන්‍ද්‍රාභ රැගෙන සැරිසරන බමුණෝ කෙමෙන් සැවැත්නුවරටද පැමිණියහ.

ඒ වනවිට, භාග්‍යවතුන් වහන්සේ උතුම් දම්සක් පවත්වා, අනුපිළිපිලිවෙලින් සැවැත් නුවරට අවුත්, බොහෝ දෙනාට හිත පිණිස දහම් දෙසමින්, ජේතවනාරාමයෙහි වසති. සැවැත්නුවරෙහිදී චන්‍ද්‍රාභ සමුදුර පත් කුඩා ගඟක් බඳු විය. 'චන්‍ද්‍රාභ' යැයි කියන කෙනෙකුදු නැත. සවස් කල මහජනයා මල් සුවඳ ගෙන ජේතවනාරාමය දෙසට යනු දුටු චන්‍ද්‍රාභ 'කොහි යවුදැ'යි ඇසීය. 'බුදුවරයෙක් ලොව උපන්හ. උන්වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස දහම් දෙසති. එය අසන්නට ජේතවනාරාමයට යමු'යි ඔවුහු කීහ. ඒ අසා බමුණු පිරිස පිරිවරා ඔහු එහි ගියේය. භාග්‍යවතුන් වහන්සේ ද ඒ වේලාවේ දම් සභාවෙහි උතුම් බුදු අස්නෙහි වැඩසිටියහ. චන්‍ද්‍රාභද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, මිහිරි පිළිසඳර කතාකොට, එකත්පස්ව හුන්නේය. එකෙණෙහිම ඔහුගේ ආලෝකය අතුරුදහන් විය. බුදුරදුන්ගේ ආලෝකය (බුදුරැස්) හමුවේ අසූරියනක් දුරට වෙනත් ආලෝකයක් නොවිහිදේ. 'චන්‍ද්‍රාභ' 'මගේ ආලෝකය නැති වී'යැයි හුන් තැනින් නැඟී ඉවතට යාමට සූදානම් විය.

එවිට එක් මිනිසෙක් 'කිම? චන්‍ද්‍රාභ, සමණ ගොතමයන්ට බියවී යන්නෙහිදැ'යි ඇසීය. 'මම බය නොවෙමි, එහෙත් එතුමන්ගේ තේජසින් මගේ ආලෝකය විහිදෙන්නේ නැතැ'යි කියා නැවත භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ හිඳ දෙපතුල සිට හිසකෙස් අග දක්වා රුසිරි ලකුණු සම්පත් දැක, 'සමණ ගොතම මහා බලවත්ය, මගේ ළමැදෙහි කුඩා ආලෝකයක් විහිදුණි. එපමණකින් බමුණෝ මා රැගෙන මුළු දඹදිවම හැසිරෙති. ඒ උතුම් සම්පත් ලකුණින් හෙබි සමණ ගොතමයන්ගේ කිසිදු මානයක් හෝ උඩඟුකමක් හෝ නැත. නිසැකවම, 'එතුමන් උසස් ගුණෙන් යුතු, දෙව්මිනිසුන්ට යහමග පෙන්වන්නෙකැ'යි බොහෝ පැහැද සතුටු සිතින් භාග්‍යවතුන් වහන්සේට වැඳ, පැවිදි කරන ලෙස ඉල්ලා සිටියේය.

භාග්‍යවතුන් වහන්සේ, 'මොහු පැවිදි කරන්නැ'යි වෙනත් තෙරනමකට දැන්වූහ. තෙරුන් වහන්සේ ඔහු පැවිදිකොට, සිරුරෙහි කෙස් සිට සම දක්වා කමටහන් පහදා දුන්හ. පැවිදි වූ චන්‍ද්‍රාභ විදසුන් වඩා නොබෝ කලකින්ම අරහත් බවට පත්ව, චන්‍ද්‍රාභ තෙරුන් යැයි හැඳින්වීය. 'අනෙක් හිමිවරු, 'ඇවැත්නි, පෙර ඇස් නැමති දොරකඩට අරමුණු වූ චන්‍ද්‍රාභගේ රුව දුටුවන්, ඒ දැක්මෙන් ධනය හෝ යසස ලැබ ඇත, සගලොව හෝ ගොසිනි. පිරිසිදු බවට හෝ පත්ව ඇතැයි කතාබහ කළහ. ඒ අදහස් පාදකකොට භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය වදාළහ.

පළමු ගාථාවෙහි අරුත නම්, 'මහණෙනි, මෙබඳු දැකීමෙන් පමණක් පිරිසිදු බව ඇති නොවේ. එහෙත් කෙලෙස් කිලුටෙන්, අපිරිසිදු කෙලෙස් රෝගයෙන් ඇත් නොවී, එයින් රෝගීවම, චන්‍ද්‍රාභ බමුණු හෝ වෙනත් මෙබඳු රුවක් දැක අනුවණයා දැඩිව ගත් හැඟීමෙන් එය මෙනෙහි කරන්නේ පසසාමි සුද්ධං පරමං අරොගං යනුවෙනි. එබඳු දිට්ඨි දැඩිව ගත් දැකීමෙන්, හැඟීමෙන්, සංසුද්ධි නරසස හොති, ඔහු මෙසේ අභිජානනෙතා ඒ දැකීම 'උසස්' යැයි දැන එය දැඩිව සිතට ගැනීමෙන් සුද්ධානුපසසී එයම (තම අරමුණ කරා) නුවණින් යා යුතු මග යැයි සිතයි. එය නුවණ ලබන මග නොවේ. එහෙයින් දැකීමෙන්ද, පිරිසිදු බවින්ද......... යන දෙවන ගාථාව කීහ. එහි අරුත නම්, ඒ රූප දැකීමෙන් දිට්ඨෙන යම් සේ කෙලෙස් (නැතිවීමෙන්) සුද්ධී නරසසහොති, එයින් වා ඤාණෙන සො යම් ආකාරයෙන් ඉපදීම් ආදීකොට ඇති දුකඛං පජහාති දුක් දුරුකරයි. කරුණු මෙසේ හෙයින් උතුම් අරිය මගෙන් (හැර) අඤ්ඤෙන අපිරිසිදු මගෙන්ම සො සුජඣති හෙතෙම රාගාදී කෙලෙස්වලින් ස උපධිකො මේ ආකාරයෙන් පිරිසිදු වේයැයි සිතයි. එහෙත් එසේ පිරිසිදු නොවේ. දිට්ඨී හි නං පාව තථා වදානං එහෙයින් ඒ දැඩිව ගත් හැඟීමෙන්ම 'මොහු මිසදිටුවෙකැ'යි - මොහුගේ මතය වැරදි යැයි කියයි. හැඟීම අනුව 'ලෝකය සදාකාලිකය' ආදී ලෙසින් එසේ කියයි. 'බමුණෙක් නොවේ.... යනු තුන්වන ගාථාවයි. එහි තේරුම නම්, පව් දුරුකරන ලද බැවින් බ්‍රාහ්මණ වෙයි. අරිඅටැඟි මගෙන් හෝ, කෙලෙස් නසා මහරහත් බවට පත්වූයේ බ්‍රාහමණෙ ඒ උතුම් අරිය මග නුවණින් හැර, වෙනත් මගකින් යහපතැයි සම්මත දිට්ඨෙ, ඒ ආකාරයෙන්ම ඇසූ දේ හඬ පිළිබඳ සලකමින් සුතෙ ඉක්මවිය නොහැකි ලෙස, සීලෙ ඇතුන්ගේ හැසිරීම් රටා වත් ආදිය අනුගමනය කිරීමෙන් වතෙ පොළව ආදියට සැළකීමෙන් අදහන සිරිත් ලෙසින් මුතෙ, මේ අයුරින් හටගත් වැරදි

නුවණින් පිරිසිදු වෙතැයි නොකියයි. මේ සියළු දේම බමුණන්ගේ ගතිසොබාව දැක්වීමට කියන ලදී. (කෙලෙස් නැසූවන්) තුන්ආකාර වූ **පුඤ්ඤ** පින් සියළුම අයහපත් පාපයෙන් ද **අනුපලිත්තො** ඒවා නැතිකරන ලද බැවින්, **තමාය** - තමාගේ යන හැඟීමක් හෝ, කිසියම් දෙයක් ලබාගැනීමේ ආසාවද අත්හළ බැවින් **අත්තඤ්ජහො** පින් ආදියද රැස් නොකරන බැවින් **න ඉධ පකුබ්බමානො** යැයි කියනු ලැබේ. එහෙයින් ඒ රහතන් වහන්සේ පසසමින් වදාළ සියළු කරුණු මුල්පදය හා සම්බන්ධකොට දතයුතුය.

'පිනෙහි ද පවෙහි ද නොඇලී, තමාගේය යන හැඟීමද අත්හළ පින් ආදියද රැස් නොකරන, කෙලෙසුන් නැසූ බැවින් බ්‍රාහ්මණ හෙවත් රහත් උතුමෝ වෙනත් මගකින් පිරිසිදු බව නොකියති. එසේම වෙනත් හැඟීම් දැඩිව පිළිගත් තැනැත්තන් එබඳු වෙනත් මගකින් පිරිසිදු බව කියතත්, ඔවුන්ගේ ඒ හැඟීම් දැකීම් නිවනට හේතු නොවන බව මුල් අදහස අත්හැර, ආදී අරුත් ඇති ගාථාවෙන් දැක්වූහ. එහි අදහස නම්, **තෙ** පිරිසිදු බව ඇතිකරන වෙනත් මතවාද - එවැනි දැකීම් මුළුමනින්ම නැති නොකරන ලදුව, තවත් මත වැළඳගැනීම හා බැහැර කිරීමත් වෙයි. ඒ අනුව **පුරිමං** වෙනත් මතවාදී මගපෙන්වන නායක ආදීන්, පහාය **අපරං** වෙළී - දැඩිව ගෙන, **එජා** තණ්හාවෙන්, **අනුගතා** රාගාදියෙන් පෙළී, **න තරන්ති සංගං** ඒවායින් ඉවත් නොවී, ඒ ඒ දහම් කරුණු ඉගෙන ගනිති. වඳුරකු (අත්තක් අතහැර අත්තක් අල්ලා ගන්නාක් මෙන්) **නිස්සජ්ජන්ති සාඛං.**

පස්වෙනි ගාථාවෙහි සම්බන්ධය මෙසේය. 'ඒ දැකීම් දැඩිව ගත් බැවින් ඔහු එසේ කියන බව දක්වා ඇත. (මෙහි II ගාථාපදය) **සයං** තමාම, **සමාදාය** ගෙන, **වතානි** ඇතුන්ගේ හැසිරීම් වැනි වත්, **උච්චාවචං** මුලින් හෝ පසුව හෝ උසස් පහත් නායකයාගෙන් නායකයන් ආදීන්ගේ, **සඤ්ඤාසත්තො** කාම හැඟීම් ආදියෙන් වෙළී, **දවිමා ච වෙදෙහි සමෙච්ච ධම්මං** උසස් අදහස දැන, සිවුමග නැණින් ලබන දැනීමෙන් (අවබෝධයෙන්) සිවුසස් දහම වූ (ඒ උසස් අදහස) මැනවින් දැනගනී. ඉතිරි වචන පැහැදිලිය. **ස සබ්බධම්මෙසු විසෙනීභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා** මහපොළව සමාන පුළුල් පැතිරුණු නුවණ ඇති ඒ රහතන් වහන්සේ දුටු හෝ ඇසූ හෝ පහස ලැබූ හෝ, එමගින් බැසගත් හැඟීම් දැකීම් නම් වූ සියළුම මාර සේනාව වනසා සිටි බැවින්,

විසෙනිභූතො, තමෙව දසසිං ඒ පිරිසිදු දැක්මම, විවටං චරනතං තණ්හා නැමති ආවරණ ඉවත් කිරීමෙන් අනාවරණව හැසිරෙන, කෙනීධ ලොකසම්ං විකපපයෙයා මුලින් කියන ලද පරිදි තණ්හා කල්පනාවෙන් හෝ, දැකීම් හා සංකල්ප ඉවත් වූ බැවින් රාගාදී ලෙසින් මේ ලෝකයෙහි කවර කෙනෙක් කුමකින් කල්පනා කරන්නේ ද?

න කපපයනති - පෙරටු කොට නොගනිති.........ආදී ගාථාවෙහි සම්බන්ධයත් අරුත් ගැන ද වැඩිදුරටත් කිවයුතුද? එබඳු සත්හුන් බවට පත් රහතන් වහන්සේලා (තණ්හා - දිට්ඨි) සංකල්ප දෙකෙන් කුමකින් න කපපයනති න පුරෙකඛරොනති ඒ උසස්තම පිරිසිදුබව ලබාගත් බැවින්, අකිරිය - සසසත ආදී) හැඟීම් දැඩිවගෙන, එය පරම පිරිසිදු වේයැයි නොකියති. ආදානගනථං ගථිතං විසජජ රූපාදී ලෙසින් සතරාකාරව ඇතිවන සිතෙහි වූ බැඳුණු බැඳීම් - ගැට අරිය මග නැමති අවියෙන් සිඳ, අත්හැර, ඉතිරි කරුණු පැහැදිලිය.

සීමාතිගො - සීමා ඉක්මවූ යන ගාථාව එක් තැනැත්තකු මුල්වන සේ කියන ලදී. එහි සම්බන්ධය පෙර පරිදිමය. එය මේ විස්තර සමග දතයුතුය. වැඩිදුර කිවයුතුද? එබඳු මහා නුවණින් යුතු ඒ රහතන් වහන්සේ කෙලෙස් සීමා ඉක්මවූ බැවින්. සීමාතිගො පව් නසන ලදින් බ්‍රාහමණෙ, මේ දෙය මෙසේ සිදුවීයැයි (තණ්හාව පෙරදැරිව ගැනීමක්) ද නැත. තසස නත්‍ථි, අනුන්ගේ සිත් දැනීම හා පෙර විසූ - උපත ලද තැන් දන්නා නුවණින් ඤත්වා වා මසැසින් හා දිවැසින් දිසවා වා යම් අදහසක්, හැඟීමක් දැඩිව ගෙන යයි කියන ලදී. ඒ රහතන් වහන්සේ කාමරාගාදියෙන් ඉවත් වූ බැවින් නරාගරාජී රූප, අරූප (භවයන්හි) දැඩි ආසා ඇලීම් නොමැති බැවින්, න විරාගරතෙතා මේ උසස් තැනට පත්වූ විට (එදිනෙදා ජීවිතය තුල තමාට) මෙබඳු යැයි දැක්වීමට පරං යැයි කිසිවක් ඉධ උගගහිතං නත්‍ථි යැයි අරහත් බව කුළුගන්වමින් දේසනය නිමාකළහ.

සුද්ධට්ඨක සූත්‍ර විස්තරය
නිමි.

# 4.5

**පරමන්ති දිට්ඨීසු** යනු පරමට්ඨක සූත්‍රයයි. මෙම සූත්‍රය දේසනා කිරීමට හේතුව කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වාසය කරන කල, නොයෙක් සමයවාදීහු රැස්ව තම තමන්ගේ දැකීම්-මතවාද පෙන්වා දෙමින් 'මෙය උසස්ය, මෙය උසස් යැයි කලහ කොට රජුට දැන්වූහ. රජු, උපතින්ම නෙත් අඳ බොහෝ මිනිසුන් රැස්කරවා, 'මොවුන්ට ඇතෙකු පෙන්වවු' යැයි අණකළේය. රාජ භටයෝ අන්ධයන් රැස්කොට ඇතු ඔවුන් ඉදිරියේ හොවා - බිම තිදිකරවා 'බලව'යි කීහ. ඔව්හූ ඇතුගේ එක් එක් අඟපසඟ අත ගෑහ. එවිට රජු, 'මේ ඇතා කෙබඳුද? කවරාකාරදැ'යි ඇසූ විට, සොඬය අතගෑ අන්ධයා 'මහරජ, නගුලිසක් මෙනැයි කීය. දළ ආදිය අත ගෑ මිනිසා, අනෙක් මිනිසාට, 'රජතුමා ඉදිරියේ බොරු නොකියව'යි නින්දා කොට, 'මහරජ, ඇතා බිත්තියෙහි ඇති ඇණයක් මෙන්'යැයි කීවේය. රජු ඒ සියළු කරුණු අසා, 'ඔබලාගේ මතවාදත් මෙබඳු යැයි කියා, වෙනත් සමයවාදීන් පිටත්කර හැරියේය. පිඬු පිණිස හැසිරුණු එක්තරා මහණෙක්, ඒ තොරතුරු දැන, භාග්‍යවතුන් වහන්සේට සැළ කළේය. භාග්‍යවතුන් වහන්සේ ඒ නිමිතිකොට සඟ පිරිස අමතා, මහණෙනි, උපතින්ම අන්ධවූවන්, ඇතු හඳුනානොගෙන, ඒ ඒ කොටස් අතපත ගා විවාද කළ සේම, තිත්ථිය සමයවාදීන් ද (දුක් ආදියෙන්) මිදෙන දහමක් ගැන නොදැන, ඒ ඒ දැකීම් දැඩිව ගෙන විවාද කරන බව පවසා දහම් දෙසනු පිණිස මේ සූත්‍රය වදාළහ.

**පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො** 'මෙය උසස්ම එකම දෙය' යැයි ගෙන, තම තමන්ගේ හැඟීම්-දැකීම්වලට වසඟ වෙමින්, **යදුත්තරිං කුරුතෙ** තමන්ගේ නායකයන් ආදීන් උසස් බව දනවයි. **හීනෙති අඤ්ඤෙ තතො සබ්බමාහ** තමන්ගේ ඒ නායකයා හැර, අනික් සියල්ලන්ම 'පහත්' යැයි කීය. **තස්මා විවාදානි අවීතිවත්තො** ඒ කරුණින් ඒ මතවාදී අරගලය නොනැවතී යයි. දෙවන ගාථාවේ අරුත නම්, මෙසේ නොනැවතී යන **යං දිට්ඨෙ සුතෙ සීලබ්බතෙ මුතෙ** මේ දේවල් කෙරෙහි ඇති කරගන්නා, ගොඩනගා ගන්නා අදහස් මත, **අත්තනි** පෙර කී පරිදි, **ආනිසංස පස්සති තදෙව සො තත්‍ථ** තමන්ගේ දැකීමෙහි පලය සේ, (තම අදහසට අනුව) 'මෙය උසස් යැයි දැඩිව තහවුරු කොටගෙන, **අඤ්ඤං සබ්බං** වෙනත් සමයවාදී නායකයන්, **නිහීනතො පස්සති** තුන්වන ගාථාවෙහි අරුත නම්, මෙසේ දකිමින්, **යං** තමන්ගේ නායක ආදීන්ට, **නිස්සි තො අඤ්ඤං**

වෙනත් කොටසකගේ නායක ආදීන්, හීනං පසසති තං දැකීම ගණ්ඨ (බැම්මක්) ඒවා ම කුසලා වදනති බැඳීම් යැයි කියන ලදී. යම් ලෙසකින් එහිම තසමා හි දිට්ඨං ව සුතං මුතං වා සීලබබතං භිකඛු න නිසසයෙය්‍ය නොඇලෙන්නේ යැයිද කියන ලදී. සිවුවන ගාථාවෙහි අරුත නම්, දැකීමෙන්, ඇසීමෙන් අදහස්වල තදින් එල්බ ගැනීම පමණක් නොවේ. එමෙන්ම මතු මතු (ඉදිරියට) ඇතිවන, හටගැනෙන දිට්ඨිමහි ලොකසමිං න කපපයෙය්‍ය (එබඳු දැකීම්-මතවාද) නූපදවන්නේ යැයි කියන ලදී. ඒ කෙබඳු අයුරින්ද? ඤාණෙන වා සීලවතෙන වාපි සමවත් ආදී නුවණින් හෝ, සිල්වත් බවින් හෝ අදහසක්, හැඟීමක් වැනි කල්පනා ඇතිකරනු ලබයිද, (රහතන් වහන්සේ) එබඳු දේ අදහස් නොකරති. (එසේ කටයුතු නොකරති.) දැකීමෙන් පමණක් නොව, ජාතිය ආදිය නිසා ඇති කරගන්නා මානයෙන් ද සමොති අතතානමනූපනෙය්‍ය හීනො න මඤ්ඤෙථ විසෙසිවාපි (කටයුතු නොකරති.) පස්වෙනි ගාථාවේ අදහස නම්, මෙසේ දැකීම් අනුව දැඩි කල්පනාවට නොගනිමින්, නොසිතමින් ද අතතං පහාය අනුපාදියානො මුලින් දැරූ හැඟීම - අදහස අතහැර, වෙනත් හැඟීමක් නොගනිමින්, වෙනස් නොකර, ඒ කියන ලද ඤාණෙ දෙආකාරව නිසසයං නො කරොති (එසේ) නොකරමින් ද සවෙ වියුතෙතසු නොයෙක් දැකීම්, හැඟීම් අනුව බෙදුණු සත්වග අතර න වගගසාරී කැමැත්ත පරිදි ඒ දෙසැටක් හැඟීම් අතර, අගතියට නොගොස්, කිඤ්චිපි දිට්ඨිං න පචෙචති නොපැමිණේ යැයි කියන ලදී.

මේ ගාථාවලින් පෙන්වා දෙන ලද රහතන් වහන්සේගේ ගුණ සොබාව තවදුරටත් විස්තර කරනු පිණිස, යසසූභයනෙත ආදී ගාථා තුනක් කීහ. එහි උභයනෙත පෙර කියා ඇති පහස ආදී කරුණු යි. පණිධි තණ්හා, භවාභවාය නැවත නැවත ඉපදෙන භවයන්හි, ඉධ වා හුරං වා මෙලොව පරලොව තමාගේ ජීවිතය හෝ, අනුන්ගේ ජීවිත පිළිබඳ හෝ, දිට්ඨෙ වා දැකීමෙන් පිරිසිදු වේ යැයි හෝ, ඇසීම ආදිය ගැනද මෙසේය. සඤ්ඤා හඳුනාගැනීම මත ඇතිවන අදහස් දැඩි ලෙස දරාගැනීම, ධමමාපි තෙසං න පටිචඡිතා සෙ (ඒ රහතන් වහන්සේ) දෙසැටක් මිසදිටු අදහස් අතර, 'මෙයම ඇත්තය, අනෙක් සියළුම අදහස්, හැඟීම් හිස්, පල රහිත යැයි නොසළකති. පාරං ගතො න පචෙචති තාදී ඒ ඒ මගෙන් කෙලෙස් දුරුකොට, නිවනින් (සසර) පරතෙරට ගියේ නැවත නොපැමිණෙති. පස් ආකාරයකින් 'තාදී' නම් වෙති. ඉතිරි කරුණු පැහැදිළිය.

**පරමට්ඨක සූත්‍ර විස්තරය නිමි.**

# 4.6

**අප්පං වත ජීවිතං** යනු ජරා සූත්‍රයයි. එය දේසනා කිරීමට හේතුව කුමක්ද? එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වස් වසා, (බුදුවරුන් අනුගමනය කරන පරිදි) කායක නිරෝගී බවද, නොපැනවූ සිකපද පැණවීමද, දමනය කොට හික්මවා ගැනීමට සුදුස්සන් හමුවද, ඊට සුදුසු පරිදි ජාතක කතා ආදිය කීම වැනි කරුණු සළකා ජනපද චාරිකාවෙහි පිටත් වූහ. අනුපිළිවෙලින් සැරිසරමින්, සවස්කල සාකේත නුවරට පැමිණ, අඳුන් වනයට පිවිසියහ. සාකේත වාසීහු ඒ බව අසා, 'දැන් භාග්‍යවතුන් වහන්සේ දැකීමට සුදුසු කාලය නොවේ'යැයි (සිතා) රැය පහන් වූ පසු, මල් සුවඳ ආදිය රැගෙන සමීපයට ගොස්, වැඳුම් පිදුම් තුටුපහටු කතාකොට, උන්වහන්සේ ගමට පිවිසෙන වේලාව පැමිණෙනතුරු පිරිවරා සිටියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බික්සඟණ පිරිවරා සාකේත නුවරට පිඬු පිණිස වැඩම කළහ. එහි වසන මහා සම්පත් ඇති එක්තරා බ්‍රමණෙක් නගරයෙන් පිටතට යන අතර, නගර දොරටුවෙහිදී (බුදුහිමි) දැක පුතු සෙනෙහස උපදවා 'පුත, මා ඔබ බොහෝ කලකින් දුටුවෙහි'යැයි හඬමින් ඉදිරියට ගියේය. භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි, මේ බමුණා කැමැත්තෙන් කරන යම් දෙයක් නොවළක්වන ලෙස මහ සඟනට කීහ. බමුණාද වසුපැටවාට ලොල්වන ගවදෙනක සේ අවුත්, 'පුත, බොහෝ කලකින් දුටුවෙහි, ඔබ නැතිව බොහෝ කල්'යැයි කියමින් බුදු සිරුර ඉදිරියෙන් ද පසුපසින් ද දකුණු පසින් ද, වම්පසින් ද හාත්පසින්ම වැළඳගත්තේය. ඔහුට එසේ ඉඩ නොලැබුණි නම්, ළය පැළී මියයනු ඇත. 'භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේටද, පැමිණි මහා සඟණටද දානය පිරිනැමීමට මම තනිවම සමත් වෙමි, මට උපකාර වනු මැනවැයි කීය. භාග්‍යවතුන් වහන්සේ නිහඬව ඉවසූහ. බමුණා පාත්‍රය ගෙන ඉදිරියෙන් යන අතර, 'පුතා ආවේය, ආසන පැණවිය යුතු යැයි බැමිණියට පණිවුඩයක් යැවීය. ඇය එසේ කටයුතුකොට, පෙරමග බලා සිටින්නී, ඇතුලු වීදියෙහිදීම භාග්‍යවතුන් වහන්සේ දැක, පුතු සෙනෙහස උපදවා 'පුත, ඔබ බොහෝ කලකින් දුටුවෙහි' කියමින් දෙපා අල්ලාගෙන හඬා, නිවසට කැඳවා ගොස්, මැනවින් වැළඳවීය. වළඳ අවසන, බමුණා පාත්‍රය ඉවතට ගත්තේය. ඔවුන්ගේ අදහස දත් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසූහ. දේසනය අවසන දෙදෙනාම සෝවාන් පල ලදහ. භාග්‍යවතුන් වහන්ස, මේ නුවර වසන තාක් කල් අප නිවසෙන්ම ආහාර ගත යුතු'යැයි

ඉල්ලා සිටියහ. 'බුදුවරුන් මෙසේ නිති එකම තැනකටම නොයතැ'යි එය නොපිළිගත්හ. 'එසේනම් හිමියනි, මහසඟණ සහ පිඬු හැසිරුණද, ඔබවහන්සේ මෙහිම බත්කිස කොට, දහම් දෙසා විහාරයට වඩිනු මැනවැ'යි පැවසූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට උපකාර පිණිස එසේ කළහ. මිනිස්සු බමුණාටද - බැමිණියටද බුදු පියා - බුදු මවු ලෙසටම ඇමතූහ. ඒ පවුල ද 'බුදු කුලය' යැයි නම ලැබීය. ආනන්ද තෙරුන් වහන්සේ, 'මම ඔබවහන්සේගේ මවුපියන් ගැන දනිමි, මොවුන් කුමක් නිසා, 'මා බුදු පියා ය, මා බුදු මව'යැයි කියත්දැ'යි ඇසූහ. 'ආනන්ද, මේ බමුණාත්, බැමිණියත් ඉපදුණු පන්සිය වාරයකදීම නිරතුරුවම මව්පියෝ වූහ. පන්සිය වාරයකදීම මවුපියන්ගේ දෙටුපුත් ද, පන්සිය වාරයකදීම ඒ මවුපියන්ගේ කනිටු පුතුද විය. ඔව්හූ ඒ පෙර සිට වූ ආදර සෙනහසින් එසේ කියන බවද, පහත සඳහන් අරුත් ඇති ගාථාවක්ද වදාළහ.

'පෙර එක්ව විසීමෙන් ද (එයින්) වත්මනෙහි ඇතිවන හිතවත් බව නිසාද සෙනහස මතුවන්නේ උපුල් මල හා ජලය මෙනි.'

පුබ්බෙව සන්නිවාසෙන පච්චුප්පන්නහිතෙන වා
එවන්තං ජායතෙ පෙමං උප්පලංව යථොදකෙ

සාකේත නගරයෙහි කැමතිතාක් කල් වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ, නැවත චාරිකාවේ යෙදෙමින් සැවැත්නුවරටම පැමිණියහ. ඒ බමුණාද බැමිණියද සංසයා වහන්සේ කරා පැමිණ සුදුසු දහම් දෙසුමක් අසා ඉතිරි මගපලවලට පත්ව අනුපාදිසෙසව පිරිනිවන්පෑහ. නගරවැසි බමුණෝ 'අපගේ නෑයන්ට සත්කාර කරන්නෙමු'යි එහි රැස්වූහ. අප හා සම දහමක් පිළිපැද්දා වූ - දැහැමි වූ ඔවුනට සත්කාර කරන්නෙමු'යි සෝවාන්, සකදාගාමි, අනාගාමි උපාසක උපාසිකාවෝ ද රැස්වූහ. ඒ සියල්ලෝම කම්බිලි රෙදිවලින් කුළුගෙයක් තනා මල්සුවඳ ආදියෙන් පූජා කරමින් නගරයෙන් පිටතට ගෙන ගියහ.

භාග්‍යවතුන් වහන්සේද එදින අළුයම් වේලෙහි බුදුඇසින් ලොව බලනවිට, ඔවුන්ගේ පිරිනිවන දැන, 'මා එහි ගියකල දම්දෙසුම අසා බොහෝදෙනාට දහම් අවබෝධය ලැබෙන්නේ'යැයි දැන, පාසිවුරු ගෙන, සැවැත්නුවරින් ආදාහන මළුවටම පිවිසියහ. මිනිස්සු ඒ දැක, මවුපියන්ගේ අවසන් කටයුතු කරනු කැමතිව, භාග්‍යවතුන් වහන්සේ පැමිණියේ යැයි

නමස්කාර කොට සිටියහ. නගරවැසියෝද පූජා පවත්වමින් කුළුගෙය ආදාහන මළුවට ගෙනවුත්, 'මගපල ලැබූ ගිහි උතුමන්ට කෙසේ පිදිය යුතුදැ'යි විමසූහ. භාග්‍යවතුන් වහන්සේ 'රහතන් වහන්සේට පූජා කරනු ලබන අයුරින්ම, මොවුන්ටද පූජා කළයුතු යැයි ද පවසා, ඔවුන් අරහත් බවට පත් මුනිවරයන් බව දැක්වීමට,

'නිති කයෙන් සංවර වූ, කිසිවකුට කරදරයක්, හිරිහැරයක් නොකරන ඒ මුනිවරු සෝක නොකරන, 'නිවන' නම් තැනට යති'යි අරුත් ඇති මේ ගාථාව වදාළහ.

**අහිංසකා යෙ මුනයො නිච්චං කායෙන සංවුතා**
**තෙ යන්ති අච්චුතං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙ**

එහි පිරිස ගැන සළකා, ඒ මොහොතට ගැළපෙන ලෙස දහම් දෙසමින් මෙම සූත්‍රය වදාළහ.

**අප්පං වත ජීවිතං ඉදං** නිසැකවම මිනිස් ජීවිත කෙටිය. අල්පය. සුළු කාලයක් පවතී, ආදී ලෙසින් සලල සූත්‍රයේදී මෙම ගති සොබාව කියන ලදී. **ඔරං වස්සසතාපි මීයති** (ඉපදී) අවුරුදු සියයක් ඉක්මවීමට පෙර (මවුකුස) කලලයව තිබියදී ද මියයයි. **අතිච්ච** අවුරුදු සියය ඉක්මවා, **ජරසාපි මීයති** ජරාවට පත්ව මියයයි. **මමායිතෙ** මගේ යැයි සිතීමෙන්, **විනාභාවසන්තමෙවිදං** වෙන්වන බව ද වෙන්වන බව දැකිය හැකි වීමද මේ ආකාරය යැයි පෙනේ. වෙන්වීම නොසිදුවිය යුතු දෙයකැයි කියා, එය (වැළැක්වීම) නොහැකි යයි කියන ලදී. මාමකො මගේ උපාසක, මගේ පැවිදි හිමි යැයි සළකනු ලබයි. බුදුවරුන් ආදීකොට මගේ යැයි හැඟීමෙන්, **සංගතං** එක් රැස්වූ හෝ පෙර දක්නා ලද හෝ, **පියායිතං** කැමැත්ත ඇති කරන ලද, **නාමමෙවාවසිස්සති** අක්ඛෙය්‍ය සියළු රූපාදී දෙයින් හටගත් සියළු දේ නැතිවේ. නම පමණක් 'බුද්ධරක්ඛිත, ධම්මරක්ඛිත' යැයි මෙසේ පැවසීමට - කතා කිරීමට ඉතුරු වේ. මුනයො කෙලෙස් නැසූ රහතන් වහන්සේලා, **ඛෙමදස්සිනො** නිවන දකින,

සත්වන ගාථාව මරණයෙන් පීඩිත ලෝකයෙහි සුදුසු පිළිවෙත පහදනු පිණිස කියන ලදී. **පතිලීනචරස්ස** ඒ ඒ තැන සිත (අරමුණුවල) වළකාලමින්, හකුළුවා ගනිමින් හැසිරෙන, **භික්ඛුනො** යහපත්ව පිළිවෙත්

පූරන, මගපල නොලත් පැවිද්දෙකුට හෝ, රහතන් වහන්සේට, **සාමග්ගියමාහු තස්ස තං යො අත්තානං භවනෙ න දස්සයෙ** මේ පිළිවෙත් මගෙහි ගමන් කරනවිට, නිරය ආදී තැන්වල තමාගේ දැකීමක් නොවන පරිදි, එයට සුදුසු වන අයුරු පැහැදිලි කරයි. මෙයින් ඒ තැනැත්තා මරණයෙන් මිදෙන්නේ යැයි අදහස් වේ.

දැන්, 'තමාගේ ඊළඟ ඉපදෙන තැනක් නොපෙනේ' යැයි කෙලෙසුන් නසන ලද තැනැත්තා ගැන දක්වන ලදී. එහි විස්තර පහදනු පිණිස ඊට පසු ගාථා තුනක් කීහ. **සබ්බත්ථ** ආයතන දොළහේ, **යදිදං දිට්ඨසුතං මුතෙසු** වා මෙහි දකින, අසන යම්දෙයක් කෙරෙහි හෝ පහස ලබන දේවල, එවං **මුනි න උපලිප්පති** යයි මෙසේ සම්බන්ධය දතයුතුය. **ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨං සුතං මුතෙසු** වා මෙහි ද දකින, අසන දේ පිළිබඳව ඒවා කැමති සේ නොසළකයි. **න හි සො රජ්ජති නො විරජ්ජති** අනුවණ, පොදු මිනිසුන් සේ නොඇලෙයි. යහපත් වූ මගපල සෙවුනා වූ, පිළිවෙත් මග යමින්ද නොඇලෙයි. යහපත් වූ මගපල සෙවුනා වූ, පිළිවෙත් මග යමින් ද නොඇලෙයි. රාගය නසන ලද බැවින් විරත්ත යයි ද හඳුන්වති. ඉතිරි කරුණු පැහැදිලිය. දේසනය අවසන අසූහාර දහසකට දහම් අවබෝධ විය.

ජරා සූත්‍ර විස්තරය නිමි.

# 4.7

**මෙථුනං අනුයුත්තස්ස** යනු **තිස්ස - මෙත්තෙය්‍ය සූත්‍රයයි.** මෙම සූත්‍රය දේසනා කිරීමට හේතු වූ කරුණ කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩවසන කල තිස්ස හා මෙත්තෙය්‍ය නම් යහළුවෝ දෙදෙනෙක් එහි පැමිණියහ. මහජනයා සවස් කාලයෙහි ජේතවනාරාම දෙසට යනු දැක 'කොහි යවු'දැයි විමසූහ. එවිට 'බුදුරජාණන් වහන්සේ

ලොව පහළව, බොහෝ දෙනාට හිත පිණිස දහම් දෙසති, එය ඇසීමට ජේතවනාරාමයට යමු'යි කී විට 'අපි ද අසන්නෙමු'යි (එහි) ගියහ. ඒ දෙදෙන, මහත් පලදායී වන සේ කරුණු පෙන්වාදෙන භාග්‍යවතුන් වහන්සේගේ දම් දෙසුම අසා, පිරිස අතර සිටිමින්ම, 'ගිහිව සිට මෙම දහම් පිළිවෙත් පිරිය නොහැකි'යයි සිතූහ. ඉක්බිති මහජනයා සිටියදීම භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිද්ද ඉල්වූහ. 'මොවුන් පැවිදි කරව'යි එක්තරා මහණකට දැන්වූහ. ඒ මහණ ඔවුන් පැවිදි කොට, හිසකෙස් සිට සම දක්වා කමටහන දී වනවාසයට යාමට සූදානම් විය. එවිට තිස්ස හිමි, මෙත්තෙය්‍ය හිමි අමතා, 'ඇවැත්නි, අපට අවවාද දුන් උපාජ්ඣාය හිමි වනවාසයට යයි, අපිත් යමු'යි කීය. එවිට තිස්ස හිමි, 'ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ දැකීමත්, දහම් ඇසීමත් කැමැත්තෙමි, ඔබ යන්නැ'යි පවසා නතර විය. මෙත්තෙය්‍ය හිමි උපජ්ඣාය හිමියන් සමග වනවාසීව මහණදම් පුරා, නොබෝ කලකින්ම උපජ්ඣාය හිමියන් සමගම රහත් බවට පත්විය. (මේ අතර) තිස්ස හිමිගේ දෙටු සොහොයුරා රෝගයක් වැළඳී මළේය. තිස්ස හිමි ඒ අසා තම ගමට ගියේය. එහිදී නෑදැයෝ තිස්ස හිමියන් පොළඹවා උපැවිදි කළහ. මෙත්තෙය්‍ය හිමි ද ගුරු උපජ්ඣාය හිමි සමග සැවැත් නුවරට පැමිණියේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වස් සමය ගතකොට, ජනපද චාරිකාවෙහි යෙදෙමින් ඒ ගමටද පැමිණියහ. එහිදී මෙත්තෙය්‍ය හිමි භාග්‍යවතුන් වහන්සේට වැඳ, 'හිමියනි, මේ ගමෙහි මගේ ගිහිකල යහළුවෙක් සිටී. අනුකම්පා උපදවා මොහොතක් නැවතී සිටිනු මැනව'යි කියා ගමට පිවිස, ඔහු කැඳවාගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස්, එකත්පස්ව සිට ඔහු වෙනුවෙන්, මුලින් සඳහන් ගාථාවෙන් පැනයක් විචාළේය. එය පැහැදිලි කිරීමට භාග්‍යවතුන් වහන්සේ ඉතිරි ගාථා වදාළහ. මේ සූත්‍රය දේසනා කිරීමට මුල් වූ කරුණයි.

මෙථූනං අනුයුත්තස්ස (ගැහැණු-පිරිමි) ලිංගික සබඳතා පවත්වන්නෙකුට, ඉති මෙසේ කීය. ආයස්මා එය පිය වදනකි. තිස්සා ඒ තෙරුන්ගේ නමයි. නමින් තිස්ස යැයි හඳුන්වන, මෙත්තයෙය්‍යා පරම්පරාවයි. පරම්පරාව ලෙසින් ද පතළ විය. ඒ අනුව මේ කතාවෙහිද 'තිස්ස මෙත්තෙය්‍ය නම් යහළුවන් දෙදෙනා යැයි කියන ලදී. විඝාතං වෙහෙස, බෲහි කියනු මැනව, මාරිස එය පියවදනකි. දුක් නැති බව යයි කියන ලදී. සුත්වාන තව සාසනං ඔබේ වචනය අසා, විවේකෙ

සික්ඛිස්සාමසෙ හික්මෙනා - හික්මිය යුතු අයුරු දහම් දෙසන ලෙස යහළුවා වෙනුවෙන් ඉල්ලයි.

මුස්සති චාපි සාසනං ඉගෙනීමෙන්, පිළිපැදීමෙන් යන දෙආකාරයෙන්ම සසුන නැසෙයි. පි යනු පද අඩුවක් පිරවීමට යෙදූ නිපාතයකි. එතං තස්මිං අනාරියං එය බුද්ධාදී උතුමන්ට අයත් නොවූ, ඒ තැනැත්තාට අයත් වැරදි පිළිවෙතකි. එකො පුබ්බෙ චරිත්වාන කලින් පැවිද්දකු ලෙස හෝ සමූහයෙන් වෙන්ව තනිව හැසිර, යානං භන්තංව තං ලොකෙ හීනමාහු පුථුජ්ජනං ඒ සිවුරු හළ පුද්ගලයා ඇතුන් යෙදූ යානයකට (ඇතකු පිට) වැරදි අයුරින් නගිනවිට ඔහුට තුවාල සිදුවෙයි. බෑවුමකට පහළට වැටේ. එසේම කයෙහි දුසිරිතෙහි යෙදීම වැනි වැරදි (ජීවිතයට) පුරුදු කිරීමෙන් නිරයන්හි (ඉපිද) වැටහීමක් නොමැති වූ (සසරෙහි) බිඳවැටීම්ද, ඉපදෙන තැන්වල දරුණු (වද වේදනා) දෙයට ගොදුරු වීමටද, ගමනෙහි යෙදෙන යානයකින් වැටෙන්නා සේ, පහත් බවට පත්වේ. අනෙක් පොදු ජනතාව අතර ලාමක අයෙකු සේ ගැනේ. යසො කිත්ති ච ලාභ සත්කාර පැසසුම්, පුබ්බෙ පැවිදිව සිටියදී, හායතෙ වාපි තස්ස සා ඒ සිවුරුහළ තැනැත්තාගේ යසස-කිතුරාව පිරිහෙයි. එතම්පි දිස්වා ඒ පෙර තිබූ කිතු යස රාවයට පසුව වන හානිය දැක, සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ තුන් ආකාරයෙන්ම හික්මෙව්. ඊට හේතුව කුමක්ද? ලිංගික සබඳතා ආදියෙන් දුරුවීම පිණිස යැයි කියන ලදී. ලිංගික සබඳතාවලින් වෙන් නොවන තැනැත්තා, නොයෙක් හැඟීම්වලින්, සංකල්පනාවලින් පෙළෙයි. පරෙතො සහිතව, යුතුව, පරෙසං නිග්ඝොසං ගුරුවරුන් ආදීන්ගේ අපහාස වදන්, මංකුහොති සිත අසතුටුව, කතා නොමැතිව සිටී.

මෙයින් පසු ගාථාවල සම්බන්ධය පහසුය. ඒ අතර සත්ථානි කය දුසිරිත් ආදියෙන්, එය තමන්ද, අනුන්ද කැපෙන අදහසින් සත්ථානි ආයුධ ලෙස කියනු ලැබේ. ඒ අතරින් මෙම කරුණ වෙසෙසින් දැක්වේ. 'මේ හේතුකොට මම සිවුරු හළෙමි'යි බොරු කීමේ ආයුධයම යොදයි. "එසස්ස මහාගෙධො මොසවජ්ජං පගාහති" යැයි එහෙයින් වදාළහ. එසස්ස එස බො අස්ස එය වෙයි. මහාගෙධො මහා බැඳීමකි. 'ඒ කුමන දෙයින්ද? මොසවජ්ජං පගාහති යනුවෙනි. එයින් ඔහුට බොරුකීම මහා බැඳීමකැයි දතයුතුය. මන්දොව පරිකිලිස්සති පරපණ නසමින්, ඒ නිසාම දුක්විඳිමින් සම්පත් සොයා - ඒවා රැකගැනීමට වෙහෙසෙමින්

මුලාවට පත්වූවාක් මෙන් කිලිටි බවට පත්වන්නේය. **එතමාදීනවං ඤත්වා පුබ්බාපරෙ ඉධ** 'පෙර තිබූ කිතුරාව පිරිහේ' යැයි මේ සසුනෙහි මුලින් තිබූ කිතුරාව සහ පැවිදි බව හැර ගිහි වූ කල්හී ඇතිවන ආදීනව මුනිවරයා දැන, **එතදරියානං උත්තමං** බුදුවරුන් ආදී උතුමන් අගය කරන ලද විවේකයෙහි යෙදීම, **විවෙකඤ්ඤෙව සික්ඛෙථ** යැයි එය අදහස් වේ. **න තෙන සෙට්ඨො මඤ්ඤෙථ** ඒ විවේකය අනුව 'මම උසස් වෙමි'යි තමන් ගැන නො සිතන්නේ ය. **රිත්තස්ස** කය දුසිරිත් ආදියෙන් වෙන් වූ **ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා පජා** ණය ගැතියන් ණයෙන් නිදහස්වීම පතන්නා සේ, ඒ ඒ දේවලට කැමතිව ඇළුණු සත්වග එම සතරාකාර සැඩපහර තරණය කළ උතුමන්ට කැමති වෙති'යි අරහත් පලය කුළුගන්වමින් දේසනය නිමකළහ. දේසනය අවසානයෙහි තිස්ස සෝවාන් පලයට පත්ව, පසුව පැවිදිව රහත්බව අවබෝධ කළේය.

**තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර විස්තරය නිමි.**

# 4.8

**ඉධෙව සුද්ධි** යනු පසූර සූත්‍රයයි. මෙම සූත්‍රය දේසනා කිරීමට හේතුව කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩවසන කල වාදයෙහි සමත් පසූර නම් පිරිවැජියෙක්, 'මම මුළු දඹදිවම වාදයෙන් මුල්තැන ගනිමි, දඹදිවෙහි දඹගස (හඳුනාගැනීමේ) සලකුණ මෙන් මම ද එසේ පතළවීමට සුදුස්සෙක්මි'යැයි දඹ අත්තක් කොඩියක් සේ ඔසවාගෙන, මුළු දඹදිවෙහිම තමා හා පෙරළා වාද කරන්නෙකු නොලබමින්, පිළිවෙලින් සැවැත් නුවරට අවුත්, නගරදොරටුවෙහි (අසළ) වැලි ගොඩක් කොට, එහි අත්ත සිටුවා 'මා සමග වාදයට සමතකු වෙත් ද, ඔහු මේ අත්ත කඩාදමනු ඇතැ'යි කියා නගරයට පිවිසියේය. මහජනයා එහි රැස්ව සිටියේය. ඒ වේලාවෙහි ගරු කටයුතු සැරියුත් තෙරුන්වහන්සේ, දන් වළඳ, සැවැත්නුවරින් නික්මෙති. ඒ දුටු තෙරණුවෝ එහි සිටි බොහෝ

ගම්දරුවන්ගෙන් 'දරුවනි, මේ කුමක්දැ'යි විමසූහ. ඔව්හූ ඒ සියළු තතු කීහ. 'එසේනම්, ඔබ හැම එය උදුරා පයින් පාගා දමව, වාදයට කැමති කෙනෙකුට විහරයට පැමිණෙන ලෙස කියවයි පවසා එතැනින් පිටත්ව ගියහ. පසුර පිරිවැජියාද පිඬු හැසිර අහර ගෙන, පැමිණ, උදුරා, කඩාදමා ඇති දඹඅතු දැක, 'මේ කරන ලද්දේ කවුරුදැ'යි විමසීය. 'බුදුසව්වකු වන සැරියුත් තෙරුන්'යැයි කී විට, 'මට අද ජය ය, සමණයාට පරාජය. නුවණැති පණ්ඩිතයෝ දකිත්වා'යි පැන විමසීමෙහිලා කටයුතු කරන තීරකයෙකු කැඳවාගෙන ඒමට සැවැත් නුවරට පිවිස වීදි-මංසන්ධි ආදියෙහි සැරිසරමින්, 'සමණ ගෝතමයන්ගේ අග සව්වකු සමග වාදයේදී මාගේ නුවණින් ඉදිරිපත් කරන කරුණු ඇසීමට කැමති පින්වතුන් එත්වා'යි හඬ නැගීය.

පඬිවරුන්ගේ වදන් අසන්නෙමු'යි සසුනෙහි පැහැදුනු, නොපැහැදුනු බොහෝ මිනිස්සු පැමිණියහ. පසුර මහජනයා පිරිවරා, 'මෙසේ කී විට, මෙසේ කියන්නෙමි'යි සිත සිතා, විහාරයට ආවේය. තෙරුන් වහන්සේද, විහාරයෙහි මහත් හඬින් කෑකෝ ගැසීම් හා බොහෝ ජනයා රැස්වීමේදී අපහසු නොවේ'යැයි සළකා ජේතවන දොරටුවෙහි අසුනක් පනවා වැඩහුන්හ. පිරිවැජියා තෙරුන් වෙත එළඹ, 'එම්බා පැවිද්දාණනි, ඔබ මගේ දඹඅතු කොඩිය කඩා දමවන ලදදැ'යි කීය. 'එසේය, පිරිවැජිය,' කී විට, 'අප අතර කිසියම් කතාබහක් වේ'යැයි පැවසීය. තෙරුන් වහන්සේ විසින්ද 'පිරිවැජිය, එසේ වේ'යැයි පිළිගන්නා ලදුව, 'මහණ, ඔබ විමසව, මම විසඳන්නෙමි'යි පසුර කීවේය. 'පිරිවැජිය අපහසු කුමක්ද? ඇසීමද? නැතිනම් විසඳීමද? තෙරුන් වහන්සේ ඇසූහ. 'පැවිද්දාණනි, විසඳීම අපහසුය. විමසීමේ ඇති අපහසුව කුමක්ද? ඔබට විමසීමට දෙයක් ඇත්නම්, අසන්න'යයි කීය. 'එසේ නම්, පිරිවැජිය, ඔබ අසව. මම විසඳන්නෙමි'යි තෙරුන්වහන්සේ කීහ.

එවිට පිරිවැජියා 'යහපත් පෙනුම ඇති මහණ, එකවරම අත්ත බිඳවීයැයි පුදුමයට පත්ව, 'මිනිසාගේ කැමැත්ත කුමක්දැ'යි තෙරුන් වහන්සේගෙන් ඇසීය. 'මිනිසාගේ කැමැත්ත, සංකල්පවලට ඇති රාගය හෙවත් ඇලීම' යැයි කීහ. පසුර ඒ අසා, තෙරුන් වහන්සේ හා එකඟ නොවන ලෙසින්, පරාජයට පත් කරනු පිණිස, 'පැවිද්දාණනි, විසිතුරු විසිතුරු අරමුණු වන දෑ මිනිසාගේ කැමැත්ත යැයි නො කියන්නෙහිදැයි ඇසීය. 'එසේය, පිරිවැජිය නොකියමි.' එවිට පසුර පිරිවැජියා තෙවරක්ම

ගිවිස්වා එය තහවුරු කරවා, 'පින්වතුනි, සමණයාගේ වාදයෙහි වැරදි අසත්වා'යි වාද පැන තීරණකයන් අමතා පැවසීය. 'පින්වත් පැවිද්දාණනි, ඔබ හා සමව පැවිදි පිළිවෙතෙහි යෙදෙන්නන් කැලයෙහි වසත්දැ'යි ඇසීය. 'එසේය, පිරිවැජිය වාසය කරති.' 'ඔවුන් එහි වසනවිට, කාම සිතිවිලි ආදිය සිත සිතා සිටින්නාහුද?' 'එසේය, පිරිවැජිය, බොහෝ දෙනෙක් වහා සිත සිතා සිටිති.' 'එසේනම්, ඔවුන්ගේ මහණකම කොතැනද? ඔවුහු ගෙවල්වල වසන කම්සුව විඳින්නෝ නොවෙතිද?' අසා මෙසේද පැවසීය. 'ලොව විසිතුරු දේ කැමැත්ත නොවේ යැයි ද කැමැත්ත යනු සංකල්පවලට ඇති රාගය යැයිද කියහි. මේ සංකල්ප අයහපත් සිතිවිලිය. ඒ පැවිද්දෝද කම්සැප විඳින්නෝ වෙති.'

**තෙ න වෙ කාමා යානි චිත්‍රානි ලොකෙ**
**සංකපපරාගඤ්ච වදෙසි කාමං**
**සංකපපයං අකුසලෙ විතකෙක**
**භිකඛූපි තෙ හෙසසති කාමභොගී**

එවිට තෙරණුවෝ පිරිවැජියාගේ වාදයෙහි වැරදි දකිමින් සංකල්පවලට ඇති මිනිසාගේ ඇල්ම, කැමැත්ත හෙවත් කාමය යයි නො කියහිද? ඒ විසිතුරු විසිතුරු අරමුණු කාමය යැයි කියහි'දැයි ඇසූහ. 'පැවිද්දාණනි, එසේය' - එහිදී තෙරුන් වහන්සේ ද (පසූර පිරිවැජියා) තෙවරක්ම (එම අදහසෙහි) ගිවිස්වාගෙන, 'ඇවැත්නි, පිරිවැජියාගේ වාදයෙහි වැරැද්ද බලව'යි ගිවිස්වාගෙන, 'ඇවැත්නි, පිරිවැජියාගේ වාදයෙහි වැරැද්ද බලව'යි වාදපැන තීරකයන් අමතා, 'ඇවැත්නි පසූර, ඔබගේ (සසුනෙහි) මගපෙන්වන නායකයෙකු ඇත්දැ'යි ඇසූහ. 'එසේය, පැවිද්දාණනි, ඇත', 'ඔහු ඇසින් හඳුනාගෙන රූප අරමුණු දකී ද?' හඬ ආදී අරමුණු ඇසුරු කරයි ද?' 'එසේය, පැවිද්දාණනි, ඇසුරු කරයි.', 'එසේනම්, ඔහුගේ නායකකම, මඟපෙන්වීම කොයින්ද? ඔහුද ගෙයක වසන, කම්සුව විඳින්නකු නොවේදැ'යි විමසා ඊට පසු මෙසේ ද කීහ.

'ලෝකයෙහි විසිතුරු දේ කාමය යැයි ද සංකල්පවලට ඇති රාගය කාමය නොවේ යැයිද කියහි. මනරම් රූප දකිමින්, මනරම් නාද අසමින්, මනරම් සුවඳ විඳිමින්, මනරම් රස විඳිමින්, මනරම් පහස ලබමින් ඔබගේ නායකයා ද කම්සුව විඳින්නෙක් වන්නේය.'

තෙ වෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සංකප්පරාගං න වදෙසි කාමං
පස්සනෙතා රූපානි මනොරමානි
සුණනෙතා සද්දානි මනොරමානි

සායනෙතා ගන්ධානි මනොරමානි
සායනෙතා රසානි මනොරමානි
ඵුසනෙතා ඵස්සානි මනොරමානි
සත්ථාපි තෙ හෙස්සති කාමභොගී

මෙසේ කී විට නොවැටහුණු පිරිවැජියා 'මේ පැවිද්දා වාදයෙහි සමත්ය, මොහු ළඟ පැවිදිවී වාද ඉගෙන ගනිමි'යි සැවැත් නුවරට ගොස් පාසිවුරු සපුරාගෙන, ජේතවනාරාමයට පිවිස, එහිදී රන්පැහැ සිරුරින් යුතු, සිරුරු ඉරියව් පවත්වා ගැනීමේදී හාත්පස පැහැදෙන සුළු ලාලුදායි තෙරුන් දැක, 'මේ පැවිද්දා ද මහා නුවණැති වාදයෙහි සමතෙකැ'යි ඒ හිමියන් වෙතින් පැවිදිව, වාදයෙන් අපහාසයට පත්කොට, ඒ පැවිදි ලෙසින්ම කලින් සිටි තීර්ථක අරමට පැමිණ, නැවතත් 'සමණ ගොතම සමග වාද කරන්නෙමි'යි පෙර පරිදිම සැවැත්නුවරටම හඬගා කියා, මහජනයා පිරිවරා 'මෙසේ සමණ ගොතමයන්ට අවමන් කරන්නෙමි'යි කියමින්, ජේතවනාරාමයට ගියේය. ජේතවන දොරටුවෙහි අරක්ගත් දේවතාවා 'මොහු නොවැදගත් ලෙසට පත්කරමි'යි ඔහුට කතා කළ නොහැකි සේ මුව අවහිර කළේය. පසූර භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ ගොළුවකු මෙන් හුන්නේය. මිනිස්සු 'දැන් විමසන්නේය, දැන් විමසන්නේ'යැයි ඔහුගේ මුහුණ බලා 'පසූර, කියව, පසූර කියව'යි මහා හඬින් කෑගැසූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ, පසූර මොනවා කියන්නදැ'යි අසා එහි පැමිණි පිරිසට දහම් දෙසනු පිණිස මේ සූත්‍රය වදාළහ.

එහි මුල් ගාථාවෙහි කෙටි අදහස නම් මේ දැකීම්, හැඟීම් තදින් වැළඳ ගත්තෝ තම තමන්ගේ ඒ මතවාද ඉධෙව සුද්ධිං මෙයම සුද්ධිය යයි කියති. අඤ්ඤෙසු ධම්මෙසු (වෙනත් ලෙසකින්) පිරිසිදු බව නොකියති. කරුණු මෙසේ නම්, තමන්ගේ (දැඩි මතවාදයේ) නායකාදීන් පිළිබඳව, **නිස්සිතා තත්ථ** 'මේ වාදී වූ, මේ කියන අදහස යහපත්'යැයි මෙසේ **සුභවාදීව** බොහෝ මහණ බමුණෝ 'ලෝකය සදා පවතී' ආදී අදහස්වලින් **පච්චෙකසච්චෙසු නිවිට්ඨා.** වෙන වෙනම ඇතුළත් කළහ.

මෙසේ ඒ හැඟීමෙන් මුල් බැසගත් ඔවුන් ගැන 'තෙ වද කාමා' යන ගාථාවෙන් දැක්වේ. **බාලං දහනති මිථු අඤ්ඤමඤ්ඤං** 'මේ අනුවණයෙකැ'යි මිනිස්සු එකිනෙකා ගැන අනුවණ ලෙසම සලකති. මෝඩ යැයි සළකති. **වදනති තෙ අඤ්ඤසිතා කථොජ්ජං** ඔව්හූ එකිනෙකා ඒ මගපෙන්වන නායකයන් නිසා, කලහ-විවාද කරති. **පසංසකාමා කුසලා වදානා** දෙකොටසම (ඒ මත අනුව බෙදී) පැසසුම් කැමතිව, 'අපි යහපත් ලෙස කියමු, අපි උගත් වැදගත් ලෙස කියමු'යි මේ හැඟීමෙන් යුතුව, මෙසේ කියන්නවුන් අතර, එක්කෙනෙක් තමන් නිසි පරිදි කියන බව 'යුතෙතා කථායං' ගාථාව (පෙන්වා දෙයි.) **යුතෙතා කථායං** විවාද කථාවෙහි උත්සාහවත්ව, **පසංසමිච්ඡං විනිඝාති හොති** තමාට පැසසුම් කැමතිව, 'කෙසේ (අනික් මතවාදියාට) අපහාස කරන්නෙම්දැ'යි සැක සහිතව කලින්ම වාදයට යෙදෙයි. **අපාහතසම්ං** 'ඔබ අදහස මතු නොවන පරිදි කියන ලදී, වචන හෝ කරුණු නිරවුල්ව නොකියන ලදැ'යි පැන විමසන තීරකයන්ගෙන් අවමන් ලබයි. **නින්‍දාය සො කුපපති** මෙසේ වාදයෙහි අපහාසයට ලක්ව ඔහු කිපෙයි. **රන්‍ධමෙසි** කෝපවීම පමණක් නොවේ. අනුන්ගේ සිදුරු (වැරදි) සොයයි. 'යමසස වාදං' යන ගාථාවෙන් තවදුරටත් කරුණු දක්වති. එම ගාථාවේ, **පරිහීණමාහු අපාහතං** අරුත් පැහැදිලි කිරීම, වචන ආදිය නොගැලපෙන බව, උසස් නොවන බව කියති. **පරිදෙවති** ඒ නිමිතිකොට ඔහු 'අනික් තැනැත්තන් තමා ගැන විමසිල්ලෙන් සිටිති'යි යනාදී ලෙසින් විලාප නගයි. **සොචති** 'ඔහුට ජය' යැයි සෝක කරයි. **උපච්චගා මං අනුත්‍ථුනාති** 'ඔහු මා හා වාදයෙන් වාදකොට මා ඉක්මවූයේ යැයි වැඩියෙන් විලාප කියයි. **එතෙ විවාදා සමණෙසු** මෙහි **සමණා** යනුවෙන් බාහිර සසුන්හි පිරිවැජියෝ, ඒ බාහිර සසුන්හි පිරිවැජියන් අතර වන විවාද, **එතෙසු උගඝාති නිඝාති හොති** ඒ වාද විවාදවලදී ජය ලැබීම, පරාජය වීම අනුව සිතට ගැටීමකට, පීඩනයට පත්වෙමින් (සිතිවිලි අතර) ගැටෙයි. පීඩා විඳියි. **විරමෙ කථොජ්ජං** කලහය දුරුකරන්නේය. **න හඤ්ඤදත්‍ථත්‍ථි පසංසලාභා** මෙහි පැසසුම් ලැබීමට වඩා වෙනත් දෙයක් නැත. සයවැනි ගාථාවේ අරුත නම්, එසේ පැසසුම් ලැබේ නම්, එය උසස්ම ලැබීම යයි ද, 'මෙය යහපත්' යැයි ද සළකයි. **තත්‍ථ** ඒ හැඟීමෙන් **පසංසිතො වා පන හොති** ඒ වාද අදහස් **වාදං පරිසමජ්ඣෙ** ඉදිරිපත්කොට, **සො තෙන** එයින් ජයගෙන, සතුටුව හෝ දත් පෙන්වා සිනහසෙමින් හෝ **හසති**, මානයෙන් ද ච **උන්නමති,** ඊට හේතුව කුමක්ද? **තං** ඒ ජය සිතේ හැටියට ලැබුණියි (සිතයි.) මෙසේ උඩඟුවීම පිළිබඳව 'යා උන්නතී' ගාථාවෙන් කරුණු දැක්වේ. ඒ ගාථාවෙහි **මානාතිමානං වදතී පනෙසො**

එසේ ඇතිවන ඒ උඩඟුකම 'විඝාතභූමි' වැනසීමට මුල්වන තැනකැයි නොවැටහීමෙන් ද, මානයෙන් ද තවත් උඩඟු වීම ගැනද සඳහන් කරයි.

මෙසේ වාදයෙහි දොස් දක්වා, මීළඟට ඔහුගේ වාදය පිළිනොගනිමින් 'සූරො' යන ගාථාව වදාළහ. එම ගාථාවේ, **රාජඛාදාය** රාජබොජුන් කා වැඩුණු (යුද්ධයෙහි) මනාව සමත්කම් දක්වන, **අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං** ඔහු තමා හා 'කරට කර' සටන් කළහැකි සමතෙකු බලාපොරොත්තුව වහසි බස් කියමින් එයි. මෙය දැකීම්, හැඟීම් දැඩිව ගත්තෙකුට නිදසුන්ය. **යෙ නෙව සො තෙන පලෙහි** එයින් සමත්කම් දක්වන ඒ තැනැත්තා ළඟටම ඔබ යව, **පුබ්බෙව නත්ථි යදිදං යුධාය** කෙලෙස්වලින් ඇතිවන යම් යුද්ධයක් වේද, එය මුලසිටම නැත. බෝමුල්හිදීම ඒවා නැති කරන ලද බව පෙන්වා දෙති.

ඉතිරි ගාථාවල සම්බන්ධතාව පැහැදිලිය. **විවාදයන්ති** විවාද කරති. පටිසෙනිකත්තා විරුද්ධව අදහස් පළකරන්නෙකු, **විසෙනිකත්වා** කෙලෙස් සේනාව වනසා දමා, **කිං ලභෙථ** පිළිමල්ව ආ තැනැත්තා කුමක් ලබන්නෙහිද? **පසූර** ඒ පිරිවැජියා අමතති. **යෙසී ද නත්ථි** එබඳු දේ මෙහි නැත. **පවිතක්කං** 'මට ජය වන්නේදැ'යි ආදී ලෙසින් දෙගිඩියාවෙන් කල්පනා කරමින්, **ධොනෙන යුගං සමාගමා** කෙලෙස් සෝදාහළ බුදුවරයකු සමග තරඟ කරන්නට පැමිණ, **න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ** සිවලෙක් සිංහයෙකු සමග මෙන්, කෙලෙස් සිඳලූ තැනැත්තකු සමග තරඟයට ඒම හෝ, එක වචනයකුදු කීමට හෝ නොහැකි වන්නෙහි? ඉතිරි සියළු කරුණු පැහැදිලිය.

**පසූර සූත්‍ර විස්තරය නිමි.**

## 4.9

දිසවාන **තණ්හං** යනු මාගන්දිය සූත්‍රයයි. මෙම සූත්‍රයට අදාල කථා පුවත කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩ වසද්දී අළුයම

බුදු ඇසින් ලොව බලමින්, කුරු රට කම්මාසදම්ම නියම්ගමෙහි වසන මාගන්දිය නම් බමුණාත්, බැමිණියත් රහත්පල ලැබීමට හේතු සම්පත් ඇති බව දැක, එකෙණෙහිම සැවැත්නුවරින් එහි ගොස්, එම නියම්ගම අසළ, එක්තරා වන ලැහැබක හිඳ රන්පැහැ ආලෝකයක් මුදාහළහ. මාගන්දිය බමුණාද එහි මුව දෝවනය පිණිස ගියේ ඒ රන්පැහැ ආලෝකය දැක, 'මේ කුමක්දැ'යි වටපිට බලනවිට, භාග්‍යවතුන් වහන්සේ දැක සතුටට පත්විය. ඔහුගේ දියණිය රන්පැහැ ඇත්තීය. ඇය බොහෝ කැත්කුල කුමාරවරුන් ආදීන් වළකනු ලබන බැවින්, (සුදුසු කෙනෙකු) නො ලබන්නීය. මාගන්දිය බමුණා ඇය, රන්පැහැ සමණයෙකුටම දෙමි යන අදහස තිබුණි. ඔහු භාග්‍යවතුන් වහන්සේ දැක, 'මොහු මගේ දුවගේ සමාන පැහැය ඇත. මොහුට ඇය (පාවා) දෙමි'යි සිතුවේය. එහෙයින් දුටු පමණින්ම සතුටට පත්විය. ඔහු වහා නිවසට ගොස්, 'සොඳුර, සොඳුර, මා දුවගේ සමාන පැහැ ඇති පිරිමියෙක් දක්නා ලදී. දැරිය සරසව, ඔහුට ඇය දෙමු'යි බැමිණියට කීවේය. බැමිණිය, දැරිය සුවඳ දියෙන් නාවා ඇඳුම්, මල් සැරසීම් ආදියෙන් අලංකාර කරන අතරම, භාග්‍යවතුන් වහන්සේට පිඬු පිණිස කාලයද පැමිණියේය.

භාග්‍යවතුන් වහන්සේ කම්මාසදම්ම ගමෙහි පිඬු පිණිස වැඩියහ. ඒ දෙදෙනාම දියණිය සමග භාග්‍යවතුන් වහන්සේ සිටි දෙසට ගියහ. එහිදී උන්වහන්සේ නොදුටු බැමිණිය, වටපිට බලන්නී, වැඩසිටි තණ ඇතිරිය දුටුවාය. බුදු අදිටන් බලෙන් වැඩසිටි තැන පා සටහනද පැහැදිලිව තිබුණි. 'බමුණ, මේ හිඳසිටි තණ ඇතිරිය' යැයි බැමිණිය කීවාය. 'එසේය සොඳුරිය,' 'එසේනම්, බමුණා අප පැමිණි අරමුණ ඉටු නො වන්නේ ය', 'කුමක් නිසාද, සොඳුරිය?', 'බමුණ, තණ ඇතිරිය තැලී-පොඩිවී නැත, කාමය මඬනා ලද කෙනෙකු පරිහරණය කර ඇතැ'යි කීවාය. බමුණාද, සොඳුර, යහපත සොයද්දී අවකැපෙන දේ නොකියව'යි කීය. නැවත ද, බැමිණිය වටපිට බලන්නී, භාග්‍යවතුන් වහන්සේගේ පා සටහන දැක, 'බමුණ, බලන්න, පා සටහන, මේ තැනැත්තා කාමයන්හි ගැලුනේ නොවේ'යැයි කීවාය. 'සොඳුර, ඔබ කෙසේ දන්නෙහිදැ'යි විමසූවිට, තම දැනුමෙහි බලය පෙන්වමින්, 'රාගී තැනැත්තාගේ පාදය තදින් බිම වැද, මැද වක්වී ඇත, නපුරු තැනැත්තාගේ පාදය බිම ඇදී ගොස් ඇත, මුළාවූ (අනුවණ) තැනැත්තකුගේ පාදය තදින් බිම හැරී ඇත. මේ පා සලකුණ රාගාදී දොස් සිඳලූ තැනැත්තකුගේය.

**රත්‍යස්ස හි උක්කුටිකං පදං භවෙ**
**දුට්ඨස්ස හොති අනුකඩ්ඪිතං පදං**
**මූළ්හස්ස හොති සහසානුපීළිතං**
**විවත්තච්ඡද්දස්සිදමීදිසං පදං** යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ වළඳ ඒ වන ලැහැබට පැමිණෙද්දී ඔවුන්ගේ කතාබහ අඩාල විය. බැමිණිය, උතුම් ලකුණින් යුතු, බඹයක් පමණ රැස් වලල්ලකින් වටකරන ලද භාග්‍යවතුන් වහන්සේගේ රුව දැක, 'බමුණ, ඔබ දුටුවේ මොහුදැ'යි ඇසුවාය. 'සොඳුරිය, එසේය', 'එසේනම්, බලාපොරොත්තුව පැමිණි කරුණ ඉටු නො වන්නේ ය. මෙබඳු තැනැත්තන් කම්සුව වැළඳීම නම් සිදුවිය නොහැකි දෙයකැ'යි බැමිණිය කීවාය. ඔවුන් මෙසේ කතාබහ කරද්දීම භාග්‍යවතුන් වහන්සේ තණ ඇතිරියෙහි හිඳගත්හ. එවිට බමුණා, දියණිය වම් අතින් අල්ලාගෙන, දකුණතින් පැන් කෙණ්ඩිය ගෙන, භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, 'පින්වත් පැවිද්දාණනි, ඔබ ද රන්පැහැ ඇත්තෙහිය. මේ දැරියත් රන්පැහැ ඇත්තීය. මැය සුදුසු ඔබටය. මම මේ දැරිය පිංවත් ඔබට බිරියකොට ඇතිදැඩි කරගැනීමට දෙමි. අතපැන් වත්කිරීමෙන් දැරිය පිළිගත මැනවැ'යි කියා ඇය පාවාදෙනු කැමතිව සූදානම් විය. භාග්‍යවතුන් වහන්සේ බමුණා හා කතා නොකරමින්, වෙනත් කෙනෙකු සමග කතා කරන්නා සේ, 'දිසවාන තණ්හං'.............යන මේ ගාථාව කීහ.

එහි අරුත නම්, අජපාල නුගමුලදී, නොයෙක් රූ මවා, පොළඹවා ගැනීමට ආ මර දූවරුන් **දිසවාන තණ්හං අරතිං රගඤ්ච ඡන්දො** ලිංගික හැසිරීමෙහි කිසිදු කැමැත්තක් ඇති නොවීය. **මුත්තකරීසපුණ්ණං** මේ දැරියගේ (මෙබඳු) රූපය දැක කෙසේනම් (ඇල්මක්) වේද? හැමවිටම **පාදාපි නං සමථුසිතුං න ඉච්ඡෙ** මේ සිරුර පයිනුදු පෑගීමට නො කැමැතියෙමි. එසේනම්, මැය හා එක්ව විසීමක් කොයින්ද?

එවිට මාගන්දිය, 'මිනිස් කම්සුව හැර, දෙව් කම් සුව කැමැතිව පැවිදි වූවෝ වෙති, මොහු දෙව් කම්සුවයද නොකැමති වේ, මේ ද කාන්තා රුවනකි. ඇය පිළිබඳව හැඟීම කෙබඳුදැ'යි? විමසීමට දෙවන ගාථාව කීය. එහි **එතාදිසඤ්චෙ රතනං** දේව කාන්තා රුවනක් ගැන කියයි. **නාරිං** තමන්ගේ දියණිය ගැනයි. **දිට්ඨිගතං සීලවතානුජීවිතං**

හැඟීමද, සීලයද, වත්පිළිවෙතද, ජීවිතය ගැන ද, **භවූපපත්තිඤ්ච වදෙසි** **කීදිසං** තමාගේ සසර උපත කෙබඳුදැ'යි කියනු මැනවි.

මෙයින් පසු දැක්වෙන ගාථා දෙක, පිළිතුරු දීම හා විමසීම අනුව කරුණු දක්වයි. එහි පළමු ගාථාවේ කෙටි අරුත නම්, **තසස** මාගන්දිය, සැටදෙකක් වූ හැඟීම් (මතවාද) **ධමෙමසු**, **තීරණය** කොට 'මෙයම ඇත්තය, අනික් සියලු කරුණු බොරු'යැයි මෙසේ **ඉදං වදාමීති සමුගගහීතං න හොති** (අදහසක්) මට නැත. අදාල නොවේ. ඊට හේතු කවරේද? **පසසනෙතා දිටඨීසු** මම කිසිදු දැකීමක් දැඩිසේ නොගෙන, ඇති තතු (ඇති ආකාරයෙන්ම) **පවිචිනනෙතා**, තමා තුළ රාගාදී හැඟීම් තිබෙන බැවින්, **අජඣතත සනතිං** එයින් ඇත් වූ සැනසීම නම් වූ නිවණම දුටුවෙමි. දෙවන ගාථාවෙහි කෙටි අරුත නම්, **යානි** මේ හැඟීම්වලින් ඒ ඒ පුද්ගලයන් තීරණය කොට පිළිගන්නා බැවින්, **විනිචඡයා** තමන් (සිතන) හේතු මත ගොඩනගා ගනු ලබන අදහස්, **පකපපිතානි** යැයි ද කියනු ලබයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, නුවණැති උතුමන් විසින් පවසන ලද ඒ වචන, (තවදුරටත්) තහවුරු වන පරිදි 'න දිටඨියා' යන ගාථාවෙන් පැහැදිලි කළහ. **න දිටඨියා** දැකීම්, ඇසීමෙන්, දැහැන් ආදී බාහිර (වෙනත් සමය) සිල් පිළිවෙත් පිළිකෙව් කරයි. **සුදධිමාහ** මෙහි කීය යන තේරුම ඇති ආහ යන පදය අදාල පරිදි න සමග යොදා (වියරණ පරිදි) උත්තම පුරිස සේ ගෙන, 'දැකීමෙන් පිරිසිදු වෙතැයි මම නො කියමි. (දිටඨියා සුදධිං නාහං කථෙමි) මෙසේ අරුත් දතයුතුය. ඉතිරි පද ද මේ අයුරිනි. එහිදී **අදිටඨියා නාහ** කරුණු දහයකින් යුතු යහපත් දැකීම හැර (වෙනත් කරුණක්) නො කියමි. **අසුතියා** එසේම නව වැදෑරුම් ඇසීම හැර, **අඤඤාණ** කම්පල අනුව යන ඇති තතු ඒ ආකාරයෙන් දකින නුවණින් හැර, **අසීලතා** පාමොක් සංවර සීලයෙන් හැර, **අබබතා** ධුතාංග හැර, **නොපි තෙන** ඒ එක් එක් දැකීම් ආදී පමණින් - නොකියමියි තේරුම් දත යුතුය. **එතෙ ච නිසසජජ අනුගගහාය** පෙර දැකීම් ආදී ලෙසින් වූ අයහපත් කරුණු මුළුමනින් ඉවත් නොකොට, පසුව දැකීම් ආදිය දැඩිව නොගැනීමෙන් (ඒවාට වහල් නොවීමෙන්) යහපත් කරුණු තමා කෙරෙහි ඇති කරගැනීමෙන් උපකාර වනු පිණිස, **සනෙතා අනිසසාය භවං න ජපෙප** මේ පිළිවෙතින් රාගාදි (හැඟීම්-කටයුතු) සමනය කිරීමෙන්, සන්සුන්ව ඇස් ආදී දේ (ඉඳුරන්) ඇසුරුකොට නොගනිමින්, එකදු උපත ලබන තැනක් නො පතන්නේ ය. (ඊට අදාල) හේතු මෙන්ම (ඉවතලීම)

නොපැතීමකටද හැකි වන්නේය. මේ කෙලෙස් නැසීමෙන් තමා තුළ ඇතිවන සන්හුන් බව යයි අදහස් වේ.

මෙසේ වදාළ කල, මාගන්දිය එහි වචනවල තේරුම් නොසළකමින් නො වෙ කිර යන ගාථාව කීවේය. එහි දැකීම් ආදිය කී පරිදිමද, අයහපත් කරුණු ආදියද යයි දෙකොටසම ගැන කීය. **ආහ** යන වචනය **නො වෙ කිර** යන වචන සමග යොදා 'නොකීවේ නම්', 'නොකීවෙහි නම්' යැයි මෙසේ අරුත් දත යුතුය. **මොමූහං** මෝහයෙන් බොරෝ සේ මුළාවී, **පවෙවනතී** දනිති.

එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ දැකීම නිසා ඇසූ දෙය පිළි නොගනිමින් 'දිට්ඨිඤ්ච නිසසාය'........යන ගාථාව වදාළහ. එහි තේරුම නම්, මාගන්දිය, ඔබ දැඩිව ගන්නා ලද දැකීම් නිසා නැවත නැවත පුචඡමානො විචාරමින් ඒ ඒ දැකීම් - හැඟීම් දැඩිසේ ගෙන, ඒවායෙහිම වෙළී සමුගගහිතෙසු දැඩිසේ මුළාවට පත්වූයෙහි. **ඉතො ච** මා විසින් කියන ලද තමා තුළ සන්සුන් බව ඇතිකරන පිළිවෙතින් දහම් දෙසීමෙන්, **අණුමපි සඤ්ඤං** (මඳක් හෝ දැනගත් බවක්) නොදුටුවෙහි. ඒ කරුණින් ඔබ මේ දහම **මොමූහතො** අති මූඪ සේ දක්නෙහිය.

මෙසේ දැඩිව ගත් හැඟීම්වලින් මුළාවූ මාගන්දියට විවාදයෙහි වරද දක්වා, මීළඟට, ඒ අනෙක් කරුණු අතර මෝහය ඉවත් නොවන තැනැත්තා වෙනස්වන අයුරු 'සමො විසෙසී' යන ගාථාවෙන් වදාළහ. එහි අරුත නම් **යො** මෙසේ තුන්ආකාර වූ මානයෙන් හෝ දැකීම්වලින් හෝ **මඤ්ඤති**, මාන කෙරේනම් ඔහු **තෙන** ඒ මානයෙන්, ඒ දැකීමෙන් - හැඟීමෙන් ඒ පුද්ගලයෙකු සමග විවාද කරන්නේය. මේ මානවලින් වෙන්වුණු අප වැනි වූ **තීසු විධාසු අවිකමපමානො සමො විසෙසීති න තසස හොති** ත්‍රිවිධ මානයෙන් නොසැලේ නම් ඔහුට මානය නොවේ. "න ච හීනො" - ලාමක නොවූයේ ද යනුවෙන් ඉතිරි පාඨයක් ද වේ. තවදුරටත් කිවයුතුද? 'සච්චනති සො' ගාථාවේ අරුත නම් **සො** මෙබඳු මාන හා දැකීම් නැති කළ, පව් බැහැර කළ මා වැනි, **බ්‍රාහමණො ඉදමෙව සච්චං කිං වදෙය්‍ය** මගේ (කීම) ඇත්තය, ඔබේ (කීම බොරු යැයි) කුමක් නිසා කියන්නේද? කුමක් හේතුකොට කියන්නේද? **මුසාති වා කෙන** මානයෙන් දැකීමෙන් හෝ පුද්ගලයෙකු සමග **විවදෙය්‍ය**, කෙලෙස් දුරු කළ මා වැනි කෙනෙක් 'මම (තවත් කෙනෙකු හා සමාන වෙමි'යි සමව

පැවතීම හෝ, අනික් තැනැත්තා හා සම නොවන බව හෝ **විසමං වා නත්‍ථි,** සමාන තැනැත්තන් කෙරෙහි **කෙන වාදං පටිසංයුඤ්ජෙය්‍ය** වාදයෙහි යෙදෙන්නේය. 'ඔකං පහාය' ගාථාව නිසැකවම මෙබඳු තැනැත්තකු ගැන නොවේද? **ඔකං පහාය** රූප, වත් ආදී දේ හඳුනා ගැනීමට ඇති අවසරයෙන් එහි හටගැනෙන ඡන්දරාගය නැතිකිරීමෙන් ඉවතලා, **අනිකෙතසාරී** රූප නිමිති නමැති නිවෙස් ආදියට තණ්හාව සිහිපත්කොට නොගනිමින්, **ගාමෙ අකුබ්බං මුනිසන්‍ථවානි** ගමෙහිදී ගිහියන් සමග සබඳතා ඇතිකර නොගනිමින්, **කාමෙහි රිත්තො** කාමයන්හි ඡන්දරාගය නැති කිරීමෙන් සියළුම කාමයන්ගෙන් වෙන්වූයේ, **අපුරෙක්ඛරානො** නැවත භවයක උපතක් නොලබමින්, **කථං න විග්ගය්හ ජනෙන කයිරා** ජනයා සමග කලහ විවාද වඩවන කථා නොකරයි.

'යෙහි විවිත්තො යන ගාථාවෙන් ඒ තැනැත්තා මෙබඳු යැයි පහදති. **යෙහි** දැඩිව ගත් හැඟීම්-දැකීම් පෙරටුකොට ගත්තවුන්, **විවිත්තො විචරෙය්‍ය** නැතිව හැසිරෙයි. **න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො** අපරාධයක් නොකරන අදහසින් 'නාගො' හැඳින්වෙන තැනැත්තා ඒ දැකීම් මතවාද ඉගෙන නො කියන්නේය. (ඒවා පෙරටුකොට නොගනී.) **එලම්බුජං** වැගිරෙන සුළු වූ, ජලයෙහි හටගත්, **කණ්ටක** නළය (හෙවත් රළු දණ්ඩ) **වාරිජං** පියුම යැයි කියන ලදී. **යථා ජලෙන පංකෙන ච නූපලිත්තං** ඒ පියුම ජලය ද මඩ ද නොතැවරෙන්නා සේ, **එවං මුනි සන්තිවාදො අගිද්ධො** මෙසේ තම සිත් සතන් සන්සුන් බවට පත් මුනිවරයා ඇලීම් රහිතව, **කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො** දෙආකාර වූ කාමයන්, අපාය ආදී ලෝකයෙහිත් තණ්හා ආදී දෙආකාර ආලේපයෙහි නොඇලුනේ වේ.

වැඩිදුරටත් (ඒ ගැන) කිවයුතු ද? 'න වෙදගූ' ගාථාවෙන් (තවදුරටත් පහදා දෙති. **න වෙදගූ දිට්ඨියා** සිවුමග මනාව දත් මා වැන්නෙක් දැඩි හැඟීම් දැකීම් - යානාවක් කරගෙන නැත. (ඒවා පෙරටුකොට කැපී පෙනීමට උත්සාහ නොගනී.) දැකීම පෙරමගට ගෙන හෝ, එහි හරයක් බලාපොරොත්තු වන්නේ ද නොවේ. එහි පද අරුත නම්, යම් වචනයකින් හැඟවෙන දෙය කරන හෝ එය කිරීමට පමුණුවන අදහස අනුව - දැකීමට හෙවත් දිට්ඨි - එයට පැමිණීමෙන්, දිට්ඨියා යනු දුතියා විබත් අදහසින් සත්තමී විභක්තිය යෙදී ඇත. **න මුතියා සමානමෙති** පහස රූප ආදියෙන්, ලබන්නා වූ පහසින්ද එබඳු මානයට නොපැමිණෙයි. **න හි**

**තමමයො සො** තණ්හාවෙන් හා දැඩිව ගත් හැඟීමෙන් (දිට්ඨී) එය තමාගේ ලෙසට, එයම පිහිටකොට ගනී. මුනිවරයා එබඳු තැනැත්තෙක් නොවේ. **න කම්මනා නොපි සුතෙන නෙයෙ‍යා** පින් ආදියෙහි රැස්කිරීම හෝ, යම් දෙයක් කිරීමෙන් හෝ ඇසීමෙන් පිරිසිදු වේ යැයි හෝ මුනිවරයා පොළඹවා ගතයුතු කෙනෙක් නොවේ. **අනුපනීතො සො නිවෙසනෙසු** මුනිවරයා ආසාවනට හා දැකීම්-හැඟීම්වලට යොමුවීමේ දෙආකාර පැවැත්මෙන් මිදුණු හෙයින්, ඒවායින් මතුවන්නා වූ, බැහැර කළ නොහැකි ලෙසින් රැඳී ඇති සිතිවිලි සියල්ලම ඉවත දමන ලදී. එබඳු කෙලෙසුන් දුරුකරන ලද මුනිවරයාගේ ගතිසොබාවය (තවදුරටත්) 'සඤ්ඤාවිරත්තසස' යන ගාථාවෙන් දක්වති. **සඤ්ඤාවිරත්තසස** (ජීවිතය හා බැඳුණු හැම දෙයකම) අතහැර දැමීමේ අදහස පෙරදැරිකොට ගත් භාවනාවෙන්, කාමාදී හැඟීම් නැතිකළ තැනැත්තාට, මෙසේ කාමාදී හැඟීම් නැතිකළ හා සියළු කෙලෙස් නැතිකළ උතුමන් අතර සමථ භාවනාව මුල්කර ගැනීම අදහස් වේ. **පඤ්ඤා විමුත්තසස** විදසුන් පෙරටුකොට ගත් භාවනාවෙන් සියළු කෙලෙසුන්ගෙන් මිදුණු තැනැත්තාට - මෙහි දැහැන් නොලබා විදසුන්පත් තැනැත්තා අදහස් වේ. **සඤ්ඤංච දිට්ඨිඤ්ච යෙ අගගහෙසුං තෙ ඝට්ටයනතා විචරනති ලොකෙ** හැඟීම් දැඩිකොට ගත්තෝ ගිහිගෙවල වසන්නෝය. ඔව්හූ ඒ කාමය හේතුකොට - මුල්කොට එකිනෙකා ගැටෙමින් හැසිරෙති. මෙහි ඉතිරි කරුණු ගැන නොකියූ දෙයක් වේනම්, එය (මේ දක්වා සූත්‍ර විස්තරවලට අනුව) දතයුතුය. දේසනය අවසානයෙහි බමුණාද බැමිණියද පැවිදිව රහත් බවට පැමිණියහ.

**මාගන්දිය සූත්‍ර විස්තරය නිමි.**

# 4.10

**කථං දසසී** යනු පුරාභෙද සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණු කුමක්ද? මේ සූත්‍රයට මෙන්ම, ඉදිරියට දැක්වෙන කලහ විවාද - චූලවියූහ - මහාවියූහ - තුවටක - අත්තදණ්ඩ යන සූත්‍ර පහද, සම්මා පරිබ්බාජනීය සූත්‍රයෙහි නිදාන කතාවට සමානය. ඒ මහා රැස්වීමේදී රාගය වැඩි

දේවතාවුන්ට ගැලපෙන සේ දහම් දෙසීමට, ඉඳු බලයෙන් පෙන්වන ලද 'බුදුරුව' විසින් තමන්වහන්සේ ලවා කරුණු විමසනු ලදුව, සමමා පරිබබාජනීය සූත්‍රය දේසනා කරන ලදී. මෙසේ ඒ හමුවෙහිදීම, 'සිරුර බිඳීයාමට පෙර කුමක් කළ යුතුද?' යන දෙවියන්ගේ සිතිවිලි දැන, ඔවුන්ට උපකාර පිණිස, හත්සිය පණහක් මහසඟ පිරිවරා ඉඳු බලෙන් පෙන්වූ බුදුරුවක් අහසින් වඩමවා, එමගින් තමන්වහන්සේ විමසන ලදුව මෙම සූත්‍රය වදාළහ. මෙහි වෙනස එයයි.

ඒ පෙන්වන ලද බුදුරද, **කථං දසසී** තියුණු උසස් නුවණත් **කථං සීලො** උසස් සීලයත්, **උපසනෙතා** උසස් සිත ගැනත් විමසයි. ඉතිරි කරුණු පැහැදිලිය.

භාග්‍යවතුන් වහන්සේ ඒ විසඳීමේදී, සුදුසු පරිදි, උසස් නුවණ ගැන විස්තර නොකොට, උසස් නුවණින් ලබන කෙලෙස් සංසිඳීමෙන් ඇතිවන උසස් සිත ගැන කීමට, නොයෙක් දේවතාවුන්ගේ සිත් අනුව බලා 'වීතතණෙහා' ආදී ගාථා දෙසූහ. එහි මුල පටන් ගාථා අටටම 'තං බ්‍රෑමි උපසනෙතා' - ඒ උසස් සිත වැඩූ තැනැත්තා යයි කියමි' යන ගාථා සම්බන්ධය දතයුතුය. එමෙන්ම හැම පසු පදයකින්ම 'ඔහු සන්සුන් වූයේමය, සාන්ත වූයේම යයි කියනු ලැබේ. (සූත්‍රයේ අවසාන ගාථාවේ පාඨයද) යොදාගැනීමද සුදුසුය.

මෙතෙක් විස්තර නොවූ පද ගැන කීමේදී **වීතතණෙහා පුරා භෙදා** (සඳහන් වේ.) යම් කෙනෙක් සිරුර බිඳීයාමට පෙරම තණ්හාව නැති කළේද, **පුබබමනතමනිසසිතො** අතීතාදී කාලයේම එහි ඇසුර නැතිකරන ලද, **වෙමජෙකධ නූපසංඛයෙය්‍යා** වත්මන් කල්හිද 'රාගී' ලෙසින් හෝ සලකනු නොලැබිය යුතුය. **තසස නත්‍ථී පූරකඛතං** එබඳු තැනැත්තාට තණ්හා දිට්ඨී දෙකෙහි පෙරටුකොට නොගන්නා බැවින් අනාගතයෙහිද පෙන්වාදීමට දැනුදු (වත්මනෙහිද) කිසිදු දෙයක් නැත. (මතු භවයක උපතකට කරුණු නැත.) 'ඔහු සැනසුනු කෙනෙකැයි කියමි' මෙහිදී යොදාගත යුතුය. අදාල හැම තැනකදීම එපරිද්දෙනි. මින්පසුව එම යෙදුම නොදක්වාම විස්තර නොවූ වචන ගැන කියන්නෙමු. **අසනතාසී** ඒ ඒ දේවල් නොලැබීමෙන් තැති නොගන්නා වූ, **අවිකත්‍ථී** සීලාදී ගුණ නොකියන සුළු, **අකුකකුචො** අත් ආදී (අඟපසඟින්) කළ දෙයින් කුකුස-පසුතැවිලි නැති, **මනතභාණී** සිතාබලා වචන කියන, **අනුදධතො** උඩඟු

නැති, **සවෙ වාචායතො** වචනයෙන් සංවරව සිවුදොස් රහිත වචන කියන ලද්දේ වෙයි. **නිරාසත්ති** ආසා නැති, **විවෙකදස්සී එසෙසසු** වත්මන්හි ඇස ගැටෙන පහස ආදියෙහිදී (අරමුණුවලදී) තමන් ලද විවේකය දකී. දිට්ඨීසු ච න නීයති සැටදෙකක් වූ මිසදිටු දැකීම්වල කිසිදු දැකීමකට නොඑළඹෙයි. දැඩිව නොගනී. **පතිලීනො** රාගාදිය නැතිකළ බැවින් එයින් ඉවත් වූයේ, **අකුහතො** නැතිගුණ පෙන්වනු ලබන තුන්ආකාර වූ කරුණින් වෙන් වූ, **අපිහාලු** බලාපොරොත්තු, පැතුම් ලෙසින් කිසිත් නැති. **අමච්ඡරී** පස්ආකාර වූ මසුරු බව නැති, **අප්පගබ්භො** කයෙන් වෙසෙස් නොකටයුතු දේ, **අජෙගුච්ඡො** සීලයෙන් යුතු බැවින්, පිළිකුල් නොකටයුතු, සේවනය කළයුතු මනාප වූ, **පෙසුනෙය්‍යෙ ච නො යුතො** දෙආකාර වූ කේලාම් කීමෙහි නොයෙදුණු, **සාතියෙසු අනස්සාවී** පස්කම් ආසා ඇතිකරන දේවල ඇලීමේ ඇසුරෙන් වෙන් වූ, **සණ්හො** කයෙන් කෙරෙන කටයුතු ආදියෙහි රළුනොවූ, **පටිභානවා** ඉගෙන දරාගත් දෙයෙහි, විමසූ විටකද මනාව වැටහීමෙන්, **න සද්ධො** කිසිවකුගේ ඇදහීමකින් තොරව තමන්ම අවබෝධ කරයි.

න විරජ්ජති රාගය නැතිකළ බැවින් දැන් කිසිවක නොඇලේ. ලාභකම්‍යා **න සික්ඛති** වාසිය පිණිස සූත්‍රාදිය ඉගෙන නොගනී. **අවිරුද්ධො** ච තණ්හාය රසෙසු නානුගිජ්ඣති කිසිවකු සමග සතුරු නොවන බැවින් තමාටද සතුරන් නැතිව, තණ්හාවෙන් කිසිදු ආකාර රසයකට ගිජුවීමක් නැත. **උපෙක්ඛතො** ඉඳුරන් සය හා අරුමුණු එක්වීමේදී මැදිහත් සිතින් යුතුව, **සතො** කයෙන් කෙරෙන කටයුතු පිළිබඳව සිහියෙන් යුතුව, **නිස්සයතා** තණ්හා දිට්ඨියෙහි නොවෙළී, **ඤත්වා ධම්මං** හැම දෙයකටම තිර පැවැත්මක් නැතැයි දැන, **අනිස්සිතො** මේ ඇසුරු කොට ඇති, වැසී පැතිරී ඇති තණ්හා ආදියෙන් වෙන්ව, එම දහම් නුවණින් හැර, ඒ තණ්හා ආදියෙහි අත්හැරීමක් නම් නොවේ යැයි පෙන්වා දෙයි. **භවාය** විභවාය වා සදාකාලික පැවැත්මක් හෝ වැනසීම වැනි දැඩිව ගත් දැකීම් නැතිව, **තං බ්‍රෑමි උපසන්තො** මේ පිළිබඳව එක් එක් ගාථාවෙහි කියා ඇති පරිදි 'සත්හුන් තැනැත්තා' යයි කියමි. **අතාරි සො විසත්තිකං** ඒ කෙලෙස් නැසූ තැනැත්තා පැතිරී ඇතැ'යි (ඔඩුදුවා ඇති) කියන ලද මහා තණ්හාව ඉක්මවා ගියේය.

මීළඟට ඒ වඩනා ලද සිතැති 'සාන්ත' වූ තැනැත්තා පසසමින් 'න තස්ස පුත්තා' යන ගාථාව වදාළහ. **පුත්තා** මෙහි තමාට දාව උපන් ආදී

ලෙසින් සතරාකාරය. මෙහිදී පුතුන් මෙන්ම, ඒ ඒ අයිති දේවල් ද සැළකෙන බව දතයුතුය. එබඳු දේවල්ද ඒ තැනැත්තාට **න විජ්ජති** ඒවා නොමැති බැවින් පුතුන් ආදී කිසිවක් නොපෙනේ. **යෙන නං වජ්ජු පුථුජ්ජනා අථො සමණබ්‍රාහමණං** රාගාදී කෙලෙස් වසඟ වූ සියළුම දෙවි මිනිස්සු ද, මේ සස්නෙහි පිටත මහණ බමුණන් ද 'රාගයෙන් හෝ කෝපයෙන් හෝ සිටිත්'යැයි කියන්නාහ. **තං තසස අපුරෙකඛතං** ඒ රාගාදී වරදක් ඒ රහත් බවට පත් උතුමාට ඉදිරියට ගෙනයාමට නැත. **තසමා වාදෙසු නෙජතී** ඒ කාරණයෙන් අපහාස වචනවලදී කම්පා නොවේ. **න උසෙසසු වදති** උසස් බවට පත්වූවන් අතර, තමන්ද ඊට ඇතුලත් කොට, මම උසස් වෙමි'යි නොකියයි. ඉතිරි කරුණු දෙකෙහිද මෙපරිදිය. **කපපං නෙති අකපපියො** ඒ රහත් උතුමා මෙබඳු දෙයාකාර වූ කල්පනාවට නොඑයි. කුමක් නිසාද? සංකල්ප නොගන්නා බැවිනි. ඒ තණ්හා දිට්ඨි කල්පනා නැති කරන ලදැයි කියන ලදී. **සකං** 'මගේ යැයි දැඩිව ගන්නා ලද, **අසතා න සොචති** අවිජජා මාන ආදිය නැති බැවින් කණගාටු නොවේ. **ධමෙමසු ච න ගචඡති** කිසිදු දෙයකට කැමැත්තක් ඇතිකර නොගනී. **සවෙ සනෙතා ති වුචචති** මෙබඳු තැනැත්තා මිනිසුන් අතර උතුම්ය. සාන්ත වේ යැයි අරහත් බව කුළුගන්වමින් දේසනය නිම කළහ. දේසනය අවසානයෙහි කෙළ දහසක් දෙවියෝ අරහත් පල ලදහ. සෝවාන් පලයට පත්වූවන් පමණ කළ නොහැකිය.

පුරාභෙද සූත්‍ර විස්තරය නිමි.

## 4.11

**කුතො පහූතා කලහා** යනු කලහ විවාද සූත්‍රයයි. එයට හේතු වූ කරුණ කුමක්ද? මෙයද ඒ මහා හමුවෙහිදී 'කලහ ආදියට හේතුවන කරුණු අට කෙසේ පවතීදැ'යි ඇතැම් දේවතාවුන්ට ඇතිවූ අදහස අනුව පෙර පරිදි පෙන්වන ලද බුදුවරයකු විසින් තමන් (වහන්සේ) විමසන ලදුව දේසනා කරන ලද්දකි.

විමසීම සහ පිළිතුරු ලෙසින් මෙහි සියළු ගාථා සම්බන්ධ වේ. එහි පැහැදිළි නොකළ වචන ගැනද මෙසේ දතයුතුය. **කුතො පහූතා කලහා විවාදා** කලහය ද එයට හේතුවන විවාදය ද යන මේවා හටගත්තේ කොතැනින් ද? **පරිදෙවසොකා සහ මච්ඡරා** ච හැඬීම්, සෝකවීම්, මසුරු බව කොතැනින් ඇතිවන්නේ ද? **මානාතිමානා සහ පෙසුනා ච** මානයද, තමාට වඩා අනික් තැනැත්තන් පහත්කොට සිතන අතිමානයද, කේලාම්ද කොතැනින් හටගත්තේ ද? **තෙ** ඒ කෙලෙස් සහගත කරුණු අට, **තදිංඝ බ්‍රෑහි** මා විමසන ලද පරිදි තේරුම කියනු මැනවි. මම එය ඉල්ලමි. ඉල්ලීම යන අදහසට **ඉංඝ** යන නිපාතය යෙදේ. **පියා පහූතා** පිය-කැමති බැවින් හටගනී. මීට අදාල කරුණු නිද්දෙසයෙහි කියන ලදී. **මච්ඡරිය යුත්තා කලහා විවාදා** මේ කලහ විවාද ආදියට හුදෙක් කැමති දේ නිසාද, මසුරු බවද පමණක් හේතු නොවේ. කලහ විවාද මූලිකව ඒ සියළුම කරුණු කියන ලදැයි දතයුතුය. මසුරුකම වේද, එසේම කේලම ද විවාදයට හේතු වේ. එහෙයින් **විවාද ජාතෙසු ච පෙසුනානි** යැයි කීහ. **පියාසු ලොකසමිං කුතො නිදානා යෙ වාපි ලොභා විචරන්ති ලොකෙ** පියතාව කැමැත්ත නිසා කලහය හටගනී යැයි කියන ලදී. ලොව ඒ කැමැත්තට හේතු වන්නේ කුමක්ද? කැමැත්තම පමණක් නොවේ. කැත් කුලවත් ආදීහු ලෝභයෙන් හැසිරෙති. ලෝභය නිසාම, ලෝභයෙන් මඬනා ලදුව හැසිරෙති. ඔවුන්ගේ ඒ ලෝභයද කොතැනින් හටගනීද යනුවෙන් තේරුම් දෙකක් එකවර විචාරයි. **ආසා ච නිට්ඨා ච** ආසාවද එය ඉටුවීමද, **යෙ සම්පරායාය නරස්ස හොන්ති** පරලොව පිණිස පවතී. පිහිට වෙතියි කියන ලදී. මෙයද එකවරම විමසීමයි. **ඡන්දානිදානානි** කාමච්ඡන්දය ආදිය හේතු වේ. **යෙ චාපි ලොභා විචරන්ති** කැත් කුලවතකු හෝ ලෝභයෙන් හැසිරෙත් ද ඔවුන්ගේ ලෝභයද කැමැත්ත නිසා ඇතිවන බව එකවිටම විසඳයි. **ඉතො නිදානා** කැමැත්ත හේතුකොටම යැයි කියන ලදී. **කුතො නිදානා** මේ වචන යෙදෙන අයුරු සූචිලොම සූත්‍රයෙහි කියන ලද පරිදි දතයුතුය. **විනිච්ඡයා** තණ්හා දිට්ඨී මුල්කොට තීරණ ගනී, **යෙ චාපි ධම්මා සමණෙන වුත්තා** තරහ ආදී එබඳු අනෙක් අයහපත් කරුණු කොතැනින් හටගන්නේ දැ'යි බුදුරජාණන් වහන්සේ නම් මහණුන් විසින් පවසන ලදී. **තමූපනිස්සාය පහොති ඡන්දො** එය සැප වේදනා-දුක් වේදනා ලෙසත්, ඒ දෙකොටසටම අයත් මිහිරි-අමිහිරි බව නිසා එක්වීම, වෙන්වීම, (තබා ගැනීමෙන්-ඉවත් කිරීමෙන්) බලාපොරොත්තු, පැතුම් සේ හටගනී. මෙපමණකින් ලෝකයෙහි ඡන්දය හෙවත් කැමැත්තට හේතුව කුමක්ද? යන මෙම පැනය විසඳන ලදී. **රූපෙසු දිස්වා විභවං භවඤ්ච** රූපයන්හි

නැසීමද, හටගැනීමද දැක, **විනිච්ඡයං කුරුතෙ ජනතු ලොකෙ** අපාය ආදී ලෝකයෙහි (සැප රහිත තැන්හී) මේ මිනිසා සැප සම්පත් ලබාගැනීම පිණිස, තණ්හාවෙන් තීරණය කොට, 'මට අයිති දෙයක් ලැබුණේ'යැයි දැකීමද, හැඟීමද මුල්කොට එයින්ද තීරණය කරයි. මීට අදාළ කරුණු නිද්දෙසයෙහි සඳහන් වෙයි. මෙපමණකින් තීරණය කරයි. මෙපමණකින් තීරණය කොතැනින් මතුවන්නේද? යන පැනය විසඳන ලදී. **එතෙපි ධම්මා ද්වයමෙව සනෙත** මේ ලෝභාදී කරුණු මිහිරි-අමිහිරි යැයි දෙආකාරයෙන්ම ඇතිවිය හැකිය. එසේ ඇතිවන අයුරු නිද්දෙසයෙහි සඳහන් වේ. මෙපමණකින් තුන්වන පැනය විසඳන ලදී.

මෙසේ, පැන විසඳීමෙහි සැකයක් වේ නම්, එම සැකය දුරුකර ගැනීමේ මගක් ලෙස **කථංකථී ඤාණපථාය සික්ඛෙ** යැයි වදාළහ. ඇති සැටියෙන්ම නුවණින් දැකීමට - හේතුවන තියුණු නුවණ ලැබ ගැනීමට (සිවුසස් අවබෝධයෙන්) තුන්ආකාර වූ හික්මීම අනුගමනය කළයුතු බව කියන ලදී. ඊට හේතු කුමක්ද? **ඤත්වා පවුත්තා සමණෙන ධම්මා** බුදුරජාණන් වහන්සේ විසින් දැනගෙනම කරුණු පහදා දී ඇති බැවිනි. උන්වහන්සේ නොදත්, අවබෝධ නොකළ කිසිවක් නැත. එම දේසනයෙහි (හෙවත් කරුණු පැහැදිලි කිරීමේදී) කිසිදු වරදක් නැත. එහෙයින් සැකය නැතිකර ගැනීමට නුවණ ලබාගැනීමට හේතුවන මගෙහි ඒ සමණ නම් වූ බුදුරදුන් කියන ලද දහම දැන හික්මීමක් ලබව. **සාතං අසාතඤ්ච කුතො නිදානා** මෙහි සාත අසාත යනු සැප දුක් විඳීම අදහස් කෙරේ. **න භවන්ති** හෙතෙ ඒවා ඇති නොවෙත් ද, **විභවං භවඤ්චාපි යමෙතමත්ථං, එතං මෙ පබ්‍රෑහි යතො නිදානං** සැප දුක් වේදනා ඇති නොවීමද, ඇතිවීමද යනුවෙන් තේරුම දෙන වචනයෙහි ලිඟු වෙනසක් ද මෙහි වෙයි. එය සාතාසාතානං විභවො භවො යැයි (විය යුතු) එහි අරුතත්, ඊට හේතුවත් මට කියනු මැනවි. සැපදුකෙහි හටගැනීම හා හටනොගැනීමත්, ඒ හටගැනීම හා හට නොගැනීම පිළිබඳව ගොඩනඟා ගන්නා දැකීමත් මෙහිලා දතයුතුය. එසේම, මේ පැනය විසඳීමේදී දුක ඇතිවීම ගැන ගොඩනැගෙන දැකීමටද පහස (සිත හා අරමුණ) හේතු වේ. දුක නැතිවීම ගැන ගොඩනැගෙන දැකීමට ද පහස හේතුවේ යැයි නිද්දෙසයෙහි දක්වන ලදී. **ඉතො නිදානා** පහස හේතුවන බවයි. **කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා** කුමක් ඉවත් වූ කල ඇසට අරමුණු වන පහස ආදී පස් ආකාර වන පහස නොගැටේද? **නාමඤ්ච රූපඤ්ච පටිච්ච** අරමුණු හා ගැටෙන රූපයද නිසා යන අරුතින්, මෙය එකතුව යෙදෙන

නාමයකි. රූපෙ විභූතෙ න ඵුසනති එසසා රූපය ඉවත් කලවිට පස්ආකාර වූ පහස නොගැටේ. කථං සමෙතසස කෙසේ පිළිපදිනා කෙනෙකුටද විභොති රූපං රූපය නොවේ හෝ නොවන්නේය හෝ, සුඛං දුකඛංවා බලාපොරොත්තු වන, බලාපොරොත්තු නොවන දකින-නොදකින රූපයක් ගැනම අසයි. න සඤඤසඤඤීති රූපය කියා දෙයක් නැතැයි සිතා කටයුතු කරන කෙනෙකුට එය තිබේය යන හැඟීම නොවේ. එයින් ඒ තැනැත්තා උමතු වූවෙක් හෝ අවුල් වූ සිතක් ඇත්තෙක්ද නොවේ. නො පි අසඤඤී නිරොධ සමවතට පත්වූවෝ හෝ අසඤඤ තලයේ වසන්නෝ හෝ හැඳිනීම් රහිත වූයේද නොවෙති. න විභූතසඤඤී සියල්ලම රූප සඤඤා දී ලෙසින් අරූප දැහැන් ලැබූවන් මෙන් හැඳිනීම් ඉක්මවූයේද නොවේ.

එවං සමෙතසස විභොති රූපං මෙසේ හැඳිනීම් සහිතව හා හැඳිනීම් නොමැති පරිදි නොසිට.... ඒ (අවබෝධය සඳහා භාවනා වඩන) තැනැත්තා.... 'මෙසේ සිත එකඟ වූ කල..........ආකාසානඤචායතන සමාපත්තිය ලබනු පිණිස සිත යොමු කරයි..........(යනුවෙන් සඳහන් වේ.) මෙසේ සමාපත්තියට පත් වූ විට රූපය ගැන යොමු නොවේ. සඤඤා නිදානා හි පපඤචසංඛා මෙසේ පිළිපන් තැනැත්තාට ද හැඳින්වීමක් වීද, ඒ හේතුකොට ඇතිවන තණ්හා-දිට්ඨි ආදී කෙලෙස්ද, නොසිඳී පවත්නා බව දක්වයි. එතතාවතගගං නො වදනති එකෙ යකඛසස සුද්ධිං ඉධ පණ්ඩිතාසෙ උදාහු අඤඤමපි වදනති එකෙ මෙපමණකින් මෙහි නුවණැති මහණ බමුණෝ උසස්ම පිරිසිදු බව කියන්නෝ නොවෙත්ද? නැතිනම් මේ රූපය සමවතට වඩා උසස් (තවත් දෙයක්) ඇතිබව පවසත්දැ'යි විමසයි. එතතාවතගගමපි වදනති එකෙ මේ අනුව සදාකාලික පැවැත්මක (සසසත) ගැන අදහන, දැනුම (තමාට) ඇතැයි සිතා සිටින ඇතැම් මහණ බමුණෝ එපමණකින්ම උසස්තම පිරිසිදු බව පවසති. තෙසං පනෙකෙ සමයං වදනති ඔවුන් අතර ඇතමෙක් (මෙයින් පසු) විනාස වේ යැයි (උච්ඡෙද) පවසති. අනුපාදිසෙසෙ කුසලා වදනා නිවැරදි යහපත් කීම වන්නේ නැවත හටගැනීමකට හේතු නැතැයි යන්නයි. එතෙ ච ඤතවා උපනිසසිතා මෙබඳු දැකීමකට වහල් වූවන්, 'සසසත-උච්ඡෙද' හැඟීම තදින් පිළිගන්නා ලද නිසා යයි දැන, ඤතවා මුනි නිසසයෙ යො විමංසී කළයුතු දෙය දන්නා ඒ විමසනසුළු වියත් බුද්ධ නම් වූ මුනිවරයා, ඤතවා විමුත්තො දුකය, තිර පැවැත්මක් නැතැයි දැන (ඒ දුකින්) මිදුනේ, භවාභවාය න සමෙති නැවත නැවත උපතකට නොපැමිණේ යැයි

අරහත් බව කුළුගන්වමින් දේසනය නිම කළහ. දේසනය අවසානයෙහි පුරාභෙද සූත්‍රයෙහි ද කියා ඇති පරිදිම දහම් අවබෝධය ලැබූහ.

**කලහවිවාද සූත්‍ර විස්තරය නිමි.**

# 4.12

**සකං සකං දිට්ඨි පරිබ්බසානා** යනු චූලවියූහ සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? (දෙවියන්ගේ) ඒ මහා හමුවෙහිදී 'මේ දැකීම් දැඩිව ගත් සියල්ලන්ම, 'අපගේ රූපය මැනවැ'යි කියන බවත්, මොවුන් (ඇත්තටම) තමන්ගේ රූපය යහපත්ය' යන දැකීමෙහි පිහිටියේද? නැතහොත් වෙනත් දැකීමක් - හැඟීමක් පිළිගනිත්දැ'යි ඇතැම් දේවතාවුන්ගේ සිත් අනුව, ඒ කරුණු පහදා දීමට, කලින් මෙන් (ඉද්ධි බලයෙන්) දක්වන ලද බුදුවරයකු ලවා විමසන පරිද්දෙන් මෙම සූත්‍රය දෙසන ලදී.

එහි මුල් ගාථා දෙකෙහි අසන ලද කරුණු වේ. මේ අතර, **සකං සකං දිට්ඨීපරිබ්බසානා** තම තමන් දරන දැකීම්-මතවාද අනුව වසමින්, **විග්ගය්හ නානා කුසලා වදන්ති** ඒ දැකීම් ඉතා දැඩිව-බලවත් ලෙස ගෙන, එය ඉතා හොඳ'යැයි දක්වමින් නොයෙක් නොයෙක් දේ කියති. එකම අදහසක් නොකියති. **යො එවං ජානාති සවෙදි ධම්මං, ඉදං පටිකෙකා සමකෙවලී සො** ඒ දැකීම්-මතවාද උදෙසා 'මෙසේ දන්නා තැනැත්තා දහම මැනවින් දැනගෙන ඇත. එයට නින්දා පරිභව කරන තැනැත්තා පහත් කෙනෙකැ'යි කියති. බාලො පහත්, ලාමක, අකුසලො නොවියත්,

මීළඟට පැන විසඳන ගාථා තුනකි. ඒ ගාථාවන්හි මුල් පද දෙකින් සඳහන් කළ අදහස පසුපද දෙකෙන් අරුත 'විසුරුවා' හැර ඇත. (මුල් අදහස තවත් ආකාරයකට පැහැදිලි කොට ඇත.) ඒ අනුව සූත්‍රයේ ගාථා පදවලින් කරුණු කෙටිකොට දැක්වෙන සැකැස්ම පරිදි මේ සූත්‍රය 'චූල වියූහ' යන නම ලැබුණි. **පරසස වෙ ධම්මං** අනුන්ගේ දැකීම, මතවාද,

සබ්බෙව ඉමෙ බාලා කරුණු මෙසේ ඇති කල්හි මේ සියල්ලෝම අනුවණයන් වෙතියි අදහස් වේ. ඊට හේතු කවරේද? **සබ්බෙවිමෙ දිට්ඨි පරිබ්බසානා** (වන හෙයිනි.) **සන්දිට්ඨියා.........මුතිමා** තමාගේ දැකීමෙන්, න විවදාතා පිරිසිදුව බබලන්නේ නොවේ. කිලිටි බවට පත්ව, **සංසුද්ධ පඤ්ඤා කුසලා මුතීමා** පිරිසිදු නුවණැති, පැණවත් වූ මනා සිහියෙන් යුතු වෙති. නැතහොත් **සන්දිට්ඨියා වෙ පන** යයි ද පාඨයකි. එහි තේරුම නම්, තමාගේ (නිවැරදි) දැකීමෙන්, පිරිසිදු නුවණැති, පැණවත් වූ, මනා සිහියෙන් යුතු වෙති. **න තෙසං කොචි** කරුණු මෙසේ ඇතිකල එක් අයෙකුවත් නුවණ අඩු කෙනෙකු නොවේ. ඊට හේතු කවරේද? **දිට්ඨී හි තෙසමපි තථා සමත්තා** අනෙක් හැම දෙනාත් එසේ වන බැවිනි. 'න වාහ මෙතං'... ගාථාවේ කෙටි අදහස නම්, **යං** ඔව්හු, මිථු පුද්ගලයෝ දෙදෙනෙක් එකිනෙකා 'අනුවණ' යැයි කියති. **අහං එතං තථියං** ඇත්තක් යැයි නෙව නොකියමි. කුමක් නිසාද? ඒ සියල්ලෝම **සකං සකං දිට්ඨි මෙයම සච්චං** 'අනික් සියළුම මත බොරු යැයි **අකංසු**, ඒ කරුණින් ද අනුවණ-මෝඩ යැයි දහනති මෙහිද **තථියං** යැයිද **තථිවං** යැයිද වචන දෙකකි.

'යමාහු...........'යන විමසන ලද ගාථාවෙහි **යං** (තම) දැකීම ඇත්ත යැයි කෙනෙක් කියති. 'එකං හි සච්චං' යනුවෙන් වූ පැන විසඳන ගාථාවෙහි **එකං සච්චං** (දුක) නැතිකිරීමේ මග හෝ, **යස්මිං පජා නො විවදෙ පජානං** ඇත්ත දන්නා වූ තැනැත්තා වාද කරන්නේ නැත. **සයං ථුනන්ති** තමන්ම කියති. 'කසමාතු' විමසන ගාථාවයි. **පවාදියාසෙ** කියනු ලබන්නා, **උදාහි තෙ තක්කමනුස්සරන්ති** නැතහොත් තමාගේ මතයම අනුව යති. 'න හෙව'........යනු විසඳන ගාථාවයි. **අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි** හැඟීම් පමණකින් 'තිර පැවැත්මක් නැතැ'යි සිත්හි දරාගන්නා ලද්දේ, **තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා** තමන්ගේ වැරදි කල්පනාවලින් යුතුව දැකීම්-මතවාද ගොඩනඟාගෙන, ඒ මතවාදවල විවාදාත්මක කරුණු ගොඩනගමින් ඒ දැකීම් තරයේ වැළඳ ගනිති. එහෙයින් දැකීමට වහල් වූවන් උපදවති. මනාකොට උපදවති ආදී ලෙසින් නිද්දෙසයෙහි සඳහන් කරන ලදී.

මීළඟට මෙසේ ඇත්ත සේ ගැනෙන බොහෝ දේ නොමැති වූ විට වාදවිවාද හෙවත් තර්කය පමණක් මුල්කරගන්නා දැකීම් දැඩි සේ දරන පුද්ගලයන්ගේ වැරදි පිළිවෙත 'දිට්ඨෙ' ආදී ගාථාවලින් කීහ. **දිට්ඨෙ** දකින ලද දේ, දන්නා ලද දෙයින් පිරිසිදු වේ යැයි අදහසයි. අසන දේ

ආදිය ගැනද මේ ආකාරය. **එතෙව නිසසාය විමාන දසසී** මේ දක්නා ලද දේ ඇසුරුකොට, පිරිසිදු වේයැයි සළකා අනෙක් තැනැත්තන්ට ගරහා දොම්නසට පත්වෙමින්, **විනිචඡයෙ ඨතවා -පෙ- අකුසලොතිවාහ** මෙසේ සළකාගෙන, එම දැකීම් පිළිබඳ තීරණය කොටගෙන, සතුටට පත්ව, විනෝදයට පත්ව, 'අනෙක් සියල්ලන්ම පහත්ය, වියත් නොවේ' යැයි මෙසේ කියයි. මේ පිළිබඳව 'යෙනෙව........' යන ගාථාවෙන් ද (පැහැදිළි වේ.) **සයං අතතනා** තමන් තමා ගැනම, **විමානෙති** ගරහයි, **තථෙව පාවා** ඒ වචනයම, ඒ දැකීම ගැනම, ඒ පුද්ගලයා ගැනම කියයි. 'අතිසාර දිට්ඨියා' යන ගාථාවෙහි අරුත නම්, **සො** ඒ බොහෝ දැකීම්වලින් (දෙසැටක් දැකීම්) **සමතෙතා** පිරුණේ, ඔදවැඩුනේ, ඒ දැකීමෙන්, **මානෙන මතෙතා** 'මම නුවණැති බවින් පිරුණු සමත්කම් ඇත්තෙමි' යැයි, **පරිපුණ්ණමානී සයමෙව** මෙසේ තම මනසින් 'මම පණ්ඩිත වෙමි'යි අබිසෙස් ලබයි. කුමක් නිසාද? **දිට්ඨී හි සා තසස තථා සමතතා** ඔහු විසින් ඒ දෘෂ්ටිය ගන්නා ලද ද එහෙයිනි.

'පරසස වෙ' යන ගාථා සම්බන්ධය හා අරුත ගැන වැඩිදෙයක් සඳහන් කළ යුතුද? තම තීරණයෙහි සතුටුවන ඒ තැනැත්තා 'අන් හැමදෙනා මෝඩයන්ය, හැකියාවන් නැත්තවුන් යැ'යි කියයි. ඒ අනෙක් තැනැත්තාට **පරසස වෙ හි වචසා** ඔහු එසේ කියමින්, **නිහීනො** නිහීන ප්‍රඥා ඇත්තේ වේ. **තුමො සහා හොති නිහීන පඤ්ඤො** ඔහු ද එයින්, ඒ සමගම නුවණ නැත්තෙක් බවට පත්වෙයි. ඒ තැනැත්තාද ඔහුට 'මෝඩයෙකැයි' කියයි. **අථ** ඔහුගේ (කථාවෙහි) වචන බොහෝය. **සයං** ඔහුම තමන් **වෙදගූ ධීරො** නම් වෙයි. කරුණු මෙසේ ඇතිකල, **න කොචි බාලො සමණෙසු අත්‍ථි** ඒ සියල්ලෝම තමන්ගේ කැමැත්ත අනුව පණ්ඩිතයෝය. **අඤ්ඤං ඉතො** ගාථා **සම්බන්ධය** හා අරුත නම් 'තමන් මහත්, නුවණැති, වේදයෙහි කෙළවරට ගිය කෙනෙකු නම්, සමණයන් අතර, කිසිදු මෝඩ, අනුවණයෙකු නැත. මෙසේ කියන ලද නමුදු, යම්කිසි කෙනෙකුට (මෙලෙස) අදහසක් තිබිය හැකිය. 'කවර හෙයින්ද' යම්හෙයකින්, **අඤ්ඤං ඉතො යාහි වදනති ධමමං අපරද්ධා සුද්ධිං අකෙවලීනො එවං හි තිත්‍ථ්‍යා පුථුසො වදනති** 'යමෙක් මෙයින් වෙනත් දැකීමක් ගැන කියත්ද, ඒ පිරිසිදු බව වරදවා ගත්තෙකි. (කිසි අයුරකින්) පිරිපුන් වූවෝ නොවෙති'යි, තීර්ථක ආදී වෙනත් සමයවාදීන් ගැන කියන ලදී. කවරහෙයින් මෙසේ කියත්ද? යම් දැකීමක් දැඩිව ගත්

ආසාවෙන් ඔවුන් 'රත්වූ' බැවිනි. තමන්ගේ දැඩි මතයට (දැකීමට) ආසාවෙන්, තදින් වෙළී ඇති බැවින් යැයි ද කියන ලදී.

මෙසේ එබඳු පුද්ගලයන් ගැන 'ඉධෙව සුදධී' යන ගාථාව (සඳහන් කරයි.) **සකායනෙ** තමා ගත් මගෙහි, **දළහං වදානා** දැඩිව කියමින්, දැඩි මතධාරීව, ඒ ගැන කියන්නවුන් අතර තීර්ථක ආදී කිසියම් කෙනෙක්, **සකායනෙවාපි දළහං වදානො කමෙත්ථ බාලොති පරං දහෙය්‍ය** කෙටියෙන් එහි සසසත - උච්ඡේද ලෙසින් ද සවිස්තරව නත්‍ථික-ඉසසර-කාරණ-නියතිවාදී ආයතන හා ඒ ඒ මතවාදීන්ද තම තමන්ගේ දැකීම් 'මෙයම ඇත්ත' යැයි දැඩිසේ කියමින්, අනෙක් තැනැත්තන් 'මෝඩ' යැයි දකින්නේය. ඔහුගේ මතය අනුව, ඒ සියල්ලෝම පණ්ඩිතයෝද? මනාව කරුණු දැන, යහමගට පිළිපන්නෝද? කරුණු මෙසේ වනවිට **සයමෙව සො මෙධගං ආවහෙය්‍ය පරං වදං බාලං අසුදධධමමං** ඔහුද අනුන්, 'මෝඩයන්, වැරදි අදහස් ඇත්තවුන් ලෙස කියමින් කලහයට කැඳවන්නේය. කුමක් හෙයින්ද? ඔහුගේ මතය අනුව, හැම ලෙසකින්ම, පණ්ඩිතයා හා මනාව පිළිවෙත් මගක යන්නා ඔහු බැවිනි. **විනිචඡයෙ ඨත්වා සයං පමාය උදධං සො ලොකසමිං විවාදමෙති** මෙසේ දැඩි දැකීමෙන් තමන් මුල්කොට ඒ ඒ සමයවාදී නායක මග පෙන්වන්නන්ද සසඳ-මැන බලා, ඔහු වැඩියෙන් විවාදයට එයි. තීරණ ගැනීමේ පලය දැන, අරිය මගෙන්, **හිත්වාන සබබානි විනිචඡයානි න මෙධගං කුරුතෙ ජනතු ලොකෙ** යනුවෙන් අරහත් බව කුළුගන්වමින් දේසනය නිමකළහ. දේසනය අවසානයෙහි පුරාභෙද සූත්‍රයෙහි කී පරිදිම පිරිස දහම් අවබෝධ කරගත්තේය.

චූල වියූහ සූත්‍ර විස්තරය නිමි.

# 4.13

යෙ කෙචි මෙ යනු මහා වියූහ සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? දෙවියන්ගේ ඒ මහා රැස්වීමේදී, 'මෙම දැකීම දැඩිව ගත් පුද්ගලයෝ නුවණැතියන් හමුවෙහි ගැරහීම් ලබත්ද, නැතිනම් පැසසුම්

ලබත්දැ'යි ඇතැම් දේවතාවුන්ට හටගත් අදහස ගැන පැහැදිලි කරන්නට පෙර පරිදි ඉඳුබලයෙන් පෙන්වන ලද බුදුවරයා ලවා තමන් වහන්සේ විමසා මෙම කරුණු වදාරා ඇත.

අනුවානයනති - අනු ආනයනති නැවත නැවත පෙරටුකොට ගනිති. දැන් යම් ආකාරයකින් ඔව්හූ 'මෙයම ඇත්ත'යයි කියන ඒ දැකීම මුල්කොට ගෙන **කිසි** තැනකදී පැසසුම් ලබති. මේ පැසසුම් දනවන වාද පලය, රාගාදී (කෙලෙස්) හා සළකනවිට ඒවා නැතිකිරීමට සමත් නොවේ. ඊළඟට වාදයෙහි දෙවන පලය වන නින්දාව ගැන කෙබඳු කතාද? එහෙයින් ඒ කරුණ දක්වා ඒ වාදයෙන් ලබන පලය අල්ප බවත්, (රාගාදී කෙලෙස්) ඉවතලීමට නොහැකි බවත්, විවාදයෙහි පල දෙකක් බවත්, වදාළහ. **දුවෙ විවාදසස ඵලානි** ගැරහීම්, පැසසුම්, ජය, පරාජය ආදී දෙයාකාර පල ලැබෙනු ඇත. **එවමපි දිසවා** ගැරහුම් අවසානය නොවේ. පැසසුම් කෙලෙස් සමනයට හේතු නොවේ යැයි මෙසේ වාද විවාදයෙහි ලැබෙන පලය දැක, **ඛෙමාභි පසසං අවිවාද භූමිං** වාද පදනමක් නොමැති නිවන 'නිබය' තැනකැයි දකිමින්, මෙසේ වාද නොකරමින් 'යා කාචිමා' යන ගාථාව කීහ. **සමමුතියො** ඒ ඒ දැකීම්, **පුථුජජා** මගපල නොලද්දවුන් විසින්, **සො උපයං කිමෙයා** ඒ තැනැත්තා (තණ්හා දැකීම් ලෙසින්) රූපාදියෙහි කිනම් කරුණක් නිසා හැඟීමක් ඇතිකර ගන්නේ නම්, දිටෙඨ **සුතෙ ඛනතිං අකුබබමානො** දක්නා ලද, අසන ලද දෙයින් පිරිසිදු වේ යන හැඟීම පිළිනොගනිමින්, බාහිර සසුන් ගැන සීලුතතමා ගාථාවෙන් (අදහස් වේ.) එහි අදහස නම්, සීලයම උතුම් යැයි හඟිමින් **සීලුතතමා**, ඇතැම් පින්වත් කෙනෙක් **සංයම** එපමණකින්, **සුදධිං** කියති. ඇතකුගේ පුරුදු ආදියට එළඹ **වතං සමාදාය උපටඨිතා** මේ දැකීමෙහිම අසස එයින් පිරිසිදු යැයි **සුදධිං** වේයැයි, **භවූපනීතා** සසර ගමනෙහි ඇලුනා වූ, **කුසලා වදානා** 'අපි හැකියාව ඇත්තෙමු'යි මෙසේ කියමින්, සීලයම උතුම් යැයි කියන කෙනෙක්, සචෙ චුතො ගාථාවේ අරුත නම්, **සචෙ** එසේ වේ නම්, **සීලවතතො** අනෙකෙකුගේ නුගුණ කියා වෙන් කිරීමෙන් හෝ නොහැකි වීමෙන් හෝ **චුතො** හොති, ඔහු ඒ සීල වත ආදී **කමමං** පුඤ්ඤාභිසංඛාර ආදී කටයුතු හෝ, **විරාධයිත්වා** වෙධෙති වරදවාගෙන සැලෙයි. එපමණක් නොවේ, ඒ සීලවත් වලින් පිරිසිදු වේ යැයි **ජපපති** විකාර දොඩවයි. **පතෙථති** කුමක් මෙන් ද? **සත්ථාව හීනො පවසං** සරමහා නොරට වසන පුරුෂයෙක් අසාර්ථක වූයේ නැවත තම ගෙය හෝ භාර්තය පතන්නාක් මෙනි.

මෙසේ උතුම් සීලයකැයි එය (වරදවාගෙන) වෙව්ලීමට (කම්පාවට) පත්වන සැටිත් කියා අරිය සාවකයා සියළුම සීල ව්‍රත අත්හැර දැමීම ගැන සීලබ්බතං වාපි ගාථාවෙන් (සඳහන් කරති.) සාවජ්ජානවජ්ජං සියළු කුසල් ද මෙලොව කුසල් ද, එතං සුද්ධිං අසුද්ධින්ති අපත්‍ථයානො පස්කම් ආදියෙහි එයින් පිරිසිදු බව ද, අකුසල ආදී ලෙසින් අපිරිසිදු බවද නොපතමින්, විරතො චරෙති පිරිසිදු බවෙන්ද, අපිරිසිදු බවෙන්ද වෙන්ව හැසිරෙන්නේ ය. සන්තං අනුග්ගහාය දැඩිසේ දැකීම් මත නොගෙන, මෙසේ බාහිර සමයවාදීන් අතර පවත්නා සිල්වත් (සතුන්ගේ හැසිරීම් ආදිය) අනුගමනය උතුම් යැයි ද, එයින් සංවරය හා පිරිසිදු වේය යන අදහසද එයින් වන වෙහෙසද, එබඳු වත් හැරදැමීමේ සුදුසු බවද දක්වා, මීළඟට තවත් බාහිර සසුනක 'පිරිසිදු වීම' ගැන වූ මත විස්තර කිරීමට තමුපනිස්සාය යන ගාථාව වදාළහ.

එහි අරුත නම්, වෙනත් ආකාර මහණ බමුණෝද වෙති. ඔව්හූ ජිගුච්ඡිතං දැඩි තපස හෝ, දිට්ඨ මෙයින් හෝ වෙනත් ලෙසකින් පිරිසිදු බව, උපනිස්සාය (හොඳ නරක පල නැතැයි) අකිරියවාදී දැකීම හෝ උද්ධංසරා එසේ ඇතිව, භවාභවෙසු අවීතතණ්හා සුද්ධිං අනුත්‍ථුනන්ති කියති. කතා කරති. මෙසේ ඔවුන් තණ්හාව ඉවත නොහළ බැවින් පිරිසිදු බව ගැන කොඳුරමින් සිටින අතර, තමන් එයින් පිරිසිදු බවට පත්වීයැයි සිතන්නේ ය. තණ්හාව නැති නොකළ බැවින්, ඒ ඒ භවයන්හි ඒ ඒ දේ පතමින්. පත්‍ථයමානස්සහි ජප්පිතානි නැවත නැවත ඉපදීම අදහස් වේ. තණ්හාවේ ඇසුර නිසාම තණ්හාව වඩනු ලබන්නේමය. ඒ ගැන කතා කිරීම පමණක් නොවේ. සංවෙධිතඤ්චාපි පකප්පිතෙසු තණ්හාවත්, දැකීමත් දැඩිව ගැනීම ලෙසින්, කල්පනා කරන, සිත තබාගන්නා ලද දේවල් වෙනස් වූ විට කම්පාවෙයි. සැලෙයි යැයි කියන ලදී. තණ්හාව නැති කළ බැවින්, නැවත භවයෙන් භවය (සසර ඉපදීම) නැත. චුතූපපාතො ඉධ යස්ස නත්‍ථි සකෙන වෙධෙය්‍ය කුහිඤ්ච ජප්පෙ මේ ඒ ගාථාවෙහි සම්බන්ධයයි. ඉතිරි කරුණු නිද්දෙසයෙහි කී පරිදිමය. (මීළඟ) 'යමාහු' යනුවෙන් කරුණු විමසන ගාථාවයි.

මෙහි වාදයට මූලික වූ එකම කරුණක්වත් ඇත්ත නොවේ. හුදෙක් දැකීම් ලෙස ගැනීමෙන් පමණක් ඔව්හූ එසේ කියති. එහෙයින් මීළඟට ඒ කරුණු 'සකං හි' යනාදී පිළිතුරු ගාථාවෙන් කීහ. සම්මුති දිට්ඨී හෙවත් ඒ ඒ මත දැඩිව ගැනීමයි. මේ අයුරින් තමන්ගේ අදහස පිරිපුන් ලෙස

කියනවිට, වෙනත් තැනැත්තන්ගේ අදහස් 'පහත්' යැයි කියන බව '**පරසස වෙ වමහයිතෙන හීනො**' යන ගාථාවෙන් දැක්වූහ. ගාථාවේ අරුත නම්, යම්සේ **පරසස** නින්දා කිරීමෙන්, **හීනො** වන්නේ නම්, **න කොචි ධමෙමසු විසෙසී** උසස් නො වන්නේ ය. ඊට හේතුව කුමක්ද? **පුථූ හි අඤඤසස වදනති ධමමං නිහීනතො** ඒ සියල්ලන්ම **සමහි දළහං වදානා** තම දැකීමෙහි අදහසෙහි දැඩිසේ එල්බගෙන සිටින හෙයිනි. (ඒ ගැන) වැඩිදුර කිවයුතුද? ඊළඟට 'සඳධමමපූජා' යන ගාථාවයි. එහි අරුත නම්, ඒ වෙනත් සමයවාදීන්, තීර්ථකයන් යථා **පසංසනති සකායනානි, සඳධමම පූජාපි** ඔවුන්ගේ **තථෙව** පැවත්ම ඔව්හූ බොහෝ සෙයින් තම සස්නෙහි නායකාදීන්ට ගරු කරති. එහිදී ඔව්හූ සිතන, ගැළපෙන පරිදි (කටයුතු) කරන්නාහු නම්, එවිට **සබෙබව වාදා තථියා භවෙය්‍යුං** හැම වාදයෝ සත්‍ය වන්නාහුය. හේතුව කුමක්ද? **සුදධී හි නෙසං පචචතතමෙව** මුල්ම හා එකම අදහසින් හෝ වෙනත් ලෙසකින් හෝ පිරිසිදු බව නොවේ. එය අනුන් කී දෙයින් ලබන දැනුම අනුව, තමන් දැඩිව ගන්නා දැකීම පමණක් වෙයි. මෙයට වෙනස්වන්නේ නම්, පව් බැහැර කරන ලද නිසා බ්‍රාහ්මණයෙකු වීමයි. න බ්‍රාහමණසස යන ගාථාවේ අරුත නම්, **බ්‍රාහමණසස** 'සියළු හේතු එක්ව සකස්වන දේවල් තිරව නොපවතී' ආදී ලෙසින් මැනවින් අවබෝධයෙන් දක්නා ලද බැවින්, වෙනත් කෙනෙකුගෙන් ගෙන ආ යුතු නුවණ **නත්‍ථි**, දැකීම් පිළිබඳව **ධමෙමසු** 'මෙයම ඇත්ත'යයි තහවුරු කොට ගැනීමක් ද **සමුගගහීතමපි** නැත. ඒ නිසා ඒ මුනිවරයා දැකීම් හා මතවාද පිළිබඳ අරගලයෙන් ඉවත් වූයේය. ඒ මුනිවරයා සිහිය පිහිටුවා ගැනීම ආදිය හැර, **න සෙටඨතො පසසති ධමමඤඤං.** අනික් ධර්මයක් ශ්‍රේෂ්ඨ වශයෙන් නෙ දක්නේය.

ජානාමි යන ගාථාවෙහි සම්බන්ධය හා අරුත මෙසේය. මෙපමණකින්ද ඒ පරම අරුත දත් මුනිවරයා අන් දහමක් උසස් යැයි නොදකී. තීර්ථක ආදී වෙනත් සමයවාදීහු පරසිත් දන්නා නුවණින් දැනගෙනද, දැක ද **ජානාමි පසසාමි තථෙව එතං** යැයි මෙසේ කියමින්ද, **දිටඨියා සුදධිං පචෙචනති** කවර හෙයින්ද? ඔවුන් අතුරෙන් එක් අයෙක් හෝ **අදදකඛි** වෙ ඒ පරසිත් දන්නා නුවණින් ඇති තතු සේ දුටුවත්, **කිං හි තුමසස තෙන** ඔහුට ඒ දැක්ම කුමක් කළේද? (කුමන පලක්ද?) දුක පිළිබඳ දැනගත්තේ ද? නැතිනම් දුක ඇතිවීමේ හේතු නැතිකිරීම ආදියෙන් වෙනස් ද? ඒ වෙනත් සමයවාදීහු අරියමග හැම අතින්ම ඉක්මවා **අඤෙඤ**

නෙව වදනති සුද්ධිං ඒ තීර්ථක ආදීන්ද ඉක්මවා බුදුවරු ආදීහු වෙනත් අයුරින් පිරිසිදු බව කියති.

පසසං නරො යන ගාථාවෙහි සම්බන්ධය හා අරුත ගැන වැඩිදුර කිවයුතු නම්, අනුන්ගේ සිත් දන්නා නුවණින් දකින තැනැත්තා **පසසං නරො දකඛති නාමරූපං** එයින් පසුව දිසවාන **වාඤඤසසති තානෙමෙව** නාමරූප සදා පවතී හෝ සැපයැයි හෝ දැඩිව ගැනීම මිස ඒ දැකීම තුළ වෙනත් දෙයක් නොවේ. ඔහු මෙසේ දකිමින්, **කාමං බහුං පසසතු අපපකං** නාමරූප සදා පවතී. සැපයයි දැකීමෙන් **නහි තෙන සුද්ධිං කුසලා වදනති** 'නිවිසස වාදී' යන ගාථාවේ සම්බන්ධය හා අරුත නම්, ඒ දැකීමෙන් ඔහුට පිරිසිදු බවක් නොලැබෙන නමුත්, 'දනිමි, දකිමි, එය එසේ යැයි දැඩිසේ සිතාගෙන **නිවිසසවාදී** මේ දැකීම නිසා - දැකීමෙන් පිරිසිදු බව බලපොරොත්තු වෙමින්, 'මෙයම ඇත්ත' යයි මෙසේ දැඩිව මුල්බැස ගත් අදහස ගැන කියන ඔහු **සුබබිනයො** න (හික්මවිය) හැකි නොවේ. ඔහු එසේ **පකපපිතං** ගොඩනගා ගන්නා ලද, **දිටඨිං පුරෙකඛරාණො** ඔහු යම් නායකයෙකු ඇසුරු කරන ලදුව, **තසෙව සුභං වදානො සුද්ධිං** වදො 'මම පිරිසිදු අදහස් හෝ පිරිසිදු දැකීමක් හෝ ඇත්තෙක්මි'යැයි තමා ගැන සිතමින් **තතථ තථදදසා** සො එහි තමාගේ දැකීමෙන් නොවෙනස්ව, ඒ දැකීම (ඔහු කෙරෙහි) පවත්නා අයුරින්ම ඔහු දුටුවේය. වෙනස් දෙයක් දැකීමට (මුල්බැස ගත් ඒ මත ඉවතලීමට) නොකැමති බව අදහස් වේ. මෙසේ කල්පනා කරන, තම දැකීම පෙරටුකොට ගත් තීර්ථකයන් අතර, 'බ්‍රාහ්මණයා' (හෙවත් රහත් මුනිවරයා) එවැනි සංකල්ප පෙරටුකොට නොගනිති. 'න බ්‍රාහමණො' ගාථාවෙහි **සංඛං** හඳුනා, දැනගෙන යන තේරුමයි. **න පි ඤාණබනධූ** සමවත් නුවණ ආදියෙන් **තණ්හා-දිටඨි** සබඳතා ඇතිකර නොගන්නා ලද, එහි පැහැදිලි කිරීම නම්, ඒ රහත් මුනිවරයාට නුවණ නෑදැයකු වී නැත. (නුවණැත්තෙකැයි සමාජයෙන් වාසි ලැබීමට තම අදහස පෙරටුකොට නොගනී.) **සමමුතියො** දැකීම්, **පුථුජ්ජා** මගපල නොලද්දවුන් අතර, (පොදු සමාජය තුළ) **උගගණ්හනත මඤෙඤ** වෙනත් දේ උගනිති. වෙනත් දැකීම් පිළිබඳව උගනිතියි කියන ලදී.

තවදුරටත් කිවයුතු නම් - විසසජ්ජ ගාථාවයි. **අනුගගහො** දැඩිව මතවාද ගැනීමක් නැතිව, රහත් මුනිවරයා (කිසිදු දැකීමක් තමා සතු කර) නොගනී. 'සො එවරූපො පුබබාසවෙ' ගාථාවෙහි, **පුබබාසවෙ** පෙර රූප ආදියෙහි හටගනු ලබන මාන ආදී කෙලෙස් (සිතිවිලි) **නවෙ** රූප ආදිය

කෙරෙහි දැන් ඇතිකරගනු ලබන කෙලෙස් සහගත හැඟීම්, **න ඡන්දගු** තදබල කැමැත්තට ඉඩ නොදෙයි. **අනනත** ගරහී කරන ලදැයි, නොකරන ලදැයි තමාට නින්දා කර නොගනිමින්, 'සො සබ්බ ධම්මෙසු යන ගාථාවෙහි, සබ්බධම්මෙසු සැටදෙකක් වූ වැරදි දැකීම් කෙරෙහි, **යං කිඤ්චි දිට්ඨං** වා මේ ආකාර වූ කොටස්වලින්, **පන්නභාරො** (ඒ හැඟීම්) බර ඉවත්කරන ලද්දේ, **න කප්පියො** දෙආකාරව (තණ්හා-දිට්ඨි) කල්පනා පෙරදැරි කොට නොගනිති. **නූපරතො** කෙලෙස් සහිත වූද, යහපත් වූද කිසිවකු කෙරෙහි බැඳීමකට-ඇලීමකට නොයයි. **න පත්ථියො** තණ්හා ආසා රහිත වූයේ, තණ්හාවෙන් පතනු ලැබේ යැයි 'පත්ථියා' රහත් මුනිවරයාට එබඳු පැතුම් නැත. ඉතිරි කරුණු පැහැදිලි බැවින් මෙහි නොකියන ලදී. මෙම දේසනයද අරහත් බව කුළුගන්වා නිමකළහ. පුරාභෙද සූත්‍රයෙහි කී පරිදි බොහෝදෙනාට දහම් අවබෝධ විය.

**මහා ව්‍යූහ සූත්‍ර විස්තරය නිමි.**

# 4.14

**පුච්ඡාමි තං** යනු තුවටක සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? මෙය ද එම මහාදේව පිරිස රැස්වූ විට, අරහත් බවට පත්වීමේ පිළිවෙත කුමක්දැ'යි ඇතැම් දෙවිවරුන්ට ඇතිවූ අදහස අනුව ඒ කරුණු පැවසීමට, පෙර පරිදිම - ඉඳු බලයෙන් පෙන්වන ලද බුදුකෙනෙකු විසින් තමන් වහන්සේගෙන් විමසවා (ඊට පිළිතුරු ලෙස) දේසනා කරන ලදී.

මුල් ගාථාවෙහි **පුච්ඡාමි** යනු පැහැදිලි නොවූ කරුණු පිළිබඳව එම කරුණු වඩාත් සවිස්තරව දැනගැනීමට විමසූ අයුරුයි. **ආදිච්චබන්ධුං** හිරුගේ පරපුරෙන් පැවතෙන, **විවෙකං සන්තිපදඤ්ච** විවේකය ද සැනසීම හෙවත් නිවීමද, **කථං** දිස්වා කුමන කරුණු දැක, මේ වටපිටාවෙහි පවත්නා කෙබඳු දෙයක් දැක,

එවිට භාග්‍යවතුන් වහන්සේ, නුවණ මෙහෙයා ඒ අනුව කෙලෙස් වළක්වයිද, එසේ ලබන අවබෝධයෙන් පිරිනිවනට පත්වේදැයි නොයෙක් ආකාරයෙන් කරුණු පැහැදිලි කරමින්, ඒ දේව සමූහයා කෙලෙස් නැති කිරීමෙහි මඟට යොමුකරවමින්, 'මූලං' පපඤ්චසංඛාය' යනුවෙන් ගාථා පහක් වදාළහ. ඒ මුල් ගාථාවේ පටන් කෙටි තේරුම් (දක්වමු.) 'පපඤ්ච' යනු 'අවිජ්ජා' ආදී කෙලෙස් මුල් හඳුන්වනු ලබන වචනයකි. **පපඤ්ච සංඛාය මූලං අසමී** එසේ පවතින්නා වූද, **සබ්බං මන්තාය උපරුන්ධෙ, යා කාචි අජ්ඣත්තං තණ්හා** හටගනු ලබන්නාහ. **විනයාය සදා සතො සික්ඛෙ** ඒ කෙලෙස් පිළිබඳව සිහිය පිහිටුවාගෙන හික්මෙන්නේය. මෙසේ පළමු ගාථාවෙන්ම තුන්ආකාර වූ හික්මීම ගැන, අරහත් බව කුළුගන්වමින් දේසනාකොට, මානය නැත කිරීම පිණිස නැවත 'යං කිඤ්චි' යන ගාථාව කීහ. **යං කිඤ්චි ධම්මමභි ජඤ්ඤා අජ්ඣත්තං** උසස් පහත් ලෙසින් තමන්ගේ කිසියම් ගුණ දැනගන්නේය. **අථවාපි බහිද්ධා** ගුරුවර - උපාධ්‍යාය ආදීන්ගේ ගුණ දන්නේය. **න තෙන මානං කුබ්බෙථ** ඒ ගුණයෙන් මානය ඇතිකර නො ගන්නේ ය. මීළඟට එය නොකරන ආකාරය 'සෙය්‍යො න තෙන' යන ගාථාවෙන් පෙන්වා දුන්හ. එහි තේරුම නම්, **තෙන** ඒ මානයෙන් 'මම උසස් වෙමි' හෝ 'මම පහත් වෙමි' හෝ 'මම සමාන වෙමි' හෝ **වාපි න මඤ්ඤෙය්‍ය**, ඒ උසස් පහත් ආදී ගතිවලින් **ඵුට්ඨො අනෙකරූපෙහි** 'මම උසස් කුලයෙන් පැවිදි වූයෙමි' ආදී ලෙසින් තමන් ගැන කල්පනා (නො) කරන්නේය. **න තිට්ඨෙය්‍ය.** නො සිටින්නේය.

මෙසේ මානය නැති කිරීම ගැන දේසනාකොට, මීළඟට 'අජ්ඣත්තමෙව' ගාථාවෙන් කෙලෙස් සංසිඳුවන කරුණු කීහ. **අජ්ඣත්තමෙව උපසමෙ** තමා කෙරෙහි ඇති රාගාදී සියළු කෙලෙස් සංසිඳවන්නේය. **න අඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය** සතිපට්ඨානාදි හැර, වෙනත් දෙයකින් (සිතෙහි) සන්සුන් බව නො සොයන්නේ ය. **කුතො නිරත්තං** වා (අත්හළ බැවින්) අත්හැරීමට දෙයක් කොයින්ද? මීළඟට, සන්සුන් වූ, කෙලෙසුන් සිඳ දැමූ (රහත් උතුමන්ගේ) නොසැලෙන බව 'මජ්ඣෙ යථා' ගාථාවෙන් කීහ. එහි තේරුම නම්, **යථා** විසාල, **සමුද්දස්ස** සාගර පත්ලේ සිට මතුපිට දක්වා අතර යොදුන් හාරදහසක් වූ මැද කොටසෙහි **මජ්ඣෙ** (යුගන්ධර ආදී) පව් අතර පිහිටි මුහුද මැද, **ඌමි න ජායති, ඨිතො**ව මුහුද නොසෙල්වී සිටී. **එවං අනෙජො** රහතන් වහන්සේ ලාභ ආදියෙහි **ඨිතො අස්ස** කම්පා නොවෙමින්, රාගාදී කෙලෙස් ගැන ද එපරිදිම **උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.**

අරහත් බව කුළුගැන්වූ එම දහම් දෙසුම මැනවින් පිළිගනිමින්, ඒ අරහත් මගෙහි පිළිවෙත් මග මුලසිටම විචාරමින් (ඉඳු බලෙන් පෙන්වූ) බුදුවරයා මීළඟට 'අකිත්තයී' යන ගාථාව කීය. **අකිත්තයී** කීයේය. **විවට චක්ඛූ** විවර වූ, අනාවරණ වූ පසැසින් යුතුව, **සක්ඛි ධම්මං** තමන් විසින්ම අවබෝධ කරන ලද, තමන්ටම තහවුරු වූ සිවුසස් දහම, **පරිස්සය විනයං** උවදුරු දුරු කරන, **පටිපදං වදෙහි** දැන් පිළිවෙත කියනු මැනව. **භද්දන්තෙ** 'ඔබට යහපත වේවා'යි භගවත් හිමිට අමතා කියන ලදී. **පාතිමොක්ඛං අථවාපි සමාධිං** ඒ පිළිවෙතම කොටස් ලෙස විමසයි. එහි අනුගමනය කළයුතු මග විචාරයි. නැතහොත් සීලයද, සිතේ එකඟතාව ගැන විමසයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, 'මේ දේසනය ඒ දෙවියන්ටද සුදුසු වන හෙයින්, ඉඳුරන් සංවරය හා සිල් රැකීමද අනුව එම පිළිවෙත් මග අනුපිළිවෙලින් 'චක්ඛූහි.......' යන ගාථාවෙන් මුලසිටම පහදා දීම ඇරඹූහ. **චක්ඛූ නෙව ලොලස්ස** දුටු නොදුටු ආදී ලෙස ඇස ලොල් බවක් නොතිබිය යුතුයි. **ගාමකථාය ආවරයෙ සොතං** තිරිසන් කතා හරවත් නොවූ, ලාමක කතාවෙන් දෙසවන් ආවරණය කරගත යුතු එසෙසන රෝග පහසින්, **භවඤ්ච නාභිජප්පෙය්‍ය** ඒ පහස දුරුකිරීම පිණිස, කාමාදී භව නො පතන්නේ ය. **භෙරවෙසුච න සම්පවෙධෙය්‍ය** ඒ පහසට හේතුවන සීහවග ආදීන්ගෙන් වන බිය ඇතිකර නොගනී. නාසය, මනස වැනි ඉඳුරන් කෙරෙහි ද බිය ඇතිකර නොගනී. මෙසේ ඉඳුරන් සංවරය මැනවින් සපිරෙතැයි කියන ලදී. මුලින්ම ඉඳුරන් හික්මවා ගැනීම කියා, කැලයෙහි වාසය කරමින් බියජනක අරමුණු දැක අසා හෝ කම්පා නොවන්නේ යැයිද දක්වයි.

**ලද්ධා න සන්නිධිං කයිරා** ආහාර ආදී යම්කිසිවක් දැහැමෙන් ලැබ, 'කැලයෙහිදී ද සෙනසුනෙහි ද වාසය කිරීමේදී ඒවා හැමදා ලබාගත නොහැකි යයි සිතා එක්රැස් නොකරන්නේය. **ඣායී න පාදලොලස්ස** දැහැන් වැඩීමෙහි නියැලුනේ (නිකරුනේ) ඇවිදීමට නොයන්නේය. **විරමෙ කුක්කුච්චං නප්පමජ්ජෙය්‍ය** අසංවර ලෙස අත් සෙලවීම්, ඉඟිපෑම් ආදියෙන් දුරුව, සංවරයෙහි පිහිටීම, මනාව කටයුතු කරමින් එහි නොපමා වන්නේය. **තන්දිං මායං හස්සං ඛිඩ්ඩං** අලස බව ද කපටි බව ද සිනාව ද කායිකව කරන සෙල්ලම් ද, වචනයට සම්බන්ධ වූ හෙවත් මුවින් කරන සෙල්ලම්ද (නොයෙක් හඬ, ඔල්වර හඬ ගැයුම් වැනි) නොයෙදේ. **සවිභූසං** අලංකාරය සහිත, **ආථබ්බණං** අනුන්ට විණ කරන මන්ත්‍ර ආදී ගුරුකම්, **සුපිනං** සිහින

පලාපල, **ලක්ඛණ** මැණික් ලකුණු (පිහිටි තැන් හා ඊට අදාළ වූ) නො විදහෙ නොයෙදෙන්නේය. **විරුතඤ්ච** සතුන්ගේ හඬ අනුව සුබාසුබ යම් යම් දේ කීම, **පෙසුනෙය්‍යං** කේළාම්, **කය වික්කයෙ** පස් දැහැමියන් සමග කපටි ලෙස හෝ මතු වාසි ලැබීම පිණිස හෝ ගනුදෙනු නොකෙරේ. **න තිටෙඨය්‍ය, උපවාදං භික්ඛු න කරෙය්‍ය** දොස් සහගත කෙලෙස් සිතිවිලි උපදවා නො ගනිමින්, තමා කෙරෙහි, වෙනත් මහණ බමුණන් කෙරෙහි දොස් නො කියන්නේ ය. **ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය** ගමෙහි ද ගිහියන් හා එක්වී ඇලී ගැලී කටයුතුවල නොයෙදෙන්නේය. **ලාභකම්‍යා ජනං න ලපෙය්‍ය** වාසිය පිණිස මිනිසුන් අමතා කතාබහ නොකරන්නේය.

**පයුතං** සිවුරු ආදියට අදාල වූ හෝ ඒවා ලබාගැනීම පිණිස, **මොසවජ්ජ න නීයෙථ** බොරු කීමෙහි නො යෙදෙව. **ජීවිතෙන** ජීවත්වීම පිණිස, **සුත්‍වා රුසිතො බහුං වාචං සමණානං වා පුථුවචනානං** තරහෙන් හෝ ගැටුම් ඇතිකිරීමෙන් හෝ සමණයන් හෝ කැත්කුලවතුන් හෝ බිඳවීමට බොහෝදෙනා කියනු ලබන අයහපත් වචන අසා, **න පටිවජ්ජා** ඊට පිළිතුරු නොදෙයි. මක්නිසාද? **නහි සනෙතා පටිසෙනිකරොනති එතඤ්ච ධම්මමඤ්ඤාය** මෙතෙක් කියන ලද සියළු කරුණු දැන, **විචිනං** විමසීමෙන් තෝරාගනිමින්, **සනතීති නිබ්බුතිං ඤත්‍වා** රාගාදියෙහි නිවීම සැනසීම යැයි දැන, 'කුමක් නිසා (ඒ සඳහා) පමා වන්නේ ද? 'අභිභූ හි සො' යන ගාථාවෙන් මෙසේ ද වදාරා ඇත. **අනභිභූතො** ඒවායින් වසඟ කරගැනීමට නොහැකි වූ, **සක්ඛිධම්මං අනීතිහමද්දසසී** මෙසේ වී යැයි කී පමණින් ම නො අදහා සිවුසස් දහම පසක් කළේය. **සදා නමසසමනුසික්ඛෙ** හැමකල්හි නමදිමින් තෙආකාර වූ හික්මීමෙන් යුතු වන්නේය.

ඉතිරි කරුණු පැහැදිලිය. හුදෙක්ම මෙහි 'ඇස්වලින් රූප දැකීමට ලොල් නො කරන්නේ ය ආදී ලෙසින් ඉඳුරන් සංවරයත්, 'ආහාරපාන පමණ ගැන කීමෙන් රැස්කර තබා නොගත යුතු සිවුපසය පරිහරණයෙහි සංවර සීලයත්, ලිංගික ඇසුර, බොරු කීම, කේළාම් කීමෙන් වැළකීම ආදියෙන් පාමොක් සංවර සීලයත්, අණවිණ, සිහින පලාපල, නිමිති ආදිය කීම වැළකීමෙන් පිරිසිදු දිවිපැවතුම් සීලයත්, 'දැහැන් වැඩීම ගැන කීමෙන් සිත එකඟබවත්, 'මහණකුගේ තෝරාගැනීම' ගැන කීමෙන් නුවණත්, 'හැමකල්හිම සිහියෙන් හික්මවිය යුතු'යැයි නැවතත් කෙටියෙන් නුවණත්, 'හැමකල්හිම සිහියෙන් හික්මවිය යුතු'යැයි නැවතත් කෙටියෙන් තෙ ආකාර වූ 'හික්මීමත්, ආසන, නිදන තැන්, (පරිහරණය හා) නිසංසල

තැන්වල පැවිද්දා වාසය කරන්නේ ය, බොහෝ නිදා නොගන්නේ ය ආදී ලෙසින් සීලය - සිත එකඟ බව හා නුවණට උපකාර වන, උපකාරී නොවන - එක්රැස් කරන - දුරුකරන ආකාරය කියන ලදී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඉඳු බලෙන් පෙන්වන ලද බුදුන්වහන්සේට පිරිපුන් පිළිවෙත පහදා, අරහත් බව කුළුගන්වා දේසනය නිම කළහ. අවසානයෙහි පුරාභෙද සූත්‍රයෙහි කියන ලද පරිදිම දහම් අවබෝධය ලැබූහ.

**තුවටක සූත්‍ර විස්තරය නිමි.**

## 4.15

**අත්තදණ්ඩා භයං ජාතං** යනු අත්තදණ්ඩ සූත්‍රයයි. මෙම සූත්‍රය දේසනයට හේතුව කුමක්ද? සම්මාපරිබ්බාජනීය සූත්‍රය දේසනයට හේතුවූ කරුණු දැක්වීමේ දී ජලය නිසා හටගත් සැකි-කෝලියවරුන්ගේ අරගලය විස්තර කරන ලදී. භාග්‍යවතුන් වහන්සේ එය දැන, 'නෑදැයින් කලහ කරතියි'ද, ඔවුන් එයින් වළක්වමි'යිද අදහස්කොට, යුද සේනා දෙකට මැද වැඩසිට මෙම සූත්‍රය වදාළහ.

එහි පළමු ගාථාවේ අරුත නම්, ලෝ වාසීනට මෙලොව හෝ පරලොව හෝ බය හටගනී ද, ඒ සියල්ලට **අත්තදණ්ඩාභයං ජාතං** තමන්ගේ දුසිරිත් කරුණු හේතු වේ. මෙසේ ඇතිකල **ජනං පස්සථ මෙධගං** එකිනෙකා කෙරෙහි කලහය - හිංසාව - හිරිහැරයට පත් මේ සැකිකුලාදි ජනයා දෙස බලව.

එසේ එකිනෙකාට සතුරුව, වැරදි මගට පිළිපන් ජනයාට දොස් නඟා තමන්ගේ නිවැරදි පිළිවෙතින් ඔවුනට සංවේගය දැනවීමට **සංවේගං කිත්තයිස්සාමි යථා සංවිජිතං මයා** ලෙස කීහ. පෙර බෝසත් කාලය මෙයින් අදහස් කෙරේ.

මීළඟට එසේ සංවේගයට පත් ආකාරය 'ඵන්දමානං' ආදී ගාථාවෙන් කීහ. **ඵන්දමානං** තණ්හා ආදියෙන් කම්පනය වන, **අප්පොදකෙ මඳ** ජලය ඇති, **අඤ්ඤමඤ්ඤෙහි** ව්‍යාරුද්ධෙ **දිස්වා** නොයෙක් සත්වග එකිනෙකා කෙරෙහි සතුරුවන අයුරු දැක, **මං භයමාවිසි** මට බය දැනුණි. **සමන්තමසාරො ලොකො** නිරය පටන් මුළු ලෝකයම අසාර වූ, තිරසාර බවක් නැති, **දිසා සබ්බා සමෙරිතා** සියළුම දිසා තිර බවක් නොමැති බවින්, අනිස බැවින් කම්පා වී, **ඉච්ඡං භවන මත්තනො** තමාට රැකවරණයක් කැමතිව, **නාද්දසාසිං අනොසිතං** ජරාව ආදියෙන් ඉවත්වුනු කිසිදු තැනක් නුදුටුවෙමි. **ඔසානෙත්වෙව** ව්‍යාරුද්ධෙ **දිස්වා** මෙ **අරතී** අහු යොවුන් බව අවසානයෙහිම, කෙළවරෙහිම, වැනසෙන කල්හිම, ජරාවෙන් පීඩිතව, නොසතුටු සිත් ඇති සත්වග දැක නොඇලීමක් කලකිරීමක් මට ඇතිවිය. **අථෙත්ථ සල්ලං** ඉක්බිති මේ සතුන් කෙරෙහි වූ රාගාදී උල්, **හදය නිස්සිතං** සිතෙහි ඇතිවූ ඒ උලෙහි බලය කෙතෙක්ද? 'යෙන සල්ලෙන ඔතිණ්ණ' යන ගාථාවෙන් එය කියන ලදී. එම ගාථාවෙහි, **දිසා සබ්බා විධාවතී** සියළු දුසිරිත් නැගෙනහිර, ආදී දිසා හා අනුදිසාවලටද පැතිරෙයි. **තමෙව සල්ලං අබ්බුය්හ න ධාවති න සීදති** ඒ උල උදුරා දැමීමෙන් පසුව, දිසා අනුව (සසර) නොදුවයි. සිවු සැඩපහරෙහි නොගිලෙයි.

මෙසේ මහා බලවත් උලකින් සිදුරුව පීඩාවට පත් සත්වග අතරෙහි (වෙනසක්) 'සික්ඛානුගීයන්ති..........' යන ගාථාවෙන් දැක්වේ. එහි තේරුම නම්, ලොකෙ පස්කම් සැප ලැබීමට එහි ගැලී මුලා වී, **ගථිතානි** යැයි කියන ලදී. බොහෝ කලක් ඊට පුරුදු වූ, ඒවා ඇසුරු කරන ලද බැවින්ද ගථිතානි නම් වේ. **තත්ථ** ඒ හේතුවෙන්, ඇතුන් හික්මවීම ආදී නොයෙක් **සික්ඛා** කියනු ලබත් හෝ උගන්වනු ලබති. 'මේ ලෝකය කොතෙක්දුරට (ඒ ඇති තතු දැකීමට) පමාවූයේද? කියා බලව.' මේ අතර දැනුම් තේරුම් ඇති කුලපුතෙක්, **තෙසු** ඒ ඇලීගැලෙන පස්කම්හි හෝ ඇතුන් හික්මවීම් ආදී කටයුතුවලින් ඈත්වී, **න සියා** හුදෙක්ම කිසිම දෙයක සදා පැවතීමක් නැතැයි අනිසතාව දැකීමෙන් **නිබ්බිජ්ජ සබ්බසො කාමෙ අත්තනො නිබ්බාණමෙව සික්ඛෙ**.

මීළඟට නිවන් පිණිස හික්මිය යුතු ආකාරය **සච්චො සියා** යන ගාථාවෙහි සඳහන් වේ. **සච්චො** ඇත්ත කතා කිරීමෙන් ද, නිසි නුවණින් ද, නියම මගෙන් ද යුක්ත වූ, **රිත්ත පෙසුණො** කේළාම් කීමෙන් වෙන් වී, **වෙවිච්ඡං** මසුරුකම, **නිද්දං තන්දිං සහෙ මීනං** නිදිකිරා වැටීමද, කයෙහි

අලස බව හා සිතෙහි අලස බව යන මේ කරුණු තුන මැඩපවත්වන්නේය. නිබ්බාණමනසො නිවනට යොමුවූ සිත ඇතිව, සාහසා රාගයෙන් රත් වූ හැසිරීම් ආදියෙන් ඉවත් වන්නේය. පුරාණං නාභිනන්දෙය්‍ය අතීතයට ඇළුම් නො වන්නේ ය. න වෙ වත්මනෙහි, හීයමානෙ මානය නැතිකොට ආකාසං න සිතො සියා තණ්හාව ඇසුරු නො කරන්නේ ය. තණ්හාවෙන් රූප ආදිය (සිතෙහි පැතිරී විහිදී යන ආකාරය අනුව) 'ආකාස' යැයිද කියනු ලැබේ. ඊට හේතුව කුමක්ද? අහස පැතිරී ඇති අයුරු මෙනි. 'ගෙධං බ්‍රෑමි' යන ගාථාවේ අරුත නම්, මම මේ අහස සේ නම් කරන ලද තණ්හාවෙන් රූප ආදියට කෑදර බව ඇතිකරන බැවින්, ගෙධං බ්‍රෑමි 'ගෙධ' යැයි කියමි. තවදුරටත් කියන්නේ නම්, කැඳවාගෙන යන අරුතින් ඔඝො හෙවත් සැඩපහර යයි ද, රඳවා ගැනීමේ අරුතින් 'ආජව' යැයි ද, මෙය මගේය, මෙය මගේ යැයි කොඳුරන බැවින් ජප්පන යැයි ද, මුදාහැරිය නොහැකි අරුතින් ආරම්මණං යයි ද කම්පා කරන බැවින් කම්පනං යයි ද කියමි. තණ්හාව උවදුරක් ලෙස ද, පහසුවෙන් ඉක්මවිය නොහැකි ලෙසින් ද කාමපංකො දුරච්චයො, 'ආකාසං න සිතො සියා මෙසේ කී කල්හී, ආකාස යයි කියන්නේ කුමක්දැ'යි 'ගෙධං බ්‍රෑමි' යන ගාථාවට එක්වන ආකාරය දැනගත යුතුය. එහි පද යෙදුම 'ආකාසංති ගෙධං බ්‍රෑමි' යනුවෙනි. එසේම 'ඔඝොසො බ්‍රෑමි, ආජවං බ්‍රෑමි, ජප්පනං බ්‍රෑමි, කම්පනං බ්‍රෑමි යැයි. (යොදා ගතයුතුය.) එසේම දෙවියන් සහිත ලෝකයෙහි කාමය නැමති මඩගොහොරුවෙන් ගොඩ ඒම අපහසුයයිද කියමි. එමෙන්ම තණ්හාව ගිජු බවෙන් ඉවත් නොවේ. 'සච්චා අවොක්කම්ම' යන ගාථාවේ අරුත නම්, පෙර කියන ලද තුන්ආකාර වූ සච්චා අවොක්කම්ම රහත් බව ලබන උසස් පිළිවෙතින් යුතු වූයේ මුනි යැයි හැඳින්වේ. නිවන නැමති ගොඩබිමෙහි (සසරින් එතෙරව) තිට්ඨති බ්‍රාහ්මණො, සවෙ මෙබඳු සියළුම කරුණු, නිස්සජ්ජිත්වා සනෙතා වුච්චති සියලු ආයතනයන් දුරලා ශාන්ත වූයේය. මේ ගැන වැඩිදුර කිවයුතුද? (මීළඟට) 'සවෙ විදිත්වා' ගාථාවයි. ඤත්වා ධම්මං අනිස ආදී කරුණු දැන, සම්මා සො ලොකෙ ඉරියානො වැරදි ඉරියවු පැවැත්මෙන් වන සියළු කෙලෙස් නැතිකොට, මැනවින් මුනිවරයා ඉරියවු පවත්වන්නේය. 'යොධ කාමෙ' ගාථාවෙහි සංග සත්ආකාර වූ එක්රැස්වීම්, යො අච්චතරී නාජෙක්ඛති දැඩිව ආසා නොකරයි. එහෙයින් ඔබලාද එසේ වීමට කැමතිවීම (මැනවි.) එසේ කියමි. යං පුබ්බෙ යන ගාථාවේ යං පුබ්බෙ අතීතයෙහි කළ කී දේ මත සකස් වූ කෙලෙසින් හටගත් අතීත කටයුතු ද, පච්ඡ තෙ මාහු කිඤ්චනං අනාගතයෙහිද එබඳු එක්රැස්වීම් නිසා ඇතිවන රාගාදී කෙලෙස්

ගැන කියයි. මජ්ඣෙ වෙ නො ගහෙස්සසී වත්මනෙහි ද රූපාදිය ද (තණ්හා-දිට්ඨී සේ) නො ගන්නේය.

මෙසේ සන්සුන්ව හැසිරෙන්නෙහි' යැයි අරහත් බවට පැමිණීම දක්වා, රහතන් වහන්සේ පිළිබඳව පැසසුම් ලෙසින් මෙයින් පසු ගාථා වදාළහ. 'සබ්බසො' යන ගාථාවෙහි මමායිතං මගේය - මම ය යන අදහසයි. මෙය මට අයත්ය යනුවෙන් අදහස් කරන දේ, අසතා ච න සොචති නොපෙනෙන දෙයකට, නොමැති දෙයකට සෝක නොකරයි. න ජීයති විපතකට නොපැමිණේ. ඒ ගැන වැඩිදුර කිවයුතුද? අනුද්ධරී යන ගාථාවෙහි අනුද්ධරී ඉසිමාන නැති, අනිට්ඨුරී යැයි ඇතමෙක් කියති. සබ්බධී සමො හැමවිටම සමව, මැදහත් බව අදහස් කෙරේ. කුමක් නිසා කියන ලද ද? ඒ රහතන් වහන්සේ 'මට මෙය නැතැ'යි සෝක නො කරති. මම ඒ කම්පානොවන තැනැත්තා ගැන ඇසූවිට, අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධීසමො යැයි මේ ගුණ හතරද ආනිසංස බ්‍රෑමි (කියමි.) තවදුරටත් ඒ ගැන කිවයුතුද? මීළඟට අනෙජස්ස යන ගාථාවයි. එම ගාථාවේ නිසංඛීතිපුඤ්ඤාභිසංඛාර ආදිය, එබඳු රැස්කිරීම්, එකතුවීම් නැති හෙයින් නිසංඛීති යැයි කියනු ලැබේ. වියාරම්භා ඒවායෙහි පටන්ගැන්ම, ඛෙමං පස්සති සබ්බධී සැමතැනම බියරහිත බවම දකී. මෙසේ දකිමින්, (ඊළඟට) න සමෙසු යන ගාථාවයි. එහි න වදති 'මම සමාන වෙමි'යි ආදී මැනීම් ලෙසින් තමා සමකොට නො කියයි. (තුන්මාන) ධමෙසු, උසෙසසු නා දෙති න නිරස්සති රූපාදී කිසිදු දෙයක් දැඩිව නොගනී. (එසේ නොගන්නා බැවින්) අත්හැර නොදමයි. ඉතිරි කරුණු පැහැදිලිය. මෙසේ අරහත් බව කුළුගන්වමින් දේසනය නිම කළහ. දේසනය අවසානයෙහි සැකි කුමරුවෝ පන්සියයක් ද, කෝලිය කුමරුවෝ පන්සියයක් ද 'එව මහණ' යැයි භාග්‍යවතුන් වහන්සේගේ ඇමතීමෙන් පැවිදි බව ලැබූහ. තථාගතයන් වහන්සේ ඒ සඟ පිරිස ද සමග මහා වනයට පිවිසියහ.

**අත්තදණ්ඩ සූත්‍ර විස්තරය නිමි.**

# 4.16

න මෙ දිට්ඨො යනු සාරිපුත්ත සූත්‍රයයි. ථෙරපඤ්හ සූත්‍රය යයි ද හඳුන්වනු ලැබේ. මෙම සූත්‍රයට හේතු වූ කරුණ කුමක්ද? මේ ඊට හේතුවයි. රජගහනුවර සිටුවරයාට සඳුන්ගැටය ලද විට ඒ සඳුන් ගැටයෙන් සෑදූ පාත්‍රය උසින් ඔසවා තැබීමත්, ගරුකටයුතු පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් ඉඳුබලෙන් එය ගැනීමත්, ඒ හේතුකොට සව්වනට ඉඳු පෙළහරපෑම තහනම් කිරීමත්, තීර්ථකයන් භාග්‍යවතුන් වහන්සේ සමග පෙළහර පෑමට කැමැති වීම, පෙළහරපෑම, භාග්‍යවතුන් වහන්සේගේ සැවැත්පුර ගමන, තීර්ථකයන් පසුපස යාම, සැවැත්පුරදී පසේනදී රජු බුදුරදුන් හමුවීම, ගඳඹරුක පහළවීම, තීර්ථක පරාජය සඳහා පෙළහරපෑමට උත්සාහවත් වූ සිවුපිරිසට එය වැළැක්වීම, යමාමහ පෙළහරපෑම, පෙළහරපෑමෙන් පසු භාග්‍යවතුන් වහන්සේගේ තව්තිසා ගමන, එහි තෙමසක් දහම් දෙසීම, ගරුකටයුතු අනුරුද්ධ තෙරුන් වහන්සේ විසින් ඉල්ලා සිටි පරිදි දෙව්ලොවින් සංකස්ස නුවරට බැසීම දක්වා මේ සිදුවීම් අතරතුර ජාතක කථාද විස්තරකොට, දස දහසක් සක්වළ දේවතාවුන් විසින් කරනු ලබන පූජා ලබමින් මැද තිබූ මැණික් හිණිමගෙන් බැස හිණිමග පාමුල සිටියහ.

'දැහැනෙහි නිරතුරුවම යෙදෙන, සියළු කාමයන් හැරදැමූ නුවණැති, සිහියෙන් යුතු සම්මා සම්බුදුවරුන්ට දෙවියෝ ද කැමති වෙති'.

**යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා**

**දෙවාපි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතං** මෙම ධම්මපද ගාථාවෙන් පැවසෙන පරිදි මේ සිදුවීමටද අදාල වේ. හිණිමග පාමුල සිටි භාග්‍යවතුන් වහන්සේට, හැමදෙනාගෙන් පළමුකොටම ගරුකටයුතු සැරියුත් තෙරුන් වහන්සේ වැන්දාහ. ඊට පසු උප්පලවණ්ණා තෙරණියද, පසුව මහජනයාද වැන්දාහ. 'මේ පිරිස අතර, මුගලන් තෙරන් ඉඳු බලයෙන්ද, අනුරුද්ධ තෙරුන් දිවැසින්ද, පුණ්ණ තෙරුන් දහම් කතාවටද උසස්ව, මුල්තැන සිටිනා බව පතළය. සැරියුත් තෙරුන් කිනම් ගුණයකින් උසස්ව මුල්තැන ගන්නේදැ'යි නොදනී. සැරියුත් තෙරුන්ගේ මහා පැණවත් බව පහදා දෙන්නේ නම් මැනවැ'යි එහිදී භාග්‍යවතුන් වහන්සේ සිතූහ. ඉක්බිති තෙරුන් වහන්සේගෙන් පැනයක් විචාළහ. තෙරුන් වහන්සේ,

භාග්‍යවතුන් වහන්සේ විසින් විමසන ලද, පොදු සමාජයට ගැලපෙන පැන, මගපලයෙහි හික්මීමට අදාල පැන, රහත් උතුමන්ට අදාල පැන සියල්ලම විසඳූහ. එදා ජනයා සැරියුත් තෙරුන් 'නුවණින් මුල්තැන' ගන්නේ යැයි මැනවින් දැන ගත්තේය. එවිට භාග්‍යවතුන් වහන්සේ, 'සැරියුත් තෙරුන් තියුණු නුවණින් මුල්තැන් ගත්තේ දැන් පමණක් නොවේ'යැයි (ජාතක කථාවක් දේසනා කළහ.) 'පෙර දහසකටත් වඩා ඉසිවරු අල, පලතුරු ආහාරයට ගනිමින්, වනයෙහි කඳුපාමුල්හි වසති. ඔවුන්ගේ ගුරුවරයාට අසනීපයක් හටගත්තේය. උවටැන් මැනවින් සිදු කෙරෙයි. දෙටු අතවැසියා 'සුදුසු බෙහෙතක් ගෙන එන්නෙමි, ඇඳුරුතුමන්ට නොපමාව උවටැන් කරව'යි කියා මිනිසුන් වසන පෙදෙසකට ගියේය. ඔහු ආපසු ඒමට පෙර, ඇදුරුතුමා මළේය. 'ඔහු දැන් මිය යන්නේ'යැයි සිතූ අතවැසියෝ සමාපත්ති ගැන විමසූහ. ආකිඤ්චායතන සමාපත්තිය ගැන සළකා 'කිසිත් නැතැ'යි ඇදුරුතුමා කීය. අතවැසියෝ එවිට, 'ඇදුරුතුමා සිත දියුණුකොට කිසිදු උසස්බවක් ලබා නැතැයි සිතූහ. දෙටු අතවැසියා බෙහෙත් ගෙන අවුත්, ඔහු මළ බව දැන, 'ඇදුරුතුමාගෙන් කිසිවක් විමසීදැ'යි ඇසීය. 'විචාළෙමු, කිසිවක් නැතැ'යි කී බැවින් කිසිදු උසස් බවක් ලබා නැතැයි අතවැසියෝ කීහ. 'කිසිවක් නැතැයි, ආකිඤ්චඤ්ඤායතන දැහැන ගැන දැනුම් දුන් බවත්, ඇඳුරුතුමන්ට ගරුසත්කාර කළයුතු'යැයි දෙටු අතවැසියා පැවසීය.

'දහසකටත් වඩා රැස්ව සිටි ඔව්හූ වසර සියයක් නුවණ නැතිව හැඬුවාහ. කියන ලද දෙයෙහි අරුත් දන්නා නුවණැති එකම තැනැත්තා වුව ද උසස්ය.

පරො සහසසමපි සමාගතානං
කන්දෙය්‍යුං තෙ වසසසතං අපඤ්ඤා
එකොපි සෙය්‍යො පුරිසො සපඤ්ඤො
යො භාසිතසස විජානාති අත්‍ථං

භාග්‍යවතුන් වහන්සේ ජාතක කථාව දේසනා කළවිට, ගරුකටයුතු සැරියුත් තෙරුන්වහන්සේ තමන් හා පන්සියයක් පමණ වූ සඟපිරිස උදෙසා සුදුසු සෙනසුන්, ගැලපෙන සීලවත් ආදිය ඇසීමට, 'මා මෙබඳු දෙයක් මීට පෙර නොදකින ලදැ'යි ආදී ලෙසින් මේ පැසසුම් ද එක්කොට,

ගාථා අටක් පැවසූහ. භාග්‍යවතුන් වහන්සේ, සැරියුත් තෙරුන් විමසන ලද කරුණු පැහැදිලි කිරීමට ඉතිරි ගාථා වදාළහ.

**ඉතො පුබ්බෙ** (දෙව්ලොව සිට) සංකස්ස නුවරට බැසීමට පෙර, **වග්ගුවදො** මිහිරි වචන කියන, **තුසිතා ගණිමාගතො** තුසිත දෙව්ලොව සිට චුතව මවුකුස පිළිසිඳගත් බැවින්, පිරිස ඇති හෙයින් ගණීයැයි දැක්වේ. සතුටුව යන අරුතින් හෝ තුසිත නමින් හඳුන්වනු ලබන දෙව්ලොවින් පැමිණ, පිරිස් ඇති, (සසර දුක් නොවන බැවින්) තුටුවන රහතන් වහන්සේලා සමූහය අතරට පැමිණි, දෙවන ගාථාවෙහි **සදෙවකස්ස ලොකස්ස යථා දිස්සති** දෙවියන් සහිත ලෝකයාට මෙන්ම, මිනිසුන්ටද පෙනේ. සැබෑ ලෙසටම, නොවෙනස්වම පෙනේ. **චක්ඛුමා** උතුම් ඇස, **එකො** පැවිදි වූවෙකු ලෙස, **රතිං** සියල්ල අත්හැර දැමීම ආදිකොට, තුන්වන ගාථාවේ **බහුන්නං ඉධ බද්ධානං** මෙහි බොහෝ කැත් කුලවතුන්ට ආදීන්ට, සිසුවන් විසින් ගුරුවරයෙක් සේ සැළකෙන පැවතුම් ඇති බැවින්, බැඳුණු යයි කියනු ලබයි. **අත්ථි පඤ්හෙන ආගමං** විමසා දැනගැනීමට පැනයක් ගෙන ආවෙමි. පැනයක් විමසා දැනගැනීමට ඇත. සිවුවන ගාථාවේ, **විජිගුච්ඡතො** ඉපදීම ආදියට පිළිකුල් කරමින්, **රිත්තමාසනං** විසිතුරු ඇඳපුටු (හැර) **පබ්බතානං** ගුහාසු වා ගිරිගුහාවල හෝ, ආසන රහිතව හෝ, භජතො (ඇසුරු කරයි.) යන මෙම වචනය හා සම්බන්ධ කළයුතුය. පස්වන ගාථාවෙහි **උච්චාවචෙසු** උසස් පහත් වූ, **සයනෙසු** විහාරයන්හි හෝ සෙනසුන්හි, **කීවන්තො තත්ථ** භෙරවා එහි බියවීමට කරුණු කෙතෙක්ද? **කුවන්තො** යයිද වචනයකි. නාදකරන යන අරුතයි. (එය) මුල හා අග සබඳතාවක් නැත. හයවන ගාථාවෙහි, **කති පරිස්සයා** උවදුරු කෙතෙක්ද? **අමතං දිසං** නිවනට, එය අමත යැයි එසේ යායුතු දිසාව (මග) පෙන්වයි. එහෙයින් අමතං දිසං යැයි කියන ලදී. **අභිසම්භවෙති** අබිබවා යන්නේය. **පන්තම්හි** කෙළවර, හත්වන ගාථාවෙහි, **ක්‍යාස්ස ව්‍යපථයො අස්සු** ඔහුගේ වචනය කෙබඳුවේද? අටවන ගාථාවෙහි **එකොදි නිපකො** එකඟ සිත් ඇති නුවණැති පණ්ඩිතයා.

මෙසේ ගරුකටයුතු සැරියුත් තෙරුන් විසින් ගාථා තුනකින් භාග්‍යවතුන් වහන්සේට තුතිපැසසුම් කොට, ගාථා පහකින් පන්සියයක් පැවිදි සිසු පිරිසට යහපතක් වන සේ, ගැලපෙන සෙනසුන් හා සිල්වත් විය යුතු සැටි විමසූ අතර, 'විජිගුච්ඡමානස්ස' ආදී ගාථාවලින් භාග්‍යවතුන් වහන්සේ එය පහදාදීම ඇරඹූහ. පළමු ගාථාවෙහි පටන් අරුත් දැක්වේ.

ජාති ආදී දේවලින් **විජිගුච්ඡමානස්ස රිත්තාසනං සයනං සෙවතො වෙ සම්බාධිකාමස්ස** සැරියුත් හිමිට යදිදං **ඵාසු** විහරණය, **යථානුධම්මං** දහමට ගැලපෙන දෙයක්, **තං තෙ පවක්ඛාමි යථාපජානං** දැනගන්නා ආකාරයෙන් කියන්නේය. මෙසේ කියමි'යි අදහසයි. දෙවන ගාථාවෙහි **පරියන්තචාරී** සීලය ආදී සිවු ආකාරයෙන් හැසිරෙමින්, **ඩංසාධිපාතානං** ඇටමැස්සන් ද, වෙනත් මැස්සන් ද, වෙනත් මැස්සෝ ඒ ඒ තැන හැපී (වැළඳ) කති. එහෙයින් 'අධිපාතා' හෙවත් ඒ ඒ තැන පතින කුඩා මක්කන් යයි කියනු ලැබේ. **මනුස්සඵස්සානං** සොරුන් ආදීන්ගෙන් වන උවදුරු, තුන්වන ගාථාවෙහි **කුසලානුඵසී** යහපත් කරුණු සොයමින්, **ආකංඛඵෙසන** රෝග පහසින්, **සීතං අච්චුණ්හං** සීතලද, උණුසුම වැඩිවීමද, **සො තෙහි ඵුට්ඨො බහුධා** ඒ (යෝගාවචර) මහණ නොයෙක් ආකාරයෙන් රෝගාදියෙන් පහස ලැබූවත්, **අනොකො** මෙයින් ලබන හඳුනාගැනීම් අනුව සිතට නැගෙන යහපත් අයහපත් හැඟීම්වලට ඉඩ නොතබා,

මෙසේ 'භික්ඛුනො විජිගුච්ඡතො' ආදී ගාථා තුනකින් විමසූ කරුණු පහදා දී, මීළඟට 'ක්‍යාස්ස ව්‍යපපථයො' ආදී ලෙසින් විමසූ කරුණු පහදමින් 'සොරකම් නොකරන්නේය'............වැනි කරුණු ඇතුලත් ගාථා වදාළහ. **එස්ස** පතුරුවන්නේය. **යදාවිලත්තං මනසො විජඤ්ඤා** සිතෙහි කැළඹුණු බව දැනගන්නේය. ඒ සියල්ල 'කළු පැත්තට' අයත්ය. අයහපත් දේ යැයි සිතා දුරු කරන්නේය. **මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ** ඔවුන්ගේ තණ්හාවට, අති මානයට අවිජ්ජා ආදිය මුල් වේ. එයද උදුරා දමා (ඉදිරියට) කටයුතු කරන්නේය. **අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය** මෙසේ කැමති අකමැති දේ එකවරම මැඩපවත්නේය. එහි කිසිදු ලිහිල් බවක් නොකරන්නේ යැයි අදහස් වේ. **පඤ්ඤං පුරක්ඛත්වා** නුවණ පෙරදැරි කොට, **කල්‍යාණපීති** යහපත් වූ සොම්නසින් යුතුව, **චතුරො සහෙථ පරිදෙව ධම්මෙ** ඇතුලත දැක්වූ ගාථාවලින් කියනු ලබන, හඬා වැලපීමට හේතුවන කරුණු ඉවසා දරා සිටින්නේය. **කිංසු අසිස්සාමි** කුමක් අනුභව කරන්නෙම්ද? **කුවං වා අසිස්සං** කොතැන සිට අනුභව කරන්නෙම්ද? **දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං** මේ රැය දුකසේ නිදාගතිමි. අද රැයෙහි කොතැන නිදන්නෙම්ද? **එතෙ විතක්කෙ** කති මේ පිණ්ඩපාතයෙහි දෙයාකාරවද, සෙනසුන් ගැන දෙයාකාරයෙන්ද, මෙසේ **සතරාකාර** දෙගිඩියාවෙන්, **අනිකෙතචාරී** උවදුරු නොමැතිව හැසිරෙමින්, **තණ්හාව** දුරුකොට හැසිරෙමින්, **කාලෙ පිඬු පිණ්ස** යන කල, එයට අදාල වූ **අන්නං** සිවුරු ලැබෙනවිට, ඊට අදාලව **වසනං** හෝ **ලද්ධා** දැහැමෙන්

සෙමෙන් ලැබීම අදහස් වේ. **මත්තං සො ජඤ්ඤා** (ඒවා) පිළිගැනීමෙහිද, පරිහරණය කිරීමෙහිද ඇති පමණ දන්නේය. **ඉධ** සසුනෙහි, එය නිපාතයක් පමණි. **තොසනත්ථං** සතුටුවන, (සෑහීමට පත්වන) මේ අයුරින් පමණ දැන ගන්නේ යැයි කියන ලදී. **සො තෙසු ගුත්තො** ඒ මහණ එම පිණ්ඩපාත, සෙනසුන් ආදියෙහි සංවරව, **යතචාරී** සන්සුන් විහරණයෙන් යුතුව මනාව ඉරියවු පවත්වා ගනිමින්, කය-වචනය-සිත යන දොරටු රැකවල් කරගන්නා ලද්දේය. **යතුචාරී** යයි ද වචනයකි. එම තේරුමයි. **රුසිතො** නපුරුව ගැටෙන ලද්දේ, **ඣානානුයුත්තො** නූපදවාගත් දැහැන් උපදවාගනු පිණිසත්, උපදවාගත් දැහැන් ඇසුරුකොට දැහැනෙහි යෙදී, **උපෙඛමාරබ්භ සමාහිතත්තො** සිවුවන දැහැනෙහි බලාපොරොත්තු රඳවා, එකඟ වූ සිත් ඇතිව, **තක්කාසයං කුක්කුච්චි යූපච්ඡින්දෙ** කාම සිතිවිලි ආදිය ගැන සිතට වදදීම් ද, කාම හැඟීම් ආදියද, ඒ ගැටීමට හේතුවන අනෙක් කරුණුද, අතින් කෙරෙන නොයෙක් අසංවර ඉරියවු පෑමද, සිඳ දමා ඉවතලන්නේය. **චුදිතො වචීහි සතිමාභිනන්දෙ** උපාජ්ඣාය ආදීන්ගෙන් අවවාද ලැබ, සිහි ඇතිව එයට සතුටු වන්නේය. **වාචං පමුඤ්චෙ කුසලං** නුවණ පිළිබිඹු වන වදනක් (මුවින්) පිටකරන්නේය. **නාතිවෙලං** සුදුසු වේලාව හෙවත් කාලයද, තම සංවරයද සළකා මිස, ඒවා ඉක්මවා යන පරිදි වචන නො කියන්නේ ය. **ජනවාද ධම්මාය** ජනතාවගේ ගැරහීමට පත්වන පරිදි කතා නොකරන්නේය. **න චෙතයෙය්‍ය** සිතිවිලි ඇතිකර නොගන්නේය.

**අථාපරං** මීළඟට - දැන් මෙයින් පසුව, **පඤ්ච රජානි** රූප රාගාදී දූවිලි පහ, **යෙසං සතිමා විනයාය සික්ඛෙ** එළඹසිටි සිහියෙන් යුතුව, සංවරය පිණිස තෙ ආකාර වූ හික්මීමෙහි යෙදෙන්නේය. මෙසේ හික්මවන ලදුව, **රූපෙසු -පෙ- ඵස්සෙසු සහෙථ රාගං** වෙනත් ලෙසට නොවේ. ඒ මහණ මෙයින් එහි සංවරයට පත්ව, කෙමෙන් කෙමෙන්, එතෙසු ධම්මෙසු යන ගාථාවෙහි **එතෙසු** රූප ආදිය කෙරෙහි, **කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො** ඒ මහණ නොසන්සුන් වූ සිත එකඟ කිරීමට කාලය යැයි දැන, ඒ මොහොතෙහි පටන්, හේතු රැසක් නිසා හැඩගැසෙන, සකස්වන සියළුම දේවල් කිසිදා ඒ අයුරින්ම තිරව නොපවතී යැයි මෙනෙහි කරමින්, **එකොදිභූතො විහනෙ තමං** සො එකඟ වූ සිතින්, ඒ සියළු දේ කෙරෙහි මුලාව නම් අඳුර දුරලන්නේය. එහි සැකයක් නැත. ඉතිරි කරුණු සියල්ල පැහැදිලිය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අරහත්

බව කුළුගන්වමින් දේසනය නිම කළහ. දේසනය අවසන පන්සියයක් මහණහු රහත් බව ලැබූහ. කෝටි තිහක් පමණ වූ දෙව් මිනිසුන්ටද දහම් අවබෝධ විය.

**සාරිපුත්ත සූත්‍ර විස්තරය නිමි.**

**අට්ඨක නම් වූ සිව්වන වර්ගය නිමියේය.**

## 5.1

කොසලානං පුරා යනු පාරායණ වග්ගයෙහි නිදාන කතාව දැක්වෙන ගාථාය. එයටද හේතුවූ කරුණු මෙසේය. අතීතයෙහි බරණැස එක් රුක් වඩුවෙක් විය. ගුරුවරයෙකු ලෙස දෙවැන්නකු නොසිටි ඔහුට සිසුහු දහසය දෙනෙක් වූහ. ඒ එක් එක් සිසුවාට අතවැසියෝ දහස බැගින් සිටියහ. මෙසේ දහසය දහස් දහහතක් වූ ගුරු-අතවැසි සියල්ලෝම බරණැස (පෙදෙස) ඇසුරුකොට ජීවත් වෙමින් කඳු අසලට ගොස් ගස් කපා, එහිදීම මන්දිරවල නොයෙක් නොයෙක් කොටස් නිමවා, පහුරක් බැඳ ගඟෙන් බරණැසට ගෙනවුත්, රජුට අවැසි වේ නම්, එක් මහලක් හෝ සත්මහලක් හෝ පහයකට ඒවා යොදති. නොඑසේනම්, වෙනත් කෙනෙකුට විකුණා අඹුදරුවන් ඇතිදැඩි කරති.

එක් දවසක් ඔවුන්ගේ ගුරුතුමා, 'වඩුකමෙන් ජීවත්වීමට නොහැකියි. මහළු වූ විට මේ කටයුතු අපහසුයැයි' අතවැසියන් අමතා, 'දරුවනි, දිවුල් ආදී අරටුව අඩු ගස් ගෙනෙව'යි කීය. ඔව්හු යහපතැ'යි කියා දිවුල් ගස් ගෙනාහ. ඔහු ඒවායින් ලී කුරුල්ලකු සාදා එතුළට පිවිස එය ඉහළට නැංවීමට කටයුතු කළේය. ලී කුරුල්ලා ගුරුළුරජකු මෙන් අහසට නැගී, කැලෑව පුරා සිසාරා ඇතුළු පුරවාසීන් ඉදිරියෙහි පොළවට බැස්සේය. ඉක්බිති ගුරුතුමා, 'දරුවනි, ලීයෙන් මෙබඳු යානා සාදා මුළු දඹදිව රජකම ලද හැකිය. ඔබලාද මෙසේ කරව, රජය ගෙන ජීවත් වන්නෙමු. වඩුකමෙන් ජීවත්වීම දුකකි'යි සිසුවන්ට කීය. සිසුවෝ එසේ කටයුතු

කොට ගුරුවරයාට දැන්වූහ. එවිට ඔහු 'දරුවනි, කිනම් රජයක් අල්ලා ගනිමුදැ'යි ඇසීය. 'ඇදුරුතුමනි, බරණැස රජයයි.' 'දරුවනි, එය නුසුදුසුය. එයට කැමති නොවවු, අපි රජය ලබාගත්තද, රජු වඩුවෙකි. යුව රජුද වඩුවෙකි'යි වඩුකතාවෙන් නොමිදෙන්නෙමු. දඹදිව විසාලය. වෙනත් තැනකට යමු'යි කීය.

ඔව්හු අඹුදරුවන් සමග ලී වාහනවලට නැගී, ආයුධ ගෙන, හිමාලය දෙසට ගොස්, හිමාලයෙහි නගරයකට පිවිස රජුගේ නිවහනටම බැස්සාහ. එහි රජය ගෙන, ගුරුතුමා රජ බවට ඔටුනු පැළඳවූහ. ඔහු 'කට්ඨවාහන' රජු යැයි හැඳින්වීය. ඒ නගරයද ඔහු විසින් අල්ලා ගන්නා ලද බැවින්, 'කට්ඨවාහන නුවරයැ'යි නම ලැබිණ. මුළු රටටමද කට්ඨවාහන රජු දැහැමි විය. යුවරජ තනතුරටද ඇමති තනතුරුවලටද සිසුන් දහසය දෙනා පත්කරන ලදී. රජ සිවු සඟරාවතින් යුතුව රජය විචාළ අතර, රටද සව් ඉසුරින් පිරි, සාමකාමී වූයේය. අනෙක් නගරවලද, ජනපදවලද, රජවරුද රජ පිරිසද 'අපට යහපත් රජකු ලැබුණි. ඒ රජුගේ පිරිසද යහපත් යැයි බෙහෙවින්ම තමන්ගේය යන හැඟීමෙන් සිටියහ.

එක් දවසක් වෙළෙන්දෝ බඩු රැගෙන දඹදිව මැද රට සිට කට්ඨවාහන නගරයට පැමිණියහ. ඔව්හු පඬුරු ගෙන රජු බැහැදුටහ. රජු, 'කොහි සිට පැමිණෙයහුදැ'යි සියළු තොරතුරු ඇසීය. 'දේවයිනි, බරණැස සිට'යැයි කීහ. රජු එහි සියළු තොරතුරු අසා, 'තොපගේ රජ සමග මා ද මිතුරු කරව'යි පැවසීය. ඔව්හූ 'යහපතැ'යි පිළිගත්හ. කට්ඨවාහන රජ ඔවුනට මග වියදම් ආදිය ලබා දී, ආපසු පිටත්ව යනවිට, ආදරයෙන් ඔවුන් හමුවී, (බරණැසට) පිටත්කර හැරියේය. බරණැසට ගොස් වෙළෙන්දෝ ඒ බව රජුට සැළකළහ. බරණැස් රජු, 'කට්ඨවාහන රටෙන් පැමිණි වෙළඳුන් අද පටන් අයබදුවලින් නිදහස් කරමි'යැයි අණබෙර යවා, 'කට්ඨවාහන රජු මගේ මිතුරකුව ඇතැ'යි (සැළකීය.) දෙදෙනා මෙසේ නුදුටු මිතුරෝ වූහ. 'අද පටන් බරණැසින් පැමිණෙන වෙළෙඳුන් අයබදුවලින් නිදහස් කරමි, ඔවුනට වියදම් ද දිය යුතු'යැයි කට්ඨවාහන රජු ද මුළු නගරයෙහි අණබෙර යැවීය. මේ අතර, බරණැස රජු, 'කට්ඨවාහන ජනපදයෙහි දැකීමට හෝ ඇසීමට හෝ සුදුසු කිසියම් පුදුම දෙයක් ඇතිවුනි නම්, අපටද දකින්නට හෝ අසන්නට හෝ සැලැස්වුව මැනවැ'යි කට්ඨවාහන රජුට ලිපියක් යැවීය. කට්ඨවාහන රජු ද එබඳුම ලිපියක් බරණැස රජුට ද යැවීය.

මෙසේ ඔවුන් කතිකා කොට තිබියදී, වරෙක, කටය්වාහන රජුට, ලහිරු මඬලෙහි රැස්මාලා පැහැ යුතු ඉතා මාහැඟි, ඉතා සිනිඳු කම්බිලි ලැබුණි. රජු එය දැක 'මගේ යහළුවාට යවමි'යි ඇත්දත් කැටයම් කරුවන් ලවා කරඬු අටක් ලියවා, ඒ කරඬුවල එම කම්බිලි බහා, ලාකඩ (සිප්හි සමත්) සිප් ඇඳුරන් ලවා, පිටත ලාකඩ ගෝල සකසවා, ලාකඩ ගෝල අටද කරඬුවෙහි බහා, රෙදිවලින් වෙලා රාජකීය තිල සලකුණ තබා 'බරණැස රජුට ගෙන යව'යි ඇමතිවරුන් යැවීය. 'මේ තෑගි පඬුර නගරය මැද දී ඇමතිවරුන් පිරිවරා බැලිය යුතු' බව සඳහන් ලිපියක් ද දුන්නේය. ඇමතිවරු එය බරණැස් රජුට භාරදුන්හ. රජු ලිපිය කියවා, (තම) ඇමතිවරුන් රැස්කොට, නගර මැද රාජකීය උයනෙහිදී, සලකුණු කඩා, වෙළුම් ඉවත්කොට, කරඬුව විවරකොට ලාකඩ ගෝල අට දැක 'මගේ මිතුරා, මා ලාකඩ බෝලවලින් සෙල්ලම් කරන දරුවකු මෙන් සළකා මට ලාකඩ බෝල එවී'යැයි මුහුණ හකුළුවාගෙන, එක් ලාකඩ බෝලයක් තමා හුන් අසුනෙහි ගැසීය. එකෙණෙහිම ලාකඩ පිපිරී කැඩුණි. ඇත්දත් කරඬුව විවරව කොටස් දෙකක් විය. රජු ඇතුලත කම්බිලියක් දැක, අනෙක් කරඬුද විවර කළේය. සියළු කරඬු එසේම විය. එක් එක් කම්බිලියක් දිගින් රියන් දහසයක් ද පළලින් අටරියනක් ද විය. කම්බිලිය දිගහැරි විට රාජකීය උයන හිරුළුළියෙන් ආලෝක වූවාක් මෙන් විය.

ඒ දුටු මහජනයා අත් ඔසවා එහා මෙහා වැනීය. (අංගුලියො විධුනි) හිසවටා පිළිද සිසාරවීය. 'නොදුටු මිතුරෙක් වූ කටය්වාහන අපගේ රජතුමාට මෙබඳු පඬුරු එවීය. මිතුදම් පැවතිය යුතු මෙබඳු කෙනෙකු සමග යැයි ද (ඔව්හු) සතුටු වූහ. රජු සළුපිළි වෙළෙන්දෙකු කැඳවා එක් එක් කම්බිලියක වටිනාකම තහවුරු කරවීය. සියල්ල ඉතා අගනා විය. 'පසුව පඬුරු (තෑගි) යවන්නෙකු විසින් නම්, මුලින් එවන ලද පඬුරුවලට වඩා දෙගුණව යැවිය යුතුය. මම මිතුරාට කුමක් යවන්නෙම්දැ'යි රජු සිතුවේය. මේ වනවිට කසසප බුදුරජාණන් වහන්සේ ලොව පහළව බරණැස වසති. 'තෙරුවනට වඩා උතුම් රුවනක් නැත. එබැවින් මම තෙරුවන් ලොව පහළ වූ බව මිතුරාට දන්වමි'යිද (වැඩිදුරටත්) අදහස් කළේය.

'බුදුරජාණන් වහන්සේ සියළු ජීවීන්ට හිත පිණිස ලොව පහළ වූහ. සියළු ජීවීන්ට හිත පිණිස දහම ලොව පහළ විය.

සියළු ජීවීන්ට හිත පිණිස සඟ (පිරිස) ලොව පහළ වූහ. (යන අරුත් ඇති)

**බුද්ධො ලොකෙ සමුප්පන්නො හිතාය සබ්බ පාණිනං**
**ධම්මො ලොකෙ සමුප්පන්නො හිතාය සබ්බ පාණිනං**
**සංඝො ලොකෙ සමුප්පන්නො හිතාය සබ්බ පාණිනං**

මෙම ගාථාව ද, අරහත් බව දක්වා වූ එක් මහණකගේ පිළිවෙත ද රන් තහඩුවකද රත්සිරියල්වලින් ලියවා, සත්රුවන් කරඬුවක බහා, ඒ ඒ කරඬුව මැණික් කරඬුවකද - මැණික් කරඬුව මැසිරිගල් කරඬුවකද, මැසිරිගල් කරඬුව පද්මරාග කරඬුවක ද - පද්මරාග කරඬුව රන් කරඬුවක ද - රන් කරඬුව රිදී කරඬුවක ද - රිදී කරඬුව ඇත්දත් කරඬුවක ද - ඇත්දත් කරඬුව තද (අරටුව සහිත) ලී කරඬුවක දමා, එය පැසක දමා, රෙදිවලින් ඔතා, සලකුණු තබා, රන්ධජවලින් හා, රන්වැඩ දමා අලංකාර වූ රන්දැලින් සැරසූ උසස් යැයි සැළකෙන මාහැඟි ඇතකු මත පලඟක එම පැස තබා, සුදු සේසත් ඔසවමින් සියළු සුවඳ මලින් පූජා කරනු ලබමින්, මියැසි වාදකයන් සියගණන් තුති ගී ගයද්දී, තම රාජධානි සීමාව දක්වා මග සරසවා, තමන්ම ගෙන ගියේය. 'මෙසේ සත්කාර කරන්නන් විසින් මේ පඬුර යැවිය යුතුයැයි සමීප (සුළු) රජවරුන්ට ද (දන්වා) තෑගි යැවීය.

ඒ අසා ඒ ඒ රජවරු පෙරමගට අවුත් කටය්වාහන රජයේ සීමාව දක්වා එය ගෙනයෑමට කටයුතු කළහ. කටය්වාහන රජු ද ඒ අසා පෙරමගට අවුත්, එපරිදිම පූජා කරමින්, නගරයට පමුණුවා, ඇමතිවරුන් ද, නගර වාසීන් ද රැස්කරවා, රජමිදුලෙහිදී ඔතා තිබූ රෙදි ඉවත්කොට, පැස විවරකොට එහි කරඬුවක් දැක, පිළිවෙලින් සියළුම කරඬු විවරකොට, රන්තහඩුවෙහි සටහන බලා 'කප් සියදහසකිනුදු බොහෝ දුලබ වූ රුවන් පඬුරක්ම මගේ මිතුරා මට එවූයේ' යැයි සතුටුව, 'බුදුවරයකු ලොව උපන්නේ යැයි පෙර නොඇසූ විරූ දෙයක් ඇසුවෙමු, මම එහි ගොස්, බුදුරජාණන් දකින්නෙම් නම්, දහම් අසන්නෙම් නම් මැනවැයි සිතා, 'බුදුන්, දහම්, සඟරුවන් ලොව පහළ විය. කුමක් කළයුතුද? කියා සිතවු'දැයි ඇමතිවරුන් ඇමතීය. 'මහරජතුමනි, ඔබතුමා මෙහිම සිටිනු මැනව, අපි ගොස් තොරතුරු දැනගන්නෙමු'යි (ඇමතිවරු) කීහ.

එවිට දහසය දහසක් පිරිවර සහිත වූ ඇමතිවරු දහසය දෙනා රජු

නැමද, 'බුදුවරයකු ලොව උපන්නේ නම් නැවත (අප) දැකීමට නොලැබෙනු ඇත. බුදුවරයෙකු ලොව ඉපිද නැත්නම්, ආපසු එන්නෙමු'යි පිටත්ව ගියහ. පසුව රජුගේ බෑණාද, 'රජුට වැඳ 'මම ද යමි'යි කීය. 'දරුව, ඔබ බුදුඋපත දැන, ආපසු අවුත් මට දන්වව'යි රජු පැවසීය. ඔහු 'යහපතැ'යි පිළිගෙන ගියේය. ඔව්හු සියල්ලෝම එක රැයකින් පසු බරණැසට පැමිණියහ. එහෙත් ඔවුන් පැමිණීමට පෙර, කසුප් බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පෑහ. ඔව්හු බුදුන්වහන්සේ කවුද? බුදුන්වහන්සේ කොහිදැ'යි මුළු විහාරය පුරා ඇවිදිමින් හමුවූ සව්වන්ගෙන් ද විමසූහ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පෑ බව පැවසූහ. ඔව්හු 'අහෝ! බොහෝ දුර මග ගෙවා ආවත්, දැකීමටවත් නොලැබීමු'යැයි වැළපෙමින්, 'හිමියනි, භාග්‍යවතුන් වහන්සේ දෙන ලද අවවාදයක් ඇත්දැ'යි ඇසූහ. 'එසේය, උපාසකවරුනි, ඇත, තෙසරණෙහි පිහිටිය යුතුය, පන්සිල් සමාදන් විය යුතුය. කරුණු අටකින් යුතු පෙහෙවස් විසිය යුතුය. දන් දිය යුතුය. පැවිදි විය යුතුයැයි පැවසූහ. ඒ අසා ඇමතිවරයෙකු වූ රජුගේ බෑණනුවන් හැර, සියල්ලෝම පැවිදි වූහ. ඇමතිවරයා පරිභෝග ධාතු රැගෙන කටය්වාහන නගරය දෙසට ගියේය. පරිභෝග ධාතු නම්, බෝරුක, පාසිවුරු ආදියයි. මෙම භාග්‍යවතුන් වහන්සේගේ පෙරහන්කඩය දහම් විනය උගත් තෙරනමක් රැගෙන ගියේය. බෑණනු ඇමති නගරයට ගොස්, 'බුදුවරයකු ලොව පහළව, පිරිනිවන්පා ඇතැ'යි රජුට සැළකොට, උන්වහන්සේගේ අවවාද පැවසීය. රජු තෙරුන්වහන්සේ වෙත පැමිණ, දහම් අසා, විහාරයක් කරවා, සෑයක් පිහිටුවා, බෝරුක රෝපණය කොට, තෙසරණ සහ නිති පන්සිල්හි පිහිටා, පෙහෙවස් දින අටසිල් සමාදන්වෙමින් ද, දන් දෙමින් ආයු ඇති තෙක් ජීවත්ව, කාමාවචර දෙව්ලොව උපනි. ඒ දහසය දහසක් පැවිදි පිරිසද මගපලයක් නොලබාම කළුරියකොට, රජුගේ පිරිවර ලෙස එහිම උපන්හ.

ඔව්හු එක් බුදුවරයකුගේ සසුන පවත්නා කාලයක් දෙව්ලොව වැස, අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහලවීමටද පෙර, එයින් චුත වූහ. (වඩු) ඇදුරුතුමා (කටය්වාහන රජු) පසේනදී රජුගේ පුරෝහිතගේ පුතකුව ඉපදී බාවරී නම්ව, මහ පුරිස් ලකුණු තුනකින් ද යුතුව, තුන් වේදයෙහි කෙළ පැමිණ, තම පියාගේ ඇවෑමෙන් පුරෝහිත තනතුර ලැබීය. ඉතිරි වූ දහසය දහසම සැවැත්පුර බමුණු කුලවල උපත ලදහ. ඔවුන් අතුරෙන් දෙටු අතවැසි දහසය දෙනා බාවරී වෙතින් සිප් සතර උගත්හ. ඒ ඉතිරි දහසය දහසම ඔවුන් සමීපයේ වූ හෙයින් නැවත සියල්ලෝම එක්ව

මුණගැසුණහ. කොසොල් රජු ද මළේය. එවිට පසේනදී ඔටුනු පළඳ රජවිය. බාවරී ඔහුටද පුරෝහිත විය. පසේනදී රජුද පියා මෙන්ම, දිය යුතු දේ හා වෙනත් සම්පත්ද බාවරීට ලබා දුන්නේය. ඔහුද ළදරු කල සිටම බාවරී සමීපයෙහි සිප් සතර හැදෑරීය. 'මහරජ, මම පැවිදි වන්නෙමි'යි බාවරී රජුට කීවේය. 'ඇදුරුතුමනි, ඔබ සිටිනවිට, මගේ පියා ජීවත්ව ඉන්නා සේය. පැවිදි නොවනු මැනවැ'යි ඉල්ලා සිටියේය. 'කම් නැත මහරජ, පැවිදි වෙමි'යි කී විට, වැළැක්වීමට නොහැකිව, 'උදේ සවස මට දැකිය හැකි ලෙස රාජකීය උයනෙහි පැවිදිව වෙසෙනු මැනවැ'යි රජු අයැදීය. ඇදුරුතුමා දහසය දහසක පිරිවරත්, සිසුන් දහසය දෙනාත් සමග පැවිදිවත් පුරමින්, රාජකීය උයනෙහි විසීය. රජු සිවුපසයෙන් උවටැන් කරයි. උදේ සවස උවටැන් පිණිස යයි.

මේ අතර, එක් දිනක අතවැසි තවුසෝ, 'නගරයට නුදුරුව වාසය කිරීම තවුස් දිවියට මහත් හිරිහැරයකි. ජනවාසයෙන් තොර තැනකට යමු, විවේක සෙනසුන් පැවිද්දන්ට මහත් උපකාර වේ'යැයි බාවරී තවුස් ඇදුරාණන්ට කීහ. ඔහු 'යහපතැයි' පිළිගෙන රජුට දැන්වීය. රජු තෙවරක්ම වළකා, තවුසාගේ ඒ අදහස වෙනස් කළ නොහැකිව, සියදහසින් දෙගුණ කොට දී, 'ඉසිවරුන් පිරිස වාසය කිරීමට කැමති තැනක අසපුවක් සකස්කොට දෙව'යි ඇමතිවරුන් දෙදෙනෙකුට අණ කළේය. එවිට ඇදුරුතුමා, දහසය දහසක් ජටා දරන තවුසන් (ජටිලයන්) පිරිවරා, ඇමතිවරුන් හා එක්ව යමින්, උතුරු ජනපදයෙන් දකුණු ජනපදය දෙසට ගියේය. මේ තොරතුරු අනුව ගරුකටයුතු ආනන්ද තෙරණුවෝ, පාරායණ වග්ගයට මුල් වූ අයුරු සංගායනාවේදී මෙම ගාථාවලින් කීහ.

ඒ (වත්ථු ගාථාවන්හි) **කොසලානං පුරා** කොසොල් රටෙහි නගරයෙන් - සැවැත් නුවරින් යැයි කියන ලදී. **ආකිඤ්චඤ්ඤං** කිසිත් නොමැති බව, (දැඩි ආසාව ඇතිවන) උපකරණ ආදිය තමා සන්තකව තබා නොගෙන විවේකයෙන් සිටීම, **සො අස්සකස්ස විසයෙ අළකස්ස සමාසනෙ** ඒ බ්‍රාහ්මණයා අස්සක-අළක යන අන්ධක රජවරුන්ගේ රටවල් දෙකට නුදුරු පෙදෙසෙහි - දෙරට අතර - මැද යන අදහසයි. **ගොදාවරී කූලෙ** ගොදාවරී ගං ඉවුරෙහි, ගොදාවරී ගඟ දෙපසට බෙදී, යොදුන් තුනක් පමණ, හැමතැන දිවුල් ගසින් යුතු කැලෑවක් සේ වූ අතුරු දූපතක් සකස් වී තිබුණි. පෙර, සරභංග (තවුසා) ආදීන් වාසය කරන ලද්දේ ඒ පෙදෙසෙහි බව අදහස් වේ. බාවරී තවුසා ඒ පෙදෙස දැක, 'මෙය පෙරද

මහණුන් කැමති වූ, මහණුන්ට සුදුසු තැනකැ'යි ඇමතිවරුන්ට කීය. ඇමතිවරු බිම්පෙදෙස ලබාගැනීමට අසසක රජුට සියදහසක්ද, අළක රජුට වෙනත් බිම් කොටසක්ද සමග යොදුන් පහක පෙදෙසක් ලබා දුන්හ. ඒ පෙදෙස ඔවුන්ගේ පාලන සීමා අතර විය. ඇමතිවරු එහි අසපුවක් කරවා, සැවැත් නුවරින් ද තවත් ධනය ගෙන්වා, ගොදුරු ගමක් ලෙස (ජනාවාසයක්) සකසා ගියහ.

උඤ්ඡෙන ච එලෙන ච පිණ්ඩපාතයෙන් ද, අල ජාති හා ගෙඩි පලතුරුවලින් ද යැපෙමින්, ගම ද විසාල වූ බව එහෙයින් කියන ලදී. තසස ඒ ගොදාවරී ගං ඉවුරෙහි හෝ ඒ බමුණාගේ සම්බන්ධතාව දැක්වීමට දුතියා විබත්ය. තතො ජාතෙන ආයෙන මහායඤ්ඤමකප්පයී ඒ ගමෙහි ගොවිතැන ආදියෙන් සියදහස් ගණනින් ආදායම් ලැබිණ. ඒවා රැගෙන එහි කෙළඹියෝ (ධනවත්හු) අස්සක රජු වෙත ගොස්, 'මේ ආදායම් භාර ගනිත්වා'යි කීහ. 'මම භාර නොගනිමි. ඇදුරුතුමන්ටම පිළිගන්වව'යි රජතුමා පැවසීය. ඇදුරු තවුසාද ඒවා භාර නොගෙන, දාන යාගයක් පිළියෙල කළේය. මෙසේ බාවරී තවුසා වසරක් පාසා දානයක් දුන්නේය. සිය දහසක් ද දුන්හ. ඔව්හු ඒ බිම් කොටසද, යොදුන් දෙකක් වූ 'මහායඤ්ඤං' යන ගාථාවේ අරුත නම්, මෙසේ ඔහු වසරින් වසර දාන යාග යදිමින්, එක් වසරක ඒ මහා යඤ්ඤං යජිත්වා ඒ ගමෙන් නික්ම, පුන පාවිසි අසසමං පන්සලට පිවිස, 'දානය ඉතා මැනවින්, දෙන ලදැ'යි සිතා සතුටුව හුන්නේය. මෙසේ සිටින අතර තසමිං පවිට්ඨමහි, තරුණ බැමිණියක ගෙදරදොර වැඩ කටයුතු කිරීමට අකමැතිව 'බමුණ, අර බාවරී-ගොදාවරී තීරයෙහි වසරක් පාසා සියදහසක් වියදම් කරයි. යව, එතැනට ගොස් පන්සියයක් ඉල්ලා, එයින් දාසියක් ගෙනෙව'යි සිය බමුණා පිටත්කර යවන ලදී. (ඒ අනුව) අඤ්ඤො ආගඤ්ජි බ්‍රාහමණො යනුවෙන් (කීහ.) උගඝට්ටපාදො පා ගමනින් එමෙන් ඉදිමුණු දෙපතුල් ඇතිව, විලුඹින් විලුඹට හෝ, වළලුකරින් (ගොප්මසින්) වළලුකර හෝ දණින් දණට හෝ එකට ගැටෙන පාදය, සුඛඤ්ච කුසලං පුච්ඡති 'කෙසේද? බමුණ, සැපසේ වෙසෙහිදැ'යි සුවදුක් විචාළේය. අනුජානාහි සිහියට ගනු මැනවි, අදහා ගනු මැනව, සතතධා කොටස් සතකට, අභිසංඛරිත්වා ගොම, වනමල්, කුසතණ ආදිය ගෙන, වහ වහා බාවරීගේ අසපුදොර කරා ගොස්, බිම ගොම ආලේප කොට, මල් විසිරුවා, තණ අතුරා, වම්පස කෙණ්ඩියේ දියෙන් සෝදා, සත් පියවරක් ගොස්, තම යටිපත්ල පිරිමදිමින්, මෙබඳු කුහක ගුණ පෙන්වන ලදී. භෙරවං සො

**අකිත්තයී** බිය උපදවන වචන කීවේය. 'සචෙ මෙ යාචමානසස' යන මේ ගාථාව කියන ලදැයි අදහස් වේ. **දුක්ඛිතො** දොම්නසට පත්ව, **උසසුසස** 'ඔහුගේ ඒ වචනය කවදා හෝ ඇත්තටම සිදුවේ'යැයි සිතමින් සුසුම්ලයි. **දෙවතා** අසපුවෙහි අරක්ගත් දේවතාවාම, **මුද්ධනි මුද්ධපාතෙ වා** (හිස්) මුදුන හෝ මුදුන (සිරස) පැලීම හෝ **භොතී චරහි ජානාති** පින්වත දනී ද, **මුද්ධාධිපාතඤ්ච** - සිරස පැලීම ද, **ඤාණං මෙ එත්‍ථ** මෙය මට මේ කරුණ දැනගැනීමට නුවණ.

**පුරා** බාවරී බමුණා වයස අවුරුදු විසිනවයෙහි සිට ගෝදාවරී තිරයෙහි වසන අතර, වසර අටකට පසු (අප) බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූහ. **අපචෙචා** පෙර බුදුවරුන් අනුව, **සබ්බාභිඤ්ඤා බලපපතෙතා** සියළු දේ දැන, බලවත්ව හෝ, සියළු දේ දැන, බලවත් බවට පත්ව (දසබල), **විමුතෙතා** අරමුණුකොට පවත්නා වූ මිදුණු සිත, **සොකසස** සෝකයට පත්වෙයි. **පහූතපඤ්ඤා** මහා නුවණැති, **වරභූරිමෙධසො** උසස් පුළුල් නුවණැති, නුවණෙහි ඇලුණු විධුරො අසමාන යැයි කියන ලදී. **මනතපාරගෙ** වේදයෙහි එතරට ගිය, **පසසවෙහා** බලවු, **අජානතං** නොදන්නවුන්ට, **ලකඛණ** ලකුණු, **ව්‍යාඛ්‍යාතා** කියන ලද විස්තර කරන ලදැයි කියන ලද්දේ වෙයි. **සමතතා** පිරිපුන් යැයි කියන ලදී.

**ධමෙමන මනුසාසති** දැහැමින් අනුසාසනා කරයි. **ජාතිං ගොතතඤ්ච ලකඛණං** 'ඉපදී කොපමණ කල්දැ'යි මගේ උපතද, පරම්පරාවද ලකුණුද, **මනෙත සිසෙස ච** මා විසින් හදාරන ලද වේදයෙහි ද, මගේ සිසුන් කෙරෙහිද, **මනසායෙව පුච්ඡථ** මේ පැන හත සිතින්ම අසවු, **තිසසමෙතෙතයෙ‍යා** ඒ එක් එක් තැනැත්තන්ගේ නම්ගොත් ලෙසින් කියන ලද, **දූභයො** දෙදෙනා, **පචෙචක ගණිනො** වෙන් වෙන්ව පිරිස් ඇතිව, **පුබ්බවාසනවාසිකා** පෙර කසුප් බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදිව, 'ගතපච්චාගත වත්' පුරා විසූ පිනින් යොමු වූ සිත් ඇත්තෝ, **මාහිසසති මාහිසසති** නම් නුවර, **පුරිමං** නගරයක් යැයි කියන ලදී. ඒ නගරයට පිවිසියහ. අදහස් වේ. නගර නම් දැක්වෙන හැම තැනකම (එසේ යොදාගත යුතුයි.) **ගොනද්ධං** ගොධ පුරයේ නමයි. **වනසවහයං** යනු තුම්බව නගරයට යයි කියනු ලැබේ. ඇතමෙක් **වනසාවත්‍ථී** යයි ද දක්වති. මෙසේ වන සැවතින් කොසඹෑවටත්, කොසඹෑවෙන් සාකෙත නුවරටත් පැමිණ ඒ ජටිලයන් දහසයදෙනාගේ පිරිස යොදුන් සයක් පමණ දුරට විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'බාවරීගේ ජටිල තවුසෝ මහජන කුතුහලය වඩවමින් එති, තවම ඔවුන්ගේ ඉඳුරන් (දහම් අවබෝධයට) සුදුසු පරිදි පිරිපුන් නැත. මගධයෙහි පාසාණක සෑය ඔවුන්ට ගැළපෙයි. එහි මා දහම් දෙසන කල මහාජනයාට දහම් අවබෝධ වන්නේය. සෑම නගරයකටම පැමිණ ආපසු එන බොහෝ ජනයා ද එහි එනු ඇතැයි බික්සඟණ පිරිවරා, සැවැත් නුවරින් රජගහනුවර දෙසට වැඩියහ. ඒ ජටිල තවුසෝ ද සැවැතට අවුත්, විහාරයට පිවිස, 'බුදුන් වහන්සේ කවුද? බුදුන් වහන්සේ කොතැන සිටිත්දැ'යි සිතමින් සුවඳ කුටියෙහි දොරකඩට ගොස්, භාග්‍යවතුන් වහන්සේගේ පා සලකුණ දැක, 'රාගී තැනැත්තාගේ යටිපත්ල ඇතුලට වක්ව ඇත. මෙබඳු පා සලකුණ නම් වැරදි නොමැත්තෙකුගේය. සියල්ල දන්නා බුදුවරයකුගේ යැයි තීරණය කළහ. භාග්‍යවතුන් වහන්සේ ද අනුපිළිවෙලින් සැවැත්, කිඹුල්වත් ආදී නගරවලට පිවිස, පාසාණක චෙතියටම වැඩියහ. කොසම්බිඤ්චාපි සාකෙතං සාවත්ථිඤ්ච පුරුත්තමං සෙතව්‍යං කපිලවත්ථුං ආදි ලෙස එහෙයින් කියන ලදී.

මාගධ පුරං මගධ නුවරයි. රජගහ නුවර අදහස් කෙරේ. පාසාණක චෙතියං පෙර විසාල ගලක් මත දේවාලයක් විය. භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි විහාරයක් බවට පත්වූයේය. පෙරදී හැඳින්වූ අයුරින්ම පාසාණක චේතිය යැයි කියනු ලැබේ. තසිතොව උදකං ඒ ජටිල තවුසෝ භාග්‍යවතුන් වහන්සේ පසුපස වේගයෙන් සවස ගිය මග උදෑසන ද, උදෑසන ගිය මග සවසද යමින්, 'මෙහි උන්වහන්සේ වැඩ සිටිති'යි අසා සතුටට පත්ව, ඒ චේතියට නැංගාහ. එහෙයින් තුරිතා පබ්බතමාරුහුං යැයි කියන ලදී. එකමන්තං ඨිතො භවෙය්‍ය ඒ පාසාණ චෙතියෙහි, සක්දෙවියන් විසින් මවන ලද මහා වේදිකාවෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක, 'ඉසිවරයාණනි, ඉවසිය හැකිද?' (සුවදුක් කෙසේද?) ආදී ලෙසින් උන්වහන්සේ සමග, පිළිසඳර කතා කරන කල්හි, 'පින්වත් ගොතම, ඉවසිය හැකිදැ'යි දෙවු අතවැසි වූ අජිත ද තමන්ම පිළිසඳර කතාකොට එකත්පස්ව සිට සතුටු සිතැතිව, මනොපඤ්හෙ අපුච්ඡි. මනසින් පැන පුළුවුත්.

ආදිසසා (වයස) 'අවුරුදු කීයද?' මෙය සළකාගෙන (සිතින් විමසයි.) ජම්මනං අපගේ ඇදුරුතුමන්ගේ උපත කියනු මැනවැ'යි අසයි. පාරමිං (දැනීමේ) අවසානයට පත්වීම, වීසං වස්සසතං අවුරුදු එකසිය විස්සක්, ලක්ඛණෙ මහාපුරිස් ලකුණෙහි, මෙයින් පසු ඉතිහාස ආදී බමුණු සමයෙහි

ඉගැන්වීම් අදහස් වේ. **පඤ්චසතානි වාචෙති** මුලදී කම්මැලි, අනුවණ, ගති ඇති තරුණයන් පන්සියයකට තමාම වේද මතුරු උගන්වයි. (කියවයි.) **සධම්මෙ** තම (පරපුරෙහි) බමුණු දහම්, 'එය ඔවුන්ගේ නායකයාගේ නොවෙනස් වන වචන ලෙස අදහති'යි කියන ලදී. **ලක්ඛණානං පවිචයං** ලකුණුවල විස්තර, 'ඔහුගේ සිරුරෙහි පුරිස් ලකුණු කෙතෙක්දැ'යි ඒ ලකුණු තුන ගැන විමසයි. **පුච්ඡං හි** විමසනු ලබන, **කමෙතං පටිභාසති** දෙවියන් ආදී පිරිස් අතරින් කවරෙක් එබඳු නැණවත් වචන කියත් ද? මෙසේ බමුණා පැන පහකම කරුණු පැහැදිලි කිරීම අසා, ඉතිරි පැන දෙක ද විමසමින්, හිස්මුදුන ද මුදුන පැලෙන සැටි ද අසන බව කීය.

එවිට භාග්‍යවතුන් වහන්සේ 'අවිජ්ජා මුද්ධා' යන ගාථාවෙන් එය පැහැදිලි කළහ. එහි සිවුසස් නොදැනීම නම් වූ 'අවිජ්ජා' යනු සංසාරයේ සිරස හෙවත් මුදුනයි. එහෙයින් **අවිජ්ජා මුද්ධා** යැයි කීහ. තමන් හා එක්ව ඇතිවන තහවුරු බව, සිත එකඟ බව ලබාගැනීමේ කටයුතු කිරීමේ කැමැත්ත හා උත්සාහයෙන් යුතු බැවින්, ඉඳුරන් (සද්ධා ආදී ඉන්ද්‍රියන්) එකම 'අරමුණක්' සේ පවත්නා බවට එළඹෙන බැවින්, අරහත් මග විදු නැණින් ඒ 'මුදුන' බිඳ හෙළයි. එහෙයින් **විජ්ජා මුද්ධාධිපාතිනි** ආදී ලෙසින් කීහ. **තතො වෙදෙන මහතා** එවිට මෙම පැන පැහැදිලිකොට විසඳීම අසා හටගත් මහත් සතුටින් **සන්ථම්භිත්වා** කයෙහි සිතෙහි පිබිදුණු ඔදවැඩි බවට පත්ව යන අදහසයි. වැඳ වැටී 'බාවරී' යන ගාථාව කීය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් 'සුඛිතො..........' ගාථාව කීහ. 'බාවරිස්ස.........' යන ගාථාවෙන් සියල්ල දන්නා බව හඟවා (කරුණු දැක්වීම) අවසන් කළහ. **සබ්බෙසං** ඉතිරි දහසය දහසකගේ තත්ථ පුච්ඡි තථාගතං පාසාණක චෙතියෙහි හෝ, ඒ පිරිස අතරෙහි හෝ **අජිතො පඨමං පුච්ඡි** ඉතිරි සියළු ගාථාවල අරුත් පැහැදිලිය.

**මේ එහි මූලික හේතු දැක්වෙන ගාථා විස්තරයි.**

ඒ විමසූ පැනයෙහි **නිවුතො** වැසුනේ, **කිස්සාභිලෙපනං බ්‍රෑසි** ලෝකයට ඇලෙන්නේ කුමකින්දැ'යි කියනු මැනවි. **වෙවිච්ඡා පමාදා නප්පකාසති** මසුරු බව හේතුවෙන් හෝ පමාවීම හේතුවෙන් නොකියයි. (හෙළි නොවෙයි) මසුරුකමෙන් දානාදී යහගුණ මතුවීමට ඉඩ නොදෙයි. සිල් ආදිය (රැකීමට) පමා වෙයි. **ජප්පාභිලෙපනං** වඳුරන් අල්ලා ගැනීමට තවරන ලද ආලේපයක් මෙන්, **දුක්ඛං** ඉපදීම ආදී දුක්, **සවනති සබ්බධී**

සොතා රූපාදී සියළුම තැන්වල තණ්හාදී දිය දහරා ගලා යයි. **කිං නිවාරණං** එයට ඇකවරණය කුමක්ද? කවුරු රකී ද? **සංවරං බ්‍රෑහි** එය දුරුකිරීම යයි කියන ලද සංවරය ගැන පවසනු මැනව. මෙයින් ඉතිරි ඉඳුරන්ගේද සංවරය ගැන විමසයි. **කෙන සොතා පිථීයරෙ** කිනම් දෙයකින් ඒ දියදහර වසනු ලබත්ද? නවතනු ලබත්ද? මෙයින් මුළුමනින්ම නැතිකිරීම ගැන අසයි. **සති තෙසං නිවාරණං** විදසුන් වඩමින් කුසල් අකුසල් පවත්නා සැටි විමසා බලන සිහිය, ඒ කන් ආදියට ගලාඑන තණ්හා දිය දහර වැළකීමයි. **සොතානං සංවරං බ්‍රෑමී** මම ඒ සිහියම තණ්හා ආදී දිය දහරෙහි සංවරය යැයි කියමි යැයි අදහසයි. **පඤ්ඤායෙතෙ පිථීයරෙ** රූප ආදියෙහි අනිස බව අවබෝධ කරනු පිණිස මගනුවණින් කණින් ඇතුළුවන එම තණ්හා ආදී දියදහර මුළුමනින්ම වළකන ලදී. පඤ්ඤාචෙව යන ගාථාවෙන් (නැවත විමසයි.) ඔබවහන්සේ විසින් කියන ලද **පඤ්ඤා,** සිහියද, ඒ ඉතිරිව ඇති නාමරූපං, එතං සියල්ලද, කත්ථ **නිරුජ්ඣති, එතං** මෙ පැනය, **පුටෙඨා** කියනු මැනවැයි මෙසේ කෙටි අරුත දතයුතුය. විසඳන ගාථාවෙහි නුවණ - සිහිය නාම යන නමින්ම ඇතුලත්ව ඇත. එහෙයින් එය වෙන්කොට නොකියන ලදී. මේ එහි කෙටි අරුතයි. ඔබ යම් පැනයක් මගෙන් **අජිත, එතං පඤ්හං** ඇසුවේද? **තං තෙ යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති** ඒ ගැන කියමි. ඒ ඒ දෙයට හඳුනා ගැනීම - විඤ්ඤාණය නැතිකිරීම සමගම පෙර පසු නොව මෙහිම (එතැනම) වැළකෙයි. මෙහිම විඤ්ඤාණය නැතිවූ විට වැළකෙයි. මෙම විඤ්ඤාණය නැති කිරීම එම නාමරූප ඉක්මවා නොයන බව කියන ලදී.

මෙපමණකින් 'දුක මහත් බයක්' යැයි මෙසේ දුක පිළිබඳ ඇත්ත ද, 'දුක්ඛමස්ස මහබ්භයං' - 'යම් දිය දහරා' 'යානි සොතානි' යනුවෙන් දුකට හේතුව ද, 'නුවණින් වසනු ලැබේ' - 'පඤ්ඤායෙතෙ පිථීයරෙ' යනුවෙන් දුක නැතිකිරීමද, 'මෙහිම සංසිඳේ' - 'එත්ථෙතං උපරුජ්ඣති' යනුවෙන් දුක නැතිකිරීමේ මග ද යැයි සිවුසස් ඇසුවද, අරහත් බව අවබෝධ නොකළ බැවින්, නැවත සෙඛ-අසේඛ පිළිවෙත ගැන **යෙච සංඛාතධම්මා** යන ගාථාවෙන් විමසීය. එහි **සංඛාතධම්මා** අනිස ලෙසින් විමසන ලද කරුණුයි. අරහත් බවට සමාන වදනකි. **සෙඛා** සීලාදියෙන් හික්මෙන, ඉතිරි (මගපල ලබනට කටයුතු කරන) තැනැත්තෝ **පුථු** බොහෝ සත්වග - බොහෝ දෙනා, **තෙසං මෙ නිපකො ඉරියං පුටෙඨා පබ්‍රෑහි** ඒ සෙඛ-අසේඛ තැනැත්තන්ගේ පිළිවෙත ගැන, නුවණැති ඔබවහන්සේ මට පවසනු මැනව.

එවිට භාග්‍යවතුන් වහන්සේ, මගපලයෙහි හික්මෙන කෙනෙකු විසින් නිවනට මග අහුරන, කාමයට කැමැත්ත මුල්කොට ඇති සියළු කෙලෙස් දුරු කළයුතු වන හෙයින් 'කාමෙසු' යන ගාථාවේ මුල් පද දෙකෙන් සේඛ පිළිවෙත පෙන්වා දුන්හ. කාමෙසු ඇලීම් ඇතිකරන භවභෝග සම්පත් හා කෙලෙස්, නාභිගිජ්ඣෙය්‍ය කයෙහි දුසිරිතද, සිතෙහි කැළඹුණු ගතිය ඇතිවන කරුණු ඉවත් කරමින්, මනසා අනාවිලො සියා, අසෙඛ තැනැත්තා හේතු නිසා හටගන්නා සියළු දෙයම අනිස ලෙසින් සමව පිරික්සා බලන බැවින් කුසලො සබ්බධම්මෙසු කය අනුව විමසා බැලීම් ආදී ලෙසින් සතො මමය - මගේය ආදී හැඟීම් බිඳ දමන ලදුව මහණෙක් බවට පත්ව හැසිරෙයි. එහෙයින් එම ගාථාවේ කුසලො...... ආදී ඊළඟ පේළි දෙකෙන් අසෙඛ පිළිවෙත දැක්වූහ. ඉතිරි කරුණු පැහැදිලිය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වා දේසනය නිම කළහ. දේසනය අවසානයෙහි අජිත, තම අතවැසි දහසක් දෙනා සමග රහත් පලෙහි පිහිටියේය. තවත් දහස් ගණනකට දහම් අවබෝධ විය. රහත් පල ලද ගරු කටයුතු අජිත උතුමන් ඇතුළු අතවැසි දහසක් දෙනාගේ අඳුන් (දිවි සම්) ජටා, දළ වැහැරි පෙරවූ සිවුරු අතුරුදන්ව, ඉඳු බලයෙන් පා සිවුරු දරා, දැගුල් කෙස් ඇතිව, 'එව මහණ' ලෙසින් පැවිද්ද ලබා, භාග්‍යවතුන් වහන්සේ ඇදිලි බැඳ නමදිමින් හුන්හ.

**අජිත සූත්‍ර විස්තරය නිමි.**

# 5.2

**කොධ සනතුසිතො** යනු තිස්සමෙත්තෙයා සූත්‍රයයි. මෙම සූත්‍රයට හේතුව කුමක්ද? (මෙහි) සියළුම සූත්‍ර විමසූ කරුණකට පිළිතුරු ලෙසින් දේසනා කොට ඇත. 'කැමති ලෙසට විමසව'යි භාග්‍යවතුන් වහන්සේ අවසර ලබාදුන් බැවින්, තම තමන්ගේ සැක සහිත අදහස් ඒ බමුණෝ විමසූහ. ඒ විමසන ලද, විමසන ලද කරුණු භාග්‍යවතුන් වහන්සේ

පැහැදිළි කළහ. එහෙයින් විමසීම් සඳහා වූ පිළිතුරු ලෙස මෙම සූත්‍ර දතයුතුය. අජිත සූත්‍රය අවසන් වූ විට, මොඝරාජ 'මරණය නැමති රජු නොදක්නා ලොවක් බලාපොරොත්තු වන්නේ කෙසේදැ'යි ඇසීමට සූදානම් විය. ඔහුගේ ඉඳුරන් (දහම් අවබෝධයට) සුදුසු පරිදි සකස්ව නොතිබූ බැවින්, භාග්‍යවතුන් වහන්සේ 'මොඝරාජ, ඔබ පසුව විමසන්න. වෙනත් කෙනෙකුට ඇසීමට ඉඩ දෙන්නැ'යි වැළකූහ. එහිදී තිස්ස මෙත්තෙය්‍ය 'කොධ.........' ආදී ගාථාවෙන් තම සැක සහිත කරුණ විචාළේය.

කොධ සනතුසිතො කවරෙක් මේ ලොවෙහි සතුටුවෙත්ද? ඉඤ්ජිතා තණ්හා දිට්ඨියෙන් කම්පාවන, උභනතමභිඤ්ඤාය දෙකෙළවර (මුල අග) දැන, මනතා න ලිපපති නුවණින් නො ඇලෙයි.

ඔහුට එම කරුණ පැහැදිලි කරමින්, භාග්‍යවතුන් වහන්සේ කාමෙසු ආදී ගාථා දෙකක් වදාළහ. කාමෙසු බ්‍රහමචරියවා කාමයෙහි ගතිලකුණු හෝ බඹසර හැසිරීම හෝ, කාමයන්හි ආදීනව දැක මග බඹසර හැසිරීමෙහි යෙදුනේ, මෙපමණකින් සෑහීමට පත්වන බව පහදති. තණ්හාවෙන් දුරු වූයේ කම්පා නොවන, සංඛාය නිබබුතො අතිස ලෙසින් කරුණු විමසා රාගාදී (ඇවිලෙන ගිනි) නිවීමෙන්, ඉතිරි කරුණු ඒ ඒ තැන සඳහන් වූ බැවින් පැහැදිලිය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වමින් මෙම සූත්‍රයද දේසනා කළහ. දේසනය අවසන මේ බමුණාද තම අතවැසි පිරිස දහස සමග රහත්බව ලැබීය. වෙනත් නොයෙක් දහස් ගණනකට දහම් ඇස පහළ විය. ඉතිරි කරුණු පෙර පරිදිය.

තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර විස්තරය නිමි.

## 5.3

අනෙජං යනු පුණ්ණක සූත්‍රයයි. මෙම සූත්‍රයද පෙර පරිදි මොඝරාජට පසුව විමසීමට ඉඩ තබා පුණ්ණකට පවසන ලද්දකි. මූල දසසාවී අකුසල්

මුල් දකින, **ඉසයො** ඉසිවරු නම් වූ ජටිලයෝ, **යඤ්ඤං** දිය යුතු දෙයක්, **අකප්පයිංසු** සොයත්, **ආසිංසමානා** රූප ආදිය පතමින්, **ඉත්ථභාවං** මේ නම් වූ කැමති භවයක් පතමින්, මිනිසත් බව ආදිය පතමින් යැයි කියන ලදී. **ජරං සිතා** ජරාව ඇසුරු කොට, ජරාව මුල්කොට මෙහිදී සියළුම සසර දුක ගැන කියන ලදී. ඒ අනුව එයින් නොමිදෙමින්, (ඒ ගැන) කල්පනා කරති'යි පෙන්වා දෙයි. **කච්චිස්සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා අතාරුං ජාතිඤ්ච ජරඤ්ච මාරිසා** මෙහි දෙන දෙයම යාග මග වෙයි. කිසියම් කෙනෙක් යාගයෙහි පමානොවී, යාග කරමින් සසර දුකින් එතර වෙත් ද? **ආසංසන්ති** රූපයෙහි පැහැපත් බව ආදිය පතති. **ථොමයන්ති** 'ඉතා යහපත්ව දෙන ලදැ'යි යාග ගැන පැසසුම් කරති. **අභිජප්පන්ති** රූප ආදිය ලැබීම පිණිස කතා කරති. **ජුහන්ති** දෙති. **කාමාභිජප්පන්ති පටිච්ච ලාභං** රූප ආදිය ලැබීම නිසා නැවත නැවත කැමැත්ත ඉටුකර ගැනීමටම පතති. 'අහෝ! මෙය ඇත්තටම අපටම විය යුතුයැ'යි කියති. එහි තණ්හාව වැඩෙන සැටි කී අයුරුයි. **යාජයොගා** යාගයෙහි ඇළුණු, **භවරාගරත්තා** මෙසේ මේ දේවල් සසරෙහි (මතු) බලාපොරොත්තු වෙමින්, සසරෙහි ඇලී (කැමති තැනකම) ඉපදීමටම ඇලෙමින්, **නාතරිංසු** ඉපදීම ආදී සසරදුකින් එතර නොවූහ. **අථ කො චරහි** දැන් වෙන කවරෙක් **අතාරි** යනුවෙනි. **සංඛාය** නුවණින් විමසා, **පරොවරානි** අනුන්ගේ ද තමාගේ ද, අනුන්ගේ ජීවිතය ද (අත්තභාව) තමාගේ ජීවිතයද (සසර පැවැත්මද) **විධූමො** කය දුසිරිත් ආදී දුම නැතිව, **අනීඝො** රාගාදී දුක් නැතිව, **අතාරි සො** මෙබඳු තැනැත්තා අරහත් වේ. **ජාතිජරං** තරණය කළේය. ඉතිරි කරුණු පැහැදිලිය. භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය අරහත් බව කුළුගන්වමින් දේසනා කළහ. දේසනය අවසන මෙම බමුණාද අතවැසි දහසක් පිරිස සමග අරහත් පලයෙහි පිහිටියේය. තවත් නොයෙක් දහසක් දෙනාට දහම් ඇස පහළ විය. ඉතිරි කරුණු කලින් කියා ඇති පරිදිමය.

**පුණ්ණක සූත්‍ර විස්තරය**
**නිමි.**

# 5.4

පුච්ඡාමි තං යනු මෙත්තගූ සූත්‍රයයි. **මඤ්ඤාමි තං වෙදගුං භාවිතත්තං** 'මේ තැනැත්තා වේදයෙහි' හෝ නුවණින් හෝ පරතෙරට ගියේ යැයි ද, භාවනාව (සිත) පුරුදු කළ කෙනෙකැයි ද සිතමි. **අපුච්ඡසී** මෙහි 'අ' අකුර (වචනයෙහි) පිරිපුන් බවක් දැනවීමට යෙදූ නිපාතයකි. කැමති දෙයක් අසව යන තේරුමයි. **පවක්ඛාමි යථා පජානං** (විමසූ දෙය ගැන) දන්නා ආකාරයට මෙසේ කියමි. **උපධිනිදානා පභවන්ති දුක්ඛා** තණ්හා ආදී කෙලෙස් හේතුවෙන් ඉපදීම ආදී දුක් ඇතිවෙයි. මෙසේ කෙලෙස් හටගැනීමට මුල්වන කරුණු ඇතිවිට දුක් හටගනිද්දී, මීළඟට යො වෙ අවිද්වා යන ගාථාවයි. **පජානං** හේතු නිසා ඇතිවන හැම දෙයක්ම අනිස බව දැන, **දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී** 'සසර දුකට ඉපදීමට හේතුවන්නේ කෙලෙස්'යැයි විමසා බලමින්, **සොකපරිද්දවඤ්ච** සෝකයද හඬා වැලපීමද, **තථා හි තෙ විදිතො එස ධම්මො** සත්වගට අවබෝධ කරගැනීමට, දැනගැනීමට හැකිවන සේ ඒ ඒ තැනැත්තාට ගැලපෙන පරිදි දහම් කරුණු පහදා දී ඇත. **කිත්තයිස්සාමි තෙ ධම්මං** නිවන ගැනද, නිවන් මග පිළිවෙත ද දේසනා කරන්නෙමි. **දිට්ඨෙ ධම්මෙ** දුක් ආදිය පිළිබඳව දැක, මේ ජීවිත කාලය ඇතුලත හෝ, **අනීතිහං** තමා ගැන නුවණින් මෙනෙහි කරමින්, **යං විදිත්වා** 'හේතු නිසා ඇතිවන හැම දෙයම අනිස'යැයි විමසීමෙන් නුවණින් දැන, (සබ්බෙ සංඛාරා අනිච්චා) **තඤ්චාහං අභිනන්දාමි** ඒ කියන ලද ඔබවහන්සේගේ වටිනා බැබළෙන සුළු වචන (කතාව) මම පතමි. **ධම්මමුත්තමං** ඒ උතුම් දහමට සතුටු වෙමි. **උද්ධං අධො තිරියඤ්ච මජ්ඣෙ** මෙහි උද්ධං යනු අනාගතයෙහි වන දේ, අධො අතීතයෙහි වූ, තිරියඤ්චාපි මජ්ඣෙ යනු දැන්, වත්මනෙහි පවත්නා, **එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච පණුජ්ජ විඤ්ඤාණං** මේ කියන ලද පරිදි, ඉදිරියට බලපාන ලෙස ඇතිකරගන්නා තණ්හා දිට්ඨියෙහි මුල්බැස ගැනීමද, එයින් ඇතිකර ගනු ලබන සිතිවිලිද දුරු කරව, එසේ දුරුකොට, **භවෙ න තිට්ඨෙ** මෙසේ වූ කල්හි දෙආකාර වූ භවයෙහි නොසිටී. **පණුජ්ජ** යන වචනයෙහි 'පණුදෙහි' යැයි මේ අදහස් වන ආකාරයයි. 'පණුදිත්වා' දුරුකොට යනුවෙන් මේ අරුත් දැක්වීම 'භවෙ න තිට්ඨෙ' හා සම්බන්ධ වේ. ඒ ආසාවලින් ඇතිවන හැඳිනීම් හා කෙලෙස් හැඟීම්වලින් දුරුව දෙආකාර භවයෙහි නොසිටිනා බව කියන ලදී. ඒ කෙලෙසුන් නැසූ තැනැත්තා - ඒවා දුරුකොට සසරෙහි නොරඳනා බව

කියන ලදී. 'එවං විහාරී' ගාථාවෙහි **ඉධෙව** මෙම සසුනෙහි හෝ මෙම ජීවිත කාලය තුල, **සුකිත්තිතං ගොතමනූපධිකං** මෙහි අනූපධිකං යනු නිවනයි. ඒ වෙනුවෙන් භාග්‍යවතුන් වහන්සේ අමතා, 'ගොතමයාණන් වහන්ස, නිවන පිලිබඳව මැනවින් පහදාදෙන ලදී. (ඒ පහදාදීමේ) සතුටු හුදෙක්ම ඔබවහන්සේ පමණක් නොවේ. (ඒ අනුව) වෙ තාපි යන ගාථාව (තිසසමෙත්තගු කීය.) **අටධීතං** මනාකොට හෝ හැමකල්හි හෝ, **තං තං නමසසාමි** එහෙයින් ඔබවහන්සේ නමදිමි. **සමෙචච** එළඹ, නාග යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ අමතමින් කීය.

'ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ දුකනැතිකරන ලදැ'යි එසේ නොපැමිණි, ඒ බමුණා දැනගත්තද, දුක ඇත්තටම නැතිකරන ලද තමන් වැනි කෙනෙක් සේ ඔහුට අවවාද දෙමින්, 'යං බ්‍රාහමණං' යන ගාථාව වදාළහ. එහි අරුත නම්, **යං** 'ඔබ' මේ තැනැත්තා පව් බැහැර කරන ලද බැවින් බමුණකු වෙයි. වේදය පරතෙරට දන්නා (ගිය බැවින් (වේදය හෙවත් සිවුසස්) **වෙදගුං** (රාගාදි කෙලෙස්) කිසිවක් නැති බැවින් **අකිඤ්චනො**, කාමයෙහිද, භවයෙහිද නොඇලෙන හෙයින් **කාමභවෙ අසතෙතාති අභිජඤ්ඤා** දැනගනුව (දැනගන්නෙහි නම්) **අද්ධා සො ඉමං ඔඝං අතාරි, තිණ්ණව පාරං අඛිලො අකංඛො** ඒ ගැන වැඩිදුර කිවයුතුද? මීළඟට විදවා **ච සො** යන ගාථාවයි. **ඉධ** මේ සසුනෙහි හෝ මේ ජීවිත කාලය තුල, **විසජ්ජ** හැරදමා, ඉතිරි කරුණු පැහැදිලිය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයද අරහත් බව කුළුවුගන්වමින් දේසනා කළහ. කලින් සඳහන් කරන ලද පරිදිම දහම් අවබෝධ විය.

**මෙත්තගු සූත්‍ර විස්තරය නිමි.**

## 5.5

**පුච්ඡාමි තං** යනු ධෝතක සූත්‍රයයි. **වාචාභිකංඛාමි** වචනය කැමැත්තෙමි. **සිකෙඛ නිබ්බාණමත්තනො** තමන්ගේ රාගාදිය නිවනු පිණිස උසස් සීලයෙහි හික්මෙන්නේය. **ඉතො** මගේ මුවින්, මෙසේ පැවසූ විට සතුටු වූ ධෝතක භාග්‍යවතුන් වහන්සේට තුතිපැසසුම් කරමින්, කතාවට

මුල් පුරන ලෙස ආයාචනා කරමින් 'පස්සාමහං.........' ගාථාව කීය. **පස්සාමහං දෙවමනුස්සලොකෙ** දෙව්-මිනිස් ලෝකයෙහි මම දකිමි. **තං තං නමස්සාමි** මෙබඳු වූ ඔබවහන්සේ නමදිමි. **පමුඤ්ච** මුදාගන්න, එවිට භාග්‍යවතුන් වහන්සේ තමන්ම කතාබහට මුල්වෙමින් (කාමාදී) සැඩපහර තරණය කරන අයුරින් 'නාහ...........'යන ගාථාව වදාළහ. **නාහං ගමිස්සාමි** මම නොයන්නෙමි, නොහික්මවන්නෙමි. වෑයම් නොකරන්නෙමි. පමොචනාය මුදවාලීමට, **කථං කථී** සැකය සහිත, **කරෙසි** එතර කරනු මැනව, මෙසේ වදාළ කල්හී බොහෝ සතුටට පත් ධෝතක භාග්‍යවතුන් වහන්සේට තුති පැසසුම් කරමින්, අවවාද ඉල්ලමින් 'අනුසාස බ්‍රහම' යැයි ගාථාව කීය. බ්‍රහම උසස් බව හඟවන ඇමතීමකි. **විවෙක ධම්මං** හේතු නිසා ඇතිවන හැමදෙයකම පැවැත්මක් නැතැයි එහි **සංසිඳීම** - විවේකය වූ නිවන, **අව්‍යාපජ්ජමානො** නොයෙක් නොයෙක් ආකාරයට නොපැමිණ, **ඉධෙව සනෙතා** මෙහිම සිටිමින් (මේ ජීවිතයෙහිම) **අසිතො** (තණ්හා-දිට්ඨි) ඇසුරු නොකොට, මෙයින් පසු දැක්වෙන ගාථා දෙක මෙත්තගූ සූත්‍රයෙහි කියා ඇති විස්තර පරිදිය. වෙනස්වන්නේ එහි 'ධම්මං' වෙනුවට මෙහි 'සනති' යැයි යෙදීම පමණි. තුන්වන ගාථාවෙහි මුල් පේළි අඩ එම සූත්‍රයෙහි දැක්වූ පරිදිමය. පසු කොටසෙහි **සංගො** - ඇලෙන, ලගින තැන්, ඉතිරි කරුණු සියල්ල පැහැදිලිය. මෙම සූත්‍රයද භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වමින් දේසනා කළහ. කලින් සඳහන් වූ පරිදි දේසනය අවසානයෙහි දහම් අවබෝධයද විය.

**ධෝතක සූත්‍ර විස්තරය නිමි.**

## 5.6

එකො අහං යනු උපසීව සූත්‍රයයි. මහන්ත මොඝං (කාමාදී) මහත් සැඩපහරක්, **අනිස්සිතො** පුද්ගලයකු හෝ දහමක් හෝ ඇසුරු නොකොට, **නො විසහාමි** නොහැකි වෙමි, **ආරම්මණං** හේතු වූ කරුණ, **යං නිස්සිතො** යම් දහමක් හෝ පුද්ගලයෙකු හෝ ඇසුරු කොට, ඒ බමුණා ආකිඤ්චඤ්ඤා යතනය ලැබී, එයින් එහා (ඉදිරියට) යාමක් නොදනී. එහෙයින් භාග්‍යවතුන්

වහන්සේ ඒ ඇසුරුකොට පවත්නා දෙයින් එහා - මතු ලද හැකි පියවර **ආකිඤ්චඤ්ඤං** යන ගාථාවෙන් වදාළහ. **පෙක්ඛමානො** ඒ ආකිඤ්චායතන 'සමවතට සිහියෙන් යුතුව සමවැදී නැගිට එහි අනිසය ලෙස දකිමින්, **නත්ථීති නිස්සාය** 'කිසිවක් නැතැ'යි ඒ සමවත අරමුණුකොට **තරස්සු ඔඝං** එතැන් පටන් පවත්නා විදසුන් මගට සුදුසුවන පරිදි සිවුආකාර සැඩපහර තරණය කරව. **කථාහි** සැකයෙන්, **තණ්හක්ඛයං නත්තමහාභිපස්ස** දිවා රෑ නිවන අරමුණුකොට බලව. මෙයින් ඔහුට මේ ජීවිතෙයහිදීම සැප විහරණය පවසයි.

දැන් 'කාමය හැරදමා' යන (වචන) අසා, මැඩපැවැත්වීමෙන් දුරු කරන ලද තම කාමයන් දකිමින්, **සබ්බෙසු....** යන ගාථාව කීය. (එහි) **හිත්වා මඤ්ඤං** සයාකාර වූ අනෙක් සමවත් හැර, **සඤ්ඤාවිමොක්ඛෙ පරමෙ** සඤ්ඤා මිදීම් සතෙන් උසස් වූ ආකිඤ්චඤ්ඤායතනයෙහි, **තිට්ඨෙය්‍ය නු සො තත්ථ අනානුයායී** ඒ පැනැත්තා ආකිඤ්චඤ්ඤායතන බඹලොවෙහි ඉවත්නොවී සිටින්නේදැ'යි විමසයි. එවිට භාග්‍යවතුන් වහන්සේ කප් සැටදහසක් පමණ එහි සිටින බව තුන්වන ගාථාවෙන් වදාළහ. මෙසේ උපසීව ඔහුගේ ඒ (උපදනා) තැන අසා, මීළඟට 'තිට්ඨෙ චෙ' යන ගාථාවෙන් 'සදාකාලික පැවැත්ම (සස්සත) හා වැනසීම (උච්ඡෙද) ගැන කීය. **පූගම්පි වස්සානං** බොහෝ අවුරුදු, අවුරුදු ගණනින්, අවුරුදු ගිණිය නොහැකි තරම්, **පූගම්පි වස්සානි** යනුවෙන් ද දැක්වේ. එහි විබත් දැක්වීමෙහිදී ආධාර විබත් අරුතෙහි පළමු විබතින් යෙදිය යුතුය. පූගං 'සමූහය' හෝ 'බහුනී' 'බොහෝ' යනුවෙන් හෝ අරුත් කිවයුතුය. පූගානි යනුවෙන්ද කියති. මුල් වචනය හැම අයුරින්ම සුදුසුය. **තත්ථෙව සො සීති සියා විමුත්තො** ඒ තැනැත්තා එම ආකිඤ්චඤ්ඤායතනයෙහිම නොයෙක් දුක්වලින් මිදී (කෙලෙස් දැවීම් තැවීම් රහිතව) සිහිල්බවට පත්වන්නේය. නිවනට යොමුව සිටින්නේ යැයි අදහස් වේ. **චවෙථ විඤ්ඤාණං තථාවිධස්ස** නැතහොත් එබඳු විඤ්ඤාණයම (සිත) නැවත නූපදනා ලෙස මරණයට පත්වන්නේ දැ'යි අසයි.

එහිදී භාග්‍යවතුන් වහන්සේ වැනසෙන-සදා පවතින අදහස නොව, එහි උපන් ආරිය පුද්ගලයාගේ සසරෙහි නැවත ඉපදීමක් නැති බව 'අච්චි යථා'.......යන ගාථාව වදාළහ. **අත්ථං පලෙති** නිවී යයි. **න උපෙති සංඛං** අසවල් දෙසට ගියේ යැයි කිව නොහැකිය. **එවං මුනි නාමකායා විමුත්තො** මෙසේ එහි උපන් රහත් බවට යොමුවන උතුමා, ලද රූප කායෙන් මිදී,

එහි සිවුවන දැහැන් මග උපදවා, නාම කාය ගැනද මැනවින් දැන, නැවත නාමකායෙන්ද මිදී දෙආකාරව මිදුණේ .සියළු කෙලෙසුන් නැතිකොට, නැවත සසර නූපදීමෙන් නිවන යැයි හඳුන්වනු ලබන නිවීමට පත්වේ. (එවිට) කැත් කුලවතෙකි. බමුණෙකි ආදී ලෙස නම් කළ නොහැකිය. (හඳුනා ගැනීමක් නැත.) දැන්, 'නිවීමට යයි' යන වචන අසා, එහි නුවණින් අරුත් වටහා නොගනිමින්, 'අත්ථංගතො සො' යන ගාථාව කීය. එම ගාථාවේ **සො අත්ථංගතො** නැතහොත් **නත්ථි, උදාහු වෙ සස්සතියා** පවතින අයුරින්, **අරොගො** ඔහු වෙනස්වීමක් නැත්ද? මෙසේ **තමෙම මුනි සාධූ වියාකරොහි** කුමක් හේතුකොට ගෙනද? **තථා හි තෙ විදිතො එස ධම්මො** එවිට, එසේ නොකිවයුතු බව **අත්ථංගතස්ස** යන ගාථාවෙන් පැහැදිළි කළහ. **අත්ථංගතස්ස** සසර ඉපදීමේ හේතු නැතිකළ හෙයින්, පිරිනිවනට පත්, **න පමාණමත්ථි** රූප ආදී දෙයක් පෙන්විය නොහැකිය. **යෙන නං වජ්ජු** යම් කෙනෙකු විසින් රාග ආදිය ඇතැයි කියත් නම්, **සබ්බෙසු ධම්මෙසු** ඛන්ධ රූපාදී සමූහ යුතු සියළු දේවල් කෙරෙහි, ඉතිරි කරුණු පැහැදිලිය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රයද අරහත් බව කුළුගන්වමින් දේසනා කළහ. දේසනය අවසානයෙහි කලින් කියා ඇති පරිද්දෙන්ම පිරිස දහම් අවබෝධය ලැබීය.

**උපසීව සූත්‍ර විස්තරය නිමි.**

# 5.7

සන්ති ලොකෙ යනු නන්ද සූත්‍රයයි. එහි මුල් ගාථාවේ අරුත් නම් ලොකෙ කැත්කුල ආදී, ජනා ආජීවක, නිගණ්ඨ ආදීන් සඳහා, **සන්ති මුනයො වදන්ති, තයිදං කථංසු** ඔවුන් සමාපත්ති, නුවණ ආදියෙන් උපන්නාහුද? නුවණින් යුතු බැවින් **ඤාණූපපන්නං නො මුනිං වදන්ති** මේ ආකාරයැයි කියත්ද? **උදාහු වෙ** නොයෙක් ආකාර වූ රළු ජීවිතයෙන්, **ජීවිතෙනූපපන්නං** යනුයි. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ කරුණු දෙකම බැහැර කොට, 'න දිට්ඨියා' යන ගාථාවෙන් මුනිවරයා ගැන පැහැදිළි

කළහ. මීළඟට 'දැකීමෙන් පිරිසිදු වේ' යැයි කියන තැනැත්තන්ගේ සැක දුරලනු පිණිස 'යෙ කෙචි මෙ' යන ගාථාවෙන් අසයි. **අනෙක රූපෙන** දැකීමෙන් යහපත වේ යැයි ඇති කුතුහලය, **තථා යථා චරනතා** තමාගේ යන දැඩිව ගත් හැඟීමෙන්, හැසිරෙන තැනැත්තන්ට එසේ පිරිසිදු විය නොහැකි බව ඔහුට පෙන්වා දීමට භාග්‍යවතුන් වහන්සේ දෙවැනි ගාථාව වදාළහ. මෙසේ 'ඔවුන් (සසරින්) එතරට නොගිය බව අසා, මීළඟට එතරවන තැනැත්තා ගැන දැනගනු කැමතිව, 'යෙ කෙචි මෙ' (යන ගාථාව කීය.) එවිට භාග්‍යවතුන් වහන්සේ (සසර) සැඩපහර තරණය කිරීම මුල්කොට, ඉපදීම හා ජරාවෙන් එතරවන අයුරු තුන්වන ගාථාවෙන් ඔහුට වදාළහ. එම ගාථාවෙහි **නිවුතා** ගැලුනු, බැසගත්, **යෙසීධා** - යෙසු ඉධ, මේ ලෝකයෙහි යමෙක්, 'සු' නිපාතයක් පමණි. **තණහං පරිඤ්ඤාය** තුන් ආකාරව තණ්හාව දැන, පෙර කී අයුරු ඉතිරි කරුණු පැහැදිලිය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වමින් දේසනය නිම කළහ. දේසනය අවසානයෙහි නන්‍ද භාග්‍යවතුන් වහන්සේගේ වදාළ කරුණුවලට 'එතාභි නන්‍දාමි' යන ගාථාවෙන් සතුට පළකළේය. කලින් දක්වා ඇති පරිදි මෙහිදී ද පිරිස දහම් අවබෝධය ලැබීය.

**නන්‍දසූත්‍ර විස්තරය නිමියේය.**

# 5.8

**යෙ මෙ පුබෙබ** යනු හේමක සූත්‍රයයි. එහි **යෙ මෙ පුබෙබ ව්‍යාකංසු** බාවරී ආදීහු කලින් මගේ අදහස ද ඉදිරිපත් කළහ. **හුරං ගොතම සාසනං** ගෝතම සාසනයට ඉහතදීත්, **සබබං තං තකකවඩඪනං** ඒ සියළු අදහස් කාම සිතිවිලි ආදිය වැඩිදියුණු කරන ඒවාය. **තණහා නිගසාතනං** තණ්හාව වැනසීම.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඊට අදාල කරුණු **ඉධ** යන ගාථා දෙකින් වදාළහ. **එතදඤ්ඤාය** යෙ සතා එය **නිබබාණපද මචචුතං** හේතු

නිසා ඇතිවන සියළුම සකස්වීම් වෙනස්වන - තිර නැති බව විදසුන් වඩමින් අනුපිළිවෙලින් දැන, කය අනුව විමසා බලන මනා සිහි ඇත්තෝ, දිට්ඨධම්මාභිනිබ්බුතා නිවැරදි දහම අවබෝධ කරන ලදින්, දකින ලද බැවින්, රාගාදී (කෙලෙස් ගිනි) නිවීමෙන්, ඉතිරි කරුණු පැහැදිලිය. භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයද අරහත් බව කුළුගන්වමින් දේසනා කළහ. පෙර කී පරිදිම දේසනය අවසන බොහෝ පිරිස දහම් අවබෝධය ලැබීය.

හේමක සූත්‍ර විස්තරය නිමි.

# 5.9

යස්මිං කාමා යනු තොදෙය්‍ය සූත්‍රයයි. එහි **විමොක්ඛො තස්ස** කීදිසො මෙබඳු කෙනෙකුගේ මැනවින් මිදීම කෙබඳු අයුරින් බලාපොරොත්තු විය යුතුදැයි අසයි. මීළඟට භාග්‍යවතුන් වහන්සේ ඔහුට (ඔහු අදහස් කළ මිදීම නොව) වෙනත් මිදීමක්, නිදහසක් ගැන දෙවන ගාථාවෙන් කීහ. **විමොක්ඛො තස්ස නාපරො** ඔහුට වෙනත් මිදීමක් නැත. මෙසේ 'තණ්හාව නැති කිරීම මිදීම' යැයි කීවත්, ඒ කරුණ නොසලකා 'ඒ තැනැත්තාට ආසා නැත්ද, නැතිනම් යම් දෙයකට බලාපොරොත්තු නැත්දැයි නැවත විචාරයි. **උද පඤ්ඤකප්පී** නැතහොත්, සමවත් නුවණ ආදියෙන් තණ්හා හැඟීම් හෝ, දැකීම් හෙවත් මතවාද මගින් ගොඩනගා ගන්නා සංකල්පවලින් (වෙලී) සිත සිතා සිටීද? එවිට භාග්‍යවතුන් වහන්සේ එය පැහැදිලි කරමින් දෙවන ගාථාව වදාළහ. එහි **කාමභවෙ** කාමයෙහිද භවයෙහිද ඉතිරි කරුණු පැහැදිලිය. මෙම සූත්‍රයද භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වමින් දෙසූහ. දේසනය අවසානයෙහි පිරිස පෙර කී පරිදි දහම් අවබෝධ කළේය.

තොදෙය්‍ය සූත්‍ර විස්තරය නිමි.

## 5.10

**මජ්ඣෙ සරසමිං** යනු කප්ප සූත්‍රයයි. එම ගාථාවේ **මජ්ඣෙ සරසමිං** මුල, අවසන් කෙළවර නොපෙනෙන මැද කොටසක් ලෙස සසර යැයි කියන ලදී. **තිට්ඨතං** සිටිනු ලබන, **යථයිදං නාපරං** සියා යම් සේ මේ දුක නැත ඇති නොවන්නේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම කරුණ පැහැදිලි කරමින් ගාථා තුනක් වදාළහ. **අකිඤ්චනං** සතුරුවන කිසිවක් නැති, (කෙලෙස් රහිත) **අනාදානං** අල්ලා ගැනීම හෙවත් තණ්හාවෙන් ඉවත්වුණු, තණ්හාවෙන් කිසිවක් නොගැනීමෙන් සැනසුනු බව කියන ලදී. අනාපරං මීට සමාන වෙනත් රැකවරණ සහිත තැනක් (දිවයිනක්) නැත. (එය) උසස් යැයි ද කියන ලදී. **න තෙ මාරසස පද්ධගූ** ඔව්හූ මාරයාගේ පා සෙවනෙහි හැසිරෙන, මාරයා පිරිවරා ඇති සිසුවෝ නොවෙති. (මාර වසඟයට පත් වූවෝ නොවෙති.) ඉතිරි කරුණු සියල්ල පැහැදිලිය. අරහත් බව කුළුගන්වා මෙම දේසනයද භාග්‍යවතුන් වහන්සේ වදාළහ. දේසනය අවසානයේ පෙර සඳහන් වූවාක් මෙන් බොහෝ පිරිසක් දහම් අවබෝධය ලැබීය.

**කප්ප සූත්‍ර විස්තරය නිමි.**

## 5.11

**සුත්වාන හං** යනු ජතුකණ්ණ සූත්‍රයයි. **සුත්වාන හං වීරමකාමකාමී** මම ඒ භාග්‍යවතුන් වහන්සේ, මේ ගුණවලින් යුතු, කාමයන් නොකැමති, වීරවත් වූ, කාමයන් අත්හළ බව අසා, **අකාමමාගමං** කාමරහිත වූ භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීමට පැමිණියෙමි. **සහජනෙත්ත** නුවණැස පහළවීමත් සමගම සියල්ල දන්නා, යථාවබෝධය ලද, **යථා තච්ඡං** ඇති සැටියෙන්, **බ්‍රෑහි** මෙ නැවත කියාදෙන ලෙස ඉල්ලමින්, ඉල්ලා සිටින්නේ නම් (තථාගතයන් වහන්සේ) දහස් වරක් වුවත් කියන්නාහ. දෙවරක් ඉල්ලීම ගැන කියනුම කවරේද? **තෙජී තෙජසා** තේජසින් යුතු, අභිභූය්‍ය,

යමහං විජඤ්ඤං ජාති ජරාය ඉධ විප්පහාණං මම ඉපදීම - ජරාවට පත්වීම නැතිකිරීමට හේතුවන කරුණු මෙතැනදීම දැනගන්නෙමි.

එවිට භාග්‍යවතුන් වහන්සේ ගාථා තුනකින් ඒ කරුණු පැහැදිලි කළහ. නෙක්ඛම්මෙම දට්ඨුං ඛෙමතො නිවනද, නිවනට මග පිළිවෙත ද 'බිය රහිත' යැයි දැක, උග්ගහිතං තණ්හා දිට්ඨී ලෙසින් දැඩිව ගන්නා ලද නිරත්තං වා ඉවත් කළයුතු, අත්හළ යුතු යැයි කියන ලදී. මා තෙ විජ්ජිථ ඔබට නොවේවා! කිඤ්චනං රාගාදී අවහිරතා ඔබට නොවේවා! පුබ්බෙ අතීතයේ කළ කී දේ අනුව හටගන්නා කෙලෙස්, බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ ජතුකණ්ණි අමතති. ඉතිරි කරුණු පැහැදිලිය. මෙම සූත්‍රයද භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වමින් දෙසූහ. පෙර පරිදිම දේසනය අවසන බොහෝ දෙනාට දහම් අවබෝධ විය.

ජතුකණ්ණි සූත්‍ර විස්තරය නිමි.

# 5.12

ඔකං ජහං යනු භද්‍රාවුධ සූත්‍රයයි. ඔකං ජහං ගිහි ගෙයි ආසාව දුරලූ, තණ්හච්ඡිදං සිරුර හා බැඳි සය ආකාර තණ්හාව නසන ලද, අනෙජං ලෝ දහමෙහි කම්පා නොවන, නන්දිං ජහං අනාගතයෙහි ද රූප ආදී බලාපොරොත්තු හැර දැමූ, තණ්හාව නම් වූ එකම කරුණ ගැන (තථාගතයන් වහන්සේ විසින් පැවසීම) අගය කිරීමේ අදහසින් මෙසේ නොඑක් ආකාරයෙන් පවසන ලදී. කප්පං ජහං තණ්හා දිට්ඨී කල්පනා දුරලන ලද, අභියා වෙති වෙසෙසින් අයදිමි. සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො අති උතුම් වූ භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේගේ මේ පාසාණක චෙතිය (පෙදෙසින්) බොහෝ ජනයා පැමිණෙතැයි අදහස් වේ. ජනපදෙහි සංගතා අංග ආදී ජනපදවලින් මෙහි රැස්වූ, වියාකරොහි දහම් දෙසනු මැනවි.

එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිතට ගැලපෙන පරිදි ගාථා දෙකකින් දහම් දෙසූහ. ආදාන තණ්හං සිතෙහි රූපාදිය රඳවා ගැනීමේ ආසාවෙන්, තණ්හා උපාදානය හෙවත් ආසාවෙහි දැඩිව අල්වාගැනීම ගැන කියන ලදී. **යං යං හි ලොකසමිං උපාදියන්ති** පෙරදීත්, මතුවටත් අගය කොට, ආසා කොට සිත රඳවා ගන්නා දේ, **තෙනෙව මාරො ජනතුං** ඒවා දැඩිකොට ගැනීමෙන්ම, කරන කියන කටයුතුවල, හටගනු ලබන - එක්රැස්වන පල විපාක අනුව (සසර) පිළිසිඳ ගැනෙන (රූප වේදනාදි) පස්කඳ නම් වූ මාරයා සත්වග අනුව යයි. **තසමා පජානං** එහෙයින් ආදීනව අනිස ලෙසින් හෝ සසර බැඳීම් ලෙස හෝ දැනගැනීමෙන්, **ආදාන සතෙත ඉති පෙකඛමානො පජං ඉමං මචචුධෙයෙ‍ය විසතතං** 'අල්ලා ගත යුතුය' යන අරුත දනවන රූප ආදී එබඳු දෙයෙහි, මේ ලොව සියළු දෙනාම මාරයාගේ බලපෑම බලා සිටිමින්, එසේ ඒවා දැඩිව ගන්නා ලද සතුන් හෝ, එසේ දැඩිව අල්ලා ගැනීමෙන්, ඊට වසඟව වෙලුනු පුද්ගලයකු හෝ, එසේ දැඩිව ගැනීම නිසා මේ මිනිස් කැලම මරණයෙහි වසඟයට පත්ව - එයින් ඉවත්ව යාමට - ගැලවී යාමට නොහැකි යයි සිතා, **කිඤචනං සබබලොකෙ න උපාදියෙථ** ඉතිරි කරුණු පැහැදිලිය. මෙම සූත්‍රයද භාග්‍යවතුන් වහන්සේ අරහත් බව කුළුගන්වා දේසනා කළහ. දේසනය අවසානයෙහි පෙර කී පරිදිම බොහෝදෙනා දහම් අවබෝධය ලැබීය.

**භද්‍රාවුධ සූත්‍ර විස්තරය නිමි.**

# 5.13

**ඣායී** යනු උදය සූත්‍රයයි. එහි **අඤඤවිමොකඛං** නුවණ බලයෙන් වැටහෙන පරිදි මිදීම-නිදහස ගැන විමසයි. උදය බමුණා සිවුවන දැහැන් ලැබුවෙකු බැවින් ඔහු ලද එම දැහැනට අනුව, නොයෙක් ආකාරයෙන් මිදීම දැනගැනීම පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ ගාථා දෙකක් වදාළහ. **පහාණං කාමචඡන්දානං** මෙසේ පළමු දැහැන උපදවා ගනු ලබන තැනැත්තා කාමච්ඡන්දය දුරු කරයි. ඒ අනුව **අඤඤා විමොකඛං** පබ්‍රෑම් මෙසේ

සියළුම පදවලට යෙදිය යුතුය. **උපෙක්ඛාසති සංසුද්ධං** සිවුවන දැහැනෙහි මැදිහත් බව හා සිහියෙන් මනා පිරිසිදු වූ, **ධම්මතක්ක පුරෙජවං** මෙයින් ඒ සිවුවන දැහැන් මිදීමෙහි සිට දැහැන්වල ඇතුලත් ඒ ඒ අංග පිළිබඳව විදසුන් වඩා ලබන ලද අරහත් බව (හෙවත් සියළු කෙලෙසුන්ගෙන් මිදීම) සඳහා කියයි. අරහත් වූ විමුක්තියට (අයත්) අරිඅටැඟි මගෙහි යහපත්, නිවැරදි කල්පනා ලෙසින් දහම් විමසා බැලීමට ඉදිරියට ගෙන යයි. එහෙයින් **ධම්මතක්ක පුරෙජවං** ධර්ම තර්ක සංඛ්‍යාත සම්‍යක් සංකල්පය පෙරටුකොට යැයි කීහ. **අවිජ්ජාය පභෙදනං** ඒ **අඤ්ඤාවිමොක්ඛ** හෙත් අරහත් බව - අවිජ්ජාව බිඳ දමන ලදුව නිවන නිසා හටගත් බැවින් ඒ කරුණු අනුව එසේ කියා ඇත. 'අවිජ්ජා' බිඳ දැමීමෙන් යන වචනයෙන් කියන ලද නිවන අසා 'ඒ කිනම් දෙයක දුරු කිරීමෙන් වේදැ'යි 'කිංසු සංයොජනො' යන ගාථාව වදාළහ. **කිංසු සංයොජනො** සසර බැඳ තබන බැඳීම් කවරේද? **විචාරණං** විවරණ කරුණු **කිස්සස්ස විප්පහාණෙන** කෙබඳු දෙයක් නැති කිරීමෙන්, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'නන්දි සංයොජන' ගාථාවෙන් එය පැහැදිලි කළහ. එහි **විතක්කස්ස** කාමසිතිවිලි ආදිය ඔහුට ඇතිවෙයි. මීළඟට ඔහු නිවනට මග 'කථං සතස්ස' යන ගාථාවෙන් විමසීය. **විඤ්ඤාණං** සකස්වන විඤ්ඤාණය, භාග්‍යවතුන් වහන්සේ අජ්ඣත්තං යන ගාථාවෙන් ඔහුට මග පැහැදිලි කළහ. **එවං සතස්ස** මෙසේ සිහි ඇතිව හැසිරෙන්නාට, භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයද අරහත් බව කුළුගන්වමින් දේසනා කළහ. දේසනය අවසානයෙහි පෙර කී පරිදි බොහෝදෙනාට දහම් අවබෝධ විය.

**උදය සූත්‍ර විස්තරය නිමි.**

# 5.14

**යො අතීතං** යනු පොසාල සූත්‍රයයි. **යො අතීතං ආදිසති** යම් භාග්‍යවතුන් වහන්සේ කෙනෙකු තමන්ගේ ද අනුන්ගේ ද 'ඉපදී එක් වාරයක් ආදී ලෙසින් පෙර තතු දක්වත් ද? **විභූත රූප සඤ්ඤිස්ස** රූපය පිළිබඳ හැඟීම් ඉක්මවන ලද, **සබ්බකායප්පහායිනො** යටපත් කිරීමෙන්

හා මුළුමනින් මැඩපැවැත්වීමෙන් සියළු රූපකාය හැරදමන ලද, රූප භවයක පිළිසිඳගැනීම් නැතැයි අදහස් කෙරේ. **නත්ථි කිඤ්චීති පස්සතො** විඤ්ඤාණය නැතිවීම නුවණින් අවබෝධ කිරීමෙන් 'කිසිත් නැතැ'යි දකිමින්, ආකිඤ්චඤ්ඤායතනය ලැබූවෙකැයි කියන ලදී. **ඤාණං සක්කා නු පුච්ඡාමි** ඒ තැනැත්තාගේ නුවණ විමසමි. කෙබඳු දෙයක් බලාපොරොත්තු විය යුතුදැයි 'සක්‍රය' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ අමතා අසයි. **කථං නෙය්‍යො** කෙසේ ඒ තැනැත්තා එම නුවණට පැමිණවිය යුතුද? කෙසේ ඊට වඩා උසස්, දියුණු වූ නුවණ උපදවා ගතයුතුද?

එවිට භාග්‍යවතුන් වහන්සේ එබඳු පුද්ගලයෙකු (මෙතෙක්) නුවණ නොලද බව පවසා ඒ නුවණ පැහැදිලි කිරීමට ගාථා දෙකක් වදාළහ. එහි **විඤ්ඤාණට්ඨිතියො සබ්බා අභිජානං තථාගතො** එක්රැස් කරගන්න ලද දේ අනුව (කුසල් අකුසල් අනුව) සිවුආකාර වූ පිළිසිඳ ගැනීම් කෙරෙහි සත්වග යොමුවන විඤ්ඤාණයෙහි පැවැත්ම තථාගතයන් වහන්සේ මැනවින් දත්හ. **තිට්ඨන්තමෙනං ජානාති** පෙර කළ කී දෑ අනුව 'මේ තැනැත්තා මෙබඳු ගතියක් (උපතක්) ලබන්නේ යැයි පුද්ගලයකු පිළිබඳව දනිති. **විමුත්තං** ආකිඤ්චඤ්ඤායතනයෙන් ද මිදුණු, **තප්පරායණං** එය පිහිටකොට, **ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වා** ආකිඤ්චඤ්ඤායතනයෙහි උපත ලබන, (එහෙත් සසර දිගුවන) මේ අවහිරය කුමක්දැයි ඊට එක්රැස් වූ හේතු දැන, **නන්දී සංයොජනං ඉති** එහි අරූපරාගී ආසාව, එයද සසර බැඳ තබන බැම්මක් වූ 'සංයොජන' යැයි දැන, **තතො තත්‍ර විපස්සති** ඉක්බිති ඒ ආකිඤ්චඤ්ඤායතන සමවතින්ද නැගිට, ඒ සමවතද අනිස ලෙස සළකා විදසුන් වඩයි. **එතං ඤාණං කථං තස්ස** මෙසේ විදසුන් අනුව නුවණින් විමසනවිට කෙමෙන් කෙමෙන් ඒ තැනැත්තා ලබන අරහත් නුවණ වෙනස්-විකාර නොවේ. **වුසීමතො** මඟ බඹසරෙහි වැස, ඉතිරි කරුණු පැහැදිලිය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයද අරහත් බව කුළුගන්වා දේසනා කළහ. දේසනය අවසන (ද) පෙර පරිදිම බොහෝ පිරිසකට දහම් අවබෝධ විය.

පොසාල සූත්‍ර විස්තරය නිමි.

# 5.15

දවාහං සක්කං මෝඝරාජ සූත්‍රයයි. දවාහං මම දෙවරක්ම, අජිතටද, තිස්ස මෙත්තෙය්‍යටද කරුණු පැහැදිලි කිරීමෙන් පසු, දෙවරක්ම, මෝඝරාජ භාග්‍යවතුන් වහන්සේගෙන් විමසීය. ඔහුගේ ඉඳුරන් දහම් අවබෝධයට සුදුසු වනතුරු එයට ඉඩ නොදුන්හ. දවාහං සක්කං අපුච්ඡිස්සං යැයි එසේ හෙයින් කියන ලදී. යාව තතියඤ්ච දෙවිසි ව්‍යාකරොතීති මෙ සුතං 'අති පිරිසිදු දෙවියකු බවට පත්, ඉසිරිවර භගවත් සම්මා සම්බුදුන් වහන්සේගෙන් සහදැමියකු තුන්වරක් දක්වා යම්කිසි කරුණක් අසන ලදවිට, එය පැහැදිලි කර දෙති'යි මා අසා ඇත. ගොදාවරී නදී තෙරදී මා එසේ අසන ලදී. එහෙයින් ව්‍යාකරොතීති මෙ සුතං යැයි කියන ලදී. අයං ලොකො මිනිස් ලොව, පරො ලොකො ඒ හැර ඉතිරි ලෝක, සදෙවකො බඹලොව හැර, දෙවියන් ලෙස උපත ලැබූවන් සහ දෙවියන් යැයි සම්මතව හඳුන්වන්නන්ගෙන් යුතු, බ්‍රහමලොකො සදෙවකො මේ ආකාර වූ දෙවියන් සහිත ලෝකයෙහි ආදී ලෙස නිදසුන් පමණි. ඒ අනුව සඳහන් කර ඇති පරිදි ලෝකය ගැන දතයුතුය. එවං අභික්කන්ත දස්සාවී මෙසේ දෙවියන් සහිත සියළු ලෝවාසීන්ගේ අදහස්, ගතිසොබා, සසර උපත් හා ඉන් මිදීමද දැකීමට හැකි, උසස් ලෙස දකින, සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු උවමනාවන, පවතින (වැදගත්) සේ සලකනු ලබන දේවල හිස් බවද, ඒවා හේතු රැසක එකතුවක් ලෙසද යන දෙආකාරයෙන්ම ලෝකයෙහි හිස් බව නුවණින් විමසා බලව. අත්තානුදිට්ඨිං ඌහච්ච මමය-මගේය යන දැඩිව ගන්නා ලද දැකීම උදුරා ඉවත දමා, ඉතිරි කරුණු පැහැදිලිය. මෙම සූත්‍රයද භාග්‍යවතුන් වහන්සේ අරහත්බව දේසනා කළහ. පෙර කියා ඇති පරිදි දේසනය අවසානයෙහි බොහෝ පිරිසට දහම් අවබෝධ විය.

මෝඝරාජ සූත්‍ර විස්තරය නිමි.

# 5.16

**ජිණ්ණොහමසමි** යනු **පිංගිය** සූත්‍රයයි. එහි **ජිණ්ණොහමසමි අබලො වීතවණ්ණො** මේ බමුණා එකසිය විසිවයස්ව, ජරාවට පත්ව, දුබලව, 'මෙතැන පා තබමි'යි සිතුවද වෙනත් තැනක පා තබමින් ගමන් කරයි. පෙර තිබූ සමෙහි පැහැය දැන් විරූපීය. එහෙයින් 'මම ජරාවට පත්වීමි. සවිබල නැත්තෙක්මි. සිරුර පැහැය වෙනස්ව ඇතැ'යි කීය. **මාහං නස්සං මොමූහො අනතරාය** ඔබවහන්සේගේ දහම අවබෝධ නොකොට, දැනුමැති කෙනෙක් නොවී, මම නොනැසෙම්වා! **ජාති ජරාය ඉධ විප්පහාණං** මෙහිදීම ඔබ වහන්සේගේ පාමුල පාසාණක චෙතියෙහිදී හෝ ඉපදීම, ජරාව නසන නිවන **ධම්මං යමහං විජඤ්ඤං** එය මට **ආචික්ඛ** දැන් පිංගිය තම සිරුරෙහි පවත්නා තතු සළකා 'මම ජරාවට පත්වූයෙමි'යි කියන අතර, එහිදී භාග්‍යවතුන් වහන්සේ (සිත) වෙහෙසට පත් කරවන රූප දැක..........'දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ යන ගාථාව කයෙහි ඇල්ම නැති කරනු පිණිස වදාළහ. **රූපෙසු** රූප හේතුකොට, රූප නිසා, **විහඤ්ඤමානෙ** (ඊට අදාලව) කරන කියන දෙයෙහි වෙහෙසෙමින්, **රුප්පන්ති** රූපෙසු ඇස් රෝග ආදිය රූප හේතුකොට ගෙනම, **ජනා** වෙනස්වෙති. බැඳෙති. (කෝප වෙති.) එසේ අරහත් පල තෙක් දේසනා කරන ලද පිළිවෙත ඇසූවත්, කය දුබලතාව නිසා වෙසෙසක් නොලබාම, නැවත පිංගිය 'දිසා චතස්සො' (සිවුදිසා) ගාථාවෙන් භාග්‍යවතුන් වහන්සේ අගයමින්, දේසනා කරන ලෙස ඉල්ලයි. නැවත ද භාග්‍යවතුන් වහන්සේ, එම පිළිවෙත 'තණ්හාධිපන්නෙ....... 'තණ්හාවෙන් ගැලී සිටින්නන්...... ගාථාවෙන් දේසනා කළහ. ඉතිරි කරුණු පැහැදිලිය.

භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයද අරහත් බව කුළුගන්වමින් දේසනා කළහ. දේසනය අවසානයෙහි පිංගිය අනාගාමි පලයෙහි පිහිටියේය. ඒ අතරතුර, පිංගිය 'මෙබඳු විසිතුරු දෙසුමක් නම්, මගේ මාමා වූ බාවරීට ඇසීමට නොලැබුණි.'යැයි සෙනෙහස මුල්ව සිත වෙනසකට යොමුවීමෙන් අරහත් පල ලැබීමට නොහැකි විය. ඔහුගේ අතවැසි ජටිලයෝ දහසම අරහත් බව ලදහ. ඒ සියල්ලෝම, 'එථ මහණ' යැයි (කැඳවීමෙන්) ඍද්ධිමය පාසිවුරු දරා පැවිදි බවද ලදහ.

**පිංගිය සූත්‍ර විස්තරය නිමි.**

මෙයින් පසු, සංගායනාවට සහභාගී වූ තෙරුන් වහන්සේලා දේසනය පසසමින්, භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ'යැයි සඳහන් කළහ. **ඉදමවොච** මේ පාරායණ හෙවත් සසරින් එතරවීමේ පිළිවෙත වදාළහ. **පරිචාරක සොළසානං** බාවරීගේ පිරිවර (ගෝලයන්) ද පිංගිය සමග දහසයක්, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පිරිවරා සිටි දහසයදෙනා, ඒ සියළුම බමුණෝ ඒ දහසයක් වූ පිරිසට ඉදිරියෙන් ද පසුපසින් ද, වම් පසින්ද, දකුණු පසින්ද, සය යොදුනක්, සය යොදුනක් සේ හුන්හ. **ඉදිරිපස** - කෙළින්ම සිටි පිරිස දොළොස් යොදුනක් විය. **අජ්ඣිට්ඨො** ඉල්ලන ලද්දේ, **අත්ථමඤ්ඤාය** පාලි අරුත දැන, **ධම්ම මඤ්ඤාය** පෙළ (දහම) දැන, **පාරායණං** පාරායණ නම් වූ, **ඉමස්ස ධම්මපරියායස්ස අධිවචනං** අජිත, තිස්ස මෙත්තෙය්‍ය ආදී ඒ බමුණන්ගේ නම් කියමින් උතුම් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණියාහ'යැයි කීහ. **සම්පන්නචරණං** නිවනෙහි පිහිටීමට හේතුවන පාමොක් සීලාදියෙන් යුතු, **ඉසිං** ඉසිවරුන්ගෙන් උසස් වූ (බුදුරදුන් වෙත) ඉතිරි කරුණු පැහැදිලිය. බ්‍රහ්මචරියමචරිංසු මග බඹසරෙහි හැසිරුණහ. **තස්මා පාරායණං** ඒ එතරට යන, නිවනට පමුණුවන යනුවෙන් කියන ලදී.

පාරායණා මනුගායිස්සං යනු මෙහි සම්බන්ධයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් 'පාරායණ' නම් වූ දහම් කොටස දේසනා කළවිට, දහසය දහසක් ජටිලයෝ අරහත් පලයට පැමිණියහ. ඉතිරි දහහතර කෝටියක් දෙව් මිනිසුන්ට දහම් අවබෝධ විය. පැරණි වියතුන් විසින් මෙසේ කියන ලදී. 'සුන්දර වූ පාසාණක (චෙතියෙහි)දී පැවැත්වූ දහම් දේසනයෙහිදී බුදුරජාණන් වහන්සේ දහහතර කෝටියක් සත්වගට (දම් අමා පෙවූ සේක.'

**තතො පාසාණකෙ රම්මෙ පාරායණ සමාගමෙ**
**අමතං පාපයී බුද්ධො චුද්දස පාණකොටියො**

දහම් දෙසුම නිමවූ විට, ඒ ඒ පෙදෙස්වලින් පැමිණි මිනිස්සු භාග්‍යවතුන් වහන්සේගේ ආනුභාවයෙන් තම තමන්ගේ ගම් නියම්ගම් ආදී පෙදෙස්වලට පැමිණවූහ. භාග්‍යවතුන් වහන්සේද (බාවරීගේ) පිරිවරව සිටි සොළොස් දහසක් සඟ පිරිස සහ නොයෙක් දහස් ගණන් බික්සඟණ පිරිවරා සැවැත් පුරටම පැමිණියහ. එහිදී පිංගිය හිමි භාග්‍යවතුන් වහන්සේට වැඳ, 'හිමියනි, බාවරී ඇදුරුතුමාට බුදුවරයෙකු ලොව පහළ වූ බව සැල කිරීමට යමි, ඔහුට මා පොරොන්දු වී'යැයි කීවේය. භාග්‍යවතුන්

වහන්සේගෙන් අවසර ලද පිංගිය හිමි, ඍද්ධි බලයෙන් ගොදාවරී ගංතෙරට පැමිණ, පා ගමනින් අසපුව දෙසට ගියේය. මඟබලමින් හුන් බාවරී බමුණා, තවුස් පිරිකරද, ජටා ආදියද නොමැතිව පැවිදි වෙසින් එන (පිංගිය හිමි) දුරදීම දැක, 'බුදුවරයකු ලොව පහළව ඇතැ'යි තීරණය කළේය. පැමිණිවිට, 'පිංගිය, කිමෙක්ද? බුදුවරයෙකු ලොව පහළවීදැ'යි ඇසීය. 'එසේය බමුණ, බුදුවරයෙක් ලොව පහල වූහ. පාසාණක සෑයෙහිදී අපට දහම් දෙසූහ. මම ඔබට ඒ දහම දේසනා කරන්නෙමි'යි කීය. එවිට, බාවරී මහත් ගරු සැලකිලිමත්ව, පිරිස සහ පුදසත්කාර කොට අසුනක් පැනවීය. එහි හිඳ පිංගිය හිමි 'පාරායණ මනුගායිස්සනති' ආදී ගාථා කීය.

**අනුගායිස්සං** භාග්‍යවතුන් වහන්සේ ගීත (මිහිරි හඬින් ගී වැනි ගාථා) නැවත ගයමි. **යථා අද්දක්ඛි** තමන් විසින්ම ඇති තතු එලෙසින්ම අවබෝධ කිරීමෙන් වෙනත් කෙනෙකු නොලබන සුවිසෙස් නුවණින් දුටහ. **නික්කාමො** කාමය නැති කළ, **නික්ඛාමො** යනුද වචනයක් වේ. උත්සාහවත් යන අරුතයි. අයහපත් දෙයින් වෙන්වූයේ එයින් නික්මුණු යන අදහසයි. **නිබ්බනො** කෙලෙස් නැමති වනය වැනසූ හෝ තණ්හාව නැති කරන ලද හෝ, **කිස්ස හෙතු මුසා භණෙ** කෙලෙස්වලින් පිරුණේ නම්, බොරු කියන්නේය. මෙහිදී ඒ කෙලෙස් නැතිකරන ලද බව දක්වයි. එයින් බාවරී බමුණාට ඇසීමට උනන්දුවක් ඇතිකරයි. **වණ්ණූපසංහිතං** උසස් බවින් යුතු, **සච්චව්හයො** 'බුද්ධ' යැයි කියන නමටම නිසැකවම ඇත්තටම සුදුසු වූ, **බ්‍රහෙම** ඒ බමුණාට අමතයි. **කුබ්බනකං** කුඩා වනය. **බහුප්ඵලං කානනමාවසෙය්‍ය** නොයෙක් පලවැල ඇති වනයකට පැමිණ වසන්නේය. **අප්පදස්සෙ** බාවරී වැනි මද නුවණ ඇත්තෙකු (හැර), **මහොදධී** අනොතත්ත ආදී බොහෝ ජලය පිරුණු, **යෙ මෙ පුබ්බෙ යෙ** + ඉමෙ යමෙක් මෙයින් පෙර, **තමනුදාසිනො** අඳුර දුරු කරන්නා වූ, **භූරිපඤ්ඤාණො** නුවණ නැමති ධජයෙන් යුතුව, **භූරි මෙධසො** මහත් වූ නුවණැති, **සන්දිට්ඨිකමකාලිකං** තමන් විසින්ම දැකිය යුතු, කාල සීමාවකට යටත්කොට පැමිණිය යුතු නොවන, **අනීතිකං** කෙලෙස් උවදුරු නැති, ඉක්බිති බාවරී පිංගිය හිමි භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් වෙන් නොවන බව 'නාහං තමහා' ආදී ගාථා කීය.

**පස්සාමි නං මනසා චක්ඛුනා ව** ඒ බුදුරදුන් මම ඇසින් මෙන් සිතින් දකිමි. **නමස්සමානො වසෙමි රත්තිං** නමදිමින්ම රැය ඉක්මවමි. **තෙන තෙනෙව නතො** යම් පෙදෙසක බුදුරජාණන් වහන්සේ වැඩ

වසත්ද, ඒ ඒ දෙයට මම ද නැඹුරු වෙමින්, ඇත් නොවෙමින් සිටිමි'යි දක්වයි. **දුබ්බලථාමකස්ස** සවිමත් බවින් අඩුවී, ඒ දුබල බව නිසා කය තිසි අයුරු පවත්වා ගැනීමට නොහැකිය. බුදුරජාණන් වහන්සේ සිටින තැනට (එහෙයින්) නොයයි. **න පලෙති** යනුවෙන්ද පාඨයකි. මේ අදහසය. **තත්ථ** බුදුරජාණන් වහන්සේ සමීපයෙහි, **සංකප්පයන්තාය** කල්පනා ගමනින්, **තෙන යුත්තො** සිත ඒ බුදුරදුන් කෙරෙහි යෙදුනේ වේ. **පංකෙසයානො** කාමය නැමති මඩෙහි නිදමින්, **දීපා දීපමුපප්ලවිං** වෙනත් සමයක නායකයෙකු ළඟ සිට, තවත් සමයක නායකයෙකු වෙත එළඹියෙමි. **අද්දසාසිං සම්බුද්ධං** මම මෙබඳු වැරදි දැක්මක් දරාගෙන, ඒ ඒ තැන ඇවිදිමින්, අථ පාසාණක චෙතියෙහි දී බුදුරජාණන් වහන්සේ දුටිමි.

මේ ගාථාව අවසානයෙහි පිංගිය හිමිගේ ද, බාවරීගේ ද ඉඳුරන් දහම් අවබෝධයට සුදුසු බව දැන, භාග්‍යවතුන් වහන්සේ සැවැත්පුරම වැඩසිටිමින්ම රන්පැහැ ආලෝකයක් මුදාහළහ. පිංගිය හිමි බාවරීට බුදුගුණ විස්තර කරමින් සිටිද්දීම, ඒ ආලෝකය දැක, 'මේ කුමක්දැ'යි විමසා බලනවිට, භාග්‍යවතුන් වහන්සේ තමා ඉදිරියේ වැඩසිටියා සේ දැක, 'බුදුරජාණන් වහන්සේ වැඩිසේකැ'යි බාවරී බමුණාට දැන්වීය. බාවරී අසුනින් නැගිට, ඇඳිලි බැඳ වැඳ සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ආලෝක දහරාවක් පතුරුවා බමුණාට තමන් දක්වන්නාක් මෙන්, දෙදෙනාගේම අදහස් දැන, පිංගිය හිමි අමතා, 'යථා අහූ වක්කලී'...... ගාථාව වදාළහ. එහි අරුත නම්, යම්සේ, සැදැහෙන් බරව සිටි වක්කලී තෙරුන් මෙන් ද (බාවරීගේ සිසුන්) දහසය දෙනා අතුරෙන් භද්‍රාවුධ මෙන්ද, ආලවි-ගොතම මෙන්ද සැදැහෙන් මිදී - අරහත් බවට පත්වූ සේ, ඔබද ඒ සැදැහැ බවින් මිදෙවු, එසේ සැදැහැ බවින්, 'හේතු නිසා ඇතිවන හැමදෙයම අනිස යැයි 'සබ්බෙ සංඛාරා අනිච්චා' ආදී ලෙසින් විදසුන් වඩා **මච්චුධෙය්‍යස්ස පාරං** නිවනට, **ගමිස්සසි** මෙසේ අරහත් බව කුළුගන්වමින් දේසනය නිමකළහ. දේසනය අවසානයෙහි පිංගිය හිමි රහත්පලයද, බාවරී අනාගාමී පලයෙහිද පිහිටියේය. බාවරී බමුණාගේ පන්සියයක් සිසුවෝ සෝවාන් පලෙහි පිහිටියහ.

දැන් පිංගිය තෙරුන් වහන්සේ තම පැහැදීම පළ කරමින් 'එස භියෙය්‍යා' ආදී ගාථා පැවසූහ. **පටිභානවා** වැටහෙන සියුම් නුවණින් යුතු, **අධිදෙවෙ අභිඤ්ඤාය** දෙවියන් අබිබවා යන දහම දැන, **පරොවරං** ලාමක, උසස්, තමාගේත්, වෙනත් පුද්ගලයන්ගේත් දෙවියන් ඉක්මවා

යන සියළු කරුණු දන්නා ලදැයි ද අවබෝධ කරන ලදැයි ද මෙයින් කියන ලදී. **කංඛීනං පටිජානතං** තදබල සැකය තිබූ බැවින්, 'දැන් මුළුමනින්ම සැකයෙන් දුරුවූයෙමි'යි මැනවින් දැන, **අසංහීරං** රාගාදියෙන් ඈත්වූයේ, එකතු නොවූයේ, **අසංකුප්පං** කෝප සහගත බවක් ඇති නොවන, වෙනස්නොවන, (මෙබඳු ගති රහිත) මේ වචන දෙකෙන්ම නිවන ගැන සඳහන් කරයි. **අද්ධාගමිස්සාමි** නිසැකවම නැවත සසර ඉපදීම නැති නිවනට යන්නෙමි. **න මෙත්ථ කංඛා** ඒ නිවන ගැන මට සැකයක් නැත. **එවං ම ධාරෙහි අධිමුත්ත චිත්තං** 'පිංගිය, එපරිදිම ඔබ ද සැදැහැ බව මුදාහරව'යි භාග්‍යවතුන් වහන්සේගේ මෙම අවවාදයෙන් තමා කෙරෙහි සැදැහැ උපදවා, සැදැහැ බර දැරීමෙන්ද මැනවින් නිදහස්ව, ඒ සැදැහැ බවින් මිදී ඒ බව භාග්‍යවතුන් වහන්සේට පැවසුවේ 'එසේ මා සළකා ගනු මැනව' යනුවෙනි.

පාරායණ වග්ගය නිමියේය.

සසරින් නිදහස සොයන ලෝකවාසීන්ට, බුදුරජාණන් වහන්සේ විසින් දේසනා කරන ලද කුඩා දහම් සූත්‍ර ඇතුළත්ව ඇතැයි සැළකෙන ඛුද්දක නිකායෙහි සුත්තනිපාත නම් වූ (සූත්‍ර එකතුවට) වන්දනීය වූ උතුම් තෙරුවන් නැමද අරුත් විවරණයක් කරන්නෙමු.

**උත්තමං වන්දනෙය්‍යානං වන්දිත්වා රතනත්තයං**
**යො ඛුද්දක නිකායම්හි ඛුද්දාචාරපහායිනා**
**දෙසිතො ලොකනාථෙන ලොකනිස්සරණෙසිනා**
**තස්ස සුත්ත නිපාතස්ස කරිස්සාමත්ථවණ්ණනං**

යැයි මුලදී කියන ලද පරිදි මෙහි උරග වග්ග ආදී කොටස් පහකින් හා උරග සූත්‍රය ආදී සූත්‍ර හැත්තෑවක් ඇතුලත් සුත්ත නිපාතයට අරුත් විස්තර කරන ලදී.

එහෙයින් මෙසේ කියන ලදී.

මතුවටද සදහම් මැනවින් පැවතීම දකිනු කැමතිව, මෙම සුත්ත නිපාතයට අරුත් විස්තර දැක්වීමෙන් මා විසින් ඇති කරගත් කුසල බලයෙන්, බුද්ධාදී උතුමන් විසින් පහදා දෙන ලද දහමෙහි මේ ජනතාව එහි මහත් වූ විපුල දැනුමෙන් ඉක්මණින්ම වැඩිදියුණුවට පැමිණේවා!

ඉමං සුත්ත නිපාතස්ස කරොන්තෙනත්ථවණ්ණනා
සද්ධම්මට්ඨිතිකාමෙන යං පත්තං කුසලං මයං

තස්සානුභාවතො ඛිප්පං ධම්මෙ අරියප්පවෙදිතෙ
වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාතු අයං ජනො

උගතයුතු දහම් කොටස් සේ බණවර හතළිස් හතරකි.

උතුම්, සුපිරිසිදු සැදැහැ බවින්, නැණින් හා උත්සාහ ගුණ යුතු, මනා සිල්වත්, නොවක්, මුදු ගුණයෙන් යුතු, තම සමය මෙන්ම වෙනත් ආගම් දසුන් හැදැරීමෙන් සමත්කම් පෑ, දැනුමෙන් වියත් වූ, උගතමනා තෙවළා දහමෙහි අටුවා විවරණ සමග බුදුසස්නෙහි නොවෙනස් නුවණ රැසින් ද, මැනවින් වියරණ - වහර දැනීමෙන් ලද උදාරබව පිරි මිහිරි වදනෙහි බුහුටිකමින් හා සියළු වාදයන්හි අගපත්, මහාකවි, උසස් ගැඹුරු සයනැණින් හා මනා වැටහෙන නුවණින් යුතු, මිනිස්වග ඉක්මවා යන උසස්තම කරුණින් හෙබි, මහා විහාරවාසී, බබලන පහන් වන් ථෙරවාදී සඟ පරපුර අලංකාර කරන ලද, පුළුල් නිමල බුද්ධිය නිසාම ගුරුන් විසින් බුද්ධඝොස (හෙවත් බුදුගොස්) න නමින් හඳුන්වනු ලබන තෙරුන් වහන්සේ විසින් 'උසස් බලාපොරොත්තු බබුළුවන) පරමත්ථ ජොතිකා නම් මෙම සුත්තනිපාත අටුවාව කරන ලදී.

පිරිසිදු සිතැති, කම්පා නොවන, ලොවටම උසස් වූ, මාහ ඉසිවර වූ බුදුරජාණන් වහන්සේ යන නම ලොව පවත්නා තෙක්, සසරින් එතරවනු කැමති කුල පුතුනට සීලයෙන් පිරිසිදු වීමේ මග - පිළිවෙල පෙන්වා දෙමින් මෙය ලොව පවතී.

තාව තිට්ඨතු ලොකස්මිං ලොක නිත්ථරණෙසිනං
දස්සෙන්ති කුලපුත්තානං නයං සීල විසුද්ධියා

යාව බුද්ධොති නාමම්පි සුද්ධචිත්තස්ස තාදිනො
ලොකම්හි ලොකජෙට්ඨස්ස පවත්තති මහෙසිනො

**සුත්තනිපාත අටුවා කථා නිමියේය.**

# සූචිය


**අ**

අක්මාව 252
අකා වො 480
අකුහතො 611

අගගාලව 4
අගසස් දානය 273

අට වැදෑරුම් තපස 330
අටපිරිකර 192
අටාකාර කාය 156
අට්ඨපාන 451
අණ කගග 455
අත්වාරු රැගෙන 97
අත්තදණ්ඩ සූත්‍රය 430
අතුරු බතක් පිස 100
අත්ථකුසල 188

අධාන වෙමත්ත තා 477
අනවජ්ජ භෝජී 87

අනාපත්ති රස රසෙ 238
අනුපදිසෙස පිරිනිවන් 316

අප්පමාදෙන අණ්ණවං 239
අරක්කැමියා 100
අරි අටඟ මග 7
අවිතත්ථී 612
අරූප භව 14
ආමගන්ධ බමුණා 317
ආලවක විමන 227

ආලවක කුමරු 243
ආප 447
ආම පත්තං 462

ඇත්දත් කරඬු 639
ඇතිදැඩි වීම 190
ඇතුලු පුරයෙහි 90

ඇත බාගෙන 192
ආලව 192

ඇසළ නැකැත් උළෙල 215

ඉසිවරුන් 320

**උ**

උඩුකුරුව නිදන 308
උණ ගොබය 70
උපැවිදි විය 97
උසස් විහරණ 199

**ඔ**

ඔකාස කත 5
ඔර පාර 14

**ක**

කඟවේණා 62
කණ මැස්සා 32
කණේරු මල්පොකුරු 321
කණ්හාභි ජාතිකො 523
කලලයක් 281

කලහ විවාද 613

කාය විච්ඡන්දික සූත්‍රය 245
කාලී උපාසිකාව 215
කාවො 480

කැටකිරිලි මස් 34
කැළණි ගඟ 7

කිහිරි වනය 265
කිඹුල්වත් පුර 276

කුඩා විල 641
කුරිර සරිකකාලී 216

කෙළ සියදහසක් සක්වල 298

කේතු මාලාවෙන් 247
කොබෝලීල 33

ග
ගග්ගරා පොකුණ 17
ගපීතානි 630
ගල් ඇඳ 378
ගවිපඵල 321

ගැබිනියක 82
ගිනිහල් ගෙය 192
ගිරිබ්බජ 453
ගිරිමේඛලා 462
ගිලන්පස 447

ගෝ කුලංක විහාර 45
ගෝචර වත 212

ගෝතමක චෛත්‍යය 206
ගෝධරණා 38

ච
චතුක්කණ්ණ 546
චාතුමාසික බ්‍රහ්මදත්ත 110
චේතො විමුත්ති 567

ජ
ජනවාද ධම්මා 637
ජාතිභේදය 533-538
ඤාණ බන්ධු 624

ත
තල්වටින් 274
තාදී ගුණ 209
තිණමිග 77
තුන් විදු නැණ 463
තුන් ආකාර හික්මීම625

ද
දායක පවුල් 185
දැලි පිහි මුවහත 562
දිවරුවන් අසුන් 227
දුගඳ වහනය 185
දෙයාකාර කාමයෝ 185
ධුතංග 559

න
නත්ථික දිට්ඨි 323
නවක පැවිද්දන් 192
නහර මුල්පිණි 185
නාගසේන තෙරුන් 519

නාන තොට 192
නික්කේතසාරී 259
නිජ්ඣාම තණ්හික 324
නිරගගල 288

නෙළුම්දැලි ආදිය 331
නො නිදන මිනිසෙකු 97

ප

පටිභාන 104
පඤ්ඤා විමුත්ත 567
පඬු පැහැව 185
පතිරූපකාරී ධුර 240
පස් ආකාර මහණුන් 341
පස් අඟුල් ලෙන 66
පස් මහා යාග 288
පවිවේකය 334
පසදමිග 77
පසේ බුදුවරු 234
පහාණ විනය 9
පහාරාද සූත්‍රය 473

පාදලොල බ්‍රහ්ම දත්ත 106
පාමුජ්ජ කරණ 333
පාමොක් සංවරය 188
පාලන සීමාව 90
පාසාණක චේතිය 660
පාරිභෝගික ධාතු 641

පිණ්ඩපාතිකංගය 559
පිදුරු වේණිය 241
පියාපත් බර පමණක් 192
පුරිසමේධ 288

පෙහෙවස් 449

බ

බට ඒදණ්ඩක් 19
බඩ හමු 32
බල සේනා 455
බරණැස් නුවර 87
බහුස්සුත 104
බාවාරි 519
බාහික හිමි 341
බුද්ධ සමණා 563

බෙර හඬ 79
බ්‍රහ්මායු බමුණු 579
බෙලිගෙඩියක අඩක් 214

හගලවතී පච්ච 269
භූමි ලද්ධ 7

ම

මඤ්ජූසක 64, 87
මඩවගුරු 41
මණ්ඩුක කණ්ටක 6
මදුරට 65
මස් වැදැල්ලක් 281
මහාපණා ද 471
මිලින්ද ප්‍රශ්නය 519
මිලක්ඛ භාසා 467
මිහිකත දෙවිවරු 336
මුඛ දුගග 544
මුනි 455
මොඝරාජ 649
මොනෙය්‍ය පිළිවෙත 548

ර

රත් සිරියල් 281
රසමසවුලින් පිරි 190
රාග විරාග 567
රෝරුව නම් නිරය 546

ලාකඩ පටලයක් වැනි 281
ලොකත්‍ථ චරියා 62
ලෝහිත කමටහන 16

ව

වචී පරම 333
වටු කුරුළු මස් 321
වනථජා 25
වන සෙනසුන් 416
වාචසික 79
වාජපෙයා 288
විභූසික බ්‍රහ්මදත්ත 164
විසුද්ධි දේව 222

වේදයෙහි පරතෙර 475
වේලායුධය 231
විනය 9
විජ්ජාචරණ 213

ස

සකාවො 480
සඟ පිරිස 185
සතරාකාර වචනය 156
සත් අහර එක්රැස් වීම් 631
සඳුන් හර කුඩු 586
සද්ධා ධුර 301
සම කේවලී 617
සමන පාසන 562
සාගලපුර 65
සමමාපාස 288
සාතාගිර 261
සාලවතී 249
සාමකා 34
සැරයටියෙන් ඉරක් ඇඳ 90
සිකපද 4
සිවුදිසා රැකවරණ 82
සිවුමාසික බඹදත් 83
සිනිඳු කම්බිලි 639
සිවු වැදෑරුම් නොසරුප් බව 193

සීලබ්බත 621
සුචිරෝම 378

සේද ජල්ලිකා 253
සේනාසන 447
සේල බමුණා 519

සෝක කාලය

හ

හැල් සහලින් පිරූ බත් 322
හැවය ඇරීම 14
හේමවත 201



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

හදන්ත බුද්ධඝොෂාචාර්‍ය්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි


බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-37-8